බහුවිධ අවස්ථාවන්

චිරස්ථායී ප්‍රගතියක්



ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ

ලංකා බැංකුව

වසර 85 ක් පුරා, ජාතික ප්‍රගතිය සඳහා වූ අඛණ්ඩ කැපවීමකින් මඟ පෙන්වනු ලබන, ශ්‍රී ලාංකිකයන් ඔවුන්ගේ අභිලාෂයන් වෙත ළඟා කරන ස්ථීර පාලමක් ලෙස අපි රැඳී සිටිමු. අපගේ විශේෂඥතාවයේ ගැඹුර සහ සිය කණ්ඩායමේ ශක්තිය උපයෝගී කරගනිමින්, බැංකුව සිය භූමිකාව නිසි ලෙස ඉටු කරමින් දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීම අඛණ්ඩව සිදු කරයි.

ජාතියේ මහා පහන් ටැඹ ලෙස...



දැක්ම

ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රගතියේ පෙර ගමන්කරු වශයෙන් නව්‍ය ඩිජිටල් ක්‍රමවේදයන්ට අනුගතව සවිමත් ගෝලීය ප්‍රවේශයකින් යුතුව ගනුදෙනුකාර භවතුන් අතර නිබඳව රැඳෙන බැංකුව බවට පත් වීම.



මෙහෙවර

නවීන තාක්ෂණය මුසු වූ මූල්‍ය සේවාවන් සුරක්ෂිත ප්‍රවේශයන් ඔස්සේ ප්‍රදානය කරමින් පුද්ගල, ව්‍යාපාර සහ සියලු සමාජ ස්ථරයන් බලගැන්වීම සමඟින් අපගේ ගනුදෙනුකාර භවතුන්, කාර්ය මණ්ඩලය සහ සියලු පාර්ශ්වකරුවන් සඳහා තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීම මෙන්ම අපගේ ජාතික සහ ජාත්‍යන්තරව පැතිරුණු සේවා විශිෂ්ටත්වය තීව්‍ර කිරීම.



ආයතනික වටිනාකම්

ගෝලීය බැංකුකරණයේ ශ්‍රී ලාංකීය සලකුණ බවට පත්වීමේ අපගේ දැක්ම කරා යන ගමනේදී පහත දැක්වෙන පංචවිධ වූ මූලික හරයන් මත බැංකුව ක්‍රියාත්මක වෙයි.

- ගනුදෙනුකාර කේන්ද්‍රීය වීම.
- අප ආයතනය හා බැඳුනු විවිධ ජන කණ්ඩායම්හි විවිධත්වයට ගරු කිරීම.
- ඉතා උසස් තත්ත්වයේ ආචාරධර්ම පිළිපැදීම සහ වෘත්තීමය පරිසරයක් ස්ථාපනය සඳහා කැපවීම.
- නම්‍යශීලි සහ නවෝත්පාදන පරිසරයක් ප්‍රවර්ධනය කිරීම.
- අපගේ සෑම ක්‍රියාකාරකමක් සඳහාම වගවීම.

බහුවිධ අවස්ථාවන්

චිරස්ථායී ප්‍රගතියක්

ප්‍රගතිය රේඛීය වන්නේ කලාතුරකිනි. එය ආර්ථික, සමාජීය, ඩිජිටල්, මානව, පාරිසරික සහ යහපාලන වර්ණාවලි අතර එකිනෙක මාරු කිරීම්, ඡේදනය වීම්, සහ බලපෑම් ඇති කිරීම් ඔස්සේ දිග හැරේ. බහුමාන රූබික් ඝනකයක් මෙන්ම, ජාතියේ සමෘද්ධිය එක් පියවරකින් නොව, අසංඛ්‍යාත අන්තර් සම්බන්ධිත මානයන් පෙළගැස්වීමෙන් ලඟා කරගනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ බැංකුව වශයෙන්, ලංකා බැංකුව මෙම අන්තර් සම්බන්ධිත වර්ණාවලි අතර මධ්‍ය ලක්ෂ්‍යය වන අතර සහභාගිවන්නෙකු ලෙස පමණක් නොව, ජාතික ප්‍රගතියේ උත්ප්‍රේරකයක් ලෙස ද ක්‍රියා කරයි.

අපි රටේ ආර්ථික පද්ධතියේ සම්පූර්ණ මානය හරහා ගමන් කරමින්, නවෝත්පාදනය සමඟ ස්ථාවරත්වය, වර්ධනය සමඟ යහපාලනය, ඇතුළත්කරණය සමඟ තාක්ෂණය, සහ වර්තමානය සමඟ අනාගතය සමතුලිත කරන්නෙමු.

මෙම දිගුකාලීන නායකත්වය තුළින්, සෑම තීරණයක්ම මෙම බහුමාන අවකාශය තුළ අරමුණු සහිත වෙනසක් වෙමින් සහ වටිනාකම් මුදා හරිමින් ඉහළ ප්‍රතිඵල ලඟා කර දේ.

මෙම බහුමාන භූ සන්දර්භය තුළ, විවිධ ස්තර අතර අගනාකම් වැඩි කරමින් අපගේ වගකීම සංකීර්ණත්වයට මුහුණ දීමෙන් ඔබ්බට විහිදේ. එය වෙළඳපළ මාරුවීම් හැඩගස්වන බලවේග, මිනිස් අභිලාෂයන්, ගෝලීය ගතික ව්‍යාපාර, ශීඝ්‍ර ඩිජිටල්කරණය සහ පුළුල් තිරසාරභාවයේ අත්‍යවශ්‍යතාවයන් පිළිබඳ ගැඹුරු අවබෝධයකින් සිටින අතර, පරිණාමය වෙමින් පවතී.

අප හට මෙම බලපෑම් සහ එහි ගම්‍යතාවය හඳුනා ගැනීම තුළින්, ඒකීය, පරිවර්තනීය අරමුණකින් ජාතික ප්‍රගතිය කරා විවිධ ශක්තීන් පෙළගස්වමින් ක්‍රියා කරන්නට හැකි වේ.

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ



අන්තර්ගතය

දළ විශ්ලේෂණය
විශිෂ්ටත්වයෙන් ගොඩනැගුණු උරුමයක්

මෙම වාර්තාව පිළිබඳව 4
ලංකා බැංකුව පිළිබඳව සංක්ෂිප්තව 10
කාර්යසාධන විශේෂාංග 16
සම්මාන සහ ඇගයීම් 18
අනාගතය සඳහා ශක්තිමත් බලගැන්වීමක් 20

නායකත්වය
අරමුණක් ඇතිව මෙහෙයවීම

සභාපතිතුමාගේ පණිවිඩය 22
මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය 26
අධ්‍යක්ෂ මණ්ඩලය 32
ආයතනික කළමනාකාරිත්වය 40
විධායක කළමනාකාරිත්වය 47

අපගේ උපායමාර්ග
අනාගතයට මඟ පෙන්වීම

මෙහෙයුම් සන්දර්භය 52
පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වීම 57
ප්‍රමාණාත්මකතා තක්සේරුව 61
උපායමාර්ග සහ සම්පත් විභජනය 65
වටිනාකම් නිර්මාණයේ ආකෘතිය 72
චිකතු කළ අගය මත ප්‍රකාශය 74
තිරසාරත්වය සමඟ සංයෝජනය 75
SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම් 85

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය
කාර්යසාධනය සහ ව්‍යාපාරික දැක්ම

මූල්‍ය සමාලෝචනය 108
ව්‍යාපාර අංශවල කාර්යසාධනය 115
ගනුදෙනුකාර සේවා ප්‍රශස්තකරණය 132
ස්ථිරසාර කාර්යසාධනයක් සඳහා පරිපූර්ණ ශ්‍රම බලකාය 138
ඩිජිටල් අත්දැකීම් බලගැන්වීම 148
තිරසාර අනාගතයක් ගොඩනැගීම 153

යහපාලනය සහ අවදානම
ඒකාග්‍රතාවය සහ වගවීම ආරක්ෂා කිරීම

ලංකා බැංකුවේ යහපාලනය 162
විගණන කමිටු වාර්තාව 180
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව 182
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව 184
නාමයෝජනා සහ යහපාලනය පිළිබඳ කමිටු වාර්තාව 186
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු වාර්තාව 188
සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව 190
අවදානම් සහ තිරසාර වර්ධනය 191

මූල්‍ය වාර්තා
කාර්යසාධනයෙන් පෙරමුණ ගැනීම

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව 218
ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම 224
මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 226
ස්වාධීන සහතික වීමේ වාර්තාව 228
මූල්‍ය වාර්තාකරණය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම 229
විගණකාධිපතිතුමාගේ වාර්තාව 230
ලාභ හෝ අලාභ ප්‍රකාශනය 236
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 237
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 238
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය 240
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 244
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 246

අනුකූලතා ඇමුණුම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2023 සංග්‍රහයට අනුකූලතා 405
2024 අංක 05 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා 411
කොළඹ කොටස් හුවමාරුව විසින් නිකුත් කරන ලද ලැයිස්තුගත කිරීමේ රීතිවල 9 වන වගන්තියට අනුකූල වීම 436
කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනෙකුත් අනුකූලවීමේ අවශ්‍යතා 441
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා 442
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය 446

අතිරේක තොරතුරු

ස්වාධීන සහතික වීමේ වාර්තාව - සමෝධානික වාර්ෂික වාර්තාව 456
ස්වාධීන සහතික වීමේ වාර්තාව - තිරසාරකත්වය 458
GRI දර්ශකය 460
මූල්‍ය ප්‍රකාශන (ඇමරිකානු ඩොලර් වලින්) 462
කාර්තුමය විශ්ලේෂණය 465
කොටස් හා ණයකර තොරතුරු 468
දස වර්ෂ සංඛ්‍යාන සාරාංශය - බැංකුව 469
පරිපාලිතයන් හා ආශ්‍රිතයන් 471
මූල්‍ය සහ බැංකුකරණ පාරිභාෂික ශබ්ද සංග්‍රහය 473
ආයතනික සහ විදේශීය කාර්යාල 475
ආයතනික තොරතුරු 476



දළ විශ්ලේෂණය

විශිෂ්ටත්වයෙන් ගොඩනැගුණු උරුමයක්

වසර 86 කට වැඩි ඉතිහාසයක් සහිතව ශ්‍රී ලාංකීය පරම්පරාවන් ගණනාවක් වෙත ප්‍රගතියේ ආලෝකය ගෙන එමින්, ලංකා බැංකුව රටේ ආර්ථිකය සහ ජන සමාජය තුළ සුවිශේෂී ස්ථානයක් හොබවමින් ජාතියේ විශාලතම සහ විශ්වාසනීයතම බැංකුව ලෙස, සමාජය සවිබල ගන්වමින් ජීවිත හැඩගස්වයි.

ලංකා බැංකුවේ සෑම පියවරක්ම ජාතියට තිරසාර වටිනාකම් නිර්මාණය සඳහා දායක වන බව සහතික කරමින් එකවර බහු උපායමාර්ගික ප්‍රමුඛතා හසුරුවන ආකාරය පිළිබඳ දෘශ්‍ය රූපකයක් ලෙස, රූබික් ඝනකය ක්‍රියා කරයි.

මෙම වාර්තාව පිළිබඳව




ලංකා බැංකුවේ
2025 වාර්ෂික වාර්තාව වෙත
ඔබව සාදරයෙන් පිළිගනිමු

ලංකා බැංකුව, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා 13 වන සමෝධානික වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන අතර, එය බහුමාන වර්ධනය, නොසැලෙන ශක්තිය, සහ අර්ථවත් ජාතික බලපෑමකින් සලකුණු වූ වසරක් පිළිබිඹු කරයි.

මෙම වසරේ තේමාව වන "බහුවිධ අවස්ථාවන් - චිරස්ථායී ප්‍රගතියක්", බැංකුවේ බහුවිධ වටිනාකම් හරහා ගොඩනැගුණු අඛණ්ඩ ශක්තිය සාරාංශ කරයි. ශ්‍රී ලංකාවේ විශාලතම සහ වඩාත්ම විශ්වාසදායක බැංකු ආයතනය ලෙස, මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව, මෙහෙයුම් විශිෂ්ටත්වය, තාක්ෂණික නවෝත්පාදනය, මානව ප්‍රාග්ධනය, යහපාලනය, අඛණ්ඩතාව, ජාතික ප්‍රවේශය සහ ජාත්‍යන්තර සම්බන්ධතාවය යන විවිධ ක්ෂේත්‍රවල පවතින බැංකුවේ හැකියාවන් වෙනස් වුවද එකිනෙකට සම්බන්ධිත වේ.

මෙම වාර්තාව, සියලු පාර්ශ්වකරුවන්; ගනුදෙනුකරුවන්, සේවකයින්, කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්, ප්‍රජාව සහ පරිසරය, ව්‍යාපාරික හවුල්කරුවන් සහ නියාමක ආයතන සඳහා ගැළපෙන ලෙස ඉදිරිපත් කර ඇති අතර, බැංකුව සිය බහුමානීය ශක්තිය භාවිතා කරමින් අභ්‍යන්තර වර්ධනය, ජාතික සංවර්ධනය සහ දිගුකාලීන විශ්වාසය ලබාදීමට කෙසේ ක්‍රියා කරන්නේද යන්න අවධාරණය කරයි. එය හුදෙක් ජයග්‍රහණ පිළිබඳ වාර්තාවක් නොව, බහුමානීය ශක්තීන් එකතු වී අර්ථවත් හා දිගුකාලීන බලපෑමක් නිර්මාණය කරන ගතික ආයතනයක ප්‍රතිබිම්බයකි.



වාර්තා කිරීමේ විෂය පථය සහ සීමාව GRI 2-2,3,6

මෙම වාර්තාව, 2025 ජනවාරි 1 වන දින සිට 2025 දෙසැම්බර් 31 දක්වා, ලංකා බැංකුවේ (මින් ඉදිරියට 'ලංකා බැංකුව' හෝ 'බැංකුව' ලෙස හඳුන්වනු ලැබේ) සහ එහි පරිපාලිත සමාගම්වල (සාමූහිකව 'සමූහය' ලෙස හඳුන්වනු ලැබේ) දේශීය සහ විදේශීය මෙහෙයුම් පිළිබඳ පුළුල් දැක්මක් සපයයි.

ප්‍රධාන මූල්‍ය අංශ ඒකාබද්ධ තොරතුරු නියෝජනය කරන අතර, සමූහය තුළ එහි ආධිපත්‍යය සැලකිල්ලට ගෙන මූල්‍ය නොවන අංශ සාකච්ඡා කරනු ලබන්නේ බැංකුවේ සන්දර්භය තුළ ය. ලබා දී ඇති වාර්තාකරණ සීමාව පෙර වසරට වඩා නොවෙනස්ව පවතින අතර BOC IT සොලුයුෂන් (පෞද්ගලික) සමාගම පිහිටුවීම හැර සමූහයේ ප්‍රමාණය, ව්‍යුහය හෝ සැපයුම් දාමයේ සැලකිය යුතු වෙනස්කම් නොමැත.

ප්‍රමාණාත්මකභාවය

බැංකුව ද්විත්ව ප්‍රමාණාත්මකතා මූලධර්මය අනුගමනය කරමින්, මූල්‍ය සහ බලපෑම් යන මානයන් දෙකම ආමන්ත්‍රණය කරයි. එය බැංකුවේ මූල්‍ය කාර්යසාධනයට බලපාන කරුණු පමණක් නොව, සමාජයට, පරිසරයට සහ පුළුල් වශයෙන් ආර්ථිකයට බලපාන ගැටලු වාර්තා කරයි. මෙම ප්‍රවේශය මඟින් පාර්ශ්වකරුවන්ට බැංකුවේ වටිනාකම් නිර්මාණය පිළිබඳ සමස්ත දැක්මක් ලබා ගත හැකි අතර, එහි මෙහෙයුම් දිගුකාලීන මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගනිමින් මැනිය හැකි බලපෑමක් ජනනය කරන ආකාරය විදහා දක්වයි.

ලංකා බැංකු වාර්ෂික වාර්තාව

ද්විත්ව ප්‍රමාණාත්මකතාව ආමන්ත්‍රණය කිරීම



වාර්තාකරණ රාමුව

අපි සම්පූර්ණයෙන්ම අනුකූලතා මත පදනම් වූ ප්‍රවේශයකින් ඔබ්බට ගොස්, ආයතනික වාර්තාකරණයේ ජාත්‍යන්තරව පිළිගත් හොඳම ක්‍රියාපටිපාටි අනුගමනය කරන්නෙමු. අපගේ වාර්තාකරණ රාමුව, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS), නියාමන මාර්ගෝපදේශ සහ ක්ෂේත්‍රයේ හොඳම ක්‍රියාපටිපාටි මත පදනම්ව ඇති අතර, එය ජාත්‍යන්තර සමෝධානික වාර්තාකරණ රාමුව, ගෝලීය වාර්තාකරණ මූලපිරීම (GRI) සහ තිරසාර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය (SASB) විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රමිතීන්ට ද අනුකූල වේ.

SLFRS තිරසාරභාවය පිළිබඳ ප්‍රමිතීන් හඳුන්වාදීමත් සමඟ SLFRS S1 - තිරසාරභාවය පිළිබඳ මූල්‍ය තොරතුරු සහ SLFRS S2 - දේශගුණික සාධක ආශ්‍රිත හෙළිදරව් කිරීම් යන ප්‍රමිතීන්ට ස්වේච්ඡාවෙන් සම්පූර්ණව අනුගත වී ඇති අතර, පළමු වරට අනුගමනය කරන ආයතන සඳහා වන සහන කාලයන් ද සැලකිල්ලට ගෙන ඇත.

T A

මූල්‍ය වාර්තාකරණය (නියාමන)

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්
- 1988 අංක 30 දරණ බැංකු පනත සහ සංශෝධන
- කොළඹ කොටස් වෙළඳපළ ලැයිස්තුගත කිරීමේ රීතීන් (CSE)
- 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත සහ සංශෝධන
- 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත
- ශ්‍රී ලංකා මහ බැංකුව සහ කොළඹ කොටස් වෙළඳපළ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතා අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් අනාවරණ ප්‍රකාශයට පත් කිරීමේ මඟ පෙන්වීම

T G A

ආයතනික යහපාලනය, අනුකූලතාවය සහ අවදානම් කළමනාකරණ වාර්තාකරණය (නියාමන)

- 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධන
- කොළඹ කොටස් වෙළඳපළ ලැයිස්තුගත කිරීමේ රීති අංක 9
- 2024 අංක 05 දරණ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු සඳහා ආයතනික යහපාලනය පිළිබඳ බැංකු පනත් විධිවිධාන
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිචය සඳහා වූ ආචාරධර්ම සංග්‍රහය (2023)
- 2016 අංක 01 දරණ බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ බැංකු පනතේ විධිවිධාන සහ එහි සංශෝධන

T

සමෝධානික වාර්තාකරණය (ස්වේච්ඡා)

- ජාත්‍යන්තර සමෝධානික වාර්තාකරණ කවුන්සිලයේ (IIRC) ජාත්‍යන්තර වාර්තාකරණ රාමුව <IR>
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද සමෝධානික වාර්තාකරණය සඳහා මාර්ගෝපදේශය

T A S

තිරසාර වාර්තාකරණය (විශේෂයෙන් සඳහන් කර නොමැති නම් ස්වේච්ඡාවෙන්)

- ගෝලීය වාර්තාකරණ මූලපිරීම (GRI) ගෝලීය තිරසාර ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද ප්‍රමිතීන් (GSSB)
- බලපත්‍රලාභී බැංකුවල තිරසාර මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ 2022 අංක 05 දරණ බැංකු පනත් විධිවිධාන (නියාමන)
- SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීමේ ප්‍රමිතීන් - SLFRS S1 සහ S2
- එක්සත් ජාතීන්ගේ (UN) තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs)
- IFRS පදනමේ තිරසාර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය (SASB) විසින් ප්‍රකාශයට පත් කරන ලද වාණිජ බැංකු සඳහා ප්‍රමිති
- හරිතාගාර වායු විමෝචනය සහ ඉවත් කිරීම් ප්‍රමාණනය කිරීම සහ වාර්තා කිරීම සඳහා සංවිධාන මට්ටමින් මඟ පෙන්වීම සහිත ISO 14064-1:2018 පිරිවිතර
- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය මූලික කොටගත් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ වාර්තාකරණ රාමුව
- හරිතාගාර වායු ආකෘතිය ආයතනික ගිණුම්කරණය සහ වාර්තාකරණ ප්‍රමිතිය (නියාමන)

මෙම වාර්තාව පිළිබඳව

විනිවිදභාවය, වගවීම, යහපාලනය, හා තිරසාරභාවය (TAGS) වෙත අනුගත වීම

මහජන විශ්වාසය ආරක්ෂා කරමින්, සදාචාරාත්මක භාරකාරත්වය සහතික කරමින් සහ සියලුම පාර්ශ්වකරුවන් සඳහා තිරසාර වටිනාකමක් ලබා දෙමින්, විනිවිදභාවය, වගවීම, යහපාලනය සහ තිරසාරභාවය බැංකුවේ සෑම තීරණයකටම මඟ පෙන්වයි.

විනිවිදභාවය


පෙන්නුම් කිරීම:

- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්තාකරණයේ හොඳම පිළිවෙත් අනිවාර්යයෙන් සහ ස්වේච්ඡාවෙන් අනුගමනය කිරීම
- ස්වාධීන බාහිර පාර්ශ්වයකින් ලබා ගන්නා සහතිකය
- ජාත්‍යන්තරව පිළිගත් වාර්තාකරණ ප්‍රමිතීන් සමඟ පෙළගැස්වීම
- පැහැදිලි සහ කාලෝචිත තොරතුරු හෙළිදරව් කිරීම
- ස්ථාවර ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි

වගවීම

පෙන්නුම් කිරීම:

- සමෝධානික වාර්තාවේ අන්තර්ගතය සඳහා වගකීම
- මූල්‍ය වාර්තාකරණය සහ අභ්‍යන්තර පාලනයන් සඳහා වගවීම
- අවදානම් කළමනාකරණය සහ ප්‍රාග්ධන ප්‍රමාණවත් බව අධීක්ෂණය කිරීම
- වාර්ෂික වාර්තාව තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ සභාපතිවරයාගේ ප්‍රකාශයේ පිළිබිඹු වන භාරකාරත්වය



යහපාලනය

පෙන්නුම් කිරීම:

- ආයතනික යහපාලනය සහ නියාමන උපදෙස් පිළිබඳ හොඳම පරිචයන් සංග්‍රහයට අනුකූල වීම.
- ව්‍යුහගත අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු අධීක්ෂණය
- සදාචාරාත්මක සංස්කෘතිය සහ නායකත්වය ප්‍රවර්ධනය කිරීම
- අවදානම්, යහපාලනය, අනුකූලතාවය සහ පාලනය යන අංශ අඛණ්ඩව ශක්තිමත් කිරීම

තිරසාරභාවය

පෙන්නුම් කිරීම:

- ව්‍යාපාර උපායමාර්ග සහ වාර්තාකරණයට තිරසාරභාවය පිළිබඳ සලකා බැලීම් ඒකාබද්ධ කිරීම
- තිරසාරභාවය, යහපාලන ව්‍යුහයට අන්තර්ගත කිරීම
- ගෝලීය තිරසාරභාවය පිළිබඳ ප්‍රමිතීන්ට අනුකූල වීම
- වගකීම් සහගත බැංකුකරණය, සමාජ බලපෑම සහ පාරිසරික කළමනාකරණය ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති සහ භාවිතයන්

පූර්ව ආරක්ෂණ මූලධර්මය

බැංකුවේ ප්‍රධාන ව්‍යාපාර මෙහෙයුම් තුළට තිරසාර බව අනුගත කරමින් පූර්ව ආරක්ෂණ මූලධර්මය සඳහා මූලික ප්‍රවේශයක් ලබාදී ඇත. පිටු 153 සිට පිටු 160 දක්වා ඇති තිරසාර මූල්‍යකරණය සඳහා බැංකුව දරණ ප්‍රයත්නයන්, මෙහෙයුම්වල ඇති විය හැකි ඍණාත්මක බලපෑම් අවම කිරීමට පමණක් නොව, පරිසරයට සහ පාර්ශ්වකරුවන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාවට විල්ල වන දේශීය හා ගෝලීය අභියෝගවලට කල්තියා ආමන්ත්‍රණය කිරීමට සවිස්තරාත්මක ක්‍රියාමාර්ග ගෙන ඇත.

ඒකාබද්ධ සහතිකය

GRI 2-4,5

කළමනාකරණය, අභ්‍යන්තර විගණනය සහ බාහිර සහතික සපයන්නන්ගේ අධීක්ෂණයේ චිකතුවක් හරහා අපගේ මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු දෙකෙහිම අඛණ්ඩතාව සහතික කිරීම අපගේ අරමුණයි. මෙම ඒකාබද්ධ සහතික ආකෘතිය හරහා, අපි ශක්තිමත් සදාචාරාත්මක සන්දර්භයක් සහ අනුකූලතාව සහතික කිරීම සඳහා වූ යාන්ත්‍රණයන් මනාව තහවුරු කිරීමේ අභිලාෂයෙන් කළමනාකරණය, අභ්‍යන්තර විගණනය සහ බාහිර සහතික සපයන්නන්ගෙන් ලබාගත් සහතිකයන් උපයෝගී කරගන්නෙමු.

ජාතික විගණන කාර්යාලය

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා බාහිර පාර්ශ්වයකින් ලබා ගන්නා සහතිකය.

විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණන කාර්යයන්

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලීන් සහ අභ්‍යන්තර පාලනයන්හි සඵලතාවය සහතික කිරීම සඳහා වගකීම දරයි.

ආයතනික කළමනාකරණ කණ්ඩායම

වාර්තාව සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වග කියනු ලබයි.

මෙම වාර්තාව සකස් කර ඇත්තේ නායකත්ව කණ්ඩායමේ උපදෙස්, අභ්‍යන්තර සහ වෙනත් අදාළ බාහිර තොරතුරු සමඟිනි.

වාර්තාවේ ප්‍රකාශයට පත් කර ඇති තිරසාරභාවය පිළිබඳ තොරතුරු අර්නස්ට් ඇන්ඩ් යන්ග් ආයතනය විසින් බාහිරව සහතික කර ඇත. පසුගිය වසරේ ප්‍රකාශයට පත් කරන ලද කිසිඳු ප්‍රධාන මූල්‍ය නොවන තොරතුරුවල නැවත ප්‍රකාශයන් නොමැත.

ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශය

සමූහය සම්බන්ධයෙන් යම් ඉදිරි දැක්මක් සහිත ප්‍රකාශ, අනාගත කාර්යසාධනය සහ අපේක්ෂාවන් මෙම වාර්තාවට ඇතුළත් විය හැකිය. මෙහි සඳහන් ප්‍රකාශයන් අනාගත ප්‍රතිඵල ලෙස හෝ අනාගත වගවීම් ලෙස සැලකිය නොහැකිය. නැගී එන අවදානම්, අනාගත සිදුවීම්, වෙනස් වන තත්ත්වයන් සහ පුරෝකථන කල නොහැකි සහ බැංකුවේ පාලනයෙන් බැහැර අනෙකුත් වැදගත් සාධක මඟින් ඒවාට බලපෑම් කළ හැකිය. මෙම වාර්තාවේ අනාවරණය කර ඇති අපගේ වර්තමාන අපේක්ෂාවන්ට වඩා සැබෑ ප්‍රතිඵල වෙනස් වීමට මෙම සිදුවීම් හේතු විය හැක.

අපගේ සමෝධානික වාර්තාකරණ ගමන් මඟ


2012 වසරේ සිට, බැංකුව සමෝධානික වාර්තාකරණ ගමන ක්‍රමානුකූලව ඉදිරියට ගෙන ගොස් ඇති අතර, එහි උපායමාර්ග සහ මෙහෙයුම් තුළට සමෝධානික චින්තනය ඇතුළත් කර ඇත. ශ්‍රී ලංකාවේ විශාලතම සහ වඩාත්ම විශ්වාසදායක බැංකුව ලෙස, වටිනාකම් නිර්මාණය පිළිබඳ පුළුල් චිත්‍රයක් ඉදිරිපත් කිරීම සඳහා සාම්ප්‍රදායික මූල්‍ය වාර්තාකරණයෙන් ඔබ්බට යාමේ වැදගත්කම, බැංකුව හඳුනාගෙන ඇත.

වසර ගණනාවක් පුරා, තිරසාර ප්‍රතිඵල ලබා ගැනීම සඳහා එහි ප්‍රාග්ධන අන්තර්ක්‍රියා කරන ආකාරය වඩා හොඳින් ප්‍රකාශ කිරීම සඳහා බැංකුව එහි වාර්තාකරණ පිළිවෙත් යාවත්කාලීන කර ඇත. මෙම විකාශනය, කාර්යසාධනය හා අරමුණ පිළිබිඹු කිරීම පමණක් නොව, බැංකුවේ ක්‍රියාකාරකම් ගනුදෙනුකරුවන්ට, ප්‍රජාවන්ට, ජාතික ආර්ථිකයට සහ අනාගත පරම්පරාවන්ට දායක වන ආකාරය පෙන්නුම් කිරීමට ගත් උත්සාහයකි.

මෙම සමෝධානික ප්‍රවේශය තුළින්, ලංකා බැංකුව සිය වටිනාකම් නිර්මාණයේ ගමන පිළිබඳ විනිවිදභාවයෙන් යුතු විස්තරයක් පාර්ශ්වකරුවන් වෙත අඛණ්ඩව ඉදිරිපත් කරයි. එමඟින් එහි ඔරොත්තු දීමේ හැකියාව, බහුමාන ශක්තිය සහ ජාතික ප්‍රගතිය සඳහා ඇති අඛණ්ඩ කැපවීම පැහැදිලි වේ. සමෝධානික චින්තනයේ සංකල්පය අනුගමනය කිරීම තුළින්, කෙටි, මධ්‍ය හා දිගුකාලීන ප්‍රතිඵල අතර සමතුලිතතාවයක් පවත්වා ගැනීමට අපට උපකාරී වන මානසිකත්වයක් ප්‍රවර්ධනය වේ. එය කාලයත් සමඟ තිරසාර ලෙස වටිනාකම් නිර්මාණය කිරීමේ අපගේ හැකියාවට මූලික වන අතර, තීරණ ගැනීම සඳහා පුළුල් හා උපායමාර්ගික ප්‍රවේශයක් ද දිරිගන්වයි.

ප්‍රධාන වශයෙන් පාර්ශ්වකරුවන් සඳහා ඉදිරිපත් කරනු ලබන මෙම වාර්තාව, නිරන්තරයෙන් වෙනස් වන මෙහෙයුම් සන්දර්භයක් තුළ බැංකුවේ දැක්ම, උපායමාර්ග, වටිනාකම් නිර්මාණය සහ පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධතාවය කෙසේ හැඩගස්වා මෙහෙයවන්නේද යන්න ප්‍රදර්ශනය කරයි. බැංකුවේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක ප්‍රතිඵලවලට අමතරව, මෙම වාර්තාව බැංකුවේ අනාගත දැක්ම සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීමේ හැකියාව පිළිබඳ සහතිකයක් ද සපයයි.

සමෝධානික වාර්තාවේ ප්‍රධාන විශේෂාංග



මෙම වාර්තාවේ නවෝත්තාවයන්

මෙම වසරේදී, වැඩි අවධානයක් සහ අනාගත දිශානතියක් සමඟ අපගේ වාර්තාකරණය ශක්තිමත් ලෙස වැඩිදියුණු කර ඇත.

1 විනිවිදභාවය, වගවීම, යහපාලනය සහ තිරසාරත්වය වාර්තාකරණ රාමුවට ඇතුළත් කිරීම තුළින් සමෝධානික වාර්තාකරණය තවදුරටත් ශක්තිමත් කරන ලදී.

2 SLFRS S1 සහ S2 පිළිබඳ ස්වේච්ඡා හෙළිදරව් කිරීම් සහ තිරසාර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලයේ ප්‍රමිති (SASB) අවශ්‍යතා අනුකූලතාවය ඇතුළත් කරමින් සමෝධානික වාර්තාකරණ රාමුව වැඩිදියුණු කර ඇත.

3 බැංකුව තිරසාර වටිනාකම් නිර්මාණයට බලපාන, නිරන්තරයෙන් වෙනස්වන ආර්ථික, පාරිසරික, සමාජීය සහ යහපාලන ගැටලු ප්‍රමුඛතාවයට ගැනීම සඳහා ප්‍රමාණාත්මකතා තක්සේරු කිරීමක් සිදුකරමින් ප්‍රධාන විෂය කරුණු සඳහා වැඩි අවධානයක් යොමු කර ඇත.

4 කෙටි, මධ්‍ය හා දිගුකාලීන ලෙස නිශ්චිත කාල සීමාවන් අනුව ඉදිරි උපායමාර්ගයන් පැහැදිලිව සකස් කර ඇත. මෙම ව්‍යුහගත කාල රාමුව, වත්මන් ක්‍රියාමාර්ග දීර්ඝකාලීන වටිනාකම් නිර්මාණය සමඟ සවිඥානිකව සම්බන්ධ කර ඇති ආකාරය පෙන්වා දෙයි.

5 අවදානම් කළමනාකරණය හා යහපාලන වාර්තාකරණය වැඩිදියුණු කරමින්, අවදානම් අවම කිරීමේ උපායමාර්ග සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය පිළිබඳ වැඩි විනිවිදභාවයක් ලබාදී ඇත.

6 තිරසාරභාවය වාර්තාකරණය සහ සමෝධානික වාර්තාකරණය පිළිබඳ වැඩිදියුණු කළ සහතිකය.

මෙම වාර්තාව පිළිබඳව

පරිශීලන සලකුණු

පාර්ශ්වකරුවන්



සය වැදෑරුම් ප්‍රාග්ධනය



උපායමාර්ගික ප්‍රමුඛතා



අවදානම් කාණ්ඩයන්

- R1 ණය අවදානම
- R2 වෙළඳපළ අවදානම
- R3 මෙහෙයුම් අවදානම
- R4 ද්‍රවශීලතා අවදානම

ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා

- M1 ආර්ථික කාර්යසාධනය
- M2 ඩිජිටල්කරණය සහ පරිවර්තනය
- M3 ගනුදෙනුකාර අත්දැකීම් සහ අලෙවිකරණය
- M4 ව්‍යාපාර ආචාරධර්ම සහ නියාමන අනුකූලතාව
- M5 සේවක සබැඳියාවන්
- M6 වගකීම් සහගත මූල්‍යකරණය
- M7 දේශගුණික විපර්යාස සහ හරිතාගාර වායු විමෝචනය
- M8 ආයතනික හවුල්කාරිත්වයන් සහ සහයෝගීතා
- M9 වගකීම් සහගත සම්පත්කරණය සහ කළමනාකරණය
- M10 ප්‍රජා සංවර්ධනය සහ සහභාගීත්වය

2025 වාර්ෂික වාර්තාවේ සන්නිවේදනය හා ප්‍රවේශය

ප්‍රතිචාර

GRI 2-3

කරුණාකර මෙම වාර්තාව පිළිබඳ යෝජනා සහ අදහස් **cfo@boc.lk** වෙත යොමු කරන්න.

කොළඹ කොටස් හුවමාරුවේ වෙබ් අඩවිය

ලංකා බැංකු වෙබ් අඩවිය

සභාපතිතුමාගේ සහ මහා කළමනාකාරතුමාගේ පණිවිඩවල සංක්ෂිප්ත ශ්‍රව්‍ය අනුවාදය (ඉංග්‍රීසි භාෂාවෙන්)

2025 වාර්ෂික වාර්තාවේ විශේෂ අවස්ථා අන්තර්ගත වීඩියෝව

සමෝධානික චින්තනය තුළින් වටිනාකම් නිර්මාණය කිරීම

වීකාබද්ධ චින්තනය අනුගමනය කිරීම මඟින්, කෙටිකාලීන කාර්යසාධනය සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය අතර සමතුලිතතාවය පවත්වා ගනිමින් පුළුල් දෘෂ්ටිකෝණයක් අනුගමනය කිරීමට බැංකුවට හැකියාව ලැබේ. උපායමාර්ග, යහපාලනය, අවදානම් කළමනාකරණය සහ තිරසාරත්වය අතර ඇති සම්බන්ධතා හඳුනාගැනීම මඟින්, බැංකුවේ තීරණ, සංවිධානීය අරමුණු සහ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් සමඟ අනුගත වන බව සහතික කරයි. මෙම ප්‍රවේශය සහයෝගිතාව ශක්තිමත් කරමින්, සම්පත් වෙන්කිරීම වඩාත් කාර්යක්ෂම කරමින්, තිරසාර වටිනාකම් නිර්මාණයට සහාය දක්වයි. එමෙන්ම, ගතික ව්‍යාපාරික පරිසරයකදී බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීමටද එය උපකාරී වේ.

ප්‍රමාණාත්මක වැදගත් කරුණු තීරණය කිරීම

මෙහෙයුම් සන්දර්භය
පිටු 52

පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වීම
පිටු 57

අවදානම් සහ තිරසාර වර්ධනය
පිටු 191

ද්විත්ව ප්‍රමාණාත්මකතාවය:



අපගේ උපායමාර්ග සැකසීම සහ සම්පත් විභජනය

උපායමාර්ගික ප්‍රමුඛතා

සම්පත් විභජනය
පිටු 65


ප්‍රධාන ව්‍යාපාරික අංශ හරහා උපායමාර්ග ක්‍රියාත්මක කිරීම



ශාඛා බැංකුකරණය
පිටු 115



ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය
පිටු 121



ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම්
පිටු 126

අවදානම් කළමනාකරණය, නිසි ආයතනික යහපාලනය සහතික කිරීම සහ තිරසාර බවට අනුගත වීම

අවදානම් කළමනාකරණය

පූර්ව අවදානම් කළමනාකරණය තුළින්, බැංකුව ස්ථාවරත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරන අතරම පාර්ශ්වකරුවන්ගේ වටිනාකම ආරක්ෂා කරයි.

පිටු 191

ආයතනික යහපාලනය

ශක්තිමත් ආයතනික යහපාලන රාමුවක් බැංකුවේ ක්‍රියාවන්ට මඟ පෙන්වන අතර, සදාචාරාත්මක හැසිරීම සහ එහි මූලික වටිනාකම් සමඟ පෙළගැස්වීම ප්‍රවර්ධනය කරයි.

පිටු 162

තිරසාර බව

තිරසාර බව අපගේ මෙහෙයුම් කටයුතු මෙහෙයවන අතර එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (UN SDGs) සමඟ සමපාත වේ.

පිටු 75

පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් ඉටු කිරීම

සියලුම පාර්ශ්වකරුවන් අතර වටිනාකම් නිර්මාණය, විශ්වාසය සහ වගකීම් සහගත වර්ධනය සහතික කිරීම.

පිටු 72

ලංකා බැංකුව පිළිබඳව සංක්ෂිප්තව

ජාතික ප්‍රගතියට ශක්තියක් වන බහුමාන බලවේගයක්

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වාණිජ බැංකුව ලෙස, ලංකා බැංකුව ජාතියේ මහා පහන් ටැඹ ලෙස ක්‍රියාකරමින්, ක්ෂේත්‍රයේ වත්කම්, ණය සහ අත්තිකාරම් සහ තැන්පතු වල විශාලතම වෙළඳපළ කොටස හිමිකරගෙන සිටී. දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකුවක් (D-SIB) ලෙස පිළිගැනෙන ලංකා බැංකුවේ කාර්යභාරය සාම්ප්‍රදායික බැංකුකරණයෙන් ඔබ්බට ගොස් ජාතික වැදගත්කමක් ඇති අවශ්‍යතා ඉටු කිරීම දක්වා විහිදේ.

වසර 86 කට වැඩි විශිෂ්ට උරුමයක් සහිත ලංකා බැංකුව, මිලියන 16.0 කට අධික ගනුදෙනුකරුවන්ට සේවය ලබාදෙමින් අපගේ ජාතික, සමාජීය හා ආර්ථික ව්‍යුහය සමඟ තදින් බැඳී ඇත. පුද්ගලයන්ගේ සිට විශාල සමාගම් සහ ආයතන දක්වා, සමාජයේ විවිධ කොටස්වල සැබෑ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දක්වන, ගනුදෙනුකාර කේන්ද්‍රීය බැංකු විසඳුම් ලබාදීම ගැන අපි ආඩම්බර වෙමු. ශක්තිමත් ප්‍රාග්ධන පදනමක්, නව ඩිජිටල් හැකියාවන් සහ කැපවූ සේවක කණ්ඩායමක සහාය ඇතිව, බැංකුව ජාතියේ ආර්ථික ප්‍රගතියට සහාය වන අතරම සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමට කැපවී සිටින්නෙමු.



ශ්‍රී ලංකාවේ අංක එකේ

No.1

වෙළඳ සන්නාමය

ස්ථාවරත්වය සහ වර්ධනය පදනම් කරගත් සුවිශේෂී ශක්තීන්

වත්කම්:
රු. ට්‍රිලියන 5.5

තැන්පතු:
රු. ට්‍රිලියන 4.4

දළ ණය සහ අත්තිකාරම්:
රු. ට්‍රිලියන 2.7

ස්කන්ධය:
රු. බිලියන 365.8

බදු පෙර ලාභය:
රු. බිලියන 120.8

ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන:
2,413

ගනුදෙනුකාර විනිවිද යාම්:
76%

සේවක සංඛ්‍යාව:
8,912

සන්නාම වටිනාකම්:
රු. බිලියන 57.4

ලොව ඉහළම බැංකු සන්නාම 500 අතරට පිවිසි ශ්‍රී ලංකාවේ පළමු සහ එකම බැංකුව

ගෝලීය ශ්‍රේණිගත කිරීම්:
වසර 16 ක් පුරා ලෝකයේ ඉහළම බැංකු 1,000 අතරට එක්වූ එකම ශ්‍රී ලාංකික බැංකුව

ෆිච් ණය ශ්‍රේණිගත කිරීම්:
දේශීය: AA-(lka)/Stable
ජාත්‍යන්තර: CCC+



01 මූල්‍ය ශක්තිය සහ ස්ථාවරත්වය

රු. ට්‍රිලියන 5.5 ක මුළු වත්කම්, 16.9% ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව සහ රු. බිලියන 120.8 ක බදු පෙර ලාභයක් සහිතව, ශ්‍රී ලංකා ආර්ථිකය තුළ විශ්වාසය ගොඩනඟාගත් මූල්‍ය ආයතනයකි.



02 විවිධාංගීකරණය වූ නිෂ්පාදන සහ සේවාදායක කළඹ

ණය දීම, ආයෝජන, වෙළඳ මූල්‍ය සහ භාණ්ඩාගාර විසඳුම් වැනි පුළුල් ජාලයක් හරහා වෙළඳ ගනුදෙනුකරුවන් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සිට ආයතනික, රාජ්‍ය ආයතන සහ විශාල සමූහ ව්‍යාපාර දක්වා සම්පූර්ණ ආර්ථික කටයුතු රාශියකට සේවා සැපයීම.



03 රට පුරා ළඟා විය හැකි ඇතුළත්කරණය

ග්‍රාමීය ප්‍රජාවන්ට, කාන්තා ව්‍යවසායකයින්ට සහ නැගී එන ව්‍යාපාරික අංශ වලට මූල්‍ය සවිබල ගැන්වීම් පුළුල් කරමින්, දේශීය ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන 2,400 කට අධික සංඛ්‍යාවක් හරහා මිලියන 16 කට අධික ගනුදෙනුකරුවන් සම්බන්ධ කරන රාජ්‍ය බැංකුවකි

විදේශීය මෙහෙයුම්, ශක්තිමත් නියෝජිත බැංකු සබඳතා සහ ප්‍රේෂණ වෙළඳපළේ ඉහළම වෙළඳපළ කොටස සඳහා පහසුකම් සලසමින්, ශ්‍රී ලංකාව, ජාත්‍යන්තරය සමඟ සම්බන්ධ කරමින් ශ්‍රී ලාංකික ජන ජීවිතයට සහ විදේශ විනිමය ප්‍රවාහයන් ශක්තිමත් කිරීමට දායක විය.



04 ඩිජිටල් නවෝත්පාදන පරිවර්තන ප්‍රවේශය

ඒකාබද්ධ ඩිජිටල් ගෙවීම් පද්ධති මගින් බලගැන්වූ, 23% ක වර්ධනයක් සමඟ 88% කට අධික, බාධාවකින් තොරව ඩිජිටල් බැංකු ගනුදෙනු සක්‍රීය කිරීමට හැකියාව ලබා දී ඇත.



05 තිරසාර බව සහ සමාජ වගකීම

ශ්‍රී ලංකාව තුළ මෙතෙක් නිකුත් කළ විශාලතම තිරසාරත්ව බැඳුම්කර නිකුතුව වන රු. බිලියන 20.0 ක බැඳුම්කර නිකුත් කරමින්, පුනර්ජනනීය බලශක්තිය, අපද්‍රව්‍ය කළමනාකරණය සහ MSME මූල්‍යකරණයට සහාය ලබා දී ජාතික සංවර්ධන ප්‍රමුඛතා ශක්තිමත් කිරීමට දායක විය.




06 විශ්වාසය, උරුමය සහ ජාතික බලපෑම

වසර 86 ක විශ්වාසනීය සේවාවක් මත ගොඩනැඟී, දේශීය හා ජාත්‍යන්තර ඇගයීම් රැසකින් පිළිගැනීමට ලක්ව ඇති අතර, ජාතික සංවර්ධනයට සහ ප්‍රජා අභිවෘද්ධියට අර්ථවත් ලෙස දායක වී ඇත.

ලංකා බැංකුව පිළිබඳව සංක්ෂිප්තව

සමූහයේ ව්‍යුහය සහ ප්‍රධාන ව්‍යාපාරික අංශ GRI 2-6






ශාඛා බැංකුකරණය

සුළු ව්‍යාපාර, ව්‍යවසායකයින් සහ පුද්ගලයින්ට සහාය වීම සඳහා නිර්මාණය කර ඇති ණය දීම, තැන්පතු, ගෙවීම් සේවා සහ ගනුදෙනු බැංකුකරණය ඇතුළු පුළුල් පරාසයක මූල්‍ය සේවා අපි සපයන්නෙමු. මහා පරිමාණ ගනුදෙනුකරුවන්ගේ සිට ඉහළ ශුද්ධ වටිනාකමක් ඇති පිරිස් දක්වා පුළුල් පරාසයක ගනුදෙනුකරුවන්ට සේවය කරන මෙම පිරිනැමීම් ප්‍රවේශය, පහසුව, සහ බාධාවකින් තොරව මූල්‍ය කළමනාකරණය සහතික කිරීම සඳහා නිර්මාණය කර ඇති අතර, මූල්‍ය ගමන්මගේ සෑම අදියරකදීම ඔවුන්ව සවිබල ගන්වයි.



ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය

ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය ආයතනික අරමුදල් සැපයීම, තැන්පතු සේවා, ව්‍යාපෘති මූල්‍යකරණය සහ වෙළඳ සේවාවන් සපයයි. පෞද්ගලික, රාජ්‍ය සහ අක්වෙරළ යන අංශයන්හි, සුළු, මධ්‍යම සහ මහා පරිමාණ සංස්ථා සඳහා මෙන්ම ආයතනික සේවාදායකයින් සඳහා, ව්‍යාපාර ව්‍යාප්තියට සහාය වීම, එතෙර ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම සහ මූල්‍ය කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම සඳහා ව්‍යුහගත කර ඇති සේවාවන් හරහා ගනුදෙනුකරුවන්ට විධාත් සංකීර්ණ හා ගතික වෙළඳපළ පරිසරයන්හි කටයුතු කිරීමට අවශ්‍ය බැංකුකරණ සහාය ලබා දේ.



ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම්

ජාත්‍යන්තර මෙහෙයුම් මගින් විදේශ මුදල් ගනුදෙනු සහ එතෙර මූල්‍ය සේවා අධීක්ෂණය කරනු ලබන අතර, ගෝලීය වෙළඳාම, ප්‍රේෂණ සහ ජාත්‍යන්තර බැංකු අවශ්‍යතා සඳහා බාධාවකින් තොරව පහසුකම් සැලසීම සහතික කෙරේ. ද්‍රවශීලතාවය, අරමුදල් සැපයීම සහ මූල්‍ය තත්ත්ව ප්‍රශස්තකරණය කළමනාකරණය කිරීමේදී භාණ්ඩාගාරය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. දිගුකාලීන මූල්‍ය අරමුණු සමඟ සමපාත වන උපායමාර්ගික ආයෝජන ක්‍රියාකාරකම් හරහා ආයෝජන අංශය ආයෝජන කළඹේ වර්ධනය මෙහෙයවයි. අපගේ විදේශීය මෙහෙයුම් සමූහය අපගේ ජාත්‍යන්තර ශාඛා ජාලය කළමනාකරණය කර ශක්තිමත් කරන අතර ප්‍රධාන ජාත්‍යන්තර වෙළඳපළවල් හරහා ගනුදෙනුකරුවන්ට ඵලදායී ලෙස සේවය කිරීම සඳහා ගෝලීය පැවැත්ම ශක්තිමත් කරයි.



අපගේ නිෂ්පාදන ගවේෂණය කිරීමට QR කේතය පරිලෝකනය කරන්න www.boc.lk

විවිධාංගීකරණය වූ නිෂ්පාදන කළඹ

ලංකා බැංකුවේ විවිධාංගීකරණය වූ නිෂ්පාදන කළඹ, පුළුල් ගනුදෙනුකාර පදනමක විකාශනය වන මූල්‍ය අවශ්‍යතා සපුරාලමින් ශ්‍රී ලංකාවේ බහු-අංශ ආර්ථික වර්ධනයට සහාය වීම සඳහා විශේෂයෙන් සකස් කරන ලද උපායමාර්ගයක් පිළිබිඹු කරයි. සාම්ප්‍රදායික බැංකු සීමාවන් ඉක්මවා යමින්, ජාතික ප්‍රගතියට සාමූහිකව සහාය වන පුද්ගලයින්, ව්‍යවසායකයින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, සංස්ථා, රාජ්‍ය ආයතන සහ මහා පරිමාණ සමූහ ව්‍යාපාර සඳහා සේවය කිරීම සඳහා බැංකුව සිය පිරිනැමීම් පුළුල් කිරීම අඛණ්ඩව සිදු කරයි.

තම නිෂ්පාදන අඛණ්ඩව පුළුල් කිරීම සහ යාවත්කාලීන කිරීම මගින්, බැංකුව සිය විසඳුම් අදාළ, තරඟකාරී සහ නැගී එන වෙළඳපල අවස්ථාවන්ට ප්‍රතිචාරාත්මකව පවතින බව සහතික කරයි. මෙම උපායමාර්ගික විවිධාංගීකරණය, තිරසාර ආර්ථික හා සමාජීය බලපෑමක් ජනනය කරමින්, සියලු අංශ හරහා ගනුදෙනුකාර සබඳතා ශක්තිමත් කරන අතර, සියලු දෙනා ඇතුළත් ජාතික වර්ධනය සඳහා උත්ප්‍රේරකයක් ලෙස ලංකා බැංකුවේ භූමිකාව ශක්තිමත් කරයි.

අපගේ නිෂ්පාදන සහ සේවා

අරමුණ		පුද්ගලයින්	SME	සංස්ථා	රාජ්‍ය ආයතන
අතිරික්ත අරමුදල්	කාලීන තැන්පතු, ආයෝජන උපකරණ සහ ණයකර	✓	✓	✓	✓
	ඉතුරුම් නිෂ්පාදන	✓	✓	✓	✓
ආයෝජනය සහ ඉතිරි කිරීම	දෛනික ගනුදෙනු සඳහා ජංගම ගිණුම්	✓	✓	✓	✓
	මුදල් කළමනාකරණ විසඳුම්	✓	✓	✓	✓
	ආයෝජන සහ කළඹ කළමනාකරණ සේවා	✓	✓	✓	✓
ණය පහසුකම්	පුද්ගලික ණය	✓			
	නිවාස ණය	✓			
	වෙළඳ මූල්‍ය	✓	✓	✓	✓
	අයිරා	✓	✓	✓	✓
	කල්බදු සේවා	✓	✓	✓	✓
	ණය යෝජනා ක්‍රම	✓	✓	✓	
	උකස් කිරීම (රන් ණය)	✓			
	සුළු හා මධ්‍ය පරිමාණ (SME) සහ සංවර්ධන ණය	✓	✓		
	ව්‍යාපෘති මූල්‍යකරණය ඇතුළු වාණිජ ණය		✓	✓	✓
	කාලීන ණය	✓	✓	✓	✓
	සමූහ ණය			✓	✓
ගෙවීම් විසඳුම්	හරපත්, ණයපත් සහ සංචාරක කාඩ්පත්	✓	✓	✓	
	ඩිජිටල් බැංකු පහසුකම්	✓	✓	✓	✓
	ජාත්‍යන්තර ගෙවීම් විසඳුම්	✓	✓	✓	✓
ජාත්‍යන්තර සේවා	අභ්‍යන්තර සහ බාහිර ප්‍රේෂණ	✓	✓	✓	✓
	නියෝජිත බැංකු සේවා, විදේශ මුදල් සහ වෙළඳ සේවා	✓	✓	✓	✓

පුද්ගලයින් | SME සුළු, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ | සංස්ථා | GOV රාජ්‍ය ආයතන

අපගේ ඩිජිටල් සේවාවන්



Flex | SMART ONLINE BANKING | BOC SMART BUSINESS | SMART PAY | BOC META banking | BOC SR

ලංකා බැංකුව පිළිබඳව සංක්ෂිප්තව


දේශීය සහ ගෝලීය පියසටහන්

ලංකා බැංකුව, ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුව ලෙස සිය නායකත්වය පවත්වා ගෙන යන අතර සැලකිය යුතු වත්කම්, තැන්පතු සහ ණය මඟින් එය ශක්තිමත් වේ. අංගසම්පූර්ණ ශාඛා, ජංගම ශාඛා, සුළු හා මධ්‍ය පරිමාණ මධ්‍යස්ථාන, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM), මුදල් චක්‍රීයකරණ යන්ත්‍ර (CRM) සහ BOC Connect නියෝජිතයන් ඇතුළුව 2,400 කට අධික ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථානවලින් සමන්විත විහි පුළුල් ජාලය, රටේ සෑම පළාතකම පුද්ගලයින්ට සහ ව්‍යාපාරවලට මූල්‍ය සේවා සඳහා ප්‍රවේශ විය හැකි බව සහතික කරන අතර, මූල්‍ය ඇතුළත්කරණය සඳහා බැංකුවේ කැපවීම ශක්තිමත් කරයි.

ශ්‍රී ලංකාවෙන් එතෙර, බැංකු දේශසීමා හරහා ප්‍රජාවන්ට සහ ව්‍යාපාරවලට සේවය කරමින් ශක්තිමත් ජාත්‍යන්තර පැවැත්මක් ස්ථාපිත කර ඇත. ඒ අනුව ඉන්දියාව, මාලදිවයින සහ සීෂෙල්ස්හි ශාඛා ද, හුඬුමාලේහි සීමිත සේවා ශාඛාවක් ද, එක්සත් රාජධානියේ ලන්ඩන්හි පූර්ණ හිමිකාරිත්වය සහිත අනුබද්ධිත ආයතනයක් ද පවත්වාගෙන මෙම ජාත්‍යන්තර මෙහෙයුම් විදේශගත ශ්‍රී ලාංකික ගනුදෙනුකරුවන්ට සහාය වීම පමණක් නොව, බැංකුව ගෝලීය මූල්‍ය වෙළඳපළ සමඟ සම්බන්ධ කරමින්, දේශීය වර්ධනය සහ ජාත්‍යන්තර අවස්ථා අතර සම්බන්ධක පාලමක් ලෙස විහි භූමිකාව තවදුරටත් ශක්තිමත් කරයි.




විදේශීය ව්‍යාප්තිය



ශාඛා	සීමිත සේවා ශාඛා	ජංගම ශාඛා	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සේවා මධ්‍යස්ථාන	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර/ මුදල් චක්‍රීකරණ යන්ත්‍ර	BOC Connect නියෝජිතයන්	විදේශ රටවල නියෝජිත බැංකු	විදේශ විනිමය හුවමාරු ආයතන
584	72	10	15	1,506	222	710	95

දේශීය ව්‍යාප්තිය



සුවිශේෂී සංධිස්ථාන



1939

ලංකා බැංකු ආඥා පනත යටතේ ජාතියේ පළමු දේශීය බැංකුව ලෙස සංස්ථාගත කරන ලදී.

1941

පළමු ශාඛාව මහනුවරදී විවෘත කරන ලදී.

1949

බැංකුවේ පළමු විදේශ ශාඛාව ලන්ඩනයේ ස්ථාපිත කිරීම.

1961

1961 අංක 65 දරණ මුදල් පනත යටතේ ජනසතු කරන ලදී.

1973

කෘෂිකාර්මික ණය දීම ශක්තිමත් කිරීම සඳහා කෘෂිකාර්මික සේවා මධ්‍යස්ථාන හරහා උප ශාඛා ජාලය පුළුල් කරන ලදී.

1979

අක්වෙරළ මෙහෙයුම් සඳහා විදේශ මුදල් බැංකු ඒකකයක් ස්ථාපිත කරන ලදී.

1981

මාලදිවයිනේ මාලේහි අංග සම්පූර්ණ ශාඛාවක් විවෘත කරන ලදී.

1989

VISA ඉන්ටනැෂනල් සමඟ සහයෝගයෙන් ශ්‍රී ලංකාවේ පළමු ණය කාඩ්පත හඳුන්වා දෙන ලදී.

1995

ඉන්දියාවේ චෙන්නායි හි ශාඛාවක් විවෘත කරන ලදී.

2008

ප්‍රථම වරට ලැයිස්තුගත, යටත්, පස් අවුරුදු, රුපියල් ණයකර නිකුත් කරන ලදී.

2012

සිංගප්පූරු කොටස් වෙළඳපලේ ලැයිස්තුගත කළ ඇමරිකානු ඩොලර් බැඳුම්කර නිකුත් කළ පළමු ශ්‍රී ලාංකික බැංකුව බවට පත්වීම.

2014

75 වන සංවත්සරය සැමරීම සහ අප්‍රිකානු මහද්වීපයට පිවිසීම සහිටුහන් කරමින් සීෂෙල්ස් හි ශාඛාවක් විවෘත කිරීම.

2016

ත්‍රිත්ව ට්‍රිලියන ශේෂ පත්‍රයක් අත්කර ගැනීම.

2017

'B-App' ජංගම බැංකුකරණ යෙදුම දියත් කළ අතර 'Branch on Wheels' යන නව්‍ය ජංගම ශාඛා සංකල්පය හඳුන්වා දුන්නේය.

2018

මහනුවර "සිටි සෙන්ටර්" හිදී "BOC DIGI" ශාඛාව ස්ථාපිත කරන ලද අතර NFC සක්‍රීය ඉලෙක්ට්‍රොනික කාඩ්පත් හඳුන්වා දෙන ලදී.

2019

මාලදිවයිනේ හුළුමාලේහි සිව්වන ජාත්‍යන්තර ශාඛාව විවෘත කරන ලදී.

2020

COVID-19 වසංගතයෙන් බලපෑම් ඇති වූ ව්‍යාපාර සඳහා සහාය වීමේ අරමුණින් ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිසංස්කරණ ඒකකය (BRRU) පිහිටුවන ලදී.

2021

සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් ශක්තිමත් කිරීම සඳහා 'අපනයන කවය' (BOC Export Circle) ආරම්භ කළ අතර, 'BOC Connect' හරහා නියෝජිත බැංකුකරණ සංකල්පය ද හඳුන්වා දෙන ලදී.

2022

ජාත්‍යන්තර ගනුදෙනුකරුවන්ට සහාය වීම සඳහා 'විදේශ කවය' (BOC Foreign Circle) පිහිටුවන ලදී.

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (MSMEs) සඳහා සංවර්ධන පහසුකම් සැලසීම මූලික කොටගෙන 'BOC SME Circle' ආරම්භ කිරීම.

2023

බාසල් III අනුකූල, ස්ථර 2 ලැයිස්තුගත, යටත්, ශක්‍යතා නොමැති වීමකදී ලියා හැරීමේ හැකියාව සහිත නිදහස් කළ හැකි ණයකරයක් නිකුත් කරන ලදී.

2024

බදු ගෙවීමට පෙර ලාභය රු. බිලියන 100.0 ක් සහ සමූහ වත්කම් රු. ට්‍රිලියන 5.0 ක් ඉක්මවා යාම.

2025

'BOC Flex' ජංගම බැංකු යෙදුම හඳුන්වාදීම.

ශ්‍රී ලංකාවේ ප්‍රථම පෙව් හායනයට ලක් වන බැංකු කාඩ්පත නිකුත් කිරීම.

හරිත මූල්‍යකරණය සහ සමාජීය මූලික ණය පහසුකම් සැපයීම පුළුල් කිරීම සඳහා මෙතෙක් නිකුත් කරන ලද විශාලතම තිරසාර බැඳුම්කර නිකුතුව සිදු කිරීම.



කාර්යසාධන විශ්ලේෂාංග

මූල්‍ය කාර්යසාධනය

මූල්‍ය කාර්යසාධනය	බැංකුව			සමූහය		
	2025	2024	වෙනස %	**2025**	2024	වෙනස %
මෙහෙයුම් ප්‍රතිඵල (රු. මිලියන)						
මුළු ආදායම	**548,623**	485,405	13.0	**558,675**	494,922	12.9
ශුද්ධ පොළී ආදායම	**206,936**	167,552	23.5	**211,843**	171,728	23.4
මූල්‍ය සේවා සඳහා බදු පෙර ලාභය	**152,708**	135,300	12.9	**154,068**	136,925	12.5
බදු පෙර ලාභය	**120,827**	106,904	13.0	**121,934**	108,221	12.7
බදු පසු ලාභය	**76,007**	64,387	18.0	**76,471**	65,061	17.5
රජයට දායකත්වය	**89,395**	65,931	35.6	**90,541**	66,969	35.2
මූල්‍ය තත්ත්වය (රු. මිලියන)						
මුළු වත්කම්	**5,467,551**	4,985,139	9.7	**5,567,050**	5,048,671	10.3
දළ ණය සහ අත්තිකාරම්	**2,654,272**	2,436,162	9.0	**2,726,686**	2,482,029	9.9
ගනුදෙනුකරුවන්ගේ තැන්පතු	**4,388,586**	4,208,603	4.3	**4,447,653**	4,245,532	4.8
මුළු වගකීම්	**5,101,751**	4,682,579	9.0	**5,179,071**	4,726,224	9.6
මුළු ස්කන්ධය	**365,800**	302,560	20.9	**387,979**	322,448	20.3
කොටස් පිළිබඳ දත්තයන් (රු.)						
කොටසක ඉපැයුම්	**2,988**	2,575	16.0	**3,011**	2,600	15.8
කොටසක ශුද්ධ වත්කම් වටිනාකම	**14,217**	12,102	17.5	**15,037**	12,852	17.0
කාර්යසාධන අනුපාත (%)						
වත්කම්හි සාමාන්‍යය මත ප්‍රතිලාභය	**2.3**	2.3	-	**2.3**	2.3	-
ස්කන්ධයෙහි සාමාන්‍යය මත ප්‍රතිලාභය	**22.7**	23.2	(0.5)	**21.5**	21.9	(0.4)
පොළී ආන්තිකය	**4.0**	3.6	0.4	**4.0**	3.6	0.4
ආදායමට පිරිවැය	**33.0**	40.1	(7.1)	**34.1**	41.3	(7.2)
තැන්පතු ණය අනුපාතය	**60.5**	57.9	2.6	**61.3**	58.5	2.8
ස්කන්ධය මත ණය	**25.5**	26.8	(1.3)			
හානිකරණ ප්‍රතිපාදන, දළ ණය සහ අත්තිකාරම් වල ප්‍රතිශතයක් ලෙස	**10.6**	10.6	-	**10.4**	10.5	(0.1)
හානිකරණ ණය (අදියර 3)	**5.6**	7.2	(1.6)			
හානිකරණ ණය (අදියර 3) සඳහා ණය හානිකර ප්‍රතිපාදන වෙන් කිරීම්	**57.9**	53.6	4.3			
ව්‍යවස්ථාපිත අනුපාත (%)						
ද්‍රවශීලතා ආවරණ අනුපාතය (රු.) (අවම අවශ්‍යතාව - 100%)	**296.0**	329.0	(33.0)			
ද්‍රවශීලතා ආවරණ අනුපාතය (සියලු මුදල්) (අවම අවශ්‍යතාවය - 100%)	**260.4**	269.6	(9.2)			
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (අවම අවශ්‍යතාවය - 100%)	**156.6**	157.9	(1.3)			
තෝලන අනුපාතය (අවම අවශ්‍යතාවය - 3%)	**4.1**	4.4	(0.3)	**4.3**	4.6	(0.3)
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත (%)						
පොදු ස්කන්ධය ස්ථර 1 ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාව - 8.50%)	**11.4**	12.0	(0.6)	**11.5**	12.2	(0.7)
ස්ථර 1 ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාව - 10.00%)	**12.4**	13.0	(0.6)	**12.4**	13.1	(0.7)
මුළු ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාව - 15.00%)	**16.9**	16.6	0.3	**16.8**	16.7	0.1

වටිනාකම් නිර්මාණයේ සුවිශේෂී අවස්ථා

සියලුම මානයන් හරහා කාර්යසාධනය



බැංකු ක්ෂේත්‍රයේ නායකත්වය
වෙළඳපළ නායකත්වය සහ බලපෑම

	2025	2024	වෙනස
විශාලතම වත්කම් පදනම (රු. ට්‍රිලියන)	5.5	4.9	10%
විශාලතම තැන්පතු පදනම (රු. ට්‍රිලියන)	4.4	4.2	5%
ඉහළම බදු පෙර ලාභය (රු. බිලියන)	120.8	106.9	13%
ඉහළම සන්නාම වටිනාකම (රු. බිලියන)	57.4	50.2	14%

ආර්ථික වටිනාකම් නිර්මාණය
ජාතික සමෘද්ධිය මෙහෙයවීම

	2025	2024	වෙනස
රජයට දායකත්වය (රු. බිලියන)	89.4	65.9	36%
දළ ණය සහ අත්තිකාරම් (රු. බිලියන)	2,654.3	2,436.2	9%
ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ අංශයේ මූල්‍ය කළඹ (රු. බිලියන)	319.9	249.4	28%
සම්පූර්ණයෙන් පුනර්ජීවනය කරන ලද ව්‍යාපාර (රු. බිලියන)	100.8	98.4	2%

ගනුදෙනුකරුවන් සහ ප්‍රවේශය
පුළුල් හා පහසු ප්‍රවේශයක් සමඟ ජාතියට සේවය කිරීම

	2025	2024	වෙනස
ඉලක්ක වෙළඳපළ ආවරණය (%)	76	74	2
ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන (ප්‍රමාණය)	2,413	2,294	119
විදේශීය නියෝජිත බැංකු සබඳතා (ප්‍රමාණය)	805	806	(1)
නව නිෂ්පාදන (ප්‍රමාණය)	10	9	1
පුනර්ජීවනය කරන ලද ගනුදෙනුකරුවන් (ප්‍රමාණය)	233	274	(41)

ඩිජිටල් නාලිකා
නව බැංකු අනාගතයක් වෙත පියනැගීම

	2025	2024	වෙනස
ඩිජිටල් ගනුදෙනු (%)	88	88	-
ඩිජිටල් ගනුදෙනු වර්ධනය (%)	23	31	(8)
ඩිජිටල් සම්බන්ධතා මධ්‍යස්ථාන (ප්‍රමාණය)	1,510	1,503	7
ස්වංක්‍රීය කරන ලද වැඩ ප්‍රවාහ (ප්‍රමාණය)	11	3	8

ප්‍රජා බලගැන්වීම සහ මූල්‍ය ඇතුළත්කරණය
සෑම ශ්‍රී ලාංකිකයෙකුටම අවස්ථා සලසා දීම

	2025	2024	වෙනස
නව ක්ෂුද්‍ර මූල්‍ය ණය (රු. බිලියන)	25.9	17.6	47%
කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ව්‍යාපාර සඳහා නව ක්ෂුද්‍ර මූල්‍ය ණය (රු. බිලියන)	7.2	4.8	50%
නව BOC Connect නියෝජිතයන් (ප්‍රමාණය)	110	35	75
නව BOC මිතුරු සමාජ (ප්‍රමාණය)	212	330	(118)
නව BOC ගම්මාන ව්‍යාපෘති (ප්‍රමාණය)	2	2	-
ප්‍රජා කටයුතු සඳහා ආයෝජනය (රු. මිලියන)	780.5	207.3	277%

මානව ප්‍රාග්ධන ශක්තිය
අපගේ සේවා බලකාය සවිබල ගැන්වීම

	2025	2024	වෙනස
සේවකයින් සඳහා ආයෝජනය කිරීම (රු. බිලියන)	45.7	40.3	13%
පුහුණු සහ සංවර්ධන කටයුතු සඳහා ආයෝජනය (රු. මිලියන)	348.0	374.9	(7%)
රඳවා ගැනීමේ අනුපාතය (%)	97	95	2
උසස්වීම් (ප්‍රමාණය)	431	714	(283)
බඳවා ගැනීම් (ප්‍රමාණය)	952	75	877

පාරිසරික භාරකාරත්වය
අනාගත බැංකුකරණයේ වගකීම

	2025	2024	වෙනස
හරිත මූල්‍ය කළඹ (රු. බිලියන)	10.2	6.1	67%
කඩදාසි ප්‍රතිචක්‍රීකරණය (මෙට්‍රික් ටොන්)	14.4	35.9	(21.5)
ප්‍රතිචක්‍රීකරණය කළ කඩදාසිවලට සමාන ඉතුරුම්;			
ශාක (ප්‍රමාණය)	244	610	(366)
ඉන්ධන (ලීටර)	25,202	63,003	(37,801)
විදුලිය (කි. වොට්. පැය)	57,440	143,596	(86,156)
ජලය (ලීටර)	456,361	1,140,870	(684,509)
ඉඩම් භාවිතය (ඝණ මීටර)	43	108	(65)
නව හරිත ගොඩනැගිලි (ප්‍රමාණය)	2	-	2

සම්මාන සහ ඇගයීම්

විවිධ වේදිකාවන් මත ඇගයීමට ලක් වූ විශිෂ්ටත්වයේ අභිමානය

ලංකා බැංකුවල අබණ්ඩව ස්වකීය නායකත්වය මූල්‍ය සේවාවන්, නවෝත්පාදනය සහ යහපාලනය යන අංශ හරහා ප්‍රදර්ශනය කර ඇත. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පුළුල් පරාසයක වේදිකාවන් හරහා බැංකුව බොහෝ ඇගයීම් වලට පාත්‍ර වී ඇත. කීර්තිමත් සම්මාන තුළින් තිරසාර මූලපිරීම්, විද්‍යුත් නවෝත්පාදන සහ පරිවර්තනීය බැංකුකරණ විසඳුම් හඳුනාගැනීම, සන්නාම නායකත්වය, ආයතනික වාර්තාකරණය සහ මෙහෙයුම් විශිෂ්ටතාවය ඇගයීම සඳහා, ලංකා බැංකුව විසින් ලබාගත් ජයග්‍රහණ, වටිනාකම් නිර්මාණය සඳහා සාකල්‍ය ප්‍රවේශයක් පිළිබිඹු කරයි.







මෙම බහුවිධ අංශයන් මගින් ලබා දුන් පිලිගැනීම් අපගේ පාර්ශ්වකරුවන්ගේ පරිණාමය වන අපේක්ෂාවන් සපුරාලීමටත්, අපගේ ගනුදෙනුකරුවන් සමඟ පවතින විශ්වාසනීයත්වය ශක්තිමත් කිරීමටත්, වෙළඳපල තුළ ප්‍රතිගත තත්ත්වයන් සළකුණු කරගැනීමටත් ඇති හැකියාව තහවුරු කරනු ලබයි. එකී සම්මානයන්, අපගේ භූමිකාවන් ශක්තිමත් කරමින් අපගේ කණ්ඩායම් වල පවතින කැපවීම, විශේෂඥතාවය, සහ ඉදිරි දැක්ම සමඟ අනුගත වෙමින් ශ්‍රී ලංකාව තුළ ආර්ථික වර්ධනය සඳහා උත්ප්‍රේරකයක් ලෙස කටයුතු කරනු ලබයි.

2025 ලංකාපේ තාක්ෂණික සම්මාන
සාමාන්‍ය ගෙවීම් සඳහා හොඳම බැංකුව - රන් සම්මානය
රජයේ ඩිජිටල් ගෙවීම් සඳහා හොඳම බැංකුව - රන් සම්මානය
මූල්‍ය ඇතුළත් කිරීම් සඳහා වසරේ හොඳම බැංකුව (A කාණ්ඩය) - රන් සම්මානය
ගනුදෙනුකාර පහසුකරණය සඳහා වූ වසරේ විශිෂ්ටතා සම්මානය (A කාණ්ඩය) - රන් සම්මානය



ඩිජිටල් ගෙවීම් සඳහා වූ සමස්ත විශිෂ්ටතා රිදී සම්මානය (බැංකු අංශය)



වසරේ හොඳම ලංකාපේ කාඩ්පත් අත්පත් කරගැනීම - කුසලතා සම්මානය
ජනප්‍රියතම ඩිජිටල් ගෙවීම් නිෂ්පාදනය (රාජ්‍ය බැංකු අංශය) - කුසලතා සම්මානය



බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රයේ හොඳම කළමනාකරණ ව්‍යාපෘති (BOC Flex) - රන් සම්මානය
2025 ජාතික ව්‍යාපෘති කළමනාකරණ විශිෂ්ටතා සම්මාන (NPME)



රාජ්‍ය අංශය තුල ඩිජිටල් බලපැවැත්ම (BOC Flex) - රන් සම්මානය
සමස්ත ජයග්‍රාහක (BOC Flex) - රන් සම්මානය
2025 ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්මාන



බැංකු වෙබ් අඩවියක් සඳහා වූ හොඳම ජංගම පරිශීලක අත්දැකීම - රන් සම්මානය
හොඳම බැංකු වෙබ් අඩවිය - රන් සම්මානය
2025 සමස්ත ජයග්‍රාහක - ලෝකඩ සම්මානය
2025 BestWeb.LK සම්මාන



ශ්‍රී ලංකාවේ හරිත ගොඩනැගිලි කවුන්සිලය මගින් සිදුකරනු ලබන හරිත ගොඩනැගිලි ශ්‍රේණිගත කිරීමේ සහතිකය - ප්ලැටිනම් සම්මානය



බැංකු අංශය - කුසලතා සම්මානය
2025 ශ්‍රී ලංකා වරලත් පුද්ගල කළමනාකරණ ආයතනය (CIPM) විශිෂ්ට මානව සම්පත් සඳහා සම්මාන



වසරේ ඉස්ලාමීය බැංකු සේවා නියුක්තික ලෝකඩ සම්මානය
2024-2025 ශ්‍රී ලංකා ඉස්ලාමීය බැංකු හා මූල්‍ය කර්මාන්ත සමූළු (SLIBFI) සම්මාන



අනාගතය සඳහා ශක්තිමත් බලගැන්වීමක්

දශක ගණනාවක ආර්ථික චක්‍ර, ප්‍රතිපත්ති මාරුවීම් සහ රටෙහි අවිනිශ්චිතතාවන් වලදී, අරමුණ අනුව අනුවර්තනය වෙමින් ලංකා බැංකුව ස්ථාවරත්වයේ කුළුණක් ලෙස නොසැලී රැඳී සිට ඇත. බැංකුව විසින් නිරන්තර සංකීර්ණත්වය අවශෝෂණය කරගනිමින්, ඔරොත්තු දීමේ හැකියාව සමග ප්‍රතිචාර දක්වමින්, ශක්තිමත් බව මතු කරගනිමින්, විශ්වාසනීයත්වය සමඟ අඛණ්ඩව ජාතියක් ලෙස ඉදිරියටම යාම සඳහා අනුබල ලබා දේ. බැංකුවේ ගමන් මග, විශ්වාසයේ ඝනක රූපකයක් ලෙස නිරූපණය කල හැක. එහි ඝනත්වය හරය ලෙස දකිමින්, ශක්තිමත් මුහුණත් මගින් අවධාරණය කිරීම හා සියලු මානයන් මගින් සමතුලිත කිරීම සිදු කරනු ලබයි. ස්ථාවරත්වය පදනම් කර ගත්, දිශානතිය සහ ශක්තිය සපයමින්, බැංකුවට වර්ධනය, පරිණාමය, සහ පැහැදිලි ලෙස අනාගතයට නායකත්වය දීමට අවස්ථාව සලසයි.

හරය: විශ්වාසය

නායකත්වයෙහි හදවත බඳු වූ ස්ථාවර බලවේගය

විශ්වාසය කේන්ද්‍රය කරගනිමින්, ආර්ථික අස්ථාවරත්වයට එරෙහිව විශ්වාසය තහවුරු කිරීම, පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සහ ජාතියේ බැංකුකරු ලෙස එහි කාර්යභාරය තහවුරු කිරීම තුළින් ලංකා බැංකුවේ නායකත්වය පරිණාමය වී ඇත.



රුබික් ඝනකයේ මුහුණත්: නායකත්වය ක්‍රියාවට නැංවීම

බහු-මාන සම්බන්ධතාවය

පුද්ගලයන්, ව්‍යාපාර, සහ රජය බාධාවකින් තොරව සම්බන්ධ කිරීමට, බැංකුවේ අඛණ්ඩතාව ශක්තිමත් කිරීමට, පාර්ශ්වකරුවන් අතර සබඳතා ඇති කිරීමට හා ජාතික ප්‍රමුඛතාවයන් ශක්තිමත් කිරීමට බැංකුවට ඇති හැකියාව මෙමගින් අදහස් වේ. ඩිජිටල් ගෙවීම් පරිසර පද්ධතියේ ව්‍යාප්තිය, ගනුදෙනුකාර අංශ අතර අනුගත කිරීම වේගවත් කිරීම සහ ආරක්ෂිත සහ ප්‍රවේශ විය හැකි මූල්‍ය විසඳුම් ඇතුළත්කරණය හරහා අරමුණු සහිත ඩිජිටල්කරණය තුලින් මෙම සම්බන්ධතා සක්‍රීය කර ඇත.

නම්‍යශීලීත්වය සහ ප්‍රතිචාර දැක්වීම

සෑම මුහුණතක්ම, වෙළඳපල බාධාවන් සහ නැගී එන පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා මගින් මතුවන වෙනස්කම්වලට දූරදර්ශීව, සක්‍රීයව, වේගයෙන් සහ විනයානුකූල ක්‍රියාත්මක වීම් මගින් තීරණාත්මකව ප්‍රතිචාර දැක්වීමට ලංකා බැංකුව සතු හැකියාව පිළිබිඹු කරයි. මෙම නම්‍යශීලී බව වඩාත් පැහැදිලි වන්නේ ජාතික ප්‍රමුඛතා සමඟ බැංකුව සක්‍රීයව පෙලගැසීම සමගයි. මූල්‍ය ඇතුළත්කරණය ශක්තිමත් කිරීමේදී සහ ජාතික ප්‍රමුඛතාවයන්ට ප්‍රතිචාර දැක්වීමේදී ලංකා බැංකුව අඛණ්ඩ උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියා කරයි.

ඔරොත්තු දීමේ හැකියාව සහිත නායකත්වය

ඔරොත්තු දීමේ හැකියාව විසින් විශ්වාසය පවත්වා ගනිමින් ආර්ථික අස්ථාවරත්වය මඟ හැරීමට ලංකා බැංකුව සතු හැකියාව මෙහෙයවයි. එය පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සුරක්ෂිතව ආරක්ෂා කිරීම සහ රට පුරා අඛණ්ඩ සේවාවන් පවත්වාගෙන යාම තුළින් පිළිබිඹු වේ. මෙම ඔරොත්තු දීමේ හැකියාව අඛණ්ඩතාව සහතික කර, විශ්වසනීයත්වය ශක්තිමත් කර ස්ථාවර ජාතික ආයතනයක් ලෙස බැංකුවේ දිගුකාලීන පැවැත්ම තහවුරු කරයි.

මූල්‍ය ඇතුළත්කරණය

ලංකා බැංකුවේ ජාතික පැවැත්ම සහ ශීඝ්‍ර ඩිජිටල් පරිණාමය මගින් වර්ධනය තුල සැබවින්ම මූල්‍ය ඇතුළත්කරණය ඇතුළත් වන බව සහතික කර ඇත. ශ්‍රී ලංකාව පුරාම මූල්‍ය ප්‍රවේශය පුළුල් කිරීම තුළින්, ලංකා බැංකුව කාන්තා ව්‍යවසායකයින් සවිබල ගන්වා, ජීවනෝපායන්ට සහාය වී ඇත. එලෙසම, බිම් මට්ටමේ ජීවනෝපායන් සඳහා ද සහාය වූ අතර එකී පිරිමිඩයේ පහළම ප්‍රජාවන්ට විධිමත් මූල්‍ය පද්ධතියට අර්ථවත් ලෙස සහභාගී වීමට හැකියාව ලබා දුන් අතර, එම ප්‍රවේශයන්, අවස්ථාවන් බවට පරිවර්තනය කරගනිමින් ඔවුන්ට ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථා සලසයි.

පාර්ශ්වකරුවන්ට වටිනාකම් නිර්මාණය

මුහුණත් විසින් ඝනකය සෑම දිශාවකටම සමපාත කරන්නා සේ, සියලුම පාර්ශ්වකරුවන් අතර ප්‍රතිලාභ බෙදී යාම සහතික කරනු ලබන අතර තිරසාර වටිනාකමක් ලබා දීමද තහවුරු කරනු ලබයි. එලෙසම, ආයතනික බදු අයකිරීම් සහ ව්‍යවස්ථාපිත ගෙවීම් හරහා රජයට ලැබෙන ශක්තිමත් බදු දායකත්වයක් මගින් රාජ්‍ය සේවා, යටිතල පහසුකම් සංවර්ධනය සහ දිගුකාලීන ආර්ථික ස්ථාවරත්වය සඳහා සහාය වීම අරමුණු වේ.

අනාගතය උදෙසා ගොඩ නැංවූ බැංකුව

විශ්වාසය එහි හරය මගින් සහ නායකත්ව ශක්තිය එහි මුහුණත් මගින් අර්ථ දක්වමින්, ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ අනාගතය සඳහා සක්‍රීය උපායමාර්ගික දායකයෙකු ලෙස ලංකා බැංකුව අඛණ්ඩව පරිණාමය වෙමින් පවතී. මෙම සමබර නායකත්ව ආකෘතිය, අනාගත අවිනිශ්චිතතාවයන් අවශෝෂණය කර ගැනීමට, අවස්ථාවන් විවෘත කිරීමට සහ පරම්පරා ගණනාවක් පුරා ස්ථාවර බලවේගයක් ලෙස සිටීමට ලංකා බැංකුවට ඇති හැකියාව විදහා දක්වයි.

මෙම සෑම අංගයක්ම අනෙක් දේවා සමඟ බාධාවකින් තොරව අන්තර් ක්‍රියා කරන අතර බැංකුවේ බහුමාන හැකියාවන් පිළිබිඹු කරයි. එමෙන්ම එක්ව ක්‍රියාකිරීමෙන්, ලංකා බැංකුවට එහි පාර්ශ්වකරුවන් සඳහා අඛණ්ඩ වටිනාකම් නිර්මාණය කරමින් සහ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයෙහි විශ්වාසදායක හවුල්කරුවෙකු ලෙස එහි භූමිකාව ශක්තිමත් කරමින් ඔරොත්තු දීමේ හැකියාව සහිතව සහ අරමුණු සහගතව මූල්‍ය තලයක සැරිසැරීමට ඉඩ සලසයි.



නායකත්වය

අරමුණක් ඇතිව මෙහෙයවීම

ලංකා බැංකුව, ශක්තිමත් නායකත්වය, දැඩි යහපාලනය, සහ ප්‍රතිපත්තිගරුක මෙහෙයුම් සංස්කෘතිය හරහා බැංකු අතර ප්‍රමුඛස්ථානයක් ගනී. බැංකුවේ මෙහෙයුම් රාමුව, පළමු පෙළ ඩිජිටල් ආකෘතිය සහ යහපාලන ව්‍යූහය මඟින් අපගේ උපායමාර්ගික දැක්ම මත ගොඩනැඟුනු ක්‍රියාකාරී සැලැසුම් හරහා, වගකීම් සහගත කාර්යසාධනය සහ ජාතික වටිනාකම් නිර්මාණය සහතික කරනු ලැබේ.

රූබික් ඝනකය පිළිබඳ ප්‍රවීණත්වය ආරම්භ වන්නේ හුදෙක් වර්ණ පමණක් නොව සම්බන්ධතා ද තේරුම් ගැනීමෙනි. සංකීර්ණ ගැටළුවක් විසඳීමට බුද්ධියට වඩා හිය ව්‍යුහගත පියවරෙන් පියවර විසඳුම් ක්‍රමවේදයක් අවශ්‍ය වේ.

සභාපතිතුමාගේ පණිවිඩය



> අපගේ දිගු කාලීන දැක්ම වනුයේ අඛණ්ඩ ලාභදායීත්වය සහ විධිමත් ප්‍රාග්ධන පදනම හරහා ගම්‍ය වන සිය මූල්‍ය ශක්තිය මගින් ජාතියේ අනාගතයට පණ පොවන විවිධ ක්ෂේත්‍ර වෙත අවශ්‍ය ජවය සපයන බැංකුවක් ලෙස පෙනී සිටීමයි.

කාවින්ද ද සොයිසා
සභාපති

පණිවිඩයේ සංක්ෂිප්තය වෙත (ඉංග්‍රීසි භාෂාවෙන්) පිවිසීමට මෙම QR කේතය පරිලෝකනය කරන්න.

හිතවත් පාර්ශ්වකරුවනි,

දශක අටකට වැඩි කාල පරිච්ඡේදයක් පුරා ලංකා බැංකුව, ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රයේ කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කරන්නේ වෙනස් වන ආර්ථික සහ සමාජීය තත්ත්වයන් වෙත අනුගත වෙමින් රටේ සංවර්ධනය උදෙසා නිරතුරුව සහයෝගය දෙමින් ය. අපගේ මෙම දිගුවූත් අභිමානවත්වූත් ගමන් මඟ තුළ විවිධ වූ අභියෝග අපි නිසි ලෙස හසුරුවමින් මූල්‍ය කාර්යසාධනය මනාව කළමනාකරණය කර ගනිමින් නවෝත්පාදනය, ස්ථාවරත්වය, වර්ධනය සහ යහපාලනය පෙරදැරිව ජාතික වගකීම් ඉටුකරමින් කටයුතු කළෙමු. 2025 වසර තුළදී මෙම සියලු පැතිකඩ ප්‍රශස්ත මට්ටමින් පෙළගස්වා සාර්ථක ප්‍රතිඵල අත්පත් කර ගැනීමට හැකි විය.

රටේ විශාලතම බැංකුව වශයෙන් අප වෙත පැවරී ඇති වගකීම් සමුදාය හුදෙක් මූල්‍ය ප්‍රතිලාභයක්ම පමණක් නොවේ. එය ඉන් ඔබ්බට විහිදුණු සමාජ වගකීම් රාශියකින් සමන්විත වූවකි. වසර ගණනාවක් පුරා ගොඩනැඟුණ විශ්වාසය පදනම්ව රටේ අසීරු සහ අභියෝගාත්මක අවස්ථාවලදී ආර්ථික මෙන්ම සමාජීය ස්ථාවරත්වය රැක ගැනීමට බැංකුව ලබා දුන් සහයෝගය සහ කැපවීම මගින් තවදුරටත් අපගේ භූමිකාව පැහැදිලි වේ. 2025 වසර තුළදී ජාතික තලයේ හොඳම සන්නාමය ලෙස ලද ඇගයීම සහ වැඩිම ලාභදායීත්වයක් වාර්තා කළ ආයතනය වීම මගින් ගනුදෙනුකරුවන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අප කෙරෙහි තැබූ විශ්වාසය ද අපගේ සේවක කණ්ඩායමේ සාමූහික කැපවීම ද ගම්‍යමාන වේ. මෙම ජයග්‍රහණය මගින් අප වෙත තැබූ විශ්වාසයම පමණක් නොව අප හට ළඟා කර ගැනීමට හැකි ඉලක්කයන් සහ ශක්‍යතාවයන් පිළිබඳ වන නොසැලෙන හැඟීමද ප්‍රදර්ශනය කරයි. බැංකුවේ ඉදිරි දැක්ම, උපායමාර්ගික සැලසුම් හරහා ක්‍රියාවට නංවමින් විශිෂ්ටත්වයේ ප්‍රමිතීන් ප්‍රතිඵල ලෙස දායාද කරමින් මෙම සියලු ජයග්‍රහණයන් පිටුපස ඇති ජවය වන්නේ කැපවීම, දක්ෂතාවය සහ ශක්‍යතාවයෙන් හෙබි අපගේ සමස්ත සේවක ප්‍රජාවයි.

වසර 86 ක අභිමානවත් ගමන් මඟක්, නොසැලෙන විශ්වාසයක් සහ විශාල ජයග්‍රහණ ප්‍රමාණයක් සහිතව මෙම අවස්ථාවේ, 2025 මූල්‍ය වර්ෂය සඳහා වන අපගේ 13 වන සමෝධානික වාර්ෂික වාර්තාව මම ඉමහත් ගෞරවයෙන් පිරිනමමි. සියලු ලාංකීය ජනතාවගේ හෙට දවස ශක්තිමත් කිරීම උදෙසා අනාගතය පෙරදැරිව බැංකු කටයුතු මෙහෙයවමින්, කැපවීමෙන්, සමාජය බල ගන්වමින් ජාතික මුලිකාංග වෙත අවධානය යොමු කරමින් ලංකා බැංකුව කටයුතු කරන ආකාරය මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර ඇත.

මූල්‍ය ශක්තිය: අරමුණු ගත කාර්යසාධනයන්

මෙම වසරේ සමාලෝචනය තුළ ප්‍රධාන මාතෘකාවන් වන්නේ ආර්ථික ප්‍රතිව්‍යුහගතකරණය, ගෝලීය වශයෙන් පැවති අස්ථාවරත්වයන් සහ ඩිට්වා සුළි කුණාටුව මගින් ඇති කරන ලද සමාජ ආර්ථික හානියයි. මෙම කාලය තුළදී ලංකා බැංකුව එහි තේමා පාඨය වන "ජාතියේ මහා පහන් ටැඹ" යන වදනට සරිලන අයුරින්ම අප රටේ උන්නතිය සහ සමාජීය වගකීම ඉටු කිරීමට නිරන්තරයෙන් කටයුතු කළේය. බැංකුව සතු ශක්තිමත් මූල්‍ය කාර්යසාධනය, ප්‍රාග්ධනය, නිසි ස්ථාවර ද්‍රවශීලතා මට්ටම්, දිගු කාලීන තිරසාර පැවැත්ම සහ යහපාලන තන්ත්‍රය මත ගොඩනැඟුණ ශක්තිය මගින් සියලු අසීරුතාවයන් වෙත නොසැලී මුහුණ දෙමින් රටට අවශ්‍යම අවස්ථාවේදී සහයෝගය දක්වමින් ජාතියේ මහා පහන් ටැඹ ලෙස අපගේ භූමිකාව මනාව ඉටු කරන ලදී.

2025 වසර තුළදී ලංකා බැංකුව සිය කීර්තිමත් ඉතිහාසය තුළ වාර්තා කළ ඉහළම ලාභදායීත්වය වාර්තා කරමින් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ නොමැකෙන සළකුණක් සනිටුහන් කළේය.

රටේ විශාලතම සහ වැඩිම ලාභදායීත්වයක් සහිත තනි ආයතනය ලංකා බැංකුව බව තවදුරටත් තහවුරු කරමින් 13% ක වර්ධනයක් සහිතව රු. බිලියන 120.8 ක බදු පෙර ලාභයක් වාර්තා කිරීමට අප මෙම වසරේ දී සමත් විය. මෙම විශිෂ්ට වර්ධනය නිසා වත්කම් මත ප්‍රතිලාභය සහ හිමිකම් මත ප්‍රතිලාභය පිළිවෙලින් 2.3% සහ 22.7% ක් ලෙස ඉහළ අගයන් නිරූපණය කල අතර මූල්‍ය සේවා මත බදු, ආදායම් බදු සහ ලාභාංශ ගෙවීම් ලෙස මෙම වසරේ දී ජාතික ආර්ථිකය වෙත රු. බිලියන 76.7ක දායකත්වයක් දක්වා ඇත.

ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ නායකත්වය යළි යළිත් තහවුරු කරමින් වත්කම්, ණය සහ අත්තිකාරම්, තැන්පතු සහ විදේශීය මුදල් තැන්පතු වෙළඳපල ප්‍රමුඛත්වය පවත්වා ගැනීමට බැංකුව සමත් වූයේ අඛණ්ඩ මූල්‍ය කාර්යසාධන දර්ශකයන්හි වර්ධනයක් ද සමගිනි. වසර තුළදී ලංකා බැංකු සමූහයේ වත්කම් පදනම 10% ක වර්ධනයක් සමගින් රු. ට්‍රිලියන 5.6 ක සීමාව පසු කල අතර, වත්කම් සහ වගකීම් කළමනාකරණයේ කාර්යක්ෂමතාවය සහ වෙළඳපල අවස්ථා නිසි ලෙස උකහා ගැනීමේ ප්‍රවීණත්වය මත මෙම ජයග්‍රහණයන් ළඟා කර ගැනීමට බැංකුවට හැකි විය. අපගේ මූල්‍ය ශක්තිය වර්ධනය වෙනවාත් සමඟම අපගේ ගනුදෙනුකාර භවතුන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් සපුරාලීමේ කාර්යක්ෂමතාවය ද වේගවත් කිරීමට කටයුතු කර ඇත.

අභියෝගාත්මක සාර්ව ආර්ථික පරිසරයක් තුළ ළඟා කරගත් මෙම ජයග්‍රහණයන් මගින් පිළිබිඹු වන්නේ ලංකා බැංකුව සතු ඉතා සූක්ෂම උපායමාර්ගික සැළසුම්කරණය, විචක්ෂණශීලී අවදානම් කළමනාකරණය සහ ඒ සැමට වඩා ප්‍රබල වන ශ්‍රී ලාංකික පරම්පරා ගණනාවක් විසින් අප වෙත තබා ඇති විශ්වාසනීයත්වයයි. මෙම සාර්ථකත්වයන් මගින් ජනිත ප්‍රතිඵලයන් හුදෙක් ජයග්‍රහණයක් අත්පත් කර ගැනීමක්ම නොවේ. ඒමඟින් අපගේ ප්‍රාග්ධන පදනම තව තවත් ශක්තිමත් කර ගැනීමට හැකියාව ලැබෙන අතර, වෙළඳපල ස්ථාවරත්වය දිර් ගන්වමින්, ඩිජිටල්කරණයේ ඉදිරි ගමනට ආයෝජනය කරමින්, ජනතාව වෙත වඩාත් සමීප බැංකුකරණයක් සපයමින් අපගේ කණ්ඩායමේ උන්නතිය සහ සංවර්ධනය උදෙසා ආයෝජනය කිරීමටත් අවශ්‍ය ශක්තිය සහ පසුබිම ගොඩනඟා දී ඇත. බැංකුවේ මූල්‍ය ශක්තිය ආරක්ෂා කර ගනිමින් ආර්ථික වර්ධනය සඳහා අවශ්‍ය සහාය සපයමින් නියමිතම සහ අවශ්‍යම අවස්ථාවේදී අපගේ භූමිකාව නිසි ලෙස ඉටු කිරීමට ලංකා බැංකුවේ ඉහළ ඉපයීමේ ශක්‍යතාවය, ප්‍රාග්ධන ස්වාරක්ෂකයන්, සහ යහපත් ද්‍රවශීලතාවයන් ප්‍රබල සාධක විය.

වගකීම් සහගත බැංකුකරණය: සැමට පුළුල් වූ සේවා සැපයුම

2025 වසර තුළදී ක්‍රමයෙන් ස්ථාවරත්වයට පත් වූ ජාතික ආර්ථිකයේ වර්ධනය තුළින් රාජ්‍ය මූල්‍ය සහ සමස්තයක් වශයෙන් අනෙකුත් සෑම අංශයකටම සාධනීය සහ ධනාත්මක ප්‍රවේශයක් පිළිබිඹු විය. කෙසේ වෙතත්, මෙම යහපත් තත්ත්වයන් වෙත දිට්වා සුළි කුණාටුව මඟින් ඇති කරන ලද අනපේක්ෂිත අභියෝග වලින් බාධා ඇති විය. එමඟින් කාලගුණික විපර්යාස වලින් ඇති වෙන ප්‍රතිඵල උදෙසා අප රටේ පවතින නිරාවරණ මට්ටම සහ ප්‍රධාන ආර්ථික ක්ෂේත්‍ර වන කෘෂිකර්මය සහ සංචාරක කර්මාන්තය වැනි අංශ වෙත ඇති වන බලපෑම මනාව ප්‍රදර්ශනය විය.

සාර්ව ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහය දක්වන වැඩ සටහන යටතේ අවශ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීමට ව්‍යාපාර සහ කුටුම්භයන් හට දැඩි සහයෝගයක් ලබා දීමට සිදු විය. දේශගුණික වෙනස් වීම් මත ඇති වන හානි නිසා පැන නඟින අවදානම් හේතු කරගෙන කෘෂිකාර්මික අංශය, ග්‍රාමීය ජනයාගේ ජීවනෝපාය මාර්ගය සහ ග්‍රාමීය ආර්ථිකය දැඩි ලෙස බලපෑමට ලක් විය. කෙසේ නමුත්, උද්ධමනය පහළ අගයක ස්ථානගත වීම, ගෙවුම් ශේෂයේ ධනාත්මක වර්ධනය, ක්‍රමයෙන් ඉහළ යන ආයෝජක විශ්වාසය සුභවාදී මට්ටමක පැවතුණි. අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙන ප්‍රතිපත්ති මාලාවක් සහ ආයතනික ශක්තීන් තුළින් මෙම අසීරු කාල පරිච්ඡේදය තුළ ඇතුළත් සහ තිරසාර වර්ධනයන් සහිත ප්‍රතිඵල ලබා ඇති බව මම ශ්‍රභවාදීව දකිමි. මෙවන් පසුබිමක, ශ්‍රී ලංකාවේ පද්ධතිමය වශයෙන් වැදගත් වන විශාලතම බැංකුව ලෙස ලංකා බැංකුව මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් දැඩි වගකීමක් ඉටු කරයි. ජාතික සංවර්ධනය උදෙසා සහයෝගය දක්වමින් රටේ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ආරක්ෂා කිරීම අපගේ න්‍යාය පත්‍රයේ මූලිකාංගයකි. මූල්‍යමය ඇතුළත්කරණය සහ ඉලක්කගත වාණිජ ණය ලබා දීම හරහා ව්‍යාපාර පුනර්ජීවනය, අපනයන ආදායම සහ ආමුඛ ප්‍රේෂණ හරහා විදේශ විනිමය ගලා ඒම ශක්තිමත් කිරීම සහ ජාතික ඩිජිටල් ආර්ථික න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාම වැනි කරුණු උදෙසා අපි මෙම වසර තුළදී ප්‍රමුඛත්වය ලබා දුන්නෙමු.

අපි සමස්ත දිවයිනේම ව්‍යාපාර සඳහා සහාය වීම, ජීවනෝපාය මාර්ගයන් සුරක්ෂිත කිරීම, සහ ව්‍යාපාර අවස්ථා පුළුල් කිරීම උදෙසා නිරතුරුව උපකාරී වුනෙමු. ආර්ථිකයේ වර්ධනය පමණක්ම නොව සමාජ සුරක්ෂිතභාවය සහ අනාගත සුභ සිද්ධියද තහවුරු කරමින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත, තරුණ සහ කාන්තා ව්‍යවසායකයින් වෙත අපි ළඟා වුනෙමු. ශ්‍රී ලංකාව සංවර්ධනය කරා යන ගමන්මඟහි තිරසාරත්වය තහවුරු කිරීමට ලංකා බැංකුව නිරන්තරයෙන් කැපවී සිටින බව සනාථ කරමින් කෘෂිකර්මාන්තය, ඉදි කිරීම්, අපනයන සහ සංචාරක යන ව්‍යාපාරික ක්ෂේත්‍ර සඳහා දායකත්වය දක්වන ලදී.

දිට්වා සුළිකුණාටුවට බැංකුව මුහුණ දුන් ආකාරය බහුවිධ වේ. ඒමඟින් බැංකුවේ වගකීම් සහගත බව මනාව පරීක්ෂාවට ලක් විය. ආපදාවට ලක්වූ ප්‍රදේශ වෙත ජංගම රථ සහ ඩිජිටල් මාධ්‍ය හරහා අඛණ්ඩව ගනුදෙනු කටයුතු පවත්වා ගැනීමට බැංකුව කටයුතු කළේය. තවද, ආපදාවට ලක්වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් සඳහා 3% ක සහන ණය අනුපාතය සහිත ණය, සහනදායී ණය පැකේජ, යළි ණය අය කර ගැනීමේදී සහන සහ අවශ්‍ය පරිදි උපදේශන සේවාවන් ද සපයන ලදී.

බැංකුව විසින් මූල්‍යකරණයට අමතරව, "ශ්‍රී ලංකාව යළි නඟා සිටුවමු" අරමුදලට රු. මිලියන 500 ක මුදලක් ලබා දෙමින් නිවාස යලි ඉදි කිරීම, යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය, ජීවන කටයුතු යලි යථා තත්ත්වයට පත් කිරීම ආදී ජාතික මෙහෙවරක් සහිත කටයුතු උදෙසා තම දායකත්වය ලබා දුන්නේය. සහයෝගීත්වය සහ සහෝදරත්වයෙන් සපිරි අප සේවක මණ්ඩලයද සමස්ත දිවයින පුරාම තම උපරිම කැප වීමෙන් යුතුව සහන සේවාවන් සැපයීම උදෙසා මූල්‍ය මෙන්ම ශ්‍රම දායකත්වය ද ලබා දීමට නොපසුබට විය.

නවෝත්පාදනය සහ ප්‍රවේශය: අනාගතය වෙතට දිශාගතව

උපායමාර්ගික වශයෙන් 2025 වසර, බැංකුව සඳහා පරිවර්තනීය වසරක් විය. නව මාධ්‍යයන් හරහා ප්‍රවේශය පුළුල් කරමින්, කාර්යක්ෂමතාවය ඉහළ නංවමින්, නියෝජිත බැංකුකරණය ආදී ක්‍රමවේද ඔස්සේ බැංකුවේ ඩිජිටල්කරණ ක්‍රියාවලීන් වැඩි දියුණු කරමින් අප රටේ ඩිජිටල්කරණ වෙත පිය නඟන ක්‍රියාදාමය සමඟ අනුගතව ඉදිරියට ගමන් කිරීමට අවශ්‍ය පියවර දියත් කර ඇත. මූල්‍ය ඇතුළත්කරණය තුළින් අඩු වරප්‍රසාදිත ප්‍රජාව වෙත බැංකු කටයුතු වලට ප්‍රවේශ වීමට අවශ්‍ය මංපෙත් සලසා දී ඇති අතර එමඟින් රටේ දිගුකාලීන තරඟකාරිත්වය ශක්තිමත් කිරීම ඉලක්ක කර ගත් තරුණ සහ නව ව්‍යාපාරික ප්‍රජාවට අවශ්‍ය වන බලගැන්වීම සහ දිර් ගැන්වීම සපයන ලදී. අපගේ දිගුකාලීන උපායමාර්ගයන් තුළට නිසැක වශයෙන්ම රටේ සංවර්ධනය ප්‍රමුඛ කොටගත් ස්ථාවර වර්ධන ඉලක්කයන් අන්තර්ගත වේ. කෘෂිකර්මාන්තය, පශු සම්පත්, සංචාරක කර්මාන්තය, ඉදිකිරීම් සහ අපනයන ආශ්‍රිත නිෂ්පාදන ආදී ක්ෂේත්‍ර වෙත වන මූල්‍ය සැපයුම අඛණ්ඩව සිදු කිරීමට බැංකුව සමත් විය. තිරසාරත්වය හුදු සංකල්පයක් හෝ අපේක්ෂාවක් නොව මෙහෙයුම් ක්‍රියාවලිය හා මුසු වූ යථාර්ථයක් බවට පත් කරමින් රාජ්‍ය බැංකුවක් විසින් නිකුත් කළ විශාලතම තිරසාර බැඳුම්කර නිකුතුව සිදු කිරීමට මෙම වසර තුළදී ලංකා බැංකුවට හැකියාව ලැබිණි. මෙමඟින් ආයෝජක ප්‍රජාව විසින් බැංකුවේ යහපාලන තන්ත්‍රය, යහපත් පැවැත්ම, විශ්වාසනීයත්වය සහ දිගුකාලීන දැක්ම කෙරෙහි තැබූ විශ්වාසය යළි යළිත් ස්ථාවරත්වයට පත් වේ.

වෙළඳපල තුළ සංධිස්ථාන කිහිපයක් සනිටුහන් කරමින් වසර තුළදී, BOC IT සොලුයුෂන්ස් (පෞද්ගලික) සමාගම පිහිටුවීම, ජාතික ගමනාගමන ඩිජිටල්කරණ මුල් පිරීම් සඳහා සහභාගිත්වය, නව ඩිජිටල් අත්දැකීම් සහිත දියුණු උපාංග ඇතුළත් බැංකුවේ දුරකථන බැංකුකරණ යෙදුම වන "BOC Flex" දියත් කිරීම ආදිය සිදු කරනු ලැබුවේ ගනුදෙනුකරුවන්ගේ පහසුව සහ සේවා සංතෘප්තිය ඉහළ නැංවීම ඉලක්ක ගතවය.

සභාපතිතුමාගේ පණිවිඩය

ඉතාමත් ඈත ගම්මානවල වාසය කරන අප ශ්‍රී ලාංකික ප්‍රජාවට ද බැංකුකරණ සේවාවන් වෙත ඉතාම පහසුවෙන් ළඟා වීමට ඉඩ ප්‍රස්තාව සලසා දෙමින් ශ්‍රී ලංකා තැපෑල සමඟ ඒකාබද්ධව “BOC Connect” නියෝජිත බැංකු සේවාව තවදුරටත් පූළුල් කිරීමට යෙදුන අතරම නව්‍ය නිපැයුම් වන “BizPlus” ණය කාඩ්පත සහ “BizLift” ණය යෝජනා ක්‍රමය මඟින් ව්‍යාපාරික ප්‍රජාව වෙත අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයන ලදී. බිම් මට්ටමේ සහභාගිත්වය යළි යළිත් බල ගන්වමින් “BOC ගම්මාන” සහ “BOC මිතුරු” වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාවට නැංවිණ.

මූල්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීම සහ බැංකු සේවාවන් වෙත යොමු නොවූ ප්‍රජාව ඒ තුළට අනුගත කරමින් 700,000 ක් ඉක්මවන අස්වැසුම ප්‍රතිලාභීන් ප්‍රමාණයකට ගාස්තු අය කිරීමකින් තොරව නොමිලේ හර කාඩ්පත් ලබා දෙන ලදී. මේ අතරම අපි නව්‍ය වූ හරිත තැන්පතු සහ ණය හරහා තිරසාර මූල්‍ය කටයුතු දිරිමත් කළෙමු. පෙව හායනයට ලක්වන හර කාඩ්පත් ප්‍රථම වරට හඳුන්වා දෙමින් අප ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රය තුළ විප්ලවීය වෙනසක් සිදු කිරීමට මුල් පිරුවෙමු. මෙම සියලු ප්‍රයත්නයන් තුළින් අපගේ පාරිසරික වගකීම, සමාජීය ඇතුළත්කරණය සහ මූල්‍ය කාර්යසාධනය එකිනෙකට සම්බන්ධිතව බල ගැන්වෙන බව පැහැදිලි වේ.

තිරසාරකත්වය: දිගු කාලීන වගකීම් උදෙසා කැපවීම - ශ්‍රී ලංකාවේ මෙතෙක් නිකුත් වූ විශාලතම තිරසාරකත්ව බැඳුම්කර නිකුතුව

මෙම වසර තුළදී බැංකුවේ තිරසාරකත්ව මුල් පිරීම් තවදුරටත් ක්‍රියාවට නංවන ලදී. බැංකුව තම තිරසාරකත්ව මූල්‍යකරණයේ නායකත්වය, හරිත සහ සමාජීය ණය සහ අභ්‍යන්තර කටයුතුවලින් ජනනය වන කාබන් නිකුතුව අවම කිරීම යන ක්‍රියාමාර්ග ඔස්සේ ස්ථාපිත කිරීමට කටයුතු කළේය. මෙහිදී වැදගත්ම පියවර වන්නේ ශ්‍රී ලංකාවේ මෙතෙක් නිකුත් කළ විශාලතම තිරසාරකත්ව බැඳුම්කර නිකුතුවයි. ශ්‍රී ලංකාවේ මෙවන් විශාල නිකුතුවක් සිදු කළ ප්‍රථම රාජ්‍ය බැංකුව ලෙස ලංකා බැංකුව වෙත ආයෝජකයන් දැඩි විශ්වාසයක් තැබූ අතර එමඟින් බැංකුවේ යහපාලන තන්ත්‍රය, මූල්‍ය ස්ථාවරත්වය සහ තිරසාරකත්ව ප්‍රතිපත්තිය පිළිබඳ ඔවුන්ගේ පැහැදීම ප්‍රදර්ශනය වේ.

ලංකා රේටින්ග්ස් ආයතනය විසින් “AA – (Stable)” ලෙස ශ්‍රේණිගත කරන ලද මෙම බැඳුම්කර නිකුතුව මඟින් රුස් කර ගත් රු. බිලියන 20.0 ක මුදල් ප්‍රමාණය ක්ෂුද්‍ර සහ සුළු පරිමාණ ව්‍යාපාරකයින් නඟා සිටු වීම, සුළු පරිමාණ කෘෂි ව්‍යවසායකයින් දිරි ගැන්වීම, සෞඛ්‍ය සහ අධ්‍යාපනය යන අංශවල සහ හරිත ව්‍යාපාරික කටයුතු යන විවිධ සමාජීය වැදගත්කමක් සහිත අංශවල වර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය සහයෝගය ලබා දීම උදෙසා යොමු කරනු ඇත. පාරිසරික, සමාජීය සහ යහපාලනය සමඟ ඒකාබද්ධව මෙහෙයුම් කටයුතු සිදු කිරීම යන අංශයන් වෙත මෙන්ම බැංකුවේ යහපාලන තන්ත්‍රය වෙත ද ආයෝජකයන් විසින් තබා ඇති විශ්වාසය ඉතා දැඩි බව මෙම බැඳුම්කර නිකුතුව මඟින් මනාව තහවුරු විය.

තිරසාරකත්වය යනු බැංකුවේ වටිනාකම් ජනනය කරන උපායමාර්ගික සැලැස්මේ ද එය ක්‍රියාවට නංවන සියලු මෙහෙයුම් කටයුතු සහ ක්‍රියා පිළිවෙත් තුළ ද අන්තර්ගත දර්ශනයකි. එය අප හුදෙක් වචනයට පමණක් සීමා නොකොට අපගේ සමස්ත කාර්යයන්හිදී අනුගත වන පුළුල් දැක්මකි. මේ බව සනාථ කරමින් බැංකුව සියලු මූල්‍ය කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ තිරසාර මූල්‍ය දැක්ම සමඟ අනුගත කරමින් පුනර්ජනනීය බල ශක්තිය, හරිත, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ කාලගුණික බලපෑම් වීරෙහි කෘෂිකාර්මික ක්‍රමවේදයන් වෙත අවශ්‍ය මූල්‍ය දායකත්වය සපයයි. ජාතික වැදගත්කමක් සහිත අංශ වෙත අවශ්‍ය මූල්‍ය ශක්තිය සැපයීම උදෙසා රටේ ප්‍රමුඛ රාජ්‍ය බැංකුවක් වශයෙන් ලංකා බැංකුව නිරන්තරව කැප වී සිටියි. ආර්ථික මෙන්ම පාරිසරික වශයෙන්ද දිගුකාලීන වැදගත්කමක් සහිත ව්‍යාපාර වන ඉහත සඳහන් ව්‍යාපාර වෙත අප මූල්‍ය සහාය ලබා දෙන්නේ අප කෙරෙහි ආයෝජක ප්‍රජාව තබා ඇති විශ්වාසය තවදුරටත් ආරක්ෂා කරමින් ය.

කාලගුණික විපර්යාස වලට ඔරොත්තු දෙන ආකාරයේ කෘෂිකාර්මික කටයුතු සහ අඩු කාබන් විමෝචනයන් සහිත නිෂ්පාදන කටයුතු වැනි ව්‍යාපාරයන් වෙත මූල්‍ය සහාය ලබා දෙන අතරම බැංකුව සිය මෙහෙයුම් කටයුතු සිදු කරන ක්‍රමවේදයන් තුළින් ද තම පාරිසරික වගකීම සහ සමාජ වගකීම ඉටු කිරීමට ක්‍රියාමාර්ග දියත් කර තිබේ. ශාඛා 100 ක් පුරා ස්ථාපිත මෙගා වොට් පැය 4.3 ක ධාරිතාව සහිත සූර්ය විදුලි බල ශක්ති පැනල පද්ධතිය, හරිත ගොඩනැගිලි සංකල්පය අනුව හඳුනාගත් ශාඛා නිම කිරීම ආදිය මේ අතර වේ. මෙම පියවරයන් මඟින් බැංකු සේවා වෙතට මෙන්ම මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතටද තිරසාර සංකල්පයන් මුසු කිරීමේ බැංකුවේ සැබෑ උවමනාව පැහැදිලිව අවබෝධ කරගත හැකි වේ.

අපගේ ඓතිහාසික ගමන් මඟේ භාරකරුවන්: ගනුදෙනුකරුවන්ගේ සිහින යථාර්ථයක් බවට පත්කරන්නන්

ඉතාමත් කැපවීමෙන් සහ අප්‍රතිහත ධෛර්යකින් යුතුව තම කාර්යභාරය ඉටු කරන ප්‍රමාණයෙන් 9,000 ක් පමණ වන ලංකා බැංකුවේ සේවක මණ්ඩලය හුදු සේවක පිරිසක්ම නොවේ. ඔවුන් ශ්‍රී ලංකාවේ අංක එකේ සන්නාමයේ භාරකරුවන් ය. තම කැපවීම, අවංකභාවය සහ වගවීම මත තමන් සිදු කරන සෑම ක්‍රියාවක් තුළින්ම ලංකා බැංකුව තව තවත් බල ගන්වන්නට ඔවුන් ක්‍රියා කරයි. ඔවුන් බිම් මට්ටමේ තම ගනුදෙනුකරුවන්ගේ ජීවිත තුළට ලංකා බැංකුව වෙතින් අපේක්ෂිත සහාය සහ සේවාවන් නිසි ලෙස ලබා දෙමින් ගනුදෙනුකරුවන්ගේ ජීවිත නඟා සිටුවීම උදෙසා සෑම අයුරකින්ම දායක වේ.

අප බැංකුව මෙතෙක් කලක් ගනුදෙනුකරුවන් තුළ ගොඩනඟා ගත් විශ්වාසය සහ අඛණ්ඩ බැඳීම තවදුරටත් වර්ධනය කර ගනිමින් බැංකු සේවාවන් තුළින් ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂිත සිහිනයන් යථාර්ථයක් බවට පත් කර ගැනීමේ ඔවුන්ගේ ගමන් මඟට අවශ්‍ය මූල්‍ය සහ සේවා සහාය ලබා දීමට අපගේ සේවක මඩුල්ල වෙත අවශ්‍ය නිසි පුහුණුව සහ දැනුම නිරන්තරයෙන් ලබා දීමට අපි අවශ්‍ය සියලු කටයුතු සම්පාදනය කරන්නෙමු. ඔවුන්ගේ ශක්තිය, කැපවීම සහ සහෝදරත්වයේ බැඳීම සහ සැලකීම අපගේ සන්නාමය තව දුරටත් පිළිගැනීමට මෙන්ම ජාතියක් වශයෙන් ඇගයීමට ලක් කිරීමට ද ප්‍රධාන වන සාධකයන් ය.

යහපාලනය: විශ්වාසයේ බැඳීම

මෙතරම් දීර්ඝ ගමන්මඟේ අභ්‍යන්තර මාර්ග දර්ශකය ලෙස ක්‍රියා කරන්නේ බැංකුවේ ශක්තිමත් යහපාලන පිළිවෙත් සහ නායකත්ව දර්ශනයයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ දූරදර්ශී තීරණ සහ අඛණ්ඩ අධීක්ෂණය, දැඩි අවදානම් කළමනාකරණ ක්‍රියා පිළිවෙත් සහ පාරිසරික සහ තිරසාරකත්ව බලපෑම් කෙරෙහි දක්වන ගැඹුරු අවධානය යන කරුණු ඔස්සේ අපගේ වර්ධනය ස්ථාවර සහ වගකීම් සහගත ලෙස අත්පත් කර ගැනීමටත් කාර්යසාධනය සහ මෙහෙයුම් ප්‍රතිඵල අරමුණු ඔස්සේම මෙහෙයවමින් සාර්ථකත්වය කරා ගමන් කිරීමට අප වෙත හැකියාව ලබා දී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශයන්ට අනුකූලව අපි අපගේ යහපාලන ක්‍රියා පිළිවෙත් සහ ව්‍යුහයන් අඛණ්ඩව බල ගැන්වූවෙමු. අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීන නියෝජනය අනු කමිටු ව්‍යුහයන් සහ හෙළිදරව් කිරීම් වැඩි දියුණු කිරීම මඟින් අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණ කටයුතු තවදුරටත් වර්ධනය කළේය. මාගේ අදහස අනුව යහපාලනය යනු ව්‍යාපාරයක වර්ධනය සීමා කෙරෙන ක්‍රියාවලියක් නොව එය හුදු දිගු කාලීන විශ්වාසය සහ වටිනාකම් ජනනය කිරීම උදෙසා වන ප්‍රධාන අඩිතාලමයි.

පුළුල් හෙළිදරව් කිරීම්, පාර්ශ්වකරුවන් සමඟ සබඳතාවන්, වාර්ෂික ස්වයං තක්සේරුව, අවදානම් අභිරුචි අධීක්ෂණය, අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්ති, චර්යාධර්ම සංග්‍රහයන්, පැමිණිලි සහ ගැටලුකාරී තත්ත්වයන් වාර්තා කිරීමේ ක්‍රියාපටිපාටිය සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අඛණ්ඩව ලබා දෙන පුහුණුව හරහා දැඩි යහපාලන ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැංවීමට අපි නිරන්තරයෙන් කැපවුනෙමු.

උපායමාර්ගික අධීක්ෂණය සහ තීරණ ගැනීමේ වපසරිය පුළුල් කරමින් අධ්‍යක්ෂවරුන් 11 දෙනෙකුගෙන් සමන්විත වන අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ මම විශේෂයෙන් ආඩම්බර වෙමි. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ පුළුල් පරාසයක් පුරා විසිරී පවතින බහුවිධ දැනුම සහ ඥාණය, අත්දැකීම් වල ප්‍රබල බව මෙන්ම කාන්තා නියෝජනය යන අංග මඟින් ලංකා බැංකුවේ යහපාලනය වෙත මහත් වූ සේවාවක්

සැපයේ. හඳුන්වා දීමේ පෙර වැඩමුළු, අවිච්ඡින්න ඉගෙනුම් ක්‍රමවේද, තිරසාරභාවය ආශ්‍රිත වන මූල්‍ය හෙළිදරව් කිරීම් - S1 සහ S2 වැනි අංග ආවරණය වන පුහුණු වැඩසටහන් හරහා අපගේ නායකත්ව කණ්ඩායමේ ශක්තිය, වගකීම් සහ බැංකුවේ අඛණ්ඩ වර්ධනයට උරදීමේ හැකියාව මනාව ස්ථාපිත බව අපි සහතික කරමු. තවද, යහපාලන ව්‍යුහයන් ශක්තිමත් කිරීම සඳහා තිරසාර සහ ණය වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු 02 ක් මෑතකදී ස්ථාපනය කරන ලදී.

ඉදිරි ගමන් මඟට දර්ශනය: අරමුණු පෙරදැරිව ප්‍රගතිය කරා

ජාතියක් වශයෙන් ඉතා විශාල අවස්ථාවන් රාශියක් අප අභිමුව ඇත. විනයගරුක මූල්‍ය ඒකාබද්ධතාවය, නවෝත්පාදනය ආදිය මතින් මෙම අවස්ථාවන් හරහා වර්ධනය අත්පත් කර ගැනීමට නිරතුරුව උත්සාහ කළ යුතුය. මෙම පසුබිම තුළ අපගේ භූමිකාව සම්ප්‍රදායික බැංකුකරණයෙන් ඔබ්බට විහිදේ. අප ප්‍රගතියේ සහකරු මෙන්ම අවස්ථා සහ අභියෝග යථාර්තයක් බවට පත් කර ගැනීමේ විශ්වාසී භාරකරු වේ.

මෙම සන්දර්භය තුළ බැංකුවේ ඉදිරි ගමන උපායමාර්ගික සැලැස්ම සහ ආයතනික පරිණතභාවය මගින් මෙහෙයවනු ලැබේ. අපගේ ඉදිරි ගමන හුදෙක් අපගේ වර්ධනය උදෙසාම නොව එම සියලු සැලසුම්, ක්‍රියාමාර්ග දියත් වන්නේ නොසැලෙන ශක්තිය සහ දිගුකාලීන වටිනාකම් සියලු පාර්ශ්ව වෙත වගකීමෙන් ළඟා කර දීමටය. මේ උදෙසා ජාතික තලයේ සේවා සැපයුම, තිරසාරකත්වය සහ විශ්වාසනීයත්වය යන මානයන් ඔස්සේ බැංකුව සිය ශක්තිය පෙළගස්වා ඇත. මෙම ඒකාබද්ධ ප්‍රවේශය, බැංකුවේ භූමිකාව දිගුකාලීනව අර්ථ දක්වා ඇති අතර ගතික පරිසරය තුළ නොනවත්වා සාර්ථකත්වය කරා ගමන් කිරීමට අවශ්‍ය පදනම සපයයි.

ජාතියේ අනාගතයට නිවැරදි මංපෙත් විවර කරමින්, ඵලදායිතාවය මත පදනම් වූ අංශ වෙත අවශ්‍ය මූල්‍ය සහ ප්‍රාග්ධනිත සාධක සපයමින් වර්ධනයට අවශ්‍ය සහයෝගය සහ ජවය ලබා දෙන බවට අප කදිම උදාහරණයකි. බැංකුවේ අඛණ්ඩව ලාභදායිතාවය සහ මනාව පාලනය කර ගනු ලබන ප්‍රාග්ධනය හරහා ජාතික ආර්ථිකය නඟා සිටුවීම පෙරදැරිව පාරිසරික බලපෑම් වලට ඔරොත්තු දෙන පරිදි කෘෂිකාර්මික කටයුතු සකස් කිරීමට, තිරසාර යටිතල පහසුකම් සැපයීමට, තරුණ සහ කාන්තා-මූලික ව්‍යවසාය නඟා සිටුවීමට අවශ්‍ය සහයෝගය සහ අවස්ථාවන් ලබා දීමට අප කටයුතු කරනු ලැබේ.

ඩිජිටල්කරණය ප්‍රවර්ධනය සඳහා වන අපගේ කැපවීම සෑම ශ්‍රී ලාංකිකයෙකුටම බැංකු සේවා වෙත ප්‍රවේශ වීමට ඇති හැකියාව තව තවත් පහසු කරවීම අරමුණු ගතය. ගනුදෙනුකරුවන් නාගරික මෙන්ම ග්‍රාමීයව විසිරී පැවතියත් ඔවුන් වෙත ළඟා වීම පහසු කර වීමට ජංගම බැංකු සේවාවන්, නියෝජිත බැංකු සේවා, දත්ත මූලිකව නව ෆින්ටෙක් හවුල්කාරිත්වයන් මඟින් අප හට හැකියාව ලැබී ඇත. මෙම තාක්ෂණයන් බැංකුවේ පහසුව පමණක්ම නොව ගනුදෙනුකරුවන්ගේ පහසුව, වර්ධනය සහ ඔවුන්ගේ අභිප්‍රේරණය සඳහා ද වේ.

අපි හෙට දවස උදෙසා ආයෝජනය සිදු කරන්නේ තිරසාරකත්වය පෙරදැරිවය. වගකීම් සහගත ආයතනයක් වශයෙන් අපි පාරිසරික, සමාජීය සහ යහපාලනය යන සාධක මූලික කරගත් අවදානම් තක්සේරුකරණය, ප්‍රාග්ධන කළමනාකරණය සහ ඒදිනෙදා මෙහෙයුම් කටයුතු හා සම්බන්ධිත තීරණ ගැනීම සිදු කරනු ලබයි. මෙමගින් දේශීය මෙන්ම විදේශීය ආයෝජකයින්ගේ, ප්‍රජාවගේ සහ අනාගත පරපුරේ නව අපේක්ෂාවන් සහ අභිලාෂයන් තෘප්තිමත් කෙරේ. මෙම අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීමේ හදවත වන්නේ වෘත්තීමය වශයෙන් තම දැනුම, කැපවීම සහ විශ්වාසනීයත්වය ප්‍රමුඛ කොට ගෙන සේවය කරන අපගේ ලංකා බැංකු සේවක ප්‍රජාවයි. අපගේ අභිමානවත් වූ ඉතිහාසය ඊළඟ පරිච්ඡේදය දක්වා රැගෙන යන අඩිතාලම ඔවුන් ය.

අපි ප්‍රාග්ධනය නිසි පරිදි විශ්ලේෂණාත්මකව යෙදවීම අඛණ්ඩව සිදු කරන්නෙමු. ජාතික මට්ටමේ තරඟකාරී ව්‍යාපාර අංශ, කාර්යක්ෂමතාව සහ ධාරිතාව ඉහළ නංවන ඩිජිටල් තාක්ෂණික නිෂ්පාදන ක්‍රමවේද ආදිය වෙත අවශ්‍ය මූල්‍ය සහාය ලබා දෙමින් තිරසාරත්ව උපායමාර්ග වෙත අනුගත කරමින් අවදානම් කළමනාකරණය සහ ප්‍රාග්ධනය කළමනාකරණය හරහා අවශ්‍ය නිසි අඩිතාලම සකස් කිරීමට බැංකුව ඉදිරියටත් කටයුතු සිදු කරනු ලැබේ. රූබික් ඝනකය මෙන් බහුවිධ අංග වලින් සමන්විත ආයතනයක් ලෙස ලංකා බැංකුව අපගේ ශක්තීන්, මූල්‍ය කාර්යසාධනය, යහපාලනය, මානව සම්පත, තාක්ෂණය සහ ජාතික වගකීම යන අංශ ඔස්සේ විදහා දක්වයි. මෙම බහුවිධ අංශයන් නිසි පරිදි එකිනෙක ක්‍රියාත්මක වී සැමට වටිනාකම් ජනිත කරයි.

ස්තුතියි: එක් අරමුණක් උදෙසා එක්ව පෙරදැරිව

අපගේ එකම කොටස් හිමියා සහ ස්ථිරසාර මාර්ගෝපදේශකයා ශ්‍රී ලංකා රජය වන අතර ඒ සඳහා කෘතඥතාවය පළ කරමින් ගරු මුදල් අමාත්‍යතුමා, භාණ්ඩාගාර ලේකම් සහ මුදල් අමාත්‍යාංශයේ නිළධාරි මණ්ඩලය මෙම අවස්ථාවේ ගෞරව පූර්වකව සිහිපත් කරමි. ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය සහ උපදේශනය අගයමි.

මාගේ සහෘද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් හට ඔවුන්ගේ අප්‍රතිහත කැපවීම සහ සහයෝගය උදෙසා ප්‍රණාමය පිරිනමන අතරම පෙර අධ්‍යක්ෂ ධූරයන් හෙබවූ සියලු දෙනාගේම දූරදර්ශී සහ විචක්ෂණශීලී උපායමාර්ග මෙහෙවර ස්තුති පූර්වකව සිහිපත් කරමි.

බැංකුවේ හිටපු මහා කළමනාකාරතුමා වන රසල් ෆොන්සේකා මහතා විසින් ඉටු කරන ලද නොපසුබට කැපවීම සහ අමිල මෙහෙය වෙනුවෙන් මාගේ හදපිරි ප්‍රණාමය දක්වන අතරම වත්මන් මහා කළමනාකාරතුමා වන වයි ඒ ජයතිලක මහතා වෙත ද ඔහුගේ නොනිමි මෙහෙය උදෙසා ස්තූතිය පළ කරමි. එමෙන්ම ආයතනික හා විධායක කළමණාකාරිත්වය, සේවක සංගම්, විශ්‍රාමික සහ වත්මන් සේවක මණ්ඩලය ඇතුළු සමස්ත ලංකා බැංකු කණ්ඩායමට මම මෙම මොහොතේදී කෘතවේදීව අගයමි. ඔවුන්ගේ වෘත්තීය දක්ෂතාවය, නොසැලෙන අධිෂ්ඨානශීලී බව සහ තම ජාතික වගකීම පිළිබඳ පවත්නා ගැඹුරු අවබෝධය අපගේ උපායමාර්ග කාර්යසාධනයන් බවටත් දැඩි විශ්වාසය අඛණ්ඩව ජනිත වන වටිනාකම් බවටත් පරිවර්තනය කිරීමට හේතු විය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා ඇතුළු නිලධාරි මණ්ඩලයට මම හදවතින්ම ගෞරව පූර්වකව ස්තූතිවන්ත වන අතරම විගණකාධිපතිතුමිය සහ කාර්ය මණ්ඩලය විසින් දක්වන ලද විචක්ෂණශීලීවූත් දූරදර්ශීවූත් යෝජනා සහ කළමනාකරණ වාර්තාවන් ඉතා අගය කොට සළකමි. දේශීය පද්ධතිමය වශයෙන් ඉතා වැදගත් බැංකුවක් ලෙස ඔවුන්ගේ වාර්තාවල සඳහන් කරුණු බැංකුවේ ඉදිරි ගමනට ඉතාම වැදගත් වේ. එමෙන්ම අපගේ හිතවත් ගනුදෙනුකාර භවතුන්ටත්, ව්‍යාපාරික හවුල්කරුවන්ටත් ඔවුන්ගේ නොබිඳෙන විශ්වාසය සහ සහයෝගය උදෙසා හදපිරි ප්‍රණාමය පිරිනමමි. මෙම සියලු පාර්ශ්වකරුවන්ගේ අප්‍රතිහත සහයෝගය සහ කැපවීම මත ලංකා බැංකුව මූල්‍ය ක්ෂේත්‍රයේ දැවැන්තයා ලෙස වැජඹෙන බව සතුටින් සඳහන් කර සිටිමි.

ඉදිරිය කරා යන මෙම ගමන් මඟේදී වසර 86 ක ඉතිහාසය පුරා අපි උපයා ගත් විශ්වාසය සහ ශක්තිමත් මූල්‍ය තත්ත්වය මත තවදුරටත් පදනම්ව සිටින්නෙමු. තවදුරටත් ඉතා අභිමානයෙන් සහ විශ්වාසයෙන් යුතුව ජාතිය වෙත සේවය සලසමින් නොසැලී අනාගතය වෙත පියවර තැබීමට අපගේ මූල්‍ය ශක්තිය, අධිෂ්ඨානය සහ අසමසම මෙහෙය අඩිතාලමක්ම වනු ඇත.



කාවින්ද ද සොයිසා
සභාපති

2026 පෙබරවාරි 24
කොළඹ දීය.

මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය



> ලංකා බැංකුව සිය පරිමාණය, ප්‍රවේශය සහ ජාතික වගකීම තුළින් ශ්‍රී ලංකාව පුරා සැලකිය යුතු බලපෑමක් ඇති කිරීම සඳහා අඛණ්ඩව ක්‍රියා කළේය.

වයි ඒ ජයතිලක
මහා කළමනාකරු/
ප්‍රධාන විධායක නිලධාරී

පණිවිඩයේ සංක්ෂිප්තය වෙත (ඉංග්‍රීසි භාෂාවෙන්) පිවිසීමට මෙම QR කේතය පරිලෝකනය කරන්න.

ලංකා බැංකු ඉතිහාසයේ තවත් සුවිශේෂී සංධිස්ථානයක් සනිටුහන් කරමින් 2025 වසර තුල මෑත ඉතිහාසයේ වාර්තා කළ ශක්තිමත්ම කාර්යසාධනය වාර්තා කිරීමට බැංකුව සමත් විය. මෙම ජයග්‍රහණය මගින් රටේ අංක එකේ බැංකුව ලෙස ලංකා බැංකුවේ නායකත්වය සහ ශක්තිය පමණක් නොව රටේ මූල්‍ය පද්ධතියේ ප්‍රධාන භූමිකාව සහ පදනම ද ලංකා බැංකුවම බව නැවත නැවතත් තහවුරු කරයි. නිසි උපායමාර්ගික සැලසුම්කරණය, ශක්තිමත් අවදානම් කලමනාකරණ පිළිවෙත්, ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා වෙනුවෙන් දක්වන නොසැලෙන කැපවීම මත පදනම්ව මූල්‍ය සේවා වෙත ප්‍රවේශය පුළුල් කිරීම සහ ඩිජිටල්කරණය මූලික කොටගත් පරිවර්තනයන් තුලින් ජාතික ආර්ථිකයේ පිබිදීම හා වර්ධනය සඳහා අපි සහයෝගය දක්වන්නෙමු.

වසර තුලදී බැංකුව සිය ආයතනික ශක්තිය සහ වෙළඳපල නායකත්වය තව දුරටත් සනාථ කරමින් කැපී පෙනෙන ඇගයීම් රැසක් ලගා කරගන්නට සමත් විය. ජාත්‍යන්තර තලයේ සිය ස්ථානය තව දුරටත් ස්ථාපනය කරගනිමින් ලංකා බැංකුව 16 වන වරටත් ලොව ප්‍රමුඛ බැංකු 1,000 අතර ශ්‍රේණිගත වීමට සමත් විය. අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් පැවතියද බැංකුවේ ණය ගනුදෙනු මූලිකාංගයන් නියමිත පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීම පදනම්ව ෆිච් රේටින්ග්ස් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය මගින් බැංකුවේ දේශීය දිගුකාලීන ණය ශ්‍රේණිය AA- (lk)/ StAble ලෙසද, විදේශීය දිගුකාලීන සහ විදේශ මුදල් නිකුතු ශ්‍රේණිගත කිරීම CCC+ ලෙසද යලි තහවුරු කරන ලදී. එපමණක් නොව, බැංකුවේ සන්නාම වටිනාකම තවදුරටත් ස්ථාවරත්වයට පත්කරමින්, සහ සන්නාම ලොවේ නායකත්වය අචලව පවත්වා ගනිමින්, රු. බිලියන 57.4 ක සන්නාම වටිනාකමක් සහිතව ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ අංක එකේ සන්නාමය බවට බ්‍රෑන්ඩ් ෆයිනැන්ස් ලංකා ආයතනය විසින් ඇගයීමට ලක්විය.

අපගේ ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවයේ ශක්තිමත්භාවය, ඩිජිටල් නවෝත්පාදනයන්, තිරසාරත්වයේ සංකලනයන්, යහපාලන ආචාරධර්මයන් සහ අපගේ සේවක මණ්ඩලයේ අප්‍රතිහත කැපවීම් බැංකුව තුළ පවත්නා ආයතනික යහපාලන රාමුවේ අන්තර් සම්බන්ධිත මානයන් වන අතර තිරසාර වටිනාකම් ජනනය කරමින් ජාතික සංවර්ධනය උදෙසා බැංකුවේ මෙහෙවර ඉටු කිරීමට උපකාරී වන ප්‍රධාන සාධක වේ.

එබැවින්, 2025 වසර සඳහා වන කාර්යසාධනය සහ මෙම සමාලෝචනය මම ඉමහත් අභිමානයකින් යුතුව ඉදිරිපත් කරනු කැමැත්තෙමි.

මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති ප්‍රගතිය සාමූහික ශක්තියේ සාක්ෂියකි. ලංකා බැංකු සේවක මණ්ඩලයේ නොමඳ කැපවීම, ආයතනික ශක්තිය, ගනුදෙනුකරුවන්, පාර්ශ්වකරුවන් සහ සමස්ත ප්‍රජාවම බැංකුව වෙත රඳවා ඇති විශ්වාසය යන සියලු කරුණුවල සමස්ත ප්‍රතිඵලයක් මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇත.

මෙහෙයුම් පරිසරය: කාර්යසාධනය පෙළගැස්ම

ගෝලීය ආර්ථිකය තුළ පැවති වර්ධනය වන වෙළඳ අර්බුදයන්, තීරුබදු සම්බාධක සහ දේශපාලනික අස්ථාවරත්වයන් මත පැන නැඟුණ අහිතකර තත්ත්වයන් අපනයන ආදායමේ වර්ධනය, විදේශීය ආයෝජන ගලා ඒම සහ ගෝලීය සැපයුම් ජාලයන් කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කළේය. දේශගුණික සාධකයන් මගින් වූ බලපෑම් මෙම තත්ත්වයන් තවදුරටත් තීව්‍ර කළ අතර විශේෂයෙන් කෘෂිකර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදනයන් වෙත වඩාත් අහිතකර බලපෑමක් ඇති විය. මෙම ගෝලීය ආර්ථික විචල්‍යතාවයන් මධ්‍යයේ වුවද ශ්‍රී ලංකාව තුළ යහපත් වාතාවරණයක් ක්‍රමයෙන් පැන නැඟිණ. ස්වෛර් ශ්‍රේණිගත කිරීමේ ඉහළ යාම, ආයෝජකයන්ගේ ඉහළ විශ්වාසය, අපනයන, සංචාරක සහ සේවා යන අංශවල සිදුවූ වර්ධනය යන කරුණු ශ්‍රී ලංකා ආර්ථිකයේ ධනාත්මක සළකුණු විය. ඒ සමඟම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය, තරුණ පරපුරේ සහභාගිත්වය සහ කාන්තා සවිබල ගැන්වීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් දිවයිනේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම සහ ඩිජිටල් පරිවර්තනයන් වේගවත් කිරීම අඛණ්ඩව සිදු විය.

මෙම ධනාත්මක වර්ධනයන් සමඟම සැළකිය යුතු දේශීය මට්ටමේ අභියෝගයන්ද අඛණ්ඩව පැවතුණි. ඉහළ මට්ටමක පවතින දරිද්‍රතා තත්ත්වයන්, බුද්ධි ගලනය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සැලසුම් ක්‍රියාත්මක කිරීම් ආදී අභියෝග සාර්ථකව ජය ගන්නා ලදී. කාලගුණය ආශ්‍රිත අවදානම් වෙත වන නිරාවරණයන්හි අභියෝගාත්මකභාවය මොනවට නිරූපණය කරමින් වසර අවසන් භාගයේදී පැන නැඟුණ දිට්වා සුළි කුණාටුව මගින් ජීවිත අහිමි වීම්, අධික දේපළ සහ යටිතල පහසුකම් හානි යනාදී විශාල අභියෝග රැසක් ඇති විය.

සමස්ත බැංකු ක්ෂේත්‍රයේ ම කාර්යසාධනය මනින දර්ශකයක් වන බැංකු කාර්යසාධන දර්ශකය වසර තුළදී වර්ධනය වූ අතර එමගින් ක්ෂණික අභියෝග දරා ගැනීමේ හැකියාවද වර්ධනය විය. වසර තුළදී වර්ධනය වූ ලාභදායීත්වය, ප්‍රාග්ධනය, වත්කම්හි ගුණාත්මකභාවය සහ වෙළඳපළ අවදානම් වෙත මුහුණ දීමේ හැකියාව මෙයට හේතු විය.

ගතික පරිසරයට ධනාත්මක ලෙස ප්‍රතිචාර දැක්වීම

නිරන්තරයෙන් වෙනස් වෙමින් විටින් විට නැඟී එන අභියෝගයන් සඳහා සාර්ථකව මුහුණ දෙමින් නිසි ප්‍රතිචාර දැක්වීමට මනා අවබෝධය සහ අනුගත වීම අවශ්‍ය වේ. මේ සඳහා ප්‍රතිචාර වශයෙන් බැංකුවේ ආයතනික පදනම අබණ්ඩව ශක්තිමත් කරන ලදී. බැංකුවේ ඩිජිටල්කරණ උපායමාර්ගයන් මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ අසීමාන්තික බැංකුකරණ අත්දැකීම් හරහා තරඟකාරී වාසි අත්පත් කර ගැනීමට බැංකුව අවශ්‍ය අභ්‍යන්තරික පරිවර්තනයන් සහ ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කරනු ලැබීය.

දිට්වා සුළි කුණාටුව නිසා විවිධ ආර්ථික අර්බුද සහ ජන ජීවිතයේ සාමාන්‍ය ක්‍රියා පටිපාටි අඩාල වූ අවස්ථාවේදී අප සතු ජංගම බැංකු සහ ඩිජිටල් සේවාවන් ඔස්සේ ව්‍යාපාර සහ පුද්ගලයන්ගේ බැංකු අවශ්‍යතාවයන් අබණ්ඩව පවත්වා ගෙන යාමට අවශ්‍ය සහයෝගය සපයනු ලැබීය.

ජාතික ආර්ථිකය යළි ගොඩනැඟීමේදී අප සතු කාර්ය භාරය හොඳින් වටහා ගත් ලංකා බැංකුව "ශ්‍රී ලංකාව යළි නඟා සිටුවමු අරමුදල"ට රු. මිලියන 500 ක දායකත්වයක් ලබා දුන්නේය. මීට අමතරව සේවක කණ්ඩායම විසින් ලබා දුන් රු. මිලියන 50 ක දායකත්වය ලංකා බැංකුවේ සහයෝගය තවත් වර්ණවත් කරවීය. මෙමගින් රටේ ජනතාවගේ මූල්‍ය අවශ්‍යතා සඳහා පමණක් නොව ඔවුන්ගේ ජීවන අභියෝග වලට මුහුණ දෙන අවස්ථා වලදී ද උපකාරයට සිටින බවට ඒත්තු ගැන්වීය. එමෙන්ම ජාතියේ අසීරු අවස්ථාවලදී අප විශ්වාසදායී හවුල්කරුවෙකු ලෙස අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් එක්ව නැඟී සිටීමට දිරි දෙන්නේ හුදු ව්‍යාපාරික අරමුණකින් තොරව ජාතික වගකීම් දරමිනි.

දිගුකාලීන බලපෑම් ජනිත කරමින් වගකීම් සහගතව ක්‍රියාත්මක වීම

අපගේ පුළුල් හා පැතිරුණ ප්‍රවේශය, ශක්තිමත් ශේෂ පත්‍රය, සහ විවිධ ක්ෂේත්‍ර සමඟ වන ශක්තිමත් සබඳතා ශ්‍රී ලංකා ආර්ථිකයේ වැදගත් ස්ථානයක බැංකුව රැඳවීමට ඉවහල් විය. එබැවින් අපගේ වර්ධනය වක්‍රාකාරයෙන් රටේ වර්ධනය හා බැඳී පවතී. මෙම වසර තුළදී ද ජාතික සංවර්ධනය පාදක වන ක්ෂේත්‍ර වෙත අපගේ අවධානය යොමු කිරීමට අප කටයුතු කරන ලදී. අන්තර්ජාතික වෙළඳාම හරහා තරඟකාරී වාසි අත්වන ව්‍යාපාර වෙත අවශ්‍ය සහාය ලබා දීමට වෙළඳ මූල්‍ය පද්ධතිය වැඩි දියුණු කිරීම, විදේශ මුදල් පහසුකම් සැපයීම ආදිය කෙරෙහි වැඩි අවධානය යොමුවිය. විදේශ නියෝජිත බැංකුකරණ ජාලය සමඟ ශක්තිමත් සම්බන්ධතාවයන් පවත්වා ගනිමින් විදේශ වෙළඳපළ තුළ ගනුදෙනු කරන සහ ප්‍රවේශ වීමට බලාපොරොත්තු වන ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයන්ට විදේශ මුදල් හුවමාරු කිරීම් සහ ගනුදෙනු පහසුව සලසා දෙනු ලැබීය.

ඖෂධ, පුනර්ජනනීය බල ශක්තිය, සූර්ය බල ශක්තිය, සුළං විදුලි බලය සහ ජල විදුලි බල උත්පාදනය ආදී ප්‍රධාන අංශවල විශාල ව්‍යාපෘති සඳහා බැංකුව මූල්‍යකරණය කරන ලදී. මේ හරහා දිගුකාලීන පාරිසරික ආරක්ෂාව ජනිත කරමින් විවිධ සහ තිරසාර බලශක්ති මූලාශ්‍ර වෙත මාරුවෙමින් බනිජ තෙල් මූලික බල ශක්ති උත්පාදනය වෙතින් විතැන් වෙමින් ආනයන වියදම අඩු කිරීමට උපකාරී විය. බිම් මට්ටමේදී අපගේ සහයෝගය ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාර අංශ වෙත සපයන ලදී. අබණ්ඩ ව්‍යාපාර කටයුතු සහ අසීරු අවස්ථා වලදී අවශ්‍ය සහාය සපයමින් කාරක ප්‍රාග්ධනීකරණ ඉලක්ක ගත මූල්‍ය සහාය ඔස්සේ බැංකුව මෙම අංශ වෙත සහාය දක්වන්නට යෙදුණි. කාලගුණික බලපෑම් සහිත ප්‍රදේශවල සිටින කෘෂිකාර්මික ව්‍යාපාරිකයන් වෙත සහාය සපයමින් අභියෝග හමුවේ නොසැලී එම අසීරුතා වලට අනුගතව කටයුතු කිරීමට අවශ්‍ය මූල්‍ය සහාය ලබා දුන්නේය. මේ නිසා බැංකුවේ වැදගත්කම සහ ප්‍රමාණය අපගේ මූල්‍ය ශක්තිය මතම නොව අප විසින් ක්‍රියාවට නංවන ලද කාර්යයන්හි බලපෑම මත ප්‍රමාණික කරන්නට යෙදුනි.


මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය

නව පරපුරේ නිර්මාණකරුවන් සහ වෘත්තිමය ව්‍යාපාරික හැකියාව සහිත තරුණ ප්‍රජාව ඉලක්ක කර ගනිමින් රු. බිලියන 9.4 ක ණය මුදල් සපයනු ලැබීය. ශ්‍රී ලංකා නව ව්‍යාපාරික ප්‍රජාවේ හැකියාව සහ බැංකුවේ ණය අධීක්ෂණයේ යහපත්භාවය පිළිබිඹු කරමින් මේ අංශය වෙත ලබා දුන් ණයවල අදියර 3 ණය ප්‍රතිශතය ඉතා අඩු අගයක් ගැනිණි. අපි තවදුරටත් කාන්තා මූලික ව්‍යාපාර සඳහාද ණය සහ උපදේශනය ලබා දෙමින් එම අංශයේ වර්ධනයට දිරි දුන්නෙමු. කෘෂිකාර්මික, නිෂ්පාදන, වෙළඳ සහ සේවා අංශයේ කාන්තා ව්‍යවසාය දිරි දීම තුළින් සමාජීය වර්ධනය උදෙසාද දායකත්වය ලබා දීමට අපට හැකි විය.

ව්‍යුහාත්මක ශක්තිය මතින් ගොඩනැඟුණු ප්‍රබල මූල්‍ය කාර්යසාධනය

2025 වසර තුළදී බැංකුව විසින් ආදර්ශමත් සහ කැපී පෙනෙන මූල්‍ය කාර්යසාධනයක් වාර්තා කරන ලදී. ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වන සහ ගතික පොළී අනුපාතයක් සහිත පසුබිමක බැංකුව උපායමාර්ගිකව සහ විචක්ෂණශීලීව තම කාර්යභාරය ඉටු කළේ සංකීර්ණ සහ අභියෝගාත්මක අවස්ථාවන් තුළින් දිගුකාලීන වටිනාකම් ජනනය කරමින්ය.

වසර තුළදී නව මං සලකුණක් සනිටුහන් කරමින් 18% ක වාර්ෂික වර්ධනයක් සහිතව රු. බිලියන 76.0 ක බදු පසු ලාභයක් වාර්තා කළ අතර බදු පෙර ලාභය රු. බිලියන 120.8 කි. ජාතික ආර්ථිකයේ වර්ධනය උදෙසා තම කාර්යභාරය ඉටු කරමින් රු. බිලියන 76.7 ක දායකත්වයක් බදු වශයෙන් බැංකුව රජයට ලබා දී ඇත.



ගනුදෙනුකරුවන් විසින් බැංකුව කෙරෙහි තබා ඇති විශ්වාසනීයත්වය පිළිබිඹු කරමින් සමස්ත වත්කම් ප්‍රමාණය රු. ට්‍රිලියන 5.5 සීමාවට ළඟා වූ අතර බැංකුවේ මුළු දළ ණය ප්‍රමාණය රු. ට්‍රිලියන 4.4 ක් ලෙසද සටහන් විය. වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පෙර) 2.3% ක් දක්වා වර්ධනය වූ අතර හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය 22.7% ක් වැනි ශක්තිමත් අගයක් විය. ශ්‍රේෂ්ඨ පත්‍ර ප්‍රශස්තකරණය සහ අඩු පිරිවැය සහිත අරමුදල් පදනමේ (ජංගම සහ ඉතුරුම් තැන්පතු) වර්ධනය මත ශුද්ධ පොළී ආන්තික අනුපාතය 4.0% ක් දක්වා පුළුල් විය.

2025 වසර හුදු මූල්‍ය වර්ධනය සහ ශක්තිය ප්‍රදර්ශනය කරන වසරක්ම නොවීය. එය බැංකුව සතු උපායමාර්ගික දර්ශනයේ, මෙහෙයුම් කාර්යක්ෂමතාවයේ සහ විචක්ෂණශීලී යහපාලන ක්‍රමවේදයන් යන අංශයන් වල සාර්ථකත්වයේ දර්ශකයක් විය. ස්ථාවර වූ ලාභදායිත්වයෙන් ශක්තිමත්ව, සවිමත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතාවය මතින් බලගැන්වූ ලංකා බැංකුව තිරසාර වර්ධනය මූලික කොටගත් ජාතික පුනර්ජීවනය සඳහා අවශ්‍ය සහාය සැපයීමට නිරන්තරයෙන් කැපවී සිටී.

ගනුදෙනුකාර කේන්ද්‍රීය මූල්‍ය ඇතුළත්කරණය

ජාතියේ මහා පහන් ටැඹ ලෙස අපගේ කැපවීම අපගේ මෙහෙයුම් කටයුතු හරහා විදහා දැක්වේ. මූල්‍ය ඇතුළත්කරණ වැඩසටහන්, ඩිජිටල්කරණය ප්‍රවර්ධනය මූලික කොටගත් විවිධ සේවා සැපයුම්, සංකේන්ද්‍රගත අවශ්‍යතා සහිත ක්ෂේත්‍ර මූලික ණය පහසුකම් වැනි කාර්යයන් හරහා ජාතික තලයේ සංවර්ධන කර්තව්‍යයන් සඳහා අප විසින් සහයෝගය ලබා දේ.

ප්‍රවේශය වැඩි කිරීම, ගනුදෙනු පිරිවැය අවම කිරීම සහ නාගරික මෙන්ම ග්‍රාමීය ප්‍රජාව අතර ද සේවා ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාවය වැඩි බැංකු සේවාවක් ලබා දීම සඳහා අපි ඩිජිටල් තාක්ෂණය උපකාරී කර ගන්නෙමු. අඩු වරප්‍රසාදිත ප්‍රජාවන් මෙන්ම ගොවි ජනතාව, විදේශගත ශ්‍රම බලකාය, කෘෂි මූල්‍ය ව්‍යවසායකයින් සහ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් වෙත ප්‍රවේශය තහවුරු කරමින් සේවා මධ්‍යස්ථාන 2,400 කට වඩා වැඩි අපගේ විශාල සහ විහිදුණු සේවා සැපයුම් සම්බන්ධතා ස්ථාන ජාලය වෙත ඩිජිටල් නාලිකා තව තවත් එක් කරමින් අපගේ සම්බන්ධතාවයන් පුළුල් කරන ලදී. උදාහරණයක් ලෙස 'BOC Connect' වැනි ශ්‍රී ලංකා තැපෑල සමඟ එක්ව පුළුල් කළ නියෝජිත බැංකු සේවාව හරහා දුර බැහැර ප්‍රදේශවල වෙසෙන ග්‍රාමීය ජනයා මෙන්ම අස්වැසුම ප්‍රතිලාභීන් වෙතද ළඟා වීමට අපට හැකියාව ලැබිණි.

අපගේ ව්‍යාපාරයේ හදවත වන්නේ ලංකා බැංකු සේවක කණ්ඩායමේ සුහදශීලී සහ මිත්‍රශීලී සේවා සැපයුම මතින් රටේ සෑම තැනම විසිර පවත්නා විවිධ වූ ගනුදෙනුකාර භවතුන් සමඟ දිගු කාලයක් පුරා ගොඩනඟාගත් නොනැසෙන, විශ්වාසනීය බැඳීමයි.

වසර තුළදී දියත් කළ 'BizLift' සහ 'BizPlus' යන ණය යෝජනා ක්‍රමවේදයන් තුළින් රටේ ආර්ථිකයේ කශේරුකාව ලෙස සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත ඔවුන්ගේ ව්‍යාපාර වර්ධනය මූලික කොට ගත් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට අවධානය යොමු විය. ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සඳහා මූලිකත්වය දී කටයුතු කිරීමේ අප සතු ප්‍රවේශය උපයෝගී කර ගනිමින් ඔවුන්ගේ අවශ්‍යතා මනාව හඳුනා ගනිමින් ඒ සඳහා ප්‍රායෝගික සහ උචිතම විසඳුම් ලබා දෙමින් සැබවින්ම ගනුදෙනුකාර කේන්ද්‍රීයභාවයකින් යුතුව කටයුතු කිරීමට අප පියවර ගන්නා ලදී. තරුණ සහ කාන්තා මූලික ව්‍යාපාරයන්ගේ නඟා සිටුවීම ඉලක්ක කර ගත් අපගේ තිරසාර උපායමාර්ගයන් පුළුල් දැක්මක් සහිත වේ. ආර්ථික කටයුතු උදෙසා එම අංශවල ඵලදායී සහභාගිත්වය උත්ප්‍රේරණය කිරීම මින් බලාපොරොත්තු වේ. ඉලක්කගත මූල්‍යකරණය, උපදේශන සේවා සහ ව්‍යුහගත මූල්‍ය විසඳුම් තුළින් ව්‍යාපාර ආරම්භ කිරීමට සහ විධිමත් කිරීමට, රැකියා උත්පාදනයට සහ ප්‍රජා මූලික වටිනාකම් ජනිත කිරීමට අප අවශ්‍ය පසුබිම සකස් කර දී ඇත. මෙම වසර තුළදී බැංකුව මෙම අංශයන් වෙත දිරි දීම අඛණ්ඩව සිදු කළ අතර මූල්‍ය සහායට අමතරව ඔවුන් වෙත අවශ්‍ය මූල්‍ය අධ්‍යාපනය සහ දැනුම මෙන්ම උපදේශනය ද ලබා දෙන ලදී. මෙම අංශයන්හි වර්ධනය හුදු සමාජ වගකීමක් ඉටු කිරීමක් ලෙස නොව සමස්ත ආර්ථික වර්ධනයේම උත්ප්‍රේරකයක් වන බව අපගේ හැඟීමයි. ලංකා බැංකුවේ භූමිකාව ණය ප්‍රදානය පමණක්ම නොව ඉන් ඔබ්බට විහිදුණු වගකීම් සහගත භූමිකාවක් වන බව පැහැදිලිවම ගෙනහැර දක්වමින් රු. බිලියන 100.8 ක් අගය වන ණය ප්‍රමාණයක් ලබා දී ව්‍යාපාර 400 ක් අසීරු අවස්ථාවෙන් ඉහළට ගෙන එමින් පුනර්ජීවනය කිරීමට යෙදුණි. මෙය බැංකුව ඔවුන්ගේ යළි

නැඟී සිටීමේ සහ වර්ධනයේ සහකරු වන බව පසක් කරයි. ඒ හා සමගාමීව තම තිරසාර බැංකුකරණ කටයුතු ද අඛණ්ඩවම ඉදිරියට ගෙන යාමට අප කටයුතු කළේය.

ඩිජිටල් පරිවර්තනයක් හරහා ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් පරිපූර්ණත්වයට

ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ ගාමක බලවේගය ලංකා බැංකුව වන බව සනාථ කරමින් ඩිජිටල් පරිවර්තන ක්‍රියාවලින්හි මූලිකත්වය බැංකුව විසින් දරන ලදී. මෙහිදී ජාතික ඩිජිටල් ක්‍රියාවලියට සහාය සපයමින්, පරිමාණය ඉහළ නංවමින් සහ ප්‍රවේශය වැඩි දියුණු කරමින් ඩිජිටල්කරණයේ වාසි අත්පත් කර ගැනීමට බැංකුව නිරන්තරයෙන් කටයුතු කළේය.

පද්ධති ස්වයංක්‍රීයකරණයෙන් එපිට ගිය පුළුල් ඩිජිටල්කරණ අත්දැකීම් ලබා ගනිමින් බැංකුව සිය ගමන් මඟේ පරිවර්තනීය වෙනස්කම් සිදු කළේ ජංගම, මාර්ගගත, ස්වයං සේවා සහ දත්ත මූලික අසීමාන්තික බැංකුකරණ සේවා රාශියක් ආරක්ෂිත ක්‍රමවේද මත ගනුදෙනුකරුවන් වෙත ලඟා කරමින්ය. ඩිජිටල්කරණය ලංකා බැංකුවේ ජාතික මෙහෙවර තවදුරටත් බලගන්වන්නේ මූල්‍ය ඇතුළත්කරණය, ප්‍රජා මූලික සමාජ වගකීම් විනිවිද භාවයකින් ඉටු කිරීම සහ ඩිජිටල්කරණය තුළින් බලගැන්වූ සමාජයක් බිහිකිරීමට නිසි ලෙස සහයෝගය දැක්වීම තුළිනි. ජනතාව අප කෙරෙහි තබා තිබෙන විශ්වාසය තවදුරටත් ආරක්ෂා කර ගනිමින්, ඩිජිටල් මාධ්‍යයන්හි ආරක්ෂාව තහවුරු කරනු පිණිස අප ආයෝජනය කල අතර නව්‍ය මෙහෙයුම් ස්වයංක්‍රීයකරණය වැනි කටයුතු හරහා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට කටයුතු කරන ලදී.

අපගේ ඩිජිටල්කරණය මූලික කොටගත් ගනුදෙනුකාර අත්දැකීම් ප්‍රශස්ත කිරීමේ අභිප්‍රාය කෙරෙහි ගනුදෙනුකරුවන් විසින් තබා ඇති විශ්වාසය සහ ප්‍රසාදය පිළිබිඹු කරමින් ඩිජිටල් ගනුදෙනු ප්‍රමාණයෙහි සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය. බැංකුවේ ඩිජිටල්කරණ ගමනේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් 'BOC Flex' ජංගම බැංකුකරණ යෙදුම හඳුන්වාදීමට යෙදුන අතර එය හඳුන්වාදී ඉතා කෙටි කාලයකින් භාවිතා කරන්නන් මිලියන 1.2 සීමාව ඉක්මවා ගිය අතර ඉතා පහසු ජංගම බැංකුකරණ පහසුකම් දිවයින පුරා සිටින ගනුදෙනුකරුවන් වෙත ළඟා කරලීමට මින් හැකියාව ලැබිණ. BOC Flex යෙදුම එහි විශිෂ්ටත්වය සඳහා විවිධ සම්මාන උළෙල වලදී ඇගයීමට ලක්විය. ඒ අතරම අපගේ තවත් ජංගම බැංකුකරණ යෙදුමක් වන 'Smart Remit' යෙදුමද උපායශීලී සම්බන්ධතා හරහා ගනුදෙනුකරුවන්ට වඩාත් කාර්යක්ෂම සහ පහසු මුදල් ප්‍රේෂණය කිරීමේ මාර්ගයක් සලසා දුන්නේය.

මානව ප්‍රාග්ධනය: හැකියාවන් පෝෂණය කිරීම

අපගේ අඛණ්ඩ නායකත්ව භූමිකාවේ ගාමක බලවේගය අපගේ වටිනා මානව ප්‍රාග්ධනයයි. උපායමාර්ග හරාත්මක ගනුදෙනුකාර සම්බන්ධතා සහ සේවා විශිෂ්ටත්වයන් බවට පත් කරනා ක්‍රියාකාරී වාහකය වන්නේ අපගේ සේවක ප්‍රජාවයි.

වසර තුළදී අපගේ මානව සම්පත් කළමණාකරණ ව්‍යුහයන් සහ උපායමාර්ගයන් පරිවර්තනීය ලෙස සකස් කරමින් ව්‍යුහාත්මක වෙනස්කම් රාශියක් හරහා මානව ප්‍රාග්ධනය තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරන ලදී. ප්‍රධාන නායකත්ව තනතුරු කිහිපයක් අලුතින් හඳුන්වා දුන් අතර, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී තනතුර, මානව සම්පත් උපායමාර්ගික සහ පරිවර්තන නියෝජ්‍ය මහා කළමණාකරු සහ නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරී (යහපාලන, මානව සම්පත් සහ බැංකුකරණ මෙහෙයුම්) යන තනතුරු පිහිටුවන ලදී. මීට අමතරව වාර්තාකරණ ව්‍යුහ සරල කිරීම, වගවීම ඉහළ නැංවීම සහ අන්තර් කාර්ය කණ්ඩායම් අතර සහයෝගීත්වය ඉහළ නැංවීම ආදී කටයුතු ද දියත් කරන ලදී. මෙම ක්‍රියාමාර්ගයන් ගතික පරිසරයට ප්‍රතිචාර දැක්වීමට, නිසි යහපාලනයක් ඇති කිරීමට සහ මෙහෙයුම් විශිෂ්ටත්වය ඉහළ නැංවීමට උපකාරී වූයේ වෙනස්වන පරිසරයක් තුළ අභියෝගවලට නොබියව මුහුණ දෙමින් ඉදිරියටම ගමන් කිරීමට අවශ්‍ය ශක්තිය අප කණ්ඩායමට ලබා දුන් බැවිනි.

මෙම වසර තුළදී නව පුහුණු මාණ්ඩලික සහකාර තනතුරු 800 කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා නව බඳවා ගැනීම් සිදු කරන ලදී. බැංකුවේ අනාගත වර්ධනයට අවශ්‍ය මානව ප්‍රාග්ධනය සූදානම් කරමින් වර්ධන අවස්ථා පෝෂණය කිරීමට අපි අවශ්‍ය පියවර ගැනීමට නිරන්තරයෙන් කැප වන්නෙමු. අපගේ සේවක කණ්ඩායම නිරන්තරයෙන් විවිධත්වයෙන් යුතුව සහ සමාජ වගකීම් සහිතව හැඩ ගස්වා ඇත. කණ්ඩායමෙන් 59% ක් කාන්තාවන් මගින් නියෝජනය වීමෙන් මෙය පැහැදිලි වේ. අපගේ මානව ප්‍රාග්ධන ආශ්‍රිත තීරණ සහ ක්‍රියාකාරකම් නිරතුරුව කේන්ද්‍ර වන්නේ මෙම දැක්ම ඔස්සේය. ඉහළ ගණයේ පුහුණු වැඩසටහන් සහ දැනුම ලබා දීමේ ක්‍රමවේද ඔස්සේ අපගේ කණ්ඩායමට අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබා දීමෙන් ඔවුන්ව පෝෂණය කරන අතර දේශීය සහ විදේශීය සම්පත් දායකත්වයන් මේ සඳහා උපයෝගී කර ගැනුනි.

මෙම ක්‍රියාමාර්ගයන් මෙන්ම ප්‍රධාන කාර්යසාධන දර්ශක පාදක කොට ගත් ඇගයීම් ක්‍රමවේද සහ උචිත ප්‍රාග්ධන කළමනාකරණ උපායමාර්ගයන් හරහා නිරතුරුව වෙනස් වන මූල්‍ය පරිසරයකට හැඩ ගැසෙමින් පැන නඟින අභියෝග උදෙසා සාර්ථකව මුහුණ දෙමින් බැංකුවේ තිරසාර වර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීම තහවුරු කෙරේ.

විශිෂ්ටත්වය ඇගයීමේ සංස්කෘතියක් ඉදිරියට ගෙන යමින් ඉහළ කාර්යසාධනයක් ප්‍රදර්ශනය කරන සේවක මහත්ම මහත්මීන් ඇගයීම් නිරන්තරයෙන් සිදු කිරීමට අපගේ පුහුණු සහ සංවර්ධන වැඩසටහන් ඉදිරිපත් කර ඇත. කාර්යසාධනය ස්ථාවරව තබා ගැනීම සඳහා ඇගයීම් මූලික කොට ගෙන ධාරිතාව සහ හැකියාව ඔප්නංවීම උදෙසා අපි දිගුකාලීන වශයෙන් නායකත්ව පුහුණුව ඩිජිටල් මූලික ශක්‍යතාවයන්, අවදානම් කළමනාකරණය සහ තිරසාරභාවය පිළිබඳ දැනුවත් කිරීම් ආදිය වෙත ආයෝජනය කළෙමු. ශාඛා සේවක කණ්ඩායම්, ක්‍රියාවලි සරලකරණය සහ විවිධ යෙදවුම් හරහා ගනුදෙනුකරුවන් උදෙසා තෘප්තිමත් සේවාවක් ලබා දීමට බලගන්වන ලදී.

තිරසාරභාවය සහ කාලගුණික විපර්යාස සඳහා ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය: වගකීම් සහගත බැංකුකරණය වෙත අවධානය

වසර තුළදී අත් විඳින්නට සිදුවුණු කාලගුණික ආපදා තත්ත්වයන්හි ප්‍රතිඵල මඟින් මූල්‍ය ස්ථාවරත්වය සහ පාරිසරික ගතිකත්වය අතර ඇති අන්තර් සම්බන්ධතාවය මනාව පැහැදිලි විය. කාලගුණික බලපෑම් මත පැන නඟින අවහිරතාවන්හි ප්‍රතිඵලය උදෙසා මුහුණ දීමේ හැකියාව සහ අවදානම බැංකුවේ මූලික මෙහෙයුම් කටයුතු වලට අන්තර්ග්‍රහණය කිරීමේ වැදගත්කම මෙහිදී පසක් විය. මීට ප්‍රතිචාර වශයෙන් තිරසාරකත්වය යනු තවදුරටත් ආයතනික සමාජ වගකීම මූලික කොට ගත් කටයුත්තක් නොව එය උපායමාර්ගික මට්ටමේදීම සැලකිල්ලට ගනිමින් සෑම ක්‍රියාවලියක් සහ

මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය

ඉදිරි අනාගතය දෙස බලන විට, අපගේ ප්‍රමුඛතා, තිරසාර ප්‍රාග්ධන ඔරොත්තු දීමේ හැකියාව, ඩිජිටල් ඒකාබද්ධතාවය ගැඹුරු කිරීම, දේශගුණික-අනුකූල මූල්‍යකරණය පුළුල් කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ දැඩි යහපාලන ප්‍රමිතීන් පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

තීරණයකටම අන්තර්ගත විය යුතු අංශයන්හි ව්‍යුහගත කරුණක් ලෙස මෙම පාරිසරික බලපෑම් සැලකිල්ලට ගනු ඇත.

බැංකුව සිය පාරිසරික සහ සාමාජීය කළමනාකරණ පද්ධතීන් තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු යෙදූ අතර කාලගුණික අවදානම් තක්සේරුව ණය විශ්ලේෂණය සහ පසු විපරම් කාර්යයන් හිදී සැලකිල්ලට ගනු ලැබේ. ස්ව කැමැත්තෙන්ම බැංකුව වෙළඳපළ තත්ත්වයන් අනුව අනුගතවෙමින් තිරසාරකත්ව වාර්තාකරණයට අදාලවන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) S1 සහ S2 වෙත අනුගතවෙමින් මෙම වසරේදී අදාළ වාර්තාකරණන් ඉදිරිපත් කර ඇත.

පුනර්ජනනීය බලශක්තිය සහ හරිත ණය ලබාදීම උදෙසා බැංකුව අඛණ්ඩව කැපවූයේ, SLFRS S1 සහ S2 ප්‍රමිතීන් ක්‍රමානුකූලව අපගේ වර්තාකරණයන් සහ අවදානම් කළමනාකරණ රාමු තුළට ඇතුලත් කරමින්ය. විභිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කරමින් නවතම ප්‍රවණතාවයන් වන තිරසාර ප්‍රමිතීන්ට අනුව වාර්තාකරණය සිදුකරමින් තිරසාර මූලධර්මයන්ට අනුකූලව ණයදීම, ප්‍රාග්ධන කලමනාකරණය, උපායමාර්ගික තීරණ, ශක්තිමත් යහපාලනය සහ දැනුවත් වූ තොරතුරු ලබාදීම යන අංශයන් සවිමත් කරන ලදී. ශ්‍රී ලංකාවේ පළමු පෙව් හායන හර කාඩ්පත් නිකුතුව මගින් අපගේ මෙම පරිසර හිතකාමී තිරසාර කැපවීම් තවදුරටත් ප්‍රායෝගිකව ක්‍රියාවේ යොදවන ලදී.

තවත් වැදගත් කාර්යභාරයක් ලෙස සැලකිය හැක්කේ රු. බිලියන 20.0 ක් වටිනා මෙතෙක් නිකුත් කල විශාලතම තිරසාර බැඳුම්කර නිකුතුවයි. එම අරමුදල් ඉහල අගයන් සහිත පාරිසරික සහ සාමාජීය වැදගත්කමකින් යුත් ව්‍යාපෘති සඳහා සපයනු ලැබේ. මේ නිකුතුව මගින් බැංකුවේ ප්‍රාග්ධන තත්ත්වය ශක්තිමත් කර ගන්නා අතරම සාමාජීය සහ පාරිසරික වශයෙන් වැදගත්කමක් සහිත ව්‍යාපෘති උදෙසා අවශ්‍ය මූල්‍ය පදනම සැපයීමටද බැංකුවට හැකියාව ලැබේ.

ජාතියේ මහා පහන් ටැඹ ලෙස උපායමාර්ගික පරිවර්තනයක

විවිධ වූ වර්ණ සහිත පැතිකඩ සමූහයක් ලෙස බැංකුව සතුව පවත්නා විවිධ අංශ සහ ක්ෂේත්‍ර පුරා විහිදුණු හැකියාවන් සහ ශක්‍යතාවයන් සමූහය ගෙනහැර දැක්විය හැකිය. ඉදිරි ගමන් මඟ දෙස අප අවධානය යොමු කරන විට අපගේ මූලික අවධානය යොමු වන අංශ ලෙස ප්‍රාග්ධන ශක්තිමත්භාවය රැක ගැනීම, ඩිජිටල්කරණය මුසු ඒකාබද්ධ කිරීම් වැඩි කිරීම, කාලගුණික සාධක මූලික කොටගත් මූල්‍යකරණය වර්ධනය කිරීම සහ දැඩි යහපාලන ප්‍රමිතීන් අනුගමනය කිරීම සඳහන් කළ හැකිය. මෙම සියලු දේ අපගේ මූල්‍යකරණය, මෙහෙයුම්, ඩිජිටල්කරණය, තිරසාරභාවය යන පැතිකඩයන් ඔස්සේ අපව මෙහෙයවමින් ශ්‍රී ලංකාවේ ඉදිරි අනාගත ප්‍රගතිය උදෙසා බැංකුවේ දායකත්වය ලබා දීමට දිරි දෙනු ඇත.

ඩිජිටල් නවෝත්පාදනයන්, නිරතුරුව වෙනස් වන ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන්, අලුතින් හඳුන්වා දෙන නියාමනයන් සහ තිරසාර ප්‍රමිතීන් මත මූල්‍ය පරිසරය සීඝ්‍රයෙන් විකාශනය වේ. එබැවින් ශ්‍රී ලංකා බැංකුකරණයේ සහ අනාගත මූල්‍ය වෙළඳපළේ උන්නතිය උදෙසා අප නිසි ආකාරයෙන් සූදානම්ව ස්ථානගත වන බව සනාථ කරමින් අපගේ මෙහෙවර සහ දැක්ම යළිත් අර්ථ දක්වන්නට යෙදුණි. අපගේ 2026 - 2030 උපායමාර්ගික සැලැස්ම, ගතික සහ විකාශනයට ලක්වන මූල්‍ය වෙළඳපළ තත්ත්වයන්, නියාමනයන් සහ තාක්ෂණය මඟින් ඇති වන බලපෑම් උදෙසා බැංකුව අනුගත වෙමින් ඒ මඟින් පැන නඟින අභියෝග වලට නොසැලී මුහුණ දෙමින් ඉදිරියට යාමට අවශ්‍ය උපායමාර්ග සහ ක්‍රියා මාර්ග නිසි පරිදි ඇතුළත් කර සකස් කරන ලදී. මෙම උපායමාර්ගික සැලැස්මේ ප්‍රධාන අංගයන් ලෙස යහපාලනය වෙත විශේෂ අවධානයක් යොමු කර ඇත. වගවීම, සුපරීක්ෂණය සහ අවදානම් අංශ හඳුනා ගැනීම ශක්තිමත් කිරීම තුළින් පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය වැඩි කිරීම, දිගු කාලීන වටිනාකම් ආරක්ෂා කිරීම සහ ගතික වෙළඳපළ තත්ත්වයන් තුළදී ශ්‍රී ලංකා ආර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම වෙත අපගේ අවධානය යොමු කර ඇත. අප සතු ශක්තිය සහ බලය සමබර සහ ස්ථායීව තිරසාර ලෙස ඉදිරියටත් පවත්වා ගෙන යාම තහවුරු කර ගැනීමට ශක්තිමත් අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග, සමෝධානික ණය දීමේ ක්‍රමවේදයන් සහ විචක්ෂණශීලී ප්‍රාග්ධන කළමනාකරණය උපකාරී වේ.

ඉදිරි අනාගතය වෙත පියනඟන ගමනේදී ජාතික සංවර්ධනය, පුළුල් වූ බැංකුකරණ කටයුතු මත රඳා පවතින බවට අපි විශ්වාස කරමු. එබැවින් සැමොම ඇතුළත් නව බැංකුකරණය මතින් ප්‍රගතිය සහ සාර්ථකත්වය ළඟා කර ගත හැකි බැංකුකරණ සේවාවක් ඇති කිරීම අපගේ අභිප්‍රායවේ. මේ අනුව අපගේ ඩිජිටල්කරණ පරිවර්තනයන් වේගවත් කිරීම ගනුදෙනුකාර මූලික නවෝත්පාදනය ඉහළ නැංවීම මෙන්ම ණය සහ අවදානම් කළමනාකරණ පිළිවෙත් ප්‍රශස්තකරණය මත ශක්තිමත් වර්ධනයක් ඉලක්කගත කෙරේ. ඊට සමගාමීවම අපගේ ජාතික වගකීම් ඉටු කිරීමට කැපවෙමින් පුද්ගලයන් බල ගැන්වීම, ව්‍යාපාර කටයුතුවල අඛණ්ඩතාවය තහවුරු කිරීම සහ දිවයින සිසාරා මෙන්ම රටින් පිටතද සිටින ප්‍රජාවේ දියුණුවට සහාය දැක්වීම සිදු කරනු ඇත.

අනාගත බැංකුකරණයේ දී වෙනස්වන පරිසරයට අනුගතව ක්‍රියා කල හැකි, උසස් කාර්යසාධන හැකියාවකින් යුත් කණ්ඩායමක් හරහා සියලු පාර්ශ්වකරුවන්ට වටිනාකම් ජනනය කිරීමට බැංකුව කටයුතු කරනු ඇත. ශක්තිමත් යහපාලනය පදනම වශයෙන්ද තිරසාරකත්වය මාර්ග දර්ශකය වශයෙන් ද සලකමින් කටයුතු කරන ලංකා බැංකුව, ශ්‍රී ලංකා මූල්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් ඇප කැපවෙමින් ඉදිරියටත් කටයුතු කරනු ඇත.

අපගේ වටිනා පාර්ශ්වකරුවන් ඇගයීම

ඉතාමත් වටිනා සන්ධිස්ථානයන් සහ ජයග්‍රාහී සටහන් රාශියක් අත්පත් කරගත් වසරක් නිමා කිරීම වෙනුවෙන් සියලු දෙනා වෙතම ස්තූති පූර්වක වීමට මම අදහස් කරමි. අපගේ සභාපතිතුමන් වන කාවින්ද ද සොයිසා මැතිතුමන් ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඔවුන්ගේ විචක්ෂණශීලී සහ දූරදර්ශී නායකත්වය වෙනුවෙන් මගේ හදපිරි ප්‍රණාමය පුදකරමි.

කීර්තිමත් දීර්ඝ බැංකු සේවා කාල පරිච්ඡේදයකින් පසුව විශ්‍රාම ලත් හිටපු මහා කළමනාකාරතුමන් වන රසල් ෆොන්සේකා මහතා වෙත මගේ කෘතඥතාවය පල කිරීමට මෙය අවස්ථාවක් කරගනු කැමැත්තෙමි. ඔහුගේ දූරදර්ශී නායකත්වය සහ නොසැලෙන කැපවීම බැංකුවේ සාර්ථකත්ව ගමන් මඟේ නොමැකෙන සටහනකි.

තවද, මගේ අවංක ස්තූතිය ආයතනික සහ විධායක කළමනාකාරිත්ව මණ්ඩලයට, වෘත්තීය සමිති සහ සමස්ත ලංකා බැංකු කණ්ඩායම වෙතට පිරිනමන්නේ ඔවුන්ගේ අචල කැපවීම සහ විශිෂ්ටත්වය උදෙසා වන නිරන්තර අධිෂ්ඨානය මත උපායමාර්ගයන් සාර්ථක ප්‍රතිඵල බවට පරිවර්තනය කිරීම වෙනුවෙන් ය.

මුදල් අමාත්‍යතුමා, ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමා, විගණකාධිපතිතුමා සහ එම සියලු ආයතනවල කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පල කරනු කැමැත්තෙමි. ඔවුන් විසින් ලබාදුන් වටිනා මඟ පෙන්වීම් සහ සහයෝගය මම ඉතා අගය කොට සලකමි. බැංකුවේ මනා යහපාලනය පවත්වා ගෙන යාමට සහ අභියෝග හමුවේ නොසැලී කටයුතු කිරීමට එම ශක්තිය ඉවහල් විය.

දිනෙන් දින විශ්වාසදායී බැංකු සේවාවන් සැපයීම උදෙසා අපගේ ගෞරවනීය ගනුදෙනුකරුවන් වෙත අපි බැඳී සිටින්නෙමු. සුවිශේෂී බැංකුකරණ අත්දැකීම් ලබාදෙමින්, නිරන්තරයෙන් වෙනස් වන අවශ්‍යතා සම්පූර්ණ කරමින් සියලු පාර්ශ්වකරුවන් වෙත නව වටිනාකම් ලබාදීමට අපි කැපවෙමු.

රූබික් ඝනකයක පැති එකිනෙක සංයෝජනය කරමින් විවිධ හැඩතල සකස් කරන ආකාරයටම විවිධවූත්, බහුවිධවූත් අප සතු හැකියාවන් සහ සම්පත් විවිධ මානයන් ඔස්සේ දිශාගතකරමින් සහ යොදවමින් ප්‍රශස්තම කාර්යසාධනයන් ළඟාකර ගැනීමට අපි වෙහෙසෙමු. අප කෙරෙහි විශ්වාසය තබා ඇති සියලු පාර්ශ්ව වෙත විශිෂ්ට, තිරසාර වර්ධනයක් අත්පත් කරදීමට ලංකා බැංකුවේ අපි සියලු දෙනාම එකසේ කැපවෙන්නෙමු.



වයි ඒ ජයතිලක
මහා කළමනාකරු /
ප්‍රධාන විධායක නිළධාරී

2026 පෙබරවාරි 24.

අධ්‍යක්ෂ මණ්ඩලය



වමේ සිට සිටගෙන

ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය ලේකම්, ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්,
සුනිමල් වීරසූරිය මහතා විධායක නොවන අධ්‍යක්ෂ, **මහාචාර්ය (ඉංජිනේරු) ආනන්ද ජයවර්ධන** විධායක නොවන අධ්‍යක්ෂ,
ආර් එම් පී රත්නායක මහතා විධායක නොවන අධ්‍යක්ෂ, **කාවින්ද ද සොයිසා මහතා** සභාපති, විධායක නොවන අධ්‍යක්ෂ,
දර්ශන ගුණසේකර මහතා විධායක නොවන අධ්‍යක්ෂ



ආචාර්ය කපිල සේනානායක විධායක නොවන, නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ, **ජෙහාන් ඉස්මයිල් මහතා** විධායක නොවන අධ්‍යක්ෂ, **තුල්සි අළුවිහාරේ මහතා** විධායක නොවන අධ්‍යක්ෂ, **ශාමිනී රත්වත්තේ මහත්මිය** විධායක නොවන අධ්‍යක්ෂ, **දර්ශන් ජයරත්න මහතා** විධායක නොවන අධ්‍යක්ෂ, **ආචාර්ය අමල් ඉලේසිංහ** විධායක නොවන අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලය



කාවින්ද ද සොයිසා මහතා

සභාපති

විධායක නොවන අධ්‍යක්ෂ

GRI 2-11

කොළඹ කොටස් හුවමාරුවේ (CSE) ලැයිස්තුගත කිරීමේ රීති අනුව ස්වාධීන අධ්‍යක්ෂ සහ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී බැංකු සඳහා වන බැංකු පනතෙහි ආයතනික යහපාලනය පිළිබඳ උපදෙස් අනුව ස්වාධීන නොවන අධ්‍යක්ෂ.

පත්වීම ලද දිනය: 2024 නොවැම්බර් 04

නිපුණතා හා පළපුරුද්ද:

- කළමනාකරණය, නායකත්වය, උපායමාර්ගික සැලසුම්කරණය සහ යහපාලනය පිළිබඳ බැංකු ක්ෂේත්‍රයේ වසර 30 කට වැඩි පළපුරුද්දක් සහ විශේෂඥතාවයක් ඇති වෘත්තීය බැංකුකරුවෙකි.
- ආයතනික සහ ආයෝජන බැංකුකරණය, ප්‍රාග්ධන වෙළඳපළ, ව්කාබද්ධ කිරීම් සහ අත්පත් කර ගැනීම්, අවදානම් කළමනාකරණය සහ උපදේශන ක්ෂේත්‍රයන්හි අත්දැකීම් බහුලය.
- ශාඛා බැංකුකරණය, ඩිජිටල්කරණය, ව්‍යාපෘති මූල්‍ය, සංවර්ධන බැංකුකරණය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය දීම, අපනයන ණය ආයතන (ECA) මූල්‍යයනය, වෙළඳාම, මුදල් කළමනාකරණය, භාණ්ඩාගාර, අලෙවිකරණ, බැංකු මෙහෙයුම් සහ විගණනය පිළිබඳ මනා පළපුරුද්දක් ඇත.
- කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනපති උපාධිය විශිෂ්ට සාමාර්ථයක් සහ රන් පදක්කමක් සහිතව හිමිකර ගෙන ඇත.
- චික්සත් රාජධානියේ වරලත් කළමණාකරණ ගණකාධිකරණ ආයතනයේ (CIMA) අධි සාමාජිකත්වය ලබා ඇත.
- චික්සත් රාජධානියේ වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරී (CGMA) - AICPA සහ CIMA.
- චික්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ (CIM) අධි සාමාජිකත්වය දරනු ලබයි.
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) අධි සාමාජිකයෙකි.
- ශ්‍රී ලංකාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (CMA) අධි සාමාජික.
- ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ (SLID) සාමාජික.
- චිකාගෝ විශ්වවිද්‍යාලයේ බූත් ව්‍යාපාරික පාසලෙන් දත්ත සහ විශ්ලේෂණ සමඟ නායකත්වය පිළිබඳ විධායක අධ්‍යාපන වැඩසටහන සම්පූර්ණ කර ඇත.
- චික්සත් රාජධානියේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (ICAEW) සහ චික්සත් රාජධානියේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සංගමය (NEDA) චික්ව ප්‍රදානය කරන ලද ICAEW විධායක නොවන අධ්‍යක්ෂ සහතිකය හිමිකරගෙන ඇත.

පෙර පත්වීම්

- ශ්‍රී ලංකාවේ සිටි බෑන්ක් එන්.ඒ හි අධ්‍යක්ෂ සහ මෙරට ප්‍රධානී
- ජාතික සංවර්ධන බැංකුව (පෙර ABN AMRO නමින් හඳුන්වන ලදී), නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සහ සෙලාන් බැංකුවෙහි සේවය කර ඇත.
- ඇමරිකානු සහතිකලත් මහජන ගණකාධිකාරී ආයතනයේ (AICPA) මැදපෙරදිග, දකුණු ආසියා සහ උතුරු අප්‍රිකා (MESANA) කලාපීය සහභාගීත්ව සමූහයේ සභාපති.
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ප්‍රධාන පරීක්ෂක, උපපරිපාලක සහ උපදේශක.
- ශ්‍රී ලංකා ඇමරිකානු වාණිජ මණ්ඩලයේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ.
- චික්සත් රාජධානියේ කළමණාකරණ ගණකාධිකරණ ආයතනයේ (CIMA) ගෝලීය සාමාජිකත්ව මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සාමාජික තක්සේරුකරු සහ සාමාජික (CIMA ගෝලීය සාමාජිකත්ව මණ්ඩලයේ උප සභාපති).

වෙනත් පත්වීම්:

- ලංකා බැංකුව (යූ.කේ.) සමාගමේ සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ.
- ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගමේ සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ.
- ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගමේ සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ.
- BOC IT සොලූයුශන්ස් (පුද්ගලික) සමාගමේ සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ.
- ලංකා හොස්පිටල්ස් කෝපරේෂන්ස් පොදු සමාගමේ සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ.
- චික්සත් රාජධානියේ කළමණාකරණ ගණකාධිකරණ ආයතනයේ (CIMA) ගෝලීය කමිටු සාමාජික.
- කොළඹ විශ්වවිද්‍යාලයේ සහ රුහුණු විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධි සඳහා බාහිර කථිකාචාර්ය.



ආචාර්ය කපිල සේනානායක

විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

පත්වීම ලද දිනය: 2024 නොවැම්බර් 14

නිපුණතා හා පළපුරුද්ද:

- රාජ්‍ය සහ පෞද්ගලික අංශ උපායමාර්ගික සැලසුම්කරණය, මූල්‍යකරණය, කළමනාකරණය, නායකත්වය සහ පාලනය පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇත.
- ඕස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා ඇත.
- ජපානයේ හිටොට්සුබාෂි විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර උපායමාර්ග උපාධි පාසලෙන් රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හිමි කරගෙන ඇත.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) දෙවන පන්තියේ (ඉහළ අංශය) උපාධිය හිමි කරගෙන ඇත.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) සහ ශ්‍රී ලංකා පදනම් ආයතනයෙන් කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් ලබා ඇත.
- ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ (SLID) සාමාජික.

පෙර පත්වීම්

- ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ.
- ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලයේ නිල බලයෙන් පත් කරන ලද සාමාජික.
- සී/ස හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගමේ අධ්‍යක්ෂ.
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ.
- ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ.
- ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයේ අධ්‍යක්ෂ.
- ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ.
- මහා භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැඩබලන) සහ සහකාර අධ්‍යක්ෂ.
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ.

වෙනත් පත්වීම්:

- මුදල්, ආර්ථික සංවර්ධන, ක්‍රමසම්පාදන, සැලසුම්කරණ අමාත්‍යාංශයේ, මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්.



ජෙහාන් ඉස්මයිල් මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

කොළඹ කොටස් හුවමාරුවේ (CSE) ලැයිස්තුගත කිරීමේ රීති අනුව ස්වාධීන අධ්‍යක්ෂ සහ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී බැංකු සඳහා වන බැංකු පනතෙහි ආයතනික යහපාලනය පිළිබඳ උපදෙස් අනුව ස්වාධීන නොවන අධ්‍යක්ෂ.

පත්වීම ලද දිනය: 2024 පෙබරවාරි 07

නිපුණතා හා පළපුරුද්ද:

- ප්‍රධාන වශයෙන් ආසියාවේ, බටහිර අර්ධ ගෝලයේ සහ මැදපෙරදිග රටවල වාණිජ හා ආයෝජන බැංකුකරණය පිළිබඳ වසර 42 කට වැඩි පළපුරුද්දක් ඇත.
- ප්‍රධාන පද්ධති ආශ්‍රිත ව්‍යාපෘති සම්බන්ධීකරණය කර ඇති අතර ආයෝජන බැංකුකරණය ආශ්‍රිත මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දරා ඇත.
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ හිටපු බාහිර කථිකාචාර්යවරයෙකි.
- කොළඹ විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී (රසායන විද්‍යාව) ගෞරව උපාධියක් ලබා ඇත.
- එක්සත් රාජධානියේ වරලත් බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකි.
- INSEAD සහ Cranfield බාහිර කළමනාකරණ සහ නායකත්ව සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වී ඇත.
- එක්සත් රාජධානියේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය (ICAEW) සහ එක්සත් රාජධානියේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සංගමය (NEDA) එක්ව ප්‍රදානය කරන ලද ICAEW විධායක නොවන අධ්‍යක්ෂ සහතිකය සම්පූර්ණ කර ඇත.
- ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ (SLID) සාමාජික.

කලින් දැරූ තනතුරු

- එම් පවර් කැපිටල් ලිමිටඩ් හි අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී.
- ෆස්ට් කැපිටල් හෝල්ඩින්ග්ස් පීඑල්සී හි අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී.
- HSBC කොලොම්බියාවේ සහ HSBC සෞදි අරාබියේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී.
- SABB සෙක්‍යුරිටීස් (HSBC සමූහය, සෞදි අරාබිය) හි ප්‍රධාන විධායක නිලධාරී.
- ඉන්දුනීසියාවේ HSBC හි ආයතනික බැංකුකරණයේ ජ්‍යේෂ්ඨ උපසභාපති.
- ගෝලීය සම්බන්ධතා කළමනාකරු - ආයතනික බැංකුකරණය HSBC හොංකොං.

වෙනත් පත්වීම්:

- එම් පවර් කැපිටල් සමාගමේ සභාපති/ විධායක අධ්‍යක්ෂ.
- එම් පවර් කැපිටල් සෙකියුරිටීස් සමාගමේ සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ.
- හොටෙල්ස් කලම්බු (1963) සමාගමේ සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ.
- කොමන් වෙල් (පුද්ගලික) සමාගමේ විධායක අධ්‍යක්ෂ.
- කපිටාන් (පුද්ගලික) සමාගමේ විධායක අධ්‍යක්ෂ.
- ලිට්ල් ජිම් ලංකා (පුද්ගලික) සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂ.
- මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පොදු සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂ.
- එම් පවර් සමූහයේ කළමනාකරණ අධ්‍යක්ෂ.



ආචාර්ය අමල් ඉලේසිංහ
විධායක නොවන අධ්‍යක්ෂ

කොළඹ කොටස් හුවමාරුවේ (CSE) ලැයිස්තුගත කිරීමේ රීති අනුව ස්වාධීන අධ්‍යක්ෂ සහ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී බැංකු සඳහා වන බැංකු පනතෙහි ආයතනික යහපාලනය පිළිබඳ උපදෙස් අනුව ස්වාධීන නොවන අධ්‍යක්ෂ.

පත්වීම ලද දිනය: 2024 දෙසැම්බර් 06

නිපුණතා හා පළපුරුද්ද:

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ උපායමාර්ගික කළමනාකරණය පිළිබඳ දශක තුනකට වැඩි පළපුරුද්දක් සහ ඉහළ සුදුසුකම් ඇති වෘත්තිකයෙකි.
- මැලේසියාවේ විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලයෙන් තොරතුරු විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය ලබා ඇත.
- කොළඹ විශ්වවිද්‍යාලයේ පරිඝනක පාසල (UCSC) වෙතින් තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හිමිය.
- කැලණිය විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

- කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක තාක්ෂණ ආයතනයෙන් පරිගණක තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හදාරා ඇත.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ගණිතය සහ සංඛ්‍යානය පිළිබඳ ගෞරව උපාධිය ලබා ඇත.
- ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ (SLID) සාමාජික.
- එක්සත් රාජධානියේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (ICAEW) සහ එක්සත් රාජධානියේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සංගමය (NEDA) එක්ව ප්‍රදානය කරන ලද ICAEW විධායක නොවන අධ්‍යක්ෂ සහතිකය හිමිකරගෙන ඇත.

පෙර පත්වීම්

- ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සහ මහජන බැංකුවේ සේවය කර ඇත.
- ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික.
- බැංකු ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරීන්ගේ සංසදයේ ලේකම්.
- ඉලෙක්ට්‍රොනික ගෙවීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ කමිටුවේ සාමාජික.
- ජාතික ගෙවීම් කවුන්සිලයේ සාමාජික.
- මහ බැංකුවේ පත් කරන ලද LankaQR සහ Blockchain තාක්ෂණ කමිටුව මත පදනම් වූ Shared KYC ක්‍රියාත්මක කිරීමේ කමිටු වල සාමාජික.
- ශ්‍රී ලංකා පරීක්ෂනක සංගමයේ (CSSL) ලේකම්.

වෙනත් පත්වීම්:

- බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ (BCS) සහ ශ්‍රී ලංකා පරිගණක සංගමයේ (CSSL) සාමාජික.
- ශ්‍රී ලංකා පරීක්ෂනක සංගමයේ (CSSL) හි භාණ්ඩාගාරික.
- විධායක වෘත්තීය සංගමය (OPA) හි විධායක සභා සාමාජික.
- BOC IT සොලූයුශන්ස් (පුද්ගලික) සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂ.



ආර් එම් පී රත්නායක මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

කොළඹ කොටස් හුවමාරුවේ (CSE) ලැයිස්තුගත කිරීමේ රීති අනුව ස්වාධීන අධ්‍යක්ෂ සහ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී බැංකු සඳහා වන බැංකු පනතෙහි ආයතනික යහපාලනය පිළිබඳ උපදෙස් අනුව ස්වාධීන නොවන අධ්‍යක්ෂ.

පත්වීම ලද දිනය: 2024 දෙසැම්බර් 20

නිපුණතා හා පළපුරුද්ද:

- රාජ්‍ය අංශයේ වසර 25 කට වඩා වැඩි කීර්තිමත් සේවාවක් සහ බහුපාර්ශ්වික සංවර්ධන බැංකුකරණය, ද්විපාර්ශ්වික සාකච්ඡා, සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය ආයතන සමඟ සම්බන්ධීකරණය ඇතුළුව යහපාලනය සහ අධීක්ෂණය පිළිබඳ පුළුල් අත්දැකීම් සහිතය.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත.
- නෝර්වේහි කෘෂිකාර්මික විශ්වවිද්‍යාලයෙන් කෘෂිකර්මය පිළිබඳ විද්‍යාපති උපාධියක් හිමිකර ගෙන ඇත.
- බහු පාර්ශ්වික සංවර්ධන බැංකුකරණය සහ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශීය අරමුදල් ඒකරාශී කිරීම පිළිබඳ ප්‍රවීණත්වය ලබා ඇත.
- ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ (SLID) සාමාජික.
- එක්සත් රාජධානියේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (ICAEW) සහ එක්සත් රාජධානියේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සංගමය (NEDA) එක්ව ප්‍රදානය කරන ලද ICAEW විධායක නොවන අධ්‍යක්ෂ සහතිකය හිමිකරගෙන ඇත.

පෙර පත්වීම්

- මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.
- ලංකා බැංකුවේ සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ.
- කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගමේ වැඩබලන සභාපති.
- ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සභාපති.
- ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අධ්‍යක්ෂ.
- චීන මහජන සමූහාණ්ඩුවේ බීජිං හි ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ විධායක නොවන අධ්‍යක්ෂ.
- මහජන බැංකුවේ අධ්‍යක්ෂ.
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ.
- ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ.
- ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ.
- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සාමාජික
- දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ නිල බලයෙන් පත්වූ සභාපති.

වෙනත් පත්වීම්:

- BOC ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගමේ සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ.



දර්ශන ගුණසේකර මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

කොළඹ කොටස් හුවමාරුව (CSE) ලැයිස්තුගත කිරීමේ රීති සහ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී බැංකු සඳහා වන බැංකු පනතෙහි ආයතනික යහපාලනය පිළිබඳ උපදෙස් අනුව ස්වාධීන අධ්‍යක්ෂ.

පත්වීම් ලද දිනය:

2025 අගෝස්තු 13 වන දින ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

2026 මාර්තු දින සිට බලපැවැත්වෙන පරිදි ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

නිපුණතා හා පළපුරුද්ද:

- වසර 25 කට වැඩි අංශ ගණනාවක නායකත්ව පළපුරුද්දක් ඇති ප්‍රවීණ ආයතනික විධායක නිලධාරියෙකි.
- ආයතනික මූල්‍ය, ඒකාබද්ධ කිරීම් සහ අත්පත් කර ගැනීම්, ව්‍යාපාර පරිවර්තනය, ආයෝජක සබඳතා, ව්‍යවසාය අවදානම් කළමනාකරණය, විශ්ලේෂණ සහ ඩිජිටල් මූල්‍යකරණය පිළිබඳ විශේෂඥතාව දරයි.
- චක්සත් රාජධානියේ කළමණාකරණ ගණකාධිකරණ ආයතනයේ (CIMA) සහ වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) අධි සාමාජිකත්වය දරණ අතර ඇමරිකානු සහතිකලත් මහජන ගණකාධිකාරී ආයතනයේ (AICPA) වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරීවරයෙකි (CGMA).
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත.
- චක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ (CIM) පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හිමිය.
- ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ (SLID) සාමාජිකයෙකි.

පෙර පත්වීම්

- ඩිල්මා ලංකා ටී පීල්සී හි ප්‍රධාන මූල්‍ය නිලධාරී.

වෙනත් පත්වීම්:

- ඩිල්මා ලංකා ටී පීල්සී හි සමූහ මූල්‍ය අධිපති
- පටියාගම ස්ටේට්ස් (පුද්ගලික) සමාගමේ විධායක අධ්‍යක්ෂ.
- එම්ජේවීපී බෙවරේජ් ඈන්ස් සමාගමේ විධායක අධ්‍යක්ෂ
- එම්ජේවීපී එපිග්‍රෝ රනීවබල්ස් (පුද්ගලික) සමාගමේ විධායක අධ්‍යක්ෂ.
- එම්ජේවීපී කෝපරේට්ස් සර්විසස් (පුද්ගලික) සමාගමේ විධායක අධ්‍යක්ෂ.
- ටීටයිම් රොක්ස් (පුද්ගලික) සමාගමේ විධායක අධ්‍යක්ෂ.
- ටීටයිම් රොක්ස් (නවසීලන්තය) සමාගමේ විධායක අධ්‍යක්ෂ.
- කහවත්ත ප්ලාන්ටේෂන්ස් පීල්සී හි විධායක නොවන අධ්‍යක්ෂ
- තලවකැලේ ටී එස්ටේට්ස් පීල්සී හි විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ
- ශ්‍රී ලංකා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ (ICCSL) අඛණ්ඩතාව සහ ආචාරධර්ම කමිටු සභාපති සහ ප්‍රතිපත්ති උපදේශන විධායක කමිටු සාමාජික.
- චක්‍ර සූත්‍ර (පුද්ගලික) සමාගමේ මූල්‍ය අධ්‍යක්ෂ
- ප්‍රධාන විධායක නිලධාරී - පුනර්ජනනීය බලශක්ති අංශය (MJF සමූහය)



තුල්සි අළුවිහාරේ මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

කොළඹ කොටස් හුවමාරුව (CSE) ලැයිස්තුගත කිරීමේ රීති සහ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී බැංකු සඳහා වන බැංකු පනතෙහි ආයතනික යහපාලනය පිළිබඳ උපදෙස් අනුව ස්වාධීන අධ්‍යක්ෂ

පත්වීම් ලද දිනය : 2025 සැප්තැම්බර් 16

නිපුණතා හා පළපුරුද්ද:

- ඒකාබද්ධ කිරීම් සහ අත්පත් කර ගැනීම්, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන්, ගනුදෙනු උපදේශන සහ ප්‍රතිව්‍යුහගත කිරීම් පිළිබඳ විශේෂඥ, ආයතනික වටිනාකම් නිර්මාණය කිරීමේ වසර 25 කට වැඩි ජාත්‍යන්තර අත්දැකීම් ඇති ආයෝජන වෘත්තිකයෙකි.
- චක්සත් රාජධානි යේ බටහිර ලන්ඩන් විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධිධාරියෙකි.
- කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.
- කෝපන්හේගන්, ස්ටොක්හෝම්, ඩබ්ලින්, රෝමය, වෝර්සෝ සහ අබුඩාබි යන නගරවල පැවති PwC උපදේශන - විශ්වවිද්‍යාල වැඩසටහනේ කළමනාකරුවන් සඳහා ඒකාබද්ධ කිරීම් සහ අත්පත් කර ගැනීම් පිළිබඳ පුහුණුවක් පවත්වන ලදී.

පෙර පත්වීම්

- PwC - ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා ඒකාබද්ධ කිරීම් සහ අත්පත් කර ගැනීම් අංශයේ ප්‍රධානි, අධ්‍යක්ෂ.

වෙනත් පත්වීම්:

- CHEC පොට්සිටි කොළඹ (පුද්ගලික) සමාගමේ නියෝජ්‍ය කළමනාකරණ අධ්‍යක්ෂ.
- අබාන්ස් මූල්‍ය පීල්සී හි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ.
- එක්ස්පැක් කොරගේටඩ් කාටන්ස් පීල්සී හි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ.

අධ්‍යක්ෂ මණ්ඩලය



ශාමිනී රත්වත්තේ මහත්මිය
විධායක නොවන අධ්‍යක්ෂ

කොළඹ කොටස් හුවමාරුව (CSE) ලැයිස්තුගත කිරීමේ රීති සහ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී බැංකු සඳහා වන බැංකු පනතෙහි ආයතනික යහපාලනය පිළිබඳ උපදෙස් අනුව ස්වාධීන අධ්‍යක්ෂ.

පත්වීම ලද දිනය : 2025 සැප්තැම්බර් 16

නිපුණතා හා පළපුරුද්ද:

- චික්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය දරයි.
- කොළඹ විශ්වවිද්‍යාලය ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත.
- 2024 දී "කළමනාකරණයේ ජයග්‍රාහී කාන්තාවක් - (සොන්ටා) ලෙස හඳුනා ගන්නා ලදී.
- ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ (SLID) සාමාජික.

පෙර පත්වීම්

- ශ්‍රී ලංකාවේ මාස් හෝල්ඩින්ග්ස් හි වසර 16 කට වැඩි කාලයක් ජ්‍යේෂ්ඨ මූල්‍ය, කළමනාකරණය සහ විධායක භූමිකාවන් හෙබවීය.
- පෝන් කීල්ස් පීල්සී හි විධායක නොවන අධ්‍යක්ෂ.
- සිලෝන් කොල්ඩ් ස්ටෝස් පීල්සී හි විධායක නොවන අධ්‍යක්ෂ.
- බීපීපීවිල් හොල්ඩින් පීවිල්සී හි විධායක නොවන අධ්‍යක්ෂ
- RECOFTC - ජන සහ වනාන්තර සඳහා වූ මධ්‍යස්ථානය (තායිලන්තය) හි විධායක නොවන අධ්‍යක්ෂ

වෙනත් පත්වීම්:

- ජාතික ණය ඇපකර (පුද්ගලික) ආයතනය හි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ.
- කන්විනියන්ස් ෆුඩ් (ලංකා) පොදු සමාගමේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
- ග්‍රීන්පීස් දකුණු ආසියා (පුද්ගලික) සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂ
- ෆෙයාර්ෆස්ට් රක්ෂණ සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂ
- සුනේරා පදනමේ භාරකරු



දර්ශන් ජයරත්න මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

කොළඹ කොටස් හුවමාරුව (CSE) ලැයිස්තුගත කිරීමේ රීති සහ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී බැංකු සඳහා වන බැංකු පනතෙහි ආයතනික යහපාලනය පිළිබඳ උපදෙස් අනුව ස්වාධීන අධ්‍යක්ෂ.

පත්වීම ලද දිනය :2025 සැප්තැම්බර් 26

නිපුණතා හා පළපුරුද්ද:

- මූල්‍ය වෙළඳපළ කළමනාකරණය, විදේශ විනිමය සහ බැඳුම්කර වෙළඳාම, මුදල් වෙළඳපළ, ආයෝජන කළමනාකරණය, ප්‍රාග්ධන වෙළඳපළ සහ ව්‍යුහගත නිෂ්පාදන පිළිබඳ විශේෂඥතාවක් ඇති, ලොව ප්‍රමුඛ පෙළේ ජාත්‍යන්තර බැංකුවල වසර 31 කට වැඩි පළපුරුද්දක් ඇති වෘත්තීය බැංකුකරුවෙකි.
- ඕස්ට්‍රේලියාවේ බටහිර සිඩ්නි විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධිධාරියෙකි.

පෙර පත්වීම්

- ශ්‍රී ලංකාවේ ස්ටැන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුවේ මූල්‍ය වෙළඳපළ අංශයේ ප්‍රධානි.



සුනිමල් වීරසූරිය මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

කොළඹ කොටස් හුවමාරුව (CSE) ලැයිස්තුගත කිරීමේ රීති සහ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී බැංකු සඳහා වන බැංකු පනතෙහි ආයතනික යහපාලනය පිළිබඳ උපදෙස් අනුව ස්වාධීන අධ්‍යක්ෂ.

පත්වීම ලද දිනය : 2025 ඔක්තෝබර් 07

නිපුණතා හා පළපුරුද්ද:

- ඩිජිටල් ගෙවීම්, සැපයුම්, ස්වයංක්‍රීය නිෂ්කාශනාගාර/ ගෙවීම් යටිතල පහසුකම්, තොරතුරු ආරක්ෂාව, ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය, මුදල් කළමනාකරණය, ආයෝජන බැංකුකරණය, නිෂ්පාදනය සහ පුහුණුව යනාදී ක්ෂේත්‍රයන්හි වසර 33 කට වැඩි පළපුරුද්දක් ඇති පළපුරුදු තාක්ෂණ වෘත්තිකයෙකි.
- තාක්ෂණික උපායමාර්ග, ඩිජිටල් පරිවර්තනය, තාක්ෂණ කළමනාකරණය, තාක්ෂණ හුවමාරුව, ව්‍යාපාර උපායමාර්ග සහ නවෝත්පාදන කෙරෙහි පුළුල් ප්‍රවීණතාවක් හිමිය.

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පළමු පන්තියේ ගෞරව උපාධිය ලබා ඇත.
- පශ්චාත් උපාධි කළමනාකරණය ආයතනයේ (PIM) ශාස්ත්‍රපති උපාධිධාරියෙකි.
- තායිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනයේ (AIT) තාක්ෂණ කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත.
- ඕස්ට්‍රේලියාවේ කර්ටින් තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධියක් හිමිකර ගෙන ඇත.
- චීක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ආයතනයේ (CMI) අධි සාමාජිකත්වය දරයි.
- සිංගප්පූරුවේ ජාත්‍යන්තර සමථකරණ ආයතනය (SIMI), සිංගප්පූරුවේ සෙගා මෙඩ්ටේශන් සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර විකල්ප ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානය (IADRC) පිළිගත් ජාත්‍යන්තර මැදිහත්කරු

පෙර පත්වීම්

- ලංකාපේ (පුද්ගලික) සමාගමේ හිටපු මහා කළමනාකරු/ ප්‍රධාන විධායක නිලධාරී.
- සිංගප්පූරුවේ ට්‍රාන්ස්නැෂනල් සමූහයේ ජ්‍යේෂ්ඨ උප සභාපති - තාක්ෂණය සහ නවෝත්පාදනය.
- සිංගප්පූරුවේ ට්‍රාන්ස්නැෂනල් සමූහයේ නේවාසික අධ්‍යක්ෂ
- ට්‍රාන්ස්නැෂනල් ටෙක්නොලජි සොලුයුශන්ස් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ.
- ට්‍රාන්ස්නැෂනල් ලංකා (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ.
- ප්‍රොන්ටෝ ලංකා (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ.
- ශ්‍රී ලංකාව පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ අධ්‍යක්ෂ (SLCERT).

වෙනත් පත්වීම්:

- සිනාප්සිස් සමාගමේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
- සිංගප්පූරුවේ ටෙක්ඩොට් සොලුයුශන්ස් (පුද්ගලික) සමාගමේ විධායක අධ්‍යක්ෂ



මහාචාර්ය (ඉංජිනේරු) ආනන්ද ජයවර්ධන
විධායක නොවන අධ්‍යක්ෂ

කොළඹ කොටස් හුවමාරුව (CSE) ලැයිස්තුගත කිරීමේ රීති සහ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී බැංකු සඳහා වන බැංකු පනතෙහි ආයතනික යහපාලනය පිළිබඳ උපදෙස් අනුව ස්වාධීන අධ්‍යක්ෂ.

පත්වීම් ලද දිනය: 2025 නොවැම්බර් 14

නිපුණතා හා පළපුරුද්ද:

- රාජ්‍ය ආයතනවල සහ පෞද්ගලික ආයතනවල බැංකු, මූල්‍ය, නිෂ්පාදන, රක්ෂණ, අධ්‍යාපනය සහ විද්‍යාව හා තාක්ෂණය යන ක්ෂේත්‍රවල ආයතනික යහපාලනය පිළිබඳ පුළුල් අත්දැකීම් ඇති කැපී පෙනෙන ශාස්ත්‍රීය නායකයෙකු සහ ආයතනික පෞරුෂයකි.
- වරලත් සහ ජාත්‍යන්තර වෘත්තීය ඉංජිනේරුවරයකු වේ.
- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ අධි සාමාජිකයෙකි.
- ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකත්වය දරයි.
- ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමියේ අධි සාමාජික
- ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ යාවජීව සාමාජික
- ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ උපාධිදාර් සාමාජිකයෙකි.
- ශ්‍රී ලංකා ව්‍යුහාත්මක ඉංජිනේරුවන්ගේ සංගමයේ සාමාජික.

පෙර පත්වීම්

- කොමර්ෂල් බැංකුවේ සභාපති
- මොරටුව විශ්වවිද්‍යාලයේ උපකුලපති.
- උපකුලපති කමිටුවේ සභාපති.
- ජාතික විද්‍යා පදනමේ අධ්‍යක්ෂ ජනරාල්.
- CBC ටෙක් සොලුයුශන් සමාගමේ සභාපති.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජික.
- සියෙරා කේබල්ස් පීල්සී හි, සර් ආතර් සී ක්ලාක් නවීන තාක්ෂණ ආයතනය, ජාතික විද්‍යා පදනම, ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, මිලෝදා මූල්‍ය අධ්‍යයන ඇකඩමිය, විවෘත විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලය සහ ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය යන ආයතනවල පාලක මණ්ඩල/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි.
- මොරටුව විශ්වවිද්‍යාලයේ ව්‍යවසායකත්වය පිළිබඳ ජාතික සංවර්ධන බැංකුවෙන් හඳුනාගත් මහාචාර්යවරයෙකි.
- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සභාපති.

වෙනත් පත්වීම්:

- මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යේෂ්ඨ මහාචාර්ය
- HNB ඇෂුවරන්ස් පීල්සී හි ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ
- මදර් ලංකා පදනමේ විධායක නොවන අධ්‍යක්ෂ
- ප්‍රයිම් ලෑන්ඩ් රෙසිඩන්ට් පොදු සමාගමේ ස්වාධීන නොවන විධායක අධ්‍යක්ෂ
- ශ්‍රී ලංකා මහ බැංකුවේ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්ව කමිටුවේ සාමාජික.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආයතනික යහපාලනය කමිටුවේ සාමාජික



ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය
ලේකම්, ලංකා බැංකුව/
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

විස්තර, පිටු අංක 42 හි දැක්වේ.

ආයතනික කළමනාකාරීත්වය



වමේ සිට දකුණට අසුන් ගෙන

ඩබ් බී පී රත්නායක මහත්මිය, ප්‍රියාල් සිල්වා මහතා, ආර් එම් එන් ජීවන්ත මහතා

වමේ සිට දකුණට සිට ගෙන

පී මදුවන්ත ලියනගේ මහතා, කුමුදිනී ජේ යෝගරත්නම් මහත්මිය, බුද්ධික සීලනාථ මහතා, රෝහණ කුමාර මහතා, හදූ කළ්‍යාණප්‍රිය ගුරුසිංහ මහතා, සම්පත් පෙරේරා මහතා, රොෂෙල් ප්‍රනාන්දු මහත්මිය, කේ ඒ අජිත් කරුණාරත්න මහතා



වමේ සිට දකුණට අසුන් ගෙන

වයි ඒ ජයතිලක මහතා, ජයශාන්ත ගොඩකන්ද මහතා, ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය

වමේ සිට දකුණට සිට ගෙන

එස් සිවන්ජන් මහතා, ප්‍රියන්ති විජේසේකර මහත්මිය, සමීර ඩී ලියනගේ මහතා, දම්ම විජයවර්ධන මහතා, රුවන් සමරක්කොඩි මහතා, එම් පී රුවන් කුමාර මහතා, ශෂී ජයසිංහ මහතා, සුරේෂ් පෙරේරා මහතා, සුහානි නානායක්කාර මහත්මිය

ආයතනික කළමනාකාරිත්වය



වයි ඒ ජයතිලක මහතා

මහා කළමනාකරු/
ප්‍රධාන විධායක නිලධාරී

2025 අගෝස්තු මාසයේදී වැඩ බලන මහා කළමනාකරු ලෙස පත් කරනු ලැබූ අතර, 2026 පෙබරවාරි මාසයේ දී එම තනතුරේ ස්ථිර කරන ලදී.

මූලික බැංකු මෙහෙයුම්, ණය මෙහෙයුම්, අයකිරීම්, භාණ්ඩාගාර සහ විදේශීය මෙහෙයුම්, ව්‍යාපෘති කළමනාකරණය, ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය, නිෂ්පාදන සංවර්ධනය සහ නවෝත්පාදන ඇතුළු ක්ෂේත්‍ර රැසක වසර 28 කට වැඩි පළපුරුද්දක් ලබා ඇත.

ලංකා බැංකුව (යූ.කේ) සමාගමේ මූලික බැංකු පද්ධතිය සහ වෙළඳ මූල්‍ය පද්ධති ක්‍රියාත්මක කිරීම, බැංකුවේ මූලික බැංකුකරණ සහ ටෙලර් පද්ධතිය වැඩිදියුණු කිරීම, ලේඛන කළමනාකරණ පද්ධතිය, කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම වැනි ප්‍රධාන තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සහ ගනුදෙනුකරුවන් වෙත පිරිනැමෙන BOC Digi, ජංගම සේවා රථ, BOC Connect, Whatsapp බැංකුකරණය, Smart ස්ථාවර තැන්පතු, BOC Flex වැනි ගනුදෙනුකාර කේන්ද්‍රීය ඩිජිටල් විසඳුම් රැසක් සහ tvBOC හඳුන්වා දෙමින් බැංකුවේ ප්‍රධාන තාක්ෂණික සහ ඩිජිටල් පරිවර්තන ක්‍රියාවලිය සඳහා සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිධාරියකු වන අතර කැළණිය විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර මූල්‍යනය පිළිබඳ පශ්චාත් උපාධිය ද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද ලබාගෙන ඇති අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ උපායමාර්ගික කළමනාකරණය පිළිබඳ උසස් පාඨමාලාව ද ප්‍රංශයේ INSEAD විශ්වවිද්‍යාලයේ උසස් කළමනාකරණ පාඨමාලාව ද නිමකොට ඇත.



ආර් එම් එන් ජීවන්ත මහතා

වැඩ බලන ප්‍රධාන මෙහෙයුම් නිලධාරී

2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

භාණ්ඩාගාර කළමනාකරණය, ආයෝජන බැංකුකරණය, මූල්‍ය කළමනාකරණය, ණය කළමනාකරණය සහ ශාඛා බැංකුකරණය වැනි ක්ෂේත්‍රවල වසර 23 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, එම විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ අධ්‍යයන ආයතනයේ ව්‍යාපාර පරිපාලනපති උපාධියද ලබා ඇති අතර ශ්‍රී ලංකාවේ සහතිකලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ජ්‍යේෂ්ඨ අධි සාමාජිකත්වය ද හොබවයි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බාහිර කථිකාචාර්යවරයෙකු වශයෙන් ද කටයුතු කරයි.



ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය

ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකාරිණී/
ලේකම්, ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

2010 ඔක්තෝබර් මාසයේදී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

සමාගම් ලේකම් සහ ආයතනික යහපාලනය පිළිබඳ බැංකුවේ වසර 29 කට වැඩි පළපුරුද්දක් ඇත.

නීතිවේදී උපාධියක් සහිත වෘත්තියෙන් නීතීඥවරියකි.

කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනපති උපාධිය විශිෂ්ට සාමාර්ථයක් සහිතව හිමිකරගෙන ඇත.



ප්‍රියාල් සිල්වා මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(ශාඛා මෙහෙයුම්)

2020 පෙබරවාරි මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

මූල්‍ය, ආයතනික, ශාඛා සහ සංවර්ධන බැංකුකරණය, ජාත්‍යන්තර සහ භාණ්ඩාගාර මෙහෙයුම්, ශාඛා මෙහෙයුම් පිළිබඳ විශේෂිත වූ, බැංකුකරණයේ විවිධ අංශවල වසර 28 කට වැඩි පළපුරුද්දක් ඇත.

රුහුණු විශ්වවිද්‍යාලයේ අලෙවිකරණයට අදාළ විශේෂිත ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියද, කැළණිය විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනපති උපාධියද, එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ වෘත්තීය අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද සහිතව ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ සහ ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ සාමාජිකත්වය ද උසුලයි.



ජයශාන්ත ගොඩකන්ද මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(ජාත්‍යන්තර, භාණ්ඩාගාර හා ආයෝජන)

2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

ශාඛා බැංකුකරණය සහ මෙහෙයුම්, ශාඛා ණය, භාණ්ඩාගාර මෙහෙයුම්, වත්කම් සහ වගකීම් කළමනාකරණය, අවදානම් කළමනාකරණය, ආපසු අයකර ගැනීම්, ආයතනික සහ අක්වෙරළ බැංකුකරණ මෙහෙයුම් සහ ණය යන ක්ෂේත්‍ර වැනි බැංකුවේ විවිධ අංශවල වසර 28 කට වඩා වැඩි විශේෂිත අත්දැකීම් ලබා ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පළමු පන්තියේ විද්‍යාවේදී විශේෂ උපාධිධාරියෙකු වන අතර කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද, ශ්‍රී ලංකා බැංකකුරුවන්ගේ ආයතනයේ ණය කළමනාකරණය සම්බන්ධව ඩිප්ලෝමාවක් ද ලබා ගෙන ඇති අතර එහි ආශ්‍රිත සාමාජිකයෙකු ද වේ.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි අධ්‍යක්ෂවරයෙකු ලෙස වසර දෙකක් සේවය කල අතර, එහි විගණන සහ අවදානම් කළමනාකරණ කමිටුවල ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කර තිබේ.



ඩබ්ලිව් බී පී රත්නායක මහත්මිය

ප්‍රධාන අනුකූලතා නිලධාරිණී

2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

ශාඛා හා ආයතනික බැංකුකරණය, ගෙවීම් කාඩ්පත් හා අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව යන ක්ෂේත්‍රවල වසර 28 කට අධික පළපුරුද්දක් සමඟ බහුවිධ නිපුණත්වයකින් හෙබි බැංකු වෘත්තිනියක වන අතර අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ මෙවලම් සංවර්ධනය කිරීමේදී සුවිශේෂී කාර්යභාරයක් ඉටු කර ඇත.

රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිධාරිනියක ද, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනපති උපාධිධාරිනියක ද වන අතර ශ්‍රී ලංකා බැංකකුරුවන්ගේ ආයතනයේ බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් විධායක උපාධි ඩිප්ලෝමාවද එක්සත් රාජධානියේ ජාත්‍යන්තර අනුකූලතා සංගමයේ යහපාලනය, අවදානම් සහ අනුකූලතා පිළිබඳ ජාත්‍යන්තර ඩිප්ලෝමාධාරිණියක මෙන්ම ශ්‍රී ලංකා බැංකකුරුවන්ගේ ආයතනයේ සාමාජිකාවක් ද වේ.

ශ්‍රී ලංකා බැංකු අනුකූලතා නිලධාරීන්ගේ සංගමයේ විධායක කමිටු සාමාජිකාවක ලෙස සේවය කරයි.



එම් පී රුවන් කුමාර මහතා

ප්‍රධාන මූල්‍ය නිලධාරී

2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

මූල්‍ය කළමනාකරණය, උපායමාර්ගික සැලසුම්කරණය, ආයෝජන බැංකුකරණය, වාණිජ බැංකුකරණය සහ විදේශීය බැංකු කටයුතු පිළිබඳ වසර 23 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පොදුරාජ්‍ය මණ්ඩලීය විධායක ව්‍යාපාර පරිපාලනපති උපාධිය ද හිමි ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය දරණ අතර ශ්‍රී ලංකාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සාමාජිකයෙකු ද වේ. තවද ශ්‍රී ලංකා බැංකකුරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ සාමාජිකත්වය ද උසුලයි.

සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලයේ නායකත්ව සංවර්ධන වැඩසටහන සම්පූර්ණ කරන ලදී.



එස් සිවන්ජන් මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(අයකර ගැනීම් - ආයතනික)

2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

ශාඛා බැංකු මෙහෙයුම්, ණය අයකර ගැනීම්, ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන, සංවර්ධන බැංකු කටයුතු, ශාඛා පරිවර්තනය, ක්ෂුද්‍ර මූල්‍ය සහ ජාත්‍යන්තර හා විදේශීය මෙහෙයුම් සම්බන්ධව වසර 23 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

යාපනය විශ්වවිද්‍යාලයේ පළමු පන්තියේ (ගෞරව) විද්‍යාවේදී උපාධියක් හිමි වන අතර කොළඹ විශ්වවිද්‍යාලයේ අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනපති උපාධියක් ද හිමිය.



හදු කළ්‍යාණප්‍රිය ගුරුසිංහ මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(සංවර්ධන බැංකුකරණ සහ ශාඛා ණය මෙහෙයුම් - කලාප 2)

2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

බැංකු වෘත්තිකයෙකු ලෙස ආයතනික බැංකුකරණය, ශාඛා බැංකුකරණය, ණය සහ ආයතනික පරිවර්තනමය ව්‍යාපෘති පිළිබඳ වසර 28 කට වැඩි පළපුරුද්දක් ඇත.

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතීඥයෙකි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පොදුරාජ්‍ය මණ්ඩලීය විධායක ව්‍යාපාර පරිපාලනපති උපාධිය ද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද, ශ්‍රී ලංකා බැංකකුරුවන්ගේ ආයතනයේ ණය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියකු ද වන අතර, ශ්‍රී ලංකා බැංකකුරුවන්ගේ ආයතනයේ හා ශ්‍රී ලංකා නීතීඥවරුන්ගේ සංගමයේ සාමාජිකත්වය ද දරනු ලබයි.



රෝහණ කුමාර මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(ව්‍යාපාර පුනර්ජීවන)

2021 ජනවාරි මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන, අයකර ගැනීම්, ශාඛා ණය සහ ව්‍යාපෘති මූල්‍යකරණය සම්බන්ධයෙන් විධායක නායකත්ව භූමිකාවන් ඇතුළුව බැංකුවේ වසර 23 කට වැඩි පළපුරුද්දක් ඇත.

ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ උප සභාපති වශයෙන් කටයුතු කරයි.

කැළණිය විශ්වවිද්‍යාලයෙන් ගණිතය පිළිබඳ විද්‍යාවේදී පළමු පන්තියේ උපාධිය, ඇමරිකා එක්සත් ජනපදයේ උතුරු ඉලිනොයිස් විශ්වවිද්‍යාලයේ නායකත්වය පිළිබඳ ඩිප්ලෝමාව සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වයද දරයි.

ආයතනික කළමනාකාරීත්වය



දම්ම විජයවර්ධන මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(මානව සම්පත්)

2021 ඔක්තෝබර් මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය.

ණය සහ ශාඛා බැංකුකරණය ආදී ක්ෂේත්‍ර වල බැංකුවේ වසර 23 කට වඩා වැඩි පළපුරුද්දක් හා මානව සම්පත් මෙහෙයුම් අංශයේ ආයතනික සහ විධායක නායකත්ව තනතුරු හොබවා ඇත.

කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (සාමාන්‍ය) දෙවන පන්තියේ (ඉහළ අංශය) ගෞරව උපාධිය ද, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකයෙකු ද වේ.



කේ ඒ අජිත් කරුණාරත්න මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(ශාඛා ණය මෙහෙයුම් - කලාප 1)

2021 දෙසැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය.

ශාඛා බැංකුකරණය, වෙළඳ මූල්‍ය, ආයතනික සහ ප්‍රිමියර් බැංකු මෙහෙයුම්, නිමැවුම් හා බැංකුකරණ සංවර්ධන, අයකර ගැනීම් - පළාත්, ශාඛා ණය මෙහෙයුම් යන ක්ෂේත්‍රවලට විශේෂිතව බැංකුවේ වසර 23 කට වැඩි පළපුරුද්දක් සහිත වේ.

ශාඛා බැංකුකරණයේ විවිධ වූ පැතිකඩයන් හි අත්දැකීම් සහ ව්‍යාපාර ප්‍රවර්ධනය, පරිපාලනය සහ මානව සම්පත් සඳහා වගකීම් සහිතව පළාත් කිහිපයක විධායක නායකයෙකු ලෙස අත්දැකීම් ලබා ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනපති උපාධිය ද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ සංගමයේ සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය ද ලබා ඇති අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහතිකපත්‍ර මට්ටම සම්පූර්ණ කර ඇත.



ප්‍රියන්ති විජේසේකර මහත්මිය

නියෝජ්‍ය මහා කළමනාකාරිණී
(මෙහෙයුම්)

2023 මාර්තු මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය.

ශාඛා බැංකුකරණය, ආයතනික ණය, අයකරගැනීම්, අක්වෙරළ බැංකුකරණය, පරිපාලන සේවා, අලෙවිකරණය, විදේශීය ශාඛා මෙහෙයුම් සහ ණය විගණනය ඇතුළු බැංකුකරණයේ විවිධ ක්ෂේත්‍රවල වසර 34 කට වැඩි පළපුරුද්දක් ඇත.

ඇය ලංකා බැංකුව (යූ.කේ.) සමාගමේ සේවා කාලය තුළ ජාත්‍යන්තර බැංකුකරණය පිළිබඳ පළපුරුද්ද ලබා ගන්නා ලදී.

ලන්ඩනයේ මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනපති උපාධිය විශිෂ්ට සාමාර්ථයක් සහිතව ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද, මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව ද හිමිකර ගෙන ඇති අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකත්වය ද උසුලයි.



රොෂෙල් ප්‍රනාන්දු මහත්මිය

නියෝජ්‍ය මහා කළමනාකාරිණී
(අයකර ගැනීම් - පළාත්)

2023 මාර්තු මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය.

ශාඛා බැංකුකරණය, අක්වෙරළ බැංකුකරණය, ආයතනික බැංකුකරණය, වෙළෙඳ මූල්‍ය, සංවර්ධන බැංකුකරණය, ශාඛා ණය සහ අයකර ගැනීම්වල වසර 28 කට වැඩි පළපුරුද්දක් ලබා ඇත.

කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය හිමි අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් මෙහෙයවනු ලබන ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා කළමනාකරණ සංවර්ධන වැඩසටහන සඳහා සහභාගී වී ඇත. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක සහ ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සාමාජිකාවකි.

2018 සිට 2022 දෙසැම්බර් දක්වා අපනයන සංවර්ධන මණ්ඩලයේ ජාත්‍යන්තර වෙළඳාමට අදාළ බැංකු ක්‍රියා පටිපාටි පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව/ ඉහළ සහතික පත්‍ර පාඨමාලාව සඳහා සම්පත් දායිකාවක ලෙස සම්බන්ධ වී ඇත. 2023 දී බැංකුකරුවන්ගේ වෙළෙඳ මූල්‍ය සංගමයේ සභාපති ලෙස කටයුතු කර ඇත.



සම්පත් පෙරේරා මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය)

2024 පෙබරවාරි මාසයේදී ආයතනික කළමනාකාරීත්වයට පත් විය.

ශාඛා බැංකුකරණය, මූල්‍ය, ආයතනික සහ අක්වෙරළ බැංකු අංශය, භාණ්ඩාගාර සහ අයකර ගැනීම් යන විවිධ අංශයන්හි වසර 23 ක පුළුල් පලපුරුද්දක් ඇත.

ලන්ඩනයේ ලංකා බැංකුව (යූ.කේ.) සමාගමේ පුහුණු අලෙවිකරු සහ ලංකා බැංකුව (යූ.කේ.) ශාඛාව ස්වාධීන පරිපාලිත සමාගමක් බවට පරිවර්තනය කිරීමෙන් පසු පළමු ණය කළමනාකරු ලෙස සේවය කිරීමෙන් ජාත්‍යන්තර පළපුරුද්ද ලබා ඇත.

රජරට විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ අධ්‍යයන ආයතනයේ ව්‍යාපාර පරිපාලනපති උපාධිය සහ උපායමාර්ගික කළමනාකරණය පිළිබඳ උසස් පාඨමාලාව ද හදාරා ඇති අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය දරයි.



සුරේෂ් පෙරේරා මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(නිෂ්පාදන සහ බැංකු සංවර්ධන)

2026 ජනවාරි මාසයේදී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

නිෂ්පාදන සංවර්ධනය, ආයතනික පරිවර්තනය, ව්‍යාපෘති කළමනාකරණය සහ ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රති-ස්ථාපනය යන ක්ෂේත්‍රයන්හි විශේෂඥතාවක්, බැංකු ක්ෂේත්‍රයේ වසර 23 කට අධික අත්දැකීම් ඇති ජ්‍යෙෂ්ඨ වෘත්තීය බැංකුකරුවෙකි.

සමස්ත ශාඛා ජාලය ස්වයංක්‍රීයකරණය සහ ඩිජිටල්කරණය හරහා ඒකාබද්ධ කිරීම ඇතුළු බැංකුවේ උපායමාර්ගික පරිවර්තන මුලපිරීම් රැසක ඔහු ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කර ඇත. විශේෂයෙන්ම බැංකුවේ ප්‍රමුඛතම බැංකුකරණ ජංගම යෙදුම වන “BOC Flex” සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේදී ඔහු පුරෝගාමී දායකත්වයක් ලබා දුන්නේය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය (පොදු) පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් ලබා ඇති අතර, කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හිමිකරගෙන ඇත. එමෙන්ම ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බැංකුකරණය සහ මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකු වන අතර ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සාමාජිකයෙකු ද වේ.



කුමුදිනී ජේ යෝගරත්නම් මහත්මිය

නියෝජ්‍ය මහා කළමනාකරු
(උපකාරක සේවා)

2026 ජනවාරි මාසයේදී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

වාණිජ බැංකුකරණ ක්ෂේත්‍රයේ වසර 28 කට අධික අත්දැකීම් සමඟ, සාමාන්‍ය බැංකුකරණය, ණය මෙහෙයුම්, අක්වෙරළ බැංකුකරණය සහ ජාත්‍යන්තර බැංකුකරණය පිළිබඳ විශේෂඥ දැනුමකින් හෙබි නිලධාරිනියකි. ලංකා බැංකුවේ නැගෙනහිර පළාත් කලාපීය මෙහෙයුම් සඳහා නායකත්වය ලබා දී ඇති අතර, ලංකා බැංකුව (එක්සත් රාජධානිය) මාලේ සහ චෙන්නායි ශාඛා ඇතුළු විදේශීය සේවා නියුක්තීන් යටතේ වසර 11 ක ජාත්‍යන්තර බැංකු පළපුරුද්දක් ද ලබා ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියක් සහ එම විශ්වවිද්‍යාලයේම කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධියක් ලබා ඇත. එමෙන්ම, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ ද සාමාජිකාවකි.

2020-2024 කාලය තුළ ඉන්දියාවේ ඉන්දු-ආසියාන් ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කළ අතර, බැංකුවේ මධ්‍යම පුහුණු ආයතනයේ සහ ශ්‍රී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්පත් දායිකාවක ලෙස ද සිය දැනුම බෙදා දෙයි.



රුවන් සමරක්කොඩි මහතා

වැඩබලන ප්‍රධාන අවදානම් නිලධාරී

2026 ජනවාරි මාසයේදී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

ශාඛා බැංකුකරණය, අවදානම් කළමනාකරණය, යහපාලනය, විමර්ශන සහ නියාමන අනුකූලතාවය පිළිබඳ පුළුල් අත්දැකීම් ඇති, වසර 30 කට අධික කීර්තිමත් සේවා පළපුරුද්දක් ඇති ජ්‍යෙෂ්ඨ බැංකු වෘත්තිකයෙකි.

ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුව, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ පද්ධතිය සහ මූලික බැංකු පද්ධතිය ස්ථාපිත කිරීමේදී සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත. එමෙන්ම විදේශීය සහ අනුබද්ධිත ආයතනයන්හි අවදානම් කළමනාකරණ රාමු, යහපාලන ව්‍යුහයන්, ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් සහ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණ වැඩපිළිවෙළවල් සංවර්ධනය කිරීමේදී පුරෝගාමී විය. බැංකුවේ ප්‍රථම පුද්ගලික දත්ත පිළිබඳ ආරක්ෂණ නිලධාරියා ලෙස කටයුතු කළ අතර, ව්‍යවස්ථාපිත අවශ්‍යතා වලට අනුකූල වීම සඳහා වන ක්‍රියාවලීන් සාර්ථකව මෙහෙයවීය.

වෘත්තියෙන් නීතිඥවරයකු වන අතර, කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධිය සහ මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇති අතර, වයඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධියක් ද හිමිකරගෙන ඇත. තවද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් බැංකු මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාව ද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් ව්‍යාපාර මූල්‍ය සහ උපායමාර්ග පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද ලබා ඇත. ඔහු එක්සත් රාජධානියේ වරලත් සුරැකුම්පත් සහ ආයෝජන ආයතනයේ මූල්‍ය සේවා පිළිබඳ අවදානම් කළමනාකරණ වෘත්තීය සුදුසුකම් ද සපුරා ඇත.



සුභානි නානායක්කාර මහත්මිය

වැඩබලන ප්‍රධාන නීති නිලධාරිණී

2025 දෙසැම්බර් මාසයේදී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

බැංකු වෘත්තිකයෙකු ලෙස වසර 21 කට අධික අත්දැකීම් සහිත ණය ප්‍රතිසාධන සහ නඩු කටයුතු කළමනාකරණය මෙන්ම, ණය සහ මානව සම්පත් ආශ්‍රිත නීති සේවා පිළිබඳ විශේෂඥතාවක් සහිත නිලධාරිනියෙකි.

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතිඥවරියෙකි.

කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිතව උපාධිය ලබා ඇති අතර, පෙනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙන් නීතිපති උපාධිය හිමිකරගෙන ඇත. එමෙන්ම, උසස් නීති අධ්‍යයන ආයතනයෙන් මූල්‍ය, බැංකු සහ රක්ෂණ නීති පිළිබඳ පශ්චාත් නීතිඥ ඩිප්ලෝමාව ද, බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානයෙන් ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ඩිප්ලෝමාව (සම්මාන සාමාර්ථ සහිතව) ද ලබා ඇත.

ජනාධිපති කමිටු, කම්කරු කොමසාරිස් කාර්යාලය, මානව හිමිකම් කොමිසම, මූල්‍ය ඔම්බුඩ්ස්මන් සහ කුලී පාලන මණ්ඩලය ඇතුළු විවිධ නියාමන සහ අධිකරණ ආයතන ඉදිරියේ බැංකුව නියෝජනය කරමින් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කර ඇත.

ආයතනික කළමනාකාරීත්වය



පී මදුවන්ත ලියනගේ මහතා

ප්‍රධාන අභ්‍යන්තර විගණක

2014 දෙසැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය.

මූල්‍ය වෘත්තිකයෙකු ලෙස බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 26 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

ලංකා බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස පත් වීමට පෙර ඔහු කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී සහ පෑන් ඒෂියා බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස කටයුතු කර ඇත. ලියනගේ මහතා 2006 සිට 2008 කාලපරිච්ඡේදයේ දී ලංකා බැංකුවේ අභ්‍යන්තර විගණක ලෙස ද කටයුතු කර ඇත. සී/ස ලංකා ක්‍රියර් (පෞද්ගලික) සමාගමේ මූල්‍ය හා පරිපාලන කළමනාකරු ලෙසත්, අර්න්ස්ට් ඇන්ඩ් යංග් ආයතනයේ සුදුසුකම් ලත් වෘත්තීය ගණකාධිකාරීවරයෙකු ලෙසත් ලත් අත්දැකීම් ඔහුගේ පළපුරුද්දට ඇතුලත් වේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ගණකාධිකරණය හා මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා ඇති අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය සහ ඇමෙරිකා චික්සත් ජනපදයේ තොරතුරු පද්ධති විගණන සංගමයෙහි සහතිකලත් තොරතුරු පද්ධති විගණකවරුන්ගේ සංගමයේ සාමාජිකත්වය ද දරනු ලැබේ.



සමීර ඩී ලියනගේ මහතා

ප්‍රධාන අලෙවිකරණ නිලධාරිර

2020 අගෝස්තු මාසයේදී ආයතනික කළමනාකාරීත්වයට පත් විය.

බැංකුකරණය සහ අලෙවිකරණය පිළිබඳ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල වසර 27 කට වඩා වැඩි වෘත්තීය විශේෂඥතාවයකින් යුක්තය.

2015 වර්ෂයේ දී චික්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනය විසින් ප්‍රදානය කරනු ලබන වරලත් අලෙවිකරු සම්මානයෙන් පිදුම් ලැබීය.

චික්සත් රාජධානියේ වෙරෙක්ස්හැම් විශ්වවිද්‍යාලයේ අලෙවිකරණ ව්‍යාපාර පරිපාලනපති උපාධිය ද චික්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයෙන් පශ්චාත් උපාධි අලෙවිකරණ ඩිප්ලෝමාව ද ලද ඔහු ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ සංගමයේ සහ චික්සත් රාජධානියේ අලෙවිකරණ ආයතනයේ අධි සාමාජිකත්වය දරන අතර ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ සහ වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමය යන ආයතන වල සාමාජිකත්වය දරනු ලබයි.



බුද්ධික සීලනාථ මහතා

ප්‍රධාන තොරතුරු නිලධාරී

2023 සැප්තැම්බර් මාසයේදී ආයතනික කළමනාකාරීත්වයට පත් විය.

රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම ආයතනවල වසර 27 කට වැඩි බැංකු සහ තොරතුරු තාක්ෂණ පළපුරුද්දක් ඇත. ආයතන තුළ ආදායම ඉහළ නැංවීම සහ ගනුදෙනුකාර අත්දැකීම් ඉහළ නැංවීම මඟින් සමස්ත අගය ඉහළ නැංවීම අරමුණු කරගත් ඩිජිටල් පරිවර්තන උපායමාර්ග මෙහෙයවීම සහ ක්‍රියාත්මක කිරීමෙහි ලා සාර්ථකත්වය ලබා ඇත. යෙදුම් සංවර්ධනය, දත්ත ගබඩා කිරීම සහ දත්ත විශ්ලේෂණ ඇතුළු ප්‍රධාන විෂයන්හි ප්‍රවීණතාවය ලබා ඇත.

බැංකුවේ ප්‍රධාන තොරතුරු නිලධාරී ධූරයට පත් වීමට පෙර, ඔහු නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ එම ධූරයම හෙබවිය. මීට පෙර ඔහු මහජන බැංකුවේ යෙදුම් පද්ධති ප්‍රධානියා ලෙස ද නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ යෙදුම් සංවර්ධන සහ කළමනාකරණ තොරතුරු පද්ධති ජ්‍යෙෂ්ඨ කළමනාකරු ලෙස ද කටයුතු කර ඇත.

අයර්ලන්තයේ ඩබ්ලින් හි ජාතික විශ්වවිද්‍යාලයේ, කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධිය හිමිය.



ශෂී ජයසිංහ මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(පරිවර්තන සහ මානව සම්පත් උපායමාර්ග)

2026 ජනවාරි මාසයේදී ආයතනික කළමනාකරණයට පත් කරන ලදී.

නිෂ්පාදන, ඉදිකිරීම්, ඉංජිනේරු විද්‍යාව, වෙළඳාම, බෙදාහැරීම සහ සේවා ඇතුළු විවිධ කර්මාන්ත ක්ෂේත්‍රයන්හි මානව සම්පත් කළමනාකරණ පළපුරුද්දක් සතුය. මානව සම්පත් පරිවර්තනය සහ උපායමාර්ග, ව්‍යාපාර උපායමාර්ග පෙළගැස්වීම, ආයතනික සංවර්ධනය, මානව සම්පත් විශ්ලේෂණය, කුසලතා කළමනාකරණය, ඉගෙනුම් සහ සංවර්ධනය, කාර්යසාධනය සහ ප්‍රතිලාභ කළමනාකරණය මෙන්ම මානව සම්පත් තොරතුරු පද්ධති ක්‍රියාත්මක කිරීම පිළිබඳව විශේෂඥතාවක් දක්වයි. තවද, කාර්මික සබඳතා සහ සේවක සබඳතා, වෙනස්වීම් කළමනාකරණය සහ ක්‍රියාවලි ප්‍රශස්තකරණය පිළිබඳව ද හසළ අත්දැකීම් සහිත අයෙකි.

බැංකු ක්ෂේත්‍රයට සම්බන්ධ වීමට පෙර, සී/ස චිමිජේ ඉන්ටනැෂනල් (පුද්ගලික) සමාගම සහ සී/ස පෙන්ගුයින් ස්පෝර්ට්ස්වෙයා (පුද්ගලික) සමාගම යන ආයතනයන්හි සමූහ මානව සම්පත් (මෙහෙයුම්) සාමාන්‍යාධිකාරී ලෙසත්, තුඩාවේ බ්‍රදර්ස් සමූහ ව්‍යාපාරයේ මානව සම්පත් ප්‍රධානියා ලෙසත්, සී/ස AMSK කන්ස්ට්‍රක්ෂන් (පුද්ගලික) සමාගමෙහි මානව සම්පත් සහ පරිපාලන ප්‍රධානියා ලෙසත් සේවය කර ඇත. එසේම, මාස් හෝල්ඩින්ග්ස් ආයතනයේ කළමනාකරණ තනතුරේ නිරත වෙමින් මහා පරිමාණ සංවිධාන සඳහා පුළුල් මානව සම්පත් රාමු නිර්මාණය කිරීමට දායක වී ඇත.

ඉන්දියාවේ ICFAI විශ්ව විද්‍යාලයෙන් වාණිජ පරිපාලනවේදී උපාධිය ලබා ඇති අතර, කොළඹ විශ්ව විද්‍යාලයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය කුසලතා සාමාර්ථයක් සහිතව සමත් වී ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ යාවජීව ආශ්‍රිත සාමාජිකයෙකු වන අතර, ශ්‍රී ලංකා වරලත් කාර්ය මණ්ඩල කළමනාකරණ ආයතනයේ සහ ශ්‍රී ලංකා මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකයෙකු ද වේ.

(ආයතනික කළමනාකරණ සාමාජිකයින් විසින් බැංකුවේ පරිපාලිත සහ ආශ්‍රිත සමාගම්හි හොබවන අධ්‍යක්ෂ ධූර සම්බන්ධයෙන් පිටු අංක 471 සිට 472 තෙක් දක්වා ඇත.)

විධායක කළමනාකාරීත්වය



කේ ජී සී දිපාල් මහතා
සහකාර මහා කළමනාකරු
(තොරතුරු පද්ධති විගණන)



ජයරාණී ඥානසම්බන්ධන් මහත්මිය
නේවාසික කළමනාකාරිණී
(චෙන්නායි ශාඛාව)



මාලා වීරසේකර මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ශාඛා ණය - කලාප 1)



කේ පී මල්ලිකා මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(භාණ්ඩාගාර පසුපෙළ කාර්යාලය)



ක්‍රිෂාන්ති ප්‍රනාන්දු මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ආයතනික ණය)



සීනා රුවයිස් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(අයවැය, ක්‍රමෝපායික සැලසුම් හා කළමනාකරණ තොරතුරු පද්ධති)



ආනන්ද වනිගසේකර මහතා
සහකාර මහා කළමනාකරු
(ආපසු අයකර ගැනීම් - පළාත්)



මන්ශලා විතාන ආරච්චි මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ශාඛා මෙහෙයුම්)



සමන්ත විමලසිරි මහතා
සහකාර මහා කළමනාකරු
(පාරිභෝගික හා සංවර්ධන බැංකුකරණ)



ඉන්දිරා කන්නංගර මෙනෙවිය
සහකාර මහා කළමනාකාරිණී
(ආපසු අයකර ගැනීම් - ආයතනික)



මනෝෂිකා හේරත් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(වයඹ පළාත)



මංජුලා හේරත් මෙනෙවිය
නේවාසික කළමනාකාරිණී
(මාලේ ශාඛාව)



සුමන්ගලා පිරපාහරන් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(මධ්‍යම ණය මෙහෙයුම්)



සමන් කේ වික්‍රමසිංහ මහතා
සහකාර මහා කළමනාකරු
(ඩිජිටල් බැංකු සේවා ප්‍රවර්ධන)



පූර්ණා තිලකරත්න මහත්මිය
නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිණී
(ජාත්‍යන්තර කටයුතු සහ මෙහෙයුම්)



නිශානදී නානායක්කාර මහත්මිය
නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිණී (ණය)

විධායක කළමනාකාරීත්වය



එස් බී ඒ එම් ජී එස් අරම්පත් මහතා
සහකාර මහා කළමනාකරු
(පිටකොටුව වෙළඳ මධ්‍යස්ථානය)



සුදත් ලියනගේ මහතා
සහකාර මහා කළමනාකරු
(බස්නාහිර පළාත - උතුර)



වී සිවානන්දන් මහතා
සහකාර මහා කළමනාකරු
(උතුරු පළාත)



දුමින්ද දයාවංශ මහතා
සහකාර මහා කළමනාකරු
(මධ්‍යගත මෙහෙයුම්)



ඩබ්ලිව් කේ එල් බී එන් සමන්ති මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ශාඛා ණය - කලාප 2)



දීපා කුමාරි මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ණය අවදානම්)



රජිත තුෂාන්ත මහතා
නේවාසික කළමනාකරු
(සීෂේල්ස් ශාඛාව)



මාධව දිසානායක මහතා
ප්‍රධාන විධායක නිලධාරී
(ලංකා බැංකුව (යූ කේ) සමාගම)



සුරේඛා කුලසේකර මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(තිරසාර බැංකුකරණය)



ගංගා වීරක්කොඩි මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(මෙහෙයුම් විගණන)



දිස්නා ඩයස් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(විශ්‍රාම නඩත්තු අංශය)



රුචින්ද්‍රා පෙරේරා මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(මෙට්‍රොපොලිටන් ශාඛාව)



රංජිත් රුවන්පතිරණ මහතා
සහකාර මහා කළමනාකරු
(දකුණු පළාත)



එන් ක්‍රිෂ්ණකුමාර් මහතා
සහකාර මහා කළමනාකරු
(ව්‍යාපාර පුනර්ජීවන - ආයතනික)



උපුල් විජේගුණවර්ධන මහතා සහකාර මහා කළමනාකරු
(විද්‍යුත් බැංකුකරණ මධ්‍යස්ථානය)



බුද්ධික ප්‍රේමරත්න මහතා
සහකාර මහා කළමනාකරු
(අලෙවිකරණ)



රිහාන් ශකූර් මහතා
සහකාර මහා කළමනාකරු
(ආයෝජන)



බී සින්තියා මාටින් මෙනෙවිය
සහකාර මහා කළමනාකාරිණී
(ණය විගණන)



කුෂාන් දෙල්ගොඩ මහතා
සහකාර මහා කළමනාකරු
(බස්නාහිර පළාත් - මධ්‍යම)



චමින්ද රණසිංහ මහතා
සහකාර මහා කළමනාකරු
(සබරගමුව පළාත)



එස් සබේසන් මහතා
සහකාර මහා කළමනාකරු



ආචාර්ය චමිල් බණ්ඩාර
සහකාර මහා කළමනාකරු
(පර්යේෂණ සහ සංවර්ධන)



කැළුම් ගජනායක මහතා
සහකාර මහා කළමනාකරු
(ව්‍යාපෘති මූල්‍යනය)



චන්දන කොඩිතුවක්කු මහතා
තොරතුරු තාක්ෂණ ප්‍රධානී
(යටිතල පහසුකම් සහ මෙහෙයුම්)



ප්‍රශානි ගුණතිලක මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(අනුකූලතා)



කේ කේ සුසන්ත මහතා
සහකාර මහා කළමනාකරු
(වෙළඳ සේවා)



කුමුදු මහවත්ත මහතා
සහකාර මහා කළමනාකරු
(නැගෙනහිර පළාත)



උත්පලා හේරත්රන්දෙණි මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(රාජ්‍ය ව්‍යවසාය සබඳතා)



ජයමාලි ප්‍රියදර්ශිකා මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(විදේශීය ශාඛා)



ඉෂාරා රණසිංහ මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ප්‍රසම්පාදන)



කෝෂිලා ජයසූරිය මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ව්‍යාපාර පුනර්ජීවන - පළාත්)



ප්‍රියංගනී ජයතුංග මහත්මිය
තොරතුරු තාක්ෂණ ප්‍රධානී
(යෙදුම් සංවර්ධන සහ සහය)

විධායක කළමනාකාරීත්වය



තනුජා පෙරේරා මහත්මිය
තොරතුරු තාක්ෂණ ප්‍රධානී
(ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය)



තරංගනී රණසිංහ මෙනෙවිය
සහකාර මහා කළමනාකාරිණී
(මානව සම්පත් මෙහෙයුම්)



උපුල් විජයතුංග මහතා
සහකාර මහා කළමනාකරු
(ජාත්‍යන්තර)



ප්‍රගීත් බාලසූරිය මහතා
සහකාර මහා කළමනාකරු
(ආයතනික සබඳතා)



චානක කොහොමන්ගේ මහතා
සහකාර මහා කළමනාකරු
(මහා කළමනාකරුගේ පුද්ගලික සහකාර)



අසංක බෙන්තර විතානගේ මහතා
සහකාර මහා කළමනාකරු
(බස්නාහිර පළාත - දකුණ)



නිරෝෂා අබේසුන්දර මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(පරිපාලන සේවා)



ඩී ඩබ්ලිව් පී කේ ප්‍රේමරත්න මහතා
සහකාර මහා කළමනාකරු
(උතුරු මැද පළාත)



දමිත් ඒකනායක මහතා
සහකාර මහා කළමනාකරු
(මධ්‍යම පළාත)



ඉරේෂ් රත්නායක මහතා
ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරී



සාරංගා පෙරේරා මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ගිණුම්කරණ හා බදු)



මලිනා ගුණතිලක මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(විමර්ශන)



ලසන්ත ප්‍රේමරත්න මහතා
සහකාර මහා කළමනාකරු
(භාණ්ඩාගාර)



එච් ඒ කේ සම්පත් මහතා
සහකාර මහා කළමනාකරු
(ඌව පළාත)



දයාජිණී පීරිස් මහත්මිය
නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිණී
(යහපාලන, මානව සම්පත් සහ බැංකු මෙහෙයුම්)



එන් රාජලිංගම් මහතා
තොරතුරු තාක්ෂණ ප්‍රධානී
(යහපාලන)



අපගේ උපායමාර්ගය

අනාගතයට මඟ පෙන්වීම

බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා ගැඹුරින් අන්තර් සම්බන්ධිත වේ. වෙළඳපළවල්, ප්‍රජාවන්, නවෝත්පාදනය, තිරසාරභාවය, යහපාලනය සහ අවදානම මනාව පෙළගැස්වීම මඟින්, බැංකුව උපායමාර්ග ක්‍රියාවන්ට පරිවර්තනය කරන්නේ, මුළු මහත් ජාතියටම විද්‍යාමාන බලපෑම් ඇති කරමින් ය.

ඝනකයේ සෑම හැරවීමක්ම සමස්ත රටාවම වෙනස් කරන්නේ, අවසන් ප්‍රතිඵලය ද වෙනසකට භාජනය කරමින් ය. එක් තනි භ්‍රමණයක් වුව ඝනකය පරිවර්තනය කරන්නාක් මෙන් ම එක මූලපිරීමකට විසල් පරිවර්තනීය වර්ධනයක් ලඟා කර ගත හැකිය.

මෙහෙයුම් සන්දර්භය



ගෝලීය සන්දර්භය

2025 දී ගෝලීය ආර්ථිකය ක්‍රියාත්මක වූයේ භූ දේශපාලනික ආතතීන්, පරිණාමය වෙමින් පවතින වෙළඳ රාමු සහ ව්‍යුහාත්මක ප්‍රතිසැකසුම් මගින් හැඩගැසුණු ගතික පරිසරයක ය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නවතම ලෝක ආර්ථික ඉදිරි දැක්මට අනුව, ගෝලීය දළ දේශීය නිෂ්පාදිත වර්ධනය 2025 දී ආසන්න වශයෙන් 3.3% දක්වා ළඟා වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර, එය ඔරොත්තු දෙන නමුත් විෂම ප්‍රසාරණයක් පිළිබිඹු කරයි. දියුණු ආර්ථිකයන් මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළ අතර, නැගී එන වෙළඳපළවල් දේශීය ඉල්ලුම සහ තාක්ෂණය මත පදනම්ව ඉහළ වර්ධනයක් පවත්වා ගෙන ගියේය.

උද්ධමනය, පෙර පැවති උච්චතම අවස්ථාවන්ගෙන් අඩු වුවද, ප්‍රධාන ක්ෂේත්‍රවල ඉහළ මට්ටමක පැවතුන අතර, එමඟින් එක්සත් ජනපද ෆෙඩරල් සංචිතය සහ යුරෝපීය මහ බැංකුව ඇතුළු මහ බැංකු මිනුම් සහ දත්ත මත පදනම් වූ ප්‍රතිපත්ති ප්‍රවේශයන් අනුගමනය කිරීමට පෙළඹුණි.

ගෝලීය මූල්‍ය වෙළඳපළ උපායමාර්ගික තරඟකාරිත්වය, කලාපීය ගැටුම් සහ විකාශනය වන වෙළඳ ගතිකතාවයන් මගින් හැඩගැසී ඇත. එක්සත් ජනපද ඩොලර් දර්ශකය, නැගී එන වෙළඳපළවල් මත පීඩනය ලිහිල් කර දේශසීමා වෙළඳාමට සහාය විය. අවදානම් වළක්වා ගැනීම සහ මහ බැංකු සංචිත විවිධාංගීකරණය මධ්‍යයේ රත්‍රන් වාර්තාගත මට්ටමක් කරා ළඟා විය. භූ දේශපාලනික අවදානම් සහ මධ්‍යස්ථ ඉල්ලුම හේතුවෙන් බලපෑමට ලක් වූ භාණ්ඩ වෙළඳපළ මිශ්‍ර ප්‍රතිඵල පෙන්වීය.

ගෝලීය බැංකු අංශය මෙම තත්ත්වයන්ට ශක්තිමත්ව මුහුණ දුන්නේය. ඉහළ පොළී අනුපාත, පොළී ආන්තිකයන්ට සහාය වූ අතර, විනයගරුක ණය දීම, ශක්තිමත් ප්‍රාග්ධන ආරක්ෂණ සහ විචක්ෂණශීලී ද්‍රවශීලතා කළමනාකරණය, අවදානම් අවම කළේය. සමස්තයක් වශයෙන් 2025 වසර, ඉහළ වෙළඳපළ අස්ථාවරත්වයක් සහ ඔරොත්තු දෙන මූල්‍ය කාර්යසාධනයක් සහිත වසරක් වූ අතර, එය සංකීර්ණ ගෝලීය පරිසරයක ක්‍රියාත්මක වන බැංකු සඳහා උපායමාර්ගික හැකියාව සහ ශක්තිමත් අවදානම් කළමනාකරණයේ වැදගත්කම අවධාරණය කළේය.



ඉදිරියේදී, බටහිර ආසියාවේ අඛණ්ඩ භූ දේශපාලනික ආතතීන්, ඉන්ධන මිල අස්ථාවරත්වය සහ උද්ධමනකාරී පීඩනයන් මත ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාවයන් ඇති වීමට ඉඩ ඇති අතර, ශ්‍රී ලංකාවේ අපනයන කාර්යසාධනය, ප්‍රේෂණ ගලා ඒම් සහ විදේශ විනිමය ස්ථාවරත්වය සඳහා එමඟින් බාධා ඇති විය හැක.

දේශීය සන්දර්භය

2025 වසර තුළ, ශ්‍රී ලංකාව නව ප්‍රතිසංස්කරණ වැඩසටහන් මගින් ස්ථාවරත්වය සහ විශ්වාසය අත්විඳින ලදී. සාර්ව ආර්ථික තිරසාරභාවය යථා තත්ත්වයට පත් කරමින් මූල්‍ය විනය, ආදායම් වැඩිදියුණු කිරීම් සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සමඟ මූල්‍ය ඒකාබද්ධතාවය කේන්ද්‍රීයව පැවතුනි. ශක්තිමත් බදු පරිපාලනය සහ පුළුල් අනුකූලතාව රජයේ ආදායම ඉහළ නැංවූ අතර, මූල්‍ය විශ්වසනීයත්වය වැඩි දියුණු කරමින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණු සපුරා ගැනීම සඳහා සහාය විය.

2025 දී, ශ්‍රී ලංකාව ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සහ ශක්තිමත් මූලධර්ම මගින් පෝෂණය වූ සාර්ව ආර්ථික ස්ථාවරත්වය කරා යන මාවතේ, ස්ථාවර ලෙස ඉදිරියට ගියේය. 2024 දී ලඟා කරගත් පුනර්ජීවනය මත පදනම්ව, සියලුම අංශ ශක්තිමත් වර්ධනයක් පවත්වා ගෙන ගිය අතර ආර්ථිකය පුළුල් විය. 2025 වසරේ තෙවැනි කාර්තුව තුළ 5.4% ක වර්ධනයක් නිරූපණය කළේ පෙර වසරට වඩා 5.3% ක වර්ධනයක් ද සමඟිනි. 6.8% ක දළ දේශීය නිෂ්පාදිතයේ නිශ්චිත මිල අවප්‍රමාණකයක් සමඟින්, සියලුම ප්‍රධාන ක්‍රියාකාරකම් හරහා ධනාත්මක දායකත්වයන්, පළමු මාස නවය තුළ 5.0% ක සමස්ත වර්ධනයක් ඇති කළ අතර, එය ජාතියේ ප්‍රකෘතිමත් වීමේ සහ ඔරොත්තු දීමේ හැකියාව ගම්‍ය කරයි. මෙම ධනාත්මක ප්‍රවණතාවය කර්මාන්ත, ප්‍රවාහන සහ සංචාරක ආශ්‍රිත සේවාවන්ගෙන් කැපී පෙනෙන දායකත්වයක් සහිතව ආර්ථික ගම්‍යතාව වැඩිදියුණු කිරීම අවධාරණය කරයි.

උද්ධමනය අඩුවීම සහ බාහිර ශේෂයන් වැඩිදියුණු වීම හරහා ශ්‍රී ලංකා මහ බැංකුවට අඩු පොළී අනුපාතයක් පවත්වා ගැනීමට හැකි වූයේ, ණය ඉල්ලුම උත්තේජනය කරමින් සහ අරමුදල් සපයා ගැනීමේදි වන පීඩනයන් ලිහිල් කරමිනි. අඛණ්ඩ විදේශ ලැබීම් සහ විචක්ෂණශීලී සංචිත කළමනාකරණය මඟින් ස්ථාපිත විනිමය අනුපාතික ස්ථාවරත්වය,

ව්‍යාපාර කටයුතු පුරෝකථනය කිරීමේ හැකියාව වැඩිදියුණු කළ අතර විදේශ මුදල් නිරාවරණයන් සහිත ව්‍යාපාර ශක්තිමත් කරන ලදී. කෙසේ වෙතත්, වාහන ආනයන සීමා ලිහිල් කිරීම් සහ ආනයන වැඩිවීම හේතුවෙන්, 2025 දී ශ්‍රී ලංකා රුපියල, ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව 5.6% ක අවප්‍රමාණයක් වාර්තා කළේය.

මෙහි සැලකිය යුතු ප්‍රතිපත්තිමය වෙනස වූයේ වාහන ආනයන සීමාවන් ක්‍රමයෙන් ලිහිල් කිරීම වන අතර, එමඟින් මූල්‍ය කටයුතු උත්ප්‍රේරණය විය. ඉහළ ණය ලබාදීම් ව්‍යාපාරවල වත්කම් පුළුල් කළ අතර, මෝටර් රථ මූල්‍යකරණ ක්ෂේත්‍රයේ ශක්තිමත් ගනුදෙනුකාර ඉල්ලුම නිසා ගාස්තු මත පදනම් වූ ආදායම වැඩිදියුණු විය. එම වර්ධනය මධ්‍යයේ වුවද ප්‍රතිරක්ෂණය හරහා වත්කම්වල ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීම සඳහා ණය සැපයුම්කරුවන් ක්‍රියා කළහ.


2025 දී රජයේ ආදායම ශක්තිමත් වූ අතර, ඉහළ බදු එකතු කිරීම්, රේගු බදු සහ අනෙකුත් ආදායම් මාර්ග හේතුවෙන් ජාතික වර්ධනය සඳහා අඛණ්ඩ ආයෝජනයන්ට සහාය වෙමින් මූල්‍ය ස්ථාවරත්වය ශක්තිමත් විය. බාහිර අංශයේ ක්‍රියාකාරිත්වය කැපී පෙනෙන ලෙස ශක්තිමත් විය. සංචාරක ව්‍යාපාරය යථා තත්ත්වයට පත් වූයේ මිලියන 2.4 ක් පමණ සංචාරක පැමිණීම් සහ ඉහළ ධාරිතා භාවිතය සමඟින්, විදේශ විනිමය ඉපැයීම් ඉහළ නංවමිනි. 2025 දී සංචාරක ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 3.2 ක් පමණ වන අතර, විධිමත් මාර්ග හරහා ප්‍රේෂණය කළ සේවා ආදායම ඉහළ ගොස් ඇති අතර එය 23% ක වර්ධනයක් සමඟ ඇමරිකානු ඩොලර් බිලියන 8.1 ක් වූ අතර එමඟින් ද්‍රවශීලතාවය සහ සංචිත වැඩි විය.

විශේෂයෙන් දිට්වා සුළි කුණාටුව බාධා ඇති කිරීමත් සමඟ ජීවනෝපායන්, කෘෂිකර්මාන්තය සහ යටිතල පහසුකම් සඳහා අභියෝග අඛණ්ඩව පැවතුනි. ප්‍රතිසංස්කරණය සහ පුනරුත්ථාපනය ඉදිකිරීම්, සැපයුම් සහ ඒ ආශ්‍රිත අංශවල ක්‍රියාකාරකම් උත්තේජනය කළේය. රාජ්‍ය-පෞද්ගලික සහයෝගිතාවය ප්‍රාග්ධන වියදම් කඩිනම් කළ අතර, මධ්‍ය කාලීන සංවර්ධනයට සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාවට සහාය වූ අතර, මූල්‍ය ආයතන සහන පියවර, සහනදායී ණය දීම සහ රක්ෂණ පියවීම් හරහා දායක විය.


සමස්තයක් වශයෙන්, 2025 වසර ශ්‍රී ලංකාව කෙරෙහි ශුභවාදී ආකල්පයක් පිළිබිඹු කරයි. සාර්ව ආර්ථික ස්ථාවරත්වය, ශක්තිමත් බාහිර ආරක්ෂණ, ලිහිල් කළ මුදල් තත්ත්වයන් සහ ආංශික ගම්‍යතාව තිරසාර වර්ධනයක් සඳහා පදනමක් නිර්මාණය කළේය. ඔරොත්තු දීමේ හැකියාව, ප්‍රතිසංස්කරණ අඛණ්ඩතාව සහ මූල්‍ය විනය කළමනාකරණය, ශේෂවී ඇති අවදානම් මඟහරවා ගැනීමට සහ ජාතියේ දිගුකාලීන ආර්ථික ගමන් මඟ ශක්තිමත් කිරීමට අත්‍යවශ්‍ය විය.

සාර්ව ආර්ථික ස්ථාවරත්වයේ දර්ශක


2025 දී, ශ්‍රී ලංකාව, අර්බුධකාරී තත්ත්වයේ සිට ව්‍යුහගත ප්‍රකෘතිමත් වීම දක්වා පරිවර්තනය වූ අතර, සාර්ව ආර්ථික ස්ථායීකරණ පියවරයන්හි දෘශ්‍ය ප්‍රතිඵල විදහා දැක්වීය.




දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය %




උද්ධමනය %



විනිමය හුවමාරු අනුපාත රුපියල්



පොළී අනුපාත විචලනය %




මෙහෙයුම් සන්දර්භය


බැංකු අංශයේ කාර්යසාධනය

ශ්‍රී ලංකාවේ බැංකු අංශයට, 2025 වසර ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වූ සහ ප්‍රවේශම් සහගත වසරක් විය. උද්ධමනය, පුළුල් ලෙස ස්ථාවර විනිමය අනුපාත සහ සහනශීලී පොළී අනුපාත මගින් සකස් කරන ලද සාර්ව ආර්ථික පරිසරය, ණය වර්ධනය සහ ක්ෂේත්‍රයේ ඔරොත්තු දීමේ හැකියාව සඳහා හිතකර පසුබිමක් සැපයීය. ද්‍රවශීලතා ආරක්ෂණය ශක්තිමත් කිරීම සහ තැන්පත්කරුවන් සහ ආයෝජකයින් අතර විශ්වාසය යථා තත්ත්වයට පත් කිරීම සඳහා බැංකුව ශක්තිමත් මූල්‍ය තත්ත්වයන් සහ සංචාරක ව්‍යාපාරයෙන් සහ විදේශ ප්‍රේෂණවලින් ලැබෙන ආදායම යොදා ගත්තේය.


ලාභදායීත්වය %




ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය %



වත්කම්වල ගුණාත්මකභාවය %



වත්කම් සහ වගකීම් රු. ට්‍රිලියන



ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද ප්‍රධාන නියාමන අවශ්‍යතා

- **2024 අංක 04 දරණ බලපෑමට ලක් වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා සහන සැලසීමේ පියවර චක්‍රලේඛණයට අතිරේකය**

  සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා සහන සැලසීමේ පියවර පුළුල් කිරීම සහ අධීක්ෂණය

- **වටිනාකමට ණය (LTV) සීමාවන්:**

  මෝටර් රථ මිලදී ගැනීම සඳහා ලබා දී ඇති ණය පහසුකම් සඳහා වන උපරිම සීමාවන්.

- **තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂණ වාර්තාකරණය:**

  බලපත්‍රලාභී බැංකු විසින් 2021 අංක 16 දරණ බැංකු පනතේ විධාන අනුව සයිබර් තර්ජන, දත්ත කඩ කිරීම්, පද්ධති අසාර්ථකත්වයන් සහ අනෙකුත් බාධා කිරීම් ආවරණය කරමින් තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂණ සිදුවීම් වහාම වාර්තා කිරීමට අවශ්‍ය වේ.

- **2024 අංක 04 දරණ සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දෙන පහසුකම් සඳහා අනුමත සුරැකුම්පත් බැංකු පනතේ සංශෝධිත තීරණය:**

  මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද පොරොන්දු ලිපියක් සමගින් ශ්‍රී ලංකා රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ව්‍යවසායන් සඳහා ණයවර ලිපි විවෘත කිරීම් සඳහා පහසුකම් සැලසීම.

- **බලපත්‍රලාභී බැංකු සඳහා ප්‍රතිසාධන සැලසුම්**

  ප්‍රතිසාධන සැලසුම් සංවර්ධනය කිරීම පිළිබඳ උපදෙස්.

- **ජංගම බැංකුකරණ ඒකක (MBU) සඳහා මාර්ගෝපදේශ**

  ජංගම බැංකුකරණ ක්‍රියාකාරකම් පැවැත්වීම සඳහා පූර්ව අනුමැතිය සංශෝධනය කිරීම.

- **දිට්වා සුළි කුණාටු සහන පියවර:**
  - මාස 3-6 ක් සඳහා ණය සහ පොළී ආපසු ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම.
  - සහන කාලසීමා සහ පොළී අනුපාත සහිතව නව ණය පහසුකම් ලබා දීම.
  - 2026 ජනවාරි 31 දක්වා ගාස්තු සහ දඩ මුදල් නිදහස් කිරීම.

2025 වසර බැංකු අංශයේ සමබර හා විචක්ෂණශීලී වර්ධනයක් පිළිබිඹු කළේ, ආර්ථික ප්‍රකෘතියට සහාය වීම, ජාතික සංවර්ධන ප්‍රමුඛතා සක්‍රීය කිරීම, ඩිජිටල් පරිවර්තනය ශක්තිමත් අවදානම් කළමනාකරණය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය පවත්වා ගනිමින් ය. ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ප්‍රකෘතිමත් වීම සහ දිගුකාලීන ස්ථාවරත්වය සඳහා වඩාත් කාර්යක්ෂමව සහ උපරිම ලෙස බැංකු ක්ෂේත්‍රය දායක විය.

වාහන ආනයන සීමා කිරීම් ක්‍රමයෙන් ලිහිල් කිරීම, මෝටර් රථ මූල්‍යකරණය සහ කල්බදු මිලදී ගැනීම් ක්‍රියාකාරකම්වල සැලකිය යුතු වැඩිවීමක් ඇති කළ අතර සිල්ලර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ නිවාස ණය විධිමත් ආකාරයකින් අඛණ්ඩව ව්‍යාප්ත විය. ඩිජිටල් බැංකුකරණය වේගවත් වූ අතර එමඟින් පුළුල් ගනුදෙනුකාර ප්‍රවේශයක මෙහෙයුම් කාර්යක්ෂමතාවයක් සහ වැඩිදියුණු කළ මූල්‍ය ඇතුළත්කරණයක් සිදුවිය.

මෙම ධනාත්මක ප්‍රවණතා තිබියදීත්, දේශගුණික අවදානම්, ඉහළ ඉල්ලුමක් ඇති අංශ වලට ණය සන්කේන්ද්‍රණය සහ විභව ගෝලීය වෙළඳපල අස්ථාවරත්වය ඇතුළු ප්‍රධාන අවදානම් පිළිබඳ අවධානය යොමු කිරීමට සිදු විය. විනයගරුක ණය ඇගයීම සහ ඉලක්කගත අවදානම් කළමනාකරණ ක්‍රමවේද මඟින් වත්කම්වල ගුණාත්මකභාවය ශක්තිමත් කිරීම හේතුවෙන් අක්‍රීය ණය ක්‍රමයෙන් දියුණුවක් පෙන්නුම් කළේ ය.

පෙස්ටල් විශ්ලේෂණය

දේශීය ආර්ථික අවකාශය තුළ මතු වෙමින් පවතින නව ප්‍රවණතා සහ අභියෝගයන්ට බැංකුව දක්වන ප්‍රතිචාරය මෙම විශ්ලේෂණය මගින් විමසා බලයි.

P දේශපාලනික සන්දර්භය

දේශපාලන ස්ථාවරත්වය:

ප්‍රතිසංවිධාන සහ ප්‍රතිව්‍යුහගතවීම් කෙරෙහි රජයේ අවධානය, මැතිවරණවලින් පසු ස්ථාවරත්වය පවත්වා ගැනීම.

ප්‍රතිපත්ති අවධානය:

මූල්‍ය විනය, රාජ්‍ය අංශයේ විනිවිදභාවය සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කෙරෙහි අවධාරණය

බහුපාර්ශ්වික සහභාගීත්වය:

මූල්‍ය අංශයේ විශ්වාසය තහවුරු කරමින් ලබාදෙන ඇමරිකානු ඩොලර් මිලියන 334 (3 වන සමාලෝචනය) සහ ඇමරිකානු ඩොලර් මිලියන 350 (4 වන සමාලෝචනය) හදිසි මූල්‍යකරණය ඇතුළුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ අඛණ්ඩව ශක්තිමත් සහයෝගිතාවය

අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය

- ස්ථාවර දේශපාලන පරිසරයක් තුළ බැංකුවට විශ්වාසයෙන් යුතුව ණය ලබා දීමට සහ තැන්පතු බලගැන්වීමට හැකි විය.
- නියාමන ප්‍රතිසංස්කරණ මගින් යහපාලනය වැඩිදියුණු වූ අතර උපායමාර්ගික වර්ධන අවස්ථා නිර්මාණය විය.
- රජය විසින් මෙහෙයවනු ලබන අංශ ඒකාබද්ධ කිරීම බැංකු මෙහෙයුම් ශක්තිමත් කළේය.
- රජයේ ප්‍රමුඛතා (ඩිජිටල් සහ මූල්‍ය ඇතුළත්කරණය) සමඟ පෙළගැස්වීම හරහා ග්‍රාමීය අඩු පහසුකම් සහිත ප්‍රජාවන් වෙත ළඟා වීමට ඉඩ සැලසීය.
- රජයේ මූලපිරීම් සහ යටිතල පහසුකම් මූල්‍යකරණයන්හි සහභාගීත්වය මඟින් බැංකුවේ ජාතික කාර්යභාරය සහ වෙළඳපල නායකත්වය ශක්තිමත් කළේය.

අදාළ අවදානම් R1 R2

ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා M1

E ආර්ථික සන්දර්භය

ආර්ථික වර්ධනය:

2025 වසරේ මුල් මාස නවය තුළ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය 5.4% කින් වර්ධනය වූ අතර කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා අංශයේ වර්ධනය ඊට දායක විය.

උද්ධමනය:

2025 දෙසැම්බර් මාසයේදී CCPI අනුපාතය 2.1% ක් ලෙස පවත්වා ගනිමින් උද්ධමනය අඩු මට්ටමක පැවතුන ද, කාලගුණික බාධා හේතුවෙන් ආහාර මිල ඉහළ ගියේය.

පොළී අනුපාත:

2025 දී වෙළඳපල පොළී අනුපාත පහත වැටුණු අතර ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තිය යටතේ ණය වර්ධනයට සහාය විය.

විදේශ අංශය:

ගෝලීය අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ වුවද සංචාරක ව්‍යාපාරය, ප්‍රේෂණ සහ වැඩිදියුණු කළ විදේශ සංචිත හේතුවෙන් බාහිර අංශය ශක්තිමත් විය.

මුදල් සංචලනය:

2025 දී ඒක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වූ නමුත් ස්ථාවරව පැවතුනි.

රාජ්‍ය කාර්යසාධනය:

වැඩිදියුණු කළ රජයේ ආදායම සහ අඩු කළ අය-වැය හිඟය මූල්‍ය ස්ථාවරත්වය සහ ප්‍රතිපත්තිමය සහාය වැඩි දියුණු කළේය.

අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය

- ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවය: ශක්තිමත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය සහ ද්‍රවශීලතාවය පවත්වා ගැනීම
- අවදානම් කළමනාකරණය: වැඩිදියුණු කළ අවදානම් රාමු සහ ආංශික සීමාවන් සමඟ අවදානම් සංවේදී ණය පවත්වා ගෙන යාම සහතික කිරීම
- ණය ප්‍රසාරණය: තෝරාගත් ක්ෂේත්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, අපනයන, සංචාරක, වාහන ලීසිං සහ නිවාස යන අංශ සඳහා ණය දීම වැඩි කිරීම.
- බාහිර අංශයේ උත්තේජනය: ඉහළ ගිය තැන්පතු සහ විදේශ මුදල් හරහා හවුල්කාරිත්වයන්, ඩිජිටල් වේදිකා, සංචාරක සහ වෙළඳ මූල්‍යකරණය
- වර්ධන අවධානය: 2025 දී තිරසාර සහ වේගවත් කළ බැංකු මෙහෙයුම්

අදාළ අවදානම් R1 R2 R3 R4

ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා M1

S සමාජීය සන්දර්භය

ජන විකාශනය:

තරුණ හා Z පරපුර මගින් ඩිජිටල් බැංකුකරණය, මූල්‍ය සාක්ෂරතාවය සහ තාරුණ්‍යය කේන්ද්‍රීය ඉතුරුම් නිෂ්පාදන සඳහා වැඩි ඉල්ලුම.

නාගරීකරණය සහ සංචලතාව:

සිල්ලර හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල බැංකු අවශ්‍යතා සඳහා ඉල්ලුම වැඩි කරන නාගරික මධ්‍යම පන්තිය වර්ධනය වීම.

මහජන අපේක්ෂාවන්:

ආයතනික සමාජ වගකීම, මූල්‍ය ඇතුළත්කරණය සහ සදාචාරාත්මක බැංකුකරණය කෙරෙහි අවධානය වැඩි වීම.

ඩිජිටල් භාවිතය:

විශේෂයෙන් තාක්ෂණික දැනුමැති තරුණයින් අතර සමාජ බැංකුකරණය වේගවත් වීම.

අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය

- **මූල්‍ය සාක්ෂරතාවය:** තරුණයන්ට ණය පහසුකම් ලබා දෙන අතරතුර පාසල් සහ විශ්වවිද්‍යාල සිසුන්ට ඉතුරුම්, ණය සහ ඩිජිටල් මූල්‍ය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දෙන වැඩසටහන් ව්‍යාප්ත කරන ලදී.
- **ඩිජිටල් බැංකුකරණය:** තාක්ෂණික දැනුමැති සහ නාගරික ගනුදෙනුකරුවන් සඳහා ජංගම යෙදුම් සහ මාර්ගගත වේදිකා හදුන්වාදෙන ලදී.
- **ඇතුළත් නිෂ්පාදන:** අඩු ආදායම්ලාභී ග්‍රාමීය කණ්ඩායම් (උදා: අස්වැසුම ප්‍රතිලාභීන්) සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ක්ෂුද්‍ර මූල්‍ය සඳහා පුද්ගලාරෝපිත සේවා ලබා දී ඇත.
- **ප්‍රජා සම්බන්ධීකරණය:** මහජන විශ්වාසය ගොඩනැගීම සඳහා ජාතික සංවර්ධන ප්‍රමුඛතා සමඟ පෙළගැස්වූ වැඩසටහන් ශක්තිමත් කරන ලදී.
- **දත්ත මත පදනම් වූ සේවා:** සමාජ ප්‍රවණතා නිරීක්ෂණය කිරීමට සහ බැංකු සේවා පුද්ගලීකරණය කිරීමට දත්ත සහ විශ්ලේෂණ භාවිතා කරන ලදී.

අදාළ අවදානම් R1 R2 R3

ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා M3 M8 M10

මෙහෙයුම් සන්දර්භය

T තාක්ෂණික සන්දර්භය

ජාතික ඩිජිටල් පරිසර පද්ධතිය:

GovPay ඇතුළු ඩිජිටල් ගෙවීම් සහ මූල්‍ය සේවා භාවිතය ඉහළ නැංවීමට රජයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුලපිරීම්.

ඩිජිටල්කරණය සහ කෘතිම බුද්ධිය:

වැඩිදියුණු කළ සේවා, පුද්ගලීකරණය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව තුළින් බැංකුකරණයේ පරිවර්තනීය වෙනසක් ඇති කිරීම.

ඩිජිටල් යටිතල පහසුකම්:

ඩිජිටල් බැංකුකරණය පුළුල් ලෙස භාවිතා කිරීමට ඉඩ සලසන අන්තර්ජාල සහ ජංගම සම්බන්ධතා ව්‍යාප්තිය.

ෆින්ටෙක් පුළුල් කිරීම:

විද්‍යුත් මුදල් පසුම්බි, ඩිජිටල් ගෙවීම් සහ විකල්ප ණය දීමේ වේදිකා වල වර්ධනය, නවෝත්පාදනය සහ තරඟකාරිත්වය වැඩි කරයි.

සයිබර් ආරක්ෂාව සහ කෘතිම බුද්ධිය සම්බන්ධ අවදානම්:

කෘතිම බුද්ධිය අනිසි භාවිතය සහ වැරදි තොරතුරු මඟින් දත්ත ආරක්ෂාව කෙරෙහි ඇති වන අවදානම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.

අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය

- **ඩිජිටල් බැංකුකරණය**
  ඩිජිටල් සහ අන්තර්ජාල බැංකුකරණ සේවාවන් පුළුල් කිරීම.
- **වේදිකා ඒකාබද්ධ කිරීම**
  ඩිජිටල් සහ ගෙවීම් පද්ධති ඒකාබද්ධ කිරීම සහ ශක්තිමත් කිරීම.
- **ස්වයංක්‍රීයකරණය**
  අනුකූලතා සහ ණය ක්‍රියාවලීන්හි ස්වයංක්‍රීයකරණය වැඩි කිරීම.
- **ඩිජිටල් ගෙවීම්**
  ඩිජිටල් ගෙවීම් සම්මත කිරීම සහ මූල්‍ය ඇතුළත්කරණය ප්‍රවර්ධනය කිරීම.
- **සයිබර් ආරක්ෂාව**
  සයිබර් සහ දත්ත ආරක්ෂණ රාමු ශක්තිමත් කිරීම.
- **කාර්යක්ෂමතාව**
  ඩිජිටල් ව්‍යාප්තිය, පිරිවැය කාර්යක්ෂමතාව සහ ප්‍රවේශය වැඩි දියුණු කිරීම.

අදාළ අවදානම් R3

ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා M2

E පාරිසරික සන්දර්භය

දේශගුණික අවදානම්:

නිරන්තරව ඇතිවන ගංවතුර, නියඟ සහ දැඩි කාලගුණික ආපදා තත්ත්වයන් ප්‍රජාවන්ට සහ ව්‍යාපාරවලට බලපායි. දිට්වා සුළි කුණාටුව දේශගුණික අවදානම් පිළිබඳ තියුණු අත්දැකීමක් සහිටුහන් කළේය.

තිරසාරභාවය කෙරෙහි අවධානය:

හරිත මූල්‍ය, පුනර්ජනනීය බලශක්තිය සහ ESG අනුකූලතාව කෙරෙහි මහජනතාවගේ සහ නියාමන ආයතනවල අවධානය

සම්පත් කළමනාකරණය:

බලශක්ති කාර්යක්ෂමතාව, ජල සංරක්ෂණය සහ අපද්‍රව්‍ය අවම කිරීම ප්‍රවර්ධනය කරන ජාතික මුලපිරීම්

ආයතනික වගවීම:

බැංකු ඇතුළු සමාගම් විසින් පාරිසරික බලපෑම හෙළිදරව් කිරීමට සහ තිරසාර සංවර්ධනයට සහාය වීම.

අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය

- ශ්‍රී ලංකාවේ විශාලතම බාසල් III අනුකූල තිරසාර බැඳුම්කර දියත් කරන ලදී
- පරිසර හිතකාමී පෙළඹ හායනයට ලක්විය හැකි බැංකු කාඩ්පත් හඳුන්වා දෙන ලදී.
- ශාඛා ජාලය පුරා පුනර්ජනනීය බලශක්ති සහ බලශක්ති කාර්යක්ෂමතා පියවරයන් අනුගමනය කරන ලදී.
- ප්‍රජා පාරිසරික වැඩසටහන් සහ දැනුවත් කිරීමේ මුලපිරීම් වල නිරත වීම.
- SLFRS S1 සහ S2 ප්‍රමිතීන් වලට ස්වේච්ඡාවෙන් අනුගත වීම.

අදාළ අවදානම් R1 R2 R3

ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා M6 M7 M9

L නීතිමය සහ නියාමන සන්දර්භය

2025 ජූලි 1 වන දින සිට බල පැවැත්වෙන පරිදි පරාටේ නීතිය නැවත ස්ථාපිත කිරීම,

ශ්‍රී ලංකා මහ බැංකුවේ තිරසාර මූල්‍ය පෙරදැක්ම

තිරසාර මූල්‍යකරණය, අවදානම් කළමනාකරණය සහ වාර්තාකරණය සඳහා මඟ පෙන්වමින්, මෙම පෙර දැක්ම (2025–2029) අදාළ පාර්ශ්වයන් විසින් අනුමත කරන ලද ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සමඟ දියත් කරන ලදී.

අනෙකුත් නියාමන යාවත්කාලීන කිරීම්:

- ණය වර්ධනයට සහාය වන සහනදායී පොළී අනුපාත ප්‍රතිපත්ති
- ඩිජිටල් බැංකුකරණය සහ සයිබර් ආරක්ෂාව නියාමනය
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ක්ෂුද්‍ර මූල්‍ය සහ ග්‍රාමීය බැංකුකරණය දිරිමත් කරමින් මූල්‍ය ඇතුළත්කරණය ප්‍රවර්ධනය

අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය

- නීති, රෙගුලාසි සහ අනුකූලතා අවශ්‍යතා කාලෝචිත ආකාරයකින් පිළිපැදීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ තිරසාරභාවය හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා වාර්තාකරණ පද්ධති සංවර්ධනය කරන ලදී.
- වැඩි දියුණු කරන ලද සහ සහතික කරන ලද ගනුදෙනුකාර දත්ත ආරක්ෂාව

අදාළ අවදානම් R1 R3

ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා M2 M4 M5

පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වීම

GRI 2-29

ලංකා බැංකුවේ පාර්ශ්වකරුවන් විවිධාකාර සහ බහුවිධ ප්‍රජාවකින් නිර්මිතය. රුබික් ඝනකයක වෙනස් වන මුහුණු මෙන්, සෑම පාර්ශ්වකරුවෙකුටම අනන්‍ය අපේක්ෂාවන්, ප්‍රමුඛතා සහ බැංකුවේ ප්‍රගතියට දායක වන ආකාරය නියෝජනය එමඟින් කරයි. මෙම සංකීර්ණත්වය හඳුනා ගනිමින්, බැංකුව ඔවුන්ගේ විකාශනය වන අවශ්‍යතා තේරුම් ගැනීමට, සබඳතා ශක්තිමත් කිරීමට සහ එහි උපායමාර්ගික දිශාව දැනුම් දීමට පුළුල් පරාසයක ව්‍යුහගත සහ ප්‍රතිචාරාත්මක සම්බන්ධතා යාන්ත්‍රණ අනුගමනය කරයි. අඛණ්ඩ සංවාද, ප්‍රතිපෝෂණ නාලිකා සහ සහයෝගීතා හවුල්කාරිත්වයන් හරහා, බැංකුව පාර්ශ්වකරුවන් සක්‍රීයව එහි තීරණ ගැනීම සඳහා දායක වන බවටත් බැංකුව තිරසාර අගය බෙදා හැරීම සඳහා කැපවන බවටත් තහවුරු කරනු ඇත.

කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්


කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන් වර්ධනය සඳහා බැංකුවට ඇති හැකියාව තහවුරු කරයි. ප්‍රාග්ධනය විවේක්ෂණශීලීව කළමනාකරණය සහ උපායමාර්ග විනයගරුකව ක්‍රියාත්මක කිරීම තුළින්, බැංකුව ඔවුන්ගේ අවශ්‍යතා ආරක්ෂා කර ගැනීමට සහ දිගුකාලීන වටිනාකමක් ලබා දීමට උත්සාහ කරයි.

සේවකයින්

සේවකයින් බැංකුවේ මෙහෙයුම් සහ උපායමාර්ගික හැකියාවේ කොඳු නාරටිය බඳුය. කුසලතා, යහපැවැත්ම, සහ වෘත්තීය දියුණුව තුළ අඛණ්ඩ ආයෝජනය, අභිප්‍රේරිත සහ අනාගතයට සූදානම් ශ්‍රම බලකායකට සහාය වේ.

ප්‍රජාව සහ පරිසරය

ප්‍රජාව සහ පරිසරය බැංකුව ක්‍රියාත්මක වන පුළුල් සන්දර්භය නියෝජනය කරයි. සමාජ යහපැවැත්ම, පාරිසරික වගකීම, සහ ඇතුළත් සංවර්ධනය ප්‍රවර්ධනය කරන මූලපිරීම් සඳහා බැංකුව ප්‍රමුඛත්වය ලබා දෙයි.



ගනුදෙනුකරුවන්

බැංකුව තම ගනුදෙනුකරුවන් සේවා නවෝත්පාදනයේ ප්‍රධාන ධාවකයින් ලෙස සලකයි. ඔවුන්ගේ විකාශනය වන අපේක්ෂාවන් නිෂ්පාදන සංවර්ධනයට, සේවා ජාලය ප්‍රසාරණයට, සහ විශ්වාසදායකව, ප්‍රවේශ විය හැකි මූල්‍ය විසඳුම් ලබා දීමට හේතු වේ.

නියාමකයින්

ස්ථාවර මූල්‍ය පරිසරයක් හැඩගැස්වීමේදී නියාමන ආයතන ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. වෙනස් වන අවශ්‍යතා සහ කර්මාන්ත ප්‍රමිතීන් සමඟ පෙළගැස්ම සහතික කරමින් නියාමන කටයුතු සඳහා බැංකුව ක්‍රියාශීලී සහ සහයෝගී ප්‍රවේශයක් පවත්වාගෙන යයි.

ව්‍යාපාරික හවුල්කරුවන්

ව්‍යාපාරික හවුල්කරුවන් බැංකුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සේවා ව්‍යාප්තිය සඳහා දායක වේ. බැංකුව සැපයුම් දාමය පුරා වගවීම බෙදා හරිමින් සහ වටිනාකම් නිර්මාණය ශක්තිමත් කරමින් විනිවිදාත්මක සහයෝගී සබඳතා වර්ධනය දිරිමත් කරයි.

පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වීමේ ක්‍රියාවලිය

බැංකුව පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වීමේ ව්‍යුහගත ප්‍රවේශය පහත සටහන් කර ඇත:

01 පාර්ශ්වකරුවන් අවබෝධ කර ගැනීම

- ප්‍රධාන පාර්ශ්වකාර කණ්ඩායම් හඳුනා ගැනීම සහ ප්‍රමුඛත්වය දීම
- ඔවුන්ගේ උනන්දුව, බලපෑම සහ අපේක්ෂාවන් තක්සේරු කිරීම

02 සබඳතා ඔප් නැංවීම

- අරමුණ සහ අපේක්ෂිත ප්‍රතිඵල නිර්වචනය කිරීම
- සුදුසු සේවා නාලිකා, ක්‍රමවේද සහ වාර ගණන තේරීම

03 වටිනාකම් ලබා දීම

- පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් ආමන්ත්‍රණය කරන ක්‍රියාමාර්ග සහ ප්‍රතිචාර සංවර්ධනය කිරීම
- පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය

04 වගවීම විදහා දැක්වීම

- කාර්යක්ෂමතාව මැනීම සහ ප්‍රතිඵල තක්සේරු කිරීම
- පාර්ශ්වකරුවන් වෙත ප්‍රගතිය වාර්තා කිරීම
- ප්‍රතිචාර මත අනාගත සම්බන්ධතා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

ප්‍රමාණාත්මක මාතෘකාවන්ට සබැඳිය

වසර තුළ බැංකුව විසින් පාර්ශ්වකරුවන්ගේ පුළුල් සහභාගීත්ව සමීක්ෂණයක් සිදු කරන ලද අතර, එය සෘජුවම ප්‍රමාණාත්මක මාතෘකා දහයක් හඳුනාගැනීමට දායක විය.

ගනුදෙනුකරුවන්

බැංකුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ආයතනික සහ අක්වේරළ ගනුදෙනුකරුවන්ට සේවය කරන අතර, විවිධ මූල්‍ය අවශ්‍යතා සඳහා සහාය වීම සඳහා නිර්මාණය කර ඇති පුළුල් පරාසයක මූල්‍ය නිෂ්පාදන සහ සේවාවන් පිරිනමයි.

සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය: ශක්තිමත්

තිරසාර සංවර්ධන ඉලක්ක

අපේක්ෂාවන්:	සම්බන්ධ වීම්:		ප්‍රතිචාරය:
• වේගවත් සහ පහසු සේවාවන්	• ශාඛා සහ ඩිජිටල් නාලිකා හරහා සෘජු සම්බන්ධ වීම	O	• ගනුදෙනුකාර කේන්ද්‍රීය විසඳුම් ලබාදීම
• විශ්වාසනීය, ආරක්ෂිත සහ ප්‍රවේශ විය හැකි වේදිකා	• වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය වේදිකා	O	• ඩිජිටල් බැංකුකරණ හැකියාවන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම
• විනිවිද බව සහ තරඟකාරී මිලකරණය	• ගනුදෙනුකාර ක්ෂණික ඇමතුම් අංකය සහ සේවා මධ්‍යස්ථාන	O	• ගනුදෙනු කාලය අඩු කිරීම සඳහා ස්වයංක්‍රීයකරණ මූලපිරීම්
• සාධාරණ සැලකීම් සහ වගකීම් සහගත බැංකුකරණය	• මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්	O	• සයිබර් ආරක්ෂාව සහ ගනුදෙනු මාධ්‍යයන්හි ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම
• මූල්‍ය සහ උපදේශන සහාය වෙත ප්‍රවේශය	• අලෙවිකරණය, වෙළඳ දැන්වීම් සහ ප්‍රචාරණය	O	• මූල්‍ය සාක්ෂරතාවය සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
	• වෙළඳපළ සමීක්ෂණ සහ ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ	P	

ජනිත කළ වටිනාකම්:

ගනුදෙනුකරුවන්ට ලබාදුන් දළ ණය සහ අත්තිකාරම්:
රු. ට්‍රිලියන 2.7

ඩිජිටල් ගනුදෙනු: **මිලියන 419.4**

තැන්පතු මත පොළිය:
රු. බිලියන 260.6

ගනුදෙනුකාර සේවා ප්‍රශස්තකරණය
පිටු *132-137*

ඩිජිටල් අත්දැකීම් බලගැන්වීම
පිටු *148-152*

උපායමාර්ගය:

ප්‍රාග්ධන සමතුලිත කිරීම්:

කෙටිකාලීන:
තාක්ෂණය සහ සේවා සඳහා ආයෝජනය කිරීමේ බලපෑම:

දිගුකාලීන:
ගනුදෙනුකාර විශ්වාසය, ඇතුළත්කරණය සහ ඩිජිටල් වැඩිදියුණු කිරීමේ බලපෑම:

ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැංවීම:

සේවකයින්

ශ්‍රී ලංකාව පුරා සහ විදේශයන්හි සිටින බැංකුවේ සේවක මණ්ඩලය එහි මෙහෙයුම් සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණයට සහාය වේ.

සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය: ශක්තිමත්

තිරසාර සංවර්ධන ඉලක්ක

අපේක්ෂාවන්:	සම්බන්ධ වීම්:		ප්‍රතිචාරය:
• තරඟකාරී වේතන	• බහු-මට්ටමේ කාර්ය මණ්ඩල රැස්වීම්	O	• පුහුණුව සහ කුසලතා අඛණ්ඩ සංවර්ධනය සඳහා වැඩසටහන් සැපයීම.
• වෘත්තීය සංවර්ධන අවස්ථා	• විවෘත-දොර සංස්කෘතිය	O	• කාර්යසාධනය මත පදනම් වූ සහන සහ ආකර්ශනීය ඇගයීම් සහ සහන ව්‍යුහයන් ක්‍රියාත්මක කිරීම
• කුසලතා වැඩිදියුණු කිරීම	• දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණ	O	• ශාරීරික හා මානසික යහපැවැත්ම සඳහා මූලපිරීම් හඳුන්වාදීම
• ආරක්ෂිත සහ ඇතුළත් සේවා ස්ථාන	• විද්‍යුත් ඉගෙනුම් වේදිකා	O	• විශ්‍රාම වැටුප් සහ පශ්චාත් සේවා ප්‍රතිලාභ වැඩි දියුණු කිරීම
• රැකියා සුරක්ෂිතභාවය සහ විශ්‍රාම ප්‍රතිලාභ	• කාර්යසාධන ඇගයීම්	O	• මානව සම්පත් ප්‍රතිපත්ති සහ යහපාලන රාමු සමාලෝචනය කිරීම සහ ශක්තිමත් කිරීම.
	• වෘත්තීය සමිති හරහා සම්බන්ධ වීම	O	
	• සේවක තෘප්තිය පිළිබඳ සමීක්ෂණ	A	

ජනිත කළ වටිනාකම්:

මුළු සේවකයින්: 8,912
සේවකයින් රඳවා තබා ගැනීමේ අනුපාතය: 97%

සේවකයෙකු සඳහා සාමාන්‍ය පුහුණු පැය:
පැය 28

ස්ථිරසාර කාර්යසාධනයක් සඳහා පරිපූර්ණ ශ්‍රම බලකාය
පිටු *138-147*

උපායමාර්ගය:

ප්‍රාග්ධන සමතුලිත කිරීම්:

කෙටිකාලීන:
මානව ප්‍රාග්ධන ආයෝජනය සහ වේතන ගෙවීම් වගකීමේ බලපෑම:

දිගුකාලීන:
සේවක ශක්‍යතාවය, සංස්කෘතිය සහ නායකත්ව හැකියාව ශක්තිමත් කිරීම:

ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැංවීම:

සම්බන්ධතා වාර ගණන: O නිරන්තර P කාලානුරූපී Q කාර්තුමය B අර්ධ-වාර්ෂික A වාර්ෂික

කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්

ශ්‍රී ලංකා රජය, බැංකුවේ විකම කොටස් හිමියා වන අතර අරමුදල් සපයන්නන්ට ණයකර හිමියන් ඇතුළත් වේ.

සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය: ශක්තිමත්

තිරසාර සංවර්ධන ඉලක්ක

අපේක්ෂාවන්:	සම්බන්ධ වීම:		ප්‍රතිචාරය:
• අවදානම සහ අවස්ථා සමඟ ප්‍රතිලාභ පෙළගස්වා ඇත • විනිවිදභාවයෙන් යුක්ත සහ කාලෝචිත වාර්තා කිරීම • ශක්තිමත් ආයතනික යහපාලනය සහ අවදානම් අධීක්ෂණය • වගකීම් සහගත හැසිරීම් සහ සදාචාරාත්මක පිළිවෙත් • පිළිගැනීම සහ කීර්තිය	• ලංකා බැංකුවේ වෙබ් අඩවිය • වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන • කාලානුරූපී රැස්වීම්/ ප්‍රධාන නියෝජිතයන් සමඟ ලිඛිත සන්නිවේදනය • විශාල ආයෝජකයින් වෙත ප්‍රවේශය සහ සාකච්ඡා • වෙළඳපළ අතරමැදියන් හරහා සම්බන්ධ වීම • කොළඹ කොටස් වෙළඳපළ ආයතනික නිවේදන	O AO P P P P	• ස්ථාවර සහ තිරසාර ප්‍රතිලාභ ජනනය කිරීම මත අවධානය යොමු කිරීම • ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් පවත්වා ගැනීම • නීති සහ මාර්ගෝපදේශ වෙත අනුගත වීම • ප්‍රාග්ධනය ශක්තිමත් කිරීමේ මූලපිරීම් ක්‍රියාත්මක කිරීම • කාලෝචිත සහ විනිවිදාත්මක වෙළඳපළ හෙළිදරව් කිරීම්

ජනිත කළ වටිනාකම්:

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය: 16.9%

ස්කන්ධයෙහි සාමාන්‍ය මත ප්‍රතිලාභය (ROE): 22.7%

ණය ශ්‍රේණිගත කිරීම AA- (lka)/ස්ථාවර දක්වා උත්ශ්‍රේණි ගත කරන ලදී

මූල්‍ය සමාලෝචනය පිටු *108-114*

උපායමාර්ගය:

ප්‍රාග්ධන සමතුලිත කිරීම්:

කෙටිකාලීන:
මෙහෙයුම්, අනුකූලතා සහ වාර්තාකරණය මගින් වන බලපෑම:

දිගුකාලීන:
ශක්තිමත් යහපාලනය, විශ්වාසය, සහ මූල්‍ය විනය වැඩි දියුණු කිරීම:

ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැංවීම:

ප්‍රජාව සහ පරිසරය

බැංකුව ක්‍රියාත්මක වන ප්‍රජාවන්, සාමාන්‍ය ජනතාව සහ ස්වභාවික පරිසරය මෙයට ඇතුළත් වේ.

සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය: ශක්තිමත්

තිරසාර සංවර්ධන ඉලක්ක

අපේක්ෂාවන්:	සම්බන්ධ වීම:		ප්‍රතිචාරය:
• ව්‍යාපාර පුනර්ජීවනය සහ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව සඳහා සහාය වීම • මූල්‍ය අංශය තුළ විශ්වාසය සහ ස්ථාවරත්වය • ජාතික සංවර්ධන ප්‍රමුඛතා සමඟ බැංකු උපායමාර්ග පෙළගැස්වීම • ESG සලකා බැලීම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම • ප්‍රජා නඟා සිටුවීමේ මූලපිරීම් සඳහා දායකත්වය • වගකීම් සහගත ව්‍යාපාරික පිළිවෙත් • මූල්‍ය ඇතුළත් කිරීම් සහ සවිබල ගැන්වීම	• වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන • ලංකා බැංකුවේ වෙබ් අඩවිය සහ අනෙකුත් ඩිජිටල් වේදිකා • කර්මාන්ත සංසද, සම්මන්ත්‍රණ සහ ප්‍රතිපත්ති සංවාද • ශාඛා හරහා සම්බන්ධ වීම • ප්‍රජා ආයෝජන වැඩසටහන් • මාධ්‍ය නිවේදන සහ මාධ්‍ය ප්‍රචාරණ	QA P P P P P	• තරුණ, කාන්තා සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ඉලක්කගත ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම • යහපාලන සහ අවදානම් කළමනාකරණ පද්ධති ශක්තිමත් කිරීම • රැකියා උත්පාදනය ප්‍රවර්ධනය කිරීම • රට පුරා මූල්‍ය ඇතුළත්කරණය දියුණු කිරීම • ප්‍රජා සංවර්ධනය සඳහා දිගුකාලීන ආයෝජන තිරසාර කිරීම • රජයේ ප්‍රමුඛතාවයන්ට වටිනාකමක් ලබා දීම • පුනර්ජීවන වැඩක හරහා ජාතික ආර්ථික ප්‍රතිසාධන ප්‍රයත්නයන්ට සහාය වීම • දේශගුණික අවදානම් සහ අවස්ථාවන් කෙරෙහි අවධානය යොමු කිරීම

ජනිත කළ වටිනාකම්:

ප්‍රජා ආයෝජනය: **රු. මිලියන 780.5**

සාක්ෂාත් කරගත් පාරිසරික බලපෑම (වළක්වා ගත් CO2e): **14.4 tCO_2e**

තිරසාර අනාගතයක් ගොඩනැගීම පිටු *153-160*

උපායමාර්ගය:

ප්‍රාග්ධන සමතුලිත කිරීම්:

කෙටිකාලීන:
මෙහෙයුම් බාධා, සම්පත් වෙන් කිරීම සහ ව්‍යාපෘතිවල ආයෝජන බලපෑම:

දිගුකාලීන:
සමාජීය දැනුවත් කිරීම සහ පාරිසරික ජයග්‍රහණ, වැඩිදියුණු කිරීම:

ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැංවීම:

ව්‍යාපාරික හවුල්කරුවන් සහ සැපයුම්කරුවන්

සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය: ශක්තිමත්

මෙහෙයුම් කටයුතු වලට සහාය වන දේශීය සහ ගෝලීය සැපයුම්කරුවන්, සේවා සපයන්නන් සහ විදේශීය නියෝජිත බැංකු හවුල්කරුවන් සමඟ බැංකුව සබඳතා පවත්වාගෙන යයි.

තිරසාර සංවර්ධන ඉලක්ක

අපේක්ෂාවන්:	සම්බන්ධ වීම්:		ප්‍රතිචාරය:
• විනිවිදභාවයෙන් යුත් තෝරා ගැනීමේ ක්‍රියාවලි	• අඛණ්ඩ ලිඛිත සන්නිවේදනය	O	• විනිවිදභාවයෙන් යුත් ලංසු තැබීමේ සහ ඇගයීම් ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම
• තරඟකාරී සහ සාධාරණ මිලකරණය	• නිතිපතා රැස්වීම්	P	• ගෙවීම් පැහැර හැරීම් නොමැත
• කාලෝචිත ගෙවීම්	• කාලානුරූපී ලංසු තැබීමේ ක්‍රියාවලි	P	• ප්‍රසම්පාදන ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය සහ ඩිජිටල්කරණය
• සදාචාරාත්මක සහ වගකිම් සහගත ප්‍රසම්පාදනය	• මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික වාර්තා	QA	• සැපයුම්කරුවන්ගේ යහපාලන සහ අධීක්ෂණ ජාලයන් ශක්තිමත් කිරීම
• ගනුදෙනු කිරීමේ පහසුව	• පුවත්පත් දැන්වීම් සහ හෙළිදරව් කිරීම්	O	

ජනිත කළ වටිනාකම්:

සැපයුම්කරුවන්ට මුළු ගෙවීම්: **රු. බිලියන 10.7**

ක්‍රියාකාරී සැපයුම්කරු පදනම: **851**

තිරසාර අනාගතයක් ගොඩනැගීම පිටු *153-160*

උපායමාර්ගය:

ප්‍රාග්ධන සමතුලිත කිරීම්:

කෙටිකාලීන:
මෙහෙයුම් වියදම් සහ කාරක ප්‍රාග්ධන වෙන් කිරීමේ බලපෑම:

දිගුකාලීන:
සැපයුම් දාමයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සහ දේශීය ආර්ථික දායකත්වය වැඩි දියුණු කිරීම:

ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැංවීම:

නියාමකයින්

සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය: ශක්තිමත්

බැංකුවේ ප්‍රධාන නියාමන ආයතන අතරට ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL), ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ හුවමාරු කොමිසම (SEC), කොළඹ කොටස් හුවමාරුව (CSE), සහ අදාළ විදේශීය නියාමන අධිකාරීන් ඇතුළත් වේ.

තිරසාර සංවර්ධන ඉලක්ක

අපේක්ෂාවන්:	සම්බන්ධ වීම්:		ප්‍රතිචාරය:
• නියාමන අනුකූලතාව	• නියාමන වාර්තාකරණය	OQ	• නියාමන වාර්තා කාලෝචිතව ඉදිරිපත් කිරීම
• ශක්තිමත් යහපාලනය සහ අවදානම් කළමනාකරණය	• පුද්ගල අධීක්ෂණ රැස්වීම්	O	• ප්‍රාග්ධන අවශ්‍යතා පිළිපැදීම සහ විවේකීශීලී අධීක්ෂණය
• මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය	• බැංකු ක්ෂේත්‍රයේ සංසඳ හරහා සාකච්ඡා	P	• අනිවාර්ය ණය දීමේ නියෝග සමඟ අනුකූලතාව
• ජාතික ආර්ථික ප්‍රමුඛතා සඳහා සහාය	• වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන	QA	• යහපාලන සහ අවදානම් අධීක්ෂණ රාමු ශක්තිමත් කිරීම
			• අවදානමට ලක්විය හැකි සහ ප්‍රමුඛතා අංශ සඳහා සහාය අඛණ්ඩව සැලසීම

ජනිත කළ වටිනාකම්:

අඛණ්ඩතාව සහ කර්මාන්තයේ සහජීවනය පවත්වා ගැනීම

ප්‍රමාණාත්මක නියාමන කඩ කිරීම්: නොමැත

අනුකූලතා ඇමුණුම් පිටු *405-454*

උපායමාර්ගය:

ප්‍රාග්ධන සමතුලිත කිරීම්:

කෙටිකාලීන:
අනුකූලතාව සහ මානව ධාරිතා වර්ධනය සඳහා ආයෝජනය කිරීමේ බලපෑම:

දිගුකාලීන:
ගනුදෙනුකාර විශ්වාසය, ඇතුළත්කරණය සහ ඩිජිටල් හැකියාව වැඩි දියුණු වීම:

ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැංවීම:

ප්‍රමාණාත්මකතා තක්සේරුව

GRI 3-1,2

බැංකුවේ මෙහෙයුම් ජාතික ආර්ථික හා සමාජීය ප්‍රමුඛතාවන්ට අඛණ්ඩව සහාය දක්වන බැවින්, ප්‍රමාණාත්මක තිරසාරභාවය පිළිබඳ ගැටළු අවබෝධ කර ගැනීම සහ ඒවාට විසඳුම් සෙවීම එහි වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියට අත්‍යවශ්‍ය වේ. වසර තුළ, පරිණාමය වන පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන්, නියාමන වර්ධනයන් සහ ගෝලීය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව තිරසාරභාවය පිළිබඳ මාතෘකා නැවත සලකා බැලීම සහ ප්‍රමුඛතාවය දීම සඳහා බැංකුව පුළුල් ප්‍රමාණාත්මක තක්සේරුවක් සිදු කළේය. ද්විත්ව ප්‍රමාණාත්මක මූලධර්මය මගින් මෙහෙයවනු ලබන තක්සේරුවල බලපෑම් ප්‍රමාණාත්මකතාවය; ආර්ථික, පාරිසරික සහ සමාජීය වශයෙන් බැංකුවෙහි බලපෑම සහ මූල්‍යමය ප්‍රමාණාත්මකතාවය; බැංකුවේ කාර්යසාධනය, පැවැත්ම සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය කෙරෙහි තිරසාර සාධකයන්හි බලපෑම යන ද්විත්වයම සළකා බලන ලදී.



ප්‍රමාණාත්මකතාවය තක්සේරු කිරීමේ ක්‍රමවේදය

අදාළත්වය සහ සම්පූර්ණත්වය සහතික කිරීම සඳහා මෙම තක්සේරුව අභ්‍යන්තර විශ්ලේෂණය, බාහිර අවබෝධය සමඟ ඒකාබද්ධ කළේය. ප්‍රධාන පියවරයන් තුළ ආංශික හා සාර්ව ආර්ථික ප්‍රවණතා සමාලෝචනය කිරීම, බාහිර සම ආයතන සමඟ සංසන්දනාත්මක මිනුම් ක්‍රමවේද ස්ථාපනය සහ සේවකයින්, ගනුදෙනුකරුවන්, නියාමන ආයතන, කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්, ප්‍රජාව සහ ව්‍යාපාරික හවුල්කරුවන් වැනි පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වීම ඇතුළත් විය. විභව තිරසාරභාවය පිළිබඳ කරුණු ආර්ථික, පාරිසරික, සමාජීය සහ යහපාලනය (EESG) යන මානයන් හරහා ඒකරාශි කර ද්විත්ව ප්‍රමාණාත්මක සාධක භාවිතයෙන් වැදගත්කම සඳහා ඇගයීමට ලක් කරන ලදී. ඉන්පසු සාපේක්ෂ බලපෑම් සහ මූල්‍යමය අදාළත්වය මත පදනම්ව ප්‍රමුඛත්වය දෙමින් මාතෘකා ශ්‍රේණිගත කරන ලදී. බැංකුවේ උපායමාර්ගික දිශාව සහ වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය සමඟ අනුකූලත්වය සහතික කරමින් කළමනාකරණ කමිටුව විසින් ප්‍රතිඵලයන් සමාලෝචනය කර තහවුරු කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

හඳුනා ගැනීම

අභ්‍යන්තර සහ බාහිර සන්දර්භයන් පිළිබඳ පුළුල් සමාලෝචනයක් කිරීම

වැදගත්කම තක්සේරු කිරීම

ව්‍යාපාරය සඳහා වැදගත්කම, පාර්ශ්වකරුවන් සහ වටිනාකම් දාමය යනාදී සාධක ඔස්සේ එක් එක් මාතෘකාව බැංකුවට කෙතරම් තීරණාත්මකද යන්න සලකා බලමින්, සෑම මාතෘකාවකම උපායමාර්ගික වැදගත්කම තක්සේරු කිරීම

ප්‍රමුඛත්වය දීම

එක් එක් පාර්ශ්වකාර කණ්ඩායම් වල වැදගත්කම තක්සේරු කිරීමෙන් සහ බැංකුවේ වටිනාකම් නිර්මාණය සහ දිගුකාලීන තිරසාරභාවය කෙරෙහි එක් එක් මාතෘකාවේ ආර්ථික, පාරිසරික, සමාජීය සහ යහපාලන බලපෑම් ඇතුළුව සමස්ත ව්‍යාපාරික බලපෑම තක්සේරු කිරීමෙන් මාතෘකා සඳහා ප්‍රමුඛත්වය ලබා දෙයි.

අධීක්ෂණය සහ වාර්තාකරණය

මෙහෙයුම් පරිසරයේ සිදුවන වෙනස්කම් වලට ප්‍රතිචාර වශයෙන් බැංකුව නිතිපතා එහි ප්‍රමාණාත්මක මාතෘකා සමාලෝචනය කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට සහ පාර්ශ්වකරුවන්ට වාර්තා කිරීම.


ප්‍රමාණාත්මක මාතෘකා

2025 දී, බැංකුව EESG මානයන් හතරක් හරහා ප්‍රධාන ප්‍රමාණාත්මක මාතෘකා 10 ක් හඳුනා ගත් අතර, ඒවා බැංකුවේ වඩාත්ම වැදගත් බලපෑම් ක්ෂේත්‍ර නියෝජනය කරන අතර, පාර්ශ්වකරුවන්ගේ සහ මූල්‍ය කාර්යසාධනය ඒවායේ අදාළත්වය මත පදනම්ව ප්‍රමුඛතාවය ලබා දෙන ලදී.

පෙර රාමුවට සාපේක්ෂව තේමාවන් හතරක් වටා ව්‍යුහගත කර ඇති මෙම සංශෝධිත ආකෘතිය, කාර්යසාධනය, යහපාලනය, පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය සහ පාරිසරික භාරකාරත්වය අතර අන්තර් සම්බන්ධතා ඉස්මතු කරන ඒකාබද්ධ EESG රාමුවක් භාවිතා කරයි. මෙය ගැටළු පාදක කණ්ඩායම්කරණයේ සිට තිරසාරභාවය පිළිබඳ සමස්ත දැක්මක් කරා උපායමාර්ගික මාරුවක් සනිටුහන් කරන අතර, ඔරොත්තු දීමේ හැකියාව, ආචාරධර්ම පැවැත්ම, වගකීම් සහගත මූල්‍යකරණය සහ සාමූහික ප්‍රගතිය අනාවරණය කරයි.


ප්‍රමාණාත්මකතා තක්සේරුව

ඩිජිටල්කරණය සහ පරිවර්තනය, ව්‍යාපාර ආචාරධර්ම සහ නියාමන අනුකූලතාව, වගකීම් සහගත මූල්‍යකරණය, සහ දේශගුණික විපර්යාස සහ හරිතාගාර වායු විමෝචනය වැනි ප්‍රධාන තේමාවන් ප්‍රමුඛස්ථානයක් ගෙන ඇති අතර, එය බැංකුවේ නැගී එන අවදානම්, අවස්ථා සහ වෙනස් වන නියාමන අපේක්ෂාවන් සඳහා ක්‍රියාකාරී ප්‍රතිචාරයන් පිළිබිඹු කරයි. නව රාමුව ජාතික සංවර්ධන ප්‍රමුඛතා, ගෝලීය ප්‍රමිතීන් (GRI, SLFRS S1 සහ S2) සහ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් සමඟ අනුකූල වීම ශක්තිමත් කරන අතර දිගුකාලීන වටිනාකම් නිර්මාණයේ ප්‍රධාන සාධකයක් ලෙස තිරසාරභාවය ස්ථානගත කරයි.



ප්‍රමාණාත්මකතාවය පිළිබඳ රාමුවෙහි වෙනස්වීම

පහත රූප සටහන මඟින් පෙර තේමා කාණ්ඩයන් හතරේ සිට සංස්කරණය කරන ලද ප්‍රමාණාත්මක මාතෘකා 10 ක් දක්වා පරිවර්තනයක් නිරූපණය කරයි. ප්‍රමුඛතා ක්ෂේත්‍ර හරහා වැඩි පැහැදිලි බවක් සහ අර්ථ දැක්වීමක් ලබා දෙන අතර අවධානය යොමු කිරීමේ අඛණ්ඩතාව පෙන්නුම් කරයි.



ප්‍රමාණාත්මක මාතෘකා සහ බැංකුවේ උපායමාර්ගය GRI 3-3

බැංකුවේ පුළුල් දැක්ම සහ පාර්ශ්වකරුවන්ට තිරසාර වටිනාකමක් ලබා දීම සඳහා එහි කැපවීම සමඟ අනුකූල වන, පහත දක්වා ඇති ප්‍රමාණාත්මක මාතෘකා දිගුකාලීන කාර්යසාධනය සහ ඔරොත්තු දීමේ හැකියාව කෙරෙහි වඩාත්ම සැලකිය යුතු ලෙස බලපාන ක්ෂේත්‍ර පිළිබිඹු කරයි. මෙම ප්‍රමාණාත්මක මාතෘකා බැංකුවේ උපායමාර්ගය, සම්පත් විභජනය සහ තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීම සඳහා ගෙන ඇති ප්‍රධාන මූලපිරීම් ආදිය ද හැඩගස්වයි. බැංකුවේ උපායමාර්ගය තුළ ප්‍රමාණාත්මක කරුණු ඇතුළත් කර ඇති ආකාරය පෙන්නුම් කරමින්, එක් එක් ප්‍රමුඛතාවයේ තාර්කිකත්වය, උපායමාර්ගික ප්‍රතිචාර සහ පාර්ශ්වකරුවන්ගේ අදාළත්වය මෙම වගුව මගින් ගෙනහැර දක්වයි.

ප්‍රමාණාත්මක මාතෘකා	ප්‍රමාණාත්මක වීමට හේතුව	උපායමාර්ගික ප්‍රතිචාර	බලපෑමට ලක්වන ප්‍රාග්ධනයන්	බලපෑමට ලක්වන පාර්ශ්වකරුවන්	SDG හි බලපෑම
M1 **ආර්ථික කාර්යසාධනය** *GRI 201, 202, 203*	ලාභදායිතාවය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව පවත්වා ගැනීම මූල්‍යමය ඔරොත්තු දීමේ හැකියාව සහතික කරන අතර ජාතික සංවර්ධන ප්‍රමුඛතා සඳහා සහාය වෙමින් පාර්ශ්වකරුවන් සඳහා දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීමට හැකියාව ලබා දෙයි.	චිකතු කළ අගය මත ප්‍රකාශය (පිටුව 74) කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය (පිටු 107-160)			
M2 **ඩිජිටල්කරණය සහ පරිවර්තනය** *SASB FN-CB-230a.1, SASB FN-CB-230a.2, GRI 418*	ඩිජිටල් පද්ධතිවල ආයෝජනය කිරීම මෙහෙයුම් කාර්යක්ෂමතාව, ගනුදෙනුකාර පහසුව සහ සයිබර් සුරක්ෂිතතාවය වැඩි දියුණු කරන අතර සීඝ්‍රයෙන් වෙනස් වන මූල්‍ය ක්ෂේත්‍රයක් තුළ බැංකුවට තරඟකාරීත්වය හා ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීමට හැකියාව ලබා දෙයි.	ඩිජිටල් අත්දැකීම් බලගැන්වීම (පිටු 148-152)			
M3 **ගනුදෙනුකාර අත්දැකීම් සහ අලෙවිකරණය** *GRI 418*	සාධාරණ, විනිවිදාත්මක සහ ප්‍රතිචාරාත්මක ගනුදෙනුකාර සේවාවක් ලබා දීම විශ්වාසය සහ පක්ෂපාතිත්වය ශක්තිමත් කරන අතර වගකීම් සහගත අලෙවිකරණය සහ පැමිණිලි කළමනාකරණය අඛණ්ඩතාව සහ වගවීම තහවුරු කරයි.	ගනුදෙනුකාර සේවා ප්‍රශස්තකරණය (පිටු 132-137)			
M4 **ව්‍යාපාර ආචාරධර්ම සහ නියාමන අනුකූලතාව** *SASB FN-CB-510a.2 GRI 205, 207*	අඛණ්ඩතාව, විනිවිදභාවය සහ අනුකූලතාව ආරක්ෂා කිරීම, පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ආරක්ෂා කරන අතර කීර්තිනාමයට හානි සිදුවීමේ අවදානම අවම කරයි, වෙනස්වන නියාමන තත්ත්වයන් යටතේ තිරසාර ව්‍යාපාර වර්ධනය සහතික කරයි.	යහපාලනය සහ අවදානම (පිටු 162-179)			
M5 **සේවක සබැඳියාවන්** *GRI 202, GRI 401, GRI 402, GRI 403, GRI 404, GRI 405, GRI 407, GRI 408, GRI 409*	සේවා විශිෂ්ටත්වය සඳහා අභිප්‍රේරිත සහ ඇතුළත් ශ්‍රම බලකායක් වැදගත් වේ. දක්ෂ සේවකයින් ආකර්ෂනය කර ගැනීමට, රඳවා ගැනීමට සහ බලගැන්වීමට බැංකුව සාධාරණ සේවා නියුක්තිය, කුසලතා සංවර්ධනය සහ සේවක යහපැවැත්මට ප්‍රමුඛත්වය දෙයි.	ස්ථිරසාර කාර්යසාධනයන් සඳහා පරිපූර්ණ ශ්‍රම බලකාය (පිටු 138-147)			

ප්‍රමාණාත්මකතා තක්සේරුව

ප්‍රමාණාත්මක මාතෘකා	ප්‍රමාණාත්මක විමට හේතුව	උපායමාර්ගික ප්‍රතිචාර	බලපෑමට ලක්වන ප්‍රාග්ධනයන්	බලපෑමට ලක්වන පාර්ශ්වකරුවන්	SDG හි බලපෑම
M6 **වගකීම් සහගත මූල්‍යකරණය** *GRI 406*	ණය දීම සහ ආයෝජන සඳහා ESG සාධක ඒකාබද්ධ කිරීම මගින් ප්‍රජාවන් පුරා මූල්‍ය ඇතුළත් කිරීම, වගකීම් සහගත ණය පිළිවෙත් සහ තිරසාර ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කෙරේ.	තිරසාර අනාගතයක් ගොඩනැඟීම (පිටු 153-160)			
M7 **දේශගුණික විපර්යාස සහ හරිතාගාර වායු විමෝචනය** *GRI 302* *GRI 305*	දේශගුණික අවදානම් ආමන්ත්‍රණය කිරීම සහ හරිත මූල්‍යකරණය ප්‍රවර්ධනය කිරීම, ජාතික කාබන් විමෝචන ඉලක්ක සඳහා සහාය වන අතර බැංකුවේ පාරිසරික භාරකාරත්වය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කරයි.	තිරසාර අනාගතයක් ගොඩනැඟීම (පිටු 153-160)			
M8 **ආයතන හවුල්කාරිත්වයන් සහ සහයෝගිතා**	ආයතනික පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම, දැනුම බෙදාගැනීම, නවෝත්පාදනය සහ අංශ පුරා තිරසාරභාවය ප්‍රවර්ධනය කරන අතර, සාමූහික ප්‍රගතිය මෙහෙයවීමේදී බැංකුවේ භූමිකාව ශක්තිමත් කරයි.	තිරසාර අනාගතයක් ගොඩනැඟීම (පිටු 57-60)			
M9 **වගකීම් සහගත සම්පත්කරණය සහ කළමනාකරණය** *GRI 306* *GRI 204*	සදාචාරාත්මක ප්‍රසම්පාදනය, කාර්යක්ෂම සම්පත් භාවිතය සහ පෙව් විවිධත්ව සුරක්ෂිතතාවය පාරිසරික බලපෑම් අඩු කරන අතර තිරසාර, විහිවිද පෙනෙන සැපයුම් දාම පරිචයන් සහතික කරයි.	තිරසාර අනාගතයක් ගොඩනැඟීම (පිටු153-160)			
M10 **ප්‍රජා සංවර්ධනය සහ සහභාගීත්වය** *SASB FN-CB-240a.1,* *SASB FN-CB-240a.2,* *SASB FN-CB-240a.3,* *SASB FN-CB-240a.4,* *GRI 413*	මූල්‍ය ඇතුළත්කරණය සහ සමාජීය මුලපිරීම් හරහා ප්‍රමාණවත් සේවාවක් නොලැබෙන ප්‍රජාවන්ට සහාය වීමෙන් සාධාරණත්වය, ජීවනෝපාය සංවර්ධනය සහ බැංකුවේ පුළුල් සමාජීය බලපෑම වැඩි කරයි.	තිරසාර අනාගතයක් ගොඩනැඟීම (පිටු 153-160)			

උපායමාර්ග සහ සම්පත් විභජනය


බැංකුවේ උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලිය, පාර්ශ්වකරුවන්ගේ පරිණාමය වන අපේක්ෂාවන්ට සහ ගතික වෙළඳපල තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීම ප්‍රමුඛ කර ගෙන සකස් කර ඇත. පස් අවුරුදු පුළුල් උපායමාර්ගික සැලැස්මක් යටතේ ක්‍රියාත්මක වන බැංකුව, එහි දිගුකාලීන පරිවර්තන ක්‍රියාවලියට අනුකූල වීම සහතික කිරීම සඳහා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ සමාලෝචනය යන ව්‍යුහගත ක්‍රියාවලියක් අනුගමනය කරයි. මෙම සැලැස්ම කළමණාකාරිත්වයේ අදහස් ඒකාබද්ධ කරමින් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ වාර්ෂිකව සමාලෝචනය කර යාවත්කාලීන කරනු ලබයි. ශාඛා නායකත්වය, ව්‍යාපාර නොවන ඒකක ප්‍රධානීන්, ජ්‍යෙෂ්ඨ නායකත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරියේ එහි විධිමත් දියත් කිරීම, අර්ථවත් සංවාද, සංවිධානාත්මක අනුකූලත්වය සහ හවුල් හිමිකාරිත්වයන් ඇති කරයි. මෙම ඇතුළත් සහ සහභාගිත්ව ප්‍රවේශය, උපායමාර්ගික ප්‍රමුඛතා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සාමූහික වගවීම ශක්තිමත් කරයි.

මෙම මනාව ස්ථාපිත උපායමාර්ගික සැලසුම්කරණය සහ අධීක්ෂණ ක්‍රියාවලිය, ස්ථාවර කාර්යසාධනයක් අත් කර ගැනීමට සහ රටේ විශාලතම සහ වඩාත්ම විශ්වාසදායක බැංකු ආයතනය ලෙස ශක්තිමත් වීමට උපකාරී වී ඇත. ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවත් බව සහතික කිරීම සඳහා, මහා කළමනාකරුගේ ප්‍රධානත්වයෙන් යුත් ආයතනික කළමනාකරණ කණ්ඩායමෙන් සමන්විත ආයතනික උපායමාර්ගික සමාලෝචන කමිටුව උපායමාර්ගික මුලපිරීම් මනාව අධීක්ෂණය කරයි. කාර්යසාධනය සතිපතා, මාසිකව, කාර්තුමය සහ වාර්ෂික සමාලෝචන හරහා ජ්‍යෙෂ්ඨ සහ මෙහෙයුම් මට්ටම් වලදී ක්‍රමානුකූලව නිරීක්ෂණය කරනු ලැබේ. මෙම සුවිශේෂී, පහළ සිට ඉහළට ක්‍රියාත්මක පාලන ව්‍යුහය මඟින් බැංකුවට වෙළඳපල වර්ධනයන්ට ක්‍රියාකාරිව ප්‍රතිචාර දැක්වීමට, නැඟී එන අවස්ථාවන්ගෙන් වටිනාකම් ජනිත කිරීමට සහ එහි උපායමාර්ගික අරමුණු සාර්ථකව ඉටු කිරීමට බැංකුවට හැකියාව ලැබෙන අතර එමඟින් කර්මාන්තය තුළ නායකත්වය ශක්තිමත් වේ.

උපායමාර්ගික සන්දර්භය සහ දිශාව

ලංකා බැංකුවේ උපායමාර්ග දිශාව එහි දැක්ම, මෙහෙවර සහ මූලික වටිනාකම් මඟින් මෙහෙයවනු ලබන අතර, දිගුකාලීන උපායමාර්ග සැලසුම්කරණයට සහ ක්‍රියාත්මක කිරීමට මූලික පදනම හා තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමට ප්‍රවේශය සපයයි.


මෙම පදනම මත, බැංකුවේ උපායමාර්ග එහි උපායමාර්ගික ප්‍රමුඛතා සහ මෙහෙයුම් අවධානය, මූලික අංශ පහක් මත ගොඩනංවා ඇත. එමඟින් ශ්‍රී ලංකාවේ විශාලතම වාණිජ බැංකුව සහ වෙළඳපල කේන්ද්‍ර කරගත් මූල්‍ය ආයතනයක් ලෙස බැංකුවේ ද්විත්ව භූමිකාව පිළිබිඹු කරන අතර, එහි මෙහෙයුම් කටයුතු වල ඔරොත්තු දීමේ හැකියාව, තරඟකාරිත්වය සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය අවධාරණය කරයි.



ලංකා බැංකුවේ උපායමාර්ගය මෙහෙය වීමේ මූලධර්ම

බැංකුවේ 2024-2028 උපායමාර්ගික සැලැස්ම පුළුල් සමාලෝචනයකින් සහ සාර්ව ආර්ථික ප්‍රතිසාධන ප්‍රවණතා, පෞද්ගලික අංශයේ ණය ඉල්ලුම, පරිණාමය වන නියාමන අවශ්‍යතා සහ වෙළඳපල වැඩිවන තරඟකාරිත්වය සැලකිල්ලට ගනිමින් බැංකුවේ පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම (2025-2029) ක්‍රියාවේ යොදවන ලදී.


ඉහත ස්ථාපිත අංශ වලට අමතරව, 2026-2030 උපායමාර්ගික සැලැස්ම තුළදී හයවන අංශය ලෙස යහපාලනය සහ අවදානම හඳුන්වා දුන් අතර, දිගුකාලීන වටිනාකම ආරක්ෂා කිරීම සඳහා පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ශක්තිමත් කරන අධීක්ෂණය, වගවීම සහ අවදානම් කළමනාකාරිත්වය ශක්තිමත් කරන ලදී. මෙමගින් පරිණාමය වන වෙළඳපලවල්, නියාමන වෙනස් වීම් සහ තාක්ෂණික බාධාවන් මධ්‍යයේ බැංකුවට ක්‍රියාත්මක වීමට හැකි වේ.



උපායමාර්ග සහ සම්පත් විභජනය

උපායමාර්ගික සැලසුම් කිරීමේ රාමුව

බැංකුවේ උපායමාර්ගික සැලසුම් රාමුව, අරමුණෙහි පැහැදිලි බව, දැනුවත් තීරණ ගැනීම, ඵලදායී ක්‍රියාත්මක කිරීම සහ අඛණ්ඩ දියුණුව සහතික කරන ව්‍යුහගත ක්‍රියාවලියක් මත ගොඩනඟා ඇත. ඒකාබද්ධ යහපාලන සහ ක්‍රියාත්මක කිරීමේ ආකෘතියක් මඟින් උපායමාර්ග ඵලදායී ලෙස මෙහෙයවීම, අධීක්ෂණය කිරීම සහ වැඩි දියුණු කිරීම සහතික කෙරේ.



උපායමාර්ගික ස්ථානගත කිරීම සහ උපායමාර්ගික ප්‍රතිචාර

සන්දර්භයෙහි සිට ක්‍රියාවන් දක්වා

බාහිර වෙළඳපළ තත්ත්වයන් සහ අභ්‍යන්තර යථාර්ථයන් පිළිබඳ සමබර තක්සේරුවක් මඟින් බැංකුවේ උපායමාර්ගය සකස් කර ඇත. උපායමාර්ගික විශ්ලේෂණය, මෙහෙයුම් සන්දර්භයට බලපාන ප්‍රධාන සාධක විශේෂ කර දක්වන අතර උපායමාර්ගික ප්‍රතිචාර මඟින් මෙම දැනුවත්භාවයන් අවදානය යොමු කළ යුතු ප්‍රමුඛතා, ප්‍රාග්ධන වෙන් කිරීම් සහ ක්‍රියාත්මක කිරීම් බවට පරිවර්තනය කරන ආකාරය දක්වා ඇත.

බැංකුවේ අපේක්ෂිත ප්‍රතිඵල

ගනුදෙනුකාර සේවාවන්හි විශිෂ්ටත්වය
භෞතික සහ ඩිජිටල් නාලිකා හරහා ස්ථාවර, උසස් තත්ත්වයේ සේවාවක් ලබා දීම

වෙළඳපළ නායකත්වය
සන්නාමය, පරිමාණය සහ ගනුදෙනුකාර ප්‍රවේශය උපයෝගී කර ගනිමින් නායකත්වය ශක්තිමත් කිරීම

ඩිජිටල් නායකත්වය
උසස් ඩිජිටල් විසඳුම් හරහා ගනුදෙනුකාර සහ සේවක අත්දැකීම් වැඩිදියුණු කිරීම

තිරසාර බැංකුකරණය
වගකීම් සහගත බැංකුකරණය හරහා ආර්ථික, සමාජීය සහ පාරිසරික අභියෝග හඳුනා ගැනීම

සන්දර්භය සකස් කිරීම

ශක්තීන් | අභ්‍යන්තර හැකියාවන්

බැංකුවෙහි ශක්තීන්

- ලාභ, වත්කම්, ණය සහ තැන්පතු සම්බන්ධ වෙළඳපළ නායකත්වයක් සහිත අංක එකේ සන්නාමය
- රාජ්‍ය ආයතනයක් ලෙස ඉහළ මහජන විශ්වාසය
- 76% ක ගනුදෙනුකාර විනිවිද යාමක් සහිත පුළුල් නිෂ්පාදිත කළඹ
- පුළුල් දේශීය ශාඛා, ජාත්‍යන්තර ශාඛා සහ නියෝජිත ජාලයන්
- විශ්වසනීයත්වය සහ පැවැත්ම ශක්තිමත් කරන ජාත්‍යන්තරව ශ්‍රේණිගත කරන ලද එකම දේශීය බැංකුව

දුර්වලතා | අභ්‍යන්තර සීමාවන්

වෙනස් වීමේ ප්‍රවණතාවය සහ අනුගත වීම

- තිරසාර ප්‍රතිසාධන අවධානයක් අවශ්‍ය වන ඉහළ 3 මට්ටමේ හානිකරණ නිරාවරණය
- වේගවත් වර්ධනය සීමා කරන ප්‍රාග්ධන සීමාවන්
- දැඩි ප්‍රසම්පාදන සහ අනුමත කිරීමේ ක්‍රියාවලීන්
- කාර්යක්ෂමතාවයට බලපාන බණ්ඩිත තොරතුරු තාක්ෂණ පද්ධති

S W O T

අවස්ථා | බාහිර වර්ධකයින්

උපායමාර්ගික අවධානය සහ ආයෝජනය යොමු වන අංශ

- ඩිජිටල් සේවා, සෞඛ්‍ය පහසුකම්, සංචාරක සේවා, ඉදිකිරීම් සහ යටිතල පහසුකම් අංශවල වර්ධනය
- ESG අපේක්ෂාවන් මත ඇති කැමැත්ත ඉහළ යාම
- තිරසාර සහ හරිත මූල්‍ය සඳහා ඇති ඉල්ලුම පුළුල් කිරීම
- ඩිජිටල් බැංකුකරණ මාධ්‍යයන් වෙත වේගවත් නැඹුරුව
- මහා පරිමාණ ව්‍යෘතති (උදා: පෝර්ට් සිටි) සහ ආර්ථික ප්‍රකෘතිය
- කාර්යක්ෂමතාව සහ තීරණ ගැනීම වැඩි දියුණු කිරීම සඳහා කෘතිම බුද්ධිය සහ විශ්ලේෂණ මෙවලම්

තර්ජන | බාහිර අවදානම්

ක්‍රියාකාරී අධීක්ෂණය සහ අවදානම් අවම කිරීමේ අවශ්‍යතාවයන්

- සයිබර් ආරක්ෂාව සහ දත්ත-පෞද්ගලිකත්ව අවදානම් වැඩි වීම
- බැංකු, මූල්‍ය තාක්ෂණ සහ නව ආයතන අතර ඇති තීව්‍ර තරඟකාරීත්වය
- මූල්‍ය අපරාධ සහ AML අවදානම් ඉහළ යාම
- වත්කම් සහ දිගුකාලීන ස්ථාවරත්වයට බලපාන දේශගුණික අවදානම්

මෙහෙයුම් සන්දර්භය වෙත යොමු වන්න (පිටු 52-56)

බැංකුවේ උපායමාර්ගික ප්‍රතිචාරය ස්ථාපිත කිරීම

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

මූලික ක්‍රියාවන්:

- ද්‍රවශීලතාවය සහ ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම
- යහපාලනය සහ අවදානම් අධීක්ෂණය ශක්තිමත් කිරීම
- උපායමාර්ග සහ මෙහෙයුම් සඳහා තිරසාරභාවය වේකාබද්ධ කිරීම

ගනුදෙනුකාර අත්දැකීම්හි විශිෂ්ටත්වය

මූලික ක්‍රියාවන්:

- භෞතික සහ ඩිජිටල් නාලිකා හරහා සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීම
- ප්‍රවේශය, පහසුව සහ ප්‍රතිචාරාත්මක බව වැඩි දියුණු කිරීම
- ගනුදෙනුකාර විශ්වාසය, පක්ෂපාතීත්වය සහ සම්බන්ධතාවය දියුණු කිරීම

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

මූලික ක්‍රියාවන්:

- මූලික වේදිකා සහ ඩිජිටල් නාලිකා වැඩි දියුණු කිරීම
- සයිබර් ආරක්ෂාව සහ පද්ධති වල පැවැත්ම ශක්තිමත් කිරීම
- දත්ත මත පදනම් වූ තීරණ ගැනීම සහ කාර්යක්ෂමතා සක්‍රීය කිරීම

ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය

මූලික ක්‍රියාවන්:

- විචක්ෂණශීලී ණය දීම සහ වත්කම් තත්ත්ව කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම
- ප්‍රතිසාධන රාමු සහ අධීක්ෂණය ශක්තිමත් කිරීම
- ප්‍රමුඛතා අංශ සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය දීම හරහා වර්ධනයට සහාය වීම

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩනැගීම

මූලික ක්‍රියාවන්:

- කුසලතා, නායකත්වය සහ සහභාගීත්වය ගොඩනැගීම
- අනුප්‍රාප්තික සැලසුම්කරණය සහ කාර්යසාධන සංස්කෘතිය ශක්තිමත් කිරීම
- සමස්ත කාර්ය මණ්ඩලයේ ශක්‍යතා ප්‍රවර්ධනය

උපායමාර්ග සහ සම්පත් විභජනය

ක්‍රියාවේ සිට බලපෑම දක්වා - උපායමාර්ග හරහා වටිනාකම් නිර්මාණය කිරීම

අවධානය යොමු කරන ලද මූලපිරීම් සහ සම්පත් වෙන් කිරීම හරහා, බැංකුව උපායමාර්ග, ප්‍රතිඵල බවට පරිවර්තනය කරයි. උපායමාර්ගික ප්‍රමුඛතා යටතේ, වසර තුළ ගනු ලැබූ ක්‍රියාමාර්ග කාර්යසාධනය, පැවැත්ම සහ තිරසාර වටිනාකම් නිර්මාණය සඳහා දායක වූ ආකාරය පහතින් දැක්වේ.

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

දිගුකාලීන මූල්‍ය පැවැත්ම, ශක්තිමත් යහපාලනය සහ තිරසාර වටිනාකම් නිර්මාණය සහතික කරයි.

ප්‍රමාණාත්මක මාතෘකා

M1 M4 M6 M7 M9 M10

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක

සම්පත් විභජනය		ඉදිරි දැක්ම
	ණයකර සහ තිරසාර බැඳුම්කර නිකුත් කිරීමෙන් රැස් කරන ලද ස්ථර II ප්‍රාග්ධනය රු. බිලියන 35.0 කි.	**කෙටිකාලීනව** පිරිවැය-ඵලදායී AT1 සහ ස්ථර II ප්‍රාග්ධන උපකරණ නිකුත් කිරීම් හරහා ප්‍රාග්ධන පදනම ශක්තිමත් කරන ලද අතර අරමුදල් විවිධාංගීකරණය සහ ශේෂ පත්‍ර ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීමට තිරසාර උපාංග හඳුන්වා දීම.
	ESMS මත පුහුණු කරන ලද සේවකයින් 347 කි.	
	වසර 90,000 කට අධික සමස්ත සේවක මණ්ඩල දැනුම	
	ප්‍රජා සහ පාර්ශ්වකාර මූලපිරීම් සඳහා රු. මිලියන 780.5 ක් ආයෝජනය කර ඇත.	
	බලශක්ති කාර්යක්ෂම ශාඛා 101 කි.	**මධ්‍යම සිට දිගුකාලීනව** දිගුකාලීන පැවැත්ම සහ වටිනාකම් ලබා දීම සඳහා තිරසාර සහ විදේශීය වර්ධනය වැඩිදියුණු කරමින් ප්‍රාග්ධනය සහ යහපාලනය ශක්තිමත් කිරීම.
අන්තර් සමතුලිතයන්	කෙටිකාලීන (-) (+) දිගුකාලීන (+) (+) (+) (+) (+) දිගුකාලීන ප්‍රතිරෝධීතාව, හැකියාව, විශ්වාසය, සහ තිරසාරභාවය සමඟ කෙටිකාලීන ලාභදායීතාවය සහ වර්ධනය සමතුලිත වේ.	
උපායමාර්ගික මූලපිරීම්	• ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවය ප්‍රශස්තිකරණය • යහපාලනය, අනුකූලතාව සහ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම • දේශගුණික අවදානම උපායමාර්ගික සැලසුම්කරණයට ඇතුළත්කරණය • තිරසාර අනුගත වීම් සඳහා මූල්‍ය පුළුල් කිරීම • විදේශීය සහ ආයෝජන බැංකුකරණ වර්ධනය	

උපායමාර්ගික කාර්යසාධනය සහ ප්‍රගතිය

අවධානය යොමු කරන පැතිකඩයන්	මූලික කාර්යසාධන දර්ශක	තත්ත්වය	ප්‍රතිඵල සහ විශේෂිත කරුණු
ප්‍රාග්ධන ශක්තිය සහ ද්‍රවශීලතාවය	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය, ද්‍රවශීලතා ආවරණ අනුපාතය, ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය	◉	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය: **16.9%** ද්‍රවශීලතා ආවරණ අනුපාතය : **260.4%** සන්නාම වටිනාකම: රු. බිලියන **57.4** බදු පෙර ලාභය: රු. බිලියන **120.8** තිරසාර මූල්‍යකරණය: රු. බිලියන **73.0**
යහපාලනය සහ අනුකූලතාව	නියාමන අනුකූලතාවය	☐	
තිරසාර වීකාබද්ධතාවය	තිරසාර මූල්‍යකරණය, දේශගුණික යහපාලනය	■	

කාර්යසාධන තත්ත්වය

◉ ඉලක්කය ඉක්මවා ගිය ☐ ඉලක්කය ළඟා කරගත් ■ ක්‍රියාත්මක වෙමින් පවතින ■ අවධානය අවශ්‍ය

ගනුදෙනුකාර අත්දැකීම්වල විශිෂ්ටත්වය

පක්ෂපාතිත්වය සහ දිගුකාලීන තරඟකාරිත්වය ශක්තිමත් කරන ස්ථාවර, ප්‍රවේශ විය හැකි සහ විශ්වාසදායක සේවාවක් ලබා දෙයි.

ප්‍රමාණාත්මක මාතෘකා

M2 M3 M6

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක

සම්පත් විභජනය		ඉදිරි දැක්ම
	ශාඛා නවීකරණය, සේවා ප්‍රතිනිර්මාණය සහ ගනුදෙනුකාර සේවා මාධ්‍යයන් ප්‍රශස්ත කිරීම සඳහා රු. බිලියන 3.1 ක් ආයෝජනය කර ඇත.	**කෙටිකාලීනව** සේවා ජාලය පුරා අනුකූලතාව සහ ගනුදෙනුකාර තෘප්තිය ඉහළ නැංවීම සඳහා ගනුදෙනුකාර කළමනාකරණ පද්ධතිය පුළුල් කර ව්‍යුහගත සේවා ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම **මධ්‍යම සිට දිගුකාලීනව** පුද්ගලීකරණය කරන ලද, දැනුම මත මෙහෙයවන සේවාවන් බෙදා හැරීම, දියුණු ගනුදෙනුකාර සම්බන්ධතා සහ ස්ථාවර බහුවිධ සේවා බෙදාහැරීම
	උත්ශ්‍රේණි කරන ලද සහ නැවත ස්ථානගත කරන ලද ශාඛා - 08	
	සේවා විශිෂ්ටත්වය සහ සම්බන්ධතා කළමනාකරණය පිළිබඳ 40,000 කට අධික පුහුණු පැය	
	ගනුදෙනුකාර සහභාගිත්වය, ඇතුළත්කරණය සහ මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ 3,000කට අධික වැඩසටහන්	
	නව හරිත ගොඩනැගිලි - 02	
අන්තර් සමතුලිතයන්	කෙටිකාලීන (-) (+) දිගුකාලීන (+) (+) (+)	කෙටිකාලීන සේවා සහ යටිතල පහසුකම් පිරිවැය, දිගුකාලීන පක්ෂපාතිත්වය, විශ්වාසය සහ ආදායම් කල් පැවැත්ම සමඟ සමතුලිත වේ.
උපායමාර්ගික මූලපිරිමි	• ගනුදෙනුකාර අත්දැකීම් ප්‍රතිනිර්මාණය • ක්‍රියාවලි සරල කිරීම හරහා ගනුදෙනු සඳහා ගතවන කාලය අඩු කිරීම • විවිධ කණ්ඩායම් කේන්ද්‍ර කරගත් සේවා යෝජනා (සුළු හා මධ්‍ය පරිමාණ, තරුණ සහ කාන්තා මූලික ව්‍යාපාර) • ඉදිරි පෙළ සේවක ශක්‍යතාවයන් වර්ධනය කිරීම	

උපායමාර්ගික කාර්යසාධනය සහ ප්‍රගතිය

අවධානය යොමු කරන පැතිකඩයන්	මූලික කාර්යසාධන දර්ශක	තත්ත්වය	ප්‍රතිඵල සහ විශේෂිත කරුණු
ගනුදෙනුකරුවන්ගේ තෘප්තිය	ශුද්ධ ප්‍රවර්ධක අගය, ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය පිළිබඳ අනුපාතය, ගනුදෙනුකාර උත්සාහක අගය	■	ශුද්ධ ප්‍රවර්ධක අගය: **33%** ගනුදෙනුකාර උත්සාහ අගය:**74%** ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය පිළිබඳ අනුපාතය: **81%**

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

පුළුල් ඩිජිටල් වේදිකා හරහා කාර්යක්ෂමතාව, ආරක්ෂාව සහ නවෝත්පාදනය ශක්තිමත් කරයි.

ප්‍රමාණාත්මක මාතෘකා

M1 M2

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක

සම්පත් විභජනය		ඉදිරි දැක්ම
	ඩිජිටල් වේදිකා සහ සයිබර් ආරක්ෂාව සඳහා රු. බිලියන 3.3 ක ආයෝජනය	**කෙටිකාලීනව** ව්‍යුහගත ලේඛන කළමනාකරණය සහ ස්වයංක්‍රීය උපස්ථ සහ අනුරූකරණ පද්ධති හරහා තොරතුරු යහපාලනය සහ මෙහෙයුම් පැවැත්ම ශක්තිමත් කිරීම **මධ්‍යම සිට දිගුකාලීනව** දත්ත මත පදනම් වූ බැංකුකරණය, කෘතිම බුද්ධිය (AI), සක්‍රීය ස්වයංක්‍රීයකරණය සහ මනා පද්ධති ආරක්ෂාව
	මුදල් චක්‍රීකරණ යන්ත්‍ර 29 ස්ථාපනය කර ඇත.	
	ක්‍රියාවලි 11 ක් ස්වයංක්‍රීය කර ඇත.	
	ඩිජිටල්, දත්ත සහ සයිබර් හැකියාවන් පිළිබඳව පුහුණු කරන ලද සේවකයින් - 1,500	
අන්තර් සමතුලිතයන්	කෙටිකාලීන (-) (+) (+) දිගුකාලීන (+) (+) (+)	දිගුකාලීන කාර්යක්ෂමතාව, කල්පැවැත්ම සහ පුළුල් කිරීමේ හැකියාව සමඟ තාක්ෂණික ආයෝජනයන් සමතුලිත වේ.
උපායමාර්ගික මූලපිරිමි	• මූලික පද්ධති නවීකරණය • විද්‍යුත්/අතත්‍ය ගනුදෙනුකාර තොරතුරු සහ ඩිජිටල් සත්‍යාපනය • ඩිජිටල් ඇතුළත්කරණය සහ ස්වයං සේවා පුළුල් කිරීම • සයිබර් ආරක්ෂාව සහ දත්ත ආරක්ෂාව ශක්තිමත් කිරීම	

උපායමාර්ගික කාර්යසාධනය සහ ප්‍රගතිය

අවධානය යොමු කරන පැතිකඩයන්	මූලික කාර්යසාධන දර්ශක	තත්ත්වය	ප්‍රතිඵල සහ විශේෂිත කරුණු
ඩිජිටල්කරණය සඳහා අනුගත වීම්	ගනුදෙනු පරිමාවන්	◉	ඩිජිටල් ගනුදෙනු වල වර්ධනය: **23%** ඩිජිටල් සම්බන්ධතා මධ්‍යස්ථාන: **1,510** වාර්තා වූ සිදුවීම්: **නැත**
සේවා ජාලයන්හි දිගුකාලීන පැවැත්ම	උපයෝජ්‍යතාව	□	
සයිබර් ආරක්ෂාව	සිදුවීම්	■	

උපායමාර්ග සහ සම්පත් විභජනය

ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය

වත්කම්වල ගුණාත්මකභාවය, විවක්ෂණශීලී වර්ධනය සහ තිරසාර ණය ප්‍රසාරණය සහතික කරයි.

ප්‍රමාණාත්මක මාතෘකා: M2 M3 M6 M10

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක

සම්පත් විභජනය		ඉදිරි දැක්ම
	වසර තුළ ප්‍රතිව්‍යුහගත කරන ලද පහසුකම් 2,500 කට අධික සංඛ්‍යාවකි.	**කෙටිකාලීනව** ව්‍යාපාරික බුද්ධි හැකියාවන් සහ විශේෂිත කෘෂිකාර්මික බැංකු ඒකකයක් ස්ථාපිත කිරීම තුළින් ණය කළඹේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
	ණය සහ ප්‍රතිසාධන පිළිබඳ පුහුණු පැය 42,850 කි.	
	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ප්‍රමුඛතා අංශ සහ සංවර්ධන මූල්‍ය කළඹ සඳහා රු. බිලියන 319.9 ක් සපයා ඇත.	**මධ්‍යම සිට දිගුකාලීනව** වරණීය වර්ධනය, අඩු කළ ණය හානිකරණ අදියර 3 නිරාවරණය, පුළුල් කළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ තිරසාර මූල්‍යකරණ කළඹ
අන්තර් සමතුලිතයන්	කෙටිකාලීන (-) දිගුකාලීන (+ + +) — දිගුකාලීන ණයකළඹ ඔරොත්තු දීමේ හැකියාව සහ ඇතුළත් වර්ධනයට සාපේක්ෂව ගතානුගතික ඇපකර සහ ප්‍රතිසාධන අවධානය සමතුලිත වේ.	
උපායමාර්ගික මූලපිරිමි	• ණය අවදානම තක්සේරුව ශක්තිමත් කිරීම • ප්‍රතිසාධන සහ ප්‍රතිව්‍යුහගත කිරීමට සහාය වීම • සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ප්‍රමුඛතා අංශ, සහ හරිත මූල්‍ය ප්‍රසාරණය	

උපායමාර්ගික කාර්යසාධනය සහ ප්‍රගතිය

අවධානය යොමු කරන පැතිකඩයන්	මූලික කාර්යසාධන දර්ශක	තත්ත්වය	ප්‍රතිඵල සහ විශේෂිත කරුණු
වත්කම් ගුණාත්මකභාවය	අදියර 03 ණය	☐	හානිකරණ ණය අදියර 3 අනුපාතය: 5.6% ණය සහ අත්තිකාරම්: රු. ට්‍රිලියන 2.7, 9% ක වර්ධනය ආවරණ අනුපාතය: 57.9%
ණය සහ අත්තිකාරම් වර්ධනය	වර්ධන අනුපාතය	■	
ප්‍රතිසාධනය	ප්‍රතිපාදන ආවරණය	☐	

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩනැගීම

විශිෂ්ටත්වය පවත්වා ගැනීම සඳහා හැකියාවන්, සහභාගිත්වය සහ තියුණු නායකත්වය ගොඩනැගීම

ප්‍රමාණාත්මක මාතෘකා: M3 M5 M8

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක

සම්පත් විභජනය		ඉදිරි දැක්ම
	වේතන සහ ප්‍රතිලාභ සඳහා රු. බිලියන 45.7 කි.	**කෙටිකාලීනව** ව්‍යුහගත යාන්ත්‍රණ සහ නවීන, ඒකාබද්ධ පුහුණු පරිසර පද්ධතියක් හරහා කාර්යසාධනය මත පදනම් වූ සංස්කෘතියක් ඇතුළත් කිරීම.
	පුහුණු කරන ලද සේවකයින් 8,563 කි.	
	පුහුණුව සහ සංවර්ධනය සඳහා රු. මිලියන 348.0 ක් ආයෝජනය කර ඇත.	**මධ්‍යම සිට දිගුකාලීනව** රඳවා තබා ගැනීම, ඉහළ නායකත්වය, ඵලදායිතාවය සහ සේවක සහභාගිත්වය පවත්වා ගැනීම වැඩිදියුණු කිරීම.
	යහපැවැත්ම, සහභාගිත්වය සහ ඇතුළත් කිරීමේ මූලපිරිමි සඳහා රු. මිලියන 185.8 ක් ආයෝජනය කර ඇත.	
අන්තර් සමතුලිතයන්	කෙටිකාලීන (- +) දිගුකාලීන (+ + + +) — දිගුකාලීන ඵලදායිතාවය, රඳවා ගැනීම සහ අඛණ්ඩ නායකත්වය සමඟ ඉහළ ආයෝජනයන් සමතුලිත වේ.	
උපායමාර්ගික මූලපිරිමි	• ඩිජිටල් සහ අවදානම යන අංශ තුළ ඉලක්කගත කුසලතා වැඩි දියුණු කිරීම • නායකත්ව සහ අනුප්‍රාප්ති සැලැස්ම ශක්තිමත් කිරීම • කාර්යසාධනයට සම්බන්ධ දීමනා සහ වෘත්තීය දියුණුව • යහපැවැත්ම සහ සහභාගීත්ව වැඩසටහන්	

උපායමාර්ගික කාර්යසාධනය සහ ප්‍රගතිය

අවධානය යොමු කරන පැතිකඩයන්	මූලික කාර්යසාධන දර්ශක	තත්ත්වය	ප්‍රතිඵල සහ විශේෂිත කරුණු
දක්ෂතාව රඳවා ගැනීම	රඳවා ගැනීමේ අනුපාතය	■	සේවයෙහි රැඳී සිටීමේ අනුපාතය: 97% සාමාන්‍ය පුහුණු පැය: 28 කාන්තා නියෝජනය : 59%
හැකියාවන් ගොඩනැගීම	සේවකයෙකු සඳහා පුහුණු පැය	☐	
විවිධත්වය සහ ඇතුළත් කිරීම	නියෝජනය	☐	

ප්‍රාග්ධන සම්බරතා සටහන

ප්‍රාග්ධන සම්බරතා සටහන මඟින් බැංකුවේ විවිධ ආකාරයේ ප්‍රාග්ධනයන්ට උපායමාර්ගික ප්‍රමුඛතා හරහා ප්‍රමුඛතාවය දී ඇති ආකාරය පිළිබඳ දෘශ්‍ය සාරාංශයක් සපයයි. එය නිරපේක්ෂ ආයෝජනයට වඩා සාපේක්ෂ අවධාරණය ඉස්මතු කරයි. උපායමාර්ගික අරමුණ අනුව ප්‍රාග්ධන අවධානය වෙනස් වන ආකාරය නිරූපණය කරන අතර සීමිත මෙහෙයුම් පරිසරයක් තුළ ස්ථාවරත්වය, පරිවර්තනය සහ හැකියාවන් ගොඩනැඟීම සමතුලිත කිරීම සඳහා බැංකුවේ ප්‍රවේශය පිළිබිඹු කරයි.

ප්‍රාග්ධන / උපායමාර්ගික ප්‍රමුඛතා							විභජන නිර්ණායක
	●●●	●●●	●●	●●●	●●	●●	දිගුකාලීන ස්ථාවරත්වය සඳහා පදනම සකසමින්, මූල්‍යමය පැවැත්ම, මනා යහපාලනය, නියාමන අනුකූලතාව සහ තිරසාර ඒකාබද්ධතාවය ආරක්ෂා කිරීම සඳහා ප්‍රාග්ධනයට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.
	●●	●●●	●●●	●●	●●●	-	භෞතික හා ඩිජිටල් නාලිකා හරහා ප්‍රවේශය, විශ්වාසය සහ සේවා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා පුද්ගල, සේවා යටිතල පහසුකම් සහ සබඳතාවන්හි ආයෝජනය කෙරෙහි අවධානය යොමු කෙරේ.
	●●	●●●	●●	●●	●	-	මෙහෙයුම් නවීකරණය කිරීම, සයිබර් ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා වේදිකා, පද්ධති, දත්ත සහ කුසලතා වෙත මූල්‍ය සහ අනෙකුත් ප්‍රාග්ධනයන් යොමු කරනු ලබයි.
	●●●	●	●●●	●●	●●	●	මූල්‍ය හා අවදානම් ආශ්‍රිත ප්‍රාග්ධනය විවක්ෂණශීලී ණය දීම, වත්කම්වල ගුණාත්මකභාවය, ප්‍රතිසාධන ප්‍රයත්නයන් සහ ප්‍රමුඛතා අංශ මූල්‍යකරණය සඳහා සහාය වීම අවධාරණය කරයි.
	●●	●	●●●	●●	●●	●	ක්‍රියාත්මක කිරීමේ හැකියාව, ඵලදායිතාව සහ දිගුකාලීන සංවිධානාත්මක පැවැත්ම ශක්තිමත් කිරීම සඳහා සම්පත්, කුසලතා සහ නායකත්වය කෙරෙහි අවධානය යොමු කරයි.

සංකේත නාමාවලිය: ●●● ඉහළ අවධානය ●● මධ්‍යම අවධානය ● සීමිත අවධානය - අවම අවධානය

වටිනාකම් නිර්මාණයේ ආකෘතිය

යෙදවුම්

අපගේ ප්‍රධාන සම්පත්

මූල්‍ය ප්‍රාග්ධනය
කොටස් හිමියාගේ අරමුදල්
රු. බිලියන 365.8
ගනුදෙනුකරුවන්ගේ තැන්පතු
රු. ට්‍රිලියන 4.4
ණය ගැනීම්
රු. බිලියන 458.8

නිෂ්පාදිත ප්‍රාග්ධනය
ගනුදෙනුකාර සම්බන්ධතා
මධ්‍යස්ථාන **2,413**
දේපල, පිරියත සහ උපකරණ වල ආයෝජන
රු. බිලියන 3.3

මානව ප්‍රාග්ධනය
පුහුණු සේවකයින් **8,912**
පුහුණුව සහ සංවර්ධනය සඳහා ආයෝජනය
රු. මිලියන 348.0

බුද්ධිමය ප්‍රාග්ධනය
අංක 01 සන්නාමය
සන්නාම සංවර්ධනය සඳහා ආයෝජනය
රු. බිලියන 1.1
සේවකයින්ගේ සේවා කාලයේ සාමාන්‍යය
අවුරුදු 12

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය
මිලියන 16. 0 කට වැඩි පක්ෂපාතී සහ පුළුල් ගනුදෙනුකාර පදනම
විදේශ රටවල නියෝජිත බැංකු සබඳතා
710
ලියාපදිංචි සැපයුම්කරුවන්
410

ස්වාභාවික ප්‍රාග්ධනය
බලශක්ති පරිභෝජනය
මෙගා වොට් පැය 26,809.7
සූර්ය බලශක්තිය සඳහා ආයෝජනය
රු. මිලියන 573.0
ජල පරිභෝජනය
ඝන මීටර් 247,986.0

අපි සම්පත් කළමනාකරණය කරන ආකාරය

මූල්‍ය ප්‍රාග්ධනය
අභියෝගය: ඉහළ යන පිරිවැය බැංකුවේ වර්ධනය මන්දගාමී කළ හැකිය.
උපායමාර්ගික ප්‍රතිචාර: මූල්‍ය කළමනාකරණය සහ ද්‍රවශීලතාවය ශක්තිමත් කිරීම
මූල්‍ය සමාලෝචනය *(පිටු 108-114)*

නිෂ්පාදිත ප්‍රාග්ධනය
අභියෝගය: ශීඝ්‍ර තාක්ෂණික දියුණුව සහ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා වෙනස් වීම.
උපායමාර්ගික ප්‍රතිචාර: අඛණ්ඩව වත්කම් වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම.
ගනුදෙනුකාර සේවා ප්‍රශස්තකරණය *(පිටු 132-137)*

මානව ප්‍රාග්ධනය
අභියෝගය: දක්ෂතා සහ කුසලතාවයන්හි ඌනතාවය.
උපායමාර්ගික ප්‍රතිචාර: කුසලතා වර්ධනය කිරීම සහ සේවක යහපැවැත්මට සහාය වීම.
ස්ථිරසාර කාර්යසාධනයක් සඳහා පරිපූර්ණ ශ්‍රම බලකාය *(පිටු 138-147)*

බුද්ධිමය ප්‍රාග්ධනය
අභියෝගය: ශීඝ්‍ර නවෝත්පාදනය සහ දැනුම් පරතරය තරඟකාරිත්වයට අභියෝග කරයි.
උපායමාර්ගික ප්‍රතිචාර: ඩිජිටල් විසඳුම් සඳහා ආයෝජනය කිරීම, කුසලතා සංවර්ධනය සහ සන්නාම ගොඩනැගීම
ඩිජිටල් අත්දැකීම් බලගැන්වීම *(පිටු 148-152)*

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය
අභියෝගය: පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් නිරන්තරයෙන් විකාශනය වෙමින් පවතී.
උපායමාර්ගික ප්‍රතිචාර: විශ්වාසය සහ අර්ථවත් හවුල්කාරිත්වයන් ගොඩනැගීම.
තිරසාර අනාගතයක් ගොඩනැගීම *(පිටු 153-160)*

ස්වාභාවික ප්‍රාග්ධනය
අභියෝගය: පාරිසරික ගැටලු සහ සම්පත් හිඟය.
උපායමාර්ගික ප්‍රතිචාර: තිරසාර පරිවයන් සහ සම්පත් භාරකාරත්වය මෙහෙයවීම
තිරසාර අනාගතයක් ගොඩනැගීම *(පිටු 153-160)*

අගය පරිවර්තන ක්‍රියාවලිය

අපගේ ව්‍යාපාරික ක්‍රියාකාරකම්

අපගේ ව්‍යාපාරික කටයුතු මෙහෙයවන්නේ ගනුදෙනුකරුවන්ට මූල්‍ය ස්ථාවරත්වයක් ලඟා කර දෙමින් තිරසාර භාවිතයන් හරහා සියලු පාර්ශ්වකරුවන් වෙත කෙටි, මධ්‍යම සහ දිගුකාලීන වශයෙන් අර්ථාන්විත ලෙස වටිනාකම් ජනනය කිරීම මූලික කරගෙනය.



ශාඛා බැංකුකරණය

ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය

ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශ මෙහෙයුම්

අපගේ උපායමාර්ගික ප්‍රමුඛතා

අපි සපයන සේවාවන්

- තැන්පතු භාර ගැනීම්
- ණය දීම්
- ප්‍රතිමූල්‍යකරණය
- ගනුදෙනුකාර බැංකු සේවා සහ ගෙවීම් සේවා
- අරමුදල් කළමනාකරණය
- භාරකාරත්වය සහ ආයෝජන කළඹ කළමනාකරණ සේවා
- ආයෝජන බැංකුකරණය
- විදේශ විනිමය සහ සුරුකුම්පත් කළමනාකරණය
- උපදේශන සේවා
- වෙළඳ මූල්‍යනය

උපකාරක සේවා

- තොරතුරු තාක්ෂණික
- නීතිමය
- මානව සම්පත්
- පරිපාලනමය සහ අනෙකුත් සේවාවන්

පාදක වන අංශ:

- උපායමාර්ගය
- සම්පත් විභජනය සහ ප්‍රාග්ධන සමතුලිතයන්
- ශක්තිමත් ආයතනික යහපාලනය
- අවදානම් කළමනාකරණය

ප්‍රතිඵල		ප්‍රතිලාභ	ධනාත්මක ලෙස බලපෑමට ලක්වන තිරසාර වර්ධන ඉලක්ක සහ පාර්ශ්වකරුවන්
අපි නිෂ්පාදනය කරන දේ		**අපි වටිනාකම් නිර්මාණය හා ආරක්ෂා කරන ආකාරය**	
මූලික ව්‍යාපාර කාර්යසාධනය උත්පාදනය කරන ලද ලාභය **රු. බිලියන 120.8** දළ ණය සහ අත්තිකාරම් **රු. ට්‍රිලියන 2.7**		**මූල්‍ය ප්‍රාග්ධනය** කොටසක ඉපැයුම **රු. 2,987.9** මූල්‍ය තත්ත්වය **රු. ට්‍රිලියන 5.5** රජයට දායකත්වය **රු. බිලියන 89.4**	
ශක්තිමත් ආයෝජන කළඹ විවිධාංගික ආයෝජන කළඹ **රු. ට්‍රිලියන 2.7** ආයෝජන ආදායම **රු. බිලියන 253.2**		**නිෂ්පාදිත ප්‍රාග්ධනය** දේපල, පිරියත සහ උපකරණ වල වටිනාකම **රු. බිලියන 46.1** ඉලක්ක වෙළඳපළ **76%**	
මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය නවීකරණය/ පරිවර්තනය කරන ලද ශාඛා **19** ඩිජිටල් ගනුදෙනු **88%**		**මානව ප්‍රාග්ධනය** උසස් වීම් ලද කාර්ය මණ්ඩලය **431** සේවකයෙකු සඳහා සාමාන්‍ය පුහුණු පැය **28** සමස්ත ස්ත්‍රී පුරුෂ අනුපාතය **(ස්ත්‍රී:පුරුෂ) 59:41**	
පුද්ගලික පිරිවැය සහ සංවර්ධනය සේවක ප්‍රතිලාභ **රු. බිලියන 45.7** සේවයේ රඳවා තබා ගැනීමේ අනුපාතය **97%**		**බුද්ධිමය ප්‍රාග්ධනය** සන්නාම වටිනාකම **රු. බිලියන 57.4** ස්වයංක්‍රීයකරණය කරන ලද ක්‍රියාවලි **11** ඩිජිටල් ලෙස සක්‍රීය ගනුදෙනුකරුවන් **71%** අතථ්‍ය ලෙස සක්‍රීය ගනුදෙනුකරුවන් **34%** ඩිජිටල් සම්බන්ධතා මධ්‍යස්ථාන **1,510**	
ඩිජිටල් බැංකුකරණය ඩිජිටල් බැංකු නාලිකා හරහා සිදුවන ගනුදෙනුවල වර්ධනය **23%**		**සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය** ශුද්ධ ප්‍රවර්ධක අගය අනුපාතය **33%** ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය පිළිබඳ අනුපාතය **81%** ප්‍රජාවන් සඳහා ආයෝජනය **රු. මිලියන 780.5**	
		ස්වාභාවික ප්‍රාග්ධනය ESMS අනුකූලතාවයෙන් පසු මූල්‍යකරණය **රු. බිලියන 322.6** හරිත මූල්‍යකරණය **රු. බිලියන 10.2** සූර්ය බලශක්ති ජනනය **මෙගා වොට් පැය 5,650.2**	

එකතු කළ අගය මත ප්‍රකාශය GRI 201-1

බැංකුවේ අගය එක් කිරීම සහ ප්‍රධාන පාර්ශ්වකරුවන් සඳහා එම අගය විසර්ජනය වන ආකාරය පිළිබඳව විශ්ලේෂණයක් පහත දැක්වේ

	2025 රු. මිලියන	2024 රු. මිලියන	වෙනස %
එකතු කළ අගය			
බැංකු කටයුතු සේවා සැපයීමෙන් ලද ආදායම	540,654	485,126	11
සේවා සැපයීමේ පිරිවැය	(294,766)	(304,383)	(3)
බැංකු සේවා තුළින් එකතු කළ අගය	245,888	180,743	36
බැංකු සේවා නොවන ආදායම	7,970	280	2,746
ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරණ (වෙන් කිරීම්)/ ප්‍රතිවර්ත්‍ය කිරීම්	(21,110)	20,343	(204)
මුළු එකතු කළ අගය	232,748	201,366	16
අගය විසර්ජනය			
සේවකයින්ට දීමනා			
වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ	45,689	40,287	13
රජයට			
ශ්‍රී ලංකා රජයට ගෙවූ ලාභාංශ	5,000	-	-
ආදායම් බදු	52,514	36,053	46
අධිභාර බදු	-	1,483	(100)
මූල්‍ය සේවා සඳහා බදු	31,881	28,395	12
	89,395	65,931	36
ප්‍රජාව වෙත			
ප්‍රජා ආයෝජන ව්‍යාපෘති	781	207	277
බාහිර අරමුදල් සපයන්නන්ට			
සෙසු ණය ගැනීම උදෙසා පොළිය	18,095	12,070	50
නිකුත් කළ ණයකර සඳහා පොළිය	10,452	9,307	12
	28,547	21,377	34
ව්‍යාප්තිය හා වර්ධනය උදෙසා			
රඳවා ගත් ලාභය	71,007	64,387	10
අධිභාර බද්ද	-	(1,483)	100
ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය	5,023	4,195	20
විලම්බිත බදු	(7,694)	6,465	(219)
	68,336	73,564	(7)
මුළු විසර්ජනය කළ අගය	232,748	201,366	16



තිරසාරත්වය සමඟ සංයෝජනය

බැංකුවේ මෙහෙයුම් ක්‍රියාවලිය තුළ තිරසාරත්වය ගැඹුරින් ඒකාබද්ධ කර ඇති අතර, එය බැංකුව පුරා තීරණ ගැනීමේ ක්‍රියාවලියට සෘජුවම බලපායි. යහපාලනය, උපායමාර්ග, අවදානම් කළමනාකරණය සහ කාර්යසාධනය යන අන්තර් සම්බන්ධිත අංග දිගුකාලීන වටිනාකම් නිර්මාණයට සහය වීම සඳහා කෙසේ සම්බන්ධීකරණය කර ඇතිද යන්න මෙහිදී විස්තර කරයි.


තිරසාරත්ව යහපාලන ව්‍යුහය GRI 2-12,14

බැංකුවේ තිරසාරත්ව යහපාලනය අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් ස්ථාපිත කර ඇති අතර, පාරිසරික, සමාජීය සහ යහපාලන (ESG) සලකා බැලීම් උපායමාර්ගික යහපාලනය, අවදානම් කළමනාකරණය සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය තුළ ඒකාබද්ධ කර ඇත. මෙම යහපාලන ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩල හා කළමනාකරණ මට්ටමේ කමිටු හරහා අධීක්ෂණයට ලක්ව ඇති අතර, විශේෂිත තිරසාරත්ව හා අනාවරණ ව්‍යුහයන්ගේ සහාය සහිතව ක්‍රියාත්මක වේ. එමෙන්ම, සම්පත් වගකීම් සහිතව භාවිතා කිරීම සහ තිරසාර ප්‍රතිඵල සඳහා වගකීම් සහගත බව වර්ධනය කිරීම අරමුණු කරගත් කාර්යසාධන නිරීක්ෂණ ක්‍රමවේද ද ක්‍රියාත්මක කර ඇත. මෙම ව්‍යුහය මඟින් යහපාලනය, මූල්‍යකරණය, මෙහෙයුම් සහ වාර්තාකරණ ක්‍රියාවලීන් පුරා තිරසාරත්ව සලකා බැලීම් ක්‍රමවත් ලෙස ඒකාබද්ධ කර පවත්වාගෙන යාම සහතික කරයි.

යහපාලනය හා අවදානම් කළමනාකරණය වෙත සබැඳිය

තිරසාරත්ව යහපාලනය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, පිටු 162 සිට 179 දක්වා ඇති ලංකා බැංකුවේ යහපාලන වාර්තාව වෙත යොමු වන්න.

එමෙන්ම, තිරසාරත්වය හා දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා අධීක්ෂණය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, පිටු 88 සිට 106 දක්වා ඇති SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම් වෙත යොමු වන්න.



අධ්‍යක්ෂ මණ්ඩලය
උපායමාර්ගික දිශානතිය | ESG අධීක්ෂණය | දිගුකාලීන වටිනාකම් නිර්මාණය

එකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC)
තිරසාරත්වය හා දේශගුණය සම්බන්ධ අවදානම් අධීක්ෂණය | ව්‍යවසාය අවදානම් කළමනාකරණ (ERM) සමඟ සමාලෝචිත අනුකූලතාව

තිරසාරත්ව කමිටුව
ප්‍රතිපත්ති අධීක්ෂණය | තිරසාරත්ව උපායමාර්ගය | කාර්යසාධන නිරීක්ෂණය

තිරසාරත්ව උපකමිටුව
ESG අවදානම් සමාලෝචනය | ණය සම්බන්ධ නිසි පරීක්ෂණ (Due Diligence) අධීක්ෂණය

තිරසාර බැංකුකරණ අංශය
තිරසාර මූල්‍යකරණය | වගකීම් සහගත බැංකුකරණ උත්සාහයන් | ශක්තීන් සහ සම්පත් කළමනාකරණය | වත්කම් කළඹ අධීක්ෂණය | ශාඛා මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම

SLFRS S1 සහ S2 ක්‍රියාකාරී කණ්ඩායම
යහපාලනය, උපායමාර්ග, අවදානම් කළමනාකරණය සහ වාර්තාකරණය පුරා තිරසාරත්ව හා දේශගුණය සම්බන්ධ අනාවරණ ඒකාබද්ධ කිරීම

ශාඛා මට්ටම
තිරසාරත්ව යහපාලනය සහ ප්‍රතිපත්ති මඟින් මඟපෙන්වනු ලබන දෛනික තීරණ ගැනීම | කාර්යක්ෂමතා නිරීක්ෂණය | සම්පත් ප්‍රශස්තිකරණය | වාර්තාකරණය

ESG අන්තර්-කාර්යමණ්ඩල කණ්ඩායම
අන්තර්-කාර්යමණ්ඩල සම්බන්ධීකරණය | ක්‍රියාත්මක කිරීම සඳහා සහාය | අභ්‍යන්තර සම්බන්ධීකරණය | තිරසාරත්ව මූලපිරිම්වල ඒකාබද්ධකරණය

තිරසාරත්වය සමඟ සංයෝජනය

බැංකුව සිසාරා තිරසාරත්වය ඒකාබද්ධ කිරීම

ලංකා බැංකුවේ තිරසාරභාවය, බැංකුව පුරා එක්ව ක්‍රියාත්මක වන අන්තර් සම්බන්ධිත ප්‍රතිපත්ති, උපායමාර්ග, අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් සහ මූල්‍යකරණ රාමු හරහා සම්බන්ධිත වේ. මෙම යාන්ත්‍රණයන් තිරසාරභාවය පිළිබඳ කැපවීම් ස්ථාවර තීරණ ගැනීම සහ මැනිය හැකි ප්‍රතිඵල බවට පරිවර්තනය කරයි.

උපායමාර්ගය හා දිශානතිය
ප්‍රමුඛතා නිර්ණය කිරීම සහ අනාගත දිශානතිය ස්ථාපනය කිරීම

- ආයතනික උපායමාර්ගය
- ශ්‍රී ලංකා මහ බැංකුවේ තිරසාර මූල්‍ය පෙරදැක්ම



ප්‍රතිපත්ති සහ රාමු
අපේක්ෂාවන් සහ ක්‍රියාකාරී පරාමිතීන් නිර්ණය කිරීම

- තිරසාරත්ව ප්‍රතිපත්තිය
- පාරිසරික හා සමාජීය කළමනාකරණ පද්ධතිය (ESMS)
- තිරසාර මූල්‍ය රාමුව

මූල්‍යකරණය සහ ප්‍රාග්ධන විභජනය
තිරසාරත්වය මූල්‍ය තීරණ වලට පරිවර්තනය කිරීම

- වගකීම් සහගත බැංකුකරණ මූලධර්ම
- තිරසාර මූල්‍ය ප්‍රමුඛ ක්ෂේත්‍ර
- වත්කම් කළඹ මට්ටමේ අධීක්ෂණය

කාර්යසාධනය හා අනාවරණය
ප්‍රතිඵල හඳුනාගැනීම, මැනීම සහ සන්නිවේදනය කිරීම

- හරිතාගාර වායු විමෝචනය (GHG) ඇතුළු තිරසාරත්ව කාර්යසාධන නිරීක්ෂණය
- SLFRS S1 සහ S2 අනාවරණයන්
- තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සමඟ අනුකූලතාව
- GRI වාර්තාකරණය
- SASB ප්‍රමිතීන්

අවදානම් කළමනාකරණය හා ඔරොත්තු දීමේ හැකියාව
අවදානම් හඳුනාගැනීම, අවම කිරීම සහ ව්‍යාපාරික අඛණ්ඩතාවයට සහාය දක්වයි

- ව්‍යවසාය අවදානම් කළමනාකරණය
- දේශගුණය සම්බන්ධ අවදානම් හා අවස්ථා (CRROs) ඇතුළුව ESG සම්බන්ධ අවදානම් හා අවස්ථා
- ව්‍යාපාරික අඛණ්ඩතාව සහ ඔරොත්තු දීමේ හැකියාව සැලසුම්කරණය

කාර්යසාධන නිරීක්ෂණය, විගණනය සහ අනාවරණය කිරීමේ සහතිකය

තිරසාර කාර්යසාධනය නිරීක්ෂණය කරනු ලබන්නේ බැංකුව පුරා මූල්‍ය නොවන දත්ත රැස් කිරීම, ඒකාබද්ධ කිරීම සහ සමාලෝචනය කිරීම සඳහා සහාය වන අභ්‍යන්තර පද්ධති මගින් ය. මෙම පද්ධති පාරිසරික, සමාජීය සහ යහපාලන කේන්ද්‍රීය ක්ෂේත්‍ර හරහා ස්ථාවර කාර්යසාධන මැනීම, කළමනාකරණ අධීක්ෂණය සහ දැනුවත් තීරණ ගැනීම සක්‍රීය කරයි.

වසර තුළ, සම්පත් කාර්යක්ෂමතාව තක්සේරු කිරීම සහ අවස්ථා හඳුනා ගැනීම සඳහා තෝරාගත් මෙහෙයුම් හරහා බලශක්ති විගණන සහ ආහාර අපද්‍රව්‍ය විගණන ඇතුළු මෙහෙයුම් විගණන පවත්වන ලදී. මෙම විගණන වලින් නිරීක්ෂිත කරුණු සහ තොරතුරු මත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග දියත් කිරීම සිදු කෙරේ.

විනිවිදභාවය සහ විශ්වසනීයත්වය වර්ධනය කිරීම සඳහා, තිරසාරත්ව අනාවරණ ස්වාධීන සහතික කිරීමකට යටත් කර ඇති අතර, එමඟින් වාර්තාගත තොරතුරු වල නිවැරදිභාවය සහ සම්පූර්ණත්වය පිළිබඳ අතිරේක විශ්වාසයක් සපයයි.

සහතික කිරීමේ පරාසය සහ නිගමන සම්බන්ධ විස්තර, ස්වාධීන සහතික කිරීමේ වාර්තා (පිටු 86–87 සහ 456–459) තුළ සවිස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

දැනුම හා හැකියාවන් සංවර්ධනය

බැංකුව පුරා තිරසාරභාවය සහ පාරිසරික හා සමාජීය අවදානම් කළමනාකරණ පිළිවෙත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා දැනුම හා හැකියාවන් සංවර්ධනය සඳහා සහාය වේ. වසර තුළ, තිරසාරභාවය පිළිබඳ මූලධර්ම, පාරිසරික ආරක්ෂාව පිළිබඳ කාර්ය මණ්ඩල අවබෝධය ශක්තිමත් කිරීම සඳහා ඉලක්කගත පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

මෙම මූලපිරීම් මඟින් දෛනික මෙහෙයුම් සහ මූල්‍ය තීරණ ගැනීමේ ක්‍රියාවලීන් තුළ තිරසාරත්ව සලකා බැලීම් පද්ධතිමය ලෙස ඒකාබද්ධ කිරීම සඳහා සහාය දක්වමින්, ව්‍යාපාරික හා මෙහෙයුම් කාර්යභාරයන් පුරා වගකීම් සහගත බව ශක්තිමත් කිරීම සහ අඛණ්ඩ ක්‍රියාත්මක කිරීම තවදුරටත් බලගන්වයි.

ESMS පුහුණු වැඩසටහන්

සේවකයින් **347** දෙනෙකු පුහුණු කරන ලදී.

තිරසාරත්ව පුහුණු වැඩසටහන්

සේවකයින් **1,149** දෙනෙකුට පුහුණුව ලබා දෙන ලදී.

පුහුණු පැය **1,836 ක්**

වැඩසටහන් **27 ක්**

තිරසාරත්ව ප්‍රතිපත්තිය සහ උපායමාර්ගික මූලස්ථාපනය

බැංකුවේ තිරසාරත්ව ප්‍රවේශය සවිස්තරාත්මක තිරසාරත්ව ප්‍රතිපත්තියක් මඟින් මඟපෙන්වනු ලබන අතර, එය පාරිසරික, සමාජීය සහ ආර්ථික සලකා බැලීම් තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඒකාබද්ධ කිරීම සඳහා මූලික රාමුව සපයයි. මෙම ප්‍රතිපත්තිය තුළ ත්‍රිත්ව පදනම් ප්‍රවේශයක් (Triple Bottom Line) අනුගමනය කරමින්, ආර්ථික කාර්යසාධනය, පාරිසරික සංරක්ෂණය සහ සමාජ වගකීම අතර සාමාන්‍යකරණය කරමින් වටිනාකම් නිර්මාණය සිදු කිරීම සහතික කරයි.

මෙම වර්ෂය තුළ, නව තිරසාරත්ව සලකා බැලීම්, විකාශනය වෙමින් පවතින නියාමන අපේක්ෂාවන් සහ බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා අනුව ප්‍රතිපත්තිය යාවත්කාලීන කර ඇත. ඒ අනුව, තිරසාරත්ව ඒකාබද්ධ කිරීම සඳහා මාර්ගෝපදේශක රාමුවක් ලෙස එහි වැදගත්කම තවදුරටත් ශක්තිමත් වී ඇත.



තිරසාරත්ව ප්‍රතිපත්ති රාමුව - ත්‍රිත්ව පදනම් ප්‍රවේශය (Triple Bottom Line)

ආර්ථික

වටිනාකම් නිර්මාණය, යහපාලනය සහ ඔරොත්තු දීමේ හැකියාව

ප්‍රධාන අවධානය යොමු කරන ක්ෂේත්‍ර:

- සදාචාරාත්මක හා වගකීම් සහගත බැංකුකරණය
- විචක්ෂණශීලී අවදානම් කළමනාකරණය
- වගකීම් සහගත ණය ප්‍රදානය සහ ආයෝජනය
- මූල්‍ය ඇතුළත්කරණය
- විනිවිදභාවය හා වගවීම

පාරිසරික

පාරිසරික භාරකාරත්වය සහ දේශගුණික ක්‍රියාමාර්ග

ප්‍රධාන අවධානය යොමු කරන ක්ෂේත්‍ර:

- මෙහෙයුම් ක්‍රියාවලීන් තුළ සම්පත් කාර්යක්ෂමතාව
- දේශගුණික ක්‍රියාමාර්ග, විමෝචන සහ ශක්ති කාර්යක්ෂමතාව
- හරිත බැංකුකරණය සහ තිරසාර මූල්‍යකරණය
- ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති ආරක්ෂාව
- පාරිසරික දැනුවත්භාවය සහ සාක්ෂරතාව

සමාජීය

පුද්ගලයන්, ප්‍රජාවන් සහ ඇතුළත්කරණය

ප්‍රධාන අවධානය යොමු කරන ක්ෂේත්‍ර:

- සේවක සුභසාධනය, විවිධත්වය සහ ඇතුළත්කරණය
- කුසලතා සංවර්ධනය සහ ආරක්ෂිත සේවා පරිසරය
- ප්‍රජා සංවර්ධනය සහ ජීවිකා සංවර්ධනය
- අධ්‍යාපන හා සෞඛ්‍ය මූලපිරීම්
- ඌන සේවා ලබන ජන කොටස් සඳහා මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශය

යහපාලනය සහ අධීක්ෂණය
අධ්‍යක්ෂ මණ්ඩලය | IRMC | තිරසාරත්ව කමිටු

දත්ත සහ අනාවරණ
මූල්‍ය නොවන දත්ත | SLFRS S1 සහ S2 | හරිතාගාර වායු ගිණුම්කරණය

හවුල්කාරිත්වයන්
නියාමකයින් | සංවර්ධන හවුල්කරුවන් | රාජ්‍ය නොවන සංවිධාන | කර්මාන්ත

අවදානම් සහ පාලන ක්‍රමවේද
ESMS | SRROs සහ CRROs | කළඹ අවදානම් ඒකාබද්ධ කිරීම

පුද්ගලයින් සහ ධාරිතාව
පුහුණුව | ESG ක්‍රියාකාරී කණ්ඩායම් | ශාඛා බලශක්ති කළමනාකරුවන්

තිරසාරත්වය සමඟ සංයෝජනය

තිරසාරත්ව කාර්යසාධනය

තිරසාර ප්‍රතිපත්තියෙන් අවධානය යොමු කරන අංශ වලට අනුකූලව මුලපිරීම් ක්‍රියාත්මක කිරීම තුළින් බැංකුව තිරසාර කාර්යසාධනය නිරීක්ෂණය කරයි. වසර තුළ ආර්ථික, පාරිසරික සහ සමාජීය මානයන් හරහා ගනු ලැබූ ක්‍රියාමාර්ග වල සාර්ථකත්වය ලැබූ ප්‍රගතිය මගින් පිළිබිඹු කරන අතර, ඒ සඳහා යහපාලන අධීක්ෂණ සහ කාර්යසාධන මැනිමේ යාන්ත්‍රණයන් සහාය වේ. මෙම වාර්තාවේ අදාළ අංශවල සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත.

E ආර්ථිකමය

අවධානය යොමු කරන අංශ	2025 වසරේ ප්‍රධාන මුලපිරීම්	ප්‍රගතිය/ ප්‍රධාන විශේෂාංග
සදාචාරාත්මක සහ වගකීම් සහගත බැංකුකරණය	සදාචාරාත්මක හැසිරීම, යහපාලන රාමු සහ වගකීම් සහගත පිළිවෙත් ශක්තිමත් කිරීම.	• බැංකුව පුරා KPI, මිනුම් සහ ඉලක්ක ඇතුළත් ESG ප්‍රතිපත්තිය සහ පෙරදැක්ම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම. • චර්යාධර්ම සහ ආචාරධර්ම සංග්‍රහයට විරෙහි අනුකූල නොවීම් කිසිවක් වාර්තා වී නොමැත.
විවේකෂණශීලී අවදානම් කළමනාකරණය	තිරසාරත්වයට අදාළ අවදානම්, ව්‍යවසාය අවදානම් කළමනාකරණයට ඒකාබද්ධ කිරීම.	• IRMC හරහා තිරසාරභාවය ආශ්‍රිත අවදානම් සහ අවස්ථා (SRROs) පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අධීක්ෂණය • අවදානම් කළමනාකරණ රාමුව තුළ අන්තර්ගත පාරිසරික අවදානම සහ සමාජ අවදානම
වගකීම් සහගත ණය ප්‍රදානය සහ ආයෝජනය	තිරසාර හා වගකීම් සහගත මූල්‍යකරණ ප්‍රවේශයන් සංවර්ධනය කිරීම.	• තිරසාර බැඳුම්කර නිකුත් කිරීම් ඇතුළුව තිරසාර මූල්‍යකරණ ක්‍රියාකාරකම් සඳහා සහාය වීම සඳහා තිරසාර මූල්‍ය රාමුවක් හඳුන්වා දෙන ලදී. • පාරිසරික හා සමාජීය මාන දර්ශක අනුව ණය පහසුකම් 1,172 ක් පිරික්සන ලදී.
මූල්‍ය ඇතුළත්කරණය	බැංකු සේවා සහ ණය පහසුකම් වෙත ප්‍රවේශය ප්‍රවර්ධනය කරන මූල්‍ය ඇතුළත්කරණ මුලපිරීම්	• සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (MSMEs) සඳහා මූල්‍යකරණය රු. බිලියන 319.9 ක් ලෙස වාර්තා වූ අතර, ගනුදෙනුකරුවන් මිලියන 1.0 කට අධික සංඛ්‍යාවක් සඳහා සහාය ලබා දෙන ලදී. • SME, ග්‍රාමීය සහ අඩු සේවා ලබන ජන කොටස් සඳහා මූල්‍යකරණ වැඩසටහන් ව්‍යාප්ත කිරීම. • දිවයින පුරා 'BOC මිතුරු' කණ්ඩායම් 3,000 කට අධික සංඛ්‍යාවක් ස්ථාපිත කර ඇත.
විනිවිදභාවය සහ වගවීම	තිරසාරත්ව වාර්තාකරණය සහ අනාවරණ ක්‍රියාපටිපාටි ශක්තිමත් කිරීම.	• SLFRS S1 සහ SLFRS S2 ප්‍රමිතීන් පූර්ව අනුගමනය කරමින්, තිරසාරත්වය හා දේශගුණය සම්බන්ධ අනාවරණයන්ගේ පැහැදිලිතාව වැඩිදියුණු කිරීම.

බලපෑමට ලක් වූ ප්‍රාග්ධන: 

උපායමාර්ගය හා සබැඳිය: 

E පාරිසරික

අවධානය යොමු කරන අංශ	2025 වසරේ ප්‍රධාන මුලපිරීම්	ප්‍රගතිය/ ප්‍රධාන විශේෂාංග
මෙහෙයුම් ක්‍රියාවලීන් තුළ සම්පත් කාර්යක්ෂමතාව	බලශක්ති විගණන, ප්‍රතිචක්‍රීකරණය, ආහාර අපද්‍රව්‍ය අඩු කිරීම සහ ද්‍රව්‍ය භාවිතය අඩු කිරීම සඳහා ඩිජිටල්කරණය	• කඩදාසි මෙට්‍රික් ටොන් 14.4 ක් ප්‍රතිචක්‍රීකරණය කරන ලදී. • කඩදාසි භාවිතය 60% කින් අඩු කරන ලදී.
දේශගුණික ක්‍රියාමාර්ග, විමෝචනය සහ ශක්ති කාර්යක්ෂමතාව	ස්ථානීය පුනර්ජනනීය බලශක්තිය භාවිතය පුළුල් කිරීම, බලශක්ති කාර්යක්ෂමතා මිනුම් සහ විමෝචන කළමනාකරණය	• සූර්ය ශක්තිකරණය කළ ශාඛා 101 ක් • මෙගා වොට් 4.3 ක ස්ථාපිත සූර්ය ශක්ති ධාරිතාව • මෙගා වොට් 5,650.2 ක සූර්ය විදුලි නිෂ්පාදනය • tCO_2e විමෝචනය ටොන් 14.4 කින් අඩු කිරීම.
හරිත බැංකුකරණය සහ තිරසාර මූල්‍යකරණය	හරිත ණය, හරිත කල්බදු, තිරසාර මූල්‍ය නිෂ්පාදන පිරිනැමීම් සහ උපදේශන සහාය	• තිරසාර මූල්‍ය කළඹ රු. බිලියන 73.0 ක් ලෙස වාර්තා විය. • රු. බිලියන 20.0 ක තිරසාර බැඳුම්කර නිකුතුව • රු. මිලියන 78.9 ක හරිත තැන්පතු පදනම • ජෛව හායන කාඩ්පත හඳුන්වා දෙන ලදී.
ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති ආරක්ෂාව	සංරක්ෂණ හා අවබෝධතා වැඩසටහන්	• වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම. • ජෛව විවිධත්වය සම්බන්ධ ප්‍රතිපත්ති සංවර්ධනය
පාරිසරික දැනුවත් භාවය සහ සාක්ෂරතාව	ගනුදෙනුකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, ප්‍රචාරණ ක්‍රියාකාරකම් සහ ව්‍යාප්තිය	• ගනුදෙනුකරුවන් සඳහා ESMS අනුකූලතාව සහ හරිත නිෂ්පාදන පිළිබඳ උපදේශන හා අවබෝධතා සැසි පැවැත්වීම.

බලපෑමට ලක් වූ ප්‍රාග්ධන: 

උපායමාර්ගය හා සබැඳිය: 

S සමාජීය

අවධානය යොමු කරන අංශ	2025 වසරේ ප්‍රධාන මූලපිරීම්	ප්‍රගතිය/ ප්‍රධාන විශේෂාංග
සේවක සුභසාධනය, විවිධත්වය, සහ ඇතුළත්කරණය	ඇතුළත් සේවක ප්‍රතිපත්ති, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සේවක සුභසාධන මූලපිරීම්	• සේවකයින් 8,912 දෙනෙකුගෙන් සමන්විත සේවක මණ්ඩලය • කාන්තා සේවක ප්‍රතිශතය 59% • මාතෘ නිවාඩු අවසන් වීමෙන් පසු සේවයට ආපසු පැමිණීමේ අනුපාතය 100% • සේවක සුභසාධනය සඳහා රු. මිලියන 185.8 ක ආයෝජනය
කුසලතා සංවර්ධනය සහ ආරක්ෂිත සේවා ස්ථාන	පුහුණු, හැකියාවන් සංවර්ධනය සහ වෘත්තීය සෞඛ්‍යය හා ආරක්ෂණ මූලපිරීම්	• පුහුණු පැය 236,387 ක් සපයන ලදී. • සේවා ස්ථාන අනතුරු කිසිවක් වාර්තා වී නොමැත. • ආරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න සේවා පරිසර පවත්වාගෙන යාම සඳහා අඛණ්ඩ අවධානය යොමු කිරීම.
ප්‍රජා සංවර්ධනය සහ ජීවිකා සංවර්ධනය	ජීවිකා සහාය, ප්‍රජා සංවර්ධන වැඩසටහන් සහ සමාජ ආයෝජන මූලපිරීම්	• ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සඳහා රු. මිලියන 780.5 ක් ආයෝජනය කරන ලදී. • වසර තුළ ජීවිකා සහ ප්‍රජා වැඩසටහන් හරහා ප්‍රතිලාභීන් 4,600 කට අධික සංඛ්‍යාවක් සඳහා සහාය ලබා දෙන ලදී.
අධ්‍යාපන හා සෞඛ්‍ය මූලපිරීම්	ශිෂ්‍යත්ව, අධ්‍යාපන සහාය සහ සෞඛ්‍ය ආශ්‍රිත ප්‍රජා වැඩසටහන්	• 'BOC හපනා' සහ 'BOC නැණපය' වැඩසටහන් යටතේ ශිෂ්‍යත්ව 10,825 ක් ප්‍රදානය කරන ලදී. • අධ්‍යාපන හා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 700 කට අධික සංඛ්‍යාවක් පැවැත්වීය. • අධ්‍යාපන හා සෞඛ්‍ය සංවර්ධනය සඳහා රු. මිලියන 130.0 කට ආසන්න මුදලක් ආයෝජනය කරන ලදී. • අපේක්ෂා රෝහලේ වාට්ටුවක් ඉදි කිරීම.
ඌන සේවා ලබන ජන කොටස් සඳහා මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශය	ඇතුළත් බැංකුකරණය සහ සමාජ ආරක්ෂණයට සම්බන්ධ මූලපිරීම්	• අස්වැසුම සම්බන්ධ මූලපිරීම් හරහා පුද්ගලයින් 700,000 කට අධික සංඛ්‍යාවක් සඳහා සහාය ලබා දෙන ලදී. • ජංගම සේවා රථ (Branch on Wheels), SME සහ ග්‍රාමීය ප්‍රවේශ වැඩසටහන්

බලපෑමට ලක් වූ ප්‍රාග්ධන:


උපායමාර්ගය හා සබැඳිය:

මූල්‍ය තීරණ ගැනීමේ ක්‍රියාවලියට තිරසාරත්වය ඒකාබද්ධ කිරීම

බැංකුව ප්‍රාග්ධනය වෙන්කිරීම සහ මූල්‍ය අවදානම් කළමනාකරණය සිදු කරන ආකාරයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස තිරසාරත්ව සලකා බැලීම් කටයුතු කරයි. මෙම සලකා බැලීම්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමත ප්‍රතිපත්ති, ව්‍යවසාය අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් සහ කළමනාකරණ මට්ටමේ අධීක්ෂණය හරහා මූල්‍ය තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඒකාබද්ධ කර ඇති අතර, එමඟින් බැංකුවේ උපායමාර්ගයන් සහ අවදානම් අභිරුචිය සමඟ සමාලෝචිත අනුකූලතාව සහතික කරයි.

මෙම වර්ෂය තුළ, තිරසාර බැඳුම්කර නිකුත් කිරීම ඇතුළු තිරසාර මූල්‍යකරණ ක්‍රියාකාරකම් සඳහා සහාය වීම සඳහා තිරසාර මූල්‍ය රාමුව සංවර්ධනය කිරීම හරහා බැංකුව මෙම ප්‍රවේශය තවදුරටත් ශක්තිමත් කර ඇත.

ESG සහ දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා, උපායමාර්ගික සැලසුම්කරණය සහ ප්‍රතිපත්ති සැකසීමේ සිට මූල්‍ය තීරණ ගැනීම, වත්කම් කළඹ මට්ටමේ නිරීක්ෂණය සහ අනාවරණය දක්වා මූල්‍යකරණ චක්‍රය පුරා සලකා බැලේ.



තිරසාරත්වය සමඟ සංයෝජනය

පාරිසරික හා සමාජීය අවදානම් කළමනාකරණය සහ තිරසාර මූල්‍යකරණ ක්‍රියාපටිපාටි

බැංකුවේ මූල්‍යකරණ ක්‍රියාකාරකම් තුළ පාරිසරික හා සමාජීය සලකා බැලීම් පිරික්සීම, ධාරිතා සංවර්ධනය සහ වගකීම් සහගත නිෂ්පාදන පිරිනැමීම් මඟින් ඒකාබද්ධ කර ඇත. මෙම ක්‍රියාපටිපාටි මනා අවදානම් කළමනාකරණය, නියාමන අනුකූලතාව සහ තිරසාර ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා සහාය දක්වයි.

පාරිසරික හා සමාජීය පිරික්සීම (ESMS)

බැංකුවේ මූල්‍යකරණ ක්‍රියාකාරකම් සමඟ සම්බන්ධ පාරිසරික හා සමාජීය අවදානම්, නියාමන හා අභ්‍යන්තර ප්‍රතිපත්ති අපේක්ෂාවන්ට අනුකූල අවම අවශ්‍යතා යොදාගනිමින් ක්‍රියාත්මක වන බැංකුවේ පාරිසරික හා සමාජීය කළමනාකරණ පද්ධතිය හරහා ඇගයීමට ලක් කරනු ලැබේ.

ප්‍රධාන අංග

- ව්‍යාපාර සඳහා ලබා දෙන ණය පහසුකම් සඳහා පාරිසරික හා සමාජීය පිරික්සීම
- ජාතික පාරිසරික පනතට අනුකූලව මධ්‍යම පාරිසරික අධිකාරිය (CEA) විසින් නිර්දේශිත හා අනුමත කර ඇති මාර්ගෝපදේශයන්ට අනුකූල වීම
- ගනුදෙනුකරුවන් හා ණය පහසුකම් මට්ටමින් පාරිසරික හා සමාජීය අවදානම් හඳුනාගැනීම හා කළමනාකරණය
- පිරික්සන ලද ණය පහසුකම් පිළිබඳ අඛණ්ඩ නිරීක්ෂණය

ESMS අනුකූලතාව	
ලබා දුන් ණය පහසුකම් සංඛ්‍යාව	1,165
ලබා දුන් ණය පහසුකම්වල වටිනාකම (රු. බිලියන)	322.6

ESMS පිරික්සීමේ අඛණ්ඩ භාවිතය අභ්‍යන්තර හැකියා සංවර්ධන සහ පුහුණු වැඩසටහන් මඟින් සහාය ලබයි.

උපදේශන සහ සහාය සේවා

මූල්‍යකරණයට අමතරව, ගනුදෙනුකරුවන් අතර පාරිසරික කාර්යසාධනය වැඩිදියුණු කිරීම සහ නියාමන අනුකූලතාව ප්‍රවර්ධනය කිරීම සඳහා බැංකුව උපදේශන සහාය ද සපයයි.

ප්‍රධාන අංග

- CEA නිර්දේශ පිළිබඳ නිරීක්ෂණය සහ අනුගමනය කිරීම
- පාරිසරික ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම සඳහා උපදේශන සේවා සැපයීම
- නියාමන අනුකූලතාව සහ පාරිසරික අවදානම් අවම කිරීම පිළිබඳ මාර්ගෝපදේශනය.

සැපයුම්කරුවන් සහ හවුල්කරුවන්ගේ පිරික්සීම

පාරිසරික හා සමාජීය සලකා බැලීම්, වටිනාකම් දාමය පුරා වගකීම් සහගත ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීම සඳහා සැපයුම්කරුවන් හා සේවා සපයන්නන් වෙත විහිදුවා ඇත.

ප්‍රධාන අංග

- මූලික පාරිසරික හා සමාජීය මාන දර්ශක අනුව සැපයුම්කරුවන් පිරික්සීම
- නියාමන අනුකූලතාව, කම්කරු ක්‍රියාපටිපාටි සහ පාරිසරික වගකීම සලකා බැලීම
- සැපයුම්කරුවන් සමඟ සම්බන්ධතා හා අධීක්ෂණ ක්‍රියාවලීන් තුළ තිරසාරත්ව සලකා බැලීම් ඒකාබද්ධ කිරීම

පාරිසරික හා සමාජීය මාන දර්ශක අනුව සැපයුම්කරුවන් 851 ක් පිරික්සන ලදී.

තිරසාර මූල්‍යකරණ මුලපිරීම්

බැංකුව, තිරසාර ආර්ථික ක්‍රියාකාරකම් සහ වගකීම් සහගත පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්මාණය කරන ලද මූල්‍ය විසඳුම් පරාසයක් පිරිනමයි.

ප්‍රධාන අංග

- තිරසාර හා වගකීම් සහගත මූල්‍ය නිෂ්පාදන
- පුනර්ජීවනය කළ හැකි ශක්ති සහ සම්පත් කාර්යක්ෂමතාව සඳහා කරන ආයෝජන වලට (ප්‍රතිචක්‍රීයකරණය ප්‍රවර්ධනය) සහාය දක්වන හරිත ණය
- හරිත ලීසිං විසඳුම්
- පාරිසරික බලපෑම අඩු කිරීම සඳහා පෙළඹ හායනයට ලක්වන කාඩ්පත් හඳුන්වා දීම
- ප්‍රාග්ධන වෙළඳපළ නිෂ්පාදන

තිරසාර නිෂ්පාදන	(රු. බිලියන)
තිරසාර ණය ප්‍රදාන	73.0
තිරසාර බැඳුම්කර	20.0

2025 වසර තුළ සිදුකළ වැඩිදියුණු කිරීම් සහ වර්ධනයන්

යහපාලනය සහ අධීක්ෂණය

- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) හරහා දේශගුණය සම්බන්ධ අවදානම් හා අවස්ථා සඳහා අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අධීක්ෂණය විධිමත් කිරීම.
- SLFRS S1 සහ SLFRS S2 ප්‍රමිතීන් පූර්ව ලෙස අනුගමනය කරමින්, දේශගුණය සම්බන්ධ කරුණු සඳහා යහපාලනය, අවදානම් කළමනාකරණය සහ අනාවරණ සූදානම ශක්තිමත් කිරීම.
- තිරසාරත්ව හා දේශගුණය සම්බන්ධ අනාවරණ සඳහා සහාය දීම පිණිස විශේෂිත SLFRS S1 සහ SLFRS S2 ක්‍රියාකාරී කණ්ඩායමක් ස්ථාපනය කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණය (2022 මැයි) සහ අන්තර්ජාතික ප්‍රාග්ධන වෙළඳපළ සංගමය විසින් නිකුත් කරන ලද හරිත බැඳුම්කර මූලධර්ම (2025 ජූනි), සමාජ බැඳුම්කර මූලධර්ම (2025 ජූනි) සහ තිරසාර බැඳුම්කර මාර්ගෝපදේශ (2021 ජූනි) ඇතුළු ජාත්‍යන්තර ප්‍රමිතීන් සමඟ තිරසාර බැඳුම්කර නිකුතුව අනුකූල කරමින්, තිරසාර මූල්‍ය රාමුව බැංකුව තුළම සංවර්ධනය කිරීම.
- බැංකුවේ ප්‍රධාන මෙහෙයුම් පුරා තිරසාරත්ව ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීම සඳහා සහ ESG ප්‍රතිපත්තිය හා ESG පෙර දැක්ම ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා ESG ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs), ඉලක්ක සහ ක්‍රියාකාරී සැලසුම් සංවර්ධනය කිරීම.

SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම් (පිටු 85 -106) වෙත යොමු වන්න.

නියාමන අනුකූලතාව

- මූල්‍ය විමෝචන මැනීම හා අනාවරණය කිරීමේ බැංකුවේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා කාබන් ගිණුම්කරණ මූල්‍ය හවුල්කාරිත්වය (PCAF) සමඟ ලියාපදිංචි වීම.
- සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) විසින් නිකුත් කරන ලද විශේෂ ශක්ති සම්මත මට්ටම පිළිබඳ නියාමන (2023 අංක 01 දරණ) ක්‍රියාත්මක කිරීම ඇතුළුව නියමිත කාර්යක්ෂමතා සම්මත මට්ටමට අනුව ශක්ති කාර්යසාධනය නිරීක්ෂණය කිරීම සඳහා ශාඛා පුරා ශක්ති කළමනාකරණ නිලධාරීන් පත් කිරීම.
- තිරසාරත්ව කාර්යසාධන නිරීක්ෂණය සහ අනාවරණයට සහාය වීම සඳහා අභ්‍යන්තර මූල්‍ය නොවන දත්ත කළමනාකරණ පද්ධති ශක්තිමත් කිරීම.

SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම් (පිටු 85 -106) වෙත යොමු වන්න.

ප්‍රමාණාත්මකතාව සහ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණය

- බැංකුවේ ප්‍රමාණාත්මකව වැදගත් කරුණු රාමුව ස්ථාපනය කිරීම, තිරසාරත්ව උපායමාර්ගය සහ අනාවරණ මඟපෙන්වීම සඳහා උප විෂයයන් 42 කින් සහාය ලබන ප්‍රධාන මූලික විෂයයන් 10 ක් හඳුනාගැනීම.
- ගනුදෙනුකරුවන්, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, කළමනාකරණය, නියාමකයන්, දායකත්ව ආයතන සහ සේවකයින් ඇතුළු ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ දෘෂ්ටිකෝණ ඇතුළත් කරමින් පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණය හා ප්‍රමාණාත්මකතා ඇගයීම සම්බන්ධ ක්‍රියාදාමය සම්පූර්ණ කිරීම.
- බැංකුවේ උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලිය තුළ මූලික තිරසාරත්ව ප්‍රමුඛතා ඒකාබද්ධ කිරීම, ESG අරමුණු සහ දිගුකාලීන ව්‍යාපාරික උපායමාර්ගය අතර සහසම්බන්ධය ශක්තිමත් කිරීම.

පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වීම පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා (පිටු 57–60) සහ ප්‍රමාණාත්මකතා තක්සේරුව පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා (පිටු 61–64) වෙත යොමු වන්න.

තිරසාරත්වය සමඟ සංයෝජනය

ඉදිරි දැක්ම

මෙම වර්ෂය තුළ ශක්තිමත් කරන ලද යහපාලන ව්‍යුහයන්, රාමු සහ හැකියාවන් මත පදනම්ව, බැංකුව විසින් උපායමාර්ගය, මෙහෙයුම් සහ මූල්‍යකරණ ක්‍රියාකාරකම් පුරා තිරසාරත්වය තවදුරටත් ගැඹුරින් ඒකාබද්ධ කිරීමට ඉදිරියටත් කටයුතු කරනු ඇත. මෙහිදී ප්‍රධාන අවධානය යොමු කරන ක්ෂේත්‍ර පහත පරිදි වේ.

ඒකාබද්ධ ESG රාමුවකට පරිවර්තනය

- නව අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ තිරසාරත්ව කමිටුවක් පිහිටුවීම මඟින් යහපාලන ව්‍යුහය ශක්තිමත් කිරීම.
- පවතින තිරසාරත්ව ප්‍රතිපත්තියේ විෂය පරාසය පුළුල් කරමින් තවදුරටත් ශක්තිමත් කිරීම.

ESG උපායමාර්ගය සහ පෙරදැක්ම (2026 - 2030)

- ඒකාබද්ධ චින්තනය සඳහා වන අපගේ කැපවීම පිළිබිඹු කරමින්, ESG පෙර දැක්ම, බැංකුවේ 2026 - 2030 උපායමාර්ගික සැලැස්මේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස ඒකාබද්ධ කිරීම සහ ESG සලකා බැලීම් අපගේ උපායමාර්ගික ප්‍රමුඛතා හා කාර්යසාධනය සඳහා මඟපෙන්වීම සහතික කිරීම.

වාර්තාකරණය සහ අනාවරණ ශක්තිමත් කිරීම

- SLFRS තිරසාරත්ව සම්බන්ධ ප්‍රමිතීන්ට අනුකූලව, මූල්‍යකරණ විමෝචන ඇතුළුව දේශගුණය හා තිරසාරත්වය සම්බන්ධ මිනුම් දර්ශක ක්‍රමයෙන් සංවර්ධනය කිරීම.
- සංගතතාවෙන් මැනීම සහ වාර්තාකරණය සඳහා සහාය වීම පිණිස අභ්‍යන්තර දත්ත පද්ධති අඛණ්ඩව ශක්තිමත් කරගැනීම.

තිරසාර මූල්‍යකරණය සහ ඇතුළත්කරණය තවදුරටත් පුළුල් කිරීම

- නියාමන දිශානතිය සහ ජාතික ප්‍රමුඛතා සමඟ සමාලෝචිත අනුකූලතාවයෙන් තිරසාර මූල්‍යකරණය හා ඇතුළත් බැංකුකරණ මුලපිරීම් අඛණ්ඩව පුළුල් කිරීම.
- මූල්‍ය තීරණ ගැනීම සහ වත්කම් කළඹ මට්ටමේ නිරීක්ෂණය තුළ ESG සලකා බැලීම් තවදුරටත් ඒකාබද්ධ කිරීම.

ආයතනය පුරා ESG කාර්යසාධනය ඒකාබද්ධ කිරීම

- ක්‍රියාත්මක කිරීම, දැනුවත් කිරීම සහ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා පාර්ශ්වකරුවන් සමඟ අඛණ්ඩ සම්බන්ධීකරණය.
- විගණන හා සහතික කිරීමේ අවශ්‍යතා සමඟ අනුකූලතාව සහතික කිරීම.
- සමස්ත කාර්යසාධන කළමනාකරණ ක්‍රියාවලීන්හි අංගයක් ලෙස ශාඛා ජාලය පුරා තිරසාරත්ව කාර්යසාධනය හඳුනාගෙන ශක්තිමත් කිරීම සඳහා ක්‍රමවේද අනාවරණය කිරීම.
- මෙහෙයුම් ශක්ති විගණන වලින් ලැබෙන දත්ත මත පදනම්ව ඉලක්කගත ශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම් ක්‍රියාත්මක කිරීම.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDG)

දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකුවක් ලෙස, බැංකුව තම මූල්‍යකරණ ක්‍රියාකාරකම්, මෙහෙයුම් සහ යහපාලන ක්‍රියාපටිපාටි මඟින් ජාතික හා ගෝලීය තිරසාර සංවර්ධන ප්‍රමුඛතා සඳහා දායක වේ. මෙම වර්ෂය තුළ, බැංකුවේ තිරසාරත්ව මුලපිරීම් එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සඳහා සහාය දක්වමින්, වගකීම් සහගත මූල්‍ය ආයතනයක් ලෙස එහි භූමිකාවේ පරිමාණය සහ විෂය පරාසය පැහැදිලිව පෙන්නුම් කරයි.

පහත වගුව තුළ, වර්ෂය තුළ ක්‍රියාත්මක කළ ප්‍රධාන මුලපිරීම්වලට අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක සහ ඒවාට සම්බන්ධ ඉලක්ක සමඟ ඒකාබද්ධව නිරූපණය කර ඇත. මෙම නිරූපණය මඟින් දායකත්වය සහ අනුකූලතාව පවතින ක්ෂේත්‍ර පැහැදිලි වන අතර, එක් එක් ඉලක්ක අනුව දායකත්වයේ ස්වභාවය සහ ගැඹුර වෙනස් විය හැකි බව ද දැක්වේ. එමෙන්ම, දත්ත පද්ධති සහ ක්‍රමවේද තවදුරටත් වර්ධනය වන බැවින්, බලපෑම් මැනීම ක්‍රමයෙන් වැඩිදියුණු කරනු ඇත.



තිරසාර සංවර්ධන ඉලක්ක දායකත්ව නිරූපණය

	අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක	ප්‍රධාන මූලපිරීම්	අදාළ තිරසාර සංවර්ධන අරමුණු	දායකත්වයේ ස්වභාවය
	දුගී බව අවසන් කිරීම	• SME සහ ග්‍රාමීය ප්‍රවේශ වැඩසටහන් ඇතුළුව මූල්‍ය ඇතුළත්කරණ මූලපිරීම් • අස්වැසුම සම්බන්ධ වැඩසටහන්	1.4 - මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශය	● ●
	කුසගින්න තුරන් කිරීම	• ප්‍රජා සංවර්ධන හා ජීවිකා සහාය වැඩසටහන්	2.3 - සුළු පරිමාණ නිෂ්පාදකයින්ගේ ආදායම	● ●
	නිරෝගී බව සහ යහපැවැත්ම	• සේවක සුභසාධන වැඩසටහන් • සෞඛ්‍ය සේවා සහ සෞඛ්‍ය යටිතල පහසුකම් සඳහා සහාය (අපේක්ෂා රෝහලේ වාට්ටු ප්‍රතිසංස්කරණ ආයෝජන ඇතුළුව) • ප්‍රජා සෞඛ්‍ය මූලපිරීම්	3.4, 3.8 - මානසික සෞඛ්‍යය සහ ගුණාත්මක සෞඛ්‍ය සේවාවන් වෙත ප්‍රවේශය	● ●
	ගුණාත්මක අධ්‍යාපනය	• ශිෂ්‍යත්ව සහ අධ්‍යාපන සහාය වැඩසටහන්	4.3, 4.4 - අධ්‍යාපනය සහ කුසලතා වෙත ප්‍රවේශය	●
	ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය	• ශ්‍රම බලකාය තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ වෙනස් කොට නොසැලකීමේ ප්‍රතිපත්තිය • ඇතුළත් සහ ඩිජිටල් මූල්‍ය මූලපිරීම් මඟින් කාන්තා ව්‍යවසායකයින්ට සහාය දීම	5.1, 5.5 - වෙනස් කොට නොසැලකීම සහ කාන්තා සහභාගීත්වය	● ● ●
	පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව	• ජලය සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය	6.1 - ආරක්ෂිත පානීය ජලය වෙත ප්‍රවේශය	● ●
	දැරිය හැකි සහ පිවිතුරු බලශක්තිය	• සූර්ය PV ස්ථාපන • හරිත මූල්‍යකරණය • පුනර්ජනනීය ශක්ති ආයෝජන සඳහා සහාය දීම	7.2, 7.3 – පුනර්ජනනීය ශක්තිය සහ ශක්ති කාර්යක්ෂමතාව	● ●
	වැදගත් වැඩ පරිසරය සහ ආර්ථික සංවර්ධනය	• SME මූල්‍යකරණය • කුසලතා සංවර්ධනය • ආරක්ෂිත සේවා ස්ථාන	8.3, 8.5, 8.8 - ඵලදායී රැකියා සහ කම්කරු ප්‍රමිතීන්	● ●
	කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම්	• ඩිජිටල් මූල්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම • BOC ගම්මාන • තාක්ෂණය මත පදනම් වූ සේවා • තිරසාර මූල්‍යකරණය	9.1, 9.5 - ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතු යටිතල පහසුකම් සහ නවෝත්පාදනය	● ●
	අවම කල අසමානාත්මතා	• ඩිජිටල් ප්‍රවේශය වැඩිදියුණු කිරීමේ මූලපිරීම් • අඩු සේවා ලබන ජන කොටස් සඳහා ඇතුළත් බැංකුකරණය • කාන්තා ව්‍යවසායකයින් වෙත ප්‍රවේශය වැඩි කිරීම	10.2, 10.3 - සමාජ හා ආර්ථික ඇතුළත්කරණය	● ●

තිරසාරත්වය සමඟ සංයෝජනය

	අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක	ප්‍රධාන මූලපිරීම්	අදාළ තිරසාර සංවර්ධන අරමුණු	දායකත්වයේ ස්වභාවය
	තිරසාර නගර සහ ප්‍රජාවන්	• හරිත ගොඩනැගිලි • ප්‍රජා සංවර්ධන මූලපිරීම් • විපත් වලට ඔරොත්තු දීමේ හැකියාව සඳහා සහාය • විපත් වලට ඔරොත්තු දීමේ හැකියාව සඳහා වැඩසටහන් සමඟ හවුල්ව ක්‍රියා කිරීම	11.3, 11.5 - ඇතුළත් ප්‍රජාවන් සහ ඔරෝත්තු දීමේ හැකියාව	● ●
	වගකීම් සහගත යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය	• සම්පත් කාර්යක්ෂමතා මූලපිරීම් • අපද්‍රව්‍ය අවම කිරීම • පෙව හායනික කාඩ්පත්	12.2, 12.5, 12.6 - සම්පත් කාර්යක්ෂමතාව සහ අපද්‍රව්‍ය අඩු කිරීම	● ●
	දේශගුණික ක්‍රියාමාර්ග	• මෙහෙයුම් විමෝචන අඩු කිරීමේ මූලපිරීම් • දේශගුණික අවදානම් ඒකාබද්ධ කිරීම • මූල්‍යකරණ විමෝචන මැනීම සඳහා සූදානම (PCAF සමඟ අනුකූලව)	13.2, 13.3 - දේශගුණය ඒකාබද්ධ කිරීම සහ අවබෝධය	● ● ●
	ජලය තුළ ජීවය	• වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් • සාගර සංරක්ෂණ හවුල්කාරිත්වයන් සහ අවබෝධතා මූලපිරීම්	14.1 - සාගර දූෂණය අඩු කිරීම	●
	ගොඩබිම මත ජීවය	• පෙව විවිධත්ව සංරක්ෂණ මූලපිරීම් • වෘක්ෂ රෝපණය • පරිසර පද්ධති ආරක්ෂාව	15.1, 15.5 - පරිසර පද්ධති සංරක්ෂණය	●
	සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන	• සදාචාරාත්මක බැංකුකරණ ක්‍රියාපටිපාටි • යහපාලන රාමුව • විනිවිදභාවය සහ අනාවරණය	16.5, 16.6 - වගවීම සහ ආයතන	●
	තිරසාර සංවර්ධනය සඳහා පාර්ශ්වකරණයන්	• නියාමකයන්, රජයේ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන (NGO), කර්මාන්ත සංවිධාන සහ සංවර්ධන හවුල්කරුවන් සමඟ සහයෝගීතාවය	17.16, 17.17 - බහු පාර්ශ්වකරුවන්ගේ හවුල්කාරිත්වයන්	● ●

පැහැදිලි කිරීම – දායකත්වයේ ස්වභාවය ● මෙහෙයුම් ● මූල්‍යකරණ ● යහපාලන

SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම්

SLFRS S1 සහ S2 ක්‍රියාත්මක කිරීමේ ලංකා බැංකුවේ ගමන් මග



2025 වර්ෂයේදී ලංකා බැංකුව ස්වේච්ඡාවෙන් SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීමේ ප්‍රමිතීන් සමඟ අනුකූලතාවය සඳහා ක්‍රියා කළේය. ඒ අනුව SLFRS S1 තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම් සඳහා පොදු අවශ්‍යතා සහ SLFRS S2 දේශගුණය ආශ්‍රිත හෙළිදරව් කිරීම් යන ප්‍රමිතීන්ට අනුගත වීමට පියවර ගන්නා ලදී.

මෙම උත්සාහය හරහා දේශගුණය ආශ්‍රිත හෙළිදරව් කිරීම් විනිවිදභාවයෙන් යුතු සංගත හා උසස් ගුණාත්මක බවක් සහිතව ඉදිරිපත් කිරීමට බැංකුවේ කැපවීම තවදුරටත් ශක්තිමත් විය.

2025 වසර තුළ ප්‍රධාන අවධානය යොමු කරනු ලැබුවේ දේශගුණය ආශ්‍රිත අවදානම් සහ අවස්ථා හඳුනා ගැනීම, ඇගයීම සහ හෙළිදරව් කිරීම යන ක්‍රියාවලියටය. මෙය SLFRS S2 හි අවශ්‍යතා අනුව සිදු කරන ලදී.

මෙම ක්‍රියාවලියට සහාය වශයෙන් බැංකුවේ පවතින යහපාලන ව්‍යුහය, අවදානම් කළමනාකරණ පද්ධති සහ තිරසාරත්ව රාමුව භාවිතා කරමින් දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා පිළිබඳ විශ්ලේෂණ සිදු කරන ලදී.

මෙම ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමේදී බැංකුව පියවරෙන්-පියවර හා සමානුපාතික ප්‍රවේශයක් අනුගමනය කරමින් SLFRS S1 සහ S2 යටතේ ලබා දී ඇති අන්තර්කාලීන සහන (Transitional Relief) භාවිතා කරමින් දත්ත ගුණාත්මකභාවය, ක්‍රමවේද සහ අභ්‍යන්තර පද්ධති ක්‍රමයෙන් ශක්තිමත් කිරීම සිදු කරනු ලැබීය.

මෙම ප්‍රවේශයේ එක් පියවරක් ලෙස, 2025 වසරේදී ලංකා බැංකුව කාබන් ගිණුම්කරණ මූල්‍ය හවුල්කාරිත්වය (PCAF) සංවිධානයට එක්වීය. මෙමගින් ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේද භාවිතා කරමින් මූල්‍ය පහසුකම් සපයන ලද විමෝචන මැනීම සහ කළමනාකරණය කිරීම සඳහා බැංකුවේ හැකියාව වැඩි දියුණු කරයි. මෙම පියවර දේශගුණය සම්බන්ධ මිනුම් (metrics) සහ ඉලක්ක (tArgets) අනාගතයේදී තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා ශක්තිමත් පදනමක් සපයයි.

2026 වසරේදී බැංකුව දේශගුණය පමණක් නොව තිරසාරත්වයට සම්බන්ධ අනෙකුත් අවදානම් සහ අවස්ථා (SRROs) හඳුනා ගැනීම හා හෙළිදරව් කිරීම ද ක්‍රමයෙන් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

2027 වසර සිට බැංකුව Scope 3 මට්ටමට අයත් මූල්‍යකරණය කරන ලද විමෝචන අනාවරණය ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර, එමගින් SLFRS S2 යටතේ දේශගුණය සම්බන්ධ අනාවරණ වල සම්පූර්ණත්වය සහ සංගතතාවය තවදුරටත් වැඩි දියුණු කරනු ඇත.

SLFRS S1 සහ S2 ප්‍රමිතීන් සංවිධානාත්මක හා පියවරෙන්-පියවර ක්‍රියාත්මක කිරීම හරහා ලංකා බැංකුව තිරසාරත්වය සහ දේශගුණය සම්බන්ධ කරුණු යහපාලන ව්‍යුහය, උපායමාර්ග, සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් තුළ ඒකාබද්ධ කරමින් දිගුකාලීන ස්ථායිතාව සහ වගකීම් සහගත බැංකු සේවාවන් ප්‍රවර්ධනය කරයි.

SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම්

EY
Shape the future with confidence

Ernst & Young
Chartered Accountants
Rotunda Towers
No. 109, Galle Road
P.O. Box 101
Colombo 03, Sri Lanka

Tel: +94 11 246 3500
Fax: +94 11 768 7869
Email: eysl@lk.ey.com
ey.com

2025 සමෝධානික වාර්ෂික වාර්තාව පිළිබඳ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පිරිනමන ස්වාධීන වෘත්තිකයන්ගේ සහතික කිරීමේ වාර්තාව

විෂය පථය

ශ්‍රී ලංකා සහතික කිරීමේ කටයුතු පිළිබඳ ප්‍රමිතිය අනුව අර්ථ දක්වා ඇති සීමිත සහතික කිරීමේ කටයුත්තක් (Limited Assuarance Engagement) සිදු කිරීම සඳහා ලංකා බැංකුව විසින් අපව නියුක්ත කර ඇත. මෙම සේවා කටයුත්ත තුළ, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ලංකා බැංකුව හි සමෝධානික වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම් (මෙතැන් සිට විෂය කරුණු ලෙස සඳහන් වේ) පිළිබඳව වාර්තා කිරීම අපගේ වගකීම වේ.

ඉහත ඡේදයේ සඳහන් කර ඇති සේවා කටයුත්තේ විෂය පථයට අමතරව, වාර්තාව තුළ ඇතුළත් අනෙකුත් තොරතුරු පිළිබඳ අප විසින් සහතික කිරීමේ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කර නොමැත. ඒ අනුව, එම තොරතුරු සම්බන්ධයෙන් අප විසින් කිසිදු නිගමනයක් ප්‍රකාශ නොකරමු.

ලංකා බැංකුව විසින් යොදාගත් නිර්ණායක

විෂය කරුණු සකස් කිරීමේදී ලංකා බැංකුව විසින් ශ්‍රී ලංකා තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම් යටතේ වන SLFRS S1 – තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම සඳහා පොදු අවශ්‍යතා සහ SLFRS S2 – දේශගුණය ආශ්‍රිත හෙළිදරව් කිරීම් (මෙතැන් සිට නිර්ණායක ලෙස සඳහන් වේ) යොදා ගන්නා ලදී.

මෙම නිර්ණායක විශේෂයෙන් සැලසුම් කර ඇත්තේ දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා පිළිබඳ සැලකිය යුතු තොරතුරු හෙළිදරව් කිරීම සඳහා වන අතර, එම තොරතුරු සාමාන්‍ය අරමුණක් සඳහා සකස් කරන ලද මූල්‍ය වාර්තා භාවිතා කරන ප්‍රධාන පරිශීලකයන්ට, ආයතනය වෙත සම්පත් සැපයීම සම්බන්ධ තීරණ ගැනීමේදී ප්‍රයෝජනවත් වීම අරමුණු කරගෙන ඇත.

ඒ අනුව, මෙම විෂය කරුණු සම්බන්ධ තොරතුරු වෙනත් අරමුණක් සඳහා සුදුසු නොවිය හැක.

ලංකා බැංකුවේ වගකීම්

විෂය කරුණු සකස් කිරීම සඳහා යොදාගන්නා නිර්ණායක තෝරා ගැනීම සහ එම නිර්ණායක අනුව, සියලු සැලකිය යුතු කරුණු සම්බන්ධයෙන් විෂය කරුණු නිවැරදිව ඉදිරිපත් කිරීම සඳහා ලංකා බැංකුවේ කළමනාකරණය වගකීම දරයි.

මෙම වගකීමට අභ්‍යන්තර යහපාලන පද්ධති ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම, ප්‍රමාණවත් වාර්තා පවත්වාගෙන යාම, සහ විෂය කරුණු සකස් කිරීම සඳහා අදාළ ඇස්තමේන්තු සිදු කිරීම ඇතුළත් වේ. එමඟින්, වංචාව හෝ දෝෂ හේතුවෙන් ඇති විය හැකි සැලකිය යුතු වැරදි ප්‍රකාශයන්ගෙන් තොරව විෂය කරුණු සකස් කර ඇති බව සහතික කිරීම අරමුණ වේ.

අර්නස්ට් ඇන්ඩ් යන්ග්හි වගකීම්

අපගේ වගකීම වන්නේ ලබාගත් සාක්ෂි මත පදනම්ව විෂය කරුණු ඉදිරිපත් කිරීම පිළිබඳ නිගමනයක් ප්‍රකාශ කිරීමයි.

අප මෙම සේවා කටයුත්ත ශ්‍රී ලංකා සහතික කිරීමේ කටයුතු පිළිබඳ ප්‍රමිතිය වන චෙතිහාසික මූල්‍ය තොරතුරු විගණන හෝ සමාලෝචන හැර අනෙකුත් සහතික කිරීමේ කටයුතු වන ශ්‍රී ලංකා ප්‍රමිතිය (SLSAE 3000 සංශෝධිත) අනුව සිදු කළ අතර, 2026 මාර්තු 06 දින ලංකා බැංකුව සමඟ එකඟ වූ කොන්දේසි (Terms of Reference) පරිදි එය ක්‍රියාත්මක කරන ලදී.

මෙම ප්‍රමිතීන් අනුව, විෂය කරුණු නිර්ණායකවලට අනුකූල වීම සඳහා සැලකිය යුතු සංශෝධන අවශ්‍යද යන්න පිළිබඳව අපට දැනගැනීමට ලැබී තිබේද යන්න තීරණය කිරීම සඳහා අප සේවා කටයුත්ත සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු අතර, ඒ අනුව වාර්තාවක් නිකුත් කළ යුතුය.

තෝරාගත් ක්‍රියාපටිපාටිවල ස්වභාවය, කාලය සහ පරාසය අපගේ වෘත්තීය විනිශ්චය මත පදනම් වන අතර, එයට වංචාව හෝ දෝෂ හේතුවෙන් ඇති විය හැකි සැලකිය යුතු වැරදි ප්‍රකාශයන් පිළිබඳ අවදානම ඇගයීම ද ඇතුළත් වේ.

අප විසින් ලබාගත් සාක්ෂි මෙම සීමිත සහතික කිරීමේ නිගමනය සඳහා ප්‍රමාණවත් සහ සුදුසු පදනමක් සපයන බව අප විශ්වාස කරමු.

අපගේ ස්වාධීනත්ව සහ තත්ත්ව කළමනාකරණය අපගේ ස්වාධීනත්වය පවත්වාගෙන ගොස් ඇති බව අප තහවුරු කරන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කරන ලද වෘත්තීය ගණකාධිකාරීන් සඳහා වූ ආචාරධර්ම සංග්‍රහයේ අවශ්‍යතා අප විසින් සපුරාලා ඇති බව ද සහතික කරමු. එමෙන්ම, මෙම සහතික කිරීමේ කටයුත්ත සිදු කිරීම සඳහා අවශ්‍ය නිපුණතා සහ පළපුරුද්ද අප සතුව පවතින බවද තහවුරු කරමු.

තවද, අප විසින් තත්ත්ව කළමනාකරණ ප්‍රමිතීන් අනුගමනය කරනු ලබන අතර, එමඟින් ආචාරධර්ම අවශ්‍යතා, වෘත්තීය ප්‍රමිතීන් සහ අදාළ නීතිමය හා නියාමන අවශ්‍යතා පිළිපැදීම සම්බන්ධ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ඇතුළත් තත්ත්ව කළමනාකරණ පද්ධතියක් සැලසුම් කර, ක්‍රියාත්මක කර සහ පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

සිදු කළ ක්‍රියාපටිපාටි පිළිබඳ විස්තරය

සීමිත සහතික කිරීමේ කටයුත්තක් තුළ සිදු කරන ක්‍රියාපටිපාටි, සාධාරණ සහතික කිරීමේ සේවා කටයුත්තක ක්‍රියාපටිපාටිවලට සාපේක්ෂව ස්වභාවයෙන් සහ කාලයෙන් වෙනස් වන අතර, ඒවායේ පරාසයද අඩු වේ. එබැවින්, සීමිත සහතික කිරීමේ කටයුත්තකින් ලබාගන්නා සහතික මට්ටම, සාධාරණ සහතික කිරීමේ සේවා කටයුත්තක් සිදු කළහොත් ලබාගත හැකි සහතික මට්ටමට වඩා සැලකිය යුතු ලෙස අඩු වේ.

Partners: D K Hulangamuwa FCA FCMA LLB (London), A P A Gunasekera FCA FCMA, Ms. Y A De Silva FCA, Ms. G G S Manatunga FCA, W K B S P Fernando FCA FCMA FCCA, B E Wijesuriya FCA FCMA, R N de Saram ACA FCMA, N M Sulaiman FCA FCMA, Ms. L K H L Fonseka FCA, Ms. P V K N Sajeewani FCA, A A J R Perera FCA ACMA, N Y R L Fernando ACA, D N Gamage ACA ACMA, C A Yalagala ACA ACMA, Ms. P S Paranavitane ACA ACMA LLB (Colombo), B Vasanthan ACA, ACMA, W D P L Perera ACA

Principals: T P M Ruberu FCMA FCCA MBA (USJ-SL), G B Goudian ACMA, D L B Karunathilaka ACMA, W S J De Silva Bsc (Hons) - MIS Msc - IT, V Shakthivel B.Com (Sp), M U M Mansoor ACA

A member firm of Ernst & Young Global Limited

EY
Shape the future with confidence

අප විසින් සිදු කළ ක්‍රියාපටිපාටි සැලසුම් කර ඇත්තේ සීමිත මට්ටමේ සහතිකයක් ලබා ගැනීම සඳහා වන අතර, ඒ මත පදනම්ව අපගේ නිගමනය ප්‍රකාශ කිරීමට ය. එබැවින්, සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා අවශ්‍ය වන සියලුම සාක්ෂි මෙම ක්‍රියාපටිපාටි මගින් ලබා දෙන බව නොසලකයි.

අපගේ ක්‍රියාපටිපාටිවල ස්වභාවය සහ පරාසය තීරණය කිරීමේදී කළමනාකරණයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදවල කාර්යක්ෂමතාව අප විසින් සලකා බැලුවද, මෙම සහතික කිරීමේ කටයුත්ත අභ්‍යන්තර පාලන පිළිබඳ සහතිකයක් ලබාදීම සඳහා සැලසුම් කර නොමැත. එබැවින්, අභ්‍යන්තර පාලන පරීක්ෂා කිරීම හෝ තොරතුරු තාක්ෂණ පද්ධති තුළ දත්ත එකතුවීම හෝ ගණනය කිරීම සම්බන්ධ ක්‍රියාපටිපාටි සිදු කර නොමැත. අප විසින් සිදු කළ ක්‍රියාපටිපාටි සැලසුම් කර ඇත්තේ සීමිත මට්ටමේ සහතිකයක් ලබා ගැනීම සඳහා වන අතර, ඒ මත පදනම්ව අපගේ නිගමනය ප්‍රකාශ කිරීමටය. එබැවින්, සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා අවශ්‍ය වන සියලුම සාක්ෂි මෙම ක්‍රියාපටිපාටි මගින් ලබා දෙන බව නොසලකයි.

සීමිත සහතික කිරීමේ කටයුත්තකදී සාමාන්‍යයෙන් සිදු කරනු ලබන්නේ ප්‍රධාන වශයෙන් විෂය කරුණු සකස් කිරීමට වගකිව යුතු පුද්ගලයන්ගෙන් විමසීම් සිදු කිරීම සහ ඒ සම්බන්ධ විශ්ලේෂණාත්මක හා අනෙකුත් සුදුසු ක්‍රියාපටිපාටි යොදා ගැනීමයි.

අප විසින් සිදු කළ ක්‍රියාපටිපාටිය තුළ:

- බැංකුවේ ව්‍යාපාර ක්‍රියාකාරකම්, අගය දාමය සහ තිරසාර වාර්තාකරණ ක්‍රියාවලිය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා තෝරාගත් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සහ අදාළ කාර්ය මණ්ඩලය සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම.
- දත්ත පිළිබඳ විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි සිදු කර, හඳුනාගත් සැලකිය යුතු වෙනස්කම් සඳහා කළමනාකරණයෙන් පැහැදිලි කිරීම ලබා ගැනීම.
- SLFRS S1 හි සංකල්පමය පදනම සම්බන්ධයෙන් සමාගමේ අනාවරණ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා ක්‍රියාපටිපාටි සිදු කිරීම, නිසි ඉදිරිපත් කිරීම, ප්‍රමාණාත්මකභාවය, වාර්තාකරණ ආයතනය සහ සම්බන්ධිත තොරතුරු ඇතුළත් වේ.
- දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා නිරීක්ෂණය කිරීම, කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා බැංකුව විසින් භාවිතා කරන යහපාලන ක්‍රියාවලීන්, පාලන ක්‍රමවේදී සහ ක්‍රියාපටිපාටි පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා අදාළ සාක්ෂි සමඟ ක්‍රියාපටිපාටි සිදු කිරීම.
- යහපාලන සම්බන්ධ අනාවරණවල අන්තර්ගතය සමඟ සමානතාව තහවුරු කිරීම සඳහා වාර්තාකරණ වර්ෂය තුළ පැවැති අධ්‍යක්ෂ මණ්ඩල සහ විගණන කමිටු රැස්වීම්වල මිනිත්තු සමාලෝචනය කිරීම.
- හඳුනාගත් දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා කළමනාකරණය කිරීම සඳහා බැංකුවේ උපායමාර්ගය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා අදාළ සාක්ෂි සහ ගණනය කිරීම් සමඟ ක්‍රියාපටිපාටි සිදු කිරීම.
- දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා හඳුනාගැනීම, ඇගයීම, ප්‍රමුඛතාව ලබාදීම සහ නිරීක්ෂණය කිරීම සඳහා බැංකුව භාවිතා කරන ක්‍රියාවලීන් පිළිබඳ පැහැදිලි කිරීම සහ අදාළ සාක්ෂි ලබා ගැනීම සඳහා විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි සිදු කිරීම, එම ක්‍රියාවලීන් සමස්ත අවදානම් කළමනාකරණ රාමුව තුළ ඇතුළත් කර ඇති ආකාරයද සලකා බැලීම.
- හඳුනාගත් දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා සම්බන්ධයෙන් බැංකුවේ කාර්යසාධනය ඇගයීම සඳහා, ඒ සම්බන්ධ පැහැදිලි කිරීම සහ සාක්ෂි ලබා ගැනීමට විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි සිදු කිරීම, සහ සමාගම විසින් නියම කර ඇති ඉලක්කවලට අදාළ ප්‍රගතියද සලකා බැලීම.
- බැංකුවේ තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම් සකස් කිරීමේ ක්‍රියාවලිය තුළ භාවිතා කර ඇති විනිශ්චයන් සහ අවිනිශ්චිතතා සම්බන්ධ අනාවරණ ඇගයීම සඳහා ක්‍රියාපටිපාටි සිදු කිරීම වේ.

එසේම, පවතින තත්ත්වයන් අනුව අවශ්‍ය බව සලකා බලන ලද අනෙකුත් ක්‍රියාපටිපාටි ද අප විසින් සිදු කරන ලදී.

අවධාරණ කාර්යය

ආර්ථික, පාරිසරික, සමාජීය සහ බුද්ධිමය ප්‍රාග්ධන කළමනාකරණයට අදාළ දත්ත/තොරතුරු, එවැනි දත්ත තීරණය කිරීම, ගණනය කිරීම සහ ඇස්තමේන්තු කිරීම සඳහා භාවිතා කරන ක්‍රමවේදවල ස්වභාවය හේතුවෙන් ඒවා අභ්‍යන්තර සීමාවන්ට යටත් වේ. මෙවැනි සීමාවන් ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් දක්නට ලැබෙන කරුණු වේ.

එමෙන්ම, ආයතනයේ වාර්ෂික වාර්තාව තුළ ඉදිරිපත් කර ඇති අනාගතයට සම්බන්ධ තොරතුරු සම්බන්ධයෙන් භාවිතා කරන උපකල්පන හෝ ඒවා සාර්ථකව ඉටු කරගත හැකි බව පිළිබඳව අප විසින් කිසිදු සහතිකයක් ලබා නොදේ.

නිගමනය

අප විසින් සිදු කළ ක්‍රියාපටිපාටි සහ ලබාගත් සාක්ෂි මත පදනම්ව, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා බැංකුවේ සමෝධානික වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් කර ඇති තොරතුරු, යොදාගත් නිර්ණායක වලට අනුකූල වීම සඳහා සැලකිය යුතු සංශෝධන අවශ්‍ය බවට අපට දැනගැනීමට ලැබී ඇති කිසිදු කරුණක් නොමැත.

සීමිත භාවිතය

මෙම වාර්තාව, යොදාගත් නිර්ණායක අනුව විෂය කරුණු පිළිබඳ සහතික නිගමනයක් ලබාදීම සඳහා ලංකා බැංකුවේ භාවිතය සඳහා පමණක් සකස් කර ඇත. එබැවින්, මෙය මෙහි සඳහන් පාර්ශ්වයන්ට අමතර වෙනත් කිසිදු පාර්ශ්වයක් විසින් භාවිතා කිරීම සඳහා අදහස් කර නොමැති අතර, එසේ භාවිතා නොකළ යුතුය.

Ernst + Young

2026 මාර්තු 27
කොළඹ දී ය.

SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම්

SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම්

වාර්තාව සකස් කිරීමේ පදනම

1. වාර්තා කිරීමේ ආයතනය, සංවිධානාත්මක සීමාව සහ වටිනාකම් දාමය

මෙම තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම් 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වාර්ෂික කාලය සඳහා සකස් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල භාවිතා කළ සංවිධානික සීමාවට අනුකූලව, ලංකා බැංකුව (ලංකා බැංකුව හෝ බැංකුව) සහ එහි අනුබද්ධ සමාගම් (ඒකාබද්ධ කර 'සමූහය' ලෙස හැඳින්වේ) සඳහා සකස් කර ඇත.

මෙම හෙළිදරව් කිරීම් මගින් බැංකුව සහ එහි අනුබද්ධ සමාගම් විසින් සිදුකරන දේශීය සහ විදේශීය මෙහෙයුම් පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ලබාදෙන අතර, ශාඛා බැංකුකරණය, ආයතනික බැංකුකරණය සහ භාණ්ඩාගාර මෙහෙයුම්, ආයෝජන කටයුතු සහ ඒවාට සහාය වන කාර්යයන් ඇතුළුව බැංකුවේ ප්‍රධාන බැංකු මෙහෙයුම් ආවරණය කරයි.

වටිනාකම් දාමය

SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම් සකස් කිරීමේදී, දේශගුණය ආශ්‍රිත අවදානම් සහ අවස්ථාවන් හඳුනාගැනීමට සහ තක්සේරු කිරීමට බැංකුව විසින් වටිනාකම් දාමය සලකා බලා ඇත. මූල්‍ය අතරමැදියෙකු ලෙස බැංකුව ඉටු කරන භූමිකාව සලකා බලන විට, තිරසාරත්වයට සම්බන්ධ බලපෑම් ප්‍රධාන වශයෙන් තැන්පතු භාර ගැනීම, අරමුදල් රැස් කිරීම, ණය ලබාදීම, ආයෝජන කටයුතු සහ භාණ්ඩාගාර මෙහෙයුම් හරහා මෙන්ම බැංකුවේ මෙහෙයුම් ක්‍රියාකාරකම් හරහාද ඇති වේ. බැංකුවේ වටිනාකම් දාමය ප්‍රධාන සංරචක තුනක් යටතේ ව්‍යුහගත කර ඇත.

යෙදවුම් සහ සහායක ක්‍රියාකාරකම්

බැංකුවේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා සහාය වන සම්පත් සහ සම්බන්ධතා

- අරමුදල් සපයන්නන් සහ තැන්පතුකරුවන්
- තාක්ෂණ හා ඩිජිටල් සේවා සපයන්නන්
- දේපළ සහ යටිතල පහසුකම් සේවා
- බාහිරකරණය කරන ලද සේවා සපයන්නන් සහ වෘත්තීය සේවා සපයන්නන්
- නියාමන සහ අධීක්ෂණ අධිකාරීන්

ඉදිරි සැපයුම් දාමය

ප්‍රධාන බැංකු මෙහෙයුම් ක්‍රියාකාරකම්

දේශීය සහ විදේශීය බැංකු මෙහෙයුම් සහ ඒවාට සහාය වන කාර්යයන්

- තැන්පතු ආකර්ෂණය
- පුද්ගලයන්, MSME සහ ආයතන සඳහා ණය ලබාදීම
- භාණ්ඩාගාර සහ ආයෝජන මෙහෙයුම්
- වෙළඳ මූල්‍ය සේවා සහ විදේශ විනිමය සේවා
- ශාඛා සහ ඩිජිටල් බැංකු මෙහෙයුම්
- අවදානම් කළමනාකරණය, අනුකූලතාව, යහපාලනය, සහ අනෙකුත් සහායක කාර්යයන්

පසු සැපයුම් දාමය

මූල්‍ය හා ආර්ථික බලපෑම්

බැංකුවේ මූල්‍යකරණය සැපයීම සහ ආයෝජන ක්‍රියාකාරකම් හරහා බලපෑමට ලක්වන ගනුදෙනුකරුවන්, ප්‍රතිපාර්ශ්වකරුවන් සහ ආර්ථික ක්‍රියාකාරකම්.

- ණය හිමියන් සහ මූල්‍ය ආයතන
- ශාඛා බැංකුකරණ සහ SME ගනුදෙනුකරුවන්
- ආයතනික සහ සංස්ථාගත ගනුදෙනුකරුවන්
- රාජ්‍ය මූල්‍ය සැපයීම
- ආයෝජන ප්‍රතිපාර්ශ්වකරුවන්

2. ප්‍රමාණාත්මකභාවයේ පදනම

බැංකුව SLFRS S1 ප්‍රමිතීන්ට අනුකූලව, තිරසාරත්වයට සම්බන්ධ අවදානම් සහ අවස්ථා හඳුනා ගැනීමේදී ප්‍රධාන වශයෙන්ම මූල්‍ය ප්‍රමාණාත්මකභාවය පදනම් කරගත් ප්‍රවේශයක් භාවිතා කරයි. තොරතුරු මඟ හැරීම, වැරදි ලෙස සඳහන් කිරීම හෝ සැඟවීම, මූල්‍ය වාර්තාවල ප්‍රාථමික පරිශීලකයින්ගේ තීරණ වලට බලපෑම් කිරීම සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම්, එය ප්‍රමාණාත්මකව වැදගත් වේ. තිරසාරභාවය හා සම්බන්ධ අවදානම් සහ අවස්ථා කෙටි, මධ්‍යම හෝ දිගුකාලීනව පහත සඳහන් අංශ කෙරෙහි බලපානු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම් ප්‍රමාණාත්මක ලෙස සැලකේ;







ප්‍රමාණාත්මක මිනුම් මත පදනම් වූ ප්‍රමාණාත්මකභාවය

බැංකුව ප්‍රමාණාත්මක මිනුම් මත පදනම් වූ ප්‍රමාණාත්මක බව තීරණය කිරීමට බදු පසු ලාභය (PBT) පදනම් කර ගනී.

එලෙසම ගණනය කිරීමේ පදනම ලෙස බදු පසු ලාභයෙන් 1% ක ප්‍රමාණයක් යොදා ගනු ලබන අතර එය අභ්‍යන්තර මූල්‍ය අවධානම් තක්සේරුකරණ පිළිවෙත් සමග අනුරූප වන ලෙස පෙලගස්වා ඇත. එමෙන්ම මෙම පදනම ප්‍රාග්ධන සැලසුම්කරණය, මූල්‍ය ඉපැයීම් කාර්යසාධනය හා මූල්‍ය ඔරොත්තුදීමේ හැකියාව පිළිබඳ ආයෝජක තක්සේරුව යන කරුණු මත බලපෑමක් ඇති කල හැකි මට්ටමක් ලෙස ද හඳුනාගත හැක.

ඉහළ ඇස්තමේන්තුගත බලපෑම - PBT හි 1% ඉක්මවන විට

මධ්‍යම බලපෑම - PBT හි 0.6% සිට 1% දක්වා පරාසයක පවතින විට

අඩු බලපෑම - PBT හි 0% සිට 0.5% දක්වා පරාසයක පවතින විට

මෙම ප්‍රවේශය, තිරසාරභාවය ආශ්‍රිත අවදානම් හඳුනාගැනීම සහ බැංකුවේ පුළුල් ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුව අතර අනුකූලතාව සහතික කරයි.

ගුණාත්මක මිනුම් මත පදනම් වූ ප්‍රමාණාත්මකභාවය

මූල්‍ය සීමාවන්ට අමතරව, දේශගුණික අවදානම් සහ අවස්ථාවන් ගුණාත්මක නිර්ණායකයන්ට අනුව තක්සේරු කරනු ලැබේ.

උපායමාර්ගික අනුගතවීම

දිගුකාලීන උපායමාර්ගය සහ අගය නිර්මාණය කිරීමේ අරමුණු සමඟ ඇති සම්බන්ධතාවය.

කීර්තිනාමයට බලපෑම

පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය, සන්නාම අගය සහ වෙළඳපොළ ස්ථානගත වීම කෙරෙහි ඇතිවිය හැකි බලපෑම.

නියාමන සහ ප්‍රතිපත්ති අනුකූලතාව

නියාමන, අධීක්ෂණ හෝ නීතිමය කටයුතු මගින් සිදුවිය හැකි බලපෑම.

පාර්ශ්වකරුවන්ගේ සංවේදී ප්‍රතිචාර

පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන්, නිරීක්ෂණ හා අතති මට්ටම්.

ප්‍රමාණාත්මක තක්සේරු කිරීම් බැංකුවේ ව්‍යවසාය අවදානම් කළමනාකර (ERM) රාමුවට ඒකාබද්ධ කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (IRMC) අධීක්ෂණයට යටත් වේ.

3. ක්‍රියාකාරී මුදල් ඒකකය

තිරසාරභාවයට අදාළ සියලුම මූල්‍ය තොරතුරු සහ හෙළිදරව් කිරීම් බැංකුවේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකයට අනුකූලව ශ්‍රී ලංකා රුපියල් වලින් (LKR) ඉදිරිපත් කර ඇත.

4. මග පෙන්වන මූලාශ්‍ර

මෙම තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත. විශේෂයෙන්, බැංකුව විසින් SLFRS S1 - තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් සඳහා පොදු අවශ්‍යතා සහ SLFRS S2 - දේශගුණය ආශ්‍රිත හෙළිදරව් කිරීම් යන ප්‍රමිතීන් අදාළ කරගෙන ඇත.

මෙම ප්‍රමිතීන් සඳහා අනුගත වීමේ දී, බැංකුව වාණිජ බැංකු සඳහා වන SASB ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් තීරණය කළ දායකත්වයන් (NDC 3.0) සහ ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයට අදාළ නියාමන මාර්ගෝපදේශ ද සලකා බැලීය. එමගින් හෙළිදරව් කිරීම් ක්ෂේත්‍රයේ ක්‍රියාපටිපාටි, ජාතික දේශගුණ ප්‍රමුඛතා සහ අධීක්ෂණ අපේක්ෂාවන් සමඟ අනුකූල වන ලෙස සකස් කර ඇති බව සහතික කරයි.

ප්‍රධාන වශයෙන් යොදාගත් ප්‍රමිතීන්		අතිරේක ලෙස යොදාගත් මාර්ගෝපදේශ		
SLFRS S1 තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් සඳහා පොදු අවශ්‍යතා	SLFRS S2 – දේශගුණය ආශ්‍රිත හෙළිදරව් කිරීම්	SASB ප්‍රමිතිය – වාණිජ බැංකු	ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් තීරණය කළ දායකත්වයන් (NDC 3.0)	ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රයට අදාළ නියාමන මාර්ගෝපදේශ

5. වාර්තා කිරීමේ කාලය

මෙම තිරසාරභාවයට අදාළ මූල්‍ය හෙළිදරව් කිරීම් 2025 ජනවාරි 1 සිට 2025 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය වර්ෂය ආවරණය කරන අතර බැංකුවේ වාර්ෂික වාර්තාවේ සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල වාර්තාකරණ කාල සීමාව සමඟ පෙළගස්වා ඇත.

6.කාල පරාසය

දේශගුණය ආශ්‍රිත අවදානම් සහ අවස්ථා තක්සේරු කිරීමේදී, විභව මූල්‍ය සහ මෙහෙයුම් බලපෑම්වල ව්‍යුහාත්මක ඇගයීමට සහාය වීම සඳහා බැංකුව විසින් නිශ්චිත කාල සීමාවන් යොදනු ලැබේ. මෙම කාල සීමාවන් බැංකුවේ උපායමාර්ගික සැලසුම් චක්‍ර, ප්‍රාග්ධන සැලසුම් රාමුව, ණය කළඹ ඇගයීම් කාලපරිච්ඡේද සහ දිගුකාලීන ව්‍යාපාරික දැක්ම සමඟ පෙළගස්වා ඇත. මෙම නිශ්චිත කාල රාමු, යහපාලන, උපායමාර්ග සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් පුරා දේශගුණය ආශ්‍රිත අවදානම් සහ අවස්ථා අඛණ්ඩව හඳුනා ගැනීමට, තක්සේරු කිරීමට සහ හෙළිදරව් කිරීමට සහාය වේ.

කාල පරාසය	අර්ථ දැක්වීම	අවුරුදු
කෙටිකාලීන	→ අවුරුදු 1 – 2	→ 2025 – 2026
මධ්‍යකාලීන	→ අවුරුදු 3 – 5	→ 2027 – 2029
දිගුකාලීන	→ අවුරුදු 5 ට වැඩි	→ 2030 සහ ඉදිරියට

7. සම්බන්ධිත තොරතුරු

SLFRS S1 ට අනුකූලව, තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම් යහපාලන ව්‍යුහයන්, උපායමාර්ග, අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් සහ මූල්‍ය වාර්තාකරණය සමඟ පැහැදිලි සම්බන්ධතාවයක් පිළිබිඹු කරන ආකාරයෙන් ඉදිරිපත් කිරීම සහතික කිරීමට උත්සාහ කර ඇත.

SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම්

බැංකුවේ පවතින යහපාලන රාමුව තුළ, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (IRMC) අධීක්ෂණය සහ ස්ථාපිත ව්‍යවසාය අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් හරහා දේශගුණික අවදානම් සහ අවස්ථාවන් සලකා බලා ඇත.

හඳුනාගත් දේශගුණික අවදානම්, බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා, ප්‍රාග්ධන සැලසුම් සලකා බැලීම් සහ සමස්ත අවදානම් පැතිකඩ අතර සම්බන්ධතාවය පෙන්නුම් කිරීම සඳහා මූල්‍ය හෙළිදරව් කිරීම් සකස් කර ඇත.

ඒකාබද්ධ අවබෝධය සහ විනිවිදභාවය තහවුරු කිරීම සඳහා අදාළ අවස්ථාවන්හිදී, ආයතනික යහපාලන වාර්තාව, අවදානම් කළමනාකරණ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ඇතුළු වාර්ෂික වාර්තාවේ අනෙකුත් පරිච්ඡේද වෙත යොමු කිරීම් සපයනු ලැබේ .

8. අන්තර්කාලීන සහන

වාර්තා කරන කාල සීමාව සඳහා තිරසාරභාවය සහ දේශගුණය ආශ්‍රිත හෙළිදරව් කිරීම් සකස් කිරීමේදී, ආරම්භක සම්මත කිරීමේ කාල සීමාව තුළ ප්‍රමිතීන් අදියර වශයෙන් සහ ව්‍යුහගතව ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම සඳහා බැංකුව SLFRS S1 සහ SLFRS S2 යටතේ අවසර දී ඇති වාර්තා කරන සහන විධිවිධාන යොදාගෙන ඇත.

පළමු වසර තුළ බැංකුවේ ප්‍රවේශය යහපාලන අධීක්ෂණය, අවදානම් හඳුනාගැනීමේ ක්‍රියාවලීන්, අනාවරණය කිරීමේ යහපාලනයන් ස්ථාපිත කිරීම සඳහා ප්‍රමුඛත්වය දී ඇත. එමෙන්ම, අදාළ වාර්තාකරණ සහන කාල පරිච්ඡේද තුළ ප්‍රමාණාත්මක සහ විශ්ලේෂණාත්මක ලෙස තොරතුරු වාර්තා කිරීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට බලාපොරොත්තු වේ.

අදියරගත විෂය පථය වල තිරසාරභාවය ආශ්‍රිත හෙළිදරව් කිරීම්

දේශගුණය කේන්ද්‍ර කරගත් ආරම්භක හෙළිදරව් කිරීමේ කටයුතු

පළමු වරට මෙම මූල්‍ය හෙළිදරව් කිරීම් සැකසීමේදී දේශගුණික අවදානම් සහ අවස්ථාවන් පමණක් සැලකිල්ලට ගනු ලබන අතර තිරසාරත්වයට අදාල අවදානම් හා අවස්ථා මෙහිදී හෙළිදරව් කිරීම සිදු නොකරයි.

මෙම ප්‍රවේශය SLFRS S1 සහ SLFRS S2 ක්‍රියාත්මක කිරීමේ මූලික පියවරක් ලෙස දේශගුණය සම්බන්ධ කරුණු පිළිබඳ යහපාලනය, අවදානම් ඇගයීම සහ වාර්තාකරණ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම බැංකුව විසින් ප්‍රමුඛත්වයට පත් කර ඇති බව පිළිබිඹු කරයි. දේශගුණය ඉක්මවා යන තිරසාරත්වයට සම්බන්ධ පුළුල් අනාවරණ මීළඟ වාර්තාකරණ කාලසීමාවේ සිට (මූල්‍ය වර්ෂ 2026) ක්‍රමයෙන් ඇතුළත් කිරීමට අපේක්ෂා කරයි.

සංසන්දනාත්මක තොරතුරු

SLFRS S1 සහ SLFRS S2 යටතේ බැංකුව වාර්තාකරණය සිදුකරන පළමු වසර මෙය වන බැවින්, පෙර කාලසීමාවන් සඳහා තිරසාරත්වයට සම්බන්ධ සහ දේශගුණය සම්බන්ධ හෙළිදරව් කිරීම් සඳහා අදාළ සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර නොමැත.

සංසන්දනාත්මක තොරතුරු, මීළඟ වාර්තාකරණ කාලසීමාව (මූල්‍ය වර්ෂ 2026) සිට ඇතුලත් කරයි.

අපේක්ෂිත මූල්‍ය බලපෑම්

බැංකුවේ ණය ලබාදීම සහ ආයෝජන ක්‍රියාකාරකම්වලින් උත්පන්න වන මූල්‍ය විමෝචන ද ඇතුළුව විෂය පථ (Scope) 3 හරිතාගාර වායු (GHG) විමෝචන SLFRS S2 යටතේ අදාළ අන්තර්කාලීන සහන විධිවිධාන අනුව, මෙම වාර්තාකරණ කාලසීමාව සඳහා අනාවරණය කර නොමැත.

Scope 3 විමෝචන, විශ්වාසනීය ලෙස ගණනය කිරීම සහ වාර්තා කිරීම සඳහා අවශ්‍ය වන දත්ත රැස් කිරීම, මිනුම් ක්‍රමවේද සහ අභ්‍යන්තර පද්ධති ශක්තිමත් කිරීමේ ක්‍රියාවලිය බැංකුව විසින් ක්‍රියාත්මක කරමින් පවතී.

මෙම හෙළිදරව් කිරීම්, අදාළ අන්තර්කාලීන සහන කාලසීමාව තුළ ක්‍රමයෙන් ඇතුළත් කිරීමට අපේක්ෂා කරන අතර, මූල්‍ය වර්ෂ 2027 වන විට පූර්ණ හෙළිදරව් කිරීම් සිදු කිරීම අපේක්ෂා කෙරේ.

Scope 3 හරිතාගාර (GHG) විමෝචන

බැංකුවේ ණය ලබාදීම සහ ආයෝජන ක්‍රියාකාරකම් වලින් උත්පන්න වන මූල්‍ය විමෝචන ද ඇතුළුව Scope 3 හරිතාගාර වායු (GHG) විමෝචන SLFRS S2 යටතේ අදාළ අන්තර්කාලීන සහන විධිවිධාන අනුව, මෙම වාර්තාකරණ කාලසීමාව සඳහා අනාවරණය කර නොමැත.

Scope 3 විමෝචන, විශ්වාසනීය ලෙස ගණනය කිරීම සහ වාර්තා කිරීම සඳහා අවශ්‍ය වන දත්ත රැස් කිරීම, මිනුම් ක්‍රමවේද සහ අභ්‍යන්තර පද්ධති ශක්තිමත් කිරීමේ ක්‍රියාවලිය බැංකුව විසින් ක්‍රියාත්මක කරමින් පවතී.

මෙම හෙළිදරව් කිරීම්, අදාළ අන්තර්කාලීන සහන කාලසීමාව තුළ ක්‍රමයෙන් ඇතුළත් කිරීමට අපේක්ෂා කරන අතර, මූල්‍ය වර්ෂ 2027 වන විට පූර්ණ හෙළිදරව් කිරීම් සිදු කිරීම අපේක්ෂා කෙරේ.

දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ සිද්ධි විශ්ලේෂණය

මෙම වාර්තාකරණ කාලසීමාව සඳහා දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ සිද්ධි විශ්ලේෂණය සම්බන්ධ හෙළිදරව් කිරීම් ඉදිරිපත් කර නොමැත. සිද්ධි විශ්ලේෂණය, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ බැංකුවේ අවදානම් පැතිකඩ කෙරෙහි ඇතිවිය හැකි බලපෑම් ඇගයීමට වැදගත් මෙවලමක් ලෙස පිළිගැනේ.

ව්‍යුහගත සිද්ධි-පදනම් ඇගයීම් සිදු කිරීමට අවශ්‍ය අභ්‍යන්තර හැකියාවන්, දත්ත ආදාන සහ විශ්ලේෂණ රාමු සංවර්ධනය කිරීම බැංකුව විසින් මේ වන විට සිදු කරමින් පවතින අතර, එම හෙළිදරව් කිරීම් පළමු වාර්තාකරණ කාලසීමාවෙන් පසු ලබා දී ඇති වසර දෙකක අන්තර්කාලීන සහන කාලසීමාව තුළ (මූල්‍ය වර්ෂ 2027) ඇතුළත් කිරීමට අපේක්ෂා කෙරේ.

9. සැලකිය යුතු විනිශ්චයන් සහ අවිනිශ්චිතතා

තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම් සකස් කිරීමේදී, විශේෂයෙන් දේශගුණය සම්බන්ධ අවදානම්වල අනාගතමය ස්වභාවය සැලකිල්ලට ගනිමින්, වෘත්තීය විනිශ්චය යොදා ගැනීම අවශ්‍ය වේ.



- ප්‍රමාණාත්මක ලෙස වැදගත් දේශගුණය සම්බන්ධයෙන් අවදානම් සහ අවස්ථා (CRROs) හඳුනාගැනීම
- සුදුසු ගුණාත්මක හෙළිදරව් කිරීම් තීරණය කිරීම
- උපායමාර්ගය සහ මූල්‍ය කාර්යසාධනය සමඟ ඇති සම්බන්ධතා ඇගයීම
- ප්‍රමාණාත්මකභාවය සඳහා සීමා මට්ටම් තෝරා ගැනීම

- අනාගත දිශානතිය සැලකිල්ලට ගත් ආර්ථික සහ දේශගුණ අනාවැකි
- දත්ත ලබාගැනීමේ සහ ක්‍රමවේදයන්හි සීමාවන්
- නියාමන සහ වෙළඳපළ වර්ධනයන්

10. සමානුපාතිකත්වයේ මූලධර්මය

කලමණාකාරිත්වය විසින් මෙම හෙළිදරව් කිරීම් සකස් කිරීමේදී, වාර්තාකරණ දිනය වන විට ලබාගත හැකි සාධාරණ සහ තහවුරු කළ හැකි තොරතුරු, අතිරේක වියදම් හෝ අනවශ්‍ය උත්සාහයක් නොදරමින් යොදාගෙන ඇත.

බැංකුව විසින් සමානුපාතිකත්වයේ මූලධර්මය අදාළ කරගෙන ඇති අතර, එමඟින් අනාවරණ ආයතනයේ ප්‍රමාණය, සංකීර්ණත්වය සහ අවදානම් පැතිකඩට අනුකූල වන අතරම, ප්‍රධාන භාවිතාකරුවන්ගේ තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් වන ලෙස ඉදිරිපත් කර ඇත.

11. අනුකූලතා ප්‍රකාශය

මෙම තිරසාරභාවය හා සම්බන්ධ මූල්‍ය හෙළිදරව් කිරීම්, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා බැංකුව සහ එහි පරිපාලිත සමාගම් (සමූහය) සඳහා තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම් පූර්ණ ලෙස යොදාගෙන ඇත.

මෙම හෙළිදරව් කිරීම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම් ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

යහපාලනය

තිරසාරත්වය සහ දේශගුණය සම්බන්ධ යහපාලනය බැංකුව තුළ ක්‍රියාත්මක වන්නේ ව්‍යුහගත සහ අදියරගත අධීක්ෂණ රාමුවක් හරහාය. මෙය නියමිත වාර්තාකරණ පිළිවෙත්, වගකීම් සහගත යාන්ත්‍රණ සහ සමස්ත ව්‍යවසාය අවදානම් කළමනාකරණ (ERM) රාමුව සමඟ ඇති ඒකාබද්ධතාවය මගින් සහාය ලබයි. දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා මුලින්ම මෙහෙයුම් මට්ටම්වලදී හඳුනාගනු ලබන අතර, එම තොරතුරු පසුව කළමනාකරණ මට්ටමේදී ඒකාබද්ධ කර සමාලෝචනය කරනු ලබයි. ඉන් අනතුරුව ඒවා අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ උපායමාර්ගික අධීක්ෂණයට යටත් වේ.

විස්තීර්ණ තිරසාරත්ව යහපාලන සහ අධීක්ෂණ රාමුවක් මගින් තිරසාරත්වයට සම්බන්ධ අවදානම් සහ අවස්ථා (SRROs) සහ දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා (CRROs) අධ්‍යක්ෂ මණ්ඩල, කළමනාකරණ සහ මෙහෙයුම් මට්ටම් හරහා යහපාලනය වන අනුක්‍රමික ව්‍යුහය පැහැදිලි කරයි. මෙම ඒකාබද්ධ ව්‍යුහය මඟින් යහපාලනය, උපායමාර්ගය, අවදානම් කළමනාකරණය, මිනුම් සහ ඉලක්ක මෙන්ම වාර්තාකරණය අතර අනුකූලතාවය SLFRS S1 සහ SLFRS S2 අනුව තහවුරු කරයි.

යහපාලනය සහ අධීක්ෂණය - ප්‍රධාන ලක්ෂණ

- IRMC හරහා අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අධීක්ෂණය සිදු කරනු ලබන අතර, එම කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්වේ.
- දේශගුණය සම්බන්ධ අවදානම් සමස්ත ව්‍යවසාය අවදානම් කළමනාකරණය සහ උපායමාර්ගික සැලසුම්කරණය සමඟ ඒකාබද්ධ කිරීම.
- තිරසාරත්ව කමිටුව හරහා විධිමත් කළමනාකරණ අධීක්ෂණය.
- මෙහෙයුම් මට්ටම්වලින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ව්‍යුහගත වාර්තාකරණය පුළුල් කිරීම.
- අදාළ KPI හරහා ආයතනික වගකීම්භාරය ශක්තිමත් කිරීම

තිරසාරත්වය සමඟ සංයෝජනය යන පරිච්ඡේදයේ තිරසාරත්ව යහපාලන සහ අධීක්ෂණ රාමුව පිළිබඳ වැඩි විස්තර සඳහා පිටු 75 - 84 වෙත යොමු වන්න.

අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය

ඉහළම මට්ටමේදී, අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවට උපායමාර්ගික දිශානතිය ලබා දෙන අතර, දිගුකාලීන වටිනාකම් නිර්මාණය, අවදානම් භාරගැනීමේ ප්‍රවණතාව සහ උපායමාර්ගික සැලසුම්කරණ ක්‍රියාවලීන් තුළ තිරසාරත්ව කරුණු ඇතුළත් කිරීම සහතික කරයි.

SRROs සහ CRROs සම්බන්ධ අධීක්ෂණය 2025 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ, අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ක්‍රියා කරන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) හරහා සිදු කරන ලදී.

තිරසාරත්ව සහ දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා පිළිබඳ කාලෝචිත අධීක්ෂණය තහවුරු කිරීම සඳහා, එම කරුණු බැංකුවේ සමස්ත ව්‍යවසාය අවදානම් කළමනාකරණය සහ අනාවරණ ක්‍රියාවලීන් සමඟ ඒකාබද්ධ කරමින් IRMC අවම වශයෙන් ත්‍රෛමාසිකව රැස්විය.

SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම්

වේතනය

තිරසාරත්වය සහ දේශගුණය සම්බන්ධ කරුණු දැනට අධ්‍යක්ෂ මණ්ඩලයේ වේතන ව්‍යුහය තුළ ඇතුළත් කර නොමැත.

බැංකුවේ වේතන සම්බන්ධ යහපාලනය පිළිබඳ වැඩි විස්තර මෙම වාර්ෂික වාර්තාවේ ලංකා බැංකුවෙහි යහපාලනය යන පරිච්ඡේදය, පිටු 179 හි අනාවරණය කර ඇත.

යහපාලන වැඩිදියුණු කිරීම

2026 වසර සිට, බැංකුව විසින් අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ තිරසාරත්ව කමිටුවක් ස්ථාපිත කර ඇත.

මෙම පියවර මඟින් තිරසාරත්වය සහ දේශගුණය සම්බන්ධ කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ විධිමත් අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂා කරන අතර, එය වර්ධනය වෙමින් පවතින නියාමන සහ වෙළඳපළ අපේක්ෂාවන් ද පිළිබිඹු කරයි.

ESG කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ දක්ෂතා සහ හැකියාව

තිරසාරත්වය සහ දේශගුණය සම්බන්ධ අවදානම් පිළිබඳ කාර්යක්ෂම අධීක්ෂණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ සුදුසු දැනුම සහ තාක්ෂණික අවබෝධය අවශ්‍ය වේ. අධ්‍යක්ෂ මණ්ඩලය සමස්තයක් ලෙස බැංකුකරණ සහ මූල්‍ය සේවා, අවදානම් කළමනාකරණය, මූල්‍ය වෙළඳපළ, ආයතනික යහපාලනය, ඩිජිටල් පරිවර්තනය සහ තිරසාරත්වයට සම්බන්ධ උපායමාර්ගික අධීක්ෂණය යන ක්ෂේත්‍රවල පුළුල් අත්දැකීම් දරයි.

SLFRS 1 සහ SLFRS 2 ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීමේ අරමුණින්, බැංකුව විසින් අර්නස්ට් ඇන්ඩ් යන්ග් ආයතනයේ සහය ඇතිව කළමනාකරණ කණ්ඩායම් සඳහා ව්‍යුහගත පුහුණු වැඩසටහනක් පැවැත්වීය. තවද, යහපාලන වගකීම්, දේශගුණය සම්බන්ධ අවදානම් අධීක්ෂණය සහ හෙළිදරව් කිරීමේ වගකීම් පිළිබඳ අවබෝධය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා විශේෂ දැනුවත් කිරීමේ සැසිවාරයක් ද පැවැත්විණි.

අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය පිළිබඳ වැඩි විස්තර සඳහා මෙම වාර්ෂික වාර්තාවේ පිටු 34-39 සහ 169 වෙත යොමු වන්න.

කළමනාකරණ අධීක්ෂණය

කළමනාකරණ මට්ටමේ අධීක්ෂණය තිරසාර කමිටුව හරහා ක්‍රියාත්මක වේ. කළමනාකරණයේ වගකීම වනුයේ;

- අධ්‍යක්ෂ මණ්ඩලයේ මාර්ගෝපදේශ මෙහෙයුම් ක්‍රියාමාර්ග බවට පරිවර්තනය කිරීම
- තිරසාරභාවයට අදාළ කාර්යසාධන දර්ශක නිරීක්ෂණය කිරීම
- ණය කළඹ පුරා දේශගුණය සම්බන්ධ අවදානම් නිරාවරණ ඇගයීම
- ණය සහ ආයෝජන ක්‍රියාවලීන් තුළ ESG සලකා බැලීම් ඇතුළත් කිරීම සඳහා සහාය වීම
- තිරසාරභාවයට අදාළ අනාවරණවල අනුකූලතාව, සම්පූර්ණත්වය සහ ගුණාත්මකභාවය සහතික කිරීම

විධායක වගකීම්භාරය

තිරසාර බැංකුකරණ ඒකකය, ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ (CFO) අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර, එමඟින් තිරසාරත්ව කාර්යසාධනය සහ හෙළිදරව්වල විශ්වාසනීයතාව පිළිබඳ විධායක මට්ටමේ වගකීම්භාරය තවදුරටත් ශක්තිමත් කරයි.

තිරසාරත්වයට සම්බන්ධ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI), ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ සහකාර මහා කළමනාකාරිණී – තිරසාර බැංකුකරණ යන තනතුරු සඳහා වන කාර්යසාධන ඇගයීම් ව්‍යුහයන් තුළ ඇතුළත් කර ඇත.

මෙම සම්බන්ධීකරණය මඟින් යහපාලන අධීක්ෂණය, මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සහ කාර්යසාධන වගකීම්භාරය අතර සංගතතාවය පවත්වා ගැනීමට සහාය වේ.

ක්‍රියාත්මක කිරීමේ කටයුතු සහ මෙහෙයුම් ඒකාබද්ධ කිරීම

ක්‍රියාත්මක කිරීමේ කටයුතු සඳහා තිරසාර බැංකුකරණ අංශය සහ SLFRS 1 සහ SLFRS 2 ක්‍රියාකාරී කණ්ඩායම ඇතුළු විශේෂිත අංශවල සහාය ලැබේ.

මෙහෙයුම් මට්ටමේදී, තිරසාරත්වයට සම්බන්ධ කරුණු ණය ලබාදීම, ආයෝජන සහ ව්‍යාපාරික තීරණ ගැනීමේ ක්‍රියාවලීන් තුළ ඇතුළත් කර ඇත.

එම මට්ටමේදී සකස් වන තොරතුරු පසුව යහපාලන ව්‍යුහය හරහා ඒකාබද්ධ කර සමාලෝචනය සහ අධීක්ෂණය සඳහා ඉහළ මට්ටම් වෙත ඉදිරිපත් කරනු ලැබේ

මෙහෙයුම් ක්‍රියාවලීන් තුළ ESG කරුණු ඒකාබද්ධ කිරීම

- බැංකු ක්‍රියාකාරකම් තුළ තිරසාරත්වය සහ දේශගුණය සම්බන්ධ කරුණු ඇතුළත් කිරීම
- දත්ත රැස් කිරීම, ඒකාබද්ධ කිරීම සහ තහවුරු කිරීම
- SLFRS S1 සහ SLFRS S2 සමඟ අනුකූල වන පරිදි හෙළිදරව් කිරීම් සකස් කිරීම
- අවදානම්, උපායමාර්ග, මූල්‍ය සහ මෙහෙයුම් කණ්ඩායම් අතර සම්බන්ධීකරණය කිරීම

තොරතුරු ප්‍රවාහය සහ හෙළිදරව් කිරීම් ඒකාබද්ධ කිරීම

දේශගුණය සම්බන්ධ තොරතුරු ව්‍යාපාර ඒකකවලින් කළමනාකරණ කමිටු හරහා IRMC වෙත ඉදිරිපත් කරනු ලැබේ. ESG සහ තිරසාරත්ව කරුණු IRMC රැස්වීම්වල ස්ථිර න්‍යායපත්‍ර අංගයක් ලෙස ඇතුළත් කර ඇති අතර, එමඟින් ඒවා පිළිබඳ කාලානුරූප සමාලෝචනය සහ උපායමාර්ගික සලකා බැලීම සිදු කරයි.

එයට අමතරව, අවම වශයෙන් වසරකට වරක් IRMC රැස්වීමක් තිරසාරත්වය සහ දේශගුණය සම්බන්ධ කරුණු සඳහා විශේෂයෙන් වෙන් කරනු ලබන අතර, එහිදී කාර්යසාධනය, නියාමන වර්ධනයන්, හෙළිදරව් කිරීම් අවශ්‍යතා සහ නව අවදානම් සමාලෝචනය කරනු ලැබේ.

කළමනාකරණය සහ තාක්ෂණික කණ්ඩායම් විසින් සකස් කරන හෙළිදරව් කිරීම් කෙටුම්පත්, වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීමට පෙර කළමනාකරණ මට්ටමේ දී සහ IRMC මඟින් සමාලෝචනය කරනු ලැබේ.



1. හඳුනාගැනීම සහ නිරීක්ෂණය
ව්‍යාපාර ඒකක සහ මෙහෙයුම්
- අවදානම් හඳුනාගැනීම
- කළඹ අධීක්ෂණය
- ESG දත්ත රැස් කිරීම
- මෙහෙයුම් තිරසාරත්ව මිනුම්

↓

2. ඒකාබද්ධ කිරීම සහ තාක්ෂණික ඇගයීම
තිරසාර බැංකුකරණ අංශය සහ SLFRS S1 සහ S2 ක්‍රියාකාරී කණ්ඩායම
- දත්ත ඒකාබද්ධ කිරීම
- දේශගුණික අවදානම් ඇගයීම
- හෙළිදරව් කිරීම් කෙටුම්පත් සකස් කිරීම
- මිනුම් තහවුරු කිරීම

↓

3. කළමනාකරණ සමාලෝචනය
කළමනාකරණ කමිටු
- CRROs සමාලෝචනය
- KPIs අනුව කාර්යසාධනය සමාලෝචනය
- ප්‍රමාණාත්මක කරුණු ඉහළ මට්ටම් වෙත යොමු කිරීම
- උපායමාර්ගය සමඟ අනුකූලතාව තහවුරු කිරීම

↓

4. අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අධීක්ෂණය
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව
- තිරසාරත්වය සහ දේශගුණය සම්බන්ධ කරුණු පිළිබඳ අධීක්ෂණය
- හෙළිදරව් කිරීම් සමාලෝචනය
- උපායමාර්ගික අනුකූලතාව තහවුරු කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු යොමු කිරීම

↓

5. පොදු හෙළිදරව් කිරීම් වාර්ෂික වාර්තාව
(SLFRS S1 සහ SLFRS S2 හෙළිදරව් කිරීම්)
- යහපාලනය
- උපායමාර්ගය
- අවදානම් කළමනාකරණය
- මිනුම් සහ ඉලක්ක

අබණ්ඩ නිරීක්ෂණය සහ වැඩිදියුණු කිරීම

යහපාලන සහ වාර්තාකරණ රාමුව අබණ්ඩ චක්‍රයක් ලෙස ක්‍රියාත්මක වන අතර අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡා සහ කළමනාකරණ සමාලෝචන මඟින් ලැබෙන ප්‍රතිපෝෂණය අභ්‍යන්තර පාලන ක්‍රම, දත්ත පද්ධති, ක්‍රමවේද සහ විශ්ලේෂණ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා භාවිතා කරනු ලැබේ.

එමඟින් කාලයත් සමඟ තිරසාරත්වයට සම්බන්ධ යහපාලන සහ අනාවරණ ක්‍රියාවලීන් තවදුරටත් ශක්තිමත් කිරීමට සහාය වේ.

උපායමාර්ගය

දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා බැංකුවේ උපායමාර්ගික සැලසුම්කරණය, ණය අවදානම් කළමනාකරණය, ප්‍රාග්ධන වෙන්කිරීම සහ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව සම්බන්ධ ක්‍රියාවලීන් තුළ සලකා බලනු ලැබේ. මෙම සලකා බැලීම් මඟින් දේශගුණය සම්බන්ධ වර්ධනයන් ණය ගුණාත්මකභාවය, යටිතල පහසුකම් ආයෝජන, කළඹ සංයුතිය සහ දිගුකාලීන අගය නිර්මාණය කෙරෙහි බලපෑම් ඇති කළ හැකි බව පිළිගනී.

SLFRS S1 සහ SLFRS S2 යටතේ වාර්තාකරණය සිදුකරන බැංකුවේ පළමු වසර ලෙස, දේශගුණය සම්බන්ධ කරුණු දැනට පවතින සමස්ත ව්‍යවසාය අවදානම් කළමනාකරණ (ERM) ක්‍රියාවලීන් තුළ ඇතුළත් කර ඇත. මෙම ක්‍රියාවලිය මූල්‍ය ප්‍රමාණාත්මකභාවය සඳහා නියමිත සීමා මට්ටම් සහ ව්‍යුහගත ගුණාත්මක ඇගයීම් මඟින් සහාය ලබයි. හඳුනාගත් දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා බැංකුවේ පවතින සම්භාවිතාව, බලපෑමේ ප්‍රමාණය සහ කාල පරාසය යන මිනුම් පරාමිතීන් අනුව ඇගයීමට ලක් කරනු ලබන අතර, එය සමස්ත අවදානම් ඇගයීමේ රාමුව සමඟ අනුකූල වේ.

බැංකුව විසින් හඳුනාගත් ප්‍රධාන දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා, ඒවාට අදාළ උපායමාර්ගික ප්‍රතිචාර සමඟ පහත සාරාංශ කර ඇත.

SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම්

දේශගුණය ආශ්‍රිත අවදානම් (CRRO)

CRRO 1 - දරුණු කාලගුණික සිදුවීම්	
දළ හැඳින්වීම	
විස්තරය	දරුණු කාලගුණික සිදුවීම් සහ පුළුල් දේශගුණික වෙනස්කම්වල බලපෑම් බැංකුවේ මෙහෙයුම් කටයුතු මෙන්ම එහි ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය ස්ථායිතාව කෙරෙහිද අහිතකර බලපෑම් ඇති කළ හැක. එවැනි තත්ත්වයන් මඟින් වත්කම්වල භෞතික හානි සිදුවීමේ හැකියාව වැඩි වන අතර ණය අවදානමද ඉහළ යා හැක. ඒ හේතුවෙන් බැංකුවේ මූල්‍ය අපේක්ෂාවන් සහ සමස්ත කාර්යසාධනය කෙරෙහිද බලපෑම් ඇතිවිය හැක.
CRRO හි ස්වභාවය	භෞතික අවදානම්
කාල රේඛාව	කෙටි, මධ්‍යම සහ දිගු
කාල රේඛාව අර්ථ දැක්වීම	පිටුව 89 වෙත යොමු වන්න.
ව්‍යාපාර ආකෘතිය සහ වටිනාකම් දාමය	
වත්මන් වර්ෂයට බලපෑම්	
මෙහෙයුම් බාධා සහ භෞතික බලපෑම්	වසර තුළ අත්විඳින ලද දරුණු කාලගුණික සිදුවීම්, දිට්වා සුළි කුණාටුව ඇතුළුව, බැංකුවේ ශාඛා ජාලය සහ ඒ සම්බන්ධ වත්කම්වලට භෞතික හානි ඇති කරමින් මෙහෙයුම් කටයුතු වලට බාධා ඇති කළේය. එමඟින් බැංකුවේ භෞතික යටිතල පහසුකම්වලට ද බලපෑම් ඇති විය. ගංවතුර සහ අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් සමහර ශාඛා තාවකාලිකව වසා දැමීමට සිදු වූ අතර, එමඟින් භෞතික සේවා සැපයීම බාධා වී මෙහෙයුම් අඛණ්ඩතාවයට සහ ආදායම් උත්පාදනයට කෙටිකාලීන බලපෑම් ඇති විය.
ණය අවදානම් සලකා බැලීම්	භෞතික හා මෙහෙයුම් බලපෑම් වලට අමතරව, විශේෂයෙන් බලපෑමට ලක් වූ ගනුදෙනුකරුවන් සහ ණය කළඹ සම්බන්ධයෙන්, දිට්වා සුළි කුණාටුවෙන් පැන නගින විභව ණය අවදානම් බලපෑම් ද බැංකුව තක්සේරු කළේය. ණය අවදානම සම්බන්ධයෙන්, දිට්වා සුළි කුණාටුව ගනුදෙනුකරුවන්ගේ ජීවනෝපායන් කෙරෙහි සැලකිය යුතු බලපෑම් ඇති කළේය. විශේෂයෙන් කෘෂිකර්ම, කුඩා ව්‍යාපාර සහ පුද්ගලික බැංකුකරණ අංශවල ගනුදෙනුකරුවන්ට මෙම තත්ත්වය වැඩි වශයෙන් බලපෑම් කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස ණය වාරික ප්‍රමාද වීමේ සහ ණය නොගෙවීම් සිදුවීමේ අවදානම ඉහළ ගිය අතර අදියර 3 ණය සහ අත්තිකාරම් ප්‍රමාණය ද වැඩිවිය හැකි බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වයෙන් ඇතිවූ ණය අවදානම් බලපෑම් හඳුනාගැනීම, ඇගයීම සහ නිරීක්ෂණය කිරීම සඳහා බැංකුව විසින් පළාත් මට්ටමින් ණය අවදානම් නිරාවරණය පිළිබඳ විශේෂ ඇගයීමක් සිදු කළේය.
අපේක්ෂිත බලපෑම්	
ණය අවදානම් කළමනාකරණය	ගංවතුර සහ නායයාම් අවදානම් ඇති ප්‍රදේශවල හෝ දේශගුණයට සංවේදී ක්ෂේත්‍රවල ක්‍රියාත්මක වන ණය ගැනුම්කරුවන් කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළ හැක. ව්‍යාපාරික ක්‍රියාකාරකම්, ආදායම් උපයාගැනීම සහ නිෂ්පාදන වත්කම්වලට සිදුවන බාධා හේතුවෙන් ණය ගැනුම්කරුවන්ගේ ණය ගෙවීමේ හැකියාව දුර්වල විය හැක. එමඟින් ණය වාරික ප්‍රමාද වීම, ණය ව්‍යුහගත කිරීම හෝ ණය නොගෙවීමේ අවදානම ඉහළ යා හැකි අතර, ඒ හේතුවෙන් බැංකුවේ ණය අවදානම් නිරාවරණය ද වැඩි විය හැක.
මෙහෙයුම් අවදානම් කළමනාකරණය	දරුණු කාලගුණික සිදුවීම් හේතුවෙන් ශාඛා ගොඩනැගිලි සහ සහායක යටිතල පහසුකම්වලට සිදුවන භෞතික හානි, ශාඛා තාවකාලිකව වසා දැමීම සහ කාර්යමණ්ඩලය සීමිත විය හැකි බව වැනි කරුණු නිසා බැංකු සේවා සැපයීම බාධා විය හැක. එවැනි බාධා හේතුවෙන් සේවා අඛණ්ඩතාවයට බලපෑම් ඇති විය හැකි අතර, හානි වූ ස්ථානවල අලුත්වැඩියා, ප්‍රතිස්ථාපන සහ මෙහෙයුම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා අමතර වියදම් ද ඇති විය හැක.
වත්කම් ගුණාත්මකභාවය සහ ඇපකර තක්සේරුව	දරුණු කාලගුණික සිදුවීම් හේතුවෙන් නිවාස ණය සහ කෘෂිකාර්මික ණය සඳහා ඇප ලෙස තබා ඇති වත්කම්වලට භෞතික හානි සිදුවිය හැක. එවැනි හානි හේතුවෙන් එම වත්කම්වල අගය සහ නැවත අය කරගැනීමේ හැකියාව කෙරෙහි බලපෑම් ඇති විය හැක. ඒ අනුව, ණය ගැනුම්කරුවන් ණය ගෙවීමට අසමත් වන අවස්ථාවලදී ණය නැවත අය කරගැනීමේ ප්‍රතිඵල සහ ණය අලාභ මට්ටම් කෙරෙහිද බලපෑම් ඇති විය හැක.
අවදානම් සංකේන්ද්‍රණය	
මෙහෙයුම් අවදානම්	දරුණු කාලගුණික සිදුවීම්වල අවදානම, ගංවතුර සහ නායයාම් අවදානමට ලක්වන ප්‍රදේශවල පිහිටි බැංකු ශාඛා ස්ථානවල වැඩි වශයෙන් සංකේන්ද්‍රණය වී ඇත.
ණය අවදානම්	කෘෂිකාර්මය ආශ්‍රිත ණය, ගංවතුර සහ නායයාම් වැනි දරුණු කාලගුණික සිදුවීම් හේතුවෙන් පාදක කෘෂිකාර්මික වත්කම්වලට බලපෑම් ඇති විය හැකි බැවින් ණය ගෙවීමේ හැකියාව ද දුර්වල විය හැක. එසේම, නිවාස ඇප මත ලබා දෙන ණය පහසුකම් සම්බන්ධයෙන් පාදක දේපළ, ගංවතුර හෝ නායයාම් අවදානම් ලෙස හඳුනාගත් ප්‍රදේශවල පිහිටා ඇති අවස්ථාවල මෙවැනි අවදානම් තත්ත්වයන් මතුවිය හැක.

CRRO 1 - දරුණු කාලගුණික සිදුවීම්	
උපායමාර්ගය සහ තීරණ ගැනීම	
ප්‍රතිචාර දැක්වීමේ සැලසුම්	
මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව	දේශගුණය සම්බන්ධ භෞතික අවදානම් බැංකුවේ උපායමාර්ගික සහ මෙහෙයුම් තීරණ ගැනීමේදී සලකා බලනු ලබන අතර, ශාඛා ස්ථාපනය සහ ස්ථාන මාරු කිරීමේදී ගංවතුර සහ නායයාම් අවදානම් සිතියම් මෙන්ම ඉතිහාසගත දේශගුණික දත්ත සැලකිල්ලට ගනු ලැබේ. දේශගුණය සම්බන්ධ බාධා ඇති වන අවස්ථාවල සේවා අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා බැංකුව ඩිජිටල් බැංකුකරණ වේදිකා, පංගම ශාඛා වැනි නම්‍යශීලී සේවා ක්‍රම ශක්තිමත් කර ඇත. ශාඛා වත්කම්වලට සිදුවිය හැකි භෞතික හානි රක්ෂණ ආවරණය මඟින් අවම කිරීමට කටයුතු කර ඇති අතර, මෙහෙයුම් අඛණ්ඩතාව ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් (BCP) රාමුව මඟින් සහාය ලබයි.
ණය අවදානම් ඒකාබද්ධ කිරීම	බැංකුව දේශගුණය සම්බන්ධ භෞතික අවදානම් කළමනාකරණය කරනුයේ පවතින ණය අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් හරහාය. නායයාම් අවදානම් ලෙස හඳුනාගත් ප්‍රදේශවල ඇති ණය යෝජනා සඳහා, ගනුදෙනුකරුවන්ගෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) හෝ අදාළ අධිකාරීන් විසින් නිකුත් කරන ලද වාර්තා ලබා ගනු ලැබේ. නිවාස ඇප මත ලබා දෙන ණය පහසුකම් සඳහා සකස් කරන දේපළ ඇගයීම් වාර්තාවලදී ගංවතුර සහ නායයාම් අවදානම් ද සලකා බලනු ලබන අතර, එවැනි දේපළ සඳහා රක්ෂණ ආවරණ ලබා ගන්නා අවස්ථාවල දේශගුණය සම්බන්ධ භෞතික අවදානම් ද ආවරණ ඇගයීමේදී ඇතුළත් කරනු ලැබේ.
සම්පත්කරණය	
මෙහෙයුම් ඔරොත්තු දීමේ මිනුම්	බැංකුව විසින් දැඩි අවදානමට ලක්විය හැකි ලෙස හඳුනාගෙන ඇති ශාඛා ආරක්ෂිත ස්ථාන වෙත ගෙනයාම සලකා බලමින් සිටී. ඊට අමතරව, ගංවතුරට ඔරොත්තු දෙන සුරක්ෂිතාගාර හඳුන්වාදීම සහ අත්‍යවශ්‍ය ආරක්ෂක ද්‍රව්‍ය සුරක්ෂිතව ගබඩා කිරීම වැනි පියවරයන් භෞතික අවදානම් වලට නිරාවරණය වීම තවදුරටත් අඩු කිරීම සඳහා ආරක්ෂිත ස්ථානවල ලේඛන ගබඩා කිරීම සලකා බලනු ලැබේ.
මානව සම්පත් සහ හැකියාව	තිරසාරත්වය සහ දේශගුණය සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා සහාය වීමට විශේෂිත මානව සම්පත් යොදවා ඇති අතර, දේශගුණික බලපෑම් වාර්තාකරණය සහ අදාළ කටයුතු සඳහා තිරසාර බැංකුකරණ අංශයට ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු පත් කර ඇත.
සේවා අඛණ්ඩතා මිනුම්	දේශගුණය සම්බන්ධ බාධා ඇති වන අවස්ථාවල සේවා අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා බැංකුව ඩිජිටල් බැංකුකරණ වේදිකා සහ පංගම ශාඛා ඇතුළු විකල්ප සේවා සැපයුම් මාර්ග භාවිතා කරයි.
ධාරිතාව ගොඩනැගීම	බැංකුව අභ්‍යන්තර ධාරිතා ශක්තිමත් කිරීමේ වැඩසටහන් ද අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් සිටී. එයට ණය නිලධාරීන් සඳහා ESMS පරීක්ෂණ පුහුණු වැඩසටහන් සහ තිරසාරත්වය සම්බන්ධ පුහුණු වැඩසටහන් ඇතුළත් වේ.
ප්‍රගතිය	
බැංකුව දරුණු කාලගුණික සිදුවීම්වලට සම්බන්ධ අවදානම් හඳුනාගැනීම ශක්තිමත් කරමින්, ශාඛා ස්ථාන සහ ගනුදෙනුකරුවන්ගේ නිරාවරණය පිළිබඳ භෞතික බලපෑම් ගංවතුර අවදානම් සිතියම්, නායයාම් අවදානම් සිතියම්, ඉතිහාසගත කාලගුණ දත්ත සහ දිට්වා සුළි කුණාටුව ඇතුළු මෑත සිදුවීම්වලින් නිරීක්ෂණය වූ බලපෑම් භාවිතා කරමින් ඇගයීමට ලක් කළේය. මෙම ඇගයීම් මඟින් විශේෂයෙන් දේශගුණයට සංවේදී ක්ෂේත්‍ර සහ ප්‍රදේශවල භූ ගෝලීය නිරාවරණය සහ ණය අවදානම පිළිබඳ බැංකුවේ අවබෝධය තවදුරටත් වැඩිදියුණු විය. පෙර සිදුකළ ඇගයීම ආරම්භක මට්ටමේ වූ අතර, එය පදනම් කරගනිමින් දරුණු කාලගුණික සිදුවීම්වලට සම්බන්ධ ගනුදෙනුකරු මට්ටමේ ණය අවදානම් ඇගයීම තවදුරටත් ශක්තිමත් කිරීමට බැංකුව සැලසුම් කරයි. මෙම ක්‍රියාවලියෙහි කොටසක් ලෙස, ඉහළ අවදානම් ණය පහසුකම් සඳහා පාරිසරික සහ සමාජ පරීක්ෂණ ක්‍රමවේදයන් යොදා ගැනීම, දේපළ ඇගයීම් සහ රක්ෂණ ක්‍රියාවලීන් තුළ දේශගුණය සම්බන්ධ කරුණු ඇතුළත් කිරීම, මෙන්ම ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් සහ විකල්ප සේවා සැපයුම් මාර්ග භාවිතය ශක්තිමත් කිරීම සඳහා බැංකුව අඛණ්ඩව කටයුතු කරනු ඇත.	
මූල්‍ය බලපෑම්	
වත්මන් මූල්‍ය වර්ෂයට බලපෑම්	දිට්වා සුළි කුණාටුවෙන් පසු, ශාඛා කිහිපයක සහ ශාඛා නොවන ස්ථානවල භෞතික හානි වාර්තා විය. කෙසේ වෙතත්, සිදුකළ ඇගයීම් අනුව මෙම භෞතික හානි වර්තමාන මූල්‍ය වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන මට්ටමක නොවීය. දේශගුණය සම්බන්ධ සිදුවීම් හේතුවෙන් ණය කළඹ තුළ ඇති විය හැකි අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණ අලාභ ප්‍රතිපාදන ගණනය කිරීමේදී බැංකුව විචක්ෂණශීලී ප්‍රවේශයක් අනුගමනය කරයි. ඒ අනුව, දිට්වා සුළි කුණාටුවෙන් ඇති විය හැකි අපේක්ෂිත ණය අවදානම් බලපෑම සලකා බැලූ අතර, අපේක්ෂිත හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන සකස් කිරීමේදී අදාළ කළමනාකරණ ආවරණ යොදා ගනු ලැබීය (වැඩි විස්තර සඳහා මූල්‍ය ප්‍රකාශනවල 28.2 සටහන වෙත යොමු වන්න).
අපේක්ෂිත මූල්‍ය බලපෑම්	අන්තර්කාලීන සහන පිළිබඳ වැඩි විස්තර සඳහා පිටු 90 වෙත යොමු වන්න.

SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම්

CRRO 1 - දරුණු කාලගුණික සිදුවීම්	
ඊළඟ වාර්ෂික වාර්තාකරණ කාල සීමාව තුළ වත්කම් සහ වගකීම්වල වර්තමාන වටිනාකම් සඳහා ප්‍රමාණාත්මක ලෙස ගැලපීමේ අවදානම.	ප්‍රමාණාත්මක ගැලපීම් අවශ්‍ය වන අවදානම් කිසිවක් හඳුනා ගෙන නොමැත.
දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව	
දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව	අන්තර්කාලීන සහන පිළිබඳ වැඩි විස්තර සඳහා පිටු 90 වෙත යොමු වන්න.
සිද්ධි විශ්ලේෂණය	අන්තර්කාලීන සහන පිළිබඳ වැඩි විස්තර සඳහා පිටු 90 වෙත යොමු වන්න.
විනිශ්චයන් සහ අවිනිශ්චිතතා	
විනිශ්චයන්	බැංකුවේ අනාගත ප්‍රතිඵල කෙරෙහි සාධාරණ ලෙස බලපෑම් ඇති කළ හැකි අවදානම් හඳුනාගෙන ඒවා ඇගයීමේදී වෘත්තීය විනිශ්චය භාවිතා කරයි. මෙහිදී ගංවතුර සහ නායයාම් අවදානම්වලට නිරාවරණය වන භූ ගෝලීය ප්‍රදේශ සහ ශාඛා ස්ථාන හඳුනා ගැනීම ප්‍රධාන විනිශ්චයන් අතරට අයත් වන අතර, එය ගංවතුර අවදානම් සිතියම්, නායයාම් අවදානම් සිතියම්, ඉතිහාසගත සිදුවීම් දත්ත සහ වාර්තාකරණ වර්ෂය තුළ නිරීක්ෂණය වූ මෙහෙයුම් බලපෑම් මත පදනම් වේ. එමෙන්ම, භෞතික හානි, මෙහෙයුම් බාධා සහ ණය අවදානම් බලපෑම්වල ප්‍රමාණාත්මකභාවය ඇගයීමේදී ද වෘත්තීය විනිශ්චය යොදා ගනු ලැබේ.
අවිනිශ්චිතතා	දරුණු කාලගුණික සිදුවීම්වල මූල්‍ය බලපෑම් ඇස්තමේන්තු කිරීමේදී මිනුම් අවිනිශ්චිතතාව පවතී. මෙය විශේෂයෙන් ගොඩනැගිලි, උපකරණ සහ ඉලෙක්ට්‍රොනික වත්කම්වලට සිදුවිය හැකි භෞතික හානි සහ සේවා බාධා හෝ ශාඛා තාවකාලිකව වසා දැමීම වැනි මෙහෙයුම් බලපෑම් සම්බන්ධයෙන් දැකිය හැක. මෙම ඇස්තමේන්තු වාර්තාකරණ දිනය වන විට ලබාගත හැකි තොරතුරු මත පදනම් වන අතර, අලුත්වැඩියා සහ ප්‍රතිසංස්කරණ කටයුතු වල ඉදිරි ප්‍රගතිය සමඟ ඒවා වෙනස් විය හැක. එමෙන්ම, දරුණු කාලගුණික සිදුවීම් ණය ගැනුම්කරුවන්ගේ ණය ගෙවීමේ හැසිරීම සහ අනාගත ණය කාර්යසාධනය කෙරෙහි ඇති කළ හැකි බලපෑම් විශේෂයෙන් කෘෂිකර්මය වැනි දේශගුණයට සංවේදී ක්ෂේත්‍රවල වාර්තාකරණ දිනය වන විට නිශ්චිතව තීරණය කළ නොහැක. එවැනි බලපෑම් ඉදිරි වාර්තාකරණ කාලසීමාවන් තුළ ප්‍රකාශ විය හැක.

CRRO 2 – කාබන් අවම කිරීමේ ක්‍රියා පිළිවෙත් මත වැඩිවන පිරිවැය	
දළ හැඳින්වීම	
විස්තරය	ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් තීරණය කළ දායකත්වයන් (NDCs) මඟින් හරිතාගාර වායු විමෝචන අඩු කිරීම සහ කාබන් අවම ආර්ථිකයක් වෙත සංක්‍රාන්ති වීම ප්‍රවර්ධනය කිරීම සඳහා රට කැපවී සිටී. මෙම ජාතික කැපවීම් මඟින් දේශගුණයට අනුකූල ආයෝජන සඳහා සහාය වීම සහ ඉහළ විමෝචන ක්‍රියාකාරකම්වලට ඇති නිරාවරණය අඩු කිරීම සම්බන්ධයෙන් මූල්‍ය ආයතන මත අපේක්ෂාවන් තවදුරටත් වැඩි කරයි. බැංකුව සම්බන්ධයෙන්, කාබන් අවම කිරීමේ සංක්‍රාන්ති අවශ්‍යතා සම්බන්ධයෙන් ඇති විය හැකි අමතර වියදම් මෙන්ම ඉහළ විමෝචන ක්ෂේත්‍රවලින් ලැබෙන ආදායම් අඩුවීමේ හැකියාව බැංකුවේ ලාභදායීත්වය සහ වර්ධන අපේක්ෂාවන් කෙරෙහි පීඩනයක් ඇති කළ හැක. එමෙන්ම, ශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම, නවීකරණීය ශක්ති භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ අනෙකුත් කාබන් අවම වැඩිදියුණු කිරීම් සඳහා අමතර ප්‍රාග්ධනය අවශ්‍ය විය හැකි අතර, එය සංක්‍රාන්ති කාලසීමාව තුළ ප්‍රාග්ධන වෙන්කිරීම සහ මූල්‍ය කාර්යසාධනය කෙරෙහි බලපෑම් ඇති කළ හැක.
CRRO හි ස්වභාවය	සංක්‍රාන්ති අවදානම්
කාල රේඛාව	මධ්‍යම, දිගු
කාල රේඛාව අර්ථ දැක්වීම	පිටුව 89 වෙත යොමු වන්න.
ව්‍යාපාර ආකෘතිය සහ වටිනාකම් දාමය	
වත්මන් වර්ෂයට බලපෑම්	
2025 වසර තුළ, බැංකුව සිය භෞතික යටිතල පහසුකම් හරහා ශක්ති කාර්යක්ෂමතා සහ නවීකරණ ශක්ති වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර, එයට ශාඛා සූර්ය ශක්තිකරණය සහ ශක්ති පද්ධති වැඩිදියුණු කිරීම් ඇතුළත් විය. මෙම ක්‍රියාකාරකම් මඟින් කාබන් අඩු කිරීමේ ප්‍රයත්න, මෙහෙයුම් තිරණ ගැනීමේ ක්‍රියාවලීන් තුළ ආරම්භක අදියරේදී ඇතුළත් කරමින් පවතින බව පිළිබිඹු කරයි.	
අපේක්ෂිත බලපෑම්	
මෙහෙයුම් සහ ප්‍රාග්ධන වියදම්	ශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම, නවීකරණ ශක්ති විසඳුම් සහ අනෙකුත් කාබන් අවම කිරීම් වැඩසටහන් සඳහා සිදුකරන ආයෝජන, සංක්‍රාන්ති අවධියේදී වැඩි වියදම් ඇති කිරීමට හේතු විය හැක. දිගුකාලීනව වියදම් ඉතිරිකිරීමේ හැකියාවක් තිබුණද, කෙටි හා මධ්‍යම කාලීනව එය ලාභදායීත්වය සහ වර්ධනය කෙරෙහි පීඩනයක් ඇති කළ හැක.
විවිධාංගීකරණය වූ සහ අංශීය මාරුවීම්	ඉහළ විමෝචන ඇති ක්ෂේත්‍රවල සම්බන්ධතාවය මෙන්ම ණය කළඹේ ක්‍රමයෙන් සිදුකරන කාබන් අඩු කිරීමේ ප්‍රයත්න නිසා බැංකුවේ නිෂ්පාදන ඉදිරිපත් කිරීම්, ක්ෂේත්‍ර නිරාවරණය සහ ප්‍රාග්ධන වෙන්කිරීම සම්බන්ධ තීරණ කෙරෙහි බලපෑම් ඇති විය හැක.

CRRO 2 – කාබන් අවම කිරීමේ ක්‍රියා පිළිවෙත් මත වැඩිවන පිරිවැය	
දළ හැඳින්වීම	
අවදානම් සංකේන්ද්‍රණය	
මෙහෙයුම් අවදානම්	බැංකුවේ භෞතික යටිතල පහසුකම්, උපකරණ සහ ක්‍රියාවලීන් ශක්ති කාර්යක්ෂම උපකරණ සහ පද්ධති වෙත වැඩි දියුණු කිරීම අවශ්‍ය විය හැක.
ණය අවදානම්	කාබන් අවම කිරීමේ සංක්‍රාන්ති අවශ්‍යතා බැංකුවේ ණය කළඹේ ව්‍යුහය කෙරෙහි බලපෑම් ඇති කළ හැකි අතර, විශේෂයෙන් ඉහළ විමෝචන ඇති ක්ෂේත්‍රවලට ඇති නිරාවරණය සම්බන්ධයෙන් විය සැලකිය හැක.
උපායමාර්ගය සහ තීරණ ගැනීම	
ප්‍රතිචාර දැක්වීමේ සැලසුම්	
හරිත මූල්‍යකරණය	බැංකුව පාරිසරික වශයෙන් තිරසාර සහ කාබන් අවම කිරීමේ ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය පහසුකම් පුළුල් කිරීම මගින් හරිත මූල්‍යකරණය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.
සංක්‍රාන්ති සැලසුම්කරණය	කාබන් ගිණුම්කරණ මූල්‍ය හවුල්කාරිත්වය (PCAF) ක්‍රමවේදයට අනුකූලව මූල්‍ය විමෝචන මිනුම් කිරීම සහ සංක්‍රාන්ති සැලැස්මක් සංවර්ධනය කිරීම සඳහා බැංකුව පියවර ගෙන ඇත.
සම්පත්කරණය	
නව්‍ය තිරසාර බැංකුකරණ නිෂ්පාදන සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙන්ම ශක්ති ඉතිරි කිරීම සහ ශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන් සඳහා සහාය වීමට බැංකුව විශේෂිත සම්පත් වෙන් කර ඇත. තිරසාර බැංකුකරණ ඒකකයට කාර්ය මණ්ඩලය පත් කිරීම සහ තිරසාර හා හරිත මූල්‍යකරණය පිළිබඳ අභ්‍යන්තර හැකියාව ශක්තිමත් කිරීම සඳහා ඉලක්කගත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් මානව සම්පත්ද ශක්තිමත් කර ඇත. එමෙන්ම, තිරසාර බැඳුම්කර වැනි මූල්‍ය මෙවලම් හරහා මූල්‍ය සම්පත් සංචලනය කරමින් තිරසාර ණය පහසුකම් පුළුල් කිරීම සහ දේශගුණයට අනුකූල ආයෝජන ක්‍රියාකාරකම් සඳහා සහාය ලබා දීමට බැංකුව කටයුතු කරයි.	
ප්‍රගතිය	
පුනර්ජනනීය බලශක්ති ආයෝජන	බැංකුව විසින් පුනර්ජනනීය බලශක්ති මූලපිරීම් සඳහා සම්පත් අබණ්ඩව සපයන අතර, ශාඛා සූර්යබලකරණය ඇතුළුව, වසර තුළ නව ශාඛා 28 ක් සූර්යබලයෙන් බල ගැන්වී ඇති අතර, ඒ සඳහා රු. මිලියන 149.6 ක ආයෝජනයක් කර ඇත.
හරිත ගොඩනැගිලි සහතික කිරීම	ජා-ඇල සහ කුරුණෑගල දෙවන නගර ශාඛා හරිත ගොඩනැගිලි සහතිකය ලබාගෙන ඇති අතර, එය ශාඛා යටිතල පහසුකම් සඳහා තිරසාරභාවය පිළිබඳ සලකා බැලීම් ඒකාබද්ධ කිරීම පිළිබිඹු කරයි.
මූල්‍ය විමෝචන	මූල්‍යකරණය කරන ලද විමෝචන මැනීම සහ අනාවරණය කිරීම සඳහා සහාය වීම සඳහා බැංකුව කාබන් ගිණුම්කරණ මූල්‍ය සඳහා හවුල්කාරිත්වයට (PCAF) සම්බන්ධ වී ඇත.
හරිත මූල්‍යකරණ ක්‍රියාකාරකම්	වසර තුළ රු. බිලියන 1.2 ක හරිත මූල්‍යකරණයක් ලබා දී ඇති අතර, එමඟින් ණය කළඹ, කාබන් අවම කිරීමේ ක්‍රියාකාරකම් කරා ක්‍රමයෙන් සංක්‍රාන්ති වීමට සහාය වේ.
තිරසාර බැඳුම්කර නිකුත් කිරීම	පුළුල් සංක්‍රාන්ති අරමුණුවලට අනුකූලව, හරිත හා තිරසාර ණය දීමේ කළඹ පුළුල් කිරීමට සහාය වීම සඳහා බැංකුව 2025 දී රු. බිලියන 20.0 ක තිරසාර බැඳුම්කර නිකුත් කළේය.
මූල්‍ය බලපෑම්	
වත්මන් මූල්‍ය වර්ෂයට බලපෑම්	2025 වසරෙන් අවසන් වූ කාලසීමාව සඳහා සිදුකළ ඇගයීම් අනුව, කාබන් අවම කිරීමේ සංක්‍රාන්ති අවශ්‍යතා හේතුවෙන් වියදම් වැඩිවීමෙන් බැංකුවේ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, ශේෂ පත්‍රය හෝ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය කෙරෙහි සැලකිය යුතු මූල්‍ය බලපෑමක් හඳුනාගැනීමට නොහැකි විය. මෙම තක්සේරුව බැංකුවේ නියමිත ප්‍රමාණාත්මකභාව සීමා මට්ටම් අනුව සිදුකර ඇත.
අපේක්ෂිත මූල්‍ය බලපෑම්	අන්තර්කාලීන සහන පිළිබඳ වැඩි විස්තර සඳහා පිටු 90 වෙත යොමු වන්න.
ඊළඟ වාර්ෂික වාර්තාකරණ කාල සීමාව තුළ වත්කම් සහ වගකීම්වල වර්තමාන වටිනාකම් සඳහා ප්‍රමාණාත්මක ලෙස ගැලපීමේ අවදානම	සැලකිය යුතු ප්‍රමාණයේ ගැලපීම් අවශ්‍ය වන අවදානම් කිසිවක් හඳුනා ගෙන නොමැත.
දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව	
දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව	අන්තර්කාලීන සහන පිළිබඳ වැඩි විස්තර සඳහා පිටු 90 වෙත යොමු වන්න.
සිද්ධි විශ්ලේෂණ අනාවරණ	අන්තර්කාලීන සහන පිළිබඳ වැඩි විස්තර සඳහා පිටු 90 වෙත යොමු වන්න.
විනිශ්චයන් සහ අවිනිශ්චිතතා	
විනිශ්චයන්	කාබන් අවම කිරීමේ වැඩිදියුණු කිරීම් අවශ්‍ය විය හැකි මෙහෙයුම් ක්ෂේත්‍ර හඳුනාගැනීමේදී වෘත්තීය විනිශ්චය යොදා ගනු ලැබේ. මෙය විශේෂයෙන් බැංකුවේ භෞතික යටිතල පහසුකම් තුළ ශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම සහ නවීකරණීය ශක්ති වැඩසටහන් සම්බන්ධයෙන් අදාළ වේ. එමෙන්ම, මෙම වැඩි දියුණු කිරීම් සඳහා ඇති විය හැකි ඇස්තමේන්තුගත වියදම් ඇගයීමේදීත්, එම වියදම් බැංකුවේ මූල්‍ය ප්‍රමාණාත්මකභාවයේ සීමා මට්ටමට සාපේක්ෂව සැලකිය යුතුද යන්න තීරණය කිරීමේදීත් වෘත්තීය විනිශ්චය යොදා ගනු ලැබේ.
අවිනිශ්චිතතා	**සත්‍ය වියදම් ඉතිරිකිරීම් සම්බන්ධ අවිනිශ්චිතතාව** ශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම් සහ නවීකරණ ශක්ති වැඩසටහන් මඟින් අපේක්ෂිත වියදම් ඉතිරිකිරීම්, සත්‍ය මෙහෙයුම් කාර්යසාධනය සහ භාවිත රටාවන් අනුව වෙනස් විය හැකි අතර, එය ආරම්භක ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක. **ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු සම්බන්ධ අවිනිශ්චිතතාව** ශක්ති කාර්යක්ෂම පද්ධති ස්ථාපනය සහ අනෙකුත් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් ඇතුළුව කාබන් අවම කිරීමේ සංක්‍රාන්ති වැඩසටහන් සම්බන්ධ ඇස්තමේන්තුගත පිරිවැය, තාක්ෂණික පිරිවිතර, ප්‍රසම්පාදන පිරිවැය සහ ක්‍රියාත්මක කිරීමේ කොන්දේසි වල ඇති විය හැකි වෙනස්කම් හේතුවෙන් අවිනිශ්චිතතාවයට යටත් වේ.

SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම්

CRRO 3 – නව්‍ය තිරසාර බැංකුකරණ නිෂ්පාදන	
දළ හැඳින්වීම	
විස්තර	බැංකුව නව්‍ය තිරසාර බැංකුකරණ නිෂ්පාදන පුළුල් කිරීම මඟින් තම ව්‍යාපාර ආකෘතිය තවදුරටත් ශක්තිමත් කරගැනීමට හැකි අවස්ථාවක් හඳුනාගෙන ඇත. එයට තිරසාර තැන්පතු, තිරසාර ණය සහ තිරසාර ආයෝජන වැනි නිෂ්පාදන ඇතුළත් වේ. මෙම නිෂ්පාදන මඟින් කාබන් අවම සහ තිරසාර ක්‍රියාකාරකම් වෙත අරමුදල් සංචලනය කිරීම සවිබල ගන්වන අතර, දේශගුණයට අනුකූල මූල්‍ය විසඳුම් සඳහා වර්ධනය වන වෙළඳපළ ඉල්ලුමටද ප්‍රතිචාර දක්වයි. මූල්‍ය දෘෂ්ටි කෝණයෙන්, මෙම නිෂ්පාදන ස්ථාවර අරමුදල් සපයා ගැනීම, කළඹ වර්ධනය, ආදායම් විවිධාංගීකරණය සහ ප්‍රාග්ධන වෙළඳපළ මූල්‍යකරණයට ප්‍රවේශය සපයන අතර, තිරසාර මූල්‍යකරණ ක්ෂේත්‍රය තුළ බැංකුවේ ස්ථානයද තවදුරටත් ශක්තිමත් කරයි.
CRRO හි ස්වභාවය	අවස්ථා
කාල රේඛාව	කෙටි, මධ්‍යම සහ දිගු
කාල රේඛාව අර්ථ දැක්වීම	පිටුව 89 වෙත යොමු වන්න.
ව්‍යාපාර ආකෘතිය සහ වටිනාකම් දාමය	
වත්මන් වර්ෂයට බලපෑම්	
නිෂ්පාදන හඳුන්වාදීම සහ අරමුදල් සංචලනය	තිරසාරත්ව සලකා බැලීම් බැංකුවේ අරමුදල් සපයා ගැනීම, ණය ලබාදීම සහ ප්‍රාග්ධන වෙළඳපළ ක්‍රියාකාරකම් තුළ වැඩි වශයෙන් ඒකාබද්ධ වෙමින් පවතින අතර, එමඟින් කළඹ විවිධාංගීකරණයට සහාය ලබාදෙමින් තිරසාර මූල්‍ය වටිනාකම් දාමය තුළ බැංකුවේ භූමිකාව තවදුරටත් ශක්තිමත් කරයි. වසර තුළදී බැංකුව “BOC Green Loans”, ජෙව භායනයට ලක්වන හර කාඩ්පත හඳුන්වා දීමත් සහ තිරසාරත්ව බැඳුම්කර නිකුත් කළ අතර, එයට අමතරව හරිත තැන්පතු සහ තිරසාර ණය නිෂ්පාදන අඛණ්ඩව පිරිනමනු ලැබීය.
අපේක්ෂිත බලපෑම්	
ආදායම සහ කළඹ වර්ධනය	තිරසාර මූල්‍ය නිෂ්පාදන සඳහා වැඩිවෙමින් පවතින ඉල්ලුම, තිරසාර ණය පහසුකම්වල වර්ධනය සහ ඒවාට අදාළ පොළී ආදායම් වැඩිවීම සඳහා සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තිරසාරත්ව බැඳුම්කර සහ තිරසාර ණය පහසුකම් ආදායම් මාර්ග විවිධාංගීකරණයට සහ ස්ථාවර කිරීමට දායක වනු ඇති අතර, තිරසාරත්ව අරමුණු සමඟ අනුකූලව දිගුකාලීන කළඹ වර්ධනය සඳහාද සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.
අරමුදල් සැපයීම සහ ප්‍රාග්ධන වෙළඳපළ ප්‍රවේශය	තිරසාරත්ව බැඳුම්කර නිකුත් කිරීම සහ තිරසාර තැන්පතු සංචලනය කිරීම මඟින් බැංකුවට තිරසාරත්වයට සම්බන්ධ අරමුදල් මූලාශ්‍රවලට ප්‍රවේශය වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමඟින් අරමුදල් මූලාශ්‍ර විවිධාංගීකරණයට සහාය ලබාදෙමින්, තිරසාරත්ව අරමුණු ඇති ආයෝජකයන් ආකර්ෂණය කරමින් ප්‍රාග්ධන වෙළඳපළ තුළ බැංකුවේ ස්ථානයද තවදුරටත් ශක්තිමත් කරයි.
ගනුදෙනුකරු සහ වෙළඳපළ ස්ථානගත කිරීම	නව්‍ය තිරසාර නිෂ්පාදන ඉදිරිපත් කිරීම මඟින් පරිසර සම්බන්ධයෙන් අවධානය යොමු කරන ගනුදෙනුකරුවන් සහ ආයෝජකයන් සමඟ සබඳතා ශක්තිමත් කිරීම, වෙළඳපළ ස්ථානගත වීම වැඩිදියුණු කිරීම සහ තිරසාරත්වය කේන්ද්‍ර කරගත් බණ්ඩ තුළ දිගුකාලීන ගනුදෙනුකරු ලබාගැනීම සහ රඳවා තබා ගැනීම සඳහා සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.
සංකේන්ද්‍රණය	
තිරසාර මූල්‍යකරණය	නව්‍ය තිරසාර බැංකුකරණ නිෂ්පාදන මඟින් ඇති වන දේශගුණය සම්බන්ධ අවස්ථා බැංකුවේ මූලික අඟය නිර්මාණය කරන ක්‍රියාකාරකම් තුළ සංකේන්ද්‍රණය වී ඇත. තිරසාර තැන්පතු, හරිත සහ තිරසාර ණය පහසුකම්, මෙන්ම තිරසාරත්ව බැඳුම්කර සංවර්ධනය කිරීම මඟින් තිරසාරත්වයට අනුකූල මූල්‍යකරණය වෙත යොමු වූ උපායමාර්ග සකස් කිරීමට සහාය වේ. මෙම වැඩසටහන් මඟින් පාරිසරික වශයෙන් තිරසාර ක්ෂේත්‍රවලට ඇති නිරාවරණය වැඩි කරමින් කළඹ විවිධාංගීකරණයට ද දායක වේ. තවද, තිරසාර මූල්‍ය නිෂ්පාදන පුළුල් කිරීම මඟින් බැංකුවේ වෙළඳපළ පැවැත්ම තවදුරටත් ශක්තිමත් වන අතර, තිරසාරත්වය කේන්ද්‍ර කරගත් ගනුදෙනුකරුවන් සහ ආයෝජකයන් වෙත ප්‍රවේශ වීමට හැකියාව සපයමින් තිරසාර මූල්‍ය වටිනාකම් දාමය තුළ බැංකුවේ ස්ථානය ද ශක්තිමත් කරයි.
උපායමාර්ගය සහ තීරණ ගැනීම	
ප්‍රතිචාර දැක්වීමේ සැලසුම්	
තිරසාර මූල්‍ය උපායමාර්ගය	බැංකුව තම ව්‍යාපාර උපායමාර්ගයේ මූලික කොටසක් ලෙස තිරසාර මූල්‍යකරණය ක්‍රමවත් ලෙස පුළුල් කිරීමට සැලසුම් කරයි. එයට පුනර්ජනනීය ශක්ති, හරිත සහ සමාජ ණය, හරිත ගොඩනැගිලි සහ ශක්ති කාර්යක්ෂමතා මූල්‍යකරණය, තිරසාර කෘෂිකර්මය, ජල සහ අප-ජල කළමනාකරණය, පිරිසිදු ප්‍රවාහනය, චක්‍රීය ආර්ථික නිෂ්පාදන, ආහාර ආරක්ෂණ වැඩසටහන්, හරිත නිවාස ණය සහ සමාජ-ආර්ථික බලපෑම් අවම කිරීමේ නිෂ්පාදන වැනි තිරසාර ණය නිෂ්පාදන සංවර්ධනය, ශක්තිමත් කිරීම සහ පුළුල් කිරීම ඇතුළත් වේ. එයට සමගාමීව, තිරසාර තැන්පතු නිෂ්පාදන හරහා අරමුදල් සපයා ගැනීම ශක්තිමත් කිරීමටත්, තේමාත්මක බැඳුම්කර මඟින් ප්‍රාග්ධන වෙළඳපළ තුළ බැංකුවේ පැවැත්ම වැඩිදියුණු කිරීමටත් බැංකුව සැලසුම් කරයි. මෙම වැඩසටහන් මඟින් බැංකුවේ වටිනාකම් දාමය තිරසාරත්වයට අනුකූල අරමුදල් සපයා ගැනීම, ණය ලබාදීම සහ ප්‍රාග්ධන වෙළඳපළ ක්‍රියාකාරකම් වෙත යොමු කිරීම නිරූපණය කරයි. නව්‍ය තිරසාර බැංකුකරණ නිෂ්පාදනවලින් උද්භව වන දේශගුණය සම්බන්ධ අවස්ථා සඳහා සහාය වීමට, බැංකුව විසින් තම පුළුල ESG රාමුව තුළ තිරසාරත්වයට සම්බන්ධ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) ස්ථාපිත කර ඇත.

CRRO 3 – නව්‍ය තිරසාර බැංකුකරණ නිෂ්පාදන	
සම්පත්කරණය	
නව්‍ය තිරසාර බැංකුකරණ නිෂ්පාදන සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීමට බැංකුව විසින් විශේෂිත සම්පත් වෙන් කර ඇත. තිරසාර බැංකුකරණ ඒකකයට කාර්ය මණ්ඩලය පත් කිරීම සහ තිරසාර හා හරිත මූල්‍යකරණය පිළිබඳ අභ්‍යන්තර හැකියාව ශක්තිමත් කිරීම සඳහා ඉලක්කගත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් මානව සම්පත්ද ශක්තිමත් කර ඇත. එමෙන්ම, තිරසාරත්ව බැඳුම්කරය වැනි මූල්‍ය මෙවලම් හරහා මූල්‍ය සම්පත් සංචලනය කරමින්, තිරසාර ණය පහසුකම් පුළුල් කිරීම සහ දේශගුණයට අනුකූල ආයෝජන ක්‍රියාකාරකම් සඳහා සහාය ලබා දීමට බැංකුව කටයුතු කරයි.	
ප්‍රගතිය	
හරිත තැන්පතු	2025 දෙසැම්බර් 31 වන විට හරිත තැන්පතු ශේෂය රු. මිලියන 78.9 ක් ලෙස වාර්තා විය.
හරිත මූල්‍ය ශේෂය	2025 දෙසැම්බර් 31 වන විට බැංකුවේ හරිත මූල්‍යකරණ කළඹ රු. බිලියන 10.2 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව 67% ක වර්ධනයකි.
තිරසාරත්ව බැඳුම්කර නිකුත් කිරීම	2025 වසරේදී බැංකුව රු. බිලියන 20.0 ක තිරසාරත්ව බැඳුම්කර හඳුන්වා දුන් අතර, එමඟින් තිරසාර අරමුදල් පදනම ශක්තිමත් කරමින් හරිත සහ සමාජ ව්‍යාපෘති පුළුල් කිරීමට සහාය ලබා දේ.
මූල්‍ය බලපෑම්	
වත්මන් මූල්‍ය වර්ෂයට බලපෑම්	තිරසාර ණය ශේෂය රු. බිලියන 73.0 (වැඩි විස්තර සඳහා මූල්‍ය ප්‍රකාශනවල සටහන 28.1 වෙත යොමු වන්න) හරිත තැන්පතු ශේෂය රු. මිලියන 78.9 (වැඩි විස්තර සඳහා මූල්‍ය ප්‍රකාශනවල සටහන 42 වෙත යොමු වන්න) තිරසාර ආයෝජන ශේෂය රු. බිලියන 20.0 (වැඩි විස්තර සඳහා මූල්‍ය ප්‍රකාශනවල සටහන 49.1 වෙත යොමු වන්න)
අපේක්ෂිත මූල්‍ය බලපෑම්	අන්තර්කාලීන සහන පිළිබඳ වැඩි විස්තර සඳහා පිටු 90 වෙත යොමු වන්න
ඊළඟ වාර්ෂික වාර්තාකරණ කාල සීමාව තුළ වත්කම් සහ වගකීම්වල වර්තමාන වටිනාකම් සඳහා ප්‍රමාණාත්මක ලෙස ගැලපීමේ අවදානම	සැලකිය යුතු ප්‍රමාණයේ ගැලපීම් අවශ්‍ය වන අවදානම් කිසිවක් හඳුනා ගෙන නොමැත.
දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව	
දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව	අන්තර්කාලීන සහන පිළිබඳ වැඩි විස්තර සඳහා පිටු 90 වෙත යොමු වන්න.
සිද්ධි විශ්ලේෂණය	අන්තර්කාලීන සහන පිළිබඳ වැඩි විස්තර සඳහා පිටු 90 වෙත යොමු වන්න.
විනිශ්චයන් සහ අවිනිශ්චිතතා	
විනිශ්චයන්	නව්‍ය තිරසාර බැංකුකරණ නිෂ්පාදනවලින් ඇතිවන දේශගුණය සම්බන්ධ අවස්ථා සම්බන්ධයෙන්, හරිත ලෙස සුදුසුකම් ලබන නිෂ්පාදන සහ නිරාවරණය හඳුනාගැනීමේදී බැංකුව වෘත්තීය විනිශ්චය යොදා ගනී. මේ සඳහා ප්‍රධාන මාර්ගෝපදේශ රාමුව ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දී ඇති හරිත වර්ගීකරණය භාවිතා කරනු ලැබේ. එමෙන්ම, ණය, තැන්පතු සහ ප්‍රාග්ධන වෙළඳපළ නිෂ්පාදන අතරින් දේශගුණය සම්බන්ධ අවස්ථාවන්ට දායක වන නිෂ්පාදන හඳුනාගැනීමේදී ද වෘත්තීය විනිශ්චය යොදා ගනු ලබයි. එහිදී එම නිෂ්පාදන බැංකුවේ ව්‍යාපාර ආකෘතිය, ගනුදෙනුකරුවන්ගේ ඉල්ලුම සහ තිරසාරත්ව අරමුණු සමඟ ඇති අදාළත්වයද සලකා බලනු ලැබේ.
අවිනිශ්චිතතා	තිරසාර මූල්‍යකරණයේ වර්ධනය වෙළඳපළ ඉල්ලුම, ගනුදෙනුකරුවන්ගේ සංක්‍රමණය සඳහා ඇති සූදානම, නියාමන වර්ධනයන් සහ පුළුල් ආර්ථික තත්ත්වයන් අනුව වෙනස් විය හැක. එමෙන්ම, මෙම නිෂ්පාදනවලින් ලැබෙන මූල්‍ය ප්‍රතිඵල සම්බන්ධයෙන්ද අවිනිශ්චිතතාව පවතී. ගනුදෙනුකරුවන්ගේ හැසිරීම්, මිලකරණ තත්ත්වයන් සහ ප්‍රතිපත්තිමය පෙළඹවීම්වල වෙනස්කම් හේතුවෙන්, තිරසාර මූල්‍යකරණ ක්‍රියාකාරකම් පුළුල් කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභවල පරිමාණය සහ කාලය බලපෑමට ලක් විය හැක.

අවදානම් කළමනාකරණය

බැංකුව දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා කළමනාකරණය කරනුයේ පවතින සමස්ත ව්‍යවසාය අවදානම් කළමනාකරණ (ERM) රාමුව හරහාය. මෙම ක්‍රියාවලිය අවදානම් හඳුනාගැනීම, ඇගයීම, ප්‍රමුඛතාව ලබාදීම සහ නිරීක්ෂණය කිරීම සඳහා ව්‍යුහගත ක්‍රමවේදයන් මගින් සහාය ලබයි.

මෙම ක්‍රියාවලිය පිළිබඳ අධීක්ෂණය කළමනාකරණ කමිටු සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) හරහා සිදු කරනු ලැබේ.

දේශගුණය සම්බන්ධ අවදානම් හඳුනාගැනීම සම්බන්ධ ක්‍රියාවලීන් සහ ප්‍රතිපත්ති

බැංකුව දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා (CRROs) හඳුනාගැනීම, ඇගයීම, ප්‍රමුඛතාව ලබාදීම සහ නිරීක්ෂණය කිරීම සඳහා අභ්‍යන්තරව සංවර්ධනය කරන ලද ක්‍රියාවලියක් භාවිතා කරයි. අවදානම් ඇගයීම ව්‍යුහගත දත්ත යෙදවුම්, නියමිත ඇගයීම් මාර්ගෝපදේශ සහ කාලානුරූප කමිටු සමාලෝචන මත පදනම් වේ.

දේශගුණය සම්බන්ධ අවදානම් හඳුනා ගැනීම සඳහා භාවිතා කරන යෙදවුම් සහ පරාමිතීන්

අවම අවදානම් හඳුනාගැනීමේ ක්‍රියාවලිය අභ්‍යන්තර මෙහෙයුම්, ණය, මූල්‍ය සහ සංක්‍රමණ සැලසුම්කරණයට අදාළ තොරතුරු මත පදනම් වන අතර, එයට අදාළ බාහිර දත්ත මූලාශ්‍ර මගින්ද සහාය ලබා දේ.

SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම්

අවදානම් කාණ්ඩය	අවදානම් වර්ගය	සලකා බැලූ ප්‍රධාන දත්ත	දත්ත මූලාශ්‍ර වර්ගය
භෞතික අවදානම්	දරුණු කාලගුණික සිදුවීම්	• ශාඛා මත ඇතිවූ අහිතකර කාලගුණ බලපෑම් පිළිබඳ වාර්තා • ශාඛා සහ පළාත් මට්ටමින් සිදුවූ භෞතික හානි සිදුවීම් • අහිතකර කාලගුණික සිදුවීම් හේතුවෙන් වසා දැමූ ශාඛා පිළිබඳ දත්ත සමුදාය (2023 සිට පවත්වාගෙන යනු ලබයි) • කාලගුණික බාධා හේතුවෙන් ඇතිවූ ව්‍යාපාරික අලාභ ඇස්තමේන්තු • දේශගුණික බලපෑම් හේතුවෙන් ගනුදෙනුකරුවන්ගේ ණය ගෙවීමේ පීඩනය පිළිබඳ දර්ශක • ගංවතුර අවදානම් ප්‍රදේශවල පිහිටි ශාඛා පිළිබඳ තොරතුරු • බලපෑමට ලක් වූ ප්‍රදේශවල කෘෂිකාර්මික ණය කළඹේ අලාභ ප්‍රතිශත • ශ්‍රී ලංකා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ගංවතුර සිතියම් • ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ තත්ත්ව වාර්තා	අභ්‍යන්තර වාර්තා බාහිර පොදු මූලාශ්‍ර
සංක්‍රාන්ති අවදානම්	කාබන් අවම කිරීමේ සංක්‍රාන්තිය හේතුවෙන් වියදම් වැඩිවීම	• ඉහළ විමෝචන ඇති ක්ෂේත්‍රවලට බැංකුවේ ණය කළඹේ නිරාවරණය • පරිශ්‍ර කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ සී/ස BOC ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම විසින් ලබා දෙන ශක්ති කාර්යක්ෂමතා සහ පද්ධති වැඩිදියුණු කිරීම සම්බන්ධ නිර්දේශ • කාබන් අවම කිරීමේ වැඩිදියුණු කිරීම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම් • මෙහෙයුම් සහ නඩත්තු වියදම්වල අපේක්ෂිත වෙනස්කම් • ඉහළ විමෝචන ක්‍රියාකාරකම්වලින් ඉවත්වීම හේතුවෙන් ආදායම් කෙරෙහි ඇති විය හැකි බලපෑම්	අභ්‍යන්තර කළඹ දත්ත අභ්‍යන්තර වාර්තා අභ්‍යන්තර පුරෝකථන අභ්‍යන්තර විශ්ලේෂණ

දේශගුණය සම්බන්ධ සිද්ධි විශ්ලේෂණය

දේශගුණය සම්බන්ධ සිද්ධි විශ්ලේෂණය, අනාගතමය අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා වැදගත් මෙවලමක් ලෙස බැංකුව හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, මෙම ක්‍රියාවලිය මේ වන විට ආරම්භක අදියරක පවතින අතර, එය තවමත් සාමාන්‍ය ආතති පරීක්ෂණ හෝ යහපාලන ක්‍රියාවලීන් තුළ සම්පූර්ණයෙන් ඒකාබද්ධ කර නොමැත.

මෙම ක්ෂේත්‍රයේ අභ්‍යන්තර හැකියාවන් සහ විශ්ලේෂණ ක්‍රමවේද ශක්තිමත් කිරීම සඳහා බැංකුව පියවර ගනිමින් සිටී. 2027 වසර සිට දේශගුණය සම්බන්ධ සිද්ධි විශ්ලේෂණය බැංකුවේ ආතති පරීක්ෂණ රාමුව තුළ ඒකාබද්ධ කරමින්, එහි ප්‍රධාන ප්‍රතිඵල අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාව ඇගයීමේ ක්‍රියාවලිය (ICAAP) තුළ පිළිබිඹු කිරීමට සැලසුම් කර ඇත.

දේශගුණය සම්බන්ධ සිද්ධි විශ්ලේෂණය - ප්‍රධාන කරුණු

- බැංකුව දේශගුණය සම්බන්ධ සිද්ධි විශ්ලේෂණය සඳහා රාමුවක් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටියි.
- 2027 මූල්‍ය වර්ෂයෙන් ආරම්භ කරමින් ප්‍රත්‍යාබල පරීක්ෂණ ක්‍රියාවලිය තුළ ක්‍රමයෙන් ඒකාබද්ධ කිරීම
- ප්‍රධාන ප්‍රතිඵල ICAAP ක්‍රියාවලීන් තුළ පිළිබිඹු කිරීම
- අදාළ අන්තර්කාලීන සහන කාලසීමාව තුළ සම්පූර්ණ අනුකූලතාව සිදු කිරීම.

අවදානම් තක්සේරුව

බැංකුව හඳුනාගත් දේශගුණය සම්බන්ධ අවදානම් ඇගයීමට ව්‍යුහගත ඇගයීම් රාමුවක් භාවිතා කරයි. සෑම අවදානමක්ම අවදානමේ ස්වභාවය, ඇතිවීමේ සම්භාවිතාව, මූල්‍ය බලපෑමේ ප්‍රමාණය සහ කාල පරාසය යන නියමිත පරාමිතීන් මත පදනම්ව ඇගයීමට ලක් කරනු ලබයි.

මෙම ක්‍රියාවලිය බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව සමඟ අනුකූල වන අතර, අභ්‍යන්තර මූල්‍ය ප්‍රමාණාත්මකභාවයේ සීමා මට්ටම් සමඟ සම්මත වීම තහවුරු කරයි. එමෙන්ම, අවදානම්වල ප්‍රමුඛතාව නියම කිරීම සහ යහපාලන අධීක්ෂණය සඳහාද මෙම ඇගයීම් ක්‍රියාවලිය සහාය ලබා දෙයි.

තක්සේරු සංරචකය	බැංකුව විසින් අනුගමනය කරන ලද ප්‍රවේශය
අවදානමේ ස්වභාවය	දේශගුණය සම්බන්ධ අවදානම් පහත පරිදි වර්ගීකරණය කර ඇත. • භෞතික අවදානම් (උදා: දරුණු කාලගුණික සිදුවීම්) • සංක්‍රාන්ති අවදානම් (උදා: කාබන් අවම කිරීමේ සංක්‍රාන්ති අවශ්‍යතා හේතුවෙන් වියදම් වැඩිවීම)
බලපෑම් සලකා බැලීම්	මෙම ඇගයීමේදී පහත කරුණු කෙරෙහි ඇති විය හැකි බලපෑම් සලකා බලයි; • බැංකුවේ මෙහෙයුම් • ගනුදෙනුකරුවන් • ණය කළඹ • වියදම් ව්‍යුහය • දිගුකාලීන අපේක්ෂාවන්

තක්සේරු සංරචකය	බැංකුව විසින් අනුගමනය කරන ලද ප්‍රවේශය
භෞතික අවදානම් ඇගයීම් දත්ත	• අහිතකර කාලගුණික සිදුවීම් හේතුවෙන් ශාඛා වසා දැමීමෙන් පසුගිය වසර තුන තුළ සිදුවූ මූල්‍ය අලාභ පිළිබඳ ඉතිහාසගත දත්ත • ගංවතුර අවදානම් ප්‍රදේශවල පිහිටි ශාඛා පිළිබඳ තොරතුරු • දේශගුණයට සංවේදී ප්‍රදේශවල කෘෂිකාර්මික ණය කළඹේ අලාභ ප්‍රතිශත
සංක්‍රාන්ති අවදානම් තක්සේරුව යෙදවුම්	• ඉහළ විමෝචන ඇති ක්ෂේත්‍රවලට ඇති කළඹ නිරාවරණය • සංක්‍රාන්තියට සම්බන්ධ වර්ධනයන් හේතුවෙන් ඇති විය හැකි වියදම් බලපෑම් පිළිබඳ පුරෝකථන
අවදානම ඇතිවීමේ හැකියාව	අවදානම් සම්භාවිතාව ස්ථර තුනක සම්භාවිතා පරිමාණයකින් ඇගයීමට ලක් කරනු ලැබේ. ● ඉහළ (61 - 100%) ● මධ්‍යම (41 - 60%) ● අඩු (0 - 40%) මෙම ශ්‍රේණිගත කිරීම ඉතිහාසගත දත්ත, නිරීක්ෂිත ප්‍රවණතා සහ කළමනාකරණ විශේෂඥ විනිශ්චය මත පදනම් වේ.
බලපෑමේ ප්‍රමාණය/ නිරාවරණය	මෙහෙයුම් ලාභය කෙරෙහි ඇති විය හැකි මූල්‍ය බලපෑම මත පදනම්ව, බැංකුවේ මූල්‍ය ප්‍රමාණාත්මකභාව මාර්ගෝපදේශ සමඟ අනුකූල වන නියමිත තීව්‍රතා සීමා මට්ටම් භාවිතා කරමින් ඇගයීමට ලක් කරයි. නිරාවරණය පහත ක්ෂේත්‍ර හරහා සලකා බලනු ලැබේ. • මෙහෙයුම් • ණය අවදානම • ප්‍රාග්ධන වියදම් • ලාභදායීත්වය
කාල පරාසය	වැඩි විස්තර සඳහා පිටු 89 වෙත යොමු වන්න.

අවදානම් ප්‍රමුඛතාව නියම කිරීම

දේශගුණය සම්බන්ධ අවදානම්, බැංකුවේ පවතින අභ්‍යන්තර අවදානම් ඇගයීම් සහ යහපාලන ක්‍රියාවලීන් අනුව ප්‍රමුඛතාව ලබාදී ඇගයීමට ලක් කරනු ලබයි. මෙම ක්‍රියාවලිය බැංකුව විසින් හඳුනාගත් අනෙකුත් සැලකිය යුතු අවදානම් ඇගයීමේ ක්‍රමවේදයන් සමඟ අනුකූල වේ.

අවදානම් සම්බන්ධ තොරතුරු, ව්‍යුහගත ඇගයීම් සහ යහපාලන සමාලෝචන සඳහා ඉදිරිපත් කිරීමට පෙර SLFRS S1 සහ S2 ක්‍රියාකාරී කණ්ඩායම හරහා ඒකාබද්ධ කරනු ලැබේ.

දේශගුණය සම්බන්ධ අවදානම් ප්‍රමුඛතාව නියම කිරීමේ ක්‍රියාවලිය

1. අවදානම් ඒකාබද්ධ කිරීම	දේශගුණය සම්බන්ධ අවදානම් තොරතුරු SLFRS S1 සහ S2 ක්‍රියාකාරී කණ්ඩායම හරහා අවදානම් කළමනාකරණ අංශය, මූල්‍ය හිඟුම්කරණ ඒකකය, තිරසාර බැංකුකරණ ඒකකය සහ අදාළ අනුබද්ධ සමාගම් වෙතින් රැස් කරනු ලැබේ.
2. අවදානම් ඇගයීම	හඳුනාගත් සෑම අවදානමක්ම පහත පරාමිතීන් මත පදනම්ව ඇගයීමට ලක් කරනු ලබයි. • අවදානම ඇතිවීමේ හැකියාව • මූල්‍ය බලපෑමේ තීව්‍රතාව • කාල පරාසය • ගුණාත්මක සලකා බැලීම් (කීර්තිනාම හා නීතිමය අවදානම් ඇතුළුව)
3. යහපාලන සමාලෝචනය	ඇගයීමට ලක් කළ අවදානම් විධිමත් යහපාලන සමාලෝචනයකට යොමු කරනු ලබන අතර, ප්‍රමුඛතාව සම්බන්ධ ප්‍රතිඵල කළමනාකරණ කමිටු විසින් සමාලෝචනය කර තහවුරු කරනු ලබයි. එය අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) විසින් අධීක්ෂණය කරනු ලබයි.
4. ERM හා ඒකාබද්ධ කිරීම	දේශගුණය සම්බන්ධ අවදානම් බැංකුවේ සමස්ත අවදානම් ඇගයීම් රාමුව තුළ අනෙකුත් අවදානම් කාණ්ඩ සමඟ එක්ව සලකා බලනු ලැබේ.

අධීක්ෂණය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියට සහ ප්‍රත්‍යාබල පරීක්ෂණ ප්‍රතිපත්තියට අනුකූලව, බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ රාමුව තුළ දේශගුණයට අදාළ අවදානම් නිරීක්ෂණය කරනු ලැබේ.

දේශගුණික අවදානම් තොරතුරු SLFRS S1 සහ S2 ක්‍රියාකාරී කණ්ඩායම විසින් ඒකාබද්ධ කරනු ලබන අතර, නිශ්චිත සම්භාවිතාව, තීව්‍රතාවය සහ කාල රේඛා නිර්ණායක භාවිතා කරමින් වරින් වර නැවත ඇගයීමට ලක් කෙරේ. කළමනාකරණ කමිටු හරහා නිරීක්ෂණ IRMC වෙත අධීක්ෂණය සඳහා යොමු කරනු ලැබේ.

SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම්

දේශගුණය සම්බන්ධ අවදානම් නිරීක්ෂණ රාමුව

අවදානම් රාමු ඒකාබද්ධ කිරීම	බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ ප්‍රත්‍යාබල පරීක්ෂණ ක්‍රියාවලීන් තුළ මෙම රාමුව ඒකාබද්ධ කර ඇත.
දත්ත ඒකාබද්ධ කිරීම	දේශගුණය සම්බන්ධ අවදානම් දත්ත SLFRS S1 සහ S2 ක්‍රියාකාරී කණ්ඩායම විසින් බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර කාර්යයන් වෙතින් රැස් කරනු ලැබේ.
නැවත ඇගයීම	අවදානම් ඇතිවීමේ හැකියාව, බලපෑමේ තීව්‍රතාව සහ කාල පරාසය යන මාර්ගෝපදේශ අනුව කාලානුරූපව නැවත ඇගයීමට ලක් කරනු ලැබේ.
ඉහළ මට්ටම් වෙත ඉදිරිපත් කිරීම	මෙහිදී, සොයාගැනීම් කළමනාකරණ කමිටු සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරනු ලැබේ.

නිරීක්ෂණ දර්ශක

දේශගුණය සම්බන්ධ අවදානම් නිරාවරණය සහ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා පහත දර්ශක භාවිතා කරනු ලැබේ.

නිරීක්ෂණ ක්ෂේත්‍රය	දර්ශකය
අවදානම් හඳුනාගැනීම	දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා හඳුනාගැනීම සහ වාර්තා කිරීම
කළඹ නිරාවරණය	මූල්‍ය බලපෑම තීරණය කිරීම සඳහා තෝරාගත් ණය කළඹ ඇගයීම
මෙහෙයුම් බලපෑම	ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍රවල දේශගුණ විපර්යාස බලපෑම් ඇගයීම
වත්කම් අගය විශ්ලේෂණය	දේශගුණ නිරාවරණය ඇගයීමට ප්‍රධාන භෞතික වත්කම්වල වත්කම් අගය විශ්ලේෂණය
අනාගත දිශානතිය සහිත ඒකාබද්ධ කිරීම	දේශගුණය සම්බන්ධ සිද්ධි විශ්ලේෂණය ආතති පරීක්ෂණ ක්‍රියාවලීන් තුළ ඇතුළත් කිරීම

පෙර වාර්තාකරණ කාලසීමාව සමඟ ඇති වෙනස්කම්

2025 වසර තුළ බැංකුව දේශගුණය සම්බන්ධ අවදානම් කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කරමින් පහත පියවර ගනු ලැබීය:

- දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා (CRROs) හඳුනාගැනීම, ඇගයීම, ප්‍රමුඛතාව ලබාදීම සහ නිරීක්ෂණය කිරීම සඳහා විධිමත් ක්‍රියාවලියක් හඳුන්වා දීම
- දේශගුණය සම්බන්ධ අවදානම් බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් තුළ ඇතුළත් කිරීම
- අවදානම ඇතිවීමේ හැකියාව, බලපෑමේ තීව්‍රතාව සහ කාල පරාසය යන සම්මත මාර්ගෝපදේශ යොදා ගැනීම
- දේශගුණය සම්බන්ධ අවදානම්වලින් ඇති විය හැකි බලපෑම් ඇගයීම සඳහා ආතති පරීක්ෂණයක් සිදු කිරීම

දේශගුණය සම්බන්ධ අවස්ථා හඳුනාගැනීම සම්බන්ධ ක්‍රියාවලීන් සහ ප්‍රතිපත්ති

දේශගුණය සම්බන්ධ අවස්ථා හඳුනාගැනීම, ඇගයීම, ප්‍රමුඛතාව ලබාදීම සහ නිරීක්ෂණය කිරීම සඳහා බැංකුව ව්‍යුහගත අභ්‍යන්තර ක්‍රියාවලියක් භාවිතා කරයි. මෙම ක්‍රියාවලිය බැංකුවේ තිරසාරත්ව අරමුණු සහ වර්ධනය වෙමින් පවතින නියාමන අපේක්ෂාවන් සමඟ අනුකූලව ක්‍රියාත්මක වේ.

දේශගුණය සම්බන්ධ අවදානම්වලට සමානවම, මෙම අවස්ථා සම්බන්ධ අධීක්ෂණය ද බැංකුවේ පවතින යහපාලන සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් තුළ ඇතුළත් කර ඇත.

සමස්ත අවදානම් කළමනාකරණය සමඟ ඒකාබද්ධ කිරීම

දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ අබණ්ඩ අවදානම් ඇගයීම් ක්‍රියාවලීන් තුළ ඇතුළත් කර ඇත.

(වැඩි විස්තර සඳහා පිටු 196-197 වෙත යොමු වන්න.)

මිනුම් සහ ඉලක්ක

දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා බැංකුවේ උපායමාර්ගික සැලසුම්කරණය, ණය අවදානම් කළමනාකරණය, ප්‍රාග්ධන වෙන්කිරීම සහ මෙහෙයුම් ඔරොත්තු දීමේ ක්‍රියාවලීන් තුළ සලකා බලනු ලැබේ. මෙම සලකා බැලීම් මඟින් දේශගුණය සම්බන්ධ වර්ධනයන් ණය ගුණාත්මකභාවය, යටිතල පහසුකම් ආයෝජන, කළඹ ව්‍යුහය සහ දිගුකාලීන අගය නිර්මාණය කෙරෙහි ඇති කළ හැකි බලපෑම පිළිගනී.

අන්තර් කර්මාන්ත පොදු මිනුම්

හරිතාගාර වායු (GHG) විමෝචන

සංවිධානික සහ මෙහෙයුම් සීමා

බැංකුව හරිතාගාර වායු (GHG) විමෝචන සඳහා සංවිධානික සහ මෙහෙයුම් සීමා නිර්වචනය කරනුයේ ISO 14064-1-2018 සහ හරිතාගාර වායු ප්‍රොටෝකෝලය අනුව වන අතර, ඒ සඳහා මූල්‍ය පාලන ප්‍රවේශය භාවිතා කරයි. මෙම ප්‍රවේශය අනුව බැංකුවේ මූල්‍ය පාලනය යටතේ පවතින මෙහෙයුම්වලින් ඇතිවන විමෝචන ගණනය කරනු ලැබේ.


වත්මන් වාර්තාකරණ චක්‍රය සඳහා, බැංකුවේ කාබන් පියසටහන ඇගයීම දේශීය මෙහෙයුම් ආවරණය කරන අතර අනුබද්ධ සමාගම් ද ඇතුළත් වේ. කෙසේ වෙතත්, මෙම වාර්තාකරණ කාලසීමාව සඳහා විදේශීය මෙහෙයුම් ඇතුළත් කර නොමැත.

බැංකුව විසින් විෂය පථය (Scope) 1 සහ විෂය පථය 2 විමෝචන මිනුම් කර ඇත. SLFRS S1 සහ S2 යටතේ ලබාදෙන අදාළ අන්තර්කාලීන සහන විධිවිධාන අනුව, මෙම වාර්තාකරණ කාලසීමාව සඳහා Scope 3 විමෝචන ඇතුළත් කර නොමැත.

හරිතාගාර වායු මිනුම් ක්‍රමවේදය

හරිතාගාර වායු විමෝචන, ISO 14064-1:2018 සහ සහ හරිතාගාර වායු ප්‍රොටෝකෝලය අනුව මිනුම් කරනු ලැබේ. CO_2, CH_4 සහ N_2O වායු විමෝචන CO_2e ලෙස පරිවර්තනය කිරීම සඳහා IPCC හයවන ඇගයීම් වාර්තාවේ ප්‍රකාශිත ගෝලීය උණුසුම් වීමේ විභව (GWP) අගයන් භාවිතා කරනු ලැබේ.

එමෙන්ම, විමෝචන ගණනය කිරීමේදී IPCC වාර්තාවට අනුකූල විමෝචන සාධක යොදා ගනු ලැබේ.



GHG ඇගයීම අවසන් කිරීමෙන් පසු, බැංකුවේ GHG සංචිතය ස්වාධීන තෙවන පාර්ශවයක් විසින් සත්‍යාපනයට ලක් කරන ලදී. මෙය වාර්තා කරන ලද විමෝචන දත්තවල නිවැරදිභාවය සහ විශ්වසනීයතාවය පිළිබඳ අමතර සහතිකයක් ලබා දේ.

හරිතාගාර වායු (GHG) විමෝචන සාරාංශය

විෂය පථය (Scope)	2025 ($MtCO_2e$)
Scope 1	1,251.9
Scope 2	11,187.7
එකතුව	**12,439.6**

හරිතාගාර වායු Scope 1 සහ Scope 2 විමෝචන

විස්තරය	හරිතාගාර වායු විමෝචනය 2025 ($MtCO_2e$)		
	Scope 1	Scope 2	එකතුව
ඒකාබද්ධ ගිණුම්කරණ සමූහය	1,251.9	11,187.7	12,439.6
වෙනත් ආයෝජිත ආයතන (අනුබද්ධ ආයතනවල ආයෝජන)	අදාළ නැත	අදාළ නැත	අදාළ නැත
එකතුව (මූල්‍ය පාලන ප්‍රවේශය)	**1,251.9**	**11,187.7**	**12,439.6**

හරිතාගාර වායු මිනුම්වල මූලාශ්‍ර

විමෝචන පරාසය	විමෝචන උප කාණ්ඩය	ක්‍රියාකාරකම්	දත්ත මූලාශ්‍රය	විමෝචන සාධක මූලාශ්‍රය	GWP අගයන්ගේ මූලාශ්‍රය
Scope 1	ස්ථාවර දහනය	ජෙනරේටර් යන්ත්‍ර	අයකිරීම් ගිණුම් පොත් / ඉන්ධන මිලදී ගැනීම් වාර්තා	IPCC - 2006	IPCC 6 වන වාර්තාව
Scope 1	ජංගම දහනය	සමාගමට අයත් වාහන, සේවක ගමන් (ගෙවීම් සහිත), ව්‍යාපාරික ගමන් - කුලී පදනම්න්	ඉන්ධන කාඩ්පත්/ මධ්‍යගත දත්ත සමුදාය	IPCC - 2006	IPCC 6 වන වාර්තාව
Scope 1	කාන්දුවීම් මගින් ඇතිවන විමෝචන	ශීතකාරක වායු කාන්දුවීම්, ගිනි නිවාරණ උපකරණ, ආහාර පිසීමට භාවිතා වන ගෑස්	සේවා සපයන්නන්ගේ දත්ත සමුදාය	IPCC - 2006	IPCC 6 වන වාර්තාව
Scope 2	විදුලි බල පරිභෝජනය	ජාල විදුලිය	විදුලි බිල්පත්	ශ්‍රී ලංකා ශක්ති සමතුලිතතා වාර්තාව 2022 - ශ්‍රී ලංකා තිරසාර ශක්ති අධිකාරිය	IPCC 6 වන වාර්තාව

SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම්

දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා පිළිබඳ නිරාවරණය

දේශගුණය සම්බන්ධ භෞතික අවදානම් (CRRO 1)	දේශගුණය සම්බන්ධ භෞතික අවදානම්වලට නිරාවරණය වන වත්කම් හෝ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල ප්‍රතිශතය පිළිබඳ ප්‍රමාණාත්මක ඇගයීමක් බැංකුව විසින් සිදු කර නොමැත.
දේශගුණය සම්බන්ධ සංක්‍රාන්ති අවදානම් (CRRO 2)	දේශගුණය සම්බන්ධ සංක්‍රාන්ති අවදානම්වලට නිරාවරණය වන වත්කම් හෝ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල ප්‍රතිශතය පිළිබඳ ප්‍රමාණාත්මක ඇගයීමක් සිදු කර නොමැත.
දේශගුණය සම්බන්ධ අවස්ථා (CRRO 3)	දේශගුණය සම්බන්ධ අවස්ථා බැංකුවේ තිරසාර මූල්‍යකරණ ක්‍රියාකාරකම් පුළුල් කිරීම තුළ පිළිබිඹු වන අතර, එයට පහත කරුණු ඇතුළත් වේ. • හරිත ණය (රු. බිලියන 10.2) • හරිත තැන්පතු (රු. මිලියන 78.9) • තිරසාර ණය පහසුකම් සඳහා සහාය වීමට නිකුත් කරන ලද තිරසාරත්ව බැඳුම්කරය (රු. බිලියන 20.0) මෙම ක්‍රියාකාරකම් මඟින් කාබන් අවම කිරීමේ සහ පාරිසරික වශයෙන් තිරසාර ව්‍යාපෘති සඳහා මූල්‍ය සපයමින්, දේශගුණයට අනුකූල මූල්‍ය වෙළඳපොළ තුළ බැංකුවේ සහභාගීත්වය ශක්තිමත් කරයි.
ප්‍රාග්ධන යෙදවීම	වාර්තාකරණ කාලසීමාව තුළ දේශගුණය සම්බන්ධ ප්‍රාග්ධන යෙදවීම් ලෙස ශාඛා ජාලය පුරා නවීකරණ ශක්ති ස්ථාපන සිදු කර ඇති අතර, එහි සමස්ත වියදම රු. මිලියන 149.6 කි. දේශගුණයට අනුකූල ප්‍රාග්ධන වෙන්කිරීම, බැංකුවේ පුළුල් ප්‍රාග්ධන සැලසුම්කරණය සහ මූල්‍යකරණ ක්‍රියාවලීන් තුළ ආවරණය කරනු ලබයි. අභ්‍යන්තර නිරීක්ෂණ ක්‍රමවේද වර්ධනය වීමත් සමඟ, දේශගුණය සම්බන්ධ ප්‍රාග්ධන වියදම් පිළිබඳ ප්‍රමාණාත්මක වර්ගීකරණය ඉදිරි වාර්තාකරණ කාලසීමාවන් තුළ තවදුරටත් ශක්තිමත් කිරීමට සැලසුම් කර ඇත.
අභ්‍යන්තර කාබන් මිලකරණය	බැංකුව අභ්‍යන්තර කාබන් මිලකරණ ක්‍රමවේදයක් භාවිතා නොකරයි. ශ්‍රී ලංකාවේ පවතින නියාමන පරිසරය අනුව, අනිවාර්ය කාබන් මිලකරණය හෝ විමෝචන වෙළඳාම් පද්ධතියක් ක්‍රියාත්මක නොවීම ඊට හේතු වේ.
ප්‍රතිලාභ සහ වැටුප්	දේශගුණය සම්බන්ධ මිනුම් අධ්‍යක්ෂ මණ්ඩලය හෝ විධායක කළමනාකරණයේ වැටුප් ව්‍යුහය සමඟ සම්බන්ධ කර නොමැත.

කර්මාන්තයට විශේෂිත මිනුම්

තිරසාර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලයේ (SASB) දර්ශකය

වාණිජ බැංකු සඳහා වන තිරසාර ගිණුම්කරණ ප්‍රමිතිය (අනුවාදය 2023-12)

වගුව 1: තිරසාර අනාවරණ මාතෘකා සහ මිනුම්

මාතෘකාව	මිනුම්	වර්ගය	මිනුම් ඒකකය	කේතය	පිටු යොමුව/ අනාවරණය
දත්ත ආරක්ෂාව	(1) දත්ත උල්ලංඝන සිදුවීම් සංඛ්‍යාව, (2) පුද්ගලික දත්ත සම්බන්ධ උල්ලංඝනවල ප්‍රතිශතය, (3) බලපෑමට ලක් වූ ගිණුම් හිමියන්ගේ සංඛ්‍යාව	ප්‍රමාණාත්මක	සංඛ්‍යාව, ප්‍රතිශතය (%)	FN-CB-230a.1	පිටුව 151
	දත්ත ආරක්ෂාවට සම්බන්ධ අවදානම් හඳුනාගැනීම සහ ඒවා කළමනාකරණය කිරීම සඳහා භාවිතා කරන ප්‍රවේශය පිළිබඳ විස්තරය	විස්තර සහ විශ්ලේෂණ	අදාළ නොවේ	FN-CB-230a.2	පිටු 151-152
මූල්‍ය ඇතුළත්කරණය සහ ධාරිතා වර්ධනය	(1) කුඩා ව්‍යාපාර සහ ප්‍රජා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්මාණය කරන ලද වැඩසටහන් යටතේ සුදුසුකම් ලබන ණය පහසුකම් සංඛ්‍යාව සහ (2) ණය ශේෂ ප්‍රමාණය	ප්‍රමාණාත්මක	සංඛ්‍යාව වාර්තාකරණ මුදල් ඒකකය	FN-CB-240a.1	පිටු 78-79
	(1) කුඩා ව්‍යාපාර සහ ප්‍රජා සංවර්ධනය සඳහා නිර්මාණය කරන ලද වැඩසටහන් යටතේ සුදුසුකම් ලබන පසුගිය කාලය ඉක්මවා ඇති ණය, අක්‍රිය ණය හෝ සහන ලබා දී ඇති ණය පහසුකම් සංඛ්‍යාව සහ (2) ප්‍රමාණය	ප්‍රමාණාත්මක	සංඛ්‍යාව වාර්තාකරණ මුදල් ඒකකය	FN-CB-240a.2	පිටුව 136
	බැංකු සේවා නොලබන හෝ සීමිත ලෙස ලැබෙන ගනුදෙනුකරුවන් සඳහා ලබා දෙන ගාස්තු රහිත බැංකු ගිණුම් සංඛ්‍යාව	ප්‍රමාණාත්මක	සංඛ්‍යාව	FN-CB-240a.3	පිටුව 24
	බැංකු සේවා නොලබන, සීමිත ලෙස ලැබෙන හෝ ප්‍රමාණවත් සේවා නොලැබෙන ගනුදෙනුකරුවන් සඳහා පැවැත්වූ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්වලට සහභාගී වූ පුද්ගලයන්ගේ සංඛ්‍යාව	ප්‍රමාණාත්මක	සංඛ්‍යාව	FN-CB-240a.4	පිටුව 137
ණය විශ්ලේෂණය තුළ ESG සාධක ඇතුළත් කිරීම	ණය විශ්ලේෂණය තුළ පාරිසරික, සමාජීය සහ යහපාලන (ESG) සාධක ඇතුළත් කිරීම සඳහා භාවිතා කරන ප්‍රවේශය පිළිබඳ විස්තරය	විස්තර සහ විශ්ලේෂණ	අදාළ නොවේ	FN-CB-410a.2	පිටුව 80

මාතෘකාව	මිනුම්	වර්ගය	මිනුම් ඒකකය	කේතය	පිටු යොමුව/ අනාවරණය
මූල්‍ය විමෝචන	Scope 1, Scope 2 සහ Scope 3 අනුව වෙන්කර දැක්වූ සමස්ත මූල්‍ය විමෝචන	ප්‍රමාණාත්මක	මෙට්‍රික් ටොන් (t) CO_2-e	FN-CB-410b.1	මූල්‍ය විමෝචන අනාවරණ සඳහා බැංකු SLFRS 2 යටතේ ලබාදෙන වසර දෙකක අන්තර්කාලීන සහනය භාවිතා කරනු ඇත.
	එක එක් කර්මාන්ත සඳහා වත්කම් කාණ්ඩ අනුව සමස්ත නිරාවරණය	ප්‍රමාණාත්මක	වාර්තාකරණ මුදල් ඒකකය	FN-CB-410b.2	
	මූල්‍යකරණය කරන ලද විමෝචන ගණනය කිරීම තුළ ඇතුළත් කර ඇති සමස්ත නිරාවරණයේ ප්‍රතිශතය	ප්‍රමාණාත්මක	ප්‍රතිශතය (%)	FN-CB-410b.3	
	මූල්‍යකරණය කරන ලද විමෝචන ගණනය කිරීම සඳහා භාවිතා කරන ක්‍රමවේදය පිළිබඳ විස්තරය	විස්තර සහ විශ්ලේෂණ	අදාළ නොවේ	FN-CB-410b.4	
ව්‍යාපාරික ආචාරධර්ම	වංචා, ඇතුළාන්ත තොරතුරු භාවිතයෙන් ගනුදෙනු කිරීම, සංගත විරෝධී, තරඟකාරී විරෝධී හැසිරීම්, වෙළඳපළ හැසිරවීම, අවප්‍රයෝග, වෘත්තීය අක්‍රමිකතා හෝ මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ නීති හා නියාමන උල්ලංඝන සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග හේතුවෙන් සිදුවූ මුදල් අලාභවල සමස්ත ප්‍රමාණය	ප්‍රමාණාත්මක	වාර්තාකරණ මුදල් ඒකකය	FN-CB-510a.1	පිටුව 177
	විසිල්-බ්ලෝවර් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි පිළිබඳ විස්තරය	විස්තර සහ විශ්ලේෂණ	අදාළ නොවේ	FN-CB-510a.2	පිටුව 177
පද්ධතිමය අවදානම් කළමනාකරණය	ගෝලීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකුව (G-SIB) කාණ්ඩයට අයත් ද යන වග	ප්‍රමාණාත්මක	පදනම් අංක	FN-CB-550a.1	ලංකා බැංකුව G-SIB ලෙස නම් කර නොමැති අතර, එය D- SIB ලෙස හඳුනාගෙන ඇත. පිටුව 10
	අනිවාර්ය සහ ස්වේච්ඡා ආතති පරීක්ෂණවල ප්‍රතිඵල ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාව සැලසුම්කරණය, දිගුකාලීන ආයතනික උපායමාර්ගය සහ අනෙකුත් ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළ ඒකාබද්ධ කිරීම සඳහා භාවිතා කරන ප්‍රවේශය පිළිබඳ විස්තරය	විස්තර සහ විශ්ලේෂණ	අදාළ නොවේ	FN-CB-550a.2	පිටු 201-202

වගුව 2: ක්‍රියාකාරී මිනුම්

ක්‍රියාකාරී මිනුම්	වර්ගය	මිනුම් ඒකකය	කේතය	පිටු යොමුව/ අනාවරණය
(1) ජංගම සහ ඉතිරි කිරීමේ ගිණුම් සංඛ්‍යාව සහ (2) වටිනාකම, පහත කාණ්ඩ අනුව (අ) පුද්ගලික සහ (ආ) කුඩා ව්‍යාපාර	ප්‍රමාණාත්මක	සංඛ්‍යාව, වාර්තාකරණ මුදල් ඒකකය	FN-CB-000.A	පිටුව 338 වාණිජ සංවේදීතාව හේතුවෙන් බැංකුව තැන්පතු ගිණුම් සංඛ්‍යාව අනාවරණය නොකරයි.
(1) ණය ගිණුම් සංඛ්‍යාව සහ (2) වටිනාකම, පහත කාණ්ඩ අනුව (අ) පුද්ගලික, (ආ) සුළු ව්‍යාපාර, සහ (ඇ) ආයතනික	ප්‍රමාණාත්මක	සංඛ්‍යාව, වාර්තාකරණ මුදල් ඒකකය	FN-CB-000.B	පිටුව 294 වාණිජ සංවේදීතාව හේතුවෙන් බැංකුව ණය ගිණුම් සංඛ්‍යාව අනාවරණය නොකරයි.

SLFRS තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය හෙළිදරව් කිරීම්

දේශගුණයට අදාළ ඉලක්ක

හරිතාගාර වායු විමෝචනයට අදාළ ඉලක්කය

CRRO 2 - කාබන් අවම කිරීමේ සංක්‍රාන්ති අවශ්‍යතා හේතුවෙන් වියදම් වැඩිවීම

කාණ්ඩය	අනාවරණය
මිනුම/ KPI	බැංකුවට අයත් ශාඛා 128 ක් සඳහා සූර්ය විදුලි (Solar - PV) පද්ධති ස්ථාපනය කිරීම
අරමුණ	පුනර්ජනනීය ශක්තිය භාවිතය වැඩි කිරීම මගින් මෙහෙයුම් (Scope 2) හරිතාගාර වායු විමෝචන අවම කිරීම
විෂය පථය	දේශීය ශාඛා ජාලය තුළ බැංකුවට අයත් ශාඛා 128 කට අදාළ වේ.
කාල සීමාව	2023 - 2027
මූලික වසර	2023 (ශාඛා 53 ක් සූර්ය බලයෙන් බලගැන්වී තිබුණි)
අන්තර්කාලීන ඉලක්ක සහ සන්ධිස්ථාන	2024 ශාඛා 20 2025 ශාඛා 28
ඉලක්ක වර්ගය	ප්‍රමාණාත්මක (සම්පූර්ණ කිරීම මත පදනම් වූ ඉලක්ක)
ජාතික ප්‍රතිපත්ති සමඟ අනුකූලතාව	මෙම ඉලක්කය ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් තීරණය කළ දායකත්වයන් (NDCs) සමඟ අනුකූල වේ. එයට 2030 වන විට විදුලි නිෂ්පාදනයෙන් 70% ක් පුනර්ජනනීය ශක්ති මූලාශ්‍රවලින් ලබා ගැනීමේ ජාතික අරමුණද ඇතුළත් වේ. බැංකුවේ ශාඛා සූර්යකරණ වැඩසටහන මගින් මෙහෙයුම් තුළ නවීකරණ ශක්තිය භාවිතය වැඩි කරමින් මෙම සංක්‍රමණයට සහාය දක්වන අතර, පවතින ප්‍රතිපත්ති දිශානතිය සහ නියාමන රාමුව සමඟද අනුකූල වේ.
සත්‍යාපනය	මෙම ඉලක්කය සහ ක්‍රමවේදය තෙවන පාර්ශ්වයකින් සත්‍යාපනය කර නොමැත.
ප්‍රගතිය නිරීක්ෂණය සඳහා මාපක	වාර්ෂික ප්‍රගතිය අභ්‍යන්තරව සමාලෝචනය කර වාර්ෂික වාර්තාව තුළ අනාවරණය කරනු ලැබේ.
ප්‍රගතිය නිරීක්ෂණය සඳහා මිනුම්	1. සූර්ය බලයෙන් බලගැන්වී ඇති බැංකුවට අයත් ශාඛා සංඛ්‍යාව 2. සූර්ය PV පද්ධති ස්ථාපිත කර ඇති බැංකුවට අයත් ශාඛා ප්‍රතිශතය 3. ස්ථාපිත කළ සමස්ත සූර්ය ශක්ති ධාරිතාව 4. නිෂ්පාදිත සමස්ත සූර්ය විදුලි ශක්තිය
සංශෝධන	වාර්තාකරණ කාලසීමාව තුළ ඉලක්කයට කිසිදු සංශෝධනයක් සිදු කර නොමැත.
වසර තුළ ලබාගත් ප්‍රගතිය සහ වසර අවසාන තත්ත්වය	වාර්තාකරණ කාලසීමාව තුළ බැංකුවට අයත් ශාඛා 28 ක් සූර්ය බලශක්තිකරණය කර ඇති අතර, 2027 වන විට ශාඛා 128 ක් සූර්ය බලශක්තිකරණය කිරීමේ ඉලක්කය වෙත ප්‍රගතියක් ලබාගෙන ඇත.



කළමනාකරණ සාකච්ඡා හා විශ්ලේෂණය

කාර්යසාධනය හා ව්‍යාපාරික විශ්වාසය

ආර්ථික, සමාජීය, ඩිජිටල්, මානව, පාරිසරික හා යහපාලන යන සියලු ක්ෂේත්‍ර ඔස්සේ, ලද අනර්ඝ අත්දැකීම් අර්ථවත් ක්‍රියාමාර්ග බවට පරිවර්තනය කරමින්, බැංකුව පාර්ශ්වකරුවන්ට සහ ජාතියේ ප්‍රගතියට නව දිශානතීන් සපයයි.

රූබික් ඝනකයක් නිවැරදිව විසඳීම සඳහා සමස්ත රූපය පැහැදිලිව දැකීම, කොටස් එකිනෙක සම්බන්ධ වන ආකාරය ගැඹුරින් අවබෝධ කර ගැනීම සහ සෑම පියවරක්ම නිරවද්‍යතාවයෙන් සහ සැලසුම් සහගතව ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

මූල්‍ය සමාලෝචනය



උපායමාර්ගික දැක්ම මූල්‍ය ශක්තියට පරිවර්තනය කිරීම

බැංකුවේ මූල්‍ය ප්‍රාග්ධනය යනු කොටස්හිමියා, අරමුදල් සපයන්නන් සහ තැන්පත්කරුවන් විසින් බැංකුවට සපයා ඇති මූල්‍ය සම්පත් වන අතර, එය බැංකුවේ ස්ථාවරත්වය සහ වර්ධනය සඳහා මූලික පදනම ලෙස ක්‍රියා කරයි. මෙම මූල්‍ය ප්‍රාග්ධනය මඟින් බැංකුවට ණය ලබාදීමට, උපායමාර්ගික ප්‍රමුඛතා සඳහා ආයෝජනය කිරීමට සහ අවදානම් අවශෝෂණය කර ගැනීමට හැකියාව ලැබේ. එසේම, ශක්තිමත් ශේෂ පත්‍රයක් පවත්වාගෙන යමින්, විනයගරුක ප්‍රාග්ධන විභජනය සහ සුපරීක්ෂාකාරී කළමනාකරණය හරහා බැංකුවේ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සහ දිගුකාලීන තිරසාර වටිනාකම් නිර්මාණය කිරීම සඳහා සහාය ලබාදේ.

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

බදු පසු ලාභය:
රු. බිලියන **76.0**
(2024: රු. බිලියන 64.4)

මුළු වත්කම්:
රු. ට්‍රිලියන **5.5**
(2024 රු. ට්‍රිලියන 4.9)

කොටස්හිමියාගේ හිමිකම
රු. බිලියන **365.8**
(2024 රු. බිලියන 302.6)

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය **16.9%**
(2024: 16.6%)

ගනුදෙනුකාර අත්දැකීම් වල විශිෂ්ටත්වය

තැන්පතු වර්ධනය **4%**
(2024: 8%)

CASA අනුපාතය **33.2%**
(2024: 27.0%)

ශුද්ධ පොළී ආදායම
රු. බිලියන **206.9**
(2024: රු. බිලියන 167.6)

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

කාඩ්පත් කළඹෙන් ලැබූ ගාස්තු ආදායම් වර්ධනය
18%
(2024: 25%)

ශාඛා බැංකු සේවාවලින් ලැබූ ගාස්තු ආදායම් වර්ධනය
30%
(2024: 45%)

ණය සංස්කෘතිය හා ගුණාත්මක ණය කළඹ

මුළු ණය හා අත්තිකාරම් වර්ධනය **9%**
(2024: -1%)

අදියර 3 ණය අනුපාතය
5.6%
(2024: 7.2%)

අදියර 3 ප්‍රතිපාදන ආවරණය
57.9%
(2024: 53.6%)

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩනැඟීම

ආදායමට සාපේක්ෂ පිරිවැය අනුපාතය
33.0%
(2024: 40.1%)

එක් සේවකයෙකුගෙන් ජනිත වන ආදායම
රු. මිලියන **61.6**
(2024: රු. මිලියන 59.1)

මෙම මූල්‍ය ප්‍රාග්ධන පරිච්ඡේදය පුරා වසර තුළ බැංකුවේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ සම්පූර්ණ විශ්ලේෂණයක් ඉදිරිපත් කරයි. එය, බැංකුවේ උපායමාර්ග සහ අනෙකුත් ප්‍රාග්ධන අතර ඇති අන්තර් ක්‍රියා හරහා මූල්‍ය යෙදවුම්, පාර්ශ්වකරුවන් සඳහා තිරසාර සහ දිගුකාලීන ප්‍රතිලාභ බවට පරිවර්තනය වූ ආකාරය පැහැදිලි කරයි. මෙම පරිච්ඡේදය සම්පූර්ණයෙන්ම අවබෝධ කර ගැනීමට, එය මෙහෙයුම් සන්දර්භය (පිටු 52 සිට 56 දක්වා) සහ ව්‍යාපාර අංශවල කාර්යසාධනය (පිටු 115 සිට 131 දක්වා) යන පරිච්ඡේද සමඟ එකට කියවීමෙන් හා විශ්ලේෂණය කිරීමෙන් වසර තුළ සිදු වූ වටිනාකම් නිර්මාණය පිළිබඳ සම්පූර්ණ සහ සවිස්තරාත්මක අවබෝධයක් ලබා ගත හැක.

මෙහෙයුම් සන්දර්භය


වසර පුරා මෙහෙයුම් පරිසරය සාමාන්‍යයෙන් හිතකරව පැවති අතර, වැඩිදියුණු වෙමින් තිබූ සාර්ව ආර්ථික තත්ත්වයන් සහ ශක්තිමත් වූ ආයෝජක විශ්වාසය මඟින් එයට සහාය ලැබුණි. මෙය පහත දර්ශක මඟින් පැහැදිලිව දැක්වේ.

දර්ශක	බැංකුව වෙත බලපෑම	දර්ශක	බැංකුව වෙත බලපෑම
ආර්ථික වර්ධනය	▲	රාජ්‍ය මූල්‍ය තත්ත්වය	▲
පොළී අනුපාත	▲	බාහිර ක්ෂේත්‍ර කාර්යසාධනය	▲
උද්ධමනය	▲	දේශගුණික වෙනස්වීම් වල භෞතික අවදානම්	▼
තැන්පතු සහ අරමුදල් සඳහා තරඟය	▼	නව නීති හා නියාමන	●


▲ ධනාත්මක ▼ සෘණාත්මක ● මධ්‍යස්ථ

උපායමාර්ගික ගම්‍යතාවය, ශක්තිය සහ ස්ථාවරත්වය

වසර තුළ බැංකුව ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් පෙන්නුම් කළේය. එය ප්‍රධාන වශයෙන් පොළී ආදායමේ ශක්තිමත් වර්ධනය, ආදායම් පදනමේ විවිධාංගීකරණය සහ සම්පත් ගුණාත්මකභාවය විචක්ෂණව පවත්වා ගැනීම මත පදනම් විය. ඒ සමඟ, තැන්පතු වර්ධනය සහ අරමුදල් මූලාශ්‍රවල විවිධාංගීකරණය මගින් මූල්‍ය ස්ථාවරත්වය තවදුරටත් ශක්තිමත් කරන ලදී. නියාමන අනුකූලතාවන්ට වඩා ඉහළින් ප්‍රාග්ධන සංරක්ෂක පවත්වාගෙන යමින්, බැංකුව ඉදිරි වසරවල තිරසාර වර්ධනය සඳහා ශක්තිමත් හා ස්ථාවර පදනමක් සකස් කර ඇත. පහත රූප සටහනේ දැක්වෙන්නේ පොළී, ගාස්තු සහ කොමිස් ආදායම, වෙළඳ සහ අනෙකුත් ආදායම් වැනි ප්‍රධාන මූලාශ්‍රවලින් ලැබෙන ආදායම් ප්‍රවාහයන්, රජයට බදු ගෙවීම් වලින් පසුව, තැන්පත්කරුවන්ට සහ ණය හිමියන්ට පොළී වියදම, සේවක වියදම් සහ සැපයුම්කරුවන්ට ගෙවීම් හරහා පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිලාභ බවට පරිවර්තනය වූ ආකාරයයි.



සැන්කි රූප සටහන මඟින් වසර තුළ බැංකුව විසින් වටිනාකම් ජනනය කළ ආකාරය පිළිබඳ දෘශ්‍ය නිරූපණයක් සපයයි. එක් එක් ප්‍රවාහයේ සාපේක්ෂ පළල සම්බන්ධ වන ප්‍රමාණයන්හි විශාලත්වය පිළිබිඹු කරන අතර, බැංකුව විසින් නිර්මාණය කරන ලද වටිනාකම පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිලාභ බවට පරිවර්තනය වූ ආකාරය පාඨකයින්ට පැහැදිලිව තේරුම් ගැනීමට හැකියාව ලබා දෙයි.



මූල්‍ය කාර්යසාධනය

පද්ධතිමය වශයෙන් වැදගත් මූල්‍ය ආයතනයක් සහ ජාතියේ බැංකුකරු ලෙස ලංකා බැංකුව, රටේ දිගුකාලීන ආර්ථික සමෘද්ධිය සහ සමාජ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කර තිරසාර සංවර්ධනයක් කරා ගමන් කරන අතරම, පාර්ශ්වකරුවන්ට ශක්තිමත් මූල්‍ය ප්‍රතිලාභ ලබාදෙමින් ද්විත්ව වගකීමක් සහිතව ක්‍රියාත්මක වේ. තවද, ජාතියේ වඩාත්ම ලාභදායී ආයතනයක් ලෙස තම ස්ථානය පවත්වා ගැනීමට බැංකුවට ඇති හැකියාව ද විශේෂයෙන් කැපී පෙනේ.

අරමුදල් මත පදනම් වූ ආදායම

බැංකුවේ අරමුදල් මත පදනම් වූ ආදායම යනු ණය හා අත්තිකාරම් වලින් ලැබෙන පොළී ආදායම සහ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වන පොළී ආදායමයි. බැංකුවේ පොළී ආදායම, මුළු ආදායමෙන් 90% ක් නියෝජනය කරමින්, 8% ක වාර්ෂික වර්ධනයක් සහිතව රු. බිලියන 496.2 දක්වා වැඩිවිය. මේ සඳහා පොළී උපයන වත්කම් 10% කින් ප්‍රසාරණය වීම බලපෑවේය. ණය හා අත්තිකාරම් මත ලැබුණු පොළී ආදායම, මුළු පොළී ආදායමෙන් 49% ක් වූ අතර, පෙර වසරේ එය 55% ක් විය.

එසේ වුවද, බැංකුවේ ආයෝජන උපායමාර්ග දක්ෂතා සහ ආදායම් පදනම වැඩිදියුණු කිරීම මත ආයෝජන පොළී ආදායම 21% කින් ඉහළ ගියේය.

මේ අතර, පොළී වියදම් 2% කින් අඩු වී රු. බිලියන 289.2 ක් වූ අතර, තැන්පතු පදනම 4% කින් ඉහළ ගියද තැන්පතු මත ගෙවූ පොළී වියදම් 4% කින් අඩු විය. මෙය තැන්පතු නැවත ප්‍රතිමිලකරණය කිරීමේ පහළ යාම මෙන්ම ජංගම ඉතුරුම් අනුපාතය පෙර වසරේ 27.0% සිට 33.2% දක්වා පුළුල් කිරීමට බැංකුවට ඇති හැකියාව පිළිබිඹු කරයි. පොළී වියදම්හි ප්‍රශස්තකරණය මඟින් බැංකුවේ අරමුදල් පදනමේ උපායමාර්ගික සංයෝජනය පිළිබිඹු වන අතර ඒ අනුව ණය ගැනුම් මත අරමුදල් සම්පාදනය පුළුල් විය. එම නිසා, බැංකුවේ ශුද්ධ පොළී ආදායම 24% කින් වර්ධනය වී රු. බිලියන 206.9 දක්වා ඉහළ ගියේය. මෙයට ක්‍රියාකාරී වත්කම්-වගකීම් කළමනාකරණය, අරමුදල් පදනම සහ ආදායම් උපයන වත්කම් සහ අරමුදල් මූලාශ්‍රවල විවිධාංගීකරණය උපකාරී විය.

ශුද්ධ පොළී ආන්තිකය 2024 දී 3.6% සිට 2025 දී 4.0% දක්වා ඉහළ ගොස් තිබීම, මිල නියම කිරීමේ විනය සහ කාලෝචිත ප්‍රතිමිලකරණය කිරීමේ ක්‍රියාමාර්ගයන්හි සාර්ථකත්වය පෙන්වයි.

අරමුදල් නොවන ආදායම


අරමුදල් නොවන ආදායම පෙර වසරට සාපේක්ෂව දෙගුණයට වැඩියෙන් ඉහළ ගොස් රු. බිලියන 39.9 දක්වා ළඟා විය. 2024 දී එය රු. බිලියන 14.5 ක් විය. ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීම කෙරෙහි බැංකුව අවධානය යොමු කළ අතර, එහි ප්‍රතිඵල ලෙස ගාස්තු හා කොමිස් ආදායම 17% කින් වර්ධනය වී රු. බිලියන 35.7 ක් විය. මෙය, හර කාඩ්පත් හා ණය කාඩ්පත් කළඹේ පුළුල් ප්‍රවේශය හේතුවෙන් 18% කින් වර්ධනය වීමත්, ඩිජිටල් නවෝත්පාදන සහ සේවා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම හේතුවෙන් පුද්ගල බැංකු සේවා ගාස්තු ආදායම 30% කින් වැඩිවීමත් නිසා සිදු විය.

ගාස්තු හා කොමිස් වියදම් 29% කින් ඉහළ ගොස් රු. බිලියන 12.6 දක්වා වැඩිවිය. එහි ප්‍රතිඵලයක් ලෙස, ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම 12% කින් වර්ධනය වී රු. බිලියන 23.1 ක් විය.

මූල්‍ය සමාලෝචනය

විදේශ විනිමය වෙළඳාමෙන් ලද ශුද්ධ වෙළඳ ලාභය රු. බිලියන 5.8 ක් විය. ඒ සමඟ, කොටස්, ඒකක භාරකාර අරමුදල් සහ ණය උපකරණවල ආයෝජන මත උපලබ්ධි නොවූ ශුද්ධ ලාභය රු. බිලියන 1.6 ක් (2024: රු. බිලියන 1.5) විය. මූල්‍ය වත්කම් හඳුනාගැනීමෙන් ඉවත් කිරීමෙන් ලද ශුද්ධ ලාභය රු. බිලියන 1.7 ක් වූ අතර, 2024 දී එය රු. බිලියන 3.6 ක ශුද්ධ අලාභයක් විය. අනෙකුත් මෙහෙයුම් ආදායම රු. බිලියන 7.6 ක් වූ අතර, එයට විදේශ විනිමය ලාභ, ලාභාංශ ආදායම සහ කුලී ආදායම ඇතුළත් විය.

අරමුදල් නොවන ආදායම



මුළු මෙහෙයුම් ආදායම

බැංකුවේ මුළු මෙහෙයුම් ආදායම 36% කින් වර්ධනය වී රු. බිලියන 246.8 ක් විය. එයට අරමුදල් පදනම් වූ හා අරමුදල් පදනම් නොවූ ආදායම් මාර්ග දෙකම බලපා ඇත. ශුද්ධ පොළී ආදායම මුළු මෙහෙයුම් ආදායමෙන් 84% ක් වූ අතර, 2024 දී එය 92% ක් විය.

අරමුදල් නොවන ආදායම් වලින් ලැබෙන දායකත්වය වැඩිවීම, ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායමේ ශක්තිමත් ගමනාගමනයක් පිළිබිඹු කරන අතර, අනෙකුත් අරමුදල් නොවන මූලාශ්‍ර වලින් ලැබෙන දායකත්වයන් වැඩිවීමත් සමඟ, වඩාත් විවිධාංගීකරණය වූ සහ ඔරොත්තු දෙන ආදායම් පැතිකඩක් ගොඩනැඟීමේ බැංකුවේ ප්‍රගතිය අවධාරණය කරයි.

හානිකරණ ප්‍රතිපාදන සහ අනෙකුත් අලාභ

වසර තුළ වඩාත් හිතකර සාර්ව ආර්ථික පරිසරයක් පැවති අතර, එය ආපසු ණය ගෙවීම් ප්‍රවණතා ශක්තිමත් කිරීමට සහ ගුණාත්මකභාවය දියුණු කිරීමට හේතු විය. ඒ සමඟ, අයකර ගැනීමේ වැඩසටහන්, ව්‍යාපාර පුනර්ජීවකරණය සහ ශක්තිමත් ණය නිරීක්ෂණය, ණය අවදානම් දර්ශක ස්ථාවර කිරීමට උපකාරී විය. තනි පුද්ගල වශයෙන් වැදගත් ණය (ISL) ගනුදෙනුකරුවන් ත්‍රිත්ව-ස්ථර ඇගයීම් ක්‍රියාවලියක් හරහා කාර්තුමය වශයෙන් විශ්ලේෂණය කරන ලදී. ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශයේ, ණය අවදානම් අංශය විසින් ISL ගනුදෙනුකරුවන් ස්වාධීනව තක්සේරු කරන ලදී. මෙය අලාභ හඳුනාගැනීමේ දෘශ්‍යතාවය වැඩි කළේය. මෙම ප්‍රවේශය හේතුවෙන්, අදියර 3 ණය අනුපාතය 7.2% සිට 5.6% දක්වා පහළ ගියේය.


බැංකුව, අපේක්ෂිත ණය අලාභ (ECL) රාමුව යටතේ විනයගත ප්‍රතිපාදන ප්‍රවේශයක් අනුගමනය කළේය. අනාගත ණය අලාභ අවශෝෂණය කිරීමට ප්‍රමාණවත් සංරක්ෂක පවත්වාගෙන ගියේය. ඒ අනුව, සිදුවිය හැකි අලාභ ද දිට්වා සුළි කුණාටුවෙන් ඇති වූ බලපෑම ද සැලකිල්ලට ගන්නා ලදී. ඒ අනුව, ණය සහ අත්තිකාරම් සඳහා මුළු හානිකරණ ප්‍රතිපාදනය රු. බිලියන 20.7 ක් වූ අතර එය 2024 රු. බිලියන 12.4 ක් වූ අගයට සාපේක්ෂව 66% ක වර්ධනයකි. 2024 වසරේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් වීම (විශේෂයෙන් ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර සම්බන්ධව) හේතුවෙන් පෙර වසරේදී ආයෝජන සම්බන්ධයෙන් රු. බිලියන 32.8 ක හානිකරණ ප්‍රතිපාදන ප්‍රතිවර්ත්‍ය කිරීමක් සිදු කලද මෙම වසරේදී, ආයෝජන සහ අනෙකුත් අලාභ සඳහා රු. මිලියන 445.1 ක ශුද්ධ අලාභ ප්‍රතිපාදනයක් වෙන් කර ඇත.

ඒ අනුව, ණය, ආයෝජන සහ අනෙකුත් අලාභ සඳහා වසර පුරා ඇති සමස්ත අලාභ ප්‍රතිපාදනය රු. බිලියන 21.1 ක් ලෙස වාර්තා වී ඇත. මෙය පෙර වසරේ වාර්තා වූ රු. බිලියන 20.3 ක ශුද්ධ ප්‍රතිවර්තනයට ප්‍රතිවිරුද්ධ තත්ත්වයකි.

මෙහෙයුම් වියදම්

2025 දී ආදායමට පිරිවැය අනුපාතය පසුගිය වසරේ පැවති 40% සිට 33% දක්වා අඩු වී ඇත. මෙය බැංකුවේ ආදායම් වර්ධනය, මෙහෙයුම් වියදම් වැඩිවීමකට වඩා වේගයෙන් ඉහළ ගොස් ඇති බවත්, ඵලදායී වියදම් කළමනාකරණයක් පවතින බවත් පෙන්වා දෙයි. මුළු වියදම් වැඩිවීම, ගනුදෙනුකාර අත්දැකීම් වැඩිදියුණු කිරීම සහ ඩිජිටල් තාක්ෂණ වර්ධනය කිරීම වැනි බැංකුවේ උපායමාර්ගික අරමුණු සමඟ සම්බන්ධ වේ. ඒ සඳහා තාක්ෂණ වේදිකා, මානව සම්පත්, සහ සේවා යටිතල පහසුකම් මත විශේෂ ආයෝජන සිදු කිරීමෙන්, වසර තුළ මුළු මෙහෙයුම් වියදම් 9% කින් වැඩි වී, රු. බිලියන 73.0 දක්වා ඉහළ ගොස් ඇත.

මෙහෙයුම් පිරිවැය



වඩාත්ම වැදගත් පිරිවැය සංරචකය ලෙස පවතින සේවක වියදම්, කුසලතා සහ ධාරිතා ගොඩනැඟීම සහ කාර්යසාධන පෙළගැස්ම සඳහා අඛණ්ඩ ආයෝජන පිළිබිඹු කරමින් 13% කින් ඉහළ ගොස් රු. බිලියන 45.7 ක් විය. ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම් වසර තුළ රු. මිලියන 828.0 කින් වැඩි වී රු. බිලියන 5.0 ක් විය. පරිපාලන වියදම් සහ ස්ථාවර වත්කම් නඩත්තු වියදම් ඇතුළත් අනෙකුත් මෙහෙයුම් වියදම් ආන්තික වශයෙන් 2% කින් අඩු වී රු. බිලියන 22.3 ක් විය. මෙය විකල්ප වියදම් සම්බන්ධයෙන් වැය පාලනය පවත්වාගෙන යාම පෙන්නුම් කරයි.


බදුකරණය GRI 207-1

බැංකුව විසින් රජයට කරන ලද අඛණ්ඩ බදු දායකත්වය, ශක්තිමත් මූල්‍ය ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යමින් ජාතික රාජ්‍ය ආදායමට දක්වන වැදගත් දායකත්වය අවධාරණය කරයි. ආදායම් බදු, මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බදු (VAT) සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) ඇතුළුව, මෙම වසර සඳහා බැංකුවේ මුළු බදු වියදම රු. බිලියන 76.7 ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 8% ක වැඩිවීමකි. වසර තුළ 37% ක ඵලදායී ආදායම් බදු අනුපාතයක් සමඟ, මූල්‍ය සේවා සඳහා බදු 12% කින් රු. බිලියන 31.9 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර, ඉහළ මෙහෙයුම් ලාභයට අනුකූලව ආදායම් බදු 5% ක වාර්ෂික වර්ධනයක් සහිතව රු. බිලියන 44.8 ක් ලෙස සටහන් විය.

ලාභදායිතාවය

සමාලෝචිත වසර තුළ, බදු පෙර ලාභය 13% කින් වැඩි වී රු. බිලියන 120.8 ක් දක්වා ඉහළ ගොස් ඇත. එසේම, බදු පසු ලාභය 18% කින් වැඩි වී රු. බිලියන 76.0 ක් වී ඇත. මෙය ශක්තිමත් මූලික ආදායම් සහ සංයමවත් මූල්‍ය කළමනාකරණය ප්‍රදර්ශනය කරයි. එමෙන්ම, බැංකුව වත්කම් මත ප්‍රතිලාභය 2.3% ක් සහ හිමිකම් මත ප්‍රතිලාභය 22.7% ක් ලෙස වාර්තා කර ඇත. මෙය කොටස් හිමියන්ට උසස් ප්‍රතිලාභ ලබාදීමට බැංකුවට ඇති හැකියාවත්, ඒ සමඟම ජාතික වගකීම් ඉටු කිරීමේ හැකියාවත් අවධාරණය කරයි.

ලාභදායීත්වය



අනෙකුත් විස්තීර්ණ ආදායම්

වසර තුළ, බැංකුවේ අනෙකුත් විස්තීර්ණ ආදායම්හි ශුද්ධ අලාභය රු. බිලියන 7.8 ක්වා අඩු වූ අතර එය 2024 දී වාර්තා වූ රු. බිලියන 12.1 ක ශුද්ධ අලාභයට සාපේක්ෂව රු. බිලියන 4.3 ක අඩු වීමකි. මෙය ප්‍රධාන වශයෙන් 2024 දී රු. බිලියන 1.8 ක විනිමය අලාභයන්ට සාපේක්ෂව රු. මිලියන 577.3 ක් වූ විදේශ මෙහෙයුම් පරිවර්තනයෙන් ඇති වූ විනිමය ලාභ මගින් සිදු විය. මේ අතර, වසර තුළ විනිමය හුවමාරු ගනුදෙනු පියවීම හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව මුදල් ප්‍රවාහ හෙජ් පාඩු වල රු. බිලියන 2.9 කට ආසන්න අඩුවීමක් සිදු වූ අතර එමඟින් අනෙකුත් විස්තීර්ණ ආදායම් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති විය. තවද, බැංකුව එහි විශ්‍රාමික ප්‍රතිලාභ සැලසුම් මත රු. බිලියන 13.1 ක ශුද්ධ ආයුගණක අලාභයක් වාර්තා කළ අතර එය පෙර වසරට සාපේක්ෂව 5% ක වාර්ෂික අඩුවීමක් වාර්තා කළේය.

මූල්‍ය ශක්තිය සහ ස්ථාවරත්වය


වත්කම්

බැංකුවේ තරඟකාරිත්ව හැකියාව ශක්තිමත් කරමින් සහ දේශීය බැංකු ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස එහි ස්ථානය තවදුරටත් තහවුරු කරමින්, වසර තුළ මුළු වත්කම් 10% කින් වර්ධනය වී රු. ට්‍රිලියන 5.5 ක මට්ටමට ළඟා විය. ස්ථාවර මෙහෙයුම් පරිසරයක් තුළ ශේෂ පත්‍ර වර්ධනය වත්කම් ප්‍රසාරණය මගින් පිළිබිඹු විය. ණය සහ අනෙකුත් ආයෝජනවල උපායමාර්ගික වැඩිවීමක් මගින් වර්ධනය ප්‍රධාන වශයෙන් සිදු වූ අතර එය 11% කින් වර්ධනය වී රු. ට්‍රිලියන 2.7 ක් වූ අතර ශුද්ධ ණය සහ අත්තිකාරම් 9% කින් ඉහළ ගොස් රු. ට්‍රිලියන 2.4 ක් විය. වත්කම් මිශ්‍රය, ණය සහ අනෙකුත් ආයෝජන උපකරණ වෙත නැඹුරු වූ අතර එය මුළු වත්කම් වලින් 48% ක් වූ අතර පෙර වසරේ 44% ක් ව පැවතුණි. ශුද්ධ ණය සහ අත්තිකාරම් 2025 දී මුළු වත්කම් වලින් 43% ක් නියෝජනය කළේය. මෙම සමානුපාතික නැවත සමායෝජනය මඟින් බැංකුවේ විනයගරුක වත්කම් වෙන්කිරීමේ ප්‍රවේශය පෙන්වයි. එය වැඩි විවිධාංගීකරණයක් හරහා කළඹ ස්ථාවරත්වය වැඩි කරමින්, ආදායම් උපයාගැනීමේ හැකියාවද ආරක්ෂා කරයි.

ණය සහ අත්තිකාරම්

බැංකු කර්මාන්තයේ විශාලතම ණය කළඹ බැංකුව විසින් කළමනාකරණය කරමින්, ඉහළම වෙළඳපළ කොටස හිමි කරගෙන, කර්මාන්තයේ නායකත්වය තවදුරටත් ශක්තිමත් කරයි. වසරේ මුල් භාගයේදී මධ්‍යස්ථ වර්ධනයක් පෙන් වුවද උපායමාර්ගික ලෙස සැලසුම් ගත වැඩි වර්ධනයක් අග භාගයේදී ප්‍රදර්ශනය විය. මෙය වෙළඳපළ අවස්ථා භාවිතා කරමින්, ඒ සමඟම අවදානම් කළමනාකරණය සුරක්ෂිතව පවත්වාගෙන යාම සඳහා බැංකුව අනුගමනය කරන සංයමවත් සහ ශිෂ්ට ප්‍රවේශය පිළිබිඹු කරයි.

වත්කම් සංයුතිය




වසර තුළ බැංකුවේ දළ ණය සහ අත්තිකාරම් රු. බිලියන 218.1 කින් වර්ධනය වී රු. ට්‍රිලියන 2.7 ක් දක්වා ළඟා වූ අතර එය පිළිබිඹු කරන්නේ විනයගරුක ණය ප්‍රමිතීන් පවත්වා ගනිමින් ආර්ථිකයේ ඵලදායී අංශවලට සහාය වීම සඳහා බැංකුවේ අඛණ්ඩ කැපවීමයි.

බැංකුව කර්මාන්තයේ විශාලතම ණය සහ අත්තිකාරම් කළඹ පාලනය කරමින්, තම වෙළඳපළ ප්‍රමුඛතා ස්ථානය තවදුරටත් පවත්වාගෙන ගොස් ඇත. 2025 වසරේ පළමු අර්ධයේදී බැංකුව සාවධාන වර්ධන උපායමාර්ගයක් අනුගමනය කළ අතර, වසරේ අවසාන භාගය වෙත යාමේදී ක්‍රමයෙන් ව්‍යාප්ති වේගය වැඩි කළේය. මුළු ණයවලින් 53% ක් කාලීන ණය වූ අතර, ඒවා වසර තුළ 4% කින් වර්ධනය විය. මෙම දිගුකාලීන මූල්‍ය සැපයුමට දක්වන අඛණ්ඩ අවධානය, ආර්ථිකයේ ප්‍රාග්ධන නිර්මාණය සහ ආර්ථික ක්‍රියාකාරකම් ඉදිරියට ගෙන යාමේදී බැංකුවේ භූමිකාව අවධාරණය කරයි. පුද්ගලික අංශයට ලබාදුන් ණය 16% කින්

මූල්‍ය සමාලෝචනය

වර්ධනය වූ අතර, එය ව්‍යාපාර නැවත සක්‍රීය කිරීම සහ ව්‍යවසාය වර්ධනය සඳහා බැංකුව දක්වන දායකත්වය තහවුරු කරයි. මෙයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට ලබාදුන් ණය ඇතුළත් වූ අතර එහි 28% ක වාර්ෂික වර්ධනයත් සමඟ රු. බිලියන 319.9 දක්වා ඉහළ ගොස් ඇත. මෙය බැංකුවේ සමානාත්මක වර්ධනය සහ ව්‍යවසායක පරිසරය පෝෂණය කිරීම සඳහා ඇති කැපවීම පෙන්වයි. එසේම, පුද්ගල ණය ඇතුළු පාරිභෝගික ණය වසර තුළ සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර, එය ගෘහස්ථ හා සුළු ව්‍යාපාරිකයන්ට අවශ්‍ය තත්කාලීන ද්‍රවශීලතා සහාය ලබාදීමේදී බැංකුවේ භූමිකාව පිළිබිඹු කරයි.

රජයට සහ රජය සතු ව්‍යවසායන් වෙත නිරාවරණය 2% කින් අඩු වී ඇති අතර එය මුළු ණය කළඹෙන් 29% ක් වන අතර එය 2024 අවසානයේ 32% ක් විය. සමස්තයක් වශයෙන් ණය කළඹ ප්‍රශස්ත විවිධාංගීකරණයක් පිලිබිඹු කළ අතර සමාගම්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ පෞද්ගලික ව්‍යවසාය ආදී, විවිධ කර්මාන්ත ක්ෂේත්‍ර ගණනාවක් අතර සමානුපාතික නිරාවරණයක් පවත්වාගෙන යයි.




වත්කම්වල ගුණාත්මකභාවය

වසර තුළ ආර්ථික මූලික අංග ශක්තිමත් වීම සහ ක්‍රමයෙන් ස්ථාවර වන මෙහෙයුම් පසුබිමක, වත්කම් ගුණාත්මක දර්ශක වැඩිදියුණු විය. කෙසේ වුවද, විශේෂයෙන්ම 'දිට්වා' සුළි කුණාටුවෙහි අහිතකර බලපෑම ඇතුළු විශේෂ බාධා වලින් ඇති විය හැකි අවදානම් සැලකිල්ලට ගනිමින්, බැංකුව අලාභ ප්‍රතිපාදන සම්බන්ධයෙන් සවිඥානික ප්‍රතිපත්තියක් අනුගමනය කළේය.

විශේෂයෙන් කේවල වශයෙන් ප්‍රමාණාත්මක ණය (ISL) ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් සැලකිය යුතු ණය අවදානම පිළිබඳ දැඩි ඇගයීමක් සිදු කරන ලදී. ගිණුම්කරණ ප්‍රමිතීන්හි අවශ්‍යතාවලට අනුකූලව, අලාභ ලක්ෂණ සඳහා සාක්ෂි පෙන්වූ ණය පහසුකම් සුදුසු පරිදි ඉහළ අදියර වලට සංක්‍රමණය කරන ලදී. භාවිතා වන ක්‍රමවේදයන් හරහා සම්පූර්ණයෙන්ම පිළිබිඹු නොවන නැඟී එන අවදානම් විසඳීම සඳහා කළමනාකරණ ආවරණ බැංකුව විසින් පවත්වාගෙන යන ලදී, ඉහළ අවදානම් සහිත කර්මාන්තවල නිරාවරණයන් අදියර 2 වෙත පූර්වගාමීව සංක්‍රමණය කරන ලදී, ඒ සමඟම 'දිට්වා' සුළි කුණාටුවෙන් පැන නඟින විභව ණය පාඩු අවම කිරීම සඳහා නිශ්චිත ප්‍රතිපාදන ද හඳුනා ගන්නා ලදී.

අදියර 1 යටතේ හානිකරණ ප්‍රතිපාදන 39% කින් වැඩි වී ඇති අතර, දිට්වා සුළි කුණාටුවෙන් ඇති විය හැකි බලපෑම සඳහා විචක්ෂණශීලීව පදනම් වූ ප්‍රතිපාදන සහ ණය වර්ධනය වැඩි වීම හේතුවෙන්, 2 වන අදියර ප්‍රතිපාදන 28% කින් ඉහළ ගොස් ඇති අතර, එය අඩු ක්‍රියාකාරී නිරාවරණයන් සඳහා ශක්තිමත් කරන ලද සවාරක්ෂක පෙන්නුම් කරයි. අදියර 3 යටතේ හානිකරණ ප්‍රතිපාදන 2% ක මධ්‍යස්ථ වැඩිවීමක් වාර්තා කර ඇති අතර, එය දැනටමත් හඳුනාගෙන ඇති දුර්වල ණය සඳහා ස්ථාවර වත්කම් ආවරණයක් පිළිබිඹු කරයි.

වසර තුළ අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීම අඛණ්ඩව සිදු වූ අතර ඒ යටතේ හිඟ පහසුකම් කිහිපයක් සලකා බලන ලදී. කෙසේ වෙතත්, බැංකුව විචක්ෂණශීලී ප්‍රවේශයක් අනුගමනය කර ඇති අතර මෙම පහසුකම් සඳහා වන ප්‍රතිපාදන තවමත් ප්‍රතිවර්ත්‍ය කර නොමැති අතර ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු අධීක්ෂණය අවසන් කිරීමේදී සලකා බලනු ලැබේ. මෙම විචක්ෂණශීලී පියවර තිබියදීත්, වසර තුළ වත්කම් ගුණාත්මක මිනුම් වැඩිදියුණු විය. අදියර 3 ණය අනුපාතය 2024 දී 7.2% සිට 5.6% දක්වා පහත වැටුණි. එය ප්‍රතිසාධන සහ නැවත අය කර ගැනීමේ මූලපිරීම් සහ විනයගරුක ණය අධීක්ෂණයේ කාර්යක්ෂමතාව පිළිබිඹු කරයි. මේ අතර, අදියර 3 ප්‍රතිපාදන ආවරණ අනුපාතය 57.9% දක්වා ශක්තිමත් කර ඇති අතර එමඟින් බැංකුවේ ක්‍රියාශීලී ප්‍රතිපාදන දර්ශනය සහ කළඹ ගුණාත්මක විනය පෙන්නුම් කර ඇත.



අරමුදල් ව්‍යුහය


බැංකුවේ අරමුදල් ව්‍යුහය වසර පුරා ප්‍රධාන වශයෙන් ගනුදෙනුකාර තැන්පතු මත රඳා පැවති අතර, එමඟින් මුළු වත්කම් වලින් 80% ක් සඳහා අරමුදල් සැපයුණි. මෙය බැංකුවේ පුළුල් භූගෝලීය තත්ත්වය, ස්ථාපිත කාර්යසාධන ඉතිහාසය සහ ගනුදෙනුකාර සබඳතා වල ශක්තිය පිළිබිඹු කරයි. වසර තුළ, බැංකුව ප්‍රශස්ත අරමුදල් මිශ්‍රයක් උපායමාර්ගිකව පවත්වාගෙන ගිය අතර, වෙනත් ණය ගැනීම් 2025 අවසානය වන විට වත්කම් පදනමේ 8% කට අරමුදල් සැපයීමට දායක විය.

තැන්පතු

ගනුදෙනුකාර තැන්පතු මෙම වසර මුළුල්ලේම බැංකුවේ අරමුදල් සපයන ප්‍රධාන උපායමාර්ගය ලෙස පැවති අතර, සමස්ත තැන්පතු 4% කින් වර්ධනය වී රු. ට්‍රිලියන 4.4 දක්වා ඉහළ ගියේය. මෙම වර්ධනය, බැංකුවේ තැන්පතු වල ශක්තිය පිළිබිඹු කරන අතර, එහි පුළුල් භූගෝලීය පියසටහන, සන්නාමය කෙරෙහි විශ්වාසය පවත්වා ගැනීම සහ ඩිජිටල් හැකියාවන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම මගින් ගනුදෙනුකාර පහසුව ඉහළ නංවයි. විශේෂයෙන්, ජංගම සහ ඉතුරුම් තැන්පතු 28% කින් ශක්තිමත් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ජංගම සහ ඉතුරුම් තැන්පතු අනුපාතය පෙර වසරේ 27.0% සිට 33.2% දක්වා වැඩිදියුණු වූ අතර එමඟින් බැංකුවේ අඩු වියදම් අරමුදල් පදනම ශක්තිමත් විය. බැංකුව විසින් අනුගමනය කරන ලද නිශ්චිත උපායමාර්ගයට අනුව, කාලීන තැන්පතු වසර පුරා 5% කින් අඩු විය. එය තැන්පතු

සංයෝජනය වඩාත් විස්තරාත්මක සහ වියදම්-කාර්යක්ෂම අරමුදල් මූලාශ්‍ර වෙත සැලකිලිමත් ලෙස නැවත සමාන්තර කිරීමක් ලෙස දක්නට ලැබේ. මේ අතර, විදේශ මුදල් තැන්පතු වසර තුළ 8% කින් වර්ධනය වී රු. බිලියන 918.8 දක්වා ඉහළ ගියේය. විදේශගත ශ්‍රී ලාංකික සමාජය ලංකා බැංකුව කෙරෙහි තබා ඇති විශ්වාසය එයින් පිළිබිඹු වේ.

තැන්පතු සංයුතිය %



ද්‍රවශීලතාවය


බැංකුවේ වත්කම් සහ වගකීම් කමිටු (ALCO) රාමුව සහ ස්ථාපිත අභ්‍යන්තර ක්‍රියා පටිපාටි හරහා පූර්වගාමී අධීක්ෂණයත් සමඟ, වසර පුරා ද්‍රවශීලතා කළමනාකරණය කෙරෙහි කේන්ද්‍රීය අවධානයක් යොමු කරන ලදී. වසර තුළ ණය වර්ධනය, තැන්පතු වර්ධනය අභිබවා ගියද, විනයගරුක අරමුදල් උපායමාර්ග සහ විචක්ෂණශීලී ශේෂ පත්‍ර කළමනාකරණය තුළින් බැංකුව ප්‍රමාණවත් ද්‍රවශීලතා ආරක්ෂණය සාර්ථකව පවත්වා ගෙන ගියේය. ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය 156.6% ක ශක්තිමත් මට්ටමක පැවති අතර එය නියාමන අවම අවශ්‍යතාවය වන 100% ට වඩා බෙහෙවින් වැඩි වූ අතර, සියලුම මුදල් වර්ග සඳහා ද්‍රවශීලතා ආවරණ අනුපාතය 260.4% ක් ලෙස පවත්වා ගෙන ගිය අතර එය අවම නියාමන අවශ්‍යතාවය වන 100% ට වඩා සැලකිය යුතු ලෙස වැඩි විය. මෙය බැංකුවේ ශක්තිමත් කොටිකාළීන ද්‍රවශීලතා තත්ත්වය සහ විභව අරමුදල් ආතතීන්ට විරෙහිව ඔරොත්තු දීමේ හැකියාව අවධාරණය කරයි.

ප්‍රාග්ධනය

ප්‍රාග්ධන කළමනාකරණය බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) සහ ව්‍යුහගත ප්‍රාග්ධන වැඩි කිරීමේ සැලැස්ම මඟින් අඛණ්ඩව මාර්ගෝපදේශනය දෙන ලදී. එමඟින්, වර්ධනය වන අවදානම් පරිසරය සහ නියාමන අපේක්ෂාවන්ට සමානුපාතිකව ප්‍රාග්ධන ආරක්ෂක පවත්වා ගැනීම සහතික කරන ලදී. මුළු කොටස් හිමිකම 21% කින් වැඩි වී රු. බිලියන 365.8 දක්වා ඉහළ ගිය අතර, එයට ප්‍රධාන වශයෙන් ශක්තිමත් ලාභ රඳවා තබා ගැනීම සහාය විය. රඳවා ගත් ඉපැයීම් 11% කින් වර්ධනය වී රු. බිලියන 204.4 දක්වා ඉහළ ගියේය. වර්ෂය තුළ, විභජනය සඳහා වන කොටස් යටතේ වාර්තා කරන ලද රු. මිලියන 730.0 ක ප්‍රාග්ධනය, අදාළ නියාමන ක්‍රියා පටිපාටි අනුගමනය කරමින් කොටස් ප්‍රාග්ධනයට මාරු කරන ලදී. අනෙකුත් සංචිත 55% කින් වර්ධනය වී රු. බිලියන 116.5 දක්වා ඉහළ ගිය අතර, මෙයට ප්‍රධාන වශයෙන් ප්‍රතිව්‍යුහගත කරන ලද රාජ්‍ය නිරාවරණ සඳහා වූ විශේෂ සංචිතය රු. බිලියන 39.9 සිට රු. බිලියන 79.3 දක්වා ඉහළ යාම බලපෑවේය. මෙම විචක්ෂණශීලී සංචිත ශක්තිමත් කිරීම, ස්වෛරී ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වර්ධනයන් මධ්‍යයේ ශේෂ පත්‍රය ආරක්ෂා කිරීම සඳහා ලද ප්‍රවේශයක් පිළිබිඹු කරයි.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත නියාමන සීමාවන්ට වඩා ඉහළින් පැවතුන අතර, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය-1 වන ස්ථරය 11.4% (2024-12.0%) සහ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය 16.9% (2024-16.6%) ක් වූ අතර මෙය බැංකුවේ අඛණ්ඩ ප්‍රාග්ධන ශක්තිමත් භාවය පිළිබිඹු කරයි.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය %



කොටස් හිමියාට වටිනාකම් නිර්මාණය කිරීම

පූර්ණ රාජ්‍ය අයිතිය යටතේ ක්‍රියාත්මක ආයතනයක් ලෙස, ලංකා බැංකුව එහි එකම කොටස් හිමිකරු වන ශ්‍රී ලංකා රජයට අඛණ්ඩව සහ තිරසාර ප්‍රතිලාභ ලබාදෙමින්, ජාතික සංවර්ධනයට දායකත්වය සපයයි. වසර තුළ, කොටසක ඉපැයීම් 16% කින් වැඩි වූ අතර, ශුද්ධ වත්කම් කොටසක වටිනාකම 18% කින් වර්ධනය වූ අතර, එය වැඩිදියුණු කළ කොටස් හිමියන්ගේ වටිනාකම් නිර්මාණය පිළිබිඹු කරයි. ඊට අමතරව, බැංකුව රජයට රු. බිලියන 5.0 ක ලාභාංශයක් ගෙවූ අතර, එක් කොටසකට ලාභාංශය රු. 194.33 ක් ලෙස සටහන් වේ. මෙය බැංකුවේ මූල්‍ය ශක්තිය පවත්වාගෙන යාම සහ පුළුල් ආර්ථික ප්‍රගතියට සහාය වීම යන ද්විත්ව වගකීම අවධාරණය කරයි.

	2025	2024	2023	2022	2021
කොටසකට ඉපැයීම් (රුපියල්)	2,987.9	2,575.5	1,067.7	1,278.9	1,503.6
කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම (රුපියල්)	14,216.9	12,102.4	10,068.6	10,167.4	8,030.4
කොටසකට ලාභාංශ (රුපියල්)	194.3	-	6.9	13.9	73.9
හිමිකම් මත ප්‍රතිලාභය (%)	22.7	23.2	10.6	14.1	21.0

මූල්‍ය සමාලෝචනය

සමූහයේ කාර්යසාධනය සහ විදේශීය මෙහෙයුම්

2025 වසර අවසන් වන විට, බැංකුව මූල්‍ය සේවා, දේපළ කළමනාකරණය සහ විවේක කළමනාකරණය ඇතුළු විවිධ ක්‍රියාකාරකම්වල නියැලී සිටින පරිපාලිත සමාගම් නවයකින් සහ ආශ්‍රිත සමාගම් හතරකින් සමන්විත විය. යුරෝපීය වෙළඳපළට ප්‍රවේශ වීමට පහසුකම් සපයන, එහි ජාත්‍යන්තර පැවැත්ම ශක්තිමත් කරන, සේවකයින් සඳහා වටිනා විදේශීය නිරාවරණ සහ සංවර්ධන අවස්ථා ලබා දෙන විදේශීය පරිපාලිත සමාගමක් ද බැංකුව එක්සත් රාජධානියේ පවත්වාගෙන යනු ලබයි.

සියලුම පරිපාලිත සමාගම් විධිමත් පරිපාලිත ප්‍රඥප්තියක් යටතේ පාලනය වන අතර වාර්ෂික විස්තීර්ණ කාර්යසාධන ඇගයීමකට යටත් වේ. ඔවුන්ගේ මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය මව් ආයතනය විසින් සමීපව නිරීක්ෂණය කරනු ලබන අතර, නිතිපතා වාර්තාකරණ යාන්ත්‍රණ ක්‍රියාත්මක වේ. සමූහයේ සමස්ත අවදානම් අභිරුචිය සහ විචක්ෂණශීලී අවදානම් පරාමිතීන් සමඟ පෙළගැස්වීම සහතික කිරීම සඳහා එක් එක් පරිපාලිත ආයතනයේ අවදානම් උපකරණ පුවරු බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරී විසින් සමාලෝචනය කරනු ලැබේ. ඊට අමතරව, සෑම පරිපාලිත සමාගමකටම සහ ආශ්‍රිත සමාගමකටම බැංකුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල නියෝජනයක් ඇතුළත් වන අතර, එමඟින් මව් ආයතනයේ උපායමාර්ගික දිශානතිය සහ යහපාලන ප්‍රමිතීන් අපේක්ෂාවන්ට අනුකූලව පවතින බව සහතික කෙරේ.

වසර තුළදී, BOC මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් සමාගම (MSS), බැංකුවේ ඩිජිටල්කරණ මෙහෙයවීම් කෙරෙහි උපායමාර්ගික අවධානය යොමු කරමින් රු. මිලියන 25.0 ක ප්‍රාග්ධනයක් සහිතව BOC IT සොලුයුෂන් (පුද්ගලික) සමාගම ලෙස නැවත නාමකරණය කරන ලදී. සමූහයේ මෙහෙයුම් වලින් මූලිකත්වය බැංකුවට දිගටම හිමිවන අතර, සමූහයේ මුළු වත්කම් වලින් ආසන්න වශයෙන් 98% ක් නියෝජනය කරයි. වසර තුළදී, සමූහයේ බදු ගෙවීමට පෙර ලාභයේ 18% ක වැඩිවීමක් වාර්තා කළ අතර, එය ප්‍රධාන මෙහෙයුම් අංශ හරහා සහ බැංකුවේ ප්‍රාථමික ව්‍යාපාරයන්හි අඛණ්ඩ ශක්තිය පිළිබිඹු කරමින් රු. බිලියන 76.5 ක් විය.

ඉදිරි උපායමාර්ගික දිශාව

ප්‍රගතිය සාක්ෂාත් කරගනු ලබන්නේ හුදකලා චලනයන් හරහා නොව, බහුවිධ, අන්තර් සම්බන්ධිත මානයන්හි ගතික පෙළගැස්ම හරහා ය. රූබික් ඝණකයක චලනයක් අනෙක් සෑම කොටසකම චලන කෙරෙහි බලපෑම් කරයි. සෑම අංගයක්ම සමතුලිතතාවයට ගෙන ඒම සඳහා නිරන්තරයෙන් වෙනස් වන පරිසරයක, බැංකුව තම උපායමාර්ගික ප්‍රමුඛතා නැවත සකස් කරමින්, මූල්‍ය ශක්තිය, මෙහෙයුම් කාර්යක්ෂමතාව, සහ දිගුකාලීන තිරසාරත්වය එකට සමකාලීනව ගමන් කරන බවට සහතික කරයි.

මෙහෙයුම් පරිසරය නැවත වර්ධනයක් සහ නවීකරණයක් ඇතිවන අවධියකට පරිවර්තනය වී ඇත. මෙය වැඩිදියුණු වූ දේශපාලන ස්ථාවරභාවය, දැඩි නීති හා ප්‍රතිපත්ති ක්‍රමඟතාවය, සහ ආයෝජක විශ්වාසය ක්‍රමයෙන් නැවත ගොඩනැඟීම මගින් සහාය ලබා ඇත. එසේ වුවද, ලෝක මට්ටමේ පවතින අවිනිශ්චිතතා සහ භූ-දේශපාලනික තත්ත්වයන් නිසා තවදුරටත් අවධානයෙන් සිටීම සහ විනයගත ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. මෙම පසුබිම තුළ, බැංකුව තම මූලික ශක්තීන් තවදුරටත් ශක්තිමත් කරගනිමින්, ඉදිරියේ ඇති නව අවස්ථා විශ්වාසයෙන් සහ පැහැදිලි දිශානතියකින් භාවිතා කිරීමට කටයුතු කරමින් සිටී.

කෙටිකාලීන

මෙහිදී, ප්‍රමුඛතාවය දෙනු ලබන්නේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කිරීම සහ කාර්යසාධනය ප්‍රශස්ත කිරීම සඳහා ය. මෙම පියවරයන් බැංකුවේ මූලික පදනම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා යොදාගෙන ඇත. එමඟින් වෙනස්වන මෙහෙයුම් පරිසරයකදී බැංකුවට ප්‍රතිචාරශීලී සහ අනුවර්තනශීලී ලෙස ක්‍රියා කිරීමට හැකි වේ.

- **විනයගරුක ණය ඇගයීම සහ විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ පිළිවෙත් හරහා කළඹ ගුණාත්මකභාවය පවත්වා ගැනීම.**
- **සේවා විශිෂ්ටත්වය පවත්වා ගනිමින් ලාභදායිතාවය ඉහළ නැංවීම සඳහා පිරිවැය විනය වැඩි දියුණු කිරීම සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) වැඩි දියුණු කිරීම.**
- **ණය වර්ධනයට සහාය වීම සඳහා ස්ථාවර තැන්පතු පදනමක් සහ සමතුලිත අරමුදල් මිශ්‍රයක් පවත්වා ගැනීම සඳහා ගනුදෙනුකාර විශ්වාසය උත්තේජනය කිරීම.**
- **නම්‍යශීලී බව වැඩි දියුණු කිරීම, නියාමන අනුකූලතාව සහතික කිරීම සහ විකාශනය වන ව්‍යාපාර අවශ්‍යතා සඳහා මානව සහ ඩිජිටල් ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම.**

මධ්‍යම සිට දිගුකාලීන

බැංකුව තවදුරටත් තිරසාර, සමාජයේ සියලුදෙනා ඇතුළත් වන, සහ ඩිජිටල් තාක්ෂණයෙන් සවිබලගැන්වූ අනාගතයක් වෙත සැලසුම් සහගත පරිවර්තනයක් කරමින් සිටී. මෙම උපායමාර්ගික දිශාව, වසර තුළ ගොඩනඟාගත් තත්ත්වය මත පදනම් වී ඇති අතර, ආරම්භක ව්‍යාපෘති හා ක්‍රියාමාර්ග දිගුකාලීනව වැඩි වටිනාකම් නිර්මාණය කරන මට්ටමට පරිවර්තනය කිරීම අරමුණු කරයි.

- **පරිසර හිතකාමී මූල්‍යකරණය වැඩිදියුණු කිරීම සහ සමාජයේ සියලු දෙනා ඇතුළත් වන මූල්‍ය සේවා පුළුල් කිරීම මගින්, ව්‍යාපාර ආකෘතිය තුළ තිරසාරභාවය ගැඹුරින් ඇතුළත් කිරීම.**
- **සමස්තයක් ලෙස බැංකුව පුරා ඩිජිටල්කරණය වේගවත් කිරීම මගින් ගනුදෙනුකාර අත්දැකීම් වැඩිදියුණු කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ සියලු සම්බන්ධතා ස්ථාන හරහා නවෝත්පාදනය දිරිගැන්වීම.**
- **ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය ව්‍යාපාර සඳහා සහාය ශක්තිමත් කිරීම මගින් ආර්ථික වර්ධනය උත්තේජනය කිරීම, රැකියා උත්පාදනය කිරීම සහ සියලු දෙනා ඇතුළත් සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.**
- **SLFRS S1, S2 ප්‍රමිතීන් භාවිතා කිරීම මගින් විනිවිදභාවය සහ වගවීම වැඩිදියුණු කිරීම, දේශගුණික සහ තිරසාරභාවය සම්බන්ධ කරුණු මූල්‍ය වාර්තාකරණයට ඒකාබද්ධ කිරීම.**
- **නිල යහපාලන ව්‍යුහ, අධ්‍යක්ෂ මණ්ඩල නියෝජනය, සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමු භාවිතා කරමින්, බැංකුවේ සමස්ත අවදානම් දැරීමේ මට්ටම සමඟ ගැළපෙන ආකාරයට පරිපාලිත සමාගම්වල පාලනය සහ අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කිරීම.**

ව්‍යාපාර අංශවල කාර්යසාධනය

ශාඛා බැංකුකරණය



ශාඛා බැංකුකරණය, ලංකා බැංකුවේ ව්‍යාපාරික පදනමේ ප්‍රධාන ස්ථම්භයක් වන අතර, දිවයින පුරා පැතිරුණු ශාඛා ජාලයක් සහ අඛණ්ඩව වර්ධනය වන ඩිජිටල් පරිසරයක් මගින් එය ශක්තිමත් කර ඇත. පහසුවෙන් ප්‍රවේශ විය හැකි, ගනුදෙනු කේන්ද්‍රීය මූල්‍ය විසඳුම් හරහා මෙම අංශය පුද්ගල මූල්‍ය ශක්තිය වැඩිදියුණු කරමින් මූල්‍ය ඇතුළත්කරණය ඉදිරියට ගෙන යමින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (MSMEs) සඳහා වඩාත් ක්‍රියාකාරිව සහ විධිමත්ව ආර්ථිකය හා සම්බන්ධ වීමට හැකියාව ලබා දෙයි.

ප්‍රධාන ශක්තීන්

- දිවයින පුරා විහිදුණු ශාඛා සහ සේවා ජාලයක් හරහා සේවය ලබන ශක්තිමත් ගනුදෙනුකාර පදනමක්.
- ව්‍යවසායකත්වය මතින් ප්‍රාදේශීය වර්ධනයට සහාය වන MSME හා සංවර්ධන බැංකුකරණ නායකත්වය.
- පුද්ගලයන්ට, තරුණයින්ට, කාන්තාවන්ට සහ MSME ව්‍යාපාර වලට පහසුකම් සළසන විවිධාංගීකරණය වූ ශාඛා ණය කළඹක්.
- ප්‍රවේශ පහසුව සහ සේවා කාර්යක්ෂමතාව ඉහළ නංවන ලද ඒකාබද්ධ ඩිජිටල් බැංකුකරණ ආකෘතියක්.
- ප්‍රජා මූලික වැඩසටහන් හරහා මූල්‍ය ඇතුළත්කරණය කෙරෙහි අඛණ්ඩ අවධානය.
- ESG මූලධර්ම වලට අනුකූල වගකීම් සහගත හා සංවිධානාත්මක ණය සැපයීම.

ප්‍රතිඵල

- තැන්පතු
- ණය හා අත්තිකාරම්
- ගනුදෙනු බැංකුකරණය
- සංවර්ධන ණය
- මූල්‍ය ඇතුළත්කරණය

මෙහෙයුම් සන්දර්භය

2025 දී ශාඛා බැංකුකරණ පරිසරය පෙර පැවති අස්ථාවරතාවයෙන් පසු ඇති වූ පුළුල් ආර්ථික ස්ථාවරතාවය මත පදනම්ව, ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වන ස්වභාවයක් පෙන්නුම් කළේය. උද්ධමනීය පීඩන පහවීම සහ වඩාත් අනුග්‍රාහී මුදල් ප්‍රතිපත්ති තත්ත්වයන් හේතුවෙන් ගනුදෙනුකාර විශ්වාසය ක්‍රමයෙන් වැඩි වූ අතර, එමඟින් පුද්ගල හා MSME මූල්‍ය පහසුකම් සඳහා ඉල්ලුම වර්ධනය විය.

විශේෂයෙන්ම ඒක පුද්ගල ගනුදෙනුකරුවන් සහ MSME අතර ණය ගනුදෙනු නැවත සක්‍රීය වුවද, ආදායම වියදම සමතුලිත කිරීමේ හැකියාව සහ වෙනස් වන නියාමන පරිසරය ණය තීරණ ගැනීමේදී තවදුරටත් ප්‍රමුඛ විය. පෙර පැවති ඉහළ පොළී අනුපාත හා ජීවන වියදම් වැඩිවීම් පසුබිම් කරගෙන, ගනුදෙනුකරුවන් තම මූල්‍ය වගකීම් කළමනාකරණයේදී තවදුරටත් මධ්‍යස්තව ක්‍රියා කළහ.

මෙම තත්ත්වය තුළ ශාඛා බැංකුකරණය සමානුපාතික හා දූරදර්ශී ප්‍රවේශයක් අනුගමනය කළ අතර, වත්කම් ගුණාත්මකභාවය සහ දිගුකාලීන ප්‍රතිරෝධක ශක්තිය ආරක්ෂා කරමින් වර්ධනය ඉදිරියට ගෙන ගියේය. ඒ සඳහා විනයගත ණය අනුමැති ප්‍රමිතීන්, වැඩිදියුණු කළ අවදානම් ඇගයීම් රාමු සහ ණය කළඹ අධීක්ෂණය ශක්තිමත් කිරීම යොදා ගන්නා ලදී.

බැංකුව වසර පුරා ණය තිරසාරභාවය හා ණය කළඹේ ගුණාත්මකභාවය ප්‍රමුඛත්වයෙන් සලකනු ලැබිණි. ව්‍යුහාත්මක ආපසු ගෙවීමේ විසඳුම්, ශක්තිමත් ණය ඇගයීම් සහ ආර්ථික ආතතියට පත් ණය ගැනුම්කරුවන් සම්පව නිරීක්ෂණය කිරීම හරහා වත්කම් වල ගුණාත්මකභාවය ආරක්ෂා කරමින් ගනුදෙනුකරුවන්ට මූල්‍ය පීඩන හමුවේ ඉදිරියට යාමට අවශ්‍ය සහාය ලබා දෙන ලදී.

දත්ත මත පදනම් වූ ණය ඇගයීම් මෙවලම් සමඟ ශක්තිමත් කළ අභ්‍යන්තර අවදානම් ක්‍රමවේද හරහා ණය කළඹ තුළ මතුවන ආතතිය කල්තියා හඳුනාගැනීමට හැකි වූ අතර, එමඟින් කාලෝචිත සහ ඉලක්කගත මැදිහත්වීම් සිදු කළ හැකි විය.

සීමිත ණය පරිසරයක් තුළද MSME, තරුණ ව්‍යවසායකයින්, කාන්තා මූලික ව්‍යාපාර, පුනර්ජනනීය බලශක්ති, අපනයන හා කෘෂිකර්මය වැනි ප්‍රමුඛ අංශ වෙත ලබා දෙන සහාය වැඩි දියුණු කරන ලදී. මෙමඟින් ආර්ථික ප්‍රතිසාධනය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ බැංකුවේ අතිමහත් කැපවීම පිළිබිඹු කරයි.

තැන්පතු පදනම ශක්තිමත් කිරීම සහ ජංගම සහ ඉතුරුම් තැන්පතු (CASA) වර්ධනය පවත්වා ගැනීම මඟින් අරමුදල් ස්ථාවරතාව

ව්‍යාපාර අංශවල කාර්යසාධනය

වැඩිදියුණු කරමින් ශේෂ පත්‍රය ශක්තිමත් කරන ලදී. ශාඛා මට්ටමේ ණය දීමේදී ද තිරසාරභාවය පිළිබඳ සලකා බැලීම අඛණ්ඩව සිදු කරමින්, ණය ව්‍යාප්තිය, වගකම් සහගත බැංකුකරණය හා ජාතික සංවර්ධන ප්‍රමුඛතා සමඟ අනුකූල කරන ලදී.

වසර තුළ දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ප්‍රදේශ කිහිපයක ශාඛා මෙහෙයුම් සඳහා තාවකාලිකව බාධා වූ අතර, යටිතල පහසුකම් හා විදුලි සැපයුම් හානි නිසා අත්‍යවශ්‍ය බැංකු සේවාවන්ට ගනුදෙනුකාර ප්‍රවේශය සීමා විය. ඊට ප්‍රතිචාර ලෙස බැංකුව කඩිනමින් අත්‍යාවශ්‍ය පියවර ගෙන, ජංගම බැංකු ඒකක යෙදවීම, ඩිජිටල් නාලිකා පුළුල් කිරීම සහ බලපෑමට ලක් වූ ගනුදෙනුකරුවන්ට ඉලක්කගත සහන ලබාදීම සිදු කළේය.

මෙම අත්දැකීම හරහා දේශගුණය ආශ්‍රිත බාධාකාරී තත්ත්වයන්ට මුහුණ දීමේදී ශක්තිමත් මෙහෙයුම් රාමු, ඩිජිටල් හැකියාවන් පුළුල් කිරීම් සහ සක්‍රීය ගනුදෙනුකාර සබඳතා කළමනාකරණයේ වැදගත්කම තවදුරටත් අවධාරණය විය.

උපායමාර්ගයට එරෙහිව කාර්යසාධනය

උපායමාර්ගික ප්‍රමුඛතා	අවදානම්	අවස්ථා	උපායමාර්ගික ප්‍රතිචාර	උපායමාර්ගික ප්‍රතිඵල
	• තැන්පතු රඳවාගැනීම සම්බන්ධව ඇති තරඟය • පාරිසරික හා අනෙකුත් බාහිර සිදුවීම් හේතුවෙන් ඇතිවන බාධාකාරී තත්ත්ව	• SME, කාන්තා නායකත්ව ව්‍යාපාර සහ තරුණ ව්‍යවසායකත්ව අංශ තුළ වර්ධන හැකියාව • තිරසාර මූල්‍යකරණ හා තැන්පතු නිෂ්පාදන සඳහා වැඩිවන ඉල්ලුම	• තරුණ හා කාන්තා ව්‍යාපාරික අංශ සඳහා පහසුකම් පුළුල් කිරීම • ශාඛා ණය කළඹ තුළ තිරසාර මූලධර්ම හා යහපාලනය ඒකාබද්ධ කිරීම • විවිධාංගීකරණය වූ අංශ වෙත නිරාවරණය සහ විචක්ෂණශීලී ප්‍රාග්ධන වෙන් කිරීම හරහා ශේෂ පත්‍රයේ ඔරොත්තු දීමේ හැකියාව ආරක්ෂා කිරීම	• මූල්‍ය ඇතුළත්කරණය පුළුල් කිරීම සහ ආර්ථික වර්ධනයට සහාය වීම හරහා ශාඛා මට්ටමේ ණය වර්ධනය • ජාතික ප්‍රතිසාධන ප්‍රමුඛතා සමඟ සමපාත වන සංවර්ධන ණය දීම • අඩු වියදම් තැන්පතු වැඩිදියුණු කිරීම මඟින් CASA අනුපාතය ශක්තිමත් කිරීම
	• මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ තරඟකාරීත්වය වැඩිවීම	• ව්‍යාපාරික විශ්වාසය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම	• තරුණයන්, කාන්තාවන් සහ MSME අංශ සඳහා විශේෂිත වූ සේවා පුළුල් කිරීම • ශාඛා සහ ඩිජිටල්කරණය හරහා සේවා සැපයීම වඩාත් කාර්යක්ෂම කිරීම • වැඩිදියුණු කළ ගනුදෙනුකාර සම්බන්ධතා මූලපිරිම්	• රු. බිලියන 9.0 කට වැඩි ණය නිකුත් කරමින් තරුණ ව්‍යවසායකයින් 19,400කට අධික පිරිසකට සහාය වීම • BOC මිතුරු සහ BOC රන්ලිය වැඩසටහන් යටතේ ශක්තිමත් ණය කාර්යසාධනයක් • සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර උපදේශන සායන පැවැත්වීම සහ වෙළඳ ප්‍රදර්ශන හරහා වෙළඳපළ ප්‍රවේශය පහසු කිරීම • BizPlus ක්‍රෙඩිට් කාඩ්පත සහ BizLift ණය යෝජනා ක්‍රමය දියත් කිරීම
	• සයිබර් ආරක්ෂණ අවදානම්	• ඩිජිටල් ක්‍රමවේද ඔස්සේ වන බැංකුකරණ කටයුතු සඳහා වන පිළිගැනීම ඉහළයාම	• ඩිජිටල් ප්‍රවේශය පුළුල් කිරීම හරහා සේවා පහසුව වැඩි කිරීම • පුද්ගලික හා MSME ණය සැකසුම් ස්වයංක්‍රීයකරණය • දත්ත පාලනය හා ඩිජිටල් ආරක්ෂාව ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම	• ජංගම දුරකථන සහ අන්තර්ජාල බැංකුකරණ වේදිකා හරහා ඩිජිටල් ගනුදෙනු පරිමාවේ වැඩිවීම • පාරිභෝගික ණය සැකසුම් කාලය එක් දිනක් දක්වා අඩු කිරීම

උපායමාර්ගික ප්‍රමුඛතා	අවදානම්	අවස්ථා	උපායමාර්ගික ප්‍රතිචාර	උපායමාර්ගික ප්‍රතිඵල
	• දේශගුණික හා බාහිර බාධා හේතුවෙන් ණය ආපසු ගෙවීමේ හැකියාව අඩුවීම	• ගෝලීය ආර්ථික හා ව්‍යාපාරික තත්ත්වයන් ක්‍රමයෙන් යහපත් වීම	• ශක්තිමත් ණය අධීක්ෂණ සහ පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණය • ණය තිරසාරභාවය වැඩි දියුණු කිරීම සඳහා ශක්‍ය ණය ගැතියන් සඳහා අඛණ්ඩ ව්‍යුහගත ආපසු ගෙවීමේ සහාය • CBSL විසින් නියම කරන ලද ණය සහන පමා කාල සහ දේශගුණික/ ආර්ථික ආතතියට ලක් වූ ණය ගැතියන් සඳහා අමතර සහන ලබා දීම	• අදියර 3 ණය අඩු කිරීම • පළාත් මට්ටමේ SME සායන 10 ක් සංවිධානය හරහා උපදේශන හා මූල්‍ය සහාය ලබා දීම • ආර්ථික පසුබෑමට ලක් වූ ශාඛා ගනුදෙනුකරුවන් නැවත සක්‍රීය කිරීම
	• සේවකයන් රඳවාගැනීමේ අභියෝග	• ඉහළ කාර්යසාධනයක් සහිත දක්ෂ මානව සම්පත් ආකර්ෂණය කිරීමේ හැකියාව • කුසලතා වැඩි දියුණු කිරීම සහ හැකියාවන් වර්ධනය	• MSME උපදේශන, ඩිජිටල් සේවා, ESG අනුකූලතා හා අවදානම් ඇගයීම යන ක්ෂේත්‍රවල කාර්ය මණ්ඩල දක්ෂතා ඉහළ නැංවීමට අඛණ්ඩ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම • ශාඛා සහ ප්‍රධාන කාර්යාල කණ්ඩායම් අතර අන්තර් ක්‍රියාකාරී සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම	• වැඩිදියුණු කළ කුසලතා සහ හැකියාවන් සහිත දක්ෂ කණ්ඩායම් • නවෝත්පාදන සඳහා සභාපතිතුමා ලබා දෙන සම්මානය හඳුන්වා දීම

ණය සහ අත්තිකාරම්

වසර තුළ, නිවාස, පුද්ගලික, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ සංවර්ධන අංශ හරහා ණය දීම ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කළ අතර, ඉලක්කගත සහනදායක සහ පුනර්ජීවනය කේන්ද්‍ර කරගත් මූල්‍ය වැඩසටහන් මඟින් එය මෙහෙයවනු ලැබීය.

බැංකුව විසින් දිට්වා සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා ණය සහන ලෙස සහනකාල සහ අඩු පොළී ණය යෝජනා ක්‍රම ලබා දෙන ලදී. ඒ අතරම, BOC BizLift සහ SMELoC වැනි වැඩසටහන් හරහා ප්‍රාග්ධන වියදම් සඳහා සංවිධානාත්මක මූල්‍යකරණය අඛණ්ඩව ලබා දෙන ලදී. තවද, වී මෝල් හිමියන් සඳහා පොළී සහනාධාර ණය සහ විශේෂ අංශ සඳහා වන මූල්‍ය පහසුකම් හරහා කෘෂි නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ නංවා ජාතික ආහාර සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම සිදු විය.

සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ ගනුදෙනුකරුවන් ඉලක්ක ගත සහන සැලසීම්;

- ආපදාවන්ට ලක්වූ ගනුදෙනුකරුවන් සඳහා දීර්ඝ කරන ලද ණය සහන කාල සීමාවන් සහ සහන මිල ගණන් සහ පොළී අනුපාත.
- සහනදායී අනුපාත යටතේ BOC BizLift ප්‍රාග්ධන මූල්‍යකරණය සපයන ලදී.
- කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වී මෝල් හිමියන්ට පොළී සහනාධාර මූල්‍යකරණයක් ලබා දෙන ලදී.
- බලපෑමට ලක් වූ ණය ගැතියන් සඳහා අවස්ථානෝචිතව නැවත ණය ගිවිසුම් ගත කිරීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම ආදී පහසුකම් සපයන ලදී.

ණය අනුමත කිරීමේදී, පාරිසරික, සමාජීය සහ යහපාලන කරුණු පිළිබඳව සලකා බැලීම් බැංකුවේ ණය අනුමැති රාමුව තුළට ඇතුළත් කර ඇති අතර, ESMS ක්‍රියාකාරකම් ශාඛා සහ සංවර්ධන ණය කළඹ හරහා අවධානයට ලක් කෙරේ.

සංවර්ධන ණය

2025 දී ශාඛා බැංකුකරණ අංශය තම සංවර්ධන ණය කළඹ ජාතික තලයේ වැඩසටහන් හරහා පුළුල් කළ අතර, MSME, තරුණ හා කාන්තා ව්‍යවසායකත්වය, හරිත ව්‍යාපාර, සහ ආපදා මඟින් බලපෑමට ලක් වූ ව්‍යාපාර ශක්තිමත් කිරීම එහි ප්‍රමුඛ අරමුණ විය.

ව්‍යාපාර අංශවල කාර්යසාධනය



ජාතික සහ සංවර්ධනය කේන්ද්‍ර කරගත් ණය යෝජනා ක්‍රම

- ජාතික ණය සහතික ණය යෝජනා ක්‍රමය (NCGLS)
- තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය (කෘෂිකර්මාන්ත සහ කර්මාන්ත)
- SMELoC2 චක්‍රීය ණය අරමුදල් යෝජනා ක්‍රමය
- MSME ආපදා සහන ණය යෝජනා ක්‍රමය - ආපදාවට ලක් වූ MSME සඳහා කාරක ප්‍රාග්ධන සහාය



නවෝත්පාදන සහ නැගී එන අංශ මූල්‍යකරණය

- BizLift ණය යෝජනා ක්‍රමය
- BOC E-Creator ණය යෝජනා ක්‍රමය - සමාජ මාධ්‍ය ව්‍යවසායකයින්
- BOC හරිත ණය යෝජනා ක්‍රමය - පුනර්ජනනීය බලශක්තිය, ප්‍රතිචක්‍රීකරණය, අපද්‍රව්‍ය භාවිතය සහ පරිසර හිතකාමී කර්මාන්ත සඳහා මූල්‍යකරණය
- BOC තරුණ ණය යෝජනා ක්‍රමය - තරුණ ව්‍යවසායකයින් සඳහා ඇපකර රහිත ප්‍රවේශ මූල්‍යකරණය

ග්‍රාමීය හා කෘෂිකාර්මික මූල්‍යකරණය ශක්තිමත් කිරීම සඳහා නව විස්තීර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS) "සරුසාර" වැඩි දියුණු කරන ලද අතර, වෙළඳුන් සහ නිෂ්පාදකයින් සඳහා කාරක ප්‍රාග්ධන ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා භාණ්ඩ මිලදී ගැනීම් සඳහා ඇප පහසුකම් විධිමත් කරන ලදී.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වර්ධනය ශක්තිමත් කිරීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට සහාය සැපයීමේදී බැංකුව තවදුරටත් නායකත්ව භූමිකාවක් ඉටු කළ අතර, ණය දීමට අමතරව උපදේශන, පුහුණු වැඩසටහන් සහ වෙළඳපළ ප්‍රවේශ පහසුකම් ඇතුළත් මූල්‍ය නොවන සේවා රැසක්ද සපයන ලදී. මෙම ඒකාබද්ධ ප්‍රවේශය හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පද්ධතිය ශක්තිමත් වූ අතර, වසර අවසානය වනවිට එම ණය කළඹ රු. බිලියන 319.9 ඉක්මවා 28%ක වාර්ෂික වර්ධනයක් ලබා ගත්තේය.

BOC SME කවය, MSMEs සඳහා කැපවූ උපදේශන සහ මූල්‍යකරණ වේදිකාවක් ලෙස දිගටම ක්‍රියාත්මක විය. මෙම වේදිකාව හරහා ව්‍යවසායකයින්ට ව්‍යාපාර සැලසුම් කිරීම, වෙළඳපළ ව්‍යාප්තිය සහ මෙහෙයුම් අභියෝග පිළිබඳ වෘත්තීය මඟ පෙන්වීම් ලබා ගත හැකිය. මෙම සේවාව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB), ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA), සුළු ව්‍යාපාර සංවර්ධන අංශය (SED) සහ කාර්මික තාක්ෂණ ආයතනය (ITI) වැනි රාජ්‍ය ආයතන අතර තීරණාත්මක සම්බන්ධතා සඳහා පහසුකම් සපයයි. මෙය බැංකුකරණයෙන් ඔබ්බට සම්පත් සහ ආධාරක පද්ධති වෙත ප්‍රවේශය වැඩි දියුණු කරයි.

2025 දී පළාත් මට්ටමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වැඩමුළු 10 ක් පවත්වා, එම ව්‍යවසායකයින්ට ඔවුන්ගේ විශේෂ ව්‍යාපාරික ගැටළු සඳහා පුද්ගලික සහ ඉලක්කගත විසඳුම් ලබා දෙන ලදී. අභ්‍යන්තර හා බාහිර ආයතනවල ණය අය කර ගැනීම, ණය ලබා දීම සහ පුනරුත්ථාපන විශේෂඥතාව ඒකාබද්ධ කරන මෙම මුලපිරීම මඟින් 2,000 කට අධික ව්‍යවසායකයින් පිරිසකට සහාය ලැබුණි.

ඊට සමගාමීව, සංවර්ධන බැංකුකරණ ඒකකය විසින් ලංකා බැංකුව ඉදිරිපිට පරිශ්‍රයේදී කාන්තා ව්‍යවසායකයින් 50 කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් දින තුනක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙළඳ පොළක් සංවිධානය කරන ලද අතර, එමඟින් වෙළඳපළ ප්‍රවේශය සහ වෙළඳ නාම දෘශ්‍යතාව වැඩි දියුණු කරන ලදී.

තරුණ ව්‍යවසායකත්වය බලගැන්වීම

BOC Youth ණය යෝජනා ක්‍රමය යනු තරුණ ව්‍යවසායකයින්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි මූල්‍ය, ප්‍රායෝගික මඟපෙන්වීම සහ සංවිධානාත්මක උපදේශන සහාය සපයන ඉලක්කගත වැඩසටහනකි. මෙය රැකියා නිර්මාණය, නවෝත්පාදනය, ග්‍රාමීය සම්පත් භාවිතය සහ ආනයන භාණ්ඩ සඳහා වන ආදේශක නිෂ්පාදනය ද ප්‍රවර්ධනය කරයි.

මෙම වැඩසටහන ණය පහසුකම් සැපයීමට පමණක් සීමා නොවී, වට්ස් ඇප් සහ යූ ට්‍යුබ් වැනි ඩිජිටල් වේදිකා හරහා ව්‍යවසායකත්ව සංවර්ධන සැසි පවත්වමින් ව්‍යාපාර සැලසුම්, මූල්‍ය කළමනාකරණය සහ නියාමන අනුකූලතාව පිළිබඳ දැනුමද ලබා දෙයි. මෙම මුලපිරීම මඟින් ප්‍රධාන බාහිර ආයතන සමඟ සහයෝගීතාවයට ඉඩ සැලසෙන අතර, තරුණ ව්‍යවසායකයින්ට වටිනා තාක්ෂණික සහ ව්‍යාපාර සංවර්ධන සහාය ලබා ගැනීමට හැකි වේ.

2025 අවසානය වනවිට මෙම වැඩසටහන තරුණ නායකත්ව ව්‍යාපාර 19,400 කට අධික සංඛ්‍යාවකට සහාය ලබා දී ඇත. මූල්‍යකරණය සහ උපදේශකත්වය ඒකාබද්ධ කරමින්, මෙම ණය යෝජනා ක්‍රමය, මඟින් ශ්‍රී ලාංකික ව්‍යවසායකයින්ගේ ඊළඟ පරම්පරාව පෝෂණය කිරීම සඳහා දිගුකාලීන හවුල්කරුවෙකු ලෙස බැංකුව කටයුතු කරන්නේ ඔවුන්ව ගනුදෙනුකරුවකු යන හැඟීමට වඩා වැඩි සමීප බවකිනි.

කාන්තා ව්‍යවසායකයින්ට සහාය

කාන්තා ව්‍යවසායකත්වයට සහාය සැපයීම බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතාවක් ලෙස පවතී. BOC රන්ලිය, BOC සිරිලිය සවිය සහ BOC මිතුරු ණය යෝජනා ක්‍රම හරහා

නිෂ්පාදන, සේවා, සංචාරක සහ අපනයන මූලික ක්ෂේත්‍රවල කාන්තා නායකත්ව, SME ව්‍යාපාර සඳහා මූල්‍ය සහාය සපයන ලදී. මෙම මූල්‍යකරණය ව්‍යාපාර ආරම්භ කිරීමට, පුළුල් කිරීමට සහ ආර්ථික අභියෝග මධ්‍යයේ ව්‍යාපාර අඛණ්ඩතාව ගොඩනඟා ගැනීමට උපකාරී විය.

මූල්‍යකරණය, උපදේශන සහ ධාරිතා වර්ධනයට අමතරව, BOC SME කවය ඇතුළුව, තිරසාර ව්‍යවසාය වර්ධනයක් සහතික කිරීම සඳහා පුහුණුව, උපදේශකත්වය සහ වෙළඳපළ ප්‍රවේශ සහාය ලබා දෙන ලදී.

ශ්‍රී ලංකාවේ කාන්තා ව්‍යවසායකයින් (WE) සඳහා වන මූල්‍ය සංග්‍රහය සඳහා සහභාගී වන මූල්‍ය ආයතනයක් ලෙස, කාන්තා නායකත්ව ව්‍යාපාර සඳහා මූල්‍ය ප්‍රවේශය වේගවත් කිරීම, නායකත්වය, දත්ත භාවිතය සහ ක්‍රියාකාරී වැඩපිළිවෙළ ශක්තිමත් කිරීම බැංකුව විසින් කැපවීමෙන් සිදු කරයි.

හරිත හා නවීන බලශක්ති මූල්‍යකරණය

හරිත හා පුනර්ජනනීය බලශක්ති මූල්‍යකරණය 2025 දී ශක්තිමත් වර්ධනයක් වාර්තා කළ අතර, ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්තියට සහාය වෙමින්, විශේෂයෙන් නිර්මාණය කරන ලද ණය යෝජනා ක්‍රම වන සූර්ය පැනල පද්ධති ණය යෝජනා ක්‍රමය සහ විශ්‍රාමික ණය යෝජනා ක්‍රමය, සූර්ය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීම, e-Friend ණය යෝජනා ක්‍රමය, BOC Green ණය යෝජනා ක්‍රමය සහ විදුලි වාහන (EV) ලීසිං වැනි ණය යෝජනා ක්‍රම හදුන්වා දෙන ලදී.

මෙම වැඩසටහන් හරහා කාබන් තීව්‍රතාව අඩු කිරීම, පිරිසිදු බලශක්ති විසඳුම් භාවිතය වැඩි කිරීම සහ පරිසර හිතකාමී ආයෝජන ශක්තිමත් කිරීම සිදු විය.

SME හා සංවර්ධන බැංකුකරණ ක්ෂේත්‍රයේ බැංකුවේ නායකත්වය ජාතික සම්මාන ගණනාවකින්ද පිළිගැනීමට ලක් වූ අතර නවෝත්පාදනය සහ සියලු දෙනා ඇතුළත් වර්ධනයක් සඳහා ඇති කැපවීම පිළිබිඹු කරයි.

තැන්පතු

2025 දී ශාඛා බැංකු අංශයේ තැන්පතු ස්ථාවරව පැවති අතර, පුද්ගලික හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශ හරහා තිරසාර තැන්පතු සවිබල ගැන්වීම ඒ සඳහා හේතු විය. ශක්තිමත් වූ බැංකු සබඳතා සහ ගනුදෙනු සම්බන්ධීකරණය වැඩි වීම, CASA වර්ධනයට හේතු වූ අතර, විනයගරුක ණය දීමේ ව්‍යාප්තිය සමඟ අරමුදල් කාර්යක්ෂමතාව ශක්තිමත් විය.

ශාඛා අංශය, බැංකුවේ අරමුදල් පදනම අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර, මුළු තැන්පතු වලින් 63% ක් නියෝජනය කළේය. මෙයට දේශීය මුදල් (LCY) ඉතුරුම් තැන්පතු වලින් 82% ක් සහ දේශීය මුදල් ජංගම තැන්පතු වලින් 77% ක් ඇතුළත් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස දේශීය මුදල් වලින් වන ඉතුරුම් සහ ජංගම තැන්පතු වලින් 81% ක් ශාඛා බැංකු අංශය විසින් කළමනාකරණය කරන ලදී. මෙම අංශය වසරින් වසර 31% ක ශක්තිමත් වර්ධනයක් වාර්තා කළ අතර එය එහි ගනුදෙනුකාර බලයේ තිරසාර ගම්‍යතාව සහ ශක්තිය පිළිබිඹු කරයි.

අඩු ආදායම්ලාභී ප්‍රජාවන් අතර මූල්‍ය ඇතුළත්කරණය සහ ඉතිරිකිරීමේ පුරුදු වැඩි දියුණු කිරීම සඳහා BOC මිතුරු කණ්ඩායම් පෙළඹවීමක් ලබා දුන්නේය. BOC Connect නියෝජිතයන් සහ ශ්‍රී ලංකා තැපෑල සමඟ හවුල්කාරිත්වයන් හරහා තැන්පතු ප්‍රවේශය අඩු ආදායම්ලාභී ප්‍රජාවන්ට ද ව්‍යාප්ත කරන ලද අතර, එමඟින් බැංකුවේ ප්‍රවේශය පුළුල් වන අතර මූල්‍ය ඇතුළත්කරණය ප්‍රවර්ධනය කෙරේ.

බැංකුව සිය පුරෝගාමී ඉස්ලාමීය බැංකුකරණ මෙහෙයුම් හරහා විවිධාංගීකරණය වූ තැන්පතු පිරිනැමීම තවදුරටත් ශක්තිමත් කළේය. BOC An-noor මඟින් ආයතනික සහ තනි පුද්ගලික ගනුදෙනුකරුවන්ට ලාභ බෙදා ගැනීමේ තැන්පතු සහ මූල්‍යකරණ විසඳුම් ලබා දෙයි. සියලුම නිෂ්පාදන ෂරියා අනුකූලතාව සඳහා සහතික කර ඇති අතර සියලු ආගම්වල ගනුදෙනුකරුවන්ට ප්‍රවේශ විය හැකි අතර, සදාචාරාත්මක සහ වටිනාකම් පදනම් කරගත් බැංකු භාවිතයන් සඳහා බැංකුවේ කැපවීම ශක්තිමත් කරයි.

වසර තුළ, ඉස්ලාමීය බැංකු ඒකකය මූල්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම, සදාචාරාත්මක බැංකු මූලධර්ම ප්‍රවර්ධනය කිරීම සහ තිරසාර සමාජ-ආර්ථික සංවර්ධනයට සහාය වීම අරමුණු කරගත් ගනුදෙනුකාර දැනුවත් කිරීමේ මූලපිරීම් සහ ප්‍රජා ආයෝජන වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. මෙම උත්සාහයන් ගනුදෙනුකරුවන් සහ ප්‍රජාව සමඟ සම්බන්ධතාවය ගැඹුරු කළ අතර, සේවා විශිෂ්ටත්වය සඳහා නොසැලෙන කැපවීම පිළිගැනීම සඳහා ජාත්‍යන්තර සහ දේශීය ඇගයීම් ද ලබා ගත්තේය.

ගනුදෙනු බැංකුකරණය

2025 දී ශාඛා බැංකුකරණ අංශය ගනුදෙනු බැංකුකරණ හැකියාවන් තවදුරටත් ශක්තිමත් කළ අතර, දිවයින පුරා ගනුදෙනුකරුවන්ට ආරක්ෂිත, මුදල් රහිත සේවාවන් සහ වැඩි පහසුවක් ලබා දීමට අවධානය යොමු කළේය.

- BOC Connect සහ තැපැල් කාර්යාල හවුල්කාරිත්වය පුළුල් කරමින් පහසුකම් අඩු ප්‍රදේශවල මූල්‍ය ප්‍රවේශය වැඩි කරන ලදී.
- අන්තර්ජාල බැංකුකරණය හා ජංගම බැංකුකරණය භාවිතය ශක්තිමත් කරමින් ඩිජිටල් ගනුදෙනු පරිමාවන් ඉහළ නංවා ඇත.
- ගනුදෙනුකාර සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය දීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කිරීම වැඩිදියුණු කිරීම, වැඩ ප්‍රවාහ සඳහා ගත කරන කාලය අඩු කිරීම.
- සුදුසු අංශ සඳහා නොමිලේ ගිණුම් විවෘත කිරීම හා හර කාඩ්පත් නිකුත් කිරීම හරහා මූල්‍ය ඇතුළත්කරණය තවදුරටත් ප්‍රවර්ධනය කරන ලදී.
- POS සහ ඩිජිටල් ගෙවීම් මාර්ග ඇතුළුව මුදල් රහිත යටිතල පහසුකම් අඛණ්ඩව පුළුල් කිරීම.
- ආරක්ෂිත ගනුදෙනු වර්ධනයට සහාය වීම සඳහා ඩිජිටල් ආරක්ෂාව සහ දත්ත යහපාලන රාමු ශක්තිමත් කිරීම.

ව්‍යාපාර අංශවල කාර්යසාධනය

පහත දැක්වෙන ඉලක්කගත වැඩසටහන් මඟින් කාඩ්පත් ආශ්‍රිත ආදායම වාර්ෂිකව 34% ක ශක්තිමත් වර්ධනයක් ලබා ගනිමින්, ගෙවීම් ක්ෂේත්‍රය තුළ බැංකුවේ ව්‍යාප්තිය ශක්තිමත් කරන ලදී.

- බාධාවකින් තොරව විදිනෙදා ව්‍යාපාර ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම, කාරක ප්‍රාග්ධනය වැඩි දියුණු කිරීම සහ රට පුරා ව්‍යවසායකයින්ගේ වර්ධන අභිලාෂයන්ට සහාය වීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කේන්ද්‍ර කරගත් BizPlus ක්‍රෙඩිට් කාඩ්පතක් දියත් කරන ලදී.



- වෘත්තිකයන්, ඉහළ ශුද්ධ වටිනාකමක් ඇති ගනුදෙනුකරුවන්, Prestige Plus හිණුම් හිමියන් සහ ප්‍රිමියර් ශාඛා ගනුදෙනුකරුවන් සඳහා සකස් කරන ලද Prestige ණය කාඩ්පත, සුවිශේෂී වරප්‍රසාද සහ අනගි වටිනාකමක් ලබා දෙයි.
- ආකර්ශනීය ත්‍යාග හරහා කාඩ්පත් භාවිතය වැඩි කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා, වැඩිදියුණු කළ වටිනාකමක් සහ ගනුදෙනුකාර තෘප්තියක් ලබා දීම අපේක්ෂා කරමින් BOC Rewardz Plus ලෝයල්ටි යෝජනා ක්‍රමය දියත් කරන ලදී.

BOC REWARDZ PLUS

ඉදිරි ගමන් මඟ

අවස්ථා

- ව්‍යවසාය ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා වටිනාකම් දාමය සහ විශේෂ අංශ කේන්ද්‍ර කරගත් මූල්‍යකරණ මුලපිරීම් පුළුල් කිරීම.
- වෙළඳ මූල්‍ය, ගනුදෙනු බැංකුකරණය සහ ඩිජිටල් ගෙවීම් විසඳුම් අඛණ්ඩව ව්‍යාප්ත වීම හේතුවෙන් ගාස්තු මත පදනම් වූ ආදායම ශක්තිමත් කිරීම සඳහා අවස්ථාවන් ඇති වීම.
- හරිත ණය (සූර්ය බල ශක්තිය, විද්‍යුත් වාහන ලීසිං) ලබා දීම, ආනයන ආදේශන සහ චක්‍රීය ආර්ථික ව්‍යාපාර සඳහා මූල්‍යකරණය පුළුල් කිරීම.
- මූල්‍ය නොවන සහාය සහ වෙළඳපළ සම්බන්ධතා සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා හවුල්කාරිත්වයන් (EDB, IDB, NEDA, SED, ITI) පුළුල් කිරීම.

අවදානම්

- ජීවන වියදම් පීඩන සහ ණය ගැණුම්කරුවන්ගේ ප්‍රවේශම් සහගත හැසිරීම ශාඛා ණය ඉල්ලුම සහ ආපසු ගෙවීමේ හැකියාව සීමා කළ හැකිය.
- නියාමන දැඩි කිරීම සහ මහ බැංකුව ප්‍රතිපත්ති අවශ්‍යතාවන්හි සිදු විය හැකි වෙනස්කම්.
- අවදානමට ලක්විය හැකි MSME සහ ආපදාවන්ට ලක් වූ අංශවලින් ණය අවදානම් පීඩන.
- වැඩිවන ඩිජිටල් ගනුදෙනු පරිමාව මධ්‍යයේ ඇති වන සයිබර් ආරක්ෂණ අවදානම්.

ඉදිරි උපායමාර්ගික දිශාව

කෙටිකාලීන

- කෘෂිකාර්මික බැංකු ඒකකයක් පිහිටුවීම මඟින් කිරි නිෂ්පාදන, කෘෂිකර්මාන්තය සහ කර්මාන්ත ඇතුළු ප්‍රමුඛතා අංශ හරහා වටිනාකම් දාම මූල්‍යකරණය කිරීම.
- ව්‍යවසායකයින්ට සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට වැඩි මූල්‍ය ඇතුළත්කරණයක් නිර්මාණය කිරීමට සහාය වීම සඳහා සෑම පළාතකම ව්‍යවසායක මධ්‍යස්ථාන පිහිටුවීම.
- උපදේශන සහ ගනුදෙනු හැකියාව ගැඹුරු කිරීම සඳහා සෑම පළාතකම වෙළඳ මූල්‍ය ඒකක ස්ථාපිත කිරීම.
- පුනර්ජනනීය බලශක්තිය, විද්‍යුත් වාහන සහ අපද්‍රව්‍ය කළමනාකරණ විසඳුම් සඳහා තිරසාර මූල්‍යකරණය ශක්තිමත් කිරීම.

මධ්‍ය සහ දිගුකාලීන

- ඉහළ වර්ධනයක් සහිත කර්මාන්ත සඳහා ඉලක්කගත මූල්‍යකරණය සහ අවස්ථානෝචිත විසඳුම් ලබා දීම සඳහා අවධානය යොමු කිරීම.
- වේගවත් පිරිවැටුම, වැඩිදියුණු කළ සම්බන්ධතා මට්ටම් සහ ගැලපෙන සේවා පිරිනැමීම් හරහා සේවා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- පිරිවැටුම් කාලය නිරීක්ෂණය ස්වයංක්‍රීයකරණය සමඟ ඩිජිටල් ක්‍රමවේද තුලින් කඩදාසි භාවිතයෙන් තොරව ණය සැකසීම.

ආයතනික හා අක්වෙරළ බැංකුකරණ අංශය



ලංකා බැංකුවේ ආයතනික හා අක්වෙරළ බැංකුකරණ අංශය ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය, මහා පරිමාණ සමාගම් සහ රාජ්‍ය අංශයේ ආයතන සඳහා ඔවුන්ගේ ව්‍යාපාර ව්‍යාප්තිය, වෙළඳාම සහ ජාතික උපායමාර්ගික ව්‍යාපෘති ඉදිරියට ගෙන යාමට ගැලපෙන මූල්‍ය විසඳුම් සපයයි. කර්මාන්තමය දැනුම, විනයගත අවදානම් කළමනාකරණය සහ ඩිජිටල් විශිෂ්ටත්වය එක් කරමින් ගනුදෙනුකරුවන්ගේ වර්ධනයට සහ රටේ ආර්ථික සංවර්ධනයට දායක වේ.

ප්‍රධාන ශක්තීන්

- ශ්‍රී ලංකා ආර්ථිකයේ ගැඹුරු ප්‍රවේශයක් සහිත විවිධ ක්ෂේත්‍රවල සමාගම් සඳහා ණය සැපයීමේ වෙළඳපළ නායකත්වය
- සීමාන්තර වෙළඳාම, විදේශ මුදල් මූල්‍යකරණය සහ ජාත්‍යන්තර ගනුදෙනුකරුවන්ට සහාය වන ශක්තිමත් අක්වෙරළ බැංකුකරණ හැකියාව
- රාජ්‍ය ආයතන, මහා පරිමාණ සමාගම් සහ අපනයන මූලික ව්‍යාපාර සමඟ දිගුකාලීන සබඳතා
- සංවිධානාත්මක වෙළඳ මූල්‍යකරණය, සමූහ ණය සහ ව්‍යාපෘති මූල්‍යකරණයේ නායකත්වය
- ණය පහසුකම් සැපයීමේ තීරණවලට තිරසාරභාවය ඇතුළත් කරන අනිවාර්ය පාරිසරික, සමාජීය සහ යහපාලන (ESG) පරීක්ෂාව
- විනයගරුක අධීක්ෂණය, ආතති පරීක්ෂණ සහ අවදානම් තක්සේරු රාමු මගින් සහාය දක්වන ශක්තිමත් ණය කළඹ ආශ්‍රිත යහපාලනය

ප්‍රතිඵල

- සමාගම් ණය
- අක්වෙරළ බැංකුකරණය
- ව්‍යාපෘති මූල්‍යකරණය
- වෙළඳ මූල්‍යකරණය හා සේවා
- ගනුදෙනුකාර තැන්පතු
- ප්‍රිමියර් බැංකුකරණය
- රාජ්‍ය හිමිකාරිත්වය සහිත ව්‍යාපාර සමඟ සම්බන්ධ වීම

මෙහෙයුම් සන්දර්භය

2025 වසරේ මෙහෙයුම් පරිසරය ක්‍රමයෙන් ස්ථාවර වන ආර්ථික තත්ත්වයක් දක්වා ගමන් කළ අතර, පොළී අනුපාත පහළ යාම සහ බාහිර වෙළඳ තත්ත්වයන් යහපත් වීම මගින් ඒ සඳහා සහාය ලැබිණි. එහෙත් ගෝලීය ආර්ථික අස්ථාවරත්වය, භූ දේශපාලනික අවිනිශ්චිතතා සහ වෙනස් වන නියාමන අපේක්ෂා හේතුවෙන් පෞද්ගලික අංශයේ ආයෝජන උනන්දුව සීමාසහිත විය.

වෙළඳ මූල්‍යකරණය සහ කාරක ප්‍රාග්ධන පහසුකම්වල ශක්තිමත් ප්‍රවණතාවය සමඟ ආයතනික ණය ඉල්ලුම තෝරාගත් ක්ෂේත්‍රවලට සීමා විය. අපනයන මූලික ව්‍යාපාර සහ ආයෝජන මණ්ඩලය අනුමත ආයතන වල සැපයුම් දාම ස්ථාවර වීම හා ජාත්‍යන්තර ඉල්ලුම වැඩි වීම සමඟ නැවත වෙළඳපළ සක්‍රියත්වයක් පෙන්නුම් කළේය.

නියාමන විනය සහ යහපාලන අධීක්ෂණය ණය තීරණවලට තවදුරටත් බලපෑ අතර, ඉහළ ණය අවදානම් වැඩි අවධානයකින් ඇගයීමට ලක් කර ESG පරීක්ෂාවටද යොමු කරන ලදී. මේ මගින් සුරක්ෂිත ණය කළඹ කළමනාකරණය සහ වත්කම් වල ගුණාත්මකභාවය ආරක්ෂා කෙරුණි.

සුපරීක්ෂාකාරී ආයෝජන පරිසරයක් තිබූ නමුත්, බැංකුව පුනර්ජනනීය බලශක්ති, ඖෂධ නිෂ්පාදනය, සංචාරක, යටිතල පහසුකම් සහ අපනයන මූලික කර්මාන්ත වැනි ජාතික වශයෙන් වැදගත් ක්ෂේත්‍ර සඳහා ව්‍යුහාත්මක ව්‍යාපෘති මූල්‍යකරණය හරහා සිය උපායමාර්ගික කැපවීම පවත්වාගෙන ගියේය. ඒ සමඟම, අක්වෙරළ බැංකු මෙහෙයුම්, කලාපීය සම්බන්ධතාව ශක්තිමත් කරමින් සීමිත ගනුදෙනු පහසු කර, ජාත්‍යන්තරව පිහිටුවා ඇති ආයතන සඳහා විදේශ මුදල් ද්‍රවශීලතාව සහ භාණ්ඩාගාර විසඳුම් සපයන ලදී.

ව්‍යාපාර අංශවල කාර්යසාධනය

උපායමාර්ගයට එරෙහිව කාර්යසාධනය

උපායමාර්ගික ප්‍රමුඛතා	අවදානම්	අවස්ථා	උපායමාර්ගික ප්‍රතිචාර	උපායමාර්ගික ප්‍රතිඵල
	• ගෝලීය සහ දේශීය වෙළඳ ප්‍රවාහවල අස්ථාවරතාව • නියාමන වෙනස්කම් • විශාල ණයවල සංකේන්ද්‍රණ අවදානම	• ආර්ථික පුනරුදය • ව්‍යාපාරික පරිසරය පිළිබඳ නැවත ඇති වූ විශ්වාසය • රාජ්‍ය මූල්‍ය හා පාලනය ශක්තිමත් කිරීම	• ණය අනුමැතිය සහ පියවීම් අධීක්ෂණයේ යහපාලන තත්ත්වය ශක්තිමත් කිරීම • විවිධාංගීකරණය වූ අංශ සඳහා නිරාවරණයන් • විනයගත ප්‍රාග්ධන වෙන්කිරීම් පවත්වාගෙන යාම • මෙහෙයුම් සඳහා ඒකාබද්ධ ශක්‍යතාව සහ තිරසාරභාවය පිළිබඳ තක්සේරු කිරීම්	• පෞද්ගලික අංශ ණය කළඹ වර්ධනය • වෙළඳ මූල්‍ය මෙහෙයුම් වැඩිදියුණු වීම • කාර්ය මණ්ඩල පුහුණුව සහ ESMS අනුගත ණය පිළිබඳ ESG දැනුවත්භාවය වැඩි කිරීම
	• සමාගම් ගනුදෙනුකරුවන්ගේ ඉහළ කේවල් කිරීමේ හැකියාව • මූල්‍ය ආයතන වලින් ඇති තරඟය	• සංවිධානාත්මක විසඳුම් සඳහා විවිධ නිෂ්පාදන හා සේවා • කර්මාන්ත හා ගනුදෙනුකාර සබඳතා සමඟ වර්ධන අපේක්ෂාවන්	• ක්ෂේත්‍ර කේන්ද්‍රීය සම්බන්ධතා කළමනාකරණය • විධිමත් අනුමත කිරීම් සහ සේවා ක්‍රියාවලීන් • ප්‍රධාන කර්මාන්ත හවුල්කාරිත්වයන් සමඟ ගැඹුරු සම්බන්ධතාවයක් • විශේෂ අවධානිත පුළුල් වටිනාකම් දාම විසඳුම් • තාක්ෂණය භාවිතයෙන් සේවා සැපයීම වැඩි දියුණු කිරීම • ගනුදෙනුකරුවන් සමඟ වන සබඳතා ශක්තිමත් කිරීම සඳහා ඇගයීම් වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී	• 'BizLift' ණය යෝජනා ක්‍රමය දියත් කිරීම • 'Export Circle' හරහා නව ගනුදෙනුකරුවන් බඳවා ගැනීම • අනෙකුත් බැංකු වලින් ලබා ගන්නා පිළිගත් අපනයන බිල්පත් සඳහා වට්ටම් ලබා දීම හඳුන්වා දීම • අපනයනකරුවන් සහ ආනයනකරුවන් සඳහා වෙළඳ ප්‍රවාහ, නියාමන අනුකූලතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රේගුව සමඟ සහයෝගීතාව ශක්තිමත් කිරීම
	• ඉහළ මෙහෙයුම් වියදම් • සයිබර් ආරක්ෂණ අවදානම්	• ඩිජිටල්, වෙළඳ හා මුදල් කළමනාකරණ විසඳුම් සඳහා වැඩි ඉල්ලුම • බාධාවකින් තොරව වෙළඳපළ ප්‍රවේශය	• වේගවත් ඉල්ලුමට සරිලන පරිදි වැඩිදියුණු කළ ඩිජිටල් නිෂ්පාදන • ස්වයංක්‍රීය ණය ඇගයීම්; සහ ණය කළඹ අධීක්ෂණය • ඒකාබද්ධ වෙළඳ මූල්‍ය නාලිකා හරහා පරිපූර්ණ වෙළඳ සේවා සැපයීම	• අපනයනකරුවන් සඳහා BizPlus ණය කාඩ්පත හඳුන්වා දීම • රජය සතු ව්‍යවසායන් සඳහා ඉන්ධන කාඩ්පතක් හඳුන්වා දීම • වෙළඳ කටයුතු සඳහා SWIFT ISO අනුකූලතාව ලබා ගන්නා ලදී

උපායමාර්ගික ප්‍රමුඛතා	අවදානම්	අවස්ථා	උපායමාර්ගික ප්‍රතිචාර	උපායමාර්ගික ප්‍රතිඵල
	• විශාල ණය නිරාවරණවල ඉහළ ණය අවදානම • විශේෂිත අංශ වල අවදානම්	• ආර්ථික තත්ත්වය ක්‍රමයෙන් යහපත් වීමත් සමඟ ණය ඉල්ලුම වැඩිවීම • වත්කම් ගුණාත්මකභාවය පිළිබඳ නියාමන පරීක්ෂාව • ESG අනුකූල ණය දීම සඳහා ඇති ඉල්ලුම	• ශක්තිමත් කරන ලද පූර්ව අනතුරු ඇඟවීම් සහ අවදානම් සමාලෝචන යාන්ත්‍රණ • ව්‍යුහගත ණය කළඹ අධීක්ෂණය සහ වැඩිදියුණු කළ යහපාලන අධීක්ෂණය • ණය ඇගයීම් සඳහා ESG නිර්ණායක	• අඩු කරන ලද අදියර 3 ණය • දිගු කලක් ගෙවීමට තිබූ රාජ්‍ය ව්‍යවසායන්හි ණය පහසුකම් සාර්ථකව ප්‍රතිව්‍යුහගත කරන ලදී. • ESMS රාමුව හරහා ණය පහසුකම් පරීක්ෂා කිරීම • අනුකූලතාව සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සමාලෝචනය කර යාවත්කාලීන කරන ලදී.
	• කාර්ය මණ්ඩලය රඳවා ගැනීමේ අභියෝග • ගනුදෙනු සංකීර්ණතාව වැඩිවීම	• ඉහළ කුසලතා සහ හැකියාවන් සහිත මානව සම්පත් • නව බඳවා ගැනීම් සමඟ සේවක කණ්ඩායම ශක්තිමත් කිරීම	• සේවක ධාරිතා වර්ධනය සඳහා අඛණ්ඩ ආයෝජනය • ව්‍යාපාරික සහ අවදානම් කණ්ඩායම් අතර සහයෝගීතාවය ශක්තිමත් කරන ලදී • කාර්යසාධනය, වගවීම සහ සේවා විශිෂ්ටත්වය	• තාක්ෂණික හා කුසලතා සංවර්ධනය පිළිබඳ දේශීය හා විදේශීය පුහුණුව • ණය යෝජනා පාරිසරික පරීක්ෂාව පිළිබඳ සියලුම ණය නිලධාරීන්ගේ කුසලතා ඉහළ නැංවීම

ආයතනික හා අක්වෙරළ බැංකුකරණය

ආයතනික බැංකු අංශය බැංකුවේ ආයතනික ගනුදෙනුකරුවන්ගෙන් සමන්විත වේ. නැව්ගත කිරීම, ඇඟලුම්, ඖෂධ සහ අනෙකුත් වෙළඳාම මත පදනම් වූ වැදගත් ව්‍යාපාර අංශවල නියැලී සිටින ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන-නැඹුරු සහ ජාත්‍යන්තරව පදනම් වූ සමාගම් වලට සහාය වීම සඳහා අක්වෙරළ බැංකු අංශය අතිමහත් සේවයක් සපයයි. මෙම අංශය විදේශීය මුදල් ප්‍රවාහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම, දේශසීමා ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම සහ ව්‍යුහගත වෙළඳ මූල්‍ය විසඳුම් වෙත ප්‍රවේශ වීම සඳහා සහය ලබා දෙයි.

මෙම සේවාවන් මඟින් ව්‍යාපාර වලට ගෝලීය තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම, කාරක ප්‍රාග්ධනය උපරිම කිරීම සහ විනිමය අවදානම අවම කිරීමට හැකි වේ. එසේම, රටට විදේශ විනිමය උපයා ගැනීම සහ ආර්ථික ස්ථාවරත්වයටද සෘජුව දායක වේ.

විශ්වාසදායක මූල්‍ය හවුල්කරුවෙකු ලෙස, ලංකා බැංකුවේ අක්වෙරළ බැංකු මෙහෙයුම්, ගෝලීය වෙළඳපළ සමඟ ශ්‍රී ලංකාවේ සම්බන්ධතාවය අඛණ්ඩව තහවුරු කරමින්, උපායමාර්ගික කර්මාන්ත වලට සහාය වෙමින්, ජාතික ආර්ථික සංවර්ධනය සහ ජාත්‍යන්තර වෙළඳ විශිෂ්ටත්වය සඳහා බැංකුවේ කැපවීම ශක්තිමත් කරයි. 2025 දී, ජාතික සංවර්ධනයට සහාය වීම සඳහා බැංකුව උපායමාර්ගිකව තම ණය කළඹ මෙහෙයවීය. පෞද්ගලික අංශයේ ණය දීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීම, අපනයන, ආනයන ආදේශක සහ කෘෂිකර්මාන්තය, රැකියා උත්පාදනය සහ ආර්ථික ක්‍රියාකාරකම් උත්තේජනය කිරීම වැනි වැදගත් අංශ වෙත මූල්‍ය ශක්තිය ලබාදීමට බැංකුවට හැකි විය. ව්‍යාපාර මුහුණ දෙන අභියෝග හඳුනා ගනිමින්, බැංකුව මුදල් ප්‍රවාහ මත පදනම් වූ ණය සැපයුම් ක්‍රමවේදයක් ආරම්භ කළ අතර, එමඟින් ශක්‍යතාවයන් හෙබි ව්‍යවසායන්ට නැවත ස්ථාවර වීමට සහ ආපසු ගෙවීමේ හැකියාව මත පදනම්ව ණය ලබා ගැනීමට ඉඩ සැලසේ.

එක්සත් ජනපදය විසින් හඳුන්වා දුන් නව තීරුබදු මධ්‍යයේ, බලපෑමට ලක් වූ ගනුදෙනුකරුවන්ට ව්‍යාපාර අඛණ්ඩතාව පවත්වා ගැනීමට කාලෝචිත මූල්‍ය සහ උපදේශන සහාය සැපයූ අතර, එය බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව සහ සේවාදායක හවුල්කාරිත්වය සඳහා ඇති කැපවීම පිළිබිඹු කරයි. පුනර්ජනනීය බලශක්තිය, ඖෂධ, ඇඟලුම් කර්මාන්තය සහ සංචාරක කර්මාන්තය ඇතුළු දිගුකාලීන වර්ධන විභවයන් සහිත අංශ සඳහා මූල්‍යකරණයේදී ප්‍රමුඛත්වය දීමෙන්, ජාතික ප්‍රමුඛතා සමඟ පෙළ ගැසුණි. ආනයන සීමා කිරීම් ක්‍රමයෙන් ලිහිල් කිරීමත් සමඟ, බැංකුව ප්‍රමුඛතා ආනයන සඳහා සහාය ද ක්‍රමයෙන් පුළුල් කළ අතර, එමඟින් රජයේ ආදායම වැඩි කිරීමට දායක වූ අතර පුළුල් ආර්ථික හා සමාජ ස්ථාවරත්වයක් ඇති කළේය.

මෙහෙයුම් කාර්යක්ෂමතාව, සේවා පිරිවැටුම් කාලය සහ අවදානම් කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා, ණය ලබාදීම සහ වෙළඳ මූල්‍ය මෙහෙයුම් ප්‍රධාන කොටගෙන තාක්ෂණය සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් අඛණ්ඩව ක්‍රියාත්මක කළේය.

ඊට සමගාමීව, 'BOC BizLift' ණය යෝජනා ක්‍රමය දියත් කිරීම හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ආයතනික ව්‍යාපාර පුළුල් කිරීම, නවීකරණය කිරීම සහ තිරසාර වර්ධන ආකෘති උපයෝගී කරගෙන උපායමාර්ගික පරිවර්තනයක් සඳහා

ව්‍යාපාර අංශවල කාර්යසාධනය

මූලපිරීමක් සනිටුහන් කළේය. මෙම යෝජනා ක්‍රමය මඟින් ව්‍යාපාර වලට මෙහෙයුම් ධාරිතාව ශක්තිමත් කිරීමට, තරඟකාරිත්වය වැඩි දියුණු කිරීමට සහ ගතික වෙළඳපළ තත්ත්වයන් තුළ උපායමාර්ගිකව හැසිරීමට හැකියාව ලැබේ.

ඉලක්කගත අංශ සමඟ සහයෝගීතාව ඒකාබද්ධ වූ මෙම පියවර, පෞද්ගලික අංශයේ ණය කළඹෙහි ශක්තිමත් වර්ධනයට හේතු වූ අතර තිරසාර ආර්ථික සංවර්ධනය සඳහා උත්ප්‍රේරකයක් ලෙස බැංකුවේ භූමිකාව ශක්තිමත් කළේය.

වගකීම් සහගත සහ තිරසාර ණය දීම ප්‍රවර්ධනය කිරීම සඳහා බැංකුව පාරිසරික, සමාජීය සහ යහපාලන (ESG) සාධක ණය විශ්ලේෂණයට ඒකාබද්ධ කරයි.

ව්‍යාපෘති මූල්‍යකරණය

බලශක්ති, නිෂ්පාදන, කෘෂිකර්මාන්තය, සංචාරක, යටිතල පහසුකම් සහ අපනයන-නැඹුරු කර්මාන්ත හරහා මහා පරිමාණ ව්‍යාපෘති සඳහා දිගුකාලීන අරමුදල් ලබා දීමෙන් ව්‍යාපෘති මූල්‍යකරණ ඒකකය ජාතික සංවර්ධනයට අඛණ්ඩව සහාය විය. ඖෂධ නිෂ්පාදනය වැනි උපායමාර්ගික අංශ සඳහා සකස් කළ මූල්‍යකරණ විසඳුම් සමඟ පුනර්ජනනීය බලශක්ති සහ පාරිසරික වශයෙන් වගකිවයුතු ව්‍යාපෘති කෙරෙහි මූලික අවධානය යොමු කරන ලදී.

අරමුදල් සැපයූ ප්‍රධාන ව්‍යාපෘති;



මෙම මූලපිරීම් මඟින් පෞද්ගලික අංශයේ සහභාගීත්වය වැඩි කිරීමට, රැකියා උත්පාදනය කිරීමට, කලාපීය ආර්ථික ක්‍රියාකාරකම් උත්තේජනය කිරීමට සහ විදේශ විනිමය ඉපැයීම් වැඩි දියුණු කිරීමට පහසුකම් සැලසුණි. මෙම ඒකකය ව්‍යාපෘති ඇගයීම, ව්‍යුහගත කිරීම සහ ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කරන අතරම, විශේෂිත අංශ වල සහභාගීත්වය වැඩි කරමින්, විනයගරුක වර්ධනයක් සහ ජාතික තිරසාර අරමුණු සමඟ සමපාත වන ඵලදායී ක්‍රියාත්මක කිරීමක් සහතික කළේය.

වෙළඳ මූල්‍යකරණය

වසර තුළ, වෙළඳ මූල්‍ය මෙහෙයුම් ශක්තිමත් කාර්යසාධනයක් ලබා දුන් අතර, අපනයන පරිමාවන්හි සැලකිය යුතු වැඩිවීමක් සනිටුහන් කළේ ඉතිහාසයේ විවෘත කරන ලද වැඩිම ණයවර ලිපි (LC) සංඛ්‍යාවක් වාර්තා කරමින් ය. මෙම වර්ධනයට නව අපනයනකරුවන් සාර්ථකව ඇතුළත් කිරීම හේතු වූ අතර, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාමට පහසුකම් සැලසීමේදී විශ්වාසදායක හවුල්කරුවෙකු ලෙස බැංකුවේ තත්ත්වය ශක්තිමත් විය.

වෙළඳ මූල්‍ය ආදායම ශක්තිමත් කිරීම සහ එහි ගනුදෙනුකාර පදනම පුළුල් කිරීම සඳහා බැංකුව බහු-පාර්ශ්වික උපායමාර්ග අනුගමනය කළේය. ආරම්භක, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ අපනයන-නැඹුරු ක්‍රියාකාරකම්වල නියැලී සිටින සමාගම් ඇතුළු නව ගනුදෙනුකරුවන් සම්බන්ධ කර ගැනීමේදී 'BOC Export Circle' කේන්ද්‍රය කාර්යභාරයක් ඉටු කළේය. ගෝලීය ඉල්ලුම් ප්‍රවණතා සහ ජාතික අපනයන ප්‍රමුඛතා සමඟ සමපාත වන පරිසර හිතකාමී නිෂ්පාදන, කාබනික සහ විජලනය කළ ආහාර සහ ආයුර්වේද පාදක ඖෂධීය නිෂ්පාදන වැනි ඉහළ විභවයක් සහිත, අගය එකතු කළ අංශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, සියලු පරිමාණයේ ව්‍යාපාර සඳහා කාලෝචිත, අවස්ථානෝචිත කළ මූල්‍ය විසඳුම් සැපයීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

ක්‍රියාශීලී මැදිහත්වීම් අතරට, අපනයනකරුවන් හා සම්බන්ධ වීම, වෙළඳාම වේගවත් කිරීම සඳහා කඩිනම් ණය අනුමත කිරීමේ ක්‍රියාවලිය ඇතුළත් වූ අතර එමඟින් නව අපනයන පහසුකම් සහ රු. මිලියන 700.0 කට අධික ණය අනුමත විය. මෙම මැදිහත්වීම් මඟින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට නිෂ්පාදන ධාරිතාව වැඩි දියුණු කිරීමට, කාරක ප්‍රාග්ධනය ප්‍රශස්ත කිරීමට සහ ජාත්‍යන්තර මෙහෙයුම් කරා එළඹීමට හැකි විය. වසර තුළ සිදු කරන ලද අපනයන ප්‍රේෂණ සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, එමඟින් විදේශ මුදල් ගලා ඒම සඳහා මෙම මූලපිරීම්වල දායකත්වය එමඟින් පිළිබිඹු විය.

තාක්ෂණික ප්‍රවීණතාවය සහ උසස් සේවා සැපයීම සහතික කරමින් ව්‍යුහගත පුහුණු වැඩසටහන් හරහා බැංකුව, සිය කාර්ය මණ්ඩල නිපුණතා වැඩිදියුණු කළේය. ගනුදෙනු කාර්යක්ෂමතාව සහ ගනුදෙනුකාර පහසුව වැඩි දියුණු කිරීම සඳහා, BOC වෙළඳ ජාලය (BTC) වඩාත් හොඳින් භාවිතා කිරීම ප්‍රවර්ධනය කරන ලදී.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ අමාත්‍යාංශයේ ප්‍රධාන පුද්ගලයන් සමඟ සහයෝගයෙන් පවත්වන ලද කර්මාන්ත ප්‍රදර්ශන, ඉලක්කගත අලෙවිකරණ ව්‍යාපාර සහ වෙළඳාම කේන්ද්‍ර කරගත් වැඩමුළු මඟින් සන්නාම දෘශ්‍යතාව සහ සේවාදායක සහභාගීත්වය තවදුරටත් ශක්තිමත් කරන ලදී. මෙම මූලපිරීම් මඟින් ආනයන හා අපනයන සැකසුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, සේවාදායක සැපයුම් දාමයන් සමඟ ඒකාබද්ධ වීම ශක්තිමත් කිරීම සහ ආයෝජන මණ්ඩල අනුමත සහ ජාත්‍යන්තරව සංස්ථාපිත ආයතන සඳහා අක්වෙරළ වෙළඳ සේවා ශක්තිමත් කිරීම සිදු විය.

2025 දී, අනෙකුත් බැංකු මඟින් ලබා ගන්නා පිළිගත් අපනයන බිල්පත් සඳහා වට්ටම් හඳුන්වාදීම මඟින් අපනයනකරුවන් සඳහා ද්‍රවශීලතා ප්‍රවේශය වැඩිදියුණු කරන ලද අතර, පරිපූර්ණ වෙළඳ මූල්‍ය විසඳුම් සැපයීම සඳහා බැංකුවේ කැපවීම ශක්තිමත් කරන ලදී.

මෙම ඒකාබද්ධ උත්සාහයන් තුළින්, 'BOC Export Circle' අපනයන ප්‍රමුඛ වර්ධනයේ උපායමාර්ගික ධාවකයෙකු ලෙස එහි භූමිකාව ශක්තිමත් කළ අතර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ආයතනික අපනයනකරුවන් සමඟ සබඳතා ශක්තිමත් කළේය.

බැංකුවේ අවධානය යොමු කළ මෙම මූලපිරීම්, එහි අපනයන කළඹ පුළුල් කිරීමට, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාමේ ප්‍රධාන පහසුකම් සපයන්නෙකු ලෙස එහි ස්ථානය තහවුරු කිරීමට දායක විය.

රාජ්‍ය හිමිකාරිත්වය සහිත ව්‍යාපාර සමඟ (SOE) සම්බන්ධ වීම්

රාජ්‍ය ව්‍යාපාර ආයතන, ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ යටිතල ව්‍යුහයේ වැදගත් භූමිකාවක් ඉටු කරන අතර, බලශක්ති, ප්‍රවාහන, උපයෝගිතා සහ අනෙකුත් වැදගත් ජාතික ක්ෂේත්‍රවල ක්‍රියාත්මක වේ. මෙම ආයතන සමඟ දීර්ඝකාලීන මූල්‍ය හවුල්කරුවෙකු ලෙස බැංකුව ඔවුන්ගේ මෙහෙයුම් අඛණ්ඩතාවයට සහ උපායමාර්ගික සංවර්ධනයට උපරිම සහාය ලබා දී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු පනතට මෑතකදී කරන ලද සංශෝධන, නිකුත් කරන ලද නියෝග, ශ්‍රී ලංකා රජයට සහ රජය සතු ව්‍යවසායන් වලට නිරාවරණය වීම පාලනය කරන නියාමන සහ යහපාලන රාමුව ශක්තිමත් කිරීමේ වැදගත් පියවරක් ගෙනහැර දක්වයි. මෙම පියවරයන් විනිවිදභාවය, ඔරොත්තු දීමේ හැකියාව සහ විචක්ෂණශීලී භාවය මූලික කොටගත් මූල්‍ය පද්ධතියේ අඛණ්ඩ වර්ධනය පිළිබිඹු කරයි.

මෙම සංශෝධිත නියාමන රාමුව, විශේෂයෙන් ණය ගැනුම්කරු ස්වෛරී හෝ රාජ්‍ය ආයතනයක් වන අවස්ථාවන්හිදී, මූල්‍යකරණ විධිවිධාන ව්‍යුහගත කිරීම සඳහා පැහැදිලි පරාමිතීන් සපයයි. මෙම සන්දර්භය තුළ, ශක්තිමත් කරන ලද නියාමන පරිසරයට අනුකූල වන විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ ප්‍රවේශයන් සහ ව්‍යුහගත මූල්‍ය විසඳුම් අනුගමනය කිරීමට බැංකු දිරිමත් කරනු ලැබේ.

රටේ ආර්ථික හා සමාජ යටිතල පහසුකම් වලට අත්‍යවශ්‍ය වන ප්‍රධාන අංශ තිරසාරව පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය ව්‍යාපාර වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ජාතික සංවර්ධනයට, ආර්ථික අඛණ්ඩතාවයට සහ රාජ්‍ය සේවා සැපයීමට තීරණාත්මක වන බලශක්ති, ජලය, සෞඛ්‍ය සේවා, ඉදිකිරීම් සහ ප්‍රවාහන අංශ මෙයට ඇතුළත් වේ. ඒවායේ උපායමාර්ගික වැදගත්කම හඳුනා ගනිමින්, නියාමන රාමුවේ පරාමිතීන් තුළ, හොඳින් ව්‍යුහගත, වගකීම් සහගත සහ තිරසාර මූල්‍යකරණ විසඳුම් හරහා ආර්ථිකයේ මෙම අත්‍යවශ්‍ය අංශවලට සහාය වීමට බැංකුව කැපවී සිටී.

මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ද්‍රවශීලතා කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා නිර්මාණය කර ඇති රාජ්‍ය ව්‍යවසායන් සඳහා ඉන්ධන කාඩ්පත වැනි නව්‍ය මූලපිරීම් ඇතුළුව, රාජ්‍ය ව්‍යවසායන් සඳහා බැංකුව විසින් නව මූල්‍ය විසඳුම් ලබා දෙන ලදී. සමහර රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීමේදී, ආයතනික කාර්යසාධනය ශක්තිමත් කිරීම සහ රාජ්‍ය අංශයේ තිරසාර වර්ධනයට සහාය වීම සඳහා එහි කැපවීම පෙන්නුම් කිරීමේදී බැංකුව ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කළේය.

ශ්‍රී ලංකාව සිය මූල්‍ය වීකාබද්ධතාවය සහ ආයතනික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය අඛණ්ඩව ඉදිරියට ගෙන යන විට, ආර්ථික ස්ථාවරත්වය සහ දිගුකාලීන ජාතික ප්‍රගතිය මෙහෙයවන ජාතික වශයෙන් වැදගත් අංශ වලට සහාය වන අතරම, ශක්තිමත් කරන ලද නියාමන පරිසරය තුළ ඵලදායී ලෙස කටයුතු කිරීමට බැංකුව දිගටම කටයුතු කරනු ඇත.

ඉදිරි ගමන් මඟ

අවස්ථා

- පෞද්ගලික අංශ ණය ඉල්ලුම ක්‍රමයෙන් නැවත වර්ධනය වීම
- සංචාරක පැමිණීම්වල අඛණ්ඩ වර්ධනය සහ සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධන හැකියාව
- නවීන බලශක්ති, කාර්මික සහ ප්‍රමුඛ ක්ෂේත්‍ර ව්‍යාපෘති මූල්‍යකරණයේ වර්ධනය

අවදානම්

- ගෝලීය අස්ථාවරතාව, භූ දේශපාලනික ආතති, තීරු බදු/ වෙළඳ බාධක සහ විදේශ විනිමය විචලනයන්
- විශාල පරිමාණ සමාගම් ව්‍යාපෘති මන්දගාමීව ක්‍රියාත්මක වීමෙන් ණය ව්‍යාප්තියට බාධා ඇතිවීම
- රාජ්‍ය අංශ හා අගයෙන් වැඩි ණය නිරාවරණ කළඹ තුළ සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණය කිරීම

ඉදිරි උපායමාර්ගික දිශාව

කෙටිකාලීන

- නවීන බලශක්ති සහ අපනයන මූලික ව්‍යාපාර වෙත වැඩි අවධානය.
- පිරිවැටුම් කාලය හා සේවා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා ණය කළමනාකරණ ස්වයංක්‍රීයකරණය වේගවත් කිරීම.
- ආයතනික ගනුදෙනුකරුවන්ට මුදල් කළමනාකරණ විසඳුම් හඳුන්වා දීම.
- පළාත් මට්ටමේ අපනයන සංසඳ හරහා 'Export Circle' සේවා පුළුල් කිරීම.

මධ්‍ය සහ දිගුකාලීන

- නව අපනයනකරුවන් සමඟ ගැඹුරු සම්බන්ධතාවයක් ඇති කිරීම සඳහා 'Export Circle' පුළුල් කිරීම, ව්‍යුහගත වෙළඳ උපදේශන, වෙළඳපළ බුද්ධිය සහ දේශසීමා පහසුකම් සැපයීමේ හැකියාවන් වැඩි දියුණු කිරීම.
- පුනර්ජනනීය බලශක්තිය සහ උපායමාර්ගික නිෂ්පාදන ව්‍යාපෘති මූල්‍යකරණය කෙරෙහි අවධානය යොමු කිරීම තීව්‍ර කිරීම, ප්‍රාග්ධන වෙන් කිරීම ජාතික සංවර්ධන ප්‍රමුඛතා සමඟ පෙළගැස්වීම සහ තිරසාර ආර්ථික පරිවර්තනය.
- ලංකා බැංකුව, කලාපීය ආයතනික බැංකු හවුල්කරුවෙකු ලෙස ස්ථානගත කිරීම සඳහා අක්වෙරළ වෙළඳ හා භාණ්ඩාගාර හැකියාවන් වැඩි දියුණු කිරීම.
- රටේ උපායමාර්ගික ආයෝජන පියවර හරහා ව්‍යාපාරික අවස්ථා වැඩි දියුණු කිරීම.

ව්‍යාපාර අංශවල කාර්යසාධනය

ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම්



මෙම ව්‍යාපාරික අංශය බැංකුවේ විදේශ මුදල් ගනුදෙනු, ද්‍රවශීලතාව, අරමුදල් කළමනාකරණය සහ උපායමාර්ගික ආයෝජන ක්‍රියාකාරකම් පාලනය කරයි. එමෙන්ම බැංකුවේ විදේශීය ශාඛා ජාලය අධීක්ෂණය කරමින් ජාත්‍යන්තර බැංකු පැවැත්ම ශක්තිමත් කරයි. මෙම කාර්යභාරයන් කැටිකොට ගත් විට, දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීම සඳහා මෙහෙයුම් විශිෂ්ටත්වය සහ මූල්‍ය ස්ථායීතාව හරහා ශක්තිමත් පදනමක් සැලසේ.

ප්‍රධාන ශක්තීන්

- රාජ්‍ය සුරැකුම්පත් සහ ස්ථාවර ණය-තැන්පතු අනුපාත මගින් සහාය ලැබූ ශක්තිමත් ද්‍රවශීලතාව.
- විචක්ෂණශීලී ආයෝජන හා හෙජින් උපායමාර්ග.
- ප්‍රේෂණ වෙළඳපළ නායකත්වය සහ වැඩිම වෙළඳපළ කොටසක හිමිකාරිත්වය.
- 800 කට අධික ගෝලීය සම්බන්ධතා ඔස්සේ පිරිවැය කාර්යක්ෂම දේශසීමා ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම.
- අඛණ්ඩ වෙළඳ පියවීම් සඳහා පහසුකම් සැලසීම.
- ආයෝජන බැංකුකරණ ශක්තිය පෙන්නුම් කළ දෙවන පෙළ ප්‍රාග්ධනය රැස් කිරීම්;
  - රු. බිලියන 15.0 ක බාසල් III අනුකූල ණයකර නිකුත් කිරීම.
  - රු. බිලියන 20.0 ක බාසල් III අනුකූල තිරසාර බැඳුම්කර නිකුත් කිරීම.
- වැඩිදියුණු කළ ඩිජිටල් විසඳුම් හරහා වේගවත් හා පහසු ගනුදෙනුකාර සේවාව.

ප්‍රධාන ප්‍රතිදාන

- ද්‍රවශීලතා කළමනාකරණය
- වත්කම් හා වගකීම් කළමනාකරණය
- තැන්පතු සහ ආමුඛ ප්‍රේෂණ
- ආයෝජන බැංකු සේවා
- භාණ්ඩාගාර නිෂ්පාදන
- විදේශීය මෙහෙයුම්

මෙහෙයුම් සන්දර්භය

පසුගිය වසරේ ස්ථායීකරණය මත ගොඩනැගුණු 2025 වසර, ශ්‍රී ලංකා මූල්‍ය ක්ෂේත්‍රයේ සංහිඳියාව සහ මධ්‍යස්ථ වර්ධනයක් ලැබූ අවධියක් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ දිගුකාලීන වැඩසටහන් යටතේ ආර්ථික ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන ගිය බැවින්, ක්‍රියාකාරී පරිසරය ප්‍රතිසාධන අවධියෙන් වර්ධන-සහාය අවධියට මාරු විය. ආයෝජක විශ්වාසය වැඩිවීම, බාහිර පීඩන පහවීම සහ ආර්ථික මූලිකත්වයන් ශක්තිමත් වීම මෙයට සහාය විය.

මේ අනුව, ආර්ථික භූ දර්ශනයේ බාහිර අංශ ප්‍රකෘතිමත් වීම සහ ව්‍යුහාත්මක අවදානම් අතර සියුම් සමතුලිතතාවයක් ඇති වී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ විනිමය අනුපාත, වෙළඳපළ මත පදනම් වී ඇති අතර, අස්ථාවරත්වය සුමට කිරීමට සහ සංචිත නැවත ගොඩනැඟීමට වරින් වර මැදිහත්වීම් සිදු කරයි.

සැලකිය යුතු අවප්‍රමාණයකින් පසුව, ශ්‍රී ලංකා රුපියල ආනයන ඉල්ලුම, ප්‍රාග්ධන ප්‍රවාහ සහ ගෝලීය ඩොලර් අගයට සංවේදී වුවද, සාපේක්ෂ ස්ථාවරත්වයක් පෙන්නුම් කර ඇත.

විදේශ විනිමය සංචිත ආර්බුදකාරී තත්ත්වයෙන් විතැන් වී වැඩිදියුණු වී ඇති අතර බහුපාර්ශ්වික වැඩසටහන් විදේශ විනිමය මිලදී ගැනීම් සහ ශක්තිමත් පංගම ගිණුමේ ක්‍රියාකාරිත්වය මගින් සහාය ලබා ඇත. කෙසේ වෙතත්, සංචිත ප්‍රමාණවත්භාවය උපායමාර්ගික ප්‍රමුඛතාවයක් ලෙස පවතී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි ආයතන සමඟ අඛණ්ඩව සම්බන්ධ වීම හේතුවෙන් ඇති වූ විශ්වසනීයත්වය බාහිර සංචිත ශක්තිමත් කිරීමට උපකාරී වී ඇත. සේවක ප්‍රේෂණ වල ස්ථාවර වර්ධනය සහ අඛණ්ඩ මාසික ප්‍රේෂණයන් හේතුවෙන්, විදේශ විනිමය ද්‍රවශීලතාවයේ තීරණාත්මක අංගයක් ලෙස ප්‍රේෂණ ඉස්මතු වේ. සංචාරක ඉපැයීම් යථා තත්ත්වයට පත්වීමත් සමඟ, ප්‍රේෂණ මගින් වෙළඳපළ විශ්වාසය වැඩිදියුණු වී ඇති අතර, සංචිත සමුච්චය වීමට සහය වීමෙන් දේශීය මුදල් ඒකකය මත පීඩනය අඩු වී ඇත.

මෙම පසුබිම තුළ, භාණ්ඩාගාර සහ ජාත්‍යන්තර බැංකු මෙහෙයුම්, විදේශ විනිමය ද්‍රවශීලතා ඔරොත්තු දීමේ හැකියා, විචක්ෂණශීලී ශේෂ පත්‍ර කළමනාකරණය, වෙළඳපළ අස්ථාවරත්වය පිළිබඳ ක්‍රියාකාරී අධීක්ෂණය, විවිධාංගීකරණය සහ අරමුදල් සඳහා ප්‍රමුඛත්වය දෙන රාමුවක් තුළ ක්‍රියාත්මක වේ. අරමුදල් පිරිවැය කළමනාකරණය කිරීම, ආතති තත්වයන් යටතේ සීමාවන් ආරක්ෂා කිරීම සහ ශක්තිමත් අවදානම් පාලන ක්‍රමවේදයන් පවත්වා ගැනීම, අනාගත ද්‍රවශීලතා කළමනාකරණය සඳහා කේන්ද්‍රීයව පවතී.

උපායමාර්ගයට එදිරිව කාර්යසාධනය

උපායමාර්ගික ප්‍රමුඛතා	අවදානම්	අවස්ථා	උපායමාර්ගික ප්‍රතිචාර	උපායමාර්ගික ප්‍රතිඵල
	• ගෝලීය වෙළඳපළ අහිතකර වෙනස්වීම්	• වෙළඳපළ තත්ත්වයන්හි ස්ථාවරත්වය	• පොළී අනුපාත සහ අරමුදල් ගතිකත්වයන් සමඟ ශේෂ පත්‍ර උපායමාර්ග පෙළගැස්වීමෙන් විනයගරුක වත්කම් - වගකීම් ප්‍රශස්තිකරණය	• දැඩි පොළී අනුපාත පරිසරයක් මධ්‍යයේ ශුද්ධ පොළී ආන්තිකය වැඩිදියුණු වීම
	• නියාමන සහ රෙගුලාසි වෙත අනුගත වීමේ දී ඇති වන අභියෝග සහ මෙහෙයුම් සංකූලතා	• විධිමත් මාර්ග හරහා ප්‍රේෂණ ගලා ඒම් සඳහා ඇති ඉල්ලුම වැඩිවීම	• විධිමත් මෙහෙයුම්, ඩිජිටල් පරිවර්තනය සහ ශක්තිමත් පාලනය	• විනිමය අනුපාත අස්ථාවරත්වය හා සම්බන්ධ අවදානම් සාර්ථකව කළමනාකරණය කිරීම
	• දේශගුණික විපර්යාස සහ පාරිසරික බාධක	• වැඩිදියුණු කළ ජාත්‍යන්තර සබඳතා සහ අරමුදල් ප්‍රවාහ	• වෙළඳපළ තත්ත්වයන්, ශේෂ පත්‍ර ප්‍රමාණය සහ අවදානම් අභිරුචිය පිළිබිඹු කිරීම සඳහා අවදානම් සීමා සමාලෝචනය කර නැවත නිර්වචනය කිරීම	• නියාමන අවශ්‍යතා වලට වඩා ශක්තිමත් ප්‍රාග්ධන ස්වාරක්ෂක පවත්වා ගැනීම
		• තිරසාරභාවය හා සම්බන්ධ ණය උපකරණ සඳහා වැඩි ඉල්ලුමක්	• මූල්‍යකරණ උපායමාර්ගයට, තිරසාරභාවය පිළිබඳ මූලධර්ම ඒකාබද්ධ කිරීම	• සුවිශේෂී සංධිස්ථානයක් සනිටුහන් කරමින් බාසල් III අනුකූල රු. බිලියන 20.0 ක තිරසාරත්ව බැඳුම්කර නිකුත් කරන ලදී
		• විදේශීය වෙළඳපළ තුළ වර්ධනය වෙමින් පවතින අවස්ථා	• ප්‍රම්තිගත ක්‍රියාවලියක් සහ ක්‍රියා පටිපාටි හරහා විදේශීය ශාඛාවල කාර්යසාධනය වැඩිදියුණු කිරීම	
	• වර්ධනය වන තරඟකාරීත්වය	• සංක්‍රමණික සේවකයින් කඩිනම් හා කාර්යක්ෂම, විධිමත් ක්‍රම හරහා මුදල් ප්‍රේෂණය කිරීමට දක්වන දැඩි කැමැත්ත	• විචක්ෂණශීලී ගනුදෙනු ව්‍යුහගත කිරීම සඳහා අන්තර් බැංකු ඒකක සමඟ වඩා හොඳ සහයෝගීතාවයක්	• ආමුඛ සහ සේවක ප්‍රේෂණවල පරිමාවන් සහ වටිනාකම් වැඩිවීම
		• විශ්වාසය හරහා ආයෝජකයින් ශක්තිමත් කිරීම	• ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීම	• මාලදිවයින, සීෂෙල්ස් සහ චෙන්නායි හි පුළුල් කරන ලද ණය පහසුකම්
		• නවෝත්පාදන ආයෝජන, භාණ්ඩාගාර නිෂ්පාදන සහ සේවා	• ආයෝජන බැංකු සේවා වැඩිදියුණු කිරීම	• ගනුදෙනුකාර සහභාගීත්ව ක්‍රියාකාරකම් හරහා ශක්තිමත් සබඳතා වර්ධනය කර ගැනීම
			• විදේශීය ගනුදෙනුකාර සබඳතා ශක්තිමත් කිරීම	
	• විදේශයන්හි තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇති වන අභියෝග	• තීරණ ගැනීම සඳහා කෘතිම බුද්ධිය සහ උසස් විශ්ලේෂණ භාවිතය	• භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය සහ තත්‍ය කාලීන තොරතුරු දර්ශක පුවරු හඳුන්වාදීම	• වැඩිදියුණු කළ කාර්යක්ෂමතාව, අවදානම් අධීක්ෂණය සහ භාණ්ඩාගාර කටයුතු පිළිබඳ කාලෝචිත සමාලෝචනය
	• සයිබර් ආරක්ෂාව සහ දත්ත ආරක්ෂාව සම්බන්ධ අවදානම්	• ඩිජිටල්කරණය සඳහා ගනුදෙනුකරුවන් වැඩි වශයෙන් අනුගත වීම	• ඩිජිටල් ප්‍රේෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම	• Smart Remit ජංගම යෙදුම දියත් කරන ලදී
			• විදේශීය ශාඛා වල සේවා සැපයීම වර්ධනය සඳහා පද්ධති වැඩිදියුණු කිරීම	• චෙන්නායි - ඉන්දියාවේ අනෙකුත් බැංකු සමඟ ස්ථාවර නියෝග ක්‍රියා පටිපාටිය ස්වයංක්‍රීයකරණය
				• මාලදිවයින – FTI පද්ධතිය හරහා ආමුඛ ප්‍රේෂණ ස්වයංක්‍රීයකරණය කිරීම
				• මාලදිවයින සහ සීෂෙල්ස් ශාඛා සඳහා විස්තීර්ණ AML සහ CFT පද්ධති විසඳුම්
	• අහිතකර දේශීය හා ගෝලීය ආර්ථික පරිසරය	• සංක්‍රමණික සේවක සහ ඉහළ ශුද්ධ වටිනාකම් අංශවල ණය වර්ධනය	• සංක්‍රමණික සේවකයින් සහ ඉහළ ශුද්ධ වටිනාකමක් ඇති සේවාදායකයින් සඳහා පුළුල් කරන ලද ණය පහසුකම්	• සංක්‍රමණික සේවකයින් සඳහා පිටත්වීමට පෙර ණය පහසුකම් 5,000 කට වඩා සැපයීම
	• විදේශීය ණය සහ අරමුදල් ප්‍රවාහ සඳහා සීමාවන්	• විදේශ ණය කළඹ පුළුල් කිරීම	• පුළුල් කරන ලද විදේශ ණය මෙහෙයුම්	• සමස්ත ණය කළඹෙහි වර්ධනය
			• විදේශ ශාඛාවල අදියර 3 ණය අධීක්ෂණය ශක්තිමත් කිරීම	• විදේශීය ශාඛා වල අදියර 3 ණය කළඹ අඩු කිරීම

ව්‍යාපාර අංශවල කාර්යසාධනය

උපායමාර්ගික ප්‍රමුඛතා	අවදානම්	අවස්ථා	උපායමාර්ගික ප්‍රතිචාර	උපායමාර්ගික ප්‍රතිඵල
	• කුසලතා රඳවා ගැනීම සහ අත්පත් කර ගැනීම	• ඉහළ තාක්ෂණික හා කුසලතා සහිත මානව සම්පත්	• කාර්ය මණ්ඩලයේ කුසලතා වැඩි දියුණු කිරීම සහ නිපුණතා ගොඩනැඟීම සඳහා විශේෂිත පුහුණුවක් • නිතිපතා ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ මූලපිරීම්	• විදේශ ශාඛා හරහා කාර්ය මණ්ඩල ශක්තිය වැඩි දියුණු කිරීම • ලංකා බැංකු කණ්ඩායමේ වැඩිදියුණු කළ නිපුණතාවය සහ කුසලතා

බැංකුවේ ජාත්‍යන්තර අංශය

බැංකුවේ ජාත්‍යන්තර අංශය, විදේශ මුදල් ගලා ඒම ආරක්ෂා කිරීම, ගෝලීය මූල්‍ය සම්බන්ධතාවය ශක්තිමත් කිරීම සහ බාධාවකින් තොරව දේශසීමා ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම මගින් ජාත්‍යන්තර කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ව්‍යුහගත ගෝලීය ජාලයක් සහ විශේෂිත මෙහෙයුම් රාමුවක් හරහා, මෙම අංශය විදේශ මුදල් ද්‍රවශීලතාවයේ ස්ථාවර පැවැත්ම සහතික කරයි, එය බැංකුවේ මෙහෙයුම් කටයුතු වල ඔරොත්තු දීමේ හැකියාවට පමණක් නොව ශ්‍රී ලංකාවෙන් පරිබාහිරව බැංකුවේ ස්ථාවරත්වයද පවත්වා ගෙන යාම සඳහා ඉතා වැදගත් වේ.

ලොව පුරා 800 කට අධික නියෝජිත සම්බන්ධතා වලින් සමන්විත, රටේ විශාලතම නියෝජිත බැංකු ජාලය ලංකා බැංකුව විසින් පවත්වාගෙන යනු ලැබේ. මෙම පුළුල් ජාලය කාර්යක්ෂම වෙළඳ බේරුම්කරණයන් සක්‍රීය කරමින්, ආනයනකරුවන්ට සහ අපනයනකරුවන්ට ජාත්‍යන්තර ගනුදෙනු සුමටව සිදු කිරීමට සහාය වන අතරම ජාතික වෙළඳ ප්‍රවාහ සහ විදේශ විනිමය සංසරණය ශක්තිමත් කරයි.

බැංකුව තම වාණිජමය කටයුතු වලට ඔබ්බෙන් සිය වගකීම් ඉටු කරමින් ශ්‍රී ලාංකීය විදේශගත සේවක ප්‍රජාව වෙත අවශ්‍ය බැංකුකරණ සහාය ලබා දීමට නිරන්තරයෙන් කැපවී සිටී. රටවල් 11 ක් පුරා ව්‍යාපාරික ප්‍රවර්ධන නිලධාරීන් 30 කට අධික සංඛ්‍යාවක් යොදවා ඇති ජාත්‍යන්තර අංශය, සංක්‍රමණික ප්‍රජාවන් අතර මූල්‍ය ඇතුළත් කිරීම සක්‍රීයව ප්‍රවර්ධනය කරමින්, උපදේශන සහාය ලබා දීමෙන් වගකිවයුතු මූල්‍ය කළමනාකරණ පිළිවෙත් දිරිමත් කරයි. මෙම ගෝලීය පැවැත්ම තිරසාර ප්‍රේෂණ ගලා ඒම් පෝෂණය කරන අතරම විදේශගත ශ්‍රී ලාංකිකයන් සමඟ සබඳතාව ශක්තිමත් කරයි.

2025 දී, බැංකුව ආමුඛ ප්‍රේෂණවල සිය නායකත්වය තවදුරටත් තහවුරු කර ගත් අතර, සැලකිය යුතු වෙළඳපළ කොටසක් අත්පත් කර ගනිමින්, පරිමාව සහ වටිනාකම යන දෙකෙහිම ශක්තිමත් වර්ධනයක් පිළිබිඹු කළේය. මෙම කාර්යසාධනය ලොව පුරා ශ්‍රී ලාංකිකයන් විසින් ලංකා බැංකුව කෙරෙහි තබා ඇති විශ්වාසය අවධාරණය කරන අතර බැංකුවේ ඉලක්කගත වෙළඳපළ උපායමාර්ගවල සහ සේවා වැඩිදියුණු කිරීම්වල ඵලදායීතාවය පිළිබිඹු කරයි.

වසර තුළ, ජාත්‍යන්තර අංශය ප්‍රමුඛතා වේදිකා හරහා ප්‍රේෂණ නාලිකා විවිධාංගීකරණය කරමින් ගෝලීය පියසටහන පුළුල් කළේය. 'Smart Remit' ජංගම යෙදුම හරහා ඩිජිටල් ප්‍රේෂණ හැකියාවන් වැඩිදියුණු කිරීමට ප්‍රවේශය පුළුල් කළ අතර, ජාත්‍යන්තර කාඩ්පත් ජාල හරහා ගනුදෙනුකරුවන්ට පහසුවෙන් අරමුදල් හුවමාරු කිරීමට හැකි විය. තවද, ප්‍රේෂණ සැකසුම් සහ වෙළඳ පියවීම් කාර්යයන් ස්වයංක්‍රීය කිරීම, වර්ධනය වන ගනුදෙනු පරිමාවන් කළමනාකරණය කිරීමේදී පිරිවැටුම් කාලය අඩු කිරීම, වැඩිදියුණු කළ නිරවද්‍යතාවය සහ පරිමාව ද වැඩි දියුණු කරන ලදී. මීට සමගාමීව, ජාත්‍යන්තර අංශය ප්‍රධාන කාර්යාලයේ බහු මුදල් සංචාරක කාඩ්පත් සහ සංචාරක මෙහෙයුම් ද සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන්තොටුපළවල හුවමාරු කවුන්ටර හරහා ගනුදෙනුකාර පහසුව ද වැඩි දියුණු කරයි.

බැංකුවේ උපායමාර්ගයේ කේන්ද්‍රීය අංගයක් ලෙස ගනුදෙනුකාර සහභාගීත්වය පැවතුනි. "පිට-පිට රටතෑගි" 4 වන වාරය වැනි දිරිගැන්වීම් මත පදනම් වූ මූලපිරීම් සංක්‍රමණික සබඳතා ශක්තිමත් කරයි. ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය (SLBFE) සමඟ සහයෝගයෙන් පවත්වන ලද BOC රන් කහවනු වැඩසටහන, විතෙර මෙතෙර රූපවාහිනී වැඩසටහන ඇතුළු අනුපූරක ව්‍යාපාර දැනුවත් කිරීමේ වැඩසටහන්, ප්‍රජා සම්බන්ධතා ප්‍රයත්නයන් ශක්තිමත් කළ අතර විධිමත් නාලිකා භාවිතය දිරිමත් කළේය.

ගනුදෙනුකාර කේන්ද්‍රීය මූල්‍ය සහකරුවෙකු ලෙස, බැංකුව සංක්‍රමණික සේවකයින්ට උචිත පුළුල් මූල්‍ය විසඳුම් අඛණ්ඩව ලබා දුන්නේය. විදේශ රැකියාවල සුවිශේෂී මූල්‍ය ජීවන චක්‍ර හඳුනා ගනිමින්, බැංකුව වසර තුළ පූර්ව පිටත්වීමේ ණය පහසුකම් 5,000 කට වඩා ලබා දුන් අතර, ඔවුන්ගේ ගමනේ සෑම අදියරකදීම මූල්‍ය සහාය සහතික කළේය. මෙම ව්‍යුහගත පහසුකම් සංක්‍රමණික සේවකයින්ට ඔවුන්ගේ අභිලාෂයන් හඹා යාමට බලගන්වන අතරම ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතියට අර්ථවත් ලෙස දායක වේ.

ගනුදෙනුකාර සේවා සඳහා කැප වූ ඒකකයක් වන ජාත්‍යන්තර අංශයේ 'Forign Circle', වසර තුළ 'My Sri Lanka' තැන්පතු යෝජනා ක්‍රමය නැවත දියත් කිරීම, ගනුදෙනුකාර විමසීම් කඩිනමින් කළමනාකරණය කිරීම සහ නව ගනුදෙනුකරුවන් ඇතුළත් කිරීම මගින් සේවා විශිෂ්ටත්වය තවදුරටත් වැඩිදියුණු කළේය. ප්‍රතිචාරාත්මක, සබඳතා මත පදනම් වූ මැදිහත්වීම් තුළින්, 'Forign Circle' ලොව පුරා සිටින ශ්‍රී ලාංකිකයින්ට ගෝලීය මට්ටමේ බැංකු අත්දැකීමක් ලබා දීම සඳහා ලංකා බැංකුවේ කැපවීම ශක්තිමත් කරයි.

භාණ්ඩාගාරය

බැංකුවේ මූල්‍ය ස්ථාවරත්වය, ද්‍රවශීලතා ශක්තිය සහ අවදානම් වලට ඔරොත්තු දීමේ හැකියාව ආරක්ෂා කිරීම සඳහා භාණ්ඩාගාර අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. 2025 වසර තුළ, ක්‍රමයෙන් ස්ථාවර වෙමින් පවතින සාර්ව ආර්ථික පසුබිමක් මධ්‍යයේ ජාතික ආර්ථික ප්‍රමුඛතාවන්ට සහාය වෙමින් ශේෂ පත්‍ර ප්‍රශස්තිකරණය ශක්තිමත් කිරීමේදී භාණ්ඩාගාර අංශය උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියා කළේය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සහනශීලී ප්‍රතිපත්ති රාමුව තුළ ක්‍රියාත්මක වන භාණ්ඩාගාරය, ස්ථාවර සහ පාවෙන අනුපාත උපකරණ අතර ක්‍රමාංකනය කරන ලද හුවමාරුවීම්

හරහා වත්කම් සහ අරමුදල් පිරිවැය ගතිකව කළමනාකරණය කළේය. පොළී සංවේදී වත්කම් සහ වගකීම් උපායමාර්ගිකව ප්‍රතිමිල කිරීම ශුද්ධ පොළී ආදායමේ කැපී පෙනෙන වර්ධනයට දායක විය. වත්කම් සහ වගකීම් කමිටුවේ (ALCO) අධීක්ෂණය යටතේ පරතර විශ්ලේෂණය, කාල සීමා නිරීක්ෂණය සහ සංවේදීතා ඇගයීම් හරහා පොළී අනුපාත නිරාවරණයන් අඛණ්ඩව තක්සේරු කරන ලද අතර, පොළී අනුපාත හැසිරීම් වලට අනුගතව ශේෂ පත්‍රයේ විවක්ෂණශීලී ස්ථානගත වීම සහතික කරන ලදී.

බැංකුව ප්‍රාග්ධන අනුපාත, නියාමන සීමාවන්ට වඩා ඉහළින් පවත්වා ගෙන ගිය අතර, කම්පන අවශෝෂණය කර ගැනීමේ හැකියාව ශක්තිමත් කරමින් වර්ධනයේ ගම්‍යතාවය පවත්වා ගත්තේය. දේශීය හා විදේශීය මුදල් දෙකෙහිම ද්‍රවශීලතා ස්වාරක්ෂක ශක්තිමත්ව පැවතුන අතර, වෙළඳපළ අස්ථාවරත්ව කාල පරිච්ඡේදවලදී පවා මෙහෙයුම් ස්ථාවරත්වය සහ ගනුදෙනුකාර විශ්වාසය ආරක්ෂා කළේය.

පෙර වසරවලට සාපේක්ෂව මුදල් චලනයන්හි සාපේක්ෂ ස්ථාවරත්වය, විදේශීය මුදල් ද්‍රවශීලතාවය සහ බාහිර අංශයේ තිරසාරභාවය වැඩි දියුණු කිරීම සඳහා ජාතික උත්සාහයන්ට අඛණ්ඩව සහාය වන අතරම, වඩාත් ඵලදායී භාණ්ඩාගාර ප්‍රශස්තිකරණයට හැකියාව ලබා දුන්නේය.

වසර පුරාම, භාණ්ඩාගාරය වත්කම්-වගකීම් ප්‍රශස්තකරණය, අරමුදල් ව්‍යුහයන් සහ ආයෝජන උපායමාර්ග පරිණාමය වන වෙළඳපළ තත්ත්වයන් සමඟ පෙළගැස්වීම කෙරෙහි අඛණ්ඩ අවධානයක් යොමු කළේය. ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) සහ ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR) නියාමන අවශ්‍යතා වලට වඩා ඉහළින් පැවති අතර, එය විවක්ෂණශීලී භාරකාරත්වය සහ ඔරොත්තු දෙන ද්‍රවශීලතා කළමනාකරණය පිළිබිඹු කරයි. මෙය ආර්ථික ප්‍රමුඛතා අංශ හරහා ණය ව්‍යාප්තියට සහාය විය.

රජයේ සුරැකුම්පත් සහ නැවත විකිණීමේ ගිවිසුම් යටතේ සුරැකුම්පත්වල ආයෝජන, වත්කම් වර්ධනයට සහ ද්‍රවශීලතා ශක්තියට අඛණ්ඩව සහාය විය. පොළී අනුපාත අවදානම අවම කරන අතරම ඉපයුම ප්‍රශස්ත කිරීම සඳහා කෙටිකාලීන සහ මධ්‍ය කාලීන උපකරණ හරහා කල්පිරීමේ කාල පරාසයේ බලපෑම සමතුලිත කරන ලදී. ශුද්ධ විවෘත සහ අවිනිශ්චිත නිරාවරණ අඛණ්ඩව අධීක්ෂණය කිරීම හරහා අනුමත සීමාවන් තුළ විදේශ මුදල් නිරාවරණ දැඩි ලෙස කළමනාකරණය කරන ලදී. විනිමය අනුපාත අස්ථාවරත්වය කළමනාකරණය කිරීමට සහ ගනුදෙනු ප්‍රවාහ ආරක්ෂා කිරීමට, ජාත්‍යන්තර බැඳීම් සහ ගනුදෙනුකාර අවශ්‍යතා සපුරාලීමට බැංකුවට ඇති හැකියාව සහතික කිරීමට ඉදිරි ගිවිසුම් සහ මුදල් හුවමාරු සක්‍රීයව භාවිතා කරන ලදී.

හෙජින් කටයුතු සාක්ෂාත් කර ගැනීම සඳහා විදේශ මුදල් වත්කම් වර්ධනය සමඟ පෙළගැස්වූ තෝරාගත් වෙළඳපළ අරමුදල් මඟින් අනුපූරකව, ස්ථාවර ගනුදෙනුකාර තැන්පතු පදනමක් මත අරමුදල් ප්‍රශස්තිකරණය සිදු කෙරුණි.

පුළුල් වෙළඳපළ අවදානම් රාමුවක් හරහා පොළී අනුපාත, විදේශ විනිමය, කොටස් සහ ණය වෙළඳපළ හරහා පාලනය වන කටයුතු අධීක්ෂණය කෙරුණි. මෙම රාමුව ආතති පරීක්ෂා කිරීම, අවදානම් අගය (VaR) නිරීක්ෂණය, අලාභ නැවැත්වීමේ සීමාවන් සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් අභිරුචි පරාමිතීන් සමෝධානය කරයි. භාණ්ඩාගාරය, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ ALCO අතර සමීප සම්බන්ධීකරණය මඟින් පරිණාමය වන සාර්ව ආර්ථික සහ නියාමන තත්ත්වයන්ට කඩිනම් ප්‍රතිචාර දැක්වීමට හැකියාව ලැබුණි.

වර්ෂය තුළ, අධීක්ෂණය සහ තීරණ ගැනීම තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා පුළුල් භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් සහ තත්‍ය කාලීන උපකරණ පුවරු හඳුන්වා දෙන ලදී. මෙම මෙවලම් ද්‍රවශීලතා සැලසුම් කිරීම, විනිවිදභාවය වැඩිදියුණු කිරීම සහ විනයගරුක ශේෂ පත්‍ර කළමනාකරණය සහ ආයතනික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරමින් වෙළඳපළ, ද්‍රවශීලතාවය සහ පොළී අනුපාත අවදානම් පිළිබඳ ක්‍රියාකාරී අධීක්ෂණයක් සක්‍රීය කළේය.

ආයෝජන බැංකුකරණය

ආයෝජන බැංකු අංශය, 2025 තුළ නව්‍ය මූල්‍ය විසඳුම් සැපයීමෙන් සහ තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමෙන් බැංකුවේ මූල්‍ය පදනම සහ ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළඳපළ වැඩි කිරීමේ නායකත්වය ප්‍රදර්ශනය කළේය.

මෙම අංශය භාරකරු-භාරකාර, ධන කළමනාකරණය සහ හිමිකාර ආයෝජන ක්‍රියාකාරකම් යන විවිධ කළඹ කළමනාකරණය කරයි. භාරකරු සහ භාරකාර ගනුදෙනුවල විශ්වාසය ශක්තිමත්ව පැවති අතර, කොටස්, ණයකර, බැඳුම්කර සහ ඒකක භාර හරහා හිමිකාර ආයෝජන සක්‍රීයව කළමනාකරණය කරමින් ස්ථාවර වර්ධනයක් වාර්තා කළේය.

ඊට සමගාමීව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලද ආයෝජන කළමනාකරණ බලපත්‍රය යටතේ ආයතනික මූල්‍ය උපදේශන බලපත්‍ර සහ ක්‍රියාකාරීව කළමනාකරණය කරන ලද ධනය කළමනාකරණ කළඹ යටතේ ආයතනික උපදේශන සේවා සපයන අතර, එමඟින් ශක්තිමත් ආයෝජන කළඹක් ගොඩනැගීම, විවක්ෂණශීලී අවදානම් කළමනාකරණය සහ සේවාදායකයින් සඳහා ස්ථාවර වටිනාකම් නිර්මාණය කිරීම සහතික කෙරේ. මෙම අංශයේ වර්ධනය වේගවත් කිරීම සඳහා කැපවූ ධනය කළමනාකරණ ඒකකයක් (Wealth Management Unit) ස්ථාපිත කරන ලද අතර, එයට විශේෂඥතාවෙන් යුත් විශේෂිත කණ්ඩායමක සහාය ලැබුණි. මෙම උපායමාර්ගික වැඩිදියුණු කිරීම උපදේශන හැකියාවන් ගැඹුරු කළ අතර ඉහළ ශුද්ධ වටිනාකමක් ඇති සහ ආයතනික සේවාදායකයින් සඳහා සකස් කළ ආයෝජන විසඳුම් පුළුල් කළේය.

CSE ක්ලියර් (පුද්ගලික) සමාගමෙහි වෘත්තීය නිෂ්කාශන සාමාජික තත්ත්වය ලබා ගැනීමෙන්, වෙළඳ සහ පියවීම් කාර්යයන් හරහා මෙහෙයුම් කාර්යක්ෂමතාවද, ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් සහ සේවා සැපයීම වැඩි දියුණු කිරීම හරහා ප්‍රාග්ධන වෙළඳපළ පැවැත්මද තවදුරටත් ශක්තිමත් කළේය.

2025 දී අංශයේ ප්‍රධාන සන්ධිස්ථානයක් වූයේ බාසල් III අනුකූල තිරසාර බැඳුම්කර නිකුත් කිරීමයි. එමඟින් පුනර්ජනනීය බලශක්තිය, බලශක්ති කාර්යක්ෂමතාව, තිරසාර ජලය සහ අපද්‍රව්‍ය කළමනාකරණය වැනි සමාජීය සහ හරිත ව්‍යාපෘති සඳහා මෙන්ම කෘෂිකර්මාන්තය, MSME මූල්‍යකරණය, සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය සහ මූලික යටිතල පහසුකම් වැනි සමාජීය අංශ සඳහා මූල්‍යකරණය වෙනුවෙන් රු. බිලියන 20.0 ක් සාර්ථකව රැස් කර ඇත. තිරසාර බැඳුම්කර නිකුත් කිරීමට පෙර, බැංකුවේ ප්‍රාග්ධන ව්‍යුහය තවදුරටත් ශක්තිමත් කරමින් බාසල් III අනුකූල, ස්ථර 2 ලැයිස්තුගත, ශ්‍රේණිගත, සුරැකුම් රහිත, යටත් කාලීන, නිදහස් කළ හැකි ශක්‍යතා නොමැති විට ඉවත් කළ හැකි පස් අවුරුදු ණයකර හරහා රු. බිලියන 15.0 ක් රැස් කළේය.

ව්‍යාපාර අංශවල කාර්යසාධනය

මෙම අංශය, කොළඹ කොටස් වෙළඳපළ, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන රාමු වලට අනුකූල වෙමින්, ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් සහ යහපාලන යාන්ත්‍රණයන්ගෙන් සහාය ලබා ගනිමින්, තම සේවාදායකයින්ගේ යහපත වෙනුවෙන් ක්‍රියා කිරීමට, අඛණ්ඩතාව සහ විනිවිදභාවයෙන් යුත් ව්‍යාපාරික පිළිවෙත් ආරක්ෂා කිරීමට කැපවී සිටී.

ආයෝජන තීරණ පාරිසරික, සමාජීය සහ යහපාලන අවදානම් තක්සේරු කිරීම් ඇගයීමේ ක්‍රියාවලියට ඒකාබද්ධ කරයි. වර්ෂය තුළ, මෙම අංශය බැංකුවේ තිරසාර මූල්‍ය රාමුවට අනුකූලව තිරසාර බැඳුම්කර නිකුත් කිරීම සාර්ථකව ව්‍යුහගත කළේය. වගකීම් සහගත මූල්‍ය ක්ෂේත්‍රයේ නායකත්වය පෙන්නුම් කරමින් සහ තිරසාර ප්‍රාග්ධන වෙළඳපළ සංවර්ධනය සඳහා එහි කැපවීම ශක්තිමත් කළේය.

සාමූහිකව, මෙම ජයග්‍රහණ මගින් ප්‍රාග්ධන වෙළඳපළ සංවර්ධනයේ උපායමාර්ගික සක්‍රීය කරන්නෙකු ලෙස සහ දිගුකාලීන කොටස්කරුවන්ගේ වටිනාකම් නිර්මාණය සඳහා ප්‍රධාන දායකයෙකු ලෙස ආයෝජන බැංකු අංශයේ කාර්යභාරය නැවත තහවුරු වේ.

විදේශීය ශාඛා

චෙන්නායි, මාලදිවයින සහ සීෂෙල්ස් හි පිහිටි ලංකා බැංකුවේ විදේශීය ශාඛා, බැංකුවේ දේශීය ශක්තියේ වැදගත් පවුරක් ලෙස සේවය කරමින් එහි ජාත්‍යන්තර පියසටහන ශක්තිමත් කරන අතර ගෝලීය සබඳතා වැඩි දියුණු කරයි.

චෙන්නායි

චෙන්නායි ශාඛාව ඉන්දියාවේ අඛණ්ඩ මෙහෙයුම්වල 30 වන සංවත්සරය සැමරිය. බහු ආගමික ආශීර්වාද, තිරසාරභාවය සංකේතවත් කරන රුක් රෝපණ වැඩසටහනක් සහ කාර්ය මණ්ඩලය සහ ගනුදෙනුකරුවන් සමඟ ගැඹුරු සම්බන්ධතාවයක් ඇති කළ රුධිර පරිත්‍යාග වැඩසටහනක් හරහා මෙම අවස්ථාව සංකේතවත් කරන ලදී. සංවත්සරය සැමරීම සඳහා විශේෂ ස්ථාවර තැන්පතු නිෂ්පාදන ද හඳුන්වා දෙන ලදී.

මෙහෙයුම් වශයෙන්, ශාඛාව තින්දිවානම් SIPCOT කාර්මික උද්‍යානයේ නවීන කඳු සැකසුම් සහ අපනයන පහසුකමක් ස්ථාපිත කිරීම සඳහා විශේෂ අරමුදලක් සැපයීම තුළින් කාර්මික වර්ධනයට සහාය විය. වසර තුළ, ශාඛාව ආපදා ප්‍රතිසාධන අංශය ක්‍රියාත්මක කිරීම, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම (AML) සහ ව්‍යුහගත මූල්‍ය පණිවිඩ පද්ධතිය (SFMS) වැඩිදියුණු කිරීම, ඉන්දියාවේ අනෙකුත් බැංකු සමඟ ස්ථාවර නියෝග ක්‍රියා පටිපාටිය ස්වයංක්‍රීය කිරීම සහ ඉන්දියානු සංචිත බැංකුවේ අඛණ්ඩ චෙක්පත් නිෂ්කාශන රාමුව සමඟ චෙක්පත් නිෂ්කාශන මෙහෙයුම් පෙළගස්වා ගැනීමෙන් එහි තාක්ෂණික සහ මෙහෙයුම් යටිතල පහසුකම් ශක්තිමත් කළේය.

චෙන්නායි ශාඛාව බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම්වල ප්‍රධාන ස්ථම්භයක් බවට පත්ව ඇති අතර ඉන්දියාවේ ඇති එකම ශ්‍රී ලාංකික බැංකුකරණ පැවැත්ම බවට පත්ව ඇත. දශක තුනක් තිස්සේ, එය වෙළඳාම, ආයෝජන සහ ප්‍රේෂණ සඳහා විශ්වාසදායක මාර්ගයක් ලෙස සේවය කර ඇති අතර, සුමට මූල්‍ය ප්‍රවාහයන් සහ ගැඹුරු කලාපීය ඒකාබද්ධතාවයක් ඇති කරයි.

මාලදිවයින

2025 වසර තුළ, මාලදිවයින ශාඛාව, තැන්පතු වගකීම් ප්‍රති මිලකරණය, රජයේ සුරැකුම්පත් කළඹ ප්‍රශස්ත කිරීම සහ දිගුකාලීන අරමුදල් මූලාශ්‍ර ශක්තිමත් කිරීම ඇතුළු, පවතින ආර්ථික තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන්, විචක්ෂණශීලී ශේෂ පත්‍ර කළමනාකරණ පියවරයන් අනුගමනය කළේය. සංචාරක, දේපළ වෙළඳාම් සහ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ණය දීම කෙරෙහි අවධානය යොමු කළ අතර, නිවාඩු නිකේතන සහ සංවර්ධන මූල්‍යකරණයේ බැංකුවේ නායකත්වය ශක්තිමත් කළේය.

වසර තුළ මහා පරිමාණ ආගන්තුක සත්කාර සහ වාණිජ සංවර්ධන අවස්ථා කිහිපයක් සඳහා මූල්‍යකරණය කරන ලද අතර, එමඟින් මාලදිවයිනේ සංචාරක කර්මාන්තය මත පදනම් වූ ආර්ථිකයේ ප්‍රධාන හවුල්කරුවෙකු ලෙස ශාඛාවේ ස්ථානය තවදුරටත් තහවුරු විය. ඒ සමඟම, AML සහ අනුකූලතා වැඩිදියුණු කිරීම්, ප්‍රේෂණ ස්වයංක්‍රීයකරණය සහ කඩිනම් අනුකූලතාවය ඇතුළු පද්ධති වැඩිදියුණු කිරීම් හරහා මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව සහ නියාමන අනුකූලතාවය ශක්තිමත් කළේය.

පැනවූ විදේශ මුදල් සීමාවන් සහ ප්‍රේෂණ නැවත මෙරටට ගෙන්වා ගැනීමේ අභියෝග මධ්‍යයේ වුවද, ශාඛාව ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් පෙන්නුම් කළ අතර, සමූහයේ විදේශීය ලාභ සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය. සේවක ප්‍රේෂණ, වෙළඳ සහ කාඩ්පත් මෙහෙයුම්, අක්වෙරළ බැංකු සහයෝගිතාවයන්, 'Export Circle' සම්බන්ධීකරණය සහ ඒකාබද්ධ මූල්‍යකරණය හරහා ශ්‍රී ලංකාව සඳහා අර්ථවත් වටිනාකමක් ජනනය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

සීෂෙල්ස්

ගනුදෙනුකාර උපායමාර්ගික කළමනාකරණය, පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය සහ තාක්ෂණික දියුණුව යන සංකලනයක් හරහා ශාඛාව, සිය මෙහෙයුම් ශක්තිමත් කළේය. බැංකුවේ ප්‍රධාන නිලධාරීන්ගේ සීෂෙල්ස් ශාඛා විසිත්ත කිරීම් හරහා චිරට නියාමකයින්, ඉහළ ශුද්ධ වටිනාකමක් ඇති ගනුදෙනුකරුවන්, ශ්‍රී ලාංකික මහ කොමසාරිස්, අනෙකුත් බැංකු සහ පාර්ශ්වකරුවන් හමුවෙන් එම ශාඛාවේ පැවැත්ම සහ සබඳතා තවදුරටත් ශක්තිමත් විය. මෙම අන්තර්ක්‍රියා මගින් විශ්වාසය සහ සහයෝගිතාවය වැඩිදියුණු වූවා පමණක් නොව, ක්‍රියාශීලී සහ ගනුදෙනුකාර කේන්ද්‍රීය ආයතනයක් ලෙස ශාඛාවේ කීර්ති නාමයද ශක්තිමත් විය.

නියාමන සහ තාක්ෂණික අවශ්‍යතා වලට අනුකූලව, ශාඛාව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ අධීක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා නව AML විසඳුමක් යෙදවූ අතර සීෂෙල්ස් මහ බැංකුවේ ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලියට අනුකූලව RTGS පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ SEFT MQ උත්ශ්‍රේණි කිරීමට හැකිවන පරිදි MT සිට MX පණිවිඩකරණය දක්වා පරිවර්තනය සාර්ථකව නිම කළේය.

ශ්‍රී ලංකා-සීෂෙල්ස් මිත්‍රත්ව සංගමය විසින් සංවිධානය කරන ලද රුධිර පරිත්‍යාග වැඩසටහන සහ වෙරළ පිරිසිදු කිරීමේ මුලපිරීමක් සමඟින්, ශාඛාවේ ක්‍රියාකාරකම්ව සඳහා ප්‍රජා සහභාගීත්වය වසර පුරා අඛණ්ඩව පැවතුනි.

ඊට අමතරව, ගනුදෙනුකාර ප්‍රණාම උත්සව පවත්වන ලද අතර, ශාඛාව සිය ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමට දක්වන කැපවීම ඉන් පිළිබිඹු විය. මෙම මූලපිරීම් හරහා, සීෂෙල්ස් ශාඛාව මෙහෙයුම් විශිෂ්ටත්වය, ගනුදෙනුකාර අත්දැකීම් සහ නියාමන අනුකූලතාව සඳහා ස්ථිර කැපවීමක් පෙන්නුම් කළ අතර, ගනුදෙනුකරුවන් සහ පාර්ශ්වකරුවන් සමඟ අර්ථවත් සම්බන්ධතා වර්ධනය කරමින්, ඉදිරි වසරවල තිරසාර වර්ධනයක් සඳහා ශක්තිමත් පදනමක් සකසනු ලැබීය.

ඉදිරි ගමන් මඟ

අවස්ථා

- ලංකා බැංකුවේ ජාත්‍යන්තර පැවැත්ම ශක්තිමත් කිරීම සහ නව සහ නැඟී එන වෙළඳපළවල් හරහා අවස්ථා විවෘත කිරීම මගින් ගෝලීය පියසටහන පුළුල් කිරීම.
- පුරෝකථන විශ්ලේෂණ සහ දත්ත මත පදනම් වූ තීක්ෂ්ණ බුද්ධියෙන් බල ගැන්වෙන, වැඩිදියුණු කළ මුදල් සහ ද්‍රවශීලතා පුරෝකථන හැකියාවන් සමඟ බුද්ධිමත් තීරණ ගැනීම දියුණු කිරීම.
- ප්‍රාග්ධන වෙළඳපළ උපදේශන සේවා පුළුල් කිරීම, භාරකරු සහ භාරකර මෙහෙයුම් ශක්තිමත් කිරීම සහ කළඹ කළමනාකරණ විසඳුම් ඉහළ නැංවීම සඳහා මූල්‍ය විශේෂඥතාව උපයෝගී කර ගැනීම.

අවදානම්

- ගෝලීය ව්‍යාපාර අස්ථාවරත්වය සහ භූ දේශපාලනික ආතතිය.
- ගෝලීය ද්‍රවශීලතා සීමාවන් සහ ආර්ථික මන්දගාමීත්වයන් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව මත පීඩනය වැඩි කළ හැකි අතර, ජාත්‍යන්තර බැංකු මෙහෙයුම් තුළ ශක්තිමත් ප්‍රාග්ධන සැලසුම්කරණය සහ අවදානම් කළමනාකරණය අවශ්‍ය වේ.
- ආනයන/ අපනයන ප්‍රතිපත්ති සහ විදේශ විනිමය නියාමනයන්හි අඛණ්ඩ වෙනස්කම්.

ඉදිරි උපායමාර්ගික දිශාව

කෙටිකාලීන

- ශ්‍රී ලංකා රුපියල් සහ ඇමරිකානු ඩොලර් වලින් නම් කරන ලද ණයකර සහ බැඳුම්කර නිකුත් කිරීම හරහා බැංකුවේ ප්‍රාග්ධන තත්ත්වය ශක්තිමත් කිරීම.
- ප්‍රශස්ත ශුද්ධ පොළී ආන්තිකයන් සහ ඵලදායී ද්‍රවශීලතා කළමනාකරණය හරහා භාණ්ඩාගාර හැකියාවන් වැඩි දියුණු කිරීම.
- විදේශයන්හි සිටින ගනුදෙනුකරුවන්ට ආරක්ෂිත, බාධාවකින් තොරව සහ තත්‍ය කාලීන ප්‍රේෂණ සේවා වෙත ප්‍රවේශ වීමට හැකි වන පරිදි ස්මාර්ට් රෙමිට් ජංගම යෙදුමේ ප්‍රවේශය බැංකුවේ විදේශීය ශාඛා වෙත පුළුල් කිරීම.
- දැනුවත් තීරණ ගැනීම සඳහා සහාය වීම සඳහා ඩිජිටල් හැකියාවන් වැඩි දියුණු කිරීම.
- විදේශීය ශාඛා හරහා Flex යෙදුම සංවර්ධනය කිරීම.

මධ්‍ය සිට දිගුකාලීන

- නියාමන අවශ්‍යතා සමඟ පූර්ණ අනුකූලතාවයක් සහතික කරමින් විවිධාංගීකරණය වූ කළඹක් හරහා ශක්තිමත් ද්‍රවශීලතා තත්ත්වයක් පවත්වා ගැනීම.
- ආයෝජන බැංකු නිෂ්පාදන සහ සේවා කළඹ පුළුල් කිරීම.
- තිරසාර වර්ධනයක් ඇති කිරීම, නියාමන අනුකූලතාවය සහතික කිරීම සහ දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය ශක්තිමත් කිරීම සඳහා විදේශීය ශාඛා සඳහා ප්‍රාග්ධන වෙන් කිරීම වැඩි දියුණු කිරීම.
- නව විදේශීය ශාඛා ස්ථාපිත කිරීමෙන් සහ භාවිතයට නොගත් ජාත්‍යන්තර වෙළඳපළ වලට ඇතුළු වීමෙන් බැංකුවේ ගෝලීය පැවැත්ම ශක්තිමත් කිරීම.

ගනුදෙනුකාර සේවා ප්‍රශස්තකරණය

GRI 3-3



2,413 ක
සෘජු ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන

76% ක
ගනුදෙනුකාර විනිවිද යාම

නව නිෂ්පාදන 16 ක
හඳුන්වා දීම

81% ක
ගනුදෙනුකාර තෘප්තිමත් අනුපාතය


33% ක
ශුද්ධ ප්‍රවර්ධක ලකුණු

සෑම චලනයක්ම සමස්තයටම බලපාන රුබික් ඝනකයක් මෙන්, අපගේ ගනුදෙනුකාර අත්දැකීම් උපායමාර්ගික විශ්වාසය, ප්‍රවේශය, විශ්වසනීයත්වය, නවෝත්පාදනය සහ සේවා විශිෂ්ටත්වය යන අන්තර් සම්බන්ධිත මානයන් ඔස්සේ හැඩගස්වා ඇත. අපගේ භෞතික සහ ඩිජිටල් සේවා සැපයුම් මධ්‍යස්ථාන හරහා සිදුවන සෑම අන්තර්ක්‍රියාවක්ම මෙම මූලික මානයන් ආවරණය කිරීමට සහ ශක්තිමත් කිරීමට නිර්මාණය කර ඇත.

අපගේ දිගුකාලීන සේවා විශිෂ්ටත්වය සහ විශ්වාසය මත පදනම්ව, සෑම ගනුදෙනුකරුවෙකු සමගම වන අපගේ සබඳතාවය ගනුදෙනුවක් ලෙස නොව වගකීමක් ලෙස සලකමු. මූල්‍ය ආරක්ෂාව සොයන පුද්ගලයින්ගේ සිට, වර්ධනය අපේක්ෂිත ව්‍යවසායන් සහ ප්‍රගතිය බලාපොරොත්තු වන ප්‍රජාවන් දක්වා, විශ්වාසදායක මූල්‍ය සහාය ලබා දීමට අප සතු විසඳුම් ව්‍යුහගත කර ඇත.

එමෙන්ම තාක්ෂණය, සේවා විශිෂ්ටත්වය සහ ආයතනික ශක්තිය සමපාත කිරීමෙන්, සෑම සම්බන්ධතා මධ්‍යස්ථානයක්ම තිරසාර ජාතික ප්‍රගතියට දායක වන බව සහතික කර ඇත.

තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා බලපෑම



ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා



උපායමාර්ගික ප්‍රමුඛතා



2025 සඳහා සන්දර්භය



- **පශ්චාත්-ස්ථායීකරණ ආර්ථික පරිසරය:** අසීරු ආර්ථික තත්ත්වයක් පැවති කාල පරිච්ඡේදයකින් පසු ක්‍රමානුකූල ආර්ථික ස්ථායීකරණය මත ගොඩනැගුණු විශ්වසනීයත්වය, විචක්ෂණභාවය සහ ස්ථාවර සේවා සැපයීම පිළිබඳ ගනුදෙනුකාර අපේක්ෂාවන්
- **ගනුදෙනුකාර හැසිරීම් සහ ඩිජිටල් අපේක්ෂාවන් වෙනස් වීම:** භෞතික සහ ඩිජිටල් නාලිකා හරහා වේගවත්, සරල සහ වඩාත් බාධාවකින් තොර අත්දැකීම් සඳහා වන ඉහළ අපේක්ෂාවන්
- **තරඟකාරිත්වය වැඩි වීම සහ උසස් ගනුදෙනුකාර සේවාවක් ලබා දීමේ හැකියාවන්**
- **කුඩා, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරික (MSME) අංශය වෙත පැවති මූල්‍ය ආතතිය සහ ව්‍යාපාර අඛණ්ඩතාවයේ අවශ්‍යතා:** සමබර අයකරගැනීම් සහ උපදේශන සහාය අවශ්‍ය වන MSME සහ තෝරාගත් ගනුදෙනුකාර කොටස් අතර පවතින මූල්‍ය පීඩනය
- **සේවාවේ ගුණාත්මකභාවය, විනිවිදභාවය සහ විශ්වාසය:** සන්නිවේදනයේ පැහැදිලි බව, සදාචාරාත්මක හැසිරීම සහ ප්‍රතිචාරාත්මක බව කෙරෙහි ගනුදෙනුකාර සංවේදීතාව ඉහළ නැංවීම
- **මූල්‍ය අන්තර්කරණය:** අන්තර්කරණ බෙදාහැරීමේ ආකෘති හරහා ග්‍රාමීය, ඌන සේවා සහ වෙනත් ගනුදෙනුකරුවන් සඳහා ප්‍රවේශය පුළුල් කිරීම කෙරෙහි අඛණ්ඩව අවධාරණය කිරීම

උපායමාර්ගික ප්‍රමුඛතා

විශිෂ්ට ගනුදෙනුකාර අත්දැකීම්

අපගේ ගනුදෙනුකාර උපායමාර්ගය මූල්‍ය ප්‍රවේශ්‍යතාව, සේවා විශිෂ්ටත්වය සහ වගකිවයුතු බැංකුකරණය මත පදනම් වේ. මෙම මානයන් එක්ව, තිරසාර ආර්ථික වර්ධනයට සහ දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාවට සහාය වෙමින්, රට පුරා පුද්ගලයන්ට සහ ව්‍යාපාර වලට විශ්වාසදායක මූල්‍ය හවුල්කරුවෙකු ලෙස සේවය කිරීමට බැංකුවට හැකියාව ලබා දෙයි.

ප්‍රමුඛතා ක්ෂේත්‍ර

- මූල්‍ය සේවා වෙත ප්‍රවේශය පුළුල් කිරීම
- සුවිශේෂී ගනුදෙනුකාර වටිනාකමක් ලබා දීම
- වගකීම් සහගත බැංකුකරණ පිළිවෙත් පවත්වා ගැනීම



ප්‍රමුඛතා කලාප 1

මූල්‍ය සේවා වෙත ප්‍රවේශය පුළුල් කිරීම


සෑම ප්‍රජාවකටම, සෑම කාණ්ඩයකටම සේවය කිරීම

ශ්‍රී ලංකාව සහ ජාත්‍යන්තර වෙළඳපළ පුරා විසිරී සිටින විවිධ ගනුදෙනුකරුවන් වෙත ගනුදෙනුකාර මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය පුළුල් කිරීමට ලංකා බැංකුව කැපවී සිටී. මිලියන 16 කට අධික ගනුදෙනුකරුවන්ට සේවය කරමින් අපගේ බැංකුව, පුළුල් දේශීය සහ ගෝලීය සබඳතා හරහා පුද්ගලයන්ට, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර වලට, මහා පරිමාණ සමාගම් වලට සහ රජයේ ආයතනවලට සහාය වේ. මෙහි කේන්ද්‍රය වන්නේ ගනුදෙනුකරුවන් බලගන්වන සහ සියලු පාර්ශ්වකරුවන් සඳහා වටිනාකමක් නිර්මාණය කරන කාර්යක්ෂම, ගනුදෙනුකාර කේන්ද්‍රීය, තාක්ෂණිකව දියුණු සහ ඔරොත්තු දෙන මූල්‍ය විසඳුම් ලබා දීමයි.

ඒකාබද්ධ ශාඛා ජාලය, ජංගම බැංකු ඒකක, පුළුල් වන ඩිජිටල් පරිසර පද්ධතිය සහ ජාත්‍යන්තර සබඳතා හරහා විවිධ භූගෝලීය ප්‍රදේශ හරහා ගනුදෙනුකාර සේවා සැපයීමට බැංකුවට ඇති හැකියාව සක්‍රීය කර ඇත.

ග්‍රාමීය සහ උඟන සේවා නියුක්ත ප්‍රජාවන් තුළ ප්‍රවේශ වීමට ඇති බාධක ඉවත් කිරීම, ඉතිරිකිරීමේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සහ ණය ලබා ගැනීමේ හැකියාව පුළුල් කිරීම මගින් රටේ වඩාත්ම ප්‍රවේශ විය හැකි මූල්‍ය ආයතනය ලෙස තම ස්ථානය ශක්තිමත් කිරීම අඛණ්ඩව 2025 වසර තුළද බැංකුව සිදු කර ඇත. තවද ජාතික සහ ජාත්‍යන්තර ආයතන සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයන් මගින් ජාත්‍යන්තර බැංකුකරණ හැකියාවන් තවදුරටත් ශක්තිමත් කළ අතර, දේශීය සහ ගෝලීය මූල්‍ය අවශ්‍යතා සඳහා සහාය වෙමින් ජාතික මූල්‍ය ඇතුළත්කරණ අරමුණු ඉදිරියට ගෙන ගියේය.

ගනුදෙනුකරුවන්ගේ භූගෝලීය ව්‍යාප්තිය



සම්බන්ධිත සහ ප්‍රවේශ විය හැකි සේවා ජාලයක් ගොඩනැඟීම

සෘජු ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන 2,400 කට අධික සංඛ්‍යාවක පුළුල් සේවා ජාලයක් බැංකුව සතු වේ. මෙම පුළුල් සේවා ජාලය, සේවා ලබා ගැනීමේ හැකියාව සහ ස්ථාවර ගනුදෙනුකාර සහභාගීත්වය සහතික කිරීම කෙරෙහි ලංකා බැංකුවේ අඛණ්ඩ අවධානය පිළිබිඹු කරන අතරම, තවදුරටත් මෙම සේවා විශිෂ්ටත්වය නංවමින් ගනුදෙනුකරුවන්ගේ අදහස්, යෝජනා සහ පැමිණිලි සුපරීක්ෂාකාරීව අවධානයට ගෙන අවශ්‍ය විසඳුම් සහ ක්‍රියාමාර්ග ගනු ලැබේ.

ශාඛා ජාලය, ස්වයං සේවා යටිතල පහසුකම්, ජංගම ඒකක සහ ඩිජිටල් වේදිකා හරහා පුළුල් පරාසයක විසිරුණු ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන ප්‍රශස්ත කිරීම සහ ඒකාබද්ධ කිරීම මගින් සිය ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධ වීමේ ක්‍රමවේදයක් ශක්තිමත් කිරීම 2025 වසර තුළ ද බැංකුව අඛණ්ඩව සිදු කර ඇත.

ගනුදෙනුකාර සේවා ප්‍රශස්තකරණය

ශාඛා ජාලය ප්‍රධාන ගනුදෙනුකාර සම්බන්ධිත ස්ථානය වන අතර 'ප්‍රිමියර් ශාඛා' සංකල්පය මහනුවර කලාපය දක්වා ව්‍යාප්ත කරන ලද අතර දෘශ්‍යතාව, ප්‍රවේශය සහ ගනුදෙනුකාර ප්‍රවාහය වැඩිදියුණු කිරීම සඳහා ශාඛා නැවත ස්ථානගත කිරීම් අටක් සිදු කරන ලදී. ඊට අමතරව, බැංකු සේවා ඉහළ ක්‍රියාකාරී ගනුදෙනුකාර පරිසරයකට සමීප කරමින් බණ්ඩාරවෙල, අකුරේගොඩ සහ පේරාදෙණිය යන ප්‍රදේශවල ප්‍රමුඛ ස්ථානවල සීමිත සේවා ශාඛා (LSB) තුනක් විවෘත කරන ලදී. ස්වයං සේවා යටිතල පහසුකම් අඛණ්ඩව ව්‍යාප්ත කිරීම මගින් මෙම වැඩිදියුණු කිරීම් පරිපූර්ණ විය. කාර්යක්ෂම ගනුදෙනුකාර සේවාවක් සඳහා සහාය වීම සහ සාම්ප්‍රදායික කවුන්ටර් සේවා හුරුව අඩු කිරීම සඳහා මුදල් චක්‍රීකරණ යන්ත්‍ර (CRM) 29 ක් සහ ස්මාර්ට් කලාප අටක් සේවා ජාලයට එක් කරන ලදී. එමෙන්ම අඛණ්ඩ අධීක්ෂණය මගින් සහාය වන, සුමට ගනුදෙනුකාර ප්‍රවාහයක් සහ සේවා විශ්වසනීයත්වයක් සහතික කිරීම සඳහා, පෝලිම් කළමනාකරණ පද්ධති (QMS) තවත් ශාඛා 100 කට හඳුන්වා දෙන ලදී.

මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය පුළුල් කිරීමේ අඛණ්ඩ උත්සාහයක් ලෙස, ශ්‍රී ලංකා තැපැල් සමඟ හවුල්කාරිත්වයෙන් නියෝජිත බැංකුකරණ විසඳුම වන 'BOC Connect' අඛණ්ඩව ශක්තිමත් කරන ලදී. තවද, දිවයින පුරා තැපැල් ජාලය උපයෝගී කරගනිමින් මෙම සහයෝගීතාවය ග්‍රාමීය, අර්ධ නාගරික සහ භූගෝලීය වශයෙන් හුදකලා වූ සහ ඌන සේවා ප්‍රජාවන්ට විධිමත් බැංකු සේවා ව්‍යාප්ත කරයි. වසර තුළ, තැපැල් කාර්යාල 100 කට අධික සංඛ්‍යාවක් 'BOC Connect' ස්ථාන ලෙස ක්‍රියාත්මක වූ අතර, තවදුරටත් පුළුල් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. මෙම සේවාව මගින් මීට පෙර බැංකු ප්‍රවේශයට සැලකිය යුතු බාධකවලට මුහුණ දුන් අනලයිතිව් සහ මාදු ගඟ ආශ්‍රිත දූපත් වැනි දුරස්ථ දූපත් ප්‍රජාවන් ඇතුළුව සීමිත ශාඛා පැවැත්මක් ඇති ප්‍රදේශවල බැංකු කටයුතු සඳහා ප්‍රවේශය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කරන ලදී.




'BOC Connect' හරහා, ගනුදෙනුකරුවන්ට තැන්පතු, මුදල් ආපසු ගැනීම්, ණය ආපසු ගෙවීම්, උපයෝගිතා බිල්පත් ගෙවීම් සහ ප්‍රේෂණ ආශ්‍රිත ගනුදෙනු ඇතුළු අත්‍යවශ්‍ය බැංකු සේවාවන් තම නිවෙස්වලට සමීපව ලබා ගත හැකිය. LankaQR ඒකාබද්ධ කිරීම මඟින් සුළු සහ ක්ෂුද්‍ර ව්‍යවසායකයින්ට ආරක්ෂිත ඩිජිටල් ගෙවීම් සඳහා සහභාගී වීමට හැකි වූ අතර එය දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සඳහා මනා පිටුවහලක් විය.

ආදර්ශ ශාඛා සංකල්පය සෑම පළාතකම අඛණ්ඩව ව්‍යාප්ත කරන ලද අතර, සෑම ප්‍රදේශයක්ම ආවරණය කරමින් ශාඛා 40 ක් හඳුන්වා දෙන ලදී. එමඟින් ගනුදෙනුකාර අන්තර්ක්‍රියා වල අනුකූලතාව ශක්තිමත් කරන අතර ඉදිරිපෙළ කාර්ය මණ්ඩලයේ හැකියාවන් ද වර්ධනය විය.

තරුණ ගනුදෙනුකාර කාණ්ඩ සමඟ සම්බන්ධතාවය ශක්තිමත් කිරීම සඳහා බැංකුව, පාසල් සංසද ඒකක 1,600 කට ආසන්න සංඛ්‍යාවක් සහ ජංගම පාසල් ඉතුරුම් වැඩසටහන් 1,000 කට අධික සංඛ්‍යාවක් හරහා අධ්‍යාපනය හා සම්බන්ධ බැංකුකරණ පැවැත්ම පුළුල් කිරීම අඛණ්ඩව සිදු කරමින්, මූල්‍ය ඇතුළත්කරණය සහ ඉතුරුම් හැසිරීම් දිරිමත් කරන ලදී.

බැංකුව සේවා සැපයීමේ දී සෑම අංශයකම ඩිජිටල් නාලිකා භාවිතය දිරිමත් කරන අතරම, ශාඛා ජාලය පුරා ඉස්ලාමීය බැංකු සේවා සඳහා සහාය වන ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන වැඩිදියුණු කළේය.



* සීමිත සේවා ශාඛා ද ඇතුළත්ව

ප්‍රමුඛතා කලාප 2

සුවිශේෂී ගනුදෙනුකාර වටිනාකමක් ලබා දීම

නවෝත්පාදනය හරහා නිෂ්පාදන සහ සේවා සැපයුම් දියුණු කිරීම

නවෝත්පාදනය හරහා ගතික සහ විවිධාකාර ගනුදෙනුකාර අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි මූල්‍ය නිෂ්පාදන සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා මඟ පෙන්වමින්, අපගේ උපායමාර්ගයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. බැංකුවේ නිෂ්පාදන සංවර්ධන ප්‍රවේශය ප්‍රධාන ගනුදෙනුකාර පාර්ශ්වයන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂා සමඟ පෙළගස්වා ඇති අතර අපගේ විවිධ ව්‍යාපාරික මාර්ග හරහා කාලෝචිත, අදාළ සහ ඵලදායී මූල්‍ය විසඳුම් සහතික කරයි.

නව තැන්පතු ක්‍රම

- Prosperity තැන්පතු යෝජනා ක්‍රම
- Flex Saver
- ජ්‍යේෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂ ස්ථාවර තැන්පතු යෝජනා ක්‍රම
- An-noor ජංගම ගිණුම
- BOC My Sri Lanka ස්ථාවර තැන්පතු

නව ණය පහසුකම්

- BOC E-Creator ණය
- BOC Green ණය

නව ණය යෝජනා ක්‍රම

'BizLift' ණය යෝජනා ක්‍රමය

කෘෂිකර්මාන්තයේ සහ කර්මාන්ත අංශවල තරුණ ව්‍යවසායකයින්ගේ සංවර්ධනය

'දිට්වා' සහන ණය

Re-MSME ආපදා සහන ණය

නව ඩිජිටල් නිෂ්පාදන



BizPlus ණය කාඩ්පත



ප්‍රිමියර් ගනුදෙනුකරුවන් සඳහා Prestige කාඩ්පත



BOC ඉන්ධන කාඩ්පත

නව ඩිජිටල් වේදිකා

BOC Flex යෙදුම

BOC Smart Remit ජංගම යෙදුම

2025 දී, ලංකා බැංකුව පුද්ගලයන්ගේ, ව්‍යාපාරවල සහ අනෙකුත් ප්‍රමුඛ ගනුදෙනුකාර පාර්ශ්වවල පරිණාමය වන අවශ්‍යතා වලට අනුකූලව අවධානය යොමු කළ මූල්‍ය විසඳුම් රාශියක් ලබා දීමෙන් සුවිශේෂී ගනුදෙනුකාර වටිනාකමක් ලබා දුන්නේය. බැංකුවේ ගනුදෙනුකාර සේවා මඟින් අදාළත්වය, විශ්වාසය සහ දිගුකාලීන හවුල්කාරිත්වය අවධාරණය කරන ලද අතර, එමඟින් ගනුදෙනුකරුවන්ට ක්ෂණික අවශ්‍යතා සහ දිගුකාලීන මූල්‍ය ඉලක්ක යන ද්විත්වයටම සහාය වන මූල්‍ය සේවාවන් සමඟ සම්බන්ධ වීමට හැකි විය.

ඉතුරුම්, ද්‍රවශීලතා කළමනාකරණය සහ මූල්‍ය ආරක්ෂාව සඳහා සහාය වීම සඳහා නිර්මාණය කර ඇති තැන්පතු, ණය දීම සහ ගනුදෙනු නිෂ්පාදන මාලාවක් බැංකුව විසින් මෙම වසර තුළදී හඳුන්වා දෙන ලදී. විස්තීර්ණ Prosperity තැන්පතු යෝජනා ක්‍රම දිගුකාලීන මූල්‍ය වින්‍යය සහ ප්‍රාග්ධන සමුච්චය දිරිමත් කරන අතර Flex Saver ගිණුම් නව ගනුදෙනුකරුවන්ට ගිණුම් විවෘත කිරීම සඳහා ශාඛා වලට නොගොස් වැඩි ප්‍රවේශයක් සහ නම්‍යශීලී බවක් ලබා දෙයි. තවද, ජ්‍යේෂ්ඨ පුරවැසියන් සඳහා වන විශේෂ ස්ථාවර තැන්පතු, ස්ථාවර ආදායමක් සහ වැඩිදියුණු කළ ප්‍රතිලාභ තුළින් විශ්‍රාමිකයන්ට සහාය වීම සඳහා සකස් කර ඇත. ඊට අමතරව, An-noor ඉස්ලාමීය බැංකුකරණ පුද්ගලික, වෙළඳ සහ ආයතනික ජංගම ගිණුම් පහසුකම් මඟින් පුද්ගලයන්ට සහ ව්‍යාපාර සඳහා ෂරියා-අනුකූල මූල්‍ය විසඳුම් ලබා දෙන ලදී. ආර්ථික පුනර්ජීවනය සඳහා අත්‍යවශ්‍ය ආමුඛ ප්‍රේෂණ ගලායාම පහසු කිරීම සඳහා ආකර්ශනීය විශේෂාංග සහිතව BOC My Sri Lanka ස්ථාවර තැන්පතු නැවත දියත් කරන ලදී.

පුද්ගලයන්ගේ, ව්‍යාපාරවල සහ ප්‍රමුඛතා ගනුදෙනුකාර කාණ්ඩ වර්ධනය වන අවශ්‍යතා වලට අනුකූලව අවධානය යොමු කළ ණය නිෂ්පාදනයන් ලබා දීමෙන් බැංකුව සුවිශේෂී ගනුදෙනුකාර වටිනාකමක් ලබා දෙන ලදී. BOC E Creator ණය යෝජනා ක්‍රමය නිර්මාණකරුවන්ට සහ ඩිජිටල් ව්‍යවසායකයින්ට උපකරණ සහ නිෂ්පාදන අවශ්‍යතා සඳහා අරමුදල් සපයයි. BOC හරිත ණය පුනර්ජනනීය බලශක්තිය සහ තිරසාර ව්‍යාපාර මූලපිරීම් ඇතුළුව පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා මූල්‍යකරණය සපයයි. BizLift ණය යෝජනා ක්‍රමය මඟින් ව්‍යාපාර සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ක්‍රියාකාරී ප්‍රාග්ධනය සහ වර්ධන මූල්‍යකරණය සපයන අතර එමඟින් ව්‍යාපාර ව්‍යාප්තිය සහ මෙහෙයුම් අඛණ්ඩතාව සක්‍රීය වේ.

කෘෂිකර්මාන්තයේ සහ කර්මාන්ත අංශයේ තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ වැඩසටහන හරහා, තරුණ ව්‍යවසායකයින්ට ප්‍රධාන අංශවල ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ වැඩි දියුණු කිරීමට අඩු පොළී, සහනදායී ණය ලැබේ. තවද, 'දිට්වා' සහන ණය වැඩසටහන 'දිට්වා' සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා ඉලක්කගත සහාය ලබා දෙන අතර, එමඟින් ඔවුන්ට තම ව්‍යාපාර යථා තත්ත්වයට පත් කිරීමට සහ මෙහෙයුම් කාර්යක්ෂමව නැවත ගොඩනැඟීමට උපකාරී විය. සාමූහිකව, මෙම ණය පහසුකම් මූල්‍ය ප්‍රවේශය වැඩි දියුණු කරයි, ව්‍යාපාර පුනර්ජීවනය උත්තේජනය කරමින්, සහ ඇතුළත් ආර්ථික සහභාගීත්වය ශක්තිමත් කරයි.

තරුණයින්, කාන්තාවන්, ජ්‍යේෂ්ඨ පුරවැසියන්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ඩිජිටල් ලෙස ක්‍රියාකාරී අංශ ඇතුළු ගනුදෙනුකාර කණ්ඩායම්වල සුවිශේෂී අවශ්‍යතා වලට අනුකූලව නිෂ්පාදන සහ සේවාවන් පෙළගැස්වීම සහතික කරමින්, එම කණ්ඩායම් කේන්ද්‍ර කරගත් මැදිහත්වීම තුළින් බැංකුව එහි වටිනාකම් ජනනය තවදුරටත් ශක්තිමත් කරන ලදී.

ගනුදෙනුකාර අත්දැකීම් උසස් කිරීම

2025 දී, ලංකා බැංකුව ශාඛා ජාලය සහ ප්‍රධාන සේවා නාලිකා හරහා සේවා ගුණාත්මකභාවය, අනුකූලතාව සහ ප්‍රතිචාරාත්මක බව වැඩිදියුණු කිරීම මඟින් ගනුදෙනුකාර සේවා සැපයුම ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කළේය. ගනුදෙනුකාර කාණ්ඩ තුළ සේවා ප්‍රමිතීන් ස්ථාවරව පවතින බව සහතික කරන අතරම, අන්තර්ක්‍රියා ආශ්‍රයෙන් ගනුදෙනුකාර අත්දැකීම් වැඩිදියුණු කිරීම කෙරෙහි උත්සාහයන් මෙහෙයවන ලදී.

පෝලිම් කළමනාකරණ පද්ධති, ඩිජිටල් සේවා සහ වැඩිදියුණු කළ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් හඳුන්වාදීම තුළින් ශාඛා වල සේවා කාර්යක්ෂමතාව වැඩිදියුණු විය. එය පොරොත්තු කාලය අඩු කිරීමට, කවුන්ටර සහ පුද්ගලික බැංකු සේවා කාලය වැඩි දියුණු කිරීමට උපකාරී විය.

සුමට මෙහෙයුම් සහ කාලෝචිත ගැටලු විසඳීම සහතික කිරීම අඛණ්ඩ අධීක්ෂණය තුළින් මෙම වැඩිදියුණු කිරීම් සිදු විය.

ගනුදෙනුකාර සේවා ප්‍රශස්තකරණය

ගනුදෙනුකරුවන් සමඟ සමීපව කටයුතු කිරීම, ලංකා බැංකුව සඳහා ප්‍රධාන වෙනසක් ලෙස පැවතුනි. සම්බන්ධතා නිලධාරීන් සහ ප්‍රමුඛ බැංකු මධ්‍යස්ථාන මගින් ප්‍රමුඛ ගනුදෙනුකාර කාණ්ඩ සඳහා පුද්ගලාරෝපිත සම්බන්ධතාවයක් ලබා දුන් අතර, වෙළඳ ආයතන, අධ්‍යාපන ආයතන සහ ප්‍රජා කණ්ඩායම් සමඟ ව්‍යුහගත අන්තර්ක්‍රියා මගින් විශ්වාසය සහ දිගුකාලීන හවුල්කාරිත්වයන් ශක්තිමත් කරන ලදී.

අතිරේක කාර්ය මණ්ඩල සහ ව්‍යුහගත ගනුදෙනුකාර සේවා පුහුණුව ලැබූ ශාඛා කාර්ය මණ්ඩලය, ඇමතුම් මධ්‍යස්ථාන නියෝජිතයින් සහ අලුතින් පත් කරන ලද කළමනාකරුවන්, නව බදවාගැනීම් ස්ථාන සඳහා අමතර සේවකයන් යෙදවීම තුළින් ඉදිරි පෙළ ධාරිතාව තවදුරටත් ශක්තිමත් කරන ලදී.

බැංකුවේ ගනුදෙනුකරුවන් සම්බන්ධ කර ගැනීමේ උපායමාර්ගයේ අනිවාර්ය අංගයක් ලෙස පුද්ගලික සහභාගීත්වය පැවතුනි. “Tea with BOC” සහ ව්‍යුහගත ගනුදෙනුකාර සම්බන්ධතා වැඩසටහන් වැනි මුලපිරීම් ගනුදෙනුකරුවන් සමඟ විශ්වාසය ශක්තිමත් කර දිගුකාලීන සබඳතා ශක්තිමත් කරන ලදී.

“ප්‍රීතිමත් ගනුදෙනුකාර සතිය” (Happy Customer Week) සහ "ශූන්‍ය පැමිණිලි මාසය” (Zero Complaint Month) වැනි මුලපිරීම් මගින් සේවාවට ප්‍රමුඛස්ථානය ලබා දෙන සංස්කෘතියක් ප්‍රවර්ධනය කරන ලද අතර බැංකුව පුරා සේවා ගුණාත්මකභාවය පිළිබඳ දැනුවත්භාවය ඉහළ නංවන ලදී.

මධ්‍යගත පැමිණිලි කළමනාකරණ රාමුවක් හරහා ගනුදෙනුකාර ප්‍රතිපෝෂණ සහ පැමිණිලි සක්‍රීයව නිරීක්ෂණය කරන ලද අතර, එමඟින් කාලෝචිත ලෙස ගැටලු කෙරෙහි අවධානය යොමු කිරීමට සහ විසඳීමට හැකි විය. එමෙන්ම වසර තුළ ලැබුණු පැමිණිලි විසඳීමට ඩිජිටල් සේවා අතුරුමුහුණත් වැඩිදියුණු කිරීම සහ වැඩිදියුණු කළ කාර්ය මණ්ඩල සහභාගීත්වය දායක විය.

ගනුදෙනුකාර පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය හඳුන්වාදීම

විශේෂ සම්බන්ධතා අංකය සහිත විශේෂ ඒකකය

ගනුදෙනුකාර ආරක්ෂණ පනතට අනුකූල වීම

වසර තුළ ගනුදෙනුකාර පැමිණිලි ⇩ 25% කින් අඩු විය

ඊට සමගාමීව, ගනුදෙනුකාර තෘප්තිය ආශ්‍රිත මිනුම් මඟින් බැංකුව කෙරෙහි ඇති වැඩිදියුණු කළ සේවා විශිෂ්ටත්වය සහ විශ්වාසය පිළිබිඹු විය.

81%
ගනුදෙනුකාර තෘප්තිමත් අනුපාතය (CSAT)

33%
ශුද්ධ ප්‍රවර්ධක අගය (NPS)

74%
ගනුදෙනුකාර උත්සාහ ලඝුණු (CESS)

ස්ථාවරත්වය සහ ව්‍යාපාර පුනර්ජීවනය සහතික කිරීම

2025 දී, ආර්ථික තත්ත්වයන් ක්‍රමයෙන් වැඩිදියුණු වන විට, ව්‍යාපාර ප්‍රකෘතිමත් වීම සහ මූල්‍යමය ඔරොත්තු දීමේ හැකියාව සඳහා සහාය වීමේදී ලංකා බැංකුව ස්ථාවර කාර්යභාරයක් ඉටු කිරීම අඛණ්ඩව සිදු විය. නැවත අයකරගැනීමේ ක්‍රියාවලි සහ සුදුසු ගනුදෙනුකාර සහභාගීත්වය ඒකාබද්ධ කරන ලද විනයගරුක සහ සමබර ප්‍රවේශයක් බැංකුව විසින් අනුගමනය කරන ලද අතර එමඟින් විභව ගනුදෙනුකරුවන්ට පහසුකම් විධිමත් කිරීමට සහ මූල්‍ය ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීමට හැකි වන අතරම වත්කම්වල ගුණාත්මකභාවය ආරක්ෂා කරයි. නව ආතති හඳුනාගැනීමට සහ අදියර 3 ණයවලට අලුතින් මාරුවීම් වැළැක්වීමට ව්‍යාපාරික ඒකක හරහා ක්‍රියාකාරී අධීක්ෂණ සහ පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණයන් ශක්තිමත් කරන ලදී.

සම්බන්ධතා සහ ප්‍රතිසාධන කණ්ඩායම්වල කාලෝචිත මැදිහත්වීම් සමඟ ඒකාබද්ධව, වැඩි අවදානම් සහිත ණය ගැනුම්කරුවන් සමීපව අධීක්ෂණය කිරීම, සුදුසු අවස්ථා වලදී ප්‍රතිව්‍යුහගත කිරීම, නැවත සැලසුම් කිරීම, සාකච්ඡා කළ බේරුම්කරණයන් හෝ ක්‍රමානුකූල පිටවීම් හරහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සක්‍රීය කළේය. විශේෂයෙන්, මූල්‍ය ආතතියෙන් මිදීමට ගනුදෙනුකරුවන්ට හැකියාව ලබා දීම සඳහා සහනදායී නැවත කාලසටහන්ගත කිරීමේ පැකේජ, කැපවූ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සහන පැකේජ සහ සම්මුතිවාදී පිටවීමේ සැලැස්ම ඇතුළු ව්‍යුහගත මැදිහත්වීම් ක්‍රියාත්මක කරන ලදී.

මුදල් ප්‍රවාහය පදනම් කරගත් අරමුදල් සැපයීම, උපදේශන නායකත්වයෙන් යුත් මැදිහත්වීම සහ වැඩිදියුණු කළ අධීක්ෂණය හරහා මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට සහාය වීම සඳහා නැවත අයකරගැනීමේ සහ ව්‍යාපාර පුනර්ජීවන කණ්ඩායම් ශක්‍ය ගනුදෙනුකරුවන් සමඟ සමීපව කටයුතු කළහ.

පළාත් වල කටයුතු ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම සඳහා, පළාත් ණය නැවත අයකර ගැනීමේ කාර්ය මණ්ඩලය සඳහා පුළුල් ධාරිතා වර්ධනය සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලද අතර, කණ්ඩායම් ප්‍රායෝගික ප්‍රතිව්‍යුහගත කිරීම, සාකච්ඡා කිරීම සහ ණය කළඹ කළමනාකරණ කුසලතා වලින් සන්නද්ධ කරන ලදී.

2025 දී පුනර්ජීවනය කරන ලද ගනුදෙනුකරුවන් සංඛ්‍යාව
233

2025 දී රු. බිලියන 7.0 ක
ව්‍යාපාර පුනර්ජීවනය කරන ලදී.

රු. බිලියන 100.8 ක
මෙතෙක් පුනර්ජීවනය කරන ලද මුළු ණය ප්‍රමාණය

ප්‍රමුඛතා කලාප 3

වගකීම් සහගත බැංකුකරණ පිළිවෙත් පවත්වා ගැනීම

දේශීය වශයෙන් හා පද්ධතිමය වශයෙන් වැදගත් මූල්‍ය ආයතනයක් ලෙස බැංකුව, ගනුදෙනුකරුගේ අවශ්‍යතා පිළිබඳ තීරණ ගැනීමේදී කේන්ද්‍රීයව පවතින බව සහතික කරමින්, විනිවිද බවින්, සාධාරණ සහ වගවීමේ ආකාරයෙන් ව්‍යාපාර කටයුතු සිදු කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි.

වගකීම් සහගත සන්නිවේදනය සහ අනුකූලතාවය

වසර පුරාවට වගකීම් සහගත සන්නිවේදනය වෙත ප්‍රධාන අවධානයක් යොමු කර තිබුණි. මූල්‍ය නිෂ්පාදන සහ සේවා පිළිබඳ නියමයන්, කොන්දේසි සහ ඒ ආශ්‍රිත අවදානම් ඇතුළුව පැහැදිලි, නිවැරදි සහ ප්‍රවේශ විය හැකි තොරතුරු, ගනුදෙනුකරුවන්ට ලබා දීම සහතික කිරීමෙන් බැංකුව වගකීම් සහගත මූල්‍යකරණය ප්‍රවර්ධනය කළේය. මෙම ප්‍රවේශය, විශේෂයෙන් ණය ගැනීම්, ඉතුරුම් සහ ආයෝජන නිෂ්පාදන සම්බන්ධයෙන් දැනුවත් තීරණ ගැනීමට සහාය වූ අතර, බැංකුවේ පිරිනැමීම් කෙරෙහි විශ්වාසය ශක්තිමත් කළේය.

බැංකුව සිය මෙහෙයුම් තුළ ඉහළ අනුකූලතා ප්‍රමිතීන් පවත්වා ගනිමින්, ශක්තිමත් නියාමන රාමුවක් තුළ ක්‍රියාත්මක වෙමින් සහ අදාළ දේශීය රෙගුලාසි සහ ජාත්‍යන්තර බැංකු ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කළේය. ස්ථාපිත කර ඇති මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (AML) සහ ගනුදෙනුකරු හඳුනා ගැනීමේ (KYC) ප්‍රොටෝකෝල, ගනුදෙනු අඛණ්ඩතාව ආරක්ෂා කිරීම, ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම සහ සියලුම සේවා නාලිකා හරහා නියාමන අනුකූලතාව සහතික කිරීම සඳහා කේන්ද්‍රයව පැවතුනි.

වගකීම් සහගත සහ සදාචාරාත්මක හැසිරීම් සන්නිවේදනය

ඒ සමඟම, අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම, නියාමන අවශ්‍යතා පිළිපැදීම සහ සදාචාරාත්මක හැසිරීම් සහ ගනුදෙනුකාර ආරක්ෂාව පිළිබඳ අඛණ්ඩ කාර්ය මණ්ඩල දැනුවත්භාවය තුළින් වගකීම් සහගත බැංකු පිළිවෙත් ශක්තිමත් කරන ලදී. එමෙන්ම සේවකයින් සඳහා නීතිපතා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් හරහා සදාචාරාත්මක හැසිරීම් සහ වගකීම් සහගත ගනුදෙනුකාර සහභාගීත්වය තවදුරටත් ශක්තිමත් කරන ලදී. මෙම මූලපිරීම් නියාමන දැනුවත්භාවය ශක්තිමත් කළ අතර ගනුදෙනුකරුවන් සමඟ සිදු කෙරෙන මෙහෙයුම් කටයුතු හරහා අනුකූලතා ප්‍රමිතීන් අඛණ්ඩව යෙදවීමට සහාය විය.

ගනුදෙනුකාර ධාරිතාව ශක්තිමත් කිරීම

වගකීම් සහගත බැංකුකරණ ප්‍රතිඵල ඉදිරියට ගෙන යාම සඳහා ගනුදෙනුකාර අධ්‍යාපනය අඛණ්ඩව වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. වසර තුළ, බැංකුව විසින් විධිමත් මූල්‍ය අධ්‍යාපනයට සීමිත ප්‍රවේශයක් ඇති පුද්ගලයින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ප්‍රජාවන් කෙරෙහි අවධානය යොමු කරමින් විවිධ මූල්‍ය සාක්ෂරතාවය සහ ගනුදෙනුකාර දැනුවත්භාවය පිළිබඳ මූලපිරීම් අඛණ්ඩව පවත්වාගෙන ගොස් පුළුල් කරන ලදී. මෙම වැඩසටහන් මගින් මූල්‍ය කළමනාකරණයේ ප්‍රායෝගික අංශ, වගකීම් සහගත ණය ගැනීම්, ඉතිරිකිරීම් විනය සහ අවදානම් පිළිබඳ දැනුවත්භාවය, වැඩිදියුණු කළ මූල්‍ය හැසිරීම් සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා සහාය වීම යන කරුණු ආමන්ත්‍රණය කරන ලදී. තවද මූල්‍ය විනය ශක්තිමත් කිරීම, මුදල් ප්‍රවාහ කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ තීරණ ගැනීමේ හැකියාවන් වැඩිදියුණු කිරීම අරමුණු කරගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා විශේෂිත ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් පවත්වන ලදී. ඊට අමතරව, කාන්තා ව්‍යවසායකයින්, අපනයනකරුවන්, ලංකා බැංකු මිතුරු කණ්ඩායම් සහ සමාජ ආධාර යෝජනා ක්‍රමවල ප්‍රතිලාභීන් සඳහා ඉලක්කගත දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලද අතර, එමඟින් මූල්‍ය දැනුම සඳහා ඇතුළත් ප්‍රවේශය ශක්තිමත් කරන ලදී.

තරුණ ව්‍යවසායකයින් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්	කාන්තා ව්‍යවසායකයින් සඳහා BOC මිතුරු සහ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්	MSME ගනුදෙනුකරුවන් සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සායන සහ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන්
148	**700**	**1,096**

උපායමාර්ගික ඉදිරි ගමන

අපගේ ඉදිරි ගමන්මඟ හැඩගස්වා ඇත්තේ ගනුදෙනුකාර අපේක්ෂාවන් අඛණ්ඩව විකාශනය වන බවට පැහැදිලි අවබෝධයක් මගිනි. වැඩි පහසුවක් සහ ප්‍රවේශයක් ලබා දෙන වැඩිදියුණු කළ ඩිජිටල් හැකියාවන්, නව්‍ය නිෂ්පාදන සහ වඩාත් ප්‍රතිචාරාත්මක සේවා ආකෘති හරහා වේගය පවත්වා ගැනීමට අපි කැපවී සිටිමු.

කෙටිකාලීන

- ණය සහාය කාර්යයන් ශක්තිමත් කිරීම.
- දැඩි ප්‍රතිසාධන ක්‍රියාමාර්ග වෙනුවට බැංකුව තුළ "ව්‍යාපාර පුනර්ජීවන සංස්කෘතියක්" නිර්මාණය කිරීම.
- සමෘද්ධිමත් ගනුදෙනුකාර සේවාවක් සඳහා ආදර්ශ ශාඛා සංකල්පය පුළුල් කිරීම.
- මූල්‍ය සාක්ෂරතාවය, විනිවිදබවින් යුතු සන්නිවේදනය සහ සදාචාරාත්මක සම්බන්ධතාව සඳහා අඛණ්ඩ ආයෝජනය තුළින් වගකීම් සහගත බැංකුකරණය සහ ගනුදෙනුකාර හැකියාව ශක්තිමත් කිරීම.

මධ්‍යම සිට දිගුකාලීන

- ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් සහ ඉදිරි පෙළ ධාරිතා සංවර්ධනය සඳහා මඟ පෙන්වීම උදෙසා ගනුදෙනුකාර ප්‍රතිපෝෂණ තීක්ෂණ බුද්ධිය භාවිතා කරමින් සේවා ගුණාත්මකභාවය සහ අනුකූලතාව ගැඹුරු කිරීම.
- ක්ෂේත්‍රයටම විශේෂ වූ මූල්‍ය විසඳුම් සහ උපදේශන නායකත්වයෙන් යුත් සම්බන්ධතා හරහා MSME ශක්තිමත් කිරීම.
- නියෝජිත බැංකුකරණය, සමාජ ප්‍රතිලාභ ගෙවීම් යාන්ත්‍රණයන් සහ අඩු පහසුකම් සහිත ප්‍රජාවන් වෙත ඉලක්කගත ප්‍රවේශය පුළුල් කිරීම මගින් ඇතුළත් බැංකු මූලපිරීම් පුළුල් කිරීම.
- ගනුදෙනුකරුවන් ඇතුළත් කිරීම සරල කිරීම, ඒ සඳහා යොදවන කාලය සහ ශ්‍රමය අඩු කිරීම සහ සේවා නාලිකා හරහා සේවා විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා ඩිජිටල් අත්දැකීම් වැඩි දියුණු කිරීම.

ස්ථිරසාර කාර්යසාධනයක් සඳහා පරිපූර්ණ ශ්‍රම බලකාය

GRI 3-3




8,912	**59%**	සේවකයෙකුට සාමාන්‍ය පුහුණු පැය ගණන **28** ක්	රු. මිලියන **348.0** ක පුහුණුව සහ සංවර්ධනය සඳහා ආයෝජනය	**431**	**952**
සේවකයින්	කාන්තා නියෝජනය			උසස්වීම්	නව අවස්ථා නිර්මාණය

ලංකා බැංකුවේ කාර්ය මණ්ඩලය බහුවිධ ශක්තීන්ගේ ප්‍රතිමූර්තියකි. ඔවුන්, අභියෝග ජය ගැනීමට, අවස්ථාවන් අත්පත් කර ගැනීමට සහ විවිධ හැකියාවන් මගින් සාර්ථක ප්‍රතිඵල ලඟාකර ගැනීමට හැකියාව ඇති බැංකුවේ ඒකාබද්ධ මානව ප්‍රග්ධනයයි. අපගේ ගනුදෙනුකරුවන්ට, ප්‍රජාවන්ට සහ ජාතියට දිගුකාලීන වටිනාකම් ජනනය කරන්නේ මෙම ශක්තීන් පෙළගැස්වීම හරහාය.

එබැවින් මානව ප්‍රාග්ධන ශක්තිය සාක්ෂාත් කරගනු ලැබුවේ හුදෙක් තනිව ක්‍රියාවට නැංවූ උපායමාර්ග හරහා නොව සාමූහිකව එකිනෙක සම්බන්ධීකරණය කරමින් ක්‍රියාවට නැංවූ සැලසුම් මතය. අපගේ උපායමාර්ගය හුදකලා මිනුම් දර්ශක වැඩිදියුණු කිරීමට වඩා පුළුල් වේ. එය සමස්ත ශ්‍රම බලකාය හරහා එකිනෙකට සම්බන්ධිත කාර්යසාධනය තුළින් වර්ධනය මුලික කොටගත් ශක්තිමත් සැලසුමකි. අපි ආචාරධර්ම අධීක්ෂණය ගැඹුරු කරන අතරම ඩිජිටල් හැකියාව ශක්තිමත් කරන්නෙමු. කාර්යසාධන විනය පවත්වා ගනිමින් ඇතුළත්කරණය ප්‍රවර්ධනය කරනුයේ ඵලදායිතාව මෙහෙයවන අතරතුර යහපැවැත්ම ප්‍රවර්ධනය කරමින්ය.

තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා බලපෑම



ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා



උපායමාර්ගික ප්‍රමුඛතා



2025 සඳහා සන්දර්භය

- ඔරොත්තු දීමේ හැකියාව, කාර්යක්ෂමතාව සහ තරඟකාරිත්වය ශක්තිමත් කිරීම සඳහා ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම.
- බැංකු මෙහෙයුම් හරහා විශේෂිත ඩිජිටල් සහ තාක්ෂණ කුසලතා වර්ධනය කිරීම.
- නම්‍යශීලී, දෙමුහුන් සහ ඉහළ කාර්යසාධනයක් සහිත වැඩ කරන පරිසරයක් සක්‍රීය කිරීම සඳහා පරිණාමය වූ සේවා ස්ථාන ආකෘති



- කාර්යසාධන ප්‍රමුඛතාවයක් ලෙස සේවක යහපැවැත්ම සහ මානසික සෞඛ්‍යය ශක්තිමත් කිරීම.
- උසස් ගනුදෙනුකාර සේවාවක් සැපයීම සඳහා නායකත්ව හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා ප්‍රශස්තකරණය කළ ව්‍යුහයන්
- දේශගුණය සහ ආපදා ආශ්‍රිත අවදානම් සඳහා වැඩිදියුණු කළ සූදානම සහ සහාය
- විශිෂ්ටත්වය සඳහා ජාතික පිළිගැනීමක් ලබා ගැනීම, මානව සම්පත් සම්මාන ලබා ගැනීම සහ සේවා යෝජකයෙකු ලෙස බැංකුව වෙත දක්වන පිළිගැනීම වර්ධනය

උපායමාර්ගික ප්‍රමුඛතාවය

ඉහළ කාර්යසාධනයක් සහිත කණ්ඩායමක් ගොඩනැඟීම

පෙර වසරවල ස්ථාපිත කරන ලද උපායමාර්ගික දිශානතිය මත පදනම්ව, බැංකුව එහි පරිවර්තනය, ඩිජිටල් සහ තිරසාරභාවය යන අරමුණු ඉදිරියට ගෙන යාම සඳහා ඔරොත්තු දෙන සහ නව්‍ය ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දීම අඛණ්ඩව සිදු කරන ලදි. මෙම තිරසාර අවධානය, බැංකුවේ ධාරිතාව, යහපාලනය සහ නායකත්වය ශක්තිමත් කිරීම සඳහා ඇති කැපවීම අවධාරණය කරන අතරම, එහි වටිනාකම් සහ දිගුකාලීන උපායමාර්ගික දිශාවන් සමඟ පෙළගැසී ඇති ශ්‍රම බලකායක් පෝෂණය කරයි.

ප්‍රමුඛතා ක්ෂේත්‍ර

- විවිධත්වය, ඇතුළත්කරණය සහ අයත් වීම පෝෂණය කිරීම
- මානව සම්පත් යහපාලනය, ප්‍රතිපත්ති සහ අනුකූලතාව ශක්තිමත් කිරීම



- අඛණ්ඩ කුසලතා සහ වෘත්තීය වර්ධනය
- සේවක සහභාගීත්වය හා යහපැවැත්ම ප්‍රවර්ධනය
- ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කිරීම සහ තිරසාර භාවිතයන්

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 1

විවිධත්වය, ඇතුළත්කරණය සහ අයත් වීම පෝෂණය කිරීම GRI 202-2

ලංකා බැංකුවෙහි, විවිධත්වය, සාධාරණත්වය සහ ඇතුළත්කරණය බැංකුවේ මෙහෙයුම් ආචාරධර්ම සහ උපායමාර්ගික අරමුණු යන දෙකටම අත්‍යවශ්‍ය වේ. මෙම මූලධර්ම බැංකුවේ සංස්කෘතිය තුළ අන්තර්ගත වී ඇති අතර දක්ෂතා සහිත පුද්ගලයින් බඳවා ගැනීම, කළමනාකරණය කිරීම සහ රඳවා ගැනීම සඳහා සහාය වේ. විවිධ දෘෂ්ටිකෝණ සහ දායකත්වයන් අගය කරන සේවා ස්ථානයක් පෝෂණය කිරීමෙන්, බැංකුව වේගයෙන් විකාශනය වන පරිසරයක් තුළ සහයෝගීතාව, නවෝත්පාදනය සහ අනුවර්තනය වීමේ හැකියාව ශක්තිමත් කරයි. තිරසාර වර්ධනයක් සඳහා සහ සංකීර්ණ අභියෝග නිර්මාණශීලීව විසඳීම සඳහා විවිධ පසුබිම්, ස්ත්‍රී පුරුෂ භාවය සහ හැකියාවන් පිළිබිඹු කරන විවිධාකාර ශ්‍රම බලකායක් අත්‍යවශ්‍ය වේ.

ස්ථිර සේවකයින්ගේ සාමාන්‍ය සේවා කාලය

වසර 12

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමේ


100%, දේශීයව බඳවා ගෙන ඇත.

ස්වභාවය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව රැකියා නියුක්තිය. GRI 2-7

	ස්ථිර		බාහිර ආයතනවලින් බඳවාගත්		කොන්ත්‍රාත් පදනම මත *	
M	3,683	F 5,229	1,743	-	06	-

බැංකුව අර්ධ කාලීන සේවකයන් රැකියාවේ යොදවන්නේ නැත.
** සියලුම කොන්ත්‍රාත් සේවකයින් බස්නාහිර පළාතෙන් වේ.*

ස්ත්‍රී පුරුෂ භාවය හා පළාත් අනුව ස්ථිර රැකියා නියුක්තිය




ස්ථිරසාර කාර්යසාධනයක් සඳහා පරිපූර්ණ ශ්‍රම බලකාය

වයස, ස්ත්‍රී පුරුෂ භාවය සහ රැකියා කාණ්ඩය අනුව සේවා නියුක්තිය GRI 405-1

වර්ගීකරණය / වයස (අවුරුදු)	ආයතනික කළමනාකරණය		විධායක කළමනාකරණය		ප්‍රධාන කළමනාකරු		ජ්‍යෙෂ්ඨ කළමනාකරු		නිලධාරී		කාර්ය මණ්ඩල සහකාර		කාර්යාල සහකාර		එකතුව	
	M	F	M	F	M	F	M	F	M	F	M	F	M	F	M	F
>50 (සංඛ්‍යාව)	11	4	22	23	28	23	17	18	104	171	122	55	70	8	374	302
(%)	73	27	49	51	55	45	49	51	38	62	69	31	90	10	55	45
30-50 (සංඛ්‍යාව)	-	-	13	10	45	69	80	120	1,369	2,402	930	1,420	198	3	2,635	4,024
(%)	-	-	57	43	39	61	40	60	36	64	40	60	99	1	40	60
<30 (සංඛ්‍යාව)	-	-	-	-	-	-	-	-	50	88	623	815	1	-	674	903
(%)	-	-	-	-	-	-	-	-	36	64	43	57	100	-	43	57
මුළු ප්‍රමාණය (සංඛ්‍යාව)	11	4	35	33	73	92	97	138	1,523	2,661	1,675	2,290	269	11	3,683	5,229
(%)	73	27	51	49	44	56	41	59	36	64	42	58	96	4	41	59

සේවක කාලය අනුව සේවා නියුක්තිය %



සමාන ප්‍රවේශය සහ අවස්ථා දිනා ගැනීම

ස්ත්‍රී පුරුෂ සමානාත්මකතාවය පිළිබඳ ප්‍රතිපත්තිය, දුක්ගැනවිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය සහ විනය සංග්‍රහය ඇතුළුව ලංකා බැංකුවේ ප්‍රතිපත්ති, සාධාරණ හා ගෞරවනීය සේවා ස්ථානයක් සඳහා පසුබිම සපයයි. 2025 දී, බැංකුව මෙම පියවර තවදුරටත් ශක්තිමත් කළ අතර, විනිවිදබවින් යුතු වාර්තාකරණ මාර්ග සහ වගවීම ශක්තිමත් කළේය.

බැංකුව සෑම හැකියාවක්ම අගය කරමින් විවිධ හැකියාවන් සහිත සේවකයින් සවිබල ගැන්වීම සඳහා ප්‍රවේශ විය හැකි පහසුකම් සහ පුළුල් සේවා අවස්ථා සපයයි. විවිධ හැකියාවන් සහිත සේවකයින් 14 දෙනෙකු සඳහා බාධක බිඳ, අවස්ථා නිර්මාණය කර, සැමට දියුණු විය හැකි ඇතුළත් පරිසරයක් පෝෂණය කර ඇත.


වෙනස්කොට නොසැලකීම GRI 406-1

2025 වසර තුළ, වෙනස්කොට සැලකීම් හෝ ඒ ආශ්‍රිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග කිසිවක් වාර්තා නොවූ අතර, එය ගෞරවනීය සහ ඇතුළත් සේවා ස්ථානයක් පවත්වා ගැනීමට බැංකුවේ කැපවීම පිළිබිඹු කරයි.


සේවක මණ්ඩල සහ නායකත්ව විවිධත්වය GRI 405-1

බැංකුවේ ස්ත්‍රී පුරුෂ සමානාත්මකතාවය පිළිබඳ ප්‍රතිපත්තිය මඟින් සියලුම සේවකයින් සඳහා සම අවස්ථා, සම්පත් සහ වෘත්තීය ප්‍රගතිය සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම සඳහා ව්‍යුහගත රාමුවක් සකසයි. මෙම රාමුව බඳවා ගැනීම්, උසස්වීම්, වෘත්තීය සංවර්ධනය, පුහුණුව, වන්දි, ප්‍රතිලාභ, සේවා ස්ථාන ආරක්ෂාව සහ දුක්ගැනවිලි හැසිරවීම යන අංශ වලට අදාළ වේ.

ස්ත්‍රී පුරුෂ භාවය අනුව පාලන යාන්ත්‍රණයෙහි විවිධත්වය (2025 දෙසැම්බර් 31 වන විට)



වයස අනුව පාලන යාන්ත්‍රණයෙහි විවිධත්වය (2025 දෙසැම්බර් 31 වන විට)





කාන්තා සහභාගිත්වය

බඳවා ගැනීමේ පරිචයන් GRI 401-1

කුසලතා, විනිවිද භාවය සහ සාධාරණත්වය යන මූලධර්ම මඟින් ලංකා බැංකුවේ බඳවා ගැනීම් මෙහෙයවනු ලැබේ. සියලුම පුරප්පාඩු විවෘතව ප්‍රචාරය කරනු ලබන අතර, සමාන අවස්ථා සහ කුසලතා මත පදනම් වූ තේරීමක් සහතික කිරීම සඳහා ව්‍යුහගත, අපක්ෂපාතී ඇගයීම් ක්‍රියාවලීන් හරහා අපේක්ෂකයින් තක්සේරු කරනු ලැබේ.

2025 දී, බැංකුව තම අනාගත මානව ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම සඳහා, පුහුණු මාණ්ඩලික සහායකයින් 800 කට අධික සංඛ්‍යාවක් පුළුල් පළාත් නියෝජනයක් සහිතව බඳවා ගන්නා ලදී.

පූර්ව සම්බන්ධතාවය සහ ඒකාබද්ධතාවය ශක්තිමත් කිරීම සඳහා අලුතින් බඳවා ගන්නා සේවකයන් සඳහා පූර්ව හඳුන්වා දීමේ සවිස්තරාත්මක තොරතුරු ඇතුලත් ගොනුවක් හඳුන්වා දෙන ලදී. එමඟින් සේවකයා බැංකුව තුළ සේවය ආරම්භ කරන මොහොතේ සිටම දැනුම හා අත්දැකීම් ලබා දීම සඳහා බැංකුව කටයුතු කර ඇත.


* ඇතුළත් කොන්ත්‍රාත් සේවකයන් ගණන - 3

නව බඳවා ගැනීම් **952**


52% කාන්තා බඳවා ගැනීම්

නව බඳවා ගැනීම් වලින් **95%** ක් අවුරුදු 30 ට අඩු අය වේ.


ස්ත්‍රී පුරුෂ භාවය අනුව බඳවා ගැනීම



වයස අනුව බඳවා ගැනීම



පළාත් සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව බඳවා ගැනීම්



- 1 බස්නාහිර: M 112 (48%) F 119 (52%) ∑ 231 (24%)
- 2 උතුර: M 61 (54%) F 52 (46%) ∑ 113 (12%)
- 3 වයඹ: M 56 (52%) F 52 (48%) ∑ 108 (11%)
- 4 දකුණ: M 46 (46%) F 54 (54%) ∑ 100 (11%)
- 5 නැගෙනහිර: M 43 (44%) F 55 (56%) ∑ 98 (10%)
- 6 ඌව: M 42 (44%) F 53 (56%) ∑ 95 (10%)
- 7 උතුරු මැද: M 34 (40%) F 52 (60%) ∑ 86 (9%)
- 8 සබරගමුව: M 32 (46%) F 38 (54%) ∑ 70 (7%)
- 9 මධ්‍යම: M 30 (59%) F 21 (41%) ∑ 51 (6%)

මාපිය නිවාඩු සහ සමාන වැටුප්

GRI 401-3, GRI 405-2

අපගේ මාපිය නිවාඩු ප්‍රතිපත්තිය පවුලේ වගකීම් ඉටු කරන අතරම වෘත්තීය අභිවෘද්ධිය සඳහා ද කටයුතු කිරීමට ඉඩකඩ සලසමින් සකස් කර ඇති අතර මාපිය නිවාඩු ලබා ගත් සියලු කාන්තා සේවිකාවන් යළි රැකියාවට වාර්තා කිරීමෙන් පසු මාස 12 කට වැඩි කාලයක් රැකියාවේ නිරතව ඇත. පිරිමි සේවකයන්ට වැටුප් සහිත දින තුනක පීතෘ නිවාඩු සඳහා හිමිකම් ඇති අතර එය බෙදා ගත් පවුල් වගකීම් දිරිමත් කරයි.

වන්දි ගෙවීමේ පිළිවෙත් වල දී සාධාරණත්වය සහ සමානාත්මතාවය සඳහා ඇති කැපවීම පිළිබිඹු කරමින්, බැංකුව සියලු ශ්‍රේණි හරහා ස්ත්‍රී සහ පුරුෂ සේවකයින් අතර සමාන වැටුප් පවත්වා ගනී.

මාපිය නිවාඩු



වසර ආරම්භයේදී මාපිය නිවාඩු සඳහා හිමිකම්	ස්ත්‍රී	පුරුෂ
	4,889	3,325

මාපිය නිවාඩු අවසන් කිරීමෙන් පසු වසර තුළ නැවත රැකියාවට පැමිණීම	ස්ත්‍රී	පුරුෂ
	248	133

වර්ෂය තුළ මාපිය නිවාඩු ලබා ගත් සේවකයින් සංඛ්‍යාව	ස්ත්‍රී	පුරුෂ
	289	134

මාපිය නිවාඩු නිම කොට රැකියාවට පැමිණීමෙන් පසු මාස 12 ක් රැකියාවේ නියුතු	ස්ත්‍රී	පුරුෂ
	248	133

නැවත සේවයට පැමිණීමේ අනුපාතය	ස්ත්‍රී	පුරුෂ
	100%	100%

රැඳවා ගැනීමේ අනුපාතය	ස්ත්‍රී	පුරුෂ
	100%	100%

පුළුල් බලපෑම

සේවක මණ්ඩලයට සහ නායකත්ව විවිධත්වයට ප්‍රමුඛත්වය දීමෙන්, බැංකුව ආයතනික සහජීවනය, නවෝත්පාදනය සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරයි. විනිවිද බවින් යුතු බඳවා ගැනීමේ පිළිවෙත්, සමාන වැටුප් සහ සමබර නායකත්ව නියෝජනය සියලුම සේවකයින්ට වටිනාකමක් සහ බලගැන්වීමක් දැනෙන බව සහතික කරයි. මෙම පියවරයන් සියල්ල ඇතුළත් අභ්‍යන්තර සංස්කෘතියක් පෝෂණය කරනවා පමණක් නොව, තිරසාර වර්ධනයක් සඳහා කැපවී සිටින සමාජීය වශයෙන් වගකීම් සහගත ආයතනික නායකයෙකු ලෙස බැංකුවේ ස්ථාවරය ශක්තිමත් කරයි.

2025 දී ලංකා බැංකුව ආචාරධර්මානුකූල ශ්‍රම පිළිවෙත් සඳහා දැඩි කැපවීමක් පවත්වා ගත් අතර, එහි මෙහෙයුම් පුරා ළමා ශ්‍රමය හෝ බලකල/ අනිවාර්ය ශ්‍රමය පිළිබඳ කිසිඳු සිද්ධියක් වාර්තා නොවීය.

GRI 408-1, 409-1

ස්ථිරසාර කාර්යසාධනයක් සඳහා පරිපූර්ණ ශ්‍රම බලකාය

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 2

මානව සම්පත් යහපාලනය, ප්‍රතිපත්ති සහ අනුකූලතාව ශක්තිමත් කිරීම

ශක්තිමත් මානව සම්පත් යහපාලනය සහ පුළුල් ප්‍රතිපත්ති, විනිවිද බවින් යුතු, වගකීම් සහගත සහ ඉහළ කාර්යසාධනයක් සහිත සේවක කණ්ඩායමක් සඳහා අඩිතාලම සාදයි. විකාශනය වන නියාමන අවශ්‍යතා, මෙහෙයුම් අවශ්‍යතා සහ සේවක අපේක්ෂාවන් සමඟ පෙළගැස්වීම සහතික කිරීම සඳහා බැංකුව සිය මානව සම්පත් රාමු අබණ්ඩව සමාලෝචනය කර සංශෝධනය කරයි. ශක්තිමත් යහපාලනය සාධාරණත්වය සහතික කරමින්, සහ අවදානම් අවම කරමින් මෙහෙයුම්වල සියලු මට්ටම් හරහා සේවක සහභාගීත්වය වැඩි දියුණු කරයි.

මානව සම්පත් ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම GRI 2-23, 24

2025 දී, මෙහෙයුම් විශිෂ්ටත්වය ඉහළ නැංවීමට සහ ඉහළ කාර්යසාධනයක් සහිත සේවා ස්ථානයක් පෝෂණය කිරීම සඳහා බැංකුව සිය මානව සම්පත් ප්‍රතිපත්ති රාමුව සමාලෝචනය කර වැඩිදියුණු කළේය.

අවධානය යොමු කරන ලද ප්‍රධාන ක්ෂේත්‍ර:

- **ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ ප්‍රතිපත්තිය**
- **සේවක දුක්ගැනවිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය**
- **උසස්වීම් ප්‍රතිපත්තිය**
- **දුරස්ථ සේවා පිළිබඳ මානව සම්පත් ප්‍රතිපත්තිය**
- **සේවකයන් ඉවත් වීමේදී වන සම්මුඛ පරීක්ෂණ පිළිබඳ ප්‍රතිපත්තිය**

එක්ව කටයුතු කිරීමේ නිදහස සහ සාමූහික කේවල් කිරීම

GRI 2-30, GRI 402-1, GRI 407-1

බැංකුව සිය 2024-2026 සඳහා වන සාමූහික ගිවිසුමේදී, සාධාරණ වැටුප්, ප්‍රතිලාභ සහ වැඩ-ජීවිත සමතුලිතතාවය සඳහා පැහැදිලි නියමයන් ස්ථාපිත කළේය. මෙම ගිවිසුම් ආයතනික ස්ථාවරත්වයට සහාය වන අතර ඵලදායිතා අරමුණු සමඟ පෙළගැස්ම පවත්වා ගනිමින් සේවක තෘප්තිය ශක්තිමත් කරයි.

සියලුම ස්ථිර සේවකයින් ව්‍යුහගත උපදේශන සහ සාකච්ඡා ක්‍රියාවලීන් දක්වා ඇති සාමූහික ගිවිසුම් යටතේ ආවරණය වේ. මාස හයක දැනුම් දීමේ කාල සීමාවක් මඟින්, කිසියම් සැලකිය යුතු මෙහෙයුම් හෝ ආයතනික වෙනස්කම් වලට පෙර සේවකයින් දැනුවත් කරනු ලැබේ. මෙමඟින් සේවක අයිතිවාසිකම් ආරක්ෂා කරන අතර කළමනාකරණය සහ කාර්ය මණ්ඩලය අතර විනිවිද පෙනෙන සන්නිවේදනය ප්‍රවර්ධනය කරයි.

දුක් ගැනවිලි යාන්ත්‍රණය සහ විසිල් බ්ලෝවිං ප්‍රතිපත්තිය GRI 2-25

වැඩිදියුණු කරන ලද විසිල් බ්ලෝවිං ප්‍රතිපත්තිය මඟින්, ආරක්ෂිත ඩිජිටල් වාර්තාකරණ නාලිකා සහ තෙවන පාර්ශ්වීය අධීක්ෂණය හරහා නිර්නාමිකභාවය සහ රහස්‍යභාවය සහතික කරයි.

දුක්ගැනවිලි කළමනාකරණය සඳහා කැපවූ දුක්ගැනවිලි හැසිරවීමේ නිලධාරියෙකු විසින් එය අධීක්ෂණය කරනු ලබන අතර, ව්‍යුහගත සහ විනිවිද බවින් යුතු ක්‍රියාවලියක් හරහා අනුමත ක්‍රියා පටිපාටිවලට අනුකූලව සේවක ගැටලු විසඳනු ලබන බව සහතික කරයි. විසිල් බ්ලෝවිං ප්‍රතිපත්තිය යටතේ මතුවන කරුණු ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අධීක්ෂණය යටතේ ස්වාධීනව විමර්ශනය කරනු ලබන අතර, රහස්‍යභාවය ආරක්ෂා කරයි.

2025 දී, වාර්තා වූ දුක්ගැනවිලි වලින් 100% ක් දින 10 ක් ඇතුළත විසඳන ලද අතර, එය විනිවිදභාවය, වගවීම සහ ගෞරවනීය සේවා ස්ථානයක් සඳහා බැංකුවේ කැපවීම අවධාරණය කරයි. බැංකුව පුරා විශ්වාසය සහ අබණ්ඩතාව ශක්තිමත් කරමින්, පළිගැනීම්වලට බිය නොවී වාර්තා කිරීමට දිරිමත් කරනු ලැබේ.

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 3

අබණ්ඩ කුසලතා සහ වෘත්තීය වර්ධනය

ගතික පරිසරයක් තුළ කාර්යසාධනය පවත්වා ගැනීම සඳහා සේවක වර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ ආයතනික කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම කේන්ද්‍රීය වේ. සේවකයින්ට තම වෘත්තීය අභිලාෂයන් සාක්ෂාත් කර ගනිමින් ඵලදායී ලෙස දායක විය හැකි බව සහතික කරමින්, කුසලතා මුවහත් කර ගැනීමට, හැකියාවන් ගොඩනඟා ගැනීමට සහ වෘත්තීය ප්‍රගතියට සහාය වීමට බැංකුව සිය මූලපිරීම් අබණ්ඩව වැඩිදියුණු කළේය.

ස්ත්‍රී පුරුෂ භාවය අනුව පුහුණු පැය GRI 404-1

	ස්ත්‍රී	පුරුෂ	මුළු
පුහුණු පැය	102,428	133,959	236,387
සේවකයෙකු සඳහා සාමාන්‍ය පුහුණු පැය	29	26	28

රු. මිලියන 348.0


පුහුණුව සහ සංවර්ධනය සඳහා ආයෝජනය

සේවකයකු සඳහා සාමාන්‍ය පුහුණු පැය

28

සේවක කාණ්ඩය අනුව සාමාන්‍ය පුහුණු පැය ගණන

පැය



විශ්‍රාම දිවිය මූලික කොටගත් වැඩසටහන්

මෙම වැඩසටහන මඟින් විශ්‍රාම යාමට ආසන්න සේවකයින්ට සහාය වීම සඳහා නිර්මාණය කරන ලද ව්‍යුහගත පුහුණුවක් ලබා දෙන ලදී.

පුහුණු වැඩසටහන	වැඩසටහන් ගණන	සහභාගිවන්නන් ගණන	පැය ගණන
ජීවිතයේ නව අදියරක් සඳහා	1	28	189

කුසලතා වර්ධනය සහ පුහුණුව

GRI 404-2

බැංකුවේ ඉගෙනුම් හා සංවර්ධන රාමුව ආයතනය පුරා තාක්ෂණික හැකියාව සහ නායකත්ව ගැඹුර ගොඩනැඟීම කෙරෙහි අවධානය යොමු කරයි. 2025 දී, බැංකුවේ පරිවර්තන න්‍යාය පත්‍රයට සහාය දෙමින් ඩිජිටල්කරණය, අවදානම් දැනුවත්භාවය සහ ගනුදෙනුකාර සේවා විශිෂ්ටත්වය ඇතුළු ව්‍යාපාරික අවශ්‍යතා සමඟ පුහුණු ප්‍රමුඛතා පෙළගස්වන ලදී.

විධිමත් පුහුණුව, උපදේශනය සහ රැකියා ස්ථානයේ සංවර්ධනය ඒකාබද්ධ කරන ව්‍යුහගත ඉගෙනුම් මාර්ග හරහා සේවකයින් දිරිමත් කරයි. නායකත්ව වැඩසටහන් මඟින් තීරණ ගැනීම, පුද්ගල කළමනාකරණය සහ උපායමාර්ගික හැකියාව ඉලක්ක කර ගන්නා අතර, ඩිජිටල් ඉගෙනුම් වේදිකා මඟින් ප්‍රවේශය සහ නම්‍යශීලීභාවය පුළුල් කර ඇති අතර, එමඟින් සේවකයින් වෙත ස්වයං ඉගෙනුම් ප්‍රවේශයකට ඉඩ සලසයි.

ඒකාබද්ධ අභ්‍යන්තර වැඩසටහන්, බාහිර හා විදේශීය පුහුණුව සහ tvBOC සහ Bankpedia වැනි ඩිජිටල් නාලිකා මාධ්‍ය ඔස්සේ මිශ්‍ර ආකෘතියක් හරහා පුහුණුව ලබා දේ. දෙමුහුන් ඉගෙනීම සහ සීමිත සති අන්ත සැසි හරහා වැඩ-ජීවිත සමතුලිතතාවයට බාධා අවම වන ලෙස පුහුණු වැඩසටහන් නිර්මාණය කර ඇත.

පුහුණු වැඩසටහන් පැවැත්වීමේ ක්‍රමවේද

- අභ්‍යන්තර පුහුණු වැඩසටහන්
- බාහිර සහ විදේශීය පුහුණුව
- ඩිජිටල් ඉගෙනුම (tvBOC, "Bankpedia" විද්‍යුත් ඉගෙනුම් වේදිකා)
- පුස්තකාල සහ දැනුම් පරිශීලන පහසුව
- 'Train the Trainer 'වැඩසටහන් මඟින් පුහුණුකරුවන් පුහුණු කිරීම

ප්‍රධාන ඉගෙනුම් අවධානය යොමු කළ ක්ෂේත්‍ර

- ගනුදෙනුකාර සේවයේ විශිෂ්ටත්වය ශක්තිමත් කිරීම
- නායකත්වය සහ කළමනාකරණ සංවර්ධනය
- වෘත්තීය සහ තාක්ෂණික කුසලතා වැඩිදියුණු කිරීම
- අවදානම් සහ අනුකූලතා දැනුවත්භාවය
- ඩිජිටල් හැකියාවන් ගොඩනැඟීම

ඉගෙනුම් අත්දැකීම් සක්‍රීය කරන්නන්

- උපදේශනය සහ පුහුණු කිරීම
- පුද්ගලාරෝපිත සංවර්ධනය සැලසුම් කිරීම
- නම්‍යශීලී ඉගෙනුම් කාලසටහන්
- දෙමුහුන් සහ ඩිජිටල් ඉගෙනුම් ක්‍රම
- පාඨමාලා ගාස්තු සහ සාමාජිකත්ව දායකත්වයන් ප්‍රතිපූරණය

පුහුණු ඵලදායීතාවය මැනීම

- ගනුදෙනුකාර තෘප්තිමත් දර්ශක
- ගනුදෙනුකාර පැමිණිලි විශ්ලේෂණය
- පුහුණුවෙන් පසු ඇගයීම් සහ සහභාගිවන්නන්ගේ ප්‍රතිපෝෂණ
- සේවක කාර්යසාධන ප්‍රතිඵල
- සේවක සමීක්ෂණ ප්‍රතිඵල

මානව සම්පත් පරිවර්තනය වේගවත් කිරීම සහ උපායමාර්ගික සංවර්ධනය

බැංකුවේ කුසලතා උපායමාර්ග ශක්තිමත් කිරීම සහ දිගුකාලීන ආයතනික පරිවර්තනයට සහාය වීම මූලික කොටගෙන, බැංකුව විසින් මානව ප්‍රාග්ධන සංවර්ධනයේ ඊළඟ අදියර මෙහෙයවීම සඳහා බාහිර කර්මාන්ත විශේෂඥතාව ගෙන ඒම සඳහා පරිවර්තනය සහ මානව සම්පත් උපායමාර්ගය සඳහා නියෝජ්‍ය මහා කළමනාකරුවකු පත් කරන ලදී.

මෙම උපායමාර්ගික පත්වීම බැංකුවේ මානව සම්පත් ආකෘති නවීකරණය කිරීම වේගවත් කිරීම සහ කුසලතා කළමනාකරණය, ශ්‍රම බලකා සැලසුම්කරණය සහ ආයතනික කාර්යසාධනය සඳහා හොඳම ප්‍රායෝගික ප්‍රවේශයන් හඳුන්වා දීම අරමුණු කර ගෙන ඇත.

මෙම භූමිකාව පුළුල් මානව සම්පත් පරිවර්තනයක න්‍යාය පත්‍රය මෙහෙයවීම කෙරෙහි අවධානය යොමු කරන අතර, පහත කරුණු සුවිශේෂී වේ:

- බැංකුවේ සමස්ත උපායමාර්ගික සැලැස්ම සහ ව්‍යාපාරික ප්‍රමුඛතා සමඟ මානව සම්පත් පරිවර්තන උපායමාර්ග පෙළගැස්වීම
- කුසලතා අත්පත් කර ගැනීම, සේවක සංවර්ධනය, කාර්යසාධන කළමනාකරණය සහ රඳවා තබා ගැනීම ශක්තිමත් කිරීම සඳහා කඩිනම් සහ හොඳම ප්‍රායෝගික විසඳුම් හඳුන්වා දීම
- ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍ර හරහා ඩිජිටල් නවෝත්පාදන සහ ඉදිරි දැක්මක් සහිත මානව සම්පත් භාවිතයන් ඒකාබද්ධ කිරීමෙන් මානව සම්පත් ක්‍රියාවලීන් නවීකරණය කිරීම
- ශ්‍රම බලකාය සැලසුම් කිරීම, කුසලතා සංවර්ධනය සහ සංවිධානාත්මක තීරණ ගැනීම සඳහා මඟ පෙන්වීම සඳහා මානව සම්පත් විශ්ලේෂණ සහ දත්ත මත පදනම් වූ අවබෝධය පුළුල් කිරීම
- බැංකු කර්මාන්තයේ මිනුම් ප්‍රමිතීන් සමඟ පෙළගැස්වූ තරඟකාරී ප්‍රතිලාභ ක්‍රමවේදයක් සංවර්ධනය කිරීම ඇතුළුව කාර්යසාධනය මත පදනම් වූ සංස්කෘතියක් ක්‍රියාත්මක කිරීමට සහාය වීම.

ඉදිරි වසර කිහිපය තුළ, මෙම පරිවර්තන මූලපිරීම මඟින් ශ්‍රම බලකායේ ධාරිතාව ශක්තිමත් කිරීම, සේවක වටිනාකම් යෝජනා වැඩිදියුණු කිරීම සහ බැංකුවේ උපායමාර්ගික අභිලාෂයන් සමඟ සමපාත වන අනාගතයට සූදානම් කුසලතා ගොඩනැඟීමට අපේක්ෂා කෙරේ.

ස්ථිරසාර කාර්යසාධනයක් සඳහා පරිපූර්ණ ශ්‍රම බලකාය

කාර්යසාධන කළමනාකරණය GRI 404-3

අර්ධ වාර්ෂික පදනමක් මත සේවක කාර්යසාධනය තක්සේරු කිරීම සඳහා විනිවිදාත්මක සහ ස්වයංක්‍රීය ක්‍රමවේදයක් සපයන ව්‍යුහගත, KPI සහ නිපුණතා පාදක කාර්යසාධන කළමනාකරණ පද්ධතියක් බැංකුව තුළ ක්‍රියාත්මක වේ. නිශ්චිත ඉලක්ක සැකසීම, නිතිපතා ඇගයීම් සහ අඛණ්ඩ ප්‍රතිපෝෂණ හරහා, පුද්ගල සංවර්ධනය ආයතනික ප්‍රමුඛතා සමඟ පෙළගස්වා ඇති අතර, ශ්‍රම බලකාය පුරා ස්ථාවර කාර්යසාධනය වැඩිදියුණු කිරීමට සහාය වේ.

ඉහළ කාර්යසාධනය ඇගයීම;

හොඳම ශාඛා සම්මානය
ශාඛා මට්ටමේ කැපී පෙනෙන කාර්යසාධනය හඳුනා ගැනීම

පළාත් මට්ටමින්, මාසිකව හොඳම සේවකයා සඳහා නාමයෝජනා
විශිෂ්ටතම සේවකයා සැමරීම

නවෝත්පාදන සඳහා සභාපතිවරයාගේ ඇගයීම
ආයතනික වටිනාකමක් ඇති කරන බලපෑම් සහගත අදහස් සහ නවෝත්පාදනයන් හඳුනා ගැනීම

උපදේශනය සහ වෘත්තීය වර්ධනය GRI 404-3

ඉහළ විභවයක් ඇති සේවකයින් හඳුනාගෙන කළමනාකරණ අභ්‍යාසලාභී සහ නායකත්ව අනුප්‍රාප්තික වැඩසටහන් ඇතුළුව වේගවත් සංවර්ධන මාර්ග හරහා සහාය ලබා දෙනු ලැබේ. කුසලතා පුළුල් කිරීමට සහ ඵලදායිතාව ශක්තිමත් කිරීමට සියලු අංශයන්හි අවශ්‍ය අත්දැකීම් ලබා දීමෙන් දිරිමත් කරනු ලැබේ. 2025 දී, උසස්වීම් සහ අනෙකුත් ඇගයීම් කුසලතා මත පදනම් වූ අතර, ශ්‍රම බලකාය පුරා සාධාරණත්වය, අනුකූලතාව සහ සමාන අවස්ථා ශක්තිමත් කළේය.


- වසර තුළ සියලුම සේවකයින් (100%) කාර්යසාධන සමාලෝචනවලට භාජනය විය.

අනුප්‍රාප්තික සැලසුම්කරණය

ව්‍යුහගත කාර්යසාධනය සහ විභව තක්සේරු කිරීම් හරහා බැංකුව තීරණාත්මක භූමිකාවන් හඳුනාගෙන අභ්‍යන්තර කුසලතා මාර්ග ගොඩනැඟීම අඛණ්ඩව කරගෙන ගියේය. ඉහළ කාර්යසාධනයක් සහිත සේවකයින් අනාගත නායකත්ව භූමිකාවන් හඳුනාගෙන ඇති අතර කළමනාකරණ අභ්‍යාසලාභී වැඩසටහන්, සේවා පදනම් අත්දැකීම් සහ ජ්‍යෙෂ්ඨ නායකයින්ගේ මගපෙන්වීම ඇතුළු ඉලක්කගත සංවර්ධන මූලපිරීම් හරහා සහාය ලබා දෙනු ලැබේ.

වෘත්තීය ප්‍රගතිය සහතික කරමින් හැකියාව සහ පූර්ව දැනුම මත පදනම්ව, පුළුල් තක්සේරුවක් සහ සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියකින් පසුව වසර තුළ සේවකයින් 400 කට වැඩි පිරිසක් උසස් කරන ලදී.

කාණ්ඩය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව උසස්වීම් සංඛ්‍යාව



ප්‍රමුඛතා ක්ෂේත්‍ර 4

සේවක සහභාගීත්වය හා යහපැවැත්ම ප්‍රවර්ධනය

බැංකුව සිය සංස්කෘතියේ හරය ලෙස සේවකයින්ට පෞද්ගලික ජීවිතයේ සහ වෘත්තීය ජීවිතයේ දියුණු විය හැකි පරිසරයක් පෝෂණය කරයි. එමෙන්ම ශාරීරික හා චිත්තවේගීය යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කරන පුළුල් සුවතා වැඩසටහන් සහ අවශ්‍ය සහයෝගය බැංකුව විසින් සපයයි.

සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම GRI 403-2,3,6

භෞතික හා මූල්‍යමය සහයෝගය: බැංකුව විවිධ භෞතික හා මූල්‍යමය ප්‍රතිලාභ හරහා සේවක යහපැවැත්මට සහාය වේ.

- නේවාසික වෛද්‍යවරයෙකු සහ ඔසුසලක් සහිත ස්ථානීය වෛද්‍ය පහසුකම්
- ක්‍රීඩා සමාජ, ක්‍රීඩා උත්සව සහ ජාතික මට්ටමේ ඉසව්වලට සහභාගී වීම
- සාමූහික ගිවිසුම යටතේ කාලානුරූපී වැටුප් සහ දීමනා සංශෝධන
- KPI පදනම් කරගත් දීමනා සහ වාර්ෂික කාර්යසාධනය හා සම්බන්ධ ප්‍රසාද දීමනා

ආරක්ෂිත සහ ගතික වැඩ පරිසරය: සේවකයින් ආරක්ෂා කිරීම, නියාමන අනුකූලතාවය සහතික කිරීම සහ සේවා ස්ථාන අවදානම අවම කිරීම සඳහා බැංකුව සියලුම මෙහෙයුම් ස්ථානවල ව්‍යුහගත වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂණ පිළිවෙත් පවත්වා ගෙන යයි.

- නියාමන ප්‍රමිතීන්ට අනුකූලව පැහැදිලිව නිර්වචනය කරන ලද ආරක්ෂක ප්‍රොටෝකෝල
- ආරක්ෂිත සහ රහස්‍ය සිදුවීම් වාර්තා කිරීමේ යාන්ත්‍රණ
- අඛණ්ඩ සේවක දැනුවත්භාවය සහ පුහුණු මූලපිරීම්
- සෞඛ්‍ය හා ආරක්ෂාව ශක්තිමත් කිරීමේ වගකීම් මත නිතිපතා අභ්‍යන්තර සන්නිවේදනය

- නිරන්තර සේවා ස්ථාන විගණන සහ සෞඛ්‍ය හා ආරක්ෂක ප්‍රමිතීන් බලාත්මක කිරීම
- දෙමුහුන් වැඩ ආකෘතියක් ඇතුළුව නම්‍යශීලී ක්‍රියාපටිපාටීන්

මානසික සෞඛ්‍ය සහාය: වසර තුළ, බැංකුව චිත්තවේගීය ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා මානසික සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය පුළුල් කළේ;

- 24/7 උපදේශනය
- චිත්තවේගී යහපැවැත්මට සහාය වීම සඳහා 'සුමිත්‍රයෝ' මිත්‍රශීලීන් සමඟ හවුල්කාරිත්වය
- ආතති කළමනාකරණ වැඩමුළු
- පවුල් සහාය වැඩසටහන්
- ආගමික සමාජ ක්‍රියාකාරකම්, - දේශනා කිරීම්, භාවනා කිරීම සහ සමස්ත යහපැවැත්මට සහාය වන ආගමික වතාවත් මඟිනි.

ක්‍රියාශීලී ජීවන රටාව ප්‍රවර්ධනය කිරීම: ශාරීරික යහපැවැත්ම සහ වැඩ-ජීවිත ඒකාබද්ධතාවය උදෙසා සුවතා මූලපිරීම් හරහා සහාය විය;

- යෝගා වැඩසටහන්
- ශාරීරික යෝග්‍යතා වැඩසටහන්
- නිතිපතා සෞඛ්‍ය පරීක්ෂාවන්
- වැඩිදියුණු කළ ව්‍යායාම ශාලා පහසුකම්
- සකස් කරන ලද සුවතා සැලසුම්

අර්බුද සහන මූලපිරීම්: 'දිට්වා' සුළි කුණාටුවට ප්‍රතිචාර වශයෙන්, බැංකුව බලපෑමට ලක් වූ සේවකයින්ට මූල්‍යමය සහ මූල්‍යමය නොවන ආධාර ලබා දුන්නේය.

සේවක ආරක්ෂාව සහ යහපැවැත්මට ප්‍රමුඛත්වය දෙමින්, 'දිට්වා' සුළි කුණාටුව නිසා ඇති වූ අහිතකර තත්ත්වයන් හේතුවෙන් සේවයට වාර්තා කිරීමට නොහැකි වූ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට බැංකුව විශේෂ නිවාඩු ලබා දුන්නේය.

මෙම ක්‍රියාකාරී පියවරයන් මඟින් සේවකයින් අවදානමට ලක් නොවන බව සහතික කරන ලද අතර දුෂ්කර කාලවලදී සහයෝගී, ජනතා කේන්ද්‍රීය සේවා පරිසරයක් ඇති කිරීම සඳහා බැංකුවේ කැපවීම ශක්තිමත් කරන ලදී. සහන සේවා සඳහා සේවකයින් ද දායක වූ අතර, එහි සාමූහික දායකත්වය රු. මිලියන 50.0 ක් වූ අතර, එය ශක්තිමත් සේවක සහයෝගීතාවය සහ සමාජ වගකීම පිළිබිඹු කරයි.

ඊට අමතරව, සුළි කුණාටුවෙන් පීඩාවට පත් සේවකයින් සඳහා සහන පියවරක් ලෙස රු. 250,000 සිට රු. 1,000,000 දක්වා පොළී රහිත කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රම සමඟ අත්‍යවශ්‍ය අවශ්‍යතා සඳහා ප්‍රතිපූරණයන් ලබා දෙන ලදී.

වේතන සහ ප්‍රතිලාභ

GRI 405-2

බැංකුවේ වේතන රාමුව, බැංකුව පුරා සාධාරණත්වය, විනිවිදභාවය සහ අනුකූලතාව සහතික කිරීම සඳහා ව්‍යුහගත කර ඇත. ප්‍රතිලාභ ගෙවීම් රැකියා වගකීම්, කාර්යසාධනය සහ සංවිධානාත්මක අරමුණු සමඟ පෙළගස්වා ඇති අතර පැහැදිලිව අර්ථ දක්වා ඇති ප්‍රතිපත්ති සහ අධීක්ෂණ යාන්ත්‍රණයන් මඟින් පාලනය වේ.

2025 දී, බැංකුව ස්ත්‍රී සහ පුරුෂ සේවකයින් අතර 1:1 වැටුප් අනුපාතය පවත්වා ගෙන ගිය අතර, සාධාරණව ගෙවීමට ඇති කැපවීම ශක්තිමත් කළේය. සේවකයින්ට කර්මාන්ත ප්‍රමිතීන් පිළිබිඹු කරන තරඟකාරී වේතන පැකේජ පිරිනමනු ලබන අතර, කාර්යසාධනය හා සම්බන්ධ ප්‍රසාද දීමනා, වැටුප් වර්ධක සහ කාර්යසාධන දර්ශක මත පදනම් වූ දීමනා හරහා කුසලතා මත පදනම් වූ පුද්ගල සහ කණ්ඩායම් ජයග්‍රහණ හඳුනා ගන්නා ප්‍රතිලාභ පිරිනමනු ලැබේ.

GRI 202-1

2025 වසර පුරාම දේශීය බඳවා ගැනීම් වලට ප්‍රමුඛත්වය දීම, සමාන අවස්ථා සහතික කිරීම සහ අවම වැටුප් රෙගුලාසි වලට අනුකූල වීම මඟින් ලංකා බැංකුව සාධාරණ රැකියා පිළිවෙත් ආරක්ෂා කරයි.

සහනදායී සහ අනුපූරක ප්‍රතිලාභ

GRI 401-2

මූලික වේතනයට අමතරව, ලංකා බැංකුව ස්ථීර සේවකයන් සඳහා පුළුල් පරාසයක සහනදායී සහ අනුපූරක ප්‍රතිලාභ ලබා දෙන අතර එමඟින් සේවක යහපැවැත්ම සහ මූල්‍ය ආරක්ෂාව වැඩි දියුණු වේ. මෙම පිරිනැමීම් ප්‍රායෝගික අවශ්‍යතා සඳහා සහාය වීම සහ සමබර වැඩ අත්දැකීමක් ප්‍රවර්ධනය කිරීම මත සම්මත ප්‍රතිලාභ ගෙවීම් ඉක්මවා වටිනාකමක් ලබා දීම සඳහා නිර්මාණය කර ඇත.

ප්‍රධාන ප්‍රතිලාභ අතරට;

- වෛද්‍ය ප්‍රතිපූරණ යෝජනා ක්‍රම
- සහනදායී කාර්ය මණ්ඩල ණය පහසුකම්
- සුභසාධන ප්‍රවාහන සේවා
- නිවාඩු නිකේතන පහසුකම්
- අධ්‍යාපනික ගාස්තු ප්‍රතිපූරණය
- දේශීය හා ජාත්‍යන්තර පුහුණුව

සේවක සහභාගීත්වය සහ අභිප්‍රේරණය

ලංකා බැංකුවේ සේවක සහභාගීත්වය විවෘත සන්නිවේදනය, විශ්වාසය සහ ශක්තිමත් සේවක සම්බන්ධතාවයක් මත පදනම් වේ. 2025 දී, මානව සම්පත් යහපාලන රාමුව තුළ ඇති දුක්ගැනවිලි හැසිරවීම සහ විසිල් බ්ලෝවිං යාන්ත්‍රණයන් මඟින් සහාය දක්වන ලද ප්‍රතිපෝෂණ, ගැටලු සහ යෝජනා සඳහා ව්‍යුහගත නාලිකා, ශ්‍රම බලකාය පුරා විනිවිද බවින් යුතු සම්බන්ධතාවයක් සක්‍රීය කළේය. නිතිපතා සමීක්ෂණ, කළමනාකරණය සමඟ පවත්වන සාකච්ඡා, අභ්‍යන්තර සන්නිවේදනයන් සහ ශාඛා මට්ටමේ අන්තර්ක්‍රියා මඟින් ආයතනික ප්‍රමුඛතා සමඟ සේවක අදහස් පෙළගැස්වීම ශක්තිමත් කරන ලදී.

නායකත්ව සංවර්ධනය සහ ආයතනික සහජීවනය ප්‍රවර්ධනය කරන ක්‍රියාකාරකම් ආදී මූලපිරීම් තුළින් සහයෝගීතාවය සහ ඇතුළත්කරණය ශක්තිමත් කරන ලදී. ලංකා බැංකු ක්‍රීඩා සමාජයේ අන්තර් පළාත් තරඟ සහ වාර්ෂික ක්‍රීඩා උළෙල හරහා වැඩ ජීවිත සමතුලිතතාවය සහ මිත්‍රත්වය තවදුරටත් ශක්තිමත් කරන ලද අතර, සේවකයින් 2,000 කට අධික සංඛ්‍යාවක් ඊට සම්බන්ධ කර ගන්නා ලදී.

ස්ථිරසාර කාර්යසාධනයක් සඳහා පරිපූර්ණ ශ්‍රම බලකාය

සමස්ත දිවයිනම ආවරණය වන ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් හඳුන්වා දීම තුළින් ශාඛා කණ්ඩායම් 150 කට අධික සංඛ්‍යාවක් සම්බන්ධ කර ගනිමින්, දැනුම බෙදාගැනීම සහ අන්තර් ශාඛා සහභාගීත්වය තවදුරටත් දිරිමත් කළේය.



බැංකුවේ ආගමික සංගම් විසින් සංවිධානය කරන ලද විවිධ ක්‍රියාකාරකම් හරහා ආගමික සහජීවනය පෝෂණය කිරීමෙන් බැංකුව විවිධත්වය වැළඳ ගනී. මෙම මුලපිරීම්, විවිධ විශ්වාසයන් සහ ආගම්වලට අයත් සේවකයින් අතර සුහදතාවය සහ එකමුතුකම වර්ධනය කරයි.

පශ්චාත් රැකියා ප්‍රතිලාභ

GRI 401-2


බැංකුව සේවකයින්ගේ ක්‍රියාකාරී සේවයට අමතරව දිගුකාලීන මූල්‍ය ආරක්ෂාව සහ යහපැවැත්මට සහාය වීමට කැපවී සිටී. විශ්‍රාම යන සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් සැලසුම්, විශ්‍රාම ගැනීමෙන් පසු වෛද්‍ය ආවරණය, සෞඛ්‍ය රක්ෂණය සහ මූල්‍ය සැලසුම් සහාය ඇතුළු පුළුල් පරාසයක පශ්චාත් රැකියා ප්‍රතිලාභ බැංකුව විසින් පිරිනමනු ලැබේ. මෙම පියවරයන් මඟින් සේවකයින් තම විශ්‍රාම දිවියට හොඳින් සූදානම් වන බව සහතික කරන අතර, ස්ථාවරත්වය, මානසික සුවය සහ ඔවුන්ගේ පශ්චාත් වෘත්තීය යහපැවැත්ම සඳහා අඛණ්ඩ සහයෝගය ලබා දේ.

මෙයට අමතරව, විශ්‍රාමික සේවකයින්ට සහනදායී මිල ගණන් යටතේ බැංකුවේ නිවාඩු නිකේතන පහසුකම් සඳහා අඛණ්ඩව ප්‍රවේශය ලබා දෙන අතර, එමඟින් අඛණ්ඩ සහභාගීත්වය පෝෂණය වන අතර ක්‍රියාකාරී සේවයෙන් ඔබ්බට ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවයි.

සේවක ඉල්ලා අස්වීම් සහ සේවක ඉවත්වීම් GRI 401-1


කැපවූ සහ ස්ථාවර සේවක මණ්ඩලයක් පවත්වා ගැනීම සඳහා බැංකුව, සේවක රඳවා ගැනීම සක්‍රීයව පෝෂණය කරයි. පිටවීමේ සම්මුඛ සාකච්ඡා සහ සමීක්ෂණ හරහා නිවැරදි ප්‍රතිචාරයන් සහ අදහස් ලබා ගනිමින් එම තොරතුරු මත සේවා පරිසරය වඩාත් යෝග්‍ය සහ රැකියා අඛණ්ඩතාවය තහවුරු වන සේ සකස් කරයි. ඉවත්ව යන සේවකයින්ට වෘත්තීය උපදේශනය, නව අවස්ථා සඳහා මාර්ගෝපදේශනය සහ අනාගත රැකියා අවස්ථා සඳහා සහාය ඇතුළුව ව්‍යුහගත බැහැර කිරීම් හරහා සහාය ලබා දෙනු ලැබේ. එමඟින් සේවක මණ්ඩලය පුරා සහභාගීත්වය සහ විශ්වාසය පවත්වා ගනිමින් සුමට හා ධනාත්මක සංක්‍රාන්තියක් සහතික කෙරේ.

පළාත් සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවක පිරිවැටුම



වයස් කාණ්ඩය අනුව සේවක පිරිවැටුම

සංඛ්‍යාව



ප්‍රමුඛතා ක්ෂේත්‍ර 5

ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කිරීම සහ තිරසාර භාවිතයන්

දිගුකාලීන කාර්යසාධනය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා වන කැපවීම් හඳුනා ගනිමින්, බැංකුව ශක්තිමත් මානව ප්‍රාග්ධන පදනමක් හරහා බැංකුව ඩිජිටල්කරණය සහ තිරසාරභාවය වෙත ප්‍රවේශ වේ. සේවකයින්ට සහාය වීමට, වැඩ කටයුතු විධිමත් කිරීමට සහ තීරණ ගැනීම වැඩිදියුණු කිරීමට, පරිණාමය වෙමින් පවතින පරිසරයක වඩාත් ඵලදායී ලෙස ක්‍රියා කිරීමට කාර්ය මණ්ඩලය හැකියාව ලබා දීම සඳහා ඩිජිටල් මෙවලම් සහ පද්ධති යොදා ගැනේ.

ඩිජිටල් හැකියාවන්, පුද්ගලයින් සහ ක්‍රියාවලීන් එදිනෙදා මෙහෙයුම් වලට ඇතුළත් කිරීමෙන්, බැංකුව ඵලදායීතාව ශක්තිමත් කරයි, අනුවර්තනය වීමේ හැකියාව ගොඩනඟයි සහ අඛණ්ඩ කුසලතා සංවර්ධනයට සහාය වේ. මෙම පුද්ගල කේන්ද්‍රීය ප්‍රවේශය මඟින් තාක්ෂණය, අනාගතය සඳහා මානව විශේෂඥතාව, සහභාගීත්වය, හැකියාව සහ සංවිධානාත්මක සූදානම ශක්තිමත් කරන බව සහතික කෙරේ.



ක්ලවුඩ් (Cloud) තාක්ෂණය පාදක මානව සම්පත් පද්ධතිය: ඩිජිටල් බඳවා ගැනීම්, පරිපාලනය, ස්වයං සේවා, ඉගෙනුම් කළමනාකරණය සහ කාර්යසාධනය මැනීමට සහාය වීම සඳහා ආරම්භ කරන ලදී.

තිරසාර මූලපිරීම්

බැංකුව සිය මෙහෙයුම් සඳහා තිරසාරභාවය අඛණ්ඩව ඒකාබද්ධ කරයි.

- සම්පත් පරිභෝජනය අඩු කිරීම සඳහා කඩදාසි රහිත වැඩ ප්‍රවාහ සහ ඩිජිටල් ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම.
- ශාඛා 300 කට වැඩි සංඛ්‍යාවක ගෙවතු වගා මූලපිරීම් ඇතුළුව ශාඛා මට්ටමේ හරිත පිළිවෙත් දියත් කිරීම, පාරිසරික භාරකාරත්වය සඳහා සේවකයින් ක්‍රියාකාරීව සම්බන්ධ කර ගැනීම.
- ශාඛාවල සූර්ය බලශක්ති ස්ථාපනයන් හරහා පුනර්ජනනීය බලශක්ති භාවිතය ඉහළ නැංවීම සහ ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ බලශක්ති කාර්යක්ෂම පිළිවෙත් සඳහා කාර්ය මණ්ඩලය සහාය වීම.
- වෙරළ පිරිසිදු කිරීම සහ සමුද්‍ර දැනුවත් කිරීමේ වැඩසටහන් ඇතුළුව පාරිසරික සංරක්ෂණ මූලපිරීම් සඳහා සේවක සහභාගීත්වය වැඩි කිරීම.
- ගනුදෙනුකාර අධ්‍යාපනය සහ නිෂ්පාදන සම්මත කිරීම සඳහා කාර්ය මණ්ඩල සහභාගීත්වයෙන් සහාය වන පරිසර හිතකාමී බැංකු විසඳුම් ප්‍රවර්ධනය කිරීම.

උපායමාර්ගික ඉදිරි ගමන

සෑම වර්ණාවත් මුහුණතක් නිසි ලෙස පෙළගස්වන විට රූබික් ඝනකයක් සම්පූර්ණ වනවා සේම, බැංකුවේ අනාගතය එහි මානව ප්‍රාග්ධනයේ සම්බන්ධීකරණ ශක්තියෙන් හැඩගැසෙනු ඇත. අපගේ මානව සම්පත් හැකියාව, විශේෂඥතාව සහ තීක්ෂණ බුද්ධියේ අත්‍යවශ්‍ය මානයක් නියෝජනය කරයි. මෙම උපායමාර්ගික පරිවර්තනය හුදෙක් වෙනසට මඟ පෙන්වීමක් පමණක් නොව, නව අවස්ථා විවෘත කිරීමට, ඒකාබද්ධ වර්ධනයක් ඇති කිරීමට සහ මැනිය හැකි බලපෑමක් ලබා දීමට බැංකුවේ සාමූහික කුසලතා උපයෝගී කර ගැනීමකි. අප ක්‍රියාවලීන් සහ නවෝත්පාදනයන් පෙළගැස්වීමෙන්, ඔරොත්තු දෙන, තිරසාර සහ හැකියාවන්ගෙන් සපිරුණු අනාගතයක් කරා ගමන් කරන්නෙමු. ඩිජිටල් පරිවර්තනය, ගනුදෙනුකාර තෘප්තිය සහ ආයතනික විශිෂ්ටත්වය යන ව්‍යාපාරික ප්‍රමුඛතා සමඟ පෙළගැස්වීම සඳහා ලංකා බැංකුව උපායමාර්ගික මානව සම්පත් පරිවර්තනයක් දියත් කළේය.

බැංකුව සියලුම තීරණාත්මක නායකත්ව භූමිකාවන් සඳහා අනුප්‍රාප්තික සැලසුම් ප්‍රතිසංස්කරණය කිරීම, කුසලතාවන්ට ප්‍රතිලාභ සහිත කාර්යසාධනය මත පදනම් වූ සංස්කෘතිය, සේවකයින් සඳහා ඩිජිටල් කුසලතා සංවර්ධනය සහ නවීන මානව සම්පත් තාක්ෂණ පද්ධති ඇතුළු උපායමාර්ගික මූලපිරීම් ක්‍රියාත්මක කරනු ඇත. මෙම පරිවර්තනය, තාක්ෂණික දියුණුව සඳහා අවශ්‍ය ඉහළ කාර්යසාධනයක් සහිත කණ්ඩායමක් ගොඩනැඟීම, උසස් ගනුදෙනුකාර අත්දැකීම් ලබා දෙන සේවකයින් නිර්මාණය කිරීම සහ නිපුණතා පරතරයන් සමඟ පෙළගැස්වූ ක්‍රමානුකූල ඉගෙනීම තුළින් උපායමාර්ගික හැකියාවන් වර්ධනය කිරීම මගින් ව්‍යාපාර සාර්ථකත්වයට සෘජුවම ඉඩ සලසයි. පැහැදිලි කාර්යසාධන දර්ශක, ශක්තිමත් යහපාලනය සහ පුළුල් වෙනස්කම් කළමනාකරණය සමඟින්, බැංකුව අනාගතයේදී මැනිය හැකි ප්‍රතිඵල අපේක්ෂා කරයි.

කෙටිකාලීන


- **මානව සම්පත් යටිතල පහසුකම් නවීකරණය කිරීම: මානව ප්‍රාග්ධන කළමනාකරණ පද්ධතිය ක්ලවුඩ් (Cloud) තාක්ෂණය මත පදනම් වූ පද්ධතියකට සංක්‍රමණය කිරීම.**
- **නායකත්වය සහ හැකියාවන් ශක්තිමත් කිරීම: සේවා විශිෂ්ටත්වය සහ ආයතනික ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම සඳහා ඉලක්කගත නායකත්වය සහ කුසලතා සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම.**
- **මානව සම්පත් පරිවර්තනය: බැංකුවෙහි පරිවර්තන නාය පත්‍රයට සහාය වෙමින්, උපායමාර්ගික මානව සම්පත් නවීකරණ මූලපිරීම් මෙහෙයවීම සඳහා බැංකුව නියෝජ්‍ය මහා කළමණාකරු - පරිවර්තන සහ මානව සම්පත් උපායමාර්ග පත් කළේය. මෙම භූමිකාව, හොඳම ප්‍රායෝගික මානව සම්පත් රාමු අනුගමනය කිරීමට, කාර්යසාධනය මත පදනම් වූ සංස්කෘතියක් ශක්තිමත් කිරීමට සහ බැංකුවේ පරිණාමය වන කුසලතා සහ ආයතනික ප්‍රමුඛතා සඳහා සහාය වීම සඳහා දත්ත මත පදනම් වූ ශ්‍රම බලකා කළමනාකරණය ඉදිරියට ගෙන යාමට මඟ පෙන්වනු ඇත.**

මධ්‍යකාලීන සිට දිගුකාලීන

- **පුද්ගල තීරණ සඳහා කෘතිම බුද්ධිය (AI) භාවිතය: ශ්‍රම බලකායේ විශ්ලේෂණ, කුසලතා ඉල්ලුම් පුරෝකථනය කිරීම සහ පුද්ගලාරෝපිත ඉගෙනීම සක්‍රීය කිරීම සඳහා AI හැකියාවන් පුළුල් කිරීම.**
- **නායකත්වය ගොඩනැඟීම ව්‍යුහගත නායකත්වයක් සහ අනුප්‍රාප්තික කළමනාකරණ රාමුවක් හරහා තීරණාත්මක සහ නැගී එන භූමිකාවන් සඳහා කුසලතා ක්‍රමානුකූලව හඳුනා ගැනීම, සංවර්ධනය කිරීම සහ යෙදවීම.**
- **ඩිජිටල් කුසලතා සහ එලදායිතාව වැඩි දියුණු කිරීම: කාර්යයන් හරහා භූමිකාව මත පදනම් වූ ඩිජිටල් ශක්‍යතා රාමු සහ ව්‍යුහගත කුසලතා ප්‍රතිපූර්ණය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**
- **සේවක සහභාගීත්වය සහ යහපැවැත්ම: රඳවා තබා ගැනීම, එලදායිතාව සහ සේවා ස්ථාන ස්ථාවරත්වය වැඩි දියුණු කිරීම සඳහා මූලික මානව සම්පත් ක්‍රියාවලීන් තුළට සහභාගිත්වය සහ වර්ධනය මූලික කොටගත් අවස්ථා ඒකාබද්ධ කිරීම.**

ඩිජිටල් අත්දැකීම් බලගැන්වීම

GRI 3-3



රු. බිලියන 3.0	1,510	71%	34%	88%	23%
ඩිජිටල්කරණය සඳහා ආයෝජනය	ඩිජිටල් ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන	ඩිජිටල් සක්‍රීය ගනුදෙනුකරුවන්	අතථ්‍ය මාර්ග ඔස්සේ සම්බන්ධිත ගනුදෙනුකරුවන්	ඩිජිටල් ගනුදෙනු	ඩිජිටල්කරණය සඳහා ප්‍රවිෂ්ට වීම

ලංකා බැංකුවේ ඩිජිටල්කරණ උපායමාර්ගය මෙහෙයවනු ලබනුයේ, ඩිජිටල් විශිෂ්ටත්වය තුළින් ගනුදෙනුකරුවන් සවිබල ගැන්වීමේ පැහැදිලි අභිලාෂය සමඟම ලංකා බැංකුව ඔරොත්තු දෙන, අනාගතයකට සූදානම් ආයතනයක් ලෙස ශක්තිමත් කරමිනි. දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීමේදී තාක්ෂණික උපායමාර්ගයක් ලෙස ඩිජිටල් පරිවර්තනයන් යොදා ගනිමින් ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු සිදු කර ඇත.

නිර්වචනය කරන ලද ප්‍රමුඛතා මඟින් මෙහෙයවනු ලබන මෙම ඩිජිටල් පෙරදැක්ම, ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය සහ ස්වයංක්‍රීයකරණය හරහා ඵලදායිතාව, කාර්යක්ෂමතාව සහ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කරන අතරම ගනුදෙනුකාර අත්දැකීම් ගෝලීය ප්‍රමිතීන්ට ඔසවා තැබීම කෙරෙහි අවධානය යොමු කරයි. වසර තුළ ප්‍රගතිය, විනයගරුක ක්‍රියාත්මක කිරීම් පිළිබිඹු කරන අතරම, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, සයිබර් ආරක්ෂාව, ඩිජිටල් වේදිකා හරහා ගනුදෙනු කිරීමේ විශ්වාසය ශක්තිමත් කිරීම සහ ප්‍රවේශය පුළුල් කිරීම, වර්ධනය වන ඩිජිටල් ආර්ථිකයක් සඳහා බැංකුවේ සූදානම විදහා දක්වයි.

තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා බලපෑම



ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා



උපායමාර්ගික ප්‍රමුඛතා



2025 සඳහා සන්දර්භය

- ඩිජිටල් පරිවර්තන පෙරදැක්ම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, ගනුදෙනුකාර අත්දැකීම්, යටිතල පහසුකම් සහ ඵලදායිතාව හරහා ප්‍රශස්ත මට්ටමේ ප්‍රතිඵල ලබා දීම.
- අන්තර් බැංකු ක්‍රියාකාරිත්වය සහිත නව ජංගම බැංකුකරණ යෙදුමක් සාර්ථකව හඳුන්වා දීම.
- ප්‍රධාන තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ සයිබර් ආරක්ෂණ හැකියාවන් වැඩිදියුණු කිරීම සහ ප්‍රමාණාත්මක දත්ත උල්ලංඝනය කිරීමේ සිදුවීම් වාර්තා කර නොමැතිව පරිමාණය සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කර ඇත.
- ක්ලවුඩ් (Cloud) තාක්ෂණික ශිල්පය සහ කෘතිම බුද්ධිය (AI) - සක්‍රීය ගනුදෙනුකාර සහාය යෙදවීම ඇතුළුව උසස් ක්ලවුඩ් තාක්ෂණික සූදානම සහ දත්ත හැකියාවන්



- සාර්ථක නියාමන සහ බාහිර විගණන හරහා වැඩිදියුණු කළ තොරතුරු තාක්ෂණ යහපාලනය සහ අනුකූලතා පරිණතභාවය.
- බැංකුවේ තොරතුරු තාක්ෂණ සේවා අංශය ලෙස BOC IT සොලුයුශන්ස් (පෞද්ගලික) සමාගම ස්ථාපිත කරන ලදී.
- පළාත් පාලන ආයතන වෙත QR ගෙවීම් පුළුල් කිරීම සහ ශ්‍රී ලංකා තැපෑල හරහා නියෝජිත බැංකුකරණය පුළුල් කිරීම මඟින් ඩිජිටල් ගෙවීම් සහ මූල්‍ය ඇතුළත්කරණය ශක්තිමත් කරන ලදී.
- ඩිජිටල් තැන්පතු, තැන්පතු මත ක්ෂණික ණය සහ විද්‍යුත් සහ අතථ්‍ය ක්‍රමවේද හරහා ගනුදෙනුකරුවන්ගේ දත්ත රැස්කර ගැනීම (e/v KYC) මඟින් පරිපූර්ණ ලෙස ඩිජිටල් ක්‍රියා පිළිවෙත් පුළුල් කරන ලදී.

උපායමාර්ගික ප්‍රමුඛතා

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

තාක්ෂණය ප්‍රමුඛ නවෝත්පාදනයන් හරහා ගනුදෙනුකරුවන් සවිබල ගැන්වීම සඳහා ලංකා බැංකුවේ ඩිජිටල් ප්‍රාග්ධන උපායමාර්ගය ක්‍රියාත්මක කර තිබුණි. වසර තුළ, ගනුදෙනුකාර හිතකාමී වේදිකා ශක්තිමත් කිරීම, මූලික යටිතල පහසුකම් නවීකරණය කිරීම සහ ආරක්ෂාව සහ යහපාලනය වැඩි දියුණු කිරීම මගින් බැංකුව සිය ඩිජිටල් පරිවර්තන පෙරදැක්ම ඉදිරියට ගෙන යනු ලැබුවේ මෙම මෙහෙයුම් හරහා ප්‍රවේශය සහ විශ්වසනීයත්වය වැඩි දියුණු කරමින් ය.

ප්‍රමුඛතා ක්ෂේත්‍ර

- සුමට සහ ප්‍රතිචාරාත්මක ගනුදෙනුකාර සේවාවක්
- ක්‍රියාවලි සහ තාක්ෂණික යටිතල පහසුකම් සංවර්ධනය
- ආරක්ෂාව සහ තොරතුරු තාක්ෂණ යහපාලනය ශක්තිමත් කිරීම



ප්‍රමුඛතා ක්ෂේත්‍ර : 01 GRI 2-6

සුමට සහ ප්‍රතිචාරාත්මක ගනුදෙනුකාර සේවාවක්

ගනුදෙනුකාර අපේක්ෂාවන් විකාශනය වන යුගයක, සුමට හා ප්‍රතිචාරාත්මක ඩිජිටල් සේවාවන් සැපයීම, සම්බන්ධ වීම සහ තෘප්තිය සඳහා අත්‍යවශ්‍ය වේ. ස්වයං සේවා හැකියාවන් පුළුල් කිරීම, ඇතුලත්වීම් විධිමත් කිරීම සහ ජීවන රටාවට නැඹුරු විශේෂාංග හඳුන්වා දීම කෙරෙහි ලංකා බැංකුව අවධානය යොමු කර ඇත. මෙමගින් ගනුදෙනුකරුවන්ට බැංකුකරණ සේවා වෙත පහසුවෙන් සහ පුළුල් පරාසයක ඩිජිටල් නාලිකා හරහා ප්‍රවේශ වීම සහතික කරයි.



ඩිජිටල් අත්දැකීම් බලගැන්වීම

නව නාලිකා සංවර්ධනය

ඩිජිටල් බැංකුකරණයේ සිය නායකත්වය ශක්තිමත් කිරීම සඳහා බැංකුව අඛණ්ඩව කටයුතු කළේ, ගනුදෙනුකාර කේන්ද්‍රීය, කඩිනම් ඩිජිටල් විසඳුම් හඳුන්වා දෙමිනි. වසර තුළ, ස්වයං සේවා හැකියාවන් පුළුල් කිරීම, ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ගනුදෙනුකරුවන් ආරක්ෂිත සහ අවබෝධාත්මක ඩිජිටල් නාලිකා හරහා බැංකුව සමඟ සක්‍රියව සම්බන්ධ කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙම මූලපිරීම් සඳහා බැංකුවේ නවෝත්පාදන ඒකකය, නිමැවුම් සංවර්ධන කටයුතු සහ ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණ ව්‍යාපෘති කණ්ඩායම් සහ මූල්‍ය හා තාක්ෂණ ක්ෂේත්‍රයේ හවුල්කාරිත්වයන්හි දායකත්වය සක්‍රීයව සපයන ලදී.

BOC Flex- ජංගම බැංකුකරණ යෙදුම: අනාගත පරපුර සඳහා හඳුන්වා දුන් මෙම ජංගම යෙදුම, අනාගත සුපිරි-යෙදුම් පරිසර පද්ධතියක් සඳහා අඩිතාලම දමයි. මෙම යෙදුම හරහා පුළුල් පරාසයක බැංකු කටයුතු අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩිදියුණු කළ ක්‍රියාකාරිත්වයක් පිරිනමනු ලැබේ. තවද එමඟින්, ඒකාබද්ධ ඩිජිටල් අතුරුමුහුණතක් හරහා බාධාවකින් තොරව අන්තර් බැංකු ගනුදෙනු සිදු කරමින්, අනෙකුත් දේශීය බැංකු සමඟ ගිණුම් සම්බන්ධ කර කළමනාකරණය කිරීමට ගනුදෙනුකරුවන්ට හැකියාව ලැබේ.

BOC Smart Remit යෙදුම: ශ්‍රී ලංකාවේ පළමු තත්‍ය කාලීන විදේශ ප්‍රේෂණ යෙදුම

නියෝජිත බැංකු සේවා පුළුල් කිරීම: බැංකුව, ශ්‍රී ලංකා තැපැල් හවුල්කාරිත්වය සමඟ එක්ව නියෝජිත බැංකුකරණය හරහා ග්‍රාමීය ප්‍රදේශ හා ඌන සේවා ලත් කලාප පුරා බැංකු ප්‍රවේශය වැඩි දියුණු කලේ රට පුරා මූල්‍ය ඇතුළත්කරණය සහ ප්‍රවේශය ශක්තිමත් කරමිනි.

ඩිජිටල් නිෂ්පාදන පුළුල් කිරීම: ඩිජිටල් ඉතුරුම් ගිණුම්, ස්ථාවර තැන්පතු සහ ස්ථාවර තැන්පතු මත ක්ෂණික ණය තවදුරටත් පුළුල් කරන ලද අතර, ගනුදෙනුකරුවන්ට ශාඛා වෙත නොගොස් සම්පූර්ණයෙන්ම මාර්ගගතව මූලික බැංකු සේවා වෙත ප්‍රවේශ වීමට මෙමඟින් ඉඩ සලසයි.

පවතින නාලිකා වැඩිදියුණු කිරීම

බැංකුව නව නාලිකා සංවර්ධනයට සමගාමීව, සියලුම ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන හරහා ස්ථාවර, විශ්වාසදායක සහ පරිශීලක-හිතකාමී අත්දැකීමක් සහතික කිරීම සඳහා පවතින ඩිජිටල් වේදිකා වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කළේය. ගනුදෙනුකාර ප්‍රතිපෝෂණ, භාවිත රීතිකණ බුද්ධිය, සහ ගනුදෙනු පරිමාවන් වැඩි කිරීමේ අවශ්‍යතාවයට සහාය වීම සඳහා මෙම වැඩිදියුණු කිරීම් සිදු විය.

- **GOVPAY ඒකාබද්ධ කිරීම:** GOVPAY ගෙවීම් නාලිකාව SmartPay සහ BOC Flex යෙදුම් දෙකෙහිම සාර්ථකව සක්‍රීය කරන ලද අතර, බැංකුවේ ඩිජිටල් වේදිකා හරහා රජයේ ආයතන 220 කට අධික සංඛ්‍යාවක් සම්බන්ධ කරමින් රජයේ ආයතනවලට බාධාවකින් තොරව ගෙවීම් සඳහා පහසුකම් සපයයි.
- **ඩිජිටල් අත්දැකීම් ඇතුළත්කරණය:** වෙනස් කළ හැකි අකුරු ප්‍රමාණයන්, විශාලන කාර්යයන් සහ ආබාධිත ගනුදෙනුකරුවන් සඳහා පහසු සංචලනයක් හරහා වෙබ් අඩවියට ප්‍රවේශය ශක්තිමත් කරන ලදී.
- **AI-පාදක වෙබ් අඩවි සහ චැට්බොට් – (BOC AI Assist):** ආයතනික වෙබ් අඩවියේ, නිවැරදි සහ පරිශීලක මිත්‍ර බැංකුකරණ සහාය ක්ෂණිකව සැපයීම සඳහා AI බලාත්මක අතථ්‍ය සහායක හඳුන්වා දී තිබේ. එම චැට්බොට් ඩිජිටල් සේවා නාලිකාවල ප්‍රතිචාර දැක්වීම සහ ප්‍රවේශය වැඩි දියුණු කරමින්, ඕනෑම වේලාවක සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සහාය ලබා ගැනීමට පාරිභෝගිකයින්ට හැකියාව ලබා දෙයි.
- **WhatsApp බැංකුකරණය හරහා චෙක්පත් විමසීම:** ගනුදෙනුකරුවන්ට නව පහසු ස්වයං සේවා සම්බන්ධතා මධ්‍යස්ථානයක් ලෙස WhatsApp බැංකුකරණය, BOC Meta බැංකුකරණය හරහා චෙක්පත් තත්ත්ව විමසීම් සිදු කළ හැක.
- **රාජ්‍ය ව්‍යවසාය සඳහා ඉන්ධන කාඩ්පතක්** හඳුන්වා දෙන ලද අතර මෙමඟින් ප්‍රධාන ජාතික ආයතන සඳහා ඩිජිටල් ගෙවීම් විසඳුම් පුළුල් කොට ඇත.
- **පෝලිම් කළමනාකරණ පද්ධතිය:** සේවා කාර්යක්ෂමතාව සහ ගනුදෙනුකාර අත්දැකීම් වැඩිදියුණු කිරීම සඳහා දිවයින පුරා නව ශාඛා 100 ක් තුළ ස්ථාපනය කර ඇත.

ඩිජිටල්කරණය සඳහා ඇතුලත් කිරීම්

බැංකුව, ගනුදෙනුකාර ඇතුළත් කිරීම් සරල කිරීම සඳහා ඩිජිටල් සත්‍යාපනය සහ දුරස්ථ සත්‍යාපන තාක්ෂණයන් උපයෝගී කර ගෙන ඇත. e/v KYC මත පදනම් වූ දුරස්ථ ඇතුළත් කිරීමේ පහසුකම මඟින් ගනුදෙනුකරුවන්ට වීඩියෝ පාදක KYC හරහා ගිණුම් විවෘත කිරීමට හැකියාව ලැබෙන අතර, ශාඛා වෙත යාම සඳහා ඇති අවශ්‍යතාවය ඉවත් කරයි. මෙම මූලපිරීම් ගිණුම් විවෘත කිරීම වේගවත් කර ඇත. මෙම වැඩිදියුණු කළ පහසුකම් බැංකුව පුරා ඩිජිටල් භාවිතය ඉහළ මට්ටමකට ගෙන ඒමට දායක විය.

372,000 +
Smart පාස්පොත්

මිලියන 1.4 +
BOC Flex/ B app/ මාර්ගගත බැංකුකරණය

143,000 +
Smart Pay

17,000 +
BOC Meta බැංකුකරණය

ප්‍රමුඛතා ක්ෂේත්‍ර: 02

ක්‍රියාවලි සහ තාක්ෂණික යටිතල පහසුකම් සංවර්ධනය

බැංකුවේ ඩිජිටල්කරණයේ වර්ධනයට සහාය වීම සඳහා මෙහෙයුම්වල ඔරොත්තු දීමේ හැකියාව සහ පරිමාණය කිරීමේ හැකියාව මූලික වශයෙන් දායක විය. වසර තුළ දී, ඉහළ තොරතුරු තාක්ෂණ ගනුදෙනු පරිමාව, ඉහළ යන ඩිජිටල් භාවිතය සහ වඩාත් නවීන ඩිජිටල් සේවා සැපයීම සඳහා යටිතල පහසුකම් තවදුරටත් නවීකරණය කරන ලදී.

අතථ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම්, ජාල සහ යෙදුම් වේදිකා ඉහළ නැංවීම සහ උසස් සේවා පද්ධති නිරීක්ෂණ විසඳුම් යෙදවීම මෙම මූලපිරීම් අතර වේ.

මෙම ආයෝජන, පද්ධති ස්ථායිතාව, වැඩිදියුණු කළ කාර්යසාධනය සහ උසස් මට්ටමේ කාර්යක්ෂමතාව සහ විශ්වසනීයත්වය යන මධ්‍යකාලීන ඉලක්ක කරා යන ගමන ශක්තිමත් කරන ලදී.

තම ඩිජිටල් සහ තාක්ෂණික ක්ෂේත්‍රයේ නවීකරණය වේගවත් කිරීම සඳහා, බැංකුව විසින් BOC IT සොලූයුශන්ස් (පෞද්ගලික) සමාගම ස්ථාපිත කරන ලදී. එම පුනර්ජීවනය කල සම්පූර්ණයෙන්ම බැංකුව සතු පරිපාලිත සමාගම ඩිජිටල් යටිතල පහසුකම් ශක්තිමත් කිරීම, තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කළමනාකරණය සහ උසස් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විසඳුම් සංවර්ධනය කිරීම සඳහා ක්‍රියා කරනු ඇත.

ඊට සමගාමීව, තොරතුරු තාක්ෂණ සේවා හැසිරවීම විධිමත් කිරීම සඳහා බැංකුව අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ සේවා කළමනාකරණ (ITSM) පද්ධතියක් හඳුන්වා දුන්නේය. එම ITSM මෙවලම හරහා ශාඛා සහ මෙහෙයුම් ඒකක වල සිදුවීම් වාර්තා කිරීම, සේවා ඉල්ලීම් සහ පද්ධති සහාය සඳහා ව්‍යුහගත සහ විනිවිදාත්මක කාර්ය ප්‍රවාහයක් සපයනුවේ වේගවත් ප්‍රතිචාර කාලයන්, වැඩිදියුණු කළ සේවා සහ තවත් බොහෝ සේවා අනුකූලතාවන් සක්‍රිය කරමිනි.

වේදිකා නවීකරණය සහ තාක්ෂණ ප්‍රශස්තකරණය

බැංකුව විසින් එහි මූලික තාක්ෂණික වේදිකා ශක්තිමත්, පරිමාණය කළ හැකි, සහ හැකියාව ඇති අනාගත ඩිජිටල් අවශ්‍යතාවන්ට සහාය වෙමින් අබණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා ඒවා වැඩිදියුණු කිරීම අබණ්ඩව සිදු කරන ලදී. ජාල සහ ආරක්ෂක වේදිකා ඉහළ දත්ත පරිමාවන් සහ පරිණාමය වන භාවිතයන් සඳහා ශක්තිමත් කරන අතර, යෙදුම් පරිසරයන් ප්‍රතිචාර දැක්වීමේ හැකියාව සහ ඔරොත්තු දීමේ හැකියාව ප්‍රශස්තකරණය දක්වා වැඩිදියුණු කරන ලදී.

වැඩිදියුණු කළ අධීක්ෂණ සහ අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණයන් මඟින් විභව පද්ධති ගැටලු කල්තියා හඳුනා ගැනීමට හැකි වූ අතර, වේගවත් විසඳුම් සඳහා සහාය වන තීරණාත්මක ඩිජිටල් නාලිකා සේවා සඳහා බාධා අවම විය. වසර තුළ සම්පූර්ණ කරන ලද යටිතල පහසුකම් ආයෝජන අතරට ණය කාඩ්පත් පද්ධති දෘඩාංග උත්ශ්‍රේණි කිරීම්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්විච සංක්‍රමණය, පරිමිති ෆයර්වෝල් ප්‍රතිස්ථාපනය, ඒකාබද්ධ උපස්ථ විසඳුම්, අතථ්‍ය වේදිකා උත්ශ්‍රේණි කිරීම් සහ නව පොදු ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු ස්විචය (CEFT) ඇතුළත් වේ.

ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය සහ කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය

ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය, වසර තුළ ප්‍රධාන අවධානය යොමු කළ ක්ෂේත්‍රයක් ලෙස පැවතුනි. බැංකුව ව්‍යුහගත ක්‍රියා ප්‍රවාහ ස්වයංක්‍රීයකරණ මුලපිරීම් හරහා, පාරිභෝගික ඇතුළත් කිරීම, ගිණුම් විවෘත කිරීම, පරිශීලක පැතිකඩ කළමනාකරණය, දත්ත රැස් කිරීම, බාහිර වාර්තාකරණය යනාදිය ඇතුළුව මධ්‍යගත මෙහෙයුම් හරහා ප්‍රධාන ක්‍රියාවලීන් සරල කර ඩිජිටල්කරණය කර ඇත.

මෙම ක්‍රියාමාර්ග වල ප්‍රතිඵලයක් ලෙස කඩදාසි භාවිතය, සැකසීමේ කාලය සහ පුද්ගල මැදිහත්වීම් අඩු කිරීම් තුළ වූ අතර මෙහෙයුම් විනිවිදභාවය සහ පාලනය වැඩිදියුණු විය. ඩිජිටල් ක්‍රියා ප්‍රවාහයන්, ගනුදෙනුකරුවන් සඳහා වේගවත් සේවා සැපයීමට සහ අභ්‍යන්තර කණ්ඩායම් අතර ඵලදායිතාව සහ අනුකූලතාව වැඩිදියුණු කිරීමට දායක විය.

11

නව ක්‍රියා ප්‍රවාහ ස්වයංක්‍රීයකරණ ගණන

රු. මිලියන 116.5 +

ක්‍රියා ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය හරහා ලබා ගත් මුළු පිරිවැය ඉතිරිකිරීම්

මිලියන 6.6 +

කඩදාසි ඉතිරිකිරීම්

101,000 +

ක්‍රියා ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය හරහා ඉතුරු වූ සේවක පැය ගණන

ක්ලවුඩ් (Cloud) - තාක්ෂණය සඳහා අනාගත සූදානම් බව

ලංකා බැංකුව, එහි ක්ලවුඩ් - තාක්ෂණ සූදානම් උපායමාර්ගය නියාමන අවශ්‍යතා සහ අවදානම් කළමනාකරණ සලකා බැලීම්වලට අනුකූලව උසස් කරන ලදී. බාහිර අනුමැතියන් ක්‍රියාත්මක කිරීමේ කාලරාමු හැඩගැස්වීම දිගටම කරගෙන යන අතර, අභ්‍යන්තර පද්ධති ක්ලවුඩ් -තාක්ෂණ ශිල්පය සඳහා අවශ්‍ය නම්‍යශීලීභාවය සහතික කරමින් නිසි පරිදි සකස් කරන ලදී.

ක්ලවුඩ් තාක්ෂණ භාවිතය, මානව සම්පත් වේදිකාවලින් ආරම්භ වන, සැලසුම්ගත ගනුදෙනුකාර නොවන දත්ත පද්ධතිවල අදියර සංක්‍රමණය, ප්‍රමාණය කල හැකි සහ අවදානම් පෙළගැස්වූ ප්‍රවේශයක් පිළිබිඹු කරයි. නියාමන අනුමැතිය ලබා ගත් පසු, දත්ත ආරක්ෂාව හෝ මෙහෙයුම් අඛණ්ඩතාව බලපෑමට ලක් නොකර, ක්ලවුඩ් තාක්ෂණික හැකියාවන් කාර්යක්ෂමව භාවිතා කිරීමට බැංකුව සූදානම් බව මෙම ප්‍රවේශය සහතික කරයි.

- **ප්‍රමාණාත්මක සයිබර් ආරක්ෂාව හෝ දත්ත උල්ලංඝනය කිරීමේ සිදුවීම් වාර්තා වී නැත.**
- **තාක්ෂණය සහ ඔරොත්තු දීමේ හැකියාව සම්බන්ධ විගණන සාර්ථකව අවසන් විය.**
- **වැඩිදියුණු කරන ලද අනුකූලතා ඇගයීම්/ විගණන නිරීක්ෂණ අඩු වීම්.**

ප්‍රමුඛතා ක්ෂේත්‍ර: 03

ආරක්ෂාව සහ තොරතුරු තාක්ෂණ යහපාලනය ශක්තිමත් කිරීම

බැංකු මෙහෙයුම් වැඩි වශයෙන් ඩිජිටල් සහ අන්තර් සම්බන්ධිතව සිදුවන විට, ශක්තිමත් සයිබර් ආරක්ෂාව සහ විනයගරුක තොරතුරු තාක්ෂණ යහපාලනය, තිරසාර ඩිජිටල් ප්‍රගතියක් සඳහා අත්‍යවශ්‍ය වේ. මෙම ඩිජිටල් පරිවර්තන න්‍යාය පත්‍රයේ අංශයක් ලෙස, පද්ධති, දත්ත සහ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා බැංකුව ව්‍යුහගත, අවදානම්-පෙළගැස්වූ ප්‍රවේශයක් අබණ්ඩව අනුගමනය කරයි.

වසර තුළ, ශක්තිමත් සයිබර් ආරක්ෂණ රාමු, දත්ත රහස්‍යතා පාලනයන් සහ යහපාලන පරිචයන් තවදුරටත් ඩිජිටල් පරිසර පද්ධතිය වෙත ඇතුළත් කර ඇත. මෙම පියවරයන් නවෝත්පාදනය, හවුල්කාරිත්වයන් සහ ඩිජිටල් ව්‍යාප්තිය සහතික කර ඔරොත්තු දීමේ හැකියාව, නියාමන අනුකූලතාව, සහ ශක්තිමත් වගවීම සඳහා සහාය දක්වන ලැබුවේ, බැංකුවේ තාක්ෂණික සක්‍රිය මෙහෙයුම් ආකෘතිය කෙරෙහි විශ්වාසය ශක්තිමත් කරමිනි.

ගනුදෙනුකාර පෞද්ගලිකත්වය

GRI 418-1

වසර තුළ ගනුදෙනුකාර පෞද්ගලිකත්වය කඩ කිරීම් පිළිබඳ සනාථ කරන ලද පැමිණිලි වාර්තා වී නැත. 2025 දී හඳුනාගත් ගනුදෙනුකාර දත්ත කාන්දුවීම්, සොරකම් කිරීම් හෝ අහිමිවීම් වාර්තා වී නොමැත.

ඩිජිටල් අත්දැකීම් බලගැන්වීම

දත්ත ආරක්ෂාව

2022 අංක 9 දරණ පුද්ගලික දත්ත ආරක්ෂණ පනතට අනුකූලව බැංකුවේ දත්ත ආරක්ෂණ නිලධාරී (DPO), ස්වාධීනව මහා කළමනාකරු වෙත වාර්තා කරන අතර, බැංකුව පුරා දත්ත පෞද්ගලිකත්වය සම්බන්ධ පියවර ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම අධීක්ෂණය කිරීමට ක්‍රියා කලේය.

දත්ත ආරක්ෂණ නිලධාරී විසින් ගනුදෙනුකරුවන්ගේ තොරතුරු ආරක්ෂා කිරීම සඳහා දත්ත සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම පිළිබඳ සවිස්තරාත්මක ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි හැසිරවීම සඳහා වගකිව යුතු වේ. දත්ත ආරක්ෂණ බැඳීම් පිළිබඳ කාර්ය මණ්ඩල අවබෝධය ශක්තිමත් කිරීම සඳහා නිරතුරුව පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. නිරන්තර විගණන සහ පරීක්ෂණ මඟින් නියාමන අනුකූලතාව තක්සේරු කිරීම සහ දත්ත කඩකිරීමේ අවදානම අවම කිරීමට බැංකුව ක්‍රියා කරන ලදී.

ආරක්ෂක රාමු

බැංකුව තම ඩිජිටල් ආරක්ෂණ ස්ථාවරය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, පිළිගත් ආරක්ෂණ රාමු සහ තාක්ෂණයන් අනුගමනය කරන ලදී. වසර තුළ ක්‍රියාත්මක කරන ලද සහ ශක්තිමත් කරන ලද මූලපිරීම් අතරට, ගනුදෙනුකාර විශ්වාසය සහ රහස්‍යභාවය ඉහළම ප්‍රමිතීන්ට පවත්වා ගැනීම සඳහා දත්ත නැතිවීම වැළැක්වීමේ (DPL) වැඩිදියුණු කිරීම් සහ විශ්ලේෂණ වැඩිදියුණු කිරීම් ඇතුළත් වේ.

තොරතුරු තාක්ෂණ යහපාලනය සහ ප්‍රමිති පෙළගැස්ම

බැංකු පද්ධති අඛණ්ඩතාව, නියාමන අනුකූලතාව සහ ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කරමින් උපායමාර්ගික අරමුණු පෙළගස්වා ඇත්තේ තාක්ෂණික ආයෝජන, ඩිජිටල් හවුල්කාරිත්වයන්, සහ වේදිකා ඒකාබද්ධ කිරීම් ආරක්ෂා කරන අතරම තොරතුරු තාක්ෂණ යහපාලන රාමුව ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදු කරමිනි.

තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් උපායමාර්ග අධීක්ෂණය ව්‍යාපාරික අරමුණු, තාක්ෂණික ආයෝජන සහ බැංකුවේ අවදානම් අභිරුචිය අතර පෙළගැස්ම සහතික කරමින් ව්‍යුහගත කළමනාකරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ කමිටු හරහා සිදු කෙරේ. තොරතුරු තාක්ෂණ යහපාලන රාමුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ 2021 අංක 16 දරණ තාක්ෂණ අවදානම් කළමනාකරණ සහ ඔරොත්තු දීමේ පිළිබඳ නියෝගය සමඟ පෙළගස්වා ඇත.

වැඩිවන සයිබර් තර්ජන, නියාමන සංකීර්ණතාව සහ පද්ධතිමය මෙහෙයුම් ආකෘති වලට ප්‍රතිචාර වශයෙන්, බැංකුව COBIT 2019 මත පදනම් වූ ව්‍යාපාරික තොරතුරු තාක්ෂණ යහපාලන රාමුව ක්‍රියාත්මක කිරීම ඇතුළුව, පහත දැක්වෙන ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ හොඳම පිළිවෙත් පෙළගැස්ම මගින් ප්‍රගතියක් ලබා ඇත;

- **තත්ත්ව කළමනාකරණ පද්ධති (ISO 9001)**
- **සේවා කළමනාකරණ පද්ධති (ISO 20000-1)**
- **තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් මධ්‍යස්ථාන (ITIL) හොඳම පිළිවෙත්**
- **අවදානම් කළමනාකරණය (ISO 31000)**
- **තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධති (ISO 27001)**
- **ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ දැනුම (PMBOK)**

ඉදිරි උපායමාර්ගික දිශාව

ලංකා බැංකුව සිය ඩිජිටල් පරිවර්තනය ඉදිරියට ගෙන යන විට, මෙම වසරේ ප්‍රගතිය මත ගොඩනැගෙන අතර එහි ඩිජිටල් පද්ධතිය පුරා ඔරොත්තු දීමේ හැකියාව, ප්‍රවේශය සහ විශ්වාසය වැඩි දියුණු කරන මූලපිරීම් මෙහෙයවනු ඇත. ප්‍රධාන අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර;

කෙටිකාලීන


- **අදාළ කුසලතා ඇති වෘත්තිකයන් බඳවා ගැනීමෙන් ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම.**
- **රජයේ ඩිජිටල් පෙරදැක්ම සහ මහ බැංකුවේ ඩිජිටල් පෙරදැක්ම සමඟ සමපාත වෙමින්, කඩිනම් ප්‍රවේශයක් හරහා අගය එකතු කළ සේවාවන් සපයන සුපිරි යෙදුමක් බවට BOC Flex පරිවර්තනය කිරීම.**
- **විදේශීය ශාඛා ගනුදෙනුකරුවන් සඳහා විශිෂ්ට යෙදුමක් සංවර්ධනය කිරීම.**
- **වැඩිදියුණු කළ ගනුදෙනුකාර ප්‍රතිචාර දැක්වීම සඳහා AI හැකියාවන් සහිත නව සම්බන්ධතා මධ්‍යස්ථාන විසඳුමක් හඳුන්වා දීම.**
- **මූල්‍ය ප්‍රවේශය සඳහා AI මත පදනම් වූ පුද්ගලාරෝපිත බැංකු සේවා ක්‍රියාත්මක කිරීම සහ ඩිජිටල් ණය දීමේ වේදිකා පුළුල් කිරීම.**
- **පවතින මූලික බැංකුකරණ පද්ධතිය උසස් විශේෂාංග සමඟ වැඩිදියුණු කිරීම.**
- **ශ්‍රම බලකායේ කාර්යක්ෂමතාව සහ ඩිජිටල් භාවිතය ශක්තිමත් කිරීම සඳහා ක්ලවුඩ්-තාක්ෂණය පාදක මානව සම්පත් විසඳුමක් ක්‍රියාත්මක කිරීම.**
- **ඔරොත්තු දීමේ හැකියාව සහිත නිපුණතාවලින් සපිරි කණ්ඩායමක් ගොඩනැගීම සඳහා විශේෂිත පුහුණුව සහ නවෝත්පාදනය සඳහා ආයෝජනය කිරීම.**

මධ්‍ය සහ දිගුකාලීන

- **පරිමාණය, විශ්වසනීයත්වය සහ කාර්යක්ෂමතාව සඳහා ක්ලවුඩ්-තාක්ෂණය මත පදනම් වූ ක්‍රියාවලින් කරා සංක්‍රමණය වීම.**
- **ගනුදෙනුකාර වත්කම් ආරක්ෂා කිරීම සහ අඛණ්ඩ නියාමන අනුකූලතාව සහතික කිරීම සඳහා සයිබර් ආරක්ෂාව, වංචා නිරීක්ෂණ සහ තොරතුරු තාක්ෂණ යහපාලන රාමු වැඩිදියුණු කිරීම.**
- **සේවා සැපයීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා ශක්තිමත් සදාචාරාත්මක ආරක්ෂණය සමඟ AI විශ්ලේෂණ සහ දත්ත පාලනය වැඩිදියුණු කිරීම.**

තිරසාර අනාගතයක් ගොඩනැඟීම

GRI 3-3



රු. බිලියන 73.0	28	මෙගා වොට් 4.3	දෙකක්	රු. බිලියන 780.5	දෙකක්
තිරසාර මූල්‍යකරණය	සූර්ය බලය භාවිතා කරන නව ශාඛා	සූර්ය බලශක්ති ස්ථාපනය	නව හරිත ගොඩනැඟිලි	ප්‍රජා ආයෝජනය	නව BOC ගම්මාන ව්‍යෂෘති

රූබික් ඝනකයක් විසඳීමේදී මෙන්, තිරසාර ප්‍රගතිය උදෙසා ගනු ලබන සෑම තීරණයක්ම සමස්ත පද්ධතියටම බලපාන ආකාරය වටහා ගැනීමත්, පොදු අරමුණක් වෙනුවෙන් විවිධ අංගයන් මනාව පෙළගැස්වීමත් අත්‍යවශ්‍ය වේ. ලංකා බැංකුවේ තිරසාරභාවය යනු හුදු සංකල්පයක් පමණක් නොව, එය බැංකුවේ උපායමාර්ගික ව්‍යුහය සහ මෙහෙයුම් ආචාරධර්ම පද්ධතිය තුළම අන්තර්ගත වූවකි. මෙය අපගේ තීරණ ගැනීම, අවදානම් කළමනාකරණය සහ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය සංවිධානය කරන ප්‍රධාන සාධකයයි. ජාතික ප්‍රගතිය සහ වගකීම් සහගත මූල්‍ය භාරකාරත්වය වෙනුවෙන් වූ අපගේ දිගුකාලීන කැපවීම මත පදනම්ව, පාරිසරික, සමාජීය සහ යහපාලන මූලධර්ම බැංකුවේ මූලික ව්‍යාපාරික ආකෘතියට බද්ධ කොට ඇත. එමඟින් අප අත්පත් කරගන්නා වර්ධනය, ඔරොත්තු දීමේ හැකියාව හා වගවීම දිගුකාලීන සමාජීය පැවැත්මක් සහිත ගමනක් බව අපි සහතික කරන්නෙමු.

යහපාලන රාමු, නවෝත්පාදනයන් සහ පාර්ශ්වකරුවන්ගේ සක්‍රීය සහභාගීත්වය තුළ තිරසාරභාවය අන්තර්ගත කිරීම මඟින්, නැඟී එන ගෝලීය සහ දේශීය අභියෝග සාර්ථකව ජය ගැනීමට ලංකා බැංකුව කටයුතු කරයි. මෙම ක්‍රියාවලිය හරහා එම අභියෝගයන් තිරසාර වර්ධනයක් උදෙසා වූ අවස්ථාවන් බවට පරිවර්තනය කිරීමට බැංකුව නිරන්තරයෙන් කැපවී සිටියි.

තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා බලපෑම




ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා



2025 සඳහා සන්දර්භය

- දේශගුණික විපර්යාස ආශ්‍රිත අවදානම් සහ සම්පත් සීමිත වීම, බැංකුවේ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව, පිරිවැය ව්‍යුහය සහ දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය කෙරෙහි අඛණ්ඩව බලපෑම් විල්ලු කරයි. මෙම තත්ත්වය, වඩාත් කාර්යක්ෂම සම්පත් කළමනාකරණයක සහ පාරිසරික වගකීම් සහගත භාවයක ඇති අවශ්‍යතාව තවදුරටත් තහවුරු කරයි.
- නියාමන අවශ්‍යතා සහ ගනුදෙනුකරුවන්ගේ ඉහළ යන අපේක්ෂාවන් හේතුවෙන් තිරසාර යහපාලනය, දේශගුණික වෙනස්වීම් ආශ්‍රිත හෙළිදරව් කිරීම් සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී පාරිසරික හා සමාජීය සාධක වඩාබද්ධ කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමේ අවශ්‍යතාව ඉහළ යාම.



- අඛණ්ඩව පවතින සමාජ-ආර්ථික පීඩනයන් හමුවේ, පුද්ගල ජීවනෝපායන් සුරැකීම සහ ජාතික ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා මූල්‍ය ඇතුළත්කරණය, ප්‍රජා සංවර්ධනය සහ වගකීම් සහගත බැංකු පිළිවෙත්වල ඇති වැදගත්කම තවදුරටත් අවධාරණය විය.
- මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පිරිවැය කෙරෙහි අවධානය යොමු වීමත් සමඟ පාරිසරික බලපෑම අවම කරමින් ඵලදායිතාව ඉහළ නැංවීමේ දී බලශක්ති කාර්යක්ෂමතාව, ඩිජිටල්කරණය සහ ස්වයංක්‍රියකරණය වැනි අංශ ඉටු කරන තීරණාත්මක කාර්යභාරය වර්ධනය වීම.
- සැපයුම් දාම සහ ප්‍රසම්පාදන පිළිවෙත් පිළිබඳව සිදුකළ පුළුල් විමර්ශනයකින් පසුව, තෙවන පාර්ශ්වීය සබඳතා හරහා වගකීම් සහගත සම්පත්කරණය, සදාචාරාත්මක ශ්‍රම ප්‍රමිතීන් සහ ඉහළ විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීමේ අවශ්‍යතාවය වැඩි වීම.

තිරසාර අනාගතයක් ගොඩනැඟීම

උපායමාර්ගික ප්‍රමුඛතා

පරිපූර්ණ සහ තිරසාර ජාතික සංවර්ධනයක් උදෙසා උත්ප්‍රේරණය

දේශීය හා පද්ධතිමය වශයෙන් වැදගත් මූල්‍ය ආයතනයක් ලෙස මෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව සහ දිගුකාලීන සංවර්ධනය ශක්තිමත් කිරීමෙහිලා ලංකා බැංකුව සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි. වගකීම් සහගත බැංකුකරණයේ මඟ පෙන්වීම ලබන ලංකා බැංකුව, සිය මෙහෙයුම් ක්‍රියාවලිය තුළට සමාජීය බලපෑම, පාරිසරික භාරකාරත්වය සහ උපායමාර්ගික හවුල්කාරිත්වයන් මනාව ඒකාබද්ධ කර ඇත. සංවර්ධන ණය පහසුකම්, ප්‍රජා ආයෝජන සහ තිරසාර මූල්‍යකරණ ප්‍රවේශයන් හරහා නිෂ්පාදන අංශයන් දිරිමත් කිරීමටත්, ප්‍රජාවන් බලගැන්වීමටත්, එමඟින් වඩාත් සාධාරණ සහ තිරසාර ජාතික ආර්ථිකයක් ගොඩනැඟීමටත් ලංකා බැංකුව නිරන්තරයෙන් දායක වේ.

ප්‍රමුඛතා ක්ෂේත්‍ර



- ආර්ථික ස්ථාවරත්වය සහ ප්‍රජා බලගැන්වීම දිරිමත් කිරීම.
- ක්ෂේත්‍රයේ සහ හවුල්කාරිත්ව ජාලයන් හරහා ශක්තිමත් සහයෝගිතාවක් ගොඩනැඟීම
- පාරිසරික භාරකාරත්වය, තුලිත කාබන් භාවිතය හා බලපෑම් කළමනාකරණය

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 01

ආර්ථික ස්ථාවරත්වය සහ ප්‍රජා බලගැන්වීම දිරිමත් කිරීම.

ආර්ථික ස්ථාවරත්වයට හා වර්ධනයට සහය වීම

ශ්‍රී ලංකා ප්‍රමුඛතම මූල්‍ය ආයතනය ලෙස, සමාජීය හා ආර්ථික ස්ථාවරත්වය තහවුරු කිරීම ලංකා බැංකුවේ ප්‍රධානතම කාර්යභාරයයි. කුටුම්බයන්, ව්‍යවසායකයන් සහ පොදු යටිතල පහසුකම් සමඟ පවතින ගැඹුරු සබඳතාව මත පදනම්ව මූල්‍ය පහසුකම් සලසා දීම, නිෂ්පාදන අංශයන් බලගැන්වීම සහ ජාතික ආර්ථික ප්‍රතිසාධන ක්‍රියාවලියට දායක වීම මඟින් ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමට බැංකුව අඛණ්ඩව කැපවී ක්‍රියා කරනු ලබයි.

ශ්‍රී ලංකා ප්‍රගමනයේ නොසැලෙන හවුල්කරුවෙකු ලෙස, ප්‍රජාවන් හැඩගස්වන, දේශීය යටිතල පහසුකම් ශක්තිමත් කරන සහ ජීවනෝපායන් බලගන්වන ප්‍රමුඛ පෙළේ ව්‍යාපෘති සඳහා ලංකා බැංකුව නායකත්වය ලබා දෙයි. බැංකුවේ උපායමාර්ගික ආයෝජනයන් ක්ෂණික ප්‍රතිලාභ වලින් ඔබ්බට යමින්, දිගුකාලීන ආර්ථික ස්ථාවරත්වයක් ගොඩනැඟීමටත්, සමස්ත ශ්‍රී ලාංකික ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමටත් සෘජුවම දායක වේ. සියලු දෙනා ඇතුළත් වන වර්ධනයක් සහ ඔරොත්තු දීමේ හැකියාවක් ප්‍රවර්ධනය කරන මෙම වැඩසටහන්, තිරසාර සමෘද්ධිය කරා ජාතිය මෙහෙයවන මාවත ශක්තිමත් කරමින් නොමැකෙන සලකුණක් තබනු ඇත.

ප්‍රධාන අංශ මූල්‍යකරණය

රු. බිලියන 493.4
නිවාස හා ඉදිකිරීම්

රු. බිලියන 159.7
කෘෂි සහ ධීවර

රු. බිලියන 206.9
නිමැවුම්

රු. බිලියන 109.5
සංචාරක

සංවර්ධන මූල්‍යනය හරහා ප්‍රජා සවිබල ගැන්වීම


GRI 413-1, 203-1,2

ලංකා බැංකුව දිගු කලක් තිස්සේ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයේ නොසැලෙන පදනම ලෙස කටයුතු කරන අතර, රටේ ප්‍රමුඛතා අංශයන් වෙත මූල්‍ය පහසුකම් සැලසීමට ප්‍රමුඛත්වය ලබා දෙයි. එහිදී, විශේෂිත ක්ෂේත්‍රයන්හි වර්ධනයක් ඇති කිරීම සඳහා බැංකුව සතු මූල්‍ය ශක්තිය සහ වෘත්තීය විශේෂඥතාව උපයෝගී කර ගනු ලබයි.

සංවර්ධන ණය දීම

ලංකා බැංකුව සංවර්ධන ණය දීම හරහා, උපායමාර්ගිකව කෘෂිකර්මාන්තය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්, පුනර්ජනනීය බලශක්තිය සහ යටිතල පහසුකම් වැනි ඉහළ අවශ්‍යතාවයක් සහිත අංශ වෙත සිය මූල්‍ය දායකත්වය යොමු කරයි. මෙම ඉලක්කගත ආයෝජන මඟින් අදාළ අංශයන්හි ප්‍රසාරණයට ශක්තියක් ලබා දෙනවා පමණක් නොව, නව රැකියා උත්පාදනය කිරීමටත්, ඵලදායිතාව ඉහළ නැංවීමටත් සහ ප්‍රාදේශීය සංවර්ධනය දිරිමත් කිරීමටත් මඟ පාදයි. එමඟින් ජාතික ආර්ථික වර්ධනය වෙනුවෙන් බැංකුව ලබා දෙන දායකත්වය තවදුරටත් පුළුල් වේ.

සංවර්ධන ණය කළඹ %



ක්ෂුද්‍ර මූල්‍යකරණය හරහා බිම් මට්ටමේ ජනතාව වෙත ළඟා වීම

බැංකුව සාර්ව මට්ටමේ මැදිහත්වීම් වලට සමගාමීව, මූල්‍ය සේවා වලින් බැහැරව සිටින හෝ අවම පහසුකම් ලබන ප්‍රජාවන් වෙත එම සේවාවන් සමීප කරවන පරිපූර්ණ මූල්‍යකරණ ප්‍රවේශයක් වෙනුවෙන් කැපවී සිටියි. මෙමඟින් එම ප්‍රජාවන්ට සුරක්ෂිත ඉතිරිකිරීම්, පහසුවෙන් ණය ලබාගැනීමේ අවස්ථා සහ පුළුල් ආර්ථික ක්‍රියාවලියට සක්‍රීයව දායක වීමේ අවස්ථාව හිමි වේ. එමෙන්ම, මෙය ඔවුන්ගේ දිගුකාලීන මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව දැඩි කරන ශක්තිමත් පදනමක් ද නිර්මාණය කරයි.

ක්ෂුද්‍ර මූල්‍යකරණය

රු. බිලියන 25.9


නව ක්ෂුද්‍ර මූල්‍ය ණය අරමුදල්

රු. බිලියන 7.2

කාන්තාවන් විසින් මෙහෙයවන ව්‍යාපාර සඳහා ණය අරමුදල්

BOC මිතුරු කණ්ඩායම් GRI 413-1

අවම පහසුකම් ලබන ප්‍රජාවන් ඉලක්ක කරගනිමින් BOC මිතුරු කණ්ඩායම් වලට සහයෝගීතා ජාල, සම්පත් හවුල් භාවිතය සහ ප්‍රජා මූලික ණය දීම් සඳහා ලංකා බැංකුව පහසුකම් සලසයි. මෙම ක්‍රියාකාරකම් මඟින් ප්‍රජාවන් තුළ අන්‍යෝන්‍ය සහයෝගීතාව සහ විශ්වාසය ගොඩනැගෙන අතර, එය තිරසාර ආර්ථික ක්‍රියාවලියක් පෝෂණය කිරීමට මඟ පාදයි.



සෑම සංවර්ධන පියවරකදීම ජීවනෝපායන් සවිබල ගැන්වීම

පුද්ගල මූල්‍ය ගමනේ සෑම අදියරකදීම අර්ථවත් බලපෑමක් ඇති කළ හැකි පරිදි ලංකා බැංකුවේ ණය දීමේ පද්ධතිය සකස් කර ඇත. මූල්‍ය සාක්ෂරතාවය කරා ප්‍රථම පියවර තබන ශිෂ්‍ය පරපුරේ සිට, දේශීය සංවර්ධනය මෙහෙයවන ව්‍යවසායකයන් සහ සමස්ත ප්‍රජාව දක්වා වූ සියලු ස්ථරයන් මෙයට ඇතුළත් වේ. එක් එක් අංශයට අනන්‍ය වූ අවශ්‍යතා වලට ගැළපෙන පරිදි බැංකු නිෂ්පාදන සහ සේවාවන් සැලසුම් කිරීම හරහා, මූල්‍ය ඇතුළත්කරණය සහ බලගැන්වීම යනාදිය හුදු සංකල්ප වලට පමණක් සීමා නොකර, ශ්‍රී ලංකාව පුරා ප්‍රායෝගික යථාර්ථයක් බවට පත් කිරීමට බැංකුව පියවර ගෙන ඇත.

නව පරම්පරාව පෝෂණය කිරීම

ලංකා බැංකුව, පුද්ගල සංවර්ධනය උදෙසා වූ සිය දායකත්වය කුඩා අවධියේ සිටම දරුවන්ට ලබා දෙන අතරම, සිසුන් තුළ ඉතිරි කිරීමේ පුරුදු සහ මූල්‍යමය දැනුවත්භාවය වර්ධනය කිරීමට සක්‍රීයව දායක වේ. 'BOC හපනා' ශිෂ්‍යත්ව වැඩසටහන සහ සම්මන්ත්‍රණ මාලාව හරහා දක්ෂ සිසුන් 15,000 කට අධික පිරිසකට අධ්‍යාපනික අත්වැලක් සපයා ඇති අතර, පාසල් ඉතුරුම් වීකක මඟින් කුඩා කල සිටම වගකීම් සහගත මුදල් කළමනාකරණ සංස්කෘතියක් ඇති කිරීමට බැංකුව කටයුතු කරයි. මෙම ක්‍රියාවලිය ජීවිත කාලය පුරාම පවතින මූල්‍ය ස්වාධීනත්වය සහ සාක්ෂරතාවය සඳහා ශක්තිමත් අඩිතාලමක් දමයි.

එමෙන්ම, 'නැණපය' වෘත්තීය මාර්ගෝපදේශන සම්මන්ත්‍රණ සහ උපදේශන වැඩසටහන් හරහා තරුණ තරුණියන් 6,000 කට අධික පිරිසකට සිය පෞද්ගලික සහ වෘත්තීය දියුණුව උදෙසා නව මාවත් ගවේෂණය කිරීමට මූල්‍යමය සහ මනෝවිද්‍යාත්මක මඟ පෙන්වීම් ලබා දී ඇත.

යොවුන් අභිලාෂයන්ට සහාය වීම

තරුණ පරපුරේ අභිලාෂයන් සහ හැකියාවන් ශ්‍රී ලංකාවේ දිගුකාලීන සමාජ-ආර්ථික ප්‍රගතියේ කේන්ද්‍රස්ථානය බව හඳුනා ගනිමින්, අධ්‍යාපනික හා මූල්‍ය බලගැන්වීමේ විවිධ වැඩසටහන් හරහා තරුණ සංවර්ධනය උදෙසා ලංකා බැංකුව අඛණ්ඩව සහාය දක්වයි.

මෙම උත්සාහයන් තවදුරටත් ශක්තිමත් කරමින්, 'BOC Youth' ණය පහසුකම හරහා ව්‍යවසායකත්වය, කුසලතා සංවර්ධනය සහ නව ව්‍යාපාර දිරිමත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය ප්‍රවේශය තරුණ තරුණියන් වෙත විවෘත කර දී ඇත. මෙම මූල්‍ය විසඳුම් මඟින් රට පුරා තරුණ ප්‍රජාව අතර නවෝත්පාදනය, රැකියා උත්පාදනය සහ ආර්ථික සහභාගීත්වය පෝෂණය කිරීමට බැංකුව සමත් විය. ඒ අනුව, සිය නිර්මාණාත්මක අදහස් සාර්ථක ව්‍යාපාර බවට පරිවර්තනය කර ගැනීමට තරුණ ව්‍යවසායකයින් 19,000 කට අධික පිරිසකට බැංකුව සක්‍රීයව සහාය වී ඇත.

මීට අමතරව, 'Dream Builders' වැඩසටහන හරහා තරුණ පරපුර තුළ ව්‍යවසායකත්ව චින්තනය සහ අනාගත අභිලාෂයන් වර්ධනය කිරීම කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කර ඇත.

ප්‍රජාව වෙත වන බලපෑම කෙරෙහි ප්‍රමුඛත්වය

GRI 413-1

ලංකා බැංකුව, ප්‍රජා සංවර්ධනය සහ ධාරිතා වර්ධනය, සිය ආයතනික අරමුණෙහි ප්‍රධානතම පදනම ලෙස සළකයි. බැංකුවේ තිරසාරත්ව රාමුව මත පදනම් වූ මෙම ප්‍රයත්නයන්, සාම්ප්‍රදායික මූල්‍ය සේවාවලින් ඔබ්බට ගොස්, ප්‍රජාවන් බලගැන්වීම, ජීවනෝපායන් ශක්තිමත් කිරීම සහ සමාජීය ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම මූලික කරගෙන දිවයින පුරා ව්‍යාප්ත වී ඇත. බැංකු කාර්ය මණ්ඩලයේ සෘජු මැදිහත්වීම මත ක්‍රියාත්මක වන ප්‍රජා ආයෝජන වැඩසටහන් සහ මූල්‍ය ඇතුළත්කරණය පදනම් බැංකු විසඳුම් හරහා ප්‍රායෝගික සමාජ බලපෑමක් ඇති කිරීමට බැංකුව උපායමාර්ගිකව කටයුතු කරයි.

'BOC ගම්මාන' වැඩසටහන යනු පරිපූර්ණ මැදිහත්වීම් හරහා අවම පහසුකම් සහිත ග්‍රාමීය ප්‍රජාවන් නඟාසිටුවීම වෙනුවෙන් ක්‍රියාත්මක වන ප්‍රමුඛතම මුලපිරීමකි. මෙම වසරේදී, දකුණු පළාතේ ගොම්බද්දල, දෙයියන්දර මෙන්ම, ඌව පළාතේ බිබිල, නාගල යන ප්‍රදේශ ආවරණය වන පරිදි නව BOC ගම්මාන ස්ථාපිත කෙරුණු අතර, එමඟින් ප්‍රතිලාභීන් 4,600 කට අධික පිරිසක් සවිබල ගැන්වේ. මෙම වැඩසටහන මඟින් යටිතල පහසුකම් සංවර්ධනය, මූල්‍ය සාක්ෂරතාවය සහ ධාරිතා වර්ධනය ඒකාබද්ධ කරමින්, එම ප්‍රජාවන් තුළ දිගුකාලීන ආර්ථික තිරසාරභාවයක් ඇති කිරීමට කටයුතු කරයි.

ප්‍රධාන මූලිකාංග:

- පිරිසිදු පානීය ජල පද්ධති ස්ථාපිත කිරීම, ක්‍රීඩා පිටි සංවර්ධනය සහ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම වැනි අත්‍යවශ්‍ය පොදු අවශ්‍යතා සපුරාලීමට දායක වීම මඟින් යටිතල පහසුකම් නඟාසිටුවීම.
- ස්මාර්ට් පන්ති කාමර, පරිගණක විද්‍යාගාර සහ පුස්තකාල පහසුකම් ලබා දෙමින් සිසුන්ගේ ඩිජිටල් සාක්ෂරතාවය සහ අධ්‍යාපන තත්ත්වය ඉහළ නැංවීම.
- BOC මිතුරු කණ්ඩායම් සහ BOC රන් කැකුළු, වැනි වැඩසටහන් හරහා විශේෂයෙන්ම දරුවන් සහ කාන්තාවන් අතර මූල්‍ය කළමනාකරණය පිළිබඳ අවබෝධය සහ ඉතිරි කිරීමේ පුරුදු ශක්තිමත් කිරීම.
- රුක් රෝපණ වැඩසටහන්, වීදි සංඥා පුවරු සවිකිරීම සහ පොදු ස්ථාන අලංකරණය වැනි ව්‍යාපෘති හරහා ප්‍රජාව තුළ තම ප්‍රදේශය පිළිබඳ අභිමානයක් සහ හිමිකාරිත්වයක් ගොඩනැගීම.

තිරසාර අනාගතයක් ගොඩනැඟීම

මෙම ඒකාබද්ධ ප්‍රවේශය හරහා ජාතික සංවර්ධන ක්‍රියාවලිය, සියලු දෙනාගේ සහභාගීත්වයෙන් සහ තිරසාර මූල්‍ය ඇතුලත්කරණ අරමුණු සමඟ මැනවින් බද්ධ කර ඇත.



සමාජීය වශයෙන් වගකීම් සහගත සහ බලපෑම් සහගත ආයතනයක් ලෙස සිය භූමිකාව තහවුරු කරමින්, 2025 වසරේදී ලංකා බැංකුව ආපදා සහන, සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය සහ ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් රු. මිලියන 780.5 ක මුදලක් පරිත්‍යාග කර ඇත. මෑතකදී සිදු වූ 'දිට්වා' සුළි කුණාටුවෙන් පීඩාවට පත් ප්‍රජාවන්ගේ සහන සේවා, ප්‍රතිසාධන සහ පුනරුත්ථාපන කටයුතු සඳහා ක්‍රියාත්මක “ශ්‍රී ලංකාව යළි නඟා සිටවමු” අරමුදල වෙත බැංකුව ලබා දුන් රු. මිලියන 500.0 ක සුවිශේෂී දායකත්වය ද මෙයට ඇතුළත් වේ.

කාර්ය මණ්ඩල ස්වේච්ඡා කැපවීම

බැංකුවේ ප්‍රජා සත්කාරක වගකීම්, මැනිය හැකි සැබෑ ප්‍රතිඵල බවට පරිවර්තනය කිරීමේදී ලංකා බැංකු කාර්ය මණ්ඩලය සක්‍රීය භූමිකාවක් ඉටු කරයි. 2025 වසරේදී, බැංකු සේවකයින් ස්වේච්ඡාවෙන් සිය කාලය සහ ශ්‍රමය කැප කරමින් දායක වී ඇති ආකාරය පහත දැක්වේ.

ප්‍රධාන මූලිකාංග:

- මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් මඟින්, ග්‍රාමීය ජනතාව වෙත ඉතිරිකිරීම්, අයවැයකරණය සහ සුළු පරිමාණ ව්‍යවසාය කළමනාකරණය පිළිබඳ දැනුම හා මඟපෙන්වීම් ලබා දීම.
- ව්‍යවසායකත්ව උපදේශන වැඩසටහන්, ක්ෂුද්‍ර ව්‍යාපාරිකයන් සඳහා ව්‍යාපාරික මෙහෙයුම් සහ උපායමාර්ගික සැලසුම්කරණය පිළිබඳ විශේෂිත උපදේශන සහාය ලබා දීම.
- ප්‍රජා සේවා ව්‍යාපෘති, පාසල් ප්‍රතිසංස්කරණය, පාරිසරික දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා සක්‍රීයව දායක වීම.
- සුළි කුණාටුවෙන් පීඩාවට පත් පළාත්වල ජනතාව වෙනුවෙන් රු. මිලියන 50.0 ක් වටිනා වියළි සලාක පරිත්‍යාග කිරීමේ මානුෂීය මෙහෙයුම

කාර්ය මණ්ඩලයේ මෙම ස්වේච්ඡා දායකත්වය, ලංකා බැංකුවේ මානුෂීය සංවේදීතාව සහ සේවා සංස්කෘතිය මැනවින් පිළිඹිබු කරන්නකි. එමඟින් බැංකු ශාඛා ජාලයේ සීමාවන්ගෙන් ඔබ්බට ගොස්, සමාජයේ පොදු යහපත උදෙසා බැංකුවේ ඇති කැපවීම සහ සමීප භාවය තවදුරටත් පිළිබිඹු වේ.

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 02

ක්ෂේත්‍රයේ සහ හවුල්කාරිත්ව ජාලයන් පුරා ශක්තිමත් සහයෝගීතාවක් ගොඩනැඟීම

සහයෝගී සබඳතා

ප්‍රජාවන් සතු සුවිශේෂී අවශ්‍යතා හඳුනා ගනිමින් ඒවාට විසඳුම් සෙවීම සඳහා උචිත ව්‍යාපෘති ඒකාබද්ධව සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට ලංකා බැංකුව රාජ්‍ය ආයතන, සිවිල් සමාජ සහ පෞද්ගලික අංශය සමඟ සමීප සහයෝගීතාවයකින් කටයුතු කරයි. ඒ අනුව, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සමඟ එක්ව වෙරළ තීරයන් පිරිසිදු කිරීම සහ ඒ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා එක්ව අලි-මිනිස් ගැටුම අවම කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් පවත්වන ලද ලෝක වනජීවී දින සැමරුම සහ ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් සමඟ ක්‍රියාත්මක කරන ලද ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියත් මින් සුවිශේෂී වේ. මෙම මුලපිරීම් මඟින් පාරිසරික භාරකාරත්වය සහ ප්‍රජා සම්බන්ධතාවය පිළිබඳ බැංකුවේ ඇති ඒකාබද්ධ ප්‍රවේශය මැනවින් ප්‍රදර්ශනය කරයි.

බැංකුවේ පාරිසරික සංරක්ෂණ මෙහෙවරෙහි තවත් එක් පියවරක් ලෙස, ජාතික දේශගුණික සහ රුක් රෝපණ අරමුණු සමඟ සමපාත වෙමින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමඟ සහයෝගීතාවයකට එළඹීමට ද බැංකුව කටයුතු කළේය. මෙම හවුල්කාරිත්වය හරහා ක්‍රියාත්මක කෙරෙන රුක් රෝපණ මුලපිරීම් මඟින් දිගුකාලීන කාබන් විමෝචනය අවම කිරීම සහ පරිසර පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම උදෙසා බැංකුව සතු නොසැලෙන කැපවීම තවදුරටත් තහවුරු කරයි.

ධනාත්මක බලපෑමක් උදෙසා හවුල්කාරිත්වයන් ගොඩනැඟීම

GRI 2-28

ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීම වෙනුවෙන් බැංකුව නිරන්තරයෙන් තම සක්‍රීය දායකත්වයක් ලබා දෙයි. ප්‍රධාන කර්මාන්ත සංගම්, වෘත්තීය ආයතන සහ සහයෝගිතා සංගම්වල සාමාජිකත්වය දැරීම හරහා බැංකුව මෙම කාර්යභාරය ඉටු කරයි. මෙවැනි ආයතනික සබඳතා මඟින් දැනුම හුවමාරු කර ගැනීම, නියාමන ක්‍රියාවලීන් සඳහා මැදිහත් වීම සහ බැංකු ක්ෂේත්‍රයේ මෙන්ම සමස්ත ආර්ථිකයේ ස්ථාවරත්වයට හා සංවර්ධනයට දායක වන සාමූහික වැඩසටහන් සඳහා සහාය ලබා දීම සිදුකරයි. මෙම ආයතන සමඟ සමීපව කටයුතු කිරීමෙන්, බැංකුවට විශේෂඥ දැනුම සහ ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීමට මෙන්ම සහයෝගීතාව සඳහා නව අවස්ථා උදා කර ගැනීමට ද හැකි වේ. මෙය වගකීම් සහගත සහ ප්‍රගතිශීලී බැංකුකරණ භාවිතයන් මඟින් බැංකුව සතු කැපවීම තවදුරටත් තහවුරු කරයි.

වසර තුළ බැංකුව පහත සඳහන් ආයතනයන්හි සක්‍රීය සාමාජිකත්වය පවත්වාගෙන යන ලදී:

කර්මාන්ත සංගම්

- ශ්‍රී ලංකා බැංකු සංගමය (ඇපයෙන් සීමිත)
- ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය
- ලංකා වාණිජ මණ්ඩලය
- ආසියා පැසිෆික් ග්‍රාමීය සහ කෘෂිකාර්මික ණය සංගමය

වෘත්තීය සහ ක්ෂේත්‍ර ආයතන

- ශ්‍රී ලංකා බැංකු අනුකූලතා නිලධාරීන්ගේ සංගමය
- ශ්‍රී ලංකා බැංකු අංශයේ අවදානම් වෘත්තිකයන්ගේ සංගමය

රාජ්‍ය සහ ආයතනික ව්‍යුහයන්

- ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් (ඇපයෙන් සීමිත) සමාගම
- ශ්‍රී ලංකා නීති පුස්තකාලය
- ශ්‍රී ලංකා නීතිඥ සංගමය

තිරසාරභාවය සහ පාරිසරික වේදිකා

- ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය
- ශ්‍රී ලංකා පෙව විවිධත්ව ආයතනය

දේශීය සැපයුම්කරුවන්ට සහය වීම

GRI 204-1

ලංකා බැංකුව, දේශීය සැපයුම්කරුවන් සවිබල ගැන්වීම, වගකීම් සහගත සහ තිරසාර ව්‍යාපාරික පිළිවෙතක ප්‍රධාන අංගයක් ලෙස සලකනු ලබයි. දේශීය මූලාශ්‍ර වෙත ප්‍රමුඛත්වය ලබා දීම මඟින් අපගේ මෙහෙයුම් කටයුතු ශක්තිමත් වීමට පමණක් නොව, ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට සහ එහි ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමට ද අපි සක්‍රීයව දායක වන්නෙමු.

මූලිකාංග:

- **දේශීය ව්‍යාපාර සවිබල ගැන්වීම:** ප්‍රසම්පාදන ක්‍රියාවලීන් හරහා දේශීය වෙළෙඳුන් මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සම්බන්ධ කර ගැනීම මඟින් ඔවුන්ගේ ව්‍යාපාරික වර්ධනයට සහ නව රැකියා අවස්ථා උත්පාදනය කිරීමට සහාය වීම.
- **තිරසාර සැපයුම් දාමයක් පවත්වා ගැනීම:** පාරිසරික මෙන්ම සමාජීය වශයෙන් වගකීම් සහගත පිළිවෙත් අනුගමනය කිරීම සඳහා අපගේ සැපයුම්කරුවන් නිරන්තරයෙන් දිරිමත් කිරීම.

- **ආර්ථික බලපෑම:** ව්‍යාපාරික වටිනාකම රට තුළම රඳවා ගැනීමට කටයුතු කිරීම, ප්‍රජා සංවර්ධනය පෝෂණය කිරීම සහ ආනයන මත යැපීම අවම කිරීම සඳහා දායක වීම.
- **හවුල්කාරිත්වය සහ වර්ධනය:** වගකීම් සහගත ආයතනික පුරවැසියෙකු ලෙස බැංකුවේ භූමිකාව තහවුරු කෙරෙන පරිදි, සැපයුම්කරුවන් සමඟ දිගුකාලීන සහ අනෙන්‍යන්‍ය වශයෙන් වාසිදායක සබඳතා ගොඩනැඟීම.

මෙම මූලපිරීම් ඔස්සේ, දේශීය සැපයුම්කරුවන් සමඟ ඇති කරගන්නා සෑම හවුල්කාරිත්වයක්ම සමස්ත ආර්ථිකයේ ස්ථාවරත්වයට සහ තිරසාරභාවයට දායක වන බව බැංකුව සහතික කරයි. මෙය අපගේ ජනතාව, ප්‍රජාවන් සහ සමස්ත ජාතිය කෙරෙහි අප සතු කැපවීම මනාව පිළිඹිබු කරන්නකි.



ප්‍රමුඛතා ක්ෂේත්‍ර 03

පාරිසරික භාරකාරත්වය, තුලිත කාබන් භාවිතය හා බලපෑම් කළමනාකරණය

බැංකුවේ කාබනික සහ සම්පත් පියසටහන අවම කිරීම

GRI 302-1| 305-4

බැංකු මෙහෙයුම්වලදී සම්පත් භාවිතය අවම කිරීම සඳහා ඩිජිටල් පරිවර්තනය, බලශක්ති විගණන සහ හරිත ගොඩනැගිලි පිළිවෙත් අඛණ්ඩව ක්‍රියාවට නංවනු ලබයි. එමඟින් ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීම සහ කඩදාසි භාවිතයෙන් තොර ක්‍රමවේද අනුගමනය කිරීම හරහා මෙහෙයුම් කාර්යසාධනය මෙන්ම බලශක්ති කාර්යක්ෂමතාව ද ඉහළ නංවා ඇත.

කාර්යක්ෂමතාව වැඩි දියුණු කළ හැකි සහ බලශක්ති පරිභෝජනය අවම කළ හැකි අවස්ථා හඳුනා ගැනීම සඳහා ලංකා බැංකු ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේදී විධිමත් බලශක්ති විගණනයක් පවත්වන ලදී. එහි නිර්දේශයන් මේ වන විට අදියර වශයෙන් ක්‍රියාත්මක කෙරෙන අතර, එමඟින් මෙහෙයුම් කාර්යසාධනය සහ පිරිවැය කළමනාකරණයෙහි සැලකිය යුතු වර්ධනයක් අපේක්ෂා කෙරේ.

මෙම වසර තුළ බැංකුවේ මුළු බලශක්ති පරිභෝජනය ටෙරා ජූල් 177.5 ක් වූ අතර, ඉන් ටෙරා ජූල් 81.0 ක් ඉන්ධන පරිභෝජනය වෙනුවෙන් වැය වී ඇත.

ප්‍රාදේශීය මට්ටමින් වගවීම තහවුරු කිරීම සඳහා, ශ්‍රී ලංකා තිරසාර බලශක්ති අධිකාරියේ බලශක්ති මිනුම් සලකුණු රෙගුලාසිවලට අනුකූලව, බැංකු ශාඛා ජාලය පුරා බලශක්ති කළමනාකරණ නිලධාරීන් පත් කරනු ලැබීය. වාර්ෂිකව වර්ග මීටරයකට, පැයට කිලෝවොට් 180 ක් ලෙස නියම කර ඇති බලශක්ති කාර්යක්ෂමතා මිනුම් සලකුණට අනුකූලව කටයුතු කිරීම සහ ඒ පිළිබඳ අධීක්ෂණය කිරීම මෙම නිලධාරීන්ගේ වගකීම වේ. මෙම අධීක්ෂණ ක්‍රියාවලිය, විදුලි පරිභෝජනයට පමණක් සීමා නොවී ජල සහ ඉන්ධන පරිභෝජනය ද ඇතුළත් වන පරිදි පුළුල් කර ඇති බැවින්, බැංකුවේ මෙහෙයුම් සම්පත් භාවිතය පිළිබඳ පරිපූර්ණ දැක්මක් ලබා ගැනීමට එමඟින් අවස්ථාව සැලසේ.

ඊට සමගාමීව, බැංකු ශාඛා ජාලය පුරා විසිරී ඇති පාරිසරික කාර්යසාධන දත්ත මධ්‍යගතව රැස්කිරීම සඳහා අභ්‍යන්තරව නිර්මාණය කරන ලද මූල්‍ය නොවන දත්ත කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම බැංකුව විසින් ආරම්භ කරන ලදී. මෙතෙක් පැවති දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය වෙනුවට වියුහගත පද්ධතියක් හරහා වාර්තාකරණය සිදු කිරීම මඟින් දත්තවල නිරවද්‍යතාව සහ සොයාගත හැකි බව වර්ධනය වේ. එමෙන්ම, මෙම පද්ධතිය මඟින් අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කරන අතර විගණන කටයුතු සඳහා වන සූදානම ද තවදුරටත් ඉහළ නංවයි.

මෙම ක්‍රියාමාර්ග සමස්තයක් ලෙස ගත් කල, කාබන් කළමනාකරණය සම්බන්ධයෙන් බැංකුව සතු ඒකාබද්ධ ප්‍රවේශය මනාව පිළිඹිබු කරයි. එමෙන්ම, බලශක්ති කාර්යසාධනය අධීක්ෂණය කිරීම බැංකුව පුරා මෙහෙයුම් තීරණ ගැනීමේ ක්‍රියාවලියේ අනිවාර්ය අංගයක් බවට පත් කිරීමට ද මෙය ඉවහල් වේ.

	2025	2024	වෙනස %
විදුලි පරිභෝජනය (පැයට කිලෝවොට්)	26,809	25,820	4
ඉන්ධන පරිභෝජනය (ඝණ මීටර)	959	233	312
පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් ජනනය වන විදුලිය %	21	18	

බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම් පුළුල් වීමත් සමඟ වසර තුළ ඉන්ධන පරිභෝජනය ද ඉහළ ගොස් තිබේ.

තිරසාර යටිතල පහසුකම් සහ බලශක්ති භාවිතය

බැංකුව විසින් සිදු කරනු ලබන සියලුම නව ඉදිකිරීම් ව්‍යාපෘති ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලයේ ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාත්මක කෙරේ. එමඟින් බලශක්ති කාර්යක්ෂම යටිතල පහසුකම් සහ පාරිසරික වශයෙන් වගකීම් සහගත නිර්මාණකරණය උදෙසා බැංකුව සතු දිගුකාලීන කැපවීම තවදුරටත් තහවුරු කරයි. මෙම කැපවීම ඇගයීමට ලක් කරමින්, වසර ගණනාවක් පුරා හරිත ගොඩනැගිලි කවුන්සිලය මඟින් පිරිනමනු ලබන හරිත ව්‍යාපාරික නායකත්ව සම්මානයෙන් බැංකුව අඛණ්ඩව පිදුම් ලබා ඇත.

මෙතෙක් හරිත ව්‍යාපාරික නායකත්ව සහතිකය යටතේ බැංකු ශාඛා 12 ක් පරිසර හිතකාමී ගොඩනැගිලි ලෙස නිල වශයෙන් නම් කර තිබේ.

හරිත බලශක්ති භාවිතය, වසර පුරා තවදුරටත් පුළුල් වූ අතර, මෙගාවොට් 4.3 ක මුළු ධාරිතාවයකින් යුත් සූර්ය බලශක්ති පද්ධති සහිත ශාඛා 101 ක් බැංකුවේ පුනර්ජනනීය බලශක්ති පදනම ශක්තිමත් කරයි. මෙලෙස ස්ථානීය මට්ටමින් සූර්ය බලශක්තිය උත්පාදනය කිරීම මඟින් ජාතික විදුලි බල පද්ධතිය මත යැපීම අවම වන අතර, එමඟින් මෙහෙයුම් විමෝචනය අඩු කිරීමටත්, ශාඛා ජාලය පුරා ඉහළ බලශක්ති සුරක්ෂිතතාවක් ඇති කිරීමටත් මහඟු සහයක් ලැබේ.

පුනර්ජනනීය බලශක්තිය සිය යටිතල පහසුකම් වලට ඒකාබද්ධ කිරීම මඟින් බැංකුව සිය පාරිසරික පියසටහන අවම කිරීමට පමණක් නොව, දිගුකාලීන පිරිවැය ස්ථාවරත්වය සහ කීර්තිනාමය ඉහළ නංවා ගැනීමට ද කටයුතු කරයි. සූර්ය බලශක්ති උත්පාදනය මඟින් අනාගත විදුලි මිල උච්චාවචනයන් නිසා ඇති විය හැකි අවදානම් අවම වන අතර, භූගෝලීය වශයෙන් විසිරී ඇති බැංකු ශාඛා පද්ධතිය පුරා මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමට ද එමඟින් මනා සහයක් ලැබේ.

හරිතාගාර වායු විමෝචනය


GRI 305 - 1, 2, 3, 4, 5, 6

බැංකුව, ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සිය හරිතාගාර වායු විමෝචනය කළමනාකරණය කරනු ලබයි. මෙහි මිනුම් සහ වාර්තාකරණ කටයුතු, අන්තර්ජාතික ප්‍රමිත අංක 14064-1 ප්‍රමිතියට අනුව සිදු කෙරෙන අතර, ඒ සඳහා 2021 වර්ෂය පාදක වර්ෂය ලෙස භාවිත කෙරේ. විමෝචන ගණනය කිරීම්වල නිරවද්‍යතාව සහ විනිවිදභාවය තහවුරු කිරීම සඳහා, දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලීය මාර්ගෝපදේශ සහ එහි හයවන තක්සේරු වාර්තාවේ "ගෝලීය උණුසුම් වීමේ විභවතා" අගයන් උපයෝගී කර ගනු ලබයි.

වසර තුළ, බැංකුව සිය විමෝචන සීමාවන් සහ දත්තවල අඛණ්ඩතාව තවදුරටත් ශක්තිමත් කළ අතර, ඒ යටතට අනුබද්ධිත ආයතන ද ඇතුළත් කිරීමට පියවර ගන්නා ලදී. එමෙන්ම 2026 වසරේ සිට මෙම වැඩපිළිවෙළ විදේශීය ශාඛා දක්වා ද ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇත.

ඊට සමගාමීව, මෙතෙක් පැවති දත්ත ඒකාබද්ධ කිරීමේ ක්‍රමවේදය වෙනුවට, අභ්‍යන්තරව සංවර්ධනය කරන ලද පද්ධති පාදක "මූල්‍ය නොවන වාර්තාකරණ ක්‍රමයකට" මාරු වීම හරහා ශාඛා ජාලය පුරා දත්තවල අනුකූලතාව, ප්‍රවේශය සහ විගණනය කිරීමේ හැකියාව ඉහළ නංවා ඇත. මෙම පාරිසරික කාර්යසාධන දත්ත අභ්‍යන්තර විගණන සමාලෝචනයට ද යටත් කෙරෙන අතර, එමඟින් තොරතුරු හෙළිදරව් කිරීමේ විශ්වසනීයත්වය තහවුරු වන අතරම බාහිර සහතික කිරීමේ අවශ්‍යතාවන් සඳහා වන සූදානම ද ශක්තිමත් වේ.

තිරසාර අනාගතයක් ගොඩනැඟීම



2025 දී බැංකුවේ විමෝචන පැතිකඩ පහත පරිදි වේ:

	2025	2024	වෙනස %
Scope 1 විමෝචනය tCO_2 e	**1,251.9**	1,120.7	**12**
Scope 2 විමෝචනය tCO_2 e	**11,187.7**	11,047.1	**1**
විමෝචන තීව්‍රතාවය - Scope 1 සහ Scope 2 (ආදායමෙන් මිලියනයකට)	**0.02**	0.02	-

2025 වර්ෂය සඳහා වාර්තා වූ වායු විමෝචනයන් අතර CO_2 මෙට්‍රික් ටොන් 1,063.01 ක්, CH_4 මෙට්‍රික් ටොන් 6.56 ක්, N_2O මෙට්‍රික් ටොන් 8.98 ක් සහ HFC මෙට්‍රික් ටොන් 173.32 ක් ඇතුළත් විය. බැංකුව, බලශක්ති කාර්යක්ෂමතා පියවර, පිරිසිදු තාක්ෂණයන් භාවිතය සහ නියාමන අනුකූලතාවන් තවදුරටත් ශක්තිමත් කිරීම හරහා විමෝචනය අවම කිරීමේ ප්‍රමුඛතා අඛණ්ඩව පවත්වා ගැනීමට කටයුතු කළේය.

එමෙන්ම, පාරිසරික වශයෙන් වඩාත් හිතකර ශීතකරණ භාවිතයට යොමු වීම, ඕසෝන් ස්ථරය ක්ෂය කරන ද්‍රව්‍ය භාවිතය සීමා කිරීම සහ සිසිලන පද්ධති මෙහෙයුම් මගින් සිදුවන විමෝචනය අවම කිරීම සඳහා වූ වැඩපිළිවෙළ ද බැංකුව විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

ද්‍රව්‍ය පරිභෝජනය

GRI 306-1, 3, 4

තොරතුරු තාක්ෂණ උපකරණ, වායු සමීකරණ පද්ධති සහ UPS ඒකක ඇතුළු සියලුම ද්‍රව්‍ය ප්‍රසම්පාදනයේදී තිරසාර මූලාශ්‍ර ප්‍රමිතීන් අනුගමනය කිරීමට බැංකුව පියවර ගෙන ඇත. එමගින් සෑම මිලදී ගැනීමක්ම, බැංකුව විසින් නිර්වචනය කරන ලද පාරිසරික කාර්යසාධන අවශ්‍යතාවන් හා අනුකූල වන බව තහවුරු කෙරේ. ප්‍රසම්පාදන තීරණ ගැනීමේදී බලශක්ති කාර්යක්ෂම නිෂ්පාදන වලට මෙන්ම ප්‍රතිචක්‍රීකරණය කළ හෝ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය වලට ප්‍රමුඛතාව ලබා දෙන අතර, ඒ හරහා සමස්ත ද්‍රව්‍ය භාවිතය අවම කරමින් චක්‍රීය ආර්ථික මූලධර්ම වලට සහාය වීම, බැංකුවේ අරමුණයි.

බැංකුවේ සම්පත් භාරකාරත්වය ප්‍රසම්පාදන ක්‍රියාවලියට පමණක් සීමා නොවී, විධිමත් ප්‍රතිචක්‍රීකරණ සහ අපද්‍රව්‍ය කළමනාකරණ හවුල්කාරිත්වයන් දක්වා ද විහිදේ. ඒ අනුව, ප්ලාස්ටික් අපද්‍රව්‍ය ක්‍රමානුකූලව ඵකතු කිරීම සහ වගකීම් සහගත ලෙස ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් සමාගම සමඟ ඇති කරගත් හවුල්කාරිත්වය වසර තුළ තවදුරටත් ශක්තිමත් කිරීමට බැංකුව කටයුතු කළේය.





මෙට්‍රික් ටොන් 14.4 ක
අපද්‍රව්‍ය කඩදාසි ප්‍රතිචක්‍රීකරණය

සම්පූර්ණයෙන්ම වැඩුණු ගස් 244 ක් ඉතිරි කිරීමට සමාන ය.

විදුලිය කිලෝ වොට් පැය 57,440 ක් ඉතිරි කිරීමට සමාන ය.

ජලය ලීටර් 456,361 ක් ඉතිරි කිරීමට සමාන ය.

ඝණ මීටර 43 ක ගොඩබිම් පිරවීම් අඩු කිරීමට සමාන ය.

බැංකු මෙහෙයුම් ක්‍රියාවලීන් තුළ පරිභෝජන රටාව තක්සේරු කිරීම සහ ඒවා අවම කළ හැකි අවස්ථා හඳුනා ගැනීම සඳහා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේදී ආහාර අපද්‍රව්‍ය විගණනයක් පවත්වන ලදී. එම විගණනයේ සොයාගැනීම්, බැංකුවේ අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත් වැඩිදියුණු කිරීමට සහ සම්පත් කාර්යක්ෂමතාව තහවුරු කිරීමට යොදා ගනිමින් පවතී.

2025 වසර වන විට, බැංකුවේ සම්මත ප්‍රසම්පාදන පිරිවිතරයන් සඳහා තිරසාර අවශ්‍යතා තවදුරටත් ඇතුළත් කළ අතර, එමගින් ප්‍රසම්පාදන කටයුතු සහ ශාඛා මෙහෙයුම් සඳහා පෙළඹ හායනයට ලක්විය හැකි විකල්පයන්ට ප්‍රමුඛතාව ලබා දීම සහතික කර ඇත. මීට අමතරව, ද්‍රව්‍ය භාවිතය නිරීක්ෂණය කිරීම සහ අපද්‍රව්‍ය වෙන් කිරීමේ විධිමත් ක්‍රමවේද බැංකු පද්ධතිය පුරා ඒකාබද්ධ කර ඇත. මෙමගින් සැපයුම්කරුවන්ගේ වගවීම ශක්තිමත් වී ඇති අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආශ්‍රිත අපද්‍රව්‍ය ප්‍රමාණාත්මකව අවම කිරීමට ද ඉහළ සහයක් ලැබේ.

මීට අමතරව, බැංකුවේ භෞතික යටිතල පහසුකම් සම්බන්ධ තීරණ ගැනීමේදී ද පාරිසරික අවදානම් පිළිබඳ දැඩි අවධානයක් යොමු කෙරේ. නව ශාඛා විවෘත කිරීමේදී සහ ශාඛා ස්ථාන මාරු කිරීමේදී මඟ පෙන්වීමක් ලබා ගැනීම සඳහා ආරක්ෂිත ප්‍රදේශ සහ පෙළඹ විවිධත්ව පරීක්ෂණ ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත. එමගින් බැංකු මෙහෙයුම් කටයුතුවලින් පාරිසරික වශයෙන් සංවේදී හෝ රක්ෂිත කලාප වලට අහිතකර ලෙස බල නොපාන බව සහතික කෙරේ.

ඩිජිටල්කරණය කරා යන බැංකුවේ ගමන්මඟ, ගනුදෙනුකාර සේවාවන්හි ස්වරූපය නවීකරණය කර ඇති අතර, බැංකුවේ පාරිසරික පියසටහන අවම කිරීමට ද දායක වී ඇත. කඩදාසි රහිත ගනුදෙනු ක්‍රමවේදයන් භාවිතා කිරීම හරහා බැංකුව විසින් විද්‍යුත් බැංකු ප්‍රකාශන, බාධාවකින් තොර අරමුදල් මාරු කිරීම් සහ පූර්ණ ඒකාබද්ධ මාර්ගගත බැංකුකරණ විසඳුම් සක්‍රීය කර තිබේ. මෙමගින් සංකීර්ණ ලිපි ලේඛන භාවිතය සහ පුද්ගලයන් සිදු කෙරෙන ක්‍රියාවලීන් අවම කිරීමට හැකි වී ඇත.

මෙම පරිවර්තනය හුදෙක් සේවා පහසුවකට පමණක් සීමා නොවී, මෙහෙයුම් කාර්යක්ෂමතාවයේ උපායමාර්ගික සන්ධිස්ථානයක් ද සනිටුහන් කරයි. සාම්ප්‍රදායික ලේඛන කටයුතු වෙනුවට ඩිජිටල් ක්‍රියාවලීන් ආදේශ වීමත් සමඟ, බැංකු කාර්ය මණ්ඩලයට වඩාත් ඉහළ වටිනාකමකින් යුතු සේවාවන් කෙරෙහි අවධානය යොමු කිරීමට අවස්ථාව ලැබී ඇත. මේ හරහා ගනුදෙනුකරුවන්ට වේගවත් මෙන්ම විශ්වාසදායක බැංකු අත්දැකීමක් හිමි වන අතර, බැංකුවේ භෞතික සම්පත් මත යැපීම ද සැලකිය යුතු ලෙස අඩු වේ.

කඩදාසි රහිත බැංකු පරිසරයක් කරා යොමු වීම, තිරසාරභාවය උදෙසා බැංකුව සතු කැපවීම මනාව පිළිඹිබු කරන්නකි. කඩදාසි භාවිතය අවම කිරීම මගින් පිරිවැය ප්‍රශස්තකරණයට අමතරව, පාරිසරික බලපෑම අවම කිරීම සඳහා ද බැංකුව සක්‍රීයව දායක වන අතර, එය වගකීම් සහගත බැංකුකරණය පිළිබඳ ගෝලීය ප්‍රමිතීන් සමඟ මනාව සමපාත වේ.

තවද, "නෙජ්ච්‍රූන් පේපර්ස්" ආයතනය සමඟ ඇති කරගත් හවුල්කාරිත්වය හරහා කඩදාසි ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක වේ. එමගින් අපද්‍රව්‍ය බැහැර කිරීමේ විධිමත් ක්‍රමවේද අනුගමනය කරමින් චක්‍රීය ද්‍රව්‍ය ප්‍රවාහය ශක්තිමත් කිරීමට බැංකුව පියවර ගෙන ඇත. පෙර වසරට සාපේක්ෂව අපද්‍රව්‍ය ප්‍රමාණය 60% කින් අඩු කරමින් කඩදාසි ප්‍රතිචක්‍රීකරණය කිරීමට ලැබීම, ස්වභාවධර්මය සුරැකීම උදෙසා බැංකුව දක්වන කැපවීමේ ප්‍රත්‍යක්ෂ සාක්ෂියකි.

මෙම ඩිජිටල් පරිණාමය හරහා, නවෝත්පාදනය, කාර්යක්ෂමතාව සහ තිරසාරභාවය අතෙහ්‍යන්‍ය වශයෙන් සමපාත කළ හැකි බව බැංකුව අඛණ්ඩව සනාථ කර ඇත. එමගින් නූතන ලෝකය තුළ සාර්ථකත්වය කරා ගමන් කිරීමට බැංකුවට මෙන්ම එහි ගනුදෙනුකාර ප්‍රජාවට ද නව ශක්තියක් ලබා දෙයි.

රැස්වීම් සහ විවිධ උත්සව සංවිධානය කිරීමේ සිට මෙහෙයුම් කටයුතුවල සෑම අංශයකටම තිරසාර පිළිවෙත් ඇතුළත් කිරීමට ලංකා බැංකුව කැපවී සිටී. විශේෂයෙන්ම, එක්වරක් පමණක් භාවිතා කළ හැකි ප්ලාස්ටික් භාවිතය සවිඥානිකව සීමා කිරීම සහ බෝතල් කළ ජලය භාවිතය අවම කිරීම හරහා බැංකුව සිය පාරිසරික බලපෑම ක්‍රියාකාරීව අඩු කරන අතරම, සේවකයින්, ගනුදෙනුකරුවන් සහ හවුල්කරුවන් අතර වගකීම් සහගත සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට ද කටයුතු කරයි.

මෙම සවිඥානික ක්‍රියාමාර්ග ඔස්සේ, තිරසාරභාවය යනු හුදෙක් ප්‍රතිපත්තියක් පමණක් නොව, එය එදිනෙදා මෙහෙයුම් සහ පොදු අත්දැකීම් සමඟ ඒකාබද්ධ වූ 'මානසිකත්වයක්' බව බැංකුව මනාව පෙන්නුම් කරයි. ඒ හරහා සමස්ත බැංකු ක්ෂේත්‍රය තුළම පරිසර හිතකාමී පිළිවෙත් සම්බන්ධයෙන් නව ප්‍රමිතියක් ස්ථාපිත කිරීමට ද බැංකුව සමත් වී ඇත.

තිරසාර මූල්‍යකරණය

බැංකුවෙහි ණය කළඹ, පුනර්ජනනීය බලශක්තිය, බලශක්ති කාර්යක්ෂම යටිතල පහසුකම් සහ සමාජීය වශයෙන් වගකිම් සහගත ව්‍යවසායන් ඇතුළු පාරිසරික හෝ සමාජීය ප්‍රතිලාභ ලබා දෙන ව්‍යාපෘති සඳහා වැඩි ප්‍රමුඛත්වයක් දෙයි. තිරසාරභාවය හා සම්බන්ධ ණය, ESG අරමුණු සමඟ සමපාත වන ප්‍රධාන කාර්යසාධන දර්ශක ඇතුළත් කරයි. එමඟින් ගනුදෙනුකරුවන්, හරිත හා වඩාත් සමාජීය වශයෙන් වගකිම් සහගත ව්‍යාපාරික භාවිතයන් අනුගමනය කිරීමට පෙළඹේ.

බැංකුව තිරසාර තැන්පතු යෝජනා ක්‍රම ද පිරිනමන අතර එමඟින් ගනුදෙනුකරුවන්ට තම ඉතුරුම්, පාරිසරික හා සමාජීය ධනාත්මක බලපෑම් සහිත ව්‍යාපෘති වෙත යොමු කිරීමට ඉඩ සලසයි. මෙම නිෂ්පාදන, වගකිම් සහගත ආයෝජන පුරුදු ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රජාවන් සහ පරිසර පද්ධති සඳහා මැනිය හැකි ප්‍රතිලාභ ජනනය කිරීම සඳහා නිර්මාණය කර ඇත.

බැංකුවේ ආයෝජන උපායමාර්ගයට, හරිත බැඳුම්කර, දේශගුණයට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සහ සමාජීය වශයෙන් වගකිම් සහගත අරමුදල් කෙරෙහි අවධානය යොමු කරමින් ESG මූලධර්ම ඒකාබද්ධ කරයි. බැංකුව තිරසාර හා ඇතුළත් ආර්ථික පරිවර්තනයකට සහාය වෙමින්, මැනිය හැකි පාරිසරික හා සමාජීය බලපෑම සමඟ මූල්‍ය ප්‍රතිලාභ සමතුලිත කිරීමට ආයෝජන කළඹ මැනවින් කළමනාකරණය කරයි.

මෙම මූලපිරීම් හරහා, බැංකුව තිරසාර මූල්‍යකරණයේ සිය නායකත්වය තවදුරටත් ශක්තිමත් කරමින්, එහි මෙහෙයුම් සහ ගනුදෙනුකාර දීමනා වල සෑම අංශයකටම පාරිසරික හා සමාජීය සලකා බැලීම් ඇතුළත් කරයි.

තිරසාරභාවය පිළිබඳ සලකා බැලීම් බැංකුවේ මූල්‍යකරණ සහ මෙහෙයුම් තීරණවලට ඇතුළත් කර ඇති අතර, අඩු බලපෑමක් සහිත සහ වඩාත් ඔරොත්තු දෙන ආර්ථිකයකට සහාය වීම සඳහා එහි කාර්යභාරය ශක්තිමත් කරයි. සියලුම ණය දීම් පාරිසරික හා සමාජ කළමනාකරණ පද්ධතිය (ESMS) යටතේ නිර්වචනය කරන ලද පාරිසරික හා සමාජීය නිර්ණායකයන්ට අනුව තක්සේරු කරනු ලබන අතර, මූල්‍යකරණ ක්‍රියාකාරකම් වගකිම් සහගත ණය දීමේ මූලධර්ම සමඟ පෙළගැසී ඇති බව සහතික කරයි.

2025 වසර තුළ, හරිත සහ තිරසාරභාවය හා සම්බන්ධ මූල්‍ය කටයුතු සඳහා මූලධර්ම, සුදුසුකම් නිර්ණායක සහ යහපාලන යාන්ත්‍රණයන් ස්ථාපිත කරන අභ්‍යන්තර තිරසාර මූල්‍ය රාමුවක් සංවර්ධනය කිරීම තුළින් බැංකුව එහි තිරසාර මූල්‍ය ආකෘතිය ශක්තිමත් කළේය. තිරසාර මූල්‍ය හෙළිදරව් කිරීම්වල විනිවිදභාවය සහ විශ්වසනීයත්වය ශක්තිමත් කරමින්, මූල්‍ය රාමුව සඳහා ස්වාධීන විගණන සහතිකයක් ද ලබා ගන්නා ලදී.

2025 වසරේ සුවිශේෂී තිරසාර සංධිස්ථාන

ශ්‍රී ලංකාවේ විශාලතම තිරසාර බැඳුම්කර නිකුතුව



- **පුරෝගාමී පියවර -** මෙරට මූල්‍ය ආයතනයක් විසින් සිදු කරන ලද විශාලතම තිරසාර බැඳුම්කර නිකුතුවයි.
- **අනාගතය සඳහා ආයෝජනය -** මෙලෙස රැස් කරන අරමුදල් වලින් 75% ක් සමාජීය ව්‍යාපෘති සඳහාත්, ඉතිරිය සුදුසුකම් ලත් හරිත ව්‍යාපෘති සඳහාත් වෙන් කර ඇත.
- **ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම -** ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපල සංගමයේ හරිත හා සමාජ බැඳුම්කර මූලධර්ම සහ තිරසාර බැඳුම්කර මාර්ගෝපදේශයන්ට අනුකූලව සකස් කර ඇත.
- **දේශීය පෙළගැස්ම -** ශ්‍රී ලංකා මහ බැංකුවේ හරිත මූල්‍ය වර්ගීකරණ ප්‍රමිතීන් සපුරාලීම.
- **වගකීම් සහගත මූල්‍යකරණය -** ලංකා බැංකුවේ ආයෝජන කළඹ තුළට පරිසරය, සමාජය සහ යහපාලනය පිළිබඳ නිර්ණායක ඇතුළත් කිරීම තවදුරටත් ශක්තිමත් කරයි.
- **ධනාත්මක වෙනසක් උදෙසා -** ප්‍රජාවන්ට සහ පරිසරයට සෘජු ප්‍රතිලාභ ලබා දෙන තිරසාර ව්‍යාපෘති බලගැන්වීමට සහාය වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රථම පෙව භායනයට ලක්විය හැකි හර කාඩ්පත



- **86 වන සංවත්සරයේ සුවිශේෂී නවෝත්පාදනය -** පාරිසරික වගකීම එක් කරමින්, නවීන බැංකුකරණයේ ස්වරූපය ප්‍රතිඅර්ථ දක්වයි.
- **පරිසර හිතකාමී අමුද්‍රව්‍ය -** සාම්ප්‍රදායික PVC වෙනුවට, ආහාරයට ගත නොහැකි ඉරිඟු පදනම් කරගත් පුනර්ජනනීය PLA ද්‍රව්‍ය භාවිතයෙන් මෙය නිෂ්පාදනය කර ඇත.
- **දිරාපත් කළ හැකි ජීවන චක්‍රය -** මෙම කාඩ්පත් කාර්මික මට්ටමින් කොම්පෝස්ට් කළ හැකි බැවින්, පරිසරයට එක්වන දිගුකාලීන ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කරයි.
- **ප්‍රායෝගික තිරසාරභාවය -** වගකීම් සහගත බැංකු පිළිවෙත්, සියලු මෙහෙයුම් සඳහා ඇතුළත් කිරීමේ ලංකා බැංකු පුළුල් උපායමාර්ගික න්‍යාය පත්‍රයේ තීරණාත්මක පියවරකි.
- **ධනාත්මක වෙනසක බලගැන්වීම -** ගනුදෙනුකරුවන්ගේ එදිනෙදා බැංකු ගනුදෙනු, වඩාත් හරිත සහ පරිසරය පිළිබඳ සවිඥානික අත්දැකීමක් බවට පත් කර ඇත.
- **ප්ලාස්ටික් අවම කිරීමේ අරමුණ -** පොසිල ඉන්ධන පදනම් කරගත් ප්ලාස්ටික් මත යැපීම අවම කරමින්, වගකීම් සහගත අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා බැංකුව සිය දායකත්වය ලබා දෙයි.

තිරසාර අනාගතයක් ගොඩනැඟීම

සිය ණය පහසුකම් සහ ආයෝජන කළඹ ආශ්‍රිත මූල්‍ය විමෝචනයන් මැනීම ආරම්භ කිරීම සඳහා බැංකුව කාබන් ගිණුම්කරණ මූල්‍ය හවුල්කාරිත්වය (PCAF) සමඟ ලියාපදිංචි විය. මෙය බැංකුවේ මෙහෙයුම් විමෝචනය කළමනාකරණය කිරීමේ සිට සමස්ත ආයෝජන මට්ටමින් දේශගුණික බලපෑම තක්සේරු කිරීම දක්වා වූ තීරණාත්මක සංක්‍රාන්තියක් සනිටුහන් කරයි. එමෙන්ම, SLFRS S2 ප්‍රමිතීන්ට අනුකූලව දේශගුණික අවදානම් තක්සේරු කිරීම සහ ඒ පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීම ශක්තිමත් කිරීමේ වැදගත් පියවරක් ලෙස ද මෙය හැඳින්විය හැකිය.

මූල්‍යකරණ කටයුතුවලට අමතරව, රටවල් 30 ක නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු “දේශගුණික ක්‍රියාකාරකම් සහ ආපදා සූදානම පිළිබඳ සමුළුව”ට සහභාගී වීමෙන් බැංකුව ජාතික හා කලාපීය දේශගුණික සංවාදයට සක්‍රීයව දායක විය. මෙම මැදිහත්වීම හරහා දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව, මූල්‍ය ස්ථාවරත්වය සහ පුළුල් සංවර්ධන ප්‍රමුඛතාවක් ලෙස බැංකුව විසින් පිළිගනු ලබන බව මනාව පැහැදිලි වේ.

සමස්තයක් ලෙස ගත් කළ, මෙම සියලු මුලපිරීම් මගින් වඩාත් විධිමත් දේශගුණික පෙළගැස්මක් කරා බැංකුව ගමන් කරන ආකාරය මනාව පැහැදිලි වේ. එමෙන්ම, ප්‍රාග්ධනය වෙන් කිරීමේදී පාරිසරික සාධක ඒකාබද්ධ කිරීමටත්, අවදානම් තක්සේරුව සහ දිගුකාලීන උපායමාර්ගික ස්ථානගත කිරීම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමටත් බැංකුව තුළ සිදුවෙමින් පවතින සුවිශේෂී ප්‍රවේශය මෙයින් මනාව පිළිඹිබු වේ.

පාරිසරික සංරක්ෂණය

බැංකුවේ මෙහෙයුම් සීමාවන්ගෙන් ඔබ්බට යමින්, සැලසුම් සහගත ප්‍රජා සහභාගීත්වය සහ පෙව් විවිධත්වය කේන්ද්‍ර කරගත් වැඩසටහන් හරහා පාරිසරික සංරක්ෂණය උදෙසා බැංකුව සක්‍රීයව දායක වේ. වසර තුළ ක්‍රියාත්මක කරන ලද විවිධ සහයෝගීතා ව්‍යාපෘති මගින් පාරිසරික දැනුවත්භාවය ඉහළ නැංවීම, පරිසර පද්ධති ආරක්ෂා කිරීම සහ වගකීම් සහගත යටිතල පහසුකම් සංවර්ධන පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම ශක්තිමත් කරන ලදී.

ප්‍රජා පාදක මුලපිරීම් වලට අමතරව, බැංකුවේ යටිතල පහසුකම් සැලසුම් කිරීමේ ක්‍රියාවලියට පෙව් විවිධත්වය පිළිබඳ නිර්ණායක ඇතුළත් කරමින් ආරක්ෂිත ප්‍රදේශ පිරික්සුම් ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන ලදී. මෙය සරල, ස්වේච්ඡා පාරිසරික ක්‍රියාකාරකම්වලින් ඔබ්බට ගොස්, බැංකු මෙහෙයුම් තීරණ ගැනීමේදී විධිමත් පෙව් විවිධත්ව අවදානම් කළමනාකරණය දෙසට යොමු වූ වැදගත් පියවරකි.

මෙම සියලු ප්‍රයත්නයන් හරහා, මෙහෙයුම් විනය, පාරිසරික භාරකාරත්වය සමඟ ඒකාබද්ධ කරන සමබර ප්‍රවේශයක් බැංකුව විසින් පෙන්නුම් කරනු ලබයි. එමගින් දිගුකාලීන පාරිසරික තිරසාරභාවය උදෙසා බැංකුව සතු නොසැලෙන කැපවීම තවදුරටත් තහවුරු වේ.

ඉදිරි උපායමාර්ගික දිශාව

ලංකා බැංකුව සෑම පියවරක්ම ඉතා සවිඥානිකව ගනු ලබන්නේ බැංකුවේ වර්ධනය, නවෝත්පාදනය සහ තිරසාරභාවය යන ප්‍රධාන අංග එකිනෙක හා සමපාත වන අයුරිනි. මෙම උපායමාර්ගික පරිවර්තනය හුදෙක් ප්‍රගතියක් පමණක් නොව, එය ඒකාබද්ධ ක්‍රියාමාර්ග, මැනිය හැකි බලපෑමක් සහ අනාගතයට සූදානම් වූ දැක්මක් වෙනුවෙන් අප සතු කැපවීම මනාව පිළිඹිබු කරයි. සියලුම පාර්ශ්වකරුවන් වෙනුවෙන් වටිනාකම් උත්පාදනය කරමින් සහ ශක්තිමත් මෙන්ම තිරසාර හෙට දවසක් හැඩගස්වමින් නව අවස්ථා කරා ගමන් කරමින් සිටියි.

කෙටිකාලීන

- **ESG ප්‍රතිපත්තිය සහ පෙරදැක්ම එළිදැක්වීම: බැංකුවේ 2026–2030 ආයතනික උපායමාර්ගික සැලසුමට අනුකූලව, පරිසරය, සමාජය සහ යහපාලනය පිළිබඳ ප්‍රතිපත්තිය සහ පෙරදැක්ම ක්‍රියාත්මක කිරීම. මෙහිදී සියලුම අංශ හරහා ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) හඳුන්වා දීම සහ මෙහෙයුම් මට්ටමින් වගවීම ශක්තිමත් කිරීම සිදු කෙරේ.**
- **දේශගුණික අවදානම් කළමනාකරණය: SLFRS S1 සහ SLFRS S2 ප්‍රමිතීන්ට අනුකූලව, ණය තක්සේරුව, කළඹ අධීක්ෂණය සහ ව්‍යවසාය අවදානම් කළමනාකරණය (ERM) යන ක්‍රියාවලීන් තුළට දේශගුණික අවදානම් පිළිබඳ නිර්ණායක ක්‍රමානුකූලව ඒකාබද්ධ කිරීම.**
- **තිරසාර මූල්‍ය නිෂ්පාදන ප්‍රවර්ධනය: තිරසාර මූල්‍ය රාමුව යටතේ නිසි ප්‍රාග්ධන විභජනයක් මගින් සහාය දක්වන, “හරිත” සහ "තිරසාරභාවය" හා බැඳුණු මූල්‍ය නිෂ්පාදන අඛණ්ඩව සංවර්ධනය කිරීම.**
- **මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සූර්ය බලශක්තිය: ශාඛා ජාලය පුරා සූර්ය බලශක්ති පද්ධති ස්ථාපිත කිරීම, බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ සම්පත් ප්‍රශස්තකරණය හරහා මෙහෙයුම් විමෝචනය අවම කර බලශක්ති ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම.**
- **වගකීම් සහගත ප්‍රසම්පාදනය සහ සංරක්ෂණය: සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී ESG නිර්ණායක පිරික්සීම ක්‍රියාත්මක කිරීම සහ නව ශාඛා සංවර්ධනය කිරීමේදී පෙව් විවිධත්ව පිරික්සුම් ක්‍රමවේද අඛණ්ඩව බලාත්මක කිරීම.**

මධ්‍යකාලීන සහ දිගුකාලීන

- **මූල්‍ය විමෝචනය මැනීම සහ දේශගුණික විනිවිදභාවය: ණය ලබා දීමේ සහ ආයෝජන කළඹ හරහා සිදුවන මූල්‍ය විමෝචනයන් නිවැරදිව ගණනය කිරීම සඳහා කාබන් ගිණුම්කරණ මූල්‍ය හවුල්කාරිත්වය (PCAF) ප්‍රමිතීන්ට අනුකූල ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම. එමගින් බැංකුවේ දේශගුණික බලපෑම පිළිබඳ විනිවිදභාවය තවදුරටත් ඉහළ නැංවීමට ශක්තිමත් පදනමක් සැකසේ.**
- **මූල්‍ය නොවන දත්ත කළමනාකරණය: තිරසාරභාවය පිළිබඳ හෙළිදරව් කිරීම්වල නිරවද්‍යතාව, සංසන්දනාත්මක බව සහ විගණන කටයුතු සඳහා ඇති සූදානම වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය නොවන දත්ත කළමනාකරණ පද්ධතියක් පූර්ණ වශයෙන් වශයෙන් ස්ථාපිත කිරීම.**



යහපාලනය සහ අවදානම

ඒකාග්‍රතාවය සහ වගවීම ආරක්ෂා කිරීම

ස්ථාවරවූත්, විවෘතවූත් පාලනයක් සහ නීතිමය සදාචාර පිලිවෙත් සමඟ, අපි සංකීර්ණ මෙහෙයුම් කටයුතු ක්‍රමානුකූලව ක්‍රියාවට නංවන්නේ සෑම පියවරක් තුලින්ම පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය තවදුරටත් ශක්තිමත්ව තහවුරු කරමින් ය. අපගේ ක්‍රියාකාරී පරිසරයේ බිලියන ගණනක වෙනස් වන සංයෝජන අතර, ඒකාග්‍රතාවය සහ අරමුණ සෑම තීරණයක් සඳහාම මඟ පෙන්වන්නේ මූලික තර්කනයන් මත පැහැදිලිවම ගොඩනැඟෙන රූබික් ඝනකයක විසඳුම් මෙන් ය.

රූබික් ඝනකයක් එහි විසඳුම හෙළි කරන්නේ සෑම මුහුණතක්ම සැලසුම් සහගතව හා හික්මීමකින් යුතුව පෙළගැස්වූ විට පමණි. යහපාලනයද ඊට වෙනස් නොවේ.

ලංකා බැංකුවේ ආයතනික යහපාලනය



ආයතනික යහපාලනය පිළිබඳ සභාපතිතුමාගේ පණිවිඩය

GRI 2-22

බැංකුවේ ශක්තිමත් ආයතනික යහපාලන ක්‍රියාමාර්ග, දැඩි මෙහෙයුම් අභියෝගයන් මධ්‍යයේ ද ආර්ථික සංවර්ධනය හා මූල්‍ය පද්ධති ස්ථාවරත්වයට සහාය වන ස්ථායීකරණ ආධාරකයක් ලෙස අඛණ්ඩව ක්‍රියා කළේය. තීරණ ගැනීමේ සහ අධීක්ෂණ ක්‍රියාවලියේ මූලික අංගයක් ලෙස ස්ථාපිත කර ඇති බැංකුවේ යහපාලන රාමුව, ඵලදායී නායකත්වය, පැහැදිලි වගවීම සහ විනිවිදභාවයෙන් යුතු වාර්තාකරණය සක්‍රීය කරන අතර, අඛණ්ඩතාව සහ ප්‍රතිරෝධීභාවය වර්ධනය කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය

අභ්‍යන්තර අවශ්‍යතා සහ බාහිර මෙහෙයුම් පරිසරයේ වෙනස්වීම් සැලකිල්ලට ගනිමින්, වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය මූලික ක්ෂේත්‍ර කිහිපයකට විශේෂ අවධානය යොමු කළේය. බැංකුවේ අරමුණු සහ අවදානම් භාරගැනීමේ හැකියාව සමඟ අනුකූල වන මධ්‍යකාලීන දිශානතියක් සපයමින්, වසර පහක උපායමාර්ගික සැලැස්ම අනුමත කිරීම මඟින් උපායමාර්ගික අධීක්ෂණය ප්‍රධාන අවධානයක් විය.

නිරන්තරයෙන් වෙනස් වන පරිසරයක අනාගතයට සූදානම් ආයතනික ව්‍යුහයක් ගොඩනැඟීම සඳහා ආයතනික ව්‍යුහය යාවත්කාලීන කිරීම පිළිබඳව ද අධ්‍යක්ෂ මණ්ඩලය අවධානය යොමු කළේය. ඩිජිටල්කරණය සහ සයිබර් ආරක්ෂාව මූලික ප්‍රමුඛතා ලෙස පවතින අතර, මෙහෙයුම් කාර්යක්ෂමතාව, වැඩිදියුණු කළ සේවා සැපයීම සහ සියලු උපායමාර්ගික අංශයන් හරහා ආයතනික ප්‍රතිරෝධීභාවය ශක්තිමත් කිරීම සඳහා ඩිජිටල් හැකියාවන් තීරණාත්මක සක්‍රීයකාරකයක් ලෙස හඳුනා ගන්නා ලදී.

ප්‍රතිලාභ වැඩිදියුණු කිරීමේදී, දෘශ්‍ය පොදු හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය (ROTCE) ශක්තිමත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ විදගත් අවධානයක් විය. අවදානම් කළමනාකරණයේදී, විශේෂයෙන් දිට්වා සුළි කුණාටුවෙහි බලපෑම් ඇතුළු බාහිර බලපෑම් කළමනාකරණය කිරීම වැඩි අවධානයක් ලබා දුන්නේය. ඒ සමඟම ව්‍යාපාර අඛණ්ඩතාව, සේවක ආරක්ෂාව සහ යටිතල පහසුකම් පිළිබඳවද අවධානය යොමු කරන ලදී.

අරමුණු මත පදනම් වූ ආයතනයක් ලෙස, මූල්‍ය ඇතුළත්කරණය මූලික ප්‍රමුඛතාවයක් ලෙස පවතින අතර, සේවක කුසලතා සංවර්ධනය සහ හැකියාවන් ගොඩනැඟීම පිළිබඳව ද අඛණ්ඩ අවධානය යොමු කරන ලදී. ඒ සමඟම, තිරසාරභාවය සහ ESG සලකා බැලීම් මූලික තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඒකාබද්ධ කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරියට ගෙන ගියේය. ඒවා ස්වාධීන වැඩසටහන් ලෙස නොව, දිගුකාලීන වටිනාකම් නිර්මාණයේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස ස්ථාපිත කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය යාවත්කාලීන කිරීම

වසර තුළ නව අධ්‍යක්ෂවරුන් හය දෙනෙකු පත් කිරීමත් සමඟ, බැංකු හා මූල්‍ය, ගිණුම්කරණය, ආයතනික යහපාලනය, විද්‍යාව හා ඉංජිනේරු, සහ තිරසාර සංවර්ධනය යන ක්ෂේත්‍රවල විවිධ හා අනුපූරක අත්දැකීම් අධ්‍යක්ෂ මණ්ඩලයට එක්විය. මෙම කුසලතා සංයෝජනය මඟින්, ඵලදායී අධීක්ෂණය සහ උපායමාර්ගික මඟපෙන්වීමට අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති හැකියාව තවදුරටත් ශක්තිමත් විය.

බැංකුව ඉදිරියට ගෙන යාමේදී, සෙසු අධ්‍යක්ෂවරුන් සමඟ සමීපව කටයුතු කිරීමටත්, ඔවුන් ගෙන එන විවිධ අදහස් සහ යෝජනා වලින් ප්‍රයෝජන ගැනීමටත් මම බලාපොරොත්තු වෙමි.

එසේම, වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වූ ජයමින් පැල්පොල මහතාට, ඔහු විසින් ලබාදුන් වටිනා දායකත්වය වෙනුවෙන් මාගේ අවංක කෘතඥතාව පළ කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

ආචාරධර්ම සහ ඒකාග්‍රතාව

බැංකුවේ දිගුකාලීන ආයතනික වටිනාකම් සහ සංස්කෘතිය තවදුරටත් ශක්තිමත් කරමින්, අධ්‍යක්ෂ මණ්ඩලය ඉහළ මට්ටමේ ආදර්ශවත් නායකත්වයක් අඛණ්ඩව පවත්වාගෙන ගියේය. බැංකුවේ හැසිරීම් හා ආචාරධර්ම සංග්‍රහය, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සහ සියලු සේවකයන්ට අදාළ වන අතර, අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වකරුවන් සමඟ කටයුතු කිරීමේදී අපේක්ෂිත පුද්ගලික හැසිරීම් සහ වෘත්තීය ප්‍රමිතීන් පිළිබඳවද පැහැදිලිව දක්වා ඇත.

වසර තුළ, ඒකාග්‍රතාව සහ ආචාරධර්මීය හැසිරීම් සම්බන්ධ රාමුව තවදුරටත් ශක්තිමත් කරන ලදී. ඒ අතර, ප්‍රධාන අඛණ්ඩතා නිලධාරියෙකු පත් කිරීම සහ අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම ඇතුළත් විය.

අනුකූලතා ප්‍රකාශය

මෙම වාර්තාවේ 405-454 පිටුවල අඩංගු අනුකූලතා ඇමුණුම්, බැංකුවේ යහපාලන ප්‍රවේශය සහ අදාළ නියාමන හා ස්වේච්ඡා අවශ්‍යතා සමඟ අඛණ්ඩ අනුකූලතාවය පිළිබඳව විස්තර කරයි. 2025 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සිය වගකීම් සහ යුතුකම් සතුටුදායක ලෙස ඉටු කළ බවත්, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ අවශ්‍යතා සමඟ අනුකූල වූ බවත් මම මෙයින් තහවුරු කරමි. සමාලෝචන වර්ෂය තුළ නීති හෝ රෙගුලාසිවල කිසිදු ප්‍රමාණාත්මක උල්ලංඝනයක් සිදු නොවූ අතර, කිසිදු ප්‍රමාණාත්මක දඩ හෝ දණ්ඩනයක් බැංකුව මත පනවා නොතිබුණි.

කාවින්ද ද සොයිසා
සභාපති

2026 පෙබරවාරි 24
කොළඹ දී ය.

අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

නව අධ්‍යක්ෂවරුන් හය දෙනෙකු එක්වීමත් සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය ශක්තිමත් වූ අතර කුසලතා වර්ධනයට, පුළුල් ඉදිරි දැක්මකට සහ විවිධත්වයක් ඇති කිරීමට එය හේතු විය.



11
අධ්‍යක්ෂවරු

උපකමිටු

බලපත්‍රලාභී බැංකු සඳහා නව ආයතනික යහපාලන නීති වලට අනුකූල වීම සහතික කිරීම සඳහා උපකමිටු ප්‍රතිසංවිධානය කිරීම සහ උපකමිටුවලට තීරණ ගැනීම සඳහා වෙන් කර ඇති කරුණු සංශෝධනය කිරීම.



අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය

- උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම
- අවදානම් කළමනාකරණය
- ඩිජිටල්කරණය සහ සයිබර් ආරක්ෂාව
- තිරසාරභාවය සහ ESG

ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම

ප්‍රතිපත්ති රාමුව සමාලෝචනය සහ සංශෝධනය.

ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි සංශෝධනය කර සකස් කර ඇත.

වසර තුළ ආයතනික යහපාලන ප්‍රතිපත්තිය සහ තිරසාරභාවය පිළිබඳ ප්‍රතිපත්තිය වැඩි දියුණු කරන ලදී.

නව ප්‍රතිපත්ති

- අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු පිළිබඳ ප්‍රතිපත්තිය
- බැංකුවේ වත්කම් සහ කොටස් හිමියන්ගේ ආයෝජන පාලනය සහ කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්තිය
- ප්‍රතිලාභ ආපසු අය කර ගැනීමේ ප්‍රතිපත්තිය
- මූල්‍ය ගනුදෙනුකාර ආරක්ෂණ ප්‍රතිපත්තිය
- ප්‍රවේශ්‍යතාව සහ විෂමකරණය නොකිරීම සඳහා වන ප්‍රතිපත්තිය
- ගනුදෙනු අධීක්ෂණ ප්‍රතිපත්තිය

ආයතනික යහපාලනය පිළිබඳ නව මාර්ගෝපදේශ වලට අනුකූල වීම

වගකීම් සහගත බැංකුකරණ පිළිවෙත් අධීක්ෂණය වැඩි දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ආයතනික යහපාලන පිළිවෙත් ශක්තිමත් කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2024 සැප්තැම්බර් මාසයේදී බලපත්‍රලාභී බැංකු සඳහා ආයතනික යහපාලනය පිළිබඳ 2024 අංක 5 දරණ බැංකු පනතේ විධානය නිකුත් කරන ලදී. නව මාර්ගෝපදේශ 2025 ජනවාරි 01 වන දින සිට බලාත්මක වූ අතර, එම අවශ්‍යතා වලට බැංකුවේ පෙළගැස්ම පහත වගුවේ සාරාංශ කර ඇත. නව මාර්ගෝපදේශ වලට අනුකූල වීම පිළිබඳ සවිස්තරාත්මක හෙළිදරව් කිරීම් පිටු අංක 411 සිට 435 තෙක් දක්වා ඇත.

අවශ්‍යතා සාරාංශය	අනුකූලතා මට්ටම	විස්තර
වැඩිදියුණු කළ අධ්‍යක්ෂ මණ්ඩල වගකීම්	✓ අනුකූල වී ඇත	වසර තුළ අවදානම් සහ අනුකූලතාව, උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සහ ආචාරධර්ම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය ශක්තිමත් කරන ලදී.
අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය, ස්වාධීනත්වය සහ විවිධත්වය	✓ අනුකූල වී ඇත	ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ වලට අනුව ස්වාධීන අධ්‍යක්ෂවරුන් 11 දෙනෙකු සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති වලට අනුව ස්වාධීන අධ්‍යක්ෂවරුන් 10 දෙනෙකු 2025 දෙසැම්බර් අග වන විට එක් කාන්තා අධ්‍යක්ෂවරියක්
සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී භූමිකාව වෙන් කිරීම	✓ අනුකූල වී ඇත	අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන සභාපතිවරයෙකු විසින් මෙහෙයවනු ලබන අතර බැංකුවේ විධායක කාර්යයන් මහා කළමනාකාරතුමා විසින් මෙහෙයවනු ලැබේ.
අනිවාර්ය මණ්ඩල උපකමිටු	✓ අනුකූල වී ඇත	වර්ෂය තුළ සංශෝධනය කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩලයට නව පත්වීම් සහිතව ප්‍රතිසංස්කරණය කරන ලදී.
ශක්තිමත් කරන ලද අවදානම, අනුකූලතාවය සහ විගණන කාර්යයන්	✓ අනුකූල වී ඇත	අනුකූලතාව, අවදානම් කළමනාකරණය සහ සයිබර් ආරක්ෂාව ඇතුළු ක්ෂේත්‍ර වලට අවධානය යොමු කිරීම
ආචාරධර්ම, විනිවිදභාවය සහ තිරසාරභාවය කෙරෙහි අවධානය යොමු කිරීම	✓ අනුකූල වී ඇත	දූෂණ හා අල්ලස් විරෝධී ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීම සහ ප්‍රධාන අඛණ්ඩතා නිලධාරියෙකු පත් කිරීම

ලංකා බැංකුවේ ආයතනික යහපාලනය

යහපාලන සන්දර්භය

මාලදිවයින, ඉන්දියාව සහ සීෂෙල්ස් හි විදේශීය ශාඛා තුනක් සහ එක්සත් රාජධානියේ පූර්ණ හිමිකාරිත්වය සහිත පරිපාලිත ආයතනයක් හරහා ක්‍රියාත්මක වන බැවින්, බැංකුව විවිධ රටවලට අදාළ වන අනුකූලතාවයන්ට යටත් වේ. විදේශීය ශාඛා පාලනය කරනු ලබන්නේ විදේශීය ශාඛා ප්‍රඥප්තියක්, හරහා වන අතර, අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය, කාර්තුමය වාර්තාකරණය සහ අධ්‍යක්ෂ මණ්ඩලයට උපායමාර්ගික මට්ටමේ තීරණ යොමු කිරීම තුළින් සහතික කෙරේ. මේ අතර, මෙම ශාඛාවල කාර්යසාධනය, අනුකූලතාවය සහ විගණනය BOC ප්‍රධාන කාර්යාලය විසින් නිතිපතා නිරීක්ෂණය කරනු ලබන අතර, ජාතික විගණන කාර්යාලය බැංකුවේ වාර්ෂික විගණනයට අනුකූලව විගණන ක්‍රියා පටිපාටිවල නිරත වේ. තවද, මෙහෙයුම් ක්‍රියාත්මක වන රටේ බාහිර විගණකවරුන් අදාළ රෙගුලාසි වලට අනුව ස්වාධීන විගණන සිදු කරයි.

ආයතනික යහපාලනය සඳහා ප්‍රවේශය

GRI 2-9

බැංකුවේ ආයතනික යහපාලන ප්‍රවේශය, අරමුණු මූලික කරගත් නායකත්වය හා ගතික සහ නිරන්තරයෙන් වෙනස් වන මෙහෙයුම් පරිසරයක බැංකුවට සාර්ථකව ඉදිරියට යාමට හැකියාව සලසන මනෝභාවයන් පිළිබිඹු කරන ඉහළ කළමනාකාරණ මට්ටමින් ස්ථාපිත කර ඇති සංස්කෘතිය තුළ ප්‍රකාශ වේ.

ජාතියේ බැංකුකරුවා ලෙස, සියළුම පාර්ශ්වකරුවන් වෙත තිරසාර වටිනාකමක් ලබාදීමට අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටින අතර, බැංකුවේ ව්‍යාපාර ආකෘතියේ තිරසාරභාවය තහවුරු කරන උපායමාර්ග ක්‍රියාත්මක කිරීමත් සමඟම විනිවිදභාවය, සදාචාරාත්මක ව්‍යාපාරික ක්‍රියාකාරිත්වය සහ අවංකභාවය යන ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙන යයි. බැංකුවේ පාලන රාමුව අනිවාර්ය අනුකූලතා අවශ්‍යතා ඉක්මවා යමින්, සිය මෙහෙයුම් ක්ෂේත්‍රයන් පුරා ස්වේච්ඡා ප්‍රමිතීන් සහ ගෝලීය හොඳම භාවිතයන් ද අනුගමනය කරයි.

බාහිර රාමු

යහපාලන රාමු සහ ප්‍රතිඵල

- 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනත (‘ආඥාපනත’ ලෙස හැඳින්වේ) සහ එහි සංශෝධන.
- 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධන.
- 2007 අංක 11 දරණ පනතේ විධි විධාන අභිබවා යමින්, 2024 අංක 5 දරණ බැංකු පනතේ ආයතනික යහපාලනය පිළිබඳ විධිවිධානය.
- කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති.
- 2021 අංක 19 දරණ ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ හොඳම පරිචයන් සංග්‍රහය: (2023).
- ගෝලීය වාර්තාකරණ මුල්පිරීම් (GRI) විසින් නිකුත් කරන ලද GRI ප්‍රමිත.
- අන්තර්ජාතික සමෝධානික වාර්තාකරණ කමිටුව (IIRC) විසින් නිකුත් කරන ලද (IR) රාමුව.
- ISACA විසින් නිකුත් කරන ලද COBIT 2019 රාමුව.
- ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. S1 සහ S2 තිරසාරභාවය ආශ්‍රිත හෙළිදරව් කිරීමේ ප්‍රමිතීන්.
- ISO 27001.
- තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs).

අභ්‍යන්තර යාන්ත්‍රණ

ප්‍රඥප්ති සහ ප්‍රතිපත්ති

- අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය
- උපකමිටු ප්‍රඥප්ති
- පරිපාලිත සමාගම් කළමනාකරණ ප්‍රඥප්තිය
- ගනුදෙනුකාර ප්‍රඥප්තිය
- විස්තීරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි

ආචාරධර්ම සහ සංස්කෘතිය

- අධ්‍යක්ෂවරුන් සඳහා ව්‍යාපාර හැසිරීම් සහ ආචාරධර්ම සංග්‍රහය
- සේවක ආචාරධර්ම සංග්‍රහය
- අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්තිය
- ආයතනික වටිනාකම් ප්‍රකාශය

යහපාලන මූලධර්ම

- නායකත්ව හැකියාවන්
- ව්‍යුහයන් සහ පැවරීම
- ඵලදායී යහපාලන ක්‍රමවේදයන්
- පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්ව

යහපාලන ප්‍රතිඵල

- වගවීමෙන් බලගැන්වූ පුද්ගලයින්
- අඛණ්ඩව නමාශීලීත්වයෙන් ක්‍රියාකරයි
- අරමුණු මූලික කරගත් දිශානතිය
- ශක්තිමත් හා විනයගරුක කාර්යසාධනය



2025 දී අධ්‍යක්ෂ මණ්ඩල අවධානය යොමු කළ ක්ෂේත්‍ර

2025 දී, අභ්‍යන්තර ප්‍රමුඛතා සහ බාහිර මෙහෙයුම් තත්ත්වයන්ගේ විකාශනය වීමට ප්‍රතිචාර වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කළේය. මේ සම්බන්ධව පහත කොටසේ සාරාංශ කර ඇති අතර මෙම වාර්තාවේ 108 සිට 160 දක්වා පිටුවල කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය තුළ විස්තරාත්මකව දක්වා ඇත.

01 උපායමාර්ග සහ කාර්යසාධන සමාලෝචනය අනුමත කිරීම

කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා වලින් පසුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම අනුමත කරන ලදී. කළමනාකරණ කණ්ඩායම සහ අධ්‍යක්ෂවරු, උපායමාර්ග ක්‍රියාත්මක කිරීම, ඉලක්ක වලට එරෙහිව කාර්යසාධනය නිතිපතා නිරීක්ෂණය කිරීම සහ මෙහෙයුම් සන්දර්භයෙන් මතුවන බාහිර බලපෑම් පිළිබඳව ද සාකච්ඡා කළහ.

අදාළ පාර්ශ්වකරුවන්: කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්, ගනුදෙනුකරුවන්, සේවකයින්

බලපෑමට ලක් වූ ප්‍රාග්ධනයන්: මූල්‍ය ප්‍රාග්ධනය, මානව ප්‍රාග්ධනය, බුද්ධිමය ප්‍රාග්ධනය

02 අවදානම් කළමනාකරණය

ව්‍යාපාර අඛණ්ඩතාව, සේවක සුභසාධනය සහ තීරණාත්මක යටිතල පහසුකම්වල අඛණ්ඩතාව කෙරෙහි ක්ෂණික අවධානයක් යොමු කරමින්, දිට්වා සුළි කුණාටුවේ විභව බලපෑම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විචක්ෂණශීලීව සමාලෝචනය කරන ලදී. මධ්‍යකාලීන බලපෑම් සම්බන්ධයෙන්, ණය සහ මෙහෙයුම් අවදානම් ඇතුළුව ගනුදෙනුකරුවන්ට ඇති විය හැකි මධ්‍යකාලීන බලපෑම් සහ බලපෑමට ලක් වූ අංශවලට සහාය වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කරන ලදී.

අදාළ පාර්ශ්වකරුවන්: කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්, ගනුදෙනුකරුවන්, සේවකයින්, ප්‍රජාව සහ පරිසරය

බලපෑමට ලක් වූ ප්‍රාග්ධනයන්: මූල්‍ය ප්‍රාග්ධනය, නිෂ්පාදිත ප්‍රාග්ධනය, මානව ප්‍රාග්ධනය, සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය, ස්වාභාවික ප්‍රාග්ධනය

03 ඩිජිටල්කරණය සහ සයිබර් ආරක්ෂාව

තාක්ෂණය යෙදවීම තුළින් ගනුදෙනුකාර වටිනාකම් වැඩිදියුණු කිරීම මෙන්ම ඩිජිටල්කරණය තුළින් ක්‍රියාවලි කාර්යක්ෂමතාව සහ ඒකාග්‍රතාව වැඩි දියුණු කිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලය අවධානය යොමු කළ අතර වසර තුළදී, බැංකුවේ පවතින ඩිජිටල් අවශ්‍යතා අඛණ්ඩව සපුරාලීම සඳහා නව පරිපාලිත සමාගමක් පිහිටුවන ලදී.

අදාළ පාර්ශ්වකරුවන්: ගනුදෙනුකරුවන්, සේවකයින්, ව්‍යාපාරික හවුල්කරුවන්

බලපෑමට ලක් වූ ප්‍රාග්ධනයන්: මූල්‍ය ප්‍රාග්ධනය, බුද්ධිමය ප්‍රාග්ධනය, සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය, මානව ප්‍රාග්ධනය

04 තිරසාරභාවය සහ පාරිසරික, සමාජීය සහ යහපාලන අංශ

වසර තුළ බැංකුවේ තිරසාරභාවය පිළිබඳ ප්‍රතිපත්තිය සහ යහපාලන යාන්ත්‍රණයන් ශක්තිමත් කරන ලදී. SLFRS S1 සහ S2 තිරසාරභාවය සම්බන්ධ හෙළිදරව් කිරීමේ ප්‍රමිතීන් වෙත පූර්ණ අනුගතවීමේ පෙර සූදානම් වීමක් ලෙස, අධ්‍යක්ෂ මණ්ඩලය ESG අවදානම් හඳුනා ගැනීම, පවතින ව්‍යාපාර ක්‍රියාවලීන් තුළට ඒකාබද්ධ කිරීමට සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ESG වාර්තාකරණය වැඩිදියුණු කිරීමට කටයුතු කළේය.

අදාළ පාර්ශ්වකරුවන්: කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්, ගනුදෙනුකරුවන්, ව්‍යාපාරික සහ අරමුදල් හවුල්කරුවන්, ප්‍රජාව සහ පරිසරය


බලපෑමට ලක් වූ ප්‍රාග්ධනයන්: මූල්‍ය ප්‍රාග්ධනය, නිෂ්පාදිත ප්‍රාග්ධනය, මානව ප්‍රාග්ධනය, සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය, ස්වාභාවික ප්‍රාග්ධනය

ලංකා බැංකුවේ ආයතනික යහපාලනය

යහපාලන ප්‍රතිඵල

ලංකා බැංකුව තුළ ඵලදායී යහපාලනය, බලගැන්වූ පුද්ගලයන්, නිසි ක්‍රියාමාර්ග, සහ ශක්තිමත් කාර්යසාධනයක් බවට පරිවර්තනය කරමින් පැහැදිලි දිශානතියක් ඔස්සේ මෙහෙයවනු ලබයි. නිර්වචනය කරන ලද ව්‍යුහයන්, පැහැදිලි වගකීම් පැවරීම් හා ශක්තිමත් ආචාරධර්ම විසින් වගවීම ප්‍රවර්ධනය ද, වඩා අර්ථවත් තීරණ ගැනීම් සඳහා සහය වීම සහ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය තහවුරු කරයි.

මෙම පරිච්ඡේදයේ ඉදිරියට ඇති කොටස්වල වසර තුළදී නිර්මිත මූලික යහපාලන ප්‍රතිඵලයන් සහ ඉන් වටිනාකම් නිර්මාණය සඳහා ලබා දුන් දායකත්වය ඉදිරිපත් කර ඇත.



පුද්ගලයන්: වගවීමෙන් බලගැන්වීම

බැංකුවේ ශක්තිමත් යහපාලන රාමුව, විනයගරුක පැවරීමකට සහාය වන අතර, ස්ථාපිත පාලනයන් සහ වගවීමේ ව්‍යුහයන් තුළ තීරණාත්මකව ක්‍රියා කිරීමට සේවකයින්ට බලය ලබා දෙයි. මෙම භූමිකාවේ පැහැදිලිකම සහ විචක්ෂණශීලී බලගැන්වීම බැංකුව පුරා හිමිකාරිත්වය, සදාචාරාත්මක හැසිරීම සහ ඵලදායී තීරණ ගැනීම ශක්තිමත් කරයි.


දක්ෂතාවයෙන් සහ විවිධත්වයෙන් යුතු අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය නියමිත කුසලතා, අත්දැකීම් සහ විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් සමන්විත වන අතර එමඟින් සාකච්ඡාවල ගුණාත්මකභාවය සහ ගැඹුරු බව වැඩි දියුණු වේ. බලපත්‍රලාභී බැංකු සඳහා ආයතනික යහපාලන අවශ්‍යතාවලට අනුකූලව (2024 අංක 3 දරණ බැංකු පනතේ විධානය), විශාල හා සංකීර්ණ බැංකුවක අවශ්‍යතාවන් පිළිබිඹු කරමින් අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව සාමාජිකයින් 11 දක්වා වැඩි කරන ලදී. අධ්‍යක්ෂවරුන් 11 දෙනාගෙන් හය දෙනෙකු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියෝග වලට අනුකූලව ස්වාධීන ලෙස වර්ගීකරණය කර ඇති අතර, ඉතිරි අධ්‍යක්ෂවරුන් ස්වාධීන නොවන ලෙස වර්ගීකරණය කර ඇති අතර, මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් තෝරා පත් කර ඇත. කෙසේ වෙතත්, කොළඹ කොටස් හුවමාරුවේ (CSE) ලැයිස්තුගත කිරීමේ රීති වලට අනුව, නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂවරයා හැර අනෙකුත් සියලුම අධ්‍යක්ෂවරුන් ස්වාධීන ලෙස සැලකේ. වර්ෂය තුළ අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වයට බලපාන හෝ බලපාන බව පෙනෙන සම්බන්ධතා හෝ තත්ත්වයන් නොමැති බව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ.


අධ්‍යක්ෂ මණ්ඩලයේ සමතුලිතතාව

අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරුන් 10 දෙනෙකුගෙන් සහ වික් ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂවරයෙකුගෙන් (CSE ලැයිස්තුගත කිරීමේ රීති මත පදනම්ව) සමන්විත වේ. එමඟින් අධ්‍යක්ෂ මණ්ඩලයට නිරවුල් විනිශ්චයන් ගෙන එනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධ්‍යක්ෂවරුන් වර්ගීකරණයට අනුව ස්වාධීනත්වය තීරණය කිරීමේ නිර්ණායක මත පදනම්ව, අධ්‍යක්ෂවරුන් හය දෙනෙකු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර අධ්‍යක්ෂවරුන් පස් දෙනෙකු ස්වාධීන නොවන සහ විධායක නොවන ලෙස වර්ගීකරණය කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව



කොළඹ කොටස් හුවමාරුවට අනුව




අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය, සේවා කාලයෙහි විවිධත්වය මත

(2025.12.31 දිනට)	සේවා වසර ගණන	අධ්‍යක්ෂකවරුන් ගණන
	< 3	11
	5-9	1

ඵලදායී තීරණ ගැනීම් සඳහා සහාය වීම සඳහා නැවුම් ඉදිරි දර්ශන හඳුන්වා දෙමින්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමූහික කුසලතා සහ විශේෂඥතාව ශක්තිමත් කර ඇත.


කුසලතා සංයුතිය

කුසලතා පැතිකඩ



වයස් සංයුතිය

වයස් පැතිකඩ



උපායමාර්ගික අභිලාෂයන් වෙත සම්බන්ධිතව

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

ගනුදෙනුකාර අත්දැකීම්වල විශිෂ්ටත්වය

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩනැඟීම

ස්ත්‍රී පුරුෂ භාවය අනුව විවිධත්වය



පුරුෂ 10



ස්ත්‍රී 1

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් GRI 2-12

බැංකුවේ ශක්තිමත්භාවය සහ සියලුම පාර්ශ්වකරුවන්ට අඛණ්ඩ වටිනාකම් නිර්මාණය කිරීම සහතික කිරීමේ අරමුණින්, අධ්‍යක්ෂ මණ්ඩලය තම වගකීම් ඉටු කිරීමේදී සැලකිලිමත් වීමේ යුතුකම සහ පක්ෂපාතීත්වයේ යුතුකම ක්‍රියාත්මක කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ දක්වා ඇති අතර පහත සඳහන් දෑ ඇතුළත් වේ (නමුත් ඒවාට පමණක් සීමා නොවේ).

- බැංකුවේ උපායමාර්ගික සැලැස්ම අනුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.
- සමස්ත අවදානම් ප්‍රතිපත්තිය සහ ක්‍රියා පටිපාටිය අනුමත කිරීම, අවදානම් අභිරුචි මට්ටම් නිර්වචනය කිරීම සහ අවදානම් පිළිබඳ දැනුවත් සංස්කෘතියක් පෝෂණය කිරීම තුළින් අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම.
- බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සහ අඛණ්ඩතාව සහතික කිරීම.
- වේතනය අධීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම ඇතුළුව වේතනය පිළිබඳ අධීක්ෂණය.
- බැංකුව පුරා වෘත්තීය, සදාචාරාත්මක සහ විචක්ෂණශීලී හැසිරීම් ඇති කරමින්, යහපත් ආයතනික සංස්කෘතියක් පෝෂණය කිරීම.
- බැංකුවේ ක්‍රියාවලීන්, උපායමාර්ග සහ තීරණ ගැනීමේදී ESG සලකා බැලීම් ඇතුළත් කිරීම.

ලංකා බැංකුවේ ආයතනික යහපාලනය

අධ්‍යක්ෂවරුන් සඳහා හඳුන්වා දීමේ වැඩසටහන GRI 2-17

බැංකුවේ ව්‍යුහගත සහ සවිස්තරාත්මක හඳුන්වා දීමේ වැඩසටහන මඟින්, නව අධ්‍යක්ෂවරුන්ට ආරම්භයේ සිටම ඵලදායී ලෙස දායක වීමට අවස්ථාව සලසයි. බැංකුවේ මෙහෙයුම් සන්දර්භය, නියාමන රාමුව, අවදානම් පැතිකඩ සහ උපායමාර්ග පිළිබඳ අවබෝධයක් අධ්‍යක්ෂවරුන්ට ලබාදීමටත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් සහ ආචාරධර්මීය ප්‍රමිතීන් සමඟ අනුකූලතාවය තවදුරටත් ශක්තිමත් කිරීමටත් මෙම වැඩසටහන සැලසුම් කර ඇත. බැංකුවේ අධ්‍යක්ෂවරුන් සඳහා හඳුන්වාදීමේ වැඩසටහනේ ප්‍රධාන අංග පහත දැක්වේ.

දැනුවත් කිරීමේ වැඩසටහන

- බැංකුවේ දළ විශ්ලේෂණය
- නියාමන සන්දර්භය
- ආයතනික යහපාලන රාමුව
- අධ්‍යක්ෂ මණ්ඩල උපකාරක රාමුව

ඉදිරිපත් කිරීම්

මහා කළමනාකරු සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් විසින් සිදු කරන ඉදිරිපත් කිරීම්

- ව්‍යාපාර ආකෘතිය
- ආයතනික ව්‍යුහය
- ව්‍යාපාරික අංශ
- උපකාරක සේවා

රැස්වීම් සහ නිරීක්ෂණයන්

අවශ්‍ය පරිදි හෝ ඉල්ලීම මත රැස්වීම් සහ දෙපාර්තමේන්තු නිරීක්ෂණයන් සැලසුම් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල පුහුණුව GRI 2-17

අධ්‍යක්ෂවරුන්ට සිය වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට හැකි වන පරිදි අඛණ්ඩ වෘත්තීය සංවර්ධන අවස්ථා සඳහා ප්‍රවේශය ලබා දෙනු ලැබේ. මෙම පුහුණුව සාමාන්‍යයෙන් නියාමන අවශ්‍යතා වල වෙනස්වීම්, මෙහෙයුම් සන්දර්භයේ නව වෙනස්වීම් සහ අනෙකුත් අදාළ කරුණු ආවරණය කරයි. අධ්‍යක්ෂවරුන් අදාළ වෘත්තීය ආයතනවල අඛණ්ඩ වෘත්තීය සංවර්ධන අවශ්‍යතාද පිළිපදිනු ලබයි. අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීන වෘත්තීය උපදේශන ප්‍රවේශය පිළිබඳ ප්‍රතිපත්තියට අනුකූලව, බැංකුව විසින් බාහිර විශේෂඥ උපදෙස් ලබාගැනීමේ අවස්ථා අධ්‍යක්ෂවරුන්ට සපයනු ලැබේ.

ප්‍රමාණාත්මක කරුණු වලට 2025 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ පුහුණුවීම්

අඛණ්ඩ සංවර්ධන වැඩසටහනක කොටසක් ලෙස, විධායක නොවන අධ්‍යක්ෂවරුන් සිව්දෙනෙකු චිංගලන්තයේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පවත්වනු ලබන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ පුහුණු සහ සහතික වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කළහ.

- මූල්‍ය අපරාධ වැළැක්වීම
- මූල්‍ය සේවාවන් තුළ විසිල්බ්ලෝවිං ප්‍රතිපත්තිය
- අවදානම් කළමනාකරණය
- SLFRS තිරසාරභාවය ආශ්‍රිත හෙළිදරව් කිරීමේ ප්‍රමිතීන්
- තාක්ෂණය සහ කෘතිම බුද්ධිය (AI)

අධ්‍යක්ෂ මණ්ඩලය යාවත්කාලීන කිරීම සහ අනුප්‍රාප්තික විධිවිධාන GRI 2-10

වගකීම් සහ ඵලදායීතාවය තහවුරු කිරීම සඳහා, නව පත්කිරීම්, විශ්‍රාම ගැන්වීම් සහ ඉල්ලා අස්වීම් හරහා අධ්‍යක්ෂ මණ්ඩලය වරින් වර යාවත්කාලීන කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම් සඳහා විධිමත් සහ විනිවිදභාවයෙන් යුතු යාන්ත්‍රණයක් පවතින අතර, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා සහ යහපාලන උපකමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩල අපේක්ෂකයින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ කොළඹ කොටස් හුවමාරුවේ සුදුසු සහ යෝග්‍යතා නිර්ණායකයන්ට අනුව ඇගයීමට ලක් කරයි. එම නිර්ණායකයන්ට අඛණ්ඩතාව, වෘත්තීය නිපුනතාව, ස්වාධීනත්වය සහ ගැටුම් සම්බන්ධිත පාර්ශ්ව ආශ්‍රිත ඇල්මක් හෝ ගැටුම් නොතිබිය යුතුය.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂවරුන් පත් කිරීම පිළිබඳ සංශෝධිත ප්‍රතිපත්තියට අනුව, කමිටුව විසින් කෙටි ලැයිස්තුවක් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන අතර, ඉන් පසු එය මූල්‍ය විෂය භාර අමාත්‍යවරයා වෙත නිල නාමයෝජනාව සඳහා යොමු කරනු ලැබේ. 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනත සහ එහි සංශෝධන අනුව, අමාත්‍යවරයා පත්කිරීම් බලධාරියා වේ. එමෙන්ම, ශ්‍රී ලංකාවේ සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින්ද නව අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම් අනුමත කරනු ලබන්නේ, බැංකුව වෙළඳපළ අතරමැදි ආයතනයක් ලෙස ක්‍රියා කරන බැවිනි.

වසර තුළ, පහත පරිදි නව අධ්‍යක්ෂවරුන් හය දෙනෙකු පත් කිරීමත් සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය සැලකිය යුතු ලෙස ශක්තිමත් කරන ලදී.

දර්ශන ගුණසේකර මහතා 2025 අගෝස්තු 13 වන දින සිට ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී. නිපුණතා සහ පළපුරුද්ද	**තුල්සි අළුවිහාරේ මහතා** 2025 සැප්තැම්බර් 16 වන දින සිට ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී. නිපුණතා සහ පළපුරුද්ද	**ශාමිනී රත්වත්තේ මහත්මිය** 2025 සැප්තැම්බර් 16 වන දින සිට ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරියක ලෙස පත් කරන ලදී. නිපුණතා සහ පළපුරුද්ද
• ආයතනික මූල්‍ය කළමනාකරණය, සහ ගිණුම්කරණය • ව්‍යාපාර පරිවර්තනය • ව්‍යවසාය අවදානම් කළමනාකරණය • ආචාරධර්ම සහ යහපාලනය	• ආයෝජන බැංකුකරණය • ආයතනික ප්‍රතිව්‍යුහගත කිරීම • ඒකාබද්ධ කිරීම සහ අත්පත් කර ගැනීම	• මූල්‍ය හා කළමනාකරණය • තිරසාර සංවර්ධනය
දර්ශන් ජයරත්න මහතා 2025 සැප්තැම්බර් 26 වන දින සිට ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී. නිපුණතා සහ පළපුරුද්ද	**සුනිමල් විරසූරිය මහතා** 2025 ඔක්තෝම්බර් 7 වන දින සිට ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී. නිපුණතා සහ පළපුරුද්ද	**ඉංජිනේරු මහාචාර්ය ආනන්ද ජයවර්ධන** 2025 නොවැම්බර් 14 වන දින සිට ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී. නිපුණතා සහ පළපුරුද්ද
• බැංකුකරණය • මූල්‍ය වෙළඳපළ කළමනාකරණය • ආයෝජන කළමනාකරණය	• තොරතුරු ආරක්ෂාව • ඩිජිටල් පරිවර්තනය • තාක්ෂණ කළමනාකරණය • තාක්ෂණ හුවමාරුව	• ආයතනික යහපාලනය • අවදානම් කළමනාකරණය • විද්‍යාව සහ ඉංජිනේරු ක්ෂේත්‍රය

බල තුලනය GRI 2-12

අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මඟින් අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාවන් සහ වගකීම් පැහැදිලිව නිර්වචනය කර ඇති අතර, කිසිදු පුද්ගලයෙකුට/ කණ්ඩායමකට අසීමිත බලතල නොමැති බව සහතික කරයි. සභාපතිවරයාගේ සහ මහා කළමනාකරුගේ භූමිකාවන් වෙන් වෙන්ව පවතින අතර, සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයයි.

සභාපතිවරයාගේ භූමිකාව

- අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබා දීම සහ සියලුම අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටි අනුගමනය කරන බව සහතික කිරීම.
- යහපාලන පිළිවෙත් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සහ විශ්වාසනීයත්වය පවත්වා ගැනීම.
- විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වයට පහසුකම් සැලසීම.
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ විවිධ අදහස් සහ යෝජනාවන් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ඉදිරිපත් වන බවට කටයුතු සැලසීම සහ සියලුම අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය සහතික කිරීම.
- අදාළ වන සියලුම නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම සහතික කිරීම.
- කොටස් හිමියාගේ විශේෂිත අවධානයට ලක්වන කරුණු නිසි ලෙස සැලකිල්ලට භාජනය වන බව සහතික කිරීම.

මහා කළමනාකරුගේ භූමිකාව

- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කර ඇති මූල්‍ය හා මූල්‍ය නොවන ඉලක්ක වලට අනුකූලව බැංකුවේ උපායමාර්ගික සැලැස්මේ දක්වා ඇති උපායමාර්ගික න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම.
- බැංකුවේ කටයුතුවල කාර්යසාධනය අධීක්ෂණය සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.
- බැංකු ව්‍යාපාරයට බලපානු ලබන අවදානම් හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා අභ්‍යන්තර පාලන සහ විගණන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
- ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය සඳහා අනුප්‍රාප්තික සැලැස්ම සකස් කිරීම.

සභාපතිවරයාගේ සහ මහා කළමනාකරුගේ විස්තර මෙම වාර්තාවේ 34 සහ 42 පිටුවල දක්වා ඇත. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ සභාපති, මහා කළමනාකරු සහ අනෙකුත් අධ්‍යක්ෂවරුන් සහ ඔවුන්ගේ ව්‍යාපාර, පවුලේ සමාජිකයින් හෝ වෙනත් සම්බන්ධ පාර්ශ්ව අතර කිසිදු ප්‍රමාණාත්මක/ අදාළ ගනුදෙනු නොතිබුණි.

ලංකා බැංකුවේ ආයතනික යහපාලනය

අධ්‍යක්ෂ මණ්ඩල ඇගයීම

අධ්‍යක්ෂ මණ්ඩලය සිය කාර්යසාධනය වාර්ෂිකව දෙවරක්, ක්‍රමවත් ස්වයං-ඇගයීම් ක්‍රියාවලියක් මඟින් ඇගයීමට ලක් කරයි. මෙම ක්‍රියාවලිය තුළ සංවර්ධනය අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනාගෙන වැඩිදුර ක්‍රියාමාර්ග සඳහා යොමු කරනු ලැබේ. මෙම ස්වයං ඇගයීම නාමයෝජනා සහ යහපාලන උපකමිටුව හරහා සිදු කෙරේ. වර්ෂය තුළ සිදු කරන ලද ඇගයීම්වල වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් පවත්වාගෙන යනු ලැබේ. 2025 වසරේදී සිදු කරන ලද ඇගයීම්වල නිරීක්ෂිත ප්‍රධාන කරුණු මීට සමගාමීව දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල ස්වයං ඇගයීම්වල ප්‍රතිඵල

2025 ප්‍රධාන ශක්තීන් (ලකුණු 90% ට වැඩි)

- අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති
- උපායමාර්ගික චින්තනය සහ සැලසුම්කරණය
- නීතිමය සහ ආචාරධර්ම අනුකූලතාව
- අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අතර සබඳතාව
- අධීක්ෂණ සහ ඇගයීමේ ක්‍රමවේද
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර (ලකුණු 90% ට අඩු)
- අධ්‍යක්ෂ මණ්ඩල ව්‍යුහය සහ ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වන ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය, බැංකු පනතේ 43 වන වගන්තියේ සහ අදාළ සංශෝධනවල විධිවිධාන සපුරාලනු ලැබේ. ඇය නියාමන නියෝග, උපදෙස් සහ අදාළ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු ප්‍රඥප්ති වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක වන බව සහතික කරයි. සියලුම අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ උපදෙස් සහ සේවාවන් ලබා ගැනීමේ හැකියාව ඇත. මණ්ඩලයේ ලේකම්වරියගේ ප්‍රධාන වගකීම් වලට පහත කරුණු ඇතුළත් වේ.

- බැංකුවේ ආයතනික යහපාලන රාමුව ක්‍රියාත්මක කිරීම.
- බැංකුවේ යහපාලන රාමුව නිරන්තරයෙන් සමාලෝචනය කිරීම සහ නියාමන අවශ්‍යතා, පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් සහ නවීන හොඳම භාවිතයන්ට අනුකූල වීම.
- නාමයෝජනා සහ යහපාලන උපකමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ අධ්‍යක්ෂවරුන් සඳහා වෘත්තීය සංවර්ධනය වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා පවත්වා ගෙන යාම සහ සාධාරණ දැනුම්දීමක් මත ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට හෝ නියාමකයෙකුට එහි ප්‍රවේශය ලබා දීම.


ක්‍රියාවලි: අඛණ්ඩතාව සමඟ කාර්යක්ෂමතාව

බැංකුවේ යහපාලන ක්‍රියාවලීන්, ශක්තිමත් අධීක්ෂණය සහ නම්‍යශීලීභාවය අතර සමබරතාවයක් පවත්වාගෙන යමින්, කාලෝචිත සහ දැනුවත් තීරණ ගැනීම සඳහා පහසුකම් සලසයි. පැහැදිලි වගකීම් ව්‍යුහයන් සහ ශක්තිමත් සහතික කිරීමේ යාන්ත්‍රණයන් සියලු ක්ෂේත්‍ර හරහා අඛණ්ඩතාව, විනිවිදභාවය සහ ස්ථාවරත්වය සහතික කරයි.

ව්‍යුහයන් සහ බලය පැවරීම

GRI 2-9

ජාතියේ මහා පහන් ටැඹ ලෙස බැංකුවේ වඩාත් සංකීර්ණත්වය සහ ශ්‍රේෂ්ඨත්වය පිළිබිඹු කිරීම සඳහා එහි යහපාලන ව්‍යුහය අඛණ්ඩව විකාශනය වෙමින් පවතී. පහත දක්වා ඇති පරිදි, අධ්‍යක්ෂ මණ්ඩල ව්‍යුහය තීරණාත්මක ක්ෂේත්‍ර වලට කාර්යක්ෂම අධීක්ෂණයක් සපයන අතර, සුදුසු ආකාරයට බලය පැවරීමෙන් බැංකුව ඵලදායී ලෙස යහපාලනය කිරීමට අවශ්‍ය නම්‍යශීලීභාවය රඳවා ගනී.



* 2026/1/1 දින සිට නැවත ස්ථාපිත කරන ලදී

** අලුතින් පිහිටුවන ලදී

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු

2025 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපකමිටු හයක් සහ 2026 ආරම්භය වන විට උපකමිටු අටක් පත්කර තිබුණි. මෙමඟින් අධීක්ෂණ කාර්යක්ෂමව ඉටු කිරීම සහතික කරන අතර ගිණුම්කරණය, තාක්ෂණය, අවදානම් කළමනාකරණය සහ තිරසාරභාවය වැනි විශේෂිත ක්ෂේත්‍රවල අධ්‍යක්ෂවරුන්ගේ විශේෂඥ දැනුම බැංකුවට උපයෝගී කර ගැනීමටද හැකියාව සලසයි.

උපකමිටු පිහිටුවීමේදී, අදාළ නියාමන අවශ්‍යතා, එක් එක් කමිටුවේ කාර්යභාරය සහ සාමාජිකයින්ගේ කුසලතා සහ පළපුරුද්ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිල්ලට ගනු ලබයි. සෑම අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවකටම විධිමත් නිල කාර්ය පටිපාටි ඇති අතර එය වාර්ෂිකව සමාලෝචනය කරයි.

නව බැංකු පනතේ නියෝග, කොළඹ කොටස් හුවමාරුවේ ආයතනික යහපාලන සහ ලැයිස්තුගත කිරීමේ රීති පිළිබඳ උපදෙස් වලට අනුකූලතාව සහතික කිරීම සඳහා උපකමිටු සඳහා වූ කාර්ය පටිපාටි සංශෝධනය කර යාවත්කාලීන කරන ලදී. විගණන, නාමයෝජනා සහ ආයතනික යහපාලනය සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන උපකමිටු ද වසර තුළ නැවත සංවිධානය කරන ලදී. මෙය ලැයිස්තුගත කිරීමේ රීතිවල නීති අංක 9.3 ට ට අනුකූලව සිදු කරන ලදී. 2025 වර්ෂයේදී උපකමිටු විසින් සිදුකරන ලද කාර්යයන් පිළිබඳ විස්තර මෙම වාර්තාවේ 180 සිට 190 දක්වා පිටුවල සඳහන් වේ.

විගණන කමිටුව
(කමිටු වාර්තාව පිටු අංක 180-181 දක්වා ඇත)

- මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව සහ අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව තක්සේරු කිරීම.
- බාහිර විගණනය
- අභ්‍යන්තර විගණනය

උපායමාර්ගය

වටිනාකම් නිර්මාණයට සබැඳිය

කමිටුව රැස්වූ වාර ගණන නවයකි.

දක්ෂතා මිශ්‍රය

1 2 1 2 1 1

වේකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව
(කමිටු වාර්තාව පිටු අංක 182-183 දක්වා ඇත)

- ණය, වෙළඳපළ, මෙහෙයුම්, ද්‍රවශීලතාවය, සයිබර්/ තොරතුරු තාක්ෂණ, උපායමාර්ගික අවදානම්, ESG අවදානම ඇතුළු අවදානම් කළමනාකරණය
- අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති රාමුව සහ නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම සහතික කිරීම

උපායමාර්ගය

වටිනාකම් නිර්මාණයට සබැඳිය

කමිටුව රැස්වූ වාර ගණන අටකි.

දක්ෂතා මිශ්‍රය

1 3 2 1 1

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව
(කමිටු වාර්තාව පිටු අංක 184-185 දක්වා ඇත)

- වැටුප් ප්‍රතිපත්තිය සහ අදාළ මානව සම්පත් ප්‍රතිපත්ති අනුමත කිරීම
- සංවිධාන ව්‍යුහය
- ප්‍රධාන කළමනාකාරීත්වය සඳහා අරමුණු සහ ඉලක්ක කාර්යසාධනය ඇගයීම

උපායමාර්ගය

වටිනාකම් නිර්මාණයට සබැඳිය

කමිටුව රැස්වූ වාර ගණන අටකි.

දක්ෂතා මිශ්‍රය

1 1 2 1 1

නාමයෝජනා සහ යහපාලන කමිටුව
(කමිටු වාර්තාව පිටු අංක 186-187 දක්වා ඇත)

- ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් පත් කිරීම
- නව අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ ක්‍රියා පටිපාටියට අනුකූල වීම සහතික කිරීම
- අනුප්‍රාප්ති සැලැස්ම
- ආචාරධර්ම සංග්‍රහය
- අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ එහි උපකමිටුවල කාර්යක්ෂමතාව

උපායමාර්ගය

වටිනාකම් නිර්මාණයට සබැඳිය

කමිටුව රැස්වූ වාර ගණන 14 කි.

දක්ෂතා මිශ්‍රය

3 2 1 1

තොරතුරු හා සංන්නිවේදන තාක්ෂණ කමිටුව
(කමිටු වාර්තාව පිටු අංක 188-189 දක්වා ඇත)

- ඩිජිටල් උපායමාර්ග ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය
- ඩිජිටල් නිෂ්පාදන, සේවා, යටිතල පහසුකම් සහ ප්‍රතිපත්ති

උපායමාර්ගය

වටිනාකම් නිර්මාණයට සබැඳිය

කමිටුව රැස්වූ වාර ගණන 10 කි.

දක්ෂතා මිශ්‍රය

1 2 1 2 1 1

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව
(කමිටු වාර්තාව පිටු අංක 190 දක්වා ඇත)

- නියාමන සහ අනෙකුත් වාර්තාකරණ අවශ්‍යතා වලට අනුකූලව අදාළ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු වාර්තා කිරීම සඳහා ඵලදායී පාලන පද්ධති ක්‍රියාත්මක කිරීම

උපායමාර්ගය

වටිනාකම් නිර්මාණයට සබැඳිය

කමිටුව රැස්වූ වාර ගණන පහ කි.

දක්ෂතා මිශ්‍රය

2 1 1 1

● කෘෂිකර්මාන්ත ● බැංකුකරණය/ අන්තර්ජාල බැංකුකරණය ● තොරතුරු තාක්ෂණ/ ෆින්ටෙක් ● මූල්‍ය සහ ගිණුම්කරණය ● ආර්ථික විද්‍යාව
● තිරසාර සංවර්ධනය ● අලෙවිකරණය

ලංකා බැංකුවේ ආයතනික යහපාලනය

ඉහත ලැයිස්තුගත කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වලට අමතරව, වත්කම් සහ වගකීම් කළමනාකරණය, ණය, උපායමාර්ග සමාලෝචනය, ව්‍යාපාර අඛණ්ඩතාව සහ තොරතුරු තාක්ෂණය වැනි ප්‍රධාන අංශ හරහා බැංකුව විධායක මට්ටමේ කමිටු කිහිපයක් පිහිටුවා ඇත. මෙම කමිටු මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ග, ප්‍රතිපත්ති සහ අවදානම් ක්‍රියාකාරී තීරණ බවට පරිවර්තනය කරයි.

විධායක කමිටු

වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (ALCO)	ආයතනික තොරතුරු ආරක්ෂක කමිටුව	නිෂ්ක්‍රීය වත්කම් කමිටුව	ණය කළඹ කළමනාකරණ කමිටුව
ශාඛා අංශ ණය කමිටුව	ආයතනික කළමනාකරණ කමිටුව	අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) සහ ප්‍රතිසාධන සැලැසුම් (PCP) කමිටුව	ත්‍යාග සහ පිළිගැනීමේ ප්‍රතිපත්ති කමිටුව (RRPC)
ව්‍යාපාර අඛණ්ඩතා සම්බන්ධීකරණ කමිටුව	ආයතනික උපායමාර්ග සමාලෝචන කමිටුව	ආයෝජන කමිටුව	ශිෂ්‍යත්ව වැඩසටහන් තෝරාගැනීම කමිටුව (සමාලෝචන කමිටුව)
ව්‍යාපාර අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමේ කමිටුව	ණය කමිටුව	තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව මෙහෙයුම් කමිටුව	ශිෂ්‍යත්ව වැඩසටහන් කමිටුව
ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ මෙහෙයුම් කමිටුව (BCMAC)	හානි තක්සේරු සහ ප්‍රතිසංස්කරණ කමිටුව (DARC)	අලෙවිකරණ කමිටුව	tvBOC මෙහෙයුම් කමිටුව
දිගුකාලීන බැර ශේෂයන් සම්බන්ධ කටයුතු කරන කමිටුව	විදේශ මුදල් ගෙවීමේ ප්‍රවාහ කළමනාකරණ කමිටුව	ජංගම බැංකු මෙහෙයුම් කමිටුව	තිරසාර කමිටුව
මෙහෙයුම් පාඩු සම්බන්ධයෙන් කටයුතු කරන කමිටුව	වංචා අවදානම් කළමනාකරණ කමිටුව	අක්‍රීය වත්කම් කමිටුව (NPAC)	තාක්ෂණික හා මෙහෙයුම් කමිටුව
රජයේ සුරැකුම්පත්වල ආයෝජනය සඳහා කමිටුව	මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුව (HRPC)	මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව	tvBOC හි කෘත්‍යාධිකාරී මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

උපායමාර්ග ක්‍රියාත්මක කිරීම, ව්‍යාපාර කාර්යසාධනය, ප්‍රාග්ධන ප්‍රමාණවත් බව, අවදානම් කළමනාකරණය සහ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා ඇතුළු පුනරාවර්තන න්‍යාය පත්‍ර කරුණු සමඟ වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය 26 වතාවක් රැස්විය. ව්‍යුහගත නොකළ කාලය ද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඇතුළත් කර ඇති අතර තාවකාලික කරුණු මතු කිරීමටද අවස්ථාව ලබාදී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සහ උපකමිටු රැස්වීම් පෙර සැලසුම් කර ඇති අතර සෑම වර්ෂයකම ආරම්භයේදීම එය අධ්‍යක්ෂවරුන්ට නිසි ලෙස දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පෙර

අධ්‍යක්ෂ මණ්ඩල සහ උපකමිටු රැස්වීම් සඳහා දින දර්ශනය සකසා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් න්‍යාය පත්‍රය සකසන අතර කරුණු යෝජනා කිරීමට අවශ්‍ය නම්‍යශීලීත්වය අධ්‍යක්ෂවරුන්ට ලබා දී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සංසරණය

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

කාර්යසාධන, යහපාලන කටයුතු සහ උපකමිටුවල නිර්දේශ පිළිබඳව සාකච්ඡාවන්

අවශ්‍ය අවස්ථාවලදී කළමනාකාරීත්වයෙන් අතිරේක පැහැදිලි කිරීම් ලබා ගනී

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙන් පසු

රැස්වීමෙන් දින 10ක් ඇතුළත ආරක්ෂිත විද්‍යුත් විසඳුමක් හරහා වාර්තා සකස් කර අධ්‍යක්ෂවරුන් අතර සංසරණය කරයි

පසුව පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පෙර රැස්වීමේ වාර්තාව සම්මත කරයි

නොවිසඳුණු කරුණු පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග

සාකච්ඡා, තීරණ සහ ක්‍රියාමාර්ග පිළිබඳ පැහැදිලි සහ නිවැරදි වාර්තාවක් සපයමින්, අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා ප්‍රමාණවත් විස්තර සහිතව සටහන් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි සාකච්ඡා වලදී භාවිතා කරන ලද තොරතුරු වල සාරාංශය, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලන ලද කරුණු සහ බැංකුව නිරාවරණය වන ප්‍රධාන අවදානම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති අවබෝධය ඇතුළු කරුණු වාර්තාවල ඇතුළත් වේ.

2025 තුළ අධ්‍යක්ෂ මණ්ඩල සහ උපකමිටු රැස්වීම්වල සහභාගීත්වය

2025 වසරේ අධ්‍යක්ෂ මණ්ඩල සහ උපකමිටු රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

අධ්‍යක්ෂවරයාගේ නම	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	විගණන කමිටු රැස්වීම් AC	මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම් HR&RC	නාමයෝජනා හා යහපාලන කමිටු රැස්වීම් N&GC	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් IRMC	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු රැස්වීම් ICTC	සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු රැස්වීම් RPTRC	විගණන කමිටු/ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු ඒකාබද්ධ රැස්වීම්
කාවින්ද ද සොයිසා මහතා [1] සභාපති	26/26	අදාළ නොවේ	8/8	14/14	7/7	8/10	අදාළ නොවේ	**1/1**
ආචාර්ය කපිල සේනානායක [2] නිලබලයෙන් පත් වූ අධ්‍යක්ෂ	21/26	5/9	7/8	1/1	0/1	4/6	5/5	**1/1**
ජෙහාන් ඉස්මයිල් මහතා[3] විධායක නොවන අධ්‍යක්ෂ	25/26	9/9	8/8	13/14	4/5	අදාළ නොවේ	අදාළ නොවේ	**1/1**
ජයමින් පැල්පොල මහතා[4] විධායක නොවන අධ්‍යක්ෂ	11/11	3/3	අදාළ නොවේ	අදාළ නොවේ	3/4	4/4	අදාළ නොවේ	**අදාළ නොවේ**
ආචාර්ය අමල් ඉලේසිංහ[5] විධායක නොවන අධ්‍යක්ෂ	26/26	6/6	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	10/10	5/5	**1/1**
ආර් එම් පි රත්නායක මහතා[6] විධායක නොවන අධ්‍යක්ෂ	26/26	අදාළ නොවේ	අදාළ නොවේ	13/13	7/7	අදාළ නොවේ	5/5	**1/1**
දර්ශන ගුණසේකර මහතා[7] විධායක නොවන අධ්‍යක්ෂ	7/8	5/5	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	**අදාළ නොවේ**
තුල්සි අළුවිහාරේ මහතා[8] විධායක නොවන අධ්‍යක්ෂ	6/6	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	**අදාළ නොවේ**
ශාමිනී රත්වත්තේ මහත්මිය[9] විධායක නොවන අධ්‍යක්ෂ	6/6	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	**අදාළ නොවේ**
දර්ශන් ජයරත්න මහතා[10] විධායක නොවන අධ්‍යක්ෂ	5/5	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	**අදාළ නොවේ**
සුනිමල් වීරසූරිය මහතා[11] විධායක නොවන අධ්‍යක්ෂ	5/5	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	**අදාළ නොවේ**
ඉංජි. මහාචාර්ය ආනන්ද ජයවර්ධන[12] විධායක නොවන අධ්‍යක්ෂ	2/2	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	**අදාළ නොවේ**

විගණන කමිටුව (AC)
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (HR&RC)
නාමයෝජනා හා යහපාලන කමිටුව (N&GC)
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC)
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව (ICTC)
සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව (RPTRC)

1 2025.02.03 දින සිට ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට පත් කරන ලදී.

2 2025.02.03 දින සිට නාමයෝජනා හා යහපාලන කමිටුවෙන් ඉල්ලා අස්විය.
2025.02.03 දින සිට ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙන් ඉල්ලා අස්විය.
2025.02.03 දින සිට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවෙන් ඉල්ලා අස්වූ අතර 2025.06.23 දින නැවත පත් කරන ලදී.

3 2025.02.03 දින සිට ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙන් ඉල්ලා අස් වූ අතර 2025.06.23 දින සිට නැවත පත් කරන ලදී.

4 2025.05.30 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්විය.
2025.05.30 දින සිට විගණන කමිටුවෙන් ඉල්ලා අස්විය.
2025.05.30 දින සිට ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙන් ඉල්ලා අස්විය.
2025.02.03 දින සිට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවට පත් කරන ලද අතර 2025.05.30 දින සිට ඉල්ලා අස්විය.

5 2025.06.23 දින සිට විගණන කමිටුවට පත් කරන ලදී.

6 2025.02.03 දින සිට නාමයෝජනා හා යහපාලන කමිටුවට පත් කරන ලදී.
2025.02.03 දින සිට ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට පත් කරන ලදී.

7 2025.08.13 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.
2025.08.15 දින සිට විගණන කමිටුවට පත් කරන ලදී.

8 2025.09.16 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

9 2025.09.16 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

10 2025.09.26 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

11 2025.10.07 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

12 2025.11.14 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

ලංකා බැංකුවේ ආයතනික යහපාලනය

ඵලදායී පාලනයන් GRI 2-23, 24

ශක්තිමත් ප්‍රතිපත්ති, විනයගරුක අවදානම් කළමනාකරණය සහ පුළුල් අනුකූලතා යාන්ත්‍රණයන් බැංකුව පුරා ඵලදායී පාලනයක් සහතික කරයි. මෙම පියවරයන් නියාමන අවශ්‍යතා, සදාචාරාත්මක ප්‍රමිතීන් සහ බැංකුවේ උපායමාර්ගික අරමුණු සමඟ මෙහෙයුම් සමපාතව පවතින බව සහතික කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

ප්‍රතිපත්තිමය රාමුව

බැංකුවේ ශක්තිමත් ප්‍රතිපත්ති රාමුව, ආයතනය පුරා තීරණ ගැනීම සඳහා ස්ථාවර සහ වගකිවයුතු ප්‍රවේශයක් සහතික කිරීම සඳහා පදනම ලෙස ක්‍රියා කරයි. වෙනස්වන මෙහෙයුම් ගතිකත්වයන්ට අදාළව පවතින බව සහතික කිරීම සඳහා සියලුම ප්‍රතිපත්ති අවම වශයෙන් වාර්ෂිකව සමාලෝචනය කර සංශෝධනය කරනු ලැබේ. නව බැංකු පනතේ අවශ්‍යතා වලට අනුකූලව, ආයතනික යහපාලනය පිළිබඳ ප්‍රතිපත්ති කිහිපයක් බැංකුව විසින් සංශෝධනය කරන ලදී. බැංකුව තුළ ක්‍රියාත්මක වන ප්‍රධාන ප්‍රතිපත්තිවලට පහත සඳහන් දෑ ඇතුළත් වේ (නමුත් ඒවාට පමණක් සීමා නොවේ).

2025 දී සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රතිපත්ති

- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ
- තිරසාර ප්‍රතිපත්තිය
- අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ ප්‍රතිපත්තිය

ආයතනික යහපාලනය

- අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ කරුණු පිළිබඳ ප්‍රතිපත්තිය (අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය)
- අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු සම්බන්ධ ප්‍රතිපත්තිය
- ආයතනික යහපාලනය පිළිබඳ ප්‍රතිපත්තිය (ආයතනික යහපාලන ප්‍රතිපත්තිය)
- ලංකා බැංකුවේ ස්වාධීන වෘත්තීය උපදෙස් සඳහා අධ්‍යක්ෂවරුන්ට ප්‍රවේශ වීම පිළිබඳ ප්‍රතිපත්තිය
- අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම පිළිබඳ ප්‍රතිපත්තිය

මානව සම්පත සහ වේතන

- මානව සම්පත් ප්‍රතිපත්තිය
- පුහුණු සහ සංවර්ධන ප්‍රතිපත්තිය
- බඳවා ගැනීම් පටිපාටිය
- නිවසේ සිට වැඩ කිරීමේ ප්‍රතිපත්තිය
- සභාපති සහ අධ්‍යක්ෂවරුන් සඳහා වූ වේතන ප්‍රතිපත්තිය
- ඉවත්වීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා වූ ප්‍රතිපත්තිය
- සේවක දුක්ගැනවිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය
- ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා වූ වැටුප් ප්‍රතිපත්තිය

අවදානම් කළමනාකරණය

- ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- රටෙහි අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- ආපති පරීක්ෂණ ප්‍රතිපත්තිය
- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP)
- මෙහෙයුම් අවදානම් කලමනාකරණය
- වංචා අවදානම් කළමනාකරණය
- තොරතුරු ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය

පාර්ශ්වකරුවන් කලමනාකරණය

- ගනුදෙනුකාර පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය සහ ක්‍රියා පටිපාටි
- සන්නිවේදන ප්‍රතිපත්තිය
- කොටස් හිමියන් සහ ආයෝජකයින් සමඟ සබඳතා පිළිබඳ ප්‍රතිපත්තිය
- ආයතනික හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය
- ප්‍රසම්පාදන අත්පොත

ආචාරධර්ම සහ සංස්කෘතිය

- අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්තිය
- විසිල්බ්ලෝවිං ප්‍රතිපත්තිය
- ස්ත්‍රී පුරුෂ සමාණාත්මතාවය පිළිබඳ ප්‍රතිපත්තිය

ESG

- තිරසාරභාවය හා ESG පිළිබඳ ප්‍රතිපත්තිය
- ESMS ප්‍රතිපත්තිය
- විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය

බැඳියාවන් අතර ගැටුම් GRI 2-15

බැංකුවේ පවතින බැඳියාවන් අතර ගැටුම් පිළිබඳ ප්‍රතිපත්තිය, අධ්‍යක්ෂවරුන් අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ ඔවුන්ගේ ක්‍රියාකාරකම් වලදී ඇතිවන ඝට්ටනයන් සහ ඇතිවිය හැකි ඝට්ටනයන් වළක්වා ගැනීම සහතික කරයි.

එකී ප්‍රතිපත්තිය මගින් සැබෑ, විභව හෝ සංජානනීය බැඳියාවන් අතර ගැටුම් කළමනාකරණය සම්බන්ධයෙන් පැහැදිලි නීති, පාලනයන් සහ මාර්ගෝපදේශ ස්ථාපිත කරයි. සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදීම අධ්‍යක්ෂවරුන් කොන්ත්‍රාත්තු/ නව පත්කිරීම් සම්බන්ධයෙන් ඕනෑම ඇල්මක් පිළිබඳව අනාවරණය කිරීම අවශ්‍ය වේ. අධ්‍යක්ෂවරුන් එවැනි බැඳියාවක් පවතින අවස්ථාවන් වලදී තොරතුරු වෙත ප්‍රවේශ වීමෙන්, සාකච්ඡා වලට සහභාගී වීමෙන්, තම මතය ප්‍රකාශ කිරීමෙන් අනුමත කිරීමෙන් වැළකී සිටිති.

අනුකූලතාව GRI 2-27

ශක්තිමත් ආචාරධර්ම හා අනුකූලතා සංස්කෘතියක්, අදාළ නියාමන රාමු වලට අනුකූල වීම සහතික කරන අතරම, බැංකුවේ කීර්තිනාමය ආරක්ෂා කරන අතරම, පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ශක්තිමත් කරයි. බැංකු පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව, බැංකුව අදාළ සියලුම නීති සහ රෙගුලාසිවලට අනුකූලව ඉහළ මට්ටමේ අඛණ්ඩතාවයකින් ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා ස්වාධීන අනුකූලතා ඒකකයක් ලංකා බැංකුව විසින් ස්ථාපිත කර ඇත. ඕනෑම නියාමනයක් උල්ලංඝනය කිරීම්, බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග හෝ මතුවන අනුකූලතා ගැටළු ඇතුළුව, බැංකුවේ අනුකූලතා තත්ත්වය පිළිබඳව ප්‍රධාන අනුකූලතා නිලධාරී සහ කළමනාකරණ කණ්ඩායමෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිතිපතා යාවත්කාලීන කිරීම් ලැබේ.

වාර්තාකරණ කාල සීමාව තුළ, බැංකුව අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීමේ කිසිදු අවස්ථාවක් වාර්තා කර නොමැති අතර කිසිදු මූල්‍යමය දඩයක් හෝ සම්බාධක පැනවී නොමැත.

තීරණාත්මක තත්ත්වයන් පිළිබඳ සන්නිවේදනය කිරීම GRI 2-16, 26

තීරණාත්මක ගැටලු අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කිරීම පහසු කිරීම සඳහා පහත සඳහන් යාන්ත්‍රණ ක්‍රියාත්මක වේ.

- අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු රැස්වීම්: අදාළ උපකමිටු හරහා තීරණාත්මක ගැටළු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ හැකිය.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයා කළමනාකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය අතර මාර්ගයක් ලෙස කටයුතු කරයි.
- මහා කළමනාකාරතුමා විසින් සෘජු වාර්තා කිරීම
- අධ්‍යක්ෂවරයාගේ විශේෂ ඉල්ලීම්
- විසිල්බ්ලෝවිං ක්‍රමයට තොරතුරු දැනුම් දෙන්නා: ප්‍රධාන අභ්‍යන්තර විගණක හෝ විගණන කමිටුවේ සභාපති හරහා.

වාර්තාකරණ කාල සීමාව තුළ කිසිදු තීරණාත්මක කරුණක් බැංකුවේ ඉහළම පාලන ආයතනයට දැනුම් දී නොමැත.

අවදානම් යහපාලනය

බැංකුව සතුව එහි අවදානම් නිරාවරණයන් ඵලදායී ලෙස හඳුනා ගැනීමට, තක්සේරු කිරීමට සහ කළමනාකරණය කිරීමට ක්‍රමානුකූල ක්‍රියා පටිපාටි ඇති අතර එමඟින් එහි සමස්ත දැරා ගැනීමේ හැකියාව ශක්තිමත් කරයි. අවදානම් සලකා බැලීම් සමස්ත තීරණ ගැනීමේදී ඇතුළත් කර ඇති අතර එමඟින් බැංකුවට අවදානම් ප්‍රතිලාභ ගතිකතාවයන් අතර ප්‍රශස්ත සමතුලිතතාවයක් ගෙන යාමට හැකි වේ. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට එහි අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර යහපාලන බැඳීම් ඉටු කිරීමට සහාය වේ. අවදානම් සම්බන්ධ ප්‍රධාන වර්ධනයන් අවදානම් කළමනාකරණ වාර්තාව (පිටු 191-216), විගණන කමිටු වාර්තාව (පිටු 180-181) සහ ඒකාබද්ධ අවදානම් කළමණාකරන කමිටු වාර්තාව (පිටු 182-183) හි විස්තරාත්මකව සාකච්ඡා කෙරේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යහපාලනය

බැංකුව තුළ තාක්ෂණය භාවිතා කිරීම යහපාලනය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ සහාය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය ඉහළම වගකීම දරයි. බැංකුවේ සයිබර් ආරක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියෙකු ද පත කර ඇත. බැංකුවේ ව්‍යවසාය තොරතුරු තාක්ෂණ යහපාලන රාමුව COBIT-2019 මත පදනම් වන අතර එයට පාලන පිළිවෙත්, අරමුණු, ක්‍රියාවලීන්, පරිණත ආකෘති සහ ව්‍යාපාරික ඉලක්ක වෙත සිතියම්ගත කිරීම ඇතුළත් වේ. කඩිසර තාක්ෂණ යහපාලනය සහ උපායමාර්ගික අධීක්ෂණය හරහා, වසර තුළ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා බැංකුව සිය ඩිජිටල් ආයෝජන සාර්ථකව උපයෝගී කර ගත්තේය.

2025 වූ අවදානම් ආශ්‍රිත ප්‍රධාන වර්ධනයන්

- දිට්වා සුළි කුණාටුවේ වත්මන් සහ අනාගත බලපෑම් තක්සේරු කිරීම
- SLFRS S1 සහ S2 තිරසාරභාවය අනාවරණය කිරීමේ ප්‍රමිතීන්ට අනුව තිරසාරභාවය සහ දේශගුණයට අදාළ අවදානම් ඇතුළත් කරන ලද අවදානම පිළිබඳ දැක්ම පුළුල් කිරීම.
- සයිබර් ආරක්ෂාව සහ ඩිජිටල් අවදානම් නිරාවරණයන් කෙරෙහි අවධානය යොමු කිරීම

ප්‍රතිපත්ති රාමුව	උපායමාර්ගික පෙළගැස්ම	අනුකූලතාව	අවදානම් කළමනාකරණය
තොරතුරු ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්ති, ප්‍රමිති සහ ක්‍රියා පටිපාටි	සමූහයේ සමස්ත ව්‍යාපාරික අරමුණු වලට අනුකූල වීම	දත්ත ආරක්ෂණ නීති ඇතුළුව රෙගුලාසි සහ අනුකූලතා ප්‍රමිතීන්	තොරතුරු තාක්ෂණ ආශ්‍රිත අවදානම් හඳුනා ගැනීම, නිරීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම (212 පිටුව බලන්න)

යහපාලන ව්‍යුහය

ලංකා බැංකුවේ ආයතනික යහපාලනය

අරමුණ: අභිප්‍රායෙන් යුතු දිශානතිය

අපේක්ෂිත කටයුතු පිළිබඳ පැහැදිලි මඟ පෙන්වීමක් ලබා දෙමින්, ආචාරධර්ම සහ අඛණ්ඩතාවයේ ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය ඉහළම තලයේ ස්ථාවරත්වය සපයයි. යහපාලන රාමු, ප්‍රතිපත්ති සහ අධීක්ෂණ ක්‍රමවේදයන් මඟින් මෙම මූලධර්ම තීරණ ගැනීමේ ක්‍රියාවලියට අන්තර්ගත කර ඇති අතර, එමඟින් හැසිරීම් හැඩගස්වන, විශ්වාසය ශක්තිමත් කරන සහ තිරසාර වටිනාකම් නිර්මාණයට සහාය වන ආචාරධාර්මික පදනමක් ගොඩනැඟේ.

වටිනාකම්

- ගනුදෙනුකාර කේන්ද්‍රීය වීම
- සියලු ආකාරයේ විවිධත්වයන්ට ගරු කිරීම
- ඉහළ මට්ටමේ ආචාරධර්ම, යහපාලනය සහ වෘත්තීයභාවය කෙරෙහි කැපවීම
- අනුගතවීම සහ නවෝත්පාදනය කෙරෙහි අවධානය යොමු කිරීම
- අපගේ සියලු ක්‍රියාවන්ට වගකිව යුතු වීම

යහපාලන යාන්ත්‍රණ

- නාමයෝජනා සහ යහපාලන කමිටුව
- විගණන කමිටුව
- වැකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව
- මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව
- සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව



නියාමන සහ ස්වේච්ඡා රාමු

- 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධන ("ආඥා පනත": ලෙස හැඳින්වේ)
- 1988 අංක 30 දරණ බැංකු පනත සහ පසුකාලීන සංශෝධන
- ආයතනික යහපාලනය පිළිබඳ 2024 අංක 5 දරණ බැංකු පනතේ උපදෙස්
- කොළඹ කොටස් වෙළඳපළේ අඛණ්ඩ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතා
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ හොඳම පිළිවෙත් සංග්‍රහය (2023)

ප්‍රතිපත්ති

- චර්යාධර්ම හා ආචාරධර්ම සංග්‍රහය
- අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්තිය
- විසිල්බ්ලෝවිං පිළිබඳ ප්‍රතිපත්තිය

ආයතනික සංස්කෘතිය

පද්ධතිමය වශයෙන් වැදගත්, රජයට අයත් ආයතනයක් සහ ජාතියේ මහා පහන් ටැඹ ලෙස, ලංකා බැංකුවේ අනිවාර්ය කාර්යභාරය වාණිජ කාර්යසාධනයෙන් ඔබ්බට ගොස් පුළුල් ජාතික බලපෑමක් දක්වා විහිදේ. එහි ආයතනික සංස්කෘතිය සාම්ප්‍රදායික වටිනාකම්, මහජන වගවීම සහ කාර්යක්ෂමතාවයේ සමතුලිතතාවයක් පිළිබිඹු කරන අතර එය සදාචාරාත්මක නායකත්වය සහ විනයගරුක යහපාලනය යන දෙකටම සහාය වේ. බැංකුවේ ආයතනික සංස්කෘතියේ ප්‍රධාන අංග වන්නේ;

- පුද්ගලාරෝපිත සේවාවන් සැපයීම සහ දිගුකාලීන සබඳතා පෝෂණය කිරීම මඟින් ගනුදෙනුකාර කේන්ද්‍රීයභාවය
- ජාතික අවශ්‍යතා සහ ආර්ථික සංවර්ධනයට ප්‍රමුඛත්වය
- තීරණ ගැනීමේදී තිරසාර වර්ධනය, පාරිසරික හා සමාජීය සලකා බැලීම් සමතුලිත කිරීම කෙරෙහි අවධානය
- අපගේ පිරිනැමීම්, නවෝත්පාදනය සහ නවීකරණය, තාක්ෂණය සහ ඩිජිටල් පරිවර්තනය වැකාබද්ධ කිරීම

චර්යාධර්ම හා ආචාරධර්ම

සේවකයින් සහ නිලධාරීන් නිල රාජකාරිවල, බාහිර කටයුතුවල හෝ පොදු සැකසුම්වල නිරත වන විට අපේක්ෂිත හැසිරීම් ප්‍රමිතීන් පැහැදිලිව දක්වා ඇති, චර්යාධර්ම සහ ආචාරධර්ම සංග්‍රහය බැංකුවේ ආචාරධර්ම සැලැස්ම ලෙස ක්‍රියා කරයි. ව්‍යාපාර හැසිරීම් සහ ආචාරධර්ම සංග්‍රහයක් අධ්‍යක්ෂ මණ්ඩලයට ද අදාළ වේ. පුද්ගලික ක්‍රියාකාරකම් වලින් බැංකුවේ කීර්තිනාමයට බලපෑමක් ඇති කළ හැකි බව හඳුනා ගනිමින්, ආයතනික කළමනාකරණ කණ්ඩායමට සහ සියලුම සේවකයින්ට වෙනම ආචාරධර්ම සංග්‍රහයක් අදාළ වේ.

අධ්‍යක්ෂවරයාගේ ව්‍යාපාර හැසිරීම් සහ ආචාරධර්ම සංග්‍රහය

අධ්‍යක්ෂවරුන් විසින් මෙම සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල වන බවට වාර්ෂික තහවුරු කිරීමක් ඉදිරිපත් කළ යුතුය. බැංකුවේ යහපත වෙනුවෙන් ක්‍රියා කිරීමට අධ්‍යක්ෂවරුන් දිරිමත් කරන අතරම, අඛණ්ඩතාව, විනිවිදභාවය සහ දූෂණ විරෝධී ශක්තිමත් සංස්කෘතියක් ප්‍රචාරය කිරීම මෙම සංග්‍රහයේ අරමුණයි.

සේවකයන්ගේ ආචාරධර්ම සංග්‍රහය

මෙය සියලුම සේවකයින්ට අදාළ වන අතර අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වකරුවන් සමඟ කටයුතු කිරීම, අල්ලස් සහ දූෂණ විරෝධී කටයුතු වලදී බැංකුවේ අපේක්ෂාවන් පැහැදිලිව දක්වා ඇත.

අල්ලස් හා දූෂණ විරෝධය

GRI 205-2

බැංකුවේ අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්තියේ පැහැදිලිවම සඳහන් වන්නේ අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රවේශය සහ මෙම අවදානම් කළමනාකරණය සංවිධානයේ ක්‍රියාවලීන්, රාමු සහ ප්‍රමිතීන් හරහා ඒකාබද්ධ කර ඇති බවයි. ප්‍රතිපත්තිය පැහැදිලිවම සියලුම සේවකයින්ට සන්නිවේදනය කරනු ලබන අතර නීතිපතා පුහුණුව සහ අභ්‍යන්තර සන්නිවේදනයන් හරහා ශක්තිමත් කරනු ලැබේ. 2003 අංක 9 දරණ දූෂණ විරෝධී පනත ක්‍රියාත්මක කිරීමෙන් පසුව, බැංකුව සිය පියවර ශක්තිමත් කිරීමට ද උත්සාහ කර ඇත. ඒ අනුව, වසර තුළ ක්‍රියාත්මක කරන ලද විවිධ පුහුණු වැඩසටහන් සමඟ බැංකුවේ අල්ලස් හා දූෂණ විරෝධී රාමුව සඳහා අධීක්ෂණ වගකීමක් සහිත විශේෂිත වූ අඛණ්ඩතා නිලධාරියෙකු පත් කරන ලදී.

පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය

දිගුකාලීන වටිනාකම් නිර්මාණය සහ වගවීම සඳහා සහාය වන ආකාරයෙන් බැංකුව එහි ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ කණ්ඩායම් හයෙහි අවශ්‍යතා ක්‍රමානුකූලව හඳුනා ගැනීම, සම්බන්ධ කර ගැනීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් කරුණු පිළිබඳ සැලකිලිමත් විය.

- අනුමත කිරීමේ ප්‍රතිපත්ති සහ පාර්ශ්වකරුවන් සමඟ අන්තර්ක්‍රියා මෙහෙයවන ක්‍රියා පටිපාටි
- උපායමාර්ග සහ තීරණ ගැනීමේදී නියැලීමේ ප්‍රතිඵල අධීක්ෂණය කිරීම සහ පාර්ශ්වකරුවන්ගේ අවබෝධයන් සුදුසු ලෙස සලකා බැලීම සහතික කිරීම.
- බොහෝ විට තරඟකාරී වන පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා තුලනය කිරීමේදී සාධාරණත්වය සහ විනිවිදභාවය ආරක්ෂා කිරීම
- පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්ව ක්‍රියාවලීන් සහ මතු කරන ලද ප්‍රධාන කරුණු පිළිබඳ පැහැදිලි, සම්බර වාර්තාකරණය ඇතුළුව උචිත හෙළිදරව් කිරීම් සහතික කිරීම. වසර තුළ මතු කරන ලද ප්‍රධාන සම්බන්ධතා යාන්ත්‍රණයන් සහ පාර්ශ්වකරුවන්ගේ සලකා බැලීම් මෙම වාර්තාවේ 57-60 පිටුවල ලැයිස්තුගත කර ඇත.

විසිල්බ්ලෝවිං ප්‍රතිපත්තිය

GRI 2-26

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විසිල්බ්ලෝවිං ප්‍රතිපත්තිය, අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වකරුවන්ට විභව සදාචාර විරෝධී හෝ නීති විරෝධී හැසිරීම් පිළිබඳ ගැටලු මතු කිරීමට ඵලදායී යාන්ත්‍රණයක් සපයයි.

මෙම ප්‍රතිපත්තිය රහස්‍යභාවය සහතික කරන අතර සොරකම්, වංචා, දූෂණ, අනිසි භාවිතය වැනි ගැටලු වාර්තා කිරීම දිරිමත් කරයි. බැංකුවේ වත්කම් සහ අක්‍රමිකතා ඇතුළු අනෙකුත් කරුණු පිළිබඳ තොරතුරු. ප්‍රතිපත්තියේ ප්‍රධාන අංග පහත දැක්වේ.

මාධ්‍යයන්

පාර්ශ්වකරුවන්ට තම ගැටලු/පැමිණිලි පුද්ගලිකව, WhatsApp, තැපෑල, විද්‍යුත් තැපෑල, දුරකථනය, ෆැක්ස්, වෙබ් අඩවිය, ඇමතුම් මධ්‍යස්ථානය හෝ ෆෙස්බුක් චැට් හරහා ඉදිරිපත් කළ හැකිය.

ක්‍රියාපටිපාටි

පැමිණිලි ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත යොමු කෙරේ. නියෝජ්‍ය මහා කළමනාකරණ ශ්‍රේණියේ හෝ ඊට ඉහළ සේවකයින්ට එරෙහි පැමිණිලි සඳහා, විගණන කමිටුවේ සභාපති වෙත පැමිණිලි ඉදිරිපත් කරනු ලැබේ. මූලික සමාලෝචනයකින් සහ තක්සේරුවකින් පසුව, දින දර්ශන දින 21 ක් ඇතුළත සියලුම පැමිණිලි විසඳීමට පියවර ගනු ලැබේ.

ආරක්ෂාව සහතික කිරීම

සම්පූර්ණ ක්‍රියාවලිය පුරාම රහස්‍යභාවය සහ නිර්නාමිකභාවය සහතික කෙරේ.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, වංචා, අභ්‍යන්තර වෙළඳාම, විශ්වාසය පළුදු වීම්, තරඟකාරී විරෝධී හැසිරීම්, වෙළඳපළ සාමාන්‍ය හැසිරීමට බාධා සිදු කිරීම්, අක්‍රමිකතා හෝ වෙනත් මූල්‍ය වෙළඳපළ සම්බන්ධිත නීති හෝ රෙගුලාසි හේතුවෙන් කිසිදු මූල්‍යමය අලාභයක් සිදු වී නොමැත.

ලංකා බැංකුවේ ආයතනික යහපාලනය

ඔරොත්තු දෙන සහ විනයගරුක කාර්යසාධනය GRI 2-18

බැංකුවේ ශක්තිමත් ආයතනික යහපාලන ව්‍යුහයන් සහ රාමු මඟින් විනයගරුක තීරණ ගැනීම සඳහා ශක්තිමත් පදනමක් සපයන අතර, එමඟින් වෙනස් වන මෙහෙයුම් තත්ත්වයන් මධ්‍යයේ වුවද සංවිධානයට කඩිසර බව සහ දරාගැනීමේ හැකියාව ලබා දී ඇත.


ව්‍යාපාරය සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයේ බැඳීම

ලංකා බැංකුව එහි උපායමාර්ගික න්‍යාය පත්‍රය මෙහෙයවන විට, වටිනාකම සහතික කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ඒ සමඟ සමීපව කටයුතු කරයි. පැහැදිලිව නිර්වචනය කරන ලද වාර්තාකරණ ව්‍යුහයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටි මඟින් බැංකුවේ උපායමාර්ගික ක්‍රියාත්මක කිරීම ඵලදායී ලෙස අධීක්ෂණය කිරීමට, බැංකුව සිය වර්ධන අභිලාෂයන් හඹා යන විට පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කරන අතරම වගකිවයුතු නායකත්වයට සහාය වීමට හැකියාව ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් යාන්ත්‍රණයන් හරහා ව්‍යාපාරය සමඟ සම්බන්ධ වේ:

- උපකමිටු 6 ක කාර්යයන් ඔස්සේ (2026 දී උපකමිටු අටක්) අධ්‍යක්ෂවරුන්ට නිශ්චිත කරුණු පිළිබඳව ගැඹුරු අවබෝධයක් ලබා ගත හැකිය.
- නායකත්ව කණ්ඩායම විසින් කාර්යසාධනය සහ අනෙකුත් අදාළ කරුණු පිළිබඳ මාසික යාවත්කාලීන කිරීම්
- අවශ්‍ය විටෙක විශේෂ රැස්වීම්

මෙම වාර්තාවේ 165 පිටුවේ තවදුරටත් විස්තර කර ඇති පරිදි, වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට ලක් වූ ප්‍රධාන ක්ෂේත්‍ර වලට පහත සඳහන් දෑ ඇතුළත් විය:



ජ්‍යෙෂ්ඨ කළමනාකරණය මත අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය

ව්‍යාපාරික උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම වගකිව යුතුය. ලංකා බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම විසින් බැංකුවේ ව්‍යාපාරික උපායමාර්ග, අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන්, පාලනයන් සහ ආයතනික සංස්කෘතිය අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත පදනම්ව ක්‍රියාත්මක කරනු ලබයි. එම කණ්ඩායම විසින් බැංකුව තුළ වගවීම සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කරන සුදුසු සංවිධාන ව්‍යුහයක් ස්ථාපිත කිරීම සහතික කරනු ලබන අතරම, ප්‍රමාණාත්මක සංවර්ධනයක් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය සහ උපකමිටු නිතිපතා යාවත්කාලීන කිරීමද සිදු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් යාන්ත්‍රණයන් හරහා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම පිළිබඳ අධීක්ෂණය සපයයි.

- උපායමාර්ගික අරමුණු වලට එරෙහිව ප්‍රගතිය සමාලෝචනය කිරීමේදී ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ නිතිපතා සම්බන්ධ වීම.
- ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සපයන ලද පැහැදිලි කිරීම් සහ තොරතුරු විවේචනාත්මකව සමාලෝචනය කිරීම.
- ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සාමූහික දැනුම සහ විශේෂඥතාව බැංකුවේ ප්‍රමාණයට සහ සංකීර්ණතාවයට අනුකූලව පවතීදැයි තක්සේරු කිරීම.
- ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ඔවුන්ගේ ක්‍රියාවන්ගේ වගකීමට නතු කරවීම

තිරසාරභාවය සහ ESG බලපෑම් කළමනාකරණය GRI 2-13

ESG බලපෑම කළමනාකරණය කිරීම, එහි පාරිසරික කළමනාකාරිත්වය සහ සමාජ වටිනාකම් නිර්මාණය තුළින් බැංකුවේ මූලික උපායමාර්ග සමඟ ඒකාබද්ධ කර ඇත. 5-84 පිටුවල තවදුරටත් සාකච්ඡා කර ඇති පරිදි, බැංකුවේ තිරසාරභාවය පිළිබඳ අභිලාෂයන් කේන්ද්‍රගත වී ඇත්තේ හරිත මූල්‍යකරණය මඟින් රටේ කාබන් සංක්‍රාන්තිය අවම කිරීමට සහාය වීමට සහ මූල්‍ය අන්තර්කරණය ඔස්සේ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් බලගැන්වීමට සහාය වීම සඳහාය. බැංකුවේ තිරසාරභාවය පිළිබඳ න්‍යාය පත්‍රය ඒක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්කවලට ද අනුකූල වේ. ආයතනය තුළ තිරසාරභාවය පිළිබඳ සලකා බැලීම් ගොනු කර ඇති බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධානතම වගකීම දරන අතර ESG අංශ වලට අදාළව බැංකුවේ උපායමාර්ග, ප්‍රතිපත්ති සහ ඉලක්කවලට එරෙහිව ප්‍රගතිය අනුමත කර වරින් වර සමාලෝචනය කරයි.

බැංකුවේ ESG බලපෑම් කළමනාකරණය කිරීමේදී, පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන්ද සලකා බලන බව සහතික කිරීම සඳහා ගනුදෙනුකරුවන්, සේවකයින් සහ ප්‍රජාවන් සමඟ විධිමත් පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්ව යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වේ. බැංකුවේ අරමුණු, ප්‍රතිපත්ති සහ මෙහෙයුම් එහි මෙහෙවර, වටිනාකම් සහ දිගුකාලීන තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ පෙළගැසී ඇති බව සහතික කිරීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය, උපායමාර්ගික සැලසුම්කරණය සහ තිරසාර මූලපිරීම්වල ප්‍රතිඵල සමාලෝචනය කර ඇගයීමට ලක් කරනු ලබයි.

මෙම ක්‍රියාවලීන්ගෙන් ලැබෙන ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සාකච්ඡා කරනු ලබන අතර තීරණ ගැනීම්, අවදානම් කළමනාකරණය සහ ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම් වලට එම ප්‍රතිඵල ඒකාබද්ධ කරනු ලබයි.

2025 දී සිදු කල ප්‍රධාන මැදිහත්වීම්

- වසර තුළ ප්‍රතිසංස්කරණය කරන ලද තිරසාර ප්‍රතිපත්තිය
- තිරසාරභාවය සහ දේශගුණය ආශ්‍රිත අවදානම් සහ අවස්ථා ඇතුළත් කිරීම සඳහා IRMC හි නියාමන බලතල පුළුල් කරන ලදී.
- SLFRS S1 සහ S2 යන තිරසාර අනාවරණයන් සඳහා වූ ප්‍රමිත සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය පුහුණු කිරීම.
- තිරසාරභාවය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය, කමිටුව 2026.01.01 දින සිට පිහිටු වීම.

තිරසාරභාවය පිළිබඳ කමිටුව

මෙම කමිටුවේ සමාලෝචන යාන්ත්‍රණයන් නිර්මාණය කර ඇත්තේ ණය යෝජනා බැංකුවේ තිරසාර අරමුණු සහ එම විභවය සමඟ සමපාත වන බවත්, බැංකුවේ ව්‍යාපාරික කටයුතු හා සම්බන්ධ පාරිසරික හා සමාජීය අවදානම් හැකිතාක් දුරට අවම වන බවත් සහතික කිරීම සඳහාය. තිරසාර කමිටුවේ කාර්යභාරයට පහත සඳහන් දෑ ඇතුළත් වේ.

1. යෝජිත ව්‍යාපාර ක්‍රියාකාරකම්වල විභව පාරිසරික හා සමාජීය බලපෑම් තක්සේරු කිරීම සඳහා ESDD වාර්තා පිළිබඳ පුළුල් සමාලෝචනයක් පැවැත්වීම.
2. ණය යෝජනා පිළිබඳව දැනුවත් ප්‍රතිපෝෂණ ලබා දීම, සියලු පාරිසරික හා සමාජීය අවදානම් නිසි ලෙස සලකා බැලීම සහතික කිරීම.
3. බැංකුවේ පාරිසරික සහ සමාජ කළමනාකරණ පද්ධතිය (ESMS) මෙකී අවදානම් කළමනාකරණය සහ ඇගයීම සඳහා රාමුවක් ලෙස භාවිතා කිරීම.

වේතන සමාලෝචනය

GRI 2-19, 20

බැංකුවේ වේතන රාමුව සැලසුම් කර ඇත්තේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම, විචක්ෂණශීලී අවදානම් කළමනාකරණය සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය සමඟ ප්‍රතිලාභ පෙළගස්වා තිරසාර කාර්යසාධනයට සහාය වීම සඳහා ය. එය අධික අවදානම් ගැනීම අධෛර්යමත් කිරීම සඳහා ආරක්ෂණ ක්‍රම ඇතුළත් කරන අතරම ආයතනය තුළ සාධාරණත්වය සහ සමානාත්මතාවය ප්‍රවර්ධනය කරයි.

වේතන යහපාලනය

මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව විසින් වේතන ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු සිදු කරනු ලැබේ. මෙම ප්‍රතිපත්ති රාමුවට අධ්‍යක්ෂවරයාගේ වේතන ප්‍රතිපත්තිය සහ KMP සඳහා වේතන ප්‍රතිපත්තිය ඇතුළත් වේ. මින් පළමුවැන්න, ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ සහ ලිපි සහ ආඥාපනත සහ එහි සංශෝධන පිළිබඳ විස්තර පිළිබිඹු කරයි. කිසිදු අධ්‍යක්ෂවරයෙකු ඔහුගේ/ ඇයගේ වේතන තීරණය කිරීමට සම්බන්ධ නොවන අතර වර්තමානයේ, වේතනය බැංකුවේ ආර්ථික, පාරිසරික සහ සමාජීය බලපෑම් කළමනාකරණයට සම්බන්ධ නොවේ.

මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව විසින් මහා කළමනාකාරතුමන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ වේතනය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරයි. මෙම නිර්දේශ මත පදනම්ව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා අනුමත කර අදාළ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලබන්නේ ආඥා පනතේ විධිවිධාන සහ එහි සංශෝධන වලට අනුකූලව අවසාන අනුමැතිය සඳහා ය. මහා කළමනාකාරතුමන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ වේතනය සෑම වසර තුනකට වරක් සමාලෝචනය කෙරේ.

- තරඟකාරී
- සාධාරණ
- විනිවිදභාවය
- ඇතුළත්

බැංකුවේ අගය කිරීමේ ප්‍රතිපත්තිය පහත සඳහන් ප්‍රතිඵල අත්කර ගැනීම අරමුණු කර ගෙන ඇත:

- ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය අත්දැකීම් සහ වටිනාකම් සහිත කුසලතා ඇති ශ්‍රම බලකායක් ආකර්ෂණය කර ගැනීම, පෙළඹවීම සහ රඳවා ගැනීම.
- සමාන වැටුප් සාධාරණත්වය සහ සාධාරණත්වය සහතික කිරීම සඳහා වේතන වැඩසටහන් සකස් කිරීමේදී විනිවිදභාවය.
- ආයතනික යහපාලනයේ මූලධර්ම වලට අනුකූලව කටයුතු කිරීම සහ අපගේ විවිධ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා ඵලදායී ලෙස සමතුලිත කිරීම.
- සංවිධානයේ වටිනාකම් වලට අනුකූල ආයතනික සංස්කෘතියක් ඇති කිරීම

වේතන අංග

බැංකුවේ වේතන ව්‍යුහයන්ගේ ප්‍රධාන අංග පහත දැක්වේ:

ස්ථාවර වැටුප

- කාර්යභාරය සහ සේවක ශ්‍රේණිය මත තීරණය වන මූලික වැටුප සහ අනෙකුත් ස්ථාවර සංරචක

විචල්‍ය ගෙවීම්

- දිරි දීමනා

ප්‍රතිලාභ සහ අවශ්‍යතා

- රැකියාවෙන් පසු ප්‍රතිලාභ
- විශේෂ යෝජනා ක්‍රම යටතේ ණය
- නිවාඩු නිකේතන පහසුකම් සඳහා ප්‍රවේශය.

වැඩිදුර විස්තර සඳහා, අධ්‍යක්ෂවරුන්ගේ වේතනය (පිටු 270) සහ KMP වේතනය (පිටු 434) යොමු වන්න. මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු වාර්තාව 184-185 පිටුවල ඇත.

විගණන කමිටු වාර්තාව

හැඳින්වීම

2025 අගෝස්තු 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි විගණන කමිටුවේ සභාපතිවරයා ලෙස මා පත් කිරීමෙන් පසු, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මෙම විගණන කමිටු වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මා හට ගෞරවයකි.

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ, හිටපු සභාපති ජයමින් පැල්පොල මහතාගේ දක්ෂ භාරකාරත්වය යටතේ විගණන කමිටුව සිය අධීක්ෂණ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම දිගටම කරගෙන ගියේය. ඔහුගේ නායකත්වය සහ ඔහුගේ ධුර කාලය තුළ සියලුම සාමාජිකයින් විසින් සිදු කරන ලද වටිනා දායකත්වයන් සඳහා කමිටුව සිය අවංක කෘතඥතාව පළ කරයි. බැංකුව පුරා යහපත් ආයතනික යහපාලනය, විනිවිදභාවය සහ මූල්‍ය විනය ප්‍රවර්ධනය කිරීම සඳහා කමිටුව සිය කැපවීම ස්ථිරව තබා ගනී.

බැංකුව පාලනය කරන නියාමන සහ පාලන රාමුවට අනුකූලව කමිටුව විසින් සිය වගකීම් ඉටු කිරීමේදී සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් මෙම වාර්තාවෙන් දක්වා ඇත.

කමිටුවේ සංයුතිය

1. **දර්ශන ගුණසේකර මහතා**
   සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ.
2. **ආචාර්ය කපිල සේනානායක**
   සාමාජික/ ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ.
3. **තුල්සි අළුවිහාරේ මහතා**
   සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ.

2025 වසර තුළ සාමාජිකත්වයේ වෙනස්වීම් නව පත්වීම්:

ජයමින් පැල්පොල මහතා*
විධායක නොවන අධ්‍යක්ෂ
2025.02.03 දින සිට බලපැවැත්වෙන පරිදි විගණන කමිටුවේ සභාපති ලෙස පත් කරන ලදී.

ආචාර්ය කපිල සේනානායක
සාමාජික/ ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ
2025.02.03 දින සිට බලපැවැත්වෙන පරිදි විගණන කමිටුවට පත් කරන ලදී.

ආචාර්ය අමල් ඉලේසිංහ*
සාමාජික/ විධායක නොවන අධ්‍යක්ෂ 2025.06.23 දින සිට බලපැවැත්වෙන පරිදි විගණන කමිටුවට පත් කරන ලදී.

දර්ශන ගුණසේකර මහතා
සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
2025.08.15 දින සිට බලපැවැත්වෙන පරිදි විගණන කමිටුවේ සභාපති ලෙස පත් කරන ලදී.

තුල්සි අළුවිහාරේ මහතා
සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ.
2025.12.17 දින සිට බලපැවැත්වෙන පරිදි විගණන කමිටුවට පත් කරන ලදී.

ඉල්ලා අස්වීම්:

ජයමින් පැල්පොල මහතා*
2025.05.30 දින සිට බලපැවැත්වෙන පරිදි විගණන කමිටුවේ සභාපති ධුරයෙන් ඉවත් විය.

ජෙහාන් ඉස්මයිල් මහතා*
2025.12.17 දින සිට බලපැවැත්වෙන පරිදි සාමාජික/ විධායක නොවන අධ්‍යක්ෂ: විගණන කමිටුවේ සාමාජික ධුරයෙන් ඉවත් විය.

ආචාර්ය අමල් ඉලේසිංහ*
2025.12.17 දින සිට බලපැවැත්වෙන පරිදි විගණන කමිටුවේ සාමාජික ධුරයෙන් ඉවත් විය.

*** කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නීති අනුව ස්වාධීන ලෙස සැලකේ.**

කමිටුවේ ලේකම්

විගණන කමිටුවට සහාය ලබා දෙන්නේ නීතිඥවරියක් වන සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකාරිණියක් ලෙස සේවය කරන ජානකි එස්. සිරිවර්ධන මහත්මිය විසිනි. ඇය ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරිය ලෙස සේවය කරන අතර, විගණන කමිටුවේද ලේකම්වරිය ලෙස ක්‍රියා කරයි.

අඛණ්ඩව සහභාගීවන්නන්

- ප්‍රධාන අභ්‍යන්තර විගණක
- ප්‍රධාන අනුකූලතා නිලධාරී
- සහකාර මහා කළමනාකරු (මෙහෙයුම් විගණන)
- සහකාර මහා කළමනාකරු (ණය විගණන)
- සහකාර මහා කළමනාකරු (විමර්ශන)
- සහකාර මහා කළමනාකරු (තොරතුරු පද්ධති විගණන)
- සහකාර මහා කළමනාකරු (අවදානම් කළමනාකරණය)
- අභ්‍යන්තර විගණක
- විගණකාධිපතිගේ නියෝජිතයන් (බැංකුවේ බාහිර විගණක)

ආරාධනයෙන් පමණක් සහභාගී වන්නන්

- මහා කළමනාකරු
- ප්‍රධාන මූල්‍ය නිලධාරී
- නියෝජ්‍ය මහා කළමනාකරු (මූල්‍ය හා සැලසුම්)
- ආයතනික හෝ විධායක කළමනානාකාරිත්වයේ ඕනෑම සාමාජිකයෙකු
- සේවක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකු

2025 වර්ෂය තුළ දී කමිටුව රැස්වූ වාර ගණන නවය කි.

(සාමාජික සහභාගීත්වය මෙම වාර්තාවේ පිටු අංක 173 හි දක්වා ඇත)

ගණපූරණය: සාමාජිකයන් හෝ බහුතර සාමාජිකත්වයෙන් වැඩිම අගය. නවතම සමාලෝචනයට අනුව, සහභාගී වන්නන්ගෙන් බහුතරය ස්වාධීන අධ්‍යක්ෂකවරුන් වේ.

කමිටුවේ කාර්යභාරය

විගණන කමිටු ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අනුගමනය කරනු ලබන අනුගමනය කරනු ලබන විගණන කමිටු ප්‍රඥප්තියේ සඳහන් කරුණු මත විගණන කමිටුවේ විෂය පථය සකස් කර ඇත.

ප්‍රධානතම අවධානය

මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පිළිබඳ ස්වාධීන හා විෂයානුබද්ධ සමාලෝචනය ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සිය කාර්යයන් ඉටු කිරීම සඳහා සහය දැක්වීම කෙරෙහි විගණන කමිටුව මූලිකව සිය අවධානය යොමු කර ඇත.

වාර්තාකරණ ක්‍රමවේදය

විගණන කමිටු රැස්වීම්වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට ඉදිරිපත් කෙරේ. එහිදී සියලු ප්‍රධාන කරුණු, ගන්නා ලද ක්‍රියාමාර්ග, අත්පත් කර ගත් හෝ අත්පත් කරගැනීමට ඇති ප්‍රතිඵල සහ පසු විපරම් ක්‍රියාමාර්ග පැහැදිලි කරගැනීම සඳහා සාකච්ඡා කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීම සිදු කෙරේ.

2025 වසර තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

මූල්‍ය වාර්තාකරණය

අ) ප්‍රධාන මූල්‍ය නිලධාරීගෙන් සහ මහා කළමනාකරුගෙන් ලැබුණු බැංකුවේ මාසික, කාර්තුමය සහ වාර්ෂිකව විගණනය නොකළ/ කළ මූල්‍ය ප්‍රකාශන සුපරීක්ෂණ හා නියාමන බලධාරීන් විසින් පනවන අදාළ ලද අවශ්‍යතා

හා ගිණුම්කරණ ප්‍රමිති හා අනුරූප වන පරිදි ප්‍රසිද්ධ කොට තිබෙන බව තහවුරු කරනු පිණිස මෙම ප්‍රකාශ සමාලෝචනය කළ අතරම බැංකුවේ මෙහෙයුම් සහ මූල්‍ය පාලනයන්හි ප්‍රමාණවත් බව සහ කාර්යක්ෂමතාව ද සහතික කරන ලදී.

ආ) ද්‍රවශීලතා කළමනාකරණය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව සහ විදේශ මුදල් කළමනාකරණය සමාලෝචනය කරන ලදී.

ඇ) සැලකිය යුතු මූල්‍ය වාර්තාකරණ ගැටලු සහ විනිශ්චයන් ඇගයීමට ලක් කරන ලදී.

නියාමන අනුකූලතාවය

අ) අනිවාර්ය බැංකු කටයුතු හා අනෙකුත් ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමඟ වූ අනුකූලතාවය සමාලෝචනය කරන ලදී.

ආ) නියාමකයින් විසින් පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණයන්ගෙන් හඳුනාගන්නා ලද කරුණු සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග වල ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.

ඇ) මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්ත විරෝධී ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා සමාලෝචනය කරන ලදී.

අභ්‍යන්තර පාලනය

අ) බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ වැඩි විනිවිදභාවයක් සහ අඛණ්ඩතාවයක්ද, ගිණුම්කරණයේ සහ අනෙකුත් අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බවද සහතික කිරීමේ අරමුණින් ගිණුම්කරණ ප්‍රතිපත්ති/ පද්ධති සහ අභ්‍යන්තර පාලන රාමුව සමාලෝචනය කරන ලදී.

ආ නිරන්තරව සහ අවශ්‍ය අවස්ථා වලදී මූල්‍ය හේතු විශ්ලේෂණ මත පද්ධති, පටිපාටි සහ අභ්‍යන්තර පාලන විධිවිධානවල ශක්තිමත්භාවය ඉහළ නැංවීම උදෙසා අවශ්‍ය සංශෝධන සිදු කරන ලදී.

ඇ) නියාමන අපේක්ෂාවන්ට අනුකූලව අවදානම් කළමනාකරණ රාමුව නිරීක්ෂණය කරන ලදී.

ඈ) අභ්‍යන්තර විගණන සොයාගැනීම් මත පදනම්ව අභ්‍යන්තර පාලනයන්හි වැඩිදියුණු කිරීම් නිර්දේශ කරන ලදී.

කමිටුව පහත සඳහන් දෑ හරහා අභ්‍යන්තර විගණන කාර්යය පිළිබඳ සහතිකය ලබා ගන්නා ලදී-

අභ්‍යන්තර විගණනය

අ) අභ්‍යන්තර විගණන ක්‍රියාමාර්ග, ස්වාධීනත්වය, වාස්තවිකත්වය සහ කාර්යසාධනය සමාලෝචනය කරන ලදී.

ආ) අභ්‍යන්තර පාලනයන්, අනුකූලව අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාශීලී ප්‍රවේශයක් ලෙස විගණන ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු කිරීම සඳහා උපායමාර්ග ගන්නා ලදී.

ඇ) කාලෝචිත හා අපක්ෂපාතී පරීක්ෂණ පවත්වමින් විනිවිදභාවය වගවීම සහ සදාචාරාත්මක ව්‍යාපාරික භාවිතයන් පවත්වා ගනිමින් අකටයුතුකම් පිළිබඳ පැමිණිලි ඵලදායී ලෙස කළමනාකරණය කළේය.

ඈ) බැංකුවේ ණය කළඹේ ගුණාත්මකභාවය ඇගයීම සහ ණය ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය මූලපිරිම් නිර්දේශ කිරීම.

ඉ) අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කර එය වසර පුරා ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාව සමාලෝචනය කළේය.

ඊ) 2025 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන ප්‍රතිපත්ති අනුමත කරන ලදී.

උ) අවශ්‍ය වෙනස්කම් සහිතව අභ්‍යන්තර විගණන අත්පොත අනුමත කරන ලදී.

ඌ) අභ්‍යන්තර පාලනයේ අධීක්ෂණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ මූලපිරිම්හි ප්‍රගතිය අධීක්ෂණය කරන ලදී.

එ) අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීමට ලක් කරන ලදී.

ඒ) පරිපාලිත ආයතනවල අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී.

ඔ) විදේශීය ශාඛාවල නියාමන බලධාරීන් සමඟ සාකච්ඡා

ඕ) භාණ්ඩාගාර ක්‍රියාකාරිත්වය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරුව, අපේක්ෂිත ණය අලාභ ආකෘති, සයිබර් ආරක්ෂාව, පරිත්‍යාගශීලීන් මත ලබා දී ඇති ණය නියෝජිත අරමුදල්, තොරතුරු තාක්ෂණ යහපාලනය, සේවා මට්ටමේ ගිවිසුම් සහ ව්‍යාපාර අඛණ්ඩතා පරීක්ෂණය පිළිබඳ විශේෂ සමාලෝචනය.

ඌ) ශාඛා ජාලය තුළ සිදු කරන ලද ණය විගණනවලදී හඳුනාගත් තීරණාත්මක නිරීක්ෂණයන් මත පදනම්ව අනාවරණය වූ රටා පිළිබඳ විශේෂ සමාලෝචනයක්.

බාහිර විගණනය

අ) රටේ ව්‍යවස්ථාව අනුව බාහිර විගණනය කරනු ලබන්නේ විගණකාධිපතිවරයා විසිනි. ඵලදායී ලෙස හා ස්වාධීනව බාහිර විගණන කටයුතු කරගෙන යන බවටත් විගණන ප්‍රවේශය හා ක්‍රියා පිළිවෙත අනුව විගණකාධිපතිගේ නියෝජිතයන් සමඟ අඛණ්ඩව සම්බන්ධතාවක් පවත්වා ගෙනයන බවටත් කමිටුව සහතික වේ.

ආ) විගණකාධිපතිගේ නියෝජිතයන් සමඟ "සංවෘත සාකච්ඡා" පැවැත්විණි.

සැලකිය යුතු ගැටලු සලකා බැලීම

වර්ෂය තුළ විගණන කමිටුව පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළේය.


- සයිබර් ආරක්ෂාව සහ තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම
- වංචා හඳුනාගැනීමේ යාන්ත්‍රණ වැඩි දියුණු කිරීම
- ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාවයන්ගෙන් මතුවන මෙහෙයුම් අවදානම් වලට මුහුණ දීම.

ඉදිරි දැක්ම

වර්ෂය තුළ විගණන කමිටුවේ කාර්යසාධනය සහ ඵලදායීතාවය පිළිබඳ වාර්ෂික තක්සේරුවක් සිදු කරන ලදී.

ඉදිරිය දෙස බලන විට, විගණන කමිටුව යහපාලනය සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම, 2026 සහ ඉන් ඔබ්බට විගණන කමිටු ප්‍රඥප්තියේ දක්වා ඇති අරමුණු සඳහා සහාය වීම සහ මූල්‍ය අඛණ්ඩතාව, අවදානම් කළමනාකරණය සහ නියාමන අනුකූලතාව පිළිබඳ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීම දිගටම කරගෙන යනු ඇත.

විගණන කමිටුව වෙනුවෙන්.



දර්ශන ගුණසේකර මහතා
සභාපති,

විගණන කමිටුව
2026 පෙබරවාරි 24

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

2025 දී කමිටු සංයුතිය

2025 වර්ෂය තුළ කමිටුවේ සංයුතිය පහත පරිදි විය.

2025.01.01 දින සිට

1. **ජයමින් පැල්පොල මහතා***
   සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ
2. **ජෙහාන් ඉස්මයිල් මහතා***
   සාමාජික/ විධායක නොවන අධ්‍යක්ෂ
3. **ආචාර්ය කපිල සේනානායක**
   සාමාජික/ ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

2025.02.03 දින සිට

1. **ආර් එම් පී රත්නායක මහතා***
   සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ
2. **ජයමින් පැල්පොල මහතා***
   සාමාජික/ විධායක නොවන අධ්‍යක්ෂ
3. **කාවින්ද ද සොයිසා මහතා***
   සාමාජික/ විධායක නොවන සභාපති

2025.06.23 සිට

1. **ආර් එම් පී රත්නායක මහතා***
   සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ
2. **කාවින්ද ද සොයිසා මහතා***
   සාමාජික/ විධායක නොවන සභාපති
3. **ආචාර්ය කපිල සේනානායක**
   සාමාජික/ ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

වර්තමාන කමිටුව

2026.01.01 දින සිට

1. **ආර් එම් පී රත්නායක මහතා***
   සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ
2. **ශාමිනී රත්වත්ත මහත්මිය**
   සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
3. **දර්ශන් ජයරත්න මහතා**
   සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
4. **සුනිමල් වීරසූරිය මහතා**
   සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

*** කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නීතිරීතිවලට අනුව ස්වාධීන ලෙස සැලකේ.**

2025 වර්ෂය තුළදී කමිටුව රැස්වූ වාර ගණන අටකි.

(සාමාජික සහභාගිත්වය මෙම වාර්තාවේ පිටු අංක 173 හි දක්වා ඇත)

ගණපූර්ණය කමිටු සාමාජිකයින්ගෙන් අඩක්වත් අවම වශයෙන් සමන්විත විය යුතුය.

කමිටුවේ ලේකම්

ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් වන, නීතිඥවරයෙක් සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකාරිණියක් වන ජානකි එස්. සිරිවර්ධන මහත්මිය කමිටුවේ ලේකම්වරිය ලෙස කටයුතු කරයි.

සැලසුම් ඇතුළුව අවදානම් කළමනාකරණයේ සියලු අංශ ඇගයීමට කමිටුව අවම වශයෙන් කාර්තුමය වශයෙන් රැස්විය යුතුය.

අබණ්ඩව සහභාගීවන්නන්

- මහා කළමනාකරු
- ප්‍රධාන අවදානම් නිලධාරී
- ප්‍රධාන අභ්‍යන්තර විගණක
- ප්‍රධාන අනුකූලතා නිලධාරී
- ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරී
- අධ්‍යක්ෂ මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකු/ කමිටුව විසින් ආරාධනා කරන ආයතනික හෝ විධායක කළමනාකාරිත්වයේ ඕනෑම සාමාජිකයෙකු හෝ සේවක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකු

කමිටුවේ කාර්යභාරය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අනුගමනය කරනු ලබන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තියේ සඳහන් කරුණු මත ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ විෂය පථය සකස් කර ඇත.

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ 2024 අංක 05 දරණ බැංකු පනතේ නියෝගවල අවශ්‍යතා සහ ඊට අයත් ක්‍රියාමාර්ග වල විෂය පථය ආවරණය සම්බන්ධයෙන්ද කමිටුව සහතික කරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ප්‍රඥප්තියෙහි හඳුනාගෙන ඇති පහත කරුණු සමාලෝචනය කිරීම සහ/හෝ නිර්දේශ කිරීම මෙයට ඇතුළත් වේ.

- අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවයට අදාළ ප්‍රතිපත්ති, සහ කළමනාකරණ කමිටු ප්‍රඥප්ති.
- ප්‍රධාන අවදානම් නිලධාරී විසින් නිර්දේශ කර ඇති පරිදි ණය, වෙළඳපළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් තොරතුරු ආරක්ෂාව සහ වෙනත් අවදානම් සඳහා අභිරුචිය ඇති කරන අවදානම් සීමාවන් සහ ප්‍රතිපත්ති.
- විශේෂිත අවදානම් පාලනය කිරීම සඳහා සහ කමිටුව විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමාවන් තුළ එම අවදානම් කළමනාකරණය කිරීම සඳහා සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය.
- විදේශීය ශාඛා සහ අනුබද්ධ ආයතන ඇතුළුව බැංකුවේ අවදානම් පැතිකඩ පිළිබඳ අවදානම් කළමනාකරණ වාර්තා මෙන්ම වත්මන් වෙළඳපළ සහ නියාමන අවදානම් සහ වේවැනි අවදානම් හඳුනා ගැනීම, මැනීම, අධීක්ෂණය සහ පාලනය සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග.
- බැංකුවේ ප්‍රතිපත්ති, නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා මත කමිටුව විසින් තීරණය කරන ලද කළ විචක්ෂණ මට්ටම් ඉක්මවා අවදානම් ඇති අවස්ථාවක නිශ්චිත අවදානම් වල බලපෑම් අවම කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග.
- ණය, වෙළඳපළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් තොරතුරු ආරක්ෂාව සහ වෙනත් අවදානම් සම්බන්ධ අවදානම් හඳුනාගැනීම, මැනීම, අධීක්ෂණය සහ අවම කිරීමෙහි ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය.

ප්‍රධාන අවධානය

අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම් කළමනාකරණයේ සියලුම අංශයන් සඳහා සිය සුපරීක්ෂක වගකීම් ඉටු කරන්නට සහය වීමට කමිටුව ප්‍රධාන ලෙසම වග බලා ගනී. මේ සම්බන්ධයෙන් කමිටුව අවදානම් කළමනාකරණ රාමුවේ පැවැත්ම, ක්‍රියාකාරිත්වය සහ කාර්යක්ෂමතාව සහතික කරන අතර උචිත අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු හරහා ණය, වෙළඳපළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම්, තොරතුරු ආරක්ෂාව සහ උපායමාර්ගික අවදානම් තක්සේරු කර සමාලෝචනය කරයි. ව්‍යාපාර මෙහෙයුම්වල සියලුම ක්ෂේත්‍රවල නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ සහ අනුමත ප්‍රතිපත්ති සමඟ බැංකුවේ අනුකූලතාවය තක්සේරු කිරීම කෙරෙහි කමිටුව තවදුරටත් අවධානය යොමු කරයි.

බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව අධීක්ෂණය කිරීමේ වගකීම් වලට අමතරව, කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල තිරසාර කමිටුව ලෙසද කටයුතු කළේය. පාරිසරික, සමාජීය සහ යහපාලන (ESG) අවදානම් කළමනාකරණය කිරීම සඳහා බැංකුවේ ප්‍රවේශය අධීක්ෂණය කිරීම, තිරසාරභාවය පිළිබඳ උපායමාර්ගය මෙහෙයවීම සහ අදාළ හෙළිදරව් කිරීම්වල අඛණ්ඩතාව සහතික කිරීමද කමිටුව විසින් සිදු කරනු ලැබේ. මෙම ද්විත්ව භූමිකාව බැංකුවේ තිරසාර මූල්‍යකරණයට, වගකීම් සහගත බැංකුකරණයට සහ පරිවර්තනය වෙමින් පවතින නියාමන හා පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන්ට ඇති කැපවීමට සහාය වේ.

වාර්තාකරණ ක්‍රමවේදය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට ඉදිරිපත් කෙරෙන අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

අවදානම් සීමාවන්

- අවදානම් අංශය විසින් ඉදිරිපත් කරන ලද අවදානම් වාර්තා හරහා බැංකුවේ අවදානම් අභිරුචිය අනුමත කරන ලද මට්ටමට සාපේක්ෂව සිදුව ඇති ව්‍යතිරේක, අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ අවදානම් අභිරුචි සීමා සමාලෝචනය.
- බැංකුවේ ස්ථාපිත කර ඇති සීමා කළමනාකරණ රාමුවේ ව්‍යතිරේක ඒවායේ යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් යෝජනා කරන ලද ක්‍රියාමාර්ග සමඟ දැඩි ලෙස නිරීක්ෂණය කරන ලදී.
- ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි.
- ව්‍යාපාර හෝ නියාමන අවශ්‍යතා මත පදනම් වූ අවශ්‍ය සංශෝධන සහිතව, විදේශීය ශාඛා ප්‍රතිපත්ති ඇතුළුව අවදානම් සම්බන්ධ සියලුම ප්‍රතිපත්ති අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කළේය.
- නිශ්චිත අවදානම් සම්බන්ධයෙන් කටයුතු කරන සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල නිර්දේශිත නියමයන් සමාලෝචනය කර සංශෝධනය කරන ලදී.
- මෙම කමිටු තමන්ට නියමිත කාර්යභාරයන්ට අනුව කාර්යක්ෂමව ක්‍රියා කරන්නේද යන්න ඇගයීම සිදු කර, ඒවා ආයතනික ඉලක්ක සමඟ සමාන වේද යන්න තහවුරු කරන ලදී.

ද්‍රවශීලතාවය

ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟ, කාලෝචිත උපායමාර්ගික තීරණ හේතුවෙන් දේශීය සහ විදේශ මුදල් වල ශක්තිමත් ද්‍රවශීලතා මට්ටමක් ගොඩනගා ගැනීමට බැංකුවට හැකි විය.

වත්කම්වල ගුණාත්මකභාවය

වසර තුළ ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු වීමත් සමඟ ණය ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී. වත්කම්වල ගුණාත්මකභාවය පිළිබඳ සාකච්ඡා බහුවිධ විය. දැඩි අධීක්ෂණයක් සහ නිරන්තර වාර්තාකරණයක් සහිත ණය ගුණාත්මක ඒකකය හරහා ණය ගුණාත්මකභාවය අධීක්ෂණය කරන අතරම, අක්‍රීය ණය ප්‍රමාණයේ වර්ධනය සීමා කිරීම සඳහා පුළුල් සැලැස්මක් සකස් කරන ලදී. මේ අනුව ගනුදෙනුකරුවන් පුනර්ජීවනය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

අනුකූලතාවය

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, බැංකුව නව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (ALM) පද්ධතියක් ප්‍රසම්පාදනය කළ අතර, එහි ක්‍රියාත්මක කිරීම ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් සමීපව නිරීක්ෂණය කර සාර්ථකව සම්පූර්ණ කරන ලදී.

රටේ අනාගත අන්‍යෝන්‍ය ඇගයීම් ක්‍රියාවලියේදී ලංකා බැංකුවෙන් අපේක්ෂා කරන වැදගත් භූමිකාව සැලකිල්ලට ගනිමින්, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) බැංකුවේ සූදානම සමීපව අධීක්ෂණය කරන ලදී.

පරිපාලිත අවදානම් සමාලෝචනය

- පරිපාලිත සමාගම්වල අවදානම් පැතිකඩ තහවුරු කර ගැනීම සඳහා පුළුල් අවදානම් සමාලෝචන සිදු කරන ලද අතර බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට අනුකූල වීම සහතික කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) සහ ප්‍රතිසාධන සැලැස්ම

- ස්ථම්භ II අවදානම් සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගැනීමට සහ බැංකුවේ ආතතිය පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියට ඔරොත්තු දීමට ලංකා බැංකු සමූහයේ ICAAP සමාලෝචනය කර නිර්දේශ කරන ලදී.
- අනතුරු ඇඟවීම් සහ ප්‍රේරක සිදුවීම් පිළිබඳ කළමනාකරණය විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග විස්තරාත්මකව සාකච්ඡා කරන ලදී.
- ප්‍රාග්ධන වර්ධන සැලැස්ම සංශෝධනය කර, හිඟතා පුරවා ගැනීම සඳහා විකල්ප ප්‍රාග්ධන මූලාශ්‍ර හඳුනාගන්නා ලදී.

තිරසාර මූලපිරීම්


- ණය ඇගයීම් සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් තුළ පාරිසරික, සමාජීය සහ යහපාලන (ESG) කරුණු ඒකාබද්ධ කිරීම මඟින්, බැංකුවේ තිරසාර මූල්‍යකරණයට ඇති කැපවීම තවදුරටත් වර්ධනය කරන ලදී.
- දිගුකාලීන ආර්ථික ස්ථිරතාවය, පාරිසරික ආරක්ෂාව සහ සමාජීය සුභසාධනයට දායක වන ව්‍යාපෘතිවලට සහාය වීමට වගකීමෙන් යුත් ණය දීමේ ක්‍රමවේද සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති ශක්තිමත් කරන ලදී.
- ජාතික තිරසාර ඉලක්ක සමඟ සමපාත වන පරිදි, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සහ පරිසර හිතකාමී ව්‍යාපාර ඇතුළු හරිත මූල්‍යකරණ අවස්ථා ප්‍රවර්ධනය කරන ලදී.
- ගනුදෙනුකරුවන්, සේවකයින් සහ ප්‍රජාවන් හරහා තිරසාරභාවය පිළිබඳ මූලධර්ම පිළිබඳ අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කරන ලදී
- ප්‍රවේශාත්මක සහ තිරසාර වර්ධනයට දායක වන අතරම පාරිසරික හා සමාජීය අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා බැංකුවේ කාර්යභාරය ශක්තිමත් කරන ලදී.

තොරතුරු ආරක්ෂාව/ තොරතුරු තාක්ෂණ අවදානම

- සංවේදී දත්තවල රහස්‍යභාවය සහ අඛණ්ඩතාව සහතික කරන අතරම ගනුදෙනුකරුවන්ට බාධාවකින් තොරව බැංකු අත්දැකීම් සහතික කිරීම සඳහා ශක්තිමත් තොරතුරු ආරක්ෂණ සහ තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදී.
- ප්‍රධාන අවදානම් නිලධාරියා (CRO) 2025 දී බැංකුවේ සේවයෙන් විශ්‍රාම ගත් අතර, පසුව මෙම කමිටුවේ නිර්දේශය මත වැඩබලන ප්‍රධාන අවදානම් නිලධාරියෙකු පත් කරන ලදී. හිටපු ප්‍රධාන අවදානම් නිලධාරී කමිටුවට ලබා දුන් වටිනා දායකත්වය වෙනුවෙන් කමිටුව සිය කෘතඥතාව පළ කරන ලදී.
- ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වූ මෙම කමිටුවේ හිටපු සභාපති සහ සාමාජික ජයමින් පැල්පොල මහතා මෙම කමිටුවට ලබා දුන් වටිනා දායකත්වය වෙනුවෙන් කමිටුව ඔහුට කෘතඥතාවය පළ කරයි.

සමාප්තිය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව 2025 සඳහා එහි කාර්යයන් සාර්ථකව නිම කරමින්, විවිධ ක්ෂේත්‍ර හරහා අවදානම් තක්සේරු කිරීම සහ අවම කිරීම, නියාමන ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සහ සංවිධානය පුරා ශක්තිමත් අවදානම්-දැනුවත් සංස්කෘතියක් පෝෂණය කිරීම සිදු කරන ලදී. කමිටුව ලංකා බැංකුවේ මූල්‍ය ඒකාග්‍රතාව ආරක්ෂා කිරීම සඳහා කැපවී සිටියි. සවිස්තරාත්මක අවදානම් අවම කිරීමේ උපායමාර්ග, ක්‍රියාකාරී පියවරයන් සමඟින් ඉදිරි අභියෝග සඳහා මුහුණ දීමට බැංකුව මැනවින් ස්ථානගත කරයි. එසේම නිරන්තරයෙන් විකාශය වන බැංකු ක්ෂේත්‍රයේ නව්‍යතාවයන් මත ව්‍යාපාර කටයුතු වර්ධනය කර ගැනීමටත් තිරසාර වර්ධනය උදෙසා කැපවීමටත් කමිටුව නිරතුරුව කටයුතු කරයි.



ආර් එම් පී රත්නායක මහතා
සභාපති,

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව.
2026 පෙබරවාරි 24

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව

GRI 2-19, 20

2025 දී කමිටු සංයුතිය

2025 වර්ෂය ආරම්භයේ දී කමිටුවේ සංයුතිය:

1. **ජෙහාන් ඉස්මයිල් මහතා***
   සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ
2. **කාවින්ද ද සොයිසා මහතා***
   සාමාජික/ විධායක නොවන සභාපති
3. **ආචාර්ය කපිල සේනානායක**
   සාමාජික/ ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

වර්තමාන කමිටුව

2026.01.01 දින සිට

1. **ජෙහාන් ඉස්මයිල් මහතා***
   සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ
2. **කාවින්ද ද සොයිසා මහතා***
   සාමාජික/ විධායක නොවන සභාපති
3. **දර්ශන් ජයරත්න මහතා**
   සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

*** කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නීතිරීතිවලට අනුව ස්වාධීන ලෙස සැලකේ.**

කමිටුවේ ලේකම්

ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් වන, නීතිඥවරියක් සහ ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකාරිණියක් වන ජානකි එස්. සිරිවර්ධන මහත්මිය කමිටුවේ ලේකම්වරිය ලෙස කටයුතු කරයි.

අබණ්ඩව සහභාගීවන්නන්

- මහා කළමනාකරු
- නියෝජ්‍ය මහා කළමනාකරු (මානව සම්පත්)
- ආයතනික හෝ විධායක කළමනාකාරිත්වයේ ඕනෑම සාමාජිකයෙකු

2025 වර්ෂය තුළදී කමිටුව රැස්වූ වාර ගණන අටකි.

(සාමාජික සහභාගීත්වය මෙම වාර්තාවේ පිටු අංක 173 හි දක්වා ඇත)

ගණපූර්ණය සඳහා කමිටු සාමාජිකයින්ගෙන් අඩක්වත් අවම වශයෙන් සමන්විත විය යුතුය.

කමිටුවේ කාර්යභාරය

කමිටුවේ ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ ශ්‍රී ලංකාව තුළ ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය පිළිබඳ බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2024 අංක 05 දරණ නියාමනයන් මත මූලික වශයෙන් පදනම් වී ඇති අතර එය පහත පරිදි වේ:

- බැංකුවේ අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී, සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සම්බන්ධයෙන් වූ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා හා සේවය අවසන් කිරීමේදී හෝ විශ්‍රාම ගැනීමේදී ලබා දෙන විශේෂ ගෙවීම්/ ප්‍රතිලාභ සහ අනෙකුත් මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ) නිගමනය කිරීම.
- අධ්‍යක්ෂවරුන්, මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අරමුණු හා ඉලක්ක නියම කිරීම.
- මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත ලබාදුන් අරමුණු හා ඉලක්ක වල කාර්යසාධනය කාල පදනමක් මත ඇගයීම හා කාර්යසාධනය මත පදනම් වූ දිරි දීමනා තුළ පාරිශ්‍රමික, ප්‍රතිලාභ හා අනෙකුත් ගෙවීම් සංශෝධනය කිරීමේ පදනම නිශ්චය කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවට යොමු කළ කාර්ය මණ්ඩලය අදාළ කරුණු සමාලෝචනය.
- බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිය හා සංවිධානය ව්‍යුහය නිශ්චය කිරීම.

ප්‍රධානතම අවධානය

ප්‍රධාන කළමනාකරණ පිරිස් ඇගයීම පිළිබඳව මානව සම්පත් ගැටළු විසඳීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට උපකාරී වීම පිළිබඳව මෙම කමිටුව අවධානය යොමු කරයි.

වාර්තාකරණ ක්‍රමවේදය

කමිටු රැස්වීම්වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරෙන අතර කමිටුවේ නිර්දේශයන්ට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

2025 වර්ෂය තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

බැංකු ආඥා පනතේ නියෝග අනුව, සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය මෙම කමිටුව විසින් නිශ්චය කළ යුතුය. කෙසේ වුවත් ලංකා බැංකුව සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික තීරණය කරනු ලබන්නේ එහි එකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ හා උපදෙස් අනුවය. මෙහිදී 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා ඊට කළ සංශෝධනයන් ද සැලකිල්ලට ගනු ලැබේ. අධ්‍යක්ෂවරුන් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමික පිළිබඳ විස්තර, මෙම වාර්ෂික වාර්තාවේ 270 වන පිටුවේ දක්වා ඇත.

ඉහත දැක්වෙන පදනම්න් පිළියෙළ කළ, රජය විසින් නව රෙගුලාසි නිකුත් කරන විට අවශ්‍ය වන පරිදි සංශෝධනය කරනු ලබන පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් බැංකුව සතුව ඇත. අධ්‍යක්ෂවරුන් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමික පිළිබඳ විස්තර, වාර්ෂික වාර්තාව තුළින් වාර්ෂික පදනමකින් අනාවරණය කෙරේ.

ප්‍රධාන කළමනාකරණ පිරිස් හි වේතන

ලංකා බැංකු ආඥාපනතේ විධිවිධාන වලට අනුව බැංකුව, විෂය පථයට අයත් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව, සේවකයින්ගේ වේතනය වසර තුනකට වරක් සංශෝධනය කෙරේ.

කාර්යසාධන ඇගයීම

මහා කළමනාකාරතුමාද ඇතුළුව ප්‍රධාන අනුකූලතා නිලධාරී, ප්‍රධාන අවදානම් නිලධාරී සහ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්යසාධන වාර්තා හැර ප්‍රධාන කළමනාකරණ පිරිසේ කාර්යසාධන වර්තා මෙම කමිටුව විසින් සමාලෝචනය කරයි. අනෙකුත් ඉහත සඳහන් නිලධාරීන්ගේ කාර්යසාධනය ඔවුන්ගේ රාජකාරීන්ට අදාළ උපකමිටුව මගින් සිදු කරයි. උපායමාර්ගික සැලැස්මට අනුකූලව වර්ෂය ආරම්භයේ නියමකර ඇති ඉලක්ක මත පදනම්ව කමිටුව විසින් මෙම ඇගයීම් වාර්ෂිකව සිදු කරනු ලැබේ.

ඉලක්ක සහ අරමුණු

කමිටුව 2025 වසර සඳහා ආයතනික කළමනාකාරිත්වය හා මහා කළමනාකරුගේ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) සමාලෝචනය කොට නිර්දේශ කළේය. ප්‍රධාන අනුකූලතා නිලධාරී, ප්‍රධාන අවදානම නිලධාරී සහ කළමනාකරණය සහ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ ප්‍රධාන කාර්යසාධක දර්ශක අදාළ කමිටු වෙත ඉදිරිපත් කර ඇති අතර මෙය වාර්ෂිකව සිදුවේ.

බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත කාර්යසාධනය මත පදනම් වූ ගෙවීම් සඳහා ප්‍රතිලාභ නැවත අයකර ගැනීමේ ප්‍රතිපත්තිය ස්ථාපිත කරන ලදී.

වසර තුළ සමාලෝචනය කරන ලද හෝ සංශෝධනය කරන ලද ප්‍රතිපත්ති/ ප්‍රඥප්ති කිහිපයක් සහ සම්මත කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරන ලදී.

ඉදිරි දැක්ම

බැංකුවේ උපායමාර්ගික දිශානතිය සහ නිරතුරු වෙනස් වන ව්‍යාපාරික අවශ්‍යතා සමඟ පෙළගැස්වීම සහතික කිරීම සඳහා කමිටුව බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්ති සහ භාවිතයන් සමාලෝචනය කර ශක්තිමත් කිරීමට කටයුතු කරනු ඇත.

පසුගිය වසරේ අනුගමනය කරන ලද ප්‍රවේශයට අනුකූලව, කමිටුව කාර්යසාධන කළමනාකරණ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම, ආයතනික සහ විධායක කළමනාකාරිත්වය සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩලයේ උසස්වීම් සහ සංවර්ධනය සඳහා විනිවිදභාවයකින් යුතු හා ව්‍යුහගත රාමුවක් සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

තවද, කමිටුව ඩිජිටල් ඉගෙනුම් වේදිකා වැඩිදියුණු කිරීම ඇතුළුව සේවක සහභාගීත්වය, දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණයන් සහ පුහුණුව සහ සංවර්ධනයට අදාළ මූලපිරීම් සඳහා අඛණ්ඩව සහාය දක්වන අතර, ප්‍රධාන කළමනාකරණ පිරිස් සම්බන්ධ සියලු කරුණු යහපාලන සහ නියාමන අපේක්ෂාවන්ට අනුකූලව පවතින බව සහතික කරයි.

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වෙනුවෙන්.



ජෙහාන් ඉස්මයිල් මහතා
සභාපති,

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

2026 පෙබරවාරි 24

නාමයෝජනා සහ යහපාලනය පිළිබඳ කමිටු වාර්තාව GRI 2-10

2025 දී කමිටු සංයුතිය

2025.01.01 දින සිට කමිටුවේ සංයුතිය:

1. **ජෙහාන් ඉස්මයිල් මහතා***
   සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ
2. **කාවින්ද ද සොයිසා මහතා***
   සාමාජික/ විධායක නොවන සභාපති
3. **ආචාර්ය කපිල සේනානායක**
   සාමාජික/ ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

2025.02.03 දින සිට

1. **ජෙහාන් ඉස්මයිල් මහතා***
   සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ
2. **කාවින්ද ද සොයිසා මහතා***
   සාමාජික/ විධායක නොවන සභාපති
3. **ආර් එම් පී රත්නායක මහතා**
   සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

වර්තමාන කමිටුව

2026.01.01 දින සිට

1. **ජෙහාන් ඉස්මයිල් මහතා***
   සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ
2. **කාවින්ද ද සොයිසා මහතා***
   සාමාජික/ විධායක නොවන සභාපති
3. **ආර් එම් පී රත්නායක මහතා***
   සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
4. **ඉංජිනේරු මහාචාර්ය ආනන්ද ජයවර්ධන**
   සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
5. **දර්ශන ගුණසේකර මහතා**
   සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

*** කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නීතිරීතිවලට අනුව ස්වාධීන ලෙස සැලකේ.**

කමිටුවේ ලේකම්

ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් වන, නීතිඥවරියක් සහ ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකාරිණියක් වන ජානකි එස්. සිරිවර්ධන මහත්මිය කමිටුවේ ලේකම්වරිය ලෙස කටයුතු කරයි.

ආරාධනයෙන් සහභාගිවන්නන්

- මහා කළමනාකරු
- කමිටුවේ අභිමතය පරිදි කළමනාකාරිත්වයේ ඕනෑම සාමාජිකයෙකු

2025 වසරේදී පැවති රැස්වීම්: 14

(සාමාජික සහභාගීත්වය මෙම වාර්තාවේ පිටු අංක 173 හි දක්වා ඇත)

ගණපූරණය: ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ සාමාජිකයින්ගේ සංඛ්‍යාව හෝ බහුතරය (ඉහළ අගය) ගණපූරණය විය යුතුය.

කමිටුවේ කාර්යභාරය

නාමයෝජනා සහ යහපාලන කමිටු ප්‍රඥප්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අනුගමනය කරනු ලබන නාමයෝජනා සහ යහපාලනය පිළිබඳ කමිටු ප්‍රඥප්තියේ සඳහන් කරුණු මත නාමයෝජනා සහ යහපාලනය පිළිබඳ කමිටුවේ විෂය පථය සකස් කර ඇත.

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ බැංකු පනතට අදාළ නියෝග වල අවශ්‍යතාවය හා ඊට අයත් ක්‍රියාමාර්ග වල විෂය පථය ආවරණය වීම සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ හොඳම පරිචය පිළිබඳ සංග්‍රහය සම්බන්ධයෙන් ද අලුතින් හඳුන්වා දුන් කොළඹ කොටස් වෙළඳපල ලැයිස්තුගත කිරීමේ නීතිරීතිවල 9 වැනි වගන්තිය සම්බන්ධයෙන් ද කමිටුව සහතික කරයි.

ප්‍රධානතම අවධානය

නාමයෝජනා සහ යහපාලනය පිළිබඳ කමිටුව නීතියෙන් නියම කර ඇති යහපාලන මූලධර්මයන්ට අනුකූල බවට සහතික කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වන අතරම මහා කළමනාකරු/ ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් පත් කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.

වාර්තාකරණ ක්‍රමවේදය

නාමයෝජනා සහ යහපාලනය පිළිබඳ කමිටු රැස්වීම්වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරෙන අතර කමිටුව විසින් කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

2025 වර්ෂය තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

කමිටුව බැංකුවේ යහපාලන රාමුව සහ නියාමන පෙළගැස්ම අඛණ්ඩව ශක්තිමත් කරගෙන ගියේය.

අධ්‍යක්ෂවරුන් පත්කිරීමේ ප්‍රතිපත්තිය

මෙම කමිටුව මඟින් අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් පත් කිරීම පහසු කරවීම සඳහා, අධ්‍යක්ෂවරුන් පත් කිරීම සම්බන්ධ ප්‍රතිපත්තිය සංශෝධනය කරන ලදී.

ආයතනික යහපාලනය

වෙනස් වන නියාමන අපේක්ෂාවන් සහ හොඳම යහපාලන පිළිවෙත් සමඟ පෙළගැස්වීම සහතික කිරීම සඳහා බැංකුව තුළ ආයතනික යහපාලන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන අතර එය නිරන්තරයෙන් සමාලෝචනය කර යාවත්කාලීන කරනු ලැබේ. 2025 වසර තුළදී, මෙම රාමුව යටතේ ප්‍රතිපත්ති කිහිපයක් සමාලෝචනය කරන ලදී.

යහපාලන පිළිවෙත් නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වන බව කමිටුව සහතික කළේය.

අධ්‍යක්ෂවරුන්ගේ පුහුණුවීම්

2025 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ ඉදිරිපත් කිරීම් පැවැත්වූ අතර එයට එංගලන්තයේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සංවිධානය කළ විධායක නොවන අධ්‍යක්ෂවරුන් සඳහා වූ පුහුණු හා සහතික කිරීමේ වැඩසටහනද ඇතුළත් විය. එමඟින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කුසලතා සහ යහපාලන ප්‍රමිතීන් ශක්තිමත් කරන ලදී.

යෝග්‍යතාවය සහ සුදුසුකම්

අධ්‍යක්ෂවරුන් පත් කරන විට සහ නිලධාරීන් උසස් කරන විට ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස පත් කරන විට සහ ඔවුන්ගේ තනතුරුවල වෙනස්කම් සිදු කරන විට සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ තනතුරු දැරීමට සුදුසු සහ සුදුසු පුද්ගලයින් බව සහතික කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය

අර්ධ වාර්ෂික ඇගයීම් සිදු කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ ඵලදායී කාර්යසාධනය, ඔවුන්ගේ පැතිකඩවල දක්වා ඇත.

අනුප්‍රාප්තික විධිවිධාන

අනුප්‍රාප්තික සැලසුම්කරණය සහ කුසලතා සංවර්ධන අරමුණු සමඟ පෙළගැස්වීම සහතික කරමින්, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු සඳහා උසස්වීම් ප්‍රතිපත්තිය සමාලෝචනය කර නිර්දේශ කරන ලදී. බැංකු ක්ෂේත්‍රයේ නියෝජ්‍ය මහා කළමනාකාර සහකාර මහා කළමනාකාර තනතුරු සඳහා උසස්වීම් ප්‍රතිපත්තිය සමාලෝචනය කර නිර්දේශ කරන ලදී.

ඉදිරි දැක්ම

අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාවලීන් සහ සමස්ත කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, නායකත්වය ශක්තිමත් කිරීම සහ පත්වීම්, උසස්වීම් සහ අනුප්‍රාප්තිය සම්බන්ධ සියලු ප්‍රතිපත්ති නියාමන අවශ්‍යතා සහ හොඳම භාවිතයන් සමඟ අනුකූලව පවතින බව සහතික කිරීම සඳහා කමිටුව අඛණ්ඩව සහාය වනු ඇත. බැංකුවේ උපායමාර්ගික දිශාවට සහාය වීම සඳහා වගවීම, විනිවිදභාවය සහ ආයතනික කාර්යක්ෂමතාව කෙරෙහි අවධාරණය කෙරේ.

සමාප්තිය

අලුතින් පත් කරන ලද අධ්‍යක්ෂවරුන් සඳහා හඳුන්වාදීමේ වැඩසටහන් පවත්වන ලදී.

බැංකුවේ ප්‍රධාන ගැටලු සහ නියාමන යාවත්කාලීන කිරීම් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වෙත ඉදිරිපත් කරනු ලැබේ. අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ ප්‍රකාශ කාර්තුමය වශයෙන් ලබා ගනු ලැබේ.

සාමූහිකව සිදු කරන ලද වාර්ෂික ඇගැයීම තුළින් කමිටුව සිය කාර්යක්ෂමතාව සමාලෝචනය කළේය. මෙම කමිටුවේ කාර්යයන් තුළින් කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්වලට තවදුරටත් වටිනාකමක් එක් කරනු ඇත.

නාමයෝජනා සහ යහපාලන කමිටුව වෙනුවෙන්.



ජෙහාන් ඉස්මයිල් මහතා
සභාපති,

නාමයෝජනා සහ යහපාලන කමිටුව
2026 පෙබරවාරි 24

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු වාර්තාව

2025 දී කමිටු සංයුතිය

2025.01.01 දින සිට කමිටුවේ සංයුතිය:

1. **ආචාර්ය අමල් ඉලේසිංහ***
   සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ
2. **කාවින්ද ද සොයිසා මහතා***
   සාමාජික/ විධායක නොවන සභාපති
3. **ආචාර්ය කපිල සේනානායක**
   සාමාජික/ ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

2025.02.03 දින සිට

1. **ආචාර්ය අමල් ඉලේසිංහ***
   සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ
2. **කාවින්ද ද සොයිසා මහතා***
   සාමාජික/ විධායක නොවන සභාපති
3. **ජයමින් පැල්පොල මහතා***
   සාමාජික/ විධායක නොවන අධ්‍යක්ෂ

2025.06.23 දින සිට

1. **ආචාර්ය අමල් ඉලේසිංහ***
   සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ
2. **කාවින්ද ද සොයිසා මහතා***
   සාමාජික/ විධායක නොවන සභාපති
3. **ආචාර්ය කපිල සේනානායක**
   සාමාජික/ ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

වර්තමාන කමිටුව

2025.12.17 දින සිට

1. **ආචාර්ය අමල් ඉලේසිංහ***
   සභාපති/විධායක නොවන අධ්‍යක්ෂ
2. **කාවින්ද ද සොයිසා මහතා***
   සාමාජික/විධායක නොවන සභාපති
3. **සුනිමල් වීරසූරිය මහතා**
   සාමාජික/ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

*** කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නීතිරීති වලට අනුව ස්වාධීන ලෙස සැලකේ.**

ගණපූරණය: සාමාජිකයන්

කමිටුවේ ලේකම්

කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන්නේ, අයර්ලන්තයේ ඩබ්ලින් හි ජාතික විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධියක් හිමි ප්‍රධාන තොරතුරු නිලධාරී බුද්ධික සීලනාථ මහතාය.

ආරාධනයෙන් සහභාගීවන්නන්

- තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත සහකාර මහා කළමනාකරුවන්.
- සහකාර මහා කළමනාකරු (නිමැවුම් සංවර්ධන කටයුතු සහ ව්‍යාපාරය ක්‍රියාවලි ප්‍රති නිර්මාණ)
- කමිටුවේ අභිමතය පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ, ආයතනික කළමනාකාරිත්වයේ හෝ කාර්ය මණ්ඩලයේ වෙනත් ඕනෑම සාමාජිකයෙකු.

2025 දී පැවති රැස්වීම්: 10

(සාමාජික සහභාගීත්වය මෙම වාර්තාවේ පිටු අංක 173 හි දක්වා ඇත)

කමිටුවේ කාර්යභාරය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අනුගමනය කරනු ලබන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු ප්‍රඥප්තියේ සඳහන් කරුණු මත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ විෂය පථය සකස් කර ඇත.

ප්‍රධානතම අවධානය

කමිටුවේ ප්‍රධාන අරමුණ වන්නේ බැංකුවේ තොරතුරු තාක්ෂණ පරිසරයේ ප්‍රමාණවත් බව, ඵලදායීතාවය සහ උපායමාර්ගික පෙළගැස්ම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට වැඩි අධීක්ෂණ වගකීම් ඉටු කිරීමට සහාය වීමයි.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, කමිටුව බැංකුවේ උපායමාර්ගික අරමුණු සහ වෙනස් වන ඩිජිටල් බැංකුකරණ ක්ෂේත්‍රයට සහාය වීම සඳහා තාක්ෂණ යහපාලනය, සයිබර් ආරක්ෂණ ඔරොත්තු දීමේ හැකියාව, ඩිජිටල් සක්‍රීය කිරීම සහ යටිතල පහසුකම් නවීකරණය ශක්තිමත් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළේය. බැංකුව ශක්තිමත් තොරතුරු තාක්ෂණ හැකියාවන් පවත්වා ගැනීම, කර්මාන්තයේ හොඳම භාවිතයන් අනුගමනය කිරීම සහ නැගී එන තාක්ෂණ ප්‍රවණතා සහ නියාමන අපේක්ෂාවන්ට ප්‍රතිචාර දක්වන බව කමිටුව අඛණ්ඩව සහතික කළේය.

වාර්තාකරණ ක්‍රමවේද

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු රැස්වීම්වල කටයුතු සමාලෝචනය සහ අනුමත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිතිපතා වාර්තා කරන ලදී. උපායමාර්ගික මඟ පෙන්වීම, ප්‍රතිපත්ති අනුමැතිය හෝ ආයෝජන තීරණ අවශ්‍ය වන කරුණු සුදුසු පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කරන ලදී.

2025 වර්ෂය තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

සංවර්ධනය අධීක්ෂණය

- ගනුදෙනුකාර අත්දැකීම් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා බැංකුව විසින් ගෙන ඇති ප්‍රධාන ඩිජිටල් සහ තාක්ෂණික මුලපිරීම්වල ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී.
- අන්තර්ජාලය සහ ජංගම බැංකුකරණ වේදිකා ඇතුළු තීරණාත්මක නාලිකා සඳහා වැඩිදියුණු කිරීම් නිරීක්ෂණය කරන ලදී.
- සම්බන්ධතාවය, ඔරොත්තු දීමේ හැකියාව සහ සේවා ලබා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ජාල නවීකරණ මුලපිරීම්වල ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී.
- බැංකුවේ උපායමාර්ගික සැලැස්මට සහාය වන නැගී එන ඩිජිටල් විසඳුම් වලට අදාළ සංවර්ධනයන් සමාලෝචනය කරන ලදී. මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (AML) විසඳුම, ඉදිරි පෙළ සේවා හැකියාව ඉහළ නැංවීම සඳහා මහා පරිමාණ අවසාන පරිශීලක උපාංග නැවුම් කිරීම, ATM ජාලය පුළුල් කිරීම සහ ව්‍යවසාය ජාල වැඩිදියුණු කිරීමේ මුලපිරීම් ඇතුළු උපායමාර්ගික තාක්ෂණික ආයෝජන කිහිපයක් වසර තුළ ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය කරන ලදී. මෙම ආයෝජන මඟින් බැංකුව පුරා ගනුදෙනුකරුවන් සේවා සැපයීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ තාක්ෂණික ඔරොත්තු දීමේ හැකියාව සැලකිය යුතු ලෙස ශක්තිමත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තොරතුරු තාක්ෂණ යහපාලනය

- බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා සහ නියාමන අවශ්‍යතා සමඟ පෙළගැස්වීම සහතික කිරීම සඳහා තොරතුරු තාක්ෂණ යහපාලන රාමුව සමාලෝචනය කර ශක්තිමත් කරන ලදී.
- වරප්‍රසාදිත ප්‍රවේශ කළමනාකරණය සහ ආරක්ෂක මෙහෙයුම් වැඩිදියුණු කිරීම ඇතුළුව සයිබර් ආරක්ෂණ තත්ත්වය වැඩිදියුණු කිරීමට අදාළ කළමනාකරණ ක්‍රියාමාර්ග නිරීක්ෂණය කරන ලදී.
- තාක්ෂණ අවදානම් කළමනාකරණයට අදාළ විගණන සහ නියාමන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ගවල ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී.
- තොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදන ක්‍රියාවලි සහ නඩත්තු ගිවිසුම් පාලනය සමාලෝචනය කර විධිමත් කරන ලදී.

- අපදා ප්‍රතිසාධන සූදානම සහ මූලික තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වල ඔරොත්තු දීමේ හැකියාව නිරීක්ෂණය කරන ලදී.
- තොරතුරු තාක්ෂණ පරිසරය තුළ ISO සහ හොඳම භාවිතයන් පෙළගැස්ම සඳහා ගෙන ඇති මුලපිරීම් සමාලෝචනය කරන ලදී.

ඉදිරි දැක්ම

බැංකුවේ තාක්ෂණික පසුබිම ආරක්ෂිතව, පරිමාණය කළ හැකිව සහ ව්‍යාපාරික උපායමාර්ගයට අනුකූලව පවතින බව සහතික කිරීම සඳහා කමිටුව නැගී එන තාක්ෂණයන්, සයිබර් ආරක්ෂණ ඔරොත්තු දීමේ හැකියාව සහ යහපාලන පරිණතභාවය කෙරෙහි අවධානය යොමු කරනු ඇත. බැංකුවේ ඩිජිටල් පරිවර්තන ගමනට සහාය දක්වමින්, දැඩි නියාමන අනුකූලතාව සහ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග පවත්වාගෙන යාමට විශේෂ අවධානය යොමු කරනු ඇත.

සමාප්තිය

බැංකුවේ තොරතුරු තාක්ෂණ පරිසරයේ කාර්යක්ෂමතාව, ඔරොත්තු දීමේ හැකියාව සහ උපායමාර්ගික පෙළගැස්ම සහතික කිරීම සඳහා වසර තුළ සුදුසු අධීක්ෂණයක් සිදු කරන ලද බවට තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කමිටුව සෑහීමකට පත්වේ.

ශක්තිමත් තොරතුරු ආරක්ෂණ සහ යහපාලන ප්‍රමිතීන් පවත්වා ගනිමින්, බැංකුවේ දිගුකාලීන අරමුණු සඳහා තාක්ෂණික ආයෝජන සහ මුලපිරීම් ඵලදායී ලෙස දායක වන බව සහතික කිරීම සඳහා කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට අඛණ්ඩව සහාය වනු ඇත.



ආචාර්ය අමල් ඉලේසිංහ
සභාපති,

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව
2026 පෙබරවාරි 24

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව

කමිටුවේ සංයුතිය

2025.01.01 දින සිට කමිටුවේ සංයුතිය:

1. **ජෙහාන් ඉස්මයිල් මහතා***
   සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ
2. **කාවින්ද ද සොයිසා මහතා***
   සාමාජික/ විධායක නොවන සභාපති
3. **ආචාර්ය කපිල සේනානායක**
   සාමාජික/ ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

2025.02.03 දින සිට

1. **ආර් එම් පී රත්නායක මහතා***
   සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ
2. **ආචාර්ය කපිල සේනානායක**
   සාමාජික/ ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ
3. **ආචාර්ය අමල් ඉලේසිංහ***
   සාමාජික/ විධායක නොවන අධ්‍යක්ෂ

2026.01.01 දින සිට වර්තමාන කමිටුවේ සංයුතිය

1. **දර්ශන් ජයරත්න මහතා**
   සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
2. **ආර් එම් පී රත්නායක මහතා***
   සාමාජික/ විධායක නොවන අධ්‍යක්ෂ
3. **තුල්සි අළුවිහාරේ මහතා**
   සාමාජික/ විධායක නොවන අධ්‍යක්ෂ

*** කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නීතිරීතිවලට අනුව ස්වාධීන ලෙස සැලකේ.**

කමිටුවේ ලේකම්

2025.01.01 දින සිට 2025.08.10 දින දක්වා මූල්‍ය හා සැලසුම් පිළිබඳ නියෝජ්‍ය මහා කළමනාකරු, ඇන්ටන් ජෝන් පුල්ලේ මහතා කමිටුවේ ලේකම් ලෙස කටයුතු කළේය.

ඇන්ටන් ජෝන් පුල්ලේ මහතා විශ්‍රාම යාමත් සමඟ, අයවැය, ක්‍රමෝපායික සැලසුම් හා කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ සහකාර මහා කළමනාකාරිණී සීනා රුවයිස් මහත්මිය 2025.08.11 දින සිට කමිටුවේ ලේකම්වරිය ලෙස කටයුතු කරයි.

අඛණ්ඩව සහභාගීවන්නන්

- මහා කළමනාකරු
- අදාළ කළමනාකරණ නිලධාරීන්

2025 දී පැවති රැස්වීම්: 05

(සාමාජික සහභාගීත්වය මෙම වාර්තාවේ පිටු අංක 173 හි දක්වා ඇත)

ගණපූර්ණය: අවම වශයෙන් සාමාජිකයින්ගෙන් අඩක්වත් සහභාගී විය යුතුයි.

කමිටුවේ කාර්යභාරය

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු ප්‍රඥප්තිය

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවේ නිර්දේශ නියමයන්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර සම්මත කරන ලද සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු ප්‍රඥප්තිය මගින් පාලනය වේ.

ප්‍රධානතම අවධානය

මෙම කමිටුවේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකා මහ බැංකු රෙගුලාසි, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති සහ අනෙකුත් අදාළ ප්‍රමිතීන්, නීති සහ රෙගුලාසිවලට අනුකූලව සියලුම සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම සහ බැංකුවේ අනෙකුත් පාර්ශ්ව වලට වඩා සම්බන්ධිත පාර්ශ්වවලට “වඩාත් වාසිදායක සැලකිල්ලක්” ලබා දෙන ආකාරයෙන් සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගනුදෙනු නොකරන බව සහතික කිරීමයි.

වාර්තාකරණ ක්‍රමවේදය

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු රැස්වීම්වල ක්‍රියා පටිපාටි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සභාගත කර අනුමත කරනු ලබන අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගනු ලැබේ.

2025 වසර තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

- සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු ප්‍රඥප්තිය සමාලෝචනය කරන ලදී.
- සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් පිළිබඳ ප්‍රතිපත්තිය සංශෝධනය කරන ලදී.
- සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමිතිගත වාර්තා ආකෘතියක් සකස් කර අනුමත කරන ලදී.
- අධ්‍යක්ෂ මණ්ඩලය, ආයතනික සහ විධායක කළමනාකාරිත්වය සහ සම්බන්ධතා කළමනාකරුවන් සඳහා ප්‍රධාන අනුකූලතා නිලධාරී විසින් දැනුවත් කිරීමේ සැසි පවත්වන ලදී.
- සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හඳුනා ගැනීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා පියවර කිහිපයක් ආරම්භ කරන ලදී.
- සම්බන්ධිත පාර්ශ්වයන්ට වාසිදායක සැලකිල්ලක් ලබා නොදුන් බවට සහතික විය.

ඉදිරි දැක්ම

කමිටුව යහපාලනයේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීමට කැපවී සිටින අතර සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු නියාමන අවශ්‍යතා සහ හොඳම භාවිතයන්ට අනුකූල වන බව සහතික කිරීම සඳහා අධීක්ෂණ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීමට දිගටම කටයුතු කරනු ඇත.

සමාප්තිය

කමිටුව සමුහිකව සිදු කරන ලද කාර්යයන්හි කාර්යක්ෂමතාව වාර්ෂික ඇගයීම මඟින් සමාලෝචනය කළේය. මෙම කමිටුවේ කාර්යයන් හරහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වලට වටිනාකමක් එක් කරයි.

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව



දර්ශන් ජයරත්න මහතා
සභාපති,

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව
2026 පෙබරවාරි 24


අවදානම් සහ තිරසාර වර්ධනය

2025 තුළ ලංකා බැංකුව ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වන සාර්ව ආර්ථික පරිසරයක් මධ්‍යයේ වුවද ඔරොත්තු දීමේ හැකියාව, ස්ථාවරත්වය සහ විචක්ෂණශීලී අවදානම් කළමනාකරණය පෙන්නුම් කරයි. මුළු වත්කම් රු. ට්‍රිලියන 5.0 ඉක්මවූ සුවිශේෂී සන්ධිස්ථානයක් සහ රු. බිලියන 120.8 ක වාර්තාගත ලාභයක් වාර්තා කරමින්, බැංකුව විශාලතම සහ දේශීය පද්ධතිමය වශයෙන් වඩාත්ම වැදගත් මූල්‍ය ආයතනය ලෙස ශ්‍රී ලංකාව තුළ සිය ස්ථානය ශක්තිමත් කළේය. මෙම ප්‍රතිඵල මගින් විධිමත් උපායමාර්ග ක්‍රියාත්මක කිරීම, වත්කම් ගුණාත්මකභාවයේ වර්ධනය සහ තිරසාර වටිනාකම් නිර්මාණය කෙරෙහි අඛණ්ඩ අවධානයක් යොමු කිරීම පිළිබිඹු වේ.

වසර පුරා බැංකුවේ කාර්යසාධනය සඳහා ඵලදායී අවදානම් කළමනාකරණය කේන්ද්‍රීය විය. නියාමන අවශ්‍යතා, ජාත්‍යන්තර හොඳම පිළිවෙත් සහ බැංකුවේ දිගුකාලීන උපායමාර්ගික අරමුණු සමඟ සමපාත වූ ක්‍රියාකාරී සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවක් බැංකුව විසින් අනුගමනය කරන ලදී.

මෙම අවදානම් කළමනාකරණ වාර්තාව, බැංකුවේ අවදානම් පැතිකඩ, යහපාලන රාමුව සහ වර්ෂය තුළ අනුගමනය කරන ලද අවදානම අවම කිරීමේ උපායමාර්ග ගෙනහැර දක්වන අතර, වෙනස් වෙමින් පවතින අවදානම් භූ දර්ශනයක් තුළ මූල්‍ය ස්ථාවරත්වය, නියාමන අනුකූලතාව සහ දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ ලංකා බැංකුවේ කැපවීම ඉස්මතු කරයි.

අන්තර් සම්බන්ධිත, ගතික සහ අඛණ්ඩව විකාශනය වන බහුමානීය අවදානම් පරිසරය



අවදානම් කළමනාකරණය තුළින් ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැඟීම

අවදානම් කළමනාකරණය සඳහා බැංකුවේ ප්‍රතිපත්තිගරුක ප්‍රවේශය, ප්‍රධාන ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය සහ කාර්යසාධන දර්ශක වලින් පිළිබිඹු වන අතර, ඒවා අවිනිශ්චිත කාල පරිච්ඡේද හරහා ඔරොත්තු දීමේ හැකියාව සහ ස්ථාවරත්වය පෙන්නුම් කරයි.

දැක්ම

අවදානම් කළමනාකරණ අභිලාෂය

බැංකුවේ දැක්ම සාක්ෂාත් කර ගැනීමේදී ක්‍රියාකාරී අවදානම් කළමනාකරණය හරහා සහාය වීම

මෙහෙවර

අවදානම් කළමනාකරණ විධිවිධාන

විස්තීර්ණ අවදානම් කළමනාකරණය සහතික කිරීම හරහා ගතික කාර්යය පරිසරය තුළ නියාමන අවශ්‍යතා සහ බැංකු ක්ෂේත්‍රයේ හොඳම භාවිතයන් සමඟින් සාමූහිකත්වය සහ වෘත්තීය වර්ධනය දිරිගන්වමින් බැංකුවේ තිරසාර වර්ධනය සඳහා පහසුකම් සැලසීම.

ජනිත කළ වටිනාකම


පද්ධතිමය වගකීම සහ මූල්‍ය ස්ථාවරත්වය


දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකුවක් ලෙස ලංකා බැංකුව ක්‍රියාකරන බැවින්,
එය ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ හරය ලෙස සලකයි.
මෙම වගකීම නිසි ලෙස ඉටු කිරීම සඳහා විධිමත් අවදානම් කළමනාකරණය අත්‍යවශ්‍ය වන අතර,
එය අවිනිශ්චිත තත්ත්වයක් හමුවේද බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව සහතික කරමින් ආර්ථික වර්ධනය,
මූල්‍ය ඇතුළත්කරණය සහ දිගුකාලීන ජාතික සංවර්ධනයට අඛණ්ඩව සහාය දක්වයි.

අවදානම් සහ තිරසාර වර්ධනය

අවදානම් කළමනාකරණ සාර්ථකත්වයේ ගමන්මඟ








අවදානම් යහපාලනය

ශක්තිමත් අවදානම් යහපාලනයක් උපායමාර්ගික අරමුණු ඉටුකරමින් අවිනිශ්චිතතා කළමනාකරණය කිරීමේ බැංකුවට ඇති හැකියාව තහවුරු කරයි. තිරසාරභාවය සහ දේශගුණය සම්බන්ධ අවදානම් ඇතුළුව, අවදානම් අධීක්ෂණය අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් ක්‍රියාත්මක වන අතර එම කමිටු, ස්වාධීන අවදානම් කළමනාකරණය සහ විධායක වගවීම ඇතුළත් ව්‍යුහගත පද්ධතියකින් සහය දක්වයි.



ප්‍රධාන අවදානම් යහපාලන ආයතනවල සංයුතිය

බැංකුවේ අවදානම් යහපාලන ආයතනවල සංයුතිය මගින් ඵලදායී අධීක්ෂණය සහ තීරණ ගැනීම සඳහා සහාය වන ස්වාධීනත්වය, අත්දැකීම් සහ ක්‍රියාකාරිත්වයේ විශේෂඥතාව අතර සවිඥානික සමතුලිතතාවයක් පිළිබිඹු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය
සමස්ත වගවීම

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඇතුළුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් විකොළොස් දෙනෙකුගෙන් (11) සමබර අධීක්ෂණය, ස්වාධීනත්වය සහ උපායමාර්ගික මඟ පෙන්වීම සිදු කරති.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC)
අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අධීක්ෂණය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවක් වන මෙය සාමාජිකයින් හතර දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගෙන් බහුතරය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.

විධායක අවදානම් කමිටු
කළමනාකරණ ක්‍රියාත්මක කිරීම

ප්‍රධාන ව්‍යාපාර, අවදානම් සහ යහපාලන කාර්යයන් නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ කළමනාකරණයෙන් සමන්විත වේ.

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD)
ස්වාධීන අවදානම් අධීක්ෂණය

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය ව්‍යාපාරික ඒකක වලින් ස්වාධීනව ක්‍රියාත්මක වන අතර ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) විසින් එහි ප්‍රධානත්වය දරනු ලැබේ.

භූමිකාවන් සහ වගකීම්

අවදානම් යහපාලන භූමිකාවන් සහ වගකීම් අනුකෘතිය

අවදානම් යහපාලන ස්ථරය	උපායමාර්ගික දිශාව සහ අධීක්ෂණය	ස්වාධීන අවදානම් අධීක්ෂණය	කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීම	ස්වාධීන සහතිකවීම
පාලනය තන්ත්‍රය/ භූමිකාව	අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව	ප්‍රධාන අවදානම් නිලධාරී ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය	විධායක අවදානම් කමිටු ව්‍යාපාරික ඒකක	අභ්‍යන්තර විගණනය
අවදානම් උපායමාර්ගය සහ අභිරුචිය	අවදානම් අභිරුචිය සහ අවදානම් උපායමාර්ගය අනුමත කිරීම	අවදානම අභිරුචිය සහ සීමාවන් සැකසීම	අනුමත අභිරුචිය තුළ ක්‍රියාත්මක වීම	සඵලතාවය සමාලෝචනය කිරීම
අවදානම් හඳුනා ගැනීම	හඳුනාගත් ප්‍රමාණාත්මක අවදානම් අධීක්ෂණය කිරීම	ස්වාධීනව අවදානම් හඳුනාගෙන තක්සේරු කිරීම	මෙහෙයුම් වල අවදානම් හඳුනා ගෙන කළමනාකරණය කිරීම	සම්පූර්ණත්වය පරීක්ෂා කිරීම
අවදානම් මිනුම්කරණය සහ අධීක්ෂණය	අවදානම් පැතිකඩ සහ ප්‍රවණතා අධීක්ෂණය කිරීම	ප්‍රධාන කාර්යසාධන දර්ශක (KRIs) සංවර්ධනය කිරීම, නිරාවරණයන් නිරීක්ෂණය කිරීම	ණය, වෙළඳපළ සහ මෙහෙයුම් අවදානම් නිරීක්ෂණය කිරීම	පාලනයන් සත්‍යාපනය කිරීම
අවදානම් අවම කිරීම	උපායමාර්ගික මඟ පෙන්වීම සැපයීම	අවම කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම	අවම කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීම	ප්‍රතිඵල සමාලෝචනය
තිරසාරභාවය සහ දේශගුණික අවදානම්	උපායමාර්ග සහ ප්‍රාග්ධන සැලසුම්කරණ ඒකාබද්ධ කිරීම් අධීක්ෂණය කිරීම	තිරසාරභාවය සහ දේශගුණය සම්බන්ධ අවදානම්, අවදානම් කළමනාකරණ රාමුවට ඒකාබද්ධ කිරීම	ව්‍යාපාරික බලපෑම් කළමනාකරණය කිරීම සහ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව සහ අර්බුද සඳහා සූදානම ශක්තිමත් කිරීම	ප්‍රමාණවත් බව තක්සේරු කිරීම
වාර්තා කිරීම සහ ඉදිරිපත් කිරීම	අවදානම් වාර්තා නිතිපතා සමාලෝචනය කිරීම	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීනව වාර්තා කිරීම	විනිවිදභාවයෙන් යුත් වාර්තාකරණය සහතික කරන අතර කළමනාකරණය හරහා ගැටළු ඉදිරිපත් කිරීම	විගණන කමිටුවට සොයාගැනීම් වාර්තා කිරීම
අවදානම් සංස්කෘතිය සහ ධාරිතාව	ඉහළ මට්ටමේ සිට අවධානය	අවදානම් දැනුවත්භාවය සහ පුහුණුව ප්‍රවර්ධනය කිරීම	දෛනික මෙහෙයුම් තුළ අවදානම් පිළිබඳ දැනුවත් සංස්කෘතියක් නිර්මාණය කිරීම	සඵලතාවය ඇගයීම

බැංකුවේ අවදානම් යහපාලන ව්‍යුහය සහ භූමිකා වෙන් කිරීම පිළිබඳ දළ විශ්ලේෂණයක් අවදානම් යහපාලන භූමිකාවන් සහ ඉහත වගකීම් අනුකෘතිය ඉදිරිපත් කර ඇත. මෙම රාමුව තුළ කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කරන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (IRMC) සහ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශයේ (IIRMD) සවිස්තරාත්මක වගකීම් පහත දැක්වේ. වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව සහ තිරසාරභාවය උපකමිටුව යන අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු 02 ක් පිහිටුවීමට මූලපිරීම් ගන්නා ලදී.

අවදානම් සහ තිරසාර වර්ධනය

IRMC ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අධීක්ෂණය

ව්‍යවසාය, තිරසාරත්වය සහ දේශගුණය සම්බන්ධ අවදානම් සඳහා එහි අධීක්ෂණ වගකීම් ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.

- බැංකුවේ අවදානම් යහපාලන රාමුව සහ අනුමත අවදානම් අභිරුචි ප්‍රකාශය සමඟ සමපාත වන බව අධීක්ෂණය කිරීම
- සමස්ත අවදානම් පැතිකඩ සහ ප්‍රමාණාත්මක අවදානම් නිරාවරණ නිරීක්ෂණය කිරීම
- ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය, අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP), ප්‍රත්‍යාබල පරීක්ෂාව සහ ප්‍රකෘතිකරණ සැලසුම් ප්‍රතිඵල සමාලෝචනය කිරීම
- ප්‍රමාණාත්මක, නැගී එන, තිරසාරභාවයට සහ දේශගුණය සම්බන්ධ අවදානම් කළමනාකරණය අධීක්ෂණය කිරීම
- ත්‍රිත්ව ආරක්ෂණ යාන්ත්‍රණයේ සහ අවදානම් කළමනාකරණයේ ක්‍රියාකාරිත්ව සඵලතාවය සහතික කිරීම
- ව්‍යාපාර අඛණ්ඩතාව සහ අර්බුද සඳහා සූදානම්භාවය නිරීක්ෂණය කිරීම
- බැංකුව තුළ ශක්තිමත් අවදානම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම

IIRMD ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය

ස්වාධීන අවදානම් අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීම

ව්‍යාපාරික ඒකකවලින් ස්වාධීනව ක්‍රියාත්මක වන අතර ප්‍රධාන අවදානම් නිලධාරී විසින් ප්‍රධානත්වය දරනු ලබයි. ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ අඛණ්ඩව නඩත්තු කිරීම සඳහා වගකිව යුතුය.

- නැගී එන තිරසාරභාවය සහ දේශගුණය සම්බන්ධ අවදානම් ඇතුළුව බැංකුව විසින් උපකල්පනය කරන ලද අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ අධීක්ෂණය කිරීම
- අවදානම් අභිරුචිය සහ ප්‍රධාන අවදානම් දර්ශක සැකසීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම සඳහා සහාය වීම
- ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ස්වාධීන අවදානම් වාර්තා කිරීම
- එදිනෙදා මෙහෙයුම් වලට අවදානම් කළමනාකරණය ඇතුළත් කිරීම සඳහා මාර්ගෝපදේශ, පුහුණුව සහ දැනුවත් කිරීම තුළින් ව්‍යාපාරික ඒකකවලට සහාය වීම
- අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP), ව්‍යාපාර අවිච්ඡින්නතා සැලැස්ම (BCP) සහ ප්‍රතිසාධන සැලැස්ම (RCP) සම්බන්ධ නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වීම සහතික කිරීම

CRO ප්‍රධාන අවදානම් නිලධාරී

ස්වාධීන අවදානම් නායකත්වය

බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යයේ ස්වාධීන නායකත්වය සපයන අතර ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුවේ සඵලතාවය අධීක්ෂණය කරයි. ප්‍රධාන අවදානම් නිලධාරී විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි.

- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම
- බැංකුව විසින් උපකල්පනය කරන ලද අවදානම් පිළිබඳ අධීක්ෂණය පවත්වා ගැනීම සහ අනුමත අවදානම් අභිරුචිය තුළ ඒවා කළමනාකරණය කිරීම සහතික කිරීම
- සීමාවන් උල්ලංඝණය වන අවස්ථාවන්හි ප්‍රතික්‍රියාවන් නිර්දේශ කිරීම ඇතුළුව අවදානම් සීමාවන් ස්ථාපිත කිරීම සහ නිරාවරණය නිරීක්ෂණය කිරීම
- ණය, වෙළඳපළ, මෙහෙයුම් සහ දේශගුණය සම්බන්ධ අවදානම් හරහා ප්‍රත්‍යාබල පරීක්ෂා කිරීම සහ අවස්ථා විශ්ලේෂණය ඇතුළු අවදානම් මිනුම් ක්‍රමවේද අධීක්ෂණය කිරීම
- බැංකුවේ අවදානම් පැතිකඩ සහ ප්‍රමාණාත්මක අවදානම් නිරාවරණය, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම
- උපායමාර්ග, ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා සැලසුම්, සහ නව නිෂ්පාදන සහ සේවා ඇතුළු ප්‍රධාන තීරණ ගැනීමේ ක්‍රියාවලීන්ට සහභාගී වීම
- අවදානම් කළමනාකරණ හැකියාවන් ශක්තිමත් කිරීම
- බැංකුව තුළ ශක්තිමත් අවදානම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම

SM ජ්‍යේෂ්ඨ කළමනාකරණය

අවදානම් කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් අභිරුචිකත්වයේ සීමාවන් තුළ අවදානම් කළමනාකරණය කිරීම සහ බැංකුව තුළ අවදානම් යහපාලන රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දරයි.

- බැංකුවේ අවදානම් නිරාවරණ තක්සේරු කිරීම, කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ඒකාබද්ධ රාමුවක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම
- බැංකුවේ ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා තත්ත්වය සමඟ සමපාත කරමින් අවදානම් නිරාවරණය නිසි ලෙස මනිනු ලබන බව සහතික කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ අභ්‍යන්තර පාලනයන් ක්‍රියාත්මක කිරීම
- අවදානම් සීමාවන්ට අනුකූල වීම, අධීක්ෂණය කිරීම සහ කඩකිරීම් කාලෝචිත ලෙස ඉදිරිපත් කිරීම සහතික කිරීම
- බැංකුව තුළ අවදානම් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සන්නිවේදනය කිරීම සහ දැඩි අවදානම් දැනුවත් භාවයක් සඳහා සහාය වීම

නිපුණතාවය, හැකියාව සහ අඛණ්ඩ සංවර්ධනය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) හරහා අධ්‍යක්ෂ මණ්ඩලය, බැංකුව තුළ අවදානම්, තිරසාරභාවය සහ දේශගුණික සම්බන්ධ අවදානම් ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා සුදුසු කුසලතා, විශේෂඥතාව සහ නිපුණතා ලබා ගත හැකි බවත් අඛණ්ඩව සංවර්ධනය කරන බවත් සහතික කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කමිටුවේ හැකියාව

- අවදානම් අධීක්ෂණයට සම්බන්ධ සාමාජිකයින්ගේ අවශ්‍ය කුසලතා, පළපුරුද්ද සහ සුදුසුකම් සහතික කිරීම
- හිඩැස් හඳුනාගෙන ඇති විට, ඉලක්කගත පුහුණුව, බාහිර විශේෂඥතාව හෝ විශේෂඥ උපදේශන සහාය නියුක්ත කිරීම

කළමනාකරණ සහ කාර්ය මණ්ඩල සංවර්ධනය

- බැංකුව විසින් ණය, වෙළඳපළ, මෙහෙයුම්, ද්‍රවශීලතාව, තොරතුරු තාක්ෂණ/සයිබර්, අනුකූලතාව, තිරසාරභාවය සහ දේශගුණය සම්බන්ධ අවදානම් ආවරණය කරමින් නියාමන අවශ්‍යතා සහ ජාත්‍යන්තර හොඳම භාවිතයන් සමඟ අනුගත වෙමින් ව්‍යුහගත පුහුණු සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන් හරහා අඛණ්ඩ ඉගෙනුම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම
- ආයතනික හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා නිරාවරණය ඇතුළුව විශේෂිත සහ නැඟී එන අවදානම් පුහුණුවට අදාළ වන ජාත්‍යන්තර වැඩසටහන් සහ සහතික සඳහා යොමු කිරීම

අනුප්‍රාප්තිය සහ අඛණ්ඩ පැවැත්ම

- විශේෂඥතාව සහ ඵලදායී අවදානම් අධීක්ෂණය සහතික කිරීම සඳහා අනුප්‍රාප්තික සැලසුම් සකස් කර ඇත

ප්‍රතිපෝෂණය සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීම

- විගණන, නියාමන පරීක්ෂණ සහ අඛණ්ඩ ඉගෙනීමෙන් ලැබෙන ප්‍රතිඵල තුළින් සමස්ත අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම

ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුව (ERM)

බැංකුවේ ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුව නිර්මාණය කර ඇත්තේ අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම මෙන්ම විභව අවදානම් තක්සේරු කිරීම, දැනුවත් කිරීම, තීරණ ගැනීම, ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාර වටිනාකම් නිර්මාණය තුළින් මෙහෙයුම් පරිසරය වෙනස් වීම නිසා ඇති විය හැකි අවස්ථා සහ නිරීක්ෂණ ඒ අතරතුර හඳුනා ගැනීමට සහාය වීමටය.

ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුවේ (ERM) පදනම

බැංකුවේ ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුව (ERM) ගොඩනැඟී ඇත්තේ අවදානම් හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම සහ එදිනෙදා මෙහෙයුම් වලට ඇතුලත් කිරීම සඳහා මඟ පෙන්වන මූලික අංග හතරක් මතයි.

අවදානම් පිළිබඳ දර්ශනය

අවදානම් කළමනාකරණය ආයතනය තුළ සාමූහික වගකීමක් වන අතර එය බැංකුවේ උපායමාර්ගික අරමුණු වලට අනුකූලවේ. නියාමන අනුකූලතාවය අනිවාර්ය වන අතර, එය බැංකුවේ කීර්තිනාමය ආරක්ෂා කිරීම, මූල්‍ය කාර්යසාධනය සහ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

අවදානම් අභිරුචිය

අවදානම් අභිරුචි රාමුව බැංකුව ක්‍රියාත්මක වන පැහැදිලිව අර්ථ දක්වා ඇති අවදානම් පරාමිතීන් බවට උපායමාර්ග පරිවර්තනය කරයි. ස්ථාපිත සීමාවන් තුළ අවදානම් අභිරුචිය කළමනාකරණය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති සහ විධායක අවදානම් කමිටුවල සහාය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි, ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විභව අවදානම් හඳුනාගෙන කලින් තක්සේරු කිරීම සහතික කිරීම සඳහා අවදානම් සමාලෝචන පවත්වයි.

අවදානම් හඳුනා ගැනීම, අවම කිරීම සහ වාර්තා කිරීම

උපායමාර්ගික, ප්‍රතිපත්තිමය සහ මෙහෙයුම් මට්ටම් වලදී අවදානම් හඳුනාගෙන, තක්සේරු කර සහ අවම කර ඇත. ස්ථාපිත අවදානම් කළමනාකරණ රාමුව හරහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කාලෝචිත ලෙස ඉදිරිපත් කිරීමට හැකි වන අතර ප්‍රමාණාත්මක අවදානම් මැනීම, අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම මගින් දැනුවත් තීරණ ගැනීමට සහාය වේ.

අවදානම් සංස්කෘතිය

ශක්තිමත් අවදානම් සංස්කෘතියක් දෛනික ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල අංගයක් ලෙස දැනුවත් කිරීම, වගවීම සහ අවදානම් විවෘතව ඉදිරිපත් කිරීම ප්‍රවර්ධනය කිරීම මගින් ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුවේ ඵලදායී ක්‍රියාකාරිත්වය තහවුරු කරයි.

අවදානම් සහ තිරසාර වර්ධනය

ලංකා බැංකුවේ ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුව

අරමුණු

- වර්ධනය සඳහා අවස්ථා උපරිම කර ගනිමින් ඵලදායී ලෙස අවදානම් අවම කිරීමට බැංකුවේ හැකියාව වැඩි දියුණු කිරීම
- සියලු අවදානම් කළමනාකරණය සහ පාලනය සඳහා පොදු ප්‍රතිපත්ති සහ ප්‍රමිතීන් ස්ථාපිත කිරීම
- අවදානම් කළමනාකරණය සඳහා ස්ථාවර ප්‍රවේශයක් පෝෂණය කිරීම සඳහා පොදු සන්නිවේදනයක්, පද්ධතියක් සහ රාමුවක් සැපයීම

අවදානම් වර්ගය

ප්‍රාථමික අවදානම්

1 ණය අවදානම් | 2 ද්‍රවශීලතා අවදානම් | 3 වෙළඳපළ අවදානම් | 4 මෙහෙයුම් අවදානම්

වෙනත් අවදානම්

05 උපායමාර්ගික අවදානම් | 06 පුද්ගල අවදානම් | 07 තොරතුරු ආරක්ෂාව සහ තොරතුරු තාක්ෂණ අවදානම් | 08 නියාමන සහ අනුකූලතා අවදානම් | 09 චර්යා අවදානම් | 10 නීතිමය අවදානම් | 11 කීර්තිනාම අවදානම් | 12 තිරසාරභාවයට සම්බන්ධ අවදානම් | 13 දේශගුණයට සම්බන්ධ අවදානම් | 14 තෙවන පාර්ශ්ව අවදානම් | 15 වංචා අවදානම්

අවදානම් යහපාලනය සහ අධීක්ෂණය

අධ්‍යක්ෂ මණ්ඩලය

අවදානම් සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු

- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC)
- විගණන කමිටුව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව

මහා කළමනාකරු

අවදානම් සම්බන්ධ විධායක කමිටු

- ණය අවදානම
  - ණය කමිටුව
  - අක්‍රීය ණය සමාලෝචන කමිටුව
  - නිෂ්ක්‍රීය වත්කම් කමිටුව
- වෙළඳපළ අවදානම
  - වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව
  - ආයෝජන කමිටුව
  - රජයේ සුරැකුම්පත්වල ආයෝජනය සඳහා කමිටුව
- මෙහෙයුම් අවදානම
  - මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව
  - වංචා අවදානම් කළමනාකරණ කමිටුව
  - මෙහෙයුම් අලාභ සම්බන්ධ කමිටුව
  - ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ කමිටුව
- තොරතුරු ආරක්ෂාව
  - ආයතනික තොරතුරු ආරක්ෂක කමිටුව
- කීර්තිනාම අවදානම
  - ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ කමිටුව

අවදානම් සම්බන්ධ ප්‍රතිපත්ති

1 පළමු මට්ටමේ ආරක්ෂක ක්‍රමවේදය — ව්‍යාපාර ඒකක

- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- සමූහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- ප්‍රත්‍යාබල පරීක්ෂා ප්‍රතිපත්තිය
- අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) පිළිබඳ ප්‍රතිපත්තිය
- ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- ණය අවදානම් ශ්‍රේණිගත කිරීමේ ප්‍රතිපත්තිය

2 දෙවන මට්ටමේ ආරක්ෂක ක්‍රමවේදය — ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD)

- ණය කළඹ සමාලෝචන යාන්ත්‍රණ ප්‍රතිපත්තිය
- ණය කළඹ කළමනාකරණ ප්‍රතිපත්තිය
- ඒකාබද්ධ පාරිසරික හා සමාජීය කළමනාකරණ පද්ධති ප්‍රතිපත්තිය
- වෙළඳපළ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- විදේශ විනිමය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

3 තුන්වන මට්ටමේ ආරක්ෂක ක්‍රමවේදය — අභ්‍යන්තර විගණනය

- ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- වංචා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය
- අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය

ත්‍රිත්ව ආරක්ෂණ යාන්ත්‍රණය

බැංකුව සිය ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුවේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් පිළිබඳ පැහැදිලි වගවීම, ඵලදායී අධීක්ෂණය සහ ස්වාධීන සහතිකකරණය සඳහා ත්‍රිත්ව ආරක්ෂණ යාන්ත්‍රණය භාවිතයේ යොදවයි.

1 පළමු මට්ටමේ ආරක්ෂක ක්‍රමවේදය

ව්‍යාපාර ඒකක සහ ආයතනික කාර්යයන්

2 දෙවන මට්ටමේ ආරක්ෂක ක්‍රමවේදය

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය මගින් අවදානම් කළමනාකරණය සහ පාලනය

3 තුන්වන මට්ටමේ ආරක්ෂක ක්‍රමවේදය

අභ්‍යන්තර සහතික කිරීම සහ විගණනය

භූමිකාවන්

- එදිනෙදා කටයුතු වලින් පැන නඟින අවදානම් භාරගැනීම සහ අවදානම් හිමිකාරිත්වය සඳහා වගකීම
- අදාළ මෙහෙයුම් ඇතුළත අවදානම් කළමනාකරණය කිරීම
- අනුමත අවදානම් අභිරුචිය සහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති තුළ ක්‍රියා කිරීම

- අවදානම් කළමනාකරණ රාමුවේ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳ ස්වාධීන අධීක්ෂණය සහ නිරීක්ෂණය
- අවදානම් නිරාවරණ මැනීම, නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම
- අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ප්‍රමිතීන් පවත්වාගෙන යාම සහ ශක්තිමත් කිරීම

- යහපාලනය, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන සහතිකයක් ලබා දීම
- පළමු සහ දෙවන මට්ටමේ ආරක්ෂක ක්‍රමවේදයන්හි සඵලතාවය ඇගයීම

සහාය දැක්වීම

- ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ සම්මත මෙහෙයුම් මාර්ගෝපදේශ
- ව්‍යාපාර ක්‍රියාවලි තුළ අන්තර්ගත අභ්‍යන්තර පාලනයන්
- කළමනාකරණ තොරතුරු පද්ධති සහ මෙහෙයුම් වාර්තාකරණය
- අවදානම් දැනුවත් කිරීමේ පුහුණුව සහ ශක්තිමත් අවදානම් සංස්කෘතියක්

- ව්‍යවසාය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ රාමු
- අවදානම් තක්සේරු මෙවලම්, ප්‍රධාන අවදානම් දර්ශක (KRI) සහ අවදානම් පුවරු
- ප්‍රත්‍යාබල පරීක්ෂාව සහ අවස්ථා විශ්ලේෂණය
- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ පද්ධති සහ වාර්තාකරණ වේදිකා

- අභ්‍යන්තර විගණන ක්‍රමවේද සහ විගණන සැලසුම්
- බාහිර විගණන සහ නියාමන සමාලෝචන ක්‍රියාවලි
- විගණන කළමනාකරණය සහ ගැටළු සෙවීමේ පද්ධති
- විගණන කමිටුව වෙත සෘජු වාර්තාකරණය

අවදානම් කළමනාකරණය ක්‍රියාවලිය

ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුව (ERM) තුළ බැංකුව පුරා අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, ප්‍රමුඛතාවය දීම, නිරීක්ෂණය කිරීම, අවම කිරීම සහ වාර්තා කිරීම සඳහා ව්‍යුහගත සහ ක්‍රමානුකූල අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් අන්තර්ගත ය.

මෙම ක්‍රියාවලිය ව්‍යාපාරික ඒකක, ක්‍රියාකාරී අංශ සහ ආයතනික ඒකක පුරා අඛණ්ඩව ක්‍රියාත්මක වේ.



විෂය පථය

- සමස්ථ දේශීය සහ විදේශීය ශාඛා ජාලය
- සියලුම තීරණාත්මක ව්‍යාපාරික ඒකක සහ සහායක කාර්යයන්
- සමූහය යටතේ ඇති සියලුම පරිපාලිත/ ආශ්‍රිත සමාගම්

යහපාලන සහාය

- ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුව තුළ ක්‍රියාත්මක වීම
- ත්‍රිත්ව ආරක්ෂණ යාන්ත්‍රණය සහාය දැක්වීම

අවදානම් සහ තිරසාර වර්ධනය

1 අවදානම් හඳුනාගැනීම

අරමුණු

බැංකුවට බලපෑ හැකි, පවතින, නැඟී එන සහ විභව අවදානම් හඳුනා ගැනීම

ප්‍රධාන ක්‍රියාකාරකම්

- අවදානම් සහ පාලන ස්වයං ඇගයීම් (RCSAs)
- ණය පරීක්ෂා කිරීම් සහ ඇගයීම් ක්‍රියාවලි
- කළඹ සමාලෝචනය සහ සංකේන්ද්‍රණ විශ්ලේෂණය
- අධීක්ෂණය සහ ප්‍රතිවිරුද්ධ අවදානම් සමාලෝචන සීමා කිරීම
- සිදුවීම් සහ අලාභ දත්ත වාර්තා කිරීම
- නිෂ්පාදන සහ ක්‍රියාවලි සමාලෝචන
- පෙර සහ පසු (ESG) තක්සේරු කිරීම් ඇතුළුව පාරිසරික සහ සමාජීය නිසි විමර්ශනය

ප්‍රතිඵල

හඳුනාගත් ණය, වෙළඳපළ, ද්‍රවශීලතා, මෙහෙයුම්, නියාමන, කීර්තිනාම, තිරසාරත්වයට සම්බන්ධ සහ අනෙකුත් අවශේෂ අවදානම්

2 අවදානම් මැනීම

අරමුණු

හඳුනාගත් අවදානම්වල ස්වභාවය, සම්භාවිතාව සහ විභව බලපෑම තක්සේරු කිරීම

ප්‍රධාන ක්‍රියාකාරකම්

- ප්‍රධාන අවදානම් දර්ශක යෙදීම (KRIs)
- අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත අවදානම් අභිරුචිය සහ සීමාවන්ට එරෙහිව තක්සේරු කිරීම
- ප්‍රත්‍යාබල පරීක්ෂාව සහ අවස්ථා විශ්ලේෂණය
- කළඹ මට්ටමේ අවදානම් තක්සේරු කිරීම්
- ඓතිහාසික අලාභ දත්ත විශ්ලේෂණය
- විශේෂඥ විනිශ්චය සහ ආංශික විශ්ලේෂණය භාවිතා කරමින් ගුණාත්මක ඇගයීම්

ප්‍රතිඵල

බලපෑම සහ සම්භාවිතාව මත අවදානම් ශ්‍රේණිගත කිරීම් සහ ප්‍රමුඛතාකරණය

3 අධීක්ෂණය සහ පාලනය

අරමුණු

අවදානම් පිළිගත හැකි සීමාවන් තුළ පවතින බවට සහතික වන අතර පාලනයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම

ප්‍රධාන ක්‍රියාකාරකම්

- කළමනාකරණ තොරතුරු පද්ධතිය වාර්තා කිරීම හරහා අඛණ්ඩ අධීක්ෂණය (MIS)
- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ පද්ධතිය භාවිතය (IRMS)
- සීමා කළමනාකරණය සහ අධීක්ෂණය
- කළමනාකරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වෙත වරින් වර අවදානම් වාර්තා කිරීම
- අඛණ්ඩ අවදානම් සහ පාලන ස්වයං ඇගයීම් සහ පාලන සඵලතා සමාලෝචනය

ප්‍රතිඵල

පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක, ප්‍රවණතා විශ්ලේෂණය සහ අවදානම් ගැටළු කාලෝචිත ලෙස හඳුනා ගැනීම

4 අවම කිරීම සහ වාර්තා කිරීම

අරමුණු

අනුමත සීමාවන් තුළ අවදානම් කළමනාකරණය කිරීම සහ ඵලදායී අධීක්ෂණය සහ විනිවිදභාවය සහතික කිරීම

ප්‍රධාන ක්‍රියාකාරකම්

- අනුමත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි වලට අනුකූලව අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම
- අවදානම් අභිරුචි රාමුව සමඟ අවදානම් ප්‍රතිචාර පෙළගැස්වීම
- ප්‍රමාණාත්මක අවදානම් සහ මතුවන ගැටලු ඉදිරිපත් කිරීම
- අවදානම් නිරාවරණ, ප්‍රවණතා සහ ප්‍රත්‍යාබල පරීක්ෂණ ප්‍රතිඵල කළමනාකරණයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම

ප්‍රතිඵල

දැනුවත් තීරණ ගැනීම, ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සහ අවදානම් කළමනාකරණයේ අඛණ්ඩ වැඩිදියුණු කිරීම

අවදානම් ප්‍රමුඛතාවය, තිරසාරභාවය සහ දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා සංයෝජනය

තිරසාරභාවය සහ දේශගුණයට සම්බන්ධ අවදානම් සහ අවස්ථා (SRROs and CRROs) ඇතුළුව සියලුම ව්‍යවසාය අවදානම් පහත පරිදි තක්සේරු කර ප්‍රමුඛතාවය දෙනු ලැබේ. මෙම ක්‍රියාවලීන් මඟින් ව්‍යවසාය සහ ESG ආශ්‍රිත අවදානම් බැංකුවේ සමස්ත අවදානම් තක්සේරු කිරීම සහ ප්‍රමුඛතා ක්‍රියාවලීන් තුළට ඇතුළත් කර ඇති බව සහතික කරයි.

ව්‍යවසාය අවදානම්වල ස්වභාවය, සිදුවීමේ සම්භාවිතාව සහ බලපෑමේ ප්‍රමාණය තක්සේරු කිරීම

බැංකුව විසින් ගුණාත්මක සහ ප්‍රමාණාත්මක නිර්ණායකයන්ගේ සංයෝගයක් භාවිතා කරමින් ආයතනය පුරා පවතින අවදානම් තක්සේරු කරයි. ඒවාට ඇතුළත් වන්නේ:

- ස්වභාවය සහ අවදානම් ධාවක
- ඓතිහාසික ප්‍රවණතා, නව අවදානම් හඳුනාගැනීමේ දර්ශක මත පදනම්ව සිදුවීමේ සම්භාවිතාව
- මූල්‍ය, මෙහෙයුම්, නියාමන, කීර්තිමත්, තිරසාරභාවය සහ දේශගුණයට සම්බන්ධ මානයන් ඔස්සේ විභව බලපෑමේ විශාලත්වය

සමස්ත අවදානම් නිරාවරණය සහ අවදානම තීරණය කිරීම සඳහා ප්‍රමාණාත්මක සීමාවන්, ප්‍රත්‍යාබල පරීක්ෂණ ප්‍රතිඵල, ප්‍රධාන අවදානම් දර්ශක (KRI) සහ විශේෂඥ විනිශ්චය සාමූහිකව යොදනු ලැබේ.

අවදානම් නිර්ණායක

- ස්වභාවය සහ මූලාශ්‍රය
- සිදුවීමේ සම්භාවිතාව
- විභව බලපෑම

යෙදවුම් / ධාවක

- බලපෑම සහ සම්භාවිතාව
- ප්‍රමාණාත්මකතා විශ්ලේෂණය
- ප්‍රත්‍යාබල පරීක්ෂාව සහ අවස්ථා සංසන්දනය
- අවදානම් අභිරුචි රාමුව
- ERM ඒකාබද්ධ කිරීම

ප්‍රමුඛත්වය

- බලපෑම x සම්භාවිතා තක්සේරුව

බලපෑමට ලක් වූ අංශ

- ණය කාර්යසාධනය
- ඇපකර අගයන්
- ප්‍රතිපාර්ශ්වීය ණය ශක්තිය
- වෙළඳපළ නිරාවරණය
- මෙහෙයුම් වත්කම්

ඉහළ කළමනාකාරීත්වයට වාර්තා කිරීම සහ අඛණ්ඩව අධීක්ෂණය කිරීම

ප්‍රමාණාත්මක අවදානම් සහ නියමයන් උල්ලංඝනය කිරීම් ඉදිරිපත් කිරීම

අවදානම් අභිරුචි රාමු සීමාවන්ට එරෙහිව සමාලෝචනය

ක්‍රියාමාර්ග සහ අධීක්ෂණය සඳහා කළමනාකරණ සහ අදාළ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වෙත වාර්තා කිරීම

සංචලන මාර්ගෝපදේශය

- අවදානම් ඇගයීම සහ ප්‍රමුඛතාකරණය, ප්‍රත්‍යාබල පරීක්ෂණ ප්‍රතිඵල, ICAAP ප්‍රතිඵල, ප්‍රධාන අවදානම් දර්ශක සහ විශේෂඥ විනිශ්චය ඇතුළු ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යෙදවුම් පරාසයක් මඟින් දැනුම් දෙනු ලැබේ.

සවිස්තරාත්මක හෙළිදරව් කිරීම්:

- ප්‍රත්‍යාබල පරීක්ෂාව, ICAAP සහ ප්‍රතිසාධන සැලසුම් මෙම වාර්තාවේ 201-202 පිටුවල ඉදිරිපත් කර ඇත.
- තිරසාරභාවය සහ දේශගුණය සම්බන්ධ අවදානම් සහ අවස්ථා (SRROs and CRROs) මෙම වාර්තාවේ 214-215 පිටුවල ඉදිරිපත් කර ඇත.

අවදානම් සහ තිරසාර වර්ධනය

විකාශනය වන රාමුවක් තුළ 2025 දී සිදු කළ වැඩිදියුණු කිරීම්

අවදානම් සන්දර්භයේ වෙනස්කම්

පෙර වාර්තාකරණ කාලපරිච්ඡේදය (2024) හා සසඳන විට, 2025 දී බැංකුවේ අවදානම් භූ සන්දර්භය පුළුල් කරන ලද අතර වඩාත් පැහැදිලිව ප්‍රකාශ කරන ලදී. සාම්ප්‍රදායික අවදානම් කාණ්ඩ සමඟ නැඟී එන සහ මූල්‍ය නොවන අවදානම් ද එමඟින් පිළිබිඹු කරයි.

වැඩිදියුණු කිරීම්

- තිරසාරභාවයට සම්බන්ධ අවදානම් විශේෂිත අවදානම් කාණ්ඩයක් ලෙස පැහැදිලිව හඳුනා ගැනීම
- දේශගුණය සම්බන්ධ අවදානම් වෙනම අවදානම් කාණ්ඩයක් ලෙස පැහැදිලිව හඳුනා ගැනීම
- ස්වාධීන අවදානමක් ලෙස චර්යා අවදානම හඳුන්වාදීම, ගනුදෙනුකාර ප්‍රතිලාභ කෙරෙහි අවධානය යොමු කිරීම, සදාචාරාත්මක චර්යා, සහ නියාමන අපේක්ෂාවන්
- තෙවන පාර්ශ්වීය අවදානම් හඳුන්වාදීම, බාහිර වෙළඳ, සේවා සපයන්නන් සහ බාහිරින් ලබාගත් සම්පාදන
- අවදානම් පරිසරය තුළ වංචා අවදානම විධිමත් ලෙස ප්‍රකාශ කිරීම සහ විකාශනය වන අභ්‍යන්තර, බාහිර සහ සයිබර් සක්‍රීය වංචා තර්ජන වලට එරෙහිව පාලනයන් සහ අධීක්ෂණ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම
- පුද්ගලයන්, උපායමාර්ග සහ තාක්ෂණය ආශ්‍රිත අවදානම් පැහැදිලිව වෙන්කර හඳුනා ගැනීම මඟින් ව්‍යවසාය පුරා පැහැදිලි බව වැඩි දියුණු කිරීම

ප්‍රතිඵල

2025 දී බැංකුව ව්‍යවසාය අවදානම් කළමනාකරණ (ERM) රාමුව සහ ප්‍රතිපත්ති ව්‍යූහය පුළුල් කර ශක්තිමත් කරන ලදී. (ERM) ව්‍යවසාය අවදානම් කළමනාකරණය (ERM) රාමුව, වඩාත් විස්තීර්ණ, ව්‍යුහගත සහ සංවිධානය පුරා ස්ථාවර අවදානම් කළමනාකරණයට සහාය වීම සඳහා ඒකාබද්ධ රාමුවක් ලෙස පරිවර්තනය කර ඇත.

ERM රාමුවේ ව්‍යූහය ශක්තිමත් කිරීම

- විවිධ අවදානම් වලදි යොදා ගැනිමට ERM රාමුව පැහැදිලිව ක්‍රියාත්මක කිරීම
- අවදානම් වර්ගීකරණය, යහපාලන විධිවිධාන සහ සහායක ප්‍රතිපත්ති වැඩිදියුණු කර පෙළගැස්වීම
- මූල්‍ය නොවන, තිරසාරභාවය සහ දේශගුණයට සම්බන්ධ ඒකාබද්ධ කිරීම් මූලික ERM රාමුව තුළ සලකා බැලීම් වැඩිදියුණු කිරීම

අවදානම් ප්‍රතිපත්ති රාමුව පුළුල් කිරීම

- COBIT 2019 ව්‍යාපෘතියට අනුකූලව නවීකරණය කරන ලද සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- තාක්ෂණය, තොරතුරු ආරක්ෂාව, සහ සයිබර් අවදානම් යහපාලනය ශක්තිමත් කිරීම
- පාරිසරික, සමාජීය හා තිරසාරත්වය සම්බන්ධ අවදානම් ප්‍රතිපත්ති ERM රාමුවට ඒකාබද්ධ කිරීම

ප්‍රතිඵල

ශක්තිමත් ස්ථාවරත්වය, යහපාලන විනය සහ ව්‍යවසායික-පුළුල් පෙළගැස්ම මඟින් අවදානම් කළමනාකරණය සඳහා ශක්තිමත් සහ ඉදිරි දැක්මක් සහිත ප්‍රවේශයක් සපයයි.

අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන්හි වෙනස්කම්

2025 වසර තුළදී, බැංකුව විසින් පුළුල් කරන ලද ERM මත ගොඩනැඟීම, අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, අධීක්ෂණය සහ කළමනාකරණය සඳහා භාවිතා කරන ක්‍රියාවලීන් වැඩිදියුණු කරන ලදී.

ක්‍රියාවලි අංශය	2025 තුළ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම	අවදානම් කළමනාකරණය මත බලපෑම
අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරුව	• අතිරේක ව්‍යාපාර ඒකක සහ අවදානම් කාණ්ඩ හරහා අවදානම් සහ පාලන ස්වයං තක්සේරු කිරීම් (RCSA) පුළුල් කිරීම • තෙවන පාර්ශ්වීය සහ බාහිරින් ලබා ගැනීමේ අවදානම් තක්සේරුව • ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම • තිරසාරභාවය සහ දේශගුණයට සම්බන්ධ අවදානම් සංයෝජනය කිරීම් හඳුනාගැනීමේ ක්‍රියාවලීන් පිළිබඳ සලකා බැලීම.	• නැඟී එන සහ අන්තර් සම්බන්ධිත අවදානම් පූර්ව හඳුනා ගැනීම, පාලන හිඩැස්වල දෘශ්‍යතාව වැඩිදියුණු කිරීම සහ ව්‍යාවසාය පුරා ශක්තිමත් පූර්ව අවදානම් කළමනාකරණය
අවදානම් මිනුම්, අධීක්ෂණය සහ පාලනයන්	• භාණ්ඩාගාර පද්ධති වැඩිදියුණු කිරීමෙන් අනතුරුව මැද පෙළ කාර්යාල අවදානම් ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය • අවදානම් කළමනාකරණය සහ සයිබර් අධීක්ෂණ පාලනයන් ශක්තිමත් කරන ලදී. • සයිබර් වගකීම් රක්ෂණ ආවරණය සහ සයිබර් ආශ්‍රිත පාඩු අවශෝෂණය කර ගැනීම සඳහා මූල්‍ය ආරක්ෂණ ස්ථාපිත කරන ලදී.	• පුද්ගල මැදිහත්වීම් අවම කිරීම, අවදානම් දත්තවල නිරවද්‍යතාවය සහ කාලෝචිතභාවය වැඩි දියුණු කිරීම, සයිබර් ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම, සහ භාණ්ඩාගාර, වෙළඳපළ සහ මෙහෙයුම් අවදානම් ක්ෂේත්‍ර හරහා යහපාලන කාර්යක්ෂමතාව ශක්තිමත් කරන ලදී.
අවදානම් යහපාලන ව්‍යුහය	• තිරසාරභාවය, සහ දේශගුණය සම්බන්ධ අවදානම් අධීක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා කැපවූ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු හඳුන්වා දීම. • කළමනාකරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු අතර වාර්තා කිරීම පැහැදිලි කරන ලදී. • නියාමන අපේක්ෂාවන් සමඟ සයිබර් සහ තාක්ෂණ අවදානම යහපාලනය ශක්තිමත් කරන ලදී.	• වෙනස් වන අවදානම් පිළිබඳ වඩාත් විශේෂිත හා ව්‍යුහගත අධීක්ෂණය, වැඩිදියුණු කළ ඉදිරිපත් කිරීමේ විනය, යහපාලන විනිවිදභාවය සහ වගවීම
අවදානම් යහපාලනය සහ අධීක්ෂණය	• පුළුල් ආංශික විශේෂඥතාව සහ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් විවිධත්වය • විශේෂයෙන් නැඟී එන සහ මූල්‍ය නොවන අවදානම් පිළිබඳ වඩා ගැඹුරු ලෙස සහ වැඩි වාර ගණනක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවදානම් වාර්තා කිරීම.	• වැඩිදියුණු කළ අධීක්ෂණ ගුණාත්මකභාවය, දැනුවත් තීරණ ගැනීම, සහ බැංකුවේ අවදානම් අභිරුචිය සමඟ ශක්තිමත් පෙළගැස්ම

අවදානම් වලට ඔරොත්තු දීමේ හැකියාව, ප්‍රාග්ධනය ප්‍රමාණවත් බව සහ ප්‍රතිසාධන සැලැස්ම

බැංකුව විසින් අභිතකර තත්ත්වයන්, මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම සහ තිරසාර වර්ධනයට සහාය වීම සඳහා ඉදිරි දැක්මක් සහිතව අභිතකර තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව සහ ප්‍රාග්ධන කළමනාකරණ යාන්ත්‍රණ පරාසයක් යොදවයි. මෙම යාන්ත්‍රණයන් ප්‍රත්‍යාබල යටතේ ඔරොත්තු දීමේ හැකියාව පරීක්ෂා කිරීම, ප්‍රමාණවත් ප්‍රාග්ධන ස්වාරක්ෂකයක් සහතික කිරීම සහ කාලෝචිත ප්‍රතිසාධන ක්‍රියාමාර්ග සක්‍රීය කිරීම මගින් ව්‍යවසාය කළමනාකරණ රාමුවට (ERP) අනුපූරක වේ.

ප්‍රත්‍යාබල පරීක්ෂා කිරීම

අරමුණ

අහිතකර නමුත් පිළිගත හැකි අවස්ථා යටතේ බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කිරීම සහ විය හැකි අවදානම් හඳුනා ගැනීම

2025 වැඩිදියුණු කිරීම්/ නව අවස්ථා

- බැංකුවේ ආයතනික සැලැස්ම සහ මධ්‍ය කාලීන උපායමාර්ගික ඉදිරි දැක්ම සමඟ පෙලගස්වා, ප්‍රත්‍යාබල පරීක්ෂණ වසර පහක් දක්වා දීර්ඝ කරන ලදී.
- නිෂ්පාදන මට්ටමේ ණය තත්ත්ව ඇගයීම් ආරම්භ කිරීම, ප්‍රධාන ණය දීමේ කළඹ හරහා පිරිහීමේ ප්‍රවණතා ඇගයීම
- විශේෂයෙන්ම වෙළඳ සංවේදී අංශ තුළ ණය ගැනුම්කරුගේ මුදල් ප්‍රවාහ සහ වත්කම්වල ගුණාත්මක භාවය මත ඇති විය හැකි එක්සත් ජනපදයේ අනන්‍යෝන්‍ය තීරුබදු බලපෑම් තක්සේරු කිරීම
- දිට්ටිවා සුළි කුණාටුවේ බලපෑම් තක්සේරුව, භෞතික දේශගුණික අවදානම් නිරාවරණය, ආංශික අවදානම් සහ ණය කාර්යසාධනය, ඇපකර අගයන් සහ ද්‍රවශීලතාව මත විභව සම්ප්‍රේෂණ බලපෑම් විශ්ලේෂණය කිරීම

ක්‍රියාත්මක කිරීම සහ භාවිතය

- ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතා සැලසුම් දැනුම් දීම
- අවදානම් අවම කිරීමේ උපායමාර්ග සහ උපායමාර්ගික තීරණ ගැනීම සඳහා සහාය වීම

තක්සේරු විෂය පථය

- ප්‍රත්‍යාබල යටතේ ප්‍රාග්ධනය ප්‍රමාණවත් වීම
- අහිතකර අරමුදල් සහ මුදල් ප්‍රවාහ තත්ත්වයන් යටතේ ද්‍රවශීලතාව
- සාර්ව ආර්ථික, වෙළඳපළ සහ ණය කම්පන වලට ඉපැයීම් සහ ශේෂ පත්‍රයේ සංවේදීතාව

ඉදිරි දැක්ම

සාර්ව ආර්ථික, භූ දේශපාලනික සහ දේශගුණය ආශ්‍රිත අවදානම් ඇතුළුව, බැංකු විශේෂිත සහ වෙළඳපළ මත පදනම් වූ අවස්ථා ඇතුළත් කිරීමට ප්‍රත්‍යාබල පරීක්ෂාව වැඩි දියුණු කිරීම.

අවදානම් සහ තිරසාර වර්ධනය

අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණාත්මකතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP)

අරමුණ

සාමාන්‍ය සහ ආතති සහගත තත්ත්වයන් යටතේ ඇති විය හැකි සියලු අවදානම් ආවරණය කිරීම සඳහා ප්‍රාග්ධනය පවතින බව සහතික කිරීම.

2025 වැඩිදියුණු කිරීම්

- පස් අවුරුදු ආයතනික සැලැස්මට අනුකූලව ICAAP හි දීර්ඝ කරන ලද කාල සීමාව
- දේශගුණය සම්බන්ධ අවදානම් පිළිබඳ ගුණාත්මක තක්සේරු කිරීම් ඇතුළත් කර ඇත.

යහපාලනය සහ අධීක්ෂණය

- ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අදාළ අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු මගින් සමාලෝචනය කෙරේ.

තක්සේරුවේ විෂය පථය

- බැංකුවේ අවදානම් පැතිකඩ, උපායමාර්ගය සහ අවදානම් අභිරුචිය සම්බන්ධයෙන් ප්‍රාග්ධන ප්‍රමාණවත් බව
- ප්‍රත්‍යාබල පරීක්ෂණ සහ අවස්ථා විශ්ලේෂණ ප්‍රතිඵල ඒකාබද්ධ කිරීම
- ඉදිරි දැක්මක් සහිත ප්‍රාග්ධනය/ද්‍රවශීලතා සැලසුම් කිරීම සහ නියාමන අපේක්ෂාවන් සමඟ පෙළගැස්වීම

ඉදිරි දැක්ම

- පාරිසරික, සමාජීය සහ දේශගුණික අවදානම් සලකා බැලීම් සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා අවදානම් දර්ශකයක් සංවර්ධනය කිරීම සහ එය ICAAP වෙත ඇතුළත් කිරීම
- බැංකුවේ ප්‍රාග්ධන වර්ධන සැලැස්ම සහ තිරසාර මුලපිරීම් යටතේ, එහි ප්‍රාග්ධන පදනම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ණයකර නිකුත් කිරීම සැලසුම් කර ඇත

ප්‍රතිසාධන සැලැස්ම (RCP)

අරමුණ

දැඩි මූල්‍ය හෝ මෙහෙයුම් ආතති කාලවලදී කාලෝචිත සහ ව්‍යුහගත ප්‍රතිසාධන ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරීම

2025 ප්‍රතිසාධන දර්ශක වැඩිදියුණු කිරීම්

- නිරන්තරයෙන් වෙනස් වන නියාමන අපේක්ෂාවන්ට ගැලපෙන පරිදි සංශෝධිත අධීක්ෂණ හා නියාමන උපදෙස් ප්‍රතිසාධන සැලැසුම් රාමුවට ඒකාබද්ධ කරන ලදී.
- පූර්ව අනතුරු ඇඟවීම වැඩි දියුණු කිරීමට සහ විභව ආතති තත්ත්වයන් සඳහා සංවේදීතාව ඇති කිරීම සඳහා අතිරේක ප්‍රතිසාධන දර්ශකයක් හඳුන්වා දෙන ලදී.

අපේක්ෂිත ප්‍රතිඵල

- වැඩි දියුණු කළ සූදානම සහ සහතික කිරීමේ හැකියාව බැංකුවේ මූල්‍ය සහ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම.

ප්‍රධාන සංරචක

- ප්‍රතිසාධන දර්ශක සහ ඉදිරිපත් කිරීමේ සීමාවන්
- නිර්වචනය කළ යහපාලන සහ තීරණ ගැනීමේ යාන්ත්‍රණ
- බැංකුවේ අවදානම් පැතිකඩ සමඟ සමපාත වූ ප්‍රතිසාධන විකල්ප

ඉදිරි දැක්ම

- 2026 සඳහා ප්‍රතිසාධන සැලැස්ම සමාලෝචනය
- ප්‍රතිසාධන ක්‍රියා හෝ විකල්පවල අවශ්‍යතාවය තක්සේරු කිරීමට අමතර ප්‍රතිසාධන දර්ශක හඳුන්වා දීමෙන් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම

සමූහය පුරා ව්‍යවසාය අවදානම් කළමනාකරණය (ERM) ක්‍රියාත්මක කිරීම

සමූහය සහ එහි ජාත්‍යන්තර මෙහෙයුම් පුරා අවදානම් අධීක්ෂණයට පදනම වන ව්‍යවසාය අවදානම් කළමනාකරණ ප්‍රවේශයක් ක්‍රියාත්මක වේ.

පරිපාලිත සමාගම් අවදානම් කළමනාකරණය

සමූහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියට අනුව අභිරුචිය, යහපාලන ප්‍රමිතීන් සහ උපායමාර්ගික අරමුණු සමූහයේ සමස්ත අවදානම සමඟ පෙළගැස්වීම සහතික කිරීම සඳහා බැංකුව එහි පරිපාලිත ආයතන හරහා ස්ථාවර අවදානම් කළමනාකරණ ප්‍රවේශයක් යොදා ගනී.

පුළුල් සමූහ අවදානම් කළමනාකරණ පිළිවෙත්

- පරිපාලිත සමාගම් හරහා මූල්‍ය ස්ථාවරත්වය, නියාමන අනුකූලතාවය සහ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව සඳහා සහාය වීම
- අවදානම් හඳුනාගැනීමේ, තක්සේරු කිරීමේ සහ අධීක්ෂණයේ අනුකූලතාව ප්‍රවර්ධනය කිරීම
- කර්මාන්තයේ හොඳම භාවිතයන් සහ නියාමන අවශ්‍යතා ඇතුළත් කිරීම

ඉදිරි දැක්ම

- ශක්තිමත් යහපාලනය සහ වරින් වර අවදානම් සමාලෝචන හරහා බැංකුව පරිපාලිත ආයතන වල අවදානම් අධීක්ෂණය තවදුරටත් වැඩිදියුණු කරනු ඇත.

විදේශීය අවදානම් කළමනාකරණය

බැංකුවේ විදේශීය අවදානම් කළමනාකරණ රාමුව ජාත්‍යන්තර මෙහෙයුම් හරහා මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාර වර්ධනය සඳහා සහාය වේ.

අවදානම් කළමනාකරණ පිළිවෙත්

- විවිධ ආර්ථික, නියාමන සහ භූ දේශපාලනික පරිසරයන් තුළ ක්‍රියාත්මක වීමේ සංකීර්ණතා ආමන්ත්‍රණය කිරීම
- ප්‍රමිතිගත අවදානම් ක්‍රියාවලිය සහ විදේශීය ශාඛා හරහා ස්වයං තක්සේරුව පාලනය කිරීම
- ජාත්‍යන්තර කළඹ සඳහා ණය අවදානම් තක්සේරු කිරීම සහ ආතතිය පරීක්ෂා ඇති කිරීමේ ක්‍රමවේද ශක්තිමත් කිරීම
- විදේශීය අවදානම් කළමනාකරණ පිළිවෙත් බැංකුවේ සමස්ත ERM රාමුව සහ අවදානම් අභිරුචිය සමඟ සමපාත වේ

ඉදිරි දැක්ම

- ජාත්‍යන්තර මෙහෙයුම් පුළුල් කිරීමට සහාය වීම
- අවදානම් පරීක්ෂණ පරිශ්‍රයේම සිදු කිරීම

2025 අවදානම් සන්දර්භය

ප්‍රාථමික අවදානම් සහ අවස්ථා

මෙම පරිච්ඡේදයෙන් බැංකුවේ ප්‍රධාන අවදානම් සහ අවස්ථා ඉදිරිපත් කෙරෙන අතර, එමඟින් වත්මන් අවදානම් ස්වභාවය මෙන්ම බැංකුවේ ව්‍යාපාරික ආකෘතියට සහ වටිනාකම් නිර්මාණයට ඉන් ඇති විය හැකි බලපෑම ද පිළිබිඹු වේ.

1 ණය අවදානම | 2 ද්‍රවශීලතා අවදානම | 3 වෙළඳපළ අවදානම | 4 මෙහෙයුම් අවදානම

1 ණය අවදානම

අවදානම් අර්ථ දැක්වීම

ණය ගැණුම්කරුවෙකු හෝ ප්‍රතිපාර්ශ්වයක් එකඟ වූ නියමයන්ට අනුකූලව තම වගකීම් නියමිත වේලාවට සහ සම්පූර්ණයෙන් ඉටු කිරීමට අපොහොසත් වීම නිසා ඇති විය හැකි මූල්‍ය අලාභයන්ගේ අවදානමයි.

අවදානම් සංරචක

- ණය පැහැර හැරීමේ අවදානම - ණය ගැනුම්කරුවෙකු එකඟ වූ පරිදි ගෙවීම් කිරීමට අපොහොසත් වීම
- පියවීමේ අවදානම - මූල්‍ය ගනුදෙනු වලදී ප්‍රතිවිරුද්ධ පාර්ශ්ව අසමත් වීම
- සංකේන්ද්‍රණ අවදානම - නිශ්චිත ණයගැතියන්, අංශ, නිෂ්පාදන හෝ භූගෝලීය ප්‍රදේශ වලට අධික ලෙස නිරාවරණය වීම
- ශ්‍රේණිගත කිරීම් පහත වැටීමේ අවදානම- ණයගැතියන්ගේ ණය ගුණාත්මකභාවය පිරිහීම
- රට සහ දේශසීමා අවදානම - නිශ්චිත අධිකරණ බලතල ආර්ථික නියාමන හෝ දේශපාලන තත්ත්වයන්ට නිරාවරණය වීම

ණය අවදානම් කළමනාකරණ රාමුව

ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ අවදානම් අභිරුචිකත්ව රාමුව සමඟ සම්බන්ධ වී, පූර්ව ණය අනුමත කිරීම් සහ පසු ණය අධීක්ෂණය ආවරණය වන පුළුල් රාමුවක් හරහා බැංකුව ණය අවදානම කළමනාකරණය කරයි.

පූර්ව ණය අනුමත කිරීම

- ව්‍යුහගත ණය තක්සේරුව සහ නිර්වචනය කරන ලද ණය නිර්ණායක
- ස්වාධීන සමාලෝචනයක් සහිත බහු-ස්ථර අනුමැතිය
- ණය ගැණුම්කරු ශ්‍රේණිගත කිරීමේ ආකෘති සහ ලකුණු පුවරු
- අවදානම් මත පදනම් වූ මිලකරණය සහ නියාමන සීමාවන්

පශ්චාත්-ණය නිරීක්ෂණය

- අඛණ්ඩ ණය සමාලෝචන සහ කළඹ ඇගයීම්
- පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා හඳුනා ගැනීම සහ ක්‍රියාකාරී මැදිහත්වීම
- නිරීක්ෂණ ලැයිස්තු නිරීක්ෂණය සහ ණය සමාලෝචන යාන්ත්‍රණ
- ප්‍රත්‍යාබල පරීක්ෂාව සහ අවස්ථා විශ්ලේෂණය

අවදානම් මැනීම

- අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් සහ ප්‍රධාන අවදානම් දර්ශක (KRIs)
- වත්කම්වල ගුණාත්මකභාවය සහ හානිකරණ අලාභ තක්සේරුව
- ප්‍රත්‍යාබල පරීක්ෂණ සහ අවස්ථා විශ්ලේෂණ ප්‍රතිදානයන්
- කළඹ මට්ටමේ ප්‍රවණතා සහ කාර්යසාධන විශ්ලේෂණය

මිනුම්

- මුළු ණය නිරාවරණය
- මුළු වත්කම්වලින් % ක් ලෙස නිරාවරණය
- අදියර 3 මුළු ණය නිරාවරණයෙන් % ක් ලෙස

ව්‍යාපාර ආකෘතියට ඇති බලපෑම

වත්මන් බලපෑම්

ණය අවදානම වත්කම්වල ගුණාත්මකභාවය, ප්‍රතිපාදන මට්ටම් සහ ඉපැයීම් ස්ථායිතාව කෙරෙහි බලපෑම් කරන අතරම, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවේ ප්‍රතිඵල හැඩගැස්වීම සහ අවදානම් බර තැබූ වත්කම් ප්‍රශස්තකරණය කෙරෙහිද බලපෑම් කරයි.

සංකේන්ද්‍රණ සංවේදීතාව

ණය ගැණුම්කරු, ආංශික, නිෂ්පාදන, භූගෝලීය, ඇපකර, ශ්‍රේණිගත කිරීමේ ශ්‍රේණි සහ දේශසීමා හරහා නිරාවරණය වන විට, විශේෂයෙන් ආතති සහගත තත්ත්වයන් යටතේ ඉහළ සංවේදීතාවයක් වේ.

වටිනාකම් නිර්මාණයට සබැඳිය

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්

අදාළ ප්‍රමාණාත්මක මාතෘකා

01 | 06 | M10

අදාළ ප්‍රාග්ධන

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක

ඉදිරි දැක්ම


- කළඹ විවිධාංගීකරණය විවිධ අංශ සහ නිෂ්පාදන හරහා අවදානම් ගැලපුම් ප්‍රතිලාභ වැඩි දියුණු කිරීම
- අවදානම් මත පදනම් වූ මිලකරණය වැඩිදියුණු කළ ණය විශ්ලේෂණ හරහා මිලකරණ ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම
- තිරසාර මූල්‍යනය යටතේ හරිත හා සංක්‍රාන්ති ණය විසඳුම් පුළුල් කිරීම
- ශේෂ පත්‍ර ඔරොත්තු දීමේ හැකියාව, දිගුකාලීන වත්කම් ගුණාත්මකභාවය සහ ප්‍රාග්ධන කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම

අවදානම් සහ තිරසාර වර්ධනය


ණය අවදානම් කාර්යසාධනය

ප්‍රධාන අවදානම් දර්ශකය	2025.12.31 ට සත්‍ය තත්ත්වය	2024.12.31 ට සත්‍ය තත්ත්වය
ශුද්ධ අඩියර 3 ණය අනුපාතය (%)	5.6	5.1
හානිකරණ ආවරණය (අඩියර 3) ණය අනුපාතය (%)	57.9	60.4
ක්ෂේත්‍ර අනුව සංකේන්ද්‍රණය වීම (HHI)	1,037	991
භූගෝලීය සංකේන්ද්‍රණය වීම	1,947	2,031


භූගෝලීය සංකේන්ද්‍රණය %




ඇපකර සංකේන්ද්‍රණය %




නිෂ්පාදන අනුව සංකේන්ද්‍රණය %




ශ්‍රේණි අනුව ව්‍යාප්තිය %



ක්ෂේත්‍රමය සංකේන්ද්‍රණය %



බැංකුව විදේශ රටවලට නිරාවරණය %



2 ද්‍රවශීලතා අවදානම

අවදානම් අර්ථ දැක්වීම

පිළිගත නොහැකි පාඩු සිදු නොකර හෝ මූල්‍ය ස්ථාවරත්වයට හානි නොකර, නියමිත වේලාවට සහ සම්පූර්ණයෙන් තම ගෙවීම් බැඳීම් ඉටු කිරීමට බැංකුවට නොහැකි වීමෙන් ඇතිවන අවදානම.

අවදානම් සංරචක

- අරමුදල් ද්‍රවශීලතා අවදානම - තොග සහ සිල්ලර අරමුදල් වෙළඳපළට ප්‍රවේශ වීම ඇතුළුව, නියමිත වගකීම් සපුරාලීමට බැංකුවට ප්‍රමාණවත් අරමුදල් ලබා ගැනීමට නොහැකි වීමේ අවදානම
- වෙළඳපළ ද්‍රවශීලතා අවදානම - වෙළඳපළ ද්‍රවශීලතා අවදානම හේතුවෙන් සුදුසු කාල රාමුවක් තුළ සාධාරණ වෙළඳපළ වටිනාකමකින් වත්කම් ඈවර කළ නොහැකි වීමේ අවදානම
- කල්පිරීමේ නොගැලපීමේ අවදානම - වත්කම්වල කල්පිරීමේ පැතිකඩ (උදා: දිගුකාලීන ණය) සහ වගකීම් (උදා: කෙටිකාලීන තැන්පතු) අතර නොගැලපීම නිසා ඇතිවන අවදානම
- පොළී අනුපාත සංවේදීතාව - පොළී අනුපාතවල වෙනස්වීම් අරමුදල් පිරිවැයට හෝ වත්කම් වටිනාකමට බලපාන අතර, ද්‍රවශීලතා නම්‍යශීලීභාවය සීමා කළ හැකි අවදානම
- ණය ශ්‍රේණිගත කිරීම පහත හෙළීමේ අවදානම - බැංකුවේ ණය ශ්‍රේණිගත කිරීමේ පිරිහීම අරමුදල් පිරිවැය වැඩි කිරීමට හෝ වෙළඳපළ ප්‍රවේශය සීමා කිරීමට හේතු විය හැකි අවදානම
- කීර්තිනාමය සහ අවිනිශ්චිත ද්‍රවශීලතා අවදානම - ආතති සිදුවීම්, අහිතකර ප්‍රචාරණය, තැන්පත්කරුවන්ගේ විශ්වාසය නැතිවීම හෝ වෙළඳපළ බාධා කිරීම් හේතුවෙන් ඇති විය හැකි අනපේක්ෂිත මුදල් පිටතට ගලා යාමේ අවදානම

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව

නියාමන අවශ්‍යතා සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් අභිරුචිකත්ව රාමුවට අනුකූලව පුළුල් රාමුවක් හරහා බැංකුව ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කරයි. මෙම රාමුව ප්‍රමාණවත් ද්‍රවශීලතා ස්වාරක්ෂකය, විවිධාංගීකරණය වූ අරමුදල් ප්‍රභවයන් සහ සාමාන්‍ය සහ ආතති තත්ත්වයන් යටතේ අඛණ්ඩ අධීක්ෂණය සහතික කරයි. එමඟින් සියලුම අරමුදල් බැඳීම් සපුරාලීමට සහ හදිසි ද්‍රවශීලතා කම්පනවලට ඔරොත්තු දීමට බැංකුවට ඇති හැකියාවට සහාය වේ.

ව්‍යුහාත්මක ද්‍රවශීලතා කළමනාකරණය

- අර්ථ දක්වා ඇති කල්පිරීම් පැතිකඩ හරහා වත්කම්-වගකීම් කළමනාකරණය
- ප්‍රමාණවත් උපස් තත්ත්වයේ ද්‍රවශීලතා වත්කම් නඩත්තු කිරීම
- අරමුදල් මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීම

අඛණ්ඩ අධීක්ෂණය සහ පාලනයන්

- ද්‍රවශීලතා අනුපාත සහ පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක අඛණ්ඩව අධීක්ෂණය කිරීම
- වරින් වර ප්‍රත්‍යාබල පරීක්ෂණ සහ අවස්ථා විශ්ලේෂණය
- නම් කරන ලද කළමනාකරණ කමිටු සහ අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු විසින් අධීක්ෂණය කිරීම

අවදානම් මැනීම

- ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR)
- ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR)
- හිවිසුම්ගත කල්පිරීම් නොගැලපීම් විශ්ලේෂණය
- අරමුදල් මූලාශ්‍ර සංකේන්ද්‍රණය
- ලබා ගත හැකි බර නොකළ ද්‍රව වත්කම්

මිනුම් දර්ශක

- ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR)
- ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR)
- බැරකම් රහිත සුරැකුම් සහිත ද්‍රවශීලී වත්කම්
- ණය - තැන්පතු අනුපාතය

ව්‍යාපාර ආකෘතියට ඇති බලපෑම

වත්මන් බලපෑම්

ද්‍රවශීලතා තත්ත්වයන් ණය දීමේ ධාරිතාව, වත්කම්-වගකීම් කළමනාකරණය සහ අරමුදල් පිරිවැය කෙරෙහි බලපෑම් කරන අතර, කෙටිකාලීන හෝ අස්ථාවර අරමුදල් මත වැඩි වශයෙන් රඳා පැවතීම ශේෂ පත්‍ර නම්‍යශීලීභාවය සීමා කරන අතර ස්ථාවර, විවිධාංගීකරණය වූ තැන්පතු සඳහා ඇති අවශ්‍යතාවය ශක්තිමත් කරයි.

සංකේන්ද්‍රණ සංවේදීතාව

භාණ්ඩාගාර සහ වත්කම්-බැරකම් කළමනාකරණ ක්‍රියාකාරකම්වල පවතින ඉහළ සංවේදීතාව, තැන්පතු වල අස්ථාවර ස්වභාවය සහ මුදල් වෙළඳපළ සඳහා බැංකුවේ ඇති නිරාවරණය මීට ඇතුළත් වේ.

වටිනාකම් නිර්මාණයට සබැඳිය

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්

අදාළ ප්‍රමාණාත්මක මාතෘකා

01 06 M10

අදාළ ප්‍රාග්ධන

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක

ඉදිරි දැක්ම


- වත්කම්-වගකීම් කළමනාකරණය හැසිරීම් විශ්ලේෂණය හරහා ද්‍රවශීලතාවය පවත්වා ගනිමින් ප්‍රතිලාභ උපරිම කිරීම සඳහා ශේෂ පත්‍ර ප්‍රශස්තකරණය
- දත්ත මත පදනම් වූ අවදානම් නවෝත්පාදනය
- විවක්ෂණශීලී ශේෂ පත්‍ර කළමනාකරණ උපායමාර්ග
- වැඩිදියුණු කළ ප්‍රත්‍යාබල පරීක්ෂණ ශිල්පීය ක්‍රම
- ස්වයංක්‍රීය අධීක්ෂණ මෙවලම්

අවදානම් සහ තිරසාර වර්ධනය


ද්‍රවශීලතා අවදානම් කාර්යසාධනය

ප්‍රධාන අවදානම් දර්ශකය	නියාමන/ ප්‍රතිපත්තිමය පරාමිතිය	2025.12.31 ට සත්‍ය තත්ත්වය	2024.12.31 ට සත්‍ය තත්ත්වය
ද්‍රවශීලතාවය ආවරණය අනුපාතය (LCR) (%)	≥ 100.0	260.4	269.6
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR) (%)	≥ 100.0	156.6	157.9
ණය-තැන්පතු අනුපාතය (%)	–	60.5	57.9

අරමුදල් සංයුතිය 2025 %



බැරකම් රහිත සුරැකුම්



3 වෙළඳපළ අවදානම

අවදානම් අර්ථ දැක්වීම

පොලී අනුපාත,විදේශ විනිමය අනුපාත, කොටස් මිල ගණන් හෝ භාණ්ඩ මිල ගණන් වල අහිතකර චලනයන් හේතුවෙන් පාඩු ඇතිවීමේ අවදානම

අවදානම් සංරචක

- පොලී අනුපාත අවදානම - වෙළඳපළ පොළී අනුපාත වෙනස්කම් තුළින් ඉපැයීම් සහ ආර්ථික වටිනාකම් මත ඇති වන බලපෑම
- විනිමය අනුපාත අවදානම - විදේශීය මුදල් නිරාවරණයට බලපාන අස්ථාවර විදේශීය විනිමය අනුපාත
- කොටස් අවදානම- කොටස් මිල ගණන් සහ අදාළ උපකරණ වල වටිනාකම් උච්චාවචනයන්
- වෙළඳ භාණ්ඩ අවදානම - භාණ්ඩ මිල ගණන් වෙනස්වීම් වලට නිරාවරණය

වෙළඳපළ අවදානම් කළමනාකරණ රාමුව

බැංකුවේ අවදානම් අභිරුචිය සහ නියාමන අවශ්‍යතා වලට අනුකූලව සකස් කරන ලද විස්තීර්ණ රාමුවක් හරහා බැංකුව සිය වෙළඳපළ අවදානම් කළමනාකරණය කරයි. මේ සඳහා අවදානම් සීමා නිර්ණය කිරීම, ස්වාධීන අධීක්ෂණය සහ ප්‍රත්‍යාබල පරීක්ෂණයන් වැනි ක්‍රමවේදයන් ඇතුළත් කර ඇත.

ව්‍යුහාත්මක අවදානම් කළමනාකරණය

- වෙළඳ සහ බැංකු නිරාවරණයන් සඳහා පූර්ව නිශ්චිත සීමාවන් පැනවීම
- කාලසීමාව සහ ප්‍රතිමිලකරණ පරතරය කළමනාකරණය
- සුදුසු පරිදි හෙජින් උපායමාර්ග භාවිතා කිරීම

අබණ්ඩ අධීක්ෂණය සහ පාලනයන්

- දිනපතා නිරීක්ෂණය වල වෙළඳපළ නිරාවරණයන් සහ සීමාව භාවිතය
- ප්‍රත්‍යාබල පරීක්ෂා කිරීම සහ අවස්ථාව විශ්ලේෂණය
- වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) සහ නම් කරන ලද අධ්‍යක්ෂ අනුකමිටු විසින් අධීක්ෂණය

අවදානම් මැනීම

- අවදානම් අගය සහ PVBP විශ්ලේෂණය
- කාලසීමාව සහ ප්‍රතිමිලකරණ පරතරය විශ්ලේෂණය
- සංවේදීතා විශ්ලේෂණය සහ ප්‍රත්‍යාබල පරීක්ෂණ ආකෘති

මිනුම් දර්ශක

- මුළු වෙළඳ කළඹ නිරාවරණය
- ශුද්ධ විවෘත විදේශීය මුදල් තත්ත්වය

ව්‍යාපාර ආකෘතියට ඇති බලපෑම

වත්මන් බලපෑම්

පොළී අනුපාත සහ විදේශ විනිමය අනුපාතිකයන්හි පවතින අස්ථාවරත්වය, භාණ්ඩාගාර ආදායම, වෙළඳ කාර්යසාධනය සහ වත්කම් තක්සේරුකරණය කෙරෙහි සෘජුවම බලපෑම් එල්ල කරයි. මෙම තත්ත්වය හේතුවෙන්, වඩාත් දියුණු විශ්ලේෂණ ක්‍රමවේදයන් භාවිත කිරීමේ සහ සක්‍රිය ශේෂ පත්‍ර කළමනාකරණයක නිරත වීමේ අවශ්‍යතාව තවදුරටත් තහවුරු වේ.

සංකේන්ද්‍රණ සංවේදීතාව

විශේෂයෙන්ම වෙළඳපළ ආතති සහගත තත්ත්වයන් පවතින කාල පරිච්ඡේදවලදී, බැංකුව මුහුණ දෙන ඉහළ සංවේදීතාව ප්‍රධාන වශයෙන්ම පැන නඟින්නේ අපනයන සහ ආනයන වෙළඳපළවල්, භාණ්ඩාගාර මෙහෙයුම්, විදේශ විනිමය අංශ, රජයේ සුරැකුම්පත් සහ වෙළඳ නිරාවරණයන් වැනි අංශ වලිනි.

වටිනාකම් නිර්මාණයට සබැඳිය

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන් අදාළ ප්‍රමාණාත්මක මාතෘකා

අදාළ ප්‍රාග්ධන

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක

ඉදිරි දැක්ම


- **වෙළඳපළ විශ්ලේෂණ**
  පද්ධති-පාදක විශ්ලේෂණ හරහා පොළී අනුපාත සහ විදේශ විනිමය අවදානම් ආකෘතිකරණය වැඩිදියුණු කිරීම
- වෙළඳපළ විචල්‍යයන්හි අස්ථාවරත්වය අනුව අවදානම් අභිරුචියට අබණ්ඩව වෙනස්කම් සිදු කිරීම
- රාජ්‍ය සුරැකුම්පත් වල අවදානම්-ප්‍රතිලාභ තුලනය ප්‍රශස්ත කිරීම සඳහා වන අවදානම් කළමනාකරණ උපායමාර්ග

වෙළඳපළ අවදානම් කාර්යසාධනය

ප්‍රධාන අවදානම් දර්ශකය	2025.12.31 ට සත්‍ය තත්ත්වය	2024.12.31 ට සත්‍ය තත්ත්වය
ශුද්ධ පොළී ආදායම (රු. මිලියන)	206,936	167,552
ශුද්ධ පොළී ආන්තිකය (%)	3.9	3.6
පදනම් ලක්ෂ්‍යයට අනුව මිල වටිනාකම් - භාණ්ඩාගාර බැඳුම්කර	717,562	629,067


පදනම් ලක්ෂ්‍යයට අනුව මිල වටිනාකම් - භාණ්ඩාගාර බැඳුම්කර

රු මිලියන




වත්කම් හා බැරකම් කල්පිරීම් පිළිබඳ විශ්ලේෂණය - 2025 දෙසැම්බර්

%



වත්කම් හා බැරකම් පිළිබඳ සංවේදීතා විශ්ලේෂණය - 2025 දෙසැම්බර්

%



අවදානම් සහ තිරසාර වර්ධනය

4 මෙහෙයුම් අවදානම

අවදානම් අර්ථ දැක්වීම

මෙහෙයුම් අවදානම යනු ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක වූ අභ්‍යන්තර ක්‍රියාවලීන්, පුද්ගලයින් සහ පද්ධති හෝ බාහිර සිදුවීම් වලින් පැන නගින මූල්‍යමය අලාභයේ අවදානමයි. එයට නීතිමය අවදානම ඇතුළත් වන අතර උපායමාර්ගික සහ කීර්තිනාම අවදානම ඇතුළත් නොවේ.

අවදානම් සංරචක

- අභ්‍යන්තර වංචාව - වංචා කිරීමට, දේපළ අනිසි ලෙස අත්පත් කර ගැනීමට හෝ රෙගුලාසි හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමට අදහස් කරන ක්‍රියාවන්ගෙන් පැන නගින පාඩු
- බාහිර වංචාව - සයිබර්-සක්‍රීය වංචා ඇතුළුව තෙවන පාර්ශ්වයන්ගේ වංචනික ක්‍රියාවන්ගෙන් පැන නගින පාඩු
- රැකියා පිළිවෙත් සහ සේවා ස්ථාන ආරක්ෂාව - රැකියා පිළිවෙත්, වෙනස්කම් කිරීම්, සේවා ස්ථාන ආරක්ෂාව සහ සේවක සබඳතාවලට අදාළ අවදානම්
- සේවාලාභීන්, නිෂ්පාදන සහ ව්‍යාපාර පිළිවෙත්- නිෂ්පාදන සැලසුම් කිරීමේදී සහ බෙදා හැරීමේදී සේවාදායකයින්ට වෘත්තීය බැඳීම් හෝ නියාමන අවශ්‍යතා සපුරාලීමේදී අසමත් වීම
- භෞතික වත්කම්වලට හානි වීම- ස්වාභාවික විපත්, විනාශකාරී ක්‍රියා හෝ වෙනත් භෞතික සිදුවීම් වලින් පැන නගින පාඩු
- ව්‍යාපාර බාධා සහ පද්ධති අසාර්ථකත්වයන් - මෙහෙයුම් වලට බලපාන තාක්ෂණික අසාර්ථකත්වයන්, සයිබර් සිදුවීම් හෝ යටිතල පහසුකම් බාධා කිරීම්
- ක්‍රියාත්මක කිරීම, බෙදා හැරීම සහ ක්‍රියාවලි කළමනාකරණය - ගනුදෙනු සැකසීමේදී, දත්ත කළමනාකරණයේදී හෝ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේ දෝෂ

මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව

බැංකුව, පුද්ගලයින්, ක්‍රියාවලීන් සහ පද්ධතිවල අභ්‍යන්තර අසාර්ථකත්වයන් මෙන්ම බාහිර සිදුවීම් වලින් පැන නගින අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, නිරීක්ෂණය කිරීම සහ අවම කිරීම සඳහා නිර්මාණය කර ඇති ව්‍යුහගත රාමුවක් හරහා මෙහෙයුම් අවදානම කළමනාකරණය කරයි.

ව්‍යුහාත්මක අවදානම් කළමනාකරණය

- අවදානම් සහ පාලන ස්වයං තක්සේරු කිරීම්
- නිර්වචනය කරන ලද මෙහෙයුම් අවදානම් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි
- සිදුවීම් වාර්තාකරණ සහ ඉහළ මට්ටම් වෙත යොමු කිරීමේ ක්‍රියාපටිපාටි

අඛණ්ඩ අධීක්ෂණය සහ පාලනයන්

- ප්‍රධාන අවදානම් දර්ශක (KRI) අධීක්ෂණය
- පාඩු සිදුවීම් නිරීක්ෂණය සහ මූල හේතු විශ්ලේෂණය
- මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව (ORMEC) සහ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු විසින් අධීක්ෂණය

අවදානම් මැනීම

- අලාභ සිදුවීම් දත්ත විශ්ලේෂණය
- ප්‍රධාන අවදානම් දර්ශක සීමාවන් සහ උල්ලංඝනය නිරීක්ෂණය
- අවස්ථා විශ්ලේෂණය සහ ආතති තක්සේරු කිරීම්

මිනුම් දර්ශක

- මෙහෙයුම් අලාභ අනුපාතය
- මුළු මෙහෙයුම් අලාභ

ව්‍යාපාර ආකෘතියට ඇති බලපෑම

වත්මන් බලපෑම්

මෙහෙයුම් අකාර්යක්ෂමතා සහ සයිබර් තර්ජන පිරිවැය වැඩි කිරීමට, සේවා සැපයීමට බාධා කිරීමට සහ ගනුදෙනුකාර විශ්වාසයට සහ ඵලදායිතාවයට බලපෑ හැකිය.

සංකේන්ද්‍රණ සංවේදීතාව

ශාඛා මෙහෙයුම්, මූලික තොරතුරු තාක්ෂණ පද්ධති, පියවීම් සහ ගනුදෙනුකාර සේවා ඒකක තුළ ඉහළ සංවේදීතාවයක් ඇති වන අතර, එහිදී ක්‍රියාවලි අසාර්ථකත්වයන් හෝ සයිබර් සිදුවීම් සේවා අඛණ්ඩතාවයට සහ කීර්තිනාමයට සෘජුවම බලපෑ හැකිය.

වටිනාකම් නිර්මාණයට සබැඳිය

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්



අදාළ ප්‍රමාණාත්මක මාතෘකා:



අදාළ ප්‍රාග්ධන



අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක



ඉදිරි දැක්ම


- **ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය**
  අත් වැරදීම් අවම කර මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට ඩිජිටල්කරණය වේගවත් කිරීම
- **ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය**
  පිරිවැය ව්‍යුහයන් ප්‍රශස්ත කිරීමට, සහ සේවා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට වැඩ ප්‍රවාහ ක්‍රියාවලීන් විධිමත් කිරීම
- **කුසලතා සංවර්ධනය**
  සංකීර්ණ මෙහෙයුම් සහ නැඟී එන අවදානම් පරිසරයන් කළමනාකරණය කිරීම සඳහා කාර්ය මණ්ඩල හැකියාවන් ශක්තිමත් කිරීම
- **සයිබර් ආරක්ෂණ නායකත්වය**
  ගනුදෙනුකාර විශ්වාසය සහ තරඟකාරී වාසිය සඳහා සාධකයක් ලෙස ශක්තිමත් සයිබර් ප්‍රතිරෝධීතාව සහ මෙහෙයුම් පාලනයන් ස්ථානගත කිරීම

මෙහෙයුම් අවදානම් කාර්යසාධනය


ප්‍රධාන අවදානම් දර්ශකය	සත්‍ය තත්ත්වය (31.12.2025)	සත්‍ය තත්ත්වය (31.12.2024)
මෙහෙයුම් අලාභය අවදානම් අභිරුචියේ ප්‍රතිශතයක් ලෙස (%)	38.0	8.0

රු. මිලියන 1,377.0 ක අභ්‍යන්තර සහන සීමාවට යටත්ව, 2025 සඳහා වූ මෙහෙයුම් අලාභ රු. මිලියන 508.0 ක් අනුමත අවදානම් අභිරුචිය තුළම පැවතුනි. ඩිට්වා සුළි කුණාටුව හේතුවෙන් භෞතික වත්කම් වලට සිදු වූ අවදානම් වලට අතිරේකව වංචා වලින් සිදු වූ අලාභයන් ගිය වසරට සාපේක්ෂව අඩු වී ඇත.

අවදානම් අභිරුචියට සාපේක්ෂව තථ්‍ය අලාභයන් හා ප්‍රතිපාදන



2025 වර්ෂය සඳහා අලාභ දත්ත විශ්ලේෂණය





අවදානම් සහ තිරසාර වර්ධනය

වෙනත් අවදානම් සහ අවස්ථා

බැංකුවේ මූලික අවදානම් කාණ්ඩයට අතිරේකව, වෙනත් බොහෝ අවදානම් සහ අවස්ථාවන්, ආයතනික අවදානම් කළමනාකරණ රාමුවේ කොටසක් වශයෙන් පුළුල්ව හා ක්‍රියාකාරීව අධීක්ෂණය හා කළමනාකරණය කිරීම සිදු කරනු ලබයි. මෙකී අවදානම්, උපායමාර්ග, පුද්ගලයන්, නියාමන, ක්‍රියාත්මක කිරීම්, තිරසාරත්වය, තාක්ෂණය සහ බැංකුවේ දීර්ඝ කාලීන ඔරොත්තු දීමේ හැකියාවට බලපාන තුන්වන පාර්ශ්වයන්ගේ සලකා බැලීම්, කීර්තිය සහ වටිනාකම් නිර්මාණය තුළින් නිරූපණය වේ. එක් එක් අවදානම බැංකුවේ අවදානම් අභිරුචිය හා යහපාලන ව්‍යුහයන්ට අනුකූලව තක්සේරු කරනු ලබන අතර, හඳුනාගත් අවස්ථා කාර්යසාධනය ශක්තිමත් කිරීම, අනුවර්තනය වීමේ හැකියාව වැඩිදියුණු කිරීම සහ තිරසාර වර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා භාවිතා කරනු ලැබේ.

05 උපායමාර්ගික අවදානම් 06 පුද්ගල අවදානම් 07 තොරතුරු හා තොරතුරු තාක්ෂණ අවදානම් 08 නියාමන සහ අනුකූලතා අවදානම් 09 චර්යා අවදානම් 10 නීතිමය අවදානම් 11 කීර්තිනාමයට සිදුවන හානි පිළිබඳ අවදානම් 12 තිරසාරභාවයට සම්බන්ධ අවදානම් 13 දේශගුණයට සම්බන්ධ අවදානම් 14 තෙවන පාර්ශ්වීය අවදානම් 15 වංචා අවදානම්

05 උපායමාර්ගික අවදානම්

අවදානම අර්ථ දැක්වීම

බැංකුවේ අනාගත ව්‍යාපාර සැලසුම්, ප්‍රමාණවත් නොවන හෝ කාර්යක්ෂම නොවන උපායමාර්ග හෝ මෙහෙයුම් පරිසරයේ සිදුවන වෙනස්වීම් වලට ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීම තුළින් පැන නැඟිය හැකි අනාගත අලාභ උපායමාර්ගික අවදානම ලෙස හඳුනාගත හැක.

අවදානම් සංරචක

- සාර්ව ආර්ථික සහ ප්‍රතිපත්තිමය අවිනිශ්චිතතාව
- තරඟකාරීත්ව පීඩනය සහ වෙළඳපළ බාධා
- උපායමාර්ග, අවදානම් අභිරුචිය සහ ප්‍රාග්ධන ධාරිතාවය අතර අනිසි පෙළගැස්වීම

මිනුම් දර්ශක

- උපායමාර්ගික අවදානම් දර්ශකය

අවදානම් අවම කිරීමේ ක්‍රියා

- ආයතනික කළමනාකරණය සහ විධායක කළමනාකරණය ක්‍රියාකාරීව සම්බන්ධ කරගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන උපායමාර්ගික සැලසුම් සහ සමාලෝචන ක්‍රියාවලියක් හරහා කළමනාකරණය කිරීම
- ක්‍රියාත්මක වන පරිසරය, නියාමන සංවර්ධනයන්, ප්‍රාග්ධන සීමාවන් සහ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් උපායමාර්ගික ප්‍රමුඛතා සකස් කිරීම
- උපායමාර්ග මුලපිරීම් සඳහා පැහැදිලිව අර්ථ දක්වා ඇති මැනිය හැකි ඉලක්ක සහ කාලානුරූප සන්ධිස්ථාන මඟින් සහාය ලැබේ.
- අර්ථ දක්වා ඇති යහපාලන ව්‍යුහයන් සහ පැහැදිලි වගවීමේ රාමු ව්‍යුහගත ලකුණු කාඩ්පත් සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක හරහා අඛණ්ඩව කාර්යසාධන අධීක්ෂණය
- උපායමාර්ගික මුලපිරීම්, බැංකුවේ අනුමත අවදානම් අභිරුචිකත්ව රාමුව සහ දීර්ඝකාලීන ප්‍රාග්ධන අරමුණු සමඟ සමපාත කිරීම

වටිනාකම් නිර්මාණයට සබැඳිය

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්



අදාළ ප්‍රමාණාත්මක මාතෘකා



අදාළ ප්‍රාග්ධන



අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක



ඉදිරි දැක්ම

- **නව ව්‍යාපාර ආකෘති**
  ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය ඩිජිටල් බැංකුකරණය, ජංගම ගෙවීම් හෝ BOC connect වලට යොමු කිරීම.
- **වෙළඳපළ පරතරය හඳුනාගැනීම**
  සපුරාලිය නොහැකිවූ ගනුදෙනුකාර අවශ්‍යතා සඳහා වූ හිඩැස් වෙළඳපළ නිෂ්පාදන දියත් කිරීම.
- **හවුල්කාරිත්වයන් සහ සන්ධාන**
  වෙළඳපළ ශක්තිමත් කිරීම සඳහා ෆින්ටෙක් සමාගම සමඟ අත්වැල් බැඳ ගැනීම.
- **නැගී එන වෙළඳපළ අවස්ථා**
  සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ඩිජිටල් ගනුදෙනුකරුවන්, හරිත අංශ

උපායමාර්ගික අවදානම් කාර්යසාධනය

ප්‍රධාන අවදානම් දර්ශකය	නියාමන අවශ්‍යතා / ප්‍රතිපත්තිමය පරාමිතිය	සත්‍ය තත්ත්වය (31.12.2025)	සත්‍ය තත්ත්වය (31.12.2024)
ස්ථරය 1 ප්‍රාග්ධන අනුපාතය (%)	≥ 10.0%	12.4	13.0
මුළු ප්‍රාග්ධන අනුපාතය (%)	≥ 15.0%	16.9	16.6
පොදු ස්කන්ධ ස්ථර 1 අනුපාතය (%)	≥ 8.5%	11.4	12.0
ස්කන්ධ මත ප්‍රතිලාභ (ROE) (%)	-	22.7	23.2

06 පුද්ගල අවදානම්

අවදානම් අර්ථ දැක්වීම

ප්‍රමාණවත් ලෙස දක්ෂතා කළමනාකරණය නොකිරීම, සේවකයන්ගේ කුසලතා හිඩැස් පැවතීම, දුර්වල අනුප්‍රාප්තික සැලසුම්කරණය සහ ශක්තිමත් සදාචාරාත්මක මෙන්ම අවදානම් පිළිබඳ දැනුවත් සංස්කෘතියක් පවත්වා ගැනීමට අපොහොසත් වීම නිසා ආයතනයකට බරපතල අහිතකර ප්‍රතිඵල ඇතිවීමේ අවදානම.

අවදානම් සංරචක

- සාර්ව ආර්ථික සහ ප්‍රතිපත්ති අවිනිශ්චිතතාව
- තරඟකාරීත්ව පීඩනය සහ වෙළඳපළ බාධා
- උපායමාර්ග, අවදානම් අභිරුචිය සහ ප්‍රාග්ධන ධාරිතාවය අතර අනිසි පෙළගැස්වීම

මිනුම් දර්ශක

- කාර්යමණ්ඩල පිරිවැටුම් අනුපාතය

අවදානම් අවම කිරීමේ ක්‍රියා

- ව්‍යුහගත දක්ෂතා සංවර්ධන වැඩසටහන්
- අනුප්‍රාප්ති සැලසුම් කිරීමේ රාමු
- කාර්යසාධන කළමනාකරණය පද්ධති
- සහභාගීත්වය සහ සංස්කෘතිය ශක්තිමත් කිරීමේ වැඩසටහන්

වටිනාකම් නිර්මාණයට සබැඳිය

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්



අදාළ ප්‍රමාණාත්මක මාතෘකා



අදාළ ප්‍රාග්ධන



අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක



ඉදිරි දැක්ම

- **කුසලතා වර්ධනය**
  ඩිජිටල් සහ අවදානම් හැකියාවන් ශක්තිමත් කිරීම.
- **නායකත්ව අනුප්‍රාප්තික සැලසුම්කරණය**
  අභ්‍යන්තර අනුප්‍රාප්තික ශක්තිය ගොඩනැගීම.
- **ආයතනික සංස්කෘතිය උසස් කිරීම**
  අවදානම්-දැනුවත්භාවය සහ සදාචාරාත්මක හැසිරීම ශක්තිමත් කිරීම.
- **සේවක සහභාගීත්ව මෙවලම්**
  රඳවා ගැනීම සහ කාර්යසාධනය වැඩි දියුණු කිරීම.

අවදානම් සහ තිරසාර වර්ධනය

07 තොරතුරු සහ තොරතුරු තාක්ෂණ අවදානම්

අවදානම් අර්ථ දැක්වීම

තොරතුරු පද්ධතිවල පවතින ප්‍රමාණවත් නොවීම් හෝ අසාර්ථක වීම්, සයිබර් ආරක්ෂණ පාලන ක්‍රමවේදයන්ගේ දුර්වලතා, දත්ත ආරක්ෂණ යාන්ත්‍රණයන්හි අඩුපාඩු හෝ තාක්ෂණික යටිතල පහසුකම් බිඳවැටීම් හේතුවෙන් ඇති විය හැකි මූල්‍ය හෝ මෙහෙයුම් අලාභයන්ගේ අවදානමයි. මීට අමතරව, බාහිර සයිබර් තර්ජන සහ තෙවන පාර්ශ්වීය තාක්ෂණික සේවා සපයන්නන් වෙතින් පැන නඟින අවදානම් ද මෙයට ඇතුළත් වේ.

අවදානම් සංරචක

- සයිබර් ආරක්ෂණ තර්ජන සහ ඩිජිටල් වංචා
- පද්ධති අක්‍රිය කාලය සහ යටිතල පහසුකම් අසාර්ථක වීම
- දත්ත රහස්‍යතාව සහ රහස්‍යභාවය උල්ලංඝනය කිරීම්
- තෙවන පාර්ශ්වීය තාක්ෂණ අවදානම්

අවදානම් අවම කිරීමේ ක්‍රියා

- ශක්තිමත් කරන ලද සයිබර් ආරක්ෂණ රාමු සහ අධීක්ෂණ මෙවලම්
- ජාල ආරක්ෂණ වැඩිදියුණු කිරීම් සහ ප්‍රවේශ පාලන
- නිතිපතා අවදානම් තක්සේරු කිරීම් සහ විනිවිදභාවයේ පරීක්ෂණ
- තොරතුරු තාක්ෂණ පාලන අධීක්ෂණය සහ සිදුවීම් ප්‍රතිචාර ක්‍රියාපටිපාටි

අවදානම් තක්සේරුව

- පද්ධති ලබා ගැනීමේ හැකියාව සහ අක්‍රිය කාල මිනුම්
- සයිබර් සිදුවීම් සංඛ්‍යාතය සහ බරපතලකම
- අවදානම් නිවැරදි කිරීමේ කාලරාමු
- විගණන සහ පාලන තක්සේරු ප්‍රතිඵල

මිනුම් දර්ශක

- පද්ධති ක්‍රියාකාරී කාලය
- සයිබර් ආරක්ෂණ සිදුවීම් ගණන

ව්‍යාපාර ආකෘතියට ඇති බලපෑම

වත්මන් බලපෑම්

සයිබර් සිදුවීම් හෝ පද්ධති අසමත්වීම්, මෙහෙයුම් වලට, ගනුදෙනුකාර විශ්වාසයට, සහ නියාමන පරීක්ෂාව වැඩි කිරීමට බලපෑ හැකිය.

සංකේන්ද්‍රණ සංවේදීතාව

සයිබර් සිදුවීම් හෝ පද්ධති අසමත්වීම් මෙහෙයුම් වලට, ගනුදෙනුකාර විශ්වාසයට, සහ නියාමන පරීක්ෂාව වැඩි කිරීමට බලපෑ හැකිය.

වටිනාකම් නිර්මාණයට සබැඳිය

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්



අදාළ ප්‍රමාණාත්මක මාතෘකා



අදාළ ප්‍රාග්ධන



අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක



ඉදිරි දැක්ම

- **සයිබර් අවකාශයට ඔරොත්තු දීමේ නායකත්වය**
  ආරක්ෂිත ඩිජිටල් බැංකු සැපයුම්කරුවෙකු ලෙස පැවතීම.
- **ඩිජිටල් පරිවර්තනය**
  පද්ධති කාර්යක්ෂමතාව සහ පරිමාණාත්මක හැකියාව වැඩිදියුණු කිරීම.
- **උසස් විශ්ලේෂණය**
  අධීක්ෂණය සහ පුරෝකථන තර්ජන හඳුනා ගැනීමේ හැකියාව ශක්තිමත් කිරීම

08 නියාමන සහ අනුකූලතා අවදානම්

අවදානම් අර්ථ දැක්වීම

බැංකු කටයුතු පාලනයට අදාළ නීති, රෙගුලාසි සහ කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකූල වීමට අපොහොසත් වීමෙන් ඇතිවන අවදානමයි.

අවදානම් සංරචක

- AML/ CFT නියාමන පැහැර හැරීම්
- වාර්තාකරණ සහ අනාවරණ දෝෂ
- නියාමන වෙනස්වීම් සහ අධීක්ෂණ ක්‍රියාමාර්ග
- ගනුදෙනුකාර ආරක්ෂණ උල්ලංඝනය කිරීම්

අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග

- කැපවූ අනුකූලතා ඒකකයක අධීක්ෂණය
- අඛණ්ඩ නියාමන නිරීක්ෂණ සහ වාර්තාකරණ රාමු
- අනුකූලතා පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්
- අභ්‍යන්තර විගණන සහ අනුකූලතා ඇගයීම්

මිනුම් දර්ශක

- නියාමන අවදානම් දර්ශකය
- අනුකූලතා අවදානම් දර්ශකය

වටිනාකම් නිර්මාණයට සබැඳිය

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්



අදාළ ප්‍රමාණාත්මක මාතෘකා



අදාළ ප්‍රාග්ධන



අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක



ඉදිරි දැක්ම

- **නියාමන තාක්ෂණය භාවිතයට අනුගත වීම**
  නිරවද්‍යතාවය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නියාමන වාර්තාකරණ සහ අධීක්ෂණ ක්‍රියාවලීන් ස්වයංක්‍රියකරණය කිරීම.
- **නියාමන සුදානම**
  බැංකුවේ විශ්වසනීයත්වය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, අලුතින් හඳුන්වා දෙන විචක්ෂණශීලී සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ රෙගුලාසි වලට ශීඝ්‍රයෙන් අනුවර්තනය වීම.
- **අනුකූලතා උපදේශන හැකියාව**
  නියාමන රෙගුලාසි සහ යහපාලන මාර්ගෝපදේශයන් නිවැරදිව අනුගමනය කිරීම සඳහා ගනුදෙනුකරුවන්ට/ සේවාදායකයින්ට අවශ්‍ය වෘත්තීය උපදෙස් සඳහා සහාය ලබා දීම.
- **යහපාලන පරිවර්තනය**
  ආයතනික විශ්වාසයේ සහ ස්ථාවරත්වයේ ප්‍රධාන පදනම ලෙස ශක්තිමත් නියාමන අනුකූලතා සංස්කෘතියක් බැංකුව තුළ ස්ථාපිත කිරීම.

09 චර්යා අවදානම්

අවදානම් අර්ථ දැක්වීම

සදාචාර විරෝධී හැසිරීම්, විෂමාචාර හෝ ගනුදෙනුකරුවන්ගේ යහපත වෙනුවෙන් ක්‍රියා කිරීමට අපොහොසත් වීමෙන් පැන නඟින මූල්‍යමය හෝ කීර්තිනාමයට හානි වීමේ අවදානම.

අවදානම් සංරචක

- විකුණුම් විෂමාචාර සහ වැරදි ලෙස විකිණීම
- සබඳතා පිළිබඳ ගැටුම්
- ප්‍රමාණවත් නොවන හෙළිදරව් කිරීමේ පිළිවෙත්
- ගනුදෙනුකාර පැමිණිලි සහ දුක්ගැනවිලි

මිනුම් දර්ශක

- ශූන්‍ය වැරදි අලෙවි කිරීම්

අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග

- චර්යාධර්ම සංග්‍රහය සහ ආචාරධර්ම ප්‍රතිපත්ති
- කාර්ය මණ්ඩල පුහුණුව සහ සහතික කිරීමේ වැඩසටහන්
- ගනුදෙනුකාර පැමිණිලි හැසිරවීමේ යාන්ත්‍රණ
- විසිල්බ්ලෝවිං රාමු

වටිනාකම් නිර්මාණයට සබැඳිය

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්

අදාළ ප්‍රමාණාත්මක මාතෘකා

M3 M4

අදාළ ප්‍රාග්ධන

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක

ඉදිරි දැක්ම

- **සදාචාරාත්මක සහ සංස්කෘතික වැඩසටහන්**
  සියලුම ව්‍යාපාරික ඒකක හරහා අවදානම් පිළිබඳ දැනුවත් සහ ගනුදෙනුකාර කේන්ද්‍රීය සංස්කෘතියක් ශක්තිමත් කිරීම
- **පුහුණුව සහ සහතික කිරීම**
  වගකීම් සහගත විකුණුම් සහ ගනුදෙනුකාර සන්නිවේදනය සඳහා කාර්ය මණ්ඩල නිපුණතාවය වැඩි දියුණු කිරීම
- **ගනුදෙනුකාර විශ්වාසය ස්ථානගත කිරීම**
  පැහැදිලි සහ සාධාරණ ගනුදෙනුකාර පිළිවෙත් හරහා බැංකුව සුවිශේෂී ලෙස ස්ථානගත කිරීම
- **අභ්‍යන්තර වාර්තාකරණ ක්‍රමවේද සහ යහපාලන යාන්ත්‍රණ වැඩිදියුණු කිරීම**
  අභ්‍යන්තර වගවීම සහ ගැටළු මුල් අවධියේදීම හඳුනාගැනීම් ශක්තිමත් කිරීම

10 නීතිමය අවදානම්

අවදානම් අර්ථ දැක්වීම

නීතිමය ක්‍රියාමාර්ග, ගිවිසුම්ගත ආරවුල් මෙන්ම නීති සහ රෙගුලාසි නිවැරදිව අර්ථ නිරූපණය කිරීමට හෝ බලාත්මක කිරීමට නොහැකි වීම වැනි අවිනිශ්චිතතා හේතුවෙන්, ආයතනයකට මූල්‍යමය පාඩු සිදුවීමේ අවදානම.

අවදානම් සංරචක

- නඩු පැවරීම් සහ හිමිකම් පෑම්
- ගිවිසුම් ලියකියවිලි වල අඩුපාඩු
- නියාමන හා නීතිමය අභියෝග
- අධිකරණමය අවදානම්

මිනුම් දර්ශක

- වසරකට ව්‍යාපාර ආශ්‍රිත නඩු ගණන
- වසරකට ව්‍යාපාර ආශ්‍රිත නොවන නඩු ගණන

අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග

- නිෂ්පාදන සහ ගිවිසුම් වල නීතිමය සමාලෝචනය
- අඛණ්ඩ නීති උපදේශන සහ අනුකූලතා අධීක්ෂණය
- ශක්තිමත් ලියකියවිලි සහ යහපාලන පාලනයන්

වටිනාකම් නිර්මාණයට සබැඳිය

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්

අදාළ ප්‍රමාණාත්මක මාතෘකා

M1 M3 M4

අදාළ ප්‍රාග්ධන

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක

ඉදිරි දැක්ම

- **නීතිමය අවදානම් ඒකාබද්ධ කිරීම**
  නිෂ්පාදන සංවර්ධනය සහ ගිවිසුම් සැලැසුම් කිරීමේ මුල් අදියරේදීම නීතිමය සමාලෝචනය ඒකාබද්ධ කිරීම
- **ගිවිසුම් ප්‍රශස්තිකරණය**
  ලියකියවිලි ප්‍රමිතීන් ශක්තිමත් කිරීම තුළින් නීතිමය කටයුතු සඳහා පවතින නිරාවරණය අවම කිරීම
- **සැලසුමේදීම අනුකූලතාව**
  ආරම්භයේ සිටම නිරන්තරයෙන් වෙනස් වන නියාමන අපේක්ෂාවන් සමඟ නිෂ්පාදන සහ සේවාවන් පෙළගැස්වීම
- **උපදේශන හැකියාව**
  සංකීර්ණ ගනුදෙනු සහ අධිකරණමය කටයුතු සඳහා සහාය වීම සඳහා අභ්‍යන්තර නීති විශේෂඥතාව වැඩි දියුණු කිරීම.

අවදානම් සහ තිරසාර වර්ධනය

11 කීර්තිනාමයට සිදු වන හානි පිළිබඳ අවදානම්

අවදානම් අර්ථ දැක්වීම

ඍණාත්මක මහජන සංජානනය, පාර්ශ්වකරුවන්ගේ අතෘප්තිය හෝ විශ්වාසය සහ වෙළඳපල විශ්වාසයට බලපාන අහිතකර මාධ්‍ය ආවරණය හේතුවෙන් ඇතිවන අලාභ පිළිබඳ අවදානම.

අවදානම් සංරචක
- ඍණාත්මක ප්‍රසිද්ධිය
- ගනුදෙනුකාර අතෘප්තිය
- සමාජ මාධ්‍ය නිරාවරණය

මිනුම් දර්ශක
- කීර්තිමත් අවදානම් දර්ශකය

අවදානම් අවම කිරීමේ ක්‍රියා
- විනිවිදභාවයෙන් යුතු සන්නිවේදන රාමු
- ගනුදෙනුකාර බැඳීම් යාන්ත්‍රණ

වටිනාකම් නිර්මාණයට සබැඳිය

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්



අදාළ ප්‍රමාණාත්මක මාතෘකා



අදාළ ප්‍රාග්ධන



අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක



ඉදිරි දැක්ම
- **වෙළඳ සන්නාමය සුවිශේෂීකරණය**
  සදාචාරාත්මක බැංකුකරණ ක්‍රමවේදයන් මඟින් කීර්තිනාමය ශක්තිමත් කිරීම.
- **ක්‍රියාශීලී සන්නිවේදනය**
  පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ශක්තිමත් කිරීම සඳහා ආතති සහගත අවස්ථාවන්හිදී විනිවිදභාවය පවත්වා ගැනීම.
- **ගනුදෙනුකාර සහභාගීත්ව වැඩසටහන්**
  සේවා විශිෂ්ටත්වය සහ ඩිජිටල් සම්බන්ධතාවය තුළින් පක්ෂපාතිත්වය ගොඩනඟා ගැනීම
- **චින්තන නායකත්වය**
  මූල්‍ය සාක්ෂරතාවය, ඇතුළත්කරණය සහ නවෝත්පාදනය පිළිබඳ විශ්වාසදායක ආයතනයක් ලෙස බැංකුව ස්ථානගත කිරීම.

12 තිරසාරභාවයට සම්බන්ධ අවදානම්

අවදානම් අර්ථ දැක්වීම

බැංකුවේ මූල්‍ය කාර්යසාධනය, වත්කම්වල ගුණාත්මකභාවය, අරමුදල් ප්‍රවේශය සහ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය කෙරෙහි බලපෑම් කළ හැකි පාරිසරික, සමාජීය සහ යහපාලන (ESG) සාධක වලින් පැන නඟින අවදානම්.

අවදානම් සංරචක
- ESG නියාමනය සහ අනාවරණය කිරීමේ අවශ්‍යතා
- කාබන්-තීව්‍ර අංශ වලට සම්බන්ධ සංක්‍රාන්ති බලපෑම්
- සමාජ බලපෑම සහ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන්
- ESG දත්ත ලබා ගැනීමේ හැකියාව සහ වාර්තා කිරීමේ ගුණාත්මකභාවය

අවදානම් අවම කිරීමේ ක්‍රියා
- තිරසාරභාවය පිළිබඳ මූලපිරීම් සඳහා විශේෂිත අරමුදල් හඳුනා ගැනීම සහ වෙන් කිරීම
- තිරසාර නිෂ්පාදන නිර්මාණය කර සංවර්ධනය කිරීම
- ප්‍රමාණාත්මක ESG තක්සේරුකරණයන් පැවැත්වීම
- ESG ආශ්‍රිත දත්ත රැස් කිරීමේ යාන්ත්‍රණය සංවර්ධනය

අවදානම් මැනීම
- ණය ඇගයීම් සහ අවදානම් රාමු තුළට ESG කරුණු ඒකාබද්ධ කිරීම්
- තිරසාර මූල්‍ය ප්‍රතිපත්තිය
- ESG පාලනය සහ කාර්යසාධනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කළමනාකාරිත්වයේ අධීක්ෂණය
- තිරසාරභාවයට අදාළ නිරාවරණයන් සහ නැඟී එන අවදානම් අධීක්ෂණය සහ සමාලෝචනය

මිනුම් දර්ශක
- තිරසාර මූල්‍ය කළඹ

ව්‍යාපාර ආකෘතියට ඇති බලපෑම

වත්මන් බලපෑම්
ESG සම්බන්ධයෙන් ඉහළ යන අපේක්ෂාවන් ණය ප්‍රතිපත්ති, අරමුදල් ලබා ගැනීමේ හැකියාව සහ සන්නාම ස්ථානගත කිරීම කෙරෙහි බලපෑම් ඇති කරන අතර, අඛණ්ඩ කළඹ පෙළගැස්ම සහ නිෂ්පාදන සංවර්ධනය අවශ්‍ය වේ.

සංකේන්ද්‍රණ සංවේදීතාව
පුනර්ජනනීය බලශක්තිය සහ හරිත යටිතල පහසුකම්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SMEs), සහ ESG සම්බන්ධිත අරමුදල් මූලාශ්‍ර වෙත ඉහළ නිරාවරණයක් පවතී.

වටිනාකම් නිර්මාණයට සබැඳිය

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්



අදාළ ප්‍රමාණාත්මක මාතෘකා



අදාළ ප්‍රාග්ධන



අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක



ඉදිරි දැක්ම
- **හරිත මූල්‍යකරණ බලශක්ති**
  පුනර්ජනනීය සහ තිරසාර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය විසඳුම් පුළුල් කිරීම
- **ESG උපදේශන සේවා**
  සේවාදායකයින්ගේ සංක්‍රාන්තිය සහ ESG සඳහා සහාය වීම
- **ජාත්‍යන්තර ESG අරමුදල් සැපයීම්**
  තිරසාරභාවයට සම්බන්ධ අරමුදල් සැපයීම සහ හවුල්කාරිත්වයන් ආකර්ෂණය කරගැනීම
- **තිරසාර උපකරණ**
  වගකීම් සහගත ස්ථානගත කිරීම් ශක්තිමත් කිරීම සඳහා හරිත/ තිරසාර බැඳුම්කර නිකුත් කිරීම හෝ සහභාගී වීම.

13 දේශගුණයට සම්බන්ධ අවදානම්

දේශගුණයට සම්බන්ධ අවදානම් සහ අවස්ථා

1 භෞතික අවදානම්

තීව්‍ර අවදානම්

(සිදුවීම් මගින් මෙහෙයවනු ලබන දේශගුණික උපද්‍රව)

ගංවතුර, නියඟ සහ නායයෑම් වැනි දරුණු කාලගුණික සිදුවීම්, මෙහෙයුම් වලට බාධා ඇති කළ හැකි, වත්කම් වලට හානි කළ හැකි සහ මූල්‍යමය පාඩු ඇති කළ හැකිය.

චිරස්ථිත අවදානම්

(දේශගුණික රටා වල දිගුකාලීන වෙනස්කම්)

දිගුකාලීන දේශගුණික බලපෑම් හේතුවෙන් ණය ගැනුම්කරුවන්ගේ ව්‍යාපාර සහ ජීවනෝපායන් කෙරෙහි ඇතිවන ණය අවදානම වැඩිවීම, ණය පැහැර හැරීම්, ද්‍රවශීලතාවය, වෙළඳපළ සහ මෙහෙයුම් අවදානම් වලට තුඩු දිය හැකි අතර එමඟින් වත්කම්, ප්‍රාග්ධනය සහ දෛනික මෙහෙයුම් කෙරෙහි ඇති වන බලපෑම් කළමනාකරණය කිරීමට බැංකුවට බල කෙරේ.

2 සංක්‍රාන්ති අවදානම්

ප්‍රතිපත්ති/ නීතිමය සහ තාක්ෂණය

බලශක්ති කාර්යක්ෂම පද්ධති සහ හරිත ගොඩනැගිලි වැඩිදියුණු කිරීම් සඳහා ආයෝජන ඇතුළුව, අවම කාබන් ආර්ථිකයකට මාරුවීම හා සම්බන්ධ ඉහළ වියදම්.

වෙළඳපළ සහ කීර්තිනාමය

ඉහළ විමෝචන අංශ වලින් ඉවත් වීමෙන් ඇතිවන ලාභදායීතාවය අඩු වීම හෝ කීර්තිනාම අවදානම් නිරන්තරයෙන් වෙනස් වන නියාමන අපේක්ෂාවන්ට අනුකූල නොවීමෙන් ඇතිවන ලාභදායීතාවය අඩු වීම හෝ කීර්තිනාම අවදානම්

සංචලන මාර්ගෝපදේශය

මෙම වාර්තාවේ 85-106 පිටුවල ඇති SLFRS S2 හෙළිදරව් කිරීම් වල, දේශගුණික සම්බන්ධ බලපෑම් පිළිබඳ උදාහරණ දක්වා ඇත.

14 තෙවන පාර්ශ්වීය අවදානම්

අවදානම් අර්ථ දැක්වීම

බාහිර වෙළෙඳුන්, සේවා සපයන්නන් සහ බාහිර සේවා සැපයුම් ගිවිසුම් මත පැන නඟින මූල්‍ය හෝ මෙහෙයුම් බලපෑම් මත අවදානම

අවදානම් සංරචක

- වෙළෙඳ කාර්යසාධන අවදානම
- බාහිරකරණ බාධා
- දත්ත ආරක්ෂාව සම්බන්ධ අවදානම
- සේවා මට්ටම් අනුකූලතා අසාර්ථකත්වයන්

අවදානම් අවම කිරීමේ ක්‍රියා

- සැපයුම්කරුවන් පිළිබඳ නිසි පරීක්ෂා සහ ඇතුළත් කිරීමේ පාලනයන්
- අඛණ්ඩ කාර්යසාධන නිරීක්ෂණය සහ සේවා මට්ටම් ගිවිසුම් (SLA) අධීක්ෂණය
- තෙවන පාර්ශ්වීය අවදානම් තක්සේරු කිරීම

වටිනාකම් නිර්මාණයට සබැඳිය

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්

අදාළ ප්‍රමාණාත්මක මාතෘකා

M2 M4 M8 M9

අදාළ ප්‍රාග්ධන

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක

ඉදිරි දැක්ම

- **කාර්යසාධන නිරීක්ෂණය**
  සේවා විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා තෙවන පාර්ශ්වීය අධීක්ෂණය ශක්තිමත් කිරීම
- **උපායමාර්ගික බාහිරකරණය**
  පරිමාණාත්මක සහ පිරිවැය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා විශේෂිත සැපයුම්කරුවන් යොදා ගැනීම.
- **තාක්ෂණික හවුල්කාරිත්වයන්**
  අවදානම් නිරාවරණය කළමනාකරණය කරමින් නවෝත්පාදනය වේගවත් කිරීම සඳහා ෆින්ටෙක් ආයතන සමඟ ඇති විය හැකි සහයෝගිතා

අවදානම් සහ තිරසාර වර්ධනය

15 වංචා අවදානම්

අවදානම් අර්ථ දැක්වීම

ඩිජිටල් වංචා, අනන්‍යතා අනිසි භාවිතය, ගනුදෙනු හැසිරවීම හෝ පාලනය මග හැරීම ඇතුළුව අභ්‍යන්තර හෝ බාහිර වංචනික ක්‍රියාකාරකම් හේතුවෙන් පැන නඟින මූල්‍යමය පාඩු, මෙහෙයුම් බාධා හෝ කීර්තිනාමයට හානි වීමේ අවදානම.

අවදානම් සංරචක

- අභ්‍යන්තර වංචා සහ සේවක විෂමාචාරය
- බාහිර වංචා, ඇතුළුව ඩිජිටල් සහ කාඩ්පත් ආශ්‍රිත වංචා
- අනන්‍යතා සොරකම සහ ගිණුම් අත්පත් කර ගැනීමේ සිදුවීම්
- පාලනය අභිබවා යන ක්‍රියාවලි දුර්වලතා

අවදානම් අවම කිරීමේ ක්‍රියා

- වංචා නිරීක්ෂණ සහ අනාවරණය පද්ධති ක්‍රියාත්මක කිරීම
- රාජකාරී සහ අභ්‍යන්තර පාලන රාමු වෙන් කිරීම
- ඩිජිටල් සහ කාඩ්පත් වේදිකා හරහා ගනුදෙනු සෝදිසි කිරීම
- කාර්ය මණ්ඩල දැනුවත්භාවය ඉහළ නැංවීමේ වැඩසටහන් සහ වංචා වැළැක්වීමේ පුහුණු වීම්
- සිදුවීම් වාර්තාකරණ ක්‍රමවේද ශක්තිමත් කිරීම

වටිනාකම් නිර්මාණයට සබැඳිය

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්



අදාළ ප්‍රමාණාත්මක මාතෘකා



අදාළ ප්‍රාග්ධන



අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක



ඉදිරි දැක්ම

- **දියුණු වංචා විශ්ලේෂණ**
  කෘතිම බුද්ධියෙන් (AI) මෙහෙයවන හඳුනාගැනීමේ සහ පුරෝකථන අධීක්ෂණ මෙවලම් යෙදවීම
- **ඩිජිටල් පාලනය වැඩිදියුණු කිරීම්**
  සත්‍යාපනය සහ ගනුදෙනු නිරීක්ෂණ රාමු ශක්තිමත් කිරීම
- **ගනුදෙනුකාර දැනුවත්භාවය මූලපිරීම්**
  විශ්වාසය තහවුරු කිරීම සඳහා වංචා වැළැක්වීමේ දැනුවත් බව ප්‍රවර්ධනය කිරීම



මූල්‍ය වාර්තා

කාර්යසාධනයෙන් පෙරමුණ ගැනීමට

ජාතිය වෙත ඇති ගැඹුරු වගකීම සහ පැහැදිලි උපායමාර්ගික දැක්ම මගින් මඟපෙන්වනු ලබමින්, බැංකුව සියලුම මූල්‍ය පරාමිතීන් හරහා විශිෂ්ට කාර්යසාධනයක් ලබා දී ඇත. එය අඛණ්ඩ වර්ධනය, ශක්තිමත් වත්කම්, ගුණාත්මකභාවය සහ පාර්ශ්වකරුවන්ට මෙන්ම ප්‍රජාවන්ටද තිරසාර වටිනාකම් නිර්මාණය කිරීම පැහැදිලිව පෙන්නුම් කරයි.

රූබික් ඝනකයක විසඳුම් සොයන මාවත් ක්වින්ට්ලියන 43ක් පවතිනවා සේම, අපේ අනාගතය ඉදිරියෙහිද බොහෝ අවස්ථා විවෘතව පවතී. වැදගත් වන්නේ ස්ථාවර පැවැත්මක්, පැහැදිලි දැක්මක් සහ අභියෝග හමුවේ නොනැවතී ඉදිරියටම යාමට ඇති හැකියාවත් ය.

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

1. හැඳින්වීම

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධනයන් හි අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කරන ලද 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන බැංකුවේ සහ සමූහයේ විගණනය කරන ලද සමෝධානික මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන මත ඉදිරිපත් කරන විගණන වාර්තාව සමඟ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, බැංකුවේ කටයුතු පිළිබඳ සිය වාර්තාව ඉදිරිපත් කරන්නේ ඉතාමත් සතුටිනි. තවද මෙම වාර්තාව තුළ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ වන 2024 අංක 05 දරණ බැංකු පනත් නියාමනයන් සහ එහි පසුකාලීන සංශෝධනයන් මඟින් හා කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීති මඟින් දක්වන අවශ්‍යතාවයන්ට අනුව ඉදිරිපත් කරන හෙළිදරව් කිරීම් ද ඇතුළත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2026 පෙබරවාරි 24 දින සමාලෝචනය කර අනුමත කරන ලදී.

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන් යටතේ 1939 අගෝස්තු 1 දින ලංකා බැංකුව සංස්ථාපනය කරන ලද අතර 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් යටතේ ස්ථාපනය කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වේ. බැංකුවේ පූර්ණ හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය සතුවේ. බැංකුව විසින් සුරැකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර නිකුත් කර ඇති අතර ඒවා කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇත.

2. ව්‍යාපාර කටයුතු පිළිබඳ සමාලෝචනය

2.1 බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ පුද්ගලික සහ සංවර්ධන බැංකුකරණය, ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය, වෙළඳ මූල්‍ය, ව්‍යාපෘති මූල්‍යකරණය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශ සඳහා මූල්‍යකරණය, ඉස්ලාමීය බැංකුකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, ජාත්‍යන්තර බැංකුකරණය, උපායමාර්ගික ආයෝජන ක්‍රියාකාරකම්, විදේශීය මෙහෙයුම් සහ අනෙකුත් අදාළ බැංකු සේවා කළමනාකරණය කිරීම ඇතුළු පුළුල් පරාසයක මූල්‍ය සේවා සැපයීමයි.

2.2 පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම්

පරිපාලිත සහ ආශ්‍රිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව විස්තරාත්මක කරුණු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් යටතේ පිටු අංක 246 හි ඇතුළත් වේ. සී/ස බී ඕ සී අයි ටී සොලූෂන්ස් (පෞද්ගලික) සමාගම ලෙස නම වෙනස් කරන ලද පෙර පැවති සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගමේ ක්‍රියාකාරකම් හැර, සමාලෝචිත වසර තුළ බැංකුවේ සහ සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයෙහි සැලකිය යුතු වෙනස්කම් කිසිවක් සිදු නොවීය.

2.3 සමූහයේ සංයුතියේ වෙනස්වීම

වර්ෂය තුළ, සමූහයේ සංයුතියේ කිසිදු වෙනසක් සිදු වී නොමැති අතර, සමූහය පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 31 සහ 32 යටතේ පිටු අංක 306 සිට 314 දක්වා ඉදිරිපත් කර ඇත.

2025 වසරේ දී, සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම එහි නම සී/ස බී ඕ සී අයි ටී සොලූෂන්ස් (පෞද්ගලික) සමාගම ලෙස වෙනස්කළ අතර බැංකුව විසින් සී/ස බී ඕ සී අයි ටී සොලූෂන්ස් (පෞද්ගලික) සමාගමට රු. මිලියන 25ක ප්‍රාග්ධනයක් යොදවන ලදී.

2.4 දැක්ම, මෙහෙවර සහ ආයතනික වටිනාකම් ප්‍රකාශය

බැංකුවේ දැක්ම සහ මෙහෙවර, බැංකුවේ වර්තමාන උපායමාර්ගික දිශානතියට අනුකූලව වැඩිදියුණු කරන ලදී. සංශෝධිත දැක්ම, මෙහෙවර සහ ආයතනික වටිනාකම් ප්‍රකාශය මෙම වාර්ෂික වාර්තාවේ ආරම්භක කවරයේ ඇතුල් පිටුවේ දක්වා ඇත. "දැක්ම", "මෙහෙවර" සහ "ආයතනික වටිනාකම් ප්‍රකාශය" යටතේ සඳහන් කර ඇති අරමුණු හඹායාමේදී බැංකුව සිය ක්‍රියාකාරකම්වල ඉහළ ආචාර ධර්ම ප්‍රමිතීන් පවත්වා ගනී.

2.5 වර්ෂයේ කාර්යසාධන සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළ දී බැංකුවේ/සමූහයේ කාර්යසාධනය සහ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳව විවරණයක් පිටු අංක 22 සිට 25 දක්වා අන්තර්ගත සභාපතිතුමාගේ පණිවිඩයෙහි ඇතුළත් කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ දී බැංකුවේ මෙහෙයුම් කටයුතු පිළිබඳව විස්තරාත්මක විග්‍රහයක් පිටු අංක 26 සිට 31 දක්වා වූ මහා කළමනාකාරතුමාගේ සමාලෝචනයෙහි ඇතුළත් කර ඇත. බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු පිළිබඳව පිටු අංක 108 සිට 114 තෙක් වූ "මූල්‍ය සමාලෝචනය" තුළ දක්වා ඇති අතර, එම වාර්තා වලින් සාධාරණ සමාලෝචනයක් ඉදිරිපත් කර ඇති අතර, ඒවා මෙම වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

2.6 ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන ව්‍යාප්තිය

ඩිජිටල් භාවිතය වැඩි දියුණු කරමින්, බැංකුව සිය ජාලය දිවයින පුරා මුදල් චක්‍රීකරණ යන්ත්‍ර 29 කින් වසර තුළ පුළුල් කළ අතර, සෘජු ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථාන 2,413 දක්වා වැඩි කරන ලදී. මෙම සංඛ්‍යාවට ලංකා බැංකුවේ ගනුදෙනුකරුවන්ට ප්‍රවේශ විය හැකි අනෙකුත් බැංකුවල ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ පාසල් ඉතුරුම් මධ්‍යස්ථාන "සංසඳ" සහ ජංගම ඉතුරුම් චීකක ඇතුළත් නොවේ.

2025 වර්ෂය තුළ බැංකුවේ භෞතික සේවා ජාලයට එක් ශාඛාවක් එක් කරන ලදි.

2.7 ආයතනික පරිත්‍යාග

දිට්වා සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ ප්‍රජාවන්ට සහාය වීම සහ යටිතල පහසුකම් නැවත ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකා රජයේ "රට යලි ගොඩනැගීමේ" අරමුදලට රු. මිලියන 500.0 ක් ඇතුළුව වසර තුළ සිදු කරන ලද ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා බැංකුව රු. මිලියන 780.5 ක් පරිත්‍යාග කර ඇත. (2024 - රු. මිලියන 215.2).

2.8 මූල්‍ය වාර්තාකරණය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

සත්‍ය හා සාධාරණ තත්ත්වය නිරූපණය කරන ආකාරයට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට, 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධන වලට, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීති වලට අනුකූලවන ආකාරයට මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇති බවයි. පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී 2007 අංක 07 දරණ සමාගම් පනතේ ප්‍රතිපාදන ද භාවිතා කර ඇත. "මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ

වගකීම" පිළිබඳ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 229 හි ඉදිරිපත් කර ඇති අතර, එය මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාවේ සංකලිත කොටසකි.

2.9 විගණක වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා, ලංකා බැංකුවේ විගණක වශයෙන් පත්කර ඇත.

2025 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ සමෝධානික මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිතුමාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 230 සිට 234 තෙක් දක්වා ඇත.

2.10 ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

බැංකුව සහ සමූහය සිය මූල්‍ය වාර්තා ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලං.ගි.ප්‍ර.) සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී ලං.මූ.වා.ප්‍ර.) අනුව පිළියෙල කරයි.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 246 සිට 261 දක්වා ඇත.

3. සැලසුම්ගත සංවර්ධන කටයුතු

අනාගතය සඳහා බැංකුව විසින් සැලසුම්කර ඇති වර්ධනයන් පිළිබඳ දළ විශ්ලේෂණයක් මෙම වාර්ෂික වාර්තාවේ 22 සිට 25 දක්වා පිටුවල සභාපතිතුමාගේ පණිවිඩය සහ මහා කළමණාකාරතුමාගේ සමාලෝචනය පිටු අංක 26 සිට 31 දක්වා ඉදිරිපත් කර ඇත.

4. මුළු ආදායම

2025 වර්ෂය සඳහා සමූහයේ මුළු ආදායම රු. මිලියන 558,674.6 ක් වූ අතර එය පෙර වසරේ රු. මිලියන 494,921.9 ක් විය. බැංකුවේ මුළු ආදායම සමූහයේ මුළු ආදායමෙන් 98% (2024 - 98%) වේ. සමූහයේ ප්‍රධාන ආදායම පොළී ආදායම වන අතර එය මුළු ආදායමෙන් 90% (2024-95%) වේ.

5. ලාභාංශ සහ සංචිත

5.1 ලාභය සහ විසර්ජනයන්

2025 දී බැංකුව රු. මිලියන 120,826.9 ක බදු ගෙවීමට පෙර ලාභයක් වාර්තා කර ඇති අතර එය පෙර වසර සඳහා වාර්තා වූ රු. මිලියන 106,904.3 ට සාපේක්ෂව 13% ක වාර්තාගත ඉහළ අගයක් පෙන්නුම් කරයි.

රු. මිලියන 44,820.0 ක් ආදායම් බදු වියදමකින් පසු (2024 -රු. මිලියන 42,517.3) 2025 වර්ෂය සඳහා බැංකුවේ බදු පසු ලාභය රු. මිලියන 76,006.9 ක් ලෙස වාර්තා වී ඇති අතර, එය 2024 වර්ෂයේ වාර්තා වූ බදු පසු ලාභය වන රු. මිලියන 64,386.9 ට වඩා 18% ක වැඩි වීමක් වේ.

ආදායම් බදු රු. මිලියන 45,462.5 ක් අය කිරීමෙන් පසු (2024 - රු. මිලියන 43,159.9), සමූහයේ වර්ෂය සඳහා බදු පසු ලාභය 2025 දී රු. මිලියන 76,471.3 කි (2024 - රු. මිලියන 65,061.5).

බැංකුවේ සහ සමූහයේ අදාළ ලාභය පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2025 රු. මිලියන	2024 රු. මිලියන	2025 රු. මිලියන	2024 රු. මිලියන
සියලුම වියදම් දැරීමෙන් සහ ක්ෂය සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන්, ක්‍රමක්ෂය, ණය හා අත්තිකාරම් සහ වෙනත් අලාභයන් සඳහා හානිකරණ ප්‍රතිපාදන හා අසම්භව්‍යන් සඳහා වෙන්කිරීමෙන් පසු, එහෙත් බදු පෙර වර්ෂයේ ලාභය	152,708.3	135,299.6	154,067.6	136,925.2
මූල්‍ය සේවා මත බදු	(31,881.4)	(28,395.3)	(32,290.0)	(28,790.1)
ආශ්‍රිත සමාගම්වල ලාභ/(අලාභ) කොටස, බදු පසු	-	-	156.2	86.4
ආදායම් බදු පෙර ලාභය	120,826.9	106,904.3	121,933.8	108,221.5
ආදායම් බදු (වියදම)/ප්‍රතිවර්තය	(44,820.0)	(42,517.3)	(45,462.5)	(43,159.9)
වර්ෂය සඳහා ලාභය	76,006.9	64,386.9	76,471.3	65,061.5
වර්ෂයට අදාළ වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු	(7,766.5)	(12,058.5)	(5,934.7)	(13,704.2)
වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම	68,240.4	52,328.4	70,536.6	51,357.3
විසර්ජනයන්				
ස්ථාවර සංචිත අරමුදලට මාරු කිරීම	(1,521.0)	(1,288.0)	(1,521.0)	(1,288.0)
ලාභාංශ	(5,000.0)	-	(5,000.0)	-

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

5.2 ලාභාංශ

සියලුම බදු, ණය අලාභයන් සඳහා වෙන්කිරීම් සහ සංචිත සඳහා අවශ්‍යවන්නා වූ මාරු කිරීම් යනාදිය සිදුකළ පසු ලාභය මත පදනම්ව බැංකුව විසින්, බැංකුවේ කොටස්කරු වශයෙන් ශ්‍රී ලංකා රජයේ උපදෙස් මත ලාභාංශ තීරණය කරනු ලැබේ. ඒ අනුව, 2025 වර්ෂය සඳහා ලාභාංශ ලෙස රු. මිලියන 5,000.0 ක් ගෙවා ඇත. (2024 - නැත).

5.3 සංචිත

සමූහයේ මුළු සංචිත 2025 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 361,174.4 ක් විය. (2024 - රු. මිලියන 295,566.3). සමූහයේ සංචිත පහත සඳහන් දෑ වලින් සමන්විත වේ.

	සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025 රු. මිලියන	2024 රු. මිලියන
ස්ථාවර සංචිත අරමුදල	18,474.0	16,953.0
මුදල් ප්‍රවාහ හෙජ් සංචිතය	738.2	1,521.4
ප්‍රත්‍යාගණන සංචිතය	34,037.1	33,584.7
නිදහස් සංචිතය	366.7	366.7
විනිමය පරිවර්තන සංචිතය	11,396.3	9,958.6
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය	9,459.2	7,328.6
ව්‍යවස්ථාපිත සංචිතය	392.3	394.6
විශේෂ සංචිත	79,261.7	39,922.1
රඳවාගත් ඉපැයුම්	207,048.9	185,536.6
එකතුව	361,174.4	295,566.3

6. දේපළ, පිරියත හා උපකරණ

වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දරන ලද මුළු ප්‍රාග්ධන වියදම රු. මිලියන 5,505.9 (2024 - රු. මිලියන 5,870.2) වන අතර, ඒවා පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 316 සිට 330 දක්වා සහ 333 සිට 334 දක්වා ඇති සටහන් අංක 34 සහ 36 මගින් නිරූපනය කරයි.

7. නිදහස් දේපලවල අගය

2025 දෙසැම්බර් 31 දිනට සමූහය සතු නිදහස් දේපලවල වටිනාකම රු. මිලියන 39,765.5 (2024 - රු. මිලියන 39,562.3) ලෙස මූල්‍ය ප්‍රකාශනවල සටහන 34 හි ඇතුළත් කර ඇත.

8. ප්‍රකාශිත ප්‍රාග්ධනය හා කොටස් හිමිකම

8.1 ප්‍රකාශිත ප්‍රාග්ධනය

2025 දෙසැම්බර් 31 දිනට බැංකුවේ නිකුත් කළ සහ සම්පූර්ණයෙන් ගෙවූ ප්‍රාග්ධනය රු. මිලියන 25,730.0 (2024 - රු. මිලියන 25,000) විය. වර්ෂය තුළ විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය යටතේ සටහන් කර තිබූ රු. මිලියන 730.0 ක්, මේ සම්බන්ධයෙන් අදාළ ගැසට් පත්‍රය නිකුත් කිරීමෙන් පසු ගෙවා නිමි ප්‍රාග්ධනයට මාරු කරන ලදී.

8.2 කොටස් හිමිකම

බැංකුවේ එකම කොටස් හිමියා ශ්‍රී ලංකා රජයයි.

9. යටත් කාලීන ණයකර/බැදුම්කර නිකුතුව

වසර තුළ දී, බැංකුව රු. මිලියන 35,000.0 (2024 - රු. මිලියන 15,000.0) ක දෙවන මට්ටමේ ප්‍රාග්ධනයක් රැස් කර ගත් අතර එයින් රු. මිලියන 15,000.0 වටිනා බාසල් III අනුකූල, ලැයිස්තුගත කළ, ශ්‍රේණිගත කළ, සුරැකුම් රහිත, යටත් කාලීන, ණයකර නිකුත් කිරීම සහ පාරිසරික හා සමාජීය වශයෙන් වගකිවයුතු මූල්‍යකරණ මුලපිරීම් සඳහා සහාය වීම සඳහා බැංකුවේ කැපවීම පෙන්නුම් කරමින් රු. මිලියන 20,000.0 ක් වටිනා තිරසාර බැඳුම්කර නිකුත් කිරීම හරහා අරමුදල් රැස් කළේය.

මූල්‍ය තත්ත්වය ප්‍රකාශ දිනට හිඟ ණයකර පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල පිටු 352 සිට 355 දක්වා සටහන් 49 යටතේ දක්වා ඇත.

10. කොටස් පිළිබඳ තොරතුරු

සමාලෝචිත වර්ෂය සඳහා සමූහයේ කොටසක මූලික ඉපැයීම් සහ කොටසක ශුද්ධ වත්කම් ප්‍රමාණය පිළිවෙලින් රු. 3,010.60 (2024 - රු. 2,600.31) සහ රු. 15,037.09 (2024 - රු. 12,851.85) විය.

11. ප්‍රජා සංවර්ධක කටයුතු

ප්‍රජා සංවර්ධක කටයුතු යටතේ ක්‍රියාත්මක කරන ලද විවිධ වැඩසටහන් පිළිබඳ විස්තරාත්මක සමාලෝචනයක් මෙම වාර්තාවෙහි අංක 153 සිට 160 දක්වා වූ පිටුවල "තිරසාර අනාගතයක් ගොඩනැගීම" යන අංශය යටතේ දක්වා ඇත.

12. අධ්‍යක්ෂ මණ්ඩලය

2025 වර්ෂය තුළ කටයුතු කළ අධ්‍යක්ෂවරුන්ගේ සහ මෙම වාර්ෂික වාර්තාව අත්සන් කරන දිනට නිලය දැරූ අධ්‍යක්ෂවරුන්ගේ විස්තර පහත දක්වා ඇත. බැංකුවේ අධ්‍යක්ෂවරුන් බැංකුවේ විධායක තනතුරු දරන්නේ නැත. ඔවුන් බැංකුවට පුළුල් පරාසයක කුසලතා සහ අත්දැකීම් ගෙන එයි. අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද මෙම වාර්ෂික වාර්තාවේ පිටු 34 සිට 39 දක්වා ඇත. වාර්ෂික වාර්තාව අත්සන් කිරීමේ දිනය වන විට, නිලතල දරන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව එකොළහකි (11). 2025 වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

12.1 අධ්‍යක්ෂ මණ්ඩල ලැයිස්තුව

කාවින්ද ද සොයිසා මහතා
විධායක නොවන අධ්‍යක්ෂ/ සභාපති
(2024 නොවැම්බර් 04 වූරයට පත් විය)

ආචාර්ය කපිල සේනානායක මහතා
ස්වාධීන නොවන, විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ
(2024 නොවැම්බර් 14 වූරයට පත් විය)

ආර් එම් පී රත්නායක මහතා
විධායක නොවන අධ්‍යක්ෂ (2023 අප්‍රේල් 29 නිල බලයෙන් අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් වී, 2024 නොවැම්බර් 06 ඉවත් විය. නැවත 2024

දෙසැම්බර් 20 විධායක නොවන අධ්‍යක්ෂවරයකු ලෙස පත් විය)

ජෙහාන් ඉස්මයිල් මහතා
විධායක නොවන අධ්‍යක්ෂ
(2024 පෙබරවාරි 07 ධූරයට පත් විය)

ආචාර්ය අමල් ඉලේසිංහ මහතා
විධායක නොවන අධ්‍යක්ෂ
(2024 දෙසැම්බර් 06 ධූරයට පත් විය)

දර්ශන ගුණසේකර මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
(2025 අගෝස්තු 13 ධූරයට පත් විය)

තුල්සි අළුවිහාරේ මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
(2025 සැප්තැම්බර් 16 ධූරයට පත් විය)

ශාමිනී රත්වත්තේ මහත්මිය
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
(2025 සැප්තැම්බර් 16 ධූරයට පත් විය)

දර්ශන් ජයරත්න මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
(2025 සැප්තැම්බර් 26 ධූරයට පත් විය)

සුනිමල් වීරසූරිය මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
(2025 ඔක්තෝබර් 07 ධූරයට පත් විය)

ඉංජිනේරු මහාචාර්ය ආනන්ද ජයවර්ධන
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
(2025 නොවැම්බර් 14 ධූරයට පත් විය)

ජයමින් පැල්පොල මහතා
විධායක නොවන අධ්‍යක්ෂ
(2024 පෙබරවාරි 22 ධූරයට පත් වී, 2025 මැයි 30 ඉවත් විය.)

අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය

වර්ථමාන අධ්‍යක්ෂක මණ්ඩලයට අනුව, පහත සඳහන් අධ්‍යක්ෂකවරුන් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති ආයතනික පාලනය පිළිබඳ මගපෙන්වීම් අනුව ස්වාධීන නොවන අධ්‍යක්ෂකවරුන් ලෙස සලකනු ලබන අතර, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති අනුව ස්වාධීන අධ්‍යක්ෂකවරුන් ලෙස සලකනු ලබයි.

කාවින්ද ද සොයිසා මහතා
ජෙහාන් ඉස්මයිල් මහතා
ආර් එම් පී රත්නායක මහතා
ආචාර්ය අමල් ඉලේසිංහ මහතා

බලපත්‍රලාභී වාණිජ බැංකු වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති ආයතනික පාලනය පිළිබඳ මගපෙන්වීම් අනුව හා කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති අනුව පහත සඳහන් අධ්‍යක්ෂවරු ස්වාධීන අධ්‍යක්ෂකවරු ලෙස සලකනු ලැබේ.

දර්ශන ගුණසේකර මහතා
දර්ශන් ජයරත්න මහතා
තුල්සි අළුවිහාරේ මහතා
සුනිමල් වීරසූරිය මහතා
ශාමිනී රත්වත්තේ මහත්මිය
ඉංජිනේරු මහාචාර්ය ආනන්ද ජයවර්ධන

ආචාර්ය කපිල සේනානායක මහතා ස්වාධීන නොවන, විධායක නොවන, නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂකවරයෙකු ලෙස සලකයි.

12.2 අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු

2025 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ කටයුතු පිළිබඳ අධීක්ෂණ පාලනය සහතික කිරීම සඳහා 2024 අංක 05 දරණ බැංකු පනත් නියාමනයන්ට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උප කමිටු හයක් පිහිටුවා ඇත. 2026 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල තිරසාර කමිටුව පිහිටවූ අතර, අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව (BCC) නැවත පිහිටුවන ලදී. මෙම වාර්ෂික වාර්තාවේ 180 සිට 190 දක්වා පිටුවල ලංකා බැංකුවේ පාලනය යටතේ ඇති උප කමිටු සංයුතිය දක්වා ඇත.

12.3 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල හා උපකමිටු රැස්වීවලට අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 173 වන පිටුවේ දක්වා ඇත.

12.4 ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

බැංකුව සමග ඇති ගිවිසුම් හා සම්බන්ධව අධ්‍යක්ෂකවරුන්ගේ සෘජු සහ වක්‍ර ඇල්ම පිළිබඳව දත්තයන් මෙම වාර්තාවෙහි 224 හා 225 පිටු වල විස්තර කර ඇත. මෙම ඇල්ම පිළිබඳව තොරතුරු අධ්‍යක්ෂවරු විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී අනාවරණය කර ඇත. ඉදිරිපත් කර ඇති ගිවිසුම් වලට අමතරව කිසිම අධ්‍යක්ෂවරයෙකු වෙනත් සෘජු හෝ වක්‍ර ඇල්මක් බැංකුව සමග ඇති කරගෙන නොමැති අතර, අනාගතයේදී යෝජිත ගිවිසුමකට සම්බන්ධයක් හෝ නොමැති බව ප්‍රකාශ කෙරේ. අධ්‍යක්ෂවරු තමන් ප්‍රමාණාත්මක වශයෙන් උනන්දුවක් දක්වන කාරණා සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටිති.

12.5 බැංකුව/සමූහය මඟින් නිකුත්කර ඇති ණයකර පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

කිසිදු අධ්‍යක්ෂවරයෙකුගේ නමින් ණයකර ලේඛණගත කර නොතිබිණි.

12.6 අධ්‍යක්ෂ මණ්ඩලයේ දීමනා/ගාස්තු

අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවනු ලබන දීමනා/ගාස්තු සියල්ලම, මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද, 2015 ජූනි 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී ඊ ඩී 3/2015 හා 2020 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී ඊ ඩී 01/2020 සහ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට අනුව සහ ලංකා බැංකුවේ සභාපතිතුමාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට අදාල වන පාරිශ්‍රමික ප්‍රතිපත්තීන්ට අනුව සිදු කර ඇත. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික පිළිබඳ තොරතුරු පිටු අංක 270 හි සටහන් 17 යටතේ දක්වා ඇත.

13. අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

13.1 අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය කිරීමේ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. අවදානම් අවම කිරීම සඳහා බැංකුව විසින් ගනු ලැබූ නිශ්චිත ක්‍රියාමාර්ග මෙම වාර්ෂික වාර්තාවේ පිටු 191 සිට 216 දක්වා විස්තර කර ඇත.

13.2 අභ්‍යන්තර පාලනය

බැංකුව තුළ විගණන කමිටුව හරහා වඩාත් ඵලදායී සහ විස්තීරණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයට සිය භාරකාර වගකීම ඉටු කිරීම සඳහා විගණන කමිටුව සහයෝගය දෙනු ලැබේ. විගණන කමිටුවේ සභාපතිතුමාගේ වාර්තාව, මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 180 සිට 181 දක්වා ඇත. සමාලෝචනයට පාත්‍ර වූ වර්ෂය තුළ මූල්‍ය වාර්තාව සහ වාර්ෂික වාර්තාව නිකුත් කල දිනය දක්වා වූ අභ්‍යන්තර විගණන පාලන පද්ධතියෙහි ඵලදායීතාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ.

බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2024 අංක 05 දරණ ආයතනික යහපාලනය පිළිබඳව මඟපෙන්වීම්වල විධි විධාන අංක 9.2 (ආ) අනුව අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳව වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කර ඇත. ඉහත සඳහන් වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 226 සහ 227 හි ඇතුලත් කර ඇත. මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සාධාරණ තහවුරුවක් ලැබෙන පරිදි නිර්මාණය කර ඇති බවටත්, බාහිර පාර්ශ්වයන්ට ඉදිරිපත් කිරීම සඳහා පිළියෙළ කරනු ලබන මූල්‍ය ප්‍රකාශ, අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූල වන ආකාරයෙන් සකස් වී තිබෙන බවටත්, අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, අභ්‍යන්තර පාලනය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය මත සහතිකවීමේ වාර්තාවක් විගණකාධිපතිතුමාගෙන් ලබාගෙන ඇති අතර එය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 228 හි දක්වා ඇත.

14. සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කරන ලංකා ගිණුම්කරණ ප්‍රමිති - ලං.ගි.ප්‍ර 24 (සම්බන්ධිත පාර්ශ්වයන් අනාවරණය) අනුව, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ලෙස වර්ගීකරණය කළ හැකි ගනුදෙනු තිබේ නම් ඒවා අධ්‍යක්ෂවරුන් විසින් හෙළිදරව් කරනු ලැබ ඇත.

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව සියලු සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කොළඹ කොටස් හුවමාරුවේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ රෙගුලාසි වලට අනුකූලව සාධාරණ සහ බැංකුවේ යහපත සඳහා බව සහතික කරමින් සමාලෝචනය කරයි.

සියලුම ගනුදෙනු වලදී බැංකුව එහි සම්බන්ධිත පාර්ශ්වයන්ට හිතකර සැලකිලි ලබා දී නොමැති බව අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි.

15. ආයතනික යහපාලනය

වඩාත් ඵලදායී ආයතනික යහපාලන රාමුවක් සහ ක්‍රියාවලීන් පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටියි. බැංකුවේ මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා ක්‍රියාකාරකම් ආයතනික යහපාලන පරිචයට අනුකූල වන පරිදි මෙහෙයවීම සහ කාර්යක්ෂමව පාලනය කිරීම සිදු වේ. වාණිජ බැංකුවල නියාමක වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2024 අංක 05 දරණ ආයතනික යහපාලනය පිළිබඳව මඟපෙන්වීම් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත ගත කිරීමේ රීති අංක 09 සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය ඒකාබද්ධව නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිචය සඳහා වූ ආචාරධර්ම සංග්‍රහයට මෙම පද්ධතීන් සහ පරිචයන් අනුකූල වන අතර, මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 162 සිට 179 දක්වා ඇති "ලංකා බැංකුවේ යහපාලනය" යටතේ සවිස්තරාත්මකව සඳහන් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ඉහත දැක්වූ 2024 අංක 05 දරණ මඟපෙන්වීම්වල විධිවිධානයන්ට අනුකූලවීම මත විගණකාධිපතිතුමාගෙන් වාර්තාවක් ලබා ගෙන ඇත.

16. මානව සම්පත

බැංකුව සතු ඉහළ වටිනාකමක් සහිත සම්පතක් ලෙස එහි සේවකයන් සලකන අතර, ඔවුන්ගේ සංවර්ධනය බැංකුවට ඉතාමත් වැදගත් වනු ඇත. සංස්ථාපිත අරමුණු ඉටු කර ගැනීමේදී ඔවුන්ගෙන් ලැබෙන දායකත්වය උපරිම තත්ත්වයෙන් පවත්වාගෙන යාමට ඉතා වටිනා මෙම මානව ප්‍රාග්ධනය තව දුරටත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර රාශියක් ගෙන ඇත. බැංකුවේ මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ පරිචයන්, "ස්ථිරසාර කාර්යසාධනයක් සඳහා පරිපූර්ණ ශ්‍රම බලකාය" යටතේ විස්තර කර ඇති අතර එය පිටු අංක 138 සිට 147 දක්වා ඇතුලත් කර ඇත.

17. නීති රීති සඳහා වූ අනුකූලතාවය

අධ්‍යක්ෂවරුන්, ඔවුන්ගේ උපරිම දැනුම හා විශ්වාසයෙන් තහවුරු කරන්නේ, සමූහය නීති සහ රෙගුලාසී වලට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක නියැලී නොමැති බවයි.

මෙම වාර්තාවේ අංගයක් වන "අනුකූලතා ඇමුණුම්" යන කොටස යටතේ 405 සිට 454 දක්වා පිටුවල බැංකුවේ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම පිළිබඳ විස්තර දක්වා ඇත. අදාළ සියලු නීති රීති සහ රෙගුලාසි පිළිබඳ දැනුවත් බවට අධ්‍යක්ෂවරුන් විසින් තහවුරු කරනු ලබයි.

18. සමථයකට පත් නොවූ නෛතික ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය පරිදි සහ බැංකුවේ නීතිඥයින් විසින් තහවුරු කළ පරිදි තවමත් සමථයකට පත් නොවූ නෛතික ක්‍රියාකාරකම් වලින් බැංකුවේ මූල්‍ය තත්ත්වයට හෝ අනාගත මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් අහිතකර බලපෑමක් සිදු වෙතැයි අපේක්ෂා නොකෙරේ.

19. ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට ගෙවිය යුතු සහ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත කාලයේ සිදු කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාසයෙන් තහවුරු කරයි.

20. පාරිසරික ආරක්ෂාව

පරිසරයට අයහපත් ප්‍රතිපල ළඟා කරදෙන කිසිම ක්‍රියාකාරකමක බැංකුව නිරත වී නැත. තවද පරිසරය රැකගැනීමේ අරමුණින් ගත් පියවර පිටු අංක 153 සිට 160 දක්වා "තිරසාර අනාගතයක් ගොඩනැගීම" යන මාතෘකාව යටතේ දක්වා ඇත.


21. ශේෂ පත්‍ර දිනෙන් පසු සිදු වූ සිද්ධීන්

අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ ගැලපීමක් හෝ හෙලිදරව්වක් සිදු කළ යුතු කිසියම් ප්‍රමාණාත්මක සිද්ධියක් ශේෂ පත්‍ර දින හා මෙම වාර්තාව නිකුත් කළ දින අතර කාල පරාසය තුළ සිදු වී නැති බවයි.

22. අඛණ්ඩභාවය

තම මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රමාණවත් සම්පත් බැංකුව සතු බව අධ්‍යක්ෂ මණ්ඩලයේ විශ්වාසයයි. එම නිසා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම යන සංකල්පය භාවිතාකර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



ජානකී සේනානායක සිරිවර්ධන
ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2026 පෙබරවාරි 24 දින
කොළඹ දීය.

ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක - ලං. ගි. ප්‍ර. 24 හි අවශ්‍යතාවන්ට අනුකූලව, "සම්බන්ධිත පාර්ශ්වයන් පිළිබඳ අනාවරණය" විස්තරාත්මක වශයෙන් මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 61 හි දක්වා ඇත.

අතිරේක වශයෙන්, සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂධූර දරණ හෝ හවුල්කරුවෙකු ලෙස කටයුතු කරන අනෙකුත් ආයතනයන් සමඟ කරන ලද ගනුදෙනු සම්බන්ධව විස්තරයක් පහත දැක්වේ.

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව	ශේෂය/ ගෙවිය යුතු වටිනාකම 31.12.2025 '000	ශේෂය/ ගෙවිය යුතු වටිනාකම 31.12.2024 '000
ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම					
කාවින්ද ද සොයිසා මහතා (2024 නොවැම්බර් 04 දින ලංකා බැංකුවේ සභාපති වශයෙන් පත්විය)					
සී/ස ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම (2024 නොවැම්බර් 12 දින පත්විය)	සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂක	ජංගම ගිණුම්		26,560	13,037
		ස්ථාවර තැන්පතු		3,609,200	3,708,660
		ප්‍රති විකිනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්		1,306,400	752,800
ලංකා බැංකුව (යූ.කේ) සමාගම (2024 දෙසැම්බර් 09 දින පත්විය)	සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂක	ජංගම ගිණුම්		9,023	8,564
		ඉතිරිකිරීමේ ගිණුම්		40	38
		නොස්ට්‍රෝ ගිණුම්		ඇ.ඩො 1,119	ඇ.ඩො 1,583
				347,004*	463,098*
				ම.බ්‍රි.ප 614	ම.බ්‍රි.ප 508
				256,088*	186,563*
				යුරෝ 5,454	යුරෝ 1,105
				1,985,009*	336,628*
		බැංකුවල ඇති තැන්පතු		ඇ.ඩො 6,133	ඇ.ඩො 6,000
				1,901,118*	1,755,500*
				ම.බ්‍රි.ප 25,948	ම.බ්‍රි.ප 25,700
				10,828,672*	9,441,723*
සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම (2025 නොවැම්බර් 06 දින පත්විය)	සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂක	ජංගම ගිණුම්		3,294	4,942
		ස්ථාවර තැන්පතු		200,100	744,700
		ණයකර ආයෝජනය		250,000	500,000
		ප්‍රති විකිනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්		783,000	296,000
සී/ස බී ඕ සී අයි ටී සොලූයුෂන්ස් (පෞද්ගලික) සමාගම (2025 ජනවාරි 15 දින පත්විය)	සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂක	ජංගම ගිණුම්		24,601	777
ජෙහාන් ඉස්මයිල් මහතා (2024 පෙබරවාරි 07 දින ලංකා බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත්විය)					
සී/ස හොටෙල් කළම්බු (1963) සමාගම (2024 අප්‍රේල් 04 දින පත්විය)	සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂක	ජංගම ගිණුම්		21,531	32,130
		ඉතිරිකිරීමේ ගිණුම්		20,462	-
		ස්ථාවර තැන්පතු		2,167	2,044
		ණය		229,751	230,851
		වෙනත් ලැබියයුතු දෑ		289,151	235,960
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී (2025 ජනවාරි 30 දින පත්විය)	විධායක නොවන අධ්‍යක්ෂක	ජංගම ගිණුම්		257,089	279,379
		ස්ථාවර තැන්පතු		33	32
		ණය		-	2,940,000
		බැංකු අයිරා	750,000	711,636	186,794

* ශ්‍රී ලංකා රුපියල් වලට සමාන අගය

සටහන: මුදල් ඒකක නිශ්චිතව සඳහන් නොකළ සංඛ්‍යා රුපියල් වලින් දක්වා ඇත.

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව '000	ශේෂය/ ගෙවිය යුතු වටිනාකම 31.12.2025 '000	ශේෂය/ ගෙවිය යුතු වටිනාකම 31.12.2024 '000
ආචාර්ය අමල් ඉලේසිංහ මහතා (2024 දෙසැම්බර් 06 දින ලංකා බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත්විය)					
සී/ස බී ඕ සී අයි ටී සොලූෂන්ස් (පෞද්ගලික) සමාගම (2025 ඔක්තෝබර් 16 දින පත්විය)	විධායක නොවන අධ්‍යක්ෂක	ජංගම ගිණුම්		24,601	777
ආර් එම් පී රත්නායක මහතා (2024 දෙසැම්බර් 20 දින ලංකා බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත්විය)					
සී/ස බී ඕ සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම (2025 අගෝස්තු 01 දින පත්විය)	සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂක	ජංගම ගිණුම්		29,914	20,976
		ස්ථාවර තැන්පතු		351,972	290,917
		බැංකු අයිරා	58,500	-	-
දර්ශන ගුණසේකර මහතා (2025 අගෝස්තු 13 දින ලංකා බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත්විය)					
ඩිල්මා සිලෝන් ටී කම්පැනි පී එල් සී (2020 ඔක්තෝබර් 01 දින පත්විය)	විධායක අධ්‍යක්ෂක	ජංගම ගිණුම්		860	1,154
		ඉතිරිකිරීමේ ගිණුම්		22,422	3,087
		ස්ථාවර තැන්පතු		2,473,755	2,328,963
තලවකැලේ ටී එස්ටේට් පී එල් සී (2024 දෙසැම්බර් 27 දින පත්විය)	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක	ජංගම ගිණුම්		6,169	4,872
තුල්සි අළුවිහාරේ මහතා (2025 සැප්තැම්බර් 16 දින ලංකා බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත්විය)					
අබාන්ස් ෆයිනෑන්ස් පී එල් සී (2022 දෙසැම්බර් 22 දින පත්විය)	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක	ජංගම ගිණුම්		149	149
		ස්ථාවර තැන්පතු		107	107
		බැංකු අයිරා	100,000	81,811	5,550
එක්ස්පැක් කොරුගේටඩ් කාටන්ස් පී එල් සී (2021 ජූනි 15 දින පත්විය)	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක	ජංගම ගිණුම්		779	644
		ඉතුරුම් තැන්පතු		122	1,435
		බැංකු ණය		137,267	585,714
ශාමිනී රත්වත්තේ මහත්මිය (2025 සැප්තැම්බර් 16 දින ලංකා බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත්විය)					
කන්ටිනියන්ස් ෆුඩ්ස් (ලංකා) පී එල් සී (2024 අප්‍රේල් 01 දින පත්විය)	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක	ජංගම ගිණුම්		257	35
සී/ස නැෂනල් ක්‍රෙඩිට් ගැරන්ටී ඉන්ස්ටිටියුෂන් සමාගම (2024 ජනවාරි 08 දින පත්විය)	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක	ජංගම ගිණුම්		468	426
		ණයකර ආයෝජනය		2,400,000	-
		ප්‍රති විකිනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්		2,787,000	-
		කොටස් ප්‍රාග්ධනය		151,145	151,145
සී/ ස ෆෙයාර්ෆස්ට් ඉන්ෂුරන්ස් සමාගම (2025 ඔක්තෝබර් 01 දින පත්විය)	විධායක නොවන අධ්‍යක්ෂක	ජංගම ගිණුම්		99,008	110,905
		ඉතිරිකිරීමේ ගිණුම්		246,949	162,359
		බැංකු අයිරා		1	4
		ප්‍රතිවිකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්		218,903	320,962
ඉංජිනේරු මහාචාර්ය ආනන්ද ජයවර්ධන (2025 නොවැම්බර් 14 දින ලංකා බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත්විය)					
එච් එන් බී ඇෂුරන්ස් පී එල් සී (2024 අගෝස්තු 09 දින පත්විය)	ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂක	ජංගම ගිණුම්		4,130	1,192
ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් පී එල් සී (2025 සැප්තැම්බර් 04 දින පත්විය)	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		-	419
		බැංකු අයිරා	250,000	250,756	-
		බැංකු ණය		700,000	-

* ශ්‍රී ලංකා රුපියල් වලට සමාන අගය

සටහන: මුදල් ඒකක නිශ්චිතව සඳහන් නොකළ සංඛ්‍යා රුපියල් වලින් දක්වා ඇත.

මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

වගකීම

2024 අංක 05 දරණ බැංකු පනතේ විධානයෙහි 9.2 (ආ) වගන්තියට අනුකූලව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ මෙම වාර්තාව ඉදිරිපත් කරයි.

ලංකා බැංකුවේ (බැංකුව) ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණවත්භාවය සහ සඵලදායිතාවය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය (“මණ්ඩලය”) වගකිව යුතුය. එවැනි ප්‍රමාණවත්භාවය සහ සඵලදායිතාවය සලකා බැලීමේදී, බැංකු ව්‍යාපාරයට ප්‍රතිලාභ කළමනාකරණය කළ පදනමක් මත අවදානම සමඟ සමතුලිත කිරීම අවශ්‍ය බව අධ්‍යක්ෂ මණ්ඩලය හඳුනා ගන්නා අතර, එම නිසා අභ්‍යන්තර පාලන පද්ධති මූලික වශයෙන් නිර්මාණය කර ඇත්තේ බැංකුවේ අවදානම් අභිරුචිය ඇතුළත් සීමාවන් සහ දර්ශක වලින් සිදුවන ඕනෑම අපගමනයක් ඉස්මතු කිරීමේ අරමුණින් ය. මේ අනුව, අභ්‍යන්තර පාලන පද්ධතියට මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ නමුත් නිරපේක්ෂ සහතිකයක් ලබා දිය නොහැකි අතර බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව සිදු කර ඇත.

බැංකුව විසින් මුහුණපෑ හැකි සැලකිය යුතු අවදානම් කාරකයන් හඳුනා ගැනීම, ප්‍රමාණ නිර්ණය, නිරීක්ෂණය සහ කළමනාකරණය සඳහා වූ අඛණ්ඩව බලපැවැත්වෙන ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපනය කර ඇත. ව්‍යාපාර පරිසරයේ සහ ව්‍යවස්ථාපිත මඟ පෙන්වීම් වල සිදු වන වෙනස්වීම් වලට අනුරූපීව මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධති වර්ධනය කිරීම හා ශක්තිමත් කිරීමද මෙයට ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් බැංකු අධ්‍යක්ෂවරුන් හට මඟ පෙන්වීම සඳහා නිකුත් කර ඇති අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව උපයෝගී කර ගනිමින් සහ ඒ අනුව යමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරතුරුවම ඉහත සඳහන් ක්‍රමවේදය නිරීක්ෂණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන කටයුතු නිරීක්ෂණයේ දී ඉහත මඟපෙන්වීමෙහි සඳහන් පරිදි අභ්‍යන්තර පාලන පද්ධති තක්සේරු කිරීමේ මූලධර්ම යොදාගෙන ඇත.

දැනට ක්‍රියාත්මක වන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධති සාධාරණ සහතික ප්‍රතිඥාවක් ලබා දීමට ප්‍රමාණවත් බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයයි. තවද බාහිර උපයෝගීතාවය සඳහා පිළියෙළ කරන මූල්‍ය ප්‍රකාශයන් අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතා වලට අනුකූල බවද අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි.

මතු වූ අවදානම් හඳුනා ගැනීමට හා තක්සේරු කිරීමට මෙන්ම එම අවදානම් අවම කිරීමට හා පාලනය කිරීමට සුදුසු අභ්‍යන්තර පාලන විධි නිර්මාණය, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම මඟින් අවදානම් සහ පාලනයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග භාවිතයට කළමනාකාරිත්වය සහය දක්වනු ලැබේ.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම හා සඵලදායිතාවය සමාලෝචනය කිරීමේදී අනුගමනය කරන ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි ප්‍රමාණාත්මකභාවය සහ සංගතභාවය සමාලෝචනය කිරීමට ස්ථාපිත කර ඇති ප්‍රධාන ක්‍රමවේදයන්හි පහත දෑ ඇතුළත් වේ:

- බැංකුවෙහි දෛනික කටයුතුවල සඵලදායිතාවය සහ බැංකුවේ සමස්ත මෙහෙයුම් අනුමත කළ ආයතනික සැලැස්ම මඟින් උකහා පිළියෙළ කල ආයතනික අරමුණු, උපක්‍රම සහ වාර්ෂික අයවැය අනුව පවතීද, යන්න සහතික කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහය පිණිස විවිධ කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇත.

- බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය නියැදි සහ චක්‍රීය ක්‍රියා පටිපාටි භාවිතා කරමින් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල සඵලදායිතාවය පිළිබඳව අඛණ්ඩව පරීක්ෂා කරන අතර එමඟින් සොයා ගනු ලබන කිසියම් අනුගත නොවීම් සම්බන්ධයෙන් අවධානයට ලක් කරනු ලබයි. සියලු අංශවල සහ ශාඛාවල විගණනයන් පවත්වනු ලබන අතර, ස්වාධීන හා විෂය මූලික වාර්තාවක් සැපයීම සඳහා විගණනයෙහි වාර ගණන ඇගයීමට ලක්වූ අවදානම මත තීරණය වේ. වාර්ෂික විගණන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කර අනුමත කරනු ලැබේ. අනුමත කල විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් සිය විගණන කටයුතු අදාල පරිශ්‍රයේ මෙන්ම පරිශ්‍රයෙන් භාහිරව සිදුකරන අතර, එමඟින් අභ්‍යන්තර විගණන අංශයේ සොයාගැනීම් ඔවුන්ගේ නිරන්තර රැස්වීම්වලදී සමාලෝචනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

- නියාමන අධිකාරීන්, කළමනාකාරිත්වය, අභ්‍යන්තර හා බාහිර විගණකයින් විසින් හඳුනාගත් අභ්‍යන්තර පාලනය පිළිබඳ ගැටළු අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අවධානය යොමු කර අවදානම් කළමනාකාරණයෙහි සහ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ප්‍රමාණාත්මකභාවය සහ කාර්යසාධනය පිළිබඳ ඇගයීම් සිදු කරයි. අභ්‍යන්තර විගණන ක්‍රියාවලියෙහි ගුණාත්මකභාවය සහ විෂය පථය පිරික්සීමද විගණන කමිටුව මඟින් සිදු කරයි. සියලුම විගණන කමිටු රැස්වීම් වාර්තා ඉදිරි ක්‍රියාමාර්ග සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ. බැංකුවේ විගණන කමිටුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණය මෙම වාර්ෂික වර්තාවේ පිටු 180 සිට 181 දක්වා ඇති විගණන කමිටු වාර්තාවේ දක්වා ඇත.

- මූල්‍ය වාර්තාකරණයට අදාල අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීමේදී බැංකුවේ අදාල නිලධාරීන් විසින් මූල්‍ය ප්‍රකාශනයන්හි වැදගත් ගිණුම්කරණ සහ හෙළිදරව් කිරීම් වලට සම්බන්ධ සියළු ක්‍රියා පිළිවෙත් සහ පාලනයන් සිදු කරන ලදී. එම සැලැස්මේ උචිතභාවය හා සඵලදායිතාවය පිළිබඳ අභ්‍යන්තර විගණන අංශය විසින් නැවත නිරීක්ෂණය කරන ලදී. මෙම ඇගයීමට බැංකුවේ පරිපාලිත සමාගම් ඇතුළත් නොවේ.

- බැංකුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - “මූල්‍ය උපකරණ” අනුව 2018 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුගත වන ලදී. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර.- 9 හි අවශ්‍යතා වලට අනුකූල වීම සඳහා, බාහිර උපදේශකයෙකුගේ සහාය ඇතිව හානිකරණ ප්‍රතිපාදන තීරණය කිරීම සඳහා

පුළුල් පරාසයක පුරෝකථන ආර්ථික අවස්ථා භාවිතා කරමින් බැංකුව අපේක්ෂිත ණය අලාභ (ECL) ආකෘති නිර්මාණය කරන ලදී. වරලත් ගණකාධිකාරී සමාගමක සහාය ඇතිව අභ්‍යන්තර විගණන අංශය විසින් මෙම ආකෘති තහවුරු කර ඇත. 2022 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. - 9 යටතේ ණය පහසුකම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2021 විධාන අංක 13 සහ 14 උපදෙස් වලට අනුකූල වීමට බැංකුව ප්‍රමාණවත් පියවර ගෙන ඇති අතර එය අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර ඇත.

- මූල්‍ය උපකරණ වඩාත් සුචලදායීව හා කාර්යක්ෂමව හඳුනා ගැනීම, මැනීම, වර්ගීකරණය හා අනාවරණය කිරීම යන අවශ්‍යතාවයන්ට අනුකූල වීම සහ "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ" ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා බැංකුව ස්වයංක්‍රීය මූල්‍ය වාර්තාකරණ පද්ධතියක් යොදාගැනීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරමින් සිටී. ස්වයංක්‍රීය පද්ධතිය මඟින් ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" යටතේ ඇති හානිකරණ ප්‍රතිපාදන ගණනය කිරීමට හැකි වන අතර අභ්‍යන්තර හා බාහිර වාර්තාකරණ අවශ්‍යතා සපුරාලීමට පහසුකම් සපයයි.

- බැංකුව, රජය විසින් හඳුන්වා දෙන ලද සහන පැකේජවලට අනුකූලව 2025 දී ද කොවිඩ්-19 මඟින් පීඩාවට පත් වූවන්ට අබණ්ඩව සහන සලසන ලදී. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 9 - "මූල්‍ය උපකරණ" යටතේ අපේක්ෂිත ණය අලාභ (ECL) ආකෘති භාවිතා කරමින් හානි ප්‍රතිපාදන තක්සේරු කිරීමේදී ඉදිකිරීම් සහ රෙදිපිළි අපනයනය වැනි අවදානම් සහිත කර්මාන්තවල නියැලෙන බැංකුවේ ගනුදෙනුකරුවන්ට කොවිඩ් -19 හි තවදුරටත් පවතින බලපෑම ද සලකා බලන ලදී.

- ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 යටතේ ණය පහසුකම් වර්ගීකරණය, හඳුනා ගැනීම සහ මැනීම සඳහා නියාමකයා විසින් නිකුත් කරන ලද උපදෙස් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් බැංකුවේ විවිධ විෂයයන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් ස්වයංක්‍රීය මූල්‍ය වාර්තාකරණ විසඳුම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කරයි.

- බැංකුවේ සහ විදේශීය ශාඛාවල ණය හා අත්තිකාරම්, මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම්, අවදානම් කළමනාකරණය, සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු සහ වෙනස්වන නියාමන සහ වෙළඳපළ තත්ත්වයන් මත පදනම්ව අනෙකුත් සියලුම වැදගත් බැංකු ක්‍රියාකාරකම් වලට අදාළ ක්‍රියා පටිපාටි බැංකුව විසින් අබණ්ඩව අධීක්ෂණය කිරීම සහ යාවත්කාලීන කිරීම සිදු කරයි. පුහුණු සහ දැනුවත් කිරීමේ සැසි මඟින් ශ්‍රී ලං.මූ.වා.ප්‍ර./ලං.ගි.ප්‍ර සහ නියාමන උපදෙස් යටතේ ඇති අවශ්‍යතා අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය ඇතුළු අදාළ පාර්ශ්වකරුවන් දැනුවත් කර ඇත.

- පෙර වර්ෂයන්හි මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් බාහිර විගණකයින්ගේ නිර්දේශයන් සමාලෝචනය කර යෝග්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග වර්ෂය තුළ දී ගන්නා ලදී. මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් 2025 වර්ෂයේ දී බාහිර විගණක නිර්දේශයන් සම්බන්ධයෙන් අනාගතයේ ක්‍රියා කරනු ඇත.

සහතික කිරීම

ඉහත සඳහන් ක්‍රියාවලීන් හා ක්‍රියාදාමයන් පදනම්ව බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවයන් සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව, බාහිර අරමුණු උදෙසා මූල්‍ය ප්‍රකාශන සැකසීමේ යථානුරූපී බව පිළිබඳව සාධාරණ සහතිකවීමක් සැපයෙන අයුරින් බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරනු ලැබේ.

බාහිර විගණකවරුන්ගේ ප්‍රකාශය සමාලෝචනය කිරීම

අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් යන විගණකවරුන්ගේ සහාය ඇතිව විගණකාධිපතිවරයා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අභ්‍යන්තර මූල්‍ය වාර්තාකරණය පාලනය කිරීම පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සමාලෝචනය කර ඇති අතර, බැංකුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම සහ කාර්යක්ෂමතාව සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය පිළිබඳ ඔවුන්ගේ අවබෝධය හා සංගත නොවන බවට විශ්වාස කිරීමට හේතු වන කිසිවක් ඔවුන්ගේ අවධානයට ලක්ව නොමැති බව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කර ඇත. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 228 පිටුවේ දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



සභාපති - විගණන කමිටුව



අධ්‍යක්ෂ



සභාපති

2026 පෙබරවාරි 24 දින
කොළඹ දීය.

ස්වාධීන සහතිකවීමේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය: BAN/B/BOC/IC/2025
දිනය: 24 March 2026

සභාපති

ලංකා බැංකුව,

ලංකා බැංකුවේ අභ්‍යන්තර පාලනයන්ට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති විසින් අධ්‍යක්ෂවරුන් වෙත ඉදිරිපත් කරනු ලබන ස්වාධීන සහතික වීමේ වාර්තාව

හැඳින්වීම

මෙම වාර්තාව 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති ලංකා බැංකුවේ ("බැංකුව") මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය ("ප්‍රකාශය") පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ සහතිකවීමක් සැපයීම සඳහා වේ.

කළමනාකරණයේ වගකීම

බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2024 අංක 05 දරණ විධානයෙහි 9.2 (ආ) වගන්තියට අනුකූලව "අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වූ මාර්ගෝපදේශය" ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, කළමනාකරණය සතු වගකීම වේ.

මාගේ වගකීම හා ශ්‍රී ලංකා සහතිකවීමේ කාර්යභාර ප්‍රමිත (ශ්‍රී ලං. ස. කා .ප්‍ර) 3050 (සංශෝධිත) ට අනුකූල වීම

මාගේ වගකීම වන්නේ අධ්‍යක්ෂවරුන් විසින් සකස් කරන ලද ලියකියවිලි මඟින් මාගේ ප්‍රකාශනයට සහය දක්වයි යන්න සහ අභ්‍යන්තර පාලනයේ සැලසුම සහ සඵලදායිතාවය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් අනුගමනය කර ඇති ක්‍රියාවලිය උචිත ලෙස පිලිබිඹු වේද යන්න තක්සේරු කිරීමයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති "අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය" පිළිබඳ බැංකු ආයතන සඳහා සහතික වීමේ වාර්තාව ශ්‍රී ලං.ස.කා.ප්‍ර. 3050 (සංශෝධිත) ට අනුකූලව මාගේ සහතිකවීමේ කාර්යභාරය මා විසින් මෙහෙයවා ඇත. මෙම ප්‍රමිතියට අනුව කළමනාකරණය විසින් ප්‍රමාණාත්මක ආකාරයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳව ප්‍රකාශය සකස් කර තිබේද යන්න පිළිබඳව සීමිත සහතිකයක් ලබා ගැනීම සඳහා ක්‍රියා පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කල යුතුය. මෙම කටයුත්ත සඳහා, කිසිදු වාර්තාවක් යාවත්කාලීන කිරීම හෝ නැවත නිකුත් කිරීම සම්බන්ධයෙන් මම වගකිව යුතු නොවේ. මෙම කටයුත්ත අතරතුර මම මූල්‍ය තොරතුරු විගණනයක් හෝ සමාලෝචනයක් කර නැත.

ඉටුකළ කාර්යයේ සාරාංශය

අදාළ ප්‍රකාශය, අධ්‍යක්ෂවරුන් විසින් හෝ අධ්‍යක්ෂවරුන් සඳහා හෝ පිළියෙළ කල ලිපි ලේඛන මඟින් තහවුරු වන්නේ ද, සහ මූල්‍ය වාර්තාකරණය සඳහා වූ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනයේ දී අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන තිබෙන ක්‍රියාවලිය මඟින් මැනවින් පිලිබිඹු වන්නේ ද යන්න ඇගයීම සඳහා මාගේ කාර්යභාරය මෙහෙයවා තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කල ක්‍රියා මාර්ග සනාථ කර ගැනීම සඳහා නියැදි ලෙස බැංකුවේ කාර්ය මණ්ඩලයෙන් විමසීම, ලිපි ලේඛන පරීක්ෂාව යන ක්‍රියා පටිපාටි සිදු කරන ලදී.

මෙම ප්‍රකාශය තුළින් සිය අවදානම් හා පාලනයන් ආවරණය වන්නේදැයි සලකා බැලීම හෝ බැංකුවේ අවදානම් හා පාලන ක්‍රියා පටිපාටිවල සඵලදායීතාවය පිළිබඳ මතයක් ගොඩනැගීම හෝ ශ්‍රී ලං.ස.කා.ප්‍ර. 3050 (සංශෝධිත) ට අනුව අවශ්‍ය නොවේ. එසේම ශ්‍රී ලං.ස.කා.ප්‍ර. 3050 (සංශෝධිත) ට අනුව වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇති ප්‍රමාණාත්මක අභ්‍යන්තර පාලන අංශයන් පිළිබඳව පවතින සැලකිය යුතු ගැටළු සඳහා ක්‍රියා කිරීමට විස්තර කර ඇති ක්‍රියාවලීන් මඟින් එම ගැටළු සඳහා නියත පිළියම් ලැබේදැයි මා විසින් සලකා බැලීම අවශ්‍ය නොවේ.

තෝරාගත් ක්‍රියා පටිපාටි රඳා පවතින්නේ බැංකුවේ ස්වභාවය, ප්‍රකාශය සකස් කර ඇති සිද්ධිය හෝ ගනුදෙනුව පිළිබඳ මගේ විනිශ්චය සැලකිල්ලට ගෙනය. මගේ නිගමනයට පදනමක් සැපයීමට මා ලබාගත් සාක්ෂි ප්‍රමාණවත් සහ සුදුසු යැයි මම විශ්වාස කරමි.

නිගමනය

ඉටුකරන ලද ක්‍රියා පටිපාටීන් මත පදනම්ව වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශය, මූල්‍ය වාර්තාකරණය සඳහා වූ බැංකුවේ අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම හා සඵලදායකත්වය පිළිබඳ සමාලෝචනයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදවා ඇති ක්‍රියාවලිය පිළිබඳ මාගේ අවබෝධය හා සංගත නොවන බවට විශ්වාස කිරීමට හේතුවන කරුණු කිසිවක් මාගේ අවධානයට ලක්වී නොමැත.

අත්සන් කලේ,

එල් එස් අයි ජයරත්න
විගණකාධිපති

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණයට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ හා විගණකවරුන්ගේ වගකීම් පැහැදිලිව දැක්වීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පිළිබඳ ප්‍රකාශය සකසනු ලබයි. ලංකා බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම මෙම ප්‍රකාශය මඟින් දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන් සමඟ 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් සහ විධානයන්ට අනුව, සෑම අවස්ථාවකදීම ප්‍රමාණවත් නිරවද්‍යතාවක් සමඟ බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබිඹු කෙරෙන ගිණුම් පොත් බැංකුව විසින් පවත්වාගෙන යාම තහවුරු කිරීම සහ බැංකුවේ කටයුතු පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය වන ආකාරයට සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඉදිරිපත් කිරීම බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරන පරිදි මෙම වාර්ෂික වාර්තාවේ නිරූපණය කර ඇති, 2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වඩාත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන් තෝරාගෙන ඇති අතර, ඒවා සංගතභාවයෙන් යුතුව භාවිතා කර, කළමනාකරණය විසින් වඩාත් සාධාරණ හා විචක්ෂණ ලෙස තම විනිශ්චයන් සහ ඇස්තමේන්තු කිරීම් පාදක කරගෙන ඇත. භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්තීන් පිළිබඳව ප්‍රමාණාත්මක වෙනස්වීම් ඇත්නම් එවැනි දෑ පිළිබඳව අනාවරණය හා පැහැදිලි කිරීම් කර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති 2025 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්, 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන් හා අනෙකුත් නියාමන අවශ්‍යතාවයන් හා අනුකූලවන පරිදි සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ වලින් 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ සත්‍ය හා සාධාරණ තත්ත්වය නිරූපණය කෙරේ.

අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේ, බැංකුවට හා සමූහයට අනාගත නිශ්චිත කාලයක් සඳහා තම ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවයි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී තව දුරටත් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය භාවිතා කර ඇත.

අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණය හා අනුකූලතාවය

බැංකුවේ වත්කම්වල සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීමට මෙන්ම වංචාවන් සහ අවකළමනාකරණය වලක්වාලීමට, වඩාත් ශක්තිමත් අභ්‍යන්තර පාලන පරිසරයක් පවත්වාගෙන යාම සඳහා සැලකිය යුතු වැදගත්කමක් ලබා දීම, අභ්‍යන්තර මූල්‍ය පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සහ අවදානම් කළමනාකරණය ද අධ්‍යක්ෂවරුන් සතු වගකීමකි.

ආවේනික හා අවශේෂ අවදානම් මුළුමනින්ම තුරන් කරලීම කළ නොහැකි නමුත් කලින් තීරණය කරන ලද පද්ධති හා සීමා පැනවීම් තුළ උචිත යටිතල පහසුකම්, පාලනයන්, පද්ධති හා ආචාරධර්ම පදනම් වූ චර්යාවන් භාවිතය හා ක්‍රියාවට නැංවීම තුළින් එවැනි දෑ අවම කරගැනීම තහවුරු කිරීම අපේක්ෂා කෙරේ.

මූල්‍ය වාර්තාකරණයේ යථානුරූපී බව පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබා දෙන ආකාරයට මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සකසා ඇති බව පිටු අංක 226 සහ 227 හි මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව මඟින් තහවුරු කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකරණය විසින් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ ඒ සඳහා වන මඟ පෙන්වීම් මනා ලෙස සංවිධානය කර ඇත. ප්‍රමාණාත්මක අවදානම් පාලනය කිරීමටත්, ඒවා කළමනාකරණය කිරීමටත් කළමනාකරණ කමිටු ස්ථාපිත කර ඇත. අවදානම් පිළිබඳ මාසික වාර්තා සමාලෝචනය සහ සාකච්ඡාව සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා විධිවිධාන ක්‍රියාත්මක වේ. අදාළ නීති, රෙගුලාසි, රීති, විධානයන් සහ මඟ පෙන්වීම් සමඟ අනුකූලවන ආකාරය ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් අධීක්ෂණය කරන අතර, මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කෙරේ.

අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ගයන්ගේ කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම සඳහා විගණන කමිටුව හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අඛණ්ඩව ක්‍රියා කරයි. විගණන කමිටුවේ හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 180 සිට 183 දක්වා අන්තර්ගත වේ.

විගණන වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයා වශයෙන් බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මත විගණන වාර්තාව සහ අවසාන විගණන මතය ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකාධිපතිගේ වගකීම මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 230 සිට 234 දක්වා ඇති විගණකාධිපතිතුමාගේ වාර්තාවේ ඇතුළත් කර ඇත.


බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ සඵලදායිතාවය පිළිබඳව විගණකාධිපතිවරයා විසින් ලබාදුන් සහතිකය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 228 හි දක්වා ඇත.

අනුකූලතාව

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට නියාමන හා ව්‍යවස්ථාපිත අධිකාරීන්ට ගෙවීමට ඇති සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් බැංකුව සහ පරිපාලිතයන් විසින් නියමිත පරිදි ගෙවා අවසන් කර හෝ ප්‍රතිපාදන සලසා ඇති බවට අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි සෑහීමට පත් වේ.

මෙම වාර්තාවේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ ඔවුන්ගේ වගකීම යථා පරිදි ඉටුකර ඇති බවයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



ජානකී සේනානායක සිරිවර්ධන
ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2026 පෙබරවාරි 24 දින
කොළඹ දීය.

විගණකාධිපතිතුමාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/B/BOC/FA/2025

ඔබගේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 26 February 2026

සභාපති
ලංකා බැංකුව

ලංකා බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ලංකා බැංකුවේ ("බැංකුව") සහ එහි පරිපාලිතයන්හි ("සමූහය") 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනත අනුව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 1971 අංක 38 දරණ මුදල් පනතේ 5(1) වන වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයාට ලැබී ඇති බලතල අනුව 1992 මැයි 14 වන දින නිකුත් කර ඇති අංක 715 දරණ රාජ්‍ය ගැසට් පත්‍රය යටතේ, 1971 අංක 38 දරණ මුදල් පනතේ II වන කොටස යටතේ ඇති විධිවිධානයන්ගෙන් බැංකුව නිදහස් කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං. වි .ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ප්‍රධාන විගණන කරුණු

ප්‍රවර්තන කාලපරිච්ඡේදය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ සමෝධානික මූල්‍ය ප්‍රකාශන විගණනයේදී මාගේ වෘත්තිමය විනිශ්චය අනුව වඩාත් වැදගත් වන කරුණු ප්‍රධාන විගණන කරුණු ලෙස සලකයි. බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ සමෝධානික මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ විගණනයේදී මෙම කරුණු සමස්තයක් ලෙස සලකා බලනු ලබන අතර මෙම කරුණු පිළිබඳ වෙන් වෙන්ව මතයක් මා විසින් ප්‍රකාශ කරනු නොලැබේ. මාගේ විගණනය තුළින් පහත සඳහන් සෑම කරුණක්ම ආමන්ත්‍රණය කළ ආකාරය පිළිබඳව සවිස්තරාත්මකව පැහැදිලි කර ඇත.

මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යටතේ මා විසින් සම්පූර්ණ කල වගකීම් විස්තර කර ඇත. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයේ අවදානම පිළිබඳ මගේ තක්සේරුවට ප්‍රතිචාර දැක්වීම සඳහා නිර්මාණය කර ඇති ක්‍රියා පටිපාටිවල කාර්යසාධනය මගේ විගණනයට ඇතුළත් විය. පහත කරුණු ආමන්ත්‍රණය කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියා පටිපාටි ඇතුළුව මගේ විගණන ක්‍රියා පටිපාටිවල ප්‍රතිඵල, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණන මතය සඳහා පදනම සපයයි.

ප්‍රධාන විගණන කරුණු	මාගේ විගණනයේදී ප්‍රධාන විගණන කරුණු ආමන්ත්‍රණය කරන ලද ආකාරය
ක්‍රමක්ෂය කළ පිරිවැයෙන් මනිනු ලබන ණය සහ අත්තිකාරම් සඳහා අපේක්ෂිත ණය හානිය සඳහා වෙන්කිරීම සටහන 28 හි දක්වා ඇති පරිදි ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලබන ණය සහ අත්තිකාරම් වල අපේක්ෂිත ණය හානිය වෙන්කිරීම, සටහන 4.4.11.6 හි විස්තර කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මත පදනම්ව කළමනාකරණය විසින් තීරණය කරනු ලැබේ. මෙය ප්‍රධාන විගණන කාරණයක් වන්නේ, • ණය සහ අත්තිකාරම් වල අනාගත අයකර ගැනීමේ හැකියාව තක්සේරු කිරීමේදී, සැලකිය යුතු කළමනාකරණ විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිත මට්ටම් සම්බන්ධ වීම සහ • අපේක්ෂිත ණය හානි වෙන් කිරීම වාර්තා වූ අගයේ ඇති ප්‍රමාණාත්මක බව. අපේක්ෂිත ණය අලාභ සඳහා වන හානිය තක්සේරු කිරීමේදී කළමනාකරණය විසින් භාවිතා කරන ලද සැලකිය යුතු විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු වල ප්‍රධාන ක්ෂේත්‍ර අතරට ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් සිදුවී ඇත්දැයි තීරණය කිරීම, පුළුල් පරාසයක අනාගත සාර්ව ආර්ථික සාධක භාවිතා කිරීම සහ ඒවායේ ආශ්‍රිත බර තැබීම් ඇතුළත් වේ. මේවා ස්වභාවයෙන්ම ඉහළ තක්සේරු අවිනිශ්චිතතාවයන් ගෙන් යුක්ත වන අතර පුද්ගලික විනිශ්චය මත පදනම් වී ඇත. ප්‍රධාන ඇස්තමේන්තු, උපකල්පන සහ විනිශ්චයන් පිළිබඳ වැඩිදුර තොරතුරු සටහන 28 හි අනාවරණය කර ඇත.	ක්‍රමක්ෂය පිරිවැයට අගය කළ මූල්‍ය වත්කම්වල අපේක්ෂිත ණය හානිය සඳහා ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් බව ආමන්ත්‍රණය කිරීමේදී, මගේ විගණන ක්‍රියා පටිපාටිවලට පහත ප්‍රධාන ක්‍රියා පටිපාටි ඇතුළත් විය: • මගේ වාර්තාවේ දිනය දක්වා පවතින තොරතුරු මත පදනම්ව, වත්මන් ආර්ථික තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීම ඇතුළුව අපේක්ෂිත ණය හානි ගණනය කිරීම් සහ පාදකව පවතින ක්‍රමවේදයන් සඳහා බැංකුවේ විධිවිධාන පෙළගැස්වීම මම තක්සේරු කළෙමි. • අපේක්ෂිත ණය අලාභ ඇස්තමේන්තු කිරීම පිළිබඳ පාලන සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය මම ඇගයීමට ලක් කළෙමි. • අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය විසින් අපේක්ෂිත ණය හානි වෙන්කිරීමට අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි, සමාලෝචනය සහ අනුමත කිරීම, අධීක්ෂණය කිරීමේ මට්ටම තක්සේරු කරන ලදී. • අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම් සඳහා භාවිතා කරන ලද මූලික දත්ත වල සම්පූර්ණතාවය, නිවැරදිතාවය සහ සාධාරණත්වය, බැංකුවේ මූලාශ්‍ර ලේඛන සහ ගිණුම් වාර්තාවල තොරතුරු සමඟ සසඳා පරීක්ෂා කරන ලදී. • ණය තත්ත්ව සහතික කිරීම් සහ අදාළ අදියර වර්ගීකරණයන්හි භාවිතා වන ගුණාත්මක හා ප්‍රමාණාත්මක සාධකවල සාධාරණත්වය ඇගයීමට ලක් කරන ලදී. • ඉහත කරුණු වලට අමතරව, පහත සඳහන් ක්‍රියා පටිපාටි සිදු කරන ලදි. ◆ කේවල පදනම මත හානිකරණය ගණනය කළ ණය සහ අත්තිකාරම් සඳහා: ◉ අපේක්ෂිත ණය හානිය සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම සඳහා භාවිතා කරන ප්‍රධාන යෙදවුම් වල සාධාරණත්වය මම ඇගයීමට ලක් කළෙමි. විශේෂයෙන් ඉහළ අවදානම් කර්මාන්ත සහ ඇපකර වල ප්‍රතිසාධන ක්‍රියාමාර්ග වල තත්ත්වය සම්බන්ධයෙන් මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු වටිනාකම සහ කාලසීමාව සැලකිල්ලට ගනිමින් එවැනි ඇගයීම් සිදු කරන ලදි. ◉ කේවල පදනමට හානිකරණය ගණනය කිරීම් වලට පාදක වූ අංක ගණිතමය නිරවද්‍යතාව පරීක්ෂා කළෙමි. ◆ සාමූහික පදනම මත හානිකරණය ගණනය කළ ණය සහ අත්තිකාරම් සඳහා: ◉ අපේක්ෂිත ණය හානිය සඳහා භාවිතා කරන ලද ප්‍රධාන යෙදවුම් සහ ගණනය කිරීම් පරීක්ෂා කරන ලදි. ◉ කළමනාකරණය විසින් පාදක ක්‍රමවේදය සඳහා භාවිතා කරන ලද විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු, සහ "දිට්වා" සුළි කුණාටුවෙන් පැන නගින බලපෑම සලකා බැලීම ඇතුළුව, කළමනාකරණ ආවරණ සාධාරණ දැයි තක්සේරු කරන ලදි. . ◉ භාවිතා කරන ලද අනාගත තොරතුරුවල සහ සලකා බැලූ ආර්ථික අවස්ථා සහ එම එක් එක් අවස්ථාවන්ට පවරා ඇති සම්භාවිතා බර තැබීමෙහි සාධාරණත්වය ඇගයීම මගේ පරීක්ෂණයට ඇතුළත් විය. • සටහන් 4.4.11.6 සහ 28 හි දක්වා ඇති අදාළ මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම් වල ප්‍රමාණවත් බව තක්සේරු කළෙමි.

විගණකාධිපතිතුමාගේ වාර්තාව

ප්‍රධාන විගණන කරුණු	මාගේ විගණනයේදී ප්‍රධාන විගණන කරුණු ආමන්ත්‍රණය කරන ලද ආකාරය
තොරතුරු තාක්ෂණ (IT) පද්ධති සම්බන්ධ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය ස්වයංක්‍රීය ක්‍රියාවලි සහ අභ්‍යන්තර පාලනයන් සහිත බහු තොරතුරු තාක්ෂණ පද්ධති මත සැලකිය යුතු ලෙස රඳා පවතී. තවද, තොරතුරු තාක්ෂණ පද්ධති මගින් ජනනය කරන ලද දත්ත සහ වාර්තා භාවිතා කරමින් ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම් සකස් කරනු ලැබේ, ඒවා පැතුරුම්පත් භාවිතයෙන් සම්පාදනය කර සකස් කර ඇත. ඒ අනුව, මූල්‍ය වාර්තාකරණයට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධති සහ අදාළ අභ්‍යන්තර පාලනයන් ප්‍රධාන විගණන කරුණක් ලෙස සැලකේ.	මගේ විගණන ක්‍රියා පටිපාටිවලට පහත ප්‍රධාන ක්‍රියා පටිපාටි ඇතුළත් විය: • මූල්‍ය වාර්තාකරණයට සහ හෙළිදරව් කිරීම් වලට අදාළ ක්‍රියාවලියන්හි අභ්‍යන්තර පාලන පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගත්තෙමි. • මාගේ අභ්‍යන්තර විශේෂඥ සම්පත් දායකයින් සම්බන්ධ කර ගන්නා ලද අතර; • පරිශීලක ප්‍රවේශය සහ වෙනස් වීම් කළමණාකරණයට අදාළ ඒවා ඇතුළුව තොරතුරු තාක්ෂණ පද්ධති සහ අදාළ පාලනවල සැලසුම් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව පරීක්ෂා කිරීම, ඇගයීම සහ හඳුනා ගැනීම සහ • බැංකුවට බලපාන සයිබර් ආරක්ෂණ අවදානම් සහ මෙම අවදානම් විසඳීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව මූලික වශයෙන් විමසීම් තුළින් ඉහළ මට්ටමේ අවබෝධයක් ලබා ගැනීම. • පොදු ලෙජරය සැසඳීම ඇතුළුව නිරවද්‍යතාව සහ සම්පූර්ණත්වය සඳහා හෙළිදරව් කිරීම් වලට භාවිතා කරන වාර්තාවල මූලාශ්‍ර දත්ත පරීක්ෂා කළෙමි.

1.4 බැංකුවේ 2025 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මා හට ලබාදීමට බලාපොරොත්තු වන බැංකුවේ 2025 වාර්ෂික වාර්තාවේ ඇතුලත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුලත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ මතයෙන් අනෙක් තොරතුරු ආවරණය නොකරන අතර ඒ පිළිබඳව කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මගේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන්, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගෙන ඇති අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී, අනෙක් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ සැලකිය යුතු ලෙස නොගැලපේද නැතහොත් විගණනයේදී ලබාගත් මගේ දැනුම සමඟ හෝ වෙනත් ආකාරයකින් ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

බැංකුවේ 2025 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශන ඇති බව මා නිගමනය කරන්නේ නම්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශ්ව වෙත එම කරුණු සන්නිවේදනය කල යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වැරදි ප්‍රකාශන තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධානවලට අනුකූලව යථා කාලයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන මගේ වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සමූහයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්වට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමණාකරණයේ වගකීමකි.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- බැංකුවේ සහ සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවන්හිදී උචිත විගණන ක්‍රියාපරිපාටි සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාව ඉදිරිපත් කරන දින දක්වා ඇති සියළු විගණන සාක්ෂීන් පිළිබඳ අවධානය යොමු කරමින් මාගේ නිගමනය තීරණය වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- සමෝධානික මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට සමූහයේ විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදී. සමූහයේ විගණනය මෙහෙයවීම, අධීක්ෂණය සහ සමාලෝචනය සඳහා මම වගකිව යුතුය. මගේ විගණන මතය සඳහා මම විසින් වගකිව යුතුය.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 1988 අංක 30 දරණ බැංකු පනතේ 39 වන වගන්තියේ (2024 අංක 24 දරණ බැංකු පනත් සංශෝධනය පරිදි) පහත සඳහන් අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත් වේ;

2.2.1 මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශනවල සිදු කර ඇති හෙළිදරව් කිරීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2024 අංක 05 දරණ චක්‍රලේඛයේ අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.3 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගත් සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.3.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයකුට බැංකුවට සම්බන්ධ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.3.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව අදාල ලිඛිත නීතියකට හෝ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

විගණකාධිපතිතුමාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.3.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව බැංකුව එහි බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.3.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර ඇවිතා කර නොමැති බව.

අත්සන් කළේ.

එල් එස් අයි ජයරත්න
විගණකාධිපති

මූල්‍ය ප්‍රකාශන - පටුන

		පිටු අංකය
මූලික මූල්‍ය ප්‍රකාශන		
	ලාභ හෝ අලාභ ප්‍රකාශනය	236
	විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	237
	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	238
	හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය	240
	මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	244
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්		
1.	වාර්තාකරණ ඒකකය	246
2.	මූල්‍ය ප්‍රකාශ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	247
3.	ගිණුම් පිළියෙල කිරීමේ පදනම	247
4.	ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති	250
5.	රක්ෂණ ව්‍යාපාරය	259
6.	නිකුත් කරන ලද නමුත් වාර්තා කරන දිනට බලාත්මන නොවන නව ගිණුම්කරණ ප්‍රමිතීන්	260
7.	මුළු ආදායම	262
8.	ශුද්ධ පොළී ආදායම	262
9.	ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	264
10.	වෙළඳපළ ගනුදෙනු වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	265
11.	ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම් වලින් ලත් ශුද්ධ ලාභ/(පාඩු)	265
12.	මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	265
13.	වෙනත් මෙහෙයුම් ආදායම්	266
14.	ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය) කිරීම	267
15.	සේවක මණ්ඩල වියදම්	268
16.	ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම්	269
17.	වෙනත් වියදම්	270
18.	බදු වියදම	271
19.	ආශ්‍රිත සමාගම්වල ලාභ/ (පාඩු) කොටස, බදු පසු	272
20.	කොටසක ඉපැයුම සහ කොටසක ලාභාංශ	273
21.	මිනුම් කිරීමේ පදනම මත මූල්‍ය උපකරණ විශ්ලේෂණය	274
22.	මුදල් සහ මුදල් හා සමාන දෑ	277
23.	මහ බැංකු සමඟ ඇති ශේෂයන්	278
24.	බැංකුවල ඇති තැන්පතු	279
25.	ප්‍රතිවික්‍රණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	280
26.	ව්‍යුත්පන්න මූල්‍ය වත්කම්	281
27.	ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්	281
28.	ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්	290
29.	ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ	297
30.	වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	303
31.	පරිපාලිත සමාගම්වල ආයෝජනය	306
32.	ආශ්‍රිත සමාගම්වල ආයෝජනය	311
33.	ආයෝජන දේපළ	314
34.	දේපළ, පිරියත හා උපකරණ	316
35.	භාවිත අයිතිය සහිත වත්කම්/ කල්බදු දේපළ	330
36.	අස්පෘශ්‍ය වත්කම්	333
37.	විලම්බිත බදු වත්කම්/(වගකීම්)	334
38.	වෙනත් වත්කම්	336
39.	බැංකුවලට ගෙවිය යුතු	336
40.	ප්‍රතිම්ලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	337
41.	ව්‍යුත්පන්න මූල්‍ය වගකීම්	337
42.	ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	338
43.	ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම්	339
44.	නිකුත් කළ ණය සුරැකුම්පත්	339
45.	ප්‍රවර්තන බදු වගකීම්/ (වත්කම්)	340
46.	රක්ෂණ ගිවිසුම් වගකීම්	341
47.	වෙනත් වගකීම්	342
48.	සේවක විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්	342
49.	යටත් කාලීන වගකීම්	352
50.	කොටස් ප්‍රාග්ධනය	356
51.	ස්ථාවර සංචිත අරමුදල	356
52.	රඳවාගත් ඉපැයුම්	357
53.	මුදල් ප්‍රවාහ හෙජ් සංචිත	357
54.	වෙනත් සංචිත	357
55.	පාලනයට යටත් නොවන හිමිකම	360
56.	මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළිබඳ සටහන්	360
57.	අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්	361
58.	සුරැකුම් ලෙස ඔඩපණය කළ වත්කම්	364
59.	වාර්තාකරණ දිනට පසුව හටගන්නා සිදුවීම්	364
60.	වත්කම් සහ වගකීම්වල කල්පිරීම විශ්ලේෂණය	364
61.	සම්බන්ධිත පාර්ශ්වයන් අනාවරණ	367
62.	බණ්ඩ පදනම මත මූල්‍ය තොරතුරු වාර්තාකරණය	374
63.	වත්කම් හා වගකීම්වල සාධාරණ අගය	376
64.	මූල්‍ය අවදානම් කළමනාකරණය	383
65.	තෝරාගත් කාර්ය සාධන දර්ශක/ ප්‍රධාන මූල්‍ය දත්ත (නියාමන වාර්තාකරණයට අනුව)	403

ලාභ හෝ අලාභ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව 2025 රු. '000	බැංකුව 2024 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000	සමූහය වෙනස %
මුළු ආදායම	7	548,623,413	485,405,047	13.0	558,674,587	494,921,947	12.9
පොළී ආදායම		496,158,958	461,113,949	7.6	504,977,909	468,786,127	7.7
අඩු කළා: පොළී වියදම		289,222,537	293,561,489	(1.5)	293,134,705	297,058,327	(1.3)
ශුද්ධ පොළී ආදායම	8	206,936,421	167,552,460	23.5	211,843,204	171,727,800	23.4
ගාස්තු සහ කොමිස් ආදායම		35,697,977	30,415,561	17.4	36,255,289	30,847,506	17.5
අඩු කළා: ගාස්තු සහ කොමිස් වියදම		12,600,869	9,802,534	28.5	12,689,384	9,845,866	28.9
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	9	23,097,108	20,613,027	12.1	23,565,905	21,001,640	12.2
වෙළඳපළ ගනුදෙනු වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	10	5,810,710	3,433,734	69.2	5,855,505	3,473,065	68.6
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය උපකරණයන් ගෙන් ලත් ශුද්ධ ලාභ/(පාඩු)	11	1,581,766	1,507,537	4.9	998,484	1,714,133	(41.7)
මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	12	1,741,194	(3,598,692)	(148.4)	2,526,648	(2,892,497)	(187.4)
වෙනත් මෙහෙයුම් ආදායම්	13	7,632,808	(7,467,042)	(202.2)	8,060,752	(7,006,387)	(215.0)
මුළු මෙහෙයුම් ආදායම		246,800,007	182,041,024	35.6	252,850,498	188,017,754	34.5
අඩු කළා: ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා ප්‍රතිපාදන/(ප්‍රතිවර්තය) කිරීම	14	21,109,778	(20,343,159)	(203.8)	21,017,651	(20,720,005)	(201.4)
ශුද්ධ මෙහෙයුම් ආදායම		225,690,229	202,384,183	11.5	231,832,847	208,737,759	11.1
අඩු කළා: මෙහෙයුම් වියදම්							
සේවක මණ්ඩල වියදම්	15	45,689,438	40,287,071	13.4	48,534,203	42,946,620	13.0
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	16	5,022,916	4,194,927	19.7	4,732,494	4,308,053	9.9
වෙනත් වියදම්	17	22,269,517	22,602,628	(1.5)	24,498,541	24,557,901	(0.2)
මුළු මෙහෙයුම් වියදම්		72,981,871	67,084,626	8.8	77,765,238	71,812,574	8.3
මූල්‍ය සේවා මත බදු වලට පෙර ලාභය/(අලාභය)		152,708,358	135,299,557	12.9	154,067,609	136,925,185	12.5
අඩු කළා: මූල්‍ය සේවා මත බදු	18.1	31,881,404	28,395,289	12.3	32,290,014	28,790,143	12.2
මූල්‍ය සේවා මත බදු වලට පසු ලාභය/(අලාභය)		120,826,954	106,904,268	13.0	121,777,595	108,135,042	12.6
ආශ්‍රිත සමාගම්වල ලාභ/(පාඩු) කොටස, බදු පසු	19	-	-	-	156,155	86,425	80.7
ආදායම් බද්දට පෙර ලාභය/(අලාභය)		120,826,954	106,904,268	13.0	121,933,750	108,221,467	12.7
අඩු කළා: ආදායම් බදු වියදම/(ප්‍රතිවර්තය කිරීම)	18.2	44,820,023	42,517,329	5.4	45,462,492	43,159,990	5.3
වර්ෂය සඳහා ලාභය/(අලාභය)		76,006,931	64,386,939	18.0	76,471,258	65,061,477	17.5
වර්ෂයේ ලාභයෙන්:							
බැංකුවේ කොටස් හිමියාට අදාළ කොටස		76,006,931	64,386,939	18.0	76,583,681	65,007,643	17.8
පාලනයට යටත් නොවන හිමිකම්		-	-	-	(112,423)	53,834	(308.8)
වර්ෂය සඳහා ලාභය/(අලාභය)		76,006,931	64,386,939	18.0	76,471,258	65,061,477	17.5
කොටසක ඉපැයුම් සහ කොටසක ලාභාංශ	20						
කොටසක මූලික ඉපැයුම් (රු.)		2,987.93	2,575.48	16.0	3,010.60	2,600.31	15.8
කොටසක තනුක ඉපැයුම් (රු.)		2,954.02	2,502.41	18.0	2,976.44	2,526.53	17.8
කොටසක ලාභාංශ (රු.)		194.33	-	-	194.33	-	-

පිටු අංක 246 සිට 403 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව			සමූහය		
	2025 රු. '000	2024 රු. '000	වෙනස %	2025 රු. '000	2024 රු. '000	වෙනස %
වර්ෂය සඳහා ලාභය/(අලාභය)	76,006,931	64,386,939	18.0	76,471,258	65,061,477	17.5
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කිරීමට හැකි අයිතමයන්						
විදේශීය මෙහෙයුම්වල මූල්‍ය වාර්තා පරිවර්තනයේ දී ඇතිවන ශුද්ධ විනිමය ලාභ/(අලාභ)	577,270	(1,849,445)	(131.2)	1,344,993	(2,499,942)	(153.8)
මුදල් ප්‍රවාහ හෙජ් උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ)	(783,217)	(3,730,094)	(79.0)	(783,217)	(3,730,094)	(79.0)
වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන ණය උපකරණවල ආයෝජන මත ශුද්ධ ලාභ/(අලාභ)	(489,211)	736,052	(166.5)	(545,848)	745,464	(173.2)
වෙනත් විස්තීර්ණ අදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) ලාභයට හෝ අලාභයට මාරු කිරීම	-	-	-	-	(6,663)	(100.0)
ඉහත අගයන් මත විලම්බිත බදු බලපෑම	148,454	(220,371)	(167.4)	148,454	(220,371)	(167.4)
ආශ්‍රිත සමාගම්හි වෙනත් විස්තීර්ණ ආදායම් කොටස, බදු පසු	-	-	-	30,421	16,795	81.1
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කිරීමට හැකි අයිතමයන්ගේ එකතුව	(546,704)	(5,063,858)	(89.2)	194,803	(5,694,811)	(103.4)
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකරන අයිතමයන්						
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන ස්කන්ධ උපකරණවල සාධාරණ අගයේ වෙනස්කම්	2,176,370	2,782,020	(21.8)	2,754,600	1,912,880	44.0
ඉහත අගය මත විලම්බිත බදු බලපෑම	(212,651)	(120,459)	76.5	(212,651)	(120,459)	76.5
ප්‍රත්‍යාගණන අතිරික්තයේ/ (ඌනතාවයේ) වෙනස්කම්	-	-	-	653,881	(139,720)	(568.0)
ඉහත අගය මත විලම්බිත බදු බලපෑම	-	-	-	(196,164)	41,916	(568.0)
විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභ/(අලාභ)	(13,119,330)	(13,794,600)	(4.9)	(13,059,383)	(13,861,596)	(5.8)
ඉහත අගය මත විලම්බිත බදු බලපෑම	3,935,799	4,138,380	(4.9)	3,930,252	4,157,605	(5.5)
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකරන අයිතමයන්ගේ එකතුව	(7,219,812)	(6,994,659)	3.2	(6,129,465)	(8,009,374)	(23.5)
වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු	(7,766,516)	(12,058,517)	(35.6)	(5,934,662)	(13,704,185)	(56.7)
වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම	68,240,415	52,328,422	30.4	70,536,596	51,357,292	37.3
මුළු විස්තීර්ණ ආදායමෙන්:						
බැංකුවේ කොටස්හිමියාට අදාළ කොටස	68,240,415	52,328,422	30.4	70,606,259	51,321,630	37.6
පාලනයට යටත් නොවන හිමිකම	-	-	-	(69,663)	35,662	(295.3)
වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම	68,240,415	52,328,422	30.4	70,536,596	51,357,292	37.3

පිටු අංක 246 සිට 403 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.


මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

		බැංකුව			සමූහය		
දෙසැම්බර් 31 දිනට	සටහන	2025 රු. '000	2024 රු. '000	වෙනස %	2025 රු. '000	2024 රු. '000	වෙනස %
වත්කම්							
මුදල් සහ මුදල් හා සමාන දෑ	22	131,083,172	115,422,407	13.6	133,811,977	116,281,852	15.1
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	23	79,845,952	52,346,230	52.5	79,845,952	52,346,230	52.5
බැංකුවල ඇති තැන්පතු	24	39,458,670	62,413,107	(36.8)	43,182,411	61,576,750	(29.9)
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	25	345,307	23,982,341	(98.6)	604,912	21,581,160	(97.2)
ව්‍යුත්පන්න මූල්‍ය වත්කම්	26	6,900,797	23,500,600	(70.6)	6,900,797	23,500,600	(70.6)
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	27	12,600,011	21,003,177	(40.0)	20,452,616	29,762,487	(31.3)
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්							
ණය සහ අත්තිකාරම්	28	2,371,751,976	2,177,707,779	8.9	2,442,422,718	2,221,161,844	10.0
ණය සහ වෙනත් උපකරණ	29	2,605,510,006	2,275,934,376	14.5	2,611,713,109	2,282,636,084	14.4
වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	30	37,379,176	52,049,653	(28.2)	39,744,042	53,862,763	(26.2)
පරිපාලිත සමාගම්වල ආයෝජන	31	8,105,402	8,080,402	0.3	-	-	-
ආශ්‍රිත සමාගම්වල ආයෝජන	32	92,988	92,988	-	894,332	828,923	7.9
ආයෝජන දේපළ	33	2,414,640	2,414,640	-	-	-	-
දේපළ, පිරියත හා උපකරණ	34	46,142,559	45,621,257	1.1	63,453,867	62,308,257	1.8
භාවිත අයිතිය සහිත වත්කම්/කල්බදු දේපළ	35	5,510,507	5,554,420	(0.8)	2,957,410	3,355,142	(11.9)
අස්පෘශ්‍ය වත්කම්	36	2,790,651	1,608,812	73.5	2,888,809	1,710,211	68.9
විලම්බිත බදු වත්කම්	37	27,402,018	15,836,422	73.0	27,518,175	15,967,300	72.3
වෙනත් වත්කම්	38	90,216,952	101,570,365	(11.2)	90,659,339	101,791,704	(10.9)
මුළු වත්කම්		5,467,550,784	4,985,138,976	9.7	5,567,050,466	5,048,671,307	10.3
වගකීම්							
බැංකු වලට ගෙවිය යුතු	39	26,397,898	1,671,087	1,479.7	27,225,943	1,682,417	1,518.3
ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	40	284,215,169	131,079,414	116.8	288,688,312	130,030,614	122.0
ව්‍යුත්පන්න මූල්‍ය වගකීම්	41	561,062	16,476,077	(96.6)	561,062	16,476,077	(96.6)
ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම්							
තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	42	4,388,585,972	4,208,603,435	4.3	4,447,652,639	4,245,531,800	4.8
වෙනත් ණය ගැනීම්	43	48,719,379	29,143,678	67.2	56,877,726	32,344,253	75.9
නිකුත් කළ ණය සුරැකුම්පත්	44	-	-	-	1,754,101	718,873	144.0
ප්‍රවර්තන බදු වගකීම්	45	25,418,318	23,209,855	9.5	25,667,188	23,594,223	8.8
විලම්බිත බදු වගකීම්	37	-	-	-	3,003,753	2,911,350	3.2
රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත	46	-	-	-	483,493	400,967	20.6
රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත නොවන	46	-	-	-	558,400	423,923	31.7
වෙනත් වගකීම්	47	228,397,006	203,859,925	12.0	227,394,869	203,826,491	11.6
යටත් කාලීන වගකීම්	49	99,455,760	68,535,700	45.1	99,203,598	68,282,559	45.3
මුළු වගකීම්		5,101,750,564	4,682,579,171	9.0	5,179,071,084	4,726,223,547	9.6

දෙසැම්බර් 31 දිනට	සටහන	බැංකුව 2025 රු. '000	බැංකුව 2024 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000	සමූහය වෙනස %
ස්කන්ධය							
කොටස් ප්‍රාග්ධනය	50	25,730,000	25,730,000	-	25,730,000	25,730,000	-
ස්ථාවර සංචිත අරමුදල	51	18,474,000	16,953,000	9.0	18,474,000	16,953,000	9.0
රඳවාගත් ඉපැයුම්	52	204,351,656	183,388,860	11.4	207,048,884	185,536,613	11.6
මුදල් ප්‍රවාහ හෙජ් සංචිත	53	738,206	1,521,423	(51.5)	738,206	1,521,423	(51.5)
වෙනත් සංචිත	54	116,506,358	74,966,522	55.4	134,913,287	91,555,247	47.4
බැංකුවේ කොටස්හිමියාට අයත් මුළු ස්කන්ධය		365,800,220	302,559,805	20.9	386,904,377	321,296,283	20.4
පාලනයට යටත් නොවන හිමිකම	55	-	-	-	1,075,005	1,151,477	(6.6)
මුළු ස්කන්ධය		365,800,220	302,559,805	20.9	387,979,382	322,447,760	20.3
මුළු වගකීම් සහ ස්කන්ධය		5,467,550,784	4,985,138,976	9.7	5,567,050,466	5,048,671,307	10.3
අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්	57	1,808,404,621	1,788,296,358	1.1	1,812,255,096	1,789,396,253	1.3
කොටසක ශුද්ධ වත්කම් වටිනාකම (රු.)	50.2	14,216.88	12,102.39	17.5	15,037.09	12,851.85	17.0


පිටු අංක 246 සිට 403 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන වලින් 2025 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂයේ ලාභය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය කරන බවට සහතික කරමි.




එම් පී රුවන් කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී


මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී.



කාවින්ද ද සොයිසා
සභාපති



ජේ ඩී එන් ගුණසේකර
අධ්‍යක්ෂ



වයි ඒ ජයතිලක
වැඩබලන මහා කළමණාකරු

2026 පෙබරවාරි 24
කොළඹ දීය.

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

බැංකුව

	සටහන	කොටස් ප්‍රාග්ධනය	විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය	ස්ථාවර සංචිත අරමුදල	මුදල් ප්‍රවාහ හෙජ් සංචිතය
		රු. '000	රු. '000	රු. '000	රු. '000
2024 ජනවාරි 1 දිනට ශේෂය		25,000,000	730,000	15,665,000	5,251,517
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම					
වර්ෂය සඳහා ලාභය		-	-	-	-
වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු		-	-	-	(3,730,094)
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		-	-	-	(3,730,094)
කෘජුව හිමිකමට හඳුනාගත් කොටස්හිමියා සමඟ සිදුකළ ගනුදෙනු					
අධිභාර බදු		-	-	-	-
වෙනත් සංචිතවලට පැවරුම්	54.4	-	-	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	51	-	-	1,288,000	-
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ මුළු ගනුදෙනු		-	-	1,288,000	-
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය		25,000,000	730,000	16,953,000	1,521,423
2025 ජනවාරි 1 දිනට ශේෂය		25,000,000	730,000	16,953,000	1,521,423
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම					
වර්ෂය සඳහා ලාභය		-	-	-	-
වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු		-	-	-	(783,217)
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		-	-	-	(783,217)
කෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ ගනුදෙනු					
2025 සඳහා ලාභාංශ	20.3	-	-	-	-
කොටස් ප්‍රාග්ධනයට පැවරුම්	50.1	730,000	(730,000)	-	-
වෙනත් සංචිතවලට පැවරුම්	54.4	-	-	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	51	-	-	1,521,000	-
හිමිකමට හඳුනාගත් කොටස්හිමියා සමඟ සිදුකළ මුළු ගනුදෙනු		730,000	(730,000)	1,521,000	-
2025 දෙසැම්බර් 31 දිනට ශේෂය		25,730,000	-	18,474,000	738,206

පිටු අංක 246 සිට 403 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

අනෙකුත් සංචිත				
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය	වෙනත් සංචිත	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ඉපැයුම්	මුළු හිමිකම
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
2,557,307	8,931,901	22,227,386	171,351,609	251,714,720
-	-	-	64,386,939	64,386,939
3,177,242	(1,849,445)	-	(9,656,220)	(12,058,517)
3,177,242	(1,849,445)	-	54,730,719	52,328,422
-	-	-	(1,483,337)	(1,483,337)
-	39,922,131	-	(39,922,131)	-
-	-	-	(1,288,000)	-
-	39,922,131	-	(42,693,468)	(1,483,337)
5,734,549	47,004,587	22,227,386	183,388,860	302,559,805
5,734,549	47,004,587	22,227,386	183,388,860	302,559,805
-	-	-	76,006,931	76,006,931
1,622,962	577,270	-	(9,183,531)	(7,766,516)
1,622,962	577,270	-	66,823,400	68,240,415
-	-	-	(5,000,000)	(5,000,000)
-	-	-	-	-
-	39,339,604	-	(39,339,604)	-
-	-	-	(1,521,000)	-
-	39,339,604	-	(45,860,604)	(5,000,000)
7,357,511	86,921,461	22,227,386	204,351,656	365,800,220

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

සමූහය

	සටහන	කොටස් ප්‍රාග්ධනය	විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය	ස්ථාවර සංචිත අරමුදල	මුදල් ප්‍රවාහ හෙජ් සංචිතය
		රු. '000	රු. '000	රු. '000	රු. '000
2024 ජනවාරි 1 දිනට ශේෂය		25,000,000	730,000	15,665,000	5,251,517
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම					
වර්ෂය සඳහා ලාභය		-	-	-	-
වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු		-	-	-	(3,730,094)
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		-	-	-	(3,730,094)
කෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ ගනුදෙනු					
අධිභාර බදු		-	-	-	-
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ පරිපාලිත ලාභාංශ		-	-	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	51	-	-	1,288,000	-
වෙනත් සංචිතවලට පැවරුම්		-	-	-	-
ලබා නොගත් ලාභාංශ නැවත මාරු කිරීම්		-	-	-	-
හිමිකමට හඳුනාගත් කොටස් හිමියන් සමඟ සිදු කළ මුළු ගනුදෙනු		-	-	1,288,000	-
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය		25,000,000	730,000	16,953,000	1,521,423
2025 ජනවාරි 1 දිනට ශේෂය		25,000,000	730,000	16,953,000	1,521,423
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම					
වර්ෂය සඳහා ලාභය		-	-	-	-
වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු		-	-	-	(783,217)
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		-	-	-	(783,217)
කෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ ගනුදෙනු					
2025 සඳහා ලාභාංශ	20.3	-	-	-	-
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ පරිපාලිත ලාභාංශ		-	-	-	-
කොටස් ප්‍රාග්ධනයට පැවරුම්	50.1	730,000	(730,000)	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	51	-	-	1,521,000	-
වෙනත් සංචිත සඳහා පැවරුම්		-	-	-	-
ලබානොගත් ලාභාංශ නැවත මාරු කිරීම්		-	-	-	-
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු		730,000	(730,000)	1,521,000	-
2025 දෙසැම්බර් 31 දිනට ශේෂය		25,730,000	-	18,474,000	738,206

පිටු අංක 246 සිට 403 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

බැංකුවේ කොටස්හිමියාට අදාළ කොටස					
අනෙකුත් සංචිත					
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය	වෙනත් සංචිත	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ඉපැයුම්	පාලනයට යටත් නොවන හිමිකම	මුළු හිමිකම
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
4,999,807	13,060,940	33,687,424	173,063,302	1,120,796	272,578,786
-	-	-	65,007,643	53,834	65,061,477
2,328,764	(2,499,942)	(102,718)	(9,682,023)	(18,172)	(13,704,185)
2,328,764	(2,499,942)	(102,718)	55,325,620	35,662	51,357,292
-	-	-	(1,483,337)	-	(1,483,337)
-	-	-	-	(6,809)	(6,809)
-	-	-	(1,288,000)	-	-
-	40,080,972	-	(40,080,972)	-	-
-	-	-	-	1,828	1,828
-	40,080,972	-	(42,852,309)	(4,981)	(1,488,318)
7,328,571	50,641,970	33,584,706	185,536,613	1,151,477	322,447,760
7,328,571	50,641,970	33,584,706	185,536,613	1,151,477	322,447,760
-	-	-	76,583,681	(112,423)	76,471,258
2,130,613	1,344,993	452,389	(9,122,200)	42,760	(5,934,662)
2,130,613	1,344,993	452,389	67,461,481	(69,663)	70,536,596
-	-	-	(5,000,000)	-	(5,000,000)
-	-	-	-	(6,809)	(6,809)
-	-	-	-	-	-
-	-	-	(1,521,000)	-	-
-	39,430,045	-	(39,430,045)	-	-
-	-	-	1,835	-	1,835
-	39,430,045	-	(45,949,210)	(6,809)	(5,004,974)
9,459,184	91,417,008	34,037,095	207,048,884	1,075,005	387,979,382

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව 2025 රු. '000	බැංකුව 2024 රු. '000	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ					
ආදායම් බදු පෙර ලාභය		120,826,954	106,904,268	121,933,750	108,221,467
ගැලපුම්:					
ශුද්ධ පොළී ආදායම	8	(206,936,421)	(167,552,460)	(211,843,204)	(171,727,800)
ලාභාංශ ආදායම	10/13	(512,051)	(441,824)	(577,304)	(452,739)
පරිපාලිත හා ආශ්‍රිත සමාගම් වලින් ලැබූ ලාභාංශ	13	(472,486)	(445,167)	-	-
ආශ්‍රිත සමාගම්වල (ලාභ)/පාඩු කොටස, බදු පසු	19	-	-	(156,155)	(86,425)
මෙහෙයුම් වත්කම්වල වෙනස්වීම්	56.1	(173,370,327)	(31,161,806)	(205,757,459)	(40,159,508)
මෙහෙයුම් වගකීම්වල වෙනස්වීම්	56.2	312,400,009	506,426,493	341,653,276	517,281,906
බදු පෙර ලාභයේ ඇතුළත් මුදල් නොවන වෙනත් අයිතමයන්	56.3	29,778,875	(12,906,185)	29,475,986	(13,154,644)
ආයෝජන කටයුතුවලින් ලද වෙනත් ශුද්ධ (ලාභ)/පාඩු		(3,322,960)	2,091,155	(3,525,132)	1,178,364
		78,391,593	402,914,474	71,203,758	401,100,621
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් තුළින් ප්‍රතිලාභ ගෙවීම		(13,197,040)	(12,902,730)	(13,215,267)	(13,005,447)
පොළී ලැබීම්		265,225,898	317,771,463	272,925,184	323,352,205
පොළී ගෙවීම්		(231,471,671)	(297,301,377)	(234,842,922)	(300,549,655)
ලාභාංශ ලැබීම්		15,357	67,751	17,155	67,751
මෙහෙයුම් කටයුතු වලින් ලැබූ/(යෙදවූ) ශුද්ධ මුදල්, බදු පෙර		98,964,137	410,549,581	96,087,908	410,965,475
ආදායම් බදු ගෙවීම්	45	(44,551,292)	(18,924,494)	(45,138,853)	(19,294,206)
මෙහෙයුම් කටයුතු වලින් ලැබූ/(යෙදවූ) ශුද්ධ මුදල්		54,412,845	391,625,087	50,949,055	391,671,269
ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහ					
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය ආයෝජනවල ශුද්ධ වැඩිවීම්		(335,099,875)	(595,497,409)	(335,025,197)	(595,638,730)
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම		18,101,520	(974,336)	18,859,371	(1,773,298)
පරිපාලිත සමාගම්වල ආයෝජන		(25,000)	-	-	-
දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම්		(3,252,065)	(5,010,986)	(4,187,206)	(5,325,538)
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම්		(1,283,266)	(508,908)	(1,318,779)	(544,655)
දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලැබීම්		3,765	17,937	92,183	32,537
ලාභාංශ ලැබීම්		969,180	819,240	560,149	384,988
පොළී ලැබීම්		245,534,441	204,156,350	246,654,104	206,247,787
ආයෝජන කටයුතු වලින් ලද/(භාවිතා කළ) ශුද්ධ මුදල්		(75,051,300)	(396,998,112)	(74,365,375)	(396,616,909)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව		සමූහය	
		2025	2024	2025	2024
		රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ					
වෙනත් ණයට ගැනීම්වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		(379,019)	(3,577,049)	2,963,010	(4,594,255)
ණයකර/ප්‍රාග්ධන බැඳුම්කර නිකුතුවෙන් ලද මුදල්		35,000,000	15,000,000	36,000,000	15,000,000
ණයකර නිදහස් කිරීම සඳහා ගෙවූ මුදල්		(5,000,000)	(9,149,654)	(5,000,000)	(9,149,654)
බැංකුවේ කොටස්හිමියාට ගෙවූ ලාභාංශ		(5,000,000)	-	(5,000,000)	-
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ ලාභාංශ		-	-	(6,809)	(6,809)
ණය ගැනීම් හා ණය සුරැකුම්පත් සඳහා පොළී ගෙවීම්		(12,795,328)	(15,960,233)	(13,300,038)	(16,219,410)
මූල්‍ය කටයුතු වලින් ලද/(භාවිතා කළ) ශුද්ධ මුදල්		11,825,653	(13,686,936)	15,656,163	(14,970,128)
වර්ෂය තුළදී මුදල් සහ මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		(8,812,802)	(19,059,961)	(7,760,157)	(19,915,768)
වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		114,381,113	133,441,074	115,229,228	135,144,996
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		105,568,311	114,381,113	107,469,071	115,229,228
මුදල් සහ මුදල් හා සමාන දෑ විශ්ලේෂණය					
මුදල් සහ මුදල් හා සමාන දෑ	22	131,083,172	115,422,407	133,811,977	116,281,852
බැංකු අයිරා	39	(25,514,861)	(1,041,294)	(26,342,906)	(1,052,624)
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		105,568,311	114,381,113	107,469,071	115,229,228

පිටු අංක 246 සිට 403 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 වාර්තාකරණ ඒකකය

1.1 ආයතනික තොරතුරු

ලංකා බැංකුව ("බැංකුව"), 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත යටතේ 1939 අගෝස්තු 1 දින ශ්‍රී ලංකාව තුළ ප්‍රතිෂ්ඨාපිත රාජ්‍ය බැංකුවකි. 1988 අංක 30 දරණ බැංකු පනත හා ඒ හා අනුෂාංගික සංශෝධනවලට යටත්වන ලෙස ස්ථාපිත කර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. ලංකා බැංකුවේ ලියාපදිංචි කාර්යාලය ශ්‍රී ලංකාවේ, කොළඹ 01, ලංකා බැංකු මාවතේ, ලංකා බැංකු චතුරශ්‍රයෙහි අංක 01 දරණ ස්ථානයේ පිහිටා ඇත. ලංකා බැංකුව නිකුත් කර ඇති ණයකර කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇත. 2025 දෙසැම්බර් 31 දිනට සේවකයින් 8,912 ක් ලංකා බැංකුවෙහි සේවයේ නියුක්තව සිටියහ (2024 දෙසැම්බර් 31 දිනට එම ප්‍රමාණය 8,214 කි).

1.2 සමෝධානික මූල්‍ය ප්‍රකාශන

2025 දෙසැම්බර් 31 දිනට හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ බැංකුවේ සමෝධානික මූල්‍ය ප්‍රකාශන බැංකුව, ඊට අයත් වන පරිපාලිතයන් (බැංකුව සහ එහි පරිපාලිතයන්ගේ එකතුව සමූහය සහ තනිව ගත් කල සමූහ ආයතන ලෙස හැඳින්වේ) සහ ආශ්‍රිත සමාගම්වල සමූහයට ඇති අයිතිය අයත් වන ආකාරයට සකස් කර ඉදිරිපත් කර ඇත. සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකොඩ්ස් සොලූයුෂන්ස් (පෞද්ගලික) සමාගම සහ සී/ස සීබෑන්ක් ඇසෙට් මැනෙජ්මන්ට් සමාගම යන ආශ්‍රිත සමාගම් හැර සමූහයේ අනෙකුත් සමාගම්වල ගිණුම් වර්ෂය දෙසැම්බර් 31 න් අවසන් වේ. සමූහයේ අවසාන මව් සමාගම බැංකුව වේ.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම්

1.3.1 බැංකුව

බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ පුද්ගලික සහ සංවර්ධන බැංකුකරණය, ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය, රාජ්‍ය ව්‍යවසාය මූල්‍යකරණය, වෙළඳ මූල්‍ය, ව්‍යාපෘති මූල්‍යකරණය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශ සඳහා මූල්‍යකරණය, ඉස්ලාමීය බැංකුකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, ජාත්‍යන්තර බැංකුකරණය, උපායමාර්ගික ආයෝජන ක්‍රියාකාරකම්, විදේශීය මෙහෙයුම් සහ අනෙකුත් අදාළ බැංකු සේවා කළමනාකරණය කිරීම ඇතුළු පුළුල් පරාසයක මූල්‍ය සේවා සැපයීමයි.

1.3.2 පරිපාලිතයන්

ලංකා බැංකුවේ පරිපාලිතයන්හි මූලික ක්‍රියාකාරකම් පහත දක්වා ඇත:

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
සී/ස ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම	ලංකා බැංකු ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ අයිතිය, පාලනය, නඩත්තු කිරීම හා උපයෝගීතාවය රඳවා ගැනීම.
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	කල්බදුකරණය සහ කුලී පිට ගනුදෙනු, ආයතනික හා ශාඛා ණය පහසුකම්, ආයතනික උපදේශක සේවා, ප්‍රාග්ධන වෙළඳපළ ක්‍රියාකාරකම්, ආන්තික වෙළඳාම සහ ක්ෂුද්‍ර මූල්‍යනය, කෘෂිකාර්මික ණය පහසුකම් සැපයීම, දේපළ ආශ්‍රිත සේවා, උකස් සේවා, ඉස්ලාමීය මූල්‍යකරණය සහ තැන්පතු බාරගැනීම.
ලංකා බැංකුව (යූ කේ) සමාගම	එක්සත් රාජධානියේ මූල්‍ය සේවා අධිකාරිය යටතේ ලියාපදිංචි කර ඇති, වාණිජ බැංකුවක් වන අතර, ශාඛා සහ ආයතනික බැංකුකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, නියෝජිත බැංකු සේවා සහ වෙළඳ මූල්‍ය සේවා සැපයීමේ නිරතව සිටී.
සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම	කොළඹ 03, බී ඕ සී මර්චන්ට් ටවර් හි සහ මහනුවර සීබෑන්ක් හවුස් හි කාර්යාල අවකාශ කුලියට දීම.
සී/ස බී ඕ සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම	සංචාරක සේවා සම්බන්ධ කටයුතුවල නිරතවීම.
සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම	හෝටල් සේවා සැපයීම.
සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම	සංචාරක නිවාස/හෝටල්/විවේකාගාර/ආගන්තුක නිවාස කළමනාකරණය, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.
සී/ස එම් බී එස් එල් ඉන්ෂුවරන්ස් සමාගම	ජීවිත සහ ජීවිත නොවන රක්ෂණ සේවා සැපයීම.
සී/ස බී ඕ සී අයි ටී සොලූයුෂන්ස් (පෞද්ගලික) සමාගම	ලංකා බැංකුව සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ සේවා සැපයීම.

2025 අගෝස්තු 10 වන දින සිට බලපැවැත්වෙන පරිදි පෙර පැවති සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම, සී/ස බී ඕ සී අයි ටී සොලූයුෂන්ස් (පෞද්ගලික) සමාගම ලෙස නම වෙනස් කරන ලදී.

1.3.3 ආශ්‍රිතයන්

ලංකා බැංකුවේ ආශ්‍රිත සමාගම්හි මූලික ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
සී/ස සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම	ඒකක භාර අරමුදල් සහ ආයතනික සහ පෞද්ගලික ආයෝජන කළමනාකරණය.
සී/ස ලංකා සික්‍යුරිටීස් (පෞද්ගලික) සමාගම	ලියාපදිංචි කොටස් තැරැව්කරුවෙකු වන අතර ස්කන්ධ සහ ණය සුරැකුම් ගනුදෙනු, ස්කන්ධ සහ ණය සුරැකුම් තැරැව්කාර සේවා සහ ණය සහ ස්කන්ධ සුරැකුම් භාර ගැනීම.
සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලූයුෂන්ස් (පෞද්ගලික) සමාගම	ගොඩනැගිලි සහ වත්කම් කුලියට දීම.
සී/ස සදර්න් ඩිවලප්මන්ට් ෆයිනෑන්ෂල් සමාගම	ක්‍රියාකාරිත්වයේ නොමැති අතර ඈවර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

සී/ස සදර්න් ඩිවලප්මන්ට් ෆයිනෑන්ෂල් සමාගම ක්‍රියාකාරිත්වයේ නොමැති අතර සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් සමාගම ඈවර කිරීමට තීරණය කර ඈවර කිරීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.

2 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

2.1 මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම හා ඉදිරිපත් කිරීම

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධන ප්‍රතිපාදන, 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලං.ගි.ප්‍ර/ශ්‍රී.ල.මූ.වා.ප්‍ර) අනුව, බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි හා ආශ්‍රිතයන්හි මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පහත ප්‍රකාශනයන්ගෙන් සමන්විත වේ.

- ලාභ හෝ අලාභ ප්‍රකාශනය
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.2 මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2025 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026 පෙබරවාරි 24 වන දින අනුමත කරන ලදි.

3 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

3.1 අනුකූලතා ප්‍රකාශය

සමූහයේ සමෝධානික මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී ලං. මූ. වා. ප්‍ර.) හා ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලං. ගි. ප්‍ර.) වලින් සමන්විත වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත. (පොදුවේ ශ්‍රී. ලං. මූ. වා. ප්‍ර. ලෙස මෙම මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇත.)

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතට, 1988 අංක 30 දරණ බැංකු පනතට සහ 2007 අංක 07 දරණ සමාගම් පනතට සහ එම පනත්වල සංශෝධනයන්ට සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියාමන මාර්ගෝපදේශයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සිදුකර ඇත. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විස්තර කෙරෙන පරිදි සමූහයේ මූල්‍ය ප්‍රකාශ 2025 දෙසැම්බර් 31 වැනි දිනට බලපැවැත්වෙන ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. වලට අනුකූල වන පරිදි පිළියෙළ කර ඇති අතර ඒ සමඟ සංසන්දනාත්මක වර්ෂය වන 2024 දෙසැම්බර් 31 වැනි දිනට සහ දිනෙන් අවසන් වන වර්ෂය සඳහා දත්ත ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2024 අංක 5 දරණ බලපත්‍රලාභී බැංකු විසින් වාර්ෂික සහ කාර්තුමය මූල්‍ය වාර්තා හා අනෙකුත් හෙළිදරව් කිරීම් ප්‍රසිද්ධ කිරීමට අදාල චක්‍ර ලේඛනය මඟින් නියම කර ඇති ආකෘතියට අනුගත වෙමින් මූල්‍ය වාර්තා හා අනෙකුත් හෙළිදරව් කිරීම් සඳහා ආකෘති සාවිතා කර ඇත.

3.2 මිනුම්කරණයේ පදනම

පහත සඳහන් ඒවා හැරුණු විට සමෝධානික මූල්‍ය ප්‍රකාශන සංගතතා පදනමට වෙතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශවලට බලපාන්නා වූ උද්ධමනකාරී සාධක වෙනුවෙන් කිසිදු ගැලපීමක් කර නැත.

- ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සාධාරණ අගය මත මැනීම (සටහන් අංක 26 සහ 41)
- ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම් (සටහන් අංක 27)
- වෙනත් විස්තීරණ අදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම් (සටහන් අංක 30)
- අයිතිකරු විසින් පදිංචි සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි සහ කල්බදු ඉඩම් මත ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කළ දිනට පැවති සාධාරණ අගයෙන් පසු කාලීන සමුච්චිත ක්ෂය හා පසු කාලීන සමුච්චිත හානිකරණ අලාභ වේ නම් ඒ සඳහා වෙන්කිරීම් අඩු කල අගයට වාර්තා කෙරේ (සටහන් අංක 34).
- නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් ආයුගණකවරයෙකු විසින් තක්සේරු කර වර්තමාන අගය මත හඳුනාගත් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වලින් සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය අඩු කර වාර්තා කරනු ලැබේ (සටහන් අංක 48).
- මුදල් ප්‍රවාහ හෙජ් සංචිතය, හෙජ් ගිණුම්කරණයට අනුව ගිණුම්ගත කර ඇත (සටහන් අංක 53).

3.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

බැංකුවේ හා සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇති අයිතම එම අයිතමයේ ස්වභාවය අනුව කාණ්ඩ ගතකර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාවය හා කල්පිරීමේ කාලය අනුව පෙළගස්වා ඉදිරිපත් කරනු ලැබේ. වාර්තාකරණ දිනයේ සිට මාස 12 ඇතුලත කල් පිරෙන (ජංගම) හා මාස 12 න් පසුව කල්පිරෙන (ජංගම නොවන) වත්කම් හා වගකීම් පිලිබඳ විස්තරයක් සටහන් අංක 60- "වත්කම් හා වගකීම් වල කල්පිරීම විශ්ලේෂණය" හි අන්තර්ගත වේ.

3.3.1 ව්‍යවහාර හා වාර්තාකරණ මුදල් ඒකක

මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් අයිතමයන් මිනුම්කරණය හා වාර්තාකරණය කරනු ලබන්නේ බැංකුව ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය තුළ පවතින මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

3.3.2 උපචිත පදනම මත ගිණුම්කරණය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හැරුනු කොට අනෙකුත් මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කර ඉදිරිපත් කර ඇත.

3.3.3 හිලව් කිරීම

සාමාන්‍යයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මූල්‍ය වත්කම් හා වගකීම් වෙන් වෙන් වශයෙන් වාර්තා කරන අතර මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කිරීම, ශුද්ධ වටිනාකමට වාර්තා කිරීම සිදුවන්නේ නීතිමය වශයෙන් බලය ලබාදී ඇති විටක සහ පහත සඳහන් අවස්ථාවල දී සම්බන්ධිත පාර්ශවයන් විසින් එකවිටම වත්කම් උපලබ්ධිය මඟින් වගකීම් පියවා ගැනීමේ අදහස් ඇති විට පමණක් වේ.

- සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු
- ණය පැහැර හැර ඇති අවස්ථාවක දී
- බැංකුවට/ සමූහයට සහ එහි පාර්ශ්වයන්ට වගකීම් පියවීමට නොහැකි අවස්ථාවන්හි හෝ බුන්වත් අවස්ථා වල දී

ගිණුම්කරණ ප්‍රමිතයක් මඟින් ඉඩ සලසා ඇති අවස්ථාවල දී හෝ අර්ථ නිරූපනය කර ඇති විටක සහ විශේෂයෙන් සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තින්හි සඳහන් කර ඇති විටක පමණක් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සඳහන් ආදායම් සහ වියදම් හිලව් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

3.3.4 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට අවශ්‍ය අවස්ථා හිදී පෙර වර්ෂයේ මූල්‍ය තොරතුරු විස්තරාත්මකව දක්වා ඇත. ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට සමගාමීව පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන අතර ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරිපත් කිරීම් වලට අනුකූල වීම සඳහා අවශ්‍ය අවස්ථාවන් වලදී පෙර වර්ෂයේ මූල්‍ය තොරතුරු නැවත වර්ගීකරණය කරනු ලැබේ.

3.3.5 ප්‍රමාණාත්මකභාවය සහ ඒකරාශි කිරීම

ලං. ගි. ප්‍ර. 1 - "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" අනුකූලව, සමාන අයිතමයන්හි සෑම ප්‍රමාණාත්මක වර්ගයක්ම මූල්‍ය ප්‍රකාශවල වෙන වෙනම ඉදිරිපත් කෙරේ. විවිධ ස්වභාවයේ අසමාන අයිතමයන් හෝ කාර්යයන් ද ප්‍රමාණාත්මකවේ නම් ඒවා වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

3.3.6 වැටයීම

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ දී වෙනත් අයුරකින් සඳහන් කර නොමැති විටෙක, ලං.ගි.ප්‍ර. 1 - "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" ට අනුව සියලුම අගයන් ආසන්නම රුපියල් දහස දක්වා වන පරිදි වටයා ඇත.

3.3.7 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ලං. ගි. ප්‍ර. 7 - "මුදල් ප්‍රවාහ ප්‍රකාශනය" ප්‍රමිතියට අනුව ලාභයට ගැලපීම් කර මෙහෙයුම් මුදල් ප්‍රවාහ ගණනය කිරීමේ වක්‍ර ක්‍රමයට සිදු කර ඇත. මුදල් හා මුදල් සමාන දෑ යටතට අතැති මුදල්, ද්‍රවශීලතාවයෙන් ඉහළ දින 7 කට අඩු කාලයකදී පරිණත ආයෝජන සහ බැංකු අයිරා අයත්වේ.

3.3.8 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පනයන්ගේ භාවිතය

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී ඒ සඳහා භාවිතා කළ යුතු සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති, තීරණය කිරීම හා වාර්තා වන වත්කම් සහ වගකීම් අගයන් මෙන්ම ආදායම් සහ වියදම් නිශ්චය කිරීමේ දී ඒ සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් නිශ්චය කිරීමට කළමනාකාරිත්වයට සිදුවේ. සැබෑ ප්‍රතිඵල ඇස්තමේන්තු සමඟ වෙනස් විය හැක. විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් අතීත අත්දැකීම් සහ විවිධ අවස්ථාවන් මත සෑහීමකට පත්විය හැකි සාධක මත පදනම් වන අතර මේවා කාලීන පදනමක් මත සමාලෝචනයට භාජනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සමාලෝචනයේ දී ඒවා පිළිබඳව සංශෝධනයක් අවශ්‍ය වන්නේ නම් සමාලෝචනයට භාජනය කෙරෙන වර්ෂය තුළ දී සහ අනාගත කාලපරිච්ඡේදයන් සඳහා එම සංශෝධනයන් අදාළ වන පරිදි ගිණුම්ගත කෙරේ. සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමේ දී සමෝධානික මූල්‍ය ප්‍රකාශනවල වඩා වැදගත් බලපෑමක් ඇති කරන්නා වූ අගයන් මත කළමනාකරණය විසින් පහත සඳහන් විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් භාවිතා කර ඇත. තවද, සමූහයේ වත්කම් මැනීමේදී අදාළ පරිදි ඇස්තමේන්තුවල වෙනස්කම් සිදු කරන ලදී. උපකල්පන, ඇස්තමේන්තු තීරණයන් සහිත ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

3.3.8.1 අඛණ්ඩ පැවැත්ම

තම මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි බවට සෑහීමකට පත්විය හැකි සම්පත්, සමූහය සතු බවට කළමනාකාරිත්වය තක්සේරුවක් කර ඇත. තවද, සමූහයෙහි අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැළකියයුතු අවිශ්වාසයක් හෝ අවිනිශ්චිතතාවයක් කළමනාකාරිත්වය හඳුනාගෙන නොමැත. එම නිසා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සමූහය අඛණ්ඩව පවතීය යන සංකල්පය භාවිතා කර ඇති අතර අඛණ්ඩව පවතීය යන පදනම සාධාරණ යැයි කළමනාකාරිත්වය සෑහීමකට පත්වී ඇත.

3.3.8.2 බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම්

සියළුම හඳුනාගත හැකි සහ මැනිය හැකි වගකීම් හි වටිනාකම් ගිණුම් තබනු ලැබේ. අසම්භාව්‍ය වගකීම් යනු අනාගත අවිනිශ්චිත සිදුවීම්වල තහවුරු කිරීමක් මත ඇතිවිය හැකි බැඳියාවක් හෝ වර්තමානයේ බැඳීමක් ඇතත් ආර්ථික ප්‍රතිලාභයන් ගලා යාමේ සම්භාවිතාවක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මැනිය නොහැකි වගකීම්ය. අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනා නොගන්නා අතර, ඒවායේ සිදුවිය හැකි බව දුරස්ථ නොවන්නේ නම් අනාවරණ කරනු ලැබේ.

3.3.8.3 සාධාරණ අගය මත මූල්‍ය උපකරණ

අගය කරනු ලබන දිනට වෙළඳපළ ගනුදෙනුකරුවන් අතර සාමාන්‍ය ව්‍යාපාර කටයුත්තක් ලෙස වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් පියවීමට ගෙවන මුදල සාධාරණ අගය වේ. සාධාරණ අගයට වර්ගකරන වත්කම් වල හෝ වගකීම් වල සාධාරණ අගය ප්‍රශස්ත ක්‍රියාකාරී වෙළඳපළක ඇති ඉල්ලුම් මිල හෝ ඉදිරිපත් කරන මිල ලෙස තක්සේරු කරනු ලැබේ. කිසියම් වත්කමකට හෝ වගකීමකට අදාලව ක්‍රියාකාරී වෙළඳපළක් නොමැති අවස්ථාවල එම වත්කම් වල හෝ වගකීම් වල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා ගණිතමය තක්සේරු ක්‍රම, ආසන්නව සිදුවූ සාධාරණ ගනුදෙනුවල තීරණය වූ මිල, වට්ටම් කල මුදල් ප්‍රවාහ විශ්ලේෂණය, මිල කිරීම් ආදී තක්සේරු ක්‍රම යොදා ගනී. සාධාරණ අගය ගණනය කිරීමේදී ණය අවදානමද අදාල පරිදි ගලපනු ලැබේ. මෙම අගය කිරීමේ ක්‍රමවලදී අවම වශයෙන් ආයතනයට විශේෂ වූ යෙදවුම් පදනම් වන අතර උපරිම වශයෙන් හඳුනාගත හැකි වෙළඳපළ යෙදවුම් යොදාගනී. මූල්‍ය උපකරණයක් මුල් වරට හඳුනා ගැනීමේදී සාධාරණ අගය සඳහා ප්‍රශස්ත පදනම ගනුදෙනු කරන ලද මිලයි. එසේ නොමැතිනම් එම මූල්‍ය උපකරණ වල හඳුනාගත් වෙළඳපළක වර්තමාන ගනුදෙනු මිල හෝ හඳුනාගත් වෙළඳපළක දත්ත පදනම්ව සිදු කරන අගය කිරීම් යොදාගනු ලැබේ. සමූහය විසින් සාධාරණ අගය සහ ගනුදෙනු මිල අතර වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශනයට හඳුනා ගනී. මූල්‍ය උපකරණ අගය කිරීම සවිස්තරාත්මකව සටහන් 63 හි දක්වා ඇත.

3.3.8.4 ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණ අලාභ

ණය හා අත්තිකාරම් සඳහා හානිකරණ අලාභ තීරණය කිරීමේදී ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" යටතේ අනාගත මුදල් ප්‍රවාහ ප්‍රමාණ හා ඒවායේ කාලය තීරණය කිරීම සඳහා කළමනාකරණයට නිගමන වලට එළඹීමට සිදුවේ.

ඒ අනුව සෑම වාර්තා කරන දිනකට අදාලව සමූහය විසින් කේවල වශයෙන් ප්‍රමාණාත්මක ණය සහ අත්තිකාරම් ඇගයීමක් සිදු කරන අතර හානිකරණ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයට වාර්තා කෙරේ.

විශේෂයෙන්ම හානිකරණ අලාභය ගණනයේදී අනාගත මුදල් ප්‍රවාහ ප්‍රමාණ හා ඒවායේ කාලය තීරණය කිරීම සඳහා කළමනාකරණ විනිශ්චයන් අවශ්‍යවේ.

මෙම මුදල් ප්‍රවාහ නිර්ණය කිරීමේදී සමූහය විසින් ණයකරුගේ මූල්‍ය තත්ත්වය, උකස්කරයන් විකුණා ලැබිය හැකි මිල ආදී කරුණු සලකා බලයි. සාධක බොහෝමයක් සඳහා සිදු කරනු ලබන උපකල්පන මත මෙම තක්සේරුව සිදු කරනු ලබන නිසා සත්‍ය ප්‍රතිඵල වෙනස් වීම මත හානිකරණ ප්‍රතිපාදන වලටද අනාගත වෙනස්කම් ඇති විය හැකිය. කේවල වශයෙන් ප්‍රමාණාත්මක නොවන ණය සහ කේවල වශයෙන් ප්‍රමාණාත්මක වුවත් හානිකරණය නොවූ ණය සහ අත්තිකාරම් සමාන ලක්ෂණ සහිත කාණ්ඩ වලට බෙදා සමූහ හානිකරණ වෙන් කිරීම් සිදු කරනු ලැබේ.

සමූහ හානිකරණ ඇගයීමේදී ණය කළඹයන්හි ණයවල ගුණාත්වය, හිඟ මට්ටම, ණය භාවිතය ආදිය සහ සංකේන්ද්‍රණ අවදානම, විරැකියාව, උද්ධමනය, දළ දේශීය නිෂ්පාදන වර්ධනය, විනිමය අනුපාත ආදී ආර්ථික දත්තයන්ද, විවිධ පුද්ගල සමූහයන්ගේ කාර්යය සාධනයන්ද සැලකිල්ලට ගෙන ඇත.

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" වලට අනුව අපේක්ෂිත ණය අලාභ ක්‍රමය පදනම්ව ණය හානි අවශ්‍යතා හඳුන්වා දී ඇති අතර එමඟින් මූල්‍ය උපකරණයන්හි ණය ගුණාත්මකතාවයේ වර්ධනය හෝ අඩුවීම නිරූපනය වේ. සමූහය විසින් කේවල වශයෙන් හෝ සමූහ වශයෙන් අපේක්ෂිත ණය අලාභය ගණනය කරනු ලැබේ. මූලික හඳුනා ගැනීමේ සිට ණය වල ගුණත්වය පහළ යාම පදනම්ව ණය හානිකරණය හෝ වෙන් කිරීම් ලෙස අපේක්ෂිත අලාභ ප්‍රමාණය හඳුනා ගන්නා අතර එය පහත පරිදි ගණනය කරනු ලැබේ.

- ඉදිරි මාස 12 තුළ අපේක්ෂිත ණය අලාභ (අදියර 1); සැලකිය යුතු ලෙස ණය අවදානම් අඩු තත්ත්වයක්.

- ආයු කාලය පුරා අපේක්ෂිත ණය අලාභ (අදියර 2 සහ අදියර 3); තනි තනි වශයෙන් හෝ කාණ්ඩ වශයෙන් ණය අවදානම ඉහළ ගොස් ඇති විට මෙම පදනම යොදා ගැනේ.

සමූහය විසින් අපේක්ෂිත ණය අලාභ ක්‍රමයට අදාලව පහත සඳහන් අමතර නිගමනයන් හා තක්සේරු සිදු කර ඇත.

- මූල්‍ය වත්කම් වල ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් ඇත්නම් ඒවා ආයුකාලය පුරා අපේක්ෂිත ණය අලාභ පදනමට අඟය කල යුතුය.

- අපේක්ෂිත ණය අලාභ ආකෘතීන් ගොඩ නැගීමේදී විවිධ සමීකරණ සහ යෙදවුම් වල තෝරා ගැනීම් සිදු කල යුතුය.

- දළ දේශීය නිෂ්පාදන වර්ධනය, උද්ධමනය, පොළී අනුපාත, විදේශීය විනිමය අනුපාත, සේවා වියුක්තිය, ව්‍යාපාර ක්ෂේත්‍රයේ තත්ත්වය, නියාමන බලපෑම, රජයේ ප්‍රතිපත්ති සහ දේශගුණික බලපෑම වැනි සාර්ව ආර්ථික තත්ත්වයන් ණය පැහැර හැරීමේ සම්භාවිතාව, ණය පැහැර හරින අවස්ථාවේ නිරාවරණ අඟය සහ ණය පැහැර හැරීමේ අලාභය සමඟ පවතින සම්බන්ධතාවය නිර්ණය කිරීම.

- අපේක්ෂිත ණය අලාභය ගණනය කිරීමේ ආකෘතියට අනාගත සාර්ව ආර්ථික යෙදවුම් තෝරා ගැනීම හා බර තැබීම.

සාමූහික ප්‍රතිපාදන ගණනය කිරීම සඳහා පාදක වූ ආර්ථික අවස්ථා සහ ඉදිරි දැක්ම සාර්ව ආර්ථික උපකල්පන සටහන 4.4.11 හි දක්වා ඇත.

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" අනුව සමාන ලක්ෂණ සහිත ණය සඳහා සමූහ හානිකරණ වෙන්කිරීම සංඛ්‍යාත්මක ආකෘතියක් හෝ අතීත පාඩු අනුපාත අත්දැකීම් පදනම් සමීකරණ ප්‍රවේශය, හිඟ හිටි දින පිළිබඳ තොරතුරු පදනම්ව අලාභ ප්‍රමාණය තීරණය කිරීම සඳහා සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රමවේදයන්ද යොදා ගනිමින් ගණනය කරයි. අලාභ ඇස්තමේන්තුව තහවුරු කර ගැනීම සඳහා වාර්තා කරන දිනයට ගැලපෙන ආකාරයට ආර්ථික තත්ත්වයන් සහ ණය කළඹේ සුවිශේෂිතා ගැලපීම සඳහා අතීත තොරතුරු ගලපනු ලැබේ. අලාභ ප්‍රතිශත සත්‍ය අලාභ සමඟ නිරතුරුව සසඳා බලනු ලැබේ.

සත්‍ය අලාභ අත්දැකීම් පදනම්ව ආකෘති කාලානුරූප ඇගයීම් සිදු කිරීම හා ගැලපීම් සිදු කිරීම සමූහයේ ප්‍රතිපත්තියයි. ආකෘතිවල යොදාගන්නා උපකල්පන සහ හානිකරණ පරිමිතීන්වල නිවැරදිතාවය මත හානිකරණ වෙන්කිරීම් වල නිවැරදිතාවය තීරණය වේ. ණය හා අත්තිකාරම් මත හානිකරණ අලාභ පිළිබඳ විස්තරාත්මක තොරතුරු සටහන් 14 සහ 28 හි දක්වා ඇත.

3.3.8.5 පරිපාලිත සමාගම්වල ආයෝජනයන්හි හානිකරණය සහ වෙනත් මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් සඳහා හානිකරණය

ආයෝජනයක් හෝ මූල්‍ය වත්කමක් හානිකරණයට ලක්වේදැයි සලකා බැලීම සඳහා බැංකුව සහ සමූහය විසින් ලං.හි.ප්‍ර. 36 - "වත්කම් සඳහා හානිකරණය" හා ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" ප්‍රමිතියන්හි දී ඇති උපදෙස් අනුගමනය කරයි. වත්කමක පොත් අඟයට වඩා අයකර ගත හැකි වටිනාකම අඩු වේ නම් හානිකරණයන් ඇති වන අතර එම හානිකරණය තීරණය කිරීම හා මැනීම සඳහා අදාළ බාහිර හා අභ්‍යන්තර පරිසරය මඟින් ලබා දෙන සංඥා හඳුනා ගත යුතු වේ. එම සංඥා හඳුනා ගැනීමට සහ හානිකරණ වටිනාකම තීරණය කිරීම සඳහා ආසන්න ව්‍යාපාරික පරිසරය විශ්ලේෂණය කිරීම සහ අදාළ වන ව්‍යාපාර ඛණ්ඩයේ මූල්‍ය පරිසරයේ ස්වභාවය, කර්මාන්තය, තාක්ෂණය සහ මෙහෙයුම් පරිසරය වෙනස් වීම යන සාධක අනාගත මුදල් ප්‍රවාහ සමඟ විශ්ලේෂණය කළ යුතු වේ. මෙම ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු ඉඟුම්කරණ විනිශ්චයන් භාවිතා වේ.

3.3.8.6 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම්

ආයුගණනක තක්සේරු යොදා ගනිමින් නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුම් සහ අනෙකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් හි පිරිවැය නිර්ණය කරනු ලබයි. ආයුගණනක තක්සේරුව සඳහා වට්ටම් අනුපාත, සැලසුම් වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය, අනාගත වැටුප් වැඩිවීම්, මරණ අනුපාතය සහ අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම යන උපකල්පන භාවිතා කරනු ලැබේ. මෙම සැලසුම් දිගු කාලීන ස්වභාවයක් ගන්නා බැවින් මෙම ඇස්තමේන්තු අවිනිශ්චිත ස්වභාවයක් ගනු ඇත.

වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වලට අදාල කාලපරිච්ඡේදයන්ට සමාන ශ්‍රී ලංකා රාජ්‍ය රුපියල් බැඳුම්කර වල පොළී අනුපාතය සලකා බලයි. උපත් හා මරණ අනුපාතය සඳහා ප්‍රසිද්ධ කර ඇති උපත් හා මරණ අනුපාත වගු යොදා ගෙන ඇත. වැටුප් හා විශ්‍රාම වැටුප් වැඩිවීම, අනාගත උද්ධමන අනුපාතය සහ සමූහයේ

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

අපේක්ෂිත අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතය මත පදනම් වී ඇත. සෑම උපකල්පනයක්ම වාර්තාකරණ දිනට සමාලෝචනය කරනු ලබන අතර වර්ෂය තුළදී යොදාගත් උපකල්පන සටහන් 48 හි දක්වා ඇත.

3.3.8.7 ඉඩම් සහ ගොඩනැගිලි වල සාධාරණ අගය

සමූහයේ නිදහස් අයිතිය සහිත ඉඩම් සහ ගොඩනැගිලි සහ කල්බදු ඉඩම් මත ඇති ගොඩනැගිලි වල සාධාරණ අගයෙන් සමුච්චිත ක්ෂය කිරීම් අඩුකර සටහන් කරනු ලැබේ. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 13 - "සාධාරණ අගය මිනුම්කරණය" අනුව, දේපළ වල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා සමූහය විශේෂඥ ස්වාධීන තක්සේරුකරුවන් යොදවනු ලැබේ. නිදහස් අයිතිය සහිත ඉඩම් හා ගොඩනැගිලි සහ කල්බදු අයිතිය සහිත ඉඩම් මත ගොඩනැගිලි තක්සේරුවට අදාළ විස්තර සටහන් 34 හි දක්වා ඇත.

3.3.8.8 දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායී ජීවිත කාලය

දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් වල සුන්බුන් අගය, ඵලදායී ජීවිත කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදයන් සෑම වාර්තා කරන දිනයකදීම සමූහය විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම තක්සේරු කිරීම් සඳහා කළමනාකරණය විසින් විවිධ ප්‍රතිශතයන්, අගයන් සහ ක්‍රමවේදයන් යොදාගනු ලබන බැවින් එම විනිශ්චයන් යම් අවිනිශ්චිතතාවයකට භාජනය විය හැක. එක් එක් වත්කම් බණ්ඩය සඳහා යොදා ගත් ක්ෂය කිරීමේ ක්‍රමවේදය සහ ක්ෂය අනුපාතයන් සටහන් 34 හි දක්වා ඇත.

3.3.8.9 ආයෝජන දේපළ වර්ග කිරීම

දේපළක් ආයෝජන දේපළක් ලෙස සුදුසුකම් ලැබීම නිර්ණය කිරීම කළමනාකරණ විනිශ්චයන් මත සිදුවේ. බදු කුලී ලබා ගැනීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීම හෝ ඒ අරමුණු දෙකම සඳහා පවත්වා ගනු ලබන දේපළ තුළින්, සමූහය පවත්වාගෙන යනු ලබන අනෙකුත් වත්කම් වලින් ස්වාධීනව විශාල මුදල් ප්‍රවාහයක් ජනනය කරනු ලබයි නම් එම දේපළ ආයෝජන දේපළක් ලෙස නිර්ණය කෙරේ. අනෙක් අතට මෙහෙයුම් කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන හෝ සේවා සැපයීමේ ක්‍රියාවලියේ යොදාගන්නා හෝ පරිපාලන අරමුණින් පවත්වාගෙන යනු ලබන ස්වාධීනව මුදල් ප්‍රවාහ ජනනය නොකරන වත්කම්, දේපළ පිරියත සහ උපකරණ ලෙස නිර්ණය කරනු ලැබේ.

3.3.8.10 ආයෝජිතයන් පාලනය කිරීම තීරණය කිරීම

පරිපාලිතයන් යනු බැංකුව විසින් පාලනය කරන ආයතන වේ. බැංකුව ආයෝජිතයා තුළ ආයෝජනය කිරීම නිසා විචලනය වන ප්‍රතිලාභ ලැබීමට අයිතියක් හෝ එසේ ලැබීමට සිදුවේ නම් සහ ආයෝජිතයාගේ කටයුතු පාලනය කිරීම තුළින් ලැබෙන ප්‍රතිලාභ වලට බලපෑමක් සිදු කිරීමට බැංකුවට හැකියාවක් ඇත්නම් එවැනි ආයෝජන මත බැංකුවට පාලනය කිරීමේ හැකියාවක් ඇතැයි නිගමනය කළ හැක. බැංකුව විසින් එහි ආයෝජිතයන් පාලනය කිරීම තීරණය කිරීම පිළිබඳව කළමනාකරණ විනිශ්චයන්ට එළඹීමට සිදු වේ.

3.3.8.11 බදුකරණය

සමූහය විසින් ආදායම් බදු සහ එකතුකළ අගය මත බද්ද (VAT) ඇතුළුව අනෙකුත් අදාල බදු ගෙවිය යුතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන කාලය තුළ අදාළ වන්නා වූ බදු නීතිරීතිවල හා එම නීති අර්ථ නිරූපනය කරන ආකාරයෙන් ඇති අවිනිශ්චිතතාවයන් නිසා ආදායම් බදු වගකීම, විලම්බිත බදු වගකීමට හා වෙනත් බදු වගකීම් වලට අදාළ වෙන් කිරීම් සඳහා ගිණුම්කරණ විනිශ්චයන් යොදා ගත යුතු වේ. අදාළ බදු අනුපාතයන් සහ බදුකරණයට අදාළ වෙනත් තොරතුරු සටහන් 4.8, 18 සහ 37 යටතේ දක්වා ඇත.

පැවරුම් මිල රෙගුලාසීන්ට සමූහය යටත් වන අතර මෙවැනි ගනුදෙනුවල බලපෑම තීරණය කිරීම සඳහා කළමනාකරණ විනිශ්චය භාවිතා කිරීම අවශ්‍ය වේ. ආශ්‍රිත ගනුදෙනු, සාධාරණ මිල තීරණය කිරීම සහ සුදුසු මිල ගණන් තෝරා ගැනීම ඇතුළුව පැවරුම් මිල රෙගුලාසිවලට අනුකූල වීම සඳහා එහි බලපෑම තීරණය කිරීමට අවශ්‍ය අවස්ථාවල දී මෙම කළමනාකරණ විනිශ්චයන් භාවිතා කරන ලදී. ප්‍රවර්තන බදු වියදම මෙම විනිශ්චයන් පදනම්ව ගණනය කර ඇත. ඇස්තමේන්තු කරන ලද ආදායම් බදු වියදම හා සත්‍ය බදු ගෙවීම් අතර වෙනසට හේතු වන්නේ කළමනාකාරිත්වයේ බදු සම්බන්ධ අර්ථ දැක්වීමේ වෙනස්කම් හා බදු රෙගුලාසි භාවිතා කිරීමෙන් ඇති වූ වෙනසයි.

4 ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති

බැංකුව සහ සමූහය විසින් සිය මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී යොදන ලද ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත ඇතුළත් කර ඇති අතර, වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් හැර, සමූහයේ සහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව අදාළ කර ඇත.

4.1 ඒකාබද්ධ කිරීමේ පදනම

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 10 - "සමෝධානික මූල්‍ය ප්‍රකාශ" සහ ලං.ගි.ප්‍ර. 27 - "සමෝධානික හා කේවල මූල්‍ය ප්‍රකාශ" අනුව බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශ ඒකාබද්ධ කර සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. ලං.ගි.ප්‍ර. 28 - "ආශ්‍රිතයන් සහ ඒකාබද්ධ ව්‍යාපාරයන්හි ආයෝජන" අනුව ආශ්‍රිත සමාගම් වල ලාභ හා ශුද්ධ වත්කම් අයත් ප්‍රමාණය හා පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබයි.

දේශීය බැංකු අංශයේ, අක්වෙරළ බැංකු අංශයේ සහ අන්තර්ජාතික ගනුදෙනු අංශයේ ඒකාබද්ධ කරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් 31 හා 32 යටතේ දක්වා ඇත.

4.1.1 ව්‍යාපාර සංයෝජනය

සමූහය, ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 3 - "ව්‍යාපාර සංයෝජන" හි නිර්වචනයට අනුකූලව දේපළ අත්පත් කරගැනීම සහ වගකීම් භාර ගැනීම සිදු වී ඇත්නම් ගනුදෙනුව හෝ වෙනත් සිද්ධියක් ව්‍යාපාර සංයෝජනයක්ද යන වග නිර්ණය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේ ක්‍රමය මඟින් ව්‍යාපාර සංයෝජනය ගණනය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේ දිනයේ දී පාලනයට යටත් නොවන හිමිකම ගණනය කරනු ලබන්නේ සාධාරණ අගය මත හෝ ආයෝජකයාගේ හඳුනාගත් ශුද්ධ වත්කම්වල පාලනයට යටත් නොවන හිමිකමට සමානුපාත කොටසෙනි.

අත්පත් කර ගැනීම සම්බන්ධිත වියදම් යනු ව්‍යාපාර සංයෝජනයේ දී අත්පත් කරනු ලබන්නා විසින් දරන ලද වියදම් වේ. එම වියදම්වල අඩංගු වන්නේ තැරැව්කාර ගාස්තු, උපදේශක, නීති, ගිණුම්කරණ, ඇස්තමේන්තු සහ අනෙකුත් වෘත්තිමය උපදේශන ගාස්තු,

සාමාන්‍ය පරිපාලන වියදම්, අභ්‍යන්තර අත්පත් කරගැනීමේ දෙපාර්තමේන්තු පවත්වා ගැනීමේ වියදම් සහ ණය සහ ස්කන්ධ සුරැකුම්පත් ලියාපදිංචි කිරීමේ සහ නිකුත් කිරීමේ වියදම්ය. ණය සහ ස්කන්ධ සුරැකුම්පත් නිකුත් කිරීමේ කටයුතු හා සම්බන්ධ නොවන අනෙකුත් අත්පත් කර ගැනීම් සහ සම්බන්ධිත වියදම් එම සේවාවට අදාළව දැරූ විට එම කාලච්ඡේදයේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

අත්පත් කර ගැනීමේ දිනයේ දී පාලනයට යටත් නොවන හිමිකම් ගණනය කිරීම සඳහා පදනම වශයෙන් සාධාරණ අගයට ගනුදෙනුවෙන් ගනුදෙනුවට හෝ ශුද්ධ වත්කම් වලින් සමානුපාතික කොටස සමූහය විසින් තෝරා ගනු ලැබේ.

සමූහය විසින් ව්‍යාපාර සංයෝජනයේ දී දරන ලද ණය නිකුත් කිරීමේ දී හා ස්කන්ධ සුරැකුම්පත් සඳහා ගන්නා ලද වියදම් හැරුණු විට අනෙකුත් වියදම් දැරූ අවස්ථාවේදීම වියදමක් ලෙස හඳුනා ගැනේ.

4.1.2 පාලනය අහිමි වීම

පාලනය අහිමි වීමේ දී සමූහය විසින් පරිපාලිතයන්ගේ හඳුනාගත් වත්කම් සහ වගකීම්, පාලනයට යටත් නොවන හිමිකම් සහ ස්කන්ධය අදාලව වෙනත් අගයන්ද ඇත්නම් සියළු අගයන් පොත් වලින් ඉවත් කරනු ලැබේ. තවද වෙනත් විස්තීර්ණ ආදායම යටතේ පෙර හඳුනාගත් යම් අගයක් වේ නම් ඒවා සුදුසු පරිදි ලාභ හෝ අලාභ ප්‍රකාශයට හෝ රඳවාගත් ඉපැයුම් වලට නැවත හඳුනාගනු ලැබේ. පාලනය අහිමි වීමේ දී ඇතිවන ඌනතාවය හෝ අතිරික්තය ලාභ හෝ අලාභ ප්‍රකාශනයට ගලපනු ලැබේ. සමූහය විසින් අදාළ පරිපාලිතයේ යම් ඇල්මක් රඳවා තබා ගනී නම් එවැනි රඳවාගත් හිමිකම පාලනය අහිමි වන දිනට සාධාරණ අගයට මනිනු ලැබේ. ඉන් පසු රඳවාගත් ආයෝජනය ස්කන්ධ ආයෝජන පදනමට හෝ සමූහයේ මූල්‍ය උපකරණ ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති අනුව ගිණුම් තැබේ.

4.2 විදේශ මුදල් පරිවර්තනය

4.2.1 විදේශ මුදල් ගනුදෙනු හා ශේෂ

විදේශ මුදල් ගනුදෙනු ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන්නේ ගනුදෙනුව සිදු වන දිනට පවතින විනිමය අනුපාත මඟින් පරිවර්තනය කිරීමෙනි. විදේශ වලංගු මුදල් වලින් නිරූපණය කෙරෙන මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කරන දිනට බලපැවැත්වෙන විනිමය අනුපාතිකයන්ට අනුව ව්‍යවහාර මුදල් වලට නැවත පරිවර්තනය කරනු ලබන අතර වෙළඳ නොවන කටයුතු තුළින් ඇතිවන්නා වූ වෙනස්කම් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සටහන් 13 - "වෙනත් මෙහෙයුම් ආදායම්" යටතේ සටහන් කරනු ලැබේ. විදේශ මුදල් වලින් වෙතිහාසික පිරිවැයට නිරූපණය කරනු ලබන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් එම ගනුදෙනුව මුලින්ම සිදු වන දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින් පරිවර්තනය කරනු ලැබේ. විදේශ මුදල් වලින් නිරූපණය කරනු ලබන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම්වල වටිනාකම සාධාරණ අගයට වාර්තා කරන විට, ව්‍යවහාර මුදල් ඒකකය බවට පරිවර්තනය කරනු ලබන්නේ සාධාරණ අගය තීරණය කරන දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින්ය. නැවත පරිවර්තනයේ දී ඇතිවන විදේශ විනිමය වෙනස්කම් ඇතුළු ලාභ හෝ පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සටහන් කරයි. ඉදිරි විනිමය ගිවිසුම් තක්සේරු කරනු ලබන්නේ වාර්තා කරන දිනට බලපැවැත්වෙන ඉදිරි වෙළඳපල අනුපාතිකයන්ට අනුව වන අතර ඉන් ඇතිවන උපලබ්ධි නොවූ ශුද්ධ ලාභ සහ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සටහන් කරනු ලැබේ.

4.2.2 විදේශීය මෙහෙයුම්

ශ්‍රී ලංකා රුපියල් නොවන ව්‍යවහාර මුදල් භාවිතා කරන්නා වූ විදේශීය මෙහෙයුම්වල මෙහෙයුම් ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වයන් පහත දැක්වෙන පරිදි ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ.

විදේශීය මෙහෙයුම්වල පවතින වත්කම් සහ වගකීම් වාර්තාකරණ දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ.

විදේශ මෙහෙයුම්වල ආදායම් සහ වියදම් ගනුදෙනු සිදුවූ දිනවල පැවති විනිමය අනුපාතවලට පරිවර්තනය කරනු ලැබේ. විදේශ මෙහෙයුම් පරිවර්තනයේ දී ඇතිවන විදේශ විනිමය අසමානතා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සටහන් කරයි. යම් විදේශ මෙහෙයුමක් බැහැර කිරීමේ දී අදාළ මෙහෙයුමට අදාළව විදේශ විනිමය පරිවර්තන සංචිතයේ ඇති ප්‍රමාණය විකිණීමෙන් ලද ලාභයක් හෝ අලාභයක් ලෙස ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම් හෝ වියදම් යටතේ දැක්වේ.

4.2.3 හෙජ් ගිණුම්කරණය

විදේශ මුදල් ගනුදෙනුවලින් විදේශ විනිමය අවදානම අවම කිරීම සඳහා බැංකුව වෙනත් පාර්ශ්ව සමඟ හෙජින් විධිවිධානවලට එළඹේ. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" ට අනුව, ආයතනයක් අයිතමයක් සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් හෙජ් අයිතමයක් ලෙස නම් කළ හැක. හෙජින් සබඳතාවයක් හෙජින් ගිණුම්කරණය සඳහා සුදුසුකම් ලබන්නේ හෙජින් සම්බන්ධතාව සුදුසුකම් ලත් හෙජින් උපකරණ සහ සුදුසුකම් ලත් හෙජින් අයිතම වලින් පමණක් සමන්විත වන්නේ නම් පමණි.

හෙජින් සබඳතාවයේ ආරම්භයේ දී හෙජින් සබඳතාවයේ විධිමත් නම් කිරීම සහ ලේඛනගත කිරීම සහ ආයතනයේ අවදානම් කළමනාකරණ පරමාර්ථය සහ හෙජ් භාර ගැනීම සඳහා උපාය මාර්ග ඇත. එම ලේඛනයට හෙජින් උපකරණය හඳුනා ගැනීම, ආරක්ෂිත අයිතමය, ආරක්ෂිත අවදානමේ ස්වභාවය සහ හෙජින් සම්බන්ධතාව හෙජ් කාර්යක්ෂමතාවයේ ප්‍රභවයන් විශ්ලේෂණය කිරීම සහ එය තීරණය කරන්නේ කෙසේද යන්න ඇතුළුව, හෙජ් සවලතා අවශ්‍යතා සපුරාලන්නේද යන්න තක්සේරු කරන්නේ කෙසේද යන්න ඇතුළත් විය යුතුය.

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 09 - "මූල්‍ය උපකරණ" නම් කරන ලද කොටස් තුනක් යටතේ හෙජ් ගිණුම්කරණයට මඟ පෙන්වයි. මුදල් ප්‍රවාහ හෙජ් (ඉහළ සම්භාවිතා පුරෝකථනයක් සහිත ආයතනික බැඳීමක් සහිත ගනුදෙනු (මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් නොකළ), විදේශ ව්‍යවහාර මුදල් ප්‍රවාහ වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනාගත් හෝ පුරෝකථනය කළ අන්තර් සමාගම් ගනුදෙනු) සාධාරණ අගයට අගය කළ හෙජ් (ආයතනික බැඳීමක් සහිත (සටහන් නොකළ) හෝ විදේශ ව්‍යවහාර මුදල් වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනාගත් ගනුදෙනු), ශුද්ධ හෙජ් ආයෝජන (විදේශ මෙහෙයුම් ශුද්ධ ආයෝජන සඳහා නම් කරන ලද), ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 09 - "මූල්‍ය උපකරණ" හි නිශ්චිතව දක්වා ඇති හෙජ් ගිණුම්කරණය යටතේ බැංකුව මෙම ගනුදෙනු ගිණුම් ගත කරනු ලබන අතර එවැනි උපකරණවල එක් එක් වාර්තාකරණ දිනයන් අනුව ඉදිරි විනිමය අනුපාත භාවිතා කරමින් අගය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

4.3 මූල්‍ය උපකරණ ණය සහ ස්කන්ධ ලෙස වර්ග කිරීම

පහත සඳහන් ස්වභාවයන් මත පදනම්ව මූල්‍ය උපකරණ ණය හා ස්කන්ධ ලෙස වර්ග කෙරේ.

- මූල්‍ය උපකරණයට දී ඇති නම
- ස්ථිර පරිනත දිනයක් ඇති හෝ නොමැති බව
- උපකරණයේ ආයු කාලය
- ගෙවීමේ ප්‍රභව
- ගෙවීම් ලබා ගැනීම සඳහා බලපෑම් කිරීමේ අයිතිය
- කළමනාකරණයට සහභාගිවීමේ අයිතිය
- උපකරණ සමඟ බැඳී ඇති අවදානම
- මුදල් ප්‍රවාහ වල විචලනය
- සුරැකුම් ලෙස දී ඇති දෑ

4.4 මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්

4.4.1 මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා බැහැර කිරීම


මූල්‍ය වත්කම් හා වගකීම් ගෙවීම් සිදුකරන දිනයේදී එනම් උපකරණයේ ගිවිසුම්ගත විධිවිධාන සඳහා සමූහය පාර්ශ්වකරුවෙකු බවට පත් වන දිනයේදී මූලිකව හඳුනා ගනී. "ක්‍රමවත් ආකාරයේ වෙළඳාම" මෙයට ඇතුලත් වේ. ක්‍රමවත් ආකාරයේ වෙළඳාම යනු වෙළඳපළ තුළ සාමාන්‍යයෙන් පවතින සම්මුතීන් හා නියාමනයන් අනුව ස්ථාපනය කර ඇති කාල රාමුව අනුව වත්කම් ලබාදීමට අවශ්‍ය මූල්‍ය වත්කම් මිලදී ගැනීම හා විකිණීමයි. ණය ලබා ගන්නාට මුදල් අත්තිකාරම් ලබා දුන් විට (හෝ ගෙවූ විට) ණය හා අත්තිකාරම් හඳුනාගනු ලබයි. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ වටිනාකමට හඳුනා ගනී. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම හා සෘජුව අදාල වන ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට හඳුනා ගනී.

වත්කමෙන් ලැබෙන මුදල් ප්‍රවාහ කල් පිරෙන විට හෝ හිමිකාරිත්වයේ සියලු අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණවත් ලෙස හුවමාරු වන ගනුදෙනුවකින් මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය හුවමාරු වේ නම් සමූහය විසින් මූල්‍ය වත්කම් බැහැර කරයි. හුවමාරු කල මූල්‍ය වත්කමක ඇති වූ හෝ රඳවාගත් අයිතියක් ඇත්නම් සමූහය විසින් එය වෙනමම වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා ගනී.

වගකීම සඳහා ඇති බැඳියාව නිදහස් කල විට හෝ අවලංගු වූ විට හෝ කල් පිරී ඇති විට මූල්‍ය වගකීම් ඉවත් කරයි. පවත්නා මූල්‍ය වගකීමක් එකම ණය දෙන්නාගෙන් ප්‍රමාණවත් ලෙස වෙනත් වගකීමකින් වෙනස් වූ කොන්දේසි වලින් ප්‍රතිෂ්ඨාපනය කරන විට හෝ පවතින වගකීමේ කොන්දේසි ප්‍රමාණවත් ලෙස සංශෝධනය කර ඇත්නම් එවැනි හුවමාරුවක් හෝ සංශෝධනයක් මුල් වගකීම ඉවත් කිරීමක් ලෙස සලකා නව වගකීමක් හඳුනා ගනී. මුල් මූල්‍ය වගකීම පවත්වාගෙන යාමේ වටිනාකම හා ගෙවූ ප්‍රතිෂ්ඨාව අතර වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී.

4.4.2 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වර්ගීකරණය

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" අනුව මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා පවතින සමූහයේ ව්‍යාපාර ආකෘතිය හා මූල්‍ය වත්කම් වල මුදල් ප්‍රවාහයන්ගේ ගිවිසුම්ගත කොන්දේසි මත පදනම්ව වර්ගීකරණය තීරණය වේ. බැංකුව මූල්‍ය වත්කම් වර්ගීකරණය කරන ආකාරය පහත රූප සටහන මඟින් නිරූපණය කෙරේ.



4.4.2.1 ආරම්භයේදී මූල්‍ය වත්කම් පහත වර්ගීකරණයන්ගෙන් එකකට වර්ග කරනු ලබයි

- ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය වත්කම් (සටහන 4.4.7 සහ 27)
- ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම්
  - ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම් (සටහන 28)
  - ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ (සටහන 4.4.8 සහ 29)
- වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම් (සටහන 4.4.9 සහ 30)

4.4.2.2 ආරම්භයේදී මූල්‍ය වගකීම් පහත වර්ගීකරණයන්ගෙන් එකකට වර්ග කරනු ලබයි

- ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම්
  - ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම් තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු (සටහන 42)
  - ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම්, නිකුත් කළ ණය සුරැකුම්පත් හා යටත්කාලීන ණය (සටහන 43, 44 සහ 49)

4.4.3 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් මූලිකව අගය කිරීම

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කර ඇති අවස්ථාවලදී හැර මූල්‍ය වත්කම් හා වගකීම් ඒවායේ සාධාරණ වටිනාකම හා ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට මූලිකව අගය කරයි. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් හා වගකීම් වලට අදාල ගනුදෙනු පිරිවැය ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

4.4.4 "පළමු දින" ලාභ හෝ අලාභ

යම් මූල්‍ය උපකරණයක ගනුදෙනු වන මිල, එම මූල්‍ය උපකරණයම ගනුදෙනු වන වෙනත් නිරීක්ෂිත වර්තමාන වෙළඳපළක සාධාරණ අගයට හෝ නිරීක්ෂිත වර්තමාන වෙළඳපළ දත්ත මත ගණනය කරන ලද සාධාරණ අගයට හෝ වෙනස් වන්නේ නම් එම සාධාරණ අගයෙහි හා ගනුදෙනු මිලෙහි වෙනස සමූහය විසින් වහාම ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ("පළමු දින" ලාභ හෝ අලාභ) හඳුනා ගැනේ. නිරීක්ෂිත නොවන දත්ත මත සාධාරණ අගය ගණනය කරනු ලබන අවස්ථාවන්හිදී ගනුදෙනු මිල සහ ආදර්ශ මිල අතර වෙනස එම මූල්‍ය උපකරණයේ ආයුකාලය තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී.

4.4.5 ව්‍යාපාර ආකෘති ඇගයීම

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" අනුව, 2018 ජනවාරි 1 දින සිට බල පැවැත්වෙන පරිදි, සමූහය විසින් සිය ව්‍යාපාර ආකෘතිය හා එහි අරමුණු පදනම් කර ගනිමින් මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලබයි. එහෙත් එය වත්කම වෙන වෙනම ඇගයීම සිදු නොකරනු ලබන අතර වත්කම් කළඹ වශයෙන් ව්‍යාපාර ආකෘතිය සමඟ සසඳා වර්ගීකරණය කරනු ලබයි. එයට හේතු වන්නේ ව්‍යාපාරය කළමනාකරණය කරන ක්‍රමය සහ කළමනාකරණයට තොරතුරු ගලාගෙන යන ආකාරය මෙය වන බැවිණි. මූල්‍ය වත්කම් වර්ගීකරණය සඳහා සලකා බලන තොරතුරු පහත දැක්වේ.

- ආයෝජන කළඹ සඳහා අදාල වන ප්‍රතිපත්ති හා අරමුණු හා ඒවා ක්‍රියාත්මක වන ආකාරය, විශේෂයෙන්ම, ගිවිසුම් ගත පොළී ආදායම උපයා ගැනීම, විශේෂිත පොළී අනුපාතයක් පවත්වා ගැනීම, වත්කම් ආයෝජනය කර ඇති කාලසීමාව හා එම වත්කම් සඳහා අරමුදල් ප්‍රතිග්‍රහණය කරණු ලබන වගකීම් වල කාලසීමාව සංසන්දනය කිරීම හෝ මුදල් ජනනය සඳහා වත්කම් විකිණීම වැනි කටයුතු කෙරෙහි කළමනාකාරිත්වයේ උපායමාර්ගික අවධානයේ ස්වභාවය,
- ආයෝජන කළඹේ කාර්යසාධනය ඇගයීමට ලක්කරන්නේ කෙසේද යන්න සහ බැංකුවේ කළමනාකාරිත්වයට වාර්තා කරන්නේ කෙසේද යන්න පිළිබඳව,
- ව්‍යාපාර ආකෘතියේ කාර්ය සාධනයට බලපාන අවදානම් (සහ එම ව්‍යාපාර ආකෘතිය තුළ පවත්වා ගෙන යන මූල්‍ය වත්කම්) සහ එම අවදානම් කළමනාකරණය කරන්නේ කෙසේද යන්න,
- ව්‍යාපාර කළමනාකරුවන්ට ගෙවීම් සිදුවන්නේ කෙසේද? එනම් කළමනාකරණය කරන වත්කම් වල සාධාරණ අගය මත පදනම්ව හෝ ගිවිසුම් ගත මුදල් ප්‍රවාහයන් එකතු කර ගැනීම මඟින් ගෙවීම් සිදු වේද යන්න හා
- පෙර වර්ෂ වලදී මූල්‍ය වත්කම් විකුණු වාර ගණන, ප්‍රමාණය සහ කාල සීමා, මෙම විකුණුම් වලට බලපාන ලද හේතු සහ අනාගතයේදී වත්කම් විකිණීමට ඇති අපේක්ෂාවන්. කෙසේ වෙතත්, විකුණුම් පිළිබඳ තොරතුරු වෙන්ව නොසැලකෙන අතර මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම තුළින් බැංකුවේ ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳ සහ මුදල් ප්‍රවාහ ජනනය කළ ආකාරයද සලකා බලයි.

ව්‍යාපාරික ආකෘතිය තක්සේරු කර ඇත්තේ "හානිකර අවස්ථාව" හෝ "ආතති අවස්ථාව" යන කරුණු සලකා නොගෙන සාධාරණ අපේක්ෂිත සිදුවීම මතය. මූලික හඳුනා ගැනීමකින් පසුව මූල්‍ය වත්කම් වලට අපේක්ෂිත මුදල් ප්‍රවාහයේ මූලික වෙනසක් සිදු වුවත්, බැංකුව විසින් ඉතිරි මූල්‍ය වත්කම් වල වර්ගීකරණයේ වෙනස් කිරීමක් සිදු නොකරනු ලැබේ. එහෙත් අළුතින් මිලදී ගන්නා මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේදී ඉහත අපේක්ෂාවන්ගේ වෙනස් වීම සැලකිල්ලට ගනු ලැබේ.

4.4.6 ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි පොළිය හා මූලික මුදල පමණක් ගෙවීමේ ලක්ෂණයන්ගෙන් යුක්ත දැයි තක්සේරු කිරීම (SPPI පරීක්ෂණය)

වත්කම් වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන පියවර ලෙස, මූල්‍ය වත්කම් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි පොළිය හා මූලික මුදල පමණක් ගෙවීමේ (SPPI) පරීක්ෂණය සමත් වන්නේ දැයි සොයා බැලීම සඳහා මූල්‍ය වත්කම් වල ගිවිසුම් ගත නියමයන් අධ්‍යයනය කරනු ලැබේ.

මෙම තක්සේරුව සිදු කිරීම සඳහා "මූලික මුදල" ලෙස අදාල මූල්‍ය වත්කම මූලික හඳුනාගැනීමේදී පොත්වල හඳුනාගන්නා ලද මූල්‍ය වත්කම් වල සාධාරණ අගය ලෙස අර්ථ දැක්විය හැකිය. එමෙන්ම මෙම වටිනාකම මූල්‍ය වත්කමේ ආයු කාලය පුරා වෙනස් විය හැකිය (උදා: අධිමිල හෝ අවමිල ක්‍රමක්ෂය කිරීම හෝ මූලික මුදල කොටස් වශයෙන් ගෙවීම).

"පොළිය" නිර්වචනයට මුදලේ කාල වටිනාකම සහ ආයෝජනය කරනු ලබන කාලපරිච්ඡේදය සඳහා ණය අවදානම සඳහා පිරිවැය මෙන්ම ලාභයද ඇතුලත් වේ.

මීට අමතරව, මූලික ණය දීමේ විධිවිධාන වලට සම්බන්ධ නොවන ප්‍රතිවිරෝධී මුදල් ප්‍රවාහයේ අවදානම් හෝ අස්ථාවරත්වය අවම කිරීමට වැඩි වශයෙන් හඳුන්වා දෙන ගිවිසුම් නියමයන් අනුව ප්‍රතිපත්තිමය ගෙවීම් සහ ප්‍රතිපත්තිමය ප්‍රමාණය මත පොළී පමණක් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයක් ඇති නොකරයි. එවිට එම මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට අගය කරන මූල්‍ය වත්කම් ලෙස වර්ගකල යුතුය.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් තුළ අන්තර්ගත වන්නේ මූලික මුදල හා පොළිය පමණක්ද යන්න තීරණය කිරීමේදී, සමූහය උපකරණයේ ගිවිසුම්ගත කොන්දේසි සලකා බලයි. මූල්‍ය වත්කමෙහි මෙම කොන්දේසිය සපුරාලිය නොහැකි වන පරිදි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්ගේ වෙලාව හෝ ප්‍රමාණය වෙනස් කල හැකි ගිවිසුම්ගත යෙදුමක් තිබේද යන්න තක්සේරු කිරීම මෙයට ඇතුලත් වේ. තක්සේරුව සිදු කිරීමේදී සමූහය පහත දෑ සලකා බලයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

- මුදල් ප්‍රවාහයන්ගේ වටිනාකම හා කාලය වෙනස් කරන අසම්භාව්‍ය සිද්ධීන්,
- තෝලන ලක්ෂණ,
- පෙරගෙවුම් හා දීර්ඝ කිරීමේ කොන්දේසි,
- නිශ්චිත වත්කම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ සඳහා සමූහයේ හිමිකම් සීමාකරණ නියමයන් සහ
- මුදලේ කාල වටිනාකම සලකා බැලීම වෙනස් කරන ලක්ෂණ

4.4.7 ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කරන මූල්‍ය වත්කම් අගය කිරීම

ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කරන අයිතමයන් ලෙස අඩංගු වන්නේ

- වෙළඳපළ ගනුදෙනු සඳහා පවතින අයිතමයන්
- ආරම්භක හඳුනාගැනීමේදී ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට විශේෂයෙන් නම් කල අයිතමයන් හා
- මූලික මුදල හා පොළිය පමණක් ගෙවීම නිරූපණය නොවන ගිවිසුම්ගත කොන්දේසි සහිත ණය උපකරණයන්

ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට පවත්වාගෙන යන මූල්‍ය උපකරණ මූලිකව හඳුනාගනු ලබන්නේ ලාභ හෝ අලාභ ගිණුමේ හඳුනාගත් දැරෑ ගනුදෙනු පිරිවැය සමඟ සාධාරණ වටිනාකමටය. පසුව සාධාරණ වටිනාකමට අගය කරන අතර කිසියම් ලාභයක් හෝ අලාභයක් පැනනගින විට ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී. මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට අගය කරන විටදී ණය අවදානමේ වෙනස් වීම් වලට අදාලව සාධාරණ අගයේ සංචලනයන් නිරූපනය වන පරිදි, ප්‍රතිපාර්ශවයේ ණය ශක්‍යතාවය පිලිබිඹු වන සේ ණය තක්සේරුකරණ ගැලපුමක් සිදු කරයි.

4.4.7.1 වෙළඳ ගනුදෙනු සඳහා පවතින මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම් වෙළඳපළ ගනුදෙනු සඳහා දරා සිටින ලෙස වර්ග කරනුයේ විකිණීමේ අරමුණින් මූලිකවම අත්පත් කරගෙන ඇති නම් හෝ දරා ඇත්නම් හෝ නුදුරේදී නැවත මිලදී ගන්නේ නම් හෝ, කෙටි කාලීනව ලාභ ලබා ගැනීමේ අරමුණ සහිත හා එක්ව කළමනාකරණය කරන මූල්‍ය උපකරණ වල ආයෝජන කළඹේ කොටසක් වන හෝ, සුදුසුකම් ලබන හෙජින් සම්බන්ධතාවයක් නොමැති ව්‍යුත්පන්න උපකරණයන් වන විටදීය.

වෙළඳ ව්‍යුත්පන්න හා වෙළඳ සුරැකුම්පත්, වෙළඳපළ ගනුදෙනු සඳහා දරා සිටින ලෙස වර්ගීකරණය කරන අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සාධාරණ වටිනාකමට හඳුනාගනී. සාධාරණ වටිනාකමේ වෙනස්වීම්, වෙළඳපළ ගනුදෙනු වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු) (සටහන 10) සහ ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම් වලින් ලත් ශුද්ධ ලාභ/(පාඩු) (සටහන 11) යටතේ හඳුනා ගනී. වෙළඳපළ ගනුදෙනු සඳහා පවතින මූල්‍ය වත්කම් වලින් ලද පොළී ආදායම ශුද්ධ පොළී ආදායම (සටහන 8) යටතේ හඳුනා ගන්නා අතර ලාභාංශ ආදායම ගෙවීමට ඇති අයිතිය ස්ථාපිත කර ඇති විට වෙළඳපළ ගනුදෙනු වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු) (සටහන 10) යටතේ හඳුනාගනී.

4.4.7.2 ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අගය කල හා නම් කල මූල්‍ය උපකරණ

මූලික හඳුනා ගැනීමෙන් පසු මූල්‍ය උපකරණයන් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අගය කිරීම හා නම් කිරීම සිදු කල හැක. වෙනත් පදනමක් මත මූල්‍ය වත්කම් හා වගකීම් මිනුම් කරන විට ඇති වන මිණුම්කරණ හෝ හඳුනාගැනීමේ නොගැලපීම් සැලකිය යුතු ලෙස අඩු කරයි නම් හෝ සම්පූර්ණයෙන් ඉවත් කරයි නම් (එනම් ගිණුම්කරණ නොගැලපීම් ඉවත් කරයි නම්) පමණක් මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කල හැක. ගිණුම්කරණ නොගැලපීම් ඉවත්කිරීමට හෝ සැලකිය යුතු ලෙස අඩු කළ හැකි නම් හෝ පහත අවස්ථාවල මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ හැක.

- ධාරක ගිවිසුම ව්‍යුත්පන්න උපකරණ එකක් හෝ කිහිපයකින් සමන්විත වේ නම් හෝ
- ලේඛනගත අවදානම් කළමනාකරණ හෝ ආයෝජන ක්‍රමවේදය අනුව සාධාරණ වටිනාකම පදනම මත මූල්‍ය වත්කම් හා වගකීම් දෙකම කළමනාකරණය හා එහි කාර්යසාධනය ඇගයීමට ලක් කර තිබේ නම් ගිණුම්කරණ නොගැලපීම් සැලකිය යුතු ලෙස අඩු කල හොත් හෝ ඉවත් කල හොත් හෝ පහත අවස්ථාවල මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කල හැක. මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කර ඇති විට නීරීක්ෂණය කල හැකි වෙළඳපළ පොළී අනුපාතිකයන්ට ඉහළ ණය විහිදීම් වල වෙනස්වීම් නිරීක්ෂණය කිරීමෙන් සමූහයේ ණය ගුණාත්වයේ වෙනස්වීම් වලට ආරෝපිත සාධාරණ අගයේ සංචලනයන් ගණනය කර වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වෙනමම ඉදිරිපත් කෙරේ. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කළ කිසිදු මූල්‍ය වගකීමක් 2025 දෙසැම්බර් 31 දිනට නොමැත.

4.4.7.3 මූලික මුදල හා පොළිය පමණක් ගෙවීම නිරූපණය නොවන ගිවිසුම් ගත කොන්දේසි සහිත ණය උපකරණයන්

මූලික මුදල හා පොළිය පමණක් ගෙවීම යන පරීක්ෂණයෙන් අසමත්වන මූල්‍ය ණය උපකරණයන් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට ගිණුම් ගත කෙරේ.

4.4.8 ක්‍රමක්ෂය පිරිවැයට අගය කල මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ

පහත අවස්ථා වලදී ණය උපකරණයන්හි ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට අගය කරයි.

- ගිවිසුම් කොන්දේසි අනුව නිශ්චිත දිනවලදී හිඟ හිටි මුදල මත පොළිය හා මූලික මුදල පමණක් පිලිබිඹු වන මුදල් ප්‍රවාහයන් ඇති විට හා
- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කර ගැනීමට තබා ගැනීමෙන් ව්‍යාපාර ආකෘතියේ අරමුණ ලගා කරගන්නා විට

මෙම ණය උපකරණයන් මූලිකව හඳුනාගනු ලබන්නේ සාධාරණ වටිනාකම හා සෘජුව අදාල වන ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට වන අතර ඵලදායී පොළී අනුපාතය භාවිතා කිරීමෙන් ක්‍රමක්ෂය පිරිවැයට පසුව හඳුනා ගනී. මූල්‍ය වත්කම් හානිකරණය යටතේ සටහන 4.4.11 හි විස්තර කර ඇති මට්ටම් තුනක අපේක්ෂිත ණය හානි ආකෘතිය මත පදනම්ව ණය හානිකරණය ගණනය කරනු ලබයි.

4.4.9 වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්

4.4.9.1 ණය උපකරණ

පහත අවස්ථාවන්හිදී ණය උපකරණයන්හි ආයෝජන වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ වටිනාකමට අගය කරයි.

- ගිවිසුම් කොන්දේසි අනුව නිශ්චිත දින වලදී හිඟ හිටි මුදල මත මූලික මුදල හා පොළිය පමණක් පිලිබිඹු වන මුදල් ප්‍රවාහයන් ඇති විට හා

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කිරීම හා මූල්‍ය වත්කම් විකිණීමෙන් ව්‍යාපාර ආකෘතියේ අරමුණ ලඟා කර ගන්නා විට

මෙම ණය උපකරණ මූලිකව හඳුනා ගනු ලබන්නේ සාධාරණ වටිනාකම හා සෘජුව අදාල වන ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට වන අතර පසුකාලීනව සාධාරණ වටිනාකමට හඳුනා ගනී.

සාධාරණ වටිනාකමේ වෙනස්වීම් මත ඇති වන ලාභ හෝ අලාභයන් ස්කන්ධයේ වෙනම කොටසක් යටතේ වෙනත් විස්තීර්ණ ආදායම යටතේ දක්වයි. හානිකරණ අලාභයන් හෝ ප්‍රතිවර්ත්‍ය කිරීම්, පොළී ආදායම හා විදේශ විනිමය ලාභ හෝ අලාභයන් ලාභ හෝ අලාභ යටතේ හඳුනා ගනී. විකුණන අවස්ථාවේදී කලින් වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභයන් වෙනත් විස්තීර්ණ ආදායමේ සිට ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කරයි.

වත්කම්හි යොදාගත් ආකෘතිය අනුව ක්‍රමක්ෂය මත පදනම් වූ මූල්‍ය ශේෂ හානිකරණ මැනීම අපේක්ෂිත ණය අලාභ අදියර 3 මත පදනම් වේ. මෙම අපේක්ෂිත ණය අලාභ ආකෘති සටහන් අංක 4.4.11 විස්තර කර ඇත.

4.4.9.2 ස්කන්ධ උපකරණ

වෙළඳපළ ගනුදෙනු සඳහා පවතින හා ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 3 - "ව්‍යාපාර සංයෝජනය" යටතේ ව්‍යාපාර සංයෝජනය සඳහා සමූහය විසින් හඳුනාගන්නා අසම්භාව්‍ය ප්‍රතිෂ්ඨාව සඳහා වන ස්කන්ධ උපකරණයන්ගේ ආයෝජන හැර කළමනාකරණය විසින් වෙනස්කල නොහැකි විකල්පය තෝරාගෙන ඇතිවිට එම ස්කන්ධ උපකරණයන්ගේ ආයෝජන, වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ වටිනාකමට අගය කරයි. වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ වටිනාකමට යන වෙනස් කල නොහැකි විකල්පය ආයෝජන කලඛයන් සඳහා කළමනාකරණය සලකා නොබලයි නම් එම ආයෝජන නිරායාසයෙන් ලාභ හෝ අලාභ තුළින් සාධාරණ වටිනාකමට අගය කල යුතුයි.

විකිණීමේදී වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයට මාරු නොකරයි.

කෙසේ වෙතත් සම්පූර්ණ විකිණීමකදී හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතයේ සිට ස්කන්ධය තුළ රඳවාගත් ඉපයීම් වලට මාරු කරයි. මෙම ආයෝජන වල ලාභාංශ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ "වෙනත් මෙහෙයුම් ආදායම්" (සටහන 13) යටතේ හඳුනා ගනී.

4.4.10 ණය පහසුකම් හැර අනෙකුත් මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීම

මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීමට අදාල ව්‍යාපාර ආකෘතිය සමූහය විසින් වෙනස් කරන විටදී පමණක් සමූහය විසින් එහි මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරයි. ක්‍රමක්ෂය පිරිවැයට, වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට හෝ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අගය කරනු ලබන මූල්‍ය වත්කම් සමූහය විසින් නැවත වර්ගීකරණය කරනු ලබයි නම් නැවත වර්ගීකරණය කරන දිනයේ සිට අනාගතයට බලපාන පරිදි නැවත වර්ගීකරණය ගලපනු ලබයි. සමූහය කලින් හඳුනාගත් ලාභ, අලාභ (හානිකරණ අලාභයන්ද ඇතුලත්ව) හෝ පොළිය නැවත සංශෝධනය සිදු නොකෙරේ.

නැවත වර්ගීකරණය කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ සඳහා වන ගිණුම්කරණ පිළියම් පහත වගුව මඟින් සාරාංශ ගත කර ඇත.

මූලික මිනුම් කිරීම	නැවත වර්ගීකරණය කිරීමෙන් පසු මිනුම් කිරීම	නැවත වර්ගීකරණය සඳහා වූ ගිණුම්ගත කිරීම
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	ක්‍රමක්ෂය පිරිවැයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම එහි නව පවත්වාගෙන යාමේ දළ වටිනාකම බවට පත්වන අතර සාධාරණ අගයෙහි පසුව සිදුවන වෙනස්කම් වෙනත් විස්තීරණ ආදායම් යටතේ හඳුනා ගනියි.
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ අගය නව පවත්වාගෙන යාමේ පිරිවැය බවට පවත්වන අතර සාධාරණ අගයෙහි පසුව සිදුවන වෙනස්කම් වෙනත් විස්තීරන ආදායම් යටතේ හදුනාගනියි.
වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට	ක්‍රමක්ෂය පිරිවැයට	පෙරදී වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභය ස්කන්ධයෙන් ඉවත් කර මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරන දිනයේ සාධාරණ වටිනාකමට ගලපනු ලැබේ. නැවත වර්ගීකරණයේ ප්‍රතිඵලයක් ලෙස සඵල පොළී අනුපාතිකයට හා අපේක්ෂිත ණය හානියට ගැලපීමක් සිදු නොකෙරේ.
වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට	ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම නව පවත්වාගෙන යාමේ පිරිවැය බවට පත් වේ. නැවත වර්ගීකරණය කරන දිනයේ නැවත වර්ගීකරණය කිරීමේ ගැලපුමක් ලෙස පෙරදී වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභය ස්කන්ධයේ සිට ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කරයි.
ක්‍රමක්ෂය පිරිවැයට	ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම හා පෙරදී හඳුනාගත් ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනසින් ඇතිවන ලාභය හෝ අලාභය ලාභ හෝ අලාභය යටතේ හඳුනාගනී.
ක්‍රමක්ෂය පිරිවැයට	වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට	මූල්‍ය වත්කමක පෙරදී හඳුනාගත් ක්‍රමක්ෂය පිරිවැය හා නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම අතර වෙනසින් ඇතිවන ලාභය හෝ අලාභය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනී. නැවත වර්ගීකරණයේ ප්‍රතිඵලයක් ලෙස සඵල පොළී අනුපාතිකයට හා අපේක්ෂිත ණය හානිය මැනීමට කිසිදු ගැලපීමක් සිදු කරනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

4.4.10.1 ණය පහසුකම් හැර අනෙකුත් මූල්‍ය වත්කම් වැඩිදියුණු/උසස් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2021 අංක 14 දරණ විධිවිධානය අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල ප්‍රතිපත්ති වලට අනුකූලව බැංකුවට මූල්‍ය වත්කම් ඉහළ ස්ථරයකට වැඩිදියුණු කළ හැක. එම නිසා, බැංකුව විසින් සුදුසු තර්කනයකට අනුව ප්‍රධාන අවදානම් නිලධාරියාගේ අභිමතය පරිදි මූල්‍ය වත්කම් වැඩිදියුණු කරයි.

4.4.11 මූල්‍ය වත්කම් හානිකරණය

ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට මිනුම් නොකරන පහත සඳහන් වර්ගයේ මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය හානිය ගණනය කිරීම සමූහය මට්ටම් තුනක් යටතේ සිදු කරයි.

- ක්‍රමක්ෂය පිරිවැයට හා වෙනත් විස්තීරණ ආදායම මඟින් සාධාරණ අගයට මනිනු ලබන ණය උපකරණ
- ණය බැඳීම්; සහ
- මූල්‍ය ඇප ගිවිසුම්

මූල්‍ය වත්කමේ ඉතිරි ආයු කාලය පුරාවට, සිදු වූ පැහැර හැරීමේ අවදානමෙහි වෙනස සැලකිල්ලට ගනිමින් මූල්‍ය වත්කම්වල ණය අවදානම ආරම්භයේ සිට සැලකිය යුතු ලෙස වැඩිවී තිබේද යන්න පිළිබඳ සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසානයේදීම සමූහය විසින් තක්සේරු කරයි. මෙම ක්‍රියාවලිය මත පදනම්ව ආරම්භක හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි වෙනස්වීම මත මූල්‍ය වත්කම් පහත සඳහන් මට්ටම් තුන තුළ සංක්‍රමණය වේ.

4.4.11.1 අදියර 1 - මාස 12 සඳහා වූ අපේක්ෂිත ණය හානිය

ආරම්භක හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් සිදුවී නොමැති හා ආරම්භයේ සිට ණය හානිකරණය වී නොමැති නිරාවරණයන් සඳහා ඉදිරි මාස 12 තුළ සිදුවිය හැකි පැහැර හැරීම් අවස්ථා වල සම්භාවිතාවය සඳහා වූ අපේක්ෂිත ණය හානියේ කොටස හඳුනා ගනී. සැලකිය යුතු ලෙස ණය පිරිහීමට ලක් නොවූ ගනුදෙනුකරුවන් වෙතින් මාස 12 සඳහා වූ අපේක්ෂිත ණය හානිය බැංකුව විසින් තීරණය කරයි.

4.4.11.2 අදියර 2 - ජීවිත කාලය සඳහා වූ අපේක්ෂිත ණය හානිය

ආරම්භක හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් සිදු වූ නමුත් ණය හානිකරණය නොවූ නිරාවරණයන් සඳහා ජීවිත කාලය සඳහා වූ (එනම් මූල්‍ය වත්කම් වල ඉතිරි ආයුකාලය පිළිඹිබු වන පරිදි) අපේක්ෂිත ණය හානිය හඳුනාගනී.

4.4.11.3 අදියර 3 - ජීවිත කාලය සඳහා වූ අපේක්ෂිත ණය හානිය

වත්කම් වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයට අහිතකර බලපෑමක් ඇතිකරන සිද්ධීන් එකක් හෝ වැඩි ගණනක් සිදු වූ විට, එම නිරාවරණයන් ණය හානිකරණය වූ නිරාවරණයන් ලෙස තක්සේරු කරනු ලැබේ. ණය හානිකරණය වූ නිරාවරණයන් සඳහා ජීවිත කාලය සඳහා වූ අපේක්ෂිත ණය හානිය හඳුනා ගනී. පොළී ආදායම ගණනය කිරීමේ දී පවත්වාගෙන යන දළ වටිනාකමට නොව, ක්‍රමක්ෂය පිරිවැයට (ප්‍රතිපාදනයන්ට පසු) සවල පොළී අනුපාතය භාවිත කිරීමෙන් ගණනය කරයි.

4.4.11.4 අපේක්ෂිත ණය හානිය ගණනය කිරීම

අපේක්ෂිත මුදල් හිඟය ගණනය කිරීම සඳහා සම්භාවිතාවය මත බර තැබූ අවස්ථා තුනක් මත පදනම්ව අපේක්ෂිත ණය හානිය ගණනය කරනු ලබන්නේ සවල පොළී අනුපාතිකයකට ආසන්න අනුපාතයකින් වට්ටම් කිරීමෙනි. මුදල් හිඟය යනු ගිවිසුමට අනුව ආයතනය සඳහා ලැබිය යුතු මුදල් ප්‍රවාහයන් සහ ආයතනය අපේක්ෂා කරන මුදල් ප්‍රවාහයන් අතර වෙනස වේ. සමූහයේ අපේක්ෂිත ණය හානිය ගණනය කිරීම් පිළිබඳ යාන්ත්‍රණය පහත දැක්වෙන අතර එහි ප්‍රධාන අංග පහත පරිදි වේ:

පැහැර හැරීමේ සම්භාවිතාවය (PD)

පැහැර හැරීමේ සම්භාවිතාවය යනු කිසියම් කාල සීමාවක් තුළදී ණය පැහැර හැරීමේ සම්භාවිතාවය පිළිබඳව තක්සේරුවකි. ණය පහසුකම පෙර කාලවිච්ඡේදයකදී හඳුනාගෙන නොමැති නම් හා තවමත් එම වත්කම කළඹ තුළ ඇත්නම් පැහැර හැරීමේ සම්භාවිතාවක් ඇතිවිය හැක්කේ තක්සේරු කරන ලද කාලසීමාව තුළ නිශ්චිත වෙලාවක පමණි. පැහැර හැරීමේ සම්භාවිතාවය පිළිබඳ සංකල්පය සටහන 28 යටතේ තවදුරටත් විස්තර කර ඇත.

ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය (EAD)

ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය යනු අනාගත දිනකදී පැහැර හැරීම සිදුවන අවස්ථාවේදී පැහැර හැරීම සිදුවන අගයයි. මෙම අගය ගණනය කරනු ලබන්නේ වාර්තාකරණ දිනට පසුව සිදුවන පොළී සහ ප්‍රාග්ධන ගෙවීම්, එකඟ වූ පහසුකම් ලබාගැනීම්, මඟ හැරුණු ගෙවීම් වලට අදාළ උපචිත පොළිය යනාදිය ගැලපීමෙන් පසු ලැබෙන නිරාවරණය වීමේ අගය වේ. සටහන 28 යටතේ ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය පිළිබඳ තවදුරටත් විස්තර කර ඇත.

පැහැර හැරීමේ අලාභය (LGD)

පැහැර හැරීමේ අලාභය යනු කිසියම් පැහැර හැරීමක් සිදුවන අවස්ථාවක ඇතිවන අලාභයේ ඇස්තමේන්තුවක් වේ. යම් කිසි කාලච්ඡේදයක් තුළදී පැහැර හැරීමෙන් පසුව සුරැකුම් උපලබ්ධි කිරීම් වැනි දෑ සැලකිල්ලට ගනිමින් අයකර ගැනීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණය හා ගිවිසුම්ගත මුදල් ප්‍රමාණය අතර වෙනස මත පැහැර හැරීමේ අලාභය පදනම් වේ. මෙය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගයෙහි ප්‍රතිශතයක් ලෙස සාමාන්‍යයෙන් දක්වයි. සටහන 28 යටතේ පැහැර හැරීමේ අලාභය පිළිබඳ තවදුරටත් විස්තර කර ඇත.

4.4.11.5 හානිකරණය සඳහා මට්ටම නිර්ණය කිරීම

සෑම වාර්තාකරණ දිනයකදීම ආරම්භක හඳුනාගැනීමේ සිට නිරාවරණයන්ගේ ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් තිබේද යන්න පිළිබඳ සමූහය තක්සේරු කරයි. මෙය තක්සේරු කරනු ලබන්නේ ආරම්භක හඳුනාගැනීමේ දිනය හා අපේක්ෂිත ජීවිත කාලය අතර පැහැර හැරීමේ අවදානමක් තිබේද යන්න සැසඳීමෙනි. මෙම කාර්යයේදී විශේෂ වියදමක් හෝ වෑයමක් නොමැතිව ලබාගන්නා සාධාරණ හා විශ්වාසදායක තොරතුරු පිලිබඳව සමූහය සලකා බලයි. මෙය ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු මෙන්ම ඉදිරි දැක්මක් සහිත විශ්ලේෂණයකින්ද යුක්ත වේ.

වත්කම් වල ගුණාත්මකභාවය පිරිහීයාමේදී නිරාවරනයන් අපේක්ෂිත ණය හානියේ අදියර තුළ සංක්‍රමණය වේ. පසුකාලීනව වත්කම් වල ගුණාත්මකභාවය වර්ධනය වුවහොත් හා කලින් තක්සේරු කරන ලද ආරම්භයේ සිට ඇති ණය අවදානමෙහි සැලකිය යුතු අඩු වීමක් සිදු වුවහොත් අවිනිශ්චිත ණය සඳහා කරන වෙන් කිරීම් ජීවිත කාලය සඳහා වන අපේක්ෂිත ණය

හානියේ සිට මාස 12 සඳහා වූ ණය හානිය දක්වා අඩු වේ. ආරම්භයේ සිට සැලකිය යුතු ලෙස පිරිහී ගොස් නොමැති හෝ පිරිහීම සමූහයේ ආයෝජන ශ්‍රේණිගත නිර්නායකයන් තුළ පවතින හෝ හිඟ හිටි දින ගණන 30 හෝ දින 30 කට වඩා අඩු නිරාවරණයන් පහල ණය අවදානමක් ඇති නිරාවරණයන් ලෙස සැලකේ. මෙම මූල්‍ය වත්කම් සඳහා හානිකරණ වෙන් කිරීම මාස 12 ක් සඳහා වූ අපේක්ෂිත ණය හානිය මත පදනම්ව සිදු කරයි.

කේවල හා සාමූහික පදනම මත නිරාවරණයන් සඳහා වන ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේද යන්න පිළිබඳ සමූහය තක්සේරු කරයි. උපකරණයේ වර්ගය, ණය අවදානම් ඇගයුම්, ඇප වර්ගය, ආරම්භක හඳුනාගැනීමේ දිනය, කල් පිරීමට ඇති කාලය, කර්මාන්තය, ණය ගැතියාගේ භූගෝලීය ව්‍යාප්තිය හා අනෙකුත් අදාල සාධක යනාදිය සැලකිල්ලට භාජනය කර සාමූහික හානිකරණ ඇගයීම සඳහා ණය අවදානම් ලක්ෂණ පදනම් කරගෙන මූල්‍ය උපකරණ කාණ්ඩගත කෙරේ.

4.4.11.6 ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණය ගණනය කිරීම

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" යටතේ අවසර දී ඇති ණය සහ අත්තිකාරම් සඳහා වන හානිකරණය ගණනය කිරීමේදී බැංකුව උපකල්පනයන් භාවිතා කරයි. පහත සඳහන් පරිදි හිඟහිටි දින ගණන මත පදනම්ව ණය කළඹ අදියර තුනකට වර්ගීකරණය කර ඇති අතර මාස 12 අපේක්ෂිත ණය අලාභ (12mECL) සහ ජීවිත කාලය අපේක්ෂිත ණය අලාභ (LTECL) වල අදාළ වීමේ මට්ටම අදියර මත රඳා පවතී. ණය පහසුකමක වර්ගීකරණ තීරණය කිරීමේදී ණය පහසුකම්වලට අදාලව ලබා ගන්නා ලද සුරැකුම් වර්ගය සහ වටිනාකම සලකා බලනු නොලැබේ. ණය ගැණුම්කරුවෙකුට බැංකුව සමඟ අයිරා සීමාවන් සහිත ජංගම ගිණුම් කිහිපයක් තිබේ නම්, අයිරා වර්ගීකරණය කිරීමේ අරමුණු සඳහා, සමස්ථ අනුමත සීමාව සහ එවැනි සියලුම ගිණුම්වල දෙනික හිඟ සමස්ත ශේෂය සලකා බලනු ලැබේ.

4.4.11.6.1 සක්‍රීය ණය පහසුකම්

(අ) ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" යටතේ අදියර 1 ලෙස වර්ග කර ඇති සියලුම ණය පහසුකම් සහ


(ආ) ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" යටතේ ණය පහසුකම් ණය අවදානම් සැලකිය යුතු වැඩි වීමක් හඳුනාගෙන ඇත්නම් ඒවා (ඌන ක්‍රියාකාරී ණය පහසුකම්), 2 වන අදියර ලෙස වර්ගීකරණය කර ඇත.

4.4.11.6.2 අක්‍රීය ණය පහසුකම් (NPCF)

අක්‍රීය ණය පහසුකම් (NPCF) යන්නෙන් අදහස් වන්නේ,

(අ) ගනුදෙනුකරුවෙකුගේ ගෙවිය යුතු ගිවිසුම්ගත නියමිත දින සිට දින 90 කට වැඩි කාලයක් ගතවී ඇති (ගෙවිය යුතු ගිවිසුම්ගත නියමිත දින සිට ගෙවිය යුතු දින ගණන ගණනය කරනු ලැබේ).

(ආ) අනුමත සීමාව ඉක්මවා දින 90 කට වඩා වැඩි කාලයක් පුරා පැවතීම.



	සක්‍රීය ණය	අක්‍රීය ණය පහසුකම් (NPCF)
අදියර 1	**අදියර 2**	**අදියර 3**
• ගෙවිය යුතු දින සිට දින 30ක් හෝ දින 30 කට අඩු කාලයක් හිඟහිටි	• ගෙවිය යුතු දින සිට දින 31 සිට දින 90 ක කාලයක් හිඟහිටි	• ගෙවිය යුතු දින සිට දින 90 කට වඩා වැඩි කාලයක් හිඟහිටි
• අදියර 2 හෝ 3 යටතේ වර්ගීකරණය කර නොමැති සියලුම ණය පහසුකම්	• ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු සතුටුදායක සක්‍රීය කාලසීමාවක් යටතේ වැඩි දියුණු කරන ලද ණය පහසුකම් හැර, දෙවරක් දක්වා ප්‍රතිව්‍යුහගත කරන ලද සියලුම ප්‍රතිව්‍යුහගත ණය. • සටහන 28 - "ණය සහ අත්තිකාරම්" යටතේ දක්වා ඇති පිරිහීමේ සාධක මත පදනම්ව හඳුනාගත් සැලකිය යුතු ණය පිරිහීමක් ලෙස ඌනක්‍රියාකාරී ණය පහසුකම්/ නිරාවරණ.	• ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු සතුටුදායක සක්‍රීය කාලසීමාවක් යටතේ වැඩි දියුණු කරන ලද ණය පහසුකම්/ නිරාවරණ හැර දෙවරකට වඩා වැඩි වාර ගණනක් ප්‍රතිව්‍යුහගත කර ඇති ණය පහසුකම් • අදියර උසස් කිරීමකට ලක් නොකරන ලද නැවත ගිවිසුම් ගත කර ඇති සියලුම ණය සහ අත්තිකාරම් • මහ බැංකුවේ විධිවිධාන අනුව අක්‍රීය ලෙස වර්ග කර ඇති සියලුම ණය පහසුකම් • සටහන 28 - "ණය සහ අත්තිකාරම්" යටතේ ලබා දී ඇති පිරිහීමේ සාධක අනුව සැලකිය යුතු ණය පිරිහීමකින් හඳුනාගත් ගනුදෙනුකරුවන්

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(ඇ) ශ්‍රී ලං.මූ.වා.ප්‍ර 9 - "මූල්‍ය උපකරණ" අනුව අදියර 3 ලෙස වර්ග කර ඇති වෙනත් ඕනෑම ණය පහසුකම් (විභව අවදානම් සහ ආරම්භයේ හානිකරණය මත පදනම්ව අක්‍රීය ණය පහසුකම් ලෙස වර්ග කර ඇති පහසුකම්).

ඉහත වර්ගීකරණ කාර්යය සඳහා, ණය ගුණාත්මක භාවයේ පිරිහීම හේතුවෙන් මුදල් ආපසු ගෙවීමේ නියමයන් සංශෝධනය කර ඇත්නම්, එම පහසුකම ප්‍රතිව්‍යුහගත පහසුකමක් ලෙස සලකනු ලබන අතර ප්‍රතිව්‍යුහගත පහසුකම් හඳුනාගැනීමේදී බැංකුවේ "ණය දරාගැනීමේ ප්‍රතිපත්තිය" ද සලකා බැලිය යුතුය. බැංකුවේ ණය දරාගැනීමේ ප්‍රතිපත්තියට අනුව, පහත සඳහන් වෙනස්කම්/නිර්ණායක ණය පහසුකමක මුදල් ආපසු ගෙවීමේ කොන්දේසිවලට වෙනස්කම් ලෙස පිළිගැනේ.

- පොළී අනුපාත වෙනස් වීම
- දිගුවන් (පරිණත) වෙනස් කිරීම
- සහන කාල සීමාවට වෙනස්කම්
- පොළී කපාහැරීම

4.4.11.6.3 අක්‍රීය ණය පහසුකම් (NPCF) උප වර්ගීකරණය

හිඟ හිටි දින ගණන සහ විභව අවදානම් මට්ටම මත පදනම්ව අක්‍රීය ණය පහසුකම් (NPCF) පහත සඳහන් පරිදි තවදුරටත් කාණ්ඩ හතරකට වර්ග කර ඇත:

වර්ගීකරණය	හිඟ හිටි දින ගණන	විභව අවදානම් නිර්ණායක
විශේෂයෙන් හඳුනාගත්	> 90 සහ < = 180	කාලානුරූපීව නිවැරදි නොකළහොත් අනාගතයේදී ගණුදෙනුකරුවන්ගේ ආපසු ගෙවීමේ හැකියාවට අහිතකර ලෙස බලපෑ හැකි දුර්වලතා පෙන්නුම් කරයි.
ආශ්‍රිත සම්මත	> 180 සහ < = 270	පවත්නා කොන්දේසි මත ආපසු ගෙවීමේ අවදානම සහ ආපසු ගෙවීමේ අවිනිශ්චිතතාවයට බාධා ඇති කළ හැකි ව්‍යාපාරය, මුදල් ප්‍රවාහය හෝ ගණුදෙනුකරුගේ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් නිශ්චිත දුර්වලතා ප්‍රදර්ශනය කරයි.
අඩමාණ	> 270 සහ < = දින 360	පැහැර හැරීමේ ඉහළ හෝ අර්ධ අවදානමක් පෙන්නුම් කරන හෝ සම්පූර්ණ චකිතූ කිරීම අවිනිශ්චිත විට සහ පැහැර හැරීමේ ඉහළ අවදානමක් ඇතිවිට වේ.
අලාභයට ගිය	> දින 360	චකිතූ කළ නොහැකි යැයි සලකන හෝ බොහෝ දුරට නිශ්චිත ආපසු ගෙවීමක් සිදු නොකරනු ඇති අතර ඉහත කාණ්ඩ යටතේ ඇතුළත් නොවන අනෙකුත් සියලුම අක්‍රීය ණය පහසුකම් (NPCF).

4.4.11.7 ණය පහසුකම් වැඩිදියුණු කිරීම

ආරම්භක අවස්ථාවට සාපේක්ෂව පසු දිනවලදී ණය පිරිහීමෙහි වැඩිදියුණු වීමේ මට්ටම මත පදනම්ව අදියර අතර ණය පහසුකම් වැඩිදියුණු කිරීම සිදු කෙරේ.

ණය පහසුකම් වැඩිදියුණු කිරීමට අදාළ ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය යටතේ සපයා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව බැංකුව විසින් ණය පහසුකම් වැඩිදියුණු කරනු ඇත.

4.5 මූල්‍ය නොවන වත්කම් හි හානිකරණය

සෑම වාර්තාකරණ දිනකටම අදාළව මූල්‍ය නොවන වත්කම් හි හානිකරණය හා සම්බන්ධ වන සංඥාවන් පිළිබඳව බැංකුව තක්සේරු කරනු ලැබේ. එවන් සංඥාවක් පවතින විට දී හෝ හානිකරණය පිළිබඳව පරීක්ෂාවක් අවශ්‍ය විටක දී එම මූල්‍ය නොවන වත්කම් යළි අයකර ගැනීමේ ශක්‍යතාවය පිළිබඳව සළකා බැලේ. වත්කම් නැවත අයකර ගත හැකි අගය වනුයේ වත්කම භාවිතයේ පවතින වටිනාකම සහ එහි මුදල් ජනනය කරන ඒකකයන්ගේ සාධාරණ අගයෙන් විකුණුම් වියදම් ඉවත් කළ පසු අගය යන දෙකෙහි උපරිම අගයයි. වත්කමේ ධාරණ අගය එහි නැවත අයකර ගැනීමේ අගය ඉක්මවන විට, එය හානිකරණයට ලක් වූ ලෙස සලකා වත්කම නැවත අයකර ගත හැකි අගයට ගිණුම්වල ගලපනු ලැබේ. භාවිතයේ පවතින වටිනාකම ගණනයේ දී, වත්කමට බද්ධ වන අවදානම සහ වෙළඳපළ තක්සේරුව මත මුදලේ කාලානුරූපී වටිනාකම ඇර්ථ නිරූපනය කෙරෙන බදු පෙර වට්ටම් අනුපාතය භාවිතයෙන් තක්සේරුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ඇත. විකුණුම් පිරිවැය සාධාරණ අගයෙන් අඩුකර තීරණය කිරීමේදී ඒ සඳහා සුදුසු තක්සේරු ආකෘතීන් භාවිතා කෙරේ. මෙම තක්සේරුකරණයන් බහුවිධ තක්සේරු ක්‍රම, ප්‍රසිද්ධියේ විකිණෙන පරිපාලිතයන්ගේ ලැයිස්තු ගත කොටස් මිල හෝ අනෙකුත් වටිනාකම් ඇති සාධාරණ මිලක් පෙන්වන සංඥාවක් මඟින් තව දුරටත් තහවුරු කෙරේ.

4.6 භාරකාර සේවා

ගනුදෙනුකරුවන් වෙනුවෙන් වත්කම් රඳවා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස සමූහය විසින් භාරකාර සේවා සපයනු ලැබේ. භාරකාරත්වයේ පවතින වත්කම් සමූහය මඟින් පාලනය නොකරන නිසා සහ සමූහය එම වත්කම් වල ප්‍රතිලාභ ලබාගන්නා අයිතිකරු නොවන නිසා එම වත්කම් සමූහයේ මූල්‍ය ප්‍රකාශවල හඳුනා නොගැනේ.

4.7 ප්‍රතිපාදනයන්

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වර්තමානයේ දී නෛතික හෝ සම්මුතික වගකීමක් ඇති වූ විට දී එම වගකීම නිවැරදිව තක්සේරුගත කල හැකි නම් සහ අදාළ වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභයන්හි පිටතට ගලා යාමක් සිදුවන බවට අපේක්ෂාවක් වේ නම් ඒ සඳහා ප්‍රතිපාදනයන් වෙන් කෙරේ. ප්‍රතිපාදන වටිනාකම තීරණය කිරීමේදී වාර්තාකරණ දිනට පවතින වගකීම් පියවීමට අවශ්‍ය වඩාත් යෝග්‍යතම අගය ඇස්තමේන්තු

කරන අතර එහිදී අදාළ සිද්ධිය සිදුවීමට ඇති අවිනිශ්චිතතාව හා අවදානම සැලකිල්ලට ගනු ලැබේ. ප්‍රතිපාදන තීරණය කිරීමේදී වර්තමාන වගකීම පියවීමට අවශ්‍ය මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කරනු ලබයි නම්, එහිදී අදාළ මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය මත පදනම්ව ධාරණ අගය තීරණය කරයි. භාරදූර ගිවිසුම් සඳහා ප්‍රතිපාදනයන් කරනු ලබන්නේ අදාල ගිවිසුමෙන් සමූහයට ලැබෙන අපේක්ෂිත ප්‍රතිලාභ එම ගිවිසුම් ඉටු කිරීමේදී දැරීමට සිදු වන නොවැලැක්විය හැකි පිරිවැයට වඩා අඩු නම් පමණි. අදාල ගිවිසුම අත්හිටුවීමට සිදුවුවහොත් එහිදී දැරීමට සිදුවන පිරිවැය හා ගිවිසුම අඛණ්ඩව පවත්වාගෙන යාමට දැරිය යුතු අපේක්ෂිත ශුද්ධ පිරිවැය යන දෙකෙහි වර්තමාන අගයන්ගේ අඩු අගය ප්‍රතිපාදනය ලෙස හඳුනාගනු ලැබේ.

4.8 ආදායම් බදු වියදම හා අනෙකුත් බදු

GRI 207-1, 2

4.8.1 ආදායම් බදු වියදම

ආදයම් බදු, ප්‍රවර්තන බදු සහ විලම්බිත බදු යන කොටස් දෙකකින් සමන්විත වේ. විස්තරාත්මක තොරතුරු සටහන 18 යටතේ දක්වා ඇත.

4.8.2 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද (VATFS)

එකතු කළ අගය මත බද්ද සඳහා පදනම වන්නේ සේවක පාරිශ්‍රමික හා බදු පෙර ලාභයට නියම කර ඇති ආකාරයට ක්ෂය ගැලපීමෙන් පසු ලැබෙන ලාභයයි. 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත හා ආනුෂාංගික සංශෝධන අනුව වර්ෂය තුල සමූහයේ මුළු එකතු කළ අගය මත 18% ක බද්දකට යටත් වේ. එසේම සමූහය "වටිනාකම ආරෝපිත ක්‍රමය" යටතේ මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු ගණනය කෙරේ.

2025 අංක 04 දරණ සංශෝධිත එකතු කළ අගය මත බදු පනතට අනුව, සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) ක්‍රමය 2025 ඔක්තෝබර් 1 වන දින සිට අහෝසි කරන ලද අතර අවදානම් පදනම් කරගත් ආපසු ගෙවීමේ ක්‍රමයක් (RBRS) ශ්‍රී ලංකා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, කලින් SVAT යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වී සිටි ගනුදෙනුකරුවන් සාමාන්‍ය VAT ලියාපදිංචි පුද්ගලයින් ලෙස සලකනු ලබන අතර 18% ක අනුපාතයකින් අය කරනු ලැබේ.

4.8.3 බෝග රක්ෂණ බද්ද (CIL)

2013 අංක 12 දරණ මුදල් පනත යටතේ බෝග රක්ෂණ බද්ද 2013 අප්‍රේල් 1 දින සිට බලපැවැත්වෙන අතර බදු අය කිරීමෙන් පසු ලාභයෙන් 1% ක බද්දක් ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය වෙත ගෙවිය යුතු වේ.

4.8.4 සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL)

2022 අංක 25 දරණ සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතට අනුව, 2022 ඔක්තෝම්බර් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය සේවා සඳහා එකතු කල අගය මත 2.5% ක ප්‍රමාණයක සහ මූල්‍ය නොවන සේවා පිරිවැටුම මත 2.5% ක ප්‍රමාණයක් සමාජ ආරක්ෂණ දායකත්ව බදු ලෙස ගණනය කරනු ලැබේ.

2025 අංක 24 දරන සංශෝධිත සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ විධිවිධානවලට අනුකූලව, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ IIIA පරිච්ඡේදය යටතේ ශ්‍රී ලංකාව තුළ මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපාරය කරගෙන යන ඕනෑම පුද්ගලයෙකුගේ මූල්‍ය සේවා 20.5% ක අනුපාතයකින් බද්දකට යටත් වූ අතර 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතට විධිමත් සංශෝධන බලපැවැත්වීමත් සමඟ එවැනි මූල්‍ය සේවා සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් නිදහස් කර ඇත.

4.8.5 බැංකුව, පරිපාලිත සමාගම් සහ ආශ්‍රිතයන් විසින් බෙදා හරින ලද ලාභාංශ මත අත්තිකාරම් ආදායම් බද්ද (AIT)

බැංකුව විසින් බෙදා හරින ලාභාංශ මත අත්තිකාරම් ආදායම් බද්ද

බැංකුව එහි එකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජයට ලාභාංශ බෙදා දෙනු ලබයි. 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ තුන්වන උපලේඛනය අනුව සහ එහි සංශෝධනවලට අනුව, ශ්‍රී ලංකා රජය විසින් ව්‍යුත්පන්න කරන ලද මුදල් ආදායම් බද්දෙන් නිදහස් කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා රජයට කරන ලද ලාභාංශ ගෙවීම් මත අත්තිකාරම් ආදායම් බද්දක් අඩු නොවේ.

පරිපාලිත සමාගම් සහ ආශ්‍රිතයන් විසින් බෙදා හරින ලද ලාභාංශ මත අත්තිකාරම් ආදායම් බද්ද (AIT)

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත සහ එහි සංශෝධනයන්ට අනුව, පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් විසින් බෙදාහරින ලද ලාභාංශ (ලැබුණු ලාභාංශයෙන් ගෙවන ලද ලාභාංශ හැර) 15% ක අනුපාතයකට ලාභාංශ මත අත්තිකාරම් ආදායම් බද්ද (AIT) සඳහා යටත් අතර එය අවසාන බද්දක් විය යුතුය.

5 රක්ෂණ ව්‍යාපාරය

5.1 ප්‍රතිරක්ෂණය

මෙමඟින් සමූහය සිය සියලු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සමඟ බැඳි රක්ෂණ අවදානම පැවරීමකට ලක්කරන අතර ප්‍රතිරක්ෂණ වත්කම මඟින් ප්‍රතිරක්ෂණ සමාගම් වෙතින් ලැබිය යුතු ශේෂයන් නිරූපණය වේ. ප්‍රතිරක්ෂණය මඟින් ලැබිය යුතු ප්‍රමාණය තීරණයේ දී ප්‍රතිරක්ෂණ ගිවිසුම් සහ බැඳි හිමිකම්පෑම් සඳහා වන ප්‍රතිපාදන සහ ගෙවා නිමකල හිමිකම් සැලකිල්ලට භාජනය කරනු ඇත. වාර්තාකරණ වර්ෂය තුළ සංඥාවක් ලද විට හෝ වාර්තාකරණ දිනයේ දී හෝ ප්‍රතිරක්ෂණ වත්කම්වල හානිකරණය පිළිබඳව සමාලෝචනයකට ලක්කරනු ලැබේ. ප්‍රතිරක්ෂණ වත්කමෙහි මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව සිදු වන ලද යම් සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රතිරක්ෂණය මඟින් ලැබිය යුතු මුදල් නොලැබී යාමේ විෂයානුබද්ධ සාක්ෂියක් සපයනු ලබන විට හානිකරණයක් සිදු ව ඇති බවට නිගමනය කෙරේ. එය ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිරක්ෂණය කරන ලද හෝ කිරීමට බලාපොරොත්තු වන ගිවිසුම්වලට අදාල වාරික ලැබීම් හා හිමිකම් වල දළ පදනම මත වාර්තා කරනු ලැබේ. ගිවිසුම් ගත අයිතිය නිම වූ පසු හෝ වෙනත් පාර්ශ්වයකට පැවරූ පසු ප්‍රතිරක්ෂණ වත්කම හෝ වගකීම බැහැර කිරීම සිදු වේ.

5.2 ලැබිය යුතු රක්ෂණ

ලැබිය යුතු රක්ෂණයන් උපචිත වූ විට හඳුනා ගැනෙන අතර මූලික හඳුනා ගැනීමේ දී ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය මත ගිණුම් ගත කෙරේ. ධාරණ අගය ගත නොහැකි බවට යම් සිද්ධියක් හෝ අවස්ථාවක් සංඥාවන් සපයන විට දී, ලැබිය යුතු රක්ෂණයන්හි ධාරණ අගයෙහි හානිකරණය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

පිළිබඳව සලකා බැලේ. එසේ හානිකරණ අලාභයක් වේ නම් එය ලාභ හෝ පාඩු ප්‍රකාශයෙහි හඳුනාගනී.

5.3 විලම්බිත වියදම්

5.3.1 විලම්බිත අත්පත් කර ගැනීමේ පිරිවැය (DAC)

නව ව්‍යාපාර අත්පත්කර ගැනීම සඳහා දරන කොමිස්, ප්‍රතිරක්ෂණය, අලෙවිකරණ, ගිවිසුම් නිකුත් කිරීමේ පිරිවැය වැනි පිරිවැයන් නව ව්‍යාපාර හෝ අභිමතය පරිදි සහභාගී වීමේ විශේෂාංග සහිත ආයෝජන ගිවිසුම්වල අනාගත වාරික වලින් ආවරණය කරගත හැකි ආකාරයට විලම්බිත කෙරේ. අනෙකුත් සියළු අත්පත් කර ගැනීමේ වියදම් ඒවා දරන අවස්ථාවේදීම වියදම් ලෙස වාර්තා කෙරේ.

මූලිකව හඳුනා ගැනීමෙන් පසුව සාමාන්‍ය රක්ෂණ සඳහා විලම්බිත අත්පත් කරගැනීමේ පිරිවැය නොඉපයූ වාරික ක්‍රමක්ෂය කරනු ලබන කාල පදනමට ක්‍රමක්ෂය කරනු ලැබේ. ප්‍රතිරක්ෂණකරුවන්ගේ විලම්බිත අත්පත්කර ගැනීම් පිරිවැය කොටස අදාල වත්කම ක්‍රමක්ෂය කරන ආකාරයටම ලාභ හෝ අලාභ ප්‍රකාශනයට වාර්තා කෙරේ.

වත්කමට අදාලව අපේක්ෂිත ඵලදායි ජීවකාලයේ හෝ අනාගත ප්‍රතිලාභ ලැබීමේ රටාවේ වෙනස් වීමක්, ක්‍රමක්ෂය කාලපරිච්ඡේදය වෙනස් කිරීම් මඟින් ගිණුම්ගත කරන අතර එය ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස් වීමක් ලෙස සලකනු ලැබේ. ගිවිසුම් අවසන් වීම හෝ අවලංගු කිරීමකදී විලම්බිත අත්පත්කර ගැනීමේ පිරිවැය ඉවත්කරනු ලැබේ.

5.4 ප්‍රතිරක්ෂණ කොමිස්

පිටස්තර ප්‍රතිරක්ෂණ ගිවිසුම මත ලැබිය යුතු කොමිස් එම ප්‍රතිරක්ෂණ ගිවිසුම් කාලයට අදාලව විලම්බනය සහ ක්‍රමක්ෂය කරනු ලැබේ.

5.5 ආයෝජන ගිවිසුම් වගකීම්

ආයෝජන ගිවිසුම් අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (අ.ස.ල.) සහිත හා රහිත ගිවිසුම් ලෙස වර්ගීකරණය කරයි. අ.ස.ල. සහිත ආයෝජන ගිවිසුම් වගකීම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ජීවිත රක්ෂණ ගිවිසුම් වගකීම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සමාන වේ.

අ.ස.ල. රහිත ආයෝජන ගිවිසුම් වගකීම් හඳුනා ගනු ලබන්නේ ගිවිසුමට ඇතුලත් වූ පසු සහ වාරිකය අය කිරීමෙන් පසුවය. මෙම වගකීම් මූලිකවම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර මෙම සාධාරණ අගය වන්නේ ගිවිසුම නිකුත් කෙරෙන ගනුදෙනු මිලයි. එම ගනුදෙනු මිල සඳහා සෘජුවම ආරෝපිත කල හැකි ගනුදෙනු පිරිවැය ඇතුලත් නොවේ. ආයෝජන ගිවිසුම් වගකීම මූලිකව හඳුනා ගැනීමෙන් අනතුරුව එය ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මනිනු ලැබේ.

තැන්පතු හා නැවත ගැනීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වගකීම්වලට ගැලපුමක් වශයෙන් සෘජුවම වාර්තා කරයි. සාධාරණ අගයට ගැලපුම් සෑම වාර්තා කරන දිනකම සටහන් කරන අතර ඒවා ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනු ලබයි. සාධාරණ අගය අනාගතය සඳහා වූ වට්ටම් කල මුදල් ප්‍රවාහ ක්‍රම භාවිතය තුළින් නිර්ණය කරනු ලබයි. ඒකක ගත ගිවිසුම් සඳහා සාධාරණ අගය ගණනය කරනුයේ සෑම ඒකකයකම ඔප්පු හිමියන් සඳහා ඇති ඒකක ගණන එම අරමුදල වාර්තාකරණ දිනයේ දී ඇති ඒකක මිලෙන් වැඩි කිරීම මඟින්ය. වාර්තාකරණ දිනයට ඒකක මිල තීරණය කිරීම සඳහා යොදා ගනු ලබන අරමුදල්මය වත්කම් සහ වගකීම්වල පදනම රඳා පවතින්නේ ඒවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දැක්වෙන අගයට විලම්බිත බදු සහ උපචිත නොවූ ලාභ වෙනුවෙන් වන ගැලපීම් සිදු කළ පසු අගයයි. ඒකක ගත නොවූ ගිවිසුම් ද අනතුරුව සාධාරණ අගයට පවත්වාගෙන යනු ලබන අතර ඒවා වට්ටම් ගත මුදල් ප්‍රවාහ හා අනුමානගත ආකෘති යන තක්සේරු ක්‍රම භාවිතය මඟින් නිර්ණය කරනු ලබයි. මෙම ආකෘතිවල වලංගු භාවය, ක්‍රමාංකිත බව සුදුසුකම් සහිත ස්වාධීන පුද්ගලයෙකු විසින් කලින් කල ඇගයීම් කරනු ලබයි.

ගිවිසුම කල් පිරුණු පසුව නිදහස් කිරීමෙන් හෝ අවලංගු කිරීමක් මඟින් වගකීම් බැහැර කල යුතුය. ඔප්පු හිමියාට අවලංගු කල හැකි ගිවිසුම් සඳහා වන සාධාරණ අගය අයිතිය අත්හරින අගයට වඩා අඩු නොවිය යුතුය. ගිවිසුම් මූල්‍ය අවදානම් සංරචක සහ සැළකිය යුතු රක්ෂණ අවදානම් සංරචකවලින් සමන්විත වන අතර සහ මෙම සංරචක දෙක සඳහා වූ මුදල් ප්‍රවාහයන් එකිනෙකට වෙනස් අතර ඒවා විශ්වාසී ලෙස මිනුම්කරණය කළ හැකිය. මේ සඳහා පාදක වන වටිනාකම් කලඛයක් ලෙස නොපවතී. රක්ෂණ අවදානම් සඳහා වන අධිභාර රක්ෂණය ගිණුම් ගත කරන පදනමට සමානව ගිණුම් ගත කෙරේ.

5.6 අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (අ.ස.ල.)

අ.ස.ල. මඟින් ගිවිසුම් ගත අයිතීන් ඔප්පු හිමියන් වෙත පරිපූරක පොරොන්දු වූ ප්‍රතිලාභ වශයෙන් ඔවුන්ගේ අයිතීන් ලබාදෙනු ලබන අතර සැලකිය යුතු වැඩිපුර ප්‍රතිලාභ අ.ස.ල. කළඹ පවතින වත්කම්වල ක්‍රියාකාරිත්වය මත පදනම් වේ. 90/10 පදනම මත ඔප්පු හිමියන්ට සහ කොටස් හිමියන්ට අ.ස.ල. අරමුදලේ අතිරික්ත, කොන්දේසි ප්‍රකාරව බෙදා දිය හැකිය. මෙම අතිරික්ත ඔප්පු හිමියන් වෙත බෙදා දීමේ දී එහි වටිනාකම සහ කාලය තීරණය කිරීමේ අභිමතය සමූහය සතුය. පොරොන්දු වූ සහ අභිමතානුරූපී, වෙන්නොකළ අතිරික්ත ද ඇතුව සියලුම අ.ස.ල. වගකීම් රක්ෂණය යටතේ හෝ ආයෝජන ගිවිසුම් වගකීම් යටතේ සුදුසු ලෙස වාර්ෂිකව රඳවා තබා ගනු ලැබේ.

5.7 නොඉපැයූ වාරික මුදල් සංචිතය

නොඉපැයූ වාරික මුදල් සංචිතය නිරූපණය කරන්නේ නොඉක්ම වූ කාල සීමාව සඳහා ආවරණය වන අදාළ වාරිකවල අගයයි. නාමික නොඉපැයූ වාරික මුදල් ගණනය කර ඇත්තේ 1/24 පදනමටය.

6 නිකුත් කරන ලද නමුත් වාර්තා කරන දිනට බලාත්මක නොවන නව ගිණුම්කරණ ප්‍රමිතීන්

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද අතර ඒවා 2026 ජනවාරි 1 වැනි දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාල සීමාව සඳහා ක්‍රියාත්මක වේ. ඒ අනුව, මෙම ගිණුම් ප්‍රමිතීන් 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ කරගෙන නොමැත. සමූහයට අදාළ වන පහත ප්‍රමිති හඳුනාගෙන ඇති අතර වැඩිදුර විස්තර පහත දක්වා ඇත.

6.1 ශ්‍රී ලං.මූ.වා.ප්‍ර 17 - "රක්ෂණ ගිවිසුම්"

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 17 - "රක්ෂණ ගිවිසුම්" ප්‍රමිතියේ විෂය පථය තුළ රක්ෂණ ගිවිසුම් හඳුනා ගැනීම, මැනීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීම සඳහා මූලධර්ම ස්ථාපිත කෙරේ. ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 17 - "රක්ෂණ ගිවිසුම්" හි පරමාර්ථය වන්නේ යම් ආයතනයක් විම ගිවිසුම් විශ්වාසනීයත්වයකින් අදාළ තොරතුරු සපයන බව සහතික කිරීමයි. මෙම තොරතුරු මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට රක්ෂණ ගිවිසුම් මඟින් ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහයන් කෙරෙහි ඇති කරන බලපෑම තක්සේරු කිරීමට පදනමක් සපයයි.

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 17 - "රක්ෂණ ගිවිසුම්" 2026 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ඇරඹෙන වාර්ෂික කාල පරිච්ඡේදය බලාත්මක වේ.

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 17- "රක්ෂණ ගිවිසුම්" යොදා ගැනීම නිසා මූල්‍ය ප්‍රකාශන වලට ඇතිවිය හැකි බලපෑම සමූහය විසින් තක්සේරු කරමින් සිටි.

6.2 ශ්‍රී ලං.මූ.වා.ප්‍ර 18 - "මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම"

ශ්‍රී ලං.මූ.වා.ප 18 - "මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම" ලං.ගි.ප්‍ර. 1 - "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" ප්‍රතිස්ථාපනය කරයි. මෙම ප්‍රමිතිය 2027 ජනවාරි 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා ක්‍රියාත්මක වන අතර, කලින් භාවිතා කිරීමට අවසර ඇත.

ශ්‍රී ලං.මූ.වා.ප 18 -"මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම්" මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමේ සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවලට සැලකිය යුතු වෙනස්කම් හඳුන්වා දෙන අතර , විශේෂයෙන් පහත කරුණු ඊට ඇතුළත් වේ:

- ලාභ හෝ අලාභ ප්‍රකාශයේ ආදායම් සහ වියදම් අර්ථ දක්වා ඇති කාණ්ඩවලට (මෙහෙයුම්, ආයෝජනය සහ මූල්‍යකරණය) වර්ගීකරණය කිරීම;
- මෙහෙයුම් ලාභය ඇතුළුව, නිර්වචනය කරන ලද උප එකතුන් අනිවාර්යයෙන් ඉදිරිපත් කිරීම;
- කළමනාකරණය -නිර්වචනය කරන ලද කාර්ය සාධන මිනුම් (MPMs) සඳහා වැඩිදියුණු කළ අවශ්‍යතා;
- වැඩිදියුණු කළ එකතු කිරීමේ සහ වෙන්කර දැක්වීමේ මූලධර්ම; සහ
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ තොරතුරු කාණ්ඩගත කිරීම පිළිබඳ අමතර මග පෙන්වීම.

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 18 - "මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම" යොදා ගැනීම නිසා මූල්‍ය ප්‍රකාශන වලට ඇතිවිය හැකි බලපෑම සමූහය විසින් තක්සේරු කරමින් සිටින අතර පහත කරුණු සම්බන්ධයෙන් වඩාත්ම වැදගත් වෙනස්කම් වනු ඇතැයි අපේක්ෂා කෙරේ .

- ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 18 - "මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම්" විසින් නියම කර ඇති නව කාණ්ඩවලට අනුකූල වීම සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ ඇතැම් ආදායම් සහ වියදම් අයිතම නැවත වර්ගීකරණය කිරීම.
- අනිවාර්ය කරන ලද නව උප එකතුන් ඉදිරිපත් කිරීම;
- අදාළ වන විට, කළමනාකරණය-නිර්වචනය කරන ලද කාර්ය සාධන මිනුම් සම්බන්ධයෙන් අමතර හෙළිදරව් කිරීම්.

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 18 - "මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම්" යොදා ගැනීම වත්කම් සහ වගකීම් හඳුනා ගැනීම හෝ මැනීම කෙරෙහි බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ, නමුත් ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම් සඳහා වෙනස්කම් ඇති කරනු ඇත.

6.3 ශ්‍රී ලං.මූ.වා.ප්‍ර 9 - "මූල්‍ය උපකරණ" සහ ශ්‍රී ලං.මූ.වා.ප්‍ර 7- "මූල්‍ය උපකරණ: හෙළිදරව් කිරීම්" සඳහා සංශෝධන

මෙම සංශෝධන මඟින් නිශ්චිත කොන්දේසි වලට යටත්ව පියවීම් දිනයට පෙර ඉලෙක්ට්‍රොනික ගෙවීම් පද්ධති හරහා පියවා ඇති මූල්‍ය වගකීම් බැහැර කිරීමට ඉඩ සලසන ගිණුම්කරණ ප්‍රතිපත්ති විකල්පයක් හඳුන්වා දෙයි.

තවද මෙහි, පරිසරය, සමාජීය සහ යහපාලනය ආශ්‍රිත සහ ඒ හා සමාන විශේෂාංග සහිත මූල්‍ය වත්කම් සඳහා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ තක්සේරු කිරීම ද පැහැදිලි කරන අතර , 'ප්‍රතිලාභ නොලබන විශේෂාංග' යනු කුමක්ද යන්න නිර්වචනය කර ගිවිසුම්ගතව බැඳී පවතින උපකරණවල ලක්ෂණ ද ගෙනහැර දක්වයි.

මීට අමතරව, අසම්භාව්‍ය ලක්ෂණ සහිත මූල්‍ය උපකරණ සඳහා නව හෙළිදරව් කිරීමේ අවශ්‍යතා හඳුන්වා දී ඇති අතර, වෙනත් විස්තිර්ණ ආදායම මඟින් සාධාරණ අගයට වර්ගීකරණය කරන ලද ස්කන්ධ උපකරණ සඳහා වැඩි දියුණු කළ හෙළිදරව් කිරීම් ද හඳුන්වා දී ඇත.

මෙම සංශෝධන 2026 ජනවාරි 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා බලපැවැත්වෙන අතර බැංකුවේ / සමූහයේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති නොකරයි.

6.4 ශ්‍රී ලං.මූ.වා.ප්‍ර 19 - "මහජන වගවීමේ හෙළිදරව් කිරීම් නොමැති පරිපාලිත සමාගම්"

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර 19- " මහජන වගවීමේ හෙළිදරව් කිරීම් නොමැති පරිපාලිත සමාගම්" ශ්‍රී ලං.මූ.වා.ප්‍ර භාවිතා කිරීමේදී සුදුසුකම් ලත් පරිපාලිත සමාගම්වලට අඩු කළ හෙළිදරව් කිරීමේ අවශ්‍යතා යෙදීමට අවසර දෙයි. මෙම ප්‍රමිතිය 2027 ජනවාරි 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේද සඳහා බලාත්මක වන අතර බැංකුවේ/සමූහයේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි කිසිදු බලපෑමක් නැත. කෙසේ වෙතත්, සුදුසුකම් ලත් පරිපාලිත සමාගම්වලට ඔවුන්ගේ ස්වාධීන මූල්‍ය ප්‍රකාශනවල මෙම ප්‍රමිතිය යොදා ගත හැක.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

7 මුළු ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ආර්ථික ප්‍රතිලාභ බැංකුවට/සමූහයට ගලා ආ බවට විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කල හැකිතාක් දුරට ආදායම් හඳුනාගනු ලැබේ.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2025	2024	2025	2024
		රු. '000	රු. '000	රු. '000	රු. '000
පොළී ආදායම	8.1	496,158,958	461,113,949	504,977,909	468,786,127
ගාස්තු සහ කොමිස් ආදායම	9.1	35,697,977	30,415,561	36,255,289	30,847,506
වෙළඳපොළ ගනුදෙනුවලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	10	5,810,710	3,433,734	5,855,505	3,473,065
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම් වලින් ලත් ශුද්ධ ලාභ/(පාඩු)	11	1,581,766	1,507,537	998,484	1,714,133
මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	12	1,741,194	(3,598,692)	2,526,648	(2,892,497)
වෙනත් මෙහෙයුම් ආදායම්	13	7,632,808	(7,467,042)	8,060,752	(7,006,387)
මුළු ආදායම		548,623,413	485,405,047	558,674,587	494,921,947

8 ශුද්ධ පොළී ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

පොළී ආදායම හා වියදම සඵල පොළී අනුපාත ක්‍රමය පදනම් කර ගනිමින් ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනාගනු ලබයි.

ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සඳහන් කර ඇති පොළී ආදායම හා වියදම යටතේ පහත සඳහන් අයිතමයන් ඇතුළත් වේ.

- ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබූ මූල්‍ය වත්කම් හා වගකීම්
- ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්
- වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය වත්කම්

සඵල පොළී අනුපාතය (EIR)

සඵල පොළී අනුපාතය යනු මූල්‍ය වත්කමට හෝ වගකීමට අදාළව ජනනය වන්නා වූ හෝ ගෙවනු ලබන මුදල් ප්‍රවාහය අදාළ වත්කමේ හෝ වගකීමේ ධාරණ අගයට සමාන වීමට වට්ටම් කළ යුතු අනුපාතය වේ. මෙම සඵල පොළී අනුපාතය ගණනය කරන විට මූල්‍ය උපකරණ තුළ සියළුම ගිවිසුම්ගත කොන්දේසි සලකා බලා මුදල් ප්‍රවාහය තක්සේරු කරයි.

මූල්‍ය උපකරණ අත්පත් කර ගැනීමේදී අදාළ වන වට්ටම් හෝ අධිභාරයන්, ගනුදෙනු පිරිවැය සහ ගෙවූ හෝ ලද ගාස්තු සඵල පොළී අනුපාතය ගණනය කිරීමේ දී එහි ඇතුළත් වේ. ගනුදෙනු පිරිවැය තුළ මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීමට සම්බන්ධ සෘජුවම ගතහැකි වර්ධන වියදම් ඇතුළත් වේ.

ණය හානිකරණය වූ මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහය ඇස්තමේන්තු ඇසුරෙන් හානිකරණය ගැලපූ සඵල පොළී අනුපාතය ගණනය කරනු ලබයි.

ණය අවදානම හැර වෙනත් හේතූන් මත මූල්‍ය වත්කම් මත අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් සංශෝධනය කරනු ලැබේ නම් පොළී ආදායමට හෝ ආදායම් ප්‍රකාශයේ සමාන ආදායමට ගැලපීම මගින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම්වල වටිනාකමට ගැලපීම සිදු කෙරේ.

8.1 පොළී ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	5,078,655	3,364,183	5,078,655	3,364,183
බැංකුවල ඇති තැන්පතු	2,795,195	4,095,404	2,885,931	4,435,574
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	3,575,702	2,243,462	3,481,708	2,150,336
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	1,719,754	1,914,923	1,722,241	1,917,552
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්				
ණය හා අත්තිකාරම්	242,979,456	251,400,593	250,682,002	256,731,662
ණය සහ වෙනත් උපකරණ	237,078,376	194,714,182	238,180,415	196,777,645
වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	2,931,820	3,381,202	2,946,957	3,409,175
මුළු පොළී ආදායම	496,158,958	461,113,949	504,977,909	468,786,127

ණය සහ අත්තිකාරම් මත පොළී ආදායම තුළ 2025 වර්ෂය සඳහා රු. මිලියන 3,661.7 (2024: රු. මිලියන 2,855.9) ක හානිකරණය වූ ණය මත පොළිය ඇතුලත් වේ.

8.2 පොළී වියදම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
බැංකුවලට ගෙවිය යුතු	67,325	159,496	80,410	165,403
ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	13,880,177	9,536,232	13,786,183	9,443,106
ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම්				
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	260,608,444	272,025,052	264,060,604	275,360,550
වෙනත් ණය ගැනීම්	4,214,408	2,533,456	4,788,118	2,818,388
යටත් කාලීන වගකීම්	10,452,183	9,307,253	10,419,390	9,270,880
මුළු පොළී වියදම	289,222,537	293,561,489	293,134,705	297,058,327
ශුද්ධ පොළී ආදායම	206,936,421	167,552,460	211,843,204	171,727,800

8.3 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්වලින් ලද ශුද්ධ පොළී ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
පොළී ආදායම	244,568,302	201,730,942	244,723,333	201,779,444
අඩු කළා: පොළී වියදම	13,880,177	9,536,232	13,786,183	9,443,106
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්වලින් ලද ශුද්ධ පොළී ආදායම	230,688,125	192,194,710	230,937,150	192,336,338

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

9 ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහය විසින් පුළුල් පරාසයක සේවා සැපයීම මඟින් ලබා ගන්නා ලද ගාස්තු සහ කොමිස්, ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම තුළ අන්තර්ගත වේ. එම ආදායම පහත පරිදි ප්‍රධාන අංශ දෙකක් යටතේ වර්ග කළ හැකිය.

(i) යම් නිශ්චිත කාලයක් පුරා ලබා දී ඇති සේවා වෙනුවෙන් උපයාගන්නා ලද ගාස්තු හා කොමිස් ආදායම

යම් නිශ්චිත කාලයක් පුරා සේවා සැපයීම වෙනුවෙන් ලබාගන්නා ලද ගාස්තු හා කොමිස් එම කාලය පුරාම උපචිත පදනම යටතේ හඳුනාගනු ලබයි. මෙහි කොමිස් ආදායම් සහ පුද්ගලික ධනය හා වත්කම් කළමනාකරණ ගාස්තු, භාරකාරත්ව සේවා, වෙනත් කළමනාකරණ සේවා හා උපදේශන ගාස්තු අන්තර්ගත වේ.

(ii) නිශ්චිත ගනුදෙනුකාර සේවාවන් ඉටුකිරීම සම්බන්ධයෙන් උපයන ගාස්තු හා කොමිස් ආදායම

කොටස් සහ වෙනත් සුරැකුම් මිලදී ගැනීමේ ගනුදෙනු වලට සහභාගී වීම, ව්‍යාපාර මිල දී ගැනීමේ හෝ විකිණීමේ ගිවිසුම් වැනි ක්‍රියාවන් වලට අදාළ කාර්යය සම්පූර්ණ කළ පසු අදාළ ගාස්තු හා කොමිස් ආදායම හඳුනාගනු ලබයි.

සේවා ලබා ගැනීම වෙනුවෙන් දරනු ලබන ගාස්තු හා කොමිස් වියදම් උපචිත පදනමට හඳුනා ගනු ලබයි.

9.1 ගාස්තු සහ කොමිස් ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
වෙළඳ සේවා	3,077,063	3,204,363	3,077,063	3,204,363
හර කාඩ්පත් හා ණය කාඩ්පත් සම්බන්ධිත සේවා	17,199,290	14,565,617	17,200,477	14,567,504
සංචාරක හා ප්‍රේෂණ සේවා	3,065,675	2,924,881	3,065,675	2,924,881
භාරකාරත්ව සේවා	151,486	135,458	151,486	135,458
ශාඛා බැංකු සේවා	8,868,013	6,822,701	9,166,119	6,991,428
ඇපකර සම්බන්ධිත සේවා	1,572,019	1,647,426	1,573,222	1,647,855
වෙනත් මූල්‍ය සේවා	1,764,431	1,115,115	2,021,247	1,376,017
මුළු ගාස්තු සහ කොමිස් ආදායම	35,697,977	30,415,561	36,255,289	30,847,506

9.2 ගාස්තු සහ කොමිස් වියදම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
හර කාඩ්පත් හා ණය කාඩ්පත් සම්බන්ධිත සේවා	11,632,575	8,923,346	11,633,106	8,924,300
සංචාරක හා ප්‍රේෂණ සේවා	330,379	289,236	330,379	289,236
ශාඛා බැංකු සේවා	541,528	477,139	541,528	477,139
ඇපකර සම්බන්ධිත සේවා	36,174	27,689	37,068	28,260
වෙනත් මූල්‍ය සේවා	60,213	85,124	147,303	126,931
මුළු ගාස්තු සහ කොමිස් වියදම	12,600,869	9,802,534	12,689,384	9,845,866
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	23,097,108	20,613,027	23,565,905	21,001,640

10 වෙළඳපල ගනුදෙනු වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වෙළඳපල ගනුදෙනු වලින් ලැබූ විදේශ විනිමය ලාභ හෝ පාඩු, ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ වෙළඳපල අගයට තක්සේරු කිරීමෙන් ලැබූ ලාභ හෝ පාඩු සහ වෙළඳපල ගනුදෙනු සඳහා ඇති ස්කන්ධයන් මත ලාභාංශ මේ යටතේ දක්වා ඇත.

ලාභාංශ ලබා ගැනීමට සමූහයට ඇති අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම හඳුනා ගනු ලබයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
විදේශ විනිමය				
බැංකුවලින්	-	-	42,997	39,331
ගනුදෙනුකරුවන්ගෙන් හා වෙනත්	5,795,353	3,365,983	5,795,353	3,365,983
ස්කන්ධයන්				
ලාභාංශ ආදායම	15,357	67,751	17,155	67,751
වෙළඳපළ ගනුදෙනුවලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	5,810,710	3,433,734	5,855,505	3,473,065

11 ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම් වලින් ලත් ශුද්ධ ලාභ/(පාඩු)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම් වලින් ලත් ශුද්ධ ලාභ/(පාඩු) වල අන්තර්ගත වන්නේ ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ ස්කන්ධ ආයෝජනයන්ගේ සහ ණය උපකරණ වල සාධාරණ අගයේ වෙනස් වීම මත වන උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
වෙළඳපල අගයට වාර්තා කල ලාභ/(පාඩු)				
ස්ථාවර ආදායම් ලැබෙන සුරැකුම්	(72,826)	(23,745)	(631,136)	29,862
ස්කන්ධයන්	234,053	696,513	210,607	847,547
වේකක භාර	1,420,539	834,769	1,419,013	836,724
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය උපකරණයන් ගෙන් ලත් ශුද්ධ ලාභ/(පාඩු)	1,581,766	1,507,537	998,484	1,714,133

12 මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල, ක්‍රමක්ෂය පිරිවැයට සහ වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කල ණය උපකරණ විකිණීමෙන් ලද ලාභ හෝ පාඩු සහ ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ ස්කන්ධයන් විකිණීමෙන් ලද ලාභ හෝ පාඩු සහ ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර (SLISBs) වල ප්‍රාග්ධන අලාභය මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු) යටතේ දැක්වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
හඳුනාගැනීම:				
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට	486,521	160,152	537,434	178,227
ක්‍රමක්ෂය පිරිවැයට	-	(4,999,545)	3,164	(5,087,161)
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට	1,254,673	1,240,701	1,986,050	2,016,437
මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	1,741,194	(3,598,692)	2,526,648	(2,892,497)

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

13 වෙනත් මෙහෙයුම් වලින් ලද ශුද්ධ ආදායම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ලාභාංශ ආදායම

ලාභාංශ ලබා ගැනීමට බැංකුවට හෝ සමූහයට ඇති අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම හඳුනා ගනු ලබයි.

මූල්‍ය නොවන වත්කම් විකිණීමෙන් ලද ලාභ/(පාඩු)

දේපළ, පිරියත හා උපකරණ සහ පරිපාලිත හා ආශ්‍රිත සමාගම් වල ආයෝජන ඇතුළුව වෙනත් ජංගම නොවන වත්කම් බැහැර කිරීමට අදාළ ලැබීම් වලින් ඒවායේ ධාරණ අගය සහ අදාළ විකුණුම් වියදම් අඩුකර ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ගිණුම්ගත කෙරේ.

විදේශ විනිමය ආදායම

විදේශ විනිමය වත්කම් හා වගකීම් සෑම වාර්තා කරන දිනයකම නැවත අගය කරනු ලබයි. මෙම වත්කම් හා වගකීම් වල සාධාරණ අගයන් වෙනස් වීම ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ අදාළ කාලපරිච්ඡේදය තුළදී හඳුනා ගනු ලබයි.

කුලී ආදායම

කුලී ආදායම උපචිත පදනම යටතේ හඳුනා ගනී. බැංකු පරිශ්‍රය කුලියට දීමෙන් ලැබූ ආදායම, සුරක්ෂිතාගාර වලින් ලද ආදායම වැනි ආදායම් මෙහි අන්තර්ගතවේ.

දළ රක්ෂණ වාරික

අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (අ.ස.ල.) සමඟ ඇති ජීවිත සහ ආයෝජන ගිවිසුම්වල දළ රක්ෂණ වාරික ඔප්පු හිමියන්ගෙන් ලැබිය යුතු විට ඒවා ආදායම් ලෙස හඳුනා ගනී. වික් වාරිකයක් පමණක් ලැබෙන ගනුදෙනුවල ආදායම හඳුනා ගනු ලබන්නේ ඔප්පුව බල සහිත වන දිනය දීය.

දළ සාමාන්‍ය රක්ෂණ වාරික මුදල් සමන්විත වන්නේ ගිණුම්කරණ කාලය තුළ දී ගිවිසුමට එළඹෙන විට ලැබිය යුතු මුළු ගිවිසුම් කාලය සඳහාම අදාළ වාරික මුදල්ය. එය ගිවිසුම ආරම්භ වන දිනයේදීම හඳුනා ගනු ලැබේ.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2025	2024	2025	2024
		රු. '000	රු. '000	රු. '000	රු. '000
වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම් වලින් ලද ලාභාංශ ආදායම්		496,694	374,073	560,149	384,988
පරිපාලිතයන්ගෙන් ලද ලාභාංශ ආදායම්		417,967	437,113	-	-
ආශ්‍රිතයන්ගෙන් ලද ලාභාංශ ආදායම්		54,519	8,054	-	-
විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභ/(පාඩු)		5,398,058	(9,004,991)	5,398,058	(9,004,991)
දේපළ, පිරියත හා උපකරණ විකිණීමේ ලාභ/(පාඩු)		1,163	15,669	59,772	24,029
අත්පත් කරගත් දේපළ විකිණීමෙන් ලද ලාභ/(පාඩු)		279,650	5,731	279,650	5,731
කුලී ආදායම		309,845	263,856	252,820	176,030
සේවා ආදායම		-	-	702,762	767,024
රත්‍රන් විකිණීමෙන් ලද ලාභය		15,998	9,322	15,998	9,322
විවිධ ආදායම්		467,527	423,714	352,301	285,954
දළ රක්ෂණ වාරික		-	-	247,855	345,109
ඉස්ලාමීය බැංකුකරණයෙන් ලද ශුද්ධ ආදායම	13.1	191,387	417	191,387	417
මුළු වෙනත් මෙහෙයුම් වලින් ලද ශුද්ධ ආදායම		7,632,808	(7,467,042)	8,060,752	(7,006,387)

13.1 ඉස්ලාමීය බැංකුකරණයෙන් ලද ශුද්ධ ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව/සමූහය 2025 රු. '000	2024 රු. '000
ඉස්ලාමීය බැංකුකරණ මෙහෙයුම්වලින් ලද ආදායම	374,218	200,605
අඩුකළා: ආයෝජකයන්ට ගෙවූ ලාභ	182,831	200,188
ඉස්ලාමීය බැංකුකරණයෙන් ලද ශුද්ධ ආදායම	191,387	417

14 ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා හානිකරණ ප්‍රතිපාදන/(ප්‍රතිවර්තය) කිරීම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මූල්‍ය වත්කම් සඳහා වූ හානිකරණයට අදාළ වෙන් කිරීම් වල වෙනස්වීම බැංකුව හා සමූහය විසින් ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" වලට අදාළව හඳුනා ගනී. මෙයට අදාළ විස්තරාත්මක සටහන ''ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්'' (සටහන 28) යටතේ දක්වා ඇත. තවද බැංකුව හෝ සමූහය විසින් මූල්‍ය නොවන වත්කම් සඳහා හානිකරණයන් වෙතොත් එයද හඳුනා ගනී. එම හානිකරණය හඳුනා ගනු ලබන්නේ ලං.ගි.ප්‍ර. 36 - "වත්කම් හානිකරණය" ප්‍රමිතිය ට අනුව ධාරණ අගය වත්කමේ නැවත අයකර ගත හැකි අගයට වඩා වැඩි නම් පමණි.

ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වර්ෂය තුළ හඳුනාගත් මූල්‍ය වත්කම් වලට අදාළ අපේක්ෂිත ණය හානිය සහ වෙනත් වත්කම් මත හානිකරණ ප්‍රතිපාදන පහත වගුවේ දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව 2025 අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000	සමූහය 2025 අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	22.2	28,843	-	-	28,843	28,843	-	-	28,843
බැංකුවල ඇති තැන්පතු	24.2	(7,659)	-	-	(7,659)	(7,659)	-	-	(7,659)
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්	28.2	12,223,930	6,087,181	2,353,556	20,664,667	12,211,430	6,078,280	2,282,830	20,572,540
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ	29.3	1,953,442	(274,421)	-	1,679,021	1,953,442	(274,421)	-	1,679,021
වෙනත් අලාභ	38.1	-	(1,255,094)	-	(1,255,094)	-	(1,255,094)	-	(1,255,094)
ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ ප්‍රතිපාදන /(ප්‍රතිවර්තය) කිරීම් එකතුව		14,198,556	4,557,666	2,353,556	21,109,778	14,186,056	4,548,765	2,282,830	21,017,651

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව 2024 අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000	සමූහය 2024 අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	22.2	418,479	-	-	418,479	418,479	-	-	418,479
බැංකුවල ඇති තැන්පතු	24.2	(22,385)	-	-	(22,385)	(22,385)	-	-	(22,385)
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්	28.2	3,385,060	(3,735,358)	12,776,669	12,426,371	3,367,623	(3,746,796)	12,704,510	12,325,337
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ	29.3	5,684	(36,199,145)	-	(36,193,461)	5,684	(36,374,221)	-	(36,368,537)
පරිපාලිත සමාගම්වල ආයෝජන	31.2	100,736	-	-	100,736	-	-	-	-
වෙනත් අලාභ	38.1	-	2,927,101	-	2,927,101	-	2,927,101		2,927,101
ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ ප්‍රතිපාදන /(ප්‍රතිවර්තය) කිරීම් එකතුව		3,887,574	(37,007,402)	12,776,669	(20,343,159)	3,769,401	(37,193,916)	12,704,510	(20,720,005)

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

15 සේවක මණ්ඩල වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සේවක පාරිශ්‍රමික, නිශ්චිත දායකත්ව හා ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය හා සේවක මණ්ඩලය සඳහා දරනු ලබන වෙනත් වියදම් සේවක මණ්ඩල වියදම් යටතේ ඇතුළත් වේ. කෙටිකාලීන සේවක ප්‍රතිලාභ වට්ටම් කිරීමෙන් තොරව එම සේවාව ලැබූ කාලච්ඡේදයට අදාළව හඳුනා ගනු ලබයි. සේවකයින්ට ලබා දෙන ඉදිරියේ දී ගෙවීමට අපේක්ෂා කරන කෙටිකාලීන ප්‍රසාද දීමනා වගකීමක් ලෙස හඳුනා ගනු ලබන්නේ අතීතයේ සැපයූ සේවාවන් වෙනුවෙන් සේවකයාට එම මුදල ගෙවීමට නීතිමය හෝ සාධනීය වගකීමක් ඇත්නම් හා එම වගකීම විශ්වාසවන්තභාවයකින් ඇස්තමේන්තු කළ හැකි නම් පමණි.

අභ්‍යන්තර හා බාහිර නීති හා රෙගුලාසිවලට අනුකූලව සේවකයා විසින් නිශ්චිත ප්‍රතිලාභ හා දායකත්ව සැලසුම් සඳහා අරමුදල් දායකත්වය සැපයීමට හැකිය.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා කරන ලද වෙන් කිරීම්වලට අදාළ වියදම් හා ආදායම් ආයුගණක තක්සේරුවක් මඟින් ලං.ගි.ප්‍ර. 19 "සේවක ප්‍රතිලාභ" ප්‍රමිතියට අදාළව ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලබයි.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
සේවක පාරිශ්‍රමික		34,977,291	31,318,096	37,150,734	33,336,727
නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායකත්වය	15.1	2,845,479	2,837,603	3,061,747	3,030,639
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය	15.2	5,366,710	3,947,180	5,503,144	4,062,394
වෙනත් සේවක පිරිවැය		2,499,958	2,184,192	2,818,578	2,516,860
මුළු සේවක මණ්ඩල වියදම්		45,689,438	40,287,071	48,534,203	42,946,620

15.1 නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායකත්වය

නිශ්චිත දායකත්ව සැලසුමක් යනු පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් යටතේ ආයතනය විසින් වෙනත් පාර්ශ්වයකට දක්වන ස්ථාවර දායකත්වයයි. මෙම ස්ථාවර දායකත්ව අගය හැරුනු විට වැඩිමනත් ගෙවීමක් සඳහා වෙනත් නීතිමය හෝ වෙනත් වගකීමක් නොමැත. වාර්තා කරන කාලච්ඡේදය අවසානයට පෙර කරන ලද සේවය උදෙසා වන නිශ්චිත දායකත්ව සැලසුම් වෙනුවෙන් ආයතනය තම වගකීම මත දක්වනු ලබන නිශ්චිත දායකත්වය ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වියදමක් වශයෙන් හඳුනා ගැනේ. නියමිත දිනට පෙර ගෙවන ලද දායකත්වය එහි මුදල් ප්‍රතිගෙවීමක් හෝ ඉදිරි ගෙවීම්වල අඩුවීමක් ලෙස සලකයි නම් එය වත්කමක් ලෙස හඳුනා ගැනේ.

ලංකා බැංකුවේ අර්ථසාධක අරමුදල

බැංකුවේ සියළුම සේවකයින් ලංකා බැංකුවේ අර්ථසාධක අරමුදලේ සාමාජිකයෝ වෙති. මෙම අරමුදලට, සේවකයාගේ දළ වැටුපෙන් 12% ක මුදලක් බැංකුව විසින් දායක මුදල් වශයෙන් ගෙවනු ලබන අතර, සේවකයින්ගේ දායක මුදල 8% කි. බැංකුවේ අර්ථසාධක අරමුදල අනුමත අරමුදලක් වන අතර, එය ස්වාධීනව පරිපාලනය කෙරේ.

සේවක අර්ථසාධක අරමුදල

ලංකා බැංකු සේවකයින් හැර සියළුම පරිපාලිතයින් ඔවුන්ගේ සේවකයන් වෙනුවෙන්, 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත හා එහි සංශෝධනවලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% (ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් සහ හොටෙල්ස් කලම්බු සමාගම - 15%) ප්‍රමාණයක් දායක මුදල් ගෙවන අතර, සෑම සේවකයකුගෙන්ම සේවක අර්ථසාධක අරමුදල් සඳහා 8% (ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් සහ හොටෙල්ස් කලම්බු සමාගම - 10%) ක දායකත්වයක් දරයි. මෙම අරමුදල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබයි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත අනුව, බැංකුව සහ සියළුම පරිපාලිතයින් සේවකයින් සඳහා මෙම අරමුදලට දායක විය යුතු අතර, මාසිකව බැංකුව/සමූහය සේවකයාගේ දළ වැටුපෙන් 3% ක මුදලක් මේ සඳහා ගෙවනු ලැබේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
සේවය දායකත්වය:				
ලංකා බැංකු/සේවක අර්ථසාධක අරමුදල	2,281,376	2,274,615	2,455,358	2,433,793
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල	564,103	562,988	606,389	596,846
නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා මුළු දායකත්වය	2,845,479	2,837,603	3,061,747	3,030,639

15.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු නිශ්චිත දායකත්ව සැලසුම් නොවන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් වේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වෙත සමූහයේ ශුද්ධ වගකීම හෝ බැඳීම එක් එක් සැලසුම වෙන් වශයෙන් සලකා එම සේවකයන් විසින් ඔවුන්ගේ වර්තමාන සහ පෙර සේවාවන් උදෙසා උපයාගත් අනාගත ප්‍රතිලාභයන් වර්තමාන අගයට වට්ටම් කර, ඉන් සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය ඉවත් කල පසු අගයට ගණනය කෙරේ. වට්ටම් අනුපාතය ලෙස සලකනු ලබන්නේ වාර්තාකරණ දිනට සමූහයේ බැඳීම් වල කාලයට ආසන්න වශයෙන් සමාන කාලයක් සහිත දිගුකාලීන භාණ්ඩාගර බැඳුම්කරවල ඉපැයුම් අනුපාතයයි. මෙම ගණනය කිරීම් සුදුසුකම් ලත් ආයුගණකවරයෙකු විසින් "පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය" භාවිතයෙන් ගණනය කෙරේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්හි ගණනය කරන ලද, ලාභ හෝ අලාභ සමූහය විසින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගන්නා අතර, ඊට අදාළ වියදම්, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සේවක මණ්ඩල වියදම් යටතේ හඳුනාගනී. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් විස්තරාත්මකව "සේවක විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්" (සටහන් අංක 48) යටතේ දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව		සමූහය	
		2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
ලාභයේ හෝ අලාභයේ හඳුනාගත් ශුද්ධ වියදම්					
ලංකා බැංකුවේ විශ්‍රාම වැටුප් භාරකාර අරමුදල	48.1.1	6,433,080	5,628,990	6,433,080	5,628,990
ලංකා බැංකුවේ වැන්දඹු/වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම අරමුදල	48.2.1	30,890	(1,166,660)	30,890	(1,166,660)
විශ්‍රාම පාරිතෝෂික	48.3	233,630	174,160	354,940	274,835
ලංකා බැංකුවේ විශ්‍රාම වැටුප් අරමුදල - 2014	48.4.1	(1,644,070)	(871,480)	(1,644,070)	(871,480)
අසනීප නිවාඩු මුදල් කිරීම සඳහා ප්‍රතිපාදන	48.5	313,180	182,170	313,180	182,170
විශ්‍රාම අරමුදල - ලංකා බැංකුව (යූ කේ) සමාගම		-	-	15,124	14,539
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා මුළු දායකත්වය		5,366,710	3,947,180	5,503,144	4,062,394

16 ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වත්කම් භාවිතය සඳහා පවතින දිනයේ සිට ආර්ථික කටයුතු සඳහා වත්කම් භාවිතා කළ හැකි මට්ටම දක්වා සමූහය ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන සිදු කරයි. වත්කම විකිණීම සඳහා වර්ගීකරණය කර ඇති දිනයේ හෝ වත්කම ඉවත් කිරීමට හඳුනාගත් දිනයේ දී වත්කම් ක්ෂය කිරීම නතර කෙරේ. වත්කම සම්පූර්ණයෙන් ක්ෂය වී ඇත්නම් මිස වත්කම භාවිතයට නොගන්නා විට හෝ ක්‍රියාකාරී භාවිතයෙන් විශ්‍රාම ගිය විට ක්ෂය වීම නතර නොකෙරේ.

අස්පෘශ්‍ය වත්කම් භාවිතයට ගත හැකි දින සිට ඒවායේ පිරිවැය ක්‍රමක්ෂය කර ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය පුරාවට වෙන්කිරීම සමූහය විසින් සිදුකරයි.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව		සමූහය	
		2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
ආයෝජන දේපළ වල ක්ෂය	33	-	-	-	92,446
දේපළ පිරියත හා උපකරණ වල ක්ෂය	34	2,636,765	2,130,103	3,236,781	2,609,870
භාවිත අයිතිය සහිත වත්කම්/කල්බදු දේපළ වල ක්‍රමක්ෂය	35	1,743,972	1,553,120	814,844	1,048,365
අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය	36	642,179	511,704	680,869	557,372
මුළු ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම්		5,022,916	4,194,927	4,732,494	4,308,053

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

17 වෙනත් වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වියදම දරනු ලබන කාලපරිච්ඡේදයට අදාළව වෙනත් වියදම් ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනා ගනී. ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු සඳහා සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට ඉවහල් වන ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම සඳහා දරන ලද සියළු වියදම් සමූහයේ ලාභය ගණනය කිරීම සඳහා ආදායමෙන් අඩුකර පෙන්වනු ලබයි. අතීත සිදුවීමක් සම්බන්ධයෙන් වර්තමාන වගකීමක් බැංකුවට හෝ සමූහයට ඇති විට දී සහ එම වගකීම් පියවීමට ආර්ථික ප්‍රතිලාභ බැංකුවෙන්/සමූහයෙන් ගලා යන්නේ නම් සහ එම වටිනාකම විශ්වාසනීය ලෙස මැනිය හැකිනම් එය වියදම් ලෙස වෙන් කිරීමක් සිදුකෙරේ.

තැන්පතු සඳහා රක්ෂණ ගාස්තු

2010 ඔක්තෝබර් 1 දින සිට බලපැවැත්වෙන පරිදි බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2010 අංක 6 දරණ විධානයන්ට යටත්ව ආසන්න විගණිත මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (CAR) මත පදනම්ව සුදුසුකම්ලත් තැන්පතු වගකීම් වලින් 0.1% ක හෝ 0.125% ක ගෙවීමක් කාර්තුමය පදනමින් බැංකුව විසින් තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමයට සිදු කළ යුතුය.

ප්‍රතිරක්ෂණ වාරික, හිමිකම් හා වෙනත් ප්‍රතිලාභ

ජීවිත රක්ෂණ ගිවිසුම් සඳහා අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (අ.ස.ල) සමඟ ඇති ආයෝජන ගිවිසුම් සඳහා වන දළ ප්‍රතිලාභ සහ හිමිකම්වල ඇතුළත් වර්ෂය තුළ ජනිත වූ හිමිකම් පිරිවැයයි. මෙම පිරිවැයෙහි සැකසුම් කිරීම සහ බේරුම් කිරීම සඳහා සෘජුවම සම්බන්ධවන බාහිර සහ අභ්‍යන්තර පරිහරණය කිරීමේ පිරිවැය සහ අ.ස.ල. ගිවිසුම් සඳහා ප්‍රකාශිත ප්‍රසාද දීමනා ද, එමෙන්ම රක්ෂණයේ දළ තක්සේරුවේ සහ අ.ස.ල සමඟ ඇති අයෝජන ගිවිසුම් හිමිකම්වල සිදුවන වෙනස්වීම් ද ඇතුළත්ය. මරණ හිමිකම් සහ අයිතිය අත් හැරීම වාර්තාවන්නේ දැනුම්දීම ලැබුණු පසුයි. කල් පිරීම් සහ වාර්ෂික ගෙවීම් වාර්තා වන්නේ යථාවත් වූ විටය. අතුරු ගෙවීම් සහ අයිතිය අත්හැරීම් හිණුම්ගත වන්නේ ඒවා බේරුම් කරන විටය.

සාමාන්‍ය රක්ෂණය යටතේ වර්ෂය තුළදී සිදුවූ හෝ වාර්තා වූ හෝ වාර්තානොවූ සියළු හිමිකම්පෑම් හිමිකම් ගෙවීමට අදාල සියළු අභ්‍යන්තර සහ බාහිර සැකසීම් හා ගෙවීම් සම්බන්ධ වියදම් සහ පසුගිය වසරට අදාල හිමිකම් පෑම්ද ගලපා ඇති අතර සුන්බුන් හෝ වෙනත් ලැබීම් අඩු කර වාර්තා කරනු ලැබේ.

සෘජු සහ අභ්‍යන්තර ප්‍රතිරක්ෂණ ව්‍යාපාර ලෙස නොපිය වූ හිමිකම් වන හිමිකම් වියදම් සහ වගකීම් හඳුනා ගෙන ඇත. වගකීම් ලෙස ආවරණය වනුයේ වාර්තා කළ නමුදු තවම ගෙවා නොමැති හිමිකම්, සිදු වූ නමුදු වාර්තාකර නොමැති හිමිකම් පියවීමට අදාළ වන සෘජු සහ වක්‍ර පිරිවැයයි. නොපිය වූ හිමිකම් එක් එක් හිමිකම් පාදකව තක්සේරු කර ඇති අතර, මෙහි දී හිමිකම් නිරවුල් කිරීමේ දී ගෙවිය යුතු අවසාන පිරිවැය මත එය ඇස්තමේන්තු කර ඇත. මෙතෙක් සිදුවී ඇති එහෙත් වාර්තා නොකරන ලද හිමිකම් සඳහා වඩාත් තාත්වික ඇස්තමේන්තු කිරීමක් වෙනුවෙන් අතීත පළපුරුදු සහ ප්‍රවනතා මත ගණනය කරන ලද අනාගත බැරකම් පිළිබඳව ආයුගණකවරයෙකුගේ තක්සේරුව ලබා ගනු ලබයි.

එකී තක්සේරු හිමිකම් නිරවුල් කිරීම සඳහා වන සම්පූර්ණ වගකීම පසුව ලැබෙන තොරතුරු හා සිදුවන සිද්ධීන් මත තීරණය වුවත්, අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරන පරිදි වර්තමානයේ පවතින තොරතුරු අනුව හිමිකම් මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇත. මෙම තත්ත්වය නිසා ප්‍රතිපාදනය කරන ලද අගයක් වෙනුවෙන් සිදු කරන ගැලපීම් අදාළ කාලච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. හිමිකම් වෙනුවෙන් භාවිතා කරන ලද ක්‍රම හා ඇස්තමේන්තු නිරන්තරයෙන් සමාලෝචනය කෙරේ.

ප්‍රතිරක්ෂණ හිමිකම හඳුනාගනු ලබන්නේ එයට අදාළ දළ රක්ෂණ වගකීම ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව හඳුනාගත් විට දීය.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
අධ්‍යක්ෂ පාරිශ්‍රමික	4,975	4,502	20,736	13,846
විගණක ගාස්තු				
විගණන සේවා ගාස්තු	49,650	21,994	112,242	80,356
විගණන සේවා හා සහතික කිරීමේ සේවා සම්බන්ධ ගාස්තු සහ වියදම්	6,573	1,555	6,573	1,555
විගණන නොවන සේවා ගාස්තු	15,880	7,803	16,235	8,452
තැන්පතු රක්ෂණ ගාස්තු	3,290,128	3,237,606	3,334,085	3,275,897
වෘත්තීය හා නීති ගාස්තු	315,227	279,499	408,378	415,011
ස්ථාවර වත්කම් නඩත්තු කිරීමේ වියදම්	7,204,886	8,784,172	7,605,674	8,614,316
ප්‍රතිරක්ෂණ වාරික, හිමිකම් හා වෙනත් ප්‍රතිලාභ	-	-	445,349	270,706
කාර්යාල පරිපාලන සහ මෙහෙයුම් වියදම්	11,382,198	10,265,497	12,549,269	11,877,762
මුළු වෙනත් වියදම්	22,269,517	22,602,628	24,498,541	24,557,901

18 බදු වියදම

GRI 207-1, 2, 4

18.1 මූල්‍ය සේවා මත බදු වියදම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මූල්‍ය සේවා මත බදු වියදම තුළ ඇතුලත් වන්නේ මූල්‍ය සේවා සඳහා එකතු කිරීමේ අගය මත ගණනය කල එකතු කළ අගය මත බදු (VAT) සහ සමාජ ආරක්ෂණ දායකත්ව බදු වියදමයි (SSCL).

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
එකතු කළ අගය මත බදු	27,993,418	24,932,941	28,349,923	25,277,395
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	3,887,986	3,462,348	3,940,091	3,512,748
මුළු මූල්‍ය සේවා මත බදු වියදම	31,881,404	28,395,289	32,290,014	28,790,143

18.2 ආදායම් බදු වියදම/ (ප්‍රතිවර්තය)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සෘජුවම ස්කන්ධය යටතේ හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගැනෙන අයිතම හැර අනෙකුත් අයිතමයන්ට අදාළ වන ප්‍රවර්තන සහ විලම්බිත බදු, ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

ප්‍රවර්තන බදු

ප්‍රවර්තන බදු ලෙස හඳුන්වනුයේ වාර්තාකරණ දිනට පවතින බදු අනුපාතය යොදා ගනිමින් වර්ෂය සඳහා බදු අයකළ හැකි ආදායම හෝ අලාභය මත ගණනය කරන ලද බදු ගෙවීම හෝ ලැබීමයි. තවද, පෙර වර්ෂයන් හි බදු ගෙවීම් සඳහා යම් ගැලපීමක් වේ නම් එයද සැලකිල්ලට භාජනය කෙරේ. ප්‍රවර්තන බදු ගෙවීම හෝ ලැබීම් වටිනාකම යනු ආදායම් බදු වෙනස්වීම කෙරෙහි බලපාන යම් අවිනිශ්චිතතාවයක් තිබිය හැකි නමුත්, බදු ලැබීමක් හෝ ගෙවීමක් සඳහා කල හැකි ප්‍රශස්ත ඇස්තමේන්තුවකි.

මේ අනුව 2018 අප්‍රේල් 1 දින සිට බලපැවැත්වෙන 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ සහ ඉන් පසුව කරන ලද සංශෝධිත විධිවිධාන අනුව, බදු අරමුණු සඳහා සකස් කර ඇති පරිදි, වර්ෂය සඳහා ගිණුම්කරණ ලාභය පදනම් කරගෙන බදුකරණය සඳහා ප්‍රතිපාදන සිදු කෙරේ. ලං.ගි.ප්‍ර 12 - "ආදායම් බදු" ප්‍රමිතයේ අවශ්‍යතාවයන්ට අනුව සඵල බදු අනුපාත, ආදායම් බදු වියදම සහ බදු පෙර ලාභය අතර සැසඳීම සටහන් අංක 18.2.2 යටතේ දක්වා ඇත.

විදේශීය මෙහෙයුම් මත, ප්‍රවර්තන වර්ෂයේ ගිණුම්කරණ ලාභයෙන් වෙන්කරන ලද බදු මුදල ගණනය කරන ලද්දේ, වර්ෂය සඳහා වන ගිණුම්කරණ ලාභය පදනම්ව බදුකරණය සඳහා වන ගැලපීම් සිදු කර ඒ ඒ රට වලට අදාල වන නීති හා රෙගුලාසි මත, වාර්තා කරන දිනට බලපාන හෝ ඉදිරියේදී බලපවත්නා බදු අනුපාත සැලකිල්ලට ගෙන වේ.

විලම්බිත බදු

තාවකාලික වෙනස්කම් මත විලම්බිත බදු වත්කම් හා වගකීම් වල සැසඳීමක් සටහන් අංක 37 යටතේ දක්වා ඇත.

18.2.1 ආදායම් බදු වියදමෙහි සංරචක

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
ප්‍රවර්තන බදු වියදම					
වර්ෂයේ ලාභය මත ආදායම් බදු වියදම		46,065,423	36,954,896	46,802,479	37,598,380
ආදායම් බද්දට අදාළව පෙර වර්ෂවල ගැළපුම්		6,448,594	(902,092)	6,448,594	(902,092)
විලම්බිත බදු වියදම					
විලම්බිත බදු ප්‍රතිපාදන/(ප්‍රතිවර්තය) කිරීම	37	(7,693,994)	6,464,525	(7,788,581)	6,463,702
වර්ෂය සඳහා මුළු ආදායම් බදු වියදම		44,820,023	42,517,329	45,462,492	43,159,990

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

18.2.2 ගිණුම්කරණ ලාභය සහ ආදායම් බදු වියදම සැසඳීම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව 2025 රු. '000	බැංකුව 2024 රු. '000	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000
බදු පෙර ගිණුම්කරණ ලාභය		120,826,954	106,904,268	121,933,750	108,221,467
එකතු කළා: පරිපාලිතයන්ගෙන් හා ආශ්‍රිතයන්ගෙන් ලද ලාභාංශ ආදායම		-	-	472,486	445,167
		120,826,954	106,904,268	122,406,236	108,666,634
එකතු කළා: ඉඩ නොදෙන වියදම්		65,786,763	36,108,781	66,955,211	36,639,568
		186,613,717	143,013,049	189,361,447	145,306,202
අඩු කළා: ඉඩ දෙන වියදම්		25,203,678	13,801,023	25,494,557	13,949,228
අඩු කළා: බදු නිදහස් ආදායම		2,033,959	7,115,756	2,033,959	7,115,756
බදු ගෙවිය යුතු ආදායම		159,376,080	122,096,270	161,832,931	124,241,218
30% අනුපාතයට බදු අය කළ හැකි ආදායම		147,726,742	122,096,270	150,183,593	124,241,218
15% අනුපාතයට බදු අය කළ හැකි ආදායම		11,649,338	-	11,649,338	-
30% අනුපාතයට ප්‍රවර්තන බද්ද		44,318,022	36,628,881	45,055,078	37,272,365
15% අනුපාතයට ප්‍රවර්තන බද්ද		1,747,401	-	1,747,401	-
වෙනත් රටවල විවිධ බදු අනුපාතවල බලපෑම		-	326,015	-	326,015
පෙර වර්ෂ වෙනුවෙන් කල බදු ගැලපීම		6,448,594	(902,092)	6,448,594	(902,092)
විලම්බිත බදු ප්‍රතිපාදන/(ප්‍රතිවර්තය කිරීම)	37	(7,693,994)	6,464,525	(7,788,581)	6,463,702
වර්ෂය සඳහා ආදායම් බදු වියදම		44,820,023	42,517,329	45,462,492	43,159,990
සඵල බදු අනුපාතය (%)		37.1%	39.8%	37.3%	39.9%

* විදේශීය මූලාශ්‍ර ආදායම් සහ සේවා අපනයන සඳහා කලින් අදාළ වූ බදු නිදහස් කිරීම් 2025 අංක 5 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතට අනුව අවලංගු කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවෙන් පිටත පුද්ගලයින්ට සපයනු ලබන සේවාවන්ගෙන් හෝ වෙනත් ඕනෑම විදේශීය මූලාශ්‍රයකින් ලබා ගන්නා ප්‍රාග්ධන ලාභ සහ අනෙකුත් ලාභ 2025/2026 තක්සේරු වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි 15% ක සහනදායී අනුපාතයකින් ආදායම් බද්දට යටත් වේ. අදාළ ගෙවීම් විදේශීය මුදලින් ලබාගෙන බැංකු පද්ධතිය හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීමේ කොන්දේසි වලට යටත්ව මෙම සහනදායී බදු අය කිරීමේ ක්‍රමවේදය අදාළ වේ.

18.2.3 පහත සඳහන් බැංකුවේ විදේශීය පරිපාලිත සමාගම ඇතුළු අනෙකුත් මෙහෙයුම් හැර නේවාසික සමාගම්වල බදු වගකීම් 30% සම්මත අනුපාතයට ගණනය කෙරේ (2024 - 30%)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2025 %	2024 %
විදේශීය මෙහෙයුම් සඳහා අදාල වන බදු අනුපාත		
මාලේ ශාඛාවේ බැංකු කටයුතු	25.00	25.00
චෙන්නායි ශාඛාවේ බැංකු කටයුතු	40.00	40.00
සීෂෙල්ස් ශාඛාවේ බැංකු කටයුතු		
සීෂෙල්ස් රුපියල් 1,000,000 දක්වා	25.00	25.00
ඉතිරිය සඳහා	33.33	33.33
ලංකා බැංකුව (යූ කේ) සමාගම	19.00	19.00

19 ආශ්‍රිත සමාගම් වල ලාභ/(පාඩු) කොටස, බදු පසු

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහයේ ආශ්‍රිතයන්ගේ ලාභ හෝ අලාභ කොටස් වල එකතුව ස්කන්ධ ගිණුම්කරණ ක්‍රමය අනුව ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000
සී/ස සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම	18,778	35,134
සී/ස ලංකා සිකියුරිටීස් (පෞද්ගලික) සමාගම	116,120	19,229
සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලුයුෂන්ස් (පෞද්ගලික) සමාගම	21,257	32,062
මුළු ආශ්‍රිත සමාගම් වල ලාභ/ (පාඩු) කොටස, බදු පසු	156,155	86,425

20 කොටසක ඉපැයුම් සහ කොටසක ලාභාංශ

20.1 කොටසක මූලික ඉපැයුම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ලං. ගි. ප්‍ර. - 33 "කොටසක ඉපැයුම්" අනුව කොටසක් වෙනුවෙන් මූලික ඉපැයුම් ගණනය කරනු ලබන්නේ මව් සමාගමේ සාමාන්‍ය කොටස්හිමියන්ට අයත් ශුද්ධ ලාභය හෝ අලාභය (ලවය) වර්ෂය සඳහා නිකුත් කර තිබූ බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් (හරය) බෙදීමෙනි.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2025	2024	2025	2024
බැංකුවේ සාමාන්‍ය කොටස්හිමියාට අයත් වර්ෂයේ ශුද්ධ ලාභය (රු. '000)		76,006,931	64,386,939	76,583,681	65,007,643
නිකුත් කර ඇති හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය	20.1.1	25,438,000	25,000,000	25,438,000	25,000,000
කොටසක මූලික ඉපැයුම් (රු.)		2,987.93	2,575.48	3,010.60	2,600.31

සටහන - 2022 වර්ෂය තුළ බැංකුවට ශ්‍රී ලංකා රජයෙන් රුපියල් මිලියන 730.0 ක් ලැබුණි. මෙම මුදල 2025 වර්ෂය තුළ දී කොටස් ප්‍රාග්ධනයට මාරු කර ඇත.

20.1.1 නිකුත් කර ඇති හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2025	2024	2025	2024
ජනවාරි 1 වන දිනට නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් ප්‍රමාණය	25,000,000	25,000,000	25,000,000	25,000,000
වර්ෂය තුළ නිකුත් කළ හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය	438,000	-	438,000	-
දෙසැම්බර් 31 දිනට නිකුත් කර ඇති හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය	25,438,000	25,000,000	25,438,000	25,000,000

20.2 කොටසක තනුක ඉපැයුම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

කොටසක තනුක ඉපැයුම් ගණනය කරනු ලබන්නේ, බැංකුවේ සාමාන්‍ය කොටස් හිමියන්ට අයත් ලාභය හෝ අලාභය (ලවය) වර්ෂය සඳහා නිකුත් කර තිබූ බර තැබූ සාමාන්‍ය කොටස් සහ සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීමේ සම්භාවිතාවක් ඇති කොටස්වල බලපෑම් ගැලපුම් කළ පසු හරිත සාමාන්‍ය කොටස් ප්‍රමාණයෙන් (හරය) බෙදීමෙනි.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2025	2024	2025	2024
බැංකුවේ සාමාන්‍ය කොටස්හිමියාට අයත් වර්ෂයේ ශුද්ධ ලාභය (රු. '000)		76,006,931	64,386,939	76,583,681	65,007,643
තනුක කිරීම සඳහා ගැලපුම් සිදු කළ පසු හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය	20.2.1	25,730,000	25,730,000	25,730,000	25,730,000
කොටසක තනුක ඉපැයුම් (රු.)		2,954.02	2,502.41	2,976.44	2,526.53

20.2.1 තනුක කිරීම සඳහා ගැලපුම් සිදු කළ පසු හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2025	2024	2025	2024
නිකුත් කර ඇති හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය	25,730,000	25,000,000	25,730,000	25,000,000
සාමාන්‍ය කොටස්වලට පරිවර්තනය කිරීම සඳහා සම්භාවිතාවක් සහිත විභජනයට ඇති ප්‍රාග්ධනයට අදාළ බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව	-	730,000	-	730,000
තනුක කිරීම සඳහා ගැලපුම් සිදු කළ පසු හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය	25,730,000	25,730,000	25,730,000	25,730,000

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

20.3 කොටසක ලාභාංශය

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

කොටසක ලාභාංශය ගණනය කර ඇත්තේ, කොටස්හිමියන්ට බෙදා හරින මුළු ලාභාංශය (ලවය) වර්ෂය සඳහා නිකුත් කර තිබූ බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් (හරය) බෙදීමෙනි.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2025	2024	2025	2024
වර්ෂය තුළ සාමාන්‍ය කොටස්හිමියාට බෙදා දුන් ලාභාංශ (රු. '000)		5,000,000	-	5,000,000	-
නිකුත් කර ඇති හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය	20.2.1	25,730,000	25,000,000	25,730,000	25,000,000
කොටසක ලාභාංශය (රු.)		194.33	-	194.33	-

21 මිනුම් කිරීමේ පදනම මත මූල්‍ය උපකරණ විශ්ලේෂණය

සියළුම මූල්‍ය වත්කම් හා වගකීම් ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 "මූල්‍ය උපකරණ" ප්‍රමිතයට අනුකූලව මිනුම් කිරීමේ පදනම මත පහත දක්වා ඇත.

21.1 බැංකුව

දෙසැම්බර් 31 දිනට	2025			
	ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ	වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කළ	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් හා සමාන දෑ	-	-	131,083,172	131,083,172
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	-	-	79,845,952	79,845,952
බැංකුවල ඇති තැන්පතු	-	-	39,458,670	39,458,670
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	-	345,307	345,307
ව්‍යුත්පන්න මූල්‍ය වත්කම්	6,900,797	-	-	6,900,797
ණය හා අත්තිකාරම්	-	-	2,371,751,976	2,371,751,976
ණය උපකරණ	11,869,450	25,007,827	2,605,510,006	2,642,387,283
ස්කන්ධ උපකරණ	730,561	12,371,349	-	13,101,910
මුළු මූල්‍ය වත්කම්	19,500,808	37,379,176	5,227,995,083	5,284,875,067

දෙසැම්බර් 31 දිනට	2025		
	ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වගකීම්			
බැංකුවලට ගෙවිය යුතු	-	26,397,898	26,397,898
ප්‍රතිමිලට ගැණුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	-	284,215,169	284,215,169
ව්‍යුත්පන්න මූල්‍ය වගකීම්	561,062	-	561,062
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට			
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	-	4,388,585,972	4,388,585,972
වෙනත් ණය ගැහීම්	-	48,719,379	48,719,379
යටත් කාලීන වගකීම්	-	99,455,760	99,455,760
මුළු මූල්‍ය වගකීම්	561,062	4,847,374,178	4,847,935,240

දෙසැම්බර් 31 දිනට	2024			
	ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ	වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කළ	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් හා සමාන දෑ	-	-	115,422,407	115,422,407
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	-	-	52,346,230	52,346,230
බැංකුවල ඇති තැන්පතු	-	-	62,413,107	62,413,107
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	-	23,982,341	23,982,341
ව්‍යුත්පන්න මූල්‍ය වත්කම්	23,500,600	-	-	23,500,600
ණය හා අත්තිකාරම්	-	-	2,177,707,779	2,177,707,779
ණය උපකරණ	20,203,381	42,007,600	2,275,934,376	2,338,145,357
රන් තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගයට තක්සේරු කරනු ලැබේ. ගැනුම් පිරිවැය, පරිවර්තන පිරිවැය සහ තොග වර්තමාන ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒමට දැරූ අනෙකුත් පිරිවැය රන් තොගවල පිරිවැය තුළ අඩංගු වේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන් විකිණීම සඳහා සුදානම් කිරීමට ඇස්තමේන්තු කල වියදම් අඩු කල පසු අගයයි.

සේවක ප්‍රතිලාභ වත්කම්

ලංකා බැංකුවේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම අරමුදලේ සහ 2014 ලංකා බැංකු විශ්‍රාම වැටුප් අරමුදලෙහි ශුද්ධ ප්‍රතිලාභ වත්කම් වලින් සේවක ප්‍රතිලාභ වත්කම් නියෝජනය කරයි. වැඩිදුර විස්තර සටහන් 48 - "සේවක විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්" මඟින් දක්වා ඇත.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
පරිභෝජනය සඳහා අතැති තොගය		1,136,316	1,057,637	1,217,763	1,126,504
කලින් ගෙවූ සේවක පිරිවැය		34,155,938	29,846,621	34,155,938	29,846,621
මාර්ගස්ථ චෙක්පත් - දේශීය		4,802,550	4,122,265	4,802,550	4,122,265
මාර්ගස්ථ චෙක්පත් - විදේශීය		4,584	4,558	4,584	4,558
ආපසු ලැබිය යුතු ආදායම් බදු	45	-	-	40,525	10,741
අතැති රන් සංචිත හා රන් කාසි		72,798	37,224	72,798	37,224
ශුද්ධ සේවක ප්‍රතිලාභ වත්කම්	48	17,244,674	18,358,454	17,244,674	18,358,454
වෙනත්		34,472,099	51,070,707	34,792,514	51,212,438
මුළු වෙනත් වත්කම් - දළ අගය		91,888,959	104,497,466	92,331,346	104,718,805
අඩුකලා - සමුච්චිත හානිකරණය	38.1	(1,672,007)	(2,927,101)	(1,672,007)	(2,927,101)
මුළු වෙනත් වත්කම් - ශුද්ධ අගය		90,216,952	101,570,365	90,659,339	101,791,704

ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු ඇතැම් ශේෂයන් සඳහා ඒවා අයකර ගැනීමේ ප්‍රමාදයන් සැලකිල්ලට ගෙන හානිකරණ ප්‍රතිපාදන වෙන් කර ඇත.

38.1 හානිකරණ ප්‍රතිපාදනවල වර්ෂය තුළ සංචලනය

	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
අදියර 2/ මුළු හානිකරණයේ සංචලනය				
ජනවාරි 1 දිනට ශේෂය	2,927,101	-	2,927,101	-
වර්ෂය තුළ හානිකරණ ප්‍රතිපාදන/ (ප්‍රතිවර්ත්‍ය)	(1,255,094)	2,927,101	(1,255,094)	2,927,101
දෙසැම්බර් 31 දිනට ශේෂය	1,672,007	2,927,101	1,672,007	2,927,101

39 බැංකුවලට ගෙවිය යුතු

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

නොස්ට්‍රෝ ගිණුම්වල බැර ශේෂයන් සහ බැංකුවලින් ලබා ගත් කෙටි කාලීන ණයවල බැර ශේෂයන් බැංකුවලට ගෙවිය යුතු ශේෂයන් නියෝජනය කරයි. මේවා මූලිකවම සාධාරණ අගයට හඳුනා ගනී. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, සඵල පොළී අනුපාත පදනම මත ක්‍රමක්ෂය පිරිවැයට මිනුම් කරනු ලැබේ. සඵල පොළී අනුපාතිකයෙහි සංකලිත කොටසක් වශයෙන් ගනුදෙනු පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. සඵල පොළී අනුපාත ක්‍රමක්ෂය ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි "පොළී වියදම" (සටහන 8.2) යටතේ ඇතුළත් වේ.

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
වෙනත් බැංකුවලට අයිති තැන්පතු	883,037	629,793	883,037	629,793
බැංකු අයිරා	25,514,861	1,041,294	26,342,906	1,052,624
බැංකුවලට ගෙවිය යුතු අයිතමයන්හි එකතුව	26,397,898	1,671,087	27,225,943	1,682,417

40 ප්‍රතිමිලට ගැණුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහය වෙත ප්‍රමාණාත්මක සහ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභයන් රඳවා ගනිමින්, නිශ්චිත අනාගත දිනයක දී ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුමක් මත විකුණනු ලබන සුරැකුම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් බැහැර කරනු නොලැබේ. මෙම ගනුදෙනු මත ලද මුදල් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආපසු ලබාදීමට අනුරූප වගකීමක් සහිත වත්කමක් ලෙස හඳුනාගනු ලබන අතර, එය ගනුදෙනුවේ ආර්ථිකමය යථා ස්වභාවය මත වගකීම උපචිත පොළිය ද සහිතව සමූහයේ ණය වගකීමක් ලෙස විදහා දැක්වේ. විකුණුම් සහ ප්‍රතිමිලදී ගැණුම් මිල අතර අන්තරය පොළී වියදම ලෙස සලකන අතර, ප්‍රතිමිලට ගැණුම් ගිවිසුමේ ආයු කාලය තුළ එය ක්‍රමක්ෂය වන පරිදි සඵල පොළී අනුපාතිකය යටතේ ගිණුම් ගත කෙරේ.

නැවත මිලදී ගැනීමේ ගනුදෙනු කපාහැරීම පිළිබඳ ප්‍රතිපත්තිය

අවදානම් කළමනාකරණ රාමුවේ කොටසක් ලෙස, ප්‍රමාණවත් ඇපකර ආවරණයක් සහතික කිරීම සඳහා බැංකුව නැවත මිලදී ගැනීමේ ගනුදෙනු සඳහා නියාමන අවශ්‍යතාවලට අනුකූල වේ. නැවත මිලදී ගැනීමේ ගනුදෙනුවකට එළඹෙන අවස්ථාවේදී, සුදුසුකම් ලත් සුරැකුම්පත්වල වෙළඳපල වටිනාකම, ගනුදෙනු කාලය තුළ ණයට ගත් මූලික මුදල සහ උපචිත පොළිය ඇතුළුව නැවත මිලදී ගැනීමේ වටිනාකම ප්‍රමාණවත් ලෙස ආවරණය කළ යුතුය.

ණය සහ වෙළඳපල අවදානම් අවම කිරීම සඳහා, සුදුසුකම් ලත් සුරැකුම්පත්වල කල් කල්පිරීමට ඇති කාලය මත පදනම්ව, පහත දක්වා ඇති පරිදි, ඒවායේ වෙළඳපල වටිනාකමට අවම කපාහැරීමක් සිදුකෙරේ:

සුදුසුකම්ලත් සුරැකුම්පත් කල් පිරීමට ඇති කාලය	අවම කපා හැරීම (%)
වසර 1 ක් දක්වා	4.0
වසර 1 ට වැඩි හා වසර 3 ක් දක්වා	6.0
වසර 3 ට වැඩි හා වසර 5 ක් දක්වා	8.0
වසර 5 ට වැඩි හා වසර 8 ක් දක්වා	10.0
වසර 8 ට වැඩි	12.0

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
බැංකු සමඟ	-	2,898,168	-	2,897,600
වෙනත් ගනුදෙනුකරුවන් සමඟ	284,215,169	128,181,246	288,688,312	127,133,014
මුළු ප්‍රතිමිලට ගැණුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	284,215,169	131,079,414	288,688,312	130,030,614

41 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" අනුව හෙජින් ගිවිසුම් යටතේ හෙජින් උපකරණ ලෙස හඳුනා නොගන්නා බැංකුව ඇති කර ගන්නා ගිවිසුම්වලින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සමන්විත වේ.

ව්‍යුත්පන්න උපකරණ සාධාරණ අගයට වාර්තා කරනු ලබන අතර, ඒවායේ සාධාරණ අගය ඍණ අගයක් ගන්නා විට වගකීමක් ලෙස වාර්තා කරනු ලබයි. ව්‍යුත්පන්න උපකරණවල සාධාරණ අගයේ වෙනස් වීම "වෙළඳපොළ ගනුදෙනු වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)" (සටහන් 10) ඇතුළත් වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
විදේශීය මුදල් ව්‍යුත්පන්න				
ඉදිරි විනිමය හිවිසුම්	33,835	29,085	33,835	29,085
මුදල් හුවමාරු හිවිසුම්	527,227	16,446,992	527,227	16,446,992
මුළු ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	561,062	16,476,077	561,062	16,476,077

42 ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මූලිකවම සාධාරණ අගයට හඳුනා ගන්නා පොළී රහිත තැන්පතු, ඉතුරුම් තැන්පතු, කාලීන තැන්පතු, ඉල්ලූ විට ගෙවිය යුතු තැන්පතු සහ තැන්පතු සහතිකවලින් ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු ශේෂය සමන්විත වේ. සමූහය විසින් ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ වගකීම් හැර, සඵල පොළී අනුපාත පදනම යටතේ තැන්පතු ක්‍රමක්ෂය පිරිවැයට මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව හඳුනා ගනී. සඵල පොළී ක්‍රමක්ෂය ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි "පොළී වියදම" (සටහන 8.2) යටතේ ඇතුළත් වේ.

42.1 තැන්පතු වර්ගය අනුව

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
දේශීය මුදල් තැන්පතු				
ජංගම ගිණුම් තැන්පතු	245,258,197	188,746,366	244,856,272	188,362,021
ඉතුරුම් තැන්පතු	1,013,565,616	774,866,841	1,014,996,004	776,120,776
කාලීන තැන්පතු	2,202,648,549	2,389,692,228	2,228,590,700	2,409,388,408
වෙනත් තැන්පතු	8,360,589	3,794,759	8,360,589	3,794,759
මුළු දේශීය මුදල් තැන්පතු	3,469,832,951	3,357,100,194	3,496,803,565	3,377,665,964
විදේශීය මුදල් තැන්පතු				
ජංගම ගිණුම් තැන්පතු	58,937,429	49,720,828	60,076,866	50,882,701
ඉතුරුම් තැන්පතු	137,572,643	123,622,316	138,310,171	124,401,536
කාලීන තැන්පතු	719,454,307	676,655,654	749,673,395	691,077,156
වෙනත් තැන්පතු	2,788,642	1,504,443	2,788,642	1,504,443
මුළු විදේශීය මුදල් තැන්පතු	918,753,021	851,503,241	950,849,074	867,865,836
මුළු තැන්පතු	4,388,585,972	4,208,603,435	4,447,652,639	4,245,531,800

42.2 මුදල් ඒකකය අනුව

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ශ්‍රී ලංකා රුපියල් (LKR)	3,469,832,951	3,357,100,194	3,496,803,565	3,377,665,964
ඇමරිකානු ඩොලර් (USD)	792,359,140	744,269,177	792,359,140	744,283,537
මහා බ්‍රිතාන්‍ය පවුම් (GBP)	50,159,524	44,983,916	82,246,554	61,315,945
මාලදිවයින් රුෆියා (MVR)	33,641,355	20,982,713	33,641,355	20,982,713
සීෂෙල්ස් රුපියල් (SCR)	4,448,002	3,121,651	4,448,002	3,121,651
යූරෝ (EUR)	16,606,031	13,463,467	16,606,031	13,471,109
ඕස්ට්‍රේලියානු ඩොලර් (AUD)	9,084,204	9,243,101	9,084,204	9,243,101
ඉන්දියානු රුපියල් (INR)	9,134,801	9,557,251	9,193,025	9,557,251
වෙනත් මුදල්	3,319,964	5,881,965	3,270,763	5,890,529
මුළු තැන්පතු	4,388,585,972	4,208,603,435	4,447,652,639	4,245,531,800

සටහන : තැන්පතුවල කල්පිරීමේ විශ්ලේෂණය සටහන් අංක 60 මඟින් දක්වා ඇත.

43 ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම් යටතට ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි බැංකුවලින් ලබා ගන්නා ලද කෙටිකාලීන ණය, ශ්‍රී ලංකාවේ අනෙකුත් මූල්‍ය ආයතනවලින් ලබා ගන්නා ලද කෙටිකාලීන ණය, විදේශයන්හි සහ ශ්‍රී ලංකාවේ බැංකුවලින් ලබා ගන්නා ලද කාලීන ණය, ශ්‍රී ලංකාවේ අනෙකුත් මූල්‍ය ආයතනවලින් ලබා ගන්නා ලද කාලීන ණය සහ ප්‍රතිමූල්‍ය ණය ගැනීම් අයත්වේ. මූලික හඳුනා ගැනීමේදී වෙනත් ණය ගැනීම් සාධාරණ අගයට පොත්වල හඳුනා ගන්නා අතර පසුව සඵල පොළී අනුපාතික ක්‍රමය (EIR) යොදා ගනිමින් ක්‍රමක්ෂය පදනමට හඳුනා ගනු ලැබේ. ක්‍රමක්ෂය අගය ගණනය කිරීමේ දී මූල්‍ය උපකරණයට අදාළ අධි මිල, වට්ටම් සහ ගනුදෙනු පිරිවැය මෙහි සඵල පොළී අනුපාතිකය තුළ ඇතුළත් වේ. සඵල පොළී අනුපාතිකය යටතේ ගණනය කරන ලද ක්‍රමක්ෂය වියදම, "පොළී වියදම" (සටහන 8.2) යටතේ ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි දක්වා ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ශ්‍රී ලංකාවේ බැංකු හා වෙනත් මූල්‍ය ආයතන වලින් ගත් කෙටිකාලීන ණය	18,754,133	-	18,754,133	3,459,284
ශ්‍රී ලංකාවේ බැංකු හා වෙනත් මූල්‍ය ආයතන වලින් ගත් කාලීන ණය	3,203,444	-	6,674,147	712,681
විදේශීය බැංකුවලින් ලබාගත් කෙටිකාලීන ණය	1,416,942	1,167,559	6,491,969	1,167,559
විදේශීය බැංකුවලින් ගත් කාලීන ණය	12,430,800	17,606,097	12,043,418	16,634,707
ප්‍රතිමූල්‍ය ණය	12,914,060	10,370,022	12,914,059	10,370,022
මුළු වෙනත් ණය ගැනීම්	48,719,379	29,143,678	56,877,726	32,344,253

44 නිකුත් කළ ණය සුරුකුම්පත්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

දිගු කාලීන අරමුදල් අවශ්‍යතා සඳහා ලබා ගන්නා ලද ණය, නිකුත් කළ ණය සුරුකුම් යටතේ දැක්වේ. මෙම ණය ගිවිසුම් වලට අනුව අදාළ ණය උපකරණයන්ගේ වටිනාකමට සරිලන ලෙස මුදල් වෙනත් වත්කමක් හෝ තම ස්කන්ධ කොටස් ප්‍රමාණයක් අදාළ පාර්ශ්වයන් වෙත ගෙවීමේ වගකීමට සමූහය බැඳී සිටී. නිකුත් කළ ණය සුරුකුම් මූලිකව සාධාරණ අගයට පොත්වල හඳුනා ගන්නා අතර, පසුව සඵල පොළී අනුපාතික ක්‍රමය (EIR) යොදා ගනිමින් ක්‍රමක්ෂය පදනමට හඳුනා ගනු ලැබේ. ක්‍රමක්ෂය අගය ගණනය කිරීමේ දී මූල්‍ය උපකරණයට අදාළ අධි මිල, වට්ටම් සහ ගනුදෙනු පිරිවැය මෙම සඵල පොළී අනුපාතිකය තුළ ඇතුළත් වේ. සඵල පොළී අනුපාතිකය යටතේ ගණනය කරන ලද ක්‍රමක්ෂය වියදම, "පොළී වියදම" (සටහන 8.2) තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි දක්වා ඇත.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	2025	2024	2025	2024
		රු. '000	රු. '000	රු. '000	රු. '000
ජ්‍යේෂ්ඨ ණයකර	44.1	-	-	1,754,101	718,873
මුළු නිකුත් කළ ණය සුරුකුම්		-	-	1,754,101	718,873

සටහන : ණය සුරුකුම්වල කල්පිරීමේ විශ්ලේෂණය සටහන් අංක 60 මඟින් දක්වා ඇත.

44.1 ජ්‍යේෂ්ඨ ණයකර

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ලැයිස්තුගත ණයකර				
සුරුකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර, එකක් රු. 100/-	-	-	1,754,101	718,873
මුළු නිකුත් කළ ණය සුරුකුම්	-	-	1,754,101	718,873

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

44.2 පේ්‍යෂ්ඨ ණයකරවල සංචලනය

	බැංකුව		සමූහය	
	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	-	-	718,873	730,839
වර්ෂය තුළදී නිකුත් කිරීම්	-	-	1,000,000	-
ක්‍රමක්ෂය ගැලපුම්	-	-	35,228	(11,966)
දෙසැම්බර් 31 දිනට ශේෂය	-	-	1,754,101	718,873

44.3 පේ්‍යෂ්ඨ ණයකර

							දෙසැම්බර් 31 දිනට අගය			
	සටහන	පොළිය ගෙවිය යුතු වාර ගණන	නිකුත් කළ දිනය	පරිණත වන දිනය	කූපන් අනුපාතය		බැංකුව		සමූහය	
					2025	2024	2025	2024	2025	2024
					%	%	රු. '000	රු. '000	රු. '000	රු. '000
ස්ථාවර පොළී අනුපාත										
සුරැකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර	(අ)	වාර්ෂික	16.11.2022	15.11.2027	29.50	29.50	-	-	22,003	25,328
සුරැකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර	(අ)	අර්ධ වාර්ෂික	16.11.2022	15.11.2027	28.00	28.00	-	-	30,267	34,713
සුරැකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර	(අ)	වාර්ෂික	10.04.2023	09.04.2028	29.50	29.50	-	-	290,625	292,087
සුරැකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර	(අ)	අර්ධ වාර්ෂික	10.04.2023	09.04.2028	28.00	28.00	-	-	232,881	269,367
සුරැකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර	(අ)	කල් පිරිමේදී	10.04.2023	09.04.2028	30.00	30.00	-	-	165,875	97,378
සුරැකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර	(අ)	වාර්ෂික	30.05.2025	30.05.2030	12.50	-	-	-	984,872	-
සුරැකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර	(අ)	අර්ධ වාර්ෂික	30.05.2025	30.05.2030	11.75	-	-	-	27,578	-
මුළු නිකුත් කළ ණය සුරැකුම්							-	-	1,754,101	718,873

සටහන:

(අ) කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත ණයකර වේ.

45 ප්‍රවර්තන බදු වගකීම්/ (වත්කම්)

	බැංකුව		සමූහය	
	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය	23,209,855	7,621,675	23,583,482	7,874,697
ප්‍රවර්තන බදු වියදම	46,065,423	36,954,896	46,802,479	37,598,380
වර්ෂය තුළදී සිදු කළ ගෙවීම්	(44,551,292)	(18,924,494)	(45,138,853)	(19,294,206)
ද්විත්ව බදු සහන සහ බදු බැර	(1,453,135)	(1,853,427)	(1,842,325)	(2,019,920)
පෙර වසර සඳහා සහ වෙනත් ගැලපුම්	2,147,467	(588,795)	2,221,880	(575,469)
දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	25,418,318	23,209,855	25,626,663	23,583,482
ප්‍රවර්තන බදු වත්කම්	-	-	(40,525)	(10,741)
ප්‍රවර්තන බදු වගකීම්	25,418,318	23,209,855	25,667,188	23,594,223
ප්‍රවර්තන බදු වගකීම්/(වත්කම්)	25,418,318	23,209,855	25,626,663	23,583,482

46 රක්ෂණ ගිවිසුම් වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ජීවිත රක්ෂණ ගිවිසුම් මත වගකීම්

2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන පනත මඟින් විස්තර කරනු ලබන, දළ වාරික තක්සේරු ක්‍රමය භාවිතයෙන් මෙම වගකීම් මිනුම්කරණය කරනු ලැබේ. අනාගත අපේක්ෂිත ප්‍රතිලාභයන්, හිමිකම් පෑමේ හා ඔප්පු කළමනාකරණයන්හි වියදම්, ඔප්පු හිමියන්ගේ විකල්ප අවස්ථා සහ ඇපවීම් යන වටිනාකම්හි වට්ටම් කළ අගයෙන් අනාගත මුදල් ප්‍රවාහයන්ගේ පිටතට ගලායාම් පියවීම සඳහා අවශ්‍ය වන අපේක්ෂිත සෛද්ධාන්තික වාරිකයන් හි වට්ටම් කළ අගය අඩුකළ පසු ලැබෙන ශේෂය වගකීම ලෙස සැලකේ. වගකීම් වාර්තා කිරීමේ දී වර්තමානයේ වන උපකල්පනයන් හෝ ගිවිසුම ආරම්භයේ දී වූ උපකල්පනයන් යොදා ගැනෙන අතර, අවදානම හෝ හානිකරණ අපගමනයන් උදෙසා යම් ගැලපීමක් කෙරේ.

පවත්නා වගකීම් ප්‍රමාණාත්මතාවය මැනීමේ පරීක්ෂණය මඟින් සෑම වාර්තාකරණ දිනකටම හඳුනාගත් ජීවිත රක්ෂණ වගකීමෙහි ප්‍රමාණාත්මතාවය පිළිබඳව තක්සේරුවක් කරනු ඇත.

වගකීම් ප්‍රමාණාත්මතාවය මැනීමේ පරීක්ෂණය (LAT)

පවත්නා වගකීම් ප්‍රමාණාත්මකතාවය මැනීමේ පරීක්ෂණය මඟින් සෑම වාර්තාකරණ දිනකටම ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 4 - "රක්ෂණ ගිවිසුම්" මඟින් නියාමනය කර ඇති පරිදි හඳුනාගත් ජීවිත රක්ෂණ වගකීමෙහි ප්‍රමාණාත්මකතාවය පිළිබඳව තක්සේරුවක් කරනු ඇත. අනාගත ප්‍රතිලාභයන් සහ වියදම් දැරීමට ප්‍රමාණවත් වන පරිදි වගකීම් සඳහා ගැලපීම් සිදු කෙරේ.

වගකීම් සඳහා ප්‍රමාණාත්මක වෙන් කිරීම ස්ථාපනය කිරීම මඟින් ඇති වන ඌනතාවය ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගැනේ.

ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් මත වගකීම්

ජීවිත නොවන රක්ෂණ ගිවිසුම්වල වගකීම් හඳුනාගනු ලබන්නේ අදාළ ගිවිසුමට ඇතුළත්ව වාරික අයකර ගැනීම සිදු කළ විටදීය. වාර්තා කරන දිනට ගෙවිය යුතු හිමිකම්පෑම් හි ඇස්තමේන්තුගත අවසාන පිරිවැය සටහන් කළ හෝ නොකළ හිමිකම්පෑම් වෙනුවෙන් වන කළමනාකරණ ගාස්තු හා වියදම්වලින් යම් ප්‍රතිගෙවීමක් හෝ ශේෂ වූ ද්‍රව්‍ය මඟින් පියවා ගැනීමක් වේ නම් එය අඩුකර ලැබෙන අගයට සිදු කරන ප්‍රතිපාදන මේ යටතේ වන වගකීම් ලෙස සටහන් කරනු ඇත. යම් හිමිකම්පෑම් සම්බන්ධයෙන් දැනුම්දීම් සහ තක්සේරු කිරීම්වල සිදුවන ප්‍රායෝගික ප්‍රමාදවීම් මත වාර්තාකරණ දින වනවිට එම හිමිකම්පෑමෙහි වටිනාකම නිශ්චිතවම තහවුරු වී නොතිබීමට පුළුවන. එබැවින් වාර්තාකරණ දිනට වන වගකීම ප්‍රත්‍යක්ෂ මූලික දත්ත සහ අවදානම් වෙනසට ගැලපුම් ද සැලකිල්ලට ගෙන සකස් කරන ලද ආයුගණක හිමිකම්පෑමේ ප්‍රක්ෂේපන ක්‍රමය මඟින් තීරණය කෙරේ. වගකීම් මුදලේ කාල අගයට ගැලපීමක් නොකරන අතර සමතකරණයන් සහ විපත්තීන් සඳහා ද ප්‍රතිපාදන වෙන් නොකෙරේ. ගිවිසුම අවසන්වීම මත හෝ කල්පිරීම මත හෝ අවලංගුවීම මත ඒ හා බැඳි වගකීම ගිණුම්වලින් බැහැර කෙරේ.

වගකීම් ප්‍රමාණාත්මකතාවය මැනීමේ පරීක්ෂණය (LAT)

උපයා නොගත් වාරික සඳහා වන ප්‍රතිපාදනයන් මඟින් මෙතෙක් අවදානම උදෙසා වන බැඳීමෙහි කාලය ඉක්ම නොවූ ගිවිසුම් මත ලද වාරික නිරූපණය වන අතර සාමාන්‍යයෙන් සංචිතය, ගිවිසුමේ කොන්දේසි මත නිදහස් කෙරෙන අතර, එය වාරික ආදායම ලෙස හඳුනාගනී. සෑම වාර්තාකරණ දිනයකටම සමූහය එහි කල් ඉකුත්නොවූ ගිවිසුම්වල අවදානම් මත වන වගකීම පිළිබඳ පරීක්ෂාවට ලක් කරයි.

මෙම ගණනය කිරීමට රක්ෂණ - ජීවිත නොවන තාක්ෂණික විධිවිධානවලට අදාළ වත්කම් මත පැන නඟින ආයෝජන ප්‍රතිලාභය සලකා බැලීමෙන් පසු අනාගත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහවල වර්තමාන ඇස්තමේන්තු භාවිතා කරයි. මෙහි දී උපයා නොගත් වාරිකවල ධාරණ අගයෙහි ඇස්තමේන්තුගත අගය (සම්බන්ධිත විලම්බිත ගැනුම් පිරිවැය අඩු කර) ප්‍රමාණාත්මක නොවන බව පෙනීයයි නම් වගකීම්වල ප්‍රමාණාත්මකතාවය සඳහා වන ප්‍රතිපාදනයන් වැඩි කරමින් එම වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශනයට ගලපනු ලැබේ.

46.1 රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත

	සමූහය	
	2025 රු. '000	2024 රු. '000
ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය	400,967	359,606
ජීවිත රක්ෂණ අරමුදලේ වැඩිවීම/(අඩුවීම)	4,298	3,564
සාධාරණ වටිනාකම් සංචිතය	30,492	3,674
හිමිකම් නොපෑ ප්‍රතිලාභ	47,736	34,123
දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	483,493	400,967

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

46.2 රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත නොවන

දෙසැම්බර් 31 දිනට	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000
ඔප්පු හිමියන්ගෙන් වාර්තා වූ හිමිකම් සඳහා ප්‍රතිපාදන	378,444	189,575
ඇතිවූ නමුත් මෙතෙක් වාර්තා නොවූ හිමිකම් සඳහා ප්‍රතිපාදන (IBNR)	24,740	49,539
හිඟහිටි හිමිකම් ප්‍රතිපාදන	403,184	239,114
නොඉපයූ වාරික සඳහා ප්‍රතිපාදන	155,216	184,809
මුළු රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත නොවන	558,400	423,923

47 වෙනත් වගකීම්

දෙසැම්බර් 31 දිනට	සටහන	බැංකුව 2025 රු. '000	බැංකුව 2024 රු. '000	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000
නිෂ්කාශනය සඳහා යැවූ චෙක්පත්		1,502,193	817,324	1,502,193	817,324
කල්බදු ණය හිමියන්					
මාස 12 ඇතුළත		164,813	619,886	473,838	758,598
මාස 12 ට පසු		5,739,173	5,248,202	2,860,946	2,624,964
සේවක ප්‍රතිලාභ වගකීම් - ශුද්ධ	48	67,066,657	55,838,477	67,606,253	56,355,102
වෙනත්		153,924,170	141,336,036	154,951,639	143,270,503
මුළු වෙනත් වගකීම්		228,397,006	203,859,925	227,394,869	203,826,491

48 සේවක විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් GRI 201-3

කර්මාන්ත ප්‍රතිලාභ යටතේ ලංකා බැංකුව තනිවම අරමුදල් සපයන විශ්‍රාම වැටුප් අරමුදල් ක්‍රමයන් බැංකුව තුල ඇත. තවද, සාමාජිකයින් විසින් ස්ථාපනය කරනු ලැබූ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල වශයෙන් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ද ඇත.

මෙම විශ්‍රාම සැලසුම් තුනෙහිම වත්කම් බැංකුවේ වත්කම්වලින් ස්වාධීන වූ කළමනාකරණයෙන් සහ සේවකයින්ගෙන් සැදුම්ලත් භාරකාර මණ්ඩලයක්/කළමනාකරුවන් විසින්, එක් එක් අරමුදලේ ඇති භාරකාර ඔප්පුව/රෙගුලාසි අනුව පරිපාලනය කෙරේ.

මෙම අරමුදල් බැංකුවේ විගණනයෙන් ස්වාධීන වූ සාමාජිකයන් විසින් පත්කරනු ලබන වරලත් ගණකාධිකාරී ආයතනයක් විසින් වාර්ෂිකව විගණනයට භාජනය කරන අතර, මෙම අරමුදල් පාලනයට අදාල වූ රෙගුලාසි අනුව ආයුගණන තක්සේරුවක් කරනු ලැබේ.

දෙසැම්බර් 31 දිනට	සටහන	බැංකුව 2025 රු. '000	බැංකුව 2024 රු. '000	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000
ශුද්ධ සේවක ප්‍රතිලාභ වගකීම්					
ලංකා බැංකු විශ්‍රාම වැටුප් භාරකාර අරමුදල	48.1.3	59,505,557	52,921,047	59,505,557	52,921,047
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	48.3	1,358,500	1,186,150	1,898,096	1,702,775
අසනීප නිවාඩු මුදල් කිරීම සඳහා ප්‍රතිපාදන	48.5	1,535,957	1,245,997	1,535,957	1,245,997
ලංකා බැංකුවේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල	48.2.3	4,666,643	485,283	4,666,643	485,283
මුළු ශුද්ධ සේවක ප්‍රතිලාභ වගකීම		67,066,657	55,838,477	67,606,253	56,355,102
ශුද්ධ සේවක ප්‍රතිලාභ වත්කම්					
ලංකා බැංකු විශ්‍රාම වැටුප් අරමුදල - 2014	48.4.3	17,244,674	18,358,454	17,244,674	18,358,454
මුළු ශුද්ධ සේවක ප්‍රතිලාභ වත්කම්		17,244,674	18,358,454	17,244,674	18,358,454

48.1 ලංකා බැංකු විශ්‍රාම වැටුප් භාරකාර අරමුදල

ලංකා බැංකුවේ විශ්‍රාම වැටුප් භාරකාර අරමුදල, අරමුදල් සපයනු ලබන, දායක මුදල් අය නොකරන නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකි. බැංකුවෙහි අවම වශයෙන් වසර දහයක අඛණ්ඩ සේවා කාලයක් ඇති විශ්‍රාම ගැනීමේ වයස් සීමාව වන වයස අවුරුදු 55 දී හෝ ඉන්පසු විශ්‍රාම ගැනීමේදී හෝ ඊට පෙරාතුව සෞඛ්‍ය හේතු මත විශ්‍රාම ගන්නා වූ බැංකුවේ සේවකයින් සඳහා යාව ජීව විශ්‍රාම වැටුපක් ගෙවීම සඳහා මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ. විශ්‍රාම වැටුප, සමහර දීමනා අත්හැර සේවකයා විසින් අවසාන වරට ලැබූ වැටුපෙහි ප්‍රතිශතයක් මත පදනම් වේ.

විශ්‍රාම වැටුප් භාර අරමුදලට දායක මුදල් සුදුසුකම් ලත් ආයුගණකවරයෙකුගේ උපදෙස්වලට අනුව බැංකුව විසින් මාසිකව ගෙවනු ලබන අතර, දැනට බැංකුවේ සේවය කරන අරමුදලේ ක්‍රියාකාරී සාමාජිකයින්ගේ දළ වැටුපෙන් 56.8% ක් වේ. ඉදිරි මාස 12 තුළ බැංකුව විසින් ලබා දෙන විශේෂ දායකත්වය ආසන්න වශයෙන් රුපියල් මිලියන 3,600 ක් වනු ඇත. කෙසේ වෙතත්, අරමුදලේ හිඟය සහ බැංකුවේ දැරිය හැකිභාවය සැලකිල්ලට ගනිමින් මෙම විශේෂ දායකත්වය වැඩි කිරීමට හෝ අඩු කිරීමට බැංකුවට තනි අභිමතය පරිදි කටයුතු කළ හැකිය. මෙම අරමුදල වසරකට වරක් සුදුසුකම් ලත් ආයුගණකවරයෙකු විසින් අගය කර ඇත. මෙම අරමුදල රජය විසින් අනුමත කර ඇති අතර, ස්වාධීනව පරිපාලනය කරයි. පරිපාලිතයන්ගේ හෝ ආශ්‍රිත සමාගම් වල විශ්‍රාම අරමුදල් ක්‍රියාත්මක කරනු නොලැබේ.

කේ. ඒ. පන්ඩිත් කන්සල්ටන්ස් ඇන්ඩ් ඇක්චූරිස් සමාගම විසින් 2025 දෙසැම්බර් 31 දිනට මෙම අරමුදලේ ආයුගණක තක්සේරුව සිදුකර ඇත.

මෙම තක්සේරුව කරන ලද්දේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - ලං.ගි.ප්‍ර. - 19 "සේවක ප්‍රතිලාභ" නිර්දේශ කරන "ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය" පාදකවයි. 1996 ජනවාරි 1 දිනට පෙර බැංකුවට බැඳුණු සියළු ස්ථිර සේවකයන්ට මෙම ප්‍රතිලාභය හිමිවේ. විශ්‍රාම භාරකාර අරමුදලේ ආයුගණක තක්සේරුවේ ප්‍රතිඵල සාරාංශය පහත වේ.

48.1.1 ශුද්ධ ප්‍රතිලාභ වියදම (සේවක පිරිවැය යටතේ හඳුනා ගන්නා)

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2025	2024
	රු. '000	රු. '000
ප්‍රවර්තන සේවා පිරිවැය	82,550	82,480
ශුද්ධ පොළී වියදම	6,350,530	5,546,510
ශුද්ධ ප්‍රතිලාභ වියදම	6,433,080	5,628,990

48.1.2 වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනා ගන්නා අගයන්

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2025	2024
	රු. '000	රු. '000
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීම් හි ආයුගණක (ලාභ)/අලාභ	2,869,680	6,443,730
සැලසුම්ගත වත්කම්හි ආයුගණක තක්සේරුව මත (ලාභ)/අලාභ	1,110,320	(43,370)
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනා ගන්නා ආයුගණක තක්සේරුව මත ශුද්ධ (ලාභ)/අලාභ	3,980,000	6,400,360

48.1.3 වෙනත් වගකීම් යටතේ හඳුනාගෙන ඇති ශුද්ධ විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම්

		බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	2025	2024
		රු. '000	රු. '000
සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය	48.1.4	47,501,603	49,372,673
නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම	48.1.5	107,007,160	102,293,720
ශුද්ධ විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම		59,505,557	52,921,047

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

48.1.4 සැලසුම්ගත වත්කම්හි සාධාරණ අගයෙහි වෙනස්වීම්

	බැංකුව/සමූහය	
	2025	2024
	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	49,372,673	51,144,443
අපේක්ෂිත ප්‍රතිලාභය	5,924,720	6,648,780
සේවායෝජකයාගේ දායකත්වය	3,828,570	1,773,810
ගෙවන ලද ප්‍රතිලාභ	(10,514,040)	(10,237,730)
සැලසුම්ගත වත්කම්හි ආයුගණක තක්සේරුව මත ලාභ/(අලාභ)	(1,110,320)	43,370
දෙසැම්බර් 31 දිනට ශේෂය	47,501,603	49,372,673

48.1.5 නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයෙහි වෙනස්වීම්

	බැංකුව/සමූහය	
	2025	2024
	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	102,293,720	93,809,950
පොළී පිරිවැය	12,275,250	12,195,290
ප්‍රවර්තන සේවා පිරිවැය	82,550	82,480
ගෙවන ලද ප්‍රතිලාභ	(10,514,040)	(10,237,730)
උපකල්පනයන්හි වෙනස්වීම් මත (ලාභ)/අලාභ	3,061,140	12,855,440
බැඳීම්වල ආයුගණක තක්සේරුව මත (ලාභ)/අලාභ	(191,460)	(6,411,710)
දෙසැම්බර් 31 දිනට ශේෂය	107,007,160	102,293,720

තක්සේරු දිනට ක්‍රියාකාරී සේවකයින් සහ විශ්‍රාමිකයින්ට අදාළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වලට අදාළ වර්තමාන අගය පිළිවෙලින් රු. මිලියන 2,840.0 සහ රු. මිලියන 104,167.2 වේ.

48.1.6 සැලසුම්ගත වත්කම් පහත දැවලින් සමන්විත වේ:

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024
	රු. '000	රු. '000
ස්ථාවර තැන්පතු	33,342,670	39,066,853
රජයේ සුරැකුම්පත්	3,468,260	1,381,490
ණයකර	536,850	522,530
ඒකකභාර	473,780	499,560
කොටස්වල ආයෝජන	8,454,640	7,202,860
වෙනත්	1,225,403	699,380
මුළු සැලසුම්ගත වත්කම්	47,501,603	49,372,673

48.1.7 ආයුගණක උපකල්පනයන

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024
	%	%
අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතිකය	වාර්ෂිකව 8.50	වාර්ෂිකව 8.50
ජීවන වියදම් දීමනාවෙහි අනාගත වැඩිවීමේ ප්‍රමාණය (COLA)	වාර්ෂිකව 7.00	වාර්ෂිකව 8.00
විශ්‍රාම ගෙවීම්වල වැඩිවීම (මූලික)	වාර්ෂිකව 1.75	වාර්ෂිකව 1.75
වට්ටම් අනුපාතය	වාර්ෂිකව 10.75	වාර්ෂිකව 12.00
සේවය හැරයාමේ අනුපාතිකය	නැත	නැත

බැංකුව විසින් ඉන්දියාවේ ආයුගණක ආයතනය විසින් නිකුත් කරන ලද පරම උපත් හා මරණ දත්ත වගුව IALM (2012-2014) භාවිතා කර ඇත.

උපකල්පනවල වැඩිවීම/අඩුවීම, නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයට ඇති කරන බලපෑම පහත පෙන්නුම් කෙරේ:

	බැංකුව/සමූහය	
	0.5% වැඩිවීම	0.5% අඩුවීම
	රු. '000	රු. '000
වට්ටම් අනුපාතය	(3,352,730)	3,562,600

තවදුරටත්, ප්‍රතිලාභ ගෙවීම් සඳහා අපේක්ෂිත ඉතිරි වසර ගණන වසර අටකි.

අනාගත වර්ෂවලදී මෙම විශ්‍රාම වැටුප් භාරකාර අරමුදලෙන් පහත සඳහන් ගෙවීම් සිදු කිරීමට අපේක්ෂා කරයි.

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024
	රු. '000	රු. '000
ඉදිරි මාස 12 තුළ	10,470,250	9,889,510
වසර 1 සහ 5 අතර	41,949,330	39,496,620
වසර 5 සහ 10 අතර	27,097,640	25,813,540
වසර 10 කට වැඩි	27,489,940	27,094,050
අපේක්ෂිත මුළු ගෙවීම්	107,007,160	102,293,720

48.2 ලංකා බැංකුවේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල

1996 ජනවාරි 1 වන දිනට පෙර බැංකුවට බැඳුණු බැංකු සේවකයින් තම දළ වැටුපෙන් 5% ක මාසික දායකත්වය දැරූ ලංකා බැංකුවේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලෙහි ඇර්ථලාභීන්ට ගෙවීම් කිරීමට බැංකුව බැඳී සිටින අතර, එම ගෙවීම් සහතික කෙරේ. මෙම අරමුදලට අඛණ්ඩව අවුරුදු පහක් තුළ දායක මුදල් ගෙවනු ලැබූ සේවකයෙකු සේවයේ යෙදී සිටියදී මියගියහොත් එම සේවකයාගේ ඇර්ථලාභීන් වෙනුවෙන් බැංකුවට වගකීමක් ඇති වේ. තවද විශ්‍රාමිකයෙකු මියගිය විටදී ඔහුගේ/ඇයගේ ඇර්ථලාභීන්ට මාසික වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපක් ගෙවීමට බැංකුව බැඳී සිටී. සේවයේ යෙදී සිටියදී මියයන සේවකයෙකු වෙනුවෙන් ඔහුගේ/ඇයගේ ඇර්ථලාභීන්ට හිමිවන විශ්‍රාම වැටුප, සමහර දීමනා රහිතව ඔහු/ඇය විසින් අවසාන වරට ලැබූ වැටුප මත පදනම් වේ.

2025 දෙසැම්බර් 31 දිනට කේ. ඒ. පන්ඩිත් කන්සල්ටන්ස් ඇන්ඩ් ඇක්චුරීස් සමාගම විසින් මෙම වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ ආයුගණක තක්සේරුව සිදු කර ඇත. ආයුගණක, භාරකරුවන් හා ඇර්ථලාභීන්ගේ උපදේශනයෙන් අරමුදල් සම්පාදනය කරයි. අරමුදලේ හිඟය සැලකිය යුතු නොවන බැවින්, ඉදිරි මාස 12 තුළ අරමුදල සඳහා කිසිදු මුදලක් දායක කිරීමට බැංකුව අපේක්ෂා නොකරයි.

මෙම අරමුදල රජය විසින් අනුමත කොට ඇති අතර, ස්වාධීනව පරිපාලනය කෙරේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - ලං. ගි. ප්‍ර. - 19 "සේවක ප්‍රතිලාභ" නිර්දේශ කරන "ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය" භාවිතා කරමින් මෙම ආයුගණක තක්සේරුව කර ඇත. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා ආයුගණක තක්සේරු ප්‍රතිඵල පහත සාරාංශ ගත කර ඇත.

48.2.1 ශුද්ධ ප්‍රතිලාභ වියදම (සේවක පිරිවැය යටතේ හඳුනා ගන්නා)

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2025	2024
	රු. '000	රු. '000
ප්‍රවර්තන සේවා පිරිවැය	6,010	6,470
ශුද්ධ පොළී ආදායම	24,880	(1,173,130)
ශුද්ධ ප්‍රතිලාභ වියදම / (ආදායම)	30,890	(1,166,660)

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

48.2.2 වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනා ගන්නා අගයන්

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2025	2024
	රු. '000	රු. '000
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්හි ආයුගණක තක්සේරුව මත (ලාභ)/අලාභ	1,835,420	9,848,640
සැලසුම්ගත වත්කම්හි ආයුගණක තක්සේරුව මත (ලාභ)/අලාභ	2,315,050	868,170
ආයුගණක තක්සේරුව මත ආයුගණක (ලාභ)/අලාභ	4,150,470	10,716,810

48.2.3 වෙනත් වගකීම් යටතේ හඳුනාගෙන ඇති ශුද්ධ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්

		බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	2025	2024
		රු. '000	රු. '000
සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය	48.2.4	39,940,908	39,819,948
නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම	48.2.5	44,607,551	40,305,231
විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම්		4,666,643	485,283

48.2.4 සැලසුම්ගත වත්කම්හි සාධාරණ අගයෙහි වෙනස්වීම්

	බැංකුව/සමූහය	
	2025	2024
	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	39,819,948	37,901,108
අපේක්ෂිත ප්‍රතිලාභ	4,778,390	4,927,140
සැලසුම් සඳහා ගෙවන ලද දායකත්වය	33,360	40,730
ගෙවන ලද ප්‍රතිලාභ	(2,375,740)	(2,180,860)
සැලසුම්ගත වත්කම්හි ආයුගණක තක්සේරුව මත ලාභ/(අලාභ)	(2,315,050)	(868,170)
දෙසැම්බර් 31 දිනට ශේෂය	39,940,908	39,819,948

48.2.5 නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයෙහි වෙනස්වීම්

	බැංකුව/සමූහය	
	2025	2024
	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	40,305,231	28,876,971
පොළී පිරිවැය	4,836,630	3,754,010
ප්‍රවර්තන සේවා පිරිවැය	6,010	6,470
ගෙවන ලද ප්‍රතිලාභ	(2,375,740)	(2,180,860)
බැඳීම් මත ආයුගණක (ලාභ)/අලාභ	572,820	5,288,060
උපකල්පනයන්හි වෙනස්වීම් මත (ලාභ)/අලාභ	1,262,600	4,560,580
දෙසැම්බර් 31 දිනට ශේෂය	44,607,551	40,305,231

තක්සේරු දිනට ක්‍රියාකාරී සේවකයින්, විශ්‍රාමිකයන් සහ ප්‍රතිලාභ ලැබීමට හිමිකම් කියන විශ්‍රාමික පවුල් සාමාජිකයන්ට අදාළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වලට අදාළ වර්තමාන අගය පිළිවෙලින් රු. මිලියන 180.6, රු. මිලියන 18,051.1 සහ රු. මිලියන 26,375.9 ක් වේ.

48.2.6 සැලසුම්ගත වත්කම් පහත දෑ වලින් සමන්විත වේ:

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024
	රු. '000	රු. '000
ස්ථාවර තැන්පතු	37,175,460	37,125,120
රජයේ සුරැකුම්පත්	2,764,220	2,693,710
වෙනත්	1,228	1,118
මුළු සැලසුම්ගත වත්කම්	39,940,908	39,819,948

48.2.7 ආයුගණක උපකල්පනයන්

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024
	%	%
අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතිකය	වාර්ෂිකව 8.50	වාර්ෂිකව 8.50
ජීවන වියදම් දීමනාවෙහි අනාගත වැඩිවීමේ ප්‍රමාණය (COLA)	වාර්ෂිකව 7.00	වාර්ෂිකව 8.00
වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම ගෙවීම්වල වැඩිවීම (මූලික)	නැත	නැත
වට්ටම් අනුපාතය	වාර්ෂිකව 10.75	වාර්ෂිකව 12.00
සේවය හැරයාමේ අනුපාතිකය	නැත	නැත

බැංකුව විසින් ඉන්දියාවේ ආයුගණක ආයතනය විසින් නිකුත් කරන ලද පරම උපත් හා මරණ දත්ත වගුව IALM (2012-2014) භාවිතා කර ඇත.

උපකල්පනවල වැඩිවීම/අඩුවීම මඟින් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයට ඇති කරන බලපෑම පහත පෙන්නුම් කෙරේ.

	බැංකුව/සමූහය	
	0.5% වැඩිවීම	0.5% අඩුවීම
	රු. '000	රු. '000
වට්ටම් අනුපාතය	(2,043,370)	2,208,530

තවදුරටත්, ප්‍රතිලාභ ගෙවීම් සඳහා අපේක්ෂිත ඉතිරි වසර ගණන වසර 12 කි.

අනාගත වර්ෂ වලදී මෙම අරමුදලෙන් පහත සඳහන් ගෙවීම් සිදු කිරීමට අපේක්ෂා කරයි.

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024
	රු. '000	රු. '000
ඉදිරි මාස 12 තුළ	2,425,571	2,178,131
වසර 1 සහ 5 අතර	11,700,900	10,402,750
වසර 5 සහ 10 අතර	10,532,210	9,309,940
වසර 10 වඩා වැඩි	19,948,870	18,414,410
අපේක්ෂිත මුළු ගෙවීම්	44,607,551	40,305,231

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

48.3 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ, විශ්‍රාම වැටුප් සඳහා අයත් නොවන දස වසරකට වඩා අඩු සේවා කාලයක් සහිත සේවකයින්ට පාරිතෝෂික ගෙවීම සඳහා පළමු සේවා වර්ෂයේ සිටම ගිණුම් පොත්පත්වල ප්‍රතිපාදන සලසා ඇත. බලපවත්නා විශ්‍රාම අරමුදල් සඳහා හිමිකම් ලබන සේවකයින් සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල ගලපා නැත. කෙසේවුවද වසර පහක සේවාකාලයකින් පසු සේවකයින් විශ්‍රාම නොගොස් වෙනත් අයුරකින් ඔවුන්ගේ සේවය නතර කරනු ලැබුව හොත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ඔවුන්ට පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම් ඇත. මෙම පාරිතෝෂිකය ගෙවනු ලබන්නේ අදාළ මුදල් වර්ෂයේ අවසාන මාසයට අදාළ වන ජීවන වියදම් දීමනා සහ අනෙකුත් දීමනාද ඇතුව සේවකයාගේ මූලික මාසික හෝ ඒකාබද්ධ වැටුපෙන් අඩක් වී සේවකයා අඛණ්ඩ සේවය කළ එක් එක් වර්ෂය සඳහා ගණන් බැලීමෙනි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - ලං.ගි.ප්‍ර. - 19 "සේවක ප්‍රතිලාභ" අනුව නිර්දේශිත ආයුගණනක තක්සේරු ක්‍රමවේදය මත පදනම්ව බැංකුව සහ එහි පරිපාලිත සමාගම් පශ්චාත් සේවක ප්‍රතිලාභ බැඳීම් ගණනය කර ඇත. පාරිතෝෂික වගකීම් සඳහා බාහිරව අරමුදල් සම්පාදනය නොකෙරේ.

2025 දෙසැම්බර් 31 දිනට කේ. වී. පන්ඩිත් කන්සල්ටන්ස් ඇන්ඩ් ඇක්චූරීස් සමාගම විසින් මෙම අරමුදලේ ආයුගණනක තක්සේරුව සිදු කර ඇත.

	බැංකුව		සමූහය	
	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	1,186,150	792,280	1,702,775	1,250,258
වර්ෂය තුළ ප්‍රතිපාදන/(ප්‍රතිවර්තය) කිරීම්	233,630	174,160	354,940	274,835
ආයුගණනක (ලාභ)/අලාභ	138,670	584,660	78,723	651,656
වර්ෂය තුළදී සිදු කළ ගෙවීම්	(199,950)	(364,950)	(218,177)	(474,520)
ගැලපුම්/පැවරුම්	-	-	(20,165)	546
දෙසැම්බර් 31 දිනට ශේෂය	1,358,500	1,186,150	1,898,096	1,702,775

ආයුගණනක තක්සේරුවේදී භාවිතා කරන ලද මූලික ආයුගණනක උපකල්පනයන් පහත පරිදි වේ.

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024
	%	%
අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතිකය	වාර්ෂිකව 8.50	වාර්ෂිකව 8.50
ජීවන වියදම් දීමනාවෙහි අනාගත වැඩිවීමේ ප්‍රමාණය (COLA)	වාර්ෂිකව 7.00	වාර්ෂිකව 8.00
වට්ටම් අනුපාතය	වාර්ෂිකව 10.75	වාර්ෂිකව 12.00

බැංකුව විසින් ඉන්දියාවේ ආයුගණනක ආයතනය විසින් නිකුත් කරන ලද පරම උපත් හා මරණ දත්ත වගුව IALM (2012-2014) භාවිතා කර ඇත. තවදුරටත්, ප්‍රතිලාභ ගෙවීම් සඳහා අපේක්ෂිත ඉතිරි වසර ගණන වසර 11 කි.

උපකල්පනවල වැඩිවීම/අඩුවීම මඟින් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල වර්තමාන අගයට ඇති බලපෑම පහත පෙන්නුම් කෙරේ.

	බැංකුව		සමූහය	
	0.5% වැඩිවීම	0.5% අඩුවීම	0.5% වැඩිවීම	0.5% අඩුවීම
	රු. '000	රු. '000	රු. '000	රු. '000
වට්ටම් අනුපාතය	(58,660)	62,880	(81,960)	87,856

48.4 ලංකා බැංකු විශ්‍රාම අරමුදල - 2014

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නිර්දේශය මත 1996 ජනවාරි 1 වෙනි දින හෝ ඊට පසු බඳවා ගත් සේවකයින් සඳහා වන මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, 2014 දෙසැම්බර් මස 16 වෙනි දින බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ ලැබීමට අවම වශයෙන් මාස 120 ක අඛණ්ඩ සේවා කාලයක් බැංකුව තුළ සේවය කර තිබිය යුතුය. තවද මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන්නන් සඳහා මරණ පාරිතෝෂික දීමනාව හැර බැංකුවේ පවත්නා වර්තමාන සේවා පාරිතෝෂික ක්‍රමය යටතේ අයිතිවාසිකම් හා වරප්‍රසාද ලැබීමට හැකියාවක් නොමැත. මෙම විශ්‍රාම වැටුප් භාර අරමුදලට දායක මුදල් සුදුසුකම්ලත් ආයුගණකවරයෙකුගේ උපදෙස්වලට අනුව බැංකුව විසින් මාසිකව ගෙවනු ලැබේ. වර්තමානයේ වය දළ වැටුපෙන් 12% කි. ඉදිරි මාස 12 තුළ බැංකුව අරමුදලට ආසන්න වශයෙන් රු. මිලියන 2,000 ක දායකත්වයක් ලබා දීමට අපේක්ෂා කරයි.

2025 දෙසැම්බර් 31 දිනට කේ. ඒ. පන්ඩිත් කන්සල්ටන්ස් ඇන්ඩ් ඇක්චුරීස් සමාගම විසින් මෙම අරමුදලේ ආයුගණක තක්සේරුව සිදු කර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - ලං.ගි.ප්‍ර. 19 - "සේවක ප්‍රතිලාභ" නිර්දේශ කරන "ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය" භාවිතා කරමින් මෙම ආයුගණක තක්සේරුව කර ඇත. මෙම අරමුදල සඳහා ආයුගණක තක්සේරු ප්‍රතිඵල පහත පරිදි සාරාංශ ගත කර ඇත.

48.4.1 ශුද්ධ ප්‍රතිලාභ වියදම (සේවක පිරිවැය යටතේ හඳුනා ගන්නා)

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2025	2024
	රු. '000	රු. '000
ප්‍රවර්තන සේවා පිරිවැය	558,940	410,330
ශුද්ධ පොළී ආදායම	(2,203,010)	(1,281,810)
ශුද්ධ ප්‍රතිලාභ වියදම/ (ආදායම)	(1,644,070)	(871,480)

48.4.2 වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනා ගන්නා අගයන්

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2025	2024
	රු. '000	රු. '000
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක (ලාභ)/පාඩු	2,680,850	(4,706,440)
සැලසුම්ගත වත්කම් මත ආයුගණක (ලාභ)/පාඩු	2,169,340	839,940
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනා ගන්නා ආයුගණක ශුද්ධ (ලාභ)/පාඩු	4,850,190	(3,866,500)

48.4.3 වෙනත් වත්කම් යටතේ හඳුනාගෙන ඇති විශ්‍රාම ප්‍රතිලාභ වත්කම්

		බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	2025	2024
		රු. '000	රු. '000
සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය	48.4.4	29,177,336	26,195,026
නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම	48.4.5	11,932,662	7,836,572
ශුද්ධ විශ්‍රාමික ප්‍රතිලාභ වත්කම්		17,244,674	18,358,454

48.4.4 සැලසුම්ගත වත්කම්හි සාධාරණ අගයෙහි වෙනස්වීම

	බැංකුව/සමූහය	
	2025	2024
	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	26,195,026	20,667,766
අපේක්ෂිත ප්‍රතිලාභ	3,143,400	2,686,810
සේවායෝජකයාගේ දායකත්වය	2,092,340	3,760,420
ගෙවන ලද ප්‍රතිලාභ	(84,090)	(80,030)
සැලසුම්ගත වත්කම් මත ආයුගණක ලාභ/(පාඩු)	(2,169,340)	(839,940)
දෙසැම්බර් 31 දිනට ශේෂය	29,177,336	26,195,026

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

48.4.5 නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයෙහි වෙනස්වීම්

	බැංකුව/සමූහය	
	2025 රු. '000	2024 රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	7,836,572	10,807,712
පොළී පිරිවැය	940,390	1,405,000
ප්‍රවර්තන සේවා පිරිවැය	558,940	410,330
ගෙවන ලද ප්‍රතිලාභ	(84,090)	(80,030)
බැඳීම් මත ආයුගණක (ලාභ)/අලාභ	1,192,780	(6,091,480)
උපකල්පනයන්හි වෙනස්වීම මත (ලාභ)/අලාභ	1,488,070	1,385,040
දෙසැම්බර් 31 දිනට ශේෂය	11,932,662	7,836,572

තක්සේරු දිනට ක්‍රියාකාරී සේවකයින් හා විශ්‍රාමිකයින්ට අදාළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වලට අදාළ වර්තමාන අගය පිළිවෙලෙන් රු. මිලියන 11,471.9 සහ රු. මිලියන 460.8 කි.

48.4.6 සැලසුම්ගත වත්කම් පහත දැවලින් සමන්විත වේ

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025 රු. '000	2024 රු. '000
ස්ථාවර තැන්පතු	26,960,700	22,928,900
ණයකර	1,347,520	1,104,690
රජයේ සුරැකුම්පත්	-	2,150,620
වෙනත්	869,116	10,816
මුළු සැලසුම්ගත වත්කම්	29,177,336	26,195,026

48.4.7 ආයුගණක උපකල්පනයන්

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025 %	2024 %
අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතිකය*	වාර්ෂිකව 8.50	වාර්ෂිකව 8.50
ජීවන වියදම් දීමනාවෙහි අනාගත වැඩිවීමේ ප්‍රමාණය (COLA)	වාර්ෂිකව 7.00	වාර්ෂිකව 8.00
විශ්‍රාම ගෙවීම්වල වැඩිවීම (මූලික)	නැත	නැත
වට්ටම් අනුපාතය	වාර්ෂිකව 11.25	වාර්ෂිකව 12.00
සේවය හැරයාමේ අනුපාතිකය	නැත	නැත

* තක්සේරු කිරීමේ කාර්යය සඳහා බැංකුව මූලික වැටුප සඳහා වසරකට 8.5% ක වර්ධක අනුපාතයක් උපකල්පනය කර ඇත. කෙසේ වෙතත්, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අනුපාත අනුව, සියළු අනාගත වර්ධක අනුපාත මූලික වැටුප සඳහා 8% දක්වා සීමා කර ඇත.

බැංකුව විසින් ඉන්දියාවේ ආයුගණක ආයතනය විසින් නිකුත් කරන ලද පරම උපත් හා මරණ දත්ත වගුව IALM (2012-2014) භාවිතා කර ඇත.

උපකල්පනවල වැඩිවීම/අඩුවීම, නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයට ඇති කරන බලපෑම පහත පෙන්නුම් කෙරේ.

	බැංකුව/සමූහය	
	0.5% වැඩිවීම රු. '000	0.5% අඩුවීම රු. '000
වට්ටම් අනුපාතය	(1,020,630)	1,147,710

තවදුරටත්, ප්‍රතිලාභ ගෙවීම් සඳහා අපේක්ෂිත ඉතිරි වසර ගණන වසර 21 කි.

අනාගත වර්ෂවලදී මෙම අරමුදලෙන් පහත සඳහන් ගෙවීම් සිදු කිරීමට අපේක්ෂා කරයි.

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024
	රු. '000	රු. '000
ඉදිරි මාස 12 තුළ	117,572	49,992
වසර 1 සහ 5 අතර	825,180	412,800
වසර 6 සහ 10 අතර	1,288,120	805,590
වසර 10 වඩා වැඩි	9,701,790	6,568,190
අපේක්ෂිත මුළු ගෙවීම්	11,932,662	7,836,572

48.5 අසනීප නිවාඩු මුදල් කිරීම සඳහා ප්‍රතිපාදන

	බැංකුව/සමූහය	
	2025	2024
	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	1,245,997	1,102,987
වර්ෂය තුළ වෙන්කිරීම්/(ප්‍රතිවර්ත්‍ය) කිරීම්	313,180	182,170
වර්ෂය තුළදී සිදු කළ ගෙවීම්	(23,220)	(39,160)
දෙසැම්බර් 31 දිනට ශේෂය	1,535,957	1,245,997

ආයුගණක තක්සේරුවේදී භාවිතාකරණ ලද ආයු ගණක උපකල්පනයන් පහත පරිදි වේ.

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024
	%	%
අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතිකය	වාර්ෂිකව 8.50	වාර්ෂිකව 8.50
ජීවන වියදම් දීමනාවෙහි අනාගත වැඩිවීමේ ප්‍රමාණය (COLA)	වාර්ෂිකව 7.00	වාර්ෂිකව 8.00
වට්ටම් අනුපාතය	වාර්ෂිකව 10.75	වාර්ෂිකව 12.00

බැංකුව විසින් ඉන්දියාවේ ආයුගණක ආයතනය විසින් නිකුත් කරන ලද පරම උපත් හා මරණ දත්ත වගුව IALM (2012-2014) භාවිතා කර ඇත.

උපකල්පනවල වැඩිවීම/අඩුවීම මඟින් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයට ඇති කරන බලපෑම පහත පෙන්නුම් කෙරේ.

	බැංකුව/සමූහය	
	0.5% වැඩිවීම	0.5% අඩුවීම
	රු. '000	රු. '000
වට්ටම් අනුපාතය	(62,300)	66,038

අනාගත වර්ෂ වලදී අසනීප නිවාඩු මුදල් කිරීම සඳහා වූ ප්‍රතිපාදන තුලින් පහත ගෙවීම් සිදු කිරීමට අපේක්ෂා කරයි.

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024
	රු. '000	රු. '000
ඉදිරි මාස 12 තුළ	22,087	19,400
වසර 1 සහ 5 අතර	130,150	113,660
වසර 6 සහ 10 අතර	136,810	127,790
වසර 10 වඩා වැඩි	1,246,910	985,147
අපේක්ෂිත මුළු ගෙවීම්	1,535,957	1,245,997

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

49 යටත් කාලීන වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

යටත් කාලීන වගකීම් යනු දිගු කාලීන අරමුදල් අවශ්‍යතා සපුරා ගැනීමට ගත් ප්‍රමුඛතාවය හිමි නොවන ණය මුදල් වන අතර යටත්කාලීන වගකීම් පළමුවෙන් සාධාරණ අගයට පොත් වල හඳුනා ගන්නා අතර පසුව සඵල පොළී අනුපාතික ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පදනමට හඳුනා ගනු ලැබේ. ක්‍රමක්ෂය අගය ගණනය කිරීමේ දී මූල්‍ය උපකරණයට අදාල අධි මිල, වට්ටම් සහ ගනුදෙනු පිරිවැය මෙහි සඵල පොළී අනුපාතිකය තුළ ඇතුළත් වේ. සඵල පොළී අනුපාතිකය යටතේ ගණනය කරන ලද වියදම "පොළී වියදම" (සටහන 8.2) තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි දක්වා ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ලැයිස්තුගත ණයකර				
සුරැකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර වකක් රු. 100/-	61,600,947	25,566,786	61,600,947	25,566,786
ලැයිස්තුගත නොකළ ණයකර				
සුරැකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර වකක් රු. 100/- (පුද්ගලික නිකුතුව)	19,051,529	24,067,197	18,799,367	23,814,056
අමතර පළමු පෙළ ප්‍රාග්ධන බැඳුම්කර				
සුරැකුම් රහිත, යටත්, නිත්‍ය ප්‍රාග්ධන බැදුම්කර වකක් රු. 100/- (පුද්ගලික නිකුතුව)	18,803,284	18,901,717	18,803,284	18,901,717
මුළු යටත් කාලීන වගකීම්	99,455,760	68,535,700	99,203,598	68,282,559

49.1 යටත් කාලීන වගකීම්වල සංචලනය

	බැංකුව		සමූහය	
	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	68,535,700	64,691,810	68,282,559	64,437,320
වර්ෂය තුළ නිකුත් කිරීම්*	35,000,000	15,000,000	35,000,000	15,000,000
වර්ෂය තුළ නිදහස් කිරීම්	(5,000,000)	(9,149,654)	(5,000,000)	(9,149,654)
ක්‍රමක්ෂය ගැළපුම්	920,060	(2,006,456)	921,039	(2,005,107)
දෙසැම්බර් 31 දිනට ශේෂය	99,455,760	68,535,700	99,203,598	68,282,559

*ණයකර නිකුතුව සඳහා වන විවර්ණිකාවෙහි සඳහන් පරිදි, වර්ෂය තුළ නිකුත් කරන ලද ණයකර මඟින් රැස් කරන ලද අරමුදල් යොදවා ඇති ආකාරය පහත වගුව මඟින් දක්වා ඇති අතර වලෙස රැස් කරන ලද අරමුදල් සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ගනුදෙනු සඳහා භාවිතා නොකරනු ඇත.

ණයකර/ බැඳුම්කර වර්ග	අරමුණු අංකය	විවර්ණිකාවට අනුව අරමුණ	විවර්ණිකාවට අනුව වෙන් කරන ලද මුදල රු.	විවර්ණිකාවට අනුව අරමුදල් භාවිතා කිරීමට යෝජිත දිනය	රැස්කරන ලද මුදලින් වෙන් කරන ලද අගය රු. (අ)	රැස් කරන ලද මුදලින් % ලෙස	භාවිතා කරන ලද අගය රු. (ආ)	භාවිතා කරන ලද අගය වෙන් කල මුදලෙහි % ලෙස (ආ/අ)	අරමුදල් යොදවා ඇති ආකාරය (උදා: සම්බන්ධිත පාර්ශ්වයන් සඳහා ණය ලබාදීම්) ද ඇතුළුව අරමුදල් පූර්ණ වශයෙන් භාවිතා නොකර ඇති විටදී අදාළ පැහැදිලි කිරීම
දෙවන පෙළ ණයකර	1	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (CAR) සහ කේවල ණය ගැනුම් සීමාව වර්ධනය කිරීම සඳහා බැංකුවෙහි ස්ථර II ප්‍රාග්ධනය ඉහළ නැංවීම.	බිලියන 15	26.05.2025	බිලියන 15	100	බිලියන 15	100	අදාළ නැත
	2	බැංකුවෙහි වත්කම්/වගකීම් කළඹවල ඇති පරතර නිරාවරණය අවම කිරීම සහ කළමනාකරණය කිරීම.							
	3	බැංකුවෙහි ද්‍රවශීලතා තත්ත්වය ශක්තිමත් කිරීම සහ වත්කම් පදනම/ණය කළඹ ඉහළ නැංවීම.		26.05.2026 දින හෝ ඊට පෙර					
දෙවන පෙළ තිරසාර බැඳුම්කර	1	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (CAR) වර්ධනය කිරීම සඳහා බැංකුවෙහි ස්ථර II ප්‍රාග්ධනය ඉහළ නැංවීම	බිලියන 20	24.12.2025	බිලියන 20	100	බිලියන 20	100	නව හරිත හා සමාජ ණය සඳහා වෙන් කරන තෙක් මාස 6 ක භාණ්ඩාගාර බිල්පත් වල රුපියල් බිලියන 6 ක් ආයෝජනය කරන ලදී.
	2	බැංකුවෙහි වත්කම්/වගකීම් කළඹවල ඇති පරතර නිරාවරණය අවම කිරීම සහ කළමනාකරණය කිරීම සහ බැංකුවෙහි ද්‍රවශීලතා තත්ත්වය ශක්තිමත් කිරීම							
	3	බැංකුවේ සමාජ ණය කළඹ පුළුල් කිරීම.	සුදුසුකම් ලත් සමාජ ණය කළඹ සඳහා මූල්‍යකරණය සහ/හෝ ප්‍රතිමූල්‍යකරණය සඳහා උපරිම වශයෙන් රුපියල් බිලියන 15 ක් දක්වා වන අතර, එයින් රුපියල් බිලියන 10.5 ක් දක්වා සුදුසුකම් ලත් සමාජ ව්‍යාපෘති සඳහා ප්‍රතිමූල්‍යකරණය සඳහා වේ.	24.12.2027 දින හෝ ඊට පෙර	ප්‍රතිමූල්‍යකරණය සඳහා බිලියන 10.5		බිලියන 10.5	100	
					නව ණය සඳහා බිලියන 4.5		නැත	නැත	
		බැංකුවේ හරිත ණය කළඹ පුළුල් කිරීම.	සුදුසුකම් ලත් හරිත ණය කළඹ සඳහා මූල්‍යකරණය සහ/හෝ ප්‍රතිමූල්‍යකරණය සඳහා උපරිම වශයෙන් රුපියල් බිලියන 5ක් දක්වා වන අතර, එයින් රුපියල් බිලියන 3.5ක් දක්වා සුදුසුකම් ලත් හරිත ව්‍යාපෘති සඳහා ප්‍රතිමූල්‍යකරණය සඳහා වේ.		ප්‍රතිමූල්‍යකරණය සඳහා බිලියන 3.5		බිලියන 3.5	100	
					නව ණය සඳහා බිලියන 1.5		නැත	නැත	

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

49.2 ණයකර වර්ග

දෙසැම්බර් 31 දිනට වටිනාකම

	සටහන්	පොළිය ගෙවිය යුතු වාර ගණන	නිකුත් කළ දිනය	පරිණත වන දිනය	කූපන් අනුපාතය 2025 %	කූපන් අනුපාතය 2024 %	සැසඳිය හැකි රජයේ සුරැකුම්පත් පොළී අනුපාතය	බැංකුව 2025 රු. '000	බැංකුව 2024 රු. '000	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000
ස්ථාවර පොළී අනුපාතය											
ලැයිස්තුගත නොකල, සුරැකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර		වාර්ෂිකව	29.12.2017	28.12.2025	12.75	12.75	-	-	5,006,407	-	5,006,407
ලැයිස්තුගත නොකල, සුරැකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර		වාර්ෂිකව	31.07.2018	30.07.2026	12.00	12.00	8.18	7,027,961	7,027,677	7,027,961	7,027,677
ලැයිස්තුගත නොකල, සුරැකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර		වාර්ෂිකව	26.07.2019	25.07.2027	11.75	11.75	8.49	64,185	64,168	64,185	64,168
ලැයිස්තුගත නොකල, සුරැකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර		වාර්ෂිකව	30.12.2022	29.12.2027	29.00	29.00	8.86	6,498,997	6,498,975	6,498,997	6,498,975
ලැයිස්තුගත කල, සුරැකුම් රහිත, යටත්, ශක්‍යතා නොමැති වීමකදී ලියා හැරීමේ හැකියාව සහිත නිදහස් කළ හැකි ණයකර	(අ)	වාර්ෂිකව	27.12.2023	27.12.2028	15.00	15.00	9.28	10,015,949	10,019,751	10,015,949	10,019,751
ලැයිස්තුගත කල, සුරැකුම් රහිත, යටත්, ශක්‍යතා නොමැති වීමකදී ලියා හැරීමේ හැකියාව සහිත නිදහස් කළ හැකි ණයකර	(අ)	වාර්ෂිකව	20.09.2024	20.09.2029	13.50	13.50	9.55	15,545,749	15,547,035	15,545,749	15,547,035
ලැයිස්තුගත කල, සුරැකුම් රහිත, යටත්, ශක්‍යතා නොමැති වීමකදී ලියා හැරීමේ හැකියාව සහිත නිදහස් කළ හැකි ණයකර	(අ)	වාර්ෂිකව	26.05.2025	26.05.2030	11.25	-	9.64	15,995,447	-	15,995,447	-
ලැයිස්තුගත කල, සුරැකුම් රහිත, යටත්, ශක්‍යතා නොමැති වීමකදී ලියා හැරීමේ හැකියාව සහිත නිදහස් කළ හැකි තිරසාර බැඳුම්කරය	(අ)	වාර්ෂිකව	24.12.2025	24.12.2030	10.50	-	9.67	19,857,406	-	19,857,406	-
මුළු ස්ථාවර පොළී අනුපාත යටත් කාලීන ණයකර								75,005,694	44,164,013	75,005,694	44,164,013
විචල්‍ය පොළී අනුපාතය											
ලැයිස්තුගත නොකල, සුරැකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර (6 මාස හා.බි. අනුපාතය (දළ)+250 පිරිකර පදනම 9.0% ක අවම සීමාවකට යටත් වේ)	(ආ)	අර්ධ වාර්ෂිකව	22.11.2021	22.11.2026	10.41	12.10	8.31	5,460,386	5,469,970	5,208,224	5,216,829
ලැයිස්තුගත කල, සුරැකුම් රහිත, යටත්, ශක්‍යතා නොමැති වීමකදී ලියා හැරීමේ හැකියාව සහිත නිදහස් කළ හැකි තිරසාර බැඳුම්කරය (12 මාස හා.බි. අනුපාතය (දළ) 200 පිරිකර පදනම)	(අ)/(ආ)	වාර්ෂිකව	24.12.2025	24.12.2030	10.19	-	9.67	186,396	-	186,396	-
මුළු විචල්‍ය පොළී අනුපාත යටත් කාලීන ණයකර								5,646,782	5,469,970	5,394,620	5,216,829

දෙසැම්බර් 31 දිනට වටිනාකම

	සටහන්	පොළිය ගෙවිය යුතු වාර ගණන	නිකුත් කළ දිනය	පරිණත වන දිනය	කූපන් අනුපාතය 2025 %	කූපන් අනුපාතය 2024 %	සැසඳිය හැකි රජයේ සුරැකුම්පත් පොළී අනුපාතය	බැංකුව 2025 රු. '000	බැංකුව 2024 රු. '000	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000
අතිරේක පළමු පෙළ ප්‍රාග්ධන බැඳුම්කර											
ලැයිස්තුගත නොකල, සුරැකුම් රහිත, යටත්, නිත්‍ය ප්‍රාග්ධන බැඳුම්කර (12 මාස හා.බි. අනුපාතය (ශුද්ධ)+150 ඒකක පදනම 9.5% ක අවම සීමාවකට යටත් වේ)		වාර්ෂිකව	06.07.2020	අ/නො	9.50	11.81	-	5,226,897	5,280,531	5,226,897	5,280,531
ලැයිස්තුගත නොකල, සුරැකුම් රහිත, යටත්, නිත්‍ය ප්‍රාග්ධන බැඳුම්කර (12 මාස බරතැබූ සාමාන්‍ය හා.බි. අනුපාතය (ශුද්ධ)+150 ඒකක පදනම 9.0% ක අවම සීමාවකට යටත් වේ)		වාර්ෂිකව	01.12.2020	අ/නො	9.53	10.58	-	10,075,305	10,083,231	10,075,305	10,083,231
ලැයිස්තුගත නොකල, සුරැකුම් රහිත, යටත් කාලීන, නිත්‍ය ප්‍රාග්ධන බැඳුම්කර (12 මාස බර තැබූ සාමාන්‍ය හා.බි. අනුපාතය (ශුද්ධ) + 150 ඒකක පදනම 9.0% ක අවම සීමාවකට යටත් වේ.)		වාර්ෂිකව	06.07.2021	අ/නො	9.44	11.81	-	3,501,082	3,537,955	3,501,082	3,537,955
මුළු අතිරේක පළමු පෙළ ප්‍රාග්ධන බැඳුම්කර								18,803,284	18,901,717	18,803,284	18,901,717
මුළු යටත් කාලීන ණයකර								99,455,760	68,535,700	99,203,598	68,282,559

සටහන්:

අ) මෙම ණයකර කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කර ඇත.

ආ) ශ්‍රී ලංකා මහ බැංකුව නිවේදනය කරන පොළී යලි සකස් කරන දිනයට පෙර සතියේදී අදාල බදු අඩු කිරීමට පෙර භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තැබූ සාමාන්‍ය පොළිය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

50 කොටස් ප්‍රාග්ධනය

50.1 සාමාන්‍ය කොටස් සහ විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය

50.1.1 සාමාන්‍ය කොටස

	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
අනුදත්				
50,000,000 සාමාන්‍ය කොටස්	50,000,000	50,000,000	50,000,000	50,000,000
නිකුත් කළ සහ ගෙවා නිමි				
ජනවාරි 1 දිනට ශේෂය	25,000,000	25,000,000	25,000,000	25,000,000
වර්ෂය තුළ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය	730,000	-	730,000	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	25,730,000	25,000,000	25,730,000	25,000,000

2025 දෙසැම්බර් 31 වන විට, නිකුත් කරන ලද සහ ගෙවා නිමි කොටස් 25,730,000 (2024 - 25,000,000) වේ.

50.1.2 විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය

	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	730,000	730,000	730,000	730,000
කොටස් ප්‍රාග්ධනයට මාරු කිරීම්	(730,000)	-	(730,000)	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	-	730,000	-	730,000

2022 වසර තුළදී ශ්‍රී ලංකා රජය විසින් බැංකුවේ සිදු කරන ලද ආයෝජනය ලෙස බැංකුවට රුපියල් මිලියන 730.0 ක් ලැබී ඇති අතර එය 2025 වර්ෂය තුළ කොටස් ප්‍රාග්ධනයට මාරු කර ඇත.

50.2 කොටසක ශුද්ධ වත්කම් වටිනාකම

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024	2025	2024
ලවය වශයෙන් භාවිතා කළ වටිනාකම				
බැංකුවේ කොටස්හිමියාට අයත් මුළු ස්කන්ධය (රු. '000)	365,800,220	302,559,805	386,904,377	321,296,283
හරය වශයෙන් භාවිතා කළ සාමාන්‍ය කොටස් ප්‍රමාණය				
නිකුත් කර ඇති මුළු සාමාන්‍ය කොටස් ප්‍රමාණය	25,730,000	25,000,000	25,730,000	25,000,000
කොටසක ශුද්ධ වත්කම් වටිනාකම (රු.)	14,216.88	12,102.39	15,037.09	12,851.85

51 ස්ථාවර සංචිත අරමුදල

	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	16,953,000	15,665,000	16,953,000	15,665,000
වර්ෂය තුළ මාරු කළ ප්‍රමාණය	1,521,000	1,288,000	1,521,000	1,288,000
දෙසැම්බර් 31 දිනට ශේෂය	18,474,000	16,953,000	18,474,000	16,953,000

ලංකා බැංකු ආඥා පනතේ (397 පරිච්ඡේදයේ) සඳහන් පරිදි, ලංකා බැංකුව මඟින් ස්ථාවර සංචිත අරමුදලක් පවත්වාගෙන යනු ලැබේ. එම ආඥා පනතට අනුව, බදු ගෙවීමෙන් පසුව, විභෙත් ලාභාංශ ප්‍රකාශ කිරීමට පෙර, ශුද්ධ ලාභයෙන් 20% කට අඩු නොවන ප්‍රමාණයක මුදලක් ස්ථාවර සංචිතයට පැවරිය යුතුය. සංචිතය නිකුත් කරන ලද සහ ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් 50% කට සමාන වීමෙන් අනතුරුව 1988 අංක 30 දරණ බැංකු පනතේ 20 (1) සහ (2) වගන්ති යටතේ තීරණය කර ඇති පරිදි වාර්ෂිකව 2% ක් වූ ප්‍රමාණයකින් ගෙවා නිමි ප්‍රාග්ධනයට සමාන වන තෙක් සංචිතයට පැවරිය යුතුය.

මෙම නියමය ඉටු කිරීම සඳහා 2025 වර්ෂය තුළදී රු. මිලියන 1521.0 ක මුදලක් ස්ථාවර සංචිතයට මාරු කරන ලදී (2024 - රු. මිලියන 1,288.0).

ස්ථාවර සංචිත අරමුදලේ ශේෂය භාවිතා කරනු ලබන්නේ 1988 අංක 30 දරණ බැංකු පනතේ 20 (2) වගන්තිය යටතේ විශේෂයෙන් දක්වා ඇති අරමුණු සඳහා පමණි.

52 රඳවාගත් ඉපැයුම්

	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	183,388,860	171,351,609	185,536,613	173,063,302
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	66,823,400	54,730,719	67,461,481	55,325,620
වෙනත් සංචිත අරමුදල් වලට මාරුකිරීම්	(1,521,000)	(1,288,000)	(1,611,441)	(1,446,841)
අධිභාර බදු	-	(1,483,337)	-	(1,483,337)
විශේෂ සංචිතයට මාරුකිරීම	(39,339,604)	(39,922,131)	(39,339,604)	(39,922,131)
හිමිකම් නොපෑ ලාභාංශ ප්‍රතිවර්තය කිරීම	-	-	1,835	-
ලාභාංශ	(5,000,000)	-	(5,000,000)	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	204,351,656	183,388,860	207,048,884	185,536,613

53 මුදල් ප්‍රවාහ හෙජ් සංචිත

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

විදේශ විනිමය අවදානම අවම කර ගැනීම සඳහාත් ඇමරිකන් ඩොලර් ණය ලබාගැනීමෙන් ලාභ හෝ අලාභයේ ඇතිවන උච්ඡාවචනයන් අවම කරගැනීම සඳහාත් බැංකුව විසින් විදේශීය බැංකුවලින් ලබාගත් ණයට එරෙහිව ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) සමඟ USD/LKR අරමුදල් හුවමාරු කිරීමේ ගිවිසුම් (SWAP) වලට ඇතුල් වී ඇත. මෙම SWAP ගිවිසුම හෙජ් සඵලතාවය පරීක්ෂා කිරීමෙන් පසු හෙජ් ගිණුම්කරණයට අනුව ගිණුම් ගතකර ඇත.

	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	1,521,423	5,251,517	1,521,423	5,251,517
මුදල් ප්‍රවාහ හෙජ් උපකරණ මත ලාභ/(පාඩු)	(783,217)	(3,730,094)	(783,217)	(3,730,094)
දෙසැම්බර් 31 දිනට ශේෂය	738,206	1,521,423	738,206	1,521,423

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

54 වෙනත් සංචිත

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	2025	2024	2025	2024
		රු. '000	රු. '000	රු. '000	රු. '000
ප්‍රත්‍යාගණන සංචිතය	54.1	22,227,386	22,227,386	34,037,095	33,584,706
නිදහස් සංචිතය	54.2	169,067	169,067	366,644	366,644
විනිමය පරිවර්තන සංචිතය	54.3	7,490,659	6,913,389	11,396,364	9,958,632
විශේෂ සංචිතය	54.4	79,261,735	39,922,131	79,261,735	39,922,131
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට දක්වන සංචිත	54.5	7,357,511	5,734,549	9,459,184	7,328,571
ව්‍යවස්ථාපිත සංචිතය - වෙනත්	54.6	-	-	392,265	394,563
මුළු වෙනත් සංචිත		116,506,358	74,966,522	134,913,287	91,555,247

54.1 ප්‍රත්‍යාගණන සංචිතය

	බැංකුව		සමූහය	
	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	22,227,386	22,227,386	33,584,706	33,687,424
ප්‍රත්‍යාගණන අතිරික්තයන්හි/(ඌනතාවයන්හි) සිදු වූ වෙනස්වීම්	-	-	653,881	(139,720)
ඉහත අගය මත විලම්බිත බදු බලපෑම	-	-	(196,164)	41,916
පාලනයට යටත් නොවන පොළියට මාරු කළ ප්‍රමාණය	-	-	(5,328)	(4,914)
දෙසැම්බර් 31 දිනට ශේෂය	22,227,386	22,227,386	34,037,095	33,584,706

නිදහස් අයිතිය සහිත ඉඩම්, ගොඩනැගිලි හා කල්බදු අයිතිය සහිත ඉඩම් මත ඇති ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය මත ඇතිවන අතිරික්තයන් ප්‍රත්‍යාගණන සංචිතයෙන් නිරූපනය කෙරේ.

ශ්‍රී ලංකා මහ බැංකුව ඉදිරිපත් කර ඇති බාසල් III නියාමන නිර්දේශයන්ට අනුව, සෑම වසර තුනකට වරක් බැංකුවට ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය ගණනය කිරීමේදි, ප්‍රත්‍යාගණන අතිරික්තය, අතිරේක ප්‍රාග්ධනයක් ලෙසට සලකා බැලිය හැකිය.

54.2 නිදහස් සංචිතය

	බැංකුව		සමූහය	
	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	169,067	169,067	366,644	366,644
දෙසැම්බර් 31 දිනට ශේෂය	169,067	169,067	366,644	366,644

අනපේක්ෂිත අවදානම් සහ අනාගතයේ විය හැකි පාඩු සඳහා නිදහස් සංචිතය නිර්මාණය කර ඇත.

54.3 විනිමය පරිවර්තන සංචිතය

	බැංකුව		සමූහය	
	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	6,913,389	8,762,834	9,958,632	12,335,352
විදේශ මෙහෙයුම්හි මූල්‍ය ප්‍රකාශන පරිවර්තනයේදී ඇතිවන විනිමය වෙනස්කම්	577,270	(1,849,445)	1,344,993	(2,499,942)
වෙනත් සංචිත සඳහා මාරු කිරීම්	-	-	92,739	123,222
දෙසැම්බර් 31 දිනට ශේෂය	7,490,659	6,913,389	11,396,364	9,958,632

ලංකා බැංකුව (යූ කේ) සමාගම සහ විදේශීය ශාඛාවල කරන ලද ප්‍රාග්ධන ආයෝජන පරිවර්තනය කිරීමේදී ඇතිවන විනිමය වෙනස හා එතෙර පරිපාලිතයන් හා විදේශීය ශාඛාවල ශුද්ධ ස්කන්ධය පරිවර්තනය කිරීමේදී ඇතිවන ශුද්ධ විනිමය සංචලනයන් සහ විදේශීය ශාඛාවල වර්ෂය සඳහා ප්‍රතිඵල, වර්ෂය අවසාන දිනට පවතින සාමාන්‍ය විනිමය වෙනස මෙහිදී නිරූපණය කෙරේ.

54.4 විශේෂ සංචිතය

	බැංකුව		සමූහය	
	2025	2024	2025	2024
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	39,922,131	-	39,922,131	-
රඳවාගත් ඉපැයුම් වලින් මාරුකිරීම්	39,339,604	39,922,131	39,339,604	39,922,131
දෙසැම්බර් 31 දිනට ශේෂය	79,261,735	39,922,131	79,261,735	39,922,131

තුන්වන මට්ටමේ මූල්‍ය උපකරණවල සාධාරණ අගය ගණනය කිරීම සඳහා 2025 දෙසැම්බර් 31 දිනට භාවිතා කරන ලද නිරීක්ෂණය කළ නොහැකි වැදගත් යෙදවුම්වලට අදාළ තොරතුරු පහත දැක්වේ.

මූල්‍ය උපකරණ වර්ගය	2025 දෙසැම්බර් 31 දිනට සාධාරණ අගය රු. '000	තක්සේරු ශිල්පීය ක්‍රමය	වැදගත් නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්	නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් සඳහා ඇස්තමේන්තු පරාසය (බර තැබූ)	නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්වලින් සාධාරණ අගය මැනීම සඳහා සංවේදීතාවය
ව්‍යුත්පන්න මූල්‍ය වත්කම්					
මුදල් හුවමාරු ගිවිසුම් (SWAPs)	6,831,227	ඉදිරි මිල කිරීම් ක්‍රමය	ඉදිරි විදේශ විනිමය අනුපාතය	පදනම් ඒකක සෘණ 100 සිට ධන 100 දක්වා	ව්‍යුත්පන්න වත්කම්වල අගයට රු. මිලියන 68.3 ක් වාසිදායකව හෝ අවාසිදායකව බලපායි.
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය වත්කම්					
මිල ප්‍රකාශ නොකල ස්කන්ධ කොටස්					
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	162,300	වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය	නොවෙනස් ලාභාංශ ක්‍රමය	පවතින ප්‍රාග්ධන පිරිවැයට 5% අඩුවීම සහ 5% වැඩිවීම.	සාධාරණ අගයට වන බලපෑම ධන රු. මිලියන 8.1 සිට සෘණ රු. මිලියන 8.1 අතර විය හැකිය. ආයෝජන සඳහා සැලකිය යුතු බලපෑමක් නැත.
ජාතික ණය සුරැකුම් ආයතනය	151,145	පිරිවැයට මිල කිරීම	-		සාධාරණ අගය විශ්වාසනීය ලෙස මැනිය නොහැක. මෙම ආයෝජන අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් ඇති ආයතනවල සිදු කර ඇති අතර, එමඟින් සාමාජිකයින්ට ගනුදෙනු සේවා හා මෙහෙයවීම සිදු කරයි. තම පිරිවැය ආවරණය කර ගැනීමට අවශ්‍ය සේවා ගාස්තු පමණක් අය කරමින් සේවා සපයනු ලැබේ.
ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය	43,645	පිරිවැයට මිල කිරීම	-		
සී/ස ලංකා ක්ලියර් (පෞද්ගලික) සමාගම	23,443	පිරිවැයට මිල කිරීම	-		
සී/ස ලංකා ෆයිනෑන්ෂියල් සර්විසස් බියුරෝ සමාගම	5,000	පිරිවැයට මිල කිරීම	-		
සී/ස ෆිව් රේටින්ස් ලංකා සමාගම	625	පිරිවැයට මිල කිරීම	-		සාධාරණ අගය විශ්වසනීය ලෙස මිනුම් කල නොහැකි අතර පිරිවැය ආකෘතිය භාවිතයෙන් තක්සේරු කර ඇත.

63.2 සාධාරණ අගයට පවත්වා ගෙන නොයන මූල්‍ය වත්කම් සහ වගකීම්හි සාධාරණ අගය

	බැංකුව					සමූහය				
	සාධාරණ අගය					සාධාරණ අගය				
2025 දෙසැම්බර් 31 දිනට	මට්ටම 1	මට්ටම 2	මට්ටම 3	එකතුව	ධාරණ අගය	මට්ටම 1	මට්ටම 2	මට්ටම 3	එකතුව	ධාරණ අගය
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්										
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්										
ණය සහ අත්තිකාරම්	-	-	2,376,731,378	2,376,731,378	2,371,751,976	-	-	2,447,550,491	2,447,550,491	2,442,422,718
ණය සහ වෙනත් උපකරණ	2,597,990,924	40,997,953	13,592,474	2,652,581,351	2,605,510,006	2,603,896,479	41,384,752	13,592,474	2,658,873,705	2,611,713,109
ආයෝජන දේපළ	-	-	3,003,007	3,003,007	2,414,640	-	-	-	-	-
එකතුව	2,597,990,924	40,997,953	2,393,326,859	5,032,315,736	4,979,676,622	2,603,896,479	41,384,752	2,461,142,965	5,106,424,196	5,054,135,827
වගකීම්										
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම්										
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	-	-	4,411,614,465	4,411,614,465	4,388,585,972	-	-	4,470,991,076	4,470,991,076	4,447,652,639
වෙනත් ණය ගැනීම්	-	-	48,719,379	48,719,379	48,719,379	-	-	56,877,726	56,877,726	56,877,726
නිකුත් කළ ණය සුරැකුම්	-	-	-	-	-	-	-	1,754,101	1,754,101	1,754,101
යටත් කාලීන ණය	-	38,541,432	65,759,148	104,300,580	99,455,760	-	38,541,432	65,506,007	104,047,439	99,203,598
එකතුව	-	38,541,432	4,526,092,992	4,564,634,424	4,536,761,111	-	38,541,432	4,595,128,910	4,633,670,342	4,605,488,064

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2024 දෙසැම්බර් 31 දිනට	බැංකුව					සමූහය				
	සාධාරණ අගය					සාධාරණ අගය				
	මට්ටම 1	මට්ටම 2	මට්ටම 3	එකතුව	ධාරණ අගය	මට්ටම 1	මට්ටම 2	මට්ටම 3	එකතුව	ධාරණ අගය
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්										
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්										
ණය සහ අත්තිකාරම්	-	-	2,186,674,853	2,186,674,853	2,177,707,779	-	-	2,230,307,847	2,230,307,847	2,221,161,844
ණය සහ වෙනත් උපකරණ	2,265,126,912	39,638,617	-	2,304,765,529	2,275,934,376	2,273,714,533	40,028,532	-	2,313,743,065	2,282,636,084
ආයෝජන දේපළ	-	-	3,003,007	3,003,007	2,414,640	-	-	-	-	-
එකතුව	2,265,126,912	39,638,617	2,189,677,860	4,494,443,389	4,456,056,795	2,273,714,533	40,028,532	2,230,307,847	4,544,050,912	4,503,797,928
වගකීම්										
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම්										
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	-	-	4,247,026,141	4,247,026,141	4,208,603,435	-	-	4,284,291,646	4,284,291,646	4,245,531,800
වෙනත් ණය ගැනීම්	-	-	29,143,678	29,143,678	29,143,678	-	-	32,344,253	32,344,253	32,344,253
නිකුත් කළ ණය සුරුකුම්	-	-	-	-	-	-	-	718,873	718,873	718,873
යටත් කාලීන ණය	-	26,559,186	45,315,115	71,874,301	68,535,700	-	26,559,186	45,061,974	71,621,160	68,282,559
එකතුව	-	26,559,186	4,321,484,934	4,348,044,120	4,306,282,813	-	26,559,186	4,362,416,746	4,388,975,932	4,346,877,485

දැනටමත් මූල්‍ය ප්‍රකාශයන්හි සාධාරණ අගයට වාර්තා නොකරන මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගය නිර්ණය කිරීමේදී භාවිතා කල ක්‍රමවේදයන් සහ උපකල්පනයන් පහතින් විස්තර කෙරේ.

ක්‍රමක්ෂ පිරිවැයට මූල්‍ය වත්කම්

මේ යටතේ ණය සහ අත්තිකාරම්, ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර, රාජ්‍ය සහ සංස්ථාපිත ණය සුරුකුම්පත් වාර්තා කරයි.

මිල ප්‍රකාශිත සංස්ථාපිත ණය සුරුකුම්පත් වාර්තා කරන දිනට ලැයිස්තුගත වෙළඳපොල මිල මත අගය කරන අතර මිල ප්‍රකාශිත රාජ්‍ය ණය සුරුකුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශිත ඵලදා අනුපාතය භාවිතා කරමින් අගය කරයි. මිල ප්‍රකාශ නොකළ ආයතනික ණය සුරුකුම්පත්හි සහ ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැදුම්කරද ඇතුලත් රාජ්‍ය සුරුකුම්පත්හි සාධාරණ අගය, එම වර්ගයට සමාන උපකරණයන්හි වාර්තා කරන දිනට පවතින පොළී අනුපාතය යටතේ ලැබිය හැකි අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන අගය පදනම්ව තක්සේරු කරනු ලැබේ.

ආයෝජන දේපළ

ආයෝජන දේපළ අගය කිරීම ස්වාධීන, වෘත්තීය තක්සේරුකරුවන් විසින් සිදු කරයි. මෙයට අදාළ වැඩි විස්තර සටහන් 33 යටතේ දක්වා ඇත.

ක්‍රමක්ෂ අගයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම්

ක්‍රමක්ෂ අගයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම් යටතේ දේශීය හා විදේශීය බැංකු හා මූල්‍ය ආයතන වලින් ගත් කාලීන ණය සහ ප්‍රතිමූල්‍ය ණය නියෝජනය කරයි.

කාලීන ණය ගැනීම් සහ ප්‍රතිමූල්‍ය ණය වල සාධාරණ අගය ඒ හා සමාන උපකරණයන්හි ඵලදායී පොළී අනුපාතය පදනම්ව අපේක්ෂිත අනාගත මූල්‍ය ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් ඇස්තමේන්තු කරයි.

නිකුත් කළ ණය සුරුකුම්පත්

වාර්තා කරන දිනට ඒ හා සමාන උපකරණයන්හි පොළී අනුපාත පදනම්ව ණය සුරුකුම්පත් සඳහා ගෙවීමට අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්මාන අගය පදනම්ව සාධාරණ අගය තක්සේරු කරනු ලබයි.

යටත් කාලීන වගකීම්

කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇති යටත්කාලීන වගකීම් වාර්තා කරන දිනට වෙළඳපල මිල පදනම්ව අගය කිරීම සිදු කරයි. වාර්තා කරන දිනට පවතින සමාන උපකරණ වල පොළී අනුපාතය පදනම්ව එම උපකරණ වලට ගෙවීමට බලාපොරොත්තු වන මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම පදනම්ව ලැයිස්තු ගත නොකළ යටත්කාලීන වගකීම් වල සාධාරණ අගය තක්සේරු කෙරේ.

63.3 ධාරණ අගය දළ වශයෙන් සාධාරණ අගයට සමාන වත්කම් හා වගකීම්

කෙටිකාලීන කල් පිරීමක් සහිත මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වල ධාරණ අගය දළ වශයෙන් සාධාරණ අගයට සමාන බව උපකල්පනය කරන ලදි. වර්ෂයකට වඩා වැඩි කාලයක් සහිත ගිවිසුම්ගත කල් පිරීමක් සහිත සමහර උපකරණයන්හි සාධාරණ අගය ද සාධාරණ පදනම් භාවිතයෙන් තීරණය කරන ලදි. මෙවැනි මූල්‍ය උපකරණ වල සාධාරණ අගය තීරණය කිරීමේදී බැංකුව භාවිත කළ පදනම් පහත දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනට	2025		2024	
	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
බැංකුව				
මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් හා සමාන දෑ	131,083,172	131,083,172	115,422,407	115,422,407
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	79,845,952	79,845,952	52,346,230	52,346,230
බැංකුවල ඇති තැන්පතු	39,458,670	39,458,670	62,413,107	62,413,107
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	345,307	345,307	23,982,341	23,982,341
මුළු මූල්‍ය වත්කම්	250,733,101	250,733,101	254,164,085	254,164,085
මූල්‍ය වගකීම්				
බැංකු වලට ගෙවිය යුතු	26,397,898	26,397,898	1,671,087	1,671,087
ප්‍රති මිලදීගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	284,215,169	284,215,169	131,079,414	131,079,414
මුළු මූල්‍ය වගකීම්	310,613,067	310,613,067	132,750,501	132,750,501
සමූහය				
මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් හා සමාන දෑ	133,811,977	133,811,977	116,281,852	116,281,852
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	79,845,952	79,845,952	52,346,230	52,346,230
බැංකුවල ඇති තැන්පතු	43,182,411	43,182,411	61,576,750	61,576,750
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු සුරැකුම්පත්	604,912	604,912	21,581,160	21,581,160
මුළු මූල්‍ය වත්කම්	257,445,252	257,445,252	251,785,992	251,785,992
මූල්‍ය වගකීම්				
බැංකු වලට ගෙවිය යුතු	27,225,943	27,225,943	1,682,417	1,682,417
ප්‍රති මිලදීගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	288,688,312	288,688,312	130,030,614	130,030,614
මුළු මූල්‍ය වගකීම්	315,914,255	315,914,255	131,713,031	131,713,031

63.4 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් නැවත වර්ගීකරණයs

2025 වර්ෂය තුළදී මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් නැවත වර්ගීකරණය කර නැත.

64 අවදානම් කළමනාකරණය

64.1 හැඳින්වීම

64.1.1 දළ විශ්ලේෂණය

බැංකුකරණ ව්‍යාපාරයේ අවදානම ආවේනික අංගයක් වන අතර, බැංකුව මූල්‍ය අතරමැදිකරණයෙහි නිරත වන බැවින් ණය අවදානමට, වෙළඳපල අවදානමට, මෙහෙයුම් අවදානමට හා ද්‍රවශීලතා අවදානමට ප්‍රධාන වශයෙන් නිරාවරණය වේ. එම අවදානම් ඵලදායි ලෙස කළමනාකරණය කිරීම සඳහා සහ බැංකුවේ අඛණ්ඩ පැවැත්ම සහ තිරසාරභාවය සහතික කිරීම සඳහා බැංකුව විසින් විස්තීරණ අවදානම් කළමණාකරණ රාමුවක් සකස්කර ඇත.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) විසින් නිසි අධීක්ෂණයකින් යුතුව කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, මැනීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ බැංකුවේ විස්තීරණ අවදානම් කළමනාකරණ රාමුව (RMF) සපයයි. බැංකුවේ ආයතනික යහපාලනය සහ අවදානම් කළමනාකරණ රාමුවේ කොටසක් ලෙස මූල්‍ය අවදානම ඇතුළුව ක්‍රමෝපායික, කීර්තිය පිළිබඳ, අනුකූලතා සහ නෛතික අවදානම් ආදී බැංකුව මුහුණ දෙන අනෙකුත් ප්‍රධාන අවදානම් කළමනාකරණය කර අධීක්ෂණය කරනු ලැබේ.

මෙම සටහනේ ඉදිරිපත් කර ඇති තොරතුරු වන්නේ ඉහත දක්වා ඇති අවදානම් වලට නිරාවරණය වීම සහ එම අවදානම් මිනුම් කිරීමේ හා කළමනාකරණය කිරීමේ ක්‍රියාවලියයි.

පොදු හැඳින්වීම
64.1.2 සමූහයේ අවදානම් කළමනාකරණය
64.1.3 අවදානම් කළමනාකරණ රාමුව
64.1.4 අවදානම් මිනුම්කරණය, වාර්තාකරණය සහ අවම කිරීම

ණය අවදානම
64.2.2 ණය අවදානමට උපරිම නිරාවරණය
64.2.3 ක්‍රමක්ෂය හා හානිකරණ වෙන්කිරීම්වල සංචලනයන්
64.2.5 රටවල් අනුව නිරාවරණය
64.2.6 අංශ අනුව නිරාවරණය
64.2.7 බැඳීම් සහ ඇපකර

ද්‍රවශීලතා අවදානම
64.3.1 ද්‍රවශීලතා අවදානමට නිරාවරණය වීම
64.3.2 මූල්‍ය වගකීම්වල කල්පිරීම විශ්ලේෂණය

වෙළඳපල අවදානම
64.4.1 වෙළඳ සහ වෙළඳ නොවන කළඹ - බැංකුව
64.4.2 පොළී අනුපාත අවදානම
64.4.3 විදේශ විනිමය අවදානම
64.4.4 ස්කන්ධ අවදානම

මෙහෙයුම් අවදානම

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය සහ ප්‍රාග්ධන කළමනාකරණය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

64.1.2 සමූහයේ අවදානම් කළමනාකරණය

ලංකා බැංකු සමූහය සෘජු හා වක්‍ර හිමිකම සහිත මූල්‍ය හා මූල්‍ය නොවන පරිපාලිත සමාගම් නවයකින් හා ආශ්‍රිත සමාගම් හතරකින් සමන්විත වේ. ඒවායේ මූලික ව්‍යාපාරික කටයුතු විවිධ ව්‍යාපාර අංශවලට පැතිරී ඇත. පරිපාලිත හා ආශ්‍රිත සමාගම්වල ශේෂ පත්‍ර ප්‍රමාණයන්ට අනුව ඒවායේ කටයුතු කීර්තිනාමය සඳහා ඇතිවිය හැකි හානියක් හැරුණු විට බැංකුවේ අවදානම් කළමනාකරණයට සැලකිය යුතු බලපෑමක් ඇති නොකරයි.

බැංකුව උපාය මාර්ගික අවදානම කළමනාකරණය කරනු ලබනුයේ ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුවේ (IRMC) අධීක්ෂණය යටතේ කාර්තු පදනම මත සිය සමූහ ව්‍යාපාර කටයුතු, ණය, වෙළඳපල, ද්‍රවශීලතා සහ මෙහෙයුම් යන අවදානම් පැතිකඩ පුළුල් වශයෙන් විමර්ශනය කිරීමෙනි. බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම මඟින් අදාළ ආයතන වල අවදානම, අනුකූලතාවය සහ විගණන කටයුතු සඳහා සමීපව සම්බන්ධ වී කටයුතු කරයි.

64.1.3 අවදානම් කළමනාකරණ රාමුව (RMF)

සමස්ත අවදානම් කළමනාකරණ රාමුවෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳව සහතිකයක් දෙමින් ආරක්ෂක රේඛා තුනේ ආකෘතිය මත පදනම්ව ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුව (IRMC) මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් කළමනාකරණ පාලන ව්‍යුහයේ පෙරමුණ ගනී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් කළමනාකරණ රාමුව (RMF) පැහැදිලිව නිර්වචනය කරන ලද පාලන ව්‍යුහයන්, ප්‍රතිපත්ති රාමු සහ අවදානම පිළිබඳ දැනුවත් කිරීමේ සංස්කෘතියකින් සමන්විත වන අතර එමඟින් බැංකුව හරහා සිදුවන අවදානම් ස්ථාවර කළමනාකරණය සහතික කෙරේ. එම නිසා අවදානම් කළමණාකරන රාමුව බැංකුවෙහි අවදානම් අභිරුචිය, සීමා පැනවීම සහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් මඟින් බැංකුවේ උපායමාර්ගික දිශාව සහ සමස්ත අවදානම් කළමනාකරණය සඳහා පරිපූර්ණ ප්‍රවේශයක් ස්ථාපිත කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපකමිටුවක් වන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට (IRMC) සෘජුවම වාර්තා කරනු ලබන ප්‍රධාන අවදානම් නිලධාරිවරයා (CRO) යටතේ බැංකුවෙහි ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) ස්ථාපිත කර ඇත. ව්‍යාපාරික ඒකක අවදානම් හිමිකරුවන් වන අතර අවදානම් කළමනාකරණය සඳහා මූලික වගකීම දරයි. ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) බැංකුවේ අවදානම් කළමනාකාරණයේ දෙවන මට්ටමේ ආරක්ෂණ ක්‍රමවේදයක් ලෙස ක්‍රියා කරනු ලබයි. බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරිවරයා, ණය කමිටුව, වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව (ALCO), මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව (ORMEC), ආයතනික තොරතුරු ආරක්ෂක කමිටුව (CISC) ආදී බැංකුව නිරාවරණය වන විවිධ අවදානම් කළමනාකරණය සඳහා දායක වන විධායක මට්ටමේ කමිටු රාශියකද සාමාජිකත්වය දරණ අතර ප්‍රධාන අවදානම් නිලධාරියා හරහා ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට (IRMC) වාර්තා කරයි.

බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරිත්වය තෙවන මට්ටමේ ආරක්ෂණ ක්‍රමවේදයක් ලෙස ස්වාධීනව අධීක්ෂණය හා ඇගයීමට ලක් කර, අවදානම් කළමනාකරණය පිළිබඳ ඔවුන්ගේ අදහස් විගණන කමිටුවට ලබා දෙනු ලැබේ.

64.1.4 අවදානම් මිනුම්කරණය, වාර්තාකරණය සහ අවම කිරීම

කර්මාන්තයේ ප්‍රශස්ත භාවිතයන් සමඟ අනුකූලව විවිධ උපක්‍රමශීලී ක්‍රම සහ මෙවලම් යොදා ගනිමින් ණය, වෙළඳපල, මෙහෙයුම්, ද්‍රවශීලතාව, තොරතුරු ආරක්ෂාව සහ අනෙකුත් අවදානම් මැනීම කරනු ලැබේ. ආර්ථිකයේ ඉහළ අස්ථාවරත්වය විසඳීම සඳහා, අනාගත අවදානම් තක්සේරු කිරීම සඳහාද බැංකුව විසින් විවිධ තත්කාර්ය විශ්ලේෂණයන් සිදුකර ඇති අතර අවම කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඉහළ කළමනාකාරීත්වය වෙත යොමුකර ඇත. ආතති සහගත ආර්ථික තත්ත්වයක් තුළ පිළිගත හැකි සුළු, මධ්‍යස්ත හා දැඩි වශයෙන් අවදානම් මට්ටම් තුනක් මත පදනම්ව තනි සාධක, සාම්ප්‍රදායික නොවන ආතති පරීක්ෂණ බැංකුව විසින් සිදු කර ඇත.

මීට අමතරව අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව ඇගයීමේ ක්‍රියාවලිය (ICAAP) මඟින් බැංකුවේ ප්‍රාග්ධන අවදානම් පැතිකඩ මත පදනම්ව එහි ප්‍රාග්ධන අවශ්‍යතාවය තක්සේරු කරන අතර බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන වර්ධනය සඳහා රාමුවක් සකසයි. ස්ථම්භ I අවදානමට අමතරව ස්ථම්භ II අවදානම මැනීම සඳහා අන්තර්ජාතිකව පිලිගත් විවිධ තක්සේරු ක්‍රමවේද භාවිතා කරනු ලැබේ. නියාමන වාර්තාකරණ අවශ්‍යතාවලට අනුකූල වෙමින් වඩා හොඳ අවදානම් කළමනාකරණයක් සඳහා අවදානම් මිනුම් සහ විශ්ලේෂණයේ ප්‍රතිඵල වරින් වර ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරනු ලැබේ.

සමස්ත අවදානම් කළමනාකරණයෙහි කොටසක් ලෙස අවදානම අඩුකිරීම සඳහා බැංකුව විසින් අවදානම් අවම කිරීමේ ක්‍රම සහ උපායමාර්ග කිහිපයක් භාවිතා කරයි. ණය අවදානම් කළමනාකරණය කිරීමේදී බැංකුව සිය අවදානම් අඩු කිරීම සඳහා පුළුල් පූර්ව අනුමත කිරීමේ සහ පසු අනුමත කිරීමේ ක්‍රමවේදයන් භාවිතා කරයි. පාරිසරික හා සමාජයීය අවදානම් මැනීමඳ ණය ඇගයීමේ ක්‍රියාවලිය හා ඒකාබද්ද කොට ඇත. අලාභයන් තවදුරටත් අවම කිරීම සඳහා සුරැකුම් භාවිතා කරනු ලැබේ. මිල නියම කිරීමේ යාන්ත්‍රණය මඟින් පහසුකම් මිල කේවල ඇගයුම් සහ සුරැකුම් සලකා බලා ඇති බව සහතික කරයි. සීමිත සන්දර්භයක් තුළ ව්‍යුත්පන්න උපකරණ භාවිතයෙන් පොළී අනුපාතය, විදේශ විනිමය සහ කොටස් අවදානම් ඇතුළු වෙළඳපල අවදානම් නිරාවරණ අවම කරනු ලැබේ. විස්තීරණ ආතති පරීක්ෂාව ඇතුළු ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවක්, මිනුම් සහ අවම කිරීමේ ප්‍රවේශයන් හරහා බැංකුව ද්‍රවශීලතා අවදානම ආමන්ත්‍රණය කරයි. මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන අතර අවශ්‍ය අවස්ථාවන්හිදී මෙහෙයුම් අවදානම් විතැන්කිරීමේ උපායමාර්ගයක් ලෙස රක්ෂණය භාවිතා කරයි. වත්මන් ව්‍යාපාරික පරිසරය තුළ වඩාත්ම අවදානමට ලක්විය හැකි තොරතුරු තාක්ෂණ අවදානම, පුළුල් ප්‍රතිපත්තීන් සහ ප්‍රමිතීන් මඟින් කළමනාකරණය කරනු ලබයි.

64.2 ණය අවදානම

ණය ගනුදෙනු වලදී චිකඟ වූ කොන්දේසි පැහැර හැරීමෙන් අනෙකුත් පාර්ශ්වයට අලාභ ඇතිවීමේ අවදානම ණය අවදානම වේ. පැහැරහැරීමෙන් සහ ගුණාත්මක භාවය පිරිහීමෙන් සහ ණය සංකේන්ද්‍රණය වන ආකාරයෙන් ණය අවදානම ඇති විය හැක.

64.2.1 ණය අවදානම් කළමනාකරණය

ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය මඟින් ගනුදෙනු හා කළඹ මට්ටමේ ණය ප්‍රදානය, පවත්වාගැනීම, අධීක්ෂණය හා කළමනාකරණයට අදාළ කොන්දේසි හා මඟපෙන්වීම් ලබා දේ. ණය අවදානම් කළමනාකරණ කාර්යය ව්‍යාපාර අංශ වලින් ස්වාධීන වන අතර ණය තීරණ ගැනීමේ ප්‍රමිතීන්, ක්‍රියාවලීන් සහ මූලධර්ම ආයතනික අංශයේ සහ ශාඛා අංශයේ නිරන්තරයෙන් ක්‍රියාත්මක වේ. සංකේන්ද්‍රණ අවදානම ඉවත් කිරීම පිණිස අවදානම් අභිරුචියට විරෙහිව ණයකරුවන් හා කර්මාන්ත විශේෂිත සංකේන්ද්‍රණයන් තක්සේරු කරමින් හා කළමනාකරණය කරමින් විවිධාංගීකරණය වූ ණය කළඹ පවත්වාගෙන යනු ලබයි.

බැංකුව විසින් නව ණය අනුමත කිරීම හා පවත්නා ණය අලුත් කිරීම සඳහා මනා ලෙස ස්ථාපනය කළ ක්‍රියාවලියක් අනුගමනය කරයි. ණය යාන්ත්‍රණයේ අවදානම් හිමිකරුවන් වන ගනුදෙනු ආරම්භ කරන්නන් විසින් බැංකුවේ විභව ණය නිරාවරණය පළමුවෙන්ම ඇගයීම සිදු කරයි. ස්ථාපිත සීමාවන් ඉක්මවා ඇති ණය යෝජනා, ප්‍රධාන අවදානම් නිලධාරිවරයා විසින් ස්වාධීනව සමාලෝචනය කරනු ලැබේ.

ශ්‍රේණිගත කිරීමේ ආකෘති යනු කළඹවල ණය අවදානම කළමනාකරණය, මැනීම සහ අධීක්ෂණය කරන ප්‍රධාන යෙදවුමයි. ගනුදෙනුකරුවන් සිටින විවිධ කර්මාන්ත ආවරණය වන පරිදි ආයතනික හා මධ්‍යම ආයතනික කළඹ හරහා බැංකුව ණය අවදානම් ශ්‍රේණිගත කිරීමේ ආකෘතීන් භාවිතා කරයි. ශාඛා ණය නිරාවරණයන් කළමනාකරණය කරනු ලබන්නේ ශාඛා දත්ත පුවරු ගණනාවක් භාවිතයෙනි.

ඇතිවිය හැකි ණය අවදානම අවම කිරීම හා ඒ මත සිදුවිය හැකි අලාභ අවම කිරීමේ අරමුණින් මූලික අවස්ථාවේදී සුරැකුම් භාවිතා කරයි. ණයකරුගේ ස්වභාවය, පවතින වත්කම්, ණය ආකෘතිය හා කාල සීමාව මත සුරැකුමේ ස්වභාවය වෙනස් වේ. පාලන ප්‍රතිපත්ති හා ප්‍රමිතීන් වල දක්වා ඇති ආකාරයට සුරැකුම් නිරන්තර තක්සේරුකරණයට ලක් කරනු ලැබේ.

මුල් අදියරේදී අලාභයක් සිදුවීමේ වැඩි අවදානමක් ඇති ණය නිරාවරණ හඳුනා ගැනීම සඳහා, ක්‍රියාපටිපාටි ද ක්‍රියාත්මක වේ. විය හැකි ණය පාඩු අවම කිරීම හා ණය ආපසු අයකර ගැනීම වැඩි කිරීම සඳහා ණය අවදානම අවම කිරීමේ ක්‍රම යොදාගනු ලැබේ. ලේඛන නිසි පරිදි පවත්වා ගැනීම, පනවන ලද ගිවිසුම් වලට අනුකූල වීම හා ණය කළඹේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා විශාල ණය ගනුදෙනු සම්බන්ධයෙන් අනුමැතියෙන් පසු වරින් වර සමාලෝචනයන් සිදු කරයි.

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - ''මූල්‍ය උපකරණ'' අනුව ණය අවදානම සඳහා ප්‍රතිපාදනයන් සිදු කිරීමේදී සිදුවූ අලාභ මෙන්ම අපේක්ෂිත ණය හානියද සලකා බැලිය යුතු වේ.

64.2.1.1 අභ්‍යන්තර ශ්‍රේණිගතකිරීම.

බැංකුවේ ණය අවදානම් කලමණාකරණ ඒකකය විහි අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආකෘතිය ක්‍රියාත්මක කරයි. බැංකුව විසින් අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආකෘතිය යොදාගනිමින් 1 සිට 8 දක්වා ආයතනික හා සුළු පරිමාණ ගනුදෙනුකරුවන් ශ්‍රේණිගත කිරීම සඳහා වෙනම ආකෘති භාවිතා කරයි. මෙම ආකෘතිවලට ගුණාත්මක සහ ප්‍රමාණාත්මක තොරතුරු දෙකම ඇතුළත් කරන අතර, ණයගැනුම්කරුට ආවේණික තොරතුරුවලට අමතරව ණය හැසිරීමට බලපෑ හැකි අතිරේක බාහිර තොරතුරු සහ විශේෂිත සාධක භාවිතා කරයි.

64.2.1.2 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

ඕනෑම අවස්ථාවක ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවලින් පැන නගින ණය අවදානම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අගය ධනාත්මක වන මූල්‍ය උපකරණවලට සීමාවේ. ණය ව්‍යුත්පන්නයන් සම්බන්ධයෙන් පැන නගින පැහැර හැරීමේ අවදානමට බැංකුව නිරාවරණය වීමෙන් ආරක්ෂා වී ඇත. වැඩි විස්තර සඳහා සටහන් 26 සහ 41 බලන්න.

64.2.1.3 අසම්භව්‍ය වගකීම් හා බැඳීම්

බැංකුව විසින් තම ගණුදෙනුකරුවන්ගේ ද්‍රවශීලතා අවශ්‍යතා ආරක්ෂා කිරීමට හා ඔවුන් වෙනුවෙන් ගෙවීම් කිරීමට බැඳීම් වලට ඵළඹීමට අවශ්‍යවන අතර අවශ්‍ය විය හැකි අවස්ථාවලදී ඇපකර ලබා දෙයි. සාමාන්‍යයෙන් භාණ්ඩ ආනයනය හෝ අපනයනය සම්බන්ධයෙන් නිශ්චිත ක්‍රියාවක් සිදුවූ විට ගණුදෙනුකරුවන් වෙනුවෙන් ගෙවීම් කිරීමට ණයවර ලිපි සහ ඇපකර නිකුත්කිරීමට බැංකුව බැඳීසිටී. වැඩිදුර විස්තර සඳහා 57 වන සටහන බලන්න.

64.2.1.4 හානිකරණය තක්සේරුව

අපේක්ෂිත ණය හානිය ගණනය (ECL)

අපේක්ෂිත ණය හානිය මඟින් මූල්‍ය වත්කම් වල අපේක්ෂිත ආයුකාලය පුරාවට සිදු විය හැකි පැහැර හැරීමේ සිද්ධීන් ඉදිරිපත් කරයි. අපේක්ෂිත ණය හානිය ගණනය කිරීමේදී ප්‍රධාන උපාංග තුනක් භාවිතා කරයි. විනම්, පැහැර හැරීමේ සම්භාවිතාව (PD), පැහැර හැරීමේ අලාභය (LGD), ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය (EAD) වේ. පොදුවේ මෙම පරාමිතීන් ගොඩනැඟී ඇත්තේ අභ්‍යන්තරව ගොඩනගාගත් සංඛ්‍යානමය ආකෘති සමඟ ගනුදෙනුකරුවන්ගේ සහ සාර්ව ආර්ථිකයේ අතීත, වර්තමාන හා අනාගත දත්ත ඒකාබද්ධ කිරීමෙනි.

පැහැර නඟින අවස්ථාවේදී හෝ මිලදී ගන්නා අවස්ථාවේදී ක්‍රියාකාරී තත්ත්වයේ පවතින මූල්‍ය වත්කම් හානිකරණය සඳහා අදියර තුනක ආකෘතියක් ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - ''මූල්‍ය උපකරණ'' මඟින් හඳුන්වා දී ඇත. හානිකරණය සඳහා අදියර තුනක ආකෘතිය මූලික හඳුනාගැනීමේ සිට සිදුවන ණය ගුණාත්මකභාවයේ වෙනස්වීම මත පදනම් වේ. මූලික හඳුනාගැනීමේදී ණය හානිකරණයකට ලක් නොවූ මූල්‍ය වත්කම් පළවන අදියරෙහි නිරූපණය වේ. ණය අවදානමෙහි සැලකිය යුතු වැඩිවීමක් තිබේ නම්, එවැනි මූල්‍ය වත්කම් දෙවන අදියර වෙත මාරු කරනු ලැබේ. බැංකුවේ හානිකරණ ප්‍රතිපත්තියේ දක්වා ඇති පූර්ව තීරණය කළ ණය අවදානම් දර්ශක භාවිතයෙන් ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීම යන්න අර්ථ දක්වා ඇත. පැහැර හැරීමක් සිදු වුවහොත්, එවැනි මූල්‍ය වත්කම් තෙවන අදියර ලෙස වර්ග කෙරේ. වැඩි විස්තර සඳහා සටහන 4.4.11.4 සහ සටහන 28 බලන්න.

64.2.1.5 අනාගත තොරතුරු සංස්ථාපනය

අපේක්ෂිත ණය හානිකරණය ගණනය කිරීමට සහය වන අපක්ෂපාති පොදු කර්මාන්ත ගැලපුම් හා ඒ හා සම්බන්ධ විශේෂිත කර්මාන්ත ගැලපුම් තීරණය කිරීම සඳහා අදාළ අනාගත සාර්ව ආර්ථික උපකල්පන පිළිබඳ සලකා බලන විශේෂඥ මණ්ඩලයක් බැංකුව විසින් පත්කර ඇත. වැඩි විස්තර සඳහා සටහන 28 බලන්න.

64.2.2 ණය අවදානම සඳහා උපරිම නිරාවරණය

64.2.2.1 ඇප සුරැකුම් සහ වෙනත් ණය පුළුල් කිරීම්

ණය අවදානම අවම කිරීමක් ලෙස බැංකුව ප්‍රතිපාර්ශවයන්ගෙන් විවිධ ආකාරයේ සුරැකුම් ලබා ගනී. ප්‍රතිපාර්ශ්වයන්ගේ තක්සේරුව ණය අවදානම් මත ණය සඳහා අවශ්‍ය සුරැකුම් වර්ගය හා වටිනාකම තීරණය කෙරේ. ඇප සුරැකුම් පිළිගැනීම හා අගය කිරීම, බැංකු සඳහා වන නියාමන මාර්ගෝපදේශනයන් සහ බැංකුවේ ප්‍රතිපත්ති මත තීරණය කරනු ලැබේ. බැංකුව විසින් ලබා ගන්නා ප්‍රධාන සුරැකුම් වර්ග පහත පරිදි වේ:

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

- වාණිජ ණය සඳහා - නිශ්චල සහ චංචල දේපළ
- පුද්ගල ණය සඳහා - නිශ්චල හා චංචල දේපළ උකසට තබා ගැනීම, මුදල්, මුදල් හා සමාන දෑ හා ස්වර්ණාභරණ
- රජය සහ රාජ්‍ය ව්‍යවසායන් සඳහා - රාජ්‍ය ඇපවීම්
- ප්‍රති විකුණුම් ගනුදෙනු සඳහා - රාජ්‍ය සුරැකුම්පත්

බැංකුව විසින් ලබාගෙන ඇති ඇප සුරැකුම්වල වෙළඳපල අගය කාලීනව නිරීක්ෂණය කරන අතර, එහි පහළ යාමක් ඇති විට ගිවිසුම් ප්‍රකාරව අමතර ඇප සුරැකුම් ලබා ගනී. අත්පත් කරගත් (පවරාගත්) දේපළ කාලානුරූපව ඉවත් කිරීම බැංකුවේ ප්‍රතිපත්තිය වේ. මේ හරහා ලැබෙන මුදල්, ලැබීමට ඇති ශේෂයන් අඩු කිරීමට හෝ අය කර ගැනීමට යොදවනු ලැබේ. සාමාන්‍යයෙන් පවරාගත් දේපළ බැංකුවේ ව්‍යාපාරික කටයුතු සඳහා භාවිතා නොකරයි.

ණය අවදානම් සඳහා උපරිම නිරාවරණය, ඇප සුරැකුම්වල සාධාරණ අගය, අතිරික්ත ඇප සුරැකුම් වටිනාකම සහ ණය අවදානම් සඳහා ශුද්ධ නිරාවරණය පහත වගුව මඟින් පෙන්නුම් කෙරේ.

64.2.2.2 ඇප සුරැකුම් වර්ගය සහ වෙනත් ණය පුළුල්කිරීම්

2025 දෙසැම්බර් 31 දිනට

	ණය අවදානම් සඳහා උපරිම නිරාවරණය	මුදල්	රන්
	රු. '000	රු. '000	රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	131,593,085	71,924,285	-
අඩු කලා: හානිකරණය	(509,913)		
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	79,845,952	79,845,952	-
බැංකුවල ඇති තැන්පතු	39,473,405	-	-
අඩු කලා: හානිකරණය	(14,735)		
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	345,307	-	-
ව්‍යුත්පන්න මූල්‍ය වත්කම්	6,900,797	-	-
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	12,600,011	-	-
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය හා අත්තිකාරම්	2,654,271,738	100,459,917	225,281,068
අඩු කලා: හානිකරණය	(282,519,762)		
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය සහ වෙනත් උපකරණ	2,615,521,499	-	-
අඩු කලා: හානිකරණය	(10,011,493)		
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	37,379,176	-	-
එකතුව	5,284,875,067	252,230,154	225,281,068

2024 දෙසැම්බර් 31 දිනට

	ණය අවදානම් සඳහා උපරිම නිරාවරණය	මුදල්	රන්
	රු. '000	රු. '000	රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	115,903,477	65,731,404	-
අඩු කලා: හානිකරණය	(481,070)	-	-
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	52,346,230	52,346,230	-
බැංකුවල ඇති තැන්පතු	62,435,501	-	-
අඩු කලා: හානිකරණය	(22,394)	-	-
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	23,982,341	-	-
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	23,500,600	-	-
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	21,003,177	-	-
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය හා අත්තිකාරම්	2,436,161,951	113,815,382	199,724,508
අඩු කලා: හානිකරණය	(258,454,172)	-	-
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය සහ වෙනත් උපකරණ	2,284,167,763	-	-
අඩු කලා: හානිකරණය	(8,233,387)	-	-
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	52,049,653	-	-
එකතුව	4,804,359,670	231,893,016	199,724,508

පවතින ඇප සුරැකුම් හා ණය පුළුල් කිරීම්වල සාධාරණ අගය						
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත්/ඇපකර	චංචල දේපළ	නිශ්චල දේපළ	වෙනත්	අතිරික්ත ඇප සුරැකුම්	ශුද්ධ ඇප සුරැකුම්	ශුද්ධ නිරාවරණය
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
-	-	-	-	-	71,924,285	59,668,800
					-	(509,913)
-	-	-	-	-	79,845,952	-
-	-	-	-	-	-	39,473,405
					-	(14,735)
-	-	-	-	-	-	345,307
-	-	-	-	-	-	6,900,797
-	-	-	-	-	-	12,600,011
446,799,827	112,339,251	605,852,254	136,673,167	(247,265,519)	1,380,139,965	1,274,131,773
					-	(282,519,762)
-	-	-	-	-	-	2,615,521,499
					-	(10,011,493)
-	-	-	-	-	-	37,379,176
446,799,827	112,339,251	605,852,254	136,673,167	(247,265,519)	1,531,910,202	3,752,964,865

පවතින ඇප සුරැකුම් හා ණය පුළුල් කිරීම්වල සාධාරණ අගය						
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත්/ඇපකර	චංචල දේපළ	නිශ්චල දේපළ	වෙනත්	අතිරික්ත ඇප සුරැකුම්	ශුද්ධ ඇප සුරැකුම්	ශුද්ධ නිරාවරණය
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
-	-	-	-	-	65,731,404	50,172,073
-	-	-	-	-	-	(481,070)
-	-	-	-	-	52,346,230	-
-	-	-	-	-	-	62,435,501
-	-	-	-	-	-	(22,394)
25,000,000	-	-	-	(1,017,659)	23,982,341	-
-	-	-	-	-	-	23,500,600
-	-	-	-	-	-	21,003,177
426,545,908	63,328,333	417,818,750	125,989,100	(226,946,940)	1,120,275,041	1,315,886,910
-	-	-	-	-	-	(258,454,172)
-	-	-	-	-	-	2,284,167,763
-	-	-	-	-	-	(8,233,387)
-	-	-	-	-	-	52,049,653
451,545,908	63,328,333	417,818,750	125,989,100	(227,964,599)	1,262,335,016	3,542,024,654

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

64.2.3 ක්‍රමක්ෂය පිරිවැය සහ හානිකරණ ප්‍රතිපාදන (ECL) සංචලනයන්

64.2.3.1 ක්‍රමක්ෂය පිරිවැයේ සංචලනය

පහත වගුව මඟින් මූල්‍ය උපකරණ කාණ්ඩය අනුව ක්‍රමක්ෂය පිරිවැයේ ආරම්භක සහ අවසාන ශේෂයන්හි සැසඳුමක් පෙන්නුම් කෙරේ

		2025			
	සටහන	ඉදිරි මාස 12 සඳහා අපේක්ෂිත ණය හානිය (අදියර 1)	ආයු කාලය තුළ අපේක්ෂිත ණය හානිය - ණය හානිකරණයට ලක් නොවූ (අදියර 2)	ආයු කාලය තුළ අපේක්ෂිත ණය හානිය - ණය හානිකරණයට ලක්වූ (අදියර 3)	මුළු එකතුව
		රු. '000	රු. '000	රු. '000	රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	22				
2025 ජනවාරි 1 වන දිනට		50,172,072	-	-	50,172,072
අදියර 1 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 2 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 3 වෙත මාරු කිරීම්		-	-	-	-
අළුතින් මිලදීගත් හෝ ඇති වූ වත්කම්		59,668,800	-	-	59,668,800
බැහැර කරනු ලැබූ හෝ ආපසු ගෙවූ මූල්‍ය වත්කම් (කපා හැරීම් හැර)		(50,172,072)	-	-	(50,172,072)
විදේශ විනිමය ගැලපීම්		-	-	-	-
2025 දෙසැම්බර් 31 දිනට		59,668,800	-	-	59,668,800
අනෙකුත් බැංකු වල ඇති තැන්පතු	24				
2025 ජනවාරි 1 වන දිනට		62,435,501	-	-	62,435,501
අදියර 1 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 2 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 3 වෙත මාරු කිරීම්		-	-	-	-
අළුතින් මිලදීගත් හෝ ඇති වූ වත්කම්		39,473,405	-	-	39,473,405
බැහැර කරනු ලැබූ හෝ ආපසු ගෙවූ මූල්‍ය වත්කම් (කපා හැරීම් හැර)		(62,435,501)	-	-	(62,435,501)
විදේශ විනිමය ගැලපීම්		-	-	-	-
2025 දෙසැම්බර් 31 දිනට		39,473,405	-	-	39,473,405
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය සහ අත්තිකාරම්	28				
2025 ජනවාරි 1 වන දිනට		1,818,262,438	245,081,345	372,818,168	2,436,161,951
අදියර 1 වෙත මාරු කිරීම්		62,243,012	(52,689,324)	(9,553,688)	-
අදියර 2 වෙත මාරු කිරීම්		(33,396,349)	37,692,907	(4,296,558)	-
අදියර 3 වෙත මාරු කිරීම්		(3,477,196)	(6,067,080)	9,544,276	-
අළුතින් මිලදීගත් හෝ ඇති වූ වත්කම්		1,087,008,839	192,334,027	225,530,830	1,504,873,696
බැහැර කරනු ලැබූ හෝ ආපසු ගෙවූ මූල්‍ය වත්කම් (කපා හැරීම් හැර)		(892,140,797)	(192,854,747)	(247,573,521)	(1,332,569,065)
කපා හැරීම්		-	-	(116,491)	(116,491)
විදේශ විනිමය ගැලපීම්		33,776,397	6,318,322	5,826,928	45,921,647
2025 දෙසැම්බර් 31 දිනට		2,072,276,344	229,815,450	352,179,944	2,654,271,738
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය සහ අනෙකුත් මූල්‍ය උපකරණ	29				
2025 ජනවාරි 1 වන දිනට		38,183,598	34,755,195	28,314	72,967,107
අදියර 1 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 2 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 3 වෙත මාරු කිරීම්		-	-	-	-
අළුතින් මිලදීගත් හෝ ඇති වූ වත්කම්		883,831,742	-	-	883,831,742
බැහැර කරනු ලැබූ හෝ ආපසු ගෙවූ මූල්‍ය වත්කම් (කපා හැරීම් හැර)		(852,377,201)	(1,943,874)	-	(854,321,075)
විදේශ විනිමය ගැලපීම්		-	4,401,565	-	4,401,565
2025 දෙසැම්බර් 31 දිනට		69,638,139	37,212,886	28,314	106,879,339

		2024			
	සටහන	ඉදිරි මාස 12 සඳහා අපේක්ෂිත ණය හානිය (අදියර 1)	ආයු කාලය තුළ අපේක්ෂිත ණය හානිය - ණය හානිකරණයට ලක් නොවූ (අදියර 2)	ආයු කාලය තුළ අපේක්ෂිත ණය හානිය - ණය හානිකරණයට ලක්වූ (අදියර 3)	මුළු එකතුව
		රු. '000	රු. '000	රු. '000	රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	22				
2024 ජනවාරි 1 වන දිනට		72,979,932	-	-	72,979,932
අදියර 1 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 2 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 3 වෙත මාරු කිරීම්		-	-	-	-
අළුතින් මිලදීගත් හෝ ඇති වූ වත්කම්		50,172,072	-	-	50,172,072
බැහැර කරනු ලැබූ හෝ ආපසු ගෙවූ මූල්‍ය වත්කම් (කපා හැරීම් හැර)		(72,979,932)	-	-	(72,979,932)
විදේශ විනිමය ගැලපීම්		-	-	-	-
2024 දෙසැම්බර් 31 දිනට		50,172,072	-	-	50,172,072
අනෙකුත් බැංකු වල ඇති තැන්පතු	24				
2024 ජනවාරි 1 වන දිනට		75,010,950	-	-	75,010,950
අදියර 1 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 2 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 3 වෙත මාරු කිරීම්		-	-	-	-
අළුතින් මිලදීගත් හෝ ඇති වූ වත්කම්		62,435,501	-	-	62,435,501
බැහැර කරනු ලැබූ හෝ ආපසු ගෙවූ මූල්‍ය වත්කම් (කපා හැරීම් හැර)		(75,010,950)	-	-	(75,010,950)
විදේශ විනිමය ගැලපීම්		-	-	-	-
2024 දෙසැම්බර් 31 දිනට		62,435,501	-	-	62,435,501
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය සහ අත්තිකාරම්	28				
2024 ජනවාරි 1 වන දිනට		1,807,745,963	338,162,831	311,862,945	2,457,771,739
අදියර 1 වෙත මාරු කිරීම්		33,918,118	(31,480,096)	(2,438,022)	-
අදියර 2 වෙත මාරු කිරීම්		(33,477,169)	38,228,958	(4,751,789)	-
අදියර 3 වෙත මාරු කිරීම්		(2,259,136)	(65,761,218)	68,020,354	-
අළුතින් මිලදීගත් හෝ ඇති වූ වත්කම්		908,598,354	138,306,846	27,427,558	1,074,332,758
බැහැර කරනු ලැබූ හෝ ආපසු ගෙවූ මූල්‍ය වත්කම් (කපා හැරීම් හැර)		(835,466,137)	(161,002,988)	(16,745,266)	(1,013,214,391)
කපා හැරීම් සහ අයකර ගැනීම්		-	-	(69,134)	(69,134)
විදේශ විනිමය ගැලපීම්		(60,797,555)	(11,372,988)	(10,488,478)	(82,659,021)
2024 දෙසැම්බර් 31 දිනට		1,818,262,438	245,081,345	372,818,168	2,436,161,951
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය සහ අනෙකුත් මූල්‍ය උපකරණ	29				
2024 ජනවාරි 1 වන දිනට		40,855,752	87,344,675	28,314	128,228,741
අදියර 1 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 2 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 3 වෙත මාරු කිරීම්		-	-	-	-
අළුතින් මිලදීගත් හෝ ඇති වූ වත්කම්		36,751,748	34,658,794	-	71,410,542
බැහැර කරනු ලැබූ හෝ ආපසු ගෙවූ මූල්‍ය වත්කම් (කපා හැරීම් හැර)		(39,423,902)	(83,525,478)	-	(122,949,380)
විදේශ විනිමය ගැලපීම්		-	(3,722,796)	-	(3,722,796)
2024 දෙසැම්බර් 31 දිනට		38,183,598	34,755,195	28,314	72,967,107

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

64.2.3.2 හානිකරණ ප්‍රතිපාදන (ECL) සංචලනයන

පහත වගුව මඟින් මූල්‍ය උපකරණ කාණ්ඩය අනුව හානිකරණය සඳහා ප්‍රතිපාදන ආරම්භක සහ අවසාන ශේෂයන්හි සැසඳුමක් පෙන්නුම් කෙරේ.

		2025			
	සටහන	ඉදිරි මාස 12 සඳහා අපේක්ෂිත ණය හානිය (අදියර 1) රු. '000	ආයු කාලය තුළ අපේක්ෂිත ණය හානිය - ණය හානිකරණයට ලක් නොවූ (අදියර 2) රු. '000	ආයු කාලය තුළ අපේක්ෂිත ණය හානිය - ණය හානිකරණයට ලක්වූ (අදියර 3) රු. '000	මුළු එකතුව රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	22				
2025 ජනවාරි 1 වන දිනට හානිකරණය (ECL) සඳහා වෙන්කිරීම		481,070	-	-	481,070
අදියර 1 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 2 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 3 වෙත මාරු කිරීම්		-	-	-	-
ශුද්ධ හානිකරණය නැවත මැන බැලීම		-	-	-	-
අළුතින් මිලදීගත් හෝ ඇති වූ වත්කම්		509,913	-	-	509,913
බැහැර කරනු ලැබූ හෝ ආපසු ගෙවූ මූල්‍ය වත්කම් (කපා හැරීම් හැර)		(481,070)	-	-	(481,070)
විදේශ විනිමය ගැලපීම්		-	-	-	-
2025 දෙසැම්බර් 31 දිනට		509,913	-	-	509,913
අනෙකුත් බැංකු වල ඇති තැන්පතු	24				
2025 ජනවාරි 1 වන දිනට හානිකරණය (ECL) සඳහා වෙන්කිරීම		22,394	-	-	22,394
අදියර 1 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 2 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 3 වෙත මාරු කිරීම්		-	-	-	-
ශුද්ධ හානිකරණය නැවත මැන බැලීම		-	-	-	-
අළුතින් මිලදීගත් හෝ ඇති වූ වත්කම්		14,735	-	-	14,735
බැහැර කරනු ලැබූ හෝ ආපසු ගෙවූ මූල්‍ය වත්කම් (කපා හැරීම් හැර)		(22,394)	-	-	(22,394)
විදේශ විනිමය ගැලපීම්		-	-	-	-
2025 දෙසැම්බර් 31 දිනට		14,735	-	-	14,735
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - අනෙකුත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්	28				
2025 ජනවාරි 1 වන දිනට හානිකරණය (ECL) සඳහා වෙන්කිරීම		34,297,861	24,197,486	199,958,825	258,454,172
අදියර 1 වෙත මාරු කිරීම්		8,908,475	(3,494,815)	(5,413,660)	-
අදියර 2 වෙත මාරු කිරීම්		(649,233)	2,101,669	(1,452,436)	-
අදියර 3 වෙත මාරු කිරීම්		(72,352)	(466,223)	538,575	-
ශුද්ධ හානිකරණය නැවත මැන බැලීම		(1,691,897)	6,246,098	14,934,001	19,488,202
අළුතින් මිලදීගත් හෝ ඇති වූ වත්කම්		14,871,447	12,078,464	8,468,778	35,418,689
බැහැර කරනු ලැබූ හෝ ආපසු ගෙවූ මූල්‍ය වත්කම් (කපා හැරීම් හැර)		(9,142,510)	(10,378,012)	(14,721,702)	(34,242,224)
විදේශ විනිමය ගැලපීම්		1,137,001	635,093	1,628,829	3,400,923
කපා හැරීම් සහ අයකර ගැනීම්		-	-	(116,491)	(116,491)
වෙනත් සංචලනයන්		-	-	116,491	116,491
2025 දෙසැම්බර් 31 දිනට		47,658,792	30,919,760	203,941,210	282,519,762
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය සහ අනෙකුත් මූල්‍ය උපකරණ	29				
2025 ජනවාරි 1 වන දිනට හානිකරණය (ECL) සඳහා වෙන්කිරීම		8,731	8,196,342	28,314	8,233,387
අදියර 1 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 2 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 3 වෙත මාරු කිරීම්		-	-	-	-
ශුද්ධ හානිකරණය නැවත මැන බැලීම		(6,416)	(274,421)	-	(280,837)
අළුතින් මිලදීගත් හෝ ඇති වූ වත්කම්		1,959,858	-	-	1,959,858
බැහැර කරනු ලැබූ හෝ ආපසු ගෙවූ මූල්‍ය වත්කම් (කපා හැරීම් හැර)		-	-	-	-
විදේශ විනිමය ගැලපීම්		-	99,085	-	99,085
2025 දෙසැම්බර් 31 දිනට		1,962,173	8,021,006	28,314	10,011,493

	සටහන	2024			
		ඉදිරි මාස 12 සඳහා අපේක්ෂිත ණය හානිය	ආයු කාලය තුළ අපේක්ෂිත ණය හානිය - ණය හානිකරණයට ලක් නොවූ	ආයු කාලය තුළ අපේක්ෂිත ණය හානිය - ණය හානිකරණයට ලක්වූ	මුළු එකතුව
		(අදියර 1)	(අදියර 2)	(අදියර 3)	
		රු. '000	රු. '000	රු. '000	රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	22				
2024 ජනවාරි 1 වන දිනට හානිකරණය (ECL) සඳහා වෙන්කිරීම		62,591	-	-	62,591
අදියර 1 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 2 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 3 වෙත මාරු කිරීම්		-	-	-	-
ශුද්ධ හානිකරණය නැවත මැන බැලීම		-	-	-	-
අළුතින් මිලදීගත් හෝ ඇති වූ වත්කම්		481,070	-	-	481,070
බැහැර කරනු ලැබූ හෝ ආපසු ගෙවූ මූල්‍ය වත්කම් (කපා හැරීම් හැර)		(62,591)	-	-	(62,591)
විදේශ විනිමය ගැලපීම්		-	-	-	-
2024 දෙසැම්බර් 31 දිනට		481,070	-	-	481,070
අනෙකුත් බැංකු වල ඇති තැන්පතු	24				
2024 ජනවාරි 1 වන දිනට හානිකරණය (ECL) සඳහා වෙන්කිරීම		44,779	-	-	44,779
අදියර 1 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 2 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 3 වෙත මාරු කිරීම්		-	-	-	-
ශුද්ධ හානිකරණය නැවත මැන බැලීම		-	-	-	-
අළුතින් මිලදීගත් හෝ ඇති වූ වත්කම්		22,394	-	-	22,394
බැහැර කරනු ලැබූ හෝ ආපසු ගෙවූ මූල්‍ය වත්කම් (කපා හැරීම් හැර)		(44,779)	-	-	(44,779)
විදේශ විනිමය ගැලපීම්		-	-	-	-
2024 දෙසැම්බර් 31 දිනට		22,394	-	-	22,394
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - අනෙකුත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්	28				
2024 ජනවාරි 1 වන දිනට හානිකරණය (ECL) සඳහා වෙන්කිරීම		31,412,474	28,817,796	188,479,545	248,709,815
අදියර 1 වෙත මාරු කිරීම්		625,967	(586,370)	(39,597)	-
අදියර 2 වෙත මාරු කිරීම්		(1,988,519)	2,480,291	(491,772)	-
අදියර 3 වෙත මාරු කිරීම්		(744,027)	(8,229,090)	8,973,117	-
ශුද්ධ හානිකරණය නැවත මැන බැලීම		3,596,393	1,677,250	5,475,117	10,748,760
අළුතින් මිලදීගත් හෝ ඇති වූ වත්කම්		6,088,267	4,933,693	1,663,708	12,685,668
බැහැර කරනු ලැබූ හෝ ආපසු ගෙවූ මූල්‍ය වත්කම් (කපා හැරීම් හැර)		(4,193,021)	(4,011,132)	(2,803,904)	(11,008,057)
විදේශ විනිමය ගැලපීම්		(499,673)	(884,952)	(1,297,389)	(2,682,014)
කපා හැරීම් සහ අයකර ගැනීම්		-	-	(69,134)	(69,134)
වෙනත් සංචලනයන්		-	-	69,134	69,134
2024 දෙසැම්බර් 31 දිනට		34,297,861	24,197,486	199,958,825	258,454,172
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය සහ අනෙකුත් මූල්‍ය උපකරණ	29				
2024 ජනවාරි 1 වන දිනට හානිකරණය (ECL) සඳහා වෙන්කිරීම		3,047	48,197,559	28,314	48,228,920
අදියර 1 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 2 වෙත මාරු කිරීම්		-	-	-	-
අදියර 3 වෙත මාරු කිරීම්		-	-	-	-
ශුද්ධ හානිකරණය නැවත මැන බැලීම		5,725	-	-	5,725
අළුතින් මිලදීගත් හෝ ඇති වූ වත්කම්		52	11,998,414	-	11,998,446
බැහැර කරනු ලැබූ හෝ ආපසු ගෙවූ මූල්‍ය වත්කම් (කපා හැරීම් හැර)		(93)	(48,197,559)	-	(48,197,652)
විදේශ විනිමය ගැලපීම්		-	(3,802,072)	-	(3,802,072)
2024 දෙසැම්බර් 31 දිනට		8,731	8,196,342	28,314	8,233,387

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

64.2.4 අවදානම් සංකේන්ද්‍රණය පිළිබඳ විශ්ලේෂණය

තනි පුද්ගලයෙකුට, කර්මාන්තයකට, යම් අංශයකට හෝ භූගෝලීය කලාපයන්ට බැංකු ණය අසමාන ලෙස බෙදාහැරීම හේතුවෙන් ණය කළඹවල සංකේන්ද්‍රණ අවදානම පැන නගී. සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණයේදී බැංකුව විසින් මිනුම් උපකරණයක් ලෙස හර්ෆින්ඩාල් - හැරිෂ්මන් දර්ශකය (Herfindahl-Harischman Index – HHI) භාවිතා කරයි. සංකේන්ද්‍රණ අවදානම පිළිගත හැකි මට්ටමක පවත්වාගෙන යාම සඳහා බැංකුව විසින් සුදුසු සීමාවන් ස්ථාපිත කර ඇත.

64.2.5 රටවල් අනුව නිරාවරණයන්

ඉන්දියාවේ, මාලදිවයිනේ හා සීෂෙල්ස් රාජ්‍යයේ පවතින ශාඛාවන් හා එක්සත් රාජධානියේ පවතින පරිපාලිත සමාගම හේතුවෙන් බැංකුව, ලංකාවෙන් පිටත පැනනගින අවදානම් සඳහා නිරාවරණය වේ. සියලුම විදේශීය ශාඛා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන පෙර නියම කරන ලද සීමාවන්ට (ණය ප්‍රමාණ සීමාවන් මෙන්ම රටවල් සඳහා පනවා ඇති සීමාවන්) යටත්ව මෙහෙයුම් කටයුතු කරනු ලබයි.

මීට අමතරව අනෙකුත් රටවලට දක්වන නිරාවරණයවීම් සඳහා එම රටවල බැංකුවල පවතින තැන්පතු සහ නියෝජිත බැංකුවල පවත්වාගෙන යන නොස්ට්‍රෝ ගිණුම් ශේෂයන් ඇතුළත් වන අතර එහි අවදානම් කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලය අනුමතකර ඇති අදාල නියෝජිත බැංකු හා රටවලට පනවා ඇති සීමා මත පදනම්ව සිදු කෙරේ.

2025 දෙසැම්බර් 31 දිනට	ශ්‍රී ලංකාව	එක්සත් රාජධානිය	මාලදිවයින	ඉන්දියාව	ඇමරිකා එක්සත් ජනපදය	සීෂෙල්ස්	වෙනත් රටවල්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්								
මුදල් සහ මුදල් හා සමාන දෑ	72,029,735	49,361,026	1,062,224	29,131	3,908,529	81,018	4,611,509	131,083,172
මහ බැංකු සමඟ ශේෂයන්	67,796,985	-	11,059,631	386,611	-	602,725	-	79,845,952
බැංකුවල ඇති තැන්පතු	1,086,865	27,383,030	-	1,036,370	-	2,695,500	7,256,905	39,458,670
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	-	-	345,307	-	-	-	345,307
ව්‍යුත්පන්න මූල්‍ය වත්කම්	6,900,797	-	-	-	-	-	-	6,900,797
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	12,600,011	-	-	-	-	-	-	12,600,011
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්	2,276,998,079	-	77,082,611	14,506,968	-	3,164,318	-	2,371,751,976
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ	2,551,921,383	-	53,038,317	-	-	550,306	-	2,605,510,006
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	28,761,910	-	-	3,595,656	-	-	5,021,610	37,379,176
මුළු මූල්‍ය වත්කම්	5,018,095,765	76,744,056	142,242,783	19,900,043	3,908,529	7,093,867	16,890,024	5,284,875,067
මූල්‍ය වගකීම්								
බැංකුවලට ගෙවිය යුතු	386,059	-	452,380	596,632	-	-	24,962,827	26,397,898
ප්‍රතිම්ලදී ගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	284,215,169	-	-	-	-	-	-	284,215,169
ව්‍යුත්පන්න මූල්‍ය වගකීම්	561,062	-	-	-	-	-	-	561,062
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	4,266,324,495	-	105,509,195	10,736,832	-	6,015,450	-	4,388,585,972
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම්	34,871,636	-	1,416,943	-	-	-	12,430,800	48,719,379
යටත් කාලීන ණය	99,455,760	-	-	-	-	-	-	99,455,760
මුළු මූල්‍ය වගකීම්	4,685,814,181	-	107,378,518	11,333,464	-	6,015,450	37,393,627	4,847,935,240

2024 දෙසැම්බර් 31 දිනට	ශ්‍රී ලංකාව	එක්සත් රාජධානිය	මාලදිවයින	ඉන්දියාව	ඇමරිකා එක්සත් ජනපදය	සීෂෙල්ස්	වෙනත් රටවල්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්								
මුදල් සහ මුදල් හා සමාන දෑ	64,346,959	31,438,250	1,306,709	3,056,749	5,638,411	95,245	9,540,084	115,422,407
මහ බැංකු සමඟ ශේෂයන්	48,252,069	-	3,047,811	462,582	-	583,768	-	52,346,230
බැංකුවල ඇති තැන්පතු	26,814,364	24,612,576	-	361,119	-	1,728,330	8,896,718	62,413,107
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	23,982,341	-	-	-	-	-	-	23,982,341
ව්‍යුත්පන්න මූල්‍ය වත්කම්	23,500,600	-	-	-	-	-	-	23,500,600
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	21,003,177	-	-	-	-	-	-	21,003,177
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්	2,093,420,722	-	67,484,936	14,325,454	-	2,476,667	-	2,177,707,779
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ	2,239,513,583	-	35,927,590	-	-	493,203	-	2,275,934,376
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	44,855,016	-	-	2,881,863	-	-	4,312,774	52,049,653
මුළු මූල්‍ය වත්කම්	4,585,688,831	56,050,826	107,767,046	21,087,767	5,638,411	5,377,213	22,749,576	4,804,359,670
මූල්‍ය වගකීම්								
බැංකුවලට ගෙවිය යුතු	33,255	184,978	-	596,538	-	-	856,316	1,671,087
ප්‍රතිම්ලදී ගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	131,079,414	-	-	-	-	-	-	131,079,414
ව්‍යුත්පන්න මූල්‍ය වගකීම්	16,476,077	-	-	-	-	-	-	16,476,077
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	4,117,479,674	-	76,306,888	10,153,791	-	4,663,082	-	4,208,603,435
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම්	10,370,022	-	1,167,559	-	-	-	17,606,097	29,143,678
යටත් කාලීන ණය	68,535,700	-	-	-	-	-	-	68,535,700
මුළු මූල්‍ය වගකීම්	4,343,974,142	184,978	77,474,447	10,750,329	-	4,663,082	18,462,413	4,455,509,391

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

බැංකුවේ මූල්‍ය වත්කම් කළඹ විවිධ අංශ තුළ මනාව විවිධාංගීකරණය වී ඇති අතර, අංශ අනුව නිරාවරණය කිරීම පහත වගුවෙහි දැකවා ඇත.

64.2.6 අංශ අනුව නිරාවරණය වීම

2025 දෙසැම්බර් 31 දිනට	කෘෂිකාර්මික සහ ධීවර	බැංකු, මූල්‍ය සහ රක්ෂණ	හෝටල්, සංචාරක සහ සේවා
	රු. '000	රු. '000	රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	-	131,593,085	-
අඩු කලා: හානිකරණය	-	-	-
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	-	67,796,985	-
බැංකුවල ඇති තැන්පතු	-	39,473,405	-
අඩු කලා: හානිකරණය	-	-	-
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	345,307	-
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	6,900,797	-
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	-	6,852,872	-
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්	385,013,092	49,987,175	109,509,595
අඩු කලා: හානිකරණය	-	-	-
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ	-	1,665,297	-
අඩු කලා: හානිකරණය	-	-	-
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	-	7,349,739	-
මුළු මූල්‍ය වත්කම්	385,013,092	311,964,662	109,509,595

2024 දෙසැම්බර් 31 දිනට	කෘෂිකාර්මික සහ ධීවර	බැංකු, මූල්‍ය සහ රක්ෂණ	හෝටල්, සංචාරක සහ සේවා
	රු. '000	රු. '000	රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	-	115,903,477	-
අඩු කලා: හානිකරණය	-	-	-
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	-	48,252,069	-
බැංකුවල ඇති තැන්පතු	-	62,435,501	-
අඩු කලා: හානිකරණය	-	-	-
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	23,982,341	-
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	23,500,600	-
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	-	5,210,796	-
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්	323,364,711	23,280,301	97,301,217
අඩු කලා: හානිකරණය	-	-	-
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ	6,476	753,333	-
අඩු කලා: හානිකරණය	-	-	-
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	-	5,343,122	-
මුළු මූල්‍ය වත්කම්	323,371,187	308,661,540	97,301,217

නිවාස, ඉදිකිරීම් සහ යටිතල පහසුකම් රු. '000	නිෂ්පාදන රු. '000	වාණිජ වෙළඳාම රු. '000	ස්වෛරී සහ සෘජු රාජ්‍ය රු. '000	ප්‍රවාහන සහ සේවා සම්පාදන රු. '000	වෙනත් වාණිජ සේවා රු. '000	පරිභෝජනය සහ වෙනත් රු. '000	එකතුව රු. '000
-	-	-	-	-	-	-	131,593,085
-	-	-	-	-	-	-	(509,913)
-	-	-	-	-	12,048,967	-	79,845,952
-	-	-	-	-	-	-	39,473,405
-	-	-	-	-	-	-	(14,735)
-	-	-	-	-	-	-	345,307
-	-	-	-	-	-	-	6,900,797
-	66,897	-	5,171,829	-	19,725	488,688	12,600,011
493,339,597	206,945,286	175,494,967	515,615,363	73,982,083	248,866,076	395,518,504	2,654,271,738
-	-	-	-	-	-	-	(282,519,762)
-	-	1,346,812	2,612,509,390	-	-	-	2,615,521,499
-	-	-	-	-	-	-	(10,011,493)
-	-	-	25,007,827	-	5,021,610	-	37,379,176
493,339,597	207,012,183	176,841,779	3,158,304,409	73,982,083	265,956,378	396,007,192	5,284,875,067

නිවාස, ඉදිකිරීම් සහ යටිතල පහසුකම් රු. '000	නිෂ්පාදන රු. '000	වාණිජ වෙළඳාම රු. '000	ස්වෛරී සහ සෘජු රාජ්‍ය රු. '000	ප්‍රවාහන සහ සේවා සම්පාදන රු. '000	වෙනත් වාණිජ සේවා රු. '000	පරිභෝජනය සහ වෙනත් රු. '000	එකතුව රු. '000
-	-	-	-	-	-	-	115,903,477
-	-	-	-	-	-	-	(481,070)
-	-	-	-	-	4,094,161	-	52,346,230
-	-	-	-	-	-	-	62,435,501
-	-	-	-	-	-	-	(22,394)
-	-	-	-	-	-	-	23,982,341
-	-	-	-	-	-	-	23,500,600
33,336	325,668	-	15,002,315	-	19,133	411,929	21,003,177
511,227,585	194,741,044	173,613,672	486,436,009	78,013,278	236,642,197	311,541,937	2,436,161,951
-	-	-	-	-	-	-	(258,454,172)
-	-	1,031,310	2,282,376,644	-	-	-	2,284,167,763
-	-	-	-	-	-	-	(8,233,387)
-	-	-	42,007,600	-	4,698,931	-	52,049,653
511,260,921	195,066,712	174,644,982	2,825,822,568	78,013,278	245,454,422	311,953,866	4,804,359,670

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

64.2.7 බැඳීම් සහ ඇපකරයන්

ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා බැංකුව විසින් අවලංගු කල නොහැකි විවිධ බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම් වලට එළඹේ. එවැනි බැඳීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා නොගත්තද එහි ණය අවදානමක්/පහැර හැරීමේ අවදානමක් තිබේ. නියාමන මාර්ගෝපදේශයන්ට අනුකූලව අදාළ ණය පරිවර්තනය කිරීමේ සාධක මත පදනම්ව එවැනි බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම් සඳහා ප්‍රාග්ධන ගාස්තු වෙන් කරනු ලැබේ.

බැඳීම් සහ ඇපකර සඳහා බැංකුවේ උපරිම නිරාවරණය පහත වගුවේ දැක්වේ. බැංකුවේ බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම් සඳහා ණය අවදානම නිරාවරණය සටහන අංක 57 හි අනාවරණය කර ඇත.

	බැංකුව	
දෙසැම්බර් 31 දිනට	2025	2024
	රු. '000	රු. '000
ප්‍රතිග්‍රහණ හා ණයවර ලිපි	192,525,473	170,192,219
රැස් කිරීම සඳහා වූ බිල්පත්	68,018,849	59,672,832
ඉදිරි විනිමය ගිවිසුම්	331,259,662	402,059,694
ඇපකර	132,739,409	135,693,404
වෙනත් බැඳීම්	154,871,849	147,970,922
	879,415,242	915,589,071

64.2.8 අපේක්ෂිත ණය අවදානම මත කළමනාකරණ ආවරණ

ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 සහ මහ බැංකු නියාමනයන් අනුව ණය සහ අත්තිකාරම් සඳහා බැංකුවේ සාමාන්‍ය ණය හානිකරණය ගණනය කිරීමේ ක්‍රියාවලියෙන් ඔබ්බට බැංකුව විසින් සලකා බලන ලදී. ඒ අනුව, කළමනාකරණ ආවරණ ලෙස ඉදිකිරීම් සහ ඇඟළුම් අපනයන යන අංශ අවදානම් සහිත කර්මාන්ත ලෙස සලකා එම අංශ වල ගනුදෙනුකරුවන් හානිකරණය තක්සේරු කිරීමේදී පළවන මට්ටම යටතේ ඉදිරි මාස 12 ක අපේක්ෂිත ණය හානිය සලකා බලනු වෙනුවට, ආයු කාලය තුළ අපේක්ෂිත ණය හානිය ගණනය කිරීම සඳහා පළමු මට්ටමේ ගනුදෙනුකරුවන් සියළු දෙනා දෙවන මට්ටම වෙත මාරු කරන ලදී. තවද, විභව අවදානම සැලකිල්ලට ගනිමින් විවිධ ණය සහන සහ සහන යෝජනා ක්‍රම යටතේ නව ණය බවට පරිවර්තනය කරන ලද ණය පහසුකම් සඳහා සිදුකරන අමතර ප්‍රතිපාදන තවදුරටත් පවත්වාගෙන යාමට බැංකුව තීරණය කරන ලදී.

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ගණුදෙනුකරුවන්ගේ ජන ජීවිතයට සහ කර්මාන්තවලට ඇතිවූ බාදා පිළිබඳව සැලකිල්ලට ගනිමින් බැංකුවේ ණය කළඹට ඇතිවිය හැකි අනාගත අලාභ සැළකිල්ලට ගනිමින් කළමණාකරණ ආවරණයක් ලෙස ණය හානිය සඳහා අවශ්‍ය වෙන්කිරීම් කරන ලදී.

සාමූහික පදනම මත තක්සේරු කරන ලද කළඹ සඳහා අපේක්ෂිත ණය හානිය ගණනයේදී ආර්ථික සාධක ගැලපීම (EFA) සඳහා පවතින ආර්ථික තත්ත්වයන් ග්‍රහණය කිරීම සඳහා බැංකුව විසින් විචක්ෂණ පදනම මත අපේක්ෂිත ආර්ථික තත්ත්ව මත වූ බරතැබීම පහත වගුවෙහි දැක්වේ.

ආර්ථික තත්ත්වය	නව බරතැබීම් 2025 (%)	පෙර වර්ෂයේ බරතැබීම් 2024 (%)
ප්‍රශස්ත	15	0 - 20
පදනම්	15	20 - 40
හානිදායී	70	40 - 80

64.3 ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතාවය ගතික වන අතර අපේක්ෂිත සහ අනපේක්ෂිත ව්‍යාපාර සහ වෙළඳපල තත්ත්වයන් අනුව වෙනස් විය හැක. පිරිවැය ඵලදායී ලෙස සහ නියමිත කාලයට සිය ගෙවීම් වගකීම් ඉටු කිරීමට හෝ තම වත්කම් සුදුසු කාලසීමාවන් තුළ අපේක්ෂිත මිලකට අලෙවි කිරීමට බැංකුව අපොහොසත් වන විට ද්‍රවශීලතා අවදානම පැන නගියි. ඵලදායී ද්‍රවශීලතා කළමනාකරණයක් සහතික කිරීම සඳහා බැංකුව විසින් තම බැඳීම් දිනපතා අධීක්ෂණය සහ කලමනාකරණය කරන අතර සිය තැන්පතු පදනමට අමතරව විවිධාංගීකරණය වූ අරමුදල් ප්‍රභවයන් පවත්වාගෙන යයි. ද්‍රවශීලතා පීඩන තත්ත්ව වලදී මහ බැංකුවේ රිපෝ කවුළුව ප්‍රධාන අරමුදල් මූලාශ්‍රවලින් එකක් ලෙස සැලකේ. තවද, බැංකුවේ ගෙවීම් වගකීම් පියවීම නියමිත කාලයට හා කාර්යක්ෂම ලෙස සිදු කිරීම සහතික කිරීම සඳහා බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මීට අමතරව, ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුවට නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම, ඉහළ ප්‍රතිලාභ සඳහා ද්‍රවශීල වත්කම්වල ප්‍රශස්ත භාවිතය සහ ව්‍යාපාර ව්‍යාප්තිය සඳහා අරමුදල් සැපයීම ඇතුළත් වේ. ප්‍රශස්ත ද්‍රවශීලතා තත්ත්වයන් සහතික කිරීම සඳහා බැංකුව විසින් ද්‍රවශීලතා අනුපාත නියාමකයා විසින් නියම කරන ලද සීමාවන් තුළ පවත්වාගනු ලබයි.

64.3.1 ද්‍රවශීලතා අවදානම් නිරාවරණය

බැංකුව භාවිතා කරන ප්‍රධාන ද්‍රවශීලතා මිනුම්කරණ මෙවලම වන්නේ, නියාමන ද්‍රවශීලතා මිනුම් උපකරණය වන ද්‍රවශීලතා ආවරණ අනුපාතයයි. මෙමඟින්, බැංකුවේ කෙටි කාලීන ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පවත්වාගත යුතු උසස් තත්ත්වයේ ඇති ද්‍රවශීලතා වත්කම් වල මට්ටම තහවුරු කරයි. මුදල්, මුදල් හා සමාන දෑ සහ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම තුලින් ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලමින් ප්‍රශස්ත ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා බැංකුව ක්‍රමානුකූලව කළමනාකරණය කරන ප්‍රධාන ද්‍රවශීල වත්කම් වේ.

*ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද්‍රවශීල වත්කම් අනුපාතය අධීක්ෂණය කිරීම නවතා දැමීමෙන් පසු බැංකුව විසින් ප්‍රධාන වශයෙන් ද්‍රවශීලතා ආවරණ අනුපාතය කෙරෙහි අවදානය යොමු කරයි.

දෙසැම්බර් 31 දිනට	2025	2024
ද්‍රවශීලතා ආවරණ අනුපාතය	260.38%	269.63%
අවම නියාමන අවශ්‍යතාවය	100.00%	100.00%

64.3.2 මූල්‍ය වගකීම්වල වට්ටම් රහිත මුදල් ප්‍රවාහය

64.3.2.1 මූල්‍ය වගකීම්වල වට්ටම් නොකල මුදල් ප්‍රවාහය

මූල්‍ය වගකීම් වල වට්ටම් නොකල පරිණත කාලය පහත වගුවේ දැක්වේ.

2025 දෙසැම්බර් 31 දිනට	ඉල්ලුමේදී රු. '000	මාස 3 ට අඩු රු. '000	මාස 3 සිට 12 දක්වා රු. '000	වසර 1 සිට 5 දක්වා රු. '000	වසර 5 ට වැඩි රු. '000	මුළු එකතුව රු. '000
බැංකුවලට ගෙවිය යුතු	26,397,898	-	-	-	-	26,397,898
ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	-	219,564,985	68,696,929	-	-	288,261,914
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	561,062	-	-	-	561,062
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	530,870,524	1,988,284,792	809,557,657	222,606,930	880,120,445	4,431,440,348
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට - වෙනත් ණය ගැහීම්	18,754,132	17,535,205	-	17,691,440	-	53,980,777
යටත් කාලීන ණයකර	-	-	13,483,566	102,647,964	18,803,284	134,934,814
මුළු එකතුව	576,022,554	2,225,946,044	891,738,152	342,946,334	898,923,729	4,935,576,813

2024 දෙසැම්බර් 31 දිනට	ඉල්ලුමේදී රු. '000	මාස 3 ට අඩු රු. '000	මාස 3 සිට 12 දක්වා රු. '000	වසර 1 සිට 5 දක්වා රු. '000	වසර 5 ට වැඩි රු. '000	මුළු එකතුව රු. '000
බැංකුවලට ගෙවිය යුතු	1,671,087	-	-	-	-	1,671,087
ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	-	74,932,274	59,168,442	-	-	134,100,716
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	16,476,077	-	-	-	16,476,077
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	445,237,402	1,593,492,498	1,100,401,536	238,262,481	921,236,128	4,298,630,045
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට - වෙනත් ණය ගැහීම්	-	11,538,212	-	18,098,019	-	29,636,231
යටත් කාලීන ණයකර	-	-	5,638,317	50,315,226	20,458,269	76,411,812
මුළු එකතුව	446,908,489	1,696,439,061	1,165,208,295	306,675,726	941,694,397	4,556,925,968

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

64.3.2.2 වාර්තා කරන දින සිට මාස 12 කට පසු අයකර ගැනීමට හෝ පියවීමට අපේක්ෂා කරන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්.

පියවීමේ දින සිට මාස 12කට පසු අයකර ගැනීමට හෝ පියවීමට බලාපොරොත්තු වන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වල ධාරණ අගය පහත වගුවේ දැක්වේ.

	බැංකුව	
දෙසැම්බර් 31 දිනට	2025	2024
	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්		
ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්		
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	6,698,320	5,273,682
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය සහ අත්තිකාරම්	1,473,612,652	606,070,694
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය උපකරණ	1,283,093,805	1,084,518,092
වෙනත් විස්තීර්ණ අදායම යටතේ සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	33,609,578	28,705,454
මුළු ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්	2,802,799,264	1,724,567,922
මූල්‍ය වගකීම්		
ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම්		
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	255,971,056	270,701,996
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට - වෙනත් ණය ගැනීම්	12,430,800	17,606,097
යටත් කාලීන ණය	86,967,413	63,529,293
මුළු ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම්	355,369,269	351,837,386

64.4 වෙළඳපල අවදානම

වෙළඳපල අවදානම යනු පොළී අනුපාත, විදේශ විනිමය අනුපාත, කොටස් මිල සහ වෙළඳ භාණ්ඩ මිල වැනි වෙළඳපල විචල්‍යයන්හි අහිතකර චලනයන් හේතුවෙන් අලාභ සිදුවීමේ අවදානමයි. වෙළඳපල අවදානමට නිරාවරණය වීම ප්‍රධාන වශයෙන් පොළී අනුපාත අවදානම (IRR) සහ විදේශ විනිමය අවදානම (FX) මඟින් පැන නගී. වෙළඳ භාණ්ඩ ආශ්‍රිත අවදානමට නිරාවරණය වීම රන් තොගයේ මිල උච්චාවචනය වන ප්‍රමාණයට පමණක් සීමා වී ඇති බැවින් එය අවම මට්ටමක පවතී.

වෙළඳ හෝ වෙළඳ නොවන කළඹ වශයෙන් බැංකුව මෙම නිරාවරණයවීම් වර්ග කර වෙන වෙනම කළමනාකරණය කරනු ලබයි. විදේශ විනිමය හුවමාරු සහ කොටස් වෙළඳාම් කළඹයන් හි වෙළඳපල අවදානම කළමනාකරණය සහ අධීක්ෂණය කරනු ලබන්නේ අවදානම් විචල්‍යයන්හි අන්තර් බැඳීම් පෙන්නුම් කරනු ලබන "අවදානමේදී අගය - (Value at Risk –VaR) ක්‍රමවේදය අනුව වේ. ශුද්ධ විවෘත තත්ත්වයට අමතරව විදේශ විනිමය අනුපාත අවදානම කළමනාකරණය කිරීමේ සීමාව හා රඳවා ගැනීමේ කාලය ස්කන්ධ අවදානම කළමණාකරණයට සීමා වේ. පදනම් අගය මත මිල වෙනස්වීම (Price Value of Basis Point – PVBP) සහ කාල විශ්ලේෂණය (Duration Analysis) ඇසුරෙන් වෙළඳ කළඹට බලපාන පොළී අනුපාත අවදානම කළමනාකරණය සිදු කරයි. මීට අමතරව, අවදානම් අධීක්ෂණය, අවදානම් තක්සේරු කිරීම, සංවේදීතා අධ්‍යයනය හා ආතති පරීක්ෂාව ආදිය මඟින් වෙළඳ හෝ වෙළඳ නොවන කළඹ කළමනාකරණය සිදු කෙරේ. බැංකු වත්කම්වල පොළී අනුපාත අවදානම (IRRBB) සංවේදීතා අධ්‍යනය හරහා නිරීක්ෂණය කෙරේ.

64.4.1 වෙළඳ සහ වෙළඳ නොවන කළඹ - බැංකුව

වෙළඳ සහ වෙළඳ නොවන කළඹ අතර වෙළඳපල අවදානමට යටත්ව වත්කම් සහ වගකීම් වෙන් කිරීම පහත වගුවේ දක්වා ඇත.

2025 දෙසැම්බර් 31 දිනට	සටහන	ධාරණ අගය	වෙළඳපල අවදානම් මැනීම	
			වෙළඳ කළඹ	වෙළඳ නොවන කළඹ
		රු. '000	රු. '000	රු. '000
වෙළඳපල අවදානමට යටත් වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	22	131,083,172	-	131,083,172
මහ බැංකු සමඟ ශේෂයන්	23	79,845,952	-	79,845,952
බැංකුවල ඇති තැන්පතු	24	39,458,670	-	39,458,670
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	25	345,307	-	345,307
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	26	6,900,797	6,900,797	-
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්	27	12,600,011	12,600,011	-
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට			-	-
- ණය සහ අත්තිකාරම්	28	2,371,751,976	-	2,371,751,976
- ණය සහ වෙනත් උපකරණ	29	2,605,510,006	-	2,605,510,006
වෙනත් විස්තීර්ණ අදායම යටතේ සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්	30	37,379,176	-	37,379,176
පරිපාලිත සමාගම්වල ආයෝජන	31	8,105,402	-	8,105,402
ආශ්‍රිත සමාගම්වල ආයෝජන	32	92,988	-	92,988
ආයෝජන දේපළ	33	2,414,640	-	2,414,640
දේපළ, පිරියත හා උපකරණ	34	46,142,559	-	46,142,559
භාවිත අයිතිය සහිත වත්කම්/කල්බදු දේපළ	35	5,510,507	-	5,510,507
අස්පෘශ්‍ය වත්කම්	36	2,790,651	-	2,790,651
විලම්බිත බදු වත්කම්	37	27,402,018	-	27,402,018
වෙනත් වත්කම්	38	90,216,952	-	90,216,952
මුළු වත්කම්		5,467,550,784	19,500,808	5,448,049,976
වෙළඳපල අවදානමට යටත් වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	39	26,397,898	-	26,397,898
ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	40	284,215,169	-	284,215,169
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	41	561,062	561,062	-
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට				
- තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	42	4,388,585,972	-	4,388,585,972
- වෙනත් ණය ගැනීම්	43	48,719,379	-	48,719,379
ප්‍රවර්තන බදු වගකීම්	45	25,418,318	-	25,418,318
වෙනත් වගකීම්	47	228,397,006	-	228,397,006
යටත් කාලීන ණය	49	99,455,760	-	99,455,760
මුළු වගකීම්		5,101,750,564	561,062	5,101,189,502

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2024 දෙසැම්බර් 31 දිනට	සටහන	ධාරණ අගය	වෙළඳපල අවදානම් මැනීම	
			වෙළඳ කළඹ	වෙළඳ නොවන කළඹ
		රු. '000	රු. '000	රු. '000
වෙළඳපල අවදානමට යටත් වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	22	115,422,407	-	115,422,407
මහ බැංකු සමඟ ශේෂයන්	23	52,346,230	-	52,346,230
බැංකුවල ඇති තැන්පතු	24	62,413,107	-	62,413,107
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	25	23,982,341	-	23,982,341
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	26	23,500,600	23,500,600	-
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්	27	21,003,177	21,003,177	-
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට				
- ණය සහ අත්තිකාරම්	28	2,177,707,779	-	2,177,707,779
- ණය සහ වෙනත් උපකරණ	29	2,275,934,376	-	2,275,934,376
වෙනත් විස්තීර්ණ අදායම යටතේ සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්	30	52,049,653	-	52,049,653
පරිපාලිත සමාගම්වල ආයෝජන	31	8,080,402	-	8,080,402
ආශ්‍රිත සමාගම්වල ආයෝජන	32	92,988	-	92,988
ආයෝජන දේපළ	33	2,414,640	-	2,414,640
දේපළ, පිරියත හා උපකරණ	34	45,621,257	-	45,621,257
භාවිත අයිතිය සහිත වත්කම්/කල්බදු දේපළ	35	5,554,420	-	5,554,420
අස්පෘශ්‍ය වත්කම්	36	1,608,812	-	1,608,812
විලම්බිත බදු වත්කම්	37	15,836,422	-	15,836,422
වෙනත් වත්කම්	38	101,570,365	-	101,570,365
මුළු වත්කම්		4,985,138,976	44,503,777	4,940,635,199
වෙළඳපල අවදානමට යටත් වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	39	1,671,087	-	1,671,087
ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	40	131,079,414	-	131,079,414
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	41	16,476,077	16,476,077	-
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට				
- තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	42	4,208,603,435	-	4,208,603,435
- වෙනත් ණය ගැනීම්	43	29,143,678	-	29,143,678
ප්‍රවර්තන බදු වගකීම්	45	23,209,855	-	23,209,855
වෙනත් වගකීම්	47	203,859,925	-	203,859,925
යටත් කාලීන ණය	49	68,535,700	-	68,535,700
මුළු වගකීම්		4,682,579,171	16,476,077	4,666,103,094

64.4.2 පොළී අනුපාත අවදානම

ශුද්ධ පොළී ආදායම කෙරෙහි අහිතකර ලෙස බලපාන පරිදි පොළී අනුපාතයන්හි බලාපොරොත්තු නොවූ වෙනස්වීම් හේතුවෙන් අනාගත මුදල් ප්‍රවාහයන්ට හෝ මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකමට බලපෑම් සිදු වීමේ හැකියාව පොළී අනුපාත අවදානම වේ. අඛණ්ඩ අධීක්ෂණය සහ කාලානුරූපීව සිදු කරන ප්‍රතිමිලකරණ උපාය මාර්ග පොළී අනුපාත අවදානම ඵලදායී ලෙස කලමනාකරණය කිරීම සහතික කරයි.

පොළී අනුපාත සංවේදී උපකරණ වන බැංකුවේ භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත්වල වෙළඳ කළඹ සඳහා පොළී අනුපාත වෙනස් වීමෙන් සිදුවිය හැකි බලපෑම තක්සේරු කිරීම සඳහා පදනම් අගය මත මිල වෙනස්වීම (PVBP) සහ කාල විශ්ලේෂණය අවදානම් අභිරුචියෙහි සීමාවන් සමඟ දෛනිකව නිරීක්ෂණය කරනු ලැබේ.

	2025 රු.	2024 රු.	අවදානම් අභිරුචිය රු.
පදනම් අගය මත මිල වෙනස්වීම (PVBP)			
භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන	1,330	47,933	900,000
භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන	717,562	629,067	2,100,000

බැංකුවේ පොළී අනුපාත අවදානම අධීක්ෂණය කිරීම සඳහා පොළී සංවේදී වත්කම් සහ වගකීම් පිළිබඳ සංවේදීතා විශ්ලේෂණය සිදු කරනු ලැබේ. එම වත්කම් සහ වගකීම් කල් පිරීමේ ඉතිරි කාලය සැළකිල්ලට ගෙන කලින් තීරණය කරන ලද කල්පිරීමේ කාණ්ඩ වලට යොමු කිරීම මඟින් සහ පරතර සීමාවන් සහ ප්‍රතිමිලකරණ පැතිකඩ නියම කිරීම සහ අධීක්ෂණය මඟින් මෙය සිදු කරනු ලැබේ. බැංකුවේ පොළී අනුපාත අවදානම් නිරාවරණය එහි මූල්‍ය වත්කම් සහ වගකීම් හි ප්‍රතිශතයක් ලෙස විශ්ලේෂණය කිරීම පහත වගුව මඟින් දක්වා ඇත.

2025	මාසයක් දක්වා (%)	මාස 1-3 දක්වා (%)	මාස 3-6 දක්වා (%)	මාස 6-12 දක්වා (%)	අවුරුදු 1-2 දක්වා (%)	අවුරුදු 2-3 දක්වා (%)	අවුරුදු 3-4 දක්වා (%)	අවුරුදු 4-5 දක්වා (%)	අවුරුදු 5 ට වැඩි (%)
පොළී අනුපාත සංවේදී වත්කම්	4.1	4.3	5.2	15.2	10.7	10.7	14.1	8.1	27.6
පොළී අනුපාත සංවේදී වගකීම්	6.5	3.3	3.7	20.1	9.0	12.4	12.4	6.6	25.9
පරතරය	(2.4)	1.0	1.5	(4.9)	1.7	(1.7)	1.7	1.5	1.7

2024	මාසයක් දක්වා (%)	මාස 1-3 දක්වා (%)	මාස 3-6 දක්වා (%)	මාස 6-12 දක්වා (%)	අවුරුදු 1-2 දක්වා (%)	අවුරුදු 2-3 දක්වා (%)	අවුරුදු 3-4 දක්වා (%)	අවුරුදු 4-5 දක්වා (%)	අවුරුදු 5 ට වැඩි (%)
පොළී අනුපාත සංවේදී වත්කම්	10.7	13.2	12.1	11.9	6.2	6.2	5.0	5.0	29.7
පොළී අනුපාත සංවේදී වගකීම්	4.9	19.9	14.5	11.8	5.0	5.0	5.1	5.1	28.8
පරතරය	5.8	(6.7)	(2.4)	0.1	1.2	1.2	(0.1)	(0.1)	0.9

64.4.3 විදේශ විනිමය අවදානම

විදේශ විනිමය අනුපාත විචලනය වීම නිසා විදේශ මුදලින් ඇති මූල්‍ය උපකරණවල වටිනාකම උච්ඡාවචනය වීමෙන් බැංකුවේ මූල්‍ය ප්‍රතිඵල වලට සහ මූල්‍ය තත්ත්වයට ඇතිවන අවදානම විදේශ විනිමය අවදානම වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති සීමාව තුළ පවතින පරිදි බැංකුව විවෘත තත්ත්වයන් වර්ෂය තුළ පවත්වාගෙන ගොස් ඇත. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මඟින් නියම කරන ලද කේවල නිරාවරණයන් මෙන්ම සමස්ත නිරාවරණයන්ද ඇතුලත් පුළුල් සීමා කළමනාකරණ රාමුවක් තුලින් විදේශ විනිමය අවදානම පාලනය කරයි. ආතති අවස්ථාවන්හිදී ලාභයට සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයට ඇති බලපෑම මැනීම සඳහා විදේශ විනිමය අනුපාත මත ආතති පරීක්ෂණ විශ්ලේෂණය සිදු කරනු ලැබේ.

දෙසැම්බර් 31 දිනට විදේශ විනිමය තත්ත්වය	2025		2024	
	සමස්ත ධන අගය (ශුද්ධ) රු. '000	සමස්ත ඍණ අගය (ශුද්ධ) රු. '000	සමස්ත ධන අගය (ශුද්ධ) රු. '000	සමස්ත ඍණ අගය (ශුද්ධ) රු. '000
මුදල් ඒකකය				
ඇමරිකානු ඩොලර්	-	(1,836,099)	262,223	-
බ්‍රිතාන්‍ය පවුම්	18,727	-	13,679	-
යූරෝ	54,119	-	47,952	-
ජපන් යෙන්	1,862,742	-	-	(94,689)
ඔස්ට්‍රේලියන් ඩොලර්	8,061	-	8,468	-
කැනේඩියන් ඩොලර්	423	-	1,208	-
ස්විස් ෆ්‍රෑන්ක්	692	-	-	-
සිංගප්පූරු ඩොලර්	-	(24,076)	1,014	-
හොංකොං ඩොලර්	124,924	-	247,081	-
උප එකතුව	2,069,688	(1,860,175)	581,625	(94,689)
වෙනත් මුදල් ඒකක වර්ග	2,291,632	(206,419)	1,980,373	(91,207)
මුළු එකතුව	4,361,320	(2,066,594)	2,561,998	(185,896)
ධන හෝ ඍණ අගයන්හි වැඩි අගය		4,361,320		2,561,998

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

විනිමය අනුපාත විචලනයන් නිසා ලාභ හෝ අලාභ ප්‍රකාශනයට වන බලපෑම

	2025		2024	
	ශුද්ධ විවෘත තත්ත්වය (අනුපාතික වෙනස්වීමෙන් පසු) රු. '000	ලාභ හෝ අලාභ ප්‍රකාශනයට බලපෑම රු. '000	ශුද්ධ විවෘත තත්ත්වය (අනුපාතික වෙනස්වීමෙන් පසු) රු. '000	ලාභ හෝ අලාභ ප්‍රකාශනයට බලපෑම රු. '000
විදේශ විනිමය අනුපාතයේ වෙනස්වීම				
5%	4,143,253	(218,066)	1,280,999	(1,280,999)
10%	3,925,187	(436,132)	2,305,799	(256,200)
-5%	4,579,385	218,066	3,842,998	1,280,999
-10%	4,797,451	436,132	2,818,198	256,200

64.4.4 ස්කන්ධ අවදානම

ස්කන්ධ අවදානම යනු ස්කන්ධ දර්ශක සහ තනි කොටස්වල මට්ටමේ වෙනසක් හේතුවෙන් කොටස් කළඹේ සාධාරණ වටිනාකම පිරිහීමේ අවදානමයි. ස්කන්ධ අවදානම අධීක්ෂණය කරනු ලබන්නේ සමස්ත කළඹ සීමාවන්, තැරැව්කාර සීමාවන්, පාඩු සීමාවන් සහ අවදානමේදී අගය (VaR) ක්‍රමවේදය භාවිතා කිරීමෙනි.

64.5 මෙහෙයුම් අවදානම

ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලි, පුද්ගලයින්ගේ හෝ පද්ධතිවල ප්‍රතිඵලයක් ලෙස හෝ බාහිර සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස අලාභ ඇතිවීමේ අවදානම මෙහෙයුම් අවදානම ලෙස නිර්වචනය කෙරේ. මූලික දර්ශක ප්‍රවේශය (Basic Indicator Approach - BIA) ඇසුරෙන්, මෙහෙයුම් අවදානම සඳහා සැළකිය යුතු ප්‍රාග්ධනයක් වෙන් කිරීම බැංකුව විසින් සිදු කරන නමුත්, සත්‍ය මෙහෙයුම් අලාභය උක්ත සඳහන් ප්‍රාග්ධන වෙන් කිරීමට සාපේක්ෂව ඉතා පහළ මට්ටමක පැවතිනි. බැංකුවේ සාර්ව සහ විස්තීරණ මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව මඟින් අදාල සියළු අවදානම් සක්‍රීයව කළමනාකරණය කිරීම සහතික කරයි.

64.6 ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධනය යනු බැංකුව විසින් උපකල්පනය කරන අවදානම් වලට එරෙහිව ඇති මූල්‍යමය ආවරණයයි. ව්‍යාපාරයේ දිගුකාලීන ස්ථාවරත්වය සහතික කිරීම සඳහා නිසි ප්‍රාග්ධන කළමනාකරණය ඉතා වැදගත් වේ. ප්‍රාග්ධන කළමනාකරණයේ මූලික පරමාර්ථය වන්නේ අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා පවත්වාගෙන යාම සහ උපරිම ලාභදායීතාවය සඳහා ප්‍රශස්ථ ප්‍රාග්ධන භාවිතය සහතික කිරීමය. ව්‍යාපාරයේ විශාලත්වය සහ ස්වභාවය අනුව, බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන උත්පාදනයේ මූලික මූලාශ්‍රය වන්නේ රඳවාගත් ඉපැයීම් ය. ව්‍යාපාර ව්‍යාප්තිය සඳහා පූර්ව තීරණය කළ ප්‍රාග්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා ප්‍රාග්ධන ප්‍රභවයන් ප්‍රාග්ධන වර්ධක සැලැස්ම තීරණය කරයි.

64.6.1 ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP)

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය යනු බැංකුවේ මූල්‍ය ශක්තියේ මිනුමක් වන අතර එහි ප්‍රාග්ධනයේ හා ණය, වෙළඳපළ සහ ව්‍යාපාරයේ මෙහෙයුම් අංශවල අවදානමේ බර සහිත වත්කම් (RWAs) වල අනුපාතයක් ලෙස ප්‍රකාශ වේ. මෙම අනුපාතය මඟින් පෙන්නුම් කරන්නේ, සාධාරණ මට්ටමේ අවදානමක් පවත්වා ගත හැකි ආකාරය ඵලදායී ලෙස තහවුරු කරන මූල්‍ය ශක්තිය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වා ගැනීමට බැංකුවට ඇති හැකියාවයි. දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකු (DSIBs) සඳහා අවම මුළු ප්‍රාග්ධන අවශ්‍යතාවය 14% වන අතර බැංකුවට ස්ථර I ප්‍රාග්ධන මට්ටම 10% පවත්වා ගැනීමට අවශ්‍ය වේ.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) නියාමකයා විසින් නියම කර ඇති බාසල් අවශ්‍යතාවයට සහ මාර්ගෝපදේශයන්ට අනුකූලව සියළු අවදානම් වලට අදාලව පවත්වා ගත යුතු ප්‍රාග්ධන මට්ටම තීරණය කරයි. බැංකුව නිරාවරණය වන සියළුම අවදානම් ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගෙන යන බව සහතික කරන ලද සහ සැලසුම් කළ ව්‍යාපාරික ක්‍රියාවලිය මත පදනම්ව ප්‍රාග්ධන සැලසුම්කරණය අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) විසින් පහසු කරනු ලැබේ. අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) හි ස්ථම්භ II අවදානම් තක්සේරු කිරීම සඳහා බැංකුව ජාත්‍යන්තරව පිළිගත් අභ්‍යන්තර ආකෘති භාවිතා කරන අතර මුළු ප්‍රාග්ධන අවශ්‍යතාවය තීරණය කිරීම සඳහා බහුවිධ අවස්ථා භාවිතා කරමින් පුළුල් ආතති පරීක්ෂාවක් සිදු කරයි. කිර්තිනාම අවදානම, අනුකූලතා අවදානම සහ තොරතුරු තාක්ෂණ අවදානම වැනි සියලුම ගුණාත්මක අවදානම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) මඟින් සලකා බලනු ලැබේ. උපායමාර්ගික අවදානම තක්සේරු කරනු ලබන්නේ අභ්‍යන්තරව ගොඩනගන ලද අවදානම් දර්ශකයක් හරහා වන අතර සංකේන්ද්‍රන අවදානම තක්සේරු කිරීම මඟින් බැංකුව කුමන හෝ පාර්ශ්වයකට, නිෂ්පාදනයකට, අංශයකට හෝ භූගෝලීය කාණ්ඩයකට අධික ලෙස නිරාවරණය නොවූ විවිධාංගීකරණය වූ කළඹක් ඇති බව සහතික කරයි.

ප්‍රාග්ධන මට්ටම්	2025	2024
ණය අවදානම් බරිත වත්කම් සඳහා ප්‍රාග්ධන ගාස්තුව (රු. 000)	247,238,509	223,131,659
ණය වෙළඳපළ අවදානම් බරිත වත්කම් සඳහා ප්‍රාග්ධන ගාස්තුව (රු. 000)	2,617,377	2,545,425
මෙහෙයුම් අවදානම් බරිත වත්කම් සඳහා ප්‍රාග්ධන ගාස්තුව (රු. 000)	26,580,620	24,582,544
ස්ථර I ප්‍රාග්ධනය % (අවම නියාමනය - 10%)	12.37	13.00
මුළු ප්‍රාග්ධනය % (අවම නියාමනය - 15%)	16.89	16.55

65 තෝරාගත් කාර්ය සාධන දර්ශක/ ප්‍රධාන මූල්‍ය දත්ත (නියාමන වාර්තාකරණයට අනුව)

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2025	2024	2025	2024
නියාමන ප්‍රාග්ධන ප්‍රමාණවත් බව (රුපියල් මිලියන වලින්)				
පොදු ස්කන්ධය ස්ථර 1	225,968	213,974	238,613	225,093
ස්ථර 1 ප්‍රාග්ධනය	244,318	232,324	256,963	243,443
මුළු නියාමන ප්‍රාග්ධනය	333,555	295,847	349,258	308,735
නියාමන ප්‍රාග්ධන අනුපාත (%)				
පොදු ස්කන්ධය ස්ථර 1 ප්‍රාග්ධනය (%) (අවම අවශ්‍යතාවය : 8.5%)	11.4	12.0	11.5	12.2
ප්‍රාග්ධන අනුපාතය ස්ථර 1 (%)(අවම අවශ්‍යතාවය : 10.0%)	12.4	13.0	12.4	13.1
මුළු ප්‍රාග්ධන අනුපාතය(%)(අවම අවශ්‍යතාවය : 15.0%)**	16.9	16.6	16.8	16.7
බාසල් 111 තෝලන අනුපාතය (අවම අවශ්‍යතාවය : 3.0%)	4.1	4.4	4.3	4.6
නියාමන ද්‍රවශීලතා අවශ්‍යතාවය (%)				
ද්‍රවශීලතා ආවරණ අනුපාතය(%)(අවම අවශ්‍යතාවය : 100.0%)				
- රුපියල් (%)	296.0	329.0		
- සියළුම මුදල් (%)	260.4	269.6		
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය(%)-(අවම අවශ්‍යතාවය : 100.0%)	156.6	157.9		
වත්කම් ගුණාත්මකභාවය (%)				
හානිකරණ ණය (අදියර 3) මුළු ණය වලට, අනුපාතය (%)*	5.6	7.2		
හානිකරණ ණය (අදියර 3) සඳහා ණය හානිකරණ ප්‍රතිපාදන වෙන්කිරීම්වලට, අනුපාතය (%)*	57.9	53.6		
ආදායම සහ ලාභදායීතාවය (%)				
ශුද්ධ පොළී ආන්තිකය (%)	4.0	3.6	4.0	3.6
වත්කම්හි සාමාන්‍ය මත ප්‍රතිලාභය (බදු ගෙවීමට පෙර)(%)	2.3	2.3	2.3	2.3
ස්කන්ධයෙහි සාමාන්‍ය මත ප්‍රතිලාභය (%)	22.7	23.2	21.5	21.9
ආදායමට පිරිවැය (%)	33.0	40.1	34.1	41.3
අතිරේක තොරතුරු				
ණය ශ්‍රේණිගත කිරීම - ෆිච්	AA-	AA-		
සේවක සංඛ්‍යාව	8,912	8,214		
ශාඛා සංඛ්‍යාව	584	584		

* ණය ලබා නොගත් ප්‍රමාණය ඇතුළුව

** 1988 අංක 30 දරණ බැංකු පනතේ 19 (10) වගන්තියට අනුකූලව අවම නිගමන ප්‍රාග්ධන අනුකූලතා අනුපාතය වන 14% ට අමතරව තවත් 1% ක ප්‍රාග්ධන ආරක්ෂණයක් පවත්වා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව නියෝගකර ඇත.



අනුකූලතා ඇමුණුම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2023 සංග්‍රහයට අනුකූලතා	405
2024 අංක 05 දරණ බැංකු පනතේ විධිවිධාන යටතේ අනුකූලවීමේ අවශ්‍යතා	411
කොළඹ කොටස් හුවමාරුව විසින් නිකුත් කරන ලද ලැයිස්තුගත කිරීමේ රීතිවල 9 වන වගන්තියට අනුකූලවීම	436
කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනෙකුත් අනුකූලවීමේ අවශ්‍යතා	441
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා	442
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය	446

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2023 සංග්‍රහයට අනුකූලතා

සංග්‍රහයේ සඳහන් කර ඇති වගන්තිය	අනුකූල වීමේ මට්ටම
අ	**අධ්‍යක්ෂවරු**
අ.1.	**අධ්‍යක්ෂ මණ්ඩලය**
මූලධර්මය අ.1	2025.12.31 දිනට ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් එකොළොස් දෙනෙකුගෙන් (11) සමන්විත වන අතර, ඵලදායී පාලනයන් සමඟ බැංකුව මෙහෙයවීමට අවශ්‍ය නිපුණතා සහ පළපුරුද්ද ඔවුන් සතුව ඇත. අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් හා අත්දැකීම් ඔවුන් පිළිබඳ විස්තර පිටු අංක 34 සිට 39 දක්වා සඳහන් වේ.
අ.1.1.	**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්** අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සති දෙකකට වරක් පවත්වනු ලබන අතර අවශ්‍ය වූ විට සහ විශේෂ රැස්වීම් පැවැත්වීමට නියමිතය. රැස්වීම් කාලසටහන වසර ආරම්භය වන විට සකස් වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තොරතුරු ඉදිරිපත් කිරීමේ ව්‍යුහයට එකඟ වී ඇත. තීරණ ගැනීම සක්‍රීය කිරීම සඳහා එකඟ වූ පරිදි අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කෙරේ. සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂ රැස්වීම්ද ඇතුළුව විසිහයවරක් (26) රැස් වූ අතර රැස්වීම්වලට පැමිණීම 173 පිටුවේ සාරාංශ කර ඇත. මෙම වගන්තිය යටතේ ලැයිස්තුගත කර ඇති තොරතුරු අදාළ උපකමිටු සහ අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ සාකච්ඡා කෙරේ.
අ.1.2.	**අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම්** අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම් ඇතුළත් කර ඇත.
අ.1.3.	**රටේ බලපවත්වන නීතියට අනුව කටයුතු කිරීම** 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට, සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධනයන්ට අනුව බැංකුව නියාමනය වේ. තවද ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකුවේ විදේශීය ශාඛා ඇති රටවල නියාමනයන්, සුරුකුම්පත් හා විනිමය කොමිසම හා කොළඹ කොටස් හුවමාරුව වෙත බැංකුව අනුකූල වන අතර බැංකුවට අදාළ වන නීති වලට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියා කරයි. අධ්‍යක්ෂවරුන්ට අවශ්‍ය වූ විට බැංකුවේ අනුග්‍රහයෙන් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම සඳහා අනුමත ප්‍රතිපත්තිය මත ප්‍රවේශ විය හැක.
අ.1.4.	**සමාගම් ලේකම්ගේ උපදෙස් සහ සේවාවන්** සියළුම අධ්‍යක්ෂවරුන්ට, නීතිඥවරියක් වන ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්තුමියගෙන් උපදෙස් සහ සේවාවන් ලබා ගැනීමේ හැකියාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි පිළිබඳ සොයා බැලීමට, නීති හා රෙගුලාසිවලට අනුකූල වීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ලබා ගැනීම හා පවත්වාගෙන යාම සහ බැංකුවට අදාළ වාර්තා තබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු වේ. ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, ඉවත් කිරීමේ අවශ්‍යතාවයන් පැන නැඟුන විට එය මුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින්ම සැලකිල්ල යොමු කර ක්‍රියාවට නැංවිය යුතු කාර්යයක් වේ. සමාගම් ලේකම්වරියගේ භූමිකාව 170 පිටුවේ දක්වා ඇත.
අ.1.5.	**ස්වාධීන විනිශ්චය** ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපායමාර්ගික සැළසුම්, කාර්යසාධනය, සම්පත් විභාජනය, අවදානම් කළමනාකරණය, අනුකූල වීම් හා සම්මතයන් පවත්වාගෙන යාමට අදාළ කාර්යයන් හා වගකීම් වලදී ස්වාධීන විනිශ්චයන් දරනු ලැබේ.
අ.1.6.	**අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ බැංකුවේ කටයුතු සඳහා ප්‍රමාණවත් කාලය සහ ශ්‍රමය කැප කිරීම** අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට දින හතකට පෙර න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සලස්වන අතර එමඟින් වැඩිදුර තොරතුරු සොයා බැලීමට හා අවශ්‍ය දත්ත ගැන විමසීමට ප්‍රමාණවත් කාලයක් ලැබී ඇත.
	ආයතනික කළමනාකාරිත්වයේ සාමාජිකයින් සහ බාහිර විශේෂඥයින් බැංකුවේ උපායමාර්ගික දිශාව, මෙහෙයුම්, මූල්‍ය කාර්යසාධනය, අවදානම් කළමනාකරණය සහ අනෙකුත් ප්‍රධාන ක්ෂේත්‍රවලට අදාළ විවිධ කරුණු සම්බන්ධයෙන් යාවත්කාලීන කිරීම්, අනුමැතිය හෝ මඟපෙන්වීම් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම් සිදු කරයි.
අ.1.7.	**යෝජනාවන් ඉදිරිපත් කිරීම** බැංකුවේ කටයුතු පිළිබඳව බැංකුවේ යහපත උදෙසා අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් හට තනි තනිව තමන්ගේ යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමට ඉඩ ප්‍රස්ථා සලසා ඇත.
අ.1.8.	**අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණුව** බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පළමු වරට පත් වීමේදී හඳුන්වාදීමේ වැඩසටහනකට සහභාගි වීමට අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සැලසෙන අතර එහිදී බැංකුවට අදාළ නියාමන අවශ්‍යතාවන්, බැංකුවේ ඉතිහාසය, සංවිධාන ව්‍යුහය, බැංකුවේ පරිපාලිතයන් හා ආශ්‍රිතයන් පිළිබඳ විස්තර, බැංකුවේ නිෂ්පාදන හා සේවා පිළිබඳ විස්තර ද අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ද ඇතුළත් සවිස්තරාත්මක ලිපිගොනුවක් ලබාදෙන අතර දත්ත ලබා ගැනීම සඳහා ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යයට පිවිසීමට ඉඩ සලස්වනු ලැබේ. පුහුණු සැසි සඳහා සහභාගී වීමට අධ්‍යක්ෂවරුන් උනන්දු කරවන අතර බැංකුවේ බාහිර පරිසරයේ වර්තමාන සහ නව්‍ය උපායමාර්ගයන්, පිළිබඳව බැංකුවේ ආයතනික කළමනාකාරිත්වය මඟින් හෝ බාහිර සම්පත් දායකයකු මඟින් හෝ විස්තරාත්මකව පැහැදිලි කිරීම් සිදු කෙරේ. අධ්‍යක්ෂවරු වසර තුළ එක් පුහුණු වැඩසටහනකට සහභාගි වූහ. කෙසේ වෙතත්, බැංකුවේ ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය යාවත්කාලීන කිරීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය අවස්ථාවලදී ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2023 සංග්‍රහයට අනුකූලතා

සංග්‍රහයේ සඳහන් කර ඇති වගන්තිය	අනුකූල වීමේ මට්ටම
අ.2.	**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී (CEO) අතර වගකීම් බෙදා හැරීම.**
	ලංකා බැංකුවේ සභාපති තනතුර හා ප්‍රධාන විධායක නිලධාරී තනතුර (ලංකා බැංකුවේ මහා කළමනාකරු) පුද්ගලයන් දෙදෙනෙකු විසින් දරණු ලබයි. සභාපති, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. බැංකුව විසින් නිකුත් කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට අනුව ලංකා බැංකුවේ සභාපතිතුමාගේ හා මහා කළමනාකාරතුමාගේ වගකීම් ඉතා පැහැදිලිව දක්වා ඇත.
අ.3.	**සභාපති භූමිකාව**
	බැංකුවේ සභාපතිතුමා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදෙන අතර අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු සාර්ථකව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සපයනු ලැබේ. මහා කළමනාකාරතුමා විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අධ්‍යක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරන ලද වෙනත් අදාල කරුණු වලට අනුව ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය සභාපතිතුමාගේ අවසරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා නෝටිස් සකස් කරයි. ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්තුමිය විසින් සකස් කරන ලද නෝටිස් පත්‍රය සභාපතිතුමා විසින් අනුමත කරයි. උපායමාර්ග, කාර්යසාධනය, සම්පත් විභජනය, අවදානම් කළමනාකරණය හා අනුකූල වීම යන සියළු ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි මෙම නෝටිස් පත්‍ර සකස් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට දින හතකට පෙර අදාල කරුණු පිළිබඳ ප්‍රමාණවත් විස්තර ඇතුලත් නෝටිස් පත්‍රය ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සැලැස්වේ. සියළුම අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ යුතුකම් හා වගකීම් ද (අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ දක්වා ඇති පරිදි) අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවල ව්‍යුහයද පැහැදිලිව ප්‍රකාශ කිරීම හේතු කොට ගෙන සිය වගකීම් නිසි ආකාරයෙන් ඉටු කිරීමට ඉඩ ප්‍රස්ථාව සැලසේ. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වන අතර ඔවුන් විසින් ඔවුන්ගේ හැකියාවන් මත බැංකුවේ සාර්ථකත්වයට උපරිම දායකත්වය ලබා දෙයි. සියළුම අධ්‍යක්ෂවරුන්ට රැස්වීම් නෝටිස් පත්‍රයට අදාළ කරුණු පිළිබඳ සාකච්ඡා කිරීමට හා අවශ්‍ය වැඩිදුර දත්ත ලබා ගැනීම සඳහා ඉඩ ප්‍රස්ථා සලසා දී ඇති අතර ආයතනිකමය වශයෙන් වැදගත් යැයි හැඟෙන කරුණු නෝටිස් පත්‍රයට ඇතුළත් කිරීමට ඉල්ලා සිටීමට අවස්ථාව සලසා ඇත සැලකිල්ලට භාජනය කරන ලද ගැටළු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ අදහස් තහවුරු කරනු ලබන අතර, එවැනි සාකච්ඡාවන් පිළිබඳ විස්තරාත්මකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවේ සටහන් කර ඇත.
අ.4.	**මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් මඟ පෙන්වීමක් ලබා දීම සඳහා මූල්‍ය දැනුම හා නිපුණතාවය**
	බැංකුවේ කටයුතු වලට මඟපෙන්වීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය දැනුමක් හා නිපුණතාවයක් අධ්‍යක්ෂවරුන් සතුව ඇති අතර ඒ සඳහා ඔවුන්ට තම ව්‍යාපාර/ වෘත්තීය තුළින් ලද පෙරහුරුවන් මහෝපකාරී වේ.
අ.5.	**අධ්‍යක්ෂ මණ්ඩලයේ සමතුලිතතාවය**
	බැංකුවේ සභාපතිවරයා සහ මණ්ඩලය විධායක නොවන නිලධාරීන් වන අතර, ඔවුන් අතර හය දෙනෙකු (06) ස්වාධීන වන අතර 2024 අංක 5 දරණ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියෝගයට අනුව, භාණ්ඩාගාර නියෝජිතයා ද ඇතුළත් ව පස් දෙනෙකු (05) ස්වාධීන නොවන අය වෙති. කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති වලට අනුව, නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂක හැර අනෙකුත් සියලුම අධ්‍යක්ෂවරුන් ස්වාධීන වේ. මෙම සංග්‍රහයේ අදාළ රෙගුලාසිවල අවශ්‍යතා වලට අනුකූලව ස්වාධීන/ ස්වාධීන නොවන තහවුරු කිරීම සඳහා ස්වාධීන ප්‍රකාශයක් ලබා ගන්නා අතර එය කොළඹ කොටස් හුවමාරු නීති යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද උපදෙස් විධිවිධාන ද ආවරණය කරයි. මෙම සංග්‍රහයේ වගන්ති අංක අ 5.5 ට අනුව සභාපතිතුමා ස්වාධීන ලෙස සැලකුව ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන්ට අනුව 2026 වසරේදී ජ්‍යේෂ්ඨ අධ්‍යක්ෂකවරයෙකු පත් කිරීමට බැංකුව තීරණය කර ඇත.
අ.6.	**කාලීන තොරතුරු සැපයීම**
	නෝටිස් පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු පත්‍රිකා අදාළ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු රැස්වීම් වලට දින හතකට පෙර ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සැලැස්වීම මඟින් ඒ සඳහා තොරතුරු සොයා බැලීමට අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් කාලයක් ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සුමටව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය අවස්ථා වලදී අවශ්‍ය කරුණු පැහැදිලි කර ගැනීම සඳහා පූර්ව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කරනු ලැබේ. පැහැදිලි කිරීම් කටයුතු සඳහා ආයතනික කළමනාකාරිත්වයේ අදාළ සාමාජිකයන් සුදානම්ව සිටී. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ සිට දින 10 ක් ඇතුළත දී එහි වාර්තාව අධ්‍යක්ෂවරුන්ට ලබා ගැනීමට ඉඩ සලස්වා ඇත.

සංග්‍රහයේ සඳහන් කර ඇති වගන්තිය	අනුකූල වීමේ මට්ටම
අ.7.	**අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම: නාමයෝජනා සහ යහපාලනය පිළිබඳ කමිටුව**
අ.7.1. සහ අ.7.2.	නාමයෝජනා සහ යහපාලනය පිළිබඳ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් පස්දෙනෙකුගෙන් (05) සමන්විත වූ අතර ඔවුන් අතරින් දෙදෙනෙකු (02) ස්වාධීන වේ. කොළඹ කොටස් හුවමාරුවේ රෙගුලාසි වලට අනුව කමිටුවේ සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ලෙස සැලකේ. අධ්‍යක්ෂ මණ්ඩලයට යෝජනා කිරීමෙන් පසු, ඔවුන්ගේ යෝග්‍යතාවය කමිටුවේ සාමාජිකයින් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2024 අංක 05 දරණ බැංකු පනතේ නියෝගයේ 6.4 (ඇ) ප්‍රකාරව තක්සේරු කරනු ලැබේ. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම නාමයෝජනා සහ යහපාලන කමිටුව හරහා සිදු කෙරේ. නාමයෝජනා සහ යහපාලන කමිටුව විනිවිදභාවයෙන් යුක්ත, වෛෂයික සහ කුසලතා මත පදනම් වූ ක්‍රියාවලියක් හරහා විභව අපේක්ෂකයින් ඇගයීමට ලක් කරනු ලබන අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ වලට අනුකූලව අවශ්‍ය පසුබිම් පරීක්ෂාවන් සහ යෝග්‍යතාවය තක්සේරු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අධ්‍යක්ෂවරුන් පත් කිරීම පිළිබඳ ප්‍රතිපත්තියෙහි මෙම ක්‍රියා පටිපාටිය සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය සඳහා අවශ්‍ය කුසලතා, පළපුරුද්ද සහ දැනුම දක්වා ඇත. නාමයෝජනා සහ යහපාලනය පිළිබඳ කමිටුව විසින් කෙටි ලැයිස්තුගත අපේක්ෂකයින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සලකා බැලීම සහ අනුමැතිය සඳහා ඉදිරිපත් කරයි. සුදුසු අපේක්ෂකයින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසු, අමාත්‍යාංශය හරහා නිකුත් කරන ලද පත්වීම් ලිපියක් සමඟ විධිමත් පත්වීමක් සඳහා අමාත්‍යවරයා වෙත යොමු කරනු ලැබේ. ඔවුන්ගේ නිල තනතුර අනුව පත් කරන ලද අධ්‍යක්ෂවරුන් නිල බලයෙන් පත් කරන ලද අධ්‍යක්ෂවරුන් ලෙස පිළිගනු ලැබේ.
අ.7.3.	බැංකුව සතුව ආයතනික කළමනාකරණය සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් ඇති අතර එය වසර තුළ සංශෝධනය කර ඇත.
අ.7.4.	නව අධ්‍යක්ෂවරුන් සම්බන්ධ තොරතුරු බැංකුවේ වෙබ් අඩවියේ, මාධ්‍යයේ පළ කර කොළඹ කොටස් වෙළඳපළ වෙත නිවේදනය කෙරේ.
අ.7.5.	නාමයෝජනා සහ යහපාලන කමිටුව පිළිබඳ වාර්තාව 186 සහ 187 පිටුවල දක්වා ඇති අතර කමිටුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් ඉදිරිපත් කර ඇත.
අ.8.	**නැවත පත් කිරීම** තම සේවා කාලයට ප්‍රථම අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් කළහොත් හෝ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතට අනුව ධුරය හෙබවීමෙන් ඉවත් වුවහොත් හැර සෑම අධ්‍යක්ෂවරයෙකුම අවුරුදු තුනක සේවා කාලයක් සඳහා පත් කරනු ලබන අතර මෙම අවස්ථා දෙකෙහිදීම බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත පත් වීමට බාධාවක් ඇති නොවේ. **ධුරයෙන් ඉල්ලා අස්වීම** පත් වූ අධ්‍යක්ෂවරයෙකු තම අධ්‍යක්ෂ ධුරයෙන් ඉල්ලා අස්වන විට හා සේවා කාලය අවසන් වනවිට තම ඉල්ලා අස්වීමේ ලිපිය බැංකු කටයුතු විෂය භාර අමාත්‍යවරයාට ලිඛිතව ලබාදිය යුතුවේ. තවද විශේෂ හේතුවක් මත සේවයෙන් ඉවත් වන්නේ නම් එයද තම ලිපියෙහි සඳහන් කළ යුතුවේ. අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම්/ ඉල්ලා අස්වීම් පිළිබඳ විස්තර පිටු අංක 173 හි දක්වා ඇත.
අ.9.	**අධ්‍යක්ෂ මණ්ඩලයේ හා එහි උපකමිටු වල කාර්යසාධනය ඇගයීම** අධ්‍යක්ෂ මණ්ඩලයේ හා උපකමිටු වල අදාළ ඉලක්ක නිවැරදිව ළඟා කර ගනිමින් අදාළ කමිටු වගකීම් තෘප්තිමත් විය හැකි අයුරින් ඉටුකර ඇති බව තහවුරු කර ගැනීමට වාර්ෂිකව ස්වයං ඇගයීම් ක්‍රියාවලියක අධ්‍යක්ෂ මණ්ඩලය සහ අදාළ උපකමිටු නිරත වේ. එම කමිටු සියල්ලේම සාමූහික ප්‍රතිඵලය අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සමාලෝචනය කරනු ලැබේ. අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික ඇගයීම ඔවුන් විසින් පුද්ගලිකව පුරවන ලද ප්‍රශ්නාවලිය මත පදනම් වේ.
අ.10.	**අධ්‍යක්ෂවරු සම්බන්ධයෙන් තොරතුරු වාර්ෂික වාර්තාවෙන් අනාවරණය කිරීම** අධ්‍යක්ෂවරු හා සම්බන්ධ පහත සඳහන් තොරතුරු වාර්ෂික වාර්තාවේ සඳහන් වේ. නම, සුදුසුකම්, ප්‍රවීණතාවය දක්වන ක්ෂේත්‍ර, විධායක හෝ විධායක නොවන බව ද ඇතුළුව අධ්‍යක්ෂවරුන්ට අදාළ විස්තර පිටු අංක 32 සිට 39 දක්වා ඇත. බැංකුව සමඟ ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම පිටු අංක 224. අධ්‍යක්ෂවරුන්ට ගෙවන ලද පාරිතෝෂික පිටු අංක 270 හි මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන් අංක 17. සම්බන්ධිත පාර්ශ්ව විස්තර පිටු අංක 367 සිට 373 තෙක් දක්වා ඇති අතර වෙනත් ආයතන වල දරණ අධ්‍යක්ෂධුර පිළිබඳ විස්තර පිටු අංක 173 හි දක්වා ඇත. උපකමිටුවල සාමාජිකත්වය, වර්ෂය තුළ පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල හා උපකමිටු රැස්වීම්වල සහභාගීත්වය පිළිබඳ පිටු අංක 173 හි දක්වා ඇත.
අ.11.	**ප්‍රධාන විධායක නිලධාරී/ මහා කළමනාකරු ඇගයීම** මහා කළමනාකාරතුමාගේ වාර්ෂික කාර්යසාධන වාර්තාව මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව මඟින් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන අතර කාර්යසාධනය මැන බැලීමට ගන්නා නිර්ණායක ලෙස බැංකුව අදාළ වර්ෂය තුළ ළඟා කරගත් ඉලක්ක හා ඊට අනුබද්ධිතව ඇති වර්ෂය ආරම්භයේ සකස් කල ආයතනික සැලැස්ම යොදා ගනී.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2023 සංග්‍රහයට අනුකූලතා

සංග්‍රහයේ සඳහන් කර ඇති වගන්තිය	අනුකූල වීමේ මට්ටම
ආ	**අධ්‍යක්ෂ පාරිශ්‍රමික**
ආ.1.	සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය (සියලු විධායක නොවන) සඳහා විධිමත් පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. ඉහත ප්‍රතිපත්තිය සකස් කරනු ලබන්නේ රජය, කොටස් හිමියා විසින් කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ සහ වෙනත් අදාළ නීති මත පදනම්වය. තමන්ගේ වේතනය තීරණය කිරීමට කිසිදු අධ්‍යක්ෂකවරයෙකු සම්බන්ධ නොවේ.
ආ.2.	**මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව** අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික තීරණය වන්නේ රජය, කොටස් හිමියා විසින් කලින් කලට නිකුත් කරන චක්‍රලේඛ සහ වෙනත් අදාළ නීති සම්පාදනය පදනම් කරගෙනය.
ආ.2.	ඒ අනුව අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික තීරණය කිරීමේදී බැංකුවේ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවට කාර්යභාරයක් නොමැත. (කෙසේ වෙතත් ජ්‍යේෂ්ඨ විධායක නිලධාරීන්ගේ වේතනය නිර්දේශ කරයි.)
ආ.3.	**පාරිශ්‍රමික පිළිබඳ හෙළිදරව් කිරීම** සමස්තයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවන ලද පාරිශ්‍රමික පිළිබඳ විස්තර 270 පිටුවේ දක්වා ඇත. මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සංයුතිය 184 පිටුවේ දැක්වේ. ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත ගෙවන ලද පාරිශ්‍රමික 368 පිටුවේ දැක්වේ.
ඇ	**කොටස් හිමියන් සමඟ ඇති සබඳතා**
ඇ.1.	බැංකුවේ එකම කොටස් හිමියා ශ්‍රී ලංකා රජය වන අතර බැංකුව හා කොටස් හිමියා අතර විවිධ ආකාරයෙන් සන්නිවේදන කටයුතු සිදු වේ. ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් නිලධාරියෙක් (මුදල් අමාත්‍යංශ නිලධාරියෙකු) බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරන අතර වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම ද සිදුවේ. වාර්ෂික වාර්තාව පිළිබඳ විමසීම් කිරීම සඳහා පාර්ලිමේන්තුවේදී ඉඩ ප්‍රස්ථාව සලසා ඇත.
ඇ.2.	බැංකුවේ කොටස්කරු වශයෙන් රජය සතුව පවතින බැංකුවට අදාළ වන ප්‍රධාන ගැටළු හා විශේෂිත අංශයන් පිළිබඳ සාකච්ඡා කිරීම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සිදු කරන අතර එහිදී රජයේ ප්‍රධාන නියෝජිතයා හා අවශ්‍ය වූ විට අමාත්‍යංශයේ උසස් නිලධාරීන් සහභාගි වේ. සමාලෝචනය කරන ලද වර්ෂය තුළ අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්ව සමඟ සාර්ථක සන්නිවේදනයක් සඳහා පිහිටුවා ඇති සන්නිවේදන ප්‍රතිපත්තිය සංශෝධනය කරන ලදී.
ඇ.3.	367 සිට 373 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ අනාවරණය කර ඇති දේ හැර, වර්ෂය තුළ බැංකුවේ ක්‍රියාකාරිත්වයට, එහි ශුද්ධ වත්කම් පදනමට හෝ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු වලට ප්‍රමාණාත්මකව බලපාන කිසිදු ගනුදෙනුවක් අධ්‍යක්ෂවරුන් විසින් සිදු කර නොතිබුණි.
ඈ	**වගවීම සහ විගණනය**
ඈ.1.	වාර්ෂික වාර්තාව මඟින් බැංකුවේ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය, ව්‍යාපාර ආකෘතිය, පාලන ව්‍යුහය, අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනයන් සහ අභියෝග, අවස්ථා සහ අපේක්ෂාවන් පිළිබඳ සමබර තක්සේරුවක් පහසුවෙන් තේරුම් ගත හැකි ආකාරයෙන් ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා සියලු පියවර ගනු ලැබේ. අදාළ නීති නියාමන හා මඟ පෙන්වීම් වලට අනුකූලව මූල්‍ය වාර්තා සකස් කර ඇති අතර සැලකිය යුතු අපගමන අවස්ථා වලදී සාධාරණ පැහැදිලි කිරීම් ද මෙම වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් කර ඇත. ව්‍යවස්ථාපිත අවශ්‍යතා, වෙනත් නියාමන ආයතන වලට ලබා දෙන වාර්තා, අතුරු සහ වෙනත් මීල සංවේදී ප්‍රසිද්ධ වාර්තා පිළියෙල කිරීමේදී සමතුලිත සහ පහසුවෙන් අවබෝධ කරගත හැකි අයුරින් පිළියෙල කර ඇති බව තහවුරු කරයි. බැංකුවේ සහ සමූහයේ මූල්‍ය වාර්තා සත්‍ය හා සාධාරණ බවට ප්‍රධාන මූල්‍ය නිලධාරී හා මහා කළමනාකාරතුමන් විසින් සහතික කරයි. සියළු මූල්‍ය වාර්තා ප්‍රසිද්ධ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට පෙර විගණන කමිටුව මඟින් සමාලෝචනය කර අනුමැතිය සඳහා නිර්දේශ කරයි. අනුකූලතා අනාවරණ අවශ්‍යතා සපුරාලීම සඳහා පහත ප්‍රකාශන වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇත. බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව පිටු අංක 218 සිට 223 දක්වා ඇත. මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර යහපාලනය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව පිටු අංක 226 සහ 227 දක්වා ඇත. මූල්‍ය සමාලෝචනය යටතේ කළමනාකරණ සාකච්ඡා හා විශ්ලේෂණ පිටු අංක 108 සිට 114 දක්වා ඇත. ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම හා ඔවුන්ට සම්බන්ධිත පාර්ශ්ව මඟින් කළ ගනුදෙනු පිළිබඳ සාරාංශය පිටු අංක 367 සහ 373 දක්වා ඇත. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිටු අංක 229 හි දක්වා ඇත. විගණකාධිපති වාර්තාව පිටු අංක 230 සිට 234 දක්වා ඇත. පිටු අංක 108 සිට 114 දක්වා මූල්‍ය සමාලෝචනය යටතේ කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය.

සංග්‍රහයේ සඳහන් කර ඇති වගන්තිය	අනුකූල වීමේ මට්ටම
ඇ.2.	අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ කොටස් හිමියාගේ ආයෝජන සහ බැංකුවේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා අභ්‍යන්තර යහපාලන ක්‍රියාවලියක් පවතී. බැංකුවේ උපායමාර්ගික අරමුණු ළඟා කර ගැනීමට යාමේදී ඇතිවිය හැකි ප්‍රධාන අවදානම් වල ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ. බැංකුවේ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මඟින් බැංකුවේ පැවැත්ම, අවදානම් කළමනාකරණ වැඩසටහන් වල මෙහෙයුම් හා කාර්යක්ෂමතාවය, බැංකුවට බලපෑ හැකි විවිධ අවදානම් වළක්වා ගැනීම සඳහා ඇති ප්‍රතිපත්ති හා භාවිතයන් ද ඊට අදාළ අනුකූලතා පිළිබඳ විස්තරද සපයමින් අධ්‍යක්ෂ මණ්ඩලයට පහසුකම් සලසයි. බැංකුවේ උපායමාර්ගික, මෙහෙයුම් සහ මූල්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී එහි සඵලතාවය සහතික කිරීම සඳහා පැහැදිලි වගකීම් පැවරීමකින් යුතුව අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අවදානම් කළමනාකරණ රාමුවක් ඇත. බැංකුවේ අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර යහපාලන පද්ධති සුපරීක්ෂණය සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හා විගණන කමිටුව පත් කර ඇති අතර එම කමිටු වල කාර්යක්ෂමතාව වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කෙරේ. බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුවේ අභ්‍යන්තර යහපාලන පද්ධතියේ මෙහෙයුම් කටයුතු, මූල්‍ය හා අනුකූලතා කටයුතු නිවැරදිව හැසිරවීම විගණන කමිටුවේ තවත් වගකීමක් වේ. බැංකුව සතුව සියළු අංශ වලින් පරිපූර්ණ වූ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවක් ඇති අතර එමඟින් අභ්‍යන්තර විගණන කටයුතු පරීක්ෂාවට ලක් වේ. බැංකුවේ බාහිර විගණක ලෙස විගණකාධිපති කටයුතු කරයි. වාර්ෂික විගණන කටයුතු ජාතික විගණන කාර්යාලය විසින් හෝ විගණකාධිපතිගේ අධීක්ෂණය යටතේ පත් කරන ලද සුදුසුකම්ලත් බාහිර ස්වාධීන විගණකවරුන් විසින් සිදු කරයි.
3(6) වගන්තිය බැංකුකරණය ඇ.3.	**විගණන කමිටුව** සමාලෝචිත වසර තුළ බැංකුවේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් පමණක් සමන්විත විය. එම වසර තුළ විගණන කමිටුවේ සභාපතිධූරය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විසින් හෙබවීය. විගණන කමිටුවේ සභාපති ඇතුළු සාමාජිකයන් මූල්‍ය වාර්තාකරණය හා මූල්‍ය තත්ත්ව පාලනය පිළිබඳ මනා දැනුමකින් හා අත්දැකීම් වලින් පරිපූර්ණ අය වේ. වසර තුළදී විගණන කමිටුවේ සංයුතියේ සිදු වූ වෙනස්වීම් පිටු අංක 180 සහ 181 හි දක්වා ඇති විගණන කමිටු වාර්තාවේ සඳහන් කර ඇත. අධීක්ෂණ වගකීම් ඉටුකිරීමේදී විගණන කමිටුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.
	විගණන කමිටුව විසින් අවදානම් කළමනාකරණය පිළිබඳ ක්‍රියාකාරිත්වය හා කාර්යක්ෂමතාවයන් පිළිබඳ සමාලෝචන පැවැත්වීම, අභ්‍යන්තර විගණනය හා විගණන වාර්තා කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. විගණන කමිටුවේ කාර්යභාරය හා වගකීම් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 180 සහ 181 දක්වා ඇති විගණන කමිටු වාර්තාවේ හෙළිදරව් කර ඇත. විගණන කමිටුව සඳහා ලිඛිත නියමයන් නියම කර ඇති අතර එහි භූමිකාව සහ වගකීම් පැහැදිලිව නිර්වචනය කරයි. එමෙන්ම එය වර්ෂය තුළ සමාලෝචනය කරන ලදී. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කමිටුව විසින් සිදු කරන ලද කාර්යයන් මෙම වාර්තාවේ පිටු අංක 180 සහ 181 හි සඳහන් කර ඇත.
ඇ.4.	**ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව** ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අවදානම් සංස්කෘතිය, අවදානම් අභිරුචිය, අවදානම් හඳුනාගැනීම සහ වර්ගීකරණය, ශ්‍රේණිගත කිරීම සහ අවදානම් කළමනාකරණය අධීක්ෂණය කරයි. කමිටුවේ සංයුතිය සහ වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් 182 සහ 183 පිටුවල දක්වා ඇත.
ඇ.5.	**සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු** සම්බන්ධිත පාර්ශ්ව, ඔවුන්ගේ ගනුදෙනු හා සම්බන්ධිත පාර්ශ්වයන්ට වඩා වාසිදායක සැලකිල්ලක් පිරිනැමීම සීමා කිරීම ආවරණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් ඇති අතර, එහි අරමුණ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් තීරණ ගැනීමේදී අනවශ්‍ය ලෙස බලපෑම් කිරීමට ඇති බැඳියාව වලක්වාලීමයි. අලුතින් පිහිටුවන ලද සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන උපකමිටුව, අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් (3) සමන්විත වන අතර, ඉන් දෙදෙනෙකු කොළඹ කොටස් හුවමාරු නීති මගින් අර්ථ දක්වා ඇති පරිදි ස්වාධීන අධ්‍යක්ෂවරුන් වේ. 2025 වසර තුළ රැස්වීම් පහක් පවත්වන ලදී, ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම් හා ඔවුන්ගේ ආසන්න පවුලේ සාමාජිකයන් විසින් සිදුකළ ගනුදෙනු පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් ප්‍රකාශයේ පිටු අංක 190 තුළ ඇතුළත් වේ.
ඇ.6.	**ව්‍යාපාර හැසිරවීම හා ආචාරධර්ම සංග්‍රහය** අදාළ නියාමනයන් හා ප්‍රතිපත්ති වලට අනුකූල වීම සඳහා බැංකුව විසින් එහි සේවකයන්ට හා අධ්‍යක්ෂ මණ්ඩලයට වෙන වෙනම ආචාරධර්ම සංග්‍රහයන් පවත්වා ගෙන යන අතර ඒවා පිළිගැනීම සඳහා ප්‍රතිඥා ලබාදේ. නීතිවිරෝධී සහ වංචා වාර්තාවීම් කඩිනමින් වාර්තා කිරීමට හැකිවන පරිදි විසිල්බ්ලෝවිං ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ. මෙම ප්‍රතිපත්ති වර්ෂය තුළ දී සමාලෝචනය කරන ලදී.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2023 සංග්‍රහයට අනුකූලතා

සංග්‍රහයේ සඳහන් කර ඇති වගන්තිය	අනුකූල වීමේ මට්ටම
ඈ.7.	**ආයතනික යහපාලන අනාවරණය** 162 සිට 179 දක්වා පිටුවල දැක්වෙන ආයතනික යහපාලන වාර්තාව, බැංකුව ආයතනික යහපාලන මූලධර්ම සහ භාවිතයන්ට කොතරම් අනුගත වේද යන්න හෙළි කරයි. ආයතනික යහපාලන පිළිබඳ හොඳම පිළිවෙත් සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූල වීම මෙම වාර්තාවේ දක්වා ඇත.
ඉ	**කොටස් හිමිකාරිත්වය**
ඉ.1. සහ ඉ.2.	බැංකුවේ එකම කොටස් හිමියා ශ්‍රී ලංකා රජයයි
ඊ	**අන්තර්ජාලය හා සයිබර් අවකාශයේ සුරක්ෂිතතාව** බැංකුවේ ව්‍යාපාර ක්‍රමවේදය පවත්වා ගැනීමට භාවිතා වන තොරතුරු තාක්ෂණික මෙවලම් හරහා බැංකු පරිසරය තුළ හා ඉන් පිටත හුවමාරුවීම හේතු කොටගෙන බැංකුවට බලපෑ හැකි සයිබර් අවකාශ අවදානම හඳුනා ගැනීමේ ක්‍රියාපිලිවෙලක් බැංකුව සතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලත් තොරතුරු සුරක්ෂණ ප්‍රතිපත්තිය, කළමනාකාරිත්වයට බැංකුවේ තොරතුරු සුරක්ෂිතභාවය තහවුරු කරලීමට අවශ්‍ය දිශානතිය සපයයි. මීට අමතරව, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මඟින් බැංකුව, සයිබර් අවකාශ අවදානම් වලින් මිදීමට නිර්දේශිත පිළිවෙත් අනුගමනය කරන බවට සහතික වේ. සයිබර් අවකාශ අවදානම් වලින් ආරක්ෂා වීමට හා තත්ත්වය සමනය කිරීමට බැංකුව භාවිතා කරන ක්‍රියා පිලිවෙත් මෙම වාර්ෂික වාර්තාවේ අවදානම් කළමනාකරණ වාර්තාවේ පිටු අංක 182 සිට 183 තෙක් දක්වා ඇත. සයිබර් අවකාශීය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම උදෙසා බැංකුව විසින් ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරියෙකු පත්කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව අධ්‍යක්ෂවරුන් හට බැංකුවට අදාළව තොරතුරු තාක්ෂණය සම්බන්ධ කාර්යයන්ට අදාළ තීරණ ගැනීමේදී හා අධීක්ෂණ කටයුතු වලදී මනා පිටුවහලක් වේ.
උ	තිරසාරත්වය: පරිසරය, සමාජීය සහ යහපාලන අවදානම සහ අවස්ථා මෙම ක්ෂේත්‍රය වඩා හොඳින් කළමනාකරණය කිරීම සඳහා තිරසාර කමිටුවක් දැන් පිහිටුවා ඇත. පරිසරය, සමාජීය සහ යහපාලන ආශ්‍රිත හෙළිදරව් කිරීම් මෙම වාර්ෂික වාර්තාවේ 75 සිට 84 දක්වා පිටුවල දක්වා ඇත.
ඌ	**ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම**
ඌ.1. ඌ.2.	පහත සඳහන් ක්ෂේත්‍ර වලට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක විය. (අ) අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ කරුණු (ආ) අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු (ඇ) ආයතනික යහපාලනය, නාමයෝජනා සහ නැවත පත්වීම (ඈ) පාරිශ්‍රමික (ඉ) ආයතනයේ ලැයිස්තුගත සුරැකුම්පත්වල වෙළඳාම් කිරීමේ ප්‍රතිපත්ති ඇතුළුව සියලුම අධ්‍යක්ෂවරුන් සහ සේවකයින් සඳහා අභ්‍යන්තර ව්‍යාපාරික හැසිරීම් සංග්‍රහය සහ ආචාරධර්ම (ඊ) අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර යහපාලනය (උ) කොටස් හිමියන් සහ ආයෝජකයින් සමඟ සබඳතා (ඌ) පාරිසරික, සමාජීය සහ යහපාලන තිරසාරත්වය (එ) සමාගම් වත්කම් සහ කොටස් හිමියාගේ ආයෝජන, යහපාලනය සහ කළමනාකරණය (ඒ) ආයතනික හෙළිදරව් කිරීම් (ඔ) විසිල්බ්ලෝවිං (ඕ) අල්ලස් හා දූෂණ විරෝධී

2024 අංක 5 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර	අනුකූලතාවය
1.1	**අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්**	
	පහත සඳහන් දෑ ක්‍රියාත්මක කිරීම සහතික කිරීමෙන් බැංකුවේ ආරක්ෂාව සහ අබණ්ඩතාව ශක්තිමත් කිරීමේ අරමුණින් අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවට "සැලකිලිමත් වීමේ වගකීම" සහ "පක්ෂපාතීත්වයේ වගකීම" ඉටු කළ යුතුය:	
	(අ) බැංකුවේ දිගුකාලීන ඉලක්ක අනුව උපායමාර්ගික අරමුණු හා ආයතනික වටිනාකම් අනුමත කිරීම හා අධීක්ෂණය කිරීමත් ඒවා බැංකුව තුළ සන්නිවේදනය වන බවත් සහතික කිරීම. උපායමාර්ගික අරමුණු සකස් කිරීම සහ ආයතනික වටිනාකම් සමාලෝචනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ඉහළ කළමනාකාරිත්වයේ සහභාගිත්වය ඇතුව සිදු කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ගික සැලැස්ම සහ ආයතනික වටිනාකම් පිළිබඳව ශාඛා මට්ටමේ සේවකයින් ඇතුළුව සියලු කාර්ය මණ්ඩලයට සන්නිවේදනය කිරීම සිදු කරන ලදී. උපායමාර්ගික සැලැස්ම දියත් කිරීම බැංකුවෙන් පරිබාහිර ස්ථානයකදී සිදු කරන ලද අතර 2026-2030 සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ උපායමාර්ගික සැලැස්ම සහ 2026 වසරේ අය වැය ද පිළියෙල කර ඇත. තවද, ආයතනික වටිනාකම් සියලුම සේවකයින්ට බැංකුවේ අන්තර් ජාලය හරහා සන්නිවේදනය කර ඇත.	✓
	(ආ) අඩුම වශයෙන් ඊළඟ වසර තුන සඳහා සමස්ථ අවදානම් ප්‍රතිපත්තිය හා අවදානම් කළමනාකරණ පටිපාටීන් සහ මැනිය හැකි අරමුණු සහිත යාන්ත්‍රණයන් ඇතුළත් බැංකුවේ සමස්ථ වෙළඳ කටයුතු පිළිබඳව උපායමාර්ග අනුමත කිරීම. බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපායමාර්ග ඇතුලත් වසරක් පාසා සංශෝධනය වන, ආයතනික සැලැස්ම හා ඊට සමගාමී ක්‍රියාකාරී සැලැස්ම වසර පහක කාලයක් සඳහා සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. බැංකුව සඳහා සමස්තයක් ලෙස නියම කර ඇති මැනිය හැකි ඉලක්කයන්ට අනුකූලව අවදානම් අභිරුචිය, ප්‍රතිපත්තිය, කළමනාකරණ රාමුව සහ යාන්ත්‍රණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. සමස්ථ බැංකුවට මැනිය හැකි ඉලක්ක පිහිටුවා ඇති අතර, එම ඉලක්කයන් මත පදනම්ව කාර්යඵලයන් ඇගයීම සිදු කරයි.	✓
	(ඇ) ශක්තිමත් අවදානම් පාලන සංස්කෘතියක් ඇති කිරීම; (i). ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම හා විචක්ෂණ ලෙස අවදානම් කළමනාකරණය කිරීම සඳහා යෝග්‍ය පද්ධති ක්‍රියාත්මක කිරීම සහතික කිරීම. 2025 වසර තුළ, බැංකුව මෙම නියෝගයට පූර්ණ අනුකූලතාවයකින් යුතුව ශක්තිමත් අවදානම් හඳුනාගැනීමේ සහ කළමනාකරණ රාමුවක් පවත්වා ගෙන ගියේය. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) හරහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර තක්සේරු කිරීම්, බාහිර ආර්ථික සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රවණතා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) නියාමන යාවත්කාලීන කිරීම් මගින් දැනුම් දෙන ලද ණය, වෙළඳපල, මෙහෙයුම්, ද්‍රවශීලතාවය, සයිබර්, සමාජ-පාරිසරික සහ කිර්තිනාම අවදානම් ඇතුළු ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම සඳහා කාර්තුමය සමාලෝචන සිදු කරන ලදී. මෙම ක්‍රියාවලිය ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) සමඟ එක්ව සහයෝගයෙන් සිදු කළ අතර, එය සම්භාවිතාව සහ බලපෑම මත පදනම්ව ප්‍රමුඛතාවය දිය යුතු අවදානම් හඳුනා ගැනීම සඳහා ආතති පරීක්ෂණ ආකෘති සහ අවස්ථා විශ්ලේෂණය වැනි උසස් මෙවලම් භාවිතා කළේය. විචක්ෂණශීලී කළමනාකරණය සහතික කිරීම සඳහා, බැංකුව ඒකාබද්ධ අවදානම් කළමනාකරණ පද්ධතිය ඇතුළු වැඩිදියුණු කළ පද්ධති භාවිතා කළේය, මෙම ඒකාබද්ධ අවදානම් කළමනාකරණ පද්ධතිය අවදානම් විශ්ලේෂණය සහ අධීක්ෂණය සඳහා බැංකුවේ මූලික පද්ධති සමඟ ඒකාබද්ධ වූ වේදිකාවකි. ප්‍රධාන මූලපිරීම් වශයෙන් බැංකුවේ සේවකයින්ට අඛණ්ඩව අවදානම් පුහුණුව ලබා දුන් අතර ඉහළ යන ඩිජිටල් තර්ජන මධ්‍යයේ බැංකුවේ සයිබර් ආරක්ෂණ ශක්තිමත් කිරීම සඳහා සැලකිය යුතු ආයෝජන සිදු කරන ලදී. අවදානම් සම්බන්ධ සියළුම පැතිකඩ ආවරණය කරන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ සංශෝධිත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. පහත වාර්තා මඟින් මේ පිළිබඳ වැඩිදුර තොරතුරු සපයනු ලැබේ: • පිටු 191 සිට 216 දක්වා අවදානම් කළමනාකරණ වාර්තාව • පිටු 182 සහ පිටු 183 දක්වා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව (ii). බැංකුවේ ත්‍රිත්ව ආරක්ෂණ යාන්ත්‍රණය සඳහා හොඳින් අර්ථ දක්වා ඇති ආයතනික වගකීම් ස්ථාපිත කිරීම, එනම් අ. ව්‍යාපාරික අංශ ව්‍යාපාර ඒකක ඔවුන්ගේ ක්‍රියාකාරකම් වලින් පැන නඟින අවදානම් හඳුනා ගැනීම, හිමිකාරිත්වය දැරීම සහ කළමනාකරණය කිරීම, ඵලදායී මෙහෙයුම් පාලනයන් පවත්වා ගැනීම සහ අනුමත ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ පවරන ලද අධිකාරීන් සමඟ එදිනෙදා අනුකූලතාවය සහතික කිරීම සඳහා ප්‍රධාන වශයෙන් වගකිව යුතුය. ආ. පළමු සහ තෙවන ආරක්ෂණ පෙළ වලින් ස්වාධීන වන අවදානම් කළමනාකරණ කාර්යය සහ අනුකූලතා කාර්යය, සහ, අවදානම් කළමනාකරණය සහ අනුකූලතා කාර්යයන් පළමු සහ තෙවන ආරක්ෂණ පෙළ වලින් ස්වාධීනව ක්‍රියාත්මක වන අතර අවදානම් කළමනාකරණය සහ අනුකූලතා රාමු සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම, නියාමන සහ අභ්‍යන්තර අවශ්‍යතා වලට අනුකූල වීම නිරීක්ෂණය කිරීම, ස්වාධීන සමාලෝචන පැවැත්වීම සහ අවදානම් සහ අනුකූලතා කරුණු සම්බන්ධයෙන් කළමනාකරණයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම මඟින් අධීක්ෂණය සපයයි.	✓
	ඇ. පළමු සහ දෙවන ආරක්ෂණ පෙළ වලින් ස්වාධීන වන අභ්‍යන්තර විගණන කාර්යය. අභ්‍යන්තර විගණනය පළමු සහ දෙවන ආරක්ෂක පෙළ වලින් ස්වාධීනව ක්‍රියාත්මක වන අතර අවදානම් මත පදනම් වූ විගණන, විගණන නිරීක්ෂණ වාර්තා කිරීම සහ එකඟ වූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ පසු විපරම් හරහා යහපාලනය, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව සහ කාර්යක්ෂමතාව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට සහ කළමනාකාරිත්වයට අරමුණු සහගත සහතිකයක් සපයයි.	

2024 අංක 05 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර	අනුකූලතාවය
	(iii). අවදානම් කළමනාකරණය, අනුකූලතාවය සහ අභ්‍යන්තර විගණන කාර්යයන් නිසි ලෙස ස්ථානගත කර ඇති බවත්, ස්වාධීනව, අරමුණු සහගත සහ ඵලදායී ලෙස වගකීම් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සහ සම්පත් ඇති බවත් සහතික කිරීම. අවදානම් කළමනාකරණය, අනුකූලතාවය සහ අභ්‍යන්තර විගණන කාර්යයන් පිළිබඳ වගකීම් පිළිවෙලින් II, III සහ IV උපලේඛනවල දක්වා ඇත; මෙම කාර්යයන් ස්වාධීන ඒකක ලෙස ස්ථාපිත කිරීම මගින් බැංකුව මෙම අවශ්‍යතාවයට සම්පූර්ණයෙන්ම අනුකූල වී ඇති අතර, ත්‍රිත්ව ආරක්ෂණ යාන්ත්‍රණයට අනුව ව්‍යාපාරික අංශ වලින් වෙන්වීම සහතික කරමින් අවදානම් සහ අනුකූලතා සෘජුවම ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) වෙත සහ විගණනය විගණන කමිටුව (AC) වෙත වාර්තා කරනු ලැබේ. අවදානම් කළමනාකරණ කාර්යය මෙහෙයවනු ලබන්නේ පුළුල් බැංකු අත්දැකීම් සහ විශේෂඥතාවක් ඇති ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) විසින් වන අතර, අවදානම් වෘත්තිකයන් කණ්ඩායමක සහාය ද ඇත. අනුකූලතා කාර්යය ප්‍රධාන අනුකූලතා නිලධාරී (CCO) විසින් මෙහෙයවනු ලබන අතර බැංකුවේ සියලුම මෙහෙයුම් මට්ටම් වලින් ස්වාධීනව ක්‍රියාත්මක වන අතර ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සෘජුවම වාර්තා කරයි. අදාළ වන සියලුම නීති රීති සහ රෙගුලාසි පිළිපැදීම සහතික කිරීම මගින් අනුකූලතා අවදානම් කල්තියා හඳුනා ගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය කිරීම සහ අවම කිරීම මෙම තීරණය මගින් සිදු කෙරේ. අභ්‍යන්තර විගණන කාර්යය, පාලන ඇගයීම සහ වංචා අනාවරණය කිරීම සඳහා වූ විශේෂිත විගණන සඳහා බාහිර උපදේශකයින්ගේ සේවා ලබා ගැනීමෙන් වැඩි දියුණු කරනු ලැබේ, විගණන 1,895 ක් සිදු කර ඇති අතර, එය මෙහෙයුම් වලින් 80% ක් ආවරණය කරයි, සාමාන්‍යයෙන් දින 90 ක් ඇතුළත සොයාගැනීම් ආමන්ත්‍රණය කර ඇත. සමස්තයක් වශයෙන්, මෙම කාර්යයන් සඳහා ප්‍රමාණවත් ලෙස සම්පත් සපයා ඇති අතර නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය සමඟ ස්වාධීනව ක්‍රියාත්මක වේ.	✓
	(iv). බැංකුවේ උපායමාර්ගික, ප්‍රාග්ධන සහ මූල්‍ය සැලසුම් සමඟ සමපාත වන පරිදි බැංකුවේ අවදානම් අභිරුචිය නිර්වචනය කිරීම සහ අවදානම් අභිරුචිය ප්‍රකාශ කිරීම. 2025 වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ අවදානම් අභිරුචිය ප්‍රකාශය (RAS) අනුමත කර සමාලෝචනය කරන ලද අතර, එමඟින් තිරසාර වර්ධනය, ඩිජිටල් පරිවර්තනය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ පෞද්ගලික අංශයේ ණය දීම කෙරෙහි අවධානය යොමු කරන උපායමාර්ගික සැලැස්මට අනුකූල වීම සහතික කරන ලදී. ඉලක්කගත කොටස් සහ මූල්‍ය අනුපාත සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රාග්ධන සැලසුම් සමඟ ඒකාබද්ධ කර ඇති උපරිම අක්‍රිය ණය අනුපාතය, ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (CAR) ඇතුළු සියලු අවදානම් ආවරණය කරමින් සෘජු ප්‍රමාණාත්මක සීමාවන් සහ ගුණාත්මක නිර්ණායක නිර්වචනය කරන ලදී. ක්‍රියාත්මක කිරීම සඳහා උපකරණ පුවරු සහ ප්‍රධාන අවදානම් දර්ශක (KRIs) හරහා RAS දෙපාර්තමේන්තු වල පෙන්නුම් කළ අතර, IRMC විසින් මාසිකව/ කාර්තුමය වශයෙන් නිරීක්ෂණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ අවදානම් නිරාවරණයන් වළක්වා ගැනීමට සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය 16.89% ක පවත්වා ගනිමින් 9.7% ක වත්කම් වර්ධනයක් සඳහා සහාය වූ විවේකණශීලී කළඹ ගැලපීම් සිදු විය.	✓
	(v). අධික අවදානම් ගැනීම සඳහා විනය ක්‍රියාමාර්ග, වාර්තා කිරීමේ ක්‍රියා පටිපාටි සහ අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දීම ඇතුළුව ප්‍රකාශිත අවදානම් අභිරුචිය සීමාවන් උල්ලංඝනය කළ විට ගත යුතු ක්‍රියාමාර්ග ගෙනහැර දැක්වීම. බැංකුවේ අවදානම් ප්‍රකාශන උල්ලංඝනය කිරීම් කාලෝචිත ක්‍රියාමාර්ග සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිසි ලෙස වාර්තා කරනු ලැබේ. ආචාරධර්ම සංග්‍රහයට අනුව, මෙම ක්‍රියාමාර්ග, කළඹ නැවත සමතුලිත කිරීම වැනි නිවැරදි කිරීමේ පියවරවල සිට කාර්යසාධන අඩු කිරීම් හෝ හිතාමතා අධික අවදානම් ගැනීම සඳහා විනය පියවර දක්වා විහිදේ. 2025 වර්ෂය තුළ ප්‍රධාන උල්ලංඝනයන් කිසිවක් වාර්තා වී නොමැත.	✓
(අ)	තැන්පත්කරුවන්ගේ, ණයහිමියන්ගේ සහ සමස්තයක් වශයෙන් බැංකුවේ අවශ්‍යතාවන්ට අහිතකර හෝ අගතිගාමී වන ආකාරයෙන් අධ්‍යක්ෂවරයෙකු හෝ අධ්‍යක්ෂ කණ්ඩායමකින් අධ්‍යක්ෂ මණ්ඩලය ආධිපත්‍යය දැරීම හෝ සැලකිය යුතු ලෙස බලපෑම් නොකිරීම සහතික කිරීම සඳහා ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම; අදාළ පාලන ආරක්ෂණ ක්‍රම අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ පුළුල් ලෙස දක්වා ඇති අතර, එමඟින් සභාපතිවරයාගේ භූමිකාව සහ වගකීම්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කළමනාකරණයේ අදාළ භූමිකාවන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන්, කළමනාකරණයට පවරා ඇති බලතල, වගවීම සහ වාර්තාකරණය, සාමාන්‍යාධිකාරිවරයාගේ වගකීම් සහ ඇගයීමට අදාළ විධිවිධාන ආදිය හරහා සමබර තීරණ ගැනීම සහ ස්වාධීන විනිශ්චය සඳහා පැහැදිලි රාමුවක් සපයයි. සාමූහිකව, මෙම විධිවිධාන ඵලදායී අධීක්ෂණයට සහාය වන අතර අනවශ්‍ය බලපෑම් වැළැක්වීම සහ තැන්පත්කරුවන්, ණයහිමියන් සහ බැංකුව ආරක්ෂා කරනු ලැබේ.	✓
(ඉ)	නියාමකයින්, තැන්පත්කරුවන්, ණයහිමියන්, කොටස්කරුවන් සහ ණයගැතියන් ඇතුළු උනන්දුවක් දක්වන සියළුම පාර්ශ්වයන් සමඟ සන්නිවේදනය කිරීම සඳහා වූ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අනුමත කිරීම; සියලුම පාර්ශ්වකරුවන් සමඟ අන්තර් ක්‍රියා කිරීම සඳහා මාර්ගෝපදේශ සපයන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සන්නිවේදන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර ඇත.	✓
(ඊ)	බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රම සහ කළමනාකරණ තොරතුරු පද්ධතීන්හි ප්‍රමාණාත්මකභාවය සහ විශ්වසනීයත්වය විමර්ශනය කිරීම. අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරන විගණන කමිටුවට, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත්භාවය සහ අඛණ්ඩතාව සමාලෝචනය කිරීමේ වගකීම පැවරී ඇත. මෙම වගකීම ඉටු කිරීමේදී, කමිටුව අභ්‍යන්තර විගණන අංශයෙන් සෘජුවම ලැබෙන වාර්තා මෙන්ම බාහිර විගණකවරුන්ගේ වාර්තා ඇගයීමට ලක් කරයි, අභ්‍යන්තර පාලන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමේ උත්සාහයේ කොටසක් ලෙස, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව නිතිපතා නියාමන සොයාගැනීම් නිරීක්ෂණය කර පසු විපරම් කරයි. කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායීත්වය පිළිබඳ ස්වාධීන සහ විෂයානුබද්ධ සහතිකයක් ලබා දීම සඳහා තොරතුරු පද්ධති විගණන පැවැත්වීම සඳහා අභ්‍යන්තර විගණන අංශය අතිරේකව වගකිව යුතුය. මෙම ක්‍රියාවලිය හරහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළමනාකරණ තොරතුරු පද්ධතියේ සහ සමස්ත අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සමාලෝචනය කර තක්සේරු කර ඇත.	✓

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර	අනුකූලතාවය
	(උ) සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් කළමනාකරණය කිරීම සඳහා සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු වලින් ඇතිවිය හැකි සම්බන්ධිත පාර්ශ්වයන්ට වඩා වාසිදායක සැලකිල්ලක් පිරිනැමීම සීමා කිරීම සහතික කිරීම සඳහා ඵලදායී පාලන පද්ධති ක්‍රියාත්මක කිරීම වසර තුළ, සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් කළමනාකරණය කිරීම සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු වලින් සම්බන්ධිත පාර්ශ්වයන්ට වඩා වාසිදායක සැලකිල්ලක් පිරිනැමීම වැළැක්වීම සඳහා බැංකුව එහි පාලන රාමුව ශක්තිමත් කළේය. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව වසර තුළ රැස්වීම් පහක් පවත්වන ලදී.	✓
	(ඌ) ඕනෑම බාධාකාරී සිදුවීමකදී මූල්‍ය ස්ථායිතාව, මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව සහ මූලික බැංකු පද්ධති ඇතුළු තීරණාත්මක මෙහෙයුම් සහ සේවාවන් සංරක්ෂණය කිරීම සඳහා ව්‍යාපාර අඛණ්ඩතාව සහ ආපදා ප්‍රකෘතිකරණ සැලසුම් අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම; 2025 දී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂික සමාලෝචන හරහා අධීක්ෂණයක් සහිතව යාවත්කාලීන කරන ලද ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම (BCP) සහ ආපදා ප්‍රකෘතිකරණ සැලැස්ම (DRP) අනුමත කරන ලදී. මෙම සැලසුම් මූලික බැංකු පද්ධති, ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර ජාල සහ ඩිජිටල් නාලිකා ප්‍රමුඛත්වය දෙමින් ස්වාභාවික විපත්, සයිබර් තර්ජන සහ වසංගත ආවරණය කරන ලදී. ප්‍රධාන අංග අතරට බාහිර ස්ථානයක අතිරික්ත දත්ත මධ්‍යස්ථාන ඇතුළත් වූ අතර, ප්‍රකෘතිකරණ කාල අරමුණු (RTO) පැය 2 ට අඩු සහ ප්‍රකෘතිකරණ ලක්ෂ්‍ය අරමුණු (RPO) පැය 0 ට අඩු හෝ ආසන්න වශයෙන් ඇතුළත් විය. දේශගුණික අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ ව්‍යාපාර අඛණ්ඩතාව සහ ඔරොත්තු දීමේ හැකියාව සහතික කරමින්, විගණනය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපෝෂණ මගින් වලංගු කරන ලද පූර්ණ පරිමාණ අභ්‍යාසය 2025 වසර තුළ සාර්ථකව නිම කරන ලදී.	✓
	(ඒ) වේතනය අධීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම ඇතුළුව වේතනය සඳහා වන ප්‍රවේශය අධීක්ෂණය කිරීම සහ බැංකුවේ අවදානම් සංස්කෘතිය සහ අවදානම් අභිරුචිය සමඟ වේතනය පෙළගැස්වීම සහතික කිරීම. වසර තුළ, බැංකුවේ වේතන රාමුව අධීක්ෂණය කිරීම හරහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වැටුප් පිළිවෙත් බැංකුවේ අවදානම් සංස්කෘතියට සහ අවදානම් රුචිකත්වයට අනුකූලව පවතින බවත්, අධික අවදානම් ගැනීම දිරිමත් නොකරන බවත් සහතික කරන ලදී. මෙම රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමේ දී, බැංකුව ප්‍රතිලාභ ආපසු අයකර ගැනීමේ ක්ලෝබැක් ප්‍රතිපත්තියක් හඳුන්වා දුන් අතර, එමඟින් අවශ්‍ය විට විචල්‍ය වේතන අයකර ගැනීමට හැකි වූ අතර, එමඟින් ආයතනය පුරා වගවීම සහ විචක්ෂණශීලී අවදානම් ගැනීම ශක්තිමත් විය. ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා වේතන විධිවිධාන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වේතන ප්‍රතිපත්තියක් හරහා පාලනය වන අතර, අනෙකුත් සේවකයින් සඳහා වේතන පරිපාලනය කරනු ලබන්නේ සාමූහික ගිවිසුමක් යටතේ වන අතර එය සෑම වසර තුනකට වරක් සමාලෝචනය කර සංශෝධනය කෙරේ.	✓
	(ඓ) ප්‍රධාන ආයතනික කළමනාකරණ පිරිස් පහත සඳහන් තනතුරු දරයි; (i). ප්‍රතිපත්ති කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කිරීම, (ii). සෘජු ක්‍රියාකාරකම්, සහ, (iii). ව්‍යාපාර ක්‍රියාකාරකම්, මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණය පාලනය කිරීම. සහකාර මහා කළමනාකරණ ශ්‍රේණි වලට අයත් නිලධාරීන් හා සමාන ශ්‍රේණි වලට අයත් නිලධාරීන් බැංකුවේ ආයතනික යහපාලන අරමුණු යටතේ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් ලෙස බැංකුව හඳුනාගෙන තිබේ.	✓
	(ඔ) අධ්‍යක්ෂ මණ්ඩලයට, ප්‍රධාන විධායක නිලධාරියාට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අයත් අධිකාරී බල ක්ෂේත්‍රය හා ප්‍රධාන වගකීම් නිර්වචනය කිරීම. අධ්‍යක්ෂ මණ්ඩලයේ අධිකාරී බලතල හා වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි ද ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ අධිකාරී බලතල හා වගකීම් රැකියා විස්තරයෙහි ද පිළිවෙලින් අර්ථ දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය ක්‍රියාත්මක වේ.	✓
	(ඕ) අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ග සහ ප්‍රතිපත්ති වලට අනුකූලව ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන ආයතනික කළමනාකරණ නිලධාරීන් විසින් බැංකුවේ කටයුතු යෝග්‍ය ආකාරයෙන් අධීක්ෂණය කරනු ලබන බවට සහතික කිරීම. ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව, බැංකුවේ උපායමාර්ගික සැලැස්මට එරෙහිව කාර්යසාධනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබේ. මහා කළමනාකරු සහ ප්‍රධාන ආයතනික කළමනාකරණ පිරිස් විසින් තමන්ගේ විෂය පථයට අදාළ කරුණු සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම් සිදු කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ විෂය පථයට අදාළව කරුණු පැහැදිලි කිරීම් වලටද කැඳවනු ලැබේ.	✓
	(ක) පහත සඳහන් දේ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ යහපාලන පරිචයන්හි ඵලදායීතාවය කලින් කලට තක්සේරු කිරීම. (i). අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරා ගැනීම, නම් කිරීම සහ තේරී පත්වීම (ii). බැඳියාවන් අතර ගැටුම් කළමනාකරණය කිරීම සහ (iii). දුර්වලතාවයන් නිශ්චය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හි දී වැඩිදියුණු කිරීම් සිදුකිරීම. අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය යහපාලන භාවිතයන් පිළිබඳ ස්වයං ඇගයීමක් අර්ධ වාර්ෂිකව සිදු කරනු ලැබේ. වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන ඒවා පසු විපරම් කරමින් පවතී. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත බැඳියාව මත ගැටුම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ.	✓

2024 අංක 05 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර	අනුකූලතාවය
	(ග) සෑම අධ්‍යක්ෂවරයෙකු විසින්ම වාර්ෂිකව සිදු කළ යුතු ස්වයං තක්සේරුව සඳහා වන නිර්ණායක අනුමත කර එවැනි තක්සේරු කිරීම් පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම. වැඩිදියුණු කළ පාලන පිළිවෙත්වලට අනුකූලව, බැංකුව 2025 වර්ෂයේ සිට අධ්‍යක්ෂ ස්වයං තක්සේරු කිරීම් අර්ධ වාර්ෂිකව සිදු කර ඇති අතර, අනුකූලතාව, සම්පූර්ණ කිරීමේ පහසුව, රහස්‍යභාවය සහ වාර්තා කිරීම සහ පසු විපරම් ක්‍රියාමාර්ග සඳහා තක්සේරු වාර්තා නඩත්තු කිරීම වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාවලිය ඩිජිටල්කරණය කර ඇත.	✓
	(ඝ) නියෝග අංක 6.4.(i) හි දක්වා ඇති පරිදි ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා උචිත අනුප්‍රාප්තික සැලැස්මක් තිබෙන බවට සහතික වීම. ප්‍රධාන විධායක නිලධාරී (මහා කළමණාකරු) සහ අනෙකුත් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් (නියෝජ්‍ය හා සහකාර මහා කළමණාකරුවන්) සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුප්‍රාප්තික සැලසුමක් අනුමත කර ඇති අතර එය නාමයෝජනා සහ යහපාලන කමිටුව විසින් මෙය සමාලෝචනය සහ සංශෝධනය කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි.	✓
	(ඞ) ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග පිහිටුවීම සහ ආයතනික අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ ප්‍රගතිය විමර්ශනය කිරීම යනාදිය සඳහා අවශ්‍යතාවය අනුව නිරන්තරයෙන් මහා කළමණාකරු සහ ප්‍රධාන කළමණාකරණ නිලධාරීන් සමඟ රැස්වීම් පැවැත්වීම. තමන්ගේ විෂය පථයට අදාළව ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම් ක්‍රමානුකූල පදනමින් සිදු කරන අතර, අවශ්‍ය නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට හා උපකමිටු වලට කැඳවනු ලැබේ. උපායමාර්ගික සැලැස්ම මත පදනම්ව ආයතනික පරමාර්ථ වල ප්‍රගතිය අධීක්ෂණය කරනු ලැබේ. උපායමාර්ගික සැලැස්මේ අරමුණු වලට එරෙහිව අර්ධ වාර්ෂික තක්සේරුව වාර්තා කර විස්තරාත්මකව සාකච්ඡා කෙරේ.	✓
	(ඟ) නියාමන පරිසරයේ සිදුවන සැලකිය යුතු වෙනස්කම් පිළිබඳව යාවත්කාලීනව සිටීම සහ නියාමකයින් සමඟ බැංකුව ඵලදායී සම්බන්ධතාවයක් පවත්වා ගන්නා බවට සහතික කිරීම. අධ්‍යක්ෂවරයකු පත් වීමේදී "විද්‍යුත් ආකෘතියෙන් පවතින අධ්‍යක්ෂ මණ්ඩල අත්පොත" සමඟ බැංකුවට අදාළ සියළුම නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ ලිපිගොනුවක් ඔහුට ලබා දේ. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් හරිහැටි ඉටු කිරීම සඳහා ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමට නියාමන පරිසරයේ සිදුවන වෙනස්වීම් පිළිබඳ අධ්‍යක්ෂවරුන් කලින් කලට දැනුවත් කරනු ලැබේ. නියාමක ආයතන වලින් ලැබෙන වැදගත් තොරතුරු එසැනින්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරන අතර ඔවුන් නියාමකයින් විසින් සංවිධානය කරනු ලබන ඕනෑම රැස්වීම්/ පුහුණු සැසි/ වැඩමුළු/ සම්මන්ත්‍රණ සඳහා සහභාගී වේ. බැංකුවේ චෙන්නායි, මාලේ සහ සීෂෙල්ස් ශාඛාවල මෙහෙයුම් කටයුතු වලට සහ ලංකා බැංකුව (යූ කේ) සමාගමට අදාල වන නියාමන අවශ්‍යතා පිළිබඳව ද ශාඛා සහ පරිපාලිත සමාගම්වල කාර්යසාධන වාර්තාව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරනු ලැබේ.	✓
	(ච) බාහිර විගණකයින්ගේ සේවය ලබාගැනීමේදී සහ අධීක්ෂණයේදී නිසි ප්‍රවේශම් සහගත භාවයකින් යුතුව කටයුතු කිරීම. බැංකුව රජය සතු ව්‍යාපාරයක් වන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන්ට අනුව විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වේ.	✓
	(ඡ) වෘත්තීයමය හා සදාචාරාත්මක ආකාරයකින් හැසිරීම සහ බැංකුවේ සේවකයින්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, කොටස්කරුවන් හෝ වෙනත් ඕනෑම උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් දිරි දීමනා, තෑගි හෝ අරමුදල් ඇතුළු කිසිදු අනවශ්‍ය මූල්‍ය හෝ මූල්‍ය නොවන ප්‍රතිලාභ නොලැබීම ; වසර පුරාවට, අධ්‍යක්ෂ මණ්ඩලය වෘත්තීයභාවය සහ සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ඉහළම ප්‍රමිතීන් අඛණ්ඩව පවත්වා ගෙන ගිය අතර, අධ්‍යක්ෂවරුන් සේවකයින්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් හෝ බැංකුවේ වෙනත් ඕනෑම උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් දිරි දීමනා, තෑගි හෝ අරමුදල් ඇතුළු කිසිදු අනවශ්‍ය මූල්‍ය හෝ මූල්‍ය නොවන ප්‍රතිලාභ ඉල්ලා සිටීම හෝ පිළිගැනීම සිදු නොකරන බවට සහතික විය. බැංකුවේ අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්තිය හරහා මෙය ශක්තිමත් කර ඇති අතර එහි තෑගි සහ අනෙකුත් ප්‍රතිලාභ පාලනය කරන නිශ්චිත වගන්ති, පැහැදිලි ප්‍රමිතීන්, හෙළිදරව් කිරීම් සහ අනුමත කිරීමේ අවශ්‍යතා සහ සියලු ගනුදෙනු වලදී අනිසි බලපෑම් වැළැක්වීම සහ අවංකභාවය පවත්වා ගැනීම සඳහා වගන්ති ඇතුළත් වේ.	✓
	(ඣ) බැංකුව පුරා වෘත්තීය, සදාචාරාත්මක සහ විචක්ෂණශීලී හැසිරීම් සඳහා සම්මතයන් ශක්තිමත් කරන හොඳ ආයතනික සංස්කෘතියක් ඇති කිරීම. දත්තවල රහස්‍යභාවය, උනන්දුව පිළිබඳ ගැටුම්, මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ සහ ත්‍යාග සමඟ කටයුතු කිරීමේ ක්‍රියා පටිපාටි, වාර්තා කිරීමේදී අඛණ්ඩතාව සහ ගනුදෙනුකරුවන්ට සාධාරණ ලෙස සැලකීම පිළිබඳ ගැටළු විසඳීම සඳහා අධ්‍යක්ෂවරුන්ගේ සහ සේවකයින්ගේ වෘත්තීමය වශයෙන් සහ සදාචාරාත්මකව පිළිගත හැකි හැසිරීම් පිළිබඳ පැහැදිලි මාර්ගෝපදේශ සපයන ආයතනික වටිනාකම් මත පදනම් වූ චර්යාධර්ම සංග්‍රහයක් ක්‍රියාත්මක කිරීම, අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම; අධ්‍යක්ෂවරුන්ට සහ සේවකයින්ට අදාළ වන චර්යාධර්ම හා ආචාරධර්ම රාමුව අධීක්ෂණය කිරීම තුළින් බැංකුවේ වටිනාකම් මත පදනම් වූ ශක්තිමත් ආයතනික සංස්කෘතියක් අධ්‍යක්ෂ මණ්ඩලය අඛණ්ඩව පෝෂණය කළේය. මෙම රාමුව සේවක ආචාරධර්ම සංග්‍රහය, අධ්‍යක්ෂවරුන් සඳහා ආචාරධර්ම සංග්‍රහය, අධ්‍යක්ෂවරුන්ගේ මැදිහත්වීම පිළිබඳ ප්‍රතිපත්තිය, අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්තිය (තෑගි සහ ප්‍රතිලාභ පිළිබඳ විධිවිධාන ඇතුළුව), ගනුදෙනුකාර ප්‍රඥප්තිය, පුද්ගල දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තිය සහ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය හරහා ක්‍රියාත්මක වන අතර, හැසිරීම්, වගවීම සහ සාධාරණ ගනුදෙනුකාර ප්‍රතිඵල පිළිබඳ ස්ථාවර ප්‍රමිතීන්ට සහාය වේ. ඊට අමතරව, දත්ත ආරක්ෂණ අනුකූලතාවයේ පාලනය සහ අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා බැංකුව පුද්ගලික දත්ත ආරක්ෂණ නිලධාරියෙකු පත් කර ඇත.	✓
	(ඤ) නියාමකයින් විසින් මතු කරන ලද අධීක්ෂණ ගැටළු කාලෝචිත ලෙස නිවැරදි කිරීම සහතික කිරීම සහ මේ සඳහා අදාළ උපකමිටු වල සහාය ලබා ගත යුතුය; අධීක්ෂණ ගැටළු නිවැරදි කිරීමේ ප්‍රගතිය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් වලදී නිතිපතා වාර්තා කරනු ලබන අතර විගණන කමිටුව විසින් නිරීක්ෂණය සහ සමාලෝචනය කරනු ලැබේ, එමඟින් කාලෝචිත පසු විපරම්, වගවීම සහ එකඟ වූ ක්‍රියාමාර්ග ඵලදායී ලෙස අවසන් කිරීම සහතික කෙරේ. අදාළ අවස්ථාවන්හිදී අදාළ උපකමිටුවේ සහාය ලබා ගනු ලැබේ.	✓

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර	අනුකූලතාවය
	(බ) නීති විරෝධී, සදාචාර විරෝධී හෝ සැක සහිත ක්‍රියාවන් පිළිබඳ නීත්‍යානුකූල ගැටළු, පළිගැනීමේ අවදානමකට ලක්වීමකින් තොරව රහසිගතව සන්නිවේදනය කිරීමට සේවකයින් දිරිමත් කිරීමේ අරමුණින් 'විසිල්බ්ලෝවිං ප්‍රතිපත්තියක්' අනුමත කළ යුතුය. මෙම ප්‍රතිපත්තිය අවම වශයෙන් වාර්ෂිකව සමාලෝචනය කළ යුතුය. 'විසිල්බ්ලෝවිං' ප්‍රතිපත්තියේ පහත කරුණු පැහැදිලිව සඳහන් කළ යුතුය: (i). බැංකුව තුළ ගැටළු යොමු කළ හැකි ඉහළ මට්ටමක පුද්ගලයින්; (ii). සේවකයින් විසින් මතු කරන ලද නීත්‍යානුකූල ප්‍රමාණාත්මක ගැටළු විමර්ශනය කිරීමේ ක්‍රියා පටිපාටි; (iii). කිසියම් හානිකර සැලකීමක් හෝ පළිගැනීමක් හේතුවෙන් ගැටළු ඉදිරිපත් කරන සේවකයින්ට සිදුවිය හැකි අහිතකර බලපෑම් වැළැක්වීම සඳහා ඔවුන්ගේ ආරක්ෂාව සහ නිර්නාමිකභාවය සහතික කිරීමේ ක්‍රියා පටිපාටි; සහ, (iv). නියාමකයින්ට ගැටළු යොමු කිරීම සඳහා විකල්ප මාර්ග. වසර තුළ බැංකුව විසින් මෙම ප්‍රතිපත්තිය සමාලෝචනය කරන ලදී.	✓
	(ම) බැංකුවේ ව්‍යාපාර උපායමාර්ගවල සුදුසු පාරිසරික, සමාජීය සහ පාලන සලකා බැලීම් හරහා තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම සහ හරිත, දේශගුණික හිතකාමී සහ සමාජීය වශයෙන් ඇතුළත් ව්‍යාපාර වලට සහාය වීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක බව සහතික කිරීම. අධ්‍යක්ෂ මණ්ඩල තිරසාර කමිටුව ස්ථාපිත කර ඇති අතර එය 2026 වසරේ සිට ක්‍රියාත්මක වේ. තිරසාරභාවය පිළිබඳ කරුණු අධීක්ෂණය කිරීම මෙම කමිටුව හරහා සිදු කරන අතර 2025 වසර තුළ බැංකුව තිරසාර ප්‍රතිපත්තිය, ESG ප්‍රතිපත්තිය සහ තිරසාර මූල්‍ය රාමුව අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර ශ්‍රී ලංකාවේ විශාලතම තිරසාර බැඳුම්කර නිකුතුව සිදු කරන ලදි. පාරිසරික සහ සමාජීය අවදානම් තක්සේරු කිරීම් බැංකුවේ පාරිසරික සහ සමාජීය කළමනාකරණ පද්ධතිය හරහා ණය තක්සේරු ක්‍රියාවලීන්ට ඒකාබද්ධ කෙරේ.	✓
1.2	**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරියා පත් කිරීම**	
	මෙම විධානවල 5 වන විධානයට අනුකූලව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරියා පත් කළ යුතු අතර, සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යයන් සහ වගකීම් නිර්වචනය කර අනුමත කළ යුතුය. 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතේ සහ එහි පසුකාලීන සංශෝධනවල විධිවිධාන වලට අනුකූලව, බැංකුව යටත් වන අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් වත්මන් සභාපතිවරයා පත් කරන ලදී. ලංකා බැංකුවේ මහා කළමනාකරු ලෙස හඳුන්වන ප්‍රධාන විධායක නිලධාරියා පත් කිරීමේ බලය එම අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරී ඇත. සභාපතිවරයාගේ සහ මහා කළමනාකරුගේ කාර්යයන් සහ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ පැහැදිලිව අර්ථ දක්වා ඇත. ඩබ්ලිව් පී ආර් පී එච් ෆොන්සේකා මහතා 2023 ජනවාරි 14 දින සිට 2025 අගෝස්තු 05 වන දින දක්වා ලංකා බැංකුවේ මහා කළමනාකරු ලෙස කටයුතු කරන ලදී. බැංකුවේ මහා කළමනාකරු තනතුර සඳහා තෝරා ගැනීම සඳහා උසස්වීම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. හිටපු නියෝජ්‍ය මහා කළමනාකරු (නිමැවුම් හා බැංකුකරණ සංවර්ධන) වයි ඒ ජයතිලක මහතා බැංකුවේ වත්මන් ප්‍රධාන විධායක නිලධාරී/ මහා කළමනාකරු ලෙස කටයුතු කරනු ලබයි.	✓
1.3	**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**	
	අධ්‍යක්ෂ මණ්ඩලය ආසන්න වශයෙන් මාසික කාල පරතරයකින් රැස්විය යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වසරකට අවම වශයෙන් දොළොස් වතාවක් පැවැත්විය යුතුය. එවැනි රැස්වීම් වලට පැමිණීමට අයිතිය ඇත්තා වූ අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරයකගේ පුද්ගලික ක්‍රියාශීලී සාකච්ඡා වලට ඇතුළත් වේ. ලිඛිත යෝජනා/ පත්‍රිකා ආදිය සංසරණය කිරීම හරහා අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත ලබා ගැනීම හැකිතාක් දුරට වළක්වා ගත යුතුය. සංසරණය හරහා ලබාගත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සංසරණයෙන් පසු වහාම පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කළ යුතුය. අදාළ අධ්‍යක්ෂවරුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය සහතික කිරීම සහ අවම වශයෙන් අර්ධ වාර්ෂික පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට භෞතිකව සහභාගී වීම සහතික කිරීමට යටත්ව, අධ්‍යක්ෂ මණ්ඩලයට රැස්වීම් පැවැත්වීම සහ/ හෝ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගී වීම අතථ්‍ය මාර්ග ඔස්සේ සිදු කළ හැකිය. අඛණ්ඩ අර්ධ මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන අතර විශේෂ රැස්වීම් අවශ්‍යතාව පැන නගින ආකාරයට සැලසුම් කරනු ලැබේ. සමාලෝචිත වසර තුළ විශේෂ රැස්වීම් ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලය 31 වතාවක් රැස්වී තිබේ. චක්‍රලේඛ යෝජනා මඟින් අනුමැතිය ලබා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවම කර තිබෙන අතර එය විශේෂිත පදනමක් මත පමණක් කරනු ලබන අතර එවැනි යෝජනා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඊළඟ රැස්වීමේදී සම්මත කෙරේ. 2025 වසර තුළ යෝජනා 50 ක් චක්‍රලේඛ මඟින් සම්මත කර ඇත.	✓
1.4	**අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටි**	
	(අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් සඳහා වූ න්‍යාය පත්‍රයට වැදගත් කරුණු හා යෝජනා ඇතුළත් කිරීමට සියලු අධ්‍යක්ෂවරුන්ට හැකියාව ලැබෙන අයුරින් නිසි පියවර ගෙන ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුත්තේය. ඒවා බැංකු ව්‍යාපාරික කටයුතු, අවදානම් කළමනාකරණය හා සේවකයින්ගේ හැසිරීම වැඩි දියුණු කිරීමට අදාළ වූ විෂයයන් හා යෝජනා විය යුතුය. සෑම වර්ෂයක්ම ආරම්භයේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දින සැලසුම් කරන අතර නිතිපතා පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රයට යෝජනා ඇතුළත් කළ හැකි වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට නිසි ලෙස දැනුම් දෙනු ලැබේ.	✓

2024 අංක 05 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර		අනුකූලතාවය
	(ආ)	සියළුම අධ්‍යක්ෂවරුන්ට සහභාගි වීමට අවස්ථාවක් ලබාදීමේ අරමුණින් සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අවම වශයෙන් දින හතකට පෙර දැනුම් දීමක් කරන බවට අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටියක් මඟින් සහතික කළ යුත්තේය. අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාධාරණ පෙර දැනුම් දීමක් කළ හැකිය. වර්ෂය ආරම්භයේදී වාර්ෂික දින දර්ශනය මඟින් රැස්වීම් දැනුම් දීම සිදු කෙරේ. රැස්වීම් වලට දින හතකට පෙර නැවත දැනුම් දීම සිදු කෙරේ. අනෙකුත් විශේෂ රැස්වීම් සඳහා සාධාරණ පෙර දැනුම් දීමක් කරනු ලබන අතර විශේෂිත රැස්වීමක් යොදා ගැනීමට පෙර සියලුම අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත ද ලබා ගනු ලැබේ.	✓
	(ඇ)	පසුගිය මාස 12 ක කාලය තුළ පැවැත්වූ රැස්වීම් වාර අඩුම වශයෙන් 2/3 කට සහභාගි නොවුණ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ පසුගිය රැස්වීම් වාර තුනකට අඛණ්ඩව සහභාගි නොවුණු අධ්‍යක්ෂවරයෙකුගේ හෝ අධ්‍යක්ෂධුරය අහිමි වන බවට අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටිය මඟින් සහතික කළ යුතුය. විකල්ප අධ්‍යක්ෂවරයෙකු මාර්ගයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගිවීම, නිසි පැමිණීමක් ලෙස පිළිගත හැකිය. ආයතනික යහපාලන සංග්‍රහයට අනුව අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ රැස්වීම් වලට සහභාගි වීම් පිළිබඳ දැනුවත් කර ඇත. අධ්‍යක්ෂවරුන් රැස්වීම් වලට සහභාගි වීම් පිළිබඳ පිටු අංක 173 හි දක්වා ඇත. අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම මෙම නියමයන්ට අනුකූලව තිබේ.	✓
1.5	**සමාගම් ලේකම්වරයෙකු පත් කිරීම**		
	(අ)	බැංකු පනතේ 43 වගන්තියේ දැක්වෙන විධිවිධාන සපුරන්නා වූ සමාගම් ලේකම්වරයකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ යුත්තේය. එම තැනැත්තාගේ මූලික වගකීම් විය යුත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය හා කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා ලේකම් සේවා ලබාදීම සහ අණ පනත්වල හා දැනට බලපැවැත්වෙන එවැනි අනෙකුත් ලිඛිත නීති මඟින් දක්වා ඇති අනෙකුත් කාර්යයන් කිරීමත්ය. ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් නීතිඥවරියක වන අතර 1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියේ විධිවිධාන සහ එහි සංශෝධන ඇය විසින් සපුරාලනු ලබයි.	✓
	(ආ)	අධ්‍යක්ෂ මණ්ඩලයේ පටිපාටීන් සහ අදාළ රීති හා නියාමනයන් පිළිපදින බව සහතික කරනු පිණිස සියළුම අධ්‍යක්ෂවරුන්ට සමානව ලේකම්ගෙන් උපදෙස් හා සේවා ලබාගැනීම සඳහා අවකාශය තිබිය යුතුය. සියළුම අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගෙන් උපදෙස් ලබා ගැනීමේ හැකියාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය නීතිඥවරියක වන අතර, අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි පිළිබඳ සොයා බැලීමට, නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ලබා ගැනීම හා පවත්වාගෙන යාම සඳහා ඇය අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු වේ.	✓
	(ඇ)	අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණුව, ධාරිතා වර්ධනය සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සඳහා නාමයෝජනා සහ යහපාලන කමිටුව විසින් කරන ලද නිර්දේශ සමාගම් ලේකම් විසින් ක්‍රියාත්මක කළ යුතුය. මෙම වගකීම් ඉටු කිරීමේදී නාමයෝජනා සහ යහපාලන කමිටුව උපකාරී වේ. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ සභාපති සහ අධ්‍යක්ෂවරු දේශීය හා විදේශීය මූල්‍ය, ආයතනික යහපාලනය, කෘතිම බුද්ධිය සහ ව්‍යවස්ථාපිත/ නියාමන අනුකූලතා පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන්/ වැඩමුළු/ සම්මන්ත්‍රණ/ සැසි සඳහා සහභාගී වූහ. වර්ෂය තුළ අධ්‍යක්ෂවරු එවැනි පුහුණු වැඩසටහන් විසි හයකට (26) සහභාගී වූහ.	✓
	(ඈ)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා සහ රැස්වීම් පටිගත කිරීම් ලේකම්වරිය විසින් පවත්වා ගතයුතු අතර ඕනෑම සාධාරණ වේලාවක දී සාධාරණ දැනුම් දීමකින් පසු ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට හෝ නියාමකට එවැනි වාර්තා පරීක්ෂා කිරීම සඳහා ඉඩ සලසා දිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා අවශ්‍ය පරිදි පවත්වාගෙන යනු ලබන අතර පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැකිය. ආරක්ෂිත මෘදුකාංගයක් හරහා සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත රැස්වීම්වල වාර්තා බෙදා හරිනු ලබන අතර පසුව පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී රැස්වීම්වල වාර්තා අනුමත කරනු ලැබේ. අධ්‍යක්ෂවරුන්ට මෙම ආරක්ෂිත මෘදුකාංගය හරහා පැරණි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවලට ප්‍රවේශ වීමට හැකියාව ඇත	✓
1.6	**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා පවත්වාගෙන යාම**		
	අධ්‍යක්ෂ මණ්ඩලය නිසි සැලකිල්ලෙන් හා විවක්ෂණශීලී බවකින් කටයුතු කළා ද යන්න අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා මඟින් තොරතුරු ලබාගත හැකිවන ආකාරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා ප්‍රමාණවත් අයුරින් විස්තරාත්මක විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ඇති වන සාකච්ඡාවන්ගේ ගැඹුරු බව පිළිබඳ තක්සේරු කිරීමට මෙම වාර්තා නියාමන හා අධීක්ෂණ අධිකාරීන්ට උපකාරී විය යුතුය. එම නිසා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා තුළ පහත දෑ පැහැදිලිව ඇතුළත් විය යුතුය:		✓
	(අ)	අධ්‍යක්ෂ මණ්ඩලය තම සාකච්ඡා සඳහා භාවිතා කරනු ලැබූ තොරතුරු හා දත්ත සහ සාධාරණීකරණයන්/ තර්කයන් පිළිබඳ සාරාංශයක්	
	(ආ)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බැලීමට යෙදුන විෂය කරුණු	
	(ඇ)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම යුතුකම් නිසි සැලකිල්ලෙන් හා ප්‍රවේශම් සහගත භාවයකින් යුතුව කරගෙන යන්නේ ද යන්න නිරූපණය වන තොරතුරු, රැස්වීමේ සාකච්ඡා සහ මතභේදයට හෝ විරෝධයට බඳුන් වූ විෂය කරුණු	
	(ඈ)	අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ග හා ප්‍රතිපත්ති සහ අදාළ නීති හා නියාමනයන් වලට අනුකූල වන බව විදහාපාන්නා වූ, අදාළ ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් කරනු ලබන සාක්ෂිදීම් සහ සනාථ කිරීම්	
	(ඉ)	බැංකුව නිරාවරණය වන අවදානම් වලට සම්බන්ධ කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුම සහ තේරුම් ගැනීම් හා අවදානම් කළමනාකරණය පිළිබඳ අනුගමනය කල ක්‍රමෝපාය පිළිබඳ විශ්ලේෂණය	
	(ඊ)	අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සහ තීරණ විස්තරාත්මක අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා මඟින් මෙම නිර්ණායකයන්ට අදාළ කරුණු ආවරණය වේ.	

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර	අනුකූලතාවය
1.7	**ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම**	
	යෝග්‍ය අවස්ථාවන්හි දී සාධාරණ ඉල්ලීම් මත බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීයමය උපදෙස් පැතීම සඳහා අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව ලබාදෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟ වූ පරිපාටියක් තිබිය යුත්තේය. අදාළ අධ්‍යක්ෂවරයෙකුට හෝ අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගෙන් බැංකුවට ඉටුවිය යුතු යුතුකම් ඉටුකිරීම සඳහා ආධාර වීම පිණිස වෙනම ස්වාධීන වෘත්තීයමය උපදෙස් ලබාදීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කළ යුතුය. අවශ්‍ය අවස්ථා වලදී අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන වෘත්තීය උපදෙස් පැතීම සඳහා වන ප්‍රඥප්තිය වර්ෂය තුළ සමාලෝචනය කරන ලද අතර අවශ්‍ය අවස්ථාවලදී ඉහත ප්‍රඥප්තිය පදනම් කොටගෙන අධ්‍යක්ෂ මණ්ඩලය විවෙනි උපදෙස් කරා යොමුවෙයි.	✓
1.8	**බැඳියාවන් අතර ගැටුම් ඇතිවීම කළමනාකරණය කිරීම**	
	(අ) අනෙකුත් සංවිධාන හෝ සම්බන්ධිත පාර්ශ්වයන් හෝ උනන්දුවක් දක්වන සියළුම පාර්ශ්වයන් සමඟ කටයුතු කිරීමේදී සහ ඒවාට ඇති බැඳීම්වල දී, බැඳියාවන් අතර ගැටුම් ඇතිවීම හෝ එවැනි බැඳියාවන් අතර ඇතිවිය හැකි ගැටුම් අධ්‍යක්ෂවරුන් විසින් වළක්වාගත යුත්තේය.	✓
	(ආ) අධ්‍යක්ෂවරයෙකු ඔහු/ ඇය හෝ ඔහුගේ/ ඇයගේ සමීප ඥාතියෙකු හෝ ඔහු/ ඇය සැලකිය යුතු උනන්දුවක් දක්වන කාරණයක් සම්බන්ධයෙන් කිසිදු සාකච්ඡාවකට සහභාගී වීමෙන් වැළකී සිටිය යුතු අතර, එම තොරතුරු වලට භෞතිකව සහ/ හෝ විද්‍යුත් වශයෙන් ප්‍රවේශ වීම ඇතුළුව ඒ හා සම්බන්ධ තොරතුරු වෙත ප්‍රවේශය නොලැබිය යුතුය.	✓
	(ඇ) අධ්‍යක්ෂවරුන් තමන් අතර මෙන්ම අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් අතර සබඳතා අධික හුරුපුරුදුකමක්, අනවශ්‍ය බලපෑමක් ඇති නොවන මට්ටමක පවතින බව අධ්‍යක්ෂවරුන් සහතික කළ යුතුය.	✓
	(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැඳියාවන් අතර ගැටුම් හඳුනාගෙන කළමනාකරණය කිරීම සඳහා වන ප්‍රතිපත්තියක් අනුමත කර ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කළ යුතු අතර, එයට පහත සඳහන් දේ ඇතුළත් විය යුතුය:	✓
	(i). බැඳියාවන් අතර ගැටුමකට හේතු විය හැකි හෝ දැනටමත් හේතු වී ඇති ඕනෑම කරුණක් වහාම හෙළිදරව් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගේ යුතුකම;	✓
	(ii). දේශපාලන සම්බන්ධතා ඇතුළුව, බැඳියාවන් අතර ගැටුම් හෝ විභව ගැටුම් ඇති කළ හැකි ක්‍රියාකාරකම් හැකිතාක් දුරට වළක්වා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගේ යුතුකම;	✓
	(iii). අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස සේවය කිරීම නිසා බැඳියාවන් අතර ගැටුම් ඇති විය හැකි අවස්ථා;	✓
	(iv). අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු හෝ ඔහුගේ/ ඇයගේ සමීප සබඳතා ඇති අයෙකු හෝ ඔහු/ ඇය සැලකිය යුතු උනන්දුවක් දක්වන කරුණක් සම්බන්ධයෙන් වන ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පිළිබඳ සාකච්ඡා වලට සහභාගී වීමෙන් වැළකී සිටීමේ වගකීම; සහ,	✓
	(v). ප්‍රතිපත්තියට අනුකූල නොවන අවස්ථාවකදී ගත යුතු ක්‍රියාමාර්ග. විභව බැඳියාවන් පිළිබඳ ගැටුමක් ඇති අවස්ථාවන්හිදී, අධ්‍යක්ෂවරුන් අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව ක්‍රියා කිරීමට ඇති වගකීම පිළිබඳව අවධානයෙන් සිටිති. එවැනි කාරණා පාලනය කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැඳියාව මත ගැටුම් ප්‍රතිපත්තියක් මගිනි. සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදීම, අධ්‍යක්ෂවරුන් වෙනත් අධ්‍යක්ෂ මණ්ඩල හෝ ආයතන වලට අදාළ කොන්ත්‍රාත්තු, නව පත්වීම් හෝ ඉල්ලා අස්වීම් සම්බන්ධයෙන් කිසියම් බැඳියාවක් තිබේදැයි විධිමත් ලෙස ප්‍රකාශ කරයි. ගැටුමක් ඇති වූ විට, අදාළ අධ්‍යක්ෂවරයා සාකච්ඡා වලින් වැළකී සිටින අතර අදහස් ප්‍රකාශ කිරීමෙන් හෝ අනුමත කිරීමේ ක්‍රියාවලියට සහභාගී වීමෙන් වැළකී සිටී.	✓
1.9	**වගකීම් ඉටු කිරීමට නොහැකි වීම පිළිබඳව දැනුම් දීමේ අවශ්‍යතාවය**	
	බැංකුවට තම වගකීම් ඉටු කිරීමට නොහැකි යැයි හෝ නොහැකි වීමට ඉඩ ඇතැයි හෝ බැංකුව බුන්වත් වීමට ආසන්න යැයි හෝ තැන්පතුකරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට නියමිත ගෙවීම් අත්හිටුවීමට ආසන්න යැයි හෝ බැංකුව සළකන්නේ නම් වෙනත් කිසිම තීරණයක් හෝ ක්‍රියාවක් ක්‍රියාත්මක කිරීමට පෙර වහාම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ තත්ත්වය පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැන්විය යුතු වේ. 2025 වර්ෂය තුළ මෙවැනි තත්ත්වයක් මතු නොවුණි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද මාසික මූල්‍ය වාර්තා මඟින් බැංකුවේ නුබුන්වත් බව සහතික වී ඇත.	
1.10	**විවක්ෂණශීලී අවශ්‍යතා වලට අනුකූල වීම**	
	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සහ අනෙකුත් විවක්ෂණශීලී පදනම් අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට නියම කර ඇති මට්ටම්වලට අනුකූල වන මට්ටමක බැංකුවේ ප්‍රාග්ධනය පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය. නියමිත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සහ අනෙකුත් විවක්ෂණ සීමාවන් පිළිපැදීම ඇතුළුව, මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති අවශ්‍යතා වලට අනුකූලව බැංකුව ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගෙන යන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ අඛණ්ඩ අධීක්ෂණය සඳහා මාසිකව, බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සමඟ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය ගණනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.	✓
1.11	**වාර්ෂික ආයතනික යහපාලන වාර්තාව**	
	මෙම නියමයන්ගේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරය සඳහන් වූ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවක්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ වාර්ෂික වාර්තාව තුළින් ප්‍රසිද්ධ කළ යුතුය. මෙම අනාවරණයන් බැංකුවේ වාර්ෂික වාර්තාවේ ආයතනික යහපාලන වාර්තාවේ අඩංගු කොටසක් වේ. (162 පිටුව බලන්න)	✓

2024 අංක 05 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර	අනුකූලතාවය
2.	**අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය**	
	බැංකුවේ මෙහෙයුම්වල ප්‍රමාණය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණතාවයට අනුකූලව විවිධ අදහස් ප්‍රවර්ධනය කිරීම සඳහා, විවිධ පසුබිම් වල දැනුම, සුදුසුකම්, කුසලතා, අදාළ ක්ෂේත්‍රවල පළපුරුද්ද සහිත පුද්ගලයන්ගෙන් සහ ස්ත්‍රී පුරුෂ වශයෙන් සමතුලිත මිශ්‍රණයක් අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය මඟින් සහතික කළ යුතුය. බැංකුකරණය, මූල්‍ය, ආර්ථික විද්‍යාව, ගිණුම්කරණය, ව්‍යාපාර පරිපාලනය, තොරතුරු තාක්ෂණය, අවදානම් කළමනාකරණය, නීතිය හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම අදාළ විෂයයකින් සුදුසුකම් සහ පළපුරුද්ද තිබිය යුතුය. වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය, අදාළ විෂය ක්ෂේත්‍රවල විවිධ සුදුසුකම් සහ පළපුරුද්ද ඇති සාමාජිකයින්ගෙන් සමන්විත වන අතර කුසලතා, විශේෂඥතාව සහ, විවිධත්වයෙන් සමතුලිත මිශ්‍රණයක් සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සවිස්තරාත්මක පැතිකඩ සඳහා කරුණාකර මෙම වාර්තාවේ 32 සිට 39 දක්වා පිටු බලන්න.	✓
2.1	**අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ ක්‍රියා පටිපාටිය**	
	(අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා වූ විධිමත් සහ විනිවිදභාවයෙන් යුක්ත ක්‍රියාපටිපාටියක් තිබිය යුතුය. එසේම අධ්‍යක්ෂ මණ්ඩලයට අනුප්‍රාප්තිකයන් පත් කිරීම සිදු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රියාපටිපාටියක් ද තිබිය යුතු ය. රජය සතු බැංකු ප්‍රතිසංස්කරණය කිරීම ක්‍රියාත්මක කිරීමත් සමඟ, ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම් අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා සහ යහපාලන කමිටුව විසින් සිදු කරනු ලැබේ. නාමයෝජනා සහ යහපාලන කමිටුව විසින් විනිවිද පෙනෙන, විෂයානුබද්ධ සහ කුසලතා මත පදනම් වූ ක්‍රියාවලියක් හරහා විභව අපේක්ෂකයින් හඳුනාගෙන අවශ්‍ය පසුබිම් පරීක්ෂාවන් සිදු කිරීම, ඇගයීමට ලක් කිරීම සහ නියාමන මාර්ගෝපදේශ වලට අනුකූලව යෝග්‍යතාවය තක්සේරු කිරීම සිදු කරයි. අධ්‍යක්ෂවරුන් පත් කිරීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තියෙහි මෙම ක්‍රියා පටිපාටිය දක්වා ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය සඳහා අවශ්‍ය කුසලතා, පළපුරුද්ද සහ දැනුම ද එහි සඳහන් කර ඇත. නාමයෝජනා සහ යහපාලන කමිටුව විසින් කෙටි ලැයිස්තුගත අපේක්ෂකයින් සලකා බැලීම සහ අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසු, සුදුසු අපේක්ෂකයින්ගේ නම් විධිමත් පත්වීම් සඳහා අමාත්‍යවරයා වෙත යොමු කරනු ලබන අතර, ලංකා බැංකු ආඥාපනතේ අවශ්‍යතා වලට අනුකූලව අමාත්‍යාංශය හරහා පත්වීම් ලිපි නිකුත් කරනු ලැබේ. ඔවුන්ගේ නිල තනතුර අනුව පත් කරන ලද අධ්‍යක්ෂවරුන් නිල බලයෙන් පත් කරන ලද අධ්‍යක්ෂවරුන් ලෙස පිළිගනු ලැබේ. 2024 අංක 03 දරණ බැංකු පනතේ තීරණයට අනුකූලව අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව තීරණය කරනු ලබන අතර, ලංකා බැංකුව අවම වශයෙන් අධ්‍යක්ෂවරුන් දස දෙනෙකු නඩත්තු කළ යුතුය. වර්තමානයේ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 11 දෙනෙකුගෙන් සමන්විත වේ.	✓
	(ආ) වෙනත් බැංකුවක් බැංකුවේ පරිපාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් වන අවස්ථාවක දී හැර බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීම, තෝරා පත් කර ගැනීම හෝ නම් කිරීම නොකළ යුතුය.	✓
2.2	**අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව**	
	(අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව හතකට වඩා අඩු නොවිය යුතු අතර, 13 ට වඩා වැඩි නොවිය යුතුය. අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව බැංකුවේ මෙහෙයුම්වල පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණත්වයට අනුරූප විය යුතුය. 2025.12.31 දිනට ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 11 දෙනෙකුගෙන් සමන්විත වේ.	✓
	(ආ) 2025.12.31 වන විට අධ්‍යක්ෂ මණ්ඩලයට අවම වශයෙන් එක් කාන්තා නියෝජිතවරියක් හෝ සිටිය යුතු අතර සාමාජිකයින් 10 දෙනෙකුට වඩා සිටින අධ්‍යක්ෂ මණ්ඩල වලට 2026.12.31 වන විට අවම වශයෙන් කාන්තා නියෝජිතවරියන් දෙදෙනෙකු සිටිය යුතුය. වර්තමානයේ, අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත වන අතර, එක් කාන්තා අධ්‍යක්ෂවරියක් ද ඊට ඇතුළත් වේ. ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ විවිධත්වය වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ කැපවීමට අනුකූලව, 2026 දෙසැම්බර් 31 වන විට කාන්තා නියෝජනය අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු දක්වා වැඩි කිරීමට පියවර ගනු ලැබේ.	✓
2.3	**විධායක අධ්‍යක්ෂවරුන්**	
	විධායක අධ්‍යක්ෂවරුන් ගණන අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින අධ්‍යක්ෂවරුන්ගේ ගණනින් තුනෙන් එකක ප්‍රමාණය නොඉක්ම වන පරිදි බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සාමාජිකයෙකු බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස (මින් මතු විධායක අධ්‍යක්ෂවරුන් ලෙස හඳුන්වන) පත් කිරීමට, තෝරා ගැනීමට හෝ නම් කිරීමට හැකිය. එවැනි අවස්ථාවකදී එක් විධායක අධ්‍යක්ෂවරයකු ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත්කළ යුතුය. ලංකා බැංකු ආඥා පනතට අනුව ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ විධායක අධ්‍යක්ෂවරුන් සිටීමට නොහැකිය.	
2.4	**විධායක නොවන අධ්‍යක්ෂවරුන්**	
	විධායක නොවන අධ්‍යක්ෂවරුන් යහපත් හැසිරීම සහ විශ්වසනීය වාර්තාවක් ඇති සුදුසු වෘත්තිකයන් විය යුතු අතර උපායමාර්ග, කාර්යසාධනය සහ සම්පත් පිළිබඳ ගැටළු ඵලදායී ලෙස විසඳීමට සහ බැංකුවේ තිරසාරභාවය සඳහා දායක වීමට ස්වාධීන විනිශ්චයක් ගෙන ඒමට අවශ්‍ය දැනුම, කුසලතා සහ අත්දැකීම් තිබිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර ඉහත සඳහන් සුදුසුකම් අවශ්‍යතා සපුරාලයි.	✓
2.5	**ස්වාධීන අධ්‍යක්ෂවරුන්**	
	(අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් අවම වශයෙන් අඩක් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතුය. බලපත්‍රලාභී බැංකු 2027.01.01 දින වන විට මෙම විධානයට අනුකූල විය යුතුය. 2025.12.31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් එකොළොස් දෙනෙකුගෙන් (11) සමන්විත වන අතර, ඔවුන්ගෙන් පස් දෙනෙකු (5) ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන් ලෙස වර්ගීකරණය කර ඇති අතර හය දෙනෙකු (6) ස්වාධීන අධ්‍යක්ෂවරුන් ලෙස වර්ගීකරණය කර ඇත.	✓

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර	අනුකූලතාවය
	(ආ) විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු පහත සඳහන් අවස්ථාවලදි ස්වාධීන ලෙස නොසැලකේ:	✓
	(i) බැංකුවේ ඡන්ද අයිතිය හිමි සහ/ හෝ ඡන්ද අයිතිය නොමැති කොටස් හිමිකාරත්වයෙන් 1% කට වඩා සෘජු ලෙස හෝ වක්‍ර ලෙස අත්කර ගෙන සිටීම.	
	(ii) දැනට හෝ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසර දෙකක කාල සීමාවක් තුළ මෙහි 7.2 වන වගන්තියෙන් දක්වන පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන කිසිදු ව්‍යාපාරික ගනුදෙනුවක වර්තමානයේ යෙදී සිටීම/ යෙදී සිට තිබීම.	
	(iii) බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසර දෙකක කාලයක් තුළ බැංකුවේ සේවා නියුක්ත වී සිට තිබීම.	
	(iv) දැනට හෝ බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසර දෙකක කාලයක් තුළ බැංකුව සමඟ ප්‍රධාන ව්‍යාපාරික සම්බන්ධතාවයක් පැවතිම හෝ පවත්වා තිබීම.	
	(v) සමීප ඥාතීත්වයක් ඇති අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු හෝ ජ්‍යෙෂ්ඨ විධායක කළමනාකාරිත්වයේ සාමාජිකයෙක් හෝ වෙනත් සැලකිය යුතු කොටස් හිමිකරුවෙකු බැංකුවේ හෝ වෙනත් බැංකුවක සිටීම. මෙහි අරමුණ සඳහා, සමීප ඥාතියකු, යන්නෙන් අදහස් වන්නේ කාලත්‍රයා හෝ යැපෙන්නා වූ ළමයෙකි.	
	(vi) බැංකුව පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන් නියෝජනය කිරීම.	
	(vii) පහත දැක්වෙන සමාගමක හෝ ව්‍යාපාරික ආයතනයක සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු හෝ සැලකිය යුතු කොටස්කරුවෙකු වීම හෝ එම සමාගම හෝ ව්‍යාපාරික ආයතනය සමඟ ප්‍රධාන ව්‍යාපාරික සම්බන්ධතාවයක් පැවතිම :	
	(අ) 7.2 විධානයේ දැක්වෙන පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන ගනුදෙනුවක බැංකුව සමඟ වර්තමානයේ සිටින හෝ	
	(ආ) මූල්‍ය අංශයේ බලධාරීන් විසින් නිර්දේශ කරනු ලබන පත්වීම් හැර, බැංකුවේ වෙනත් යම් අධ්‍යක්ෂවරුන් සේවයේ යෙදී සිටින හෝ අධ්‍යක්ෂවරයෙක් වන හෝ සැලකිය යුතු කොටස් හිමියකු වී සිටින හෝ	
	(ඇ) මෙම විධානයන්ගේ 7.2 වන විධානයේ දක්වා ඇති පරිදි බැංකුවේ වෙනත් යම් අධ්‍යක්ෂවරයෙකු බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන ගනුදෙනුවක යෙදී සිටි.	
	(viii) දැනට හෝ බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසරක කාලයක් තුළ බැංකුවට විශේෂඥයෙකු/ උපදේශකයෙකු ලෙස සේවය කිරීම/ කර තිබීම හෝ බැංකුවට උපදේශන සේවා සපයන ආයතනයක ප්‍රධාන විශේෂඥයෙකු/ උපදේශකයෙකු ලෙස සේවය කිරීම/ කර තිබීම.	
	(ix) දැනට හෝ බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසරක කාලයක් තුළ බැංකුවට විගණන සේවා සපයන ආයතනයක ගිවිසුම් හවුල්කරුවෙකු වී සිටීම/ සිට තිබීම.	
	(ඈ) සියළුම ආයතනික සන්නිවේදන කටයුතු වලදී බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම් හෙළිකිරීමේ දී ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්, ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස නිශ්චිතව හඳුනාගත යුතුය. ශ්‍රී ලංකා මහ බැංකුවේ අර්ථ නිරූපණයට අනුව, උපදෙස් අංක 2.5 (අ) හි සඳහන් පරිදි, "ස්වාධීන අධ්‍යක්ෂ" සම්බන්ධයෙන්, පහත සඳහන් අධ්‍යක්ෂවරුන් "ස්වාධීන" ලෙස සැලකේ- (i) දර්ශන ගුණසේකර මහතා (ii) තුල්සි අලුවිහාරේ මහතා (iii) ශාමිනී රත්වත්තේ මහත්මිය (iv) දර්ශන් ජයරත්න මහතා (v) සුනිමල් වීරසූරිය මහතා (vi) මහාචාර්ය ආනන්ද ජයවර්ධන	✓
2.6	**විකල්ප අධ්‍යක්ෂවරුන් හරහා නියෝජනය කිරීම**	
	(අ) විකල්ප අධ්‍යක්ෂවරයෙකු හරහා නියෝජනය කිරීමට අවසර දෙනු ලබන්නේ බැංකු පනතේ 42 වන වගන්තියේ විධිවිධාන යටතේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සුවිශේෂී අවස්ථාවන්හිදී පමණි. එවැනි පත්වීමක් සඳහා අනුමැතිය පත්වීම කළ දින සිට උපරිම වසරක කාලයක් සඳහා පමණක් හිමි වේ.	
	(ආ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලැබුවහොත්, එසේ පත් කරන ලද පුද්ගලයා ස්වාධීන අධ්‍යක්ෂවරයාට අදාළ වන නිර්ණායක ද සපුරාලිය යුතුය.	
	(ආ) බැංකුවේ දැනට සිටින අධ්‍යක්ෂවරයෙකු, බැංකුවේ දැනට සිටින වෙනත් අධ්‍යක්ෂවරයෙකුට විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කළ නොහැක.	
	(ඈ) එක් අධ්‍යක්ෂවරයෙකුගේ විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලද පුද්ගලයෙකු එම අධ්‍යක්ෂ මණ්ඩලයේම තවත් අධ්‍යක්ෂවරයෙකුගේ විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කළ නොහැක. කිසිදු අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කර නොමැත.	
2.7	**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ගණපූරණය**	
	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ගණපූරණය අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගෙන් අඩක් විය යුතුය. එවැනි රැස්වීමක ගණපූරණය සෑදීමට අවශ්‍ය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව සිටියද, එවැනි රැස්වීමකට සහභාගී වන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකකට වඩා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් නොවන්නේ නම්, අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක් නොපැවැත්විය යුතුය. බලපත්‍රලාභී බැංකු 2026.01.01 දින වන විට මෙම විධානයට අනුකූල විය යුතුය.	✓

2024 අංක 05 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර	අනුකූලතාවය
3.	**අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය**	
	බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන හෝ සේවය කිරීමට බලාපොරොත්තු වන පුද්ගලයෙකු පහත අවශ්‍යතා වලට අනුකූල විය යුතුය.	
3.1	**අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සහ උචිතභාවය ඇගයීමේ නිර්ණායක**	
	බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන හෝ සේවය කිරීමට බලාපොරොත්තු වන පුද්ගලයෙකුගේ යෝග්‍යතාවය සහ උචිතභාවය තීරණය කිරීම සඳහා බැංකු පනතේ 42 වන වගන්තියේ සහ 76H වගන්තියේ විධිවිධාන අදාළ වේ. එහි දක්වා ඇති කිසිදු නිර්ණායකයකට අනුකූල නොවීම අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීමට, තේරී පත් වීමට හෝ නම් කිරීමට හෝ අධ්‍යක්ෂවරයෙකු ලෙස දිගටම කටයුතු කිරීමට නුසුදුස්සෙකු කරනු ඇත. බැංකු පනතේ 42 වන වගන්තිය සහ 76H වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීමට, තේරී පත් වීමට හෝ නම් කිරීමට එක් එක් පුද්ගලයාගේ යෝග්‍යතාවය සහ උචිතභාවය සඳහා බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.	✓
3.2	**අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සඳහා අමතර අවශ්‍යතා**	
	(අ) අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන පුද්ගලයෙකුගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් කිසිම අයෙකු වයස අවුරුදු 70 ට වඩා වැඩි නොවේ	✓
	(ආ) ප්‍රධාන විධායක නිලධාරී තනතුර හෝ ප්‍රධාන කළමනාකරණ පුද්ගල තනතුර දරන අධ්‍යක්ෂවරයෙකු හැර වෙනත් අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර නවයක් නොඉක්මවිය යුතුය. ලංකා බැංකුවේ සියලුම අධ්‍යක්ෂවරුන් වසර නවයකට (09) අඩු කාලයක් සේවය කර ඇත. ඔවුන්ගේ පත්වීම්, අත්හිටුවීම් සහ ඉල්ලා අස්වීම් පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ 173 පිටුවේ දක්වා ඇත.	✓
	(ඇ) බැංකුවේ පරිපාලන සමාගම් හෝ ආශ්‍රිත සමාගම් ඇතුළුව සමාගම්/ ආයතන/ සංවිධාන 20 කට වැඩි ගණනක අධ්‍යක්ෂවරයෙකු ලෙස පුද්ගලයෙකු ධුරය නොදැරිය යුතුය. කිසිදු අධ්‍යක්ෂවරයෙකු සමාගම්/ ආයතන 20 කට වඩා වැඩි ගණනක අධ්‍යක්ෂ ධුර දරන්නේ නැත. ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන් පත් කිරීමෙන් පසු සහ වසර අවසානයේදී මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා ගනු ලැබේ.	✓
	(ඈ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස වගකීම් ඉටු කිරීමට අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් කාලයක් තිබිය යුතුය. බැංකුවේ අධ්‍යක්ෂවරයෙකුගේ භූමිකාවන් සහ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් සහ කැපවීමක් ලබා දෙන බවට සෑම අධ්‍යක්ෂවරයෙකුම සහතික වේ.	✓
3.3	**සහන කාලය**	
	ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් සිදුවන බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකුට හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකුට තම ධුරයෙන් ඉවත් වූ දින සිට මාස හයක් ඉකුත් වීමට පෙර ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් සිදුවන වෙනත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු ලෙස පත්වීමට නොහැක. ප්‍රතිව්‍යුහගත කිරීම අවශ්‍ය වන බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පිහිටුවීමේදී විශ්‍රාමික බැංකුකරුවන්ගේ විශේෂ දැනුම අවශ්‍ය වීම වැනි සුවිශේෂී අවස්ථාවන්හි දී සිදුවන වෙනස්කම් ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමැතියට යටත් විය යුතුය. මේ සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු විසින් අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන විධායක නිලධාරියා පත් කිරීමේදී අත්හිටුවීමේ සහන කාලය අවශ්‍ය බව සහතික කළ යුතුය. පත් කිරීමේ අධිකාරියක් විසින් බලපත්‍රලාභී බැංකුවකට අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමේදී මෙම විධිවිධාන කඩකරන්නේ නම්, බලපත්‍රලාභී බැංකුව විසින් එවැනි පත්වීම්ලාභියෙකු බලය හෝ ප්‍රතිලාභ භුක්තිවිඳීමෙන් වැලැක්වීමට පියවර ගත යුතුය. සමාලෝචනය කරන ලද වසර තුළදී මෙවැනි තත්ත්වයක් පැන නැඟී නොමැත.	✓
4.	**කාර්යයන් පැවරීම**	
	අධ්‍යක්ෂ මණ්ඩලය තම කාර්යයන් පැවරීමේදී පහත සඳහන් අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.	
4.1	**වගකීම් බෙදීම**	
	බලතල සහ අධිකාරිය අතර වැඩි තුලනයක් සහතික කිරීම සඳහා, බලතල කිසිදු පුද්ගලයෙකු වෙත සංකේන්ද්‍රණය නොවන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් සහ ප්‍රධාන කළමනාකරණ මට්ටමින් වගකීම් පැහැදිලි ලෙස බෙදා හැරිය යුතුය. අධිකාරියේ අනවශ්‍ය සංකේන්ද්‍රණය වැළැක්වීම සඳහා සාධාරණ බලගැන්වීමක් සහ ඵලදායී පාලනයක් සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකාරිත්වය අතර පැහැදිලි රාජකාරි වෙන් කිරීමක් පවත්වා ගෙන යනු ලැබේ. මේ සම්බන්ධයෙන්, යහපාලන ආඥා පනතේ දක්වා ඇති විධිවිධාන කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.	✓
4.2	**අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සඳහා නිශ්චිත කරුණු**	
	බැංකුවේ මඟ පෙන්වීම සහ පාලනය ස්ථිරවම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධිකාරිය යටතේ පවතින බව සහතික කිරීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ සඳහා විශේෂයෙන් වෙන් කර ඇති විධිමත් කරුණු කාර්ය සටහනක් තිබිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් කර ඇති බලතල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ ඇතුළත් කර ඇත.	✓
4.3	**පැවරීම සඳහා ඇති සීමාවන්**	
	අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ කාර්යයන් ඉටු කිරීමට ඇති හැකියාව සැලකිය යුතු ලෙස බාධා කරන හෝ අඩු කරන ප්‍රමාණයකට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කිසිදු කරුණක් අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවකට, ප්‍රධාන විධායක නිලධාරියාට, විධායක අධ්‍යක්ෂවරුන්ට හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට පැවරිය නොහැක. බැංකුවේ කටයුතු සඳහා අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන අතර, ඵලදායී අධීක්ෂණය සහ වගවීම ක්‍රියාත්මක කිරීමේ හැකියාවට හානි වන ආකාරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවලට හෝ කළමනාකරණයට කටයුතු පවරන්නේ නැත.	✓

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර	අනුකූලතාවය
4.4	**පැවරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම**	
	ක්‍රියාත්මක වන පැවරුම් ක්‍රියාවලීන් බැංකුවේ අවශ්‍යතා වලට අදාළව පවතින බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒවා වරින් වර සමාලෝචනය කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින් වර ක්‍රියාත්මක වන පැවරුම් ක්‍රියාවලීන් සමාලෝචනය කර අනුමත කරන අතර පැවරුම් ප්‍රමාණය බැංකුවේ අවශ්‍යතා සපුරාලන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ කාර්යයන් ඵලදායී ලෙස ඉටු කිරීමට හැකි වන බව සහතික කරයි. මෙම ක්‍රියාවලියේදී යහපාලන ආඥා පනතේ විධිවිධාන සලකා බලනු ලැබේ.	✓
5.	**සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී**	
	සෑම බැංකුවකම කළමනාකරණයේ ප්‍රධාන අංශ දෙකක් තිබේ, එනම්, (අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමස්ත පාලනය සහ (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ගික අරමුණු, ආයතනික වටිනාකම්, සමස්ත අවදානම් ප්‍රතිපත්තිය සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි වලට අනුකූලව ප්‍රධාන විධායක නිලධාරියා විසින් බැංකුවේ ව්‍යාපාරයේ දෛනික කළමනාකරණය. සභාපතිවරයාගේ සහ "මහා කළමනාකාරතුමා" ලෙස නම් කර ඇති ප්‍රධාන විධායක නිලධාරීගේ භූමිකාවන් වෙනම පුද්ගලයන් දෙදෙනෙකු විසින් දරනු ලැබේ. සභාපතිවරයාගේ සහ මහා කළමනාකාරතුමාගේ අදාළ වගකීම් පැහැදිලිව අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ නිර්වචනය කර ඇත.	✓
5.1	**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී අතර වගකීම් බෙදා හැරීම**	
	සභාපති හා ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යභාරයන් වෙන් කළ යුතු අතර, මෙම කාර්යයන් තනි පුද්ගලයෙකු විසින් සිදු නොකළ යුතුය. සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරියා අතර වගකීම් බෙදා හැරීම පැහැදිලිව ස්ථාපිත කර ලිඛිතව දක්වා තිබිය යුතුය. ලංකා බැංකුවේ සභාපති තනතුර හා මහා කළමනාකරු වශයෙන් හඳුන්වන ප්‍රධාන විධායක තනතුර පුද්ගලයින් දෙදෙනෙකු විසින් දරනු ලැබේ. සභාපතිතුමන්ගේ සහ මහා කළමනාකරුගේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි විස්තර වෙයි.	✓
5.2	**සභාපතිවරයාගේ යෝග්‍යතාවය**	
	(අ) සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතුය. මූලික පත්වීමෙන් පසු සභාපතිවරයා ස්වාධීන නොවන අවස්ථාවකදී, අන්තර්කාලීන විධිවිධානයක් ලෙස, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සුදුසු ලේඛනගත නියමයන් සහිතව මාස හයකට නොඉක්මවන කාලයක් සඳහා ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයා ලෙස නම් කළ යුතුය. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ තනතුර බැංකුවේ වාර්ෂික වාර්තාවේ හෙළි කළ යුතුය. 2026 වසරේ සිට බැංකුවේ ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයා ලෙස දර්ශන ගුණසේකර මහතා පත් කර ඇත.	
	(ආ) දැනට ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකු සභාපතිවරයා ලෙස සේවය කරන විට, එවැනි අධ්‍යක්ෂවරයෙකුට 2027.12.31 දිනෙන් ඔබ්බට නොයන තවත් කාලයක් සඳහා, නියෝග අංක 3 ඇතුළුව අදාළ නීති සහ රෙගුලාසි වලට යටත්ව සභාපතිවරයා ලෙස සේවය කළ හැකිය. අදාළ නොවේ.	
	(ඇ) මෙම වගන්තිය ක්‍රියාත්මක වන දිනට පසුව පත් කරන ලද සභාපතිවරයෙකු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතුය. ඉදිරියේදී අනුකූල වනු ඇත.	
5.3	**සභාපතිවරයාගේ වගකීම්**	
	සභාපතිවරයා විසින්:	
	(අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබා දිය යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස ක්‍රියා කරන බවත්, එහි වගකීම් නිසි ලෙස ඉටු කරන බවත් සහතික කළ යුතුය; සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයට උපායමාර්ගික නායකත්වය සපයන අතර, අවංකභාවය, වගවීම සහ ඉහළ කාර්යසාධනය පිළිබඳ සංස්කෘතියක් ප්‍රවර්ධනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය තම අධීක්ෂණ, භාරකාරත්ව සහ පාලන වගකීම් ඉටු කිරීමේදී අදාළ නීති, රෙගුලාසි සහ සාර්ථක ක්‍රමවේදයන්ට අනුකූල වෙමින් ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බව සහතික කරයි.	✓
	(ආ) ප්‍රධාන ගැටළු කාලීන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සාකච්ඡා කරන බව සහතික කිරීම කළ යුතු වේ. නිවැරදි තීරණ ගැනීම සහ ඵලදායී අධීක්ෂණය සඳහා හැකියාව ලබා දෙමින්, සියලුම ප්‍රමාණාත්මක, උපායමාර්ගික, මූල්‍ය, අවදානම්, නියාමන සහ මෙහෙයුම් කරුණු කාලෝචිත ආකාරයකින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන බව සභාපතිවරයා සහතික කරයි.	✓
	(ඇ) අනෙකුත් අධ්‍යක්ෂවරුන් විසින් රැස්වීම්වල දී සාකච්ඡා කිරීමට යෝජනා කරන ලද ඕනෑම කරුණක් සුදුසු අවස්ථාවලදී න්‍යාය පත්‍රයට ඇතුළත් වන්නේ ද යන්න තහවුරු කරමින්, සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහාම න්‍යාය පත්‍රය අනුමත කළ යුතු වේ. සභාපතිවරයාට න්‍යාය පත්‍රය සකස් කිරීම සමාගමේ ලේකම්වරයාට පැවරිය හැකිය; මහා කළමනාකරු හරහා ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා මත පදනම්ව, න්‍යාය පත්‍රය සකස් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර බෙදා හැරීම අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරිය වෙත පවරා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් යෝජනා කරන ලද ඕනෑම අමතර අයිතමයක් නිසි ලෙස න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබේ.	✓

2024 අංක 05 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර		අනුකූලතාවය
	(ඈ)	රැස්වීමේ පැන නගින කරුණු පිළිබඳව සියළුම අධ්‍යක්ෂවරුන් නිසි ලෙස දැනුවත්ව සිටින බවට සහතික විය යුතු අතර, ප්‍රමාණවත් තොරතුරු කාලීන පදනමක් මත අධ්‍යක්ෂවරුන්ට ලැබෙන බවට ද සහතික විය යුතුය. අර්ථවත් සාකච්ඡා සඳහා පහසුකම් සැලසීම සඳහා අධ්‍යක්ෂවරුන්ට නිවැරදි, සවිස්තරාත්මක සහ කාලෝචිත තොරතුරු ලැබෙන බවත්, අධ්‍යක්ෂ මණ්ඩල සහ උපකමිටු රැස්වීම්වලදී පැන නගින කරුණු පිළිබඳව අධ්‍යක්ෂවරුන් ප්‍රමාණවත් ලෙස දැනුවත් කරන බවත් සභාපතිවරයා සහතික කරයි.	✓
	(ඉ)	අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සඳහා සම්පූර්ණ හා සක්‍රීය දායකත්වයක් ලබාදීම සඳහා සියළුම අධ්‍යක්ෂවරුන් ධෛර්යමත් කළ යුතු අතර, බැංකුවේ උපරිම වාසිය සඳහා ක්‍රියාකරන බව සහතික කිරීමට මූලිකත්වය ගත යුතුය. සභාපතිවරයා, සියලු අධ්‍යක්ෂවරුන් සාකච්ඡා සඳහා ක්‍රියාකාරීව දායක වීමට දිරිමත් කරමින් සහ බැංකුවේ සහ එහි කොටස්කරුවන්ගේ යහපත සඳහා තීරණ ගන්නා බව සහතික කරමින්, සියලු දෙනා ඇතුළත් සහ සහභාගීත්ව අධ්‍යක්ෂ මණ්ඩල සංස්කෘතියක් පෝෂණය කරයි.	✓
	(ඊ)	විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායී දායකත්වය ලබාගැනීමට පහසුකම් සැපයිය යුතු අතර, විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර ඵලදායී සාකච්ඡා පැවැත්වීම සහතික කළ යුතුය. සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලයම විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. සභාපතිවරයා සියලුම අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායී සහභාගීත්වයට පහසුකම් සපයන අතර ශක්තිමත් සහ ස්වාධීන තීරණ ගැනීම සඳහා සහාය වීම සඳහා විවෘත, ඵලදායී සහ සම්බර සාකච්ඡා ප්‍රවර්ධනය කරයි.	✓
	(උ)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී විවේචනාත්මක හා ඵලදායී සාකච්ඡා පැවැත්වීමට සියලුම අධ්‍යක්ෂවරුන් දිරිමත් කිරීම සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ විරුද්ධ මත නිදහසේ ප්‍රකාශ කිරීමට සහ සාකච්ඡා කිරීමට හැකි බව සහතික කළ යුතුය; අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සභාපතිවරයා විවේචනාත්මක, විෂයානුබද්ධ සහ ඵලදායී විවාදයන් දිරිමත් කරන අතර, තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස වෙනස් හා විරුද්ධ අදහස් නිදහසේ ප්‍රකාශ කිරීම, සාකච්ඡා කිරීම සහ සුදුසු පරිදි සලකා බැලීම සහතික කරයි.	✓
	(ඌ)	ප්‍රධාන කළමනාකරණ පිරිස්, අනෙකුත් සේවකයින් හෝ වෙනත් කිසිදු විධායක රාජකාරියක් සෘජුවම අධීක්ෂණය කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම්වල නිරත නොවිය යුතුය; සභාපතිවරයා පාලන අධීක්ෂණයේ සහ කළමනාකරණ වගකීම් අතර සුදුසු වෙන්වීමක් පවත්වා ගනිමින්, ප්‍රධාන කළමනාකරණ පිරිස් හෝ සේවකයින් සෘජුවම අධීක්ෂණය කිරීමේ නිරත නොවන අතර කිසිදු විධායක හෝ මෙහෙයුම් රාජකාරියක් ඉටු නොකරයි.	✓
	(එ)	කොටස් හිමියන් සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීම සඳහා සුදුසු පියවර ගන්නා බවටත්, කොටස් හිමියන්ගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දෙන බවටත් සහතික විය යුතුය; එකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යනු ලැබේ. නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂ මණ්ඩලය සහ කොටස් හිමියා අතර සන්නිවේදන නාලිකාව ලෙස ක්‍රියා කරයි.	✓
5.4	**ප්‍රධාන විධායක නිලධාරියාගේ චර්යාව**		
	(අ)	ප්‍රධාන විධායක නිලධාරියා බැංකුවේ එදිනෙදා මෙහෙයුම් සහ ව්‍යාපාර කටයුතු කළමනාකරණය භාරව සිටින ඉහළම විධායක නිලධාරියා ලෙස කටයුතු කළ යුතු අතර වෙනත් කිසිදු විධායක කාර්යයක් ඉටු නොකළ යුතුය. බැංකුවේ එදිනෙදා කටයුතු මහා කළමනාකරුගේ වගකීම වන අතර, එම අධිකාරියේ විෂය පථය පැහැදිලිව නිර්වචනය කර අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ දක්වා ඇත.	✓
	(ආ)	බලපත්‍රලාභී බැංකුවක පරිපාලිත ආයතනයක හෝ ආශ්‍රිත සමාගමක විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස හැර, ප්‍රධාන විධායක නිලධාරියා වෙනත් බලපත්‍රලාභී බැංකුවක හෝ වෙනත් සමාගමක/ ආයතනයක/ සංවිධානයක සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීම හෝ නම් කිරීම නොකළ යුතුය. අනුකූල වී ඇත.	✓
	(ඇ)	බලපත්‍රලාභී බැංකුවක පරිපාලිත ආයතනයක හෝ ආශ්‍රිත සමාගමක විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස ප්‍රධාන විධායක නිලධාරියා පත් කරනු ලැබුවහොත්, ප්‍රධාන විධායක නිලධාරියා ලෙස වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට එම රාජකාරි බලපාන්නේ නැති බවට ඔහු/ ඇය සහතික විය යුතුය. එවැනි ඕනෑම පත්වීමක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත් වන අතර ප්‍රධාන විධායක නිලධාරීගේ ඵලදායී වගකීම් ඉටු කිරීමට එය බාධාවක් නොවේ.	✓
5.5	**ප්‍රධාන විධායක නිලධාරීගේ යෝග්‍යතාවය**		
	ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත් කරන ලද පුද්ගලයා බැංකු පනතේ 44A සහ 76H වගන්තියට අනුව එවැනි තනතුරක් දැරීමට සුදුසු සහ සරිලන පුද්ගලයෙකු විය යුතු අතර, බැංකුවේ මෙහෙයුම්වල විශාලත්වය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණත්වය මත පදනම්ව මූලික බැංකු කාර්යයන්හි ප්‍රමාණවත් අධිකාරියක්, පෞරුෂය, දැනුම, නිපුණතා සහ විශේෂඥතාව තිබිය යුතුය. 44 A වගන්තියට අනුව, ප්‍රධාන විධායක නිලධාරියා තනතුර දැරීමට සුදුසු සහ සරිලන පුද්ගලයෙකු බව නාමයෝජනා සහ යහපාලන කමිටුව සහතික කරන අතර අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඔහු සතු වේ. මහා කළමනාකරු පත් කිරීමට අදාළ ක්‍රියා පටිපාටිය මහා කළමනාකරු පත් කිරීම පාලනය කරන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තියක දක්වා ඇති අතර එම භූමිකාව සඳහා අවශ්‍ය කුසලතා, පළපුරුද්ද සහ දැනුම එහි දක්වා ඇත. ඒ අනුව, නාමයෝජනා සහ යහපාලන කමිටුවේ නිර්දේශය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් පසුව, 2025 දී වයි ඒ ජයතිලක මහතා නව මහා කළමනාකරු ලෙස පත් කරන ලදී.	✓

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර	අනුකූලතාවය
6.	**අධ්‍යක්ෂ මණ්ඩල කමිටු**	
	මෙම නියෝගවල 6.2 - 6.6 විධානවල දක්වා ඇති පරිදි, සෑම බලපත්‍රලාභී බැංකුවකටම අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල කමිටු පහක්වත් තිබිය යුතුය.	
6.1	**අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු සඳහා අදාළ කොන්දේසි**	
	(අ) සෑම උපකමිටුවක්ම අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කළ යුතුය අදාළ උපදෙස් වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු පහක් එනම් විගණන කමිටුව, මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව, නාමයෝජනා සහ යහපාලන කමිටුව, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව ස්ථාපිත කර ඇති අතර එම කමිටු සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. ඊට අමතරව, තවත් උපකමිටු තුනක් වන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කමිටුව, තිරසාරභාවය පිළිබඳ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව ද ක්‍රියාත්මක වේ. සෑම උපකමිටුවක්ම පැහැදිලිව නිර්වචනය කරන ලද විෂය පථයන් යටතේ ක්‍රියාත්මක වන අතර, මෙම විෂය පථයන්ගේ අඛණ්ඩ අදාළත්වය සහ ඵලදායීතාවය සහතික කිරීම සඳහා වාර්ෂිකව සමාලෝචනය කෙරේ.	✓
	(ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක් එක් උපකමිටුවේ අධිකාරිය, විශේෂයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ක්‍රියා කිරීමට කමිටුවට බලය තිබේද නැතහොත් නිශ්චිත ගැටළුවක් පරීක්ෂා කර නිර්දේශ සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීමට බලය තිබේද යන්න සඳහන් කළ යුතුය. ප්‍රධාන වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු පිහිටුවා ඇත්තේ ඒවායේ අදාළ බලතල තුළ ඇති නිශ්චිත කරුණු පරීක්ෂා කිරීම, අධීක්ෂණය කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයට සලකා බැලීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට බව විෂය පථයන්හි සඳහන් වේ. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවලට අනුමත කිරීමට හෝ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ක්‍රියා කිරීමට බලයක් නොමැත. නමුත් ණය පහසුකම් අනුමත කිරීමට අදාළව අධ්‍යක්ෂ මණ්ඩලයට පවරා ඇති කාර්යයන් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ අරමුණින්, අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුවට ණය පහසුකම් අනුමත කිරීම සඳහා බල සීමාවක් පවරා ඇත. සියලුම වැදගත් තීරණ ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් කර ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු උපදේශක ධාරිතාවයකින් ක්‍රියාත්මක වේ. මෙම උපකමිටු අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහාය වීම සඳහා ශක්තිමත් විශ්ලේෂණ සහ තොරතුරු මත පදනම් වූ නිර්දේශ ඉදිරිපත් කරයි. මෙම රාමුව පැහැදිලි වගවීම සහතික කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත වගකීම ලිහිල් වීම වළක්වමින්, ඵලදායී පාලනය සහ නියාමනය ශක්තිමත් කරයි.	✓
	(ඇ) සෑම කමිටුවකටම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විෂය පථයන් තිබිය යුතුය.	✓
	(ඈ) රැස්වීම් සංවිධානය කිරීමට සහ කමිටුවේ සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ ප්‍රමාණවත් විස්තරාත්මක වාර්තා පවත්වා ගැනීමට සෑම කමිටුවක් සඳහාම ලේකම්වරයෙකු පත් කළ යුතුය. සියලුම කමිටුවල රැස්වීම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කමිටුව, තිරසාරභාවය පිළිබඳ කමිටුව සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව හැර අනෙකුත් සියලුම උපකමිටු වල ලේකම් ලෙස කටයුතු කරන අතර, අදාළ සභාපතිවරුන්ගේ අධීක්ෂණය යටතේ රැස්වීම් වාර්තා සහ අදාළ අනෙකුත් වාර්තා පවත්වාගෙන යාම සඳහා වගකිව යුතුය. ප්‍රධාන තොරතුරු නිලධාරී, සහකාර මහා කළකමනාකාරිණී (අයවැය, ක්‍රමෝපායික සැලසුම් හා කළමනාකරණ තොරතුරු පද්ධති) සහ සහකාර මහා කළකමනාකාරිණී (තිරසාර බැංකුකරණය) පිළිවෙලින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කමිටුවේ, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවේ සහ තිරසාරභාවය පිළිබඳ කමිටුවේ ලේකම්වරුන් ලෙස සේවය කරයි. සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් විස්තර කරන උපකමිටු වාර්තා මෙම වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇත.	✓
	(ඉ) එක් එක් උපකමිටුවේ ගණපූරණය සඳහා කමිටු සාමාජිකයින්ගෙන් අවම වශයෙන් අඩකින් සමන්විත විය යුතුය.	✓
	(ඊ) වාර්ෂික මහා සභා රැස්වීමේදී, එක් එක් උපකමිටුවේ කාර්යසාධනය, රාජකාරී සහ භූමිකාවන් පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කළ යුතුය. රජය එකම කොටස් හිමියා වන බැවින්, ඉහත සඳහන් කරුණු වලින් සමන්විත බැංකුවේ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට සහ බැංකුව අදාළ වන අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබේ.	✓
6.2	**විගණන කමිටුව**	
	(අ) විගණන කමිටුවේ සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විය යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ වෙනත් කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවක සභාපතිවරයා නොවිය යුතුය. ඊට අමතරව මූල්‍ය, ගිණුම්කරණය සහ/හෝ විගණනය පිළිබඳ සුදුසුකම් සහ පළපුරුද්ද තිබිය යුතු අතර, පිළිගත් වෘත්තීය ගිණුම්කරණ ආයතනයක සාමාජිකත්වයක් තිබිය යුතුය. විගණන කමිටුවේ සභාපතිත්වය 2025 මැයි 30 වන දින දක්වා ජයමින් පැල්පොල මහතා විසින් දරන ලදී. ඔහු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස සලකනු ලැබූ අතර අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ජයමින් පැල්පොල මහතා සතු විය. 2025 මැයි 30 වන දින ඔහු ඉල්ලා අස්වීම ඉදිරිපත් කිරීමෙන් පසුව, 2025.08.15 දින සිට බලපැවැත්වෙන පරිදි අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ දර්ශන ගුණසේකර මහතා විගණන කමිටුවේ සභාපති ලෙස පත් කරන ලදී.	✓
	(ආ) විගණන කමිටුවේ සියලුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතු අතර, බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරුන් විය යුතුය. බැංකුවේ මෙහෙයුම්වල ප්‍රමාණය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණත්වයට අනුරූපව මූල්‍ය, ගිණුම්කරණය සහ විගණනය පිළිබඳ කුසලතා සහ විශේෂඥ දැනුමේ සාමූහික සමතුලිතතාවයක් සාමාජිකයින්ට තිබිය යුතුය. වත්මන් විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් (04) සමන්විත වන අතර, ඉන් තිදෙනෙකු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.	✓

2024 අංක 05 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර		අනුකූලතාවය
	(ඇ)	විගණන කමිටුවේ සාමාජිකයින් බහුතරයක් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් නොවිය යුතු අතර ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් බහුතරයක් ද විගණන කමිටුවේ සාමාජිකයින් නොවිය යුතුය.	✓
	(ඈ)	විගණන කමිටුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කළ යුතුය:	✓
		(i). විගණන සේවා සැපයීම සඳහා අදාළ ප්‍රඥප්තියට අනුකූලව බාහිර විගණකවරයෙකු පත් කිරීම. විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වන බැවින්, බැංකුවේ බාහිර විගණකවරයා පත් කිරීමේදී කමිටුවට කිසිදු කාර්යභාරයක් නොමැත.	
		(ii). මහ බැංකුව විසින් විගණකවරුන් වෙත වරින් වර නිකුත් කරන ලද මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම.	
		(iii). අදාළ ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කිරීම.	
		(iv). බාහිර විගණකගේ සේවා කාලය, විගණන ගාස්තුව සහ ඔහුගේ ඉල්ලා අස්වීම හෝ සේවයෙන් පහ කිරීම; මෙහි දී බාහිර විගණකගේ සේවය ලබා ගැනීම වසර හයක් නොඉක්මවිය යුතු අතර සෑම වසර තුනකට වරක්ම නිශ්චිත විගණක හවුල්කරු වෙනස් කළ යුතුය. විගණන කමිටු ප්‍රඥප්තියේ නියමයන්ට අනුකූලව, කමිටුව විසින් පහත නිර්දේශ ඉදිරිපත් කරයි: - මහ බැංකුව විසින් විගණකවරුන්ට කලින් කල නිකුත් කර ඇති මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම. - අදාළ ගිණුම්කරණ ප්‍රමිත භාවිතය.	
	(ඉ)	බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය, විෂය මූලිකත්වය සහ විගණන ක්‍රියාවලියේ සඵලදායකත්වය, අදාළ ප්‍රමිතීන් සහ මනා පරිචයන් අනුව සමාලෝචනය කිරීම කමිටුවේ කාර්යයකි. විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වන නිසා ඔහුගේ ස්වාධීනත්වය හා සඵලතාව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සහතික කර ඇත.	✓
	(ඊ)	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ යටතේ බාහිර විගණකවරුන්ට අවසර දී ඇති විගණන නොවන සේවාවන් සැපයීම සඳහා බාහිර විගණකවරයෙකු සම්බන්ධ කර ගැනීම පිළිබඳ ප්‍රතිපත්තියක් කමිටුව විසින් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. බාහිර විගණකවරයෙකු විසින් විගණන නොවන සේවාවන් සැපයීම බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වයට හෝ වෛෂයිකභාවයට හානි නොවන බවට කමිටුව සහතික විය යුතුය. විගණන නොවන සේවාවන් සැපයීම සම්බන්ධයෙන් බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය හෝ වෛෂයිකභාවය තක්සේරු කිරීමේදී, කමිටුව විසින් පහත කරුණු සළකා බැලිය යුතුය:	
		(i). විගණන සමාගමේ නිපුණතා සහ පළපුරුද්ද විගණන නොවන සේවා සැපයීම සඳහා යෝග්‍ය වන්නේ ද නැද්ද යන්න	
		(ii). බාහිර විගණකවරයා විසින් එවැනි සේවා සැපයීමේදී විගණනයේ ස්වාධීනත්වය හා/ හෝ විෂය මූලිකභාවය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇද්දැයි යන්න සහ	
		(iii). විගණන නොවන සේවාවල ස්වභාවය, විගණන සමාගමට සාපේක්ෂව එක් එක් ගාස්තු මට්ටම් හා සමුච්චිත ගාස්තු මට්ටම් යනාදිය බාහිර විගණකවරයාගේ විෂය මූලිකභාවයට හෝ ස්වාධීනත්වයට කිසියම් බලපෑමක් කරන්නේ ද යන වග. බැංකුවේ විගණක විගණකාධිපති බැවින් මෙය පැහැ නොනඟී. විගණකාධිපති විසින් ඔහුගේ සහයට පත් කරන ලද බාහිර විගණක ආයතනය බැංකුවේ විගණන නොවන කටයුතු සඳහා යොදා ගන්නා විට එම විගණක ආයතනයේ ස්වාධීනත්වයට හෝ විෂය මූලිකභාවයට බලපෑමක් නොකරන බවට කමිටුව සහතික කරයි.	
	(උ)	කමිටුව, බාහිර විගණක සමඟ විගණනයේ ස්වභාවය සහ විෂය පථය සම්බන්ධයෙන් පහත කරුණු විගණනය ආරම්භ කිරීමට පෙර සාකච්ඡා කර අවසන් කළ යුතුය : (i). අදාළ ආයතනික නීති සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ කළමනාකරණයේ අභ්‍යන්තර පාලන විධිවිධානවලට බැංකුවේ අනුකූලවීම පිළිබඳ ඇගැයීමක්. (ii). අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කිරීමේ අවශ්‍යතාවයන් අනුව බාහිර අවශ්‍යතා වෙනුවෙන් මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම. (iii). එක් විගණන සමාගමකට වඩා වැඩි සංඛ්‍යාවක් සම්බන්ධ වන විට ඒවා අතර සම්බන්ධීකරණය යනාදියයි. 2025 වර්ෂයේ විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය විගණකාධිපතිවරයා සහ විගණනය සඳහා විගණකාධිපතිවරයාට සහාය වූ අර්නස්ට් සහ යංග් වරලත් ගණකාධිකාරී ආයතනය විසින් තීරණය කර ඇත. 2025 වර්ෂය සඳහා විගණන සැලැස්ම අර්නස්ට් සහ යංග් වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ඉදිරිපත් කළ අතර, විගණන කමිටුව යෝජිත සැලැස්ම සමාලෝචනය කර එකඟ විය.	✓
	(ඌ)	බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ වැඩි විනිවිදභාවයක් සහ අඛණ්ඩතාවයක් සහ ගිණුම්කරණයේ සහ අනෙකුත් අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව සහතික කිරීමේ අරමුණින් කමිටුව ගිණුම්කරණ ප්‍රතිපත්ති/ පද්ධති සහ අභ්‍යන්තර පාලන රාමුව සමාලෝචනය කළ යුතුය.	✓
	(එ)	තොරතුරු අනාවරණය කිරීම සඳහා බැංකුව විසින් නිකුත් කරනු ලබන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන එහි වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තාවල සත්‍යතාවය සහ ඒවායේ අඩංගු මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් පරීක්ෂා කිරීම සඳහා කමිටුව විසින් බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කළ යුතුය. බැංකුවේ වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර කමිටුව විසින් විශේෂයෙන් අවධානය යොමු කළ යුතු කරුණු වන්නේ; (i). ප්‍රධාන විනිශ්චයන් සහිත ක්ෂේත්‍ර, (ii). ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පරිචයන්ගේ සඳහා වූ වෙනස්කම්, (iii). විගණනය තුළින් ඇති වූ ප්‍රධාන ගැලපීම්	✓

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර	අනුකූලතාවය
	(iv). අබණ්ඩ පැවැත්මේ උපකල්පනයන් සහ	
	(v). අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලවීම ආදියයි.	
	කමිටුව විසින් බැංකුවේ මාසික, කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන අබණ්ඩව සමාලෝචනය කරන අතර, ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට සිය නිර්දේශ ඉදිරිපත් කරයි.	
(ඒ)	කමිටුව විසින් අතුරු සහ වර්ෂ අවසාන විගණන මඟින් මතුවන ගැටළු, ප්‍රශ්න සහ අනෙකුත් දේ සාකච්ඡා කළයුතු අතර, ප්‍රධාන විධායක නිලධාරිගේ සහ/හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ සහභාගිත්වය නොමැතිව විගණකවරයාට සාකච්ඡා කිරීමට අවශ්‍ය දෑ වේ නම් ඒවාද ඇතුළු අනෙකුත් කරුණු ද අවශ්‍ය විට සාකච්ඡා කළ යුතුය.	✓
	කමිටුව විසින් අතුරු සහ වසර අවසාන විගණන මඟින් මතුවන ගැටළු, ප්‍රශ්න සහ අනෙකුත් දේ සාකච්ඡා කරයි. විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වන අතර, ඔහුගේ නියෝජිතයෙකු විගණන කමිටුව සමඟ සංවෘත සාකච්ඡා වලට ඉදිරිපත් වෙයි. සමාලෝචනය කරන ලද වර්ෂය තුළ එක් සංවෘත සාකච්ඡාවක් පැවැත්වුන අතර, ඒ සඳහා නිතිපතා පවත්වන විගණන කමිටු න්‍යාය පත්‍රයට අයිතම ඇතුලත් කිරීම මගින් පහසුකම් සපයනු ලැබේ.	
(ඔ)	කමිටුව බාහිර විගණනයේ කළමනාකරණ ලිපිය හා එයට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කළ යුතුය.	✓
(ඕ)	බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය පිළිබඳව කමිටුව විසින් පහත දැක්වෙන පියවර ගත යුතුය:	
	(i). අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ සම්පත් ප්‍රමාණවත්ද යන්න සමාලෝචනය හා සිය කටයුතු කරගෙන යාම සඳහා දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය බලය තිබේද යන්න පිළිබඳව සෑහීමකට පත් වීම.	✓
	අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ සම්පත්හි ප්‍රමාණාත්මකභාවය සම්බන්ධයෙන් විගණන කමිටුව සමාලෝචනය කර අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ පවතින/ අවශ්‍ය කාර්ය මණ්ඩල පිහිටීම ඇතුළත් වූ කාල සීමාවක් සහිත විගණන සැලැස්මක්, කමිටුව විසින් සලකා බලන ලදී.	
	(ii). අභ්‍යන්තර විගණන වැඩසටහන හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය සහ අදාළ වන පරිදි අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත උචිත ක්‍රියාමාර්ග ගෙන තිබේදැයි සහතික කිරීම.	✓
	කමිටුව අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන කටයුතුවල ප්‍රතිඵල සමාලෝචනය කරන අතර, විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීමට සුදුසු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන බව සහතික කරයි.	
	(iii). ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ හා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම හෝ තක්සේරු කිරීම සමාලෝචනය කිරීම.	✓
	2025 වර්ෂය සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්යසාධන ඇගයීම කමිටුව විසින් සිදු කරන ලද අතර,ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් පවත්වන ලද අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කාර්යසාධන ඇගයීම් ද කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.	
	(iv). ප්‍රධාන අභ්‍යන්තර විගණක, ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් හා අභ්‍යන්තර විගණන කාර්යය සඳහා බාහිර සේවා සපයන්නන් බඳවා ගැනීම හා සේවය අවසන් කිරීම පිළිබඳ නිර්දේශ කිරීම.	✓
	අභ්‍යන්තර විගණන ප්‍රධානියා වනම් ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාට අදාළව, අනුකූල වීය.	
	(v). ප්‍රධාන අභ්‍යන්තර විගණක ද ඇතුළුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයේ හා බාහිර සේවා සම්පාදකයන්ගේ ඉල්ලා අස්වීම් පිළිබඳව කමිටුව දැනුවත් කරන බවට ද ඉල්ලා අස්වන ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයට හා බාහිර සේවා සම්පාදකයන්ට තමන් ඉල්ලා අස්වීමට හේතු ඉදිරිපත් කරන්නට අවස්ථාවක් සලසා දී ඇති බවට සහතික වීම.	✓
	මෙබඳු අවස්ථාවක් වසර තුළ පැන නැඟුනේ නැත.	
	(vi). අභ්‍යන්තර විගණනය, එහි විගණනයට බඳුන්වන කටයුතු වලින් ස්වාධීන වන බවට හා අපක්ෂපාතීව, ප්‍රවීණතාවයෙන් යුක්තව හා නිසි වෘත්තීය සැලකිල්ල සහිතව ඉටු කෙරෙන බවට සහතික වීම.	✓
	බැංකුවේ සංවිධානාත්මක ව්‍යුහයට අනුකූලව, ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා සෘජුවම විගණන කමිටුවට වාර්තා කරන අතර බැංකුවේ මෙහෙයුම් කාර්යයන්ගෙන් ස්වාධීනව කටයුතු කරයි.	
(ක)	කමිටුව, අභ්‍යන්තර විමර්ශනයන් හි ප්‍රධාන පෙළේ නිගමන හා ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සලකා බැලිය යුතුය.	✓
	විගණක කමිටුව, අභ්‍යන්තර විමර්ශනයන් හි ප්‍රධාන පෙළේ නිගමන හා ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කළේය .	
(ග)	අදාළ න්‍යාය පත්‍ර අයිතමය සඳහා කමිටුවේ ආරාධනයෙන් අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, ප්‍රධාන විධායක නිලධාරි, ප්‍රධාන මූල්‍ය නිලධාරි, ප්‍රධාන අවදානම් නිලධාරි, ප්‍රධාන අනුකූලතා නිලධාරි, වෙනත් ඕනෑම ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකුට සහ බාහිර විගණකවරුන්ගේ නියෝජිතයෙකුට රැස්වීම්වලට සහභාගී විය හැකිය. කෙසේ වෙතත්, කමිටුව විසින් විධායක අධ්‍යක්ෂවරුන් නොමැතිව, අවම වශයෙන් වසරකට දෙවරක්වත්, බාහිර විගණකවරුන් හමුවිය යුතුය.	✓
	ප්‍රධාන මූල්‍ය නිලධාරි, ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන අවදානම් නිලධාරි, ප්‍රධාන අනුකූලතා නිලධාරි හා විගණකාධිපතිවරයාගේ නියෝජිතවරයා කමිටු රැස්වීම් වලට සහභාගි විය. මහා කළමනාකාරතුමාද කමිටුවේ ආරාධනය මත රැස්වීම් වලට සහභාගි විය. කළමනාකාරිත්වයේ සාමාජිකයන් අවශ්‍යතාවය මත, කරුණු පැහැදිලි කිරීම සඳහා කැඳවනු ලබති. "සංවෘත සාකච්ඡා" රැස්වීම්වල න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති අතර විගණකාධිපතිවරයාගේ නියෝජිතයා අවශ්‍යතාවය තීරණය කරයි. විධායක නිලධාරීන් නොමැතිව විගණකාධිපතිවරයාගේ නියෝජිතයා සමඟ එක් සංවෘත සාකච්ඡාවක් වර්ෂය තුළ පවත්වන ලදී.	

2024 අංක 05 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර		අනුකූලතාවය
	(ජ)	කමිටුව සතුව i. විෂය පථයට අයත් වන කරුණක් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා ප්‍රකාශිත අධිකාරිය ii. එසේ කටයුතු කරන්නට අවශ්‍ය සම්පත්; iii. තොරතුරු සඳහා පූර්ණ ප්‍රවේශය, සහ iv. අවශ්‍ය නම්, බාහිර වෘත්තීය උපදෙස් ලබා ගැනීමට හා අදාළ පළපුරුද්ද සහිත බාහිර පාර්ශ්වයන්ට රැස්වීම් සඳහා ආරාධනා කිරීම උදෙසා අධිකාරිය තිබිය යුතුය.	✓
	(ට)	කමිටුව, සාකච්ඡාවට නියමිත කරුණු පිළිබඳ නිසි දැනුම්දීමක් සහිතව ක්‍රමිකව රැස්විය යුතු අතර, සිය කාර්යයන් හා වගකීම් ඉටු කිරීමෙහි දී එළඹී නිගමනයන් වාර්තාගත කළ යුතුය. විගණන කමිටුව ක්‍රමිකව රැස්වීම් පැවත්වීය. අවශ්‍ය කරන පරිදි අතිරේක රැස්වීම් පවත්වනු ලැබේ. ඒ අනුව මෙම වසර තුළ දී නව වතාවක් කමිටුව රැස්වන ලදී. කමිටුවේ සාමාජිකයන් වෙත සාකච්ඡාවට භාජනය වන කරුණු පිළිබඳ කල් ඇතිව දැනුම් දී ඇති අතර, එහි බලතල හා වගකීම් ඉටු කිරීමේදී එළඹෙන නිගමනයන් නිසි පරිදි වාර්තා කර ඇත.	✓
	(ඩ)	කමිටුවේ ලේකම් (සමාගම් ලේකම් හෝ ප්‍රධාන අභ්‍යන්තර විගණක විය හැක) කමිටු රැස්වීම්වල වාර්තා සවිස්තරව වාර්තා ගත කර පවත්වාගෙන යා යුතුය. කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන ලංකා බැංකුවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් රැස්වීම්වල වාර්තා පවත්වා ගනු ලබයි.	✓
	(ත)	කමිටුව විසින් පහත සඳහන් දේවල් සහතික කළ යුතුය : (i). අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විසිල්බිලෝවිං ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම.	✓
		(ii). එවැනි කරුණු පිළිබඳ සාධාරණ හා ස්වාධීන විමර්ශනයක් සඳහා සහ සුදුසු පසු විපරම් ක්‍රියාමාර්ග සඳහා නිසි විධිවිධාන ක්‍රියාත්මක වන බව. මෙම කරුණු ආවරණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලත් 'විසිල්බ්ලෝවිං ප්‍රතිපත්තියක්' ස්ථාපිත කර ඇති අතර 2025 වර්ෂය තුළ සමාලෝචනය කරන ලදී. සැලකිය යුතු මට්ටමේ සොයා ගැනීම්, උචිත පසු විපරම් කටයුතු සඳහා විගණන කමිටුවට වාර්තා කරනු ලබයි.	✓
	(ප)	බාහිර විගණකවරයා සමඟ බැංකුවේ සබඳතා අධීක්ෂණය කිරීම සඳහා වන ප්‍රධානතම නියෝජන මණ්ඩලය ලෙස කමිටුව කටයුතු කළ යුතුය. ලංකා බැංකුව සම්බන්ධයෙන්, බාහිර විගණක, එනම් විගණකාධිපති සමඟ බැංකුවේ සබඳතා අධීක්ෂණය කිරීම සඳහා ප්‍රධාන නියෝජිතයා විගණන කමිටුව වන අතර බැංකුවේ බාහිර විගණක වන විගණකාධිපති සමඟ සම්බන්ධීකරණ කටයුතු කරයි.	✓
6.3	**මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව**		
	කමිටුවට පහත දැක්වෙන කොන්දේසි අදාළ වේ:		
	(අ)	අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති නොවන සහ වඩාත් සුදුසු ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් සභාපතිත්වය දැරිය යුතුය;	✓
	(ආ)	කමිටුව බහුතර ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වීම වඩාත් සුදුසු වේ ;	✓
	(ඇ)	ප්‍රධාන විධායක නිලධාරියාට අදාළ කරුණු සාකච්ඡා කරන විට හැර, කමිටුවේ ආරාධනාව මත ප්‍රධාන විධායක නිලධාරියා රැස්වීම්වලට සහභාගී වීම අවශ්‍ය වේ;	✓
	(ඈ)	අධ්‍යක්ෂවරුන්ට, ප්‍රධාන විධායක නිලධාරියාට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ලබා දෙන වැටුප්, දීමනා, සේවය අවසන් කිරීමේදී හෝ විශ්‍රාම ගැනීමේදී ලබා දෙන විශේෂ ගෙවීම්/ප්‍රතිලාභ සහ අනෙකුත් මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ සම්බන්ධයෙන් වේතන ප්‍රතිපත්තිය තීරණය කිරීම කළ යුතුයි; අධ්‍යක්ෂවරුන් සඳහා වන වේතනය, ශ්‍රී ලංකා රජය විසින් අදාළ අමාත්‍යාංශය හරහා නිකුත් කරන ලද චක්‍රලේඛ/ලිපි සහ 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධන අනුව වේතන සැපයීම සිදු කෙරේ. එම චක්‍රලේඛ/ලිපි සහ ආඥා පනත මත පදනම්ව බැංකුව විසින් වේතන ප්‍රතිපත්තියක් සම්මත කර ගෙන ඇත. ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් ස්ථාපිතය. කමිටුව විසින් වසර තුනකට වරක් මහා කළමනාකාරතුමාගේ සහ ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින්ගේ පාරිශ්‍රමික පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කරයි. සමාලෝචිත වර්ෂය තුළ කමිටුව අටවරක් (08) රැස්වී ඇත.	✓
	(ඉ)	කමිටුව, අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් හා ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන් සඳහා අරමුණු හා ඉලක්ක ස්ථාපිත කළ යුතුය. කමිටුව ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා 2025 වර්ෂයට අදාළව ප්‍රධාන කාර්යසාධන දර්ශක ස්ථාපිත කරන අතර 2026 සඳහා අනුරූප ප්‍රධාන කාර්යසාධන දර්ශක ද සකසා ඇත. විධායක නොවන අධ්‍යක්ෂවරුන් සඳහා ද කාර්යසාධන ඉලක්ක වී හා සමානව සකස් කරනු ලබයි.	✓
	(ඊ)	ප්‍රධාන විධායක නිලධාරියාගේ හා ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන්ගේ කාර්යසාධනය, ඔවුන්ට ලබාදුන් ඉලක්ක හා අරමුණු සමඟ කලින් කලට ඇගයීමට ලක් කරනු ලබන අතර, පාරිශ්‍රමික, ප්‍රතිලාභ හා කාර්යසාධනය මත පදනම් අනෙකුත් ගෙවීම් සමාලෝචනය කිරීමේ පදනම නිශ්චය කළ යුතුය. ආයතනික කළමනාකාරීත්වයේ සාමාජිකයින්ගේ වර්ෂ අවසාන කාර්යසාධන ඇගයීම මෙම කමිටුව මගින් පවත්වන ලද අතර ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සහ ප්‍රධාන අනුකූලතා නිලධාරිනියගේ කාර්යසාධන ඔවුන් වාර්තාකරන අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු හරහා ඇගයීමට ලක් කරන ලදී. මහා කළමනාකරුගේ කාර්යසාධන ඇගයීම සිදු කරන ලදී. ප්‍රධාන අවදානම් නිලධාරී බැංකුවේ සේවයෙන් විශ්‍රාම යාම හේතුවෙන් ඔහු වෙනුවෙන් කිසිදු ඇගයීමක් සිදු කර නොමැත.	✓

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර	අනුකූලතාවය
	(උ) රැකියාව අවසන් කිරීමේදී හෝ විශ්‍රාම යාමේදී අධ්‍යක්ෂවරුන්ට, ප්‍රධාන විධායක නිලධාරියාට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ලබා දෙන ඕනෑම විශේෂ ගෙවීම්/මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ සඳහා කොටස් හිමියන්ගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගෙන ඇති බවට සහතික විය යුතුය. නිකුත් කරන ලද ඡන්ද අයිතිය හිමි ප්‍රාග්ධනයෙන් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජය සතුව ඇති බලපත්‍රලාභී බැංකු සම්බන්ධයෙන්, එවැනි පූර්ව අනුමැතිය භාණ්ඩාගාර ලේකම්ගෙන් ලබා ගත යුතුය; අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අදාළ වේතන ප්‍රතිපත්තියේ සඳහන් ප්‍රතිලාභ හැර, නව ගෙවීම්/ප්‍රතිලාභ සඳහා බැංකුව විසින් භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන ඇත.	✓
	(ඌ) අධ්‍යක්ෂවරුන්ට, ප්‍රධාන විධායක නිලධාරීන්ට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ගෙවන වන්දි බැංකුවේ අවදානම් අභිරුචියේ සීමාවන් තුළ ඇති බව සහතික කිරීම සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමඟ සම්බන්ධීකරණය කිරීම; සහ, මේ ලෙස කමිටුව ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමඟ සම්බන්ධීකරණයෙන්, වන්දි මුදල බැංකුවේ අනුමත අවදානම් අභිරුචියට අනුකූල බවට සෑහීමකට පත්වේ. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමඟ සම්බන්ධීකරණයෙන් මෙම අවශ්‍යතාවය සපුරාලීමට අවශ්‍ය පියවර ගෙන ඇත.	
	(එ) වංචා ඇතුළු වෙනත් කරුණු සහ අරමුදල් අනිසි ලෙස පරිහරණය කිරීමේ තත්ත්වයන් යටතේ බලපත්‍රලාභී බැංකුවට සිදුවන මූල්‍ය අලාභයට බලපත්‍රලාභී බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට සිදු කරන ලද කාර්යසාධනය මත පදනම් වූ ගෙවීම් සඳහා ක්ලෝබැක් විධිවිධාන පිළිබඳ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම. එවැනි ප්‍රතිපත්තියක් මඟින් ක්‍රියා පටිපාටිමය යෝග්‍යතාවය, සාධාරණ ශ්‍රවණය සහ විනිවිදභාවය සහතික කරමින් ක්ලෝබැක් විධිවිධාන බලාත්මක කිරීමට පෙර බලපත්‍රලාභී බැංකුව විසින් අනුගමනය කළ යුතු ක්‍රියාවලිය පැහැදිලි කළ යුතුය. බලපත්‍රලාභී බැංකුවේ ක්ලෝබැක් ක්‍රියා පටිපාටිය ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ රැකියා කොන්ත්‍රාත්තුවලට ඇතුළත් කළ යුතු අතර, පවතින ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා සමාන විධිවිධානයක් ක්‍රියාත්මක කළ යුතුය. ක්ලෝබැක් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා හඳුන්වා දෙන ලදී.	✓
6.4	**නාමයෝජනා සහ යහපාලන කමිටුව**	
	කමිටුවට පහත දැක්වෙන කොන්දේසි අදාළ වේ:	
	(අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් සභාපතිත්වය දැරිය යුතු අතර කමිටුව බහුතර ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතුය (2027.01.01 දින සිට බලාත්මක වන පරිදි). කමිටුවේ ආරාධනයෙන් ප්‍රධාන විධායක නිලධාරිවරයාට රැස්වීම්වලට සහභාගී විය හැකි අතර ඔහුට අදාළ කරුණු සාකච්ඡා කරන විට සහභාගී විය නොහැක.	✓
	(ආ) නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හඳුනා ගැනීම, නම් කිරීම සහ නිර්දේශ කිරීම සඳහා විධිමත් සහ විනිවිදභාවයෙන් යුක්ත ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කළ යුතුය; ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්, මහා කළමනාකාරතුමා සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් පත් කිරීම නාමයෝජනා සහ යහපාලන කමිටුවේ නිර්දේශය මත පදනම්ව එම කමිටුව හරහා සිදු කෙරේ. නාමයෝජනා සහ යහපාලන කමිටුව විසින් විනිවිදභාවයෙන් යුක්ත, වෛෂයික සහ කුසලතා පදනම් කරගත් ක්‍රියාවලියක් හරහා විභව අපේක්ෂකයින් හඳුනාගෙන ඇගයීමට ලක් කර පසුබිම් පරීක්ෂාවන් සිදු කරන අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශවලට අනුකූලව අපේක්ෂකයින්ගේ යෝග්‍යතාවය තක්සේරු කරයි. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් පත්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්තියෙහි මෙම ක්‍රියා පටිපාටිය දක්වා ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීමට සලකා බැලීමට අවශ්‍ය කුසලතා, පළපුරුද්ද, දැනුම ආදිය ද එහි විස්තර කරයි. 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතේ සහ එහි පසුකාලීන සංශෝධනවල නියමයන්ට අනුව, ශ්‍රී ලංකා රජය, බැංකුව අදාළ වන අමාත්‍යවරයා හරහා, අදාළ අමාත්‍යාංශයේ නියෝජිතයෙකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලබන අතර, ඔහු "නිල බලයෙන් පත් කරන ලද" අධ්‍යක්ෂවරයෙකු ලෙස නම් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මහා කළමනාකාරතුමා සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් පත් කිරීම පාලනය කරන ප්‍රතිපත්ති ද ක්‍රියාත්මක වේ.	✓
	(ඇ) නියෝග අංක 3 සහ 8.2 උපදෙස්වල දක්වා ඇති නිර්ණායකවලට අනුව සහ අනෙකුත් අදාළ නීති සහ රෙගුලාසිවල දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අදාළ තනතුරු දැරීමට සුදුසු සහ යෝග්‍ය පුද්ගලයින් බව සහතික කළ යුතුය; අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරීගේ සහ ප්‍රධාන කළමනාකරණ පිරිස්හි යෝග්‍යතාවය නාමයෝජනා සහ යහපාලන කමිටුව විසින් සහතික කළේය.	✓
	(ඈ) ප්‍රධාන අවදානම් නිලධාරී සහ ප්‍රධාන අනුකූලතා නිලධාරී තෝරා ගැනීමේදී ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක තෝරා ගැනීමේදී විගණන කමිටුවේ අදහස් ලබා ගත යුතුය;	✓
	(ඉ) වත්මන් අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩලයට නැවත තෝරා පත් කර ගැනීම සලකා බැලීම සඳහා අදාළ අධ්‍යක්ෂවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් සමස්ත ලෙස ඉටු කිරීම සඳහා ලබා දුන් කාර්යසාධනය සහ දායකත්වය වරින් වර ඇගයීම හරහා නිර්දේශ කළ යුතුය (නැතහොත් නිර්දේශ නොකළ යුතුය); අදාළ නීතිරීති හා රෙගුලාසි වලට අනුව ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයට නැවත පත් පත්කිරීම් සිදු කරනු නොලැබේ. කෙසේ වෙතත්, නව පත්වීම් සිදු කරන විට මෙය සැලකිල්ලට ගනු ලැබේ.	

2024 අංක 05 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර	අනුකූලතාවය
	(ඊ) නියෝග අංක 2.5 (ආ) අනුව කාර්තුමය වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වයේ තත්ත්වය එවැනි අධ්‍යක්ෂවරුන්ට ස්වාධීනව රාජකාරි ඉටු කිරීමේ හැකියාවට බාධාවක් විය හැකි කිසියම් ගැටුම්කාරිත්වයක් තිබේද යන්න ඇගයීමට ලක් කළ යුතු අතර ස්වාධීන තත්ත්වයට වෙනස්කම් (ඇත්නම්) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතය; කාර්තුමය වශයෙන් ඇගයීම් සිදු කරනු ලැබේ.	✓
	(උ) ප්‍රධාන විධායක නිලධාරි තනතුරට සහ ප්‍රධාන කළමනාකරණ තනතුරුවලට පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද සහ සුදුසුකම් සඳහා අවශ්‍ය ප්‍රධාන ගුණාංග වැනි නිර්ණායක කමිටුව විසින් ස්ථාපිත කළ යුතුය; සෙසු ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරි තනතුරු සඳහා තෝරා ගැනීම හෝ උසස් කිරීමට යෝග්‍යතාවය ලැබීමට අවශ්‍ය කරණු, අවශ්‍ය සුදුසුකම්ද සඳහන් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උසස් වීම් ක්‍රියාවලියක් ඇත.	✓
	(ඌ) කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අතිරේක/ නව නිපුණතාවයන් පිළිබඳ අවශ්‍යතා හා විශ්‍රාම ගන්නා අධ්‍යක්ෂවරුන්ගේ අනුප්‍රාප්තික සැලසුම් පිළිබඳව සළකා බලා, විටින් විට නිර්දේශ කළ යුතුය; ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් ක්‍රියාත්මක වන අතර එය වසර තුළ සමාලෝචනය කරන ලදී. අවශ්‍ය ඕනෑම අමතර හෝ නව විශේෂඥතාවයක් අදාළ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු විසින් හඳුනාගෙන නිර්දේශ කරනු ලැබේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ. අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන්, අනුප්‍රාප්තික සැලසුම් කිරීම පහසු කිරීම සහ සුදුසු අනුප්‍රාප්තිකයන් හඳුනා ගැනීම සඳහා කුසලතා අනුකෘතියක් පවත්වාගෙන යනු ලැබේ.	✓
	(එ) බැංකුව සතුව ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා ශක්තිමත් අනුප්‍රාප්තික සැලැස්මක් ඇති බව සහතික කළ යුතු අතර, එම සැලැස්මෙහි පහත සඳහන් දේවල් සඳහා ඵලදායී හා විනිවිද පෙනෙන ක්‍රියාවලියක් තිබිය යුතුය; (i). බැංකුවේ මෙහෙයුම්වල ප්‍රමාණය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණත්වය සැලකිල්ලට ගෙන කෙටි, මධ්‍යම හා දිගු කාලීනව අනුප්‍රාප්තිය සඳහා ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ තනතුරු ඉටු කිරීම සඳහා සුදුසුකම් ලත් සහ දක්ෂ පුද්ගලයින් (අභ්‍යන්තර/ බාහිර) හඳුනා ගැනීම; (ii). තෝරාගත් අනුප්‍රාප්තිකයින්ගේ කුසලතා/ දැනුම හිඩැස් ඇති ක්ෂේත්‍ර හඳුනාගෙන ඒවා අවම කිරීමෙන් අදාළ තනතුරු සඳහා සූදානම් කිරීම; සහ, (iii). අවම වශයෙන් වාර්ෂික පදනමින් අනුප්‍රාප්තික සැලැස්ම සමාලෝචනය කිරීම.	✓
	(ඒ) බැංකු ක්ෂේත්‍රයට අදාළ වන නීති, රෙගුලාසි, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති, නවතම තාක්ෂණික සංවර්ධනයන් සහ නැගී එන මූල්‍ය අංශයහි සහ වෙළඳපළෙහි සංවර්ධනයන් පිළිබඳව අඛණ්ඩව අධ්‍යක්ෂවරුන් යාවත්කාලීන කිරීම සහතික කළ යුතුය;	✓
	(ඔ) අධ්‍යක්ෂවරුන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන, නිතිපතා අධ්‍යක්ෂවරුන් සඳහා අවශ්‍ය පුහුණුව, ධාරිතා වර්ධනය සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කළ යුතුය; සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂවරුන් බැංකු ක්ෂේත්‍රයට අදාළ පුහුණු/ සම්මන්ත්‍රණ/ වැඩමුළු සහ ඉදිරිපත් කිරීම් 26 කට සහභාගී වී ඇත. මෙය ක්‍රියාවලිය අඛණ්ඩව සිදුවේ.	✓
	(ඕ) රාජකාරි සහ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවල ව්‍යුහය, ප්‍රමාණය, සුදුසුකම් සහ සංයුතිය සමාලෝචනය කළ යුතුය; රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය කිරීම හේතුවෙන් පැන නගින අපේක්ෂිත අධ්‍යක්ෂ මණ්ඩල පත්වීම් සැලකිල්ලට ගනිමින්, 2025 දී සම්පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලයම මෙම සමාලෝචනය සිදු කරන ලදී. නාමයෝජනා සහ යහපාලන කමිටුව හරහා, වාර්ෂික අධ්‍යක්ෂ මණ්ඩල ඇගයීමේ ප්‍රතිඵල සහ කමිටුවට ඉදිරිපත් කරන ලද තනි අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවල ඇගයීම් වාර්තා සැලකිල්ලට ගනිමින්, අධ්‍යක්ෂ මණ්ඩලය තම අධ්‍යක්ෂ මණ්ඩලයේ ව්‍යුහය, ප්‍රමාණය, සුදුසුකම්, සංයුතිය සහ සමස්ත කාර්යක්ෂමතාව සමාලෝචනය කරයි. මෙම ඇගයීම් මත පදනම්ව, සමස්ත අධ්‍යක්ෂ මණ්ඩල කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම සහ ආයතනික යහපාලනයේ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීම අරමුණු කරගනිමින්, අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවලට පත්වීම්, නැවත පත් කිරීම්, මාරු කිරීම්, සහ හඳුනාගත් පුහුණු සහ සංවර්ධන අවශ්‍යතා ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ උපකමිටුවල ව්‍යුහයන්, සාමාජිකත්වය හෝ සංයුතිය සඳහා අවශ්‍ය වෙනස්කම් පිළිබඳව කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරයි.	✓
	(ක) අදාළ වන සියලුම නීති සහ රෙගුලාසි සහ බැංකු ක්ෂේත්‍රයෙහි/ ජාත්‍යන්තර වශයෙන් හොඳම භාවිතයන් සැලකිල්ලට ගනිමින්, බැංකුවේ සමස්ත ආයතනික යහපාලන රාමුව සහ ප්‍රතිපත්ති සමාලෝචනය කර, යාවත්කාලීන කර, ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන බවට සහතික විය යුතුය.	✓
6.5	**ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව**	
	කමිටුවට පහත දැක්වෙන කොන්දේසි අදාළ වේ:	
	(අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ වෙනත් කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවක සභාපති නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් සභාපතිත්වය දැරිය යුතුය; කමිටු සංයුතිය පිළිබඳ විස්තර සඳහා කරුණාකර කමිටු වාර්තාව බලන්න.	✓
	(ආ) කමිටුව ස්වාධීන අධ්‍යක්ෂවරුන් බහුතරයක් සහිත විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. කමිටු සාමාජිකයින්ට බැංකු සහ/හෝ මූල්‍ය සේවා සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ ගැටළු සහ භාවිතයන් පිළිබඳ හොඳ සාමූහික අත්දැකීම් තිබිය යුතුය; සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ අදාළ අත්දැකීම් ඇති විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් කමිටුව සමන්විත විය.	✓

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර	අනුකූලතාවය
	(ඇ) කමිටුවේ සාමාජිකයින්ගෙන් බහුතරයක් විගණන කමිටුවේ සාමාජිකයින් නොවිය යුතු අතර, විගණන කමිටුවේ සාමාජිකයින් බහුතරයක් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් නොවිය යුතුය;	✓
	(ඈ) ණය, වෙළඳපළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම් වැනි පුළුල් අවදානම් කාණ්ඩ අධීක්ෂණය කරන ප්‍රධාන විධායක නිලධාරි, ප්‍රධාන අවදානම් නිලධාරි, ප්‍රධාන අනුකූලතා නිලධාරි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අවශ්‍යතා පදනම මත රැස්වීම්වලට සහභාගී වන ලෙස නියම කළ යුතුය; ණය, වෙළඳපළ, මෙහෙයුම්, කීර්තිනාම සහ උපායමාර්ගික අවදානම් අධීක්ෂණය කරන මහා කළමනාකාරතුමා සහ ප්‍රධාන අවදානම් නිලධාරි, ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන මූල්‍ය නිලධාරි සහ ප්‍රධාන අනුකූලතා නිලධාරි සමඟ එක්ව කමිටුවේ ඉල්ලීම පරිදි සියලුම කමිටු රැස්වීම්වලට සහභාගී වේ. අවශ්‍ය පරිදි අනෙකුත් ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ආරාධනා කරනු ලැබේ.	✓
	(ඉ) කමිටුවට පවරා ඇති අධිකාරිය සහ වගකීමේ රාමුව තුළ, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ ඉතා සමීපව කටයුතු කළ යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගත යුතුය; ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවය කළමනාකරණය සඳහා ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරන උපායමාර්ග සහ අනුමත අවදානම් අභිරුචිය සමඟ පෙළගැස්වීම සහතික කිරීම සඳහා ණය, වෙළඳපළ, මෙහෙයුම්, තොරතුරු ආරක්ෂාව සහ උපායමාර්ගික අවදානම් ඇතුළුව බැංකුවේ සියලුම ප්‍රමාණාත්මක අවදානම් කළමනාකරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයට සහ එහි කමිටුවලට නිතිපතා වාර්තා කිරීම හරහා මෙම අධීක්ෂණයට කමිටුව සහාය වන අතර, අවදානම් නිරාවරණයන් කාලෝචිත ලෙස නිරීක්ෂණය කිරීමට, අපගමනයන් හඳුනා ගැනීමට සහ සුදුසු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට එමඟින් හැකියාව ලැබේ. කමිටුවට පවරා ඇති අධිකාරියේ සහ වගකීමේ රාමුව තුළ කමිටුව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ සමීපව කටයුතු කරයි.	✓
	(ඊ) බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණය සඳහා වගකිව යුතු ස්වාධීන අවදානම් කළමනාකරණ කාර්යයක් ස්ථාපිත කළ යුතුය; බැංකුව විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත සෘජුවම වාර්තා කරන ප්‍රධාන අවදානම් නිලධාරි ප්‍රධානත්වයෙන් යුත් පූර්ණ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශයක් පවත්වාගෙන යන ලදී. මෙම අංශය සියලුම ව්‍යාපාර සහ ආදායම් උත්පාදන ඒකක වලින් ස්වාධීනව ක්‍රියාත්මක වූ අතර, ණය, වෙළඳපළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ තොරතුරු ආරක්ෂණ අවදානම් කළමනාකරණය සඳහා කැපවූ සම්පත් ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද එහි ප්‍රඥප්තිය, එහි අධිකාරිය, ස්වාධීනත්වය සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත සෘජු ප්‍රවේශය පැහැදිලිව නිර්වචනය කරයි.	✓
	(උ) සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු හරහා මාසිකව බැංකුවට අදාළ සියලුම අවදානම්, එනම් ණය, වෙළඳපළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම්, තොරතුරු ආරක්ෂාව සහ උපායමාර්ගික අවදානම් තක්සේරු කළ යුතුය. පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන්, අවදානම් කළමනාකරණය තනි සහ ඒකාබද්ධ පදනම්න් සිදු කළ යුතුය; මෙම කමිටුව විසින් නිර්දේශ කරන ලද සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති ලේඛන මත පදනම්ව, බැංකුවේ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය මාසිකව බැංකුවේ ණය, වෙළඳපළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම්, උපායමාර්ගික සහ කීර්තිනාම අවදානම් තක්සේරු කරන අතර සාරාංශ ගත වාර්තා කමිටු රැස්වීම් වලටද ඉන් පසු එළෙඹෙන ආසන්නතම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමටද ඉදිරිපත් කරනු ලැබේ. පරිපාලිත සහ ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන්, අවදානම් පිළිබඳව කටයුතු කිරීම සඳහා අවදානම් කළමනාකරණ දර්ශන පුවරුවක් සකස් කර ඇති අතර එය කමිටුවට වාර්තා කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සාමූහික අවදානම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ.	✓
	(ඌ) අවදානම් අභිරුචිකත්වයට එරෙහිව බැංකුවේ නිරාවරණයන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම සහ වාර්තා කිරීම කළ යුතුය; ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් අභිරුචිකත්ව ප්‍රකාශයට සාපේක්ෂව බැංකුවේ අවදානම් නිරාවරණයන් පිළිබඳව මාසිකව/ කාර්තුමය පදනමක් මත ව්‍යුහගත උපදෙස් සහ පුළුල් වාර්තාකරණයක් සපයන අතර, සැලකිය යුතු උල්ලංඝනයන් හෝ ආසන්න උල්ලංඝනයන් සිදු වූ විට ක්ෂණික වාර්තා සපයනු ලැබේ. 2025 දී, කමිටුව විසින් ප්‍රවණතා විශ්ලේෂණය, ආතති පරීක්ෂණ ප්‍රතිඵල සහ දුරදර්ශී අවදානම් පුරෝකථන ප්‍රකාශ සමඟ සවිස්තරාත්මක අවදානම් අභිරුචිකත්ව දර්ශන පුවරු වාර්තා ඉදිරිපත් කරන ලදී. සියලුම නිරාවරණයන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට පූර්ණ දැනුම් දීමක් ලබා දී ඇති අතර, එහි අදහස් සහ උපදෙස් විධිමත් ලෙස වාර්තා කර අවදානම් අභිරුචියට එරෙහිව ක්‍රියා කරන ලදී.	✓
	(එ) ප්‍රධාන අවදානම් නිලධාරීගේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කළ යුතුය. කමිටුවට ප්‍රධාන අවදානම් නිලධාරීගෙන් සහ අනෙකුත් අදාළ අංශ වෙතින් අවදානම් පැතිකඩ, ස්ථාපිත අවදානම් අභිරුචිකත්ව සීමාවන්ට එරෙහිව නිරාවරණය සහ සීමා උල්ලංඝනයන් සම්බන්ධයෙන් නිතිපතා වාර්තා සහ සන්නිවේදනයන් ලැබෙනු ඇත; කමිටුව ප්‍රධාන අවදානම් නිලධාරීගේ වාර්ෂික කාර්යසාධන ඇගයීම හරහා ඔහුගේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කරයි. කමිටුව ප්‍රධාන අවදානම් නිලධාරි වෙතින් නිතිපතා වාර්තා සහ සන්නිවේදනයන් ලබා ගන්නා අතර බැංකුවේ සමස්ත අවදානම් පැතිකඩ, ස්ථාපිත අවදානම් අභිරුචිකත්ව සීමාවන්ට නිරාවරණය වීම සහ එවැනි සීමාවන් උල්ලංඝනය කිරීම, අවදානම් කළමනාකරණ රාමුව ඵලදායී ලෙස අධීක්ෂණය කිරීමට හැකි වේ.	✓
	(ඒ) ප්‍රකාශිත අවදානම් අභිරුචිය සමඟ අනුකූලතාව සහතික කිරීම සඳහා, ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතා කළමනාකරණයට සඳහා සහ ණය, වෙළඳපළ, මෙහෙයුම්, තොරතුරු ආරක්ෂාව සහ උපායමාර්ගික අවදානම් වැනි බැංකුවේ සියලුම අදාළ අවදානම් කළමනාකරණය සඳහා ක්‍රියාත්මක කරන උපාය මාර්ග අධීක්ෂණය කළ යුතුය; එහි අවදානම් පාලන වගකීම්වලට අනුකූලව, කමිටුව ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් විසින් ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතා කළමනාකරණයට අදාළව ක්‍රියාත්මක කරන උපායමාර්ග සහ ණය, වෙළඳපළ, මෙහෙයුම්, තොරතුරු ආරක්ෂාව සහ උපායමාර්ගික අවදානම් ඇතුළුව බැංකුවේ සියලුම ප්‍රමාණාත්මක අවදානම් කළමනාකරණය අධීක්ෂණය කරයි. මෙම අධීක්ෂණ ප්‍රතිපත්ති, අවදානම් වාර්තා, ආතති පරීක්ෂණ ප්‍රතිඵල සහ ප්‍රධාන අවදානම් දර්ශක සමාලෝචනය කිරීම හරහා සිදු කරනු ලබන අතර, එවැනි උපායමාර්ග අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් අභිරුචිය සමඟ සමපාත වන බව සහතික කිරීම සහ බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ රාමුවට සහාය වීම සහතික කෙරේ.	✓

2024 අංක 05 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර		අනුකූලතාවය
	(ඔ)	කමිටුව විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් තුළ නිශ්චිත අවදානම් පාලනය කිරීමට සහ එම අවදානම් කළමනාකරණය කිරීමට ණය කමිටුව සහ වත්කම් වගකීම් කමිටුව වැනි අවදානම් ගැනීමේ ක්‍රියාකාරකම්වලට අදාළ සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණවත්භාවය සහ ඵලදායීතාවය සමාලෝචනය කළ යුතුය.; සියලුම කළමනාකරණ මට්ටමේ අවදානම් කමිටුවල නියමයන්, අධිකාරිය, සංයුතිය සහ ඵලදායීතාවය පිළිබඳ විධිමත් වාර්ෂික සමාලෝචනයක් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් පවත්වනු ලබන අතර, ඒවාට පහත සඳහන් කමිටු ඇතුළත් වන අතර ඒවායේ මෙහෙයුම් කාර්යක්ෂමතාව පිළිබඳ සහතිකයක් ලබා ගනු ඇත: ණය කමිටුව වත්කම්-වගකීම් කළමනාකරණ කමිටුව මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව තොරතුරු ආරක්ෂණ අවදානම් කමිටුව	
	(ඕ)	බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව කමිටුව විසින් තීරණය කරන ලද විවක්ෂණ මට්ටම්වලට වඩා ඉහළ මට්ටම්වල නිශ්චිත අවදානම් ඇති විට, ඒ වායේ බලපෑම් අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ පියවර ගත යුතුය;	✓
		සීමාවන් ඉක්මවා ගිය විශේෂිත ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම්, ප්‍රධාන අවදානම් නිලධාරී විසින් අධීක්ෂණය කරනු ලබන අතර ඒ සම්බන්ධ ගැටළුවල තීව්‍රතාවය මත කමිටුවට සෘජුවම වාර්තා කෙරේ.	
	(ක)	යාවත්කාලීන කරන ලද ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇතුළුව අවදානම් කළමනාකරණයේ සියලු අංශ තක්සේරු කිරීම සඳහා අවම වශයෙන් කාර්තුමය වශයෙන් රැස්විය යුතුය;	✓
		වසර තුළ කමිටුව අට වතාවක් (08) රැස්විය. රැස්වීම් සහ පැමිණීම් පිළිබඳ විස්තර 173 පිටුවේ දක්වා ඇත.	
	(ග)	කමිටුව විසින් නිර්දේශ කර ඇති පරිදි නිශ්චිත අවදානම් හඳුනා ගැනීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය;	✓
		මෙම නියෝගයට අනුකූල වීම සඳහා බැංකුව තුළ විධිමත් ලේඛනගත විනය ක්‍රියාමාර්ග පටිපාටියක් ක්‍රියාත්මක වේ.	
	(ජ)	කමිටුව, සෑම රැස්වීමක්ම පවත්වා සතියක් ඇතුළත අවදානම් තක්සේරු වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර, එමඟින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, එකඟතාවය හා/හෝ විශේෂිත නියෝග ඉල්ලා සිටිය යුතුය.	✓
		සෑම රැස්වීමකටම පසු වලඹෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට, විස්තරාත්මක කමිටු රැස්වීම් වාර්තා ඉදිරිපත් කරන අතර, ඒ හා සමඟ අවදානම් කළමනාකරණ වාර්තා සහ නිර්දේශ ද යොමු කෙරේ.	
	(ට)	කමිටුව, නීති, රෙගුලාසි, නියාමන මඟ පෙන්වීම්, හා ව්‍යාපාරික මෙහෙයුම් තුළ සෑම අංශයකම අනුමත ප්‍රතිපත්ති හා බැංකුවේ අනුකූලතාවය තක්සේරු කිරීම උදෙසා අනුකූලතා කෘත්‍යයක් ස්ථාපනය කළ යුතුය. ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරී කාර්ය මණ්ඩලය තුළින් තෝරා ගැනුන කැපවූ අනුකූලතා නිලධාරියෙකු අනුකූලතා කෘත්‍යය ඉටුකළ යුතු අතර, කලින් කලට කමිටුවට වාර්තා කළ යුතුය.	✓
		අනුකූලතා කාර්යය ප්‍රධාන අනුකූලතා නිලධාරියා විසින් මෙහෙයවනු ලබන අතර බැංකුවේ සියලුම මෙහෙයුම් මට්ටම්වලින් ස්වාධීනව ක්‍රියාකරමින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සෘජුවම වාර්තා කරයි. අදාළ වන සියලුම නීති, රීති සහ රෙගුලාසි පිළිපැදීම සහතික කිරීමෙන් මෙම අංශය පූර්වගාමීව අනුකූලතා අවදානම හඳුනා ගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය කිරීම සහ අවම කිරීම සිදු කරයි.	
		අනුකූලතා කාර්යය අභ්‍යන්තර පාලනයන්හි ඵලදායීතාවය ඇගයීමට ලක් කරන අතර ව්‍යාපාර මෙහෙයුම් අනුමත ප්‍රතිපත්ති සහ නියාමන අපේක්ෂාවන්ට අනුකූලව සිදු කරන බව සහතික කරයි.	
	(ඩ)	මතු වෙමින් පවතින අවදානම් ඇතුළුව සියලු අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහ බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවට අවශ්‍ය ඕනෑම ගැලපීමක් සහතික කිරීම සඳහා තොරතුරු හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසීම සඳහා විගණන කමිටුව සමඟ ඵලදායී සන්නිවේදන සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය;	✓
		ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සහ විගණන කමිටුවල වාර්තා සාමාජිකයින් සහ සම්පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ බෙදා ගනු ලැබේ.	
	(ත)	මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ කාර්යයන්ට අගතියක් නොවන පරිදි, සේවකයින්ට ලබා දෙන දිරි දීමනා බැංකුවේ අවදානම් මට්ටම්, ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය සහ ඉපැයීම් සැලකිල්ලට ගන්නේ දැයි පරීක්ෂා කළ යුතුය;	
		ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමඟ සම්බන්ධීකරණයෙන් මෙම අවශ්‍යතාවය සපුරාලීමට පියවර ගෙන ඇත.	
6.6	**සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව**		
	මෙම කමිටුව පහත සඳහන් කොන්දේසිවලට යටත් වේ.		
	(අ)	අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් සභාපතිත්වය දැරිය යුතුය;	✓
	(ආ)	ස්වාධීන අධ්‍යක්ෂවරුන් බහුතරයකගෙන් සහ අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. ප්‍රධාන විධායක නිලධාරී සහ අදාළ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට රැස්වීම්වලට සහභාගී විය හැක්කේ න්‍යාය පත්‍රයේ අදාළ අයිතම සඳහා පමණි;	✓
		වත්මන් කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු (03) දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඉන් දෙදෙනෙකු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.	
	(ඇ)	අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව අඛණ්ඩ පදනමක් මත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හඳුනා ගැනීම, නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම සඳහා පැහැදිලි ප්‍රතිපත්තියක්, ක්‍රියා පටිපාටි සහ ක්‍රියාවලීන් ක්‍රියාත්මක වන බව සහතික කළ යුතුය;	✓

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර		අනුකූලතාවය
	(ඈ)	7.2 විධානයේ අර්ථ දක්වා ඇති ගනුදෙනු ඇතුළුව බැංකුවේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචනය කළ යුතුය, විශේෂයෙන් 7.1 විධානයේ අර්ථ දක්වා ඇති පරිදි "සම්බන්ධිත පාර්ශ්වකරුවන්" ලෙස සලකනු ලබන පුද්ගලයින් සමඟ, එවැනි ගනුදෙනු වලින් ඇතිවිය හැකි ඕනෑම බැඳියාවන් පිළිබඳ ගැටුම් වළක්වා ගැනීමේ අරමුණින් මෙය සිදු කළ යුතුය;	✓
	(ෘ)	සම්බන්ධිත පාර්ශ්වයන්ගේ විස්තර, සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු සහ සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනුවල ආර්ථික ප්‍රතිවිපාක පිළිබඳව කාර්තුමය වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය; කමිටුවේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.	✓
	(ඊ)	අධ්‍යක්ෂවරයෙකු, ඔහුගේ/ඇයගේ සමීප ඥාතියෙකු හෝ අධ්‍යක්ෂවරයාට සැලකිය යුතු උනන්දුවක් ඇති සමාගමක ගනුදෙනු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් පිළිබඳ පැවැත්වෙන ඕනෑම සාකච්ඡාවකට එම අධ්‍යක්ෂවරයා සහභාගී වීමෙන් වැළකී සිටින බවට සහතික විය යුතුය; සහ,	✓
	(උ)	බැංකුව විධාන අංක 7.1 තුළ නිර්වචනය කර ඇති අන්දමට සම්බන්ධිත පාර්ශ්ව සමඟ, සමාන ව්‍යාපාරික කටයුතු වල නිරත බැංකුවේ සෙසු ගනුදෙනුකරුවන්ට සපයනවාට වඩා වැඩි වාසිදායක සැලකීමක් එබදු පාර්ශ්වයන්ට පිරිනැමෙන අන්දමේ ගනුදෙනුවල නිරත නොවන බවට සහතික කළ යුතුය. මේ සම්බන්ධයෙන් වැඩි වාසිදායක සැලකීම යන්නට, පහත දැක්වෙන දෑ ඇතුළත් වෙයි. (i) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කළ පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ විචක්ෂණශීලි ප්‍රතිශතය ඉක්මවමින් සමස්ථ ශුද්ධ ණය පහසුකම්, සම්බන්ධිත පාර්ශ්වයන්ට සැපයීම. මෙම උප විධානය අනුව, (අ) බැංකු පනතේ නියෝග අනුව "පහසුකම්" යනුවෙන් නිර්වචනය කරනුයේ උපරිම ප්‍රමාණයේ පහසුකමයි. (ආ) "සමස්ත ශුද්ධ ණය පහසුකම" සමස්ථ ණය පහසුකමෙන්, මුදල්මය සුරැකුම් හා මෙබඳු සම්බන්ධිත පාර්ශ්ව විසින් බැංකුවේ කොටස් ප්‍රාග්ධනය තුළ හා වසර 5 කට හා එයට වැඩි කල්පිරීමේ කාලසීමාවක් සහිත ණය උපකරණයන් හි ආයෝජනය අඩු කිරීමෙන් ගණනය කළ යුතුය. බැංකුවේ සියලුම සේවකයින්ට අදාළ වන සාමාන්‍ය කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රම යටතේ හැර, බැංකුවේ කිසිදු සේවකයෙකුට වඩාත් හිතකර කොන්දේසි මත වඩා වැඩි වාසිදායක සැලකීමක්/ පහසුකම් ලබා නොදේ. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට සහ ඔවුන්ගේ සමීප පවුලේ සාමාජිකයින්ට වඩා වැඩි වාසිදායක සැලකීමක් ලබා දීමෙන් වැළකී සිටීමට චක්‍රලේඛ උපදෙස් නිකුත් කර ඇත.	✓
		(ii) සම්බන්ධිත නොවන සංසන්දනාත්මක ප්‍රතිපාර්ශ්වයක් සමඟ සංසන්දනාත්මක ගනුදෙනුවකදී බැංකුවේ ප්‍රශස්තම ණය පොළී අනුපාතයට වඩා අඩු පොළියක් අය කිරීම හෝ බැංකුවේ තැන්පතු පොළියට වඩා වැඩි පොළියක් ගෙවීම.	
		(iii) සම්බන්ධිත නොවන පාර්ශ්වයක් සමඟ සිදු කරන සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ලබා දී ඇති නියමයන්ට වඩා වැඩි වන වාසිදායක කොන්දේසි වෙළඳ පාඩු ආවරණය කිරීම සහ/ හෝ ගාස්තු/ කොමිස් මුදල් අත්හැරීම වැනි මනාප/ සැලකිලි සැපයීම.	
		(iv) ඇගයීම් පටිපාටියක් රහිතව සම්බන්ධිත පාර්ශ්වයකට සේවා සැපයීම හෝ සේවා ලබා ගැනීම.	
		(v) නිත්‍යානුකූල වැඩ කටයුතු හා කාර්යසාධනය සඳහා අවශ්‍ය ප්‍රමාණ හැර, හිමිකාරිත්ව, රහසිගත හෝ වෙනත් ආකාරයකින් සංවේදී විභවයක් සහිත තොරතුරු සම්බන්ධිත පාර්ශ්ව හා බෙදාගැනීමට තුඩුදිය හැකි වාර්තාකරණ මාර්ග හා තොරතුරු ප්‍රවාහ පවත්වාගෙන යාම. සියලුම සේවකයින්ට ඒකාකාරව අදාළ වන සාමාන්‍ය කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රම යටතේ හැර, වරණීය කොන්දේසි මත බැංකුවේ කිසිදු සේවකයෙකුට හිතකර සැලකිලි හෝ පහසුකම් ලබා නොදේ. මේ සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් නිකුත් කර ඇත. ඒ හා සමානව, බැංකු සේවකයින්ගේ සමීප ඥාතීන්ට කිසිදු වරණීය සැලකිලි ලබා නොදේ.	
7.	**සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු**		
	බලපත්‍රලාභී බැංකුවල සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සඳහා පහත අවශ්‍යතා අදාළ වේ.		✓
7.1	**සම්බන්ධිත පාර්ශ්වයන්**		✓
	(අ)	බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු;	
	(ආ)	එවැනි අධ්‍යක්ෂවරයෙකුගේ සමීප ඥාතීන්;	
	(ඇ)	බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකුට සැලකිය යුතු හිමිකමක් ඇති ව්‍යාපාරයක් (එම හිමිකම අධ්‍යක්ෂ තනතුරට පත් වීමට පෙර හෝ පසු ලබාගත් වුවද);	
	(ඈ)	බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකුගේ සමීප ඥාතීන්ට සැලකිය යුතු හිමිකමක් ඇති ව්‍යාපාරයක්.	
	(ෙ)	බලපත්‍රලාභී බැංකුවක සේවකයින්ට පොදුවේ අදාළ වන යෝජනා ක්‍රමයක් යටතේ එම නිලධාරියාට ලබා දෙන පහසුකම් හැර වෙනත් ඕනෑම පහසුකම් සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකුවක ප්‍රධාන විධායක නිලධාරියෙකු හෝ විධායක කාර්යයන් ඉටු කරන නිලධාරියෙකු;	
	(ඊ)	බලපත්‍රලාභී බැංකුවක, සැලකිය යුතු කොටස් හිමිකමක් ඇති පුද්ගලයෙකු හෝ සමාගමක්	
	(උ)	බලපත්‍රලාභී බැංකුවේ පරිපාලිත ආයතනයක් හෝ ආශ්‍රිත සමාගමක්;	
	(ඌ)	ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති බැංකුවක මව් බැංකුව සහ එහි පරිපාලිත ආයතන හැර, බලපත්‍රලාභී බැංකුවේ හිමිකාර සමාගමක් සහ එහි පරිපාලිත ආයතන.	
	(එ)	බලපත්‍රලාභී බැංකුවේ පරිපාලිත සමාගමක හෝ ආශ්‍රිත සමාගමක අධ්‍යක්ෂවරයෙකු;	
	(ඒ)	බලපත්‍රලාභී බැංකුවක සහ එහි පරිපාලිත සමාගම්වල මව් සමාගමක අධ්‍යක්ෂවරයෙකු;	
	(ඔ)	ඉහත 7.1 (ෘ) සහ (ඊ) උපදෙස්වල දක්වා ඇති පුද්ගලයෙකුගේ සමීප ඥාතියෙකු;	

2024 අංක 05 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර		අනුකූලතාවය
	(ඕ)	බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු, අධ්‍යක්ෂවරයෙකු හෝ හවුල්කරුවෙකු ලෙස කටයුතු කරන ව්‍යාපාරයක්	
	(ක)	බලපත්‍රලාභී බැංකුවක සැලකිය යුතු කොටස් හිමිකමක් ඇති කොටස් හිමියෙකු විසින් සැලකිය යුතු හිමිකමක් දරන ව්‍යාපාරයක්;	
	(ග)	බලපත්‍රලාභී බැංකුවක සැලකිය යුතු කොටස් හිමිකමක් ඇති කොටස් හිමියෙකුගේ සමීප ඥාතියෙකු විසින් සැලකිය යුතු හිමිකමක් දරන ව්‍යාපාරයක්;	
7.2	**සම්බන්ධිත පාර්ශව ගනුදෙනු වර්ග**		✓
	(අ)	බලපත්‍රලාභී බැංකුවල උපරිම ණය පහසුකම්/ විශාල නිරාවරණ ප්‍රමාණය පිළිබඳ බැංකු පනතේ උපදෙස්වල අර්ථ දක්වා ඇති පරිදි, ඕනෑම ආකාරයක ණය පහසුකම් ප්‍රදානය කිරීම.	
	(ආ)	තැන්පතු, ණය ගැනීම් හා ආයෝජන යන ආකාරයෙන් බැංකුවේ ඕනෑම වගකීමක් නිර්මාණය කිරීම.	
	(ඇ)	බැංකුවට සැපයූ හෝ බැංකුවෙන් ලබාගත් කිසියම් මූල්‍යමය හෝ මූල්‍යමය නොවන සේවා සම්පාදනය.	
	(ඈ)	බැංකුව හා කිසියම් සම්බන්ධිත පාර්ශ්ව අතර, එබඳු සම්බන්ධිත පාර්ශ්වයන්ට ප්‍රතිලාභ අත්කර දිය හැකි, හිමිකාරිත්ව, රහසිගත හෝ වෙනයම් ආකාරයකින් සංවේදී විභවයක් සහිත තොරතුරු හුවමාරු කිරීමට තුඩුදිය හැකි වාර්තාකරණ මාර්ග හෝ තොරතුරු ප්‍රවාහ ගොඩනැඟීම හා පවත්වා ගෙන යාම. මේ පිළිබඳ තොරතුරු වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇත.	
7.3	**බැංකු පනතේ විධිවිධානවල අදාළත්වය**		
	සම්බන්ධිත පාර්ශ්ව, ඔවුන්ගේ ගනුදෙනු හා සම්බන්ධිත පාර්ශ්වයන්ට වාසිදායක සැලකිල්ලක් පිරිනැමීම සීමා කිරීම ආවරණය කෙරෙන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් ඇති අතර සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ඇති අධ්‍යක්ෂවරුන්ගෙන් ඔවුන්ගේ ගනුදෙනු ප්‍රකාශ කරන ලෙස තනි තනිව ඉල්ලා සිටිනු ලැබේ. ගනුදෙනු ස්වයංක්‍රීය පද්ධතියක් හරහා නිරීක්ෂණය කෙරේ. අනුකූල වීම සඳහා ක්‍රියා පටිපාටි සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වේ.		✓
7.4	**අධ්‍යක්ෂවරුන්ට සහ සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දෙන ණය පහසුකම්**		
	බැංකුවක් කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයෙකුගේ ආසන්න පවුලේ සාමාජිකයෙකුට හෝ පුද්ගලයා විසින් සැලකිය යුතු බැඳියාවක් දරණ කිසියම් ව්‍යාපාරයකට කිසියම් ණය පහසුකමක් පිරිනමනු ලැබූ අවස්ථාවක එකී පුද්ගලයා පසු කාලීනව බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස පත්කර ඇත්නම් සහ:		✓
	(අ)	අදාළ පුද්ගලයා අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කළ දින සිට වසරක් ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද අවශ්‍ය සුරැකුම ලබා නොදේ නම්; සහ,	
	(ආ)	ඉහත (අ) හි දක්වා ඇති කාල සීමාව තුළ ඇතුළත අවශ්‍ය සුරැකුම ලබා දී නොමැති අවස්ථාවක; අදාළ ණය පහසුකම් සම්බන්ධයෙන් පොළිය ද ඇතුළුව ගෙවිය යුතු ඕනෑම මුදලක්, ණය පහසුකම් ප්‍රදානය කරන අවස්ථාවේ දී නිශ්චිතව එකඟ වූ කාල සීමාව තුළ හෝ අධ්‍යක්ෂවරයා පත් කළ දින සිට මාස දහඅටක කාලයක් ඉකුත් වන විට යන කාල සීමාවන් දෙකෙන් කලින් එළඹෙන කාලය තුළ පියවා නොමැති නම්; අදාළ අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් වී ඇති බවට සලකනු නොලැබේ. කෙසේ වෙතත්, ණය පහසුකම් ප්‍රදානය කරන අවස්ථාවේ බැංකුවේ සේවකයෙකු වූ සහ එම බැංකුවේ සියලුම සේවකයින්ට පොදුවේ අදාළ වන යෝජනා ක්‍රමයක් යටතේ ණය පහසුකම් ප්‍රදානය කරන ලද අධ්‍යක්ෂවරයෙකුට මෙම විධානය අදාළ නොවේ. මෙම ණය පහසුකම්, මුදල් මණ්ඩලය විසින් කලින් කලට තීරණය කරනු ලබන සුරැකුම් මගින් ද සුරක්ෂිත කළ යුතුය.	
7.5	**සේවකයන්ට ලබා දෙන ණය පහසුකම්**		
	බැංකු පනතේ 47(3) සහ (5) වගන්ති ප්‍රකාරව ලබා දී ඇති ණය පහසුකම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ණය යෝජනා ක්‍රමයක පදනම මත සුරැකුම් මගින් සුරක්ෂිත කර ඇති විට හෝ බැංකුවේ සියලුම සේවකයින්ට පොදුවේ අදාළ වන යෝජනා ක්‍රමයක් යටතේ ණය පහසුකම් ප්‍රදානය කර ඇති විට යන අවස්ථා වලදී හැර, කිසියම් සේවකයෙකුට හෝ එවැනි සේවකයෙකුගේ සමීප ඥාතියෙකුට හෝ සේවකයාට හෝ සමීප ඥාතියෙකුට සැලකිය යුතු උනන්දුවක් ඇති ඕනෑම ආයතනයකට ගාස්තු සහ/හෝ කොමිස් මුදල් නිදහස් කිරීම සම්බන්ධයෙන් කිසිදු "වඩාත් හිතකර සැලකීමක්" බැංකුවක් විසින් ලබා නොදිය යුතුය. බැංකුවේ සියලුම සේවකයින්ට පොදුවේ අදාළ වන සාමාන්‍ය කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රම යටතේ මිස, බැංකුවේ කිසිදු සේවකයෙකුට වඩාත් වාසිදායක කොන්දේසි මත හිතකර ප්‍රතිකාර/නවාතැන් පහසුකම් ලබා නොදේ. මේ සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් නිකුත් කර ඇත. බැංකු සේවකයින්ගේ ආසන්න පවුලේ සාමාජිකයින්ට ද කිසිදු හිතකර සැලකිල්ලක් ලබා නොදේ.		✓
7.6	**සම්බන්ධිත පාර්ශ්ව ණය පහසුකම් කපා හැරීම**		
	බලපත්‍රලාභී බැංකුවක් විසින් විධාන 7.1 මත ලබා දුන් කිසිදු පහසුකමක් හෝ එකී පහසුකමක කිසියම් කොටසක් හෝ ඒ සඳහා ලැබිය යුතු කිසියම් පොළියක්, ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමැතිය රහිතව කපා හැරීම නොකළ යුතු අතර, අදාළ අනුමැතිය රහිතව කිසියම් කපා හැරීමක් සිදු කරයි නම් එය වලංගු රහිත හා බලනොපාන එකක් විය යුතුය. වසර තුළ එවැනි කිසිදු සිදුවීමක් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවට වාර්තා වී නොමැත.		

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර		අනුකූලතාවය
8.	**ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය**		
	මෙම නියෝගය සඳහා ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය යනුවෙන් අදහස් වන්නේ බලපත්‍රලාභී බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ය.		✓
8.1	**ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය**		
	අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත වගකීම එදිනෙදා කටයුතු පරීක්ෂා කිරීමේ වගකීමක් ලෙස නොසැලකිය යුතු අතර, ජ්‍යේෂ්ඨ කළමනාකරණ සාමාජිකයින් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ග සහ ප්‍රතිපත්තිවලට අනුකූලව එදිනෙදා කටයුතු ආරක්ෂිතව සහ යහපත් ආකාරයකින් සිදු කරන බව අධීක්ෂණය කිරීමට සහ සහතික කිරීමට ඇති වගකීමක් ලෙස වටහා ගත යුතුය. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතුය.:		✓
	(අ)	ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වයේ බලතල සහ වගකීම් අදාළ ක්ෂේත්‍ර නිර්වචනය කිරීම;	
	(ආ)	ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වයේ ක්‍රියාමාර්ග අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපාර උපායමාර්ග සහ ප්‍රතිපත්තිවලට අනුකූල වන බව සහතික කිරීම;	
	(ඇ)	අවශ්‍යතාවය අනුව, ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය සමඟ නිතිපතා හමුවී, සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම;	
	(ඈ)	ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය විසින් සපයන ලද පැහැදිලි කිරීම් සහ තොරතුරු ප්‍රශ්න කිරීම සහ විවේචනාත්මකව සමාලෝචනය කිරීම;	
	(ඉ)	බැංකුවේ මෙහෙයුම්වල ප්‍රමාණය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණත්වය සැලකිල්ලට ගෙන ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වයේ සාමූහික දැනුම සහ විශේෂඥතාව සුදුසු දැයි තක්සේරු කිරීම; සහ	
	(ඊ)	ජ්‍යේෂ්ඨ කළමනාකරණ සාමාජිකයින් බැංකුවේ ක්‍රියාවන් සඳහා වගකිව යුතු පුද්ගලයන් බවට පත් කිරීම.	
8.2	**ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වයේ යෝග්‍යතාවය සහ සුදුසුකම තක්සේරු කිරීම සඳහා වන නිර්ණායක**		
	බැංකු පනතේ 44A සහ 76H වගන්ති ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරන පරිදි බලපත්‍රලාභී බැංකුවල ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය අදාළ තනතුරු දැරීමට සුදුසු සහ යෝග්‍ය පුද්ගලයින් විය යුතු අතර, ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වයේ සාමාජිකයින් සුදුසු සහ යෝග්‍ය පුද්ගලයින්ද යන්න තීරණය කිරීමේදී බැංකු පනතේ 42(2) වගන්තිවල විධිවිධාන සළකා බැලිය යුතුය. ප්‍රධාන කළමනාකරණ පිරිස් එම තනතුරු වලට පත් කරන අවස්ථාවේදී සහ ඔවුන් ඊළඟ ශ්‍රේණියට උසස් කරන විට අදාළ තනතුරු දැරීමට සුදුසු සහ යෝග්‍ය පුද්ගලයින් බවට සහතික කරනු ලැබේ.		✓
8.3	**ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වයේ වගකීම්**		
	(අ)	පුද්ගලික හැසිරීම තුළින් බලපත්‍රලාභී බැංකුවක ශක්තිමත් ආයතනික යහපාලන රාමුවට සැලකිය යුතු ලෙස දායක වීම;	✓
	(ආ)	බලපත්‍රලාභී බැංකුවේ ඔහුගේ/ඇයගේ රාජකාරී ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් වෘත්තීය කාලයක් කැප කළ යුතුය. ජ්‍යේෂ්ඨ කළමනාකරණ සාමාජිකයෙකු බලපත්‍රලාභී බැංකුවේ පරිපාලිත ආයතනයක හෝ ආශ්‍රිත සමාගමක විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරනු ලැබුවහොත්, එම රාජකාරී බැංකුවට වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට බලපාන්නේ නැති බව ඔහු/ඇය සහතික කළ යුතුය;	✓
	(ඇ)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇති උපදෙස් යටතේ මූල්‍ය සහ මූල්‍ය නොවන අවදානම් කළමනාකරණය කිරීම සඳහා ව්‍යාපාර උපායමාර්ග, අවදානම් කළමනාකරණ පද්ධති, අවදානම් සහ අනුකූලතා සංස්කෘතිය, ක්‍රියාවලීන් සහ පාලනයන් ක්‍රියාත්මක කිරීම;	✓
	(ඈ)	අවදානම් කළමනාකරණය, අනුකූලතාවය සහ අභ්‍යන්තර විගණන කාර්යයන්හි ස්වාධීන යුතුකම් හඳුනාගෙන ඒවාට ගරු කළ යුතු අතර එවැනි රාජකාරී ක්‍රියාත්මක කිරීමට මැදිහත් නොවිය යුතුය;	✓
	(ඉ)	නිපුණතා පවත්වා ගැනීමට සහ වැඩිදියුණු කිරීමට සහ අදාළ වගකීම් ක්ෂේත්‍රවලට අදාළ වර්ධනයන් පිළිබඳව යාවත්කාලීනව සිටීමට නිතිපතා පුහුණුව සඳහා ප්‍රවේශය ලබා ගැනීම;	✓
	(ඊ)	කාර්ය මණ්ඩලයට රාජකාරී පැවරීම සහ එවැනි පවරන ලද රාජකාරී අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතුය;	✓
	(උ)	බැංකුව පුරා වගවීම සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කරන කළමනාකරණ ව්‍යුහයක් ස්ථාපිත කිරීම;	✓
	(ඌ)	උල්ලංඝනයන් හඳුනාගනු ලැබුවහොත් සුදුසු ප්‍රතිකර්ම හෝ විනය ක්‍රියාමාර්ග ගන්නා බවට සහතික වීම;	✓
	(එ)	අදාළ වන පරිදි, අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවලට නිතිපතා පහත කරුණු ඇතුළුව අනෙකුත් වැදගත් කරුණු පිළිබඳ තොරතුරු සැපයීම; (i) ව්‍යාපාර උපායමාර්ගයේ, අවදානම් උපායමාර්ගයේ/ අවදානම් අභිරුචියේ වෙනස්කම්, (ii) බැංකුවේ කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය, (iii) අවදානම් සීමාවන් හෝ අනුකූලතා නීති උල්ලංඝනය කිරීම, (iv) අභ්‍යන්තර පාලන අසාර්ථකත්වයන් සහ, (v) නීතිමය හෝ නියාමන ගැටළු.	✓
	(ඒ)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගේ හෝ වෙනත් ජ්‍යේෂ්ඨ කළමනාකරණ සාමාජිකයෙකුගේ යෝග්‍යතාවයට සහ සුදුසුකමට අහිතකර ලෙස බලපාන ඕනෑම වැදගත් තොරතුරක් පිළිබඳව දැනුවත් වූ පසු බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතුය.	

2024 අංක 05 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර		අනුකූලතාවය
9.	**හෙළිදරව් කිරීම්**		
9.1	**හෙළිදරව් කිරීම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වගකීම්**		✓
	බැංකුවේ මෙහෙයුම්වල ප්‍රමාණය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණතාවයට අනුරූපව වැඩිදියුණු කළ වෙළඳපළ නීති සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, ප්‍රධාන කාර්යසාධන දර්ශක, ප්‍රාග්ධන ප්‍රමාණාත්මක බව, ද්‍රවශීලතාවය, ව්‍යාපාර සංකේන්ද්‍රණයන්, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු, ආයතනික යහපාලන කටයුතු සහ මූල්‍ය ප්‍රකාශන ඇතුළුව නමුත් ඒවාට සීමා නොවී, අදාළ තොරතුරු ප්‍රමාණවත් සහ කාලෝචිත ලෙස මහජනයාට හෙළිදරව් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි. ඊට අමතරව වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන අදාළ අධීක්ෂණ සහ නියාමන බලධාරීන් විසින් නියම කරන ලද ආකෘතිවලට අනුකූලව සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ප්‍රකාශයට පත් කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.		
9.2	**වාර්ෂික වාර්තාවේ සැපයිය යුතු අවම හෙළිදරව් කිරීම්**		
	වාර්ෂික වාර්තාවේ පහත සඳහන් අවම හෙළිදරව් කිරීම් සිදු කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය.		
	(අ)	වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, නිශ්චිත හෙළිදරව් කිරීම් ඇතුළුව, අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව සකස් කර ඇති බවට ප්‍රකාශයක්. පිටු අංක 218 සිට 223 දක්වා "ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව" හි සහ පිටු අංක 229 හි "මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම"යන වාර්තාවල මේ සම්බන්ධයෙන් හෙළිදරව් කර ඇත.	✓
	(ආ)	මූල්‍ය වාර්තාකරණ පද්ධතිය, මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් සැපයීම සඳහා නිර්මාණය කර ඇති බවට හා බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශ සැකසීම අදාළ මූල්‍යකරණ හා නියාමන අවශ්‍යතා හා අනුරූපවෙමින් ඉටු කළ බවට ද, බැංකුවේ අභ්‍යන්තර යහපාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවක්. වාර්ෂික වාර්තාවේ පිටු අංක 226 සහ 227 හි 'මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර යහපාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය' හා පිටු අංක 229 හි 'මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම' තුළ හෙළිදරව් කර ඇත.	✓
	(ඇ)	ඉහත (ආ) හි සඳහන් අභ්‍යන්තර යහපාලන යාන්ත්‍රණයේ සඵලතාවය පිළිබඳ බාහිර විගණකගේ සහතිකය. "ශ්‍රී ලංකා සහතික කිරීමේ කාර්යභාර ප්‍රමිති 3050 යටතේ අභ්‍යන්තර යහපාලනය මත අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශ පිළිබඳව බැංකු සඳහා සහතික වාර්තා" යටතේ විගණකවරුන් විසින් නිකුත් කරන ලද සහතික කිරීමේ වාර්තාව මේ සම්බන්ධයෙන් ආදේශක හෙළිදරව් කිරීමක් ලෙස භාවිතා කළ හැකිය. බැංකුව මූල්‍ය වාර්තාකරණය මත අභ්‍යන්තර යහපාලන විධින් හි සඵලතාවය පිළිබඳව විගණනකාධිපතිවරයාගෙන් සහතිකයක් ලබාගෙන ඇති අතර එය මෙම වාර්තාවේ පිටු අංක 228 හි දැක්වේ.	✓
	(ඈ)	නාමයන්, බැංකුව සමඟ ඇති ගනුදෙනු සහ බැංකුව විසින් ගෙවූ මුළු ගාස්තු/ පාරිශ්‍රමික ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ විස්තරාත්මක තොරතුරු. අධ්‍යක්ෂවරුන්ගේ තොරතුරු පිටු අංක 32 සිට 39 හි දක්වා ඇත. බැංකුව සමඟ වන ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත පිටු අංක 224 සිට 225 හි දක්වා ඇත. බැංකුව විසින් ගෙවූ පාරිශ්‍රමික පිළිබඳ විස්තර, පිටු අංක 270 හි 17 වන සටහන යටතේ දක්වා ඇත.	✓
	(ඉ)	එක් එක් සම්බන්ධිත පාර්ශ්ව සඳහා ලබා දී ඇති මුළු ශුද්ධ ණය පහසුකම්. අදාළ පාර්ශ්වවල එක් එක් කාණ්ඩයට ලබා දී ඇති ශුද්ධ ණය පහසුකම් බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස ද හෙළි කළ යුතුය. බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස 2025 වර්ෂය තුළ එක් එක් අදාළ පාර්ශ්වයන් සඳහා ප්‍රදානය කරන ලද "මුළු ශුද්ධ ණය" පහසුකම් පහත දැක්වේ.	✓

	රු. '000	ප්‍රතිශතය %
ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP)	994,758	0.35
පරිපාලිත/ ආශ්‍රිත සහකාර සමාගම්වල අනෙකුත් අධ්‍යක්ෂවරුන්	32,959	0.01
පරිපාලිත ආයතන	869,661	0.31
ආශ්‍රිත සමාගම්	390,705	0.41
රජය සහ රජයට අදාළ ආයතන (මූල්‍ය ප්‍රකාශනවල 61 වන සටහනේ අර්ථ දැක්වීම බලන්න)	3,297,631,282	1,164.58

පරිච්ඡේදය	නියෝගය සහ ක්‍රියාත්මක කිරීමේ විස්තර	අනුකූලතාවය
	(ඊ) බැංකුව ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන්ට ගෙවූ පාරිශ්‍රමික වල මුළු එකතුව හා ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් සමඟ බැංකුවේ මුළු ගනුදෙනු එකතුව, ගෙවූ පාරිශ්‍රමික, සැපයූ ණය පහසුකම්, තැන්පතු හා ආයෝජන ආදී වශයෙන් පුළුල් වර්ග යටතේ වෙන්ව දැක්වීම.	✓
	2025 වර්ෂය සඳහා ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන්ට ගෙවූ පාරිශ්‍රමික හා බැංකුව හා ඔවුන් අතර වූ ගනුදෙනු පහත දැක්වේ:	

	රු. '000
කෙටි කාලීන රැකියා ප්‍රතිලාභ	1,521,924
පශ්චාත් රැකියා ප්‍රතිලාභ	301,395

මෙයට අමතරව බැංකුව එහි අනුමත ප්‍රතිලාභ සැලසුම යටතේ, ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන්ට වාහන පරිහරණය වැනි මුදල්මය නොවන ප්‍රතිලාභ ද සපයා ඇත.

	රු. '000
ණය	829,249
බැංකු අයිරා	42,726
ණය කාඩ්පත්	30,940
තැන්පත්	2,052,711
ණයකර	15,674
භාවිතා නොකළ පහසුකම්	161,879

	(උ) පහත සඳහන් කරුණු ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවල විස්තර (i) වර්ෂය තුළ එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර; (ii) වසර තුළ පවත්වන ලද එක් එක් කමිටුවේ රැස්වීම් ගණන; සහ (iii) එවැනි රැස්වීම් සඳහා එක් එක් අධ්‍යක්ෂවරයාගේ පැමිණීම පිටු අංක 180 සිට 190 හි දක්වා ඇත.	✓
	(ඌ) වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවේ පහත සඳහන් දෑ අනාවරණය කළ යුතුය:	
	(i) මෙම විධානයන්හි එක් එක් උප-විධානයන් සමඟ බැංකුවේ අනුකූලතා තත්ත්වය පැහැදිලිව පෙන්නුම් කරමින්; බලපත්‍රලාභී බැංකුවේ අනුකූල වීම පිළිබඳ බාහිර විගණකගේ සහතිකය	✓
	(ii) සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කාණ්ඩය අනුව විධායක අධ්‍යක්ෂවරුන්, විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය ; සහ,	✓
	(iii) සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ අනන්‍යතාවය සහ සභාපතිවරයා, ප්‍රධාන විධායක නිලධාරියා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් අතර මූල්‍ය, ව්‍යාපාර, පුද්ගලික හෝ වෙනත් ප්‍රමාණාත්මක/අදාළ සම්බන්ධතා තිබේ නම්, ඒවායේ ස්වභාවය.	
	පිටු අංක 162 සිට 190 හි දක්වා ඇත.	
	(එ) විචක්ෂණශීලී අවශ්‍යතා, නියාමන නීති රීති හා අභ්‍යන්තර පාලන විධි හා කිසියම් සැලකිය යුතු අනුකූල නොවීම් නිවැරදි කරන්නට ගත් ක්‍රියාමාර්ග සමඟ අනුකූලතා විස්තර විදහා පෙන්වන වාර්තාවක්.	✓
	පිටු අංක 218 සිට 223 හි දක්වා ඇත.	
